ශ්‍රීමත් බුද්ධඝෝෂ ආචාර්ය පාදයන් විසින් විරචිත

## අත්ථසාලිනී නම් වූ

# ධම්මසඞ්ගණිප්පකරණට්ඨ කථා

## (සිංහල පරිවර්තනය)




ප්‍රකාශනය

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

# ධම්මසඞ්ගණිප්පකරණට්ඨ කථා සිංහල පරිවර්තනය

පාලි අට්ඨකථා සිංහලට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉල්ලීම පරිදි ධම්මසඞ්ගණිප්පකරණට්ඨ කථා සිංහලට පරිවර්තනය කරන ලද්දේ, මොරොන්තොට සෝමරත්න ගම්ලත් වෙළගෙදර මහාතණන් විසිනි. සෝමරත්න ගම්ලත් වෙළගෙදර මහතා කැළණියේ, විද්‍යාලංකාර විශ්ව විද්‍යාලය යේ ආරම්භක අවධියේම එහි ඇතුළත්ව, පාලි භාෂාව පිළිබඳ ගෞරව උපාධිය 1963 වර්ෂයේදී ලබා ගත්තේ ය. උස්සාපිටිය ශ්‍රී සුමංගල පිරිවෙන් විද්‍යායතනයේ ගුරුවරයකු වසයෙන් දශක තුනකට ආසන්න කාලයක් සේවය කොට, විශ්‍රාම ගැනීමෙන් පසුව ප්‍රදේශයේ සාමාජික කටයුතුවල යෙදී සිටින ප්‍රදේශයේ ගරු බුහුමනට පත් බහුශ්‍රැතයෙකි.

Vol XLII

ශ්‍රීමත් බුද්ධඝෝෂ ස්ථවිරපාදයන් විසින් විරචිත

## අත්ථසාලිනී නම් වූ

# ධම්මසංගණිප්පකරණට්ඨ කථා

(සිංහල පරිවර්තනය)

*බුද්ධශාසන අරමුදලේ භාරකාර මණ්ඩලයේ අනුග්‍රහයෙනි.*

ශ්‍රීමත් බුද්ධඝෝෂ ආචාර්යපාදයන් විසින් විරචිත

# අත්ථසාලිනී නම් වූ

# ධම්මසංගණිප්පකරණට්ඨ කථා

## (සිංහල පරිවර්තනය)

*සිංහල පරිවර්තනය*

**සෝමරත්න ගම්ලත් වෙලගෙදර**

**ශාස්ත්‍රවේදී - පණ්ඩිත**

*අධීක්ෂණය*

**පූජ්‍ය විදුරුපොල ආනන්ද ස්ථවිර**

**රාජකීය පණ්ඩිත - ශාස්ත්‍රවේදී**

**හොරණ විද්‍යාරත්න මහ පිරිවෙන්හි ආචාර්ය**

*ප්‍රකාශනය*

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.

දුරකථන: 2734256 ෆැක්ස්: 2736737

ශ්‍රීමත් බුද්ධඝෝෂ ආචාර්යපාදයන් විසින් විරචිත

# අත්ථසාලිනී නම් වූ
# ධම්මසංගණිප්පකරණට්ඨ කථා

(සිංහල පරිවර්තනය)

ප්‍රථම මුද්‍රණය 2008

I S B N - 978-955-1604-37-8

*පරිගණක අකුරුකරණය*

උපමාලි කුලසේකර - කටුගස්තොට.

*පිටකවරය*

සුසිල් ජයශාන්ත පෙරේරා - මහරගම.

මුද්‍රණය

අජිත් ප්‍රින්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

342, පරණ කැස්බෑව පාර, රත්තනපිටිය, බොරලැස්ගමුව.

දුරකථනය: 0112517269

*ප්‍රකාශනය*

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය

125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.

දුරකථන: 2734256, 2728468, 2726234 ෆැක්ස්: 2736737

විද්‍යුත් තැපැල: bcc456@sltnet.lk

www.buddhistcc.com

# ප්‍රස්තාවනා (අට්ඨකථා)

පාළි භාෂාව මධ්‍යතන ඉන්දු ආර්ය පූර්ව අවධියට අයත් ප්‍රාකෘත විශේෂයක් බවත්, එම ප්‍රාකෘතය වූ කලී එකල උත්තර භාරතයේ ඒ ඒ ප්‍රදේශවල පැවති පොදු ජනයාගේ කථා ව්‍යවහාරය බවත්, පිළිගත් විද්වත් මතයයි. ප්‍රාකෘත ව්‍යවහාරය පොදු ජනතාවගේ හා ශ්‍රමණ සම්ප්‍රදාය ගරු කළ චින්තකයන්ගේ ද භාෂා මාධ්‍යය විය. එය උත්තර භාරතයේ පැතිරී ගිය ඉන්දු යුරෝපීය භාෂා ව්‍යවහාරයෙන් ජනිත වූවක් සේ සැලකිය යුතුය. මෙම ප්‍රාකෘත ව්‍යවහාරයේ ලිඛිත සාධක අනුව මූල අවස්ථාවක් සේ පෙනෙන පාළි භාෂාව උත්තර භාරතයේ කිසියම් විශේෂ ප්‍රදේශයක කථා ව්‍යවහාරයේ මාධ්‍යයක් විය.

1. පාළි භාෂාව ක්‍රි.පූ. 6 වැනි 7 වැනි සියවස්වල කොසොල් රට පැවති කථා ව්‍යවහාරය පදනම් කොට ඇති වූවෙකැයි ද එය නොයෙක් ජනපදවල ජනයාගේ පොදු භාෂා මාධ්‍යය වී යැයි ද මහාචාර්ය රීස් ඩේවිඩ්ස් තුමා පවසයි.

2. පාළිය උජ්ජයිනී ප්‍රදේශයේ භාෂාව යැයි වෙස්ටර් ගාඩ් සහ ඊ කුන් සහ ඔටෝ ප්‍රොන්කේ වැනි විචාරකයෝ පවසති.

3. පාළිය මගධයේ කථා ව්‍යවහාරයයි යන බුද්ධඝෝෂ හිමියන්ගේ මතය මහාචාර්ය ගෛගර් තුමා අනුමත කරයි.

4. බුදුරජාණන් වහන්සේ මුලදී කොසොල් රට බසින් දහම් දෙසන්නට ඇතැයි සලකන වින්ටර්නීට්ස් පාළි ත්‍රිපිටකයේ භාෂාව පැරණි මගධ ව්‍යවහාරය බව පදනම් කොට වෙනත් ප්‍රදේශ ව්‍යවහාරයන්ගේ සම්මිශ්‍රණයද ඇතිව ගොඩනැගුණු බෞද්ධයන්ගේ සාහිත්‍යයික භාෂාවකැයි පවසයි.

5. බුදුන් වහන්සේ ධර්ම ප්‍රචාරයේ යෙදුණු පන්සාළිස් වසින් වැඩි කොටසක් කොසොල් මගධ ප්‍රදේශවල සැරිසැරූ බව බෞද්ධ සාහිත්‍යයේ පෙනෙන බැවින් පාළි භාෂාව කොසොල් මගධ දෙරට

කථා ව්‍යවහාරය පදනම් කොටගෙන බිහි වූවාක් සේ සැලකීමට පුළුවන් බව ඊ කුන් නම් විචාරකයා පෙන්වා දෙයි.

මෙම විග්‍රහයන් ශාස්ත්‍රීය වශයෙන් වැදගත් වන අතර විශේෂයෙන් සැලකිය යුත්තේ බුදුන් වහන්සේගේ මතයයි. බුදුරජාණන් වහන්සේ දක්වා වදාළ ආකල්ප විග්‍රහ වන්නේ මජ්ඣිම නිකායේ අරණ විභංග සූත්‍රයෙහි. මෙම සූත්‍රයෙන් පෙන්වන්නේ උන්වහන්සේ භාෂා මාධ්‍යයෙහි අනවශ්‍ය ලෙස දැඩිව එල්බ ගත් ශාස්තෲවරයෙකු නොවන බවයි. එකම දෙය විවිධ ජනපදවල නාම කීපයකින් හඳුන්වනු ලබන කල ඒ එක නාමයක් දැඩිව අල්ලා නොගෙන ඒ ඒ ලෙසට ව්‍යවහාර කළ යුතු බවත් ලෝක ව්‍යවහාරය නොඉක්මවිය යුතු බවත් අරණ විභංග සූත්‍රයෙහි උගැන්වෙයි.

බුද්ධ පරිනිර්වාණයෙන් පසුව ත්‍රිපිටකය සංගීත වූ භාෂාව වන පාළි භාෂාව ථේරවාදීන්ගේ ආගමික භාෂාව විය. එය සමස්ත ත්‍රිපිටකය පුරා රැඳී ගියේය. ථේරවාදීන්ගෙන් බිඳී ගිය මහායානිකයෝ බුද්ධ ධර්මය සංස්කෘතයට පෙරළා ගත්හ. ඔවුන්ගේ සංස්කෘත සාහිත්‍යය දියුණුවීමත් මුස්ලිම් ආක්‍රමණ වැනි ආක්‍රමණත් මහායානික දර්ශනය විශ්ව විද්‍යාල මගින් රට මුළුල්ලෙහි බෙදා හැරීමත්, මහායානිකයන් ආමිස පූජා යන්ත්‍ර, මන්ත්‍ර ආදියෙන් පෘථග්ජන ප්‍රසාදය දිනාගැනීමත්, භික්ෂු විනය නීති ලිහිල් ලෙස මහායානිකයන් විසින් සකස් කිරීමත් ආදිය නිසා බුද්ධ ධර්මයත් පාළි භාෂාවත් බුද්ධජන්මභූමියෙන් අතුරුදහන් විය. එය ශ්‍රී ලංකාද්වීපයේ තහවුරු විය.

### හෙළඅටුවා

සම්බුද්ධ පරිනිර්වාණයෙන් දෙසිය පන්තිස් වැන්නෙහි අශෝක අධිරාජයාගේ දායකත්වයෙන් පැලලුප් නුවරදී තුන්වන සංගායනාව පැවැත්වීය. මොග්ගලීපුත්තතිස්ස මහ රහතන් වහන්සේගේ ප්‍රධානත්වයෙන් රහතන් වහන්සේලා දාහක් සම්බන්ධ වෙමින් මෙම සංගායනාව පවත්වා ඇත. සාහස්සිකා නමින් හඳුන්වන මෙම සංගායනාව නව මසකින් සම්පූර්ණ විය.

තෘතිය සංගායනාවසානයේ දඹදිව ථේරවාදාචරිය පරම්පරාවේ අවසන් පුරුෂයා වූ මොග්ගලීපුත්තතිස්ස මහ රහතන් වහන්සේගේ ශිෂ්‍ය

මිහිඳු මහ රහතන් වහන්සේ විසින් තෘතීය සංගායනාවේදී තෝරා බේරා ගෙන සංග්‍රහ කළ, ථේරවාදී ත්‍රිපිටකය ශ්‍රී ලංකාවට ගෙන එන ලදි. මිහිඳු හිමියන් විසින් ලක්දිවට ගෙන එන ලද පාළි ත්‍රිපිටකය මහා අරිට්ඨ රහතන් වහන්සේ ප්‍රමුඛ කොට ඇති සිංහල භික්ෂූන් වහන්සේලා උගත්හ. පාළියෙන් තිබූ ත්‍රිපිටකයේ ගැටලු තැන් සිංහල ජනතාවට පැහැදිළි කර දීම අවශ්‍ය විය. බුද්ධ කාලයේ සිට වාචනා මාර්ගයෙන්, ආචාර්ය පරම්පරා වලින් පැවත ආ අර්ථ විවරණ ක්‍රම මිහිඳු හිමියන්ගෙන් සිංහල භික්ෂූන් වහන්සේලා උගෙන ත්‍රිපිටකයේ ගැටලු තැන් හෙළ බසින් අරුත් විවරණය කළහ. හෙළටුවා නමින් මේවා හඳුන්වයි.

අටුවා වනාහි ත්‍රිපිටකයට අයත් පොත් වලට ලියා ඇති ව්‍යාඛ්‍යාන සංග්‍රහ සමූහයයි. අටුවාවල පරමාර්ථය පෙළෙහි ඇති දුරවබෝධ වචන සහ ධර්මයේ ගැඹුරු තැන් විස්තර කිරීමත් අවශ්‍ය තැන්වලදී විස්තරාර්ථ සැපයීමත්ය. මෙම පරමාර්ථයෙන් ලියන ලද හෙළටුවා නම්,

මහා අට්ඨකථා
කුරුන්දි අට්ඨකථා
පච්චරිය අට්ඨකථා නම් වේ.

හෙළ අටුවා අතුරින් ප්‍රමුඛ ස්ථානය දැරුවේ මහා අට්ඨකථාව හෙවත් මූල අට්ඨ කථාවයි. බුද්ධඝෝෂ හිමියන්ගේ අට්ඨ කථා සියල්ලටම පාහේ ශරීරය කරගෙන ඇත්තේ මෙම අටුවාවයි. තුන් පිටකයටම අයත් අට්ඨ කථාවන්හි මහා අට්ඨකථාව ගැන සඳහන් වන බැවින් එය තුන්පිටකයම අළලා සකස් වුනු හෙළටුවාවක් වශයෙන් සැලකිය හැකිය. වස්තු විෂය අතින් සෙසු හෙළටුවාවන්ට වඩා පරිපූර්ණ වී තිබුණ මහා අට්ඨකථාවේ ලක්දිව සිදුවූ දේ පිළිබඳව බොහෝ වෘතාන්ත ද සඳහන්ව තිබුණ බව සිතා ගත හැකිය.

මහා පච්චරිය අට්ඨකථාවට එම නම ලැබුනේ පච්චරියක් හෙවත් පහුරක් උඩදී එය ලියන ලද බැවිනි. කුරුන්දිවේලු විහාරයේදී ලියන ලද හෙයින් කුරුන්දි අටුවා නම් විය.

මෙම ප්‍රධාන හෙළටුවාවන්ට අමතරව තවත් අටුවා කීපයක් දක්නට ඇත. අන්ධ අට්ඨකථාව එයින් එකකි. දකුණු ඉන්දියාවේ කාඤ්චිපුර

(කොන්ජිවරම්) යෙහි පැවති අටුවාවයි. එය ආන්ධ්‍රා භාෂාවෙන් ලියා ඇතැයි සැලකේ.

## බුද්ධඝෝෂ හිමි

දඹදිව බෝමැඩට නුදුරු ඝෝෂ නම් ග්‍රාමයේ බමුණු කුලයක උපත ලද බුද්ධඝෝෂ වාදයෙහි දක්ෂ වූ රේවත නම් මහා තෙරපාණන් වෙත පැවිදි වූ බව ප්‍රචලිත මතයයි. බුද්ධඝෝෂ මහාබෝධි මණ්ඩපයට දකුණුදිග බමුණුගම උපන් බව සද්ධම්මසංගහ නම් පොතෙහි සඳහන් වේ. බෝමැඩට නුදුරෙහි ඝෝෂ නම් වූ ගමේ උපන් බව බුද්ධඝෝසුප්පත්ති නම් කථාවේ ද සඳහන් වේ. මෙවැනි විවිධ කරුණු විමංශනයෙන් පසුව බුද්ධඝෝෂ ජන්ම භූමිය මොරණ්ඩඛේටක නම් ගම බව පිළිගෙන ඇත. ආන්ධ්‍ර දේශයේ ගුන්ටූර් දිස්ත්‍රික්කයේ පාල්නාඩ් තලුන් පෙදෙසේ "කෝටනේමලී පුරිගුන්ඩිලු පල්ලි" යන ලඟ පිහිටි ගම් දෙක මොරන්ඩඛේටක යැයි පැවසේ. උන්වහන්සේ උපන් පෙදෙස මොරන්ඩඛේටක යැයි විසුද්ධි මග්ගයෙන් පෙනේ. මජ්ඣිමනිකායට්ඨ කථාවේ කර්තෘ සංදර්ශක ගාථාවක මයූර සුත්ත පට්ඨන හෝ මයූර රූප පට්ඨන සඳහන් වන බැවින් එතුමා එහි විසූ බව ද සිතිය හැකිය.

ව්‍යාකරණ විෂයෙහි ද දර්ශන ශාස්ත්‍රයෙහි ද වෛදික ග්‍රන්ථ විෂයෙහි ද ඉතිහාස පුරාවිද්‍යා විෂයෙහිද කාය ව්‍යවච්ඡේද විද්‍යාවන් හීද ලක්ෂණ ශාස්ත්‍රයෙහිද පැතිරී ගිය බුද්ධි ප්‍රභාවයක් එතුමා කෙරෙහි පැවති බව පැහැදිලිය. බුද්ධඝෝෂ හිමියන් ලංකාවට පැමිණීමට පෙර ඤාණෝදය නම් ධර්ම ප්‍රකරණයත් අත්ථසාලිනී අටුවාවත් දඹදිව දී කළ බවද සඳහන්ය. බුද්ධෝඝෝෂ හිමියන් කලින් සර්වාස්ති වාදියෙකුව සිට පසුව ථේරවාදී වූ බව ඇතැම් විචාරකයන්ගේ පිළිගැනීමයි.

බුද්ධඝෝෂ හිමියන් ලක්දිවට පැමිණියේ අනුරාධපුරය රාජධානිය කරගත් මහානාම රජ දවසය. බුද්ධවර්ෂ 953-975 අතර කාලයේය. උන්වහන්සේ ලංකාවට වඩින විට අට්ඨකථා සංහිතා කීපයක්ම මේ දිවයිනේ පැවති බවත් ඒවා හෙළ බසින්ම උගත් බවත් මෙයින් සමහරක් ග්‍රන්ථ ස්වරූපයෙන්ද සමහරක් පූර්වාචාරීන්ගේ මතවාද ඇතුලත් වුන සාහිත්‍යය වශයෙන්ද පැවති බවත් ආචාර්ය අදිකාරම් මහතා පවසයි.

මිහිඳු හිමියන් දවසම ආරම්භ වූ සිංහල අටුවා කථා වසර 700ක පමණ කාලයක් සිංහල ත්‍රිපිටකය හෙළි පෙහෙළි කරමින් පැවතියහ. ත්‍රිපිටක පාළියට සිංහල අටුවා ලියා ඇති බව දඹදිව විසූ රේවත හිමියන්ද දූන ගැනීමෙන් සිංහල අටුවා පාළියට පරිවර්තනය කිරීම, බුදුදහම චිරස්ථායී වීමට හේතුවක් යැයි උන්වහන්සේ ද සලකා හෙළටුවා පාළියට පරිවර්තනය කිරීම සඳහා බුද්ධඝෝෂ හිමියන් ලක්දිවට එවන්න ඇතැයි සැලකිය හැකිය.

බුද්ධඝෝෂ හිමියන් මෙහි පැමිණ බුදුන් වදාල දෙලක්‍ෂ පන්සැත්තෑ දහස් දෙසියපනස් ග්‍රන්ථ සංඛ්‍යාවක් ඇති ආගමයට තුන්ලක්‍ෂ එක්සැටදහස් සත්සියපනස් ග්‍රන්ථ සංඛ්‍යාවක් පමණ අටුවා කථා ලියා ආගමයෙහි පහන් නැගු සේකැයි දත යුතු යැයි පූජාවලියේ සඳහන්ව තිබේ.

සංස්කාරකයෙකු හා අනුවාදයකු වශයෙන් බුද්ධඝෝෂ හිමියන්ගේ කාර්යය වූයේ තමන් ඉදිරියෙහි වූ හෙළටුවාවන්හි අන්තර්ගත වූ විවරණ වෙනස් කිරීම නොව, ඒවා සකස් කිරීම සහ අවශ්‍ය ස්ථාන පිඬු කරමින්, අවශ්‍ය ස්ථාන විස්තරාර්ථ දක්වමින්, විධිමත්ව සුගමව පාළි භාෂාවට නැගීමයි. බුද්ධඝෝෂ හිමියන්ට අට්ඨකථා සකස් කරන්නට මහාවිහාරයෙන් ඉඩ ලැබී ඇත්තේ මහාවිහාර වාචනා 'මාර්ගයට විරුද්ධ මත ඒවායේ ඇතුලත් නොවිය යුතුය' යන කොන්දේසිය ද සහිතවය.

"මහා අට්ඨකථාව ශරීරය කොටගෙන මහාපච්චරිය කුරුන්දි ආදී විශ්‍රැතඅර්ථ කථාවන්හි යම් විනිශ්චයක් වේද එහි යුක්තාර්ත සහ ඇතුලත් වන්නා වූ ස්ථවිර වාදයද අත්නොහරිමින් සංවර්ධනය හොඳින් ආරම්භ කරන්නෙමු."

තව ද එම අර්ථ කථාවලින් භාෂාන්තරය පමණක් අත්හැර විස්තර තැන් පිඬුකොට සියලුම විනිශ්චයන් ඇතුලත් කොට කිසිම තන්හි යුත් අත් නොඉක්මවා සංවර්ණනය කරන්නෙමු යි බුදුගොස් හිමියෝ පවසති.

බුද්ධඝෝෂ හිමියන් විසින් කරන ලද අට්ඨකථා සියල්ලම මිහිඳු මාහිමියන් විසින් ලක්දිවට ගෙන එන ලදුව මහා විහාරිකයන් විසින් ආරක්ෂා කරනු ලැබූ හෙළටුවාවන්හි පාළි අනුවාද බවත් මහා අට්ඨකථාවේ සාරය ගෙන පාළි අට්ඨකථා රචිත බවත් මෙම අට්ඨකථාවල සඳහන් වේ.

මේ අනුව බුදුගොස් හිමියන්ගේ කාර්යය වූයේ බුදුසමය පිළිබඳව අමුතුවෙන් පොත් ලිවීම නොව එතෙක් හෙළටුවාවන්හි ආ කරුණු විධිමත්ව හා සුගමව පාළි භාෂාවට නැඟීම වෙයි. පාළි අටුවා පොත්වලින් අඩකටත් වඩා සපයා ඇත්තේ බුදුගොස් හිමියන් විසිනි. බෞද්ධ අට්ඨකථාචාරීන් අතුරෙන් එතුමා ශ්‍රේෂ්ඨතමයායි. එතුමාගේ ජීවන චරිතය වටා විවිධ ජනප්‍රවාද ගෙතී ඇත්තේ ඒ නිසාමය. එතුමා මෙලොව පහළ වූයේ බුදුන්ගේ පර්යාප්ති ශාසනය දීර්ඝ කාලයක් නිර්මලව පවත්වාගෙන යාම සඳහා පාළි අට්ඨකථා ලිවීමටමය යන ජන ජනප්‍රවාදයක් ද ඇත.

## අටුවා විස්තරය

### විනය පිටකය

| | පෙළ | | අටුවාව | කර්තෘ | කාලය |
|---|---|---|---|---|---|
| උභය විභංග | 1 පාරාජිකා පාළි | 1 ආණා දෙසනා | සමන්තපාසාදිකා | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| | 2 පාචිත්තිය පාළි | 2 යථාපරාධ සාසන | විනය අට්ඨකථා | | |
| ඛන්ධක | 3 චුල්ල වග්ග පාළි | 3 සංවරාසංවර කථා | | | |
| | 4 මහාවග්ග පාළි | | | | |
| පරිවාර | 5 පරිවාර පාළි | | | | |
| | | භික්ඛුපාතිමොක්ඛ | කඞ්ඛා විතරණී | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| | | භික්ඛුණී පාතිමොක්ඛ | (මාතිකට්ඨ කථා) | | |

### අභිධර්ම පිටකය

| | | | | |
|---|---|---|---|---|
| 1 ධම්මසංගණිප්පකරණ | 1 පරමත්ථ දේසනා | අත්ථසාලිනී | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| 2 විභංගප්පකරණ | 2 යථාධම්ම සාසන | සම්මොහ විනොදනී | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| | 3 නාමරූප පරිච්ඡේද කථා | | | |
| 3 කථාවත්ථුප්පකරණ | | | බුද්ධඝෝෂ හිමි | 5වන ශ.ව. |
| 4 පුද්ගලපඤ්ඤත්තිප්පකරණ | | | | |
| 5 ධාතුකථාප්පකරණ | | පරමත්ථදීපනී | | |
| 6 යමකප්පකරණ | | පඤ්චප්පකරණට්ඨකථා | | |
| 7 පට්ඨානප්පකරණ | | | | |

## සූත්‍ර පිටකය

| | | | |
|---|---|---|---|
| 1 දීඝනිකාය | 1 වොහාරා දේශනා | සුමංගල විලාසිනී | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 2 මජ්ඣිමනිකාය | 2 යථානුලෝමසාසන | පපඤ්ච සූදනී | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 3 සංයුක්තනිකාය | 3 දිට්ඨි විනිවෙඨන කථා | සාරත්ථප්පකාසිනී | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 4 අංගුත්තරනිකාය | | මනෝරථපූරණී | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 5 ඛුද්දක නිකාය | | | |
| 1 ඛුද්දකපාඨ | | පරමත්ථ ජෝතිකා | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 2 ධම්මපද | | ධම්මපදට්ඨ කථා | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 3 උදාන | | පරමත්ථ දීපනී | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 4 ඉතිවුත්තක | | පරමත්ථ දීපනී | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 5 සුත්තනිපාත | | පරමත්ථ ජෝතිකා | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 6 විමානවත්ථු | | පරමත්ථ දීපනී | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 7 පේත වත්ථු | | පරමත්ථ දීපනී | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 8 ථේර ගාථා | | පරමත්ථ දීපනී | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 9 ථේරී ගාථා | | පරමත්ථ දීපනී | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 10 ජාතක | | ජාතකට්ඨකථා | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| 11 නිද්දේස (චුල්ල-මහා) | | සද්ධම්ම ජෝතිකා | උපසේන ආචාර්ය 6වන ශ.ව. |
| 12 අපදාන (ථේර-ථේරී) | | විසුද්ධ ජන විලාසනී | මහානාම ආචාර්ය 7වන ශ.ව. |
| 13 පටිසම්භිදා මග්ග | | සද්ධම්මප්පකාසිනී | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| 14 බුද්ධවංස | | මධුරත්ථප්පකාසිනී | බුද්ධදත්ත හිමි 5වන ශ.ව. |
| 15 චරියාපිටක | | පරමත්ථ දීපනී | ධම්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| | | විසුද්ධි මග්ග | බුද්ධඝෝෂ හිමි 5වන ශ.ව. |
| නෙත්තිප්පකරණ | | නෙත්ති අට්ඨකථා | ධර්මපාල ආචාර්ය 5වන ශ.ව. |
| චතුභාණවාරපාළි | | චතුභාණවාර අට්ඨකථා | ආනන්ද වනරතන 8වන ශ.ව. |

බුද්ධඝෝෂ හිමියන් විසින් පාළියට නොනගන ලද අට්ඨ කථා පාළියට නගන ලද්දේ බුද්ධදත්ත ධම්මපාල උපසේන සහ මහානාම තෙරවරුන් විසින්ය.

## බුද්ධදත්ත හිමි

බුද්ධඝෝෂ හිමියන්ගේ සමකාලීනයෙකි. මධුරත්ථ විලාසිනී නම් බුද්ධවංශ අටුවාව උන්වහන්සේ ලියා ඇත.

### උපසේන හිමි

සද්ධම්මජෝතිකා නම් නිද්දේශ අට්ඨකථාව මහාපරිවේනවාසී උපසේන හිමියන් විසින් කරන ලදි.

### මහානාම හිමි

පටිසම්භිදාමග්ග අට්ඨකථාව වන සද්ධම්මප්පකාසනිය මුන්වහන්සේ විසින් ලියන ලදී.

### ධම්මපාල හිමි

පරමත්ථදීපනී අට්ඨකථා - උදාන - ඉතිවුත්තක - විමානවත්ථු - ප්‍රේතවත්ථු - ථෙර ථෙරී ගාථා අට්ඨකථා මුන්වහන්සේ ලියන ලදී.

මෙම අට්ඨකථාවන් උගෙන ඒවා ආරක්ෂා කළ අය අට්ඨකථිකා නමින් හඳුන්වා ඇත. අට්ඨකථාචරියා යනු අට්ඨකථා සම්පාදනය කළ ආචාර්යවරයෝය. ආචරිය වාද, ආචරිය මත, ආචරිය වාද යන නම්වලින් කියවෙන්නේ අට්ඨකථාවන් මැයි.

අට්ඨකථාවන් පිළිබඳ විවිධ විවේචන හා මතවාද උගතුන් අතර පවතී. මෑතකාලීන වියතුන් අතුරින් අග්ගමහාපණ්ඩිත පොල්වත්තේ බුද්ධදත්ත හිමියෝ එවැනි විවේචකයෙකි. උන්වහන්සේගේ අටුවා පරීක්ෂණ නම් පොතෙන් එවැනි විවේචන ඉදිරිපත් කර ඇත. අටුවාකථා බුදුන් වහන්සේගේ දේශනා නොවන බව කවුරුත් පිළිගනිති. අටුවාචාරීන් වහන්සේලා අතරද විවිධ මතභේද තිබූ බව දක්නට ඇත. වසර හත්අට සියයක් ගෙන ආ ලිඛිතව නොතිබූ අර්ථ කථා සාහිත්‍යයට එවැනි දේ ඇතුළත් වන්නට පහසුකම් තිබේ. මිහිඳු හිමියන් විසින් ගෙන එන ලද පාළි විවරණ මහාවිහාරික භික්ෂූන් විසින් සිංහලට පරිවර්තනය කොට එම හෙළටුවා පස්වන සියවසේ බුද්ධඝෝෂ හිමියන් විසින් නැවත පාළි භාෂාවට පරිවර්තනය කළ බව පිළිගත් සම්ප්‍රදායයි. මේ තැන්වලදී එම මතිමතාන්තර ඇතුළත් වන්නට ඇති බව සිතිය යුතුය.

මහාවිහාරීය සම්ප්‍රදාය එකකි. අභයගිරි ජේතවන පරම්පරා හිද එවැනි සම්ප්‍රදායන් පැවතුණු බවට සැකයක් නැත. ස්වකීය පාරම්පරික මතවලට පටහැනි සූත්‍ර ධර්මයන් පෙළෙහි ඇති බව දැන දැනත් සිය මතය

තහවුරු කරනු සඳහා ඒවා මදකිනිදු වෙනස් නොකර, ඉවත් නොකර, සංගායනාවලදී පැවති තත්ත්වයෙන්ම ත්‍රිපිටකය රැකගෙන ඒම ගැන මහාවිහාරීය පරම්පරාවට බෞද්ධයාගේ ප්‍රණාම පූර්වක ගෞරවය හිමිවිය යුතුය.

මේ අන්දමින් පැවතගෙන ආ අට්ඨකථා අපේ හාමුදුරුවරු තවත් වර්ෂ සිය ගණනක් තම ආරාමවල පොත්ගුල්වල තබා පුස්තකාලවල තැන්පත්කොට උදේ සවස සුවඳ දුම් අල්ලා ධර්ම ගෞරවයෙන් ධර්ම රත්නය රැකගෙන ආහ. අනගාරික ධර්මපාලතුමාගේ ජාතික ආගමික වැඩපිළිවෙළ ආරම්භ වීමෙන් පසුව එතුමාගේම පවුලේ නෑයන් විසින් අට්ඨකථා මුද්‍රණය කිරීමේ වැඩපිළිවෙළ ආරම්භ කර ඇත. ඒ ධර්මපාලතුමා විසින් ඇතිකරන ලද ආගමික ප්‍රබෝධයේ එක් ආභාෂයකි. 1916 ජූලි 05 දින ත්‍රිපිටක මුද්‍රණසභා නම් ආයතනයක් සයිමන් ඇලෙක්සැන්ඩර් හේවාවිතාරණ මහතුන්ගේ මැදහත්වීමෙන් කොල්ලුපිටියේ පාම් හවුස්හි පිහිටුවා ඇත. 1929 ජුනි 29 දින මෙම ත්‍රිපිටක සභාවේ රැස්වීමක් කොළඹ ඩික්මන් පාරේ තක්සලාහිදී පවත්වා තිබේ. මෙම රැස්වීමට අති පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල මහා නාහිමියන්ද, රත්මලානේ ශ්‍රී ධම්මානන්ද ධර්මාලෝක නායක හිමියන්ද ප්‍රධාන පණ්ඩිත ධර්මධර භික්ෂූන් වහන්සේලා 25 නමක් සහභාගී වූ බව සඳහන් වේ. අනගාරික ධර්මපාලතුමා ප්‍රධාන සාසනමාමක පිරිස්ද මෙම රැස්වීමට සහභාගී වී ඇත. මෙම නායක පණ්ඩිත ස්වාමීන් වහන්සේලා එක් එක් අටුවා ග්‍රන්ථ සංස්කරණය භාරගත් බවද සඳහන් වේ.

සයිමන් හේවාවිතාරණ මහතාගේ අභාවයෙන් පසුව සෝමලතා හේවාවිතාරණ ළමාතැනී විසින් ත්‍රිපිටක මුද්‍රණය සඳහා අරමුදල පිහිටුවීය. එම අරමුදල මගින් හේවාවිතාරණ අට්ඨකථා ග්‍රන්ථ සමූහය මුද්‍රණය කර ඇත. ආගම ධර්මය, ඉතිහාසය, පුරාවිද්‍යාව, සාහිත්‍යය ආදී ශ්‍රී ලංකා සංස්කරණ විවිධ ක්ෂේත්‍රයන් පර්යේෂණාත්මක අධ්‍යයනවලට යොමු කරමින් ශාස්ත්‍රීය පොතපත සපයා සංස්කෘතිය පිළිබඳව අවබෝධයක් ජනතාවට ලබාදීමේ අරමුණින් 1845 දී ආරම්භ කළ ශ්‍රී ලංකා රාජකීය ආසියාතික සමිතියේ සිංහල අට්ඨකථා සිංහලට පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය මගින් පොත් දහයක් මුද්‍රණය කිරීම මහඟු කාර්යයකි.

අභාවයට යන පැරණි බෞද්ධ පොත්පත් හා අලුතින් ලියැවෙන බෞද්ධ පොත්පත් මුද්‍රණය කරවීමත් ඉංග්‍රීසි බෞද්ධ පොත්පත් සිංහලට

පරිවර්තනය කර මුද්‍රණය කිරීමත් පරපුරෙන් පරපුරට බුද්ධ ධර්මය ගෙන යාමත් බෞද්ධ සංස්කෘතියේ ආරක්ෂාවත් සඳහා පිහිටුවා ඇති අප ආයතනය වන බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය මගින් බුද්ධ ජයන්ති ත්‍රිපිටකයේ පුනර්මුද්‍රණය නිමවීමෙන් පසු අට්ඨකථා සිංහලට පරිවර්තනය කොට මුද්‍රණය කිරීමට ප්‍රතිපත්ති සකස් කරන ලදී. සිංහලෙන් මුද්‍රණය අවසන් කොට අටුවා කථා ඉංග්‍රීසියට පරිවර්තනය කර මුද්‍රණය කිරීම අපේ අදහසයි.

"කථා පවත්තිනී" නම් පාඨයක් ත්‍රිපිටකයේ අංගුත්තර නිකායේ සඳහන් වෙයි. ධර්මදේශකයා පෙළත් අටුවාවත් දනී නම් දහම් අසන්නා පෙළත් අටුවාවත් දනී නම් දහම් දෙසන්නාත් අසන්නාත් දෙදෙනාම පෙළත් අටුවාවත් දනීනම් එම ධර්ම දේශනාව සාර්ථක දේශනාවක් වන බව මෙහි සාමාන්‍ය අදහසයි. තථාගත ධර්මය වඩාත් ප්‍රකට වීම විවෘත වීම එහි පැවැත්මට හා උත්තරීතර භාවයට හේතුවන බව සඳහන්ය. මෙම කරුණු පිළිබඳ විමසිලිමත් වනවිට අට්ඨකථා පරිවර්තනයේ හා මුද්‍රණයේ අවශ්‍යතාව වඩාත් පැහැදිලි වන්නේය. එයට අමතරව විශ්ව විද්‍යාලවල පාළි හා බෞද්ධ අධ්‍යයනාංශවල උසස් අධ්‍යාපනය ලබන ශිෂ්‍යයන්ට විෂය නිර්දේශානුකූල අට්ඨකථාවල සිංහල පරිවර්තන නොමැතිකමේ බාධාවද, එම ගුරු ශිෂ්‍ය දෙපිරිසටම මේ මගින් දුරු කිරීමද අපේ පරමාර්ථයකි.

අපගේ ඉල්ලීමද පූජ්‍ය රාජකීය පණ්ඩිත වැලමිටියාවේ කුසලධම්ම නාහිමියන්ගේ අනුශාසනාවද අනුව අටුවා කථා සිංහලට පරිවර්තනය කර මුද්‍රණය කරවීමේ භාරදූර කර්තව්‍යය ශ්‍රී ලංකා ජනරජයේ වර්තමාන ආගමික අමාත්‍යාංශය මගින් ඉතාම කෙටි කාලයක් තුළ අවසන් කිරීම සඳහා අපට පවරන ලදි. බුද්ධ ජයන්ති ත්‍රිපිටක පුනර් මුද්‍රණය මගින් අප දක්වූ ආදර්ශයත් ගොඩනැගූ විශ්වාසයත් මෙයට හේතු වූ බව නිසැකය. මෙම කාර්යය අපට පැවරීම පිළිබඳව ශ්‍රී ලංකා ජනරජයේ ගරු ජනාධිපතිතුමන්ට, ගරු අගමැතිතුමන්ට, ගරු බුද්ධශාසන නියෝජ්‍ය ඇමතිතුමන්ට, ආගමික අමාත්‍යාංශයේ ලේකම් මහතාට සහ අමරහේවා මද්දුම මහතාට ද අපේ කෘතඥතාවය, පුණ්‍යානුමෝදනාපූර්වකව පළකරමු.

අටුවා පරිවර්තනයේදී ආමිෂ ලාභයම නොව ශාසනික සේවයම සලකා එක් එක් පොත භාරගෙන මැනවින් සිංහලට පරිවර්තනය කරදුන් පණ්ඩිත ස්වාමීන් වහන්සේලාට ද, උගත් ගිහි මහතුන්ට ද අපගේ

කෘතඥතාව හිමිවේ. සිංහල අටුවා පරිවර්තන සමීක්ෂණය කළ උගත් ගිහි පැවිදි දෙපිරිසටම අපගේ කෘතඥතාව හිමිවේ.

අටුවා කථා පරිවර්තන කාර්යය සම්බන්ධීකරණය කරමින් කටයුතු කළේ විජිතනන්ද සරත්චන්ද්‍ර මහතාය. එම ග්‍රන්ථාවලිය මුද්‍රණය කරවීමේ කාර්යය භාරවූයේ අප ආයතනයේ මුද්‍රණ කටයුතු අධ්‍යක්ෂ පාලිත ලියනගේ මහතාටය. මෙම මහත්වරු දෙපළම ඉතා උනන්දුවෙන් මෙම කටයුතුවල නියැලීම පිළිබඳව එම මහත්වරුන්ටද මාගේ කෘතඥතාවය පළවේ. මෙයට අමතරව මෙම කාර්යයට හොඳහිතින් අවංකව සහාය දුන් සියලු දෙනාටම පින් පුරවමින් ආසිරි පතම්හ.

මෙයට,

ශාසනස්ථිතිකාමී,

**කිරම විමලජෝති ස්ථවිර,**
අධ්‍යක්ෂක, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය,
නැදිමාල, දෙහිවල.

# බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ අට්ඨකථා පරිවර්තක මණ්ඩලය

පූජ්‍ය රාජකීය පණ්ඩිත ආඳාවල දේවසිරි නායක මාහිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත යාලේගම චන්දකිත්ති හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මැදඋයන්ගොඩ විජයකිත්ති හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත වටගෙදර විමලබුද්ධි හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත විදුරුපොල ආනන්ද හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත හත්තොටුවේ ඉන්දරතන හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත පල්ලේගම සමිත හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මාවනානේ සෝමින්ද හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත බලපිටියේ සිරිසීවලී හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත මැදගම්පිටියේ විජිතධම්ම හිමිපාණන් වහන්සේ
පූජ්‍ය රාජකීය පණ්ඩිත පන්නල සුමේධ හිමිපාණන් වහන්සේ

| | |
|---|---|
| රාජකීය පණ්ඩිත | කීර්ති නාරම්පනාව මහතා |
| ශාස්ත්‍රවේදී | ඇන්.එච්. පෙරේරා මහතා |
| පණ්ඩිත | ජේ.පී. නිමල්ලාල් රංජිත් මහතා |
| පණ්ඩිත | ටී.ජී. ජයතිලක මහතා |
| පණ්ඩිත | ඒ.ඇම්.ඩී.වයි. සරත්චන්ද්‍ර අමරතුංග මහතා |
| පණ්ඩිත | බී.ඇම්.පී. බාලසූරිය මහතා |
| පණ්ඩිත | සෝමරත්න ගම්ලත් වෙලගෙදර මහතා |
| පණ්ඩිත | දයා ගුණසේකර මහතා |
| පණ්ඩිත | ඩබ්ලිව්. ඇල්.පී. ධර්මදාස මහතා |
| පණ්ඩිත | ජිනදාස ගොඩකන්ද මහතා |
| පණ්ඩිත | පී.ඇල්.කේ. පෙරේරා මහතා |

**සම්බන්ධීකරණය:-** විජිතනන්ද සරත්චන්ද්‍ර මහතා

# බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානයේ අට්ඨකථා පරිවර්තක සමීක්ෂණ මණ්ඩලය

1. පූජ්‍ය මැදගම්පිටියේ විජිතධම්ම හිමිපාණන් වහන්සේ (පේරාදෙණිය ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය)
2. පූජ්‍ය කොටියාගල උපරතන හිමිපාණන් වහන්සේ (කැලණිය විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය)
3. පූජ්‍ය මැදඋයන්ගොඩ විජයකිත්ති හිමිපාණන් වහන්සේ. (ශාස්ත්‍රපති)
4. පූජ්‍ය ඇස්වත්තේ රේවත හිමිපාණන් වහන්සේ. (ශාස්ත්‍රපති)
5. හේමචන්ද්‍ර දිසානායක මහතා. (ශාස්ත්‍රවේදී)
6. පණ්ඩිත දයා ගුණසේකර මහතා (රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව)
7. පණ්ඩිත ඒ ලසිත් නලන්ත මහතා (රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව)
8. පණ්ඩිත සිරිමෙවන් සේනක මහතා (ශාස්ත්‍රවේදී)
9. අභිධර්මාචාර්ය බුද්ධික විජේසිංහ මහතා (ශාස්ත්‍රවේදී-විද්‍යාවේදී)

# සංඥාපනය

'ධම්මසංගණී' නම් වන පාලි අභිධර්ම පොතට ලියන ලද අටුවා ග්‍රන්ථය වූ 'අත්ථසාලිනී අට්ඨකථාවේ' සිංහල පරිවර්තනය ඔබට අතට පත්ව ඇත. අභිධර්ම පිටකයේ ග්‍රන්ථ අතුරෙන් ප්‍රථම හා වැදගත්ම ග්‍රන්ථය ධම්මසංගණිප්පකරණයයි. එය අභිධර්ම සාහිත්‍යයේ ප්‍රතිෂ්ඨාව වශයෙන් සලකයි. මිනිසාගේ මානසික හා භෞතික අවස්ථාවන් ධම්මසංගණියේ සංකලනය කර ඇත්තේය. "කාමාවචර රූපාවචරාදී ධම්මෙ සංගය්හ සංඛිපිත්වා වා ගණයති සංඛ්‍යාති එත්ථාති ධම්මසංගණී" කාමාවචර රූපාවචර ආදී රූපයෙන් සංගණනාවක් හා ව්‍යාඛ්‍යාවක් කිරීම නිසාම මෙය ධම්මසංගණී නම් වේ යයි ග්‍රන්ථයේ ම නිරුක්ති දක්වා ඇත. ධම්මසංගණියේ විශේෂත්වය නම් බාහිර හා අභ්‍යන්තර විශ්වයේ සියල්ල පිළිබඳව නීතිමය විස්තර කථනයක් කිරීමයි. නීතිමය විස්තර කථනයෙන් අදහස් කරන්නේ කර්මයේ කුසල අකුසල අව්‍යාකෘත විපාක රූපයන් විස්තර කිරීමයි. එනිසා එය බෞද්ධ මනෝ විඥානය හා නීතිමය විස්තරයක් යයි හැඳින් වේ. එය එක්තරා ආකාරයක විෂය සූචියකි. මෙහි මාතෘකා සම්පූර්ණ වර්ග කිරීම් 122 ක් දැක්වේ. මේ වර්ග කිරීම් 122 ධර්ම විශ්ලේෂණය ධම්ම සංගණියේ දක්වා ඇත. මෙය මේ අන්දමින් වර්ග කර ඇත්තේ කුසල අකුසල අව්‍යාකෘත යන නීතිමය දෘෂ්ටියෙනි. කවර ධර්ම කුසල් වෙයිද කවර ධර්ම අකුසල් වෙයිද කවර ධර්ම අව්‍යාකෘත වෙයිද යනුවෙන් දීර්ඝව විස්තර කර ඇත. තික මාතිකය යන පරිච්ඡේදය යටතේ මාතෘකා 36 ක් ආවරණය කරමින් කුසලධර්ම අකුසල ධර්ම අව්‍යාකෘත ධර්ම විදාරණය කෙරේ.

ධම්මසංගණියේ විෂය වස්තුව කාණ්ඩ සතරකට බෙදා දැක්වේ. චිත්තුප්පාද කාණ්ඩ, රූප කාණ්ඩ, නික්ඛේප කාණ්ඩ, අත්ථුද්ධාර කාණ්ඩ යනුවෙනි. චිත්තුප්පාද රූප කාණ්ඩ දෙකෙහි මානසික හා භෞතික විශ්වය අවස්ථාවන් කුශල අකුශල අව්‍යාකෘත රූපයෙන් විශ්ලේෂණය කර ඇත. අනෙක් වර්ගයන්ගේ ස්වරූපය ප්‍රශ්නෝත්තර ක්‍රමයෙන් දක්වා ඇත. එම ධර්මයන්ගේ ස්වරූප විශ්ලේෂණයක් ද දක්වා ඇත. එනිසා එම කාණ්ඩ හතර චිත්ත චෛතසික රූප යන ශීර්ෂ තුනට බෙදා දැක්විය

හැකිය. මේ අනුව ප්‍රථම කාණ්ඩයේ චිත්ත චෛතසිකහා එහි නා නා උප විභාග ද දෙවැනි කාණ්ඩවලින් රූපය ද විස්තර කෙරේ.

චිත්තය යන්නෙහි අර්ථය චේතනාවයි. චේතනාව බෞද්ධ දර්ශනයේ ඉතා ව්‍යාප්ත අන්දමින් ගෙන තිබේ. "චේතනාහං භික්ඛවේ කම්මං වදාමි" යන්නෙන් මම චේතනාවම කර්මය යයි කියමි. මේ අනුව කර්මයේ ශුභ අශුභ ස්වරූප චේතනාව සමග දැඩි සම්බන්ධතාවයක් පවත්නා බව පෙනේ. චිත්ත භූමි සතරකි. කාමාවචර භූමි, රූපාවචර භූමි, අරූපාවචර භූමි, ලෝකෝත්තර භූමි වශයෙන් මේ චිත්තභූමි සතර ධම්මසංගණියේ විස්තර කෙරේ. කාය කර්ම වචී කර්ම මනෝ කර්ම වශයෙන් ද ධර්ම සංගණිය මිනිසාගේ යම් යම් ක්‍රියාවන් විස්තර කරයි.

මිථ්‍යාදෘෂ්ටි සහගත සිතින් කතරගම දෙවි, විෂ්ණු දෙවි, ශිව දෙවි ආදීහු ශ්‍රේෂ්ඨ යයි ගෙන ඔවුන්ට වැඳීම පිදීම ඇඳිලි බැඳීම, පිරිබඩ කිරීම, පිඬු දීම ආදිය කරයිද එකල්හි කර්මය මනෝ කර්මය වෙයි. ද්වාරය කාය ද්වාරය වෙයි. මෙහි චේතනාව අබ්බෝහාරිකය. මේ උදාහරණයකි. මෙවැනි විග්‍රහ කිරීම් විශ්ලේෂණ මෙහි සඳහන්ය.

ධම්ම සංගණී ප්‍රකරණය අභිධර්මයේ එන සප්තප්‍රකරණයන්ගෙන් එකක් බව යට සඳහන් කරන ලදී. අභිධර්මය වූ කලී පිටක වශයෙන් අභිධර්ම පිටකයයි. දේශනා වශයෙන් පරමාර්ථ බහුල බැවින් පරමත්‍ථ දේසනායි. ශාසන වශයෙන් යථාධම්ම ශාසනය රාගාදියට ප්‍රතිපක්ෂ වූ නාම රූප පරිච්ඡේද කියන බැවින් නාම රූප පරිච්ඡේද කථා නම් වේ.

අධි ශීල, අධි චිත්ත, අධි ප්‍රඥා යන ත්‍රි ශික්ෂා අතුරෙන් අධි ප්‍රඥා යන ශික්ෂාවට අයත් වේ.

ත්‍රිවිධ ක්ලේශ ප්‍රහාණයන් අතුරෙන් අනුසය ප්‍රහාණයයි.

අංග වශයෙන් ඛුද්දක නිකායයෙහි ද සුත්ත ගෙය්‍ය ආදී නවාංග අතුරෙන් වෙය්‍යාකරණ අංගයට ද අයත් වේ. නොයෙක් ප්‍රභේදයෙන් භින්න වූ අර්ථයෙන් ප්‍රකාරයෙන් කියනු ලබන හෙයින් ධම්ම සංගණිය ප්‍රකරණ නම් වේ.

අභිධර්මය බුද්ධ භාසිත නො වේය. ප්‍රථම ධර්ම සංගායනාවේ දී සංගායනා නො වූයේය. යනුවෙන් සමහර වියතුන් අතර මතභේද පවතී. මේ මතභේද නිරාකරණය කිරීම මෙහි අදහස නොවේ. එවැනි මත දැරීමේ අයිතිය වියතුන්ට තිබේ. බෞද්ධ දර්ශනය තුළ චින්තනය ආවරණය කර නැත. එසේ වුව ද ධම්ම සංගණියට ලියන ලද අත්‍ථසාලිනී අටුවාවේ මෙසේ සඳහන් වේ.

"එකං සමයං භගවා දෙවෙසු විහරති තාවතිංසෙසු පාරිච්ඡත්තක මූලෙ පණ්ඩුකම්බල සිලායං තත්‍ර බො භගවා දෙවානං තාවතිංසානං අභිධම්ම කථං කථෙසි, කුසලා ධම්මා අකුසලා ධම්මා අව්‍යාකතා ධම්මා" මේ නිදානයයි.

මේ විස්තරය සුප්‍රසිද්ධය. භාග්‍යවතුන් වහන්සේ තව්තිසා දෙව්ලොවදී අභිධර්මය දේශනා කළ බවත්, එම දේශනාව සැරියුත් හිමියන් විසින් උගෙන සැරියුත් හිමියන් ගේ සිසු පරපුර විසින් පවත්වාගෙන ආයේය යන පුවත වැඩි දෙනෙක් දනිති. පළමුවන සංගායනාව වනවිට සැරියුත් හිමියන් පිරිනිවන් පා සිටීමේ අඩුව මෙහිදී ද මැනවින් පෙනේ.

එහෙත් මෙහි දී වෙනත් කරුණක් නම් ඉදිරිපත් වේ. ආනන්ද හිමියන් බුද්ධෝපස්ථායක තනතුර භාර ගනිද්දී වර අටක් ලබාගත් බව ප්‍රකටය. ඒ වර අටෙන් එකක් වන්නේ භාග්‍යවතුන් වහන්සේ යම්තැනකදී ධර්මයක් දේශනා කළේ නම් ඒ ධර්මය සූත්‍රය ආනන්ද හිමියන්ට දෙවනුව කියාදීම උගැන්වීම එක් වරයකි. එහෙත් තව්තිසාවේදී වදාළ අභිධර්ම දේශනාව ආනන්ද හිමියන්ට දෙවනුව වදාළ බවක් හෝ ආනන්ද හිමියන් උගත් බවක් සඳහන්ව නොතිබීම අඩුවකි. මේ පෙනෙන්නේ ඒ අඩුවයි. සමහරවිටක මහාප්‍රාඥ සැරියුත් තෙරුන් උගත් නිසා ආනන්ද හිමියන් ඒ ගැන උත්සාහ නොවන්නට ඇත.

එය එසේ වුව ද අත්‍ථසාලිනී අටුවාවේ මෙවැන්නක් එයි. 'සියලු අභිධර්ම පිටකයෙහි නය මාර්ග මහා ප්‍රකරණයෙහි ප්‍රශ්නෝද්වාරය හා ගණවාරය නො සළකන්නකු විසින් ද අට්ඨකථාවෙන් ම ගෙනහැර දක්වන්නට වටී. මෙය කොතැනින් ප්‍රභව වීද, ශාරිපුත්‍ර ස්ථවිරයන්ගෙනි. ශාරීපුත්‍ර ස්ථවිරයන් වහන්සේ වනාහි නික්ෂේප කාණ්ඩයේ අර්ථ තම

සද්ධිවිහාරිකයකුට කියා දී එය වටහා ගන්නට නො හැකි වූ විට අර්ථකථා කාණ්ඩය කියවා දුන්හ.

මෙම අදහස මහා අටුවාව ප්‍රතික්ෂේප කරයි. මහා අටුවාව කියන්නේ 'අභිධර්මය නම් ශ්‍රාවක විෂය නොවේ. ශ්‍රාවක ගෝචර නොවේ. බුද්ධ විෂය වේ. බුද්ධ ගෝචර වේ. දම්සෙනෙවි සැරියුත් තෙරණුවෝ වනාහි සද්ධි විහාරිකයා විසින් විමසන ලදුව ඔහු රැගෙන බුදුරදුන් වෙත ගොස් සම්මා සම්බුදුන්ට කීහ. සම්මා සම්බුදුරජාණන් වහන්සේ ඒ භික්ෂුවට ඒ අර්ථ කථා කාණ්ඩය පැහැදිළි කර දුන් සේක.

මේ විස්තරයෙන් පැහැදිළි වන්නේ අභිධර්මයේ නික්ෂේප කාණ්ඩයේ සමහර තැන් අවබෝධ නොකළ සැරියුත් හිමියන්ගේ ශිෂ්‍යයෙක්, ඒ නොවැටහෙන තැන් සැරියුත් හිමියන්ගෙන් විමසූවිට ඒ ශිෂ්‍යයා සැරියුත් තෙරුන් විසින්ම සර්වඥයන් වෙත කැඳවාගෙන ගියවිට සර්වඥයන් වහන්සේ විසින්ම ඒ භික්ෂුවට නික්ෂේප කාණ්ඩය පැහැදිලි කර අවබෝධ කර දුන් බවයි.

එය එසේනම් බුදුන් දවස අභිධර්මය භික්ෂූන් අතර ප්‍රචලිතව තිබූ බවත්, ඒවා සාකච්ඡා කළ බවත්, අමාරු ගැටලු තැන් බුදුන් වෙතින් ම විසඳගෙන ඇති බවත් ඔප්පු වෙයි.

තවත් උදාහරණයක් දක්වමි.

මේ සස්නෙහි මහණහු දෙදෙනෙක් අභිධර්මය කථා කරත්ද, ඔවුනොවුන් පැන පුළුවුසිත්ද පැන විසඳත් ද නොපසුබසිත් ද, ඔවුන්ගේ දැහැමි කථාත් පවත්වන්නෝ ද, මෙවන් මහණහු විසින් ගෝසිංග සාලවනය හොබනේ ය.

ධර්මකථිකයන් අතර අභිධර්මික තෙරවරුන්ම ධර්මකථික නම් වෙති. සෙස්සෝ බණ කියන මුත් යථාර්ථයෙන් ධර්මකථික නොවන බව පෙන්වා දෙත්. ආභිධර්මික ධර්මකථික වීමට සූක්ෂම වූ චිත්තාන්තර, සජ්ඣාන්තර, ධාත්වන්තර, ආයතනාන්තර, ධ්‍යාන වක්‍රාන්ති, ආලම්බන වක්‍රාන්ති, අව්‍යව්‍යවස්ථා, උභතොවර්ධන යන ලක්ෂණවලින් පූර්ණ විය

යුතුය. මෙවැනි පූර්ණ දැනුමෙන් තොර වූවෝ ධර්මය කියතුදු මේ ස්වවාදයය මේ පරවාදය යයි නො දනී. (ගෝසිංග සාලවන සූත්‍ර අටුවාව)

මජ්ඣිම නිකාය අටුවාවේ එන මෙම විස්තරයෙන් පැහැදිලි වන්නේ භික්ෂූන් වහන්සේලා අභිධර්මය පිළිබඳව සාකච්ඡා කළ බව, ප්‍රශ්න විසඳූ බව, ප්‍රශ්න විචාළ බව, ආභිධම්මික තෙරවරුන් ධර්ම දේශනා කළ බව ද වේ. ඒ බුද්ධකාලීන ප්‍රවෘත්තිය ගෝසිංගසාලවනය පිළිබඳව වූ මේ අදහස් භාග්‍යවතුන් වහන්සේ අනුමත කළහ. ඒ අනුව බුදුන් දවස භික්ෂු භික්ෂුනී උපාසක උපාසිකා සිව්වනක් පිරිස අභිධර්මය පිළිබඳ අවබෝධයෙන් සිටි බව පැහැදිලි වෙයි.

එසේ හෙයින් අභිධර්මය බුද්ධ භාසිත නොවේය යන මතය නිරවද්‍යයද ?

සරත්චන්ද්‍ර

# පටුන


| | පිටු අංකය |
|---|---|
| නිදාන කථා | 1 |
| කායද්වාර කම්ම කථා | 85 |
| වචීද්වාර කම්ම කථා | 136 |
| මනෝද්වාර කම්මකථා | 137 |
| අකුසල කර්ම කථා | 146 |
| ධම්මුද්දෙස වාර කථා | 157 |
| නිද්දෙස වාර කථා | 188 |
| සංගහවාර කථා | 205 |
| කාමාවචර කුසල නිර්දේශ කථා | 208 |
| රූපාවචර කුසල කථා | 215 |
| අරූපාවචර කුසල කථා | 256 |
| ත්‍රෛභූමක කුසල කථා | 268 |
| ප්‍රකීර්ණක කථා | 270 |
| මාර්ග කථා | 292 |
| අකුසල ධර්ම කථා | 301 |
| අබ්‍යාකත ධම්ම කථා | 315 |
| රූප කාණ්ඩ වර්ණනා | 347 |
| නික්ඛෙප කාණ්ඩ වර්ණනා | 391 |
| අර්ථකථා කාණ්ඩ වර්ණනා | 454 |

# අත්ථසාලිනී නම් වූ
# ධම්මසංගණිප්පකරණට්ඨ කථා
## (සිංහල පරිවර්තනය)

### නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස

### ඒ භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට නමස්කාරය වේවා !

යම් බුදුරජාණන් වහන්සේ කෙනෙකුන්ගේ කරුණාව මෙන් ම ප්‍රඥාවත් රුචි පරිදි සත්ත්වයන් කෙරෙහි මෙන් ම සියලු ඥෙය්‍ය ධර්මයන් කෙරෙහිත් පැවතියේ ද,

සත්ත්වයන් කෙරෙහි වූ ඒ දයාවෙන් උත්සාහවත් කරන ලද සිත් ඇතියේ ප්‍රාතිහාර්ය අවසානයේ දී දෙව්ලොව වැඩසිටින සේක.

පරසතු රුක්මුලෙහි පණ්ඩුකම්බල නම් සෙලසුනෙහි යුගන්ධර පර්වතයෙහි සූර්යයා මෙන් වැඩහුන් සේක්,

දසදහසක් සක්වලින් සර්වප්‍රකාරයෙන් ම පැමිණ හුන් දිව්‍ය සමූහයා විසින් පිරිවරන ලදුව,

මව ප්‍රමුඛ කරගෙන ඇයගේ ප්‍රඥාවෙන් මෙන් ම තේජසින් ද දෙවියන්ට අභිධර්ම කථා මාර්ගය මනාව පැවැත්වූ සේක්ද,

සිරිමත් වූ ඒ සම්බුදුරජාණන් වහන්සේගේ පා නැමද, උන්වහන්සේගේ සද්ධර්මයටත් පූජාකොට සංඝයාට ද ඇදිලි කොට,

රත්නත්‍රයෙහි කරන ලද මේ වන්දනාවේ ආනුභාවයෙන් අන්තරායන් සම්පූර්ණයෙන් ම නැතිකොට,

පිරිසිදු ආචාරය සීලයෙන් යුක්ත වූ, සියුම් නිර්මල බුද්ධියෙන් යුක්ත වූ බුද්ධඝෝෂ නම් භික්ෂූන් වහන්සේ විසින් විශේෂයෙන් ඉල්ලන ලදුව,

දෙවියන්ට දෙවි වූ විනායක නම් වූ බුදුරජාණන් වහන්සේ යම්හෙයකින් දෙවියන්ට දේසනා කොට නැවත සැරියුත් තෙරුන් වහන්සේට දේසනා කළ සේක් ද,

ඒ තෙරුන් වහන්සේ අනෝතත්ත විලේ දී බුදුන්ට උපස්ථාන කොට යම් ධර්මයක් අසා මහී තලයට ගෙනවුත්,

භික්ෂූන්ට නැවත දේශනා කළ සේක. මෙසේ භික්ෂූන් විසින් දරන ලදුව සංගීති කාලයේ දී නැවත වේදේහ රහතන් වහන්සේ විසින් සංගායනා කරන ලදී.

උන්වහන්සේගේ ගැඹුරු නුවණින් බැසගන්නා ලද නොයෙක් නයින් විසිතුරු වූ අභිධර්මය පිළිබඳ යම් අර්ථකථාවක් පෙර මුලදී මහා කාශ්‍යප ආදී රහතන් වහන්සේලා විසින් සංගායනා කරන ලද ද, ඒ අට්ඨකථාව පසුව ද රහතන් වහන්සේලා විසින් අනුසංගායනා කරන ලදී.

මිහිඳු තෙරුන් වහන්සේ විසින් ඒ උතුම් දිවයිනට (හෙළදිවට) ගෙනෙන ලද ඒ අට්ඨකථාව හෙළදිව් වැසියන්ගේ බසින් මනාව සංස්කරණය කරන ලදී.

ඉක්බිති තම්බපණ්ණි නිවැසියන්ගේ - ලක්වැසියන්ගේ බස ඉවත්කොට දොස් රහිත පාළි භාෂානය අනුව ගිය භාෂාවට - පාළි භාෂාවට නඟා

වෙනත් නිකායන්ගේ ලබ්ධීන්ගෙන් මිශ්‍ර නොවූ නිරවුල් වූ මහාවිහාර වාසීන්ගේ විනිශ්චය දක්වමින්

ආගමට්ඨ කථාවන්හි ද ගතයුතු දේ ගෙන බුද්ධිමතුන් සතුටු කරමින් අර්ථ ප්‍රකාශ කරන්නෙමි.

සියලු ම කර්මස්ථාන, චර්යා, අභිඥා, විදර්ශනා යන මේ සියල්ල වනාහි යම්හෙයකින් විශුද්ධි මාර්ගයෙහි ප්‍රකාශ කරන ලදී.

එහෙයින් එය නො ගෙන මුළු පාළි භාෂාවේ ම පදක්‍රමය අනුව ම අර්ථ වර්ණනාව කරමි.

මෙසේ මා විසින් කියනු ලබන්නා වූ මේ අභිධර්ම අර්ථකථාව වික්ෂිප්ත නොවී අසන්න. මේ කථාව වනාහි දුර්ලභය යනුයි.

එහි 'අභිධම්මෙ' යනු කවර අර්ථයකින් අභිධර්ම වීද? මෙහි 'අභි' ශබ්දය වනාහි ධර්ම අතිරේක ධර්ම විශේෂණාර්ථයෙන් අතිරේක විශේෂාර්ථ දක්වන්නකි. 'බාළ්හා මෙ දුක්ඛා වෙදනා අභික්කමන්ති නො පටික්කමන්ති' යම්හෙයකින් ඔසවන ලද බොහෝ ඡත්‍ර අතරෙහි මෙන්ම ධ්වජ අතරෙහි ද ප්‍රමාණයෙන් වැඩි විශේෂ වර්ණ සටහන් ඇති යම් ඡත්‍රයක් වේද, එය 'අතිඡත්‍රය' යැයි කියනු ලැබේ. ප්‍රමාණයෙන් වැඩි නොයෙක් පාට - වර්ණ විශේෂයන්ගෙන් යුත් යම් ධ්වජයක් වේද එය 'අති ධ්වජය' යැයි කියනු ලැබේ. යම් සේ එකට රැස් වූ බොහෝ රාජ කුමාරවරුන් අතරෙහි මෙන් ම දෙවියන් අතරෙහි ද යමෙක් ජාති - භෝග - යස - ඉසුරු ආදී සම්පත්තීන්ගෙන් අතිරේකතර මෙන් ම විශේෂවන්තතර වේද ඒ 'අතිරාජ කුමාරයා' යැයි කියනු ලැබේ. යමෙක් ආයු-වර්ණ-ඓශ්වර්ය යස සම්පත් ආදියෙන් අතිරේකතර මෙන් ම විශේෂතර වේද, ඒ දෙවියා 'අතිදේව' යැයි කියනු ලැබේ. එබඳු වූ බ්‍රහ්මයා ද 'අතිබ්‍රහ්ම' යැයි කියනු ලැබේ. එපරිද්දෙන් යම් ධර්මයක් ධර්මාභිෂේක ධර්ම විශේෂාර්ථයෙන් අභිධර්මය යැයි කියනු ලැබේ. එබඳු වූ බ්‍රහ්මයා ද 'අතිබ්‍රහ්ම' යැයි කියනු ලැබේ. එපරිද්දෙන් යම් ධර්මයක් ධර්මාභිෂේක ධර්ම විශේෂාර්ථයෙන් අභිධර්මය යැයි කියනු ලැබේ.

පංචස්කන්ධය වනාහි සූත්‍රාන්තයට පැමිණ ඒකදේශයකින් ම බෙදන ලදී. නිෂ්ප්‍රදේශ වශයෙන් නොබෙදන ලදී. අභිධර්මයට පැමිණ වනාහි සූත්‍රාන්තභාජනීය, අභිධර්ම භාජනීය ප්‍රශ්න පෘච්ඡක නය වශයෙන් නිෂ්ප්‍රදේශ වශයෙන් බෙදන ලදී. දොළොස් ආයතන, අටළොස් ධාතු, චතුරාර්ය සත්‍යය, දෙවිසි ඉන්ද්‍රිය, දොළොස්පදික ප්‍රත්‍යාකාරය යන මේවා ද එසේ ය. හුදු ඉන්ද්‍රිය විභංගයෙහි වනාහි සූත්‍රාන්ත භාජනීය නැත. ප්‍රකරණයෙහි ද ප්‍රශ්න පෘච්ඡකය නැත. සතර සතිපට්ඨානයෝ ද

සූත්‍රාන්තයට පැමිණ ඒකදේශ වශයෙන් ම බෙදන ලදහ. නිෂ්ප්‍රදේශ වශයෙන් නො බෙදන ලදහ. අභිධර්මයට පැමිණ වනාහි ත්‍රිවිධ නය වශයෙන් නිෂ්ප්‍රදේශයෙන් ම බෙදන ලදහ. එසේ ම සතර සම්‍යක්ප්‍රධාන සතර ඍද්ධිපාද, සප්ත බොජ්ඣංග ආර්ය අෂ්ටාංගික මාර්ගය, සතරධ්‍යාන, සතර අප්පමඤ්ඤා, පංචශික්ෂාපද, සතර පටිසම්භිදා, ත්‍රිවිධ නය අනුව නිෂ්ප්‍රදේශ වශයෙන් ම බෙදන ලදී. හුදෙක් මෙහි වනාහි ශික්ෂාපද විභංගයෙහි සූත්‍රාන්ත භාජනීය නැත. සූත්‍රාන්තයට පැමිණ ද ඥානං ඒකදේශ වශයෙන් ම බෙදන ලදී. නිෂ්ප්‍රදේශ වශයෙන් නො බෙදන ලදී. ක්ලේශ ද එසේ ම ය. අභිධර්මයට පැමිණ වනාහි 'එකවිධෙන ඤාණවත්ථුං' ආදී ක්‍රමයෙන් මාතෘකාව නිෂ්ප්‍රදේශ වශයෙන් ම බෙදන ලදී. එසේ ම ඒකකයේ පටන් නොයෙක් නයින් කෙලෙස් බෙදන ලදී. සූත්‍රාන්තයට පැමිණ ද ගුම්බන්තර පරිච්ඡේදය ඒකදේශ වශයෙන් ම බෙදන ලදී. නිෂ්ප්‍රදේශ වශයෙන් නොබෙදන ලදී. අභිධර්මයට පැමිණ වනාහි ගුම්බන්තර පරිච්ඡේදය ත්‍රිවිධ නය වශයෙන් නිෂ්ප්‍රදේශයෙන් ම බෙදන ලදී. මෙසේ ධර්මාතිරේක වශයෙන්, ධර්ම විශේෂාර්ථයෙන් අභිධර්මය යැයි දතයුතුය.

මෙය වනාහි ප්‍රකරණ පරිච්ඡේද වශයෙන්, ධම්ම සංගණි විභංග ධාතුකථා පුග්ගල පඤ්ඤත්ති කථාවත්‍ථු යමක පට්ඨාන යනුවෙන් සප්ත ප්‍රකරණ වශයෙන් සිටියේ ය. මෙය මෙහි ආචාර්යවරුන්ගේ සමාන කථාය. විතණ්ඩවාදීහු මෙසේ කියත්. කථාවත්‍ථුව කවර හෙයින් ගන්නා ලද ද? මෙය සම්මා සම්බුදුන්ගේ පිරිනිවීමෙන් වසර දෙසිය දහඅටක් ඉක්ම මොග්ගලීපුත්ත තිස්ස තෙරුන් විසින් තබන ලද්දේ නොවේද? එහෙයින් ශ්‍රාවක භාෂිතයක් හෙයින් එය ඉවතලන්න. කිම? අභිධර්මය ෂට්ප්‍රකරණද? එසේ නො කියමි. එසේනම් කුමක් කියන්නෙහි ද? සප්ත ප්‍රකරණ යැයි කවරක් ගෙන සතරක් කරත් ද? මහාධම්මහදය නම් (දේශනයක්) ඇත. එයත් සමග සතකි. මහාධම්මහදයෙහි පිළිවෙලක් නැත. ප්‍රශ්න වාර කීපයක් ම අවශේෂය. කථාවත්‍ථුව සමගම සතකි යනුයි. කථාවත්‍ථුව සමග නොවේ. මහාධාතුකථා නම් ප්‍රකරණයක් ඇත. එය සමග සතකි. මහාධම්ම හදයෙහි වනාහි ප්‍රශ්නවාර කීපයක් අවශේෂය. මහාධාතු කථාවෙහි පිළිවෙළක් ඇත. අවශේෂ ස්වල්ප මාත්‍රමය. කථාවත්‍ථුව සමගම සතකි යනුයි.

සම්මා සම්බුදුරජාණන් වහන්සේ වනාහී සප්තප්‍රකරණ දේශනා කරන සේක් කථාවස්තුවට පැමිණ ඒ කථාවස්තුව පුද්ගලවාදයෙහි පමණක් සතර ප්‍රශ්නයන්හි ද්විපංචක වශයෙන් අභිමුඛවාද යුක්තිය යැයි එය මුල්කොට සියලු කථා මාර්ගයන්හි අසම්පූර්ණ බණවර පමණින් පාළියෙහි මාතෘකා තැබූ සේක.

ඒ මේ මාතෘකාව තබනසේක් මෙය දැක තැබූ සේක. මාගේ පිරිනිවීමෙන් වසර දෙසිය දහඅටෙකින් මත්තෙහි මොග්ගලිපුත්ත තිස්ස නම් භික්ෂුවක් භික්ෂූන් දහසක් මැද හිඳ ස්වකීය වාදයෙන් සූත්‍ර පන්සියයකුත් පරවාදයෙන් සූත්‍ර එක්දහස් පන්සියයකුත් සමෝධානය කොට දීඝනිකාය පමණ වූ කථාවස්තු ප්‍රකරණය බෙදන්නේය යනුයි. මොග්ගලිපුත්තතිස්ස ස්ථවිරයන් වහන්සේ ද මේ ප්‍රකරණය දේසනා කරන සේක් තමාගේ ඥානයෙන් දේශනා නොකළ සේක. බුදුරජාණන් වහන්සේ විසින් දෙනු ලද නය අනුව තබන ලද මාතෘකාවෙන් දෙසන ලද හෙයින් මේ සියලුම ප්‍රකරණය බුද්ධභාසිත ම නම් විය. කුමක් මෙන් ද යත්? යම්සේ මධුපිණ්ඩික සූත්‍රාන්තාදිය මෙනි. භාග්‍යවතුන් වහන්සේ වනාහි මධුපිණ්ඩික සූත්‍රාන්තයෙහි 'යතො නිදානං භික්ඛු! පුරිසං පපඤ්ච සඤ්ඤාසංඛා සමුදාචරන්ති එත්ථ චෙ නත්ථි අභිනන්දිතබ්බං අභිවදිතබ්බං අජ්ඣොසිතබ්බං එසෙවන්තො රාගානුසයානං'න්ති මාතෘකාව තබා අසුනෙන් නැගී විහාරයට පිවිසි සේක. ධර්මය පිළිගත් භික්ෂූහු මහාකච්චායන තෙරුන් වෙත එළඹ දසබල නම් වූ බුදුන් විසින් තබන ලද මාතෘකාවේ අර්ථය විචාළහ. තෙරුන් වහන්සේ විචාළ පමණින් ම නොකියා බුදුන්ට ගෞරව දැක්වීම පිණිස 'සෙය්‍යථාපි ආවුසො පුරිසො සාරත්ථිකො සාරගවෙසී' යන සාරෝපමාව ගෙනහැර දක්වා, භාග්‍යවතුන් වහන්සේ හරසහිත රුකක් මෙනි. ශ්‍රාවකයෝ ශාඛා පත්‍ර මෙනි. ඇවැත්නි, ඒ භාග්‍යවතුන් වහන්සේ වනාහි දතයුත්ත දන්නාහ. දැකිය යුත්ත දක්නාහ. චක්ෂුර්භූතය, ඥානභූතය, ධර්මභූතය, බ්‍රහ්මභූතය, වක්තෘය අර්ථය ප්‍රකාශ කරන්නාහ. නිවන් කරා නැඹුරු කරන්නාහ. අමෘතය දෙන්නාහ. ධර්මස්වාමිය, තථාගතයැයි බුදුන්ට ස්තුතිකොට නැවත නැවතත් භික්ෂූන් විසින් ඉල්ලන ලදුව ශාස්තෘන් වහන්සේ විසින් තබන ලද මාතෘකාව බෙදා දක්වා, 'ඇවැත්නි, තෙපි බලාපොරොත්තු වන්නහුව නම් භාග්‍යවතුන් වහන්සේ වෙතට එළඹ මේ අර්ථය නැවත විචාරව්, සර්වඥතාඥානය සමග සසඳන්නාහු සම වේනම් ගනුව නොවේ නම් නො ගනුව'යි මේ අදහසින් 'යම් සේ භාග්‍යවතුන් වහන්සේ ප්‍රකාශ කරන සේක්ද එසේ එය දරව' යැයි

කියා පිටත්කොට යැවීය. උන්වහන්සේලා භාග්‍යවතුන් වහන්සේ වෙත එළඹ විචාළාහුය. ශාස්තෘන් වහන්සේ 'කාත්‍යයනයන් විසින් වැරදි ලෙස කියන ලදැයි නොවදාරා ස්වර්ණ සංඛයක් ඔසවන්නාක් මෙන් ග්‍රීවය ඔසවා මනාව පිපුණු පියුමක් මෙන් සශ්‍රීක වූ මහා මුඛය පුරවමින් බ්‍රහ්මස්වරය නිකුත්කොට 'සාධු සාධු' යැයි තෙරුන්ට සාධුකාර දී 'මහණෙනි, මහා කාත්‍යායන පණ්ඩිතය, මහණෙනි, මහාකාත්‍යායන මහාප්‍රාඥය, තෙපි මේ කරුණ මාගෙන් විචාරව් නම් මා එය ප්‍රකාශ කරන්නේ ද මහාකාත්‍යානයන් ප්‍රකාශ කළ අයුරින් ම යැයි වදාළ සේක. මෙසේ ශාස්තෘන් වහන්සේ විසින් අනුමෝදන් වුණු කාලයේ පටන් වනාහි මුළු සූත්‍රය ම බුද්ධභාසිත නම් විය. ආනන්ද ස්ථවිරාදීන් විසින් විස්තර කරන ලද සූත්‍රයන්හි ද මේ ක්‍රමය මැයි. මෙසේ ම සම්මා සම්බුදු රජාණන් වහන්සේ සප්තප්‍රකරණයන් දේසනා කරන සේක් කථාවස්තුවට පැමිණ කියන ද ක්‍රමයෙන් මාතෘකාව තැබූ සේක. තබන සේක් ද වනාහි මෙය දුටු සේක. මාගේ පිරිනිවීමෙන් වසර දෙසිය දහඅටෙකින් මත්තෙහි මොග්ගලිපුත්ත තිස්ස ස්ථවිර නම් භික්ෂුවක් භික්ෂූන් දහසක් මැද හිඳ ස්වකීය වාදයෙන් සූත්‍ර පන්සියයක් ද පරවාදයෙන් සූත්‍ර එක්දහස් පසක් සමෝධානය කොට දීඝනිකාය පමණ වූ කථාවස්තු ප්‍රකරණය බෙදා දක්වන්නේය යනුයි. මොග්ගලිපුත්තතිස්ස ස්ථවිරයන් වහන්සේ ද මෙම ප්‍රකරණය දේශනා කරන සේක් තමාගේ ඥානයෙන් නො දෙසූ සේක බුදුරජාණන් වහන්සේ විසින් දෙන ලද නයින් තබන ලද මාතෘකාවෙන් ම දෙසූ සේක. මෙසේ බුදුරදුන් විසින් දෙන ලද නයින් තබන තබන ලද මාතෘකාවෙන් දෙසන ලද බැවින් මේ මුළු ප්‍රකරණය ම බුද්ධ භාසිතම වීය. මෙසේ කථා වස්තුවක් සමග සප්තප්‍රකරණ අභිධර්ම නම්.

එහි ධම්මසංගණී ප්‍රකරණයෙහි සතර විභක්ති නම් චිත්ත විභක්ති, රූප විභක්ති, නික්ඛේපණය, අත්‍ථුද්ධාර යනුයි. එහි කාමාවචර කුසල වසයෙන් අටකි. අකුසල වසයෙන් දොළොසකි. කුසල විපාක වසයෙන් සොළොසකි. අකුසල විපාක වසයෙන් සතකි. ක්‍රියා වසයෙන් එකොළොසකි. රූපාවචර කුසල වසයෙන් පසෙකි. විපාක වසයෙන් පසෙකි. ක්‍රියා වසයෙන් පසකි. රූපාවචර කුසල වසයෙන් පසකි. විපාක වසයෙන් පසෙකි. ක්‍රියා වසයෙන් පසෙකි. අරූපාවචර කුසල වසයෙන් සතරෙකි. විපාක වසයෙන් සතරෙකි. ක්‍රියා වසයෙන් සතරෙකි. ලෝකුත්තර කුසල වසයෙන් සතරෙකි. විපාක වසයෙන් සතරෙකැයි අසූනවයක් සිත් චිත්ත විභක්ති නම් වෙයි. චිත්තුප්පාද කාණ්ඩ යනු ද මෙයටම නාමෙකි.

එය වාචනා මාර්ග වසයෙන් අතිරේක බණවර දෙකකි. විස්තර කරනු ලබනුයේ නම් අනන්තා පරිමාණ ද වේ.

ඉන් අනතුරුව ඒකවිධියෙන් ද්විවිධියෙන් පැය ආදී වසයෙන් මාතෘකාව තබා විස්තර වසයෙන් බෙදා දක්වන ලද්දේ රූප විභක්ති නම්. රූප කාණ්ඩය යනු ද මෙයට ම නම්. එය වාචනා මාර්ග වසයෙන් අතිරේක බණවර දෙකකි. විස්තර කරනු ලබනුයේ වනාහි අනන්තා පරිමාණ වෙයි.

ඉන් අනතුරුව මූල වසයෙන් ස්කන්ධ වසයෙන් ද්වාර වසයෙන් භූමි වසයෙන් අර්ථ වශයෙන් ධර්ම වශයෙන් නාම වශයෙන් ලිංග වශයෙන්දැයි මෙසේ මූලාදීන් බහාලමින් දේශනා කරන ලදුයේ නික්ඛෙප රාසි නම්. එය :-

මූලතො ඛන්‍ධතො චාපි - දහරතො චාපි භූමිතො
අත්‍ථතො ධම්මතො චාපි - නාමතො චාපි ලිංගතො
නික්ඛිපිත්‍වා දෙසිතත්තා - නික්ඛෙපොති පවුච්චති

(යනුවෙන් ද කියන ලදී.)

නික්ඛෙප කාණ්ඩ යනු ද එය ට ම නම්. එය වාචනා මාර්ගයෙන් බණවර තුනක් පමණි. විස්තර කරනු ලබනුයේ වනාහි අනන්තා පරිමාණ වෙයි.

ඉන් අනතුරුව වනාහි ත්‍රිපිටක බුද්ධ වචනයට අර්ථෝද්ධාර වූ සරණ දුකය දක්වා බහාලන ලදුයේ අට්ඨකථා කාණ්ඩ නම් වේ. යම්හෙයකින් මහාප්‍රකරණික භික්ෂූහු මහා ප්‍රකරණයෙහි ගණන වාරය නොසලකා ගණන වාරය ගෙනහැර දක්වති. එය වාචනා මාර්ගයෙන් බණවර දෙකක් පමණි. විස්තර කරනු ලබනුයේ නම් අනන්තා පරිමාණ වේ. මෙසේ මුළු ධම්මසංගණී ප්‍රකරණය වාචනා මාර්ග වසයෙන් අතිරේක බණවර තෙළෙසක් පමණි. විස්තර කරනු ලබන්නේ නම් අනන්තා පරිමාණ වේ.

මෙසේ මෙය :-

චිත්ත විභත්ති, රූප විභත්ති, නික්ඛෙප, අත්ථුද්ධාර යන මේ කාරණය ගැඹුරුය. සියුම්ය. එය ද බුදුන් විසින් දෙසන ලදී.

ඉන් අනතුරුව විභංග ප්‍රකරණය නම්. එය ඛන්ධ විභංගය, ආයතන විභංගය, ධාතු විභංගය, සංඛ විභංගය, ඉන්‍ද්‍රිය විභංගය, පච්චයාකාර විභංගය, සතිපට්ඨාන විභංගය, සම්මප්පධාන විභංගය, ඉද්ධිපාද විභංගය, බොජ්ඣංග විභංගය, මග්ග විභංගය, ඣාන විභංගය, අප්පමඤ්ඤා විභංගය, සික්ඛාපද විභංගය, පටිසම්භිදා විභංගය, ඤාණ විභංගය, ඛුද්දකවත්ථු විභංගය, ධම්මහදය විභංගය යැයි අටළොස් විදියකින් බෙදන ලදී.

එහි ඛන්ධ විභංගය, සුත්තන්ත භාජනීය, අභිධම්ම භාජනීය පඤ්හ පුච්ඡක වශයෙන් තුන් අයුරකින් බෙදන ලදී. එය වාචනා මාර්ග වසයෙන් බණවර පසක් පමණය. විස්තර කරනු ලබනුයේ වනාහි අනන්ත අප්‍රමාණ වෙයි. එයින් පසු ආයතන විභංග ආදිය ද මේ තුන් නයින් ම බෙදන ලදී. ඒවා අතුරින් ආයතන විභංගය වාචනා මාර්ග වසයෙන් අතිරේක බණවරකි. ධාතු විභංගය බණවර දෙකක් පමණය. සච්ච විභංගය ද එසේය. ඉන්‍ද්‍රිය විභංගයෙහි සුත්තන්ත භාජනීය නැත. එය වාචනා මාර්ග වසයෙන් අතිරේක බණවරක් පමණි. පච්චයාකර විභංගය බණවර සයක් පමණය. මෙහි වනාහි පඤ්හපුච්ඡකය නැත. සතිපට්ඨාන විභංගය අතිරේක බණවරක් පමණි. සම්මප්පධාන, ඉද්ධිපාද, බොජ්ඣංග, මග්ග විභංග ද එසේමය. ඣාන විභංගය බණවර දෙකක් පමණි. අප්පමඤ්ඤා විභංගය අතිරේක බණවරක් පමණි. සික්ඛාපද විභංගයෙහි ද සුත්තන්ත භාජනීය නැත. එය වනාහි වාචනාමග්ග වසයෙන් අතිරේක බණවරක් පමණය. පටිසම්භිදා විභංගය ද එසේය. ඤාණ විභංගය දස විදියකින් බෙදන ලදී. මෙය වනාහි වාචනා මග්ග වසයෙන් බණවර තුනක් පමණි. ඛුද්දක විභංගය ද දස විදියකින් බෙදන ලදී. වාචනා මග්ග වසයෙන් අතිරේක බණවර දෙකක් පමණය. සියල්ල ම විස්තර කරනු ලබනුයේ අනන්තය, අප්‍රමාණය. මෙසේ මේ විභංගප්පකරණය නම් වාචනා මග්ග වශයෙන් බණවර තිස්පහක් පමණය. විස්තර වශයෙන් අනන්තාපරිමාණ වෙයි.

ඉන් අනතුරුව ධාතුකථාප්පකරණය නම් වෙයි. එය සංගහය අසංගහය, සංගහිතෙන අසංගහිතය, අසංගහිතෙන සංගහිතය, සංගහිතෙන සංගහිතය, අසංගහිතයෙන් අසංගහිතය. සම්පයෝගය,

විප්‍රයෝගය, සම්ප සුත්තයෙන් විප්පයුත්තය, විප්පයුත්තයෙන් සම්පයුත්තය, සම්පයුත්තයෙන් සම්පයුත්තය, විප්පයුත්තයෙන් විප්පයුත්තය, සංගහීතයෙන් සම්පයුත්ත විප්පයුත්තය, සම්පයුත්තයෙන් සංගහිත අසංගහිතය, අසංගහිතයෙන් සම්පයුත්ත විප්පයුත්තය, විප්පයුත්තයෙන් සංගහිත අසංගහිතය යැයි තුදුස් අයුරකින් බෙදන ලදී. එය වාචනා මග්ග වසයෙන් අතිරේක බණවර සයක් පමණය. විස්තර කරනු ලබනුයේ වනාහි අනන්තා පරිමාණ වෙයි.

ඉන් අනතුරුව පුග්ගල පඤ්ඤත්ති නම්. එය ඛන්ධපඤ්ඤත්ති ආයතන පඤ්ඤත්ති, ධාතු පඤ්ඤත්ති, සච්ච පඤ්ඤත්ති, ඉන්ද්‍රිය පඤ්ඤත්ති, පුග්ගල පඤ්ඤත්ති යනුවෙන් සයාකාරයකින් බෙදන ලදී. එය වාචනා මග්ග වසයෙන් අතිරේක බණවර පහකි. විස්තර කරනු ලබනුයේ වනාහි අනන්තා පරිමාණ වේ.

ඉන් අනතුරුව කථා වත්ථුප්පකරණය නම් වේ. එය ස්වකීය වාදයෙහි සූත්‍ර පන්සියයක් ද පරවාදයෙහි සූත්‍ර එක්දහස් පසක් සමෝධානය කර බෙදන ලදී. එය දැන් වාචනා මාර්ගයෙන් පොතෙහි ලියන ලද්ද නො ගෙන සංගීතයට නගන ලද නයින් දීඝනිකාය පමණි. විස්තර කරනු ලබනුයේ වනාහි අනන්තාපරිමාණ වෙයි.

ඉන් අනතුරුව යමක නම් වෙයි. එය මූල යමකය, ඛන්ධ යමකය, ආයතන යමකය, ධාතු යමකය, සච්ච යමකය, සංඛාර යමකය, අනුසය යමකය, චිත්ත යමකය, ධම්ම යමකය, ඉන්ද්‍රිය යමකය යැයි දස විදියකින් බෙදන ලදී. එය වාචනා මග්ග වසයෙන් බණවර එකසිය විස්සකි. විස්තර වශයෙන් වනාහි අනන්තාපරිමාණ වෙයි.

ඉන් අනතුරුව මහාපකරණ නම්. පට්ඨාන යනු ද එයට ම නමකි. එය හේතු පච්චය, ආරම්මණ පච්චය, අධිපති පච්චය අනන්තර පච්චය, සමනන්තර පච්චය, සහජාත පච්චය, අඤ්ඤමඤ්ඤා පච්චය, නිස්සය පච්චය, උපනිස්සය පච්චය, පුරේජාත පච්චය, පච්ඡාජාත පච්චය, ආසේවන පච්චය, කම්ම පච්චය, විපාක පච්චය, ආහාර පච්චය, ඉන්ද්‍රිය පච්චය, ඣාන පච්චය, මග්ග පච්චය, සම්පයුත්ත පච්චය, විප්පයුත්ත පච්චය, අත්ථිපච්චය, නත්ථිපච්චය, විගත පච්චය, අවිගත පච්චය යැයි පච්චය වශයෙන් වනාහි සූවිසි විදියකින් බෙදන ලදී.

මෙහි දී වනාහි පට්ඨානය ගෙනා යුතුයි. කුසල ත්‍රිකාදිය වනාහි දෙවිසි තික නම්. හෙතු ධම්මය, න හෙතුධම්මය -පෙ- සරණ ධම්මය, අසරණ ධම්මයැයි යන සියය දුක නම්. තව ද විජ්ජාභාගීය ධම්ම, අවිජ්ජා භාගීය ධම්ම, -පෙ- ඛය ඤාණය, අනුප්පාද ඤාණය යන දෙසාළිස් සුත්තන්තික දුක නම්. ඒවා අතුරින් දෙවිසි තිකය සියක් දුක යැයි යන මේවා ගෙන කියන ලද ජින වචන වූ සර්වඥ වූ බුදුන් විසින් දේසනා කරන ලද මෙය සප්තප්‍රකරණයන්ගේ මාතිකා නම් වෙයි. තව ද අනෙක් දෙසාළිස් සුත්තන්තික දුක කොතැනින් ප්‍රභව වීද? කවරෙකු විසින් තබන ලද ද? කවරෙකු විසින් දේසනා කරන ලදද? දම්සෙනෙවි සැරියුත් තෙරුන් ප්‍රභව කොට ඇත්තේ ය. උන්වහන්සේ විසින් තබන ලදී. උන්වහන්සේ විසින් දෙසන ලදී යතුයි. මේවා තබන්නා වූ උන්වහන්සේ වනාහි සාමුක්කංසික වූ තමන් වහන්සේගේ ඤාණයෙන් නො තැබූ සේක. එකුත්තරිය වූ ඒකනිපාත දුක නිපාත සංගීති වනාහි දසුත්තරිය සූත්‍රාන්ත සමග සමෝධානය කොට ආභිධම්මික තෙරුන් වහන්සේලාගේ සූත්‍රාන්තයට පැමිණ නො වෙහෙසීම පිණිස තබන ලදී. එකී ධර්ම එකම නික්ඛෙප කාණ්ඩයක ම මුදුන් පමුණුවා බෙදන ලදී. සෙසු තැන්වලදී සරණ දුකය තෙක් අභිධර්මය බෙදන ලදී. සම්මා සම්බුදුන් විසින් වනාහි අනුලෝම පට්ඨානයෙහි දෙවිසි තිකයන් නිසා තික පට්ඨානය දක්වන ලදී. සියයක් දුකයන් නිසා දුක පට්ඨානය දක්වන ලදී. ඉන්පසුව දෙවිසි තිකයන් ගෙන දුක සතයෙහි බහා දුක තික පට්ඨානය දක්වන ලදී. ඉක්බිති දුකසතය ගෙන දෙවිසි තිකයෙහි බහා තික දුක පට්ඨානය දක්වන ලදී. තිකය වනාහි තිකයන්හි ම බහා තිකතික පට්ඨානය දක්වන ලදී. දුකයන් ද දුකයන්හිම බහා දුකදුක පට්ඨානය දක්වන ලද්දේම ය.

උතුම් වූ තික පට්ඨානය ද උතුම් වූ දුකය ද, දුක තිකය ද තික දුකය ද තික තිකය මෙන් ම දුක දුකය යයි අනුලෝම නයෙහි ඉතා ගැඹුරුය.

පච්චනීය පට්ඨානයෙහි ද දෙවිසි තික නිසා තිකපට්ඨාන නම් විය. දුක සතය නිසා දුක පට්ඨාන නම් විය. දෙවිසි තිකයන් දුක සතයෙහි බහා දුක තික පට්ඨාන නම් විය. දුකසතය දෙවිසි තිකයෙන් බහා තික දුක පට්ඨාන නම් විය. තිකයන් තිකයන්හි ම බහා තිකතික පට්ඨාන නම් විය. දුකයන් දුකයන්හි බහා දුක දුක පට්ඨාන නමැයි පච්චනීයයන් ද නය සයකින් පට්ඨානය දක්වන ලදී. එහෙයින් කියන ලදී.

උතුම් වූ තිකපට්ඨානය ද උතුම් වූ දුකය ද, දුක තිකය ද තික දුකය ද තික තිකය ද, දුක දුකය ද යන පච්චනීයෙහි නය සය ඉතා ගැඹුරුය යනුයි.

ඉන් ඉක්බිති අනුලෝම පච්චනීයයන් ද මෙම උපායෙන් ම නය සයකින් දක්වන ලදී. එහෙයින් කීය :-

උතුම් වූ තික පට්ඨානය ද, උතුම් වූ දුකය ද දුක තිකය ද තික දුකය ද තික තිකය ද දුක දුකය ද යන අනුලෝප පච්චනීයෙහි නය සය ඉතා ගැඹුරුය යනුයි.

එයින් ඉක්බිති පච්චනීය දුනුලෝමයෙහි මෙම නය සයෙන් ම දක්වන ලදී. එහෙයින් කීය.

උතුම් වූ තිකපට්ඨානය ද උතුම් වූ දුකය ද දුකතිකය ද තික දුකය ද, තික තිකය ද, දුකදුකය ද යන දුනුලෝම පච්චනීයෙහි නය සය ඉතා ගැඹුරුය යනුයි.

මෙසේ අනුලෝමයෙහි පට්ඨාන සයෙක, පටිලෝමයෙහි සයෙක, අනුලෝම පච්චනීයෙහි සයෙක, පච්චය අනුලෝමයෙහි පට්ඨාන සයකැයි යන මේ සූවිසි සමනතපටඨාන සමෝධානය මහාපට්ඨාන ප්‍රකරණය නම්.

දැන් මේ මේ අභිධර්මයාගේ ගැඹුරුබව දැනගැනීම පිණිස සතර සයුර දතයුතුයි. සසර සයුර, දිය සයුර, නය සයුර, නැණ සයුර යනුයි. එහි සසර සයුර නම් :-

ස්කන්ධ ධාතු ආයතන යන මොවුන්ගේ පිළිවෙළ නොසිඳ පැවැත්ම සංසාරයැයි කියනු ලැබේ යනුයි.

මේ කියන ලද්දේ සංසාර වෘත්තයයි. ඉදින් මෙය මේ සත්ත්වයන්ගේ උත්පත්තියේ මුල් කෙළවර නො පැනේ. මෙතෙක් වස් සියයෙකින් හෝ වස් දහයකින් හෝ හෝ වර්ෂ ලක්‍ෂයකින් හෝ කල්ප සියයකින් හෝ කල්ප දහසකින් හෝ කල්ප ලක්‍ෂයකින් හෝ මත්තෙහි සත්ත්වයෝ

උපන්නාහ. එයින් පෙර නොවූහයි හෝ අසවල් රජුගේ කාලයේ උපන්නාහ. අසවල් බුදුන්ගේ කාලයේ උපන්නාහ. එයින් පෙර නොවූහ යි හෝ යන මේ සීමාවක් නැත. 'මහණෙනි, අවිද්‍යාව මෙයින් පෙර නොවීය. පසුව ඇතිවී යැයි අවිද්‍යාවේ මුලවර නොපැනේ' යනුයි. මේ නයින් වනාහි මේ සසර සයුර නොදන්නා ලද කෙළවර ඇත්තේම ය.

මහ සමුදුර වනාහි ජල සාගර නමැයි දතයුතුයි. එය යොදුන් අසූහාර දහසක් ගැඹුරුය. එහි ජලය ළාහ සියයකින් හෝ ළාහ දහසකින් ළාහ ලක්‍ෂයකින් ප්‍රමාණ කිරීමෙක් නම් නැත. එහෙයින් අසංඛෙයයි. අප්‍රමේයයි. මහා ජලස්කන්ධය ම යන නමට පැමිණේ. මේ ජලසාගර නමි.

නය සාගරය කුමක්ද? ත්‍රිපිටක බුද්ධ වචනයයි. දෙවැදෑරුම් පෙළ මෙනෙහි කරන්නා වූ ශ්‍රද්ධා සම්පන්න ප්‍රසාද බහුල ඥානාධික කුලපුත්‍රයන්ට අනන්ත ප්‍රීතියක් සොම්නසක් උපදී. කවර දෙකක්ද? විනය හා අභිධර්මයයි. විනය පාළිය මෙනෙහි කරන විනයධර භික්‍ෂූන්ට වනාහි 'දෝෂානුරූප ශික්‍ෂාපද පැණවීම නමි. මේ දෝෂයෙහි මේ (ශික්‍ෂාපද) ඉක්මවීමෙහි මෙනම් (අවතක්) වේයැයි ශික්‍ෂාපද පැණවීම නම් අන්‍යයන්ට අවිෂයය. බුදුවරුන්ට ම විෂයයැයි.

අනන්ත වූ ප්‍රීතියක් සොම්නසක් උපදී. 'අපගේ ශාස්තෲන් වහන්සේ ඛන්‍ධන්තර, ආයතනන්තර ධාත්‍වන්තර ඉන්ද්‍රියන්තර, බලබොජ්ඣංගික කම්ම විපාකංන්තර රූපාරූප පරිච්ඡේද යන ඉතා සියුම් ධර්ම අහස්තලයෙහි තාරකාරූප ගන්නාක් මෙන් රූපාරූප ධර්ම පුරුකින් පුරුක කොටසින් කොටස කොට බෙදමින් දැක්වූයේයැයි 'අභිධර්ම පාළිය ප්‍රත්‍යවේක්‍ෂා කරන ආභිධම්මික භික්‍ෂූන්ට ද අනන්ත වූ ප්‍රීතියක් සොම්නසක් උපදී.

මෙසේ ප්‍රීති උත්පත්තිය පිළිබඳව මේ වස්තුව ද දතයුතුයි. මහා ගති තිම්බය තිස්සදත්ත නම් තෙරුන් වහන්සේ වනාහි පරතෙරට වඩනා සේක් නැවෙහි මතුතලයෙහි හිඳ මහා සමුද්‍රය බැලූහ. ඉක්බිති උන්වහන්සේට එසමයෙහි පරතෙර මනා පෙනිණ. වෙහෙර ද නො පෙනිණ. රළ වේගයෙන් බිඳී උඩට නැගුණු දියසුනින් විසිරුණු, දිගහරින ලද රිදීපටක්, සමන්මල් ඇතිරියක් සමාන මහා සමුද්‍රයට පැතිණ. උන්වහන්සේ කිමෙක්ද?

මහා සමුද්‍රයේ රළවේගය බලවත් ද? නැතහොත් සූවිසි ප්‍රභේදයකින් යුත් සමන්තපට්ඨානයෙහි නයමුඛය බලවත්දැයි සිතූ සේක. ඉක්බිති මහා සමුද්‍රයේ කෙළවර පෙනෙයි. මෙය වනාහි යට මහපොළොවෙන් පිරිසිඳියේය. උඩ අහසින් ද එක් පසෙකින් චක්‍රවාට පර්වතයෙන් ද එක්පසෙකින් වෙරළින් ද පිරිසිඳියේය. සමන්තපට්ඨානයෙහි වනාහි පරිච්ඡේදයක්, කෙළවරක් නො පෙනේයැයි සියුම් ධර්මය ප්‍රත්‍යවේක්ෂා කරන්නා වූ උන්වහන්සේට බලවත් ප්‍රීතියක් උපන්නේය. උන්වහන්සේ ප්‍රීතිය විෂ්කම්භනය කොට - යටපත් කොට විදසුන් වඩා වැඩහුන් අයුරින්ම සියලු කෙලෙස් ගෙවා අග්‍රඵලය වූ රහත්බැව්හි පිහිටා උදානයක් ප්‍රකාශ කළ සේක.

අත්‍ථෙ ච ගම්භීරගතං සුදුබ්බුධං
සයං අභිඤ්ඤාය සහෙතුසම්භවං
යථානුපුබ්බං නිඛිලෙන දෙසිතං
මහෙසිනා රූපගතං ව පස්සතී ති

අර්ථයෙහි ගැඹුරු වූ අතිශයින් දුරවබෝධ වූද හේතු සම්භව නම් වූ සමන්තපට්ඨාන නය තමන් වහන්සේ ම විශේෂයෙන් අවබෝධ කරගෙන මහර්ෂි නම් වූ සර්වඥයන් වහන්සේ විසින් දේශනා කරන ලදද? එය රූපගත වූවක් මෙන් පෙනෙයි යනුයි.

මේ නය සාගර නම්.

ඤාණ සාගරය නම් කවරේද? සර්වඥතා ඥානය ඤාණ සාගර නම්. මෙය සංසාර සාගරය නම් වේ. මෙය ජල සාගරය නම් වේ. මෙය නය සාගරය නම් වේ යැයි අන් කෙනෙකුන් විසින් වනාහි දැනගන්නට නොහැක. සර්වඥතා ඥානයෙන් ම දැනගන්නට හැකිනුයි සර්වඥතා ඥානය ඥානසාගර නම්. මේ සතර සාගර අතුරෙන් මෙතැන දී නය සාගරය අධිප්‍රේතයි. (බලාපොරොත්තු වෙයි.)

මෙය වනාහි සර්වඥ වූ බුදුරජාණන් වහන්සේලා ම ප්‍රතිවේධ කරගනිති. මේ භාග්‍යවතුන් වහන්සේ ද බෝමුල වැඩහුන් සේක. මෙය ප්‍රතිවේධ කොටගෙන මේ ධර්මය සොයන්නා වූ, ගවේෂණය කරන්නා වූ මා විසින් වනාහි සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් ඉක්මවන ලදී. නැවත මේ

පළඟෙහි හුන් මා විසින් එක්දහස් පන්සියයක් කෙලෙස් ගෙවා මේ ධර්මය ප්‍රතිවේධ කරන ලදැයි ප්‍රතිවේධ කරන ලද ධර්මය ප්‍රත්‍යවේක්ෂා කරමින් සතියක් එක්පළඟින් වැඩහුන් සේක. ඉක්බිති ඒ පළඟින් නැගිට මා විසින් වනාහි මේ පළඟෙහි දී සර්වඥතා ඥානය ප්‍රතිවේධ කරන ලදැයි නො පියූ ඇස්වලින් යුතු ව සත්දිනක් පළඟ බලමින් වැඩහුන් සේක. ඉක්බිති 'අදත් වනාහි සිද්ධාර්ථයන්ට කළයුතු කිසක් ඇද්ද? පළඟෙහි ආලය නො හරීයැයි දෙවියන්ට විතර්කයක් පහළ විය. ශාස්තෘන් වහන්සේ දෙවියන්ගේ විතර්කය දැන එකෙණෙහි ම ඔවුන්ගේ විතර්කය සංසිඳුවීම පිණිස අහසට පැන නැගී යමාමහ පෙළහර දැක්වූ සේක. මහබෝ පළඟෙහි දී කරන ලද පෙළහරත්, ඥාති සමාගමයෙහිදී කරන ලද පෙළහරත්, පාථිකපුත්‍ර සමාගමයේ දී කරන ලද පෙළහරත් යන මේ සියල්ල ගණ්ඩබ්බ වෘක්ෂ මූලයේ දී කරන ලද යමාමහ පෙළහර සමාන ම විය. මෙසේ යමාමහ පෙළහර දක්වා පළඟටත් වැඩසිටි තැනටත් අතරෙහි අහසින් වැඩ සත්දිනක් සක්මන් කළ සේක.

මේ විසිඑක් දිනයන් අතුරෙහි එක් දිනකදී බුදුන්ගේ සිරුරෙන් රශ්මි නො නික්මියේය. සතරවන සතියෙහි වනාහි වයඹදිග රුවන්ගෙයි වැඩහුන් සේක. රුවන් ගෙය සත්රුවන්මුවා ගෙයක් නොවේමය. සප්තප්‍රකරණයක් සම්මර්ශනය කළ ස්ථානය වනාහි රුවන්ගෙය යැයි දතයුතුයි. එහිදී ධම්මසංගණිය සම්මර්ශනය කරන්නා වූ ද බුදුන්ගේ ශරීරයෙන් රශ්මි නො නික්මිණ. විභංග ප්‍රකරණය, ධාතුකථාව, පුද්ගල ප්‍රඥප්තිය, කථාවස්තු ප්‍රකරණය සහ යමක ප්‍රකරණය යන මේවා සම්මර්ශනය කරන්නා වූ ශාස්තෘන් වහන්සේගේ ශරීරයෙන් රශ්මි නො නික්මිණි. යම් අවස්ථාවකදී වනාහි මහා ප්‍රකරණයට බැස 'හෙතුපච්චයො, ආරම්මණ පච්චයො -පෙ- අවිගත පච්චයො' යනුවෙන් සම්මර්ශනය පටන්ගත් සේක් ද? ඉක්බිති සූවිසි සමන්තපට්ඨානය සම්මර්ශනය කරන්නා වූ උන්වහන්සේගේ සර්වඥතා ඥානය නිරන්තරවැ මහා ප්‍රකරණයේ අවකාශ ලැබීය. යම්සේ තිමිරපිංගල මහාමත්ස්‍යයා වනාහි අසූහාර දහසක් යොදුන් ගැඹුරැති මහා සමුද්‍රයෙහි ම අවකාශ ලබයිද? මෙ පරිද්දෙන් සර්වඥතා ඥානය ඒකාන්ත වශයෙන් මහා ප්‍රකරණයෙහි අවකාශ ලැබීය. මෙසේ අවකාශ ලද සර්වඥතා ඥානයෙන් සුවසේ ඉතා සියුම්ව ධර්මය සම්මර්ශනය කරන්නා වූ ශාස්තෘන් වහන්සේගේ ශරීරයෙන් නීල පීත ලෝහිත ඕදාත මාංජෙෂ්ඨ ප්‍රභාශ්වර වශයෙන් සවනක් රැස් නික්මිණ. කෙස් රවුලු මෙන් ම ඇස්වල නිල්

තැන්වලින් නිල් රැස් නික්මිණ. ඒවායේ වශයෙන් අහස්තලය අඳුන් සුනින් ගැවසුණාක් මෙන් ද, දියබෙරලිය මල් නිලු පුල්පෙත් ගැවසුණාක් මෙන් ද විසිරෙන්නා වූ මිණි තල්වැටක් මෙන් ද දිගහරින ලද නිල්පටක් මෙන් ද විය. සිව්යේ මෙන් ම ඇස්වල කහවන් තැන්වලින් කහවන් රැස් නික්මිණ. ඒවා විසින් රන්දිය දහර ඉසින්නාක් මෙන් ද දිගහරින ලද රන්පට මෙන් ද, කොකුම්සුනු, කිණිහිරි මල් ගැවසුණාක් මෙන් ද බැබළිණ. මස් ලේවලින් මෙන් ම ඇස්වල රතුපැහැ තැන්වලින් ද ලෝහිත රශ්මි නික්මිණ. ඒවා විසින් දිසාභාග සින්දූර සූත්‍රයෙන් රඳනා ලද්දක් මෙන් ද මනාව පැසවන ලද ලතුරස ඉසින්නාක් මෙන් ද රතු කම්බිලියකින් වටකරන ලද්දක් මෙන් ද බඳුවදමලින් පිරිබඩ කළ බඳුවදමලින් විසුරුවන ලද්දක් මෙන් ද බැබළිණ. ඇටවලින් මෙන් ම දත්වලින් ද ඇස්වල සුදු තැන්වලින් ද සුදුරැස් නික්මිණ. එයින් දිසාභාග රිදී කළයකින් වත්කරනු ලබන ක්ෂීරධාරා විසුරුණාක් මෙන් ද දිගහරින ලද රිදීපටින් කළ වියනක් මෙන් ද දිගහැරෙන රිදී තල්වැටක් මෙන් ද කොඳකුමුදු තික සමන් බෝලිද්ද ආදී කුසුමින් ගැවසුණා මෙන් ද බැබළිණ. මාංජෙෂ්ඨ ප්‍රභාශ්වර වර්ණ වනාහි ඒ ඒ සිරුරු පෙදෙස්වලින් නික්මිණ.

මෙසේ ඒ සවනක් රැස් නික්ම ගන මහපොළව ගත්තේය. දෙලක්ෂ සතළිස් දහසක් යොදුන් ගන මහපොළොව වැසීයන රන්පිඩක් මෙන් විය. ඉක්බිති මහපොළොව බිඳගෙන යට ජලය ගත්තේය. පොළොව දරා සිටින්නා වූ හාරලක්ෂ අසූදහසක් යොදුන් ගග ජලය රන් කළසින් ඉසිනු ලබන ලිහිල් වූ ස්වර්ණයක් මෙන් විය. ජලය විනිවිද වාතය ගත්තේය. නවලක්ෂ සැටදහසක් යොදුන් ගන වාතය ඔසවන ලද රත්කඳන් මෙන් විය. වාතය විනිවිද යට අජටාකාශයට පැන්නේය. මතු භාගයෙන් උඩට ද නැගී චාතුර්මහා රාජිකයන් ගත්තේය. ඔවුන් විනිවිද තාවතිංස දෙවියන් ද එයින් යාම දෙවියන් ද එයින් තුසිත දෙවියන් ද එයින් නිම්මානරතී දෙවියන් ද එයින් පරනිම්මිත වසවත්ති දෙවියන් ද එයින් බ්‍රහ්මලෝකවාසී බ්‍රහ්මයන් ද එයින් වේහප්ඵල බ්‍රහ්මයන් ද එයින් පංච සුද්ධාවාසීන් ද විනිවිද සතර අරූපීන් ගත්තේය. සතර අරූපීන් ද විනිවිද අජටාකාසයට පැන්නේය. සරසින් අනන්ත ලෝකධාතුන්ට පැන්නේය. මේ තැන්වල ද චන්ද්‍රයන්ගේ චන්ද්‍රප්‍රභා නැත. සූර්යයන්ගේ සූර්යප්‍රභා නැත. තාරකා රූපයන්හි තාරකා රූප ප්‍රභා නැත. දෙවියන්ගේ, උයන් විමන කල්ප වෘක්ෂයන්ගේ මෙන් ම ශරීරයන්හි ආභරණයන්හි යන සියලු තන්හි ප්‍රභාවක් නැත. ත්‍රිසහස්‍රී, මහාසහස්‍රී ලෝකධාතුයෙහි ආලෝකය

පැතිරවීමේ සමත් මහා බ්‍රහ්මයා ද සූර්යෝද්ගමනයෙහි දී කදෝපැණියකු මෙන් විය.

චන්ද්‍ර, සූර්ය, තාරකා රූප, දේවතා, උයන්, විමාන, කප්රුක් පිරිසිඳීම් පමණක් පෙනිණ. මෙතෙක් තැන බුදුරැස් ම පැතිරුණේ විය. මෙය ද බුදුන්ගේ අධිෂ්ඨානයෙන් වූ ඍද්ධියක් නොවේ. භාවනාමය ඍද්ධියක් ද නොවේ. සියුම් වූ ධර්මය සම්මර්ශනය කරන්නා වූ ලෝකනාථ වූ බුදුන්ගේ ලෙස පැහැදිණ. හෘදයවස්තු රූපය පැහැදුණේය. ඡවි වර්ණය පැහැදුණේය. සිතින් පැන නැඟි වර්ණ ධාතුව හාත්පස අසූරියන් පමණ ප්‍රදේශයෙහි නිශ්චලව සිටියේය. මේ අයුරින් සත්දිනක් සම්මර්ශනය කළ සේක. රෑ දාවල් සතක් සම්මර්ශනය කළ ධර්මය කෙතෙක් වීද යත්, අනන්තා පරිමාණ ම විය. මේ වනාහී මානසික දේසනා නම්.

ශාස්තෘන් වහන්සේ වනාහි මෙසේ සත්දිනක් මනසින් සිතූ ධර්මය වාග්භේද කොට දේශනා කරන සේක් නම් වර්ෂ සියයකිනුදු වර්ෂ දහසකිනුදු වර්ෂ ලක්ෂයකිනුදු මුදුන්පත්කොට දෙසන්නට නොහැකියි නොකිව යුතුයි. අපරභාගයෙහි දී තථාගතයන් වහන්සේ තව්තිසා භවයේ පරසතු රුක්මුල පඬුපුල් සලසුනෙහි දසදහසක් සක්වල දෙවියන් මැද වැඩහුන් සේක් මව කායසාක්ෂි කොටගෙන 'කුසලා ධම්මා අකුසලා ධම්මා අබ්‍යාකතා ධම්මා' යි දහම් දෙසන සේක් සතභාගයෙන් සහස්‍ර භාගයෙන් සතසහස්‍රභාගයෙන් ධර්මාන්තරයෙන් ධර්මාන්තරයට සංක්‍රමණය වෙමින් දෙසූ සේක. තෙමසක් නිරතුරුව පවත්වන ලද දේශනා වේගයෙන් පැවතියේ අහස් ගඟ මෙන් ද, යටිකුරු කොට තබන ලද දිය කළයකින් නික්මෙන ජලධාරාවක් මෙන් ද වී අනන්තාපරිමාණ විය. බුදුරජාණන් වහන්සේලාගේ භුක්තානුමෝදනා කාලයේදී ද මඳක් වැඩිකොට අනුමෝදනා කරන දේශනා දීඝමජ්ඣිම නිකායන් පමණ වෙයි. සවස් වරුවෙහි පැමිණි පිරිසට ධර්මය දේශනා කරන බුදුවරුන්ගේ දේශනාව සංයුත්ත අංගුත්තර යන මහා නිකාය දෙක පමණ වෙයි. කවර හෙයින් ද? බුදුවරුන්ගේ භවංග පරිවාසය වනාහි ලඝුකය. තොල් මනාව ස්පර්ශිතය. මුව විවර සිලිටුහ. දිව මෘදුය. ස්වරය මිහිරිය. වචනය වහා පරිවර්තනය වෙයි. එහෙයින් ඒ මොහොතේදී දේශනා කරන ලද ධර්මයන් මෙ පමණ වෙයි. තෙමසක් දේශනා කරන ලද ධර්මය අනන්තය. අප්‍රමාණමය. ආනන්ද ස්ථවිරයන් වහන්සේ වනාහි බහුශ්‍රැතයහ. ත්‍රිපිටක ධරයහ. ගාථා පන්ලක්ෂයක්, පද සැට දහසක් ලියමල් කඩන්නාක් මෙන්

සිටි පියෙහිම සිට ගන්නා සේක් ද කියවන සේක් ද දෙසන සේක් ද වෙති. මේ තෙරුන් වහන්සේගේ එක් උද්දේශ මාර්ගයකි. තෙරුන් වහන්සේගේ පද අනුව උදෙසීම් දෙන්නට අනිකෙක් නො හැක්කේ වෙයි. නො සපැමිණෙයි. සම්මා සම්බුදුරජාණන් වහන්සේ ම සපැමිණෙන සේක. මෙසේ අධිමාත්‍ර සිහි ඇති සේක. අධිමාත්‍ර ගති ඇති සේක. අධිමාත්‍ර ප්‍රඥා ඇති සේක. තථාගත ශ්‍රාවකයෙක් ශාස්තෲන් වහන්සේ විසින් තෙමසක් මේ අයුරින් දේශනා කරන ලද දේශනාව වර්ෂ සියයක් වර්ෂ දහසක් උගන්නේ වී නමුත් මුදුන්පමුණුවන්නට නො හැක්කේ වෙයි. මෙසේ තෙමසක් නිරතුරුව දේශනා කරන්නා වූ තථාගතයන් වහන්සේගේ කබලීකාහාර ප්‍රතිබද්ධ වූ ශරීරය කෙසේ යැපූ සේක් ද? පිළිදැගුම් කිරීමෙන්මය. බුදුරජාණන් වහන්සේලාගේ ඒ ඒ කාලය මනාව ව්‍යවස්ථාපනය කරන ලද්දේය. මනාව පිරිසිඳින ලදය. අතිශයින් ප්‍රත්‍යක්‍ෂය. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ දහම් දෙසන සේක් ම මිනිස් ලොව කාලය බලන සේක. උන්වහන්සේ පිඬුසිඟා වඩනා වේලාව සලකා නිර්මිත බුදුරුවක් මවා මේ නිර්මිත බුදුන්ගේ පාසිවුරු ගැනීම ස්වර විලාසය ආකල්ප මේ අයුරින් වේවයි මෙතෙක් දහම් දෙසාවායි අධිෂ්ඨාන කොට පාසිවුරු ගෙන අනෝතත්ත විලට වඩනා සේක. දේවතාවෝ නාලිය දැහැටු දෙති. ඒ වළඳ අනෝතත්ත විලෙහි සිරුර පිළිදැගුම් කොට මනොසිලා තලයෙහි සිටි සේක් සුරත් සඟළ සිවුර හැඳ සිවුර පෙරවා සිවුමහ රජුන් දුන් සිලාමය පාත්‍රය ගෙන උතුරුකුරු දිවයිනට වඩිනා සේක. ඉක්බිති පිණ්ඩපාතය ගෙන අනෝතත්ත විල්තෙර වැඩහිඳ එය වළඳ දිවා විහරණය පිණිස නන්දන වනයට වඩිනා සේක.

දම්සෙනෙවි සැරියුත් තෙරණුවෝ ද එහි වැඩ සම්මා සම්බුදුන්ට වත් කොට එකත්පසෙක වැඩහිඳින සේක. ඉක්බිති ශාස්තෲන් වහන්සේ උන්වහන්සේට නය දෙන සේක. ශාරිපුත්‍රය, මා විසින් මෙතෙක් ධර්මය දෙසන ලදැයි වදාරණ සේක. මෙසේ සම්මා සම්බුදුන් විසින් නය දෙන කල්හි පිළිසිඹියා පත් අග්‍රශ්‍රාවකයන් වහන්සේ නමකට නයදීම වෙරළෙහි සිට අත දිගහැර දක්වන ලද සමුද්‍රය මෙන් වෙයි. තෙරුන් වහන්සේට ද භාග්‍යවතුන් වහන්සේ විසින් නය සියයකින්, නය දහසකින්, නය ලක්‍ෂයකින් දේශනා කරන ලද ධර්මය වැටහේමය. ශාස්තෲන් වහන්සේ දිවා විහරණය පිණිස වැඩහිඳ දහම් දෙසා පාසිවුරු ගෙන කවර වේලාවක වඩනා සේක්ද යත්, සැවැත්නුවර වැසි සපැමිණි කුලපුත්‍රයන්ට ධර්මදේශනා කරන වේලාවක් ඇත. ඒ වේලාවට වඩිනා සේක. දහම් දෙසා එන්නහු

හෝ යන්නහු කවරෙක් දනිත් ද? කවරෙක් නො දනිත්ද? මහේශාක්‍ය දෙවියෝ දනිත්. අල්පේශාක්‍ය දෙවියෝ නොදනිත්. කවර හෙයින් නො දනිත් ද යත්, සම්මා සම්බුදුන්ගේ හෝ නිර්මිත බුදුන්ගේ හෝ රශ්මි ආදියෙහි වෙනසක් නැති හෙයිනි. උන්වහන්සේලා දෙදෙනාගේ ම රශ්මිවල හෝ ස්වරවල හෝ වචනවල හෝ වෙනසක් නැත. සැරියුත් තෙරුන් වහන්සේ ද බුදුන් විසින් දෙසන දෙසන ලද ධර්මය ගෙනවුත් තමන් වහන්සේ සද්ධිවිහාරික පන්සියයක් භික්ෂූන් වහන්සේලාට දෙසන සේක. මේ උන්වහන්සේලාගේ පූර්වයෝගයයි. උන්වහන්සේලා වනාහි කාශ්‍යප බුදුන්ගේ කාලයෙහි කුඩා වවුලු යෝනියෙක ඉපිද ගල්ලෙනක එල්බුනාහු අභිධර්මය දේශනා කරන ආභිධම්මික භික්ෂූන් දෙනමකගේ ස්වරයෙහි නිමිති ගෙන කෘෂ්ණපක්‍ෂ, ශුක්ල පක්‍ෂයන් - පච්පින් නොදැන නමුදු ස්වරයෙහි නිමිති ගත් පමණකින් ම කළුරිය කොට දෙව්ලොව උපන්නාහුය. එක් බුද්ධාන්තරයක් දෙව්ලොව වැස, ඒ කාලයෙහි මිනිස් ලොව උපන්නාහු යමාමහ පෙළහරෙහි පැහැදී තෙරුන් වෙත පැවිදි වූහ. තෙරුන් වහන්සේ බුදුරජාණන් වහන්සේ විසින් දෙසන දෙසන ලද ධර්මය ගෙනවුත් උන්වහන්සේලාට දෙසන සේක. සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ අභිධර්ම දේශනා අවසානයක් ඒ භික්ෂූන් වහන්සේලාගේ සප්ත ප්‍රකරණය උගෙනීමක් එක්වර ම විය.

අභිධර්ම වාචනා මාර්ගය නම් ශාරිපුත්‍ර ස්ථවිර ප්‍රභව කොට ඇත්තේය. මහා ප්‍රකරණයෙහි ගණන වාරය තෙරුන් විසින් ම තබන ලදී. තෙරුන් වහන්සේ ද මේ අයුරින් ධර්මාන්තරය නො මකාම සුවසේ ගන්නට දරන්නට නිතර පුහුණු කරන්නට කියවන්නට ද පොහොනේ යැයි ගණන වාරය තැබීය. මෙසේ ඇතිකල්හි තෙරුන්වහන්සේ පළමුව අභිධර්මිකයා වන සේක් ද? නොවන සේක. සම්මා සම්බුදුරජාණන් වහන්සේ ම ප්‍රථම ආභිධර්මිකයාණෝ වූ සේක. උන්වහන්සේ බෝධි පර්යංකයෙන් වැඩසිට එය ප්‍රතිවේධ කළ සේක. බුදුව වනාහි සත්දිනක් එක් පළඟින් වැඩහුන් සේක් උදන් ඇනූ සේක.

යදා හවෙ පාතුභවන්ති ධම්මා
ආතාපිනො ඣායතො බ්‍රාහ්මණස්ස
අථස්ස කංඛා වපයන්ති සබ්බා
යතො පජානාති සහෙතුධම්මං

**යදා හවෙ පාතුභවනති ධමමා**
**ආතාපිනො ඣායතො බ්‍රාහමණසස**
**අථසස කංඛා වපයනති සබබා**
**යතො බයං පචචයානං අවෙදි**

**යදා හවෙ පාතු භවනති ධමමා**
**ආතාපිනො ඣායතො බ්‍රාහමණසස**
**විධූපයං තිටඨති මාරසෙනං**
**සූරියො ව ඔභාසයනතන ලිකඛනති**

යනුයි.

(කෙලෙස් තවන වීර්ය ඇති) ධ්‍යාන වඩන, පව් දුරු කළ යෝගියාට යම් වේලාවක සත්තිස් බෝධිපාක්ෂික ධර්මයෝ පහළ වෙත් ද, එකෙණෙහි (අවිද්‍යාදි) හේතුසහිත වූ ධර්මය (අවිද්‍යාදි හේතුන් නිසා හටගත් දුක් රැස) දැන ගනී ද, ඉක්බිති ඔහුගේ සියලු සැක දුරුවෙයි.

කෙලෙස් තවන (වීර්ය ඇති) ධ්‍යාන වඩන පව් දුරුකළ යෝගියාට යම් වේලාවක සත්තිස් බෝධිපාක්ෂික ධර්මයෝ පහළ වෙද්ද, එකෙණෙහි ප්‍රත්‍යයන්ගේ ක්‍ෂයවීම දැනගත්තේ ද ඉක්බිති ඔහුගේ සියලු සැක දුරුවෙයි. කෙලෙස් තවන (වීර්ය ඇති) ධ්‍යාන වඩන පව් දුරුකළ යෝගියාට යම් වේලාවක සත්තිස් බෝධිපාක්ෂික ධර්මයෝ පහළ වෙද්ද, එකෙණෙහි අහස බබුළුවන සූර්යයා මෙන් මාරසේනාව කම්පා කරමින් සිටී.)

මේ ප්‍රථම බුද්ධවචන නම්. ධම්මපද භාණකයෝ වනාහි:-

**අනෙකජාති සංසාරං - සනධාවිසසං අනිබබිසං**
**ගහකාරකං ගවෙසෙනෙතා - දුකඛා ජාති පුනපපුනං**

**ගහකාරක දිටෙඨාසි - පුන ගෙහං න කාහසි**
**සබබා තෙ ඵාසුකා භගගා - ගහකූටං විසඞඛිතං**
**විසඞඛාරගතං චිත්තං - තණහානං ඛය මජඣගා**

(නැවත නැවත ඉපදීම දුකය. (එබැවින්) ආත්මභාව නමැති ගෙය කරන (තෘෂ්ණා නමැති) වඩුව සොයමින් නොයෙක් ගණන් ජාති ඇති

සසර (එකී වඩුවා දැකීමට සමත් බෝධිඥානය) එය නොලැබ ඇවිද්දෙමි. (එම්බා) වඩුව, (දැන්) තෝ දක්නා ලද්දෙහිය. නැවත (ආත්මභාව නමැති) ගෙය නො කරන්නෙහිය. තාගේ (කෙලෙස් නමැති) පරාල (මා විසින්) බිඳිනා ලදී. (අවිද්‍යාව නමැති) කැණිමඩල පළා දමන ලදී. (මාගේ) සිත නිවන කරා පැමිණියේය. තෘෂ්ණා ක්ෂය නමැති අර්හත්වය ලැබීමි) යනුයි.

මෙය ප්‍රථම බුද්ධ වචනය නමැයි කියත්.

යමහල් අතර වැදහොත්තා වූ සර්වඥයන් වහන්සේ විසින් පිරිනිවන් පානා සමයේදී 'හන්‍දදානි භික්‍ඛවෙ ආමනතයාමි වො වයධම්මා සංඛාරා අප්පමාදෙන සම්පාදෙථ'ති

(මහණෙනි, දැන් වනාහි තෙපි අමතමි. සංස්කාරයෝ නැසෙන සුල්ලෝය. (එබැවින්) එළඹ සිටි සිහියෙන් (සියලු පැවිදි කිස) සම්පූර්ණ කරව්. යනුවෙන් වදාළ වචනය පශ්චිම බුද්ධ වචනය නම්.

මේ දේසනාතුර පන්සාළිස් වසක් මුළුල්ලෙහි මල්දමක් නොගන්නාක් මෙන් ද රත්නාවලියක් අමුනන්නාක් මෙන් ද දේශනා කරන ලද අමෘත ප්‍රකාශක වූ සද්ධර්මය මධ්‍යම බුද්ධවචනය නම් වෙයි. ඒ සියල්ල ම සංග්‍රහ කරනු ලබනුයේ පිටක වශයෙන් තුන් පිටකයක් වෙයි. නිකාය වශයෙන් පංච නිකයෙකි. අංග වශයෙන් නවාංගයෙකි. ධර්මස්කන්ධ වශයෙන් ධර්මස්කන්‍ධ සුවාසූ දහසෙකි. කෙසේද යත්? මේ සියල්ල ම වනාහි පිටක වශයෙන් විනය පිටකය සූත්‍රාන්ත පිටකය, අභිධර්ම පිටකය යැයි තෙවැදෑරුම් ම වෙයි. එහි උභය ප්‍රාතිමෝක්ෂය, විභංග දෙක, දෙවිසි ස්කන්ධ, සොළොස් පරිවාරදැයි යන මේවා විනය පිටකය නම් වේ. බ්‍රහ්මජාලා ආදී වූ චතුත්‍රිංශස් (තිස්හතර) සූත්‍ර සංග්‍රහය දීඝනිකායයි. මූලපරියාය සූත්‍රය ආදී එකසිය පණහක් වූ සූත්‍ර සංග්‍රහය මජ්ඣිම නිකායයි. ඕඝතරණ සූත්‍රය ආදිකොට ඇති සූත්‍ර හත්දාස් හත්සිය හැටදෙකින් සමන්විත සූත්‍ර සංග්‍රහය සංයුත්ත නිකායයි. චිත්ත පරිදාන සූත්‍රය ආදිකොට ඇති සූත්‍ර නවදහස් පන්සිය පණස් හතකින් සමන්විත වූ සූත්‍ර සංග්‍රහය අංගුත්තර නිකායයි. ඛුද්දක පාඨ, ධම්මපද, උදාන, ඉතිවුත්තක, සුත්තනිපාත, විමානවත්‍ථු, පෙතවත්‍ථු, ථෙරගාථා, ථෙරීගාථා, ජාතක, නිද්දේස, පටිසම්භිදා, අපදාන, බුද්ධවංස, චරියාපිටක වශයෙන් වූ පසළොස්

ප්‍රභේද ඇති සූත්‍රය සංග්‍රහ ඛුද්දක නිකාය යැයි යනුවෙන් මේ සූත්‍රාන්ත පිටකයයි. ධම්මසංගණී ආදී වූ සප්තප්‍රකරණ අභිධර්ම පිටකය නම් වේ. එහි :-

විවිධ විශේෂ නය ඇති හෙයින් ද කය වචනය දෙක හික්මවන හෙයින් ද විනයාර්ථ දන්නවුන් විසින් මේ විනය විනයමැයි කියන ලදී.

මෙහි විවිධ නම් පස් වැදෑරුම් පාමොක් උදෙසීම් පාරාජිකා ද සප්ත ආපත්ති ස්කන්ධ මාතික විභංග ප්‍රභේද ආදී නයයි. විශේෂ නම් දැඩි කර්ම ලිහිල් කිරීම ප්‍රයෝජන කොට ඇති අනුප්‍රඥප්ති නයයි. මෙය වනාහි කායික වාචසික අධි ආචාරයන් වළක්වන හෙයින් කයත් වචනයත් හික්මවයි. එහෙයින් විවිධ නය ඇති බැවින්, විශේෂ නය ඇති බැවින්, කාය වාග් දෙක හික්මවන හෙයින් ද මේ විනය, විනය යයි කියන ලදී. එහෙයින් මෙය මෙහි වචනාර්ථ කෞෂල්‍ය පිණිස කියන ලදී.

**විවිධ විසෙසනයත්තා විනයනතො චෙව කායවාචානං**
**විනයත්ථ විදූහි අයං විනයො විනයොති අක්ඛාහොති**

අනෙකක් ද වනාහි :-

**අත්ථානං සූචනතො සුවුත්තතො සවනථො ථ සූදනතො**
**සුත්තාණා සුත්ත සභාගතො ච සුත්තං සුත්තන්ති අක්ඛාතං**

එය වනාහි ආත්මාර්ථ පරාර්ථ ආදී ප්‍රභේද ඇති අර්ථයන් ප්‍රකාශ කරයි. වෛනෙය්‍යයන්ගේ අදහසට අනුලෝම්ව කියන ලද හෙයින් මෙහි අර්ථ මනාව කියන ලද්දේ ද වෙයි. මෙය සශ්‍ය ඵලයන් රැස්කරන්නාක් මෙන් අර්ථ රැස් කෙරේනුයි 'පසවති' යැයි කියන ලදි. 'සූදති' යන මෙයද දෙන කිරි මෙන් (අර්ථ) වගුරුවයි යැයි කියන ලද්දේ වෙයි. ඒ අර්ථයන් මනාව පාලනය කරයි. රකී යැයි කියන ලද්දේ වෙයි. මෙය සූත්‍රයනට - නූලකට සමාන වන්නේ ද වෙයි. යම්සේ වඩුවන්ය. නූල ප්‍රමාණ වෙයි ද, නුවණැතියන්ට මෙයත් එසේමය. යම්සේ වනාහි නූලෙහි එක්රැස් කරන ලද - අමුණන ලද මල් නො විසිරේ ද, විනාශ නොවේ ද, එපරිද්දෙන් මෙයින් අර්ථ සංග්‍රහ කරන ලද්දේ වෙයි. එහෙයින් මෙහි වචන කෞශල්‍යය සඳහා (මෙය) කියන ලදී.

**අත්ථානං සූචනතො - සුවුත්තතො සවනතො ථ සූදනතො**
**සුත්තාණා සුත්ත සභාගතො ච සුත්තං සුත්තනති අක්ඛාතං**

(අර්ථ ප්‍රකාශ කරන නිසා ද, මනාව අර්ථ කියන ලද නිසා ද, අර්ථ රැස්කරන නිසා ද අර්ථ වගුරුවන නිසා ද මනාව පාලනය කරන නිසා ද සූත්‍රයක් - නූලක් හා සමාන නිසා ද සූත්‍රය, සූත්‍රය යැයි කියන ලදී.)

අභිධර්මයේ වචනාර්ථ කියන ලද්දේ මය. තවත් නයෙක් වෙයි.

මෙහි යමක් ඍද්ධිමත් ද, ලක්‍ෂණ සහිත ද, පූජිත ද පිරිසිඳින ලද ද අධික ධර්මය කියන ලද ද, එහෙයින් අභිධර්මය යැයි කියන ලදී.

මේ අභිශබ්දය වනාහී වෘද්ධි, සලක්‍ෂණ, පූජිත, පරිච්ඡේද අධික යන අර්ථයන්හි දක්නා ලැබේ. ඒ මෙසේය. 'බාළ්හා මෙ ආවුසො! දුක්ඛා වෙදනා අභික්කමන්ති නො පටික්කමන්ති' යන ආදියෙහි වෘද්ධියෙහි ආයේ ය. 'යා තා රත්තියො අභිඤ්ඤාතා අභිලක්ඛිතා' යන ආදියෙහි සලක්‍ෂණායෙහිය. 'රාජාභිරාජා මනුජින්දො' යන ආදියෙහි පූජිතාර්ථයෙහිය. 'පටිබලො විනෙතුං අභිධම්මෙ අභිවිනයෙ' යන ආදියෙහි පිරිසිඳීමෙහි ය. අන්‍යෝන්‍ය සංකර (සම්මිශ්‍රණ) විරහිත ධර්මයෙහි හා විනයෙහි යැයි කියන ලද්දේ වෙයි. 'අභික්කන්තෙන වණ්ණෙන' යන ආදීන්හි අධිකයෙහිය. 'රූපූපපත්තියා මග්ගං භාවෙති මෙත්තා සහගතෙන චෙතසා එකං දිසං ඵරිත්වා විහරති' යන ආදී නයෙන් වෘද්ධිමත්හු ද ධර්මය යැයි කියන ලදී. 'රූපාරම්මණං වා සද්දාරම්මණං වා' යන ආදි නයින් අරමුණු ආදියෙහි ලක්‍ෂණියත්වය ඇති හෙයින් සලක්‍ෂණ ද ගැනේ. 'සෙක්ඛා ධම්මා අසෙක්ඛා ධම්මා ලොකුත්තරා ධම්මා' යන ආදී නයින් පූජිතධර්ම ගැනේ. පූජාර්හ යනු අදහසයි.

'ඵස්සො හොති වෙදනා හොති' ආදී නයින් ස්වභාවය පිරිසිඳින ලද හෙයින් පිරිසිඳීම් ද ගැනේ. 'මහග්ගතා ධම්මා අප්පමාණා ධම්මා අනුත්තරා ධම්මා' යනාදී නයින් අධික ධර්මයෝ ද කියන ලදහ. එහෙයින් මෙහි වචනාර්ථ කෞශල්‍යය පිණිස කියන ලදී.

යම් හෙයකින් මෙහි වෘද්ධිමත් ධර්මය සලක්‍ෂණ ධර්ම පූජිත ධර්ම, පරිච්ඡින්න ධර්ම, අධිකාර්ථ ධර්ම වේද එහෙයින් අභිධර්මය යැයි කියන ලදී.

මෙහි වනාහි යමක් අවශේෂ වීද එයඃ-

පිටකාර්ථයන් දන්නා ආචාර්යවරු පර්යාප්ති භාජන අර්ථ වශයෙන් යමක් පිටක යැයි කීවාහු ද එයත් සමග සමෝධානය කොට විනය ආදී ත්‍රිපිටකයම දතයුතුයි.

පර්යාප්තිය ද 'මා පිටක සම්පදානෙන' යන ආදීන්හි පිටකයැයි කියනු ලැබේ. 'අථ පුරිසො ආගච්ඡෙය්‍ය කුද්දාල පිටකං ආදාය' යන ආදීන්හි යම්කිසි භාජනය ද ගැනේ. එහෙයින් පිටකාර්ථ දන්නෝ පර්යාප්ති භාජන යන අර්ථ වශයෙන් කීහ. දැන් එය හා සමෝධානය කොට විනයාදි පිටක තුන දතයුතුයි යනුයි. එහෙයින් මෙසේ දෙවැදෑරුම් අර්ථ ඇති පිටක ශබ්දය සමග සමාස කොට විනය වූයේත් එම පිටක වූයේත් එම යැයි පර්යාප්ති වශයෙන් ද ඒ ඒ අර්ථයට භාජන වන හෙයින් දැයි = විනය පිටක නමි. කියන ලද ක්‍රමය අනුව ම 'සුත්තඤ්ච තං පිටකඤ්චාති සුත්ත පිටකං (සූත්‍ර වූයේත් එම පිටක වූයේත් එම නුයි සූත්‍ර පිටක නමි.) 'අභිධම්මො ච සො පිටකං චා ති අභිධම්මං පිටකං' (අභිධර්ම වූයේත් එම පිටක වූයේත් එම නුයි අභිධර්ම පිටක නමි.) යැයි මෙසේ මේ විනය ආදී තුන්පිටකය ම දතයුතුයි. මෙසේ දැන ද වනාහි ඒ පිටකයන්හි නානාප්‍රකාර කෞශල්‍යය සඳහා ඒවා අතුරෙන් ආඥා වෝහාරාදි දේශනා, යථාපරාධ ආදී සාසනා, සංවරා සංවර ආදී කථා, භේද, ශික්‍ෂා ප්‍රහාණ, ගම්භීරතාව යන මේවා සුදුසු පරිදි දක්වන්නේ ය.

පර්යාපති භේදය යන තැනකදී භික්‍ෂුව යම් සම්පත්තියකට විපත්තියකට පැමිණේ ද ඒ සියල්ල ද (මෙහි) දැක්වෙන්නේ ය. මේ එහි දැක්වීම හා විස්තර කිරීමය. මේ තුන්පිටකය යථානුලෝම, යථාධම්ම යන මේවා සාසනය, සංවරා සංවර දිට්ඨි විනිවෙඨන, නාමරූප පරිච්ඡේද යන මේ කථායැයි කියනු ලැබේ. මෙහි විනය පිටකය ආඥාරහ බුදුන් විසින් ආඥා බහුල වශයෙන් දෙසූ හෙයින් ආඥාදේසනාය, සූත්‍රාන්ත පිටකය ව්‍යවහාර කුශල වූ බුදුන් විසින් ව්‍යවහාර බහුල වශයෙන් දෙසූ හෙයින් වෝහාර දේසනාය. අභිධර්මය පරමාර්ථ කුශල වූ බුදුන් විසින් පරමාර්ථ බහුල වශයෙන් දෙසූ හෙයින් පරමාර්ථ දේශනා යැයි කියනු ලැබේ.

එසේ ම පළමුව යම් ඒ බොහෝ අපරාධ ඇති සත්ත්වයෝ වෙත් ද ඔවුහු අපරාධය පරිදි මෙහිදී අනුශාසනා කරන ලදහයි = යථාපරාධ

සාසනයි. දෙවනුව, නොයෙක් අදහස්, අනුසය, චරියා ඇති සත්ත්වයෝ අනුපිළිවෙළින් මෙහි අනුසාසන කරන ලදහයි = යථානුලෝම සාසනයි. තෙවනුව, ධර්ම පුඤ්ජ මාත්‍රයෙක මමය මාගේය යන සංඥා ඇති සත්ත්වයෝ ධර්මය අනුව මෙහිදී අනුශාසනා කරන ලදහයි = යථාධම්ම සාසන යැයි කියනු ලැබේ.

එසේ ම පළමුව, අධිආචාරය (ඉක්මවා හැසිරීම්) ප්‍රතිපක්ෂ වූ සංවරාසංවර මෙහි කියන ලදැයි = සංවරා සංවර කථා යි. සංවරාසංවර යනු කුඩා වූද මහත් වූද සංවරා සංවරයි. කම්මා කම්ම - ඵලාඵල මෙනි. දෙවනුව දෙසැට දෘෂ්ටීන්ට ප්‍රතිපක්ෂ වූ දෘෂ්ටි විනිශ්චය නය (දෘෂ්ටි ලිහීම) මෙහි කියන ලදැයි දිට්ඨි විනිවෙඨන කථා යි. තෙවනුව, රාගාදීන්ට ප්‍රතිපක්ෂ වූ නාමරූප පරිච්ඡේදය මෙහි කියන ලදැයි = නාමරූප පරිච්ඡේද කථා යැයි කියනු ලැබේ.

මේ තුනෙහිදීම ත්‍රිවිධ ශික්ෂා, ත්‍රිවිධ ප්‍රහාණ, චතුර්විධ ගම්භීර භාවය ද දතයුතුයි. ඒ එසේමැයි. විනය පිටකයෙහි විශේෂයෙන් අධිශීල ශික්ෂාව කියන ලදී. සූත්‍රාන්ත පිටකයෙහි අධිචිත්ත ශික්ෂාව කියන ලදී. අභිධර්ම පිටකයෙහි අධිප්‍රඥා ශික්ෂාව කියන ලදී. විනය පිටකයෙහි ව්‍යතික්‍රමණ ප්‍රහාණය නම් කෙලෙසුන්ගේ ව්‍යතික්‍රමණය ශීලයට ප්‍රතිපක්ෂ බැවිනි. සූත්‍රාන්ත පිටකයෙහි පරියුට්ඨාන (කෙලෙසුන්ගේ නැගිටීම) ප්‍රහාණය නම් පරියුට්ඨානය සමාධියට ප්‍රතිපක්ෂ බැවිනි. අභිධර්ම පිටකයෙහි අනුසය ප්‍රහාණය නම් අනුසය ප්‍රඥාවට ප්‍රතිපක්ෂ බැවිනි. පළමුවැන්නෙහි කෙලෙසුන්ගේ තදංග ප්‍රහාණයයි. අනෙක් දෙකෙහි විෂ්කම්භන සමුච්ඡේද ප්‍රහාණයෝයි. පළමුවැන්නෙහි දුශ්චරිත සංක්ලේශයාගේ ප්‍රහාණයයි. මෙහි එකිනෙකෙහි ද චතුර්විධ වූ ධර්ම - අර්ථ - දේශනා - ප්‍රතිවේධ ගම්භීරභාවද දතයුතුයි. එහි ධර්ම නම් පෙළයි. අර්ථ නම් එහිම අර්ථයයි. දේශනා නම් මනසින් ව්‍යවස්ථාපනය කරන ලද ඒ පෙළ දේශනා කිරීමයි. ප්‍රතිවේධ නම් පෙළෙහි ද පෙළේ අර්ථයෙහි ද යථාභූත අවබෝධයයි. මේ තුනෙහිම මෙකී ධර්ම - අර්ථ - දේශනා - ප්‍රතිවේධ යන මේවා යන ආදීන් විසින් මහා සමුද්‍රය මෙන් මන්දබුද්ධිකයන් විසින් බැසගත නො හැක්කේ ය. නො ලැබිය හැකි ප්‍රතිෂ්ඨා ඇත්තේ ය. එහෙයින් ගැඹුරු ය. මෙසේ මෙහි එකිනෙකෙහි චතුර්විධ ගාම්භීරභාවය දතයුතුයි.

තවත් නයෙකි. ධර්මය නම් හේතුවයි. මෙය කියන ලද්දේමය. 'හෙතුම්හි ඤාණං ධම්ම පටිසම්භිදාති' හේතුවෙහි ඤාණය ධම්ම පටිසම්භිදා

යනුයි. අර්ථය නම් හේතුඵලයයි. මෙය කියන ලද්දේ ම ය. 'හෙතුඵලෙ ඤාණං අත්ථපටිසම්භිදා' ති, හේතුඵලයෙහි ඤාණය අත්ථපටිසම්භිදා යනුයි. දේසනා නම් පඤ්ඤත්තිය යි. අනුලෝම, ප්‍රතිලෝම සංක්ෂේප විස්තර ආදී වශයෙන් හෝ කීමයි. ප්‍රතිවේධ යනු අභිසමයයි. එය ද ලෞකික ලෝකෝත්තර වේ. විෂය වශයෙන් ද ධර්මයට අනුවද පැණවීම (දේසනා හැරීම) සුදුසු පරිදි කරන ලද ප්‍රඥප්තීන්හි (ධර්මයන්හි) අවබෝධය ද, ඒ ඒ හෝ ඒ ඒ තැන්හි කියන ලද ධර්මයන්ගේ ප්‍රතිවේධ කළයුතු වූ සලක්ෂණ නම් වූ අවිපරීත ස්වභාවයයි. දැන් යම්හෙයකින් මේ පිටකයන්හි යම් යම් ධර්ම සමූහයක් හෝ අර්ථ සමූහයක් වේද, යම් යම් අයුරෙකින් දැන්විය යුතු අර්ථයක් වේද, එය අසන්නවුන්ගේ ඤාණයට අභිමුඛ වේද, ඒ ඒ අයුරින් ඒ ඒ අර්ථය බබළවන දේශනයක් වේද, මෙහි අවිපරීත අවබෝධය නම් වූ යම් ප්‍රතිවේධයක් වේද, ඒ ඒ ධර්මයන්ගේ හෝ ප්‍රතිවේධ කරගත යුතු වූ සලක්ෂණ නම් වූ අවිපරීත ස්වභාවයක් වේද, මේ සියල්ල රැස් නොකරන ලද කුසල සම්භාරයන් ඇති අඥානය විසින් යන ආදීන් විසින් මහා සමුද්‍රය මෙන් බැසගත නොහැක්කේ ද, ප්‍රතිෂ්ඨා නැත්තේ ද වෙයි. එහෙයින් ගැඹුරුය. මෙහි ද එකිනෙකෙහි සිව්වැදෑරුම් ගැඹුරු බව දතයුතුයි. මෙපමණකින් ද:-

**දෙසනා සාසන කථා භෙදං තෙසු යථාරහං**
**සික්ඛාපපහාණ ගම්භීර භාවඤ්ච පරිදීපයෙ**

මෙසේ මේ ගාථාව කියහ ලද අර්ථ ඇත්තේ වෙයි.

**පරියත්ති භෙදං සම්පත්තිං විපත්තිඤ්චාපි යං යහිං**
**පාපුණාති යථා භික්ඛු තමපි සබ්බං විභාවයෙති**

මෙහි වනාහි තුන් පිටකයන්හි ත්‍රිවිධ පර්යාප්ති භේදය දතයුතුයි. පර්යාප්ති වනාහි තුනෙකි. 'නිවන අර්ථකොට ඇති අලගද්දූපමාව භාණ්ඩාගාරික පර්යාප්තියයි' යන එහි වරදවා ගන්නා ලද යම් පරවාදයෙහි දොස් නැගීම ආදී හේතු ප්‍රගුණ කරන ලද ද? (උගන්නා ලදද) මේ අගලද්දූපමාව ඒ සඳහා කියන ලදී. 'මහණෙනි, සර්පයන්ගෙන් ප්‍රයෝජන ඇති සර්පයන් සොයන්නා වූ සර්පයන් සෙවීමෙහි යෙදුණා වූ පුරුෂයෙක් යම් සේ වේද, හෙතෙම මහත් සර්පයකු දක්නේ ය. ඒ සර්පයා දරණයෙන් හෝ නගටෙන් හෝ අල්ලා ගන්නේ ය. ඒ සර්පයා ආපසු හැරී ඔහුගේ

අත හෝ බාහුව හෝ අන් අඟපසඟයෙන් හෝ දෂ්ට කරන්නේ ය. හෙතෙම ඒ හේතුවෙන් මරණයට හෝ මරණය පමණ වූ දුකකට හෝ පැමිණෙයි. ඒ කවර හෙයින්ද යත්, මහණෙනි, සර්පයා වැරදි ලෙස ගත් හෙයිනි. මහණෙනි, එපරිද්දෙන් ම මේ මේ සාසනයෙහි ඇතැම් හිස් පුරුෂයෝ සූත්‍ර -පෙ- වේදල්ල යන මේ ධර්ම උගනිත්. ඔවුහු ඒ ධර්ම උගෙන ඒ ධර්මයන්ගේ අර්ථය නුවණින් පරීක්ෂා නො කරත්. නුවණින් අර්ථය පරීක්ෂා නොකරන ඔවුන්ට ධර්මයෝ නො වැටහෙත්. ඔවුහු පරවාදයෙහි දොස් නැගීම අනුසස් කොට ඇත්තාහු ද, මෙසේ වාදයෙන් මිදෙමුයි යන්න ප්‍රයෝජන කොට ඇත්තාහු ද ධර්මය උගනිත්. යමක් සඳහා ධර්මය උගනිත් නම්, ඒ අර්ථය ද නොලබත්. වරදවා ගන්නා ලද ඒ ධර්මයෝ ඔවුන්ට බොහෝ කලක් අහිත පිණිස දුක් පිණිස පවතිත්. ඒ කවර හෙයින් ද යත්? මහණෙනි, ධර්මය වරදවා උගත් හෙයිනි' යනුයි. යමක් වනාහි නොව ඉගෙන ගන්නා ලද්දේ ද? ශීලස්කන්ධාදිය සම්පූර්ණ කිරීම ම බලාපොරොත්තුවෙන් උගන්නා ලද ද? පරවාදයෙහි දොස් නැගීම් හේතුවෙන් නොවේ ද? මෙය නිවන ප්‍රයෝජන කොට ඇත්තේ ය. එය සඳහා ම කියන ලදී.

"මනාව උගත් ඔවුන්ගේ ඒ ධර්මයෝ බොහෝ කලක් හිත පිණිස, සුව පිණිස පවතිත්. ඊට හේතු කවරේ ද? යත්? මහණෙනි, ධර්මයන් මනාව උගත් හෙයිනි.' යනුයි. පිරිසිඳ දන්නා ලද පංච ස්කන්ධයන් ඇති, කෙලෙස් ප්‍රහීණ කළ, වඩනා ලද සිවුමග ඇති ප්‍රතිවිරුද්ධ කෙලෙසුන්ගෙන් වෙනස් නොවන සාක්ෂාත් කළ නිවන් ඇති යම්බඳු ඒ රහතන් වහන්සේ හුදෙක් ප්‍රවේණි පාලනය පිණිස, වංශය ආරක්ෂා කිරීම පිණිස උගනී. මේ භාණ්ඩාගාරික පර්යාපතියයි යනුයි.

විනයෙහි වනාහි මනාව පිළිපන් භික්ෂුව සීල සම්පත්තිය නිසා ත්‍රිවිද්‍යාවන්ට පැමිණේ. ඒ ත්‍රිවිද්‍යාවන්ගේ ද එහි ප්‍රභේද වචනයන්ගේ ද වශයෙනි. සූත්‍රයෙහි මනාව පිළිපන්නේ සමාධි සම්පත්තිය නිසා ෂට් අභිඥාවන්ට පැමිණේ. ඒ ෂට් අභිඥාවන්ගේ ද එහි ප්‍රභේද වචන වශයෙනි. අභිධර්මයෙහි මනාව පිළිපන්නේ ප්‍රඥා සම්පත්තිය නිසා සිව්පිළිසිඹියාවන්ට පැමිණේ. එකී සිව්පිළිසිඹියාවන්ගේ ද එහි ප්‍රභේද වචන ද වශයෙනි. මෙසේ විනය සූත්‍ර අභිධර්මයන්හි මනාව පිළිපන්නේ පිළිවෙළින් මේ ත්‍රිවිද්‍යා ෂට්අභිඥා, සිව් පිළිසිඹියා යන ප්‍රභේද ඇති සම්පත්තියට පැමිණේ. විනයෙහි වනාහි වැරදි ලෙස පිළිපන් නො අනුදත් සුවපහස් ඇතිරිලි

ප්‍රතික්ෂේප කරන ලද දැඩිව ගන්නා ලද ස්පර්ශාදියෙහි අනවද්‍ය සංඥා ඇත්තේ වෙයි. මෙය කියන ලද්දේ ද වෙයි. 'යම් අන්තරායකර ධර්ම කෙනෙක් අන්තරායකරහයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලද්දාහු නම් ඒ ධර්මයෝ සේවනය කරන්නා හට යම්සේ අන්තරාය පිණිස අසමර්ථයහ ද මම භාග්‍යවතුන් වහන්සේ විසින් වදාළ ඒ ධර්මය එසේ දනිමි'යි එයින් දුශ්ශීලභාවයට පැමිණෙයි. සූත්‍රයෙහි වැරදි ලෙස පිළිපන්නේ 'මහණෙනි, ලෝකයෙහි මෙබඳු පුද්ගලයෝ සතරදෙනෙක් විද්‍යමාන වෙත්' ආදියෙහි අදහස නොදන්නේ වැරදි දෘෂ්ටියක් ගනී.

"තමා විසින් ගන්නා ලද මිථ්‍යාදෘෂ්ටියෙන් අප ද අභිබවා කියයි. තමා ද ගුණයෙන් සාරා දමයි. බොහෝ අකුසල් ද රැස් කරයි" යන මෙය ඒ සඳහා වදාරන ලදී. එයින් මිථ්‍යාදෘෂ්ටි බවට පැමිණෙයි. අභිධර්මයෙහි වැරදි ලෙස පිළිපන්නේ දහම් සිත අතිධාවනය කරන්නේ නොසිතිය යුතු දේ ද සිතයි. එයින් සිතේ කැළඹීමට පත්වෙයි. මෙය ද වදාරන ලදී. 'මහණෙනි, යමක් සිතන තැනැත්තේ උමතු බවට පීඩාවට පත්වේ නම් එබඳු නොසිතිය යුතු මේ අචින්ත්‍යයෝ සතර දෙනෙකි" යනුයි. මෙසේ මෙකී ධර්මයන්හි වැරදි ලෙස පිළිපන්නේ පිළිවෙළින් දුශ්ශීල, මිථ්‍යාදෘෂ්ටි චිත්තක්ෂෙප යන ප්‍රභේද ඇති විපත්තියට පැමිණේ. මෙපමණකින් ද

**පරියත්ති භෙදං සම්පත්ති විපත්ති වාචි යං යහිං**
**පාපුණාති යථා භික්ඛු තමපි සබ්බං විභාවයෙ**

යනුයි.

මේ ගාථාව ද කියන ලද අර්ථ ඇත්තේ වෙයි. මෙසේ නානා ප්‍රකාරයෙන් පිටකයන් දැන ඒ පිටකයන් ගේ වශයෙන් සංග්‍රහ කරනු ලබන මේ සියල්ල ම තුන් පිටකය වෙයි. නිකාය වශයෙන් පංච නිකාය කෙසේ ද යත් මේ සියල්ල ම වනාහි, දීඝනිකාය, මජ්ඣිම නිකාය, සංයුත්ත නිකාය, අංගුත්තර නිකාය, ඛුද්දක නිකාය යැයි පංචභේද ඇත්තේ වෙයි. එහි දීඝනිකාය කවරේ ද? වර්ග තුනකින් සංග්‍රහ කරන ලද බ්‍රහ්මජාලාදි සූතිස් සූත්‍රයෝ ය.

**චතුත්තිංසෙව සුත්තන්තා තිවග්ගො යස්ස සංගහො**
**එස දීඝනිකායොති පඨමො අනුලොමිකො**

(යම් නිකායක සංග්‍රහය සූත්‍ර සූතිසෙකින් ද වර්ග තුනකින් යුක්ත ද එය පිළිවෙළින් පළමු දීඝනිකාය යි.)

කවර හෙයින් මෙය දීඝනිකාය යැයි කිත්ද? දීර්ඝප්‍රමාණ වූ සූත්‍රයන්ගේ සමූහයක් වශයෙන් හා නිවාසයක් වශයෙනි. සමූහ නිවාස ඇත්තෝ ද නිකාය යැයි කයනු ලබත්. 'මහණෙනි, මම සිත වැනි අන් එක නිකායක්වත් නො දකිමි. මහණෙනි, යම්සේ තිරිසන්ගත ප්‍රාණීහූ පොතික නිකාය, විකබලික නිකාය'යැයි මේ ආදිය මෙහිදී සායනයෙනුත් ලෝකයෙනුත් සාධකයි. මෙසේ සෙස්සන්ගේ ද නිකායභාවයෙහි වචනාර්ථය දතයුතුයි. මජ්ඣිමනිකාය නම් කවරේ ද? මධ්‍යමප්‍රමාණ වූ වර්ග පසළොසකින් සංග්‍රහ කරන ලද මූලපරියාය සූත්‍රාදී එකසිය පණස් දෙකක් වූ සූත්‍රයෝ ය.

දියඩ්ඩසත සුත්තන්තා - ද්වෙ ච සුත්තානි යස්ස සො
නිකායො මජ්ඣිමො - පඤ්චදසවග්ග පරිග්ගහො

යම් නිකායෙක්හි සූත්‍රාන්ත එකසිය පණස් දෙකක් වේ ද, වර්ග පසළොසකින් සංග්‍රහ කරන ලද ද එය මජ්ඣිම නිකාය යි.

සංයුත්ත නිකාය යනු කවරේ ද? දේවතා සංයුත්ත ආදී වශයෙන් සිටි ඕඝතරණ සූත්‍රය ආදී වූ සත්දහස් සත්සිය හැටදෙකක් සූත්‍රයෝ ය.

සත්ත සුත්ත සහස්සානි සත්ත සුත්ත සතානි ච
ද්වාසට්ඨි චෙව සුත්තන්තා එසො සංයුත්ත සංගහො
(යැයි කීයේ ද එය ම ය.)

අංගුත්තර නිකාය නම් කවරේ ද? එක් අංගය අතිරේක වශයෙන් සිටි චිත්ත පරියාදාන ආදී වූ නවදාස් පන්සිය පණස්හතක් සූත්‍රයෝ ය.

නව සුත්ත සහස්සානි - පඤ්ච සුත්ත සතානිච
සත්ත පඤ්ඤාස සුත්තානි - සංඛා අංගුත්තරෙ අයං

ගණනින් සූත්‍ර නවදහසක් ද, සූත්‍ර පන්සියයක් ද සූත්‍ර පණස්හතක් වූ මෙය අංගුත්තර නිකාය යි.

බුද්දක නිකාය කවරේ ද?

**ඨපෙත්වා චතුරො පෙතෙ නිකායෙ දීඝ ආදිකෙ**
**තදඤ්ඤං බුද්ධවචනං නිකායො ඛුද්දකො ම තො**

දීඝනිකාය ආදී සතර නිකායන් හැර අන්‍ය වූ බුද්ධ වචනය බුද්දක නිකාය යැයි දන්නා ලදී යනුයි.

මුළු විනය පිටකය, අභිධර්ම පිටකය, පළමු දක්වන ලද පසළොස් ප්‍රභේද ඇති බුද්දකපාඨ ධම්මපදාදිය අවශේෂ බුද්ධ වචනයෝ ය.

මෙසේ නිකාය වශයෙන් නිකාය පසක් වෙයි. කෙසේ නම් අංග වශයෙන් නවයෙක් වී ද, මේ සියල්ලම වනාහි 'සුත්ත - ගෙය්‍ය - වෙය්‍යාකරණ - ගාථා - උදාන - ඉතිවුත්තක - ජාතක - අබ්භූත ධම්ම - වෙදල්ල' යැයි නවප්‍රභේද වෙයි. එහි උභතොවිභංග - නිද්දෙස - ඛන්ධක - පරිවාර - සුත්ත නිපාතයෙහි මංගල සූත්‍රය - රතන සූත්‍රය - නාලක සූත්‍රය - තුවටක සූත්‍ර හා වෙනත් සූත්‍ර නාමක වූ තථාගත වචනය සූත්‍රයැයි දතයුතුයි. සියලුම ගාථා සහිත සූත්‍ර ගෙය්‍ය යැයි දතයුතුයි. විශේෂයෙන් සංයුත්ත නිකායෙහි මුළු සගාථක වර්ගය (මීට අයත් ය) මුළු අභිධර්ම පිටකය, ගාථා රහිත සූත්‍ර, (ඉහත කී) අෂ්ඨාංගයන්ට සංග්‍රහ නොවූ වෙනත් යම් බුද්ධවචනයක් වේ ද එය වෙය්‍යාකරණයැයි දතයුතුයි. ධම්මපද - ථෙරගාථා - ථෙරීගාථා සුත්ත නිපාතයෙහි සූත්‍ර නාමික නො වූ ශුද්ධ ගාථා ද ගාථා යැයි දතයුතුයි. සෝමනස්ස ඤාණමයික ගාථා පටිසංයුත්ත දෙ අසූවක් සූත්‍රාන්තයෝ උදාන යැයි දතයුත්තාහ.

**වුත්තඤ්හෙතං භගවතා** යන ආදී වූ නයෙන් පැවති එකසිය දහයක් සූත්‍රාන්තයෝ ඉතිවුත්තක යැයි දතයුත්තාහ. අපණ්ණක ජාතකය ආදී වූ පන්සිය පණස් ජාතක, ජාතක යැයි දතයුතුයි. 'චත්තාරො මෙ භික්ඛවෙ ! අච්ඡරියබ්භූතා ධම්මා ආනන්දෙ' යන ආදී නයින් පැවති සියලු ම ආශ්චර්ය අද්භූත ධර්ම ප්‍රතිසංයුත්ත වූ සූත්‍රාන්තයෝ අබ්භූතධම්ම යැයි දතයුත්තාහ. චූල්ලවේදල්ල - මහාවේදල්ල - සම්මා දිට්ඨි - සක්කපඤ්හ - සංඛාර භාජනීය - මහා පුණ්ණමසුත්ත ආදී වූ වේදයත් තුෂ්ටියත් ලබමින් විචාරන ලද සියලු ම සූත්‍රාන්ත වේදල්ලයැයි දතයුතුයි. මෙසේ මෙය අංග වශයෙන් නවයෙකි. ස්කන්ධ වශයෙන් සුවාසූ දහසක් ධර්මස්කන්ධ වන්නේ කෙසේ ද යත්, මේ සියලු ම බුද්ධ වචනය :

අසූ දෙදාහක් බුදුන්ගෙන් ගතිමි. දෙදහසක් භික්ෂූන්ගෙන් (ගතිමි) පවත්නා වූ මේ ධර්මයෝ අසූහාර දහසක් වෙති.

මෙසේ දක්වන ලද ධර්මස්කන්ධ වශයෙන් අසූහාර දහසක් ප්‍රභේද වෙයි. එහි අනුසන්ධි එකක් සූත්‍රය එක් ධර්මස්කන්ධයෙකි. යම් සූත්‍රයක් නොයෙක් අනුසන්ධි ඇත්තේ නම් අනුසන්ධි වශයෙන් ධර්මස්කන්ධ ගිනීම වේ. ගාථා බන්ධනයන්හි ප්‍රශ්න විචාරීම එක් ධර්ම ස්කන්ධයකි. විසඳීම එකකි. අභිධර්මයෙහි එක් එක් තික දුක බෙදීම්, එක් එක් චිත්තවාර බෙදීම් එක් එක් ධර්මස්කන්ධයෙකි. විනයෙහි අත්‍ථිවත්‍ථු, අත්‍ථිමාතිකා, අත්‍ථිපද භාජනීය, අත්‍ථි ආපත්ති, අත්‍ථි අනාපත්ති, අත්‍ථි අන්තරාපත්ති, අත්‍ථි තිකචෙඡද යන මෙහි එක් එක් කොට්ඨාසයක් එක් එක් ධර්මස්කන්ධයකැයි දතයුතුය. මෙසේ ධර්මස්කන්ධ වශයෙන් අසූහාර දහසෙක් වෙයි. මෙසේ මේ සියලු ම බුද්ධවචනය පංචසත්ත සංගීති කාලයෙහි සංගායනා කරන්නා වූ මහා කාශ්‍යප හිමියන් ප්‍රමුඛ රහතන් වහන්සේලා විසින් මේ ධර්මයයි, මේ විනයයි, මේ ප්‍රථම බුද්ධ වචනයි, මේ මධ්‍යම බුද්ධ වචනයයි. මේ පශ්චිම බුද්ධ වචනයයි. මේ විනය පිටකයයි. මේ සූත්‍රාන්ත පිටකයයි. මේ අභිධර්ම පිටකයයි. මේ දීඝනිකායයි. -පෙ- මේ ඛුද්දක නිකායයි, මේ සූත්‍රාදී නවාංගයෝයි. මේ සුවාසූ දහසක් ධර්ම ස්කන්ධයෝයැයි මේ ප්‍රභේදය ව්‍යවස්ථාපනය කොට ම සංගායනා කරන ලදී. හුදෙක් මෙ පමණක් ම නොවේ. අනිකුදු උද්‍යාන සංග්‍රහ, වර්ග සංග්‍රහ, පෙය්‍යාල සංග්‍රහ, එකනිපාත දුක නිපාත ආදී නිපාත සංග්‍රහ සංයුත්ත සංග්‍රහ, පණ්ණාස සංග්‍රහාදී අනේකවිධ වූ ත්‍රිපිටකයෙහි දක්නට ලැබෙන සංග්‍රහ ප්‍රභේද ව්‍යවස්ථාපනය කොට ම සත්මසෙකින් සංග්‍රහ කරන ලදී. සංගීතිය අවසානයේ දී මහාකාශ්‍යප තෙරුන් විසින් මේ බුදුන්ගේ ශාසනය අවුරුදු පන්දහසක් පමණ කල් පැවැත්මට සමත් වූවක් කරන ලදැයි සාධුකාර දෙන්නාක් මෙන් මේ මහපොළොව ජලය පවරන්නට නොයෙක් ආකාරයෙන් කම්පා විය. විශේෂයෙන් කම්පා විය. විශේෂයෙන් වෙව්ලී ය. නොයෙක් ආශ්චර්යද පහළ විය.

මෙසේ සංගායනා කරන ලද මෙහි වනාහි මේ අභිධර්මය පිටක වශයෙන් අභිධර්ම පිටකය යි. නිකාය වශයෙන් ඛුද්දක නිකාය යි. අංග වශයෙන් වෙය්‍යාකරණ අංගය යි. ධර්මස්කන්ධ වශයෙන් ධර්මස්කන්ධ කීපදහසක් ද වේ. පෙර එය දරන්නා වූ භික්ෂූන් අතුරෙන් එක් භික්ෂුවක් සර්වසාමයික පිරිසෙහි හිඳ අභිධර්මයෙහි සූත්‍රයක් ගෙන බණ කියනුයේ

රූපස්කන්ධය අව්‍යාකෘතය. සතර ස්කන්ධයෝ කුසල් ද වන්නාහ. අකුසල් ද වන්නාහ. අව්‍යාකෘත වන්නාහ.

මෙසේ සංගායනා කරන ලද මෙහි වනාහි මේ අභිධර්මය පිටක වශයෙන් අභිධර්ම පිටකය යි. නිකාය වශයෙන් ඛුද්දක නිකාය යි. අංග වශයෙන් වෙය්‍යාකරණ අංගය යි. ධර්මස්කන්ධ වශයෙන් ධර්මස්කන්ධ කීපදහසක් ද වේ. පෙර එය දරන්නා වූ භික්ෂූන් අතුරෙන් එක් භික්ෂුවක් සර්වසාමයික පිරිසෙහි හිඳ අභිධර්මයෙන් සූත්‍රයක් ගෙන බණ කියනුයේ රූපස්කන්ධය අව්‍යාකෘතය, සතර ස්කන්ධයෝ කුසල් ද වන්නාහ. අකුසල් ද වන්නාහ. අව්‍යාකෘත වන්නාහ. දස ආයතනයෝ අව්‍යාකෘතයහ. ආයතන දෙකක් කුසල් ද වන්නාහ. අකුසල් ද වන්නාහ. අව්‍යාකෘත ද වන්නාහ. ධාතු සොළසෙක් අව්‍යාකෘතය. ධාතු දෙකක් කුසල් ද වන්නේ ය. අකුසල ද වන්නේ ය. අව්‍යාකෘත ද වන්නේ ය. සමුදය සත්‍යය අකුසල ය. මාර්ග සත්‍යය කුසලය, නිරෝධ සත්‍යය අව්‍යාකෘතය. දුඃඛසත්‍යය කුසල ද වන්නේය. අකුසල ද වන්නේ ය. අව්‍යාකෘත ද වන්නේ ය. දස ඉන්‍ද්‍රියයෝ අව්‍යාකෘතයහ. දොමනස්ස ඉන්‍ද්‍රියය අකුසලය, අනඤ්ඤාතඤ්ඤස්සාමීති ඉන්‍ද්‍රිය කුසලය, ඉන්‍ද්‍රිය සතරක් කුසල් ද වන්නේ ය. අව්‍යාකෘත ද වන්නේ ය. ඉන්‍ද්‍රිය සයක් කුසල් වන්නේ ය. අකුසල් ද වන්නේ ය. අව්‍යාකෘත ද වන්නේ යැයි ධර්මකථාව කීය. එතැන හුන් එක් භික්ෂුවක් ධර්මකථිකයන් වහන්ස, ඔබවහන්සේ මහමෙර වසන්නාක් දීර්ඝ සූත්‍රයක් ඉදිරිපත් කරති. මේ කිනම් සූත්‍රයක්දැයි ඇසී ය. ඇවැත්නි අභිධර්ම සූත්‍රය නමැයි කීය. කවර හෙයින් අභිධර්ම සූත්‍රය ගෙනහැර දක්වන්නෙහි ද? කිම අනෙක් බුද්ධභාෂිත සූත්‍රයක් ගෙනහැර දක්වන්නට නො වටී ද? අභිධර්මය කවර කෙනෙකුන් කියන ලද ද? මෙය බුද්ධභාෂිතයක් නො වේ යැයි කීය. කිම ඇවැත්නි, ඔබ විසින් විනය පිටකය උගන්නා ලද ද? ඇවැත්නි, නො උගන්නා ලද්දේ යැයි අවිනයධාරී නිසා ඔබ නො දැන මෙසේ කියන්නේ යැයි සිතමියැයි කී ය. විනය පමණක් ම උගන්නා ලද්දේ නමුදු එය ද ඔබ වරදවා ගන්නා ලදී. පිරිස් කෙළවර හිඳ නිදන්නකු මෙන් උගන්නා ලද්දේ වන්නේ ය. ඔබ වැන්නවුන් පැවිදි කරන්නේ හෝ උපසම්පදා කරන්නේ වන්නේ ය. කවර කරුණෙකින් ද? විනය පමණකද වරදවා ගත් හෙයිනි. මෙයද කියන ලදී. ඇවැත්නි, ඒ විනයෙහි අනාපත්තිභාවය විවරණය කරන්නට නො කැමැත්තෙහි නම් සූත්‍රාන්තය හෝ ගාථා හෝ අභිධර්මය හෝ ඉගෙනගන්න. පසුව විනයක් ඉගෙන ගන්න යනුයි. සූත්‍රාන්තයෙහි අවකාශ කරවා (ඉඩ ලබාදී) අභිධර්මය හෝ

විනය විචාරයි. අභිධර්මයෙහි අවකාශ කරවා සූත්‍රාන්තය හෝ විනය විචාරයි.

විනයෙහි අවකාශ කරවා සූත්‍රාන්ත හෝ අභිධර්මය විචාරයි. ඔබ වනාහි මෙපමණකුදු නො දන්නෙහි ය. මෙ පමණකින් ද පරවාදියා නිග්‍රහ කරන ලද්දේ වෙයි. මහා ගොසිංග සූත්‍රය වනාහි මෙයට ද වඩා බලවත්ය. එහිදී වනාහි දම්සෙනෙවි සැරියුත් තෙරුන්වහන්සේ ඔවුනොවුන් විචාළ ප්‍රශ්න ද විසඳීම ද දන්වන්නට බුදුන් වෙතට ගොස් මහමුගලන් තෙරුන් වහන්සේගේ විසඳීම දක්වන සේක් 'ආයුෂ්මත් ශාරිපුත්‍රයෙනි, භික්ෂූහු දෙදෙනෙක් අභිධර්ම කථාවක් කෙරෙති. ඔව්හූ ඔවුනොවුන් ප්‍රශ්න විචාරත්, ඔවුනොවුන්ගේ ප්‍රශ්න විචාරන ලද්දාහු විසඳත්. කරුණු යටපත් නො කෙරෙත්. ඔවුන්ගේ දැහැමි කථාව පවත්නේ ද වෙයි. ආයුෂ්මත් ශාරිපුත්‍රයෙනි, මෙබඳු භික්ෂුවගෙන් ගෝසිංග සාලවනය ශෝභමාන වන්නේ ය' යනුයි වදාළහ. ශාස්තෘන් වහන්සේ ආභිධර්මිකයෝ නම් මාගේ ශාසනයෙහි පරිබාහිරයෝ යැයි නො වදාරා රන්සකක් වන් ගෙල ඔසවා පුන්සඳ මෙන් සිරිමත් මහමුව පුරා බඹගොස නික්මවමින් සාධු සාධු ශාරිපුත්‍රයෙනියි, මහමුගලන් තෙරුන්ට සාධුකාර දී යම් සේ එය මනාව ප්‍රකාශ කරන මුගලන් තෙමේ ම එය ප්‍රකාශ කරන්නේ ය. ශාරිපුත්‍රය, මුගලන් තෙමේ ධර්මකථිකයෙකැයි වදාළ සේක.

ආභිධර්මික භික්ෂූහු ම ධර්මකථිකයෝ නම් වෙත්. අවශේෂ භික්ෂූහු ධර්මකථා කියන්නේ නමුදු ධර්මකථිකයෝ නොවෙත්. කවර හෙයින් ද යත්, ඔව්හු වනාහි ධර්මකථා කියන්නේ කර්මාන්තර, විපාකාන්තර, රූපාරූප පරිච්ඡේද ධර්මාන්තර අළලත්. කියත්. ආභිධර්මිකයෝ වනාහි ධර්මාන්තර අලෝළනය නො කරත්. එහෙයින් ආභිධර්මික භික්ෂුව ධර්මය කීයේ වා නො කීයේ වා විචාළ කල්හි ම වනාහි ප්‍රශ්නය කියන්නේ ය යනුයි. මෙ තෙමේ ම වනාහි ඒකාන්ත ධර්මකථිකයා නම් වන්නේ ය. මේ සඳහා ශාස්තෘන් වහ්නසේ සාධුකාර දී මොග්ගල්ලාන විසින් මනාව කියන ලදැයි වදාළ සේක. අභිධර්මය වළකාලන තැනැත්තේ මේ ජින චක්‍රයට පහර දෙයි. සර්වඥතා ඥානය වළක්වයි. ශාස්තෘන් වහන්සේගේ චතුර් වෛශාරද්‍ය ඥානය වළක්වයි. අසනු කැමති පිරිස ආර්ය මාර්ගයෙන් ආවරණ (වැට) බඳී. අටළොස් භේදකර වස්තුන්ගෙන් එකක පෙනීසිටී. උක්ෂෙපනීය කර්මය, නිස්සය කර්මය තර්ජනීය කර්මය දඬුවම්වලට සුදුස්සෙක් වෙයි. ඒ ඒ කර්මකොට පිටත් කළයුතුයි. යව, දඬුවම් විඳින්නකුව

ජීවත් වෙව කියා යි. තව ද මෙසේ ද කියන්නේ ය. ඉදින් අභිධර්මය බුද්ධ භාෂිතයක් නොයෙක් දහස් ගණන් සූත්‍රයන්හි 'එකං සමයං භගවා රාජගහෙ විහජති' ආදී වශයෙන් යම්සේ නිදානය සඳහා කියන ලද ද එපරිද්දෙන් මෙයට ද නිදානය සැදිය යුතු වන්නේ ය කියායි. හෙතෙම ජාතක - සුත්තනිපාත - ධම්මපද ආදියේ ද මෙබඳු නිදානයක් නැත. මේවා බුද්ධවචන නො වේයැයි ප්‍රතික්ෂේප කොට මතුයෙහි ද මෙසේ කිය යුතු වන්නේ ය. පණ්ඩිතය! මේ අභිධර්මය නම් සර්වඥ වූ බුදුවරුන්ට ම විෂය වූවකි. අන්‍යයන්ට විෂය නොවේ. බුදුවරුන්ගේ වනාහි ගර්භාවක්‍රාන්තිය ප්‍රකටය. උත්පත්තිය ප්‍රකටය. අභිසම්බෝධිය (බුද්ධත්වය) ප්‍රකටය. දම්සක් පැවැත්ම ප්‍රකටය. යමාමහ පෙළහර ප්‍රකටය. ත්‍රිවික්‍රමය ප්‍රකටය. දෙව්ලොවදී (අභිධර්මය) දෙසූ බව ප්‍රකටය. දේවාවරෝහණය ප්‍රකටය. යම් සේ සක්විති රජුගේ හස්තිරත්නය හෝ අශ්වරත්නය හෝ සොරකම් කොට යාගයක යොදා හැසිරීමක් නම් නො වන්නේ ද එය අට්ඨානය, අකාරණය චක්‍රරත්නය හෝ සොරකම් කොට පිදුරු ගැලෙක එල්ලාගෙන හැසිරීමක් නො වන්නේ ය. එය සිදුනොවන්නකි. යොදුනක් පමණ ආලෝකය පතුරන්නට සමත් මණිරත්නය හෝ කපු පැසක බහා පරිභෝග කිරීම සිදු නොවන්නකි. කවර හෙයින් ද යත්, රජුන්ට සුදුසු භාණ්ඩ නිසා ය. මෙ පරිද්දෙන් අභිධර්මය නම් අන්‍යයන්ට විෂය නො වේ. සර්වඥ වූ බුදුවරුන්ට ම විෂය වේ. දේශනාව උත්වහන්සේලා වශයෙන් ම දේශනා කළ යුතුයි. බුදුවරුන්ගේ ගර්භාවක්‍රාන්තිය ප්‍රකටය. -පෙ- දේවාවරෝහණය ප්‍රකට ය.

පණ්ඩිතයෙනි, අභිධර්මයට නිදාන කිසක් නම් නැතැයි යනුයි. මෙසේ කී කල්හි පරවාදියා විසින් සහධාර්මික (ධර්මානුකූල) උදාහරණයක් දක්වන්නට නො හැකි වෙයි.

මණ්ඩලාරාම වාසී තිස්සභූති ස්ථවිරයන් වහන්සේ වනාහි මහාබෝධි නිදානයේ දී මෙය අභිධර්මය යැයි දක්වන්නට 'යෙන සවාහං භික්ඛවෙ විහාරෙන පඨමා භිසම්බුද්ධො විහරාමි තසස පදෙයෙන විහාසිං' යැයි මේ ප්‍රදේශ විහාර සූත්‍රාන්තය ගෙනහැර දක්වා වදාළ සේක. පදේස නම් දසවිධය. ඛන්ධපදේස - ආයතන පදේස - ධාතුපදේස - සච්ච පදේස - ඉන්ද්‍රිය පදේස - පච්චයාකාර පදේස - සතිපට්ඨාන පදේස - ඣාන පදේස - නාම පදේස - ධම්ම පදේස යනුවෙනි. ශාස්තෘන් වහන්සේ බෝධි මණ්ඩපයේ දී එකී පදේස අතුරෙන් පඤ්චස්කන්ධයන් තිෂ්ප්‍රදේශ

වශයෙන් ප්‍රතිවේධ කළ සෙක. මේ තෙමස වේදනා ස්කන්ධ වශයෙන් වාසය කළ සේක. දොළොස් ආයතන, අටළොස් ධාතු යන මේවා නිෂ්ප්‍රදේශ වශයෙන් ප්‍රතිවේධ කළ සේක. මේ තුන්මස ධර්මායතනයෙහි වේදනා වශයෙන් මෙන්ම ධර්මධාතුවෙහි ද, වේදනා වශයෙන් ම වාසය කළ සේක. සතර සත්‍යයන් නිෂ්ප්‍රදේශ වශයෙන් ප්‍රතිවේධ කළ සේක. මේ තුන් මස දුඃඛ සත්‍යයෙහි වේදනා වශයෙන් ම වාසය කළ සේක. ද්විධ ඉන්ද්‍රියයන් නිෂ්ප්‍රදේශ වශයෙන් ප්‍රතිවේධ කළ සේක. මේ තෙමස වේදනා පංචකයෙහි ඉන්ද්‍රිය වශයෙන් වාසය කළ සේක. ද්වාදස පදිකය, පච්චයාකාර වට්ටය නිෂ්ප්‍රදේශ වශයෙන් ප්‍රතිවේධ කළ සේක. මේ තෙමස ස්පර්ශ ප්‍රත්‍යයෙන් වේදනා වශයෙන් ම වාසය කළ සේක. සතර සතිපට්ඨාන ධර්මයන් නිෂ්ප්‍රදේශ වශයෙන් ප්‍රතිවේධ කළ සේක. මේ තෙමස වේදනා සතිපට්ඨාන වශයෙන් ම වාසය කළ සේක. සතර ධ්‍යානයන් නිෂ්ප්‍රදේශ වශයෙන් ප්‍රතිවේධ කළ සේක. මේ තෙමස ධ්‍යානාංගයන්හි වේදනා වශයෙන් වාසය කළ සේක. නාමය නිෂ්ප්‍රදේශ වශයෙන් ප්‍රතිවේධ කළ සේක. මේ තෙමස එහි වේදනා වශයෙන් ම වාසය කළ සේක.

ධර්මයන් නිෂ්ප්‍රදේශ වශයෙන් ප්‍රතිවේධ කළ සේක. මේ තෙමස වේදනාත්මක වශයෙන් ම වාසය කළසේකැයි මෙසේ තෙරුන් වහන්සේ ප්‍රදේශවිහාර සූත්‍රාන්තය වශයෙන් අභිධර්මය නිදානය වදාළ සේක. ගම්වැසි සුමනදේව තෙරුන් වහන්සේ ලෝහ ප්‍රාසාදයේ යට ධර්මය ධර්මය පරිවර්තනය කරන සේක් 'මේ පරවාදියා දෑත් බැඳගෙන වනයෙහි හඬන්නකු මෙන් නො හැකි අවුලක් කරන්නකු මෙන් ද අභිධර්මයෙහි නිදානයක් ඇති බවත් නො දන්නේ යයි කියා නිදානය කියන සේක් මෙසේ කීහ. 'එකං සමයං භගවා දෙවෙසු විහරති තාවතිංසෙසු පාරිච්ඡත්තකමූලෙ පණ්ඩුකම්බලසිලායං, තත්‍ර ඛො භගවා දෙවානං තාවතිංසානං අභිධම්මකථං කථෙසි කුසලා ධම්මා අකුසලා ධම්මා අව්‍යාකතා ධම්මා' යනුවෙනි. අන්‍ය සූත්‍රයන්හි වනාහි එකම නිදානයකි. අභිධර්මයෙහි අධිගම නිදානය දේශනා නිදානය යැයි නිදාන දෙකකි.එ එහි අධිගම නිදානය දීපංකර බුදුන්ගේ පටන් බෝධි පර්යංකය තෙක් බව දතයුතු යි. දේශනා නිදානය දම්සක් පැවැත්වීම දක්වා ය. මෙසේ උභය නිදාන සහිත මේ අභිධර්මයාගේ නිදාන කෞශල්‍යය පිණිස පළමුව මේ ප්‍රශ්න කථනය දතයුතු යි.

මේ අභිධර්මය කවර හේතුවකින් වඩන ලද ද? කොහිදී මුහුකරවන ලදද? කොහිදී අධිගම කරන ලද ද? කවර දිනෙක අධිගම කරන ලද ද?

කවරෙකු විසින් අධිගම කරන ලද ද? කොහිදී සිතන ලද ද? කවර කලෙක සිතන ලද ද? කවරෙකු විසින් සිතන ලද ද? කොහිදී දේශනා කරන ලද ද? කවරෙකු සඳහා දේශනා කරන ලද ද? කුමක් සඳහා දේශනා කරන ලද ද? කවර කෙනෙකුන් විසින් පිළිගන්නා ලද ද? කවරහු හික්මෙත් ද? කවරෙක් හික්මවන ලද ශික්ෂා ඇත්තෝ ද? කවර කෙනෙක් දරත් ද? කාගේ වචනයක් ද? කවරෙකු විසින් ගෙනෙන ලද ද? යනුයි මේ එහි විසඳුමයි. කවර හේතුවකින් වඩන ලද ද? යත් බුද්ධත්වය අවබෝධ කිරීම සඳහා වඩන ලදී. කොහිදී මුහුකරවන ලද ද? යත් පන්සිය පනස් ජාතකයන්හි දී ය. කොහිදී අධිගම කරන ලද ද යත්, බෝධි මූලයේ දී ය. කවර දිනෙක අධිගම කරන ලද ද යත්, වෙසක් පුනු පොහෝදිනය කවරෙකු විසින් අධිගම කරන ලද ද යත්, සර්වඥ බුදුරජාණන් වහන්සේ විසිනි. කවර තැනෙක දී මෙනෙහි කරන ලද ද යත්, බෝමැඩ දී ය. කවර අවස්ථාවෙක මෙනෙහි කරන ලද ද යත් රතනඝර සතියේ දී ය. කවරෙකු විසින් මෙනෙහි කරන ලද ද යත්, සර්වඥ බුදුරජාණන් වහන්සේ විසිනි. කොහිදී දේශනා කරන ලද ද යත්, තව්තිසා දෙව්ලොව දී ය. කවරෙකු සඳහා දේශනා කරන ලද ද යත්, දෙවියන් සඳහා ය. කුමක් සඳහා දේශනා කරන ලද ද යත්, සතර ඕඝයන් තරණය කිරීම සඳහා ය. කවරෙකු විසින් පිළිගන්නා ලද ද යත්, දෙවියන් විසිනි. කවරෙක් හික්මෙත් ද යත්, ශෛක්ෂයෝත් කල්‍යාණ පෘථග්ජනයෝත් හික්මෙත්. කවරෙක් හික්මුණු ශික්ෂා ඇත්තෝ ද යත්, ක්ෂීණාශ්‍රව නම් වූ රහතන් වහන්සේලා ය. කවරෙක් දරත් ද යත්, යම්කෙනෙක් (යම් ශ්‍රාවක කෙනෙක්) පවතිත් නම් (ජීවත්ව සිටිත් නම්) උන්වහන්සේලා දරත්. කාගේ වචනයක් ද යත්, භාග්‍යවත් අර්හත් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේගේ වචනයයි. කවර කෙනෙකුන් විසින් ගෙනෙන ලද ද යත්, ආචාර්ය පරම්පරාවෙනි. මේ අභිධර්මය වනාහි සැරියුත් තෙරණුවෝ ය. භද්දජි තෙරණුවෝය. සෝභිත තෙරණුවෝය. පියජාලි තෙරණුවෝය. පියාපල තෙරණුවෝය. පියදස්සී තෙරණුවෝය. කෝසියපුත්ත තෙරණුවෝය. සිග්ගව තෙරණුවෝය. සන්දේශ තෙරණුවෝය. මොග්ගලිපුත්ත තෙරණුවෝය. සුදත්ත තෙරණුවෝය. ධම්මිය තෙරණුවෝය. දායක තෙරණුවෝය. සෝනක තෙරණුවෝය. රේවත තෙරණුවෝය යන මේ ආදී තෙරවරුන් විසින් තුන්වන සංගීති කාලය තෙක් ගෙනෙන ලදී. ඉන් මතු උන්වහන්සේලාගේම ශිෂ්‍යානුශිෂ්‍යයන් විසින් ගෙනෙන ලදී යනුයි. මෙසේ පළමුවෙන් දඹදිව් තෙලෙහි ඇදුරු පරපුරෙන් ගෙනෙන ලදී. මේ දිවයිනට වනාහි එයින්,

මහින්දො ඉට්ඨියො උත්තියො
සම්බලො භද්දනාමො ච
එතෙ නාගා මහාපඤ්ඤා
ජම්බුදීපා ඉධාගතා

මහින්දය, ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දනාව, (භද්දසාල) යන මහාප්‍රාඥ වූ මේ රහතන් වහන්සේලා දඹදිවින් මෙහි පැමිණියාහු ය යනුයි.

මේ මහරහතන් වහන්සේලා විසින් ගෙනෙන ලදී. ඉන් මතු උන්වහන්සේලාගේ ම ශිෂ්‍යානුශිෂ්‍ය සංඛ්‍යාත ආචාර්ය පරම්පරාවෙන් අද දක්වා ගෙනෙන ලදී. මෙසේ ගෙනෙන ලද මේ අභිධර්මය පිළිබඳව දීපංකර බුදුන්ගේ පටන් මහා බෝධිපර්යංකය තෙක් යම්කිසි නිදානයක් වී නම් එය අධිගම නිදානය යි.

යම්තාක් දම්සක් පැවතුම් දේශනාව දක්වා නිදානයක් කියන ලද ද? එය ප්‍රකට කිරීම සඳහා මේ පිළිවෙළ කථාව දතයුතු යි.

මෙයින් වනාහි සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයකින් මත්තෙහි අමරවතී නම් නුවරක් විය. එහි මව්පිය දෙපසින් සුජාත වූ පිරිසුදු පිරිවර ඇති සත්මුතු කුලපරම්පරාව දක්වා (පරපුරෙන්) බැහැර නො කරන ලද, ජාතිවාද කිලිටු නො වූ මනා රූ ඇති දැකුම්කලු වූ ප්‍රසාදවහ වූ උතුම් වූ වර්ණ සෞන්දර්හයෙන් යුක්ත වූ සුමේධ නම් බ්‍රාහ්මණයෙක් වාසය කෙරේ. හෙතෙම වෙනත් කාර්යයක් නො කොට බ්‍රාහ්මණ ශිල්පය ම උගත්තේ ය. ඔහුගේ ළමා කාලයේ ම මව්පියෝ කළුරිය කළහ. ඉක්බිති ඔහුගේ අයකැමි ඇමතියා අයපොත ගෙනවුත් රන්රිදී මුතුමැණික් ආදියෙන් පුරවන ලද ගබඩා විවෘත කර කුමාරය, ඔබගේ මව සතු ධනය මෙපමණය. පියා සතු ධනය මෙපමණය. මුතු මීමුතුන් සතු ධනය මෙපමණයැයි සත්මුතු කුල පරම්පරාව දක්වා ධනය කියා දී මෙය පිළිපදින්නැයි කී ය. සුමේධ පණ්ඩිත තෙමේ මෙසේ සිතීය. මාගේ පිය-මුතු ආදීහු මේ ධනය රැස්කොට තබා පරලොව යද්දී එක් කහවණුවකුදු නොගෙන ගියහ. මා විසින් වනාහි (මේ ධනය) ගෙන යායුතු වන්නේ යැයි කියායි (ඉක්බිති) රජුට දැනුම් දී නුවර පෙර පියෙව් කරවා මහජනයාට දන් දී තවුස් පැවිද්දෙන් පැවිදි විය. මෙතැන දී වනාහි සුමේධ කථාව කිවයුතුයි. බුද්ධවංසයේ දී මෙය කියන ලදී.

සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයකින් මත්තෙහි දර්ශනීය වූ, මනහර වූ දසවිධ ශබ්දයෙන් අවිවේකී වූ ආහාරපානයෙන් යුක්ත වූ හස්ති ශබ්දය, අශ්ව ශබ්දය, භේරි ශබ්දය, සංඛ ශබ්දය, රථ ශබ්දය, වීණා ශබ්දය, මිහිඟුබෙර ශබ්දය, තාල ශබ්දය, ගීත ශබ්දය, එසේ ම කව බොව යනුවෙන් කරන ලද ආහාරපාන පිළිබඳ ඝෝෂාවෙන් ද යුක්ත වූ සියලු නගරාංගයන්ගෙන් යුක්ත වූ සියලු කාම සැපතින් යුක්ත වූ සප්තවිධ රත්නයන්ගෙන් යුක්ත වූ නොයෙක් ජනයාගෙන් යුක්ත වූ දිව්‍ය නගරයක් මෙන් සමෘද්ධ වූ පින් කරන්නවුන්ට ආවාසයක් වූ අමර නම් නුවරක් විය.

(එකී) අමරවතී නගරයෙහි නොයෙක් කෙළ ගණන් තැන්පත් ධනය ඇති බොහෝ ධනධාන්‍ය ඇති වේදමන්ත්‍ර හදාළ, වේදමන්ත්‍රධාරී වූ ත්‍රිවේදයෙහි පරතෙරට පැමිණි,

ලක්‍ෂණ ශාස්ත්‍රයෙහි ද ඉතිහාසයෙහි ද ධර්මයන්හි ද පරතෙරට පැමිණි සුමේධ බ්‍රාහ්මණ නම් වූ ඒ මම එකල්හි රහසිගත ව හිඳ මෙසේ සිතීමි.

නැවත ඉපදීම නම් දුකෙකි. ශරීරයාගේ බිඳීම සම්මෝහ (සිහි මුළාවෙන්) මරණය, (මෙන්ම) ජරාවෙන් මැඩීම ද දුකෙකි.

මම ඉපදීම ස්වභාව කොට ඇත්තෙමි. ජරාව ස්වභාවකොට ඇත්තෙමි. ව්‍යාධිය ස්වභාවකොට ඇත්තෙමි. එසේ ඇතිකල්හි ජරාවෙන් තොර මරණයෙන් තොර භය රහිත නිවන සොයන්නෙමි.

මම නොයෙක් කුණපයන්ගෙන් පිරුණු මේ කුණු ශරීරය අපේක්‍ෂාවෙන් තොර ව වැඩරහිත වූවක් සේ සලකා යන්නෙම් නම් ඉතා යෙහෙක.

(භවයෙන් මිදීම පිණිස වූ) යම් මාර්ගයක් ඇත. එබඳු මාර්ගයක් වන්නේ ය. හේතුන්ගෙන් (සාධකයන්ගෙන්) තොරව එම මාර්ග (සෙවිය) නො හැක්කේ ය. සසරින් මිදීම පිණිස ඒ මාර්ගය සොයන්නෙමි.

යම් සේ දුකක් ඇති කල්හි සැපයකුත් ඇත්තේ ද එසේම භවයක් ඇතිකල්හි විභවයක් (නිවනක්) කැමතිවිය යුතු යි.

යම් සේ උෂ්ණය ඇතිකල්හි අන්‍ය වූ ශීතලක් ද ඇත්තේ ද මෙසේ ම ත්‍රිවිධ ශීත ඇතිකල්හි නිවන ද බලාපොරොත්තු විය යුතු ය.

යම් සේ පාපය ඇති කල්හි කල්‍යාණයක් (කුශලයක්) ඇත්තේ ද මෙ පරිද්දෙන් ජාතිය ඇතිකල්හි ජාතියෙන් තොර වූ නිවන ද බලාපොරොත්තු විය යුතු ය.

යම් සේ ගූථගත වූ (අසූචියෙන් තැවරුණු) පුරුෂයෙන් පිරුණු විලක් දැක ඒ විල ඇසුරු නො කෙරේ ද, එය විලෙහි දෝෂයක් නො වේ.

මෙසේ කෙලෙස් මල සෝදන නිවන් නමැති විල ඇතිකල්හි ඒ (නිවන් නමැති) විල නො සොයන්නේ නම් එය අමාවිලෙහි දෝෂයෙක් නො වේ.

යම්සේ සතුරන් විසින් වටකරන ලද (පුරුෂයෙක්) ගමන් මාර්ගය තිබෙද්දී පලා නොයේ නම් එය මාර්ගයේ දෝෂයෙක් නො වේ.

යම් සේ කෙලෙසුන් විසින් වටකරන ලද පුරුෂයෙක් නිවන් මාර්ගය තිබෙද්දී එම නිවන් මාර්ගය නො සොයා ද, ඒ නිවන් මාර්ගයේ දෝෂයෙක් නො වේ.

යම් සේ රෝගී වූ පුරුෂයෙක් වෙදුන් සිටිද්දී ඒ රෝගයට පිළියම් නො කෙරේ නම් ඒ වෙදුන්ගේ දෝෂයෙක් නො වේ.

මෙසේ කෙලෙස් නමැති රෝගයන්ගෙන් දුකට පත් වූයේ එයින් හාත්පසින් පෙළුණේ ඒ සඳහා වූ ආචාර්යවරයෙක් නො සොයයි නම් ඒ ආචාර්යවරයාගේ දෝෂයක් නො වේ.

යම් සේ පුරුෂයෙක් ගෙලෙහි බඳනා ලද කුණපයක් පිළිකුල් කොට (එය) මුදාහැර සුවපත්ව ස්වෛරීව ස්වයංවසී ව (තමාට වසඟව) යන්නේ ද,

එපරිද්දෙන් නන් වැදෑරුම් කුණුගොඩක් වූ මේ කුණු කය අපේක්ෂාවෙන් තොරව අනර්ථකාරී ලෙස සලකා අතහැර යන්නෙමි.

යම් සේ ස්ත්‍රී පුරුෂයෝ වැසිකිළියෙහි මල (පහකොට) අපේක්ෂාවෙන් තොරව අනර්ථකාරී ලෙස සලකා අතහැර ලා යත් ද,

මෙ පරිද්දෙන් ම මමත් නන්වැදෑරුම් කුණපයන්ගෙන් පිරුණු මේ කය මල පහකොට කුටිය හැරයන්නාක් මෙන් අතහැර යන්නෙමි.

යම් සේ (නැව්) හිමියෝ දිරාපත් වූ පලුදු වූ දියබෙදන සුලු වූ නැවක් අපේක්ෂාවෙන් තොරව අනර්ථකාරී ලෙස සලකා හැර දමා යත් ද,

එපරිද්දෙන් මමත් සිදුරු නවයකින් යුත් නිරතුරුවම (කුණප) වෑහෙන මේ කය (නැව්) හිමියන් දිරූ නැවක් (අතහැර යන්නා) සේ අතහැර යන්නෙමි.

යම් සේ බඩු රැගෙන යන පුරුෂයෙක් සොරුන් විසින් බඩු පැහැරගැනීමේ බිය දැක (බඩු) ඉවත දමා යේ ද,

මෙපරිද්දෙන් මේ කය මහා සොරෙක් මෙනි. (මම) කුසල් සිඳීමේ බියෙන් මේ ශරීරය හැර යන්නෙමි.

මම මෙසේ සිතා නොයෙක් කෙළසිය ගණන් ධනය නාථ-අනාථයින්ට දී හිමවත පැමිණියේ ය.

හිමවතට නොදුරෙහි ධම්මික නම් පර්වතයක් විය. එහි මා විසින් ආශ්‍රමයක් මනාව කරන ලදී. පන්සල ද මනාසේ මවන ලදී.

එහි පස්වැදෑරුම් දෝෂයන්ගෙන් තොර වූ සක්මන මැවී ය. අටවැදෑරුම් ගුණයන්ගෙන් යුත් අභිඥා බලය ලබා ගතිමි.

එහි දී නව දෝෂයන්ගෙන් යුත් සළුව අත්හළෙමි. දොළොස් ගුණයෙන් යුත් වැහැරි සිවුර හැඳීමි.

දෝෂ අටෙකින් යුත් පන්සල අත්හළෙමි. දසගුණයකින් යුත් වෘක්ෂ මූලයට පැමිණියෙමි.

වවන ලද රෝපණය කරන ලද ධාන්‍ය සම්පූර්ණයෙන් ම අත්හළෙමි. නොයෙක් ගුණයන්ගෙන් යුත් පවත්තඵල (ගස් යට වැටුණු ගෙඩි) (ආහාර පිණිස) ගතිමි.

එහිදී හිඳීම, සිටීම, සක්මන යන ඉරියව්වලින් වීර්යය වඩා සත්දිනක් ඇතුළත දී අභිඥා බලයට පැමිණියෙමි යනුයි.

එහි 'අසසමො සුකතො මයහං පණ්ණසාලා සුමාපිතා' යන මේ පාළියෙහි සුමේධ පණ්ඩිතයන් විසින් පන්සල සක්මන සියතින් මවන ලද මෙන් කියන ලදී. මේ වනාහි මෙහි අර්ථය යි. මහසත්හු හිමවතට වැද අද ධාර්මික පර්වතයට පිවිසෙන්නෙමියි නික්මුණාහු දැක සක්දෙව් රජ විස්කම් දෙව්පුත් අමතා දරුව, යන්න. අර සුමේධ පණ්ඩිත තෙමේ පැවිදි වන්නෙමි යි නික්මුණේ ය. ඔහුට වාසස්ථානයක් මවන්නැයි (කීය.)

හෙතෙම ඔහුගේ වචනය පිළිගෙන රමණීය අසපුවක් ද මනාව ආවරණය කරන ලද පන්සලක් ද මනරම් වූ සක්මනක් ද මැවී ය. භාග්‍යවතුන් වහන්සේ වනාහි එදා තමාගේ පුණ්‍යානුභාවයෙන් නිපන් ඒ ආශ්‍රමය ද සඳහා ශාරිපුත්‍රය, ඒ ධාර්මික පර්වතයෙහි,

**අසසමො සුකතො මයහං**
**පණ්ණසාලා සුමාපිතා**
**චංකමං තත්‍ථ මාපෙසිං**
**පඤ්චදොසවිවජ්ජිතං** යි වදාළ සේක. එහි **සුකතො මයහං** යනු මා විසින් මනාව කරන ලදී (යන අර්ථයි.) 'පණ්ණසාලා සුමාපිතා' යනු පත් සෙවිලි කළ සාලාවද මා විසින් මනාව මවන ලද්දේ විය (යන අර්ථයි) 'පඤ්චදොස විවජ්ජිතං' යනු සක්මනෙහි මේ දොස් පසෙකි. තද විසම බව, ඇතුළත වෘක්ෂ ඇති බව, ලැහැබින් වැසී ඇති බව, අතිශයින් බාධා ඇති බව, ඉතා විශාල බව යනුයි. තද විසම භූමි භාගයෙහි වූ සක්මනෙහි වනාහි සක්මන් කරන්නාගේ පා රිදෙයි. පොළ නැගෙයි. සිත එකඟ බවක් නො ලබයි. කමටහන විපතට පත්වෙයි. මෘදු සමතලාවෙහි වනාහි පහසු විහරණයට පැමිණ කමටහන පැපයෙයි. එබැවින් තද විසම භූමි භාග ඇති බව එක් දෝෂයකැයි දතයුතු ය. සක්මනෙහි ඇතුළත හෝ මැද හෝ කෙළවර හෝ රුක් ඇති කල්හි ප්‍රමාදයට පැමිණ සක්මන් කරන්නාගේ නළල හෝ හිස හෝ ගැටේ යනු ඇතුළත රුක් ඇති බව

දෙවන දෝෂය යි. තෘණලතා ආදී ලැහැබින් වැසුණු සක්මනෙහි සක්මන් කරන්නා අඳුරු වේලාවේ දී සර්ප ආදී ප්‍රාණීන් පාගා මරන්නේ හෝ උන් විසින් දෂ්ට කරනු ලැබ දුකට හෝ පැමිණේ යනු මේ තුන්වන දෝෂය යි. පළලින් රියන් පමණ හෝ අඩරියන් පමණ වූ ඉතා සම්බාධ සහිත සක්මනෙහි සක්මන් කරන්නා සේ නිය ද ඇඟිලි ද සක්මන් කෙළවර හැපී බිඳේනුයි අති සම්බාධතාව සතරවන දෝෂය යි. ඉතා විශාල සක්මනෙහි සක්මන් කරන්නාගේ සිත (අරමුණෙන්) බැහැර දිවෙයි. එකඟ බව නො ලැබේ නුයි ඉතා විශාල බව පස්වන දෝෂය යි. පළලින් වනාහි රියන් එකහමාරක් වූ දෙපයෙහි රියනක් පමණ වූ අනුසක්මන් ඇති දිගින් සැටරියන් වූ මෘදු තලයක් ඇති සමව විසුරුවන ලද වැලි ඇති සක්මන වටනේ ය. සෑගිරියෙහි වූ දීපප්‍රසාද මහින්ද ස්ථවිරයන් වහන්සේගේ සක්මන මෙනි. එය ද එබඳු විය. එහෙයින් 'චංකමං තත්‍ථ මාපෙසිං පඤ්ච දොස විවජ්ජිතං' යනු කීහ.

'අට්ඨගුණ සමුපෙතං' යනු අටවැදෑරුම් ශ්‍රමණ සුඛයන්ගෙන් යුක්ත වූ, මේ අට ශ්‍රමණ සුඛයෝ නම් වෙත්. ධන ධාන්‍ය පරිභෝගයෙන් තොර බව, නිවැරදි වූ පිණ්ඩපාතය සෙවිනා බව, නිවුණු පිඬු බුදිනා බව, රට පෙළා ධනසාරය හෝ කළු ඊයම් කහවණු ආදිය හෝ ගන්නා වූ රාජ කුලයන්හි රට පෙළන කෙලෙසුන්ගෙන් තොර බව, උපකරණයන්හි ඡන්ද රාගයෙන් තොර බව, සොරුන් පැහැර ගැනීම පිළිබඳ බිය රහිත බව, රාජ-රාජ මහාමාත්‍යාදීන් සමග අමිශ්‍රභාවය, සතර දිසාවන්හි නො ගැටෙනා බව යන මේ කියන ලදී. මෙසේ ඒ අසපුවෙහි වසන්නා විසිා් මේ අටවැදෑරුම් පැවිදි සුවයන් විඳිය හැකි වෙයි. මෙසේ අටගුණයකින් යුත් ඒ අසපුව මැවීමි යනුයි.

'අභිඤ්ඤාබල මාහරිං' යනු පසුව ඒ අසපුවෙහි වෙසෙමින් කිසුණු පිරියම් කොට අභිඥාවන් හා සමාපත්තීන් ඉපදවීම පිණිස අනිත්‍ය වශයෙන් දුක් වශයෙන් විදසුන් පටන්ගෙන බලවත් වූ විදර්හනා ඵලයට පැමිණියෙමි. එසේ එහි වෙසෙමින් ඒ බලය ලබාගන්නට හැකිවෙයි. මෙසේ ඒ අසපුව ඒ මාගේ අභිඥාව පිණිස විදර්ශනා බලයට සුදුස්සක් කොට මැවීමි යනු අර්ථයි.

'එහි දී නව දෝෂයන්ගෙන් යුත් සළුව අත්හළෙමි' යන මෙහි මේ පිළිවෙළ කථාවයි.

එකල්හි වනාහි කුටි-ලෙන්-සක්මන් ආදියෙන් යුක්ත වූ මල්පල සහිත වෘක්ෂයන් ගැවසීගත් රමණීය ජලාසත් ඇති ව්‍යාඝ්‍රාදීන් හා බිය ගෙනදෙන පක්ෂීන්ගෙන් තොර වූ විවේකයට සුදුසු වූ අසපුවක් මවා අලංකාර කළ සක්මනෙහි දෙ කෙළවර එල්බෙන පුවරුව සංවිධානය කොට හිඳීම පිණිස සක්මන මැද සමතලා වූ මුංපැහැති ගලක් මවා, පන්සල ඇතුළෙහි දළමඬුලු, වැහැරි සිවුරු, ත්‍රිදණ්ඩය, කෙණ්ඩිය ආදී වූ තවුස් පිරිකර ද, මණ්ඩපයෙහි පැන්බඳුන, පැන්සක, පැන්මලාව ද, ගිනිහල්ගෙයි අඟුරු කබල, දර ආදිය දැයි මෙසේ පැවිද්දන් උපකාර පිණිස යම් යම් දේ වේනම් ඒ සියල්ල මවා පන්සලෙහි බිත්තියෙහි 'යම් කෙනෙක් පැවිදිවනු කැමැත්තෝ වෙත් ද (ඔව්හු) මේ පිරිකර ගෙන පැවිදි වෙත්වා'යි අකුරු කොටා විස්කම් දෙව්පුත් දෙව්ලොවට ම ගිය කල්හි සුමේධ පණ්ඩිත තෙමේ හිමවත් පාදයෙහි ගිරිකඳුරු අනුසාරයෙන් තමාට වාසයට පහසු තැනක් බලනුයේ ගංමිටියාවතෙහි විස්කම් විසින් මවන ලද ශක්‍රයා දුන් රමණීය ආශ්‍රමය දැක සක්මන කෙළවරට ගොස් පා සලකුණු නො දක්නේ ඒකාන්තයෙන් පැවිද්දෝ ගොදුරුගමෙහි පිඬු සොයා ක්ලාන්ත වූවාහු අවුත් පන්සලට පිවිස හුන්නේ වෙත් යැයි සිතා මදක් නතරව සිට ඉතා ම පමාවෙති. දැනගනිමියි පන්සල් කුටියෙහි දොර හැර ඇතුළට පිවිස ඔබමොබ බලන්නේ මහ බිත්තියේ (වූ) අකුරු කියවා මේ මට කැප පිරිකර ය. මේවා ගෙන පැවිදි වෙමි යි තමා හැඳි පෙරවි සළු අත් හළේ ය. එහෙයින් 'සාටකං පජහිං තත්‍ථ' යනු කීය. ශාරිපුත්‍රය, මෙසේ පිවිසි මම ඒ පන්සලේ දී සළුව අත්හළෙමි.

නවදොස මුපාගතං යනු සළුව අත්හරිනුයේ දොස් නවයක් දැක අත්හළෙමියි දක්වයි. තවුස් පැවිද්දෙන් පැවිදි වූවන්ට වනාහි දෝෂ නමයක් වැටහෙයි. මහඟු බව එක් දෝෂයෙකි. අනුන් පිළිබඳව උපන් බව එක් දෝෂයෙකි. පරිභෝග කිරීමෙන් මහා කිලිටුවීම එක් දෝෂයෙකි. කිලිටු වූ කල්හි සේදිය යුතු ද රජනය කළයුතු ද වෙයි. පරිභෝග කිරීමෙන් දිරන බව එක් දෝෂයෙකි. දිරූ සළුව මැසීම හෝ අඩ දැමීම කළයුතු වෙයි. නැවත සොයාගැනීම දුෂ්කර බව එක් දෝෂයෙකි. තවුස් පැවිද්දට නොසරුප් බව එක් දෝෂයෙකි. පසමිතුරන්ට සාධාරණවීම එක් දෝෂයෙකි. එය පසමිතුරන් විසින් ගත නොහැකි පරිදි ආරක්ෂා කළයුතු වෙයි. පරිභෝග කරන්නාගේ අලංකාරයට හේතුවීම එක් දෝෂයෙකි. පිළිගෙන හැසිරෙන්නහුගේ ස්කන්ධභාරයේ මහේච්ඡභාවය එක් දෝෂයෙකි යනුයි.

චාකචීරං නිවාසෙසිං යනු ශාරිපුත්‍රය, මම එකල්හි මේ නවදෝෂයන් දැක සළුව අතහැර වැහැරි සිවුර හැඳගතිමි. මුදුතණ හීරි හීරි කොට ගෙන කරන ලද වැහැරි සිවුර හැඳීම පෙරවීම පිණිස ගතිමි යන අර්ථයි.

'ද්වාදසගුණ මුපාගතං' යනු දොළොස් අංගයකින් යුක්ත වූ, වැහැරි සිවුරෙහි අනුසස් දොළොසෙකි. අගය අල්ප බව, සොඳුර බව, කැප බව යනු මේ එක් ආනිසංසයෙකි. සියතින් කළ හැක්කේ ය යන මෙය දෙවන ආනිසංස යි. පරිභෝග කිරීමේ දී සෙමෙන් කිලිටි වේ. දෙවීමේ ද ප්‍රපඤ්චයක් නැත යන මේ තුන්වැන්නය. පරිභෝග කිරීමේ දී දිරූ විට ද නො මැඩිය යුතුවීම සතරවැන්නයි. නැවත සොයන්නාට පහසුවෙන් සොයාගත හැකිවීම පස්වැන්නයි. තවුස් පැවිද්දට සරුප් බව සයවැන්න යි. සතුරන් විසින් පරිභෝග කළ නොහැකිවීම සත්වැන්න යි. පරිභෝග කරන්නාගේ අලංකාරය පිණිස නොවීම අටවැන්න යි. දැරීමේ දී සැහැල්ලුබව නවවැන්නයි. සිවුරුපයෙහි (චීවර ප්‍රත්‍යයෙහි) අපිස්බව දසවැන්න යි. වැහැරි නිපැයීමේ දී දැහැමි, නිවැරදි බව එකොළොස් වැන්න යි. වැහැරි සිවුර නට කල්හි ද අපේක්ෂා රහිත බව දොළොස්වැන්න යි.

'අට්ඨදොස සමාකිණ්ණං පජහිං පණ්ණසාලකං' යනු කෙසේ අත්හළේ ද යත්, ඒ සුමේධ තාපස තෙමේ වනාහි උතුම් වූ සළු යුවල මුදනුයේ සිවුරු දණ්ඩෙහි ලැගි අනෝජ මල්දමක් වැනි රතුපැහැති වැහැරි සිවුර හැඳ එය මතුයෙහි වෙනත් රන්වන් වැහැරි සිවුරක් පෙරවා දොඹමල් විසුරුවා වැනි වූ අඳුන් දිවිසම සකස්කොට දළමඬුලු මුණ සිළ සමග නිසල බැව් කිරීමට සාර සූචිය (හරයකින් කළ හුල) පිවිසවා මුතුදැලක් වැනි සාල්ලෙක පබළුවන් කෙණ්ඩිය බහා තුන් තැනකින් වක් වූ කද ගෙන කදෙහි එක් කෙළවරෙක කෙණ්ඩිය ද එක් කෙළවරෙක කෙක්ක පැස ත්‍රිදණ්ඩක ආදිය ද රුවාගෙන පිරිකර කද අංශයෙහි කොට දකුණු අතින් සැරයටිය ගෙන පන්සලෙන් නික්ම සැටරියන් පමණ වූ මහසක්මනෙහි ඔබ මොබ සක්මන් කරන්නේ තමාගේ වේසය බලා 'මගේ සිත මුදුන් පැමිණියේ ය, ඒකාන්තයෙන් මාගේ පැවිද්ද හොබනේ ය. බුදු පසේ බුදු ආදී වූ සියලු ම ප්‍රාඥ පුරුෂයින් විසින් මේ පැවිද්ද නම් වර්ණනා කරන ලදී. ස්තුති කරන ලදී. මා විසින් ගිහි බන්ධනය ප්‍රහීණ කරන ලදී. නෛෂ්ක්‍රම්‍යයට නික්මුණේ වෙමි. මවිසින් උතුම් පැවිද්ද ලබන ලදී. මහණදම් කරන්නෙමි. මාර්ගඵල සැප ලබමි'යි උත්සාහවත් වූයේ පිරිකර කද බිම තබා සක්මන මැද මුංවන් ගල්තලායෙහි රන්

පිළිමයක් මෙන් හුන්නේ දිවාකාලය ගෙවා සවස් කාලයෙහි පන්සලට පිවිසි ඉදල්මැස්ස පසෙක කවු ඇතිරියෙහි වැද හොත්තේ ශරීරය සෑතු ගන්වා ඉතා අලුයම් වේලාවෙහි පිබිද තමාගේ පැමිණීම ආවර්ජනා කළේ ය. මම ගෙයි විසීමේ ආදීනව (දොස්) දැක අප්‍රමාණ භෝග ද අනන්ත වූ සම්පත් ද හැර වනයට පිවිස විමුක්තිය සොයන්නෙකුව පැවිදි වීමි. එහෙයින් දැන් මෙතැන් පටන් ප්‍රමාද ව හැසිරෙන්නට නො වටී. ප්‍රකර්ෂ (දැඩි) විවේකය හැර හැසින්නා මිථ්‍යාදෘෂ්ටිව තර්ක නමැති මැස්සෙක් කති. දැන් මා විසින් ප්‍රකර්ෂ විවේකය සොයන්නට වටී. මම වනාහි ගිහිගෙය පළිබෝධ වශයෙන් දැක නික්මුණෙමි. මේ පන්සල මන වඩනේ ය. පිරියම් කළවිට ඉදුණු බෙලිගෙඩියක පැහැයෙන් යුක්ත ය. සුදු බිත්ති රිදීවන්ය. පන්සෙවිල්ල පරෙවි පා පැහැති ය. ඉදලින් කළ ඇඳ විසිතුරු ඇතිරියක පැහැ ඇත්තේ ය. වාසස්ථානයට නිවාස පහසුකම් වලින් යුක්ත ය. මේ පමණකින් (මේ අනුව) මෙය මාගේ ගෘහ සම්පත්තියට වඩා අමතර දෙයක් ලෙස නො පෙනේ යැයි පන්සලෙහි දොස් පරීක්‍ෂා කරනුයේ දොස් අටක් දුටුයේ ය.

පන්සල් පරිභෝග කිරීමේ වනාහි ආදීනව (දොස්) අටෙකි. මහා ආරම්භයකින් දැව සම්භාරයන් එක්රැස් කොට උපකරණ සෙවිය යුතු බව එක් ආදීනවයෙකි. තෘණ පණ්ණ මැටි ආදිය වැටුණු කල්හි ඒවා නැවත නැවත තැබිය යුතු බැවින් නිතර පිළිදැගුම් කළයුතු බව දෙවැන්නයි, සෙනසුන නම් වැඩිහිටියාට පැමිණෙ යි. නොකල්හි නැගිටුවනු ලබන්නාගේ සිතෙහි එකඟ බවක් නො වේ. මෙසේ නැගිටිය යුතු බව තෙවැන්න යි. ශීතෝෂ්ණයන්ගෙන් වැළකීම කය සියුමැලි කරන බව සතරවැන්නයි. ගෙට පිවිසියහු විසින් පවක් කළ හැක්කේයැයි ගර්හාව වැඩිය හැකි බව පස්වැන්නයි. මාගේ පිළිගන්නා බව සවැන්නයි. මේ ගෙයක් ඇති බව නම් දෙවෙනි වාසයක් වාසයක් ඇතියාක් මෙනි යනු සත්වැන්නයි. උකුණන් මකුණන් සිකනලුන් ආදීන්ට සාධාරණ බැවින් බොහෝ දෙනාට සාධාරණ බව අටවැන්නැයි මෙසේ අටදොස් දැක මහබෝසත් තෙම පන්සල අත්හළේ ය. එහෙයින් මෙසේ කීය. 'අට්ඨදොස සමාකිණ්ණං පජහිං පණ්ණසාලකං' යනුයි.

'උපාගමිං රුක්ඛමූලං ගුණෙහි දසහුපාගං' (ගුණ දහයකින් යුත් වෘක්‍ෂ මූලයට පැමිණියෙමි) යනු ආවරණය වූ පන්සල ප්‍රතික්‍ෂේප කොට දස ගුණයකින් යුත් වෘක්‍ෂමූලයට ගියේ වෙමියි කියයි. එහි මේ

දසගුණයෝ ය. අල්ප වශයෙන් ආරම්භ කළහැකි බව එක් ගුණයෙක. එහි වනාහි එළඹීම් මාත්‍රයක් ම වෙයි. පිළිදැගුම් කිරීමෙක් නැත. ඒ දෙවැන්නයි. එය වනාහි මනාව මට වූයේ ද මට නොවූයේ ද පරිභෝගයට පහසු වේ ම ය. නො නැගිටිය යුතු බව තුන්වන ගුණය යි. ගර්හාව ප්‍රතිච්ඡාදනය (වැඩීම) නො කෙරේ. එහි වනාහි පවක් කරනුයේ ලජ්ජා වේ යැයි ගර්හාව නො සඟවන බව සතරවැන්නයි. අභ්‍යවකාශය මෙන් කය සන්‍ථම්භය දැඩි බව නොවෙයි. කය සන්‍ථම්භනය නොවීම පස්වැන්නයි. අයිති කරගැනීමක් නොමැතිවීම සයවැන්නයි. ගෙය පිළිබඳ ඇල්ම ප්‍රතික්ෂේපය සත්වැන්නයි. බොහෝදෙනාට සාධාරණ වූ ගෙයක මෙන් එය පිළිදැගුම් කරමි නික්මෙව'යි බැහැර කිරීමක් නැති බව අටවැන්නයි. වසන්නා හට ප්‍රීතියකි. ඒ බව නවවැන්නයි. රුක්මුල් සෙනසුන ගිය ගිය තැන සුලභ බැවින් අපේක්ෂා රහිත බව දසවැන්නයි යනුයි. මේ දසගුණයන් දැක රුක්මුලට ගියෙමි'යි කිය යි. මහාසත්ත්වයන් වහන්සේ මෙතෙක් මේ කරුණු සලකා දෙවන දින පිඬු පිණිස වැඩියහ. ඉක්බිති උන්වහන්සේ පැමිණි ගමෙහි මිනිස්සු මහත් උත්සාහයෙන් දන් දුන්හ. උන්වහන්සේ බත්කිස නිමවා අසපුවට අවුත් හිඳ මෙසේ සිතුහ. 'මම ආහාර නො ලබමියි පැවිදි නො වීමි. මේ සිනිඳු ආහාරය නම් මානමදය හා පුරිසමදය වඩයි, ආහාරමූලික වූ දුකෙහි කෙළවරක් නැත. මම වවන ලද රෝපණය කරන ලද ධාන්‍යයෙන් තිපන් ආහාර අතහැර පවත්තඵලභෝජී වන්නෙම් නම් ඉතා යෙහෙක.' උන්වහන්සේ එතැන් පටන් එසේ කොට ගැටෙමින් (දැඩිව) උත්සාහ කරන සේක් සත්දිනක් ඇතුළතදීම අෂ්ට සමාපත්ති පංච අභිඥාවන් ද ඉපිදවූහ. එහෙයින් කියන ලදී.

වවන ලද රෝපණය කරන ලද ධාන්‍ය සම්පූර්ණයෙන් ම අත්හළෙමි. නොයෙක් ගුණයෙන් යුත් (තුරුලියෙන්) වැටුණු ඵල ආහාර පිණිස ගනියි.

එහි දී හිඳීමෙන් සිටීමෙන් හා සක්මනින් වීර්යය වැඩීමි. සත්දින ඇතුළත දී අභිඥා බලයට පැමිණියෙමි යනුයි.

මෙසේ මා අෂ්ට සමාපත්ති අභිඥාබල සිද්ධියට පැමිණ සස්නෙහි වසී වූ කල්හි ලෝකනායක වූ දීපංකර නම් වූ බුදුරජාණන් වහන්සේ ලෝකයෙහි උපන් සේක.

ධ්‍යාන රතියෙහි යෙදී සිටි මම (ඒ දීපංකර බුදුන්) පිළිසිඳ ගනිද්දීත් උපදිද්දීත් බුදු වනවිටත් ධර්ම දේශනා කරන විටත් සතර නිමිති නො දිටිමි.

ප්‍රත්‍යන්ත ප්‍රදේශයක (වැසියෝ) සතුටු සිත් ඇත්තාහු තථාගතයන් වහන්සේට ආරාධනා කොට උන්වහන්සේට වැඩීම පිණිස මාර්ගය පිරිසිදු කරති.

එකල්හි මම සිය අසපුවෙන් නික්ම වැහැරි සිවුරු කම්පනය කරමින් අහසින් යමි.

එකෙණෙහි තුටුපහටු වූ ප්‍රමෝදයට පත් හටගත් ප්‍රීති ඇති ජනයා දැක අහසින් බැස මිනිසුන් විචාළෙමි.

මහජනයා තුටුපහටු වූයේ ය. ප්‍රමෝදයට පත්විය. හටගත් ප්‍රීති ඇත්තේ ය. කවරෙකු සඳහා වටුමායන නම් වූ මාර්ගය සරසනු ලැබේ ද,

මා විසින් විචාරන ලද ඔව්හු චතුරාර්ය සත්‍යය අවබෝධ කරගත් හෙයින් බුද්ධ නම් වූ අනුත්තර වූ ලොවට නායක වූ දීපංකර නම් වූ බුදුරජාණන් වහන්සේ ලෝකයෙහි උපන් සේකැයි ප්‍රකාශ කළහ.

අංජය, වටුමායන නම් වූ මාර්ගය උන්වහන්සේට පිරිසිදු කරනු ලැබේ. එකෙණෙහි බුද්ධ යන නම අසා ප්‍රීතිය උපන්නේ ය.

බුද්ධෝ බුද්ධෝ යි කියමින් සොම්නස ප්‍රකාශ කෙළෙමි. සතුටටත් සංවේගයටත් පත් වූ මම එහි සිට (මෙසේ) සිතීමි.

මෙහි බිජු රෝපණය කරමි. ඒකාන්තයෙන් ක්ෂණය (අවස්ථාව) නො ඉක්මවිය යුතුයි. ඉදින් බුදුරජාණන් වහන්සේට (මාර්ගය) පිරිසිදු කරම් නම් මටත් එක් පෙදෙසක් දෙව්.

මම ද මාර්ගය පිරිසිදු කරන්නෙමි. එකල්හි ඔව්හූ මටත් මාර්ගය පිරිසිදු කරන්නට අවකාශයක් දුන්හ.

මම එකලහි බුද්ධෝ, බුද්ධෝ යැයි සිතමින් මාර්ගය පිරිසිදු කරමි. මට ලැබුණු ප්‍රදේශය (පිරිසිදු කර) නොනිමියදී ජින නම් වූ දීපංකර මහා මුනීන්ද්‍රයන් වහන්සේ ෂට් අභිඥාවන්ට පැමිණි තාදීගුණයෙන් (අටලෝ

දහම්හි නොසැලෙන ගුණයෙන්) යුත් නිර්මල වූ සාරලක්ෂයක් රහතුන් වහන්සේලා සමග මාර්ගයට පිළිපන් සේක.

පෙර ගමන් පැවැත් වේ. බොහෝ බෙර වාදනය වෙයි. සතුටට පත් දිව්‍ය මනුෂ්‍යයන් සාධුකාර පැවැත්වූහ.

දෙවියෝ මිනිසුන් දකිත්. මනුෂ්‍යයෝ ද දෙවියන් (දකිත්) ඒ දෙපාර්ශ්වය ම ඇඳිලි බැඳගෙන බුදුන් අනුව යති.

අහසෙහි වූ දෙවියෝ දිසානුදිසාවන්හි දිව්‍යමය වූ මදාරා මල් පියුම් හා පරසතුමල් විසුරුවති.

අහසෙහි වූ දෙවියෝ හුදෙක් දිව්‍යමය වූ සඳුන්සුනු ද උතුම් සුවඳ දිසානුදිසාවන්හි විසුරුවති.

පොළෝතලයෙහි වූ මිනිස්සු සපු හොර මිදෙල්ල නා දොඹ කේතක (දුනුකේ) යන මල් දිසානුදිසාවන්හි උඩට විසුරුවති.

එහි දී මම කෙස් මුදා වැහැරි සිවුරත් අඳුන්දිවිසමත් මඩෙහි අතුරා යටිකුරුව වැද හොත්තෙමි.

බුදුරජාණන් වහන්සේ ශිෂ්‍යයන් (රහතන් වහන්සේලා) සමග මා ඇක්මගෙන (පාගාගෙන) වඩිනා සේක්වා. නො මඩ ඇක්ව වඩිනා සේක්නම් එය මට හිත පිණිස වන්නේ ය.

පොළොවෙහි වැද හොත්ත වූ මට මෙබඳු සිතක් ඇතිවිය. ඉදින් මම කැමැත්තෙම් නම් අද කෙලෙස් නසන්නෙමි.

මෙහිදී අප්‍රකට වේෂයකින් ධර්මය අවබෝධ කරගැනීමෙන් මට කවර ප්‍රයෝජනයක් වේ ද, බුදුබවට පැමිණ දෙවියන් සහිත ලෝකයෙහි බුදු වන්නෙමි.

ථාමදර්ශී වූ (උත්සාහවන්ත වූ) මා විසින් හුදකලාව (සසරින්) එතෙරවීමෙන් කවර ප්‍රයෝජනයක් ද, බුදුබවට පැමිණ දෙවියන් සහිත ලෝකයා (සසරින්) එතෙර කරන්නෙමි.

පුරුෂෝත්තම වූ බුදුරජාණන් වහන්සේ කෙරෙහි කරන ලද්දා වූ මාගේ මේ පිනෙන් බුදුබවට පැමිණ බොහෝ ජනයා එතෙර කරමි.

දහම් නැවට නැග සංසාර ඕඝය සිඳ ත්‍රිවිධ භවයන් නසා දෙවියන් සහිත ලෝකයා එතෙර කරන්නෙමි.

පූජාවෙන් පිළිගන්නා වූ දීපංකර බුදුරජාණන් වහන්සේ මාගේ හිස පැත්තෙහි සිට මේ වචනය වදාළේ ය.

උග්‍ර තපස් ඇති මේ තවුසා බලව්. මෙතෙමේ මෙයින් අප්‍රමාණ කල්ප ගණනකින් (සාරාසංඛ්‍ය කල්ප ලක්‍ෂයකින්) මත්තෙහි ලොවෙහි බුදු වන්නේ ය.

තථාගතයන් වහන්සේ රම්‍ය වූ කිඹුල්වත් නුවරින් නික්ම උත්සාහ වඩා දුෂ්කරක්‍රියා කොට,

තථාගතයන් වහන්සේ අජපල් රුක්මුල වැඩහිඳ එහිදී කිරිපිඬු නේරංජරා ගඟ වෙත පැමිණෙන සේක.

ඒ බුදුරජාණන් වහන්සේ නේරංජරා නදී තීරයේ දී කිරිපිඬු වළඳ පිළියෙල කරන ලද උතුම් මාර්ගයෙන් බෝධි මූලයට පැමිණෙන සේක.

ඉක්බිති අනුත්තර වූ මහත් යසස් ඇති උන්වහන්සේ බෝමැඩ පැදකුණු කොට ඇසතු රුක්මුලදී බුදුවන සේක.

උන්වහන්සේගේ මව මායා නම් වන්නී ය. පියා සුද්ධෝදන නම් වන්නේ ය. මුන්වහන්සේ ගෞතම නම් වන්නේ ය.

ආශ්‍රව රහිත වීතරාගී වූ ශාන්ත සිත් ඇති එකඟ වූ සිත් ඇති කෝලිත උපතිස්ස යන දෙදෙනා අග්‍ර ශ්‍රාවකයෝ වන්නාහ.

ආනන්ද නම් උපස්ථායකයන් වහන්සේ ඒ බුදුන්ට උපස්ථාන කරන්නාහ. ආශ්‍රව රහිත වූ වීතරාගී වූ ශාන්ත සිත් ඇති එකඟ වූ සිත්

ඛේමා උප්පවණ්ණා යන දෙදෙන අග්‍රශ්‍රාවිකාවෝ වන්නාහ. ඒ භාග්‍යවතුන් වහන්සේගේ බෝධිය ඇසතු නම් වන්නේ ය.

දස දහසක් සක්වළ දෙවියන් සහිත මනුෂ්‍යයෝ (අසම වූ දීපංකර) බුදුරජාණන් වහන්සේ මේ වචන අසා මෙතෙම බුද්ධාංකුරයෙකැයි සතුටු වූවෝ අසුරුසන් පවත්වති. අපොළති. සිනහ වෙති. ඇඳිලි බැඳ නමස්කාර කරති.

ඉදින් මේ බුදුරජාණන් වහන්සේගේ ශාසනය වරදවා ගත්තමෝ නම් අනාගත කාලයේද මුන්වහන්සේ හමුවෙමු.

නදියකින් එතර වන්නා වූ මනුෂ්‍යයෝ යම් සේ ඉහළින් වූ තොටුපළ වැරදී පහළ තොටුපළ ගෙන මහා නදිය තරණය කරත් ද,

එපරිදි අපි සියලු දෙනා ද මේ බුදුන් අත හැරුණොත් අනාගත කාලයේ දී මුන්වහන්සේ හමුවෙමු.

පූජාවන් පිළිගන්නා වූ දීපංකර බුදුරජාණන් වහන්සේ මාගේ (පුණ්‍ය) කර්මය ප්‍රකාශ කොට ප්‍රදක්ෂිණා කළ සේක.

එහි යම් බුද්ධපුත්‍රයෝ වූවාහු නම් (ඒ) සියලු දෙනාම මා පැදකුණු කළහ. මනුෂ්‍යයෝ ද නාගයෝ ද ගාන්ධර්වයෝ ද වැඳ නික්ම ගියාහු ය.

එකල්හි සංඝයා සහිත බුදුරජාණන් වහන්සේ මාගේ දර්ශනය ඉක්මවා වැඩි කල්හි සතුටු වූ මම සතුටු සිතින් අසුනෙන් නැගිටියෙමි.

එකල්හි (මම) සැපයෙන් සැපයට පත්වූයේ වෙමි. ප්‍රමෝදයෙන් ප්‍රමෝදයට පත්වූයේ, ප්‍රීතියෙන් ප්‍රීතියට පත්වූයේ පළඟක් බැඳගත්තෙමි.

එකල්හි මම පළඟින් හිඳ මෙසේ සිතීමි. මම ධ්‍යානයෙහි වසී වීමි. අභිඥාවන්ගේ පරතෙරට ගියේ වෙමි.

සහශ්‍රී ලෝකධාතුයෙහි මා හා සමාන ඍෂිවරු නැත්තාහ. ඍද්ධි ධර්මයන්ගේ අසම වූයෙමි මෙබඳු සුවයක් ලැබීමි.

මා පළඟ බඳිද්දී දසදහසක් සක්වල වැසියෝ ඒකාන්තයෙන් බුදුවන සේකැයි මහානාද පැවැත්වූහ.

පෙර බෝසත්වරුන් පළඟ බඳිද්දී යම් නිමිති දක්නට ලැබේ නම් ඒ නිමිති අද දක්නට ලැබේ.

සීතල පහව ගියේ වෙයි. උෂ්ණය සංසිඳෙයි. ඒ නිමිති අද දක්නට ලැබේ. ඒකාන්තයෙන් බුදු වන්නේ ය.

දස දහසක් ලෝකධාතුව නිශ්ශබ්ද වෙයි. නිරවුල් වෙයි. ඒ නිමිති අද දක්නට ලැබේ. ඒකාන්තයෙන් බුදුවන්නේ ය.

මහාවාත නො හමයි. ගංගාවෝ ගලා නො බසිත්. ඒ නිමිති අද දක්නට ලැබේ. ඒකාන්තයෙන් බුදුවන්නේ ය.

එකෙණෙහි ගොඩබිම ද ජලයෙහි ද (පිපෙන) සියලු පුෂ්පයෝ පිපෙත්. සියල්ලෝ ද අද පිපුණාහ. ඒකාන්තයෙන් බුදු වන්නේ ය.

එකෙණෙහි ලතාවෝ ද වෘක්ෂයෝ ද පලබර වෙති. ඒ සියල්ලෝ ද අද පල ගත්තේ ය. ඒකාන්තයෙන් බුදුවන්නේ ය.

එකෙණෙහි අහසෙහි වූත් පොළොවෙහි වූත් රත්නයෝ බබළත්. ඒ රත්නයෝ අද බබළත්. ඒකාන්තයෙන් බුදුවන්නේ ය.

ඒ කෙණෙහි මනුෂ්‍යයන්ගේත් දෙවියන්ගේත් තූර්යයෝ වාදනය වෙත්. අද ඒ දෙවැදෑරුම් තූර්යයෝ ද වෙසෙසින් රැව් දෙත්. ඒකාන්තයෙන් බුදු වන්නේ ය.

එකෙණෙහි අහසින් විසිතුරුමල් වැසි වසී. අද ඒවා ද වසී. ඒකාන්තයෙන් බුදුවන්නේ ය.

මහා සමුදුර උදම් වෙයි. දසදහසක් ලෝ කම්පාවෙයි. ඒ දෙදෙනාම අද වෙසෙසින් රැව් දෙත්. ඒකාන්තයෙන් බුදුවන්නේ ය.

එකෙණෙහි දසදහසක් නිරයෙහි ගිනි නිවෙයි. අද ඒ ගිනි ද නිවුණේ ය. ඒකාන්තයෙන් බුදු වන්නේ ය.

සූර්යයා නිර්මල වෙයි. සියලු තරු දිස්වෙයි. අදත් ඒවා දක්නට ලැබේ. ඒකාන්තයෙන් බුදුවන්නේ ය.

එකෙණෙහි පොළොවෙන් වැසි නැතිව ජලය මතුවිය. අදත් පොළොවෙන් ඒ ජලය මතුවෙයි. ඒකාන්තයෙන් බුදුවන්නේ ය.

අහස් තෙලෙහි නැකත් තරු සමූහයෝ බබළත්. සඳ විශාඛා නක්‍ෂත්‍රයෙහි එක්විය. ඒකාන්තයෙන් බුදු වන්නේ ය.

එකෙණෙහි සත්ත්වයන්ට අරතියක් ඇති නො වේ. සතුටු වූවෝ වෙත්. අද ඒ සියල්ලෝ ම සතුටු වූවාහු ය. ඒකාන්තයෙන් බුදු වන්නේ ය.

එකල්හි රෝග සංසිඳෙයි. බඩගින්න වැනසෙයි. ඒ ලකුණු ද අද දක්නට ලැබේ. ඒකාන්තයෙන් බුදු වන්නේ ය.

එකල්හි රෝග තුනී වෙයි. දෝස, මෝහ වැනසෙයි. අද ඒ සියල්ල පහව ගියේ ය. ඒකාන්තයෙන් බුදුවන්නේ ය.

එකල් බිය ඇති නොවෙයි. අදත් එය දක්නට ලැබෙයි. ඒ සලකුණෙන් දැනගතිමු. ඒකාන්තයෙන් බුදුවන්නේ ය.

දූලි උඩට මතු නොවෙයි. අදත් එය දක්නට ලැබේ. ඒ සලකුණෙන් දැන ගනිමු. ඒකාන්තයෙන් බුදුවන්නේ ය.

අනිටුගඳ පහව යයි. දිව්‍යමය සුවඳ හමයි. අදත් ඒ සුවඳ හමයි. ඒකාන්තයෙන් බුදුවන්නේ ය.

අරූපීන් හැර සියලු දෙවියෝ දක්නට ලැබෙත්. අදත් ඒ දෙවියෝ දක්නට ලැබෙත්. ඒකාන්තයෙන් බුදු වන්නේ ය.

එකෙණෙහි යම්තාක් නිරය වේ ද, ඒ සියල්ල දක්නට ලැබෙයි. අදත් ඒ සියල්ල දක්නට ලැබෙයි. ඒකාන්තයෙන් බුදුවන්නේ ය.

එකල්හි බිත්ති කවුළු සෙල් ආවරණ නොවෙයි. අද ඒවා අහස බවට පත්විය. ඒකාන්තයෙන් බුදු වන්නේය.

එකෙණෙහි චුති උත්පත්ති දක්නට නො ලැබේ. ඒවා අදත් දක්නට ලැබේ. ඒකාන්තයෙන් බුදු වන්නේ ය.

නො නවතින්න, දැඩිව වීර්යය ගෙන ඉදිරියට යන්න. අපි ද මෙය දනිමු. ඒකාන්තයෙන් බුදුවන්නේ ය.

එකල්හි මම බුදුන්ගේත් දසදහසක් ලෝවැසියන්ගේත් යන දෙපාර්ශ්වයේ ම වචනය අසා තුටුපහටු වූයෙම් ප්‍රමෝදයට පත්වූයෙම් මෙසේ සිතීමි.

ජින නම් වූ බුදුවරු වචන දෙකක් නැත්තෝ ය. හිස්වචන නැත්තෝ ය. බුදුවරුන්ගේ අනිස්ථිර වචන නැත. මම ඒකාන්තයෙන් බුදු වෙමි.

යම්සේ අහසට දමන ලද කැටක් ඒකාන්තයෙන් බිම වැටේ ද එසේම ශ්‍රේෂ්ඨ වූ බුදුවරුන්ගේ වචනය ස්ථිරය. ශාස්වතය.

යම් සේ සියලු සත්ත්වයන්ට මරණය ස්ථිර ද, ශාස්වත ද, එසේ ම ශ්‍රේෂ්ඨ වූ බුදුවරුන්ගේ වචනය ස්ථිරය. ශාස්වතය.

යම් සේ රාත්‍රිය ක්ෂයව ගිය කල්හි සූර්යයාගේ උදාව ස්ථිර ද, එසේ ම ශ්‍රේෂ්ඨ වූ බුදුවරුන්ගේ වචනය ස්ථිර ය. ශාස්වත ය.

යම් සේ සයනයෙන් නික්මුණු සිංහයාගේ නාද කිරීම ස්ථිර ද එසේ ම ශ්‍රේෂ්ඨ වූ බුදුවරුන්ගේ වචනය ස්ථිරය. ශාස්වත ය.

උඩ යට දස දිසා යන යම්තාක් ධර්මධාතු වේද එහි ඔබ මොබ ඒකාන්ත වශයෙන් බුද්ධාකාරක ධර්මයන් සොයමි.

එකල්හි (එසේ) සොයන්නා වූ මම පූර්ව මහර්ෂීන් වහන්සේලා විසින් අනුගමනය කළ මහා මාර්ගය වූ ප්‍රථම දාන පාරමිතාව දුටුවෙමි.

ඉදින් බුද්ධත්වය පැමිණීමට කැමැත්තෙහි නම් ඔබ පළමුවෙන් මේ දාන පාරමිතාව දැඩිකොට සමාදන්ව දාන පාරමිතාවට පැමිණෙන්න.

යම්කිසිවෙකු විසින් යටිකුරු කරන ලද පිරුණු කළයක් යම්සේ ජලය ඉතිරි නොකොට පිට කෙරේ ද, එහි නොරකී ද, (ඉතිරි නොකරයි ද)

එසේම හීන මධ්‍යම උත්කෘෂ්ට යාචකයන් දැක යටිකුරු කළ කළයක් සේ ඉතිරි නො කොට දන් දෙව.

මේ බුද්ධකාරක ධර්මයෝ මෙපමණක් නො වන්නාහ. බෝධි ඥානය මුහු කරවන්නා වූ යම් අනෙකුත් ධර්මයෝ වෙත් ද, ඒවා සොයන්නෙමි.

එකල්හි (එසේ) පරීක්‍ෂා කරන්නා වූ මම පූර්ව මහාර්ෂීන් වහන්සේලා විසින් සේවනය කරන ලද, නිතර සේවනය කරන ලද දෙවන සීල පාරමිතාව දුටිමි.

ඉදින් ඔබ බුද්ධත්වයට පැමිණීමට කැමති වන්නෙහි නම් මේ දෙවන පාරමිතාව දැඩිකොට සමාදන් ව සීල පාරමිතාවට පැමිණෙන්න.

යම්සේ සෙමර මුවා කිසියම් තැනෙක පැටලුණු වාලධිය ඇත්තේ එහි ම මරණයට පැමිණේ ද වාලධිය නො සිඳගනී ද,

එසේ ම සතර භූමින් පිළිබඳ සීලයක් පූරණය කරන්න. සෙමරා වාලධිය රකින්නාක් මෙන් හැමකල්හි ම සීලය ආරක්ෂා කරන්න.

මේ බුද්ධකාරක ධර්මයෝ මෙ පමණක් නො වන්නාහ. බෝධිය මුහුකරවන ධර්මයෝ වෙත් නම් ඒ ධර්මයන් ද සොයන්නෙමි.

එකල්හි එසේ පරීක්‍ෂා කරන්නා වූ (මම) පෙර බුදුවරයන් වහන්සේලා

විසින් සේවනය කරන ලද විශේෂයෙන් සේවනය කරන ලද තුන්වන නෙක්ඛම්ම පාරමිතාව දුටිමි.

ඉදින් ඔබ බුද්ධත්වයට පැමිණෙනු කැමැත්තෙහි නම් මේ තුන්වන පාරමිතාව දැඩිකොට සමාදන්ව නෙක්ඛම්ම පාරමිතාවට පැමිණෙන්න.

යම් සේ සිරගෙයි බොහෝ කලක් විසූ දුකින් පෙළුණු පුරුෂයෙක් එහි ඇල්මක් නූපදවයි ද මුක්තියම සොයයි ද,

එසේ ම ඔබත් සියලු භවයන් සිරගෙවල් මෙන් බලන්න. සසරින් මිදීම පිණිස නෛෂ්ක්‍රම්‍යයට අභිමුඛ වන්න.

බුද්ධකාරක ධර්මයෝ මෙපමණක් ම නො වන්නාහ. බෝධිය මුහුකරවන්නා වූ අනෙකුත් යම් ධර්මයෝ වෙත්නම් (ඒ ධර්මයන්ද) සොයන්නෙමි.

(එසේ) පරීක්ෂා කරන්නා වූ මම පෙර බුදුවරයන් වහන්සේලා විසින් සේවනය කරන ලද, විශේෂයෙන් සේවනය කරන ලද සතරවන ප්‍රඥා පාරමිතාව දුටිමි.

ඉදින් බුද්ධත්වයට පැමිණෙනු කැමැත්තෙහි නම් මේ සතරවන පාරමිතාව දැඩිව සමාදන්ව ප්‍රඥා පාරමිතාවට පැමිණෙන්න.

යම්සේ පිඬු පිණිස හැසිරෙන භික්ෂුවක් හීන මධ්‍යම උත්තම යැයි කුලයන් වර්ජනය නොකරමින් මෙසේ යැපීම ලබයි ද,

එසේ ම ඔබත් හැම කල්හිම පණ්ඩිත ජනයා විමසමින් ප්‍රඥා පාරමිතාවට පැමිණ සම්බෝධියට පැමිණෙන්න.

මේ බුද්ධකාරක ධර්මයෝ මෙපමණක් ම නො වන්නාහ. බෝධි කරවන්නා වූ වෙනත් යම් ධර්මයෝ වෙත්නම් ඒ ධර්මයන් ද පරීක්ෂා කරන්නෙමි.

(එසේ) සොයන්නා වූ (මම) පෙර බුදුවරයන් වහන්සේලා විසින් සේවනය කරන ලද, විශේෂයෙන් සේවනය කරන ලද පස්වන වීර්ය පාරමිතාව දුටිමි.

ඉදින් ඔබ බුද්ධත්වය පැමිණීමට කැමැත්තෙහි නම් මේ පස්වන පාරමිතාවන් දැඩිව සමාදන් ව වීර්ය පාරමිතාවට පැමිණෙන්න.

මෘගරාජන් වූ සිංහයා හැමකල්හි ම හිඳීම සිටීම සක්මන යන ඉරියව් පැවැත්මේ දී යම්සේ නො සැඟවුණු වීර්ය ඇත්තන් දැඩිව ගන්නා ලද මනස ඇත්තේ වේ ද,

එසේ ම ඔබ සියලු භවයේ දී දැඩි ව වීර්ය ගෙන වීර්ය පාරමිතාවට පැමිණ සම්බෝධියට පැමිණෙන්න.

මේ බුද්ධකාරක ධර්මයෝ මෙ පමණක් නො වන්නාහ. බෝධිය මුහුකරවන්නා වූ වෙනත් ධර්මයෝ වෙත් නම් (ධර්මයන් ද) සොයන්නෙමි.

එකල්හි එසේ සොයන්නා වූ මම පෙර බුදුවරයන් වහන්සේලා විසින් සේවනය කරන ලද විශේෂයෙන් සේවනය කරන ලද සවන ක්‍ෂාන්ති පාරමිතාව දුටුවෙමි.

ඔබ මේ සවන පාරමිතාව දැඩි ව සමාදන් ව එහි දෙසිතක් නොමැති ව සම්බෝධියට පැමිණෙන්න.

පෘථිවිය පිරිසිදු වූත් අපිරිසිදු වූත් සියලු නික්‍ෂේපයන් (පොළොව මත දමන ද්‍රව්‍ය) යම් සේ නම් ඉවසයි ද ක්‍රෝධයක් හෝ දයාවක් නොකරයි ද,

එසේ ම ඔබත් සියලු දෙනාගේ සම්මාන අවමාන ඉවසන්නෙකු ව ක්‍ෂාන්ති පාරමිතාවට පැමිණ සම්බෝධියට පැමිණෙන්න.

මේ බුද්ධකාරක ධර්මයෝ මෙපමණක් නො වන්නාහ. බෝධිය මුහුකරවන්නා වූ වෙනත් ධර්මයෝ වෙත් නම් (ඒ ධර්මයන් ද) සොයන්නෙමි. එකල්හි එසේ සොයන්නා වූ මම පෙර මහාර්ෂී වූ

බුදුරජාණන් වහන්සේලා විසින් සේවනය කරන ලද, විශේෂයෙන් සේවනය කරන ලද සත්වන සත්‍ය පාරමිතාව දුටිමි.

ඔබ මේ සත්වන පාරමිතාව දැඩි කොට සමාදන් ව එහි වචන දෙකක් නොමැති ව සම්බෝධියට පැමිණෙන්න.

දෙවියන් සහිත ලෝකයාට තුලාවක් බඳු වූ ඔසධී නම් තාරකාව යම් සේ වස්සාන ඍතු සමයේ හෝ වීථියෙන් (=ගමන් මාර්ගයෙන්) ඉවතට නොයේ ද,

එසේ ම ඔබ ද සත්‍යයේ දී වීථිය (=හෙවත් මාර්ගය නො ඉක්මවන්න. සත්‍ය පාරමිතාවට පැමිණ සම්බෝධියට පැමිණෙන්න.

මේ බුද්ධකාරක ධර්මයෝ මෙපමණක් ම නො වන්නාහ. බෝධිය මුහුකරවන්නා වූ වෙනත් ධර්මයෝ වෙත් නම් (ඒ ධර්මයන් ද) සොයන්නෙමි.

එකල්හි එසේ පරීක්‍ෂා කරන්නා වූ මම පෙර බුදුවරයන් වහන්සේලා විසින් සේවනය කරන ලද, විශේෂයෙන් සේවනය කරන ලද අටවන අධිෂ්ඨාන පාරමිතාව දුටිමි.

ඔබ මේ අටවන පාරමිතාව දැඩිකොට සමාදන් ව ඔබ එහි නිශ්චලව සම්බෝධියට පැමිණෙන්න.

යම් සේ නිශ්චල වූ මනාව පිහිටි පර්වත නම් වූ ශෛලයක් තද සුළඟින් කම්පා නොවේ ද ස්වකීය ස්ථානයේ ම සිටීද,

එසේ ම ඔබත් හැමකල්හි ම අධිෂ්ඨාන පාරමිතාවෙහි නිශ්චල වන්න. අධිෂ්ඨාන පාරමිතාවට පැමිණ සම්බෝධියට පැමිණෙන්න.

මේ බුද්ධකාරක ධර්මයෝ මෙපමණක් ව නො වන්නාහ. බෝධිය මුහුකරවන්නා වූ වෙනත් ධර්මයෝ වෙත් නම් ඒ ධර්මයන් ද සොයන්නෙමි.

එකල්හි එසේ පරීක්ෂා කරන්නා වූ මම පෙර බුදුවරයන් වහන්සේලා විසින් සේවනය කරන ලද විශේෂයෙන් සේවනය කරන ලද නවවන මෛත්‍රී පාරමිතාව දුටිමි.

ඉදින් ඔබ බෝධියට පැමිණීමට කැමැත්තෙහි නම් මේ නවවන පාරමිතාව දැඩිකොට සමාදන් ව මෛත්‍රියෙහි අසමයෙක් වන්න.

යම් සේ ජලය කලණ වූත් පාපී වූත් ජනයන් සිහිලෙස සමව පතුරුවයි ද, දූලි හා මල පාකර යවයි ද,

එසේ ම ඔබත් හිත වූත් අහිත වූත් ජනයන්ට සම ව මෛත්‍රිය වඩන්න. මෛත්‍රී පාරමිතාවට පැමිණ සම්බෝධියට පැමිණෙන්න.

මේ බුද්ධකාරක ධර්මයෝ මෙපමණක් ම නො වන්නාහ. බෝධිය මුහුකරවන්නා වූ වෙනත් ධර්මයෝ වෙත් නම් ඒ ධර්මයන් ද සොයමි.

එකල්හි එසේ සොයන්නා වූ මම පෙර බුදුවරුන් විසින් සේවනය කරන ලද විශේෂයෙන් සේවනය කරන ලද දසවන උපේක්ෂා පාරමිතාව දුටිමි.

ඔබ මේ දසවන පාරමිතාව දැඩි ව සමාදන් ව තුලාවක් වැනි වූයේ දැඩි වූයේ සම්බෝධියට පැමිණෙන්න.

යම් සේ පොළොව (එහි) දමන ලද අපිරිසිදු වූත් පිරිසිදු වූත් දෙවගය ම ක්‍රෝධ අඥානය දෙකින් තොර ව උපේක්ෂාවෙන් සලකා ද,

එසේ ම ඔබ ද හැමකල්හි ම සැපදුක් දෙකෙහි තුලාවක් මෙන් වන්න. උපේක්ෂා පාරමිතාවට පැමිණ සම්බෝධියට පැමිණෙන්න.

ලෝකයෙහි බෝධිය මුහුකරවන්නා වූ යම් ධර්මයෝ වෙත් නම් ඒ ධර්මයෝ මෙපමණක් විය. මෙයින් උඩ වෙනත් තැනක නැත. දැඩි කොට ඒ ධර්මයන්හි පිහිටන්න.

මේ ධර්මයන් ස්වභාව රස ලක්ෂණ වශයෙන් සම්මර්ශනය කරන්නා වූ ඒ බෝධිසත්ත්වයන්ගේ ධර්ම තේජසින් දසදහසක් ලෝකය කම්පා විය.

පෙළන ලද උක්සකක් මෙන් පොළොව සැලෙද්දී රැව් දෙද්දී තෙලියත සකක් මෙන් පොළොව කම්පා වෙයි.

බුදුරජාණන් වහන්සේ වැළඳවීමෙහි යම්තාක් පිරිසක් වූ නම් ඒ පිරිස වෙව්ලමින් මූර්ජා වූවාහු එහි බිම සයනය කළහ.

එහි නොයෙක් දහස් ගණන් කළ ද බොහෝ සියගණන් කුඹු ද කැළඹී එකිනෙක ගැටී සුණු විය.

උද්වේගයට පත් ත්‍රාසයට පත් බියට පත් භ්‍රාන්ත වූ ව්‍යාධියට පත් සිත් ඇති මහජනයා රැස්ව දීපංකර බුදුන් වෙත පැමිණියහ.

ලොවට කුමක් වේ ද, යහපතක් ද? නපුරක් ද? සියලු ලොව උපද්‍රවයට පත් විය. චක්ෂුර්මත් වූ (පසැස් ඇති) බුදුරජාණන් වහන්ස, එය (ඒ සැකය) දුරුකරන්න.

එකල්හි දීපංකර මහා මුනීන්ද්‍රයන් වහන්සේ මේ පොළෝ කම්පාවෙහි විශ්වාස ඇත්තෝ වන්න බිය නොවන්නැයි ඔවුන්ට හැඟවූහ.

ලෝකයෙහි බුදුවරයෙක් පහළ වන්නේ යැයි මම අද යම් ප්‍රකාශයක් කෙළෙම් ද, එතෙම පෙර බුදුවරයන් වහන්සේලා සේවනය කළ ධර්මය සම්මර්ශනය කරයි.

බුද්ධකාරක ධර්මයන් නිරවශේෂ කොට සම්මර්ශනය කරන්නා වූ ඔහු විසින් මේ දෙවියන් සහිත දසදහසක් ලෝකධාතුව කම්පා කරවන ලදී.

එකෙණෙහි බුදුන්ගේ වචනය අසා සිත නිවිණ. සියලු දෙන ම මා වෙත එළඹ නැවතත් වැන්දාහ.

බුදුගුණ සමාදන් ව මනස දැඩිකොට ගෙන දීපංකර බුදුන් වැඳ එකල්හි අස්නෙන් නැගී සිටියෙමි.

උභය දිව්‍ය මනුෂ්‍යයෝ අස්නෙන් නැගෙන්නා වූ මට දිව්‍යමය වූත් මනුෂ්‍යමය වූත් මල් විසුරුවත්.

ඒ උභය දිව්‍ය මනුෂ්‍යයෝ ඔබගේ ප්‍රාර්ථනාව මහත්ය. එය කැමති පරිදි ලබන්නැයි යහපත ප්‍රකාශ කළහ.

සියලු උවදුරු දුරුවේවා. ශෝක රෝග නැසේවා. ඔබට අන්තරාය නොවේවා. වහා උතුම් වූ බෝධිඥානය අවබෝධ කරගන්න.

කල් පැමිණි විට යම්සේ මල් හටගන්නා වෘක්ෂයෝ පිපෙත් ද, මහා වීරයන් වහන්ස, ඔබවහන්සේ බෝධි ඥානයෙන් පිපෙන්න.

යම්කිසි බුදුවරයෝ යම් සේ දසපාරමීන් පිරුවාහු ද, මහාවීරයන් වහන්ස, ඔබවහන්සේත් දසපාරමීන් පුරන්න.

යම්කිසි බුදුවරයෝ යම් සේ බෝමැඩදී බුද්ධත්වය අවබෝධ කෙරෙත් ද, මහාවීරයන් වහන්ස, ඔබවහන්සේත් එසේම බෝමැඩදී බුද්ධත්වය අවබෝධ කරගන්න.

යම්කිසි බුදුවරයෝ යම්සේ දම්සක් පැවැත්වූ ද මහාවීරයන් වහන්ස, ඔබවහන්සේත් එසේ ම දම්සක් පවත්වන්න.

පසළොස්වක චන්ද්‍රයා යම්සේ පිරිසිදු ව බබළා ද එසේ ම ඔබවහන්සේත් පිරුණු මනසින් යුතු ව දසදහසක් ලෝකධාතුවෙහි බබළන්න.

රාහුගෙන් මිදුණු සූර්යයා යම්සේ තේජසින් අතිශයින් බබළා ද, එසේ ම ඔබවහන්සේත් ලොව මුදා සිරියෙන් බබළන්න.

යම්සේ ඒ සියලු නදීහු මහා සාරයට ගලා බසිත් ද, එසේ ම දෙවියන් සහිත ලෝවැසියෝ ඔබ වෙත පැමිණෙත්වා.

ඔවුන් විසින් ස්තුති ප්‍රශංසා කරනු ලැබූ ඒ සුමේධ තාපසයන් වහන්සේ දසපාරමී ධර්මයන් සමාදන්ව ඒ ධර්මයන් සපුරමින් එකල්හි වනයට පිවිසියහ.

## සුමේධ කථා නිමා විය.

එකල්හි ඕව්හූ සංසයා සහිත වූ ලෝක නායකයන් වහන්සේ වළඳවා ඒ දීපංකර බුදුන් සරණ ගියහ.

දීපංකර තථාගතයන් වහන්සේ කිසිවෙකු සරණාගමනයෙහි ද, කිසිවෙකු පංච ශීලයෙහි ද තවත් අයෙකු දශවිධ ශීලයෙහි ද පිහිටුවූහ.

උන්වහන්සේ කිසිවෙකුට පැවිද්ද ද, කිසිවෙකුට උතුම් වූ සතර ඵලයන් ද කිසිවෙකුට අසම ධර්මයන් වූ සිවුපිළිසිඹියාවන් ද දෙන සේක.

නර ශ්‍රේෂ්ඨ වූ ඒ බුදුරජාණන් වහන්සේ කිසිවෙකුට උතුම් වූ අෂ්ට සමාපත්තිය ද කිසිවෙකුට ත්‍රිවිද්‍යාවන් ද කිසිවෙකුට ෂට් අභිඥාවන් ද දෙන සේක.

මහා මුනීන්ද්‍රයන් වහන්සේ ඒ යෝගයේ දී ජනකායට අවවාද කරන සේක. ඒ ජනකාය විසින් ලෝකනාථයන් වහන්සේගේ ශාසනය පතුරුවන ලද්දේ ය.

මහා හනු ඇති වෘෂභ ස්කන්ධ වූ ඒ දීපංකර නම් වූ බුදුරජාණන් වහන්සේ බොහෝ ජනයා (සසරින්) එතර කරන සේක. දුගතියෙන් මුදන සේක.

මහා මුනි තෙමේ සියදහස් යොදුන්හි වූ ද බෝධනීය ජනයා දැක සැණෙකින් එළඹ ඒ ජනයා අවබෝධ කරවන සේක.

බුදුරජාණන් වහන්සේ ප්‍රථම බෝධිසමයේ දී කෝටි සියයක් අවබෝධ කරවූ සේක. ද්විතීයහි සමයේදී නාථයන් වහන්සේ අනූකෝටියක් අවබෝධ කරවූ සේක.

බුදුරජාණන් වහන්සේ යම් අවස්ථාවක දී දිව්‍ය භවනයේ දී ධර්මය දේශනා කළ සේක් ද (ඒ අවස්ථාවේදී) කෝටි අනූදහසකි. තෘතියාභිසමය විය.

දීපංකර බුදුරජාණන් වහන්සේගේ සන්නිපාත (සේවිත) තුනක් විය. ප්‍රථම සමාගම කෝටි ලක්‍ෂයකට විය.

නැවත බුදුරජාණන් වහන්සේ නාරද කූටයෙහි විවේකගතව වැඩහුන් කල්හි පහකළ කෙලෙස්මල ඇති කෝටි සියක් ක්‍ෂීණාශ්‍රවයන් වහන්සේලා රැස්වූහ.

කෙලෙසුන් වසඟ කළ මහාවීරයන් වහන්සේ යම් අවස්ථාවක සුදර්ශන පර්වතයේ වැඩසිටි සේක් ද, එකල්හි බුදුරජාණන් වහන්සේ කෝටි අනූදහසක් සමග පැවරූ සේක.

මම එසමයෙහි උග්‍ර තපස් ඇති, අහසෙහි හැසිරෙන පංචභිඥාවන්හි පරතෙරට පැමිණි ජටිලයෙක් වීමි.

ඒ අවස්ථාවේ දී දෙලක්‍ෂයකට ධර්මාවබෝධය විය. එක්කෙනා දෙදෙනා බැගින් අවබෝධ කරගත් අය ගණනින් අසංඛ්‍යයහ.

එකල දීපංකර බුදුරජාණන් වහන්සේගේ ශාසනය බොහෝ ජනයා අතර පැතිරුණේ, සමෘද්ධිමත් වූයේ, අතිශයින් පිරිසිදු වූයේ ද, විය.

හැමකල්හි ෂට් අභිඥාප්‍රාප්ත මහත් ඍද්ධි ඇති හාරලක්ෂයක් (ශ්‍රාවකයන් වහන්සේලා) දීපංකර බුදුන් පිරිවැරූහ.

එසමයෙහි ඇතැම් කෙනෙක් මිනිසත් බව අත්හරිත්. නො පැමිණි අර්හත්ඵල ඇති ඒ ශෛක්‍ෂයෝ ගර්හිතයෝ මෙන් වෙත්.

තාදීගුණයෙන් (අටලෝ දහමින් නොසැලෙන) යුත් රහතන් වහන්සේලා විසින් ශාසනය මනාව පුබුදුවන ලදී. දෙවියන් සහිත ලෝකය හොබනේ වෙයි.

දීපංකර බුදුරජාණන් වහන්සේට රම්‍යවතී නම් නුවරක් විය. සුදේව නම් රජ (පියා විය.) මව සුමේධා නම් වූවා ය.

දීපංකර බුදුරජාණන් වහන්සේට සුමංගලය. තිස්සය යන දෙනම අග්‍ර ශ්‍රාවකයෝ වූහ. උපස්ථායකයන් වහන්සේ සාගත නම් විය.

නන්දා සුනන්දා යන දෙදෙන අග්‍රශ්‍රාවිකාවෝ වූහ. ඒ භාග්‍යවතුන් වහන්සේගේ බෝධිය පුලිල (රුක) යැයි කියනු ලැබේ.

අසූරියනක් උස් වූ දීපංකර මහා මුනීන්ද්‍රයන් වහන්සේ පහන් රුකක් මෙන් ද, පිපුණු සාලවෘක්ෂ රාජයකු මෙන් ද බබළන සේක.

මහර්ෂි වූ ඒ බුදුන්ට ලක්ෂයක් ආයු වෙයි. එතෙක් කල් වැඩසිටිනා වූ උන්වහන්සේ බොහෝ ජනතාව (සසරින්) එතර කරවන සේක.

ශ්‍රාවකයින් සහිත වූ ඒ (භාග්‍යවතුන් වහන්සේ) සද්ධර්මය බබුළුවා මහජනයා (සසරින්) සමාන කොට ගිනිකඳක් මෙන් බැබළී පිරිනිවී සේක.

(උන්වහන්සේ ගේ) ඒ ඍද්ධියත්, ඒ කීර්තියත් ශ්‍රී පාදයන්හි වූ ඒ චක්‍රරත්නත් යන සියල්ල අතුරුදහන් විය. සියලු සංස්කාරයෝ ඉතිරි නො වන්නේ වේ ද?

දීපංකර භාග්‍යවතුන් වහන්සේට මෑත භාගයේ දී එක් අසංඛ්‍යයක් ඉක්ම කොණ්ඩඤ්ඤ නම් ශාස්තෘන් වහන්සේ පහළ වූ සේක. උන්වහන්සේට ද ශ්‍රාවක සන්නිපාත තුනක් විය. පළමුවන සන්නිපාතයේ දී කෝටිලක්ෂයකි. දෙවන සන්නිපාතයේ දී කෝටි දහසකි. තුන්වන සන්නිපාතයේ දී අනූකෝටියකි. එකල්හි බෝසතාණෝ විජිතාවී නම් සක්විති රජව බුද්ධප්‍රමුඛ කෝටි ලක්ෂයක් භික්ෂු සංඝයාට මහා දානයක් දුන්හ. ශාස්තෘන් වහන්සේ බෝසතුන් බුදුවන්නේ යැයි ප්‍රකාශ කොට දහම් දෙසූ සේක. ඒ බෝසතාණෝ ශාස්තෘන් වහන්සේගේ ධර්මකථාව අසා රාජ්‍යය භාරදී පැවිදි වූ සේක් ත්‍රිපිටකය ඉගෙන අෂ්ට සමාපත්ති ද පංච අභිඥාවන් ද උපදවාගෙන නො පිරිහුණු ධ්‍යාන ඇතිසේක් බඹලොව උපන්හ. කොණ්ඩඤ්ඤ බුදුරජාණන් වහන්සේට වනාහි රම්‍යවතී නම් නුවරක් විය. සුනන්ද නම් රජ පියා විය. මව සුජාතා නම් වූවා ය. භද්‍රය,

සුභද්‍රය යන අග්‍ර ශ්‍රාවකයෝ දෙදෙනෙක් වූහ. අනුරුද්ධ නම් උපස්ථායකයෙක් විය. තිස්සා ය උපතිස්සා ය යන අග්‍රශ්‍රාවිකාවෝ දෙදෙනෙක් වූහ. සල්කලණ බෝධිය විය. ශරීරය අසූඅටරියන් විය. ආයු ප්‍රමාණය අවුරුදු ලක්ෂයක් විය.

උන්වහන්සේට මෑතභාගයේ දී එක් අසංඛ්‍යයක් ඉක්ම එක් කපෙක්හිම මංගලය, සුමනය, රේවතය, සෝභිතය යන බුදුවරු සතර නමක් උපන්හ. මංගල බුදුරජාණන් වහන්සේට වනාහි ශ්‍රාවක සන්නිපාත තුනෙක් පළමුවන සන්නිපාතයේ දී භික්ෂූන් වහන්සේලා කෝටි ලක්ෂයක් වූහ. දෙවන සන්නිපාතයේ දී කෝටි දහයක් වූහ. තුන්වන සන්නිපාතයේ දී අනූකෝටියක් වූහ.

උන්වහන්සේගේ එක් පියෙකු හා වෙනස් මවුවරුන් ඇති සොහොයුරු වූ ආනන්ද නම් කුමාර තෙම වනාහි අනූකෙළක් පිරිස සමග බණ ඇසීම පිණිස බුදුන් වෙත ගියේ ය. බුදුරජාණන් වහන්සේ ඔහුට පිළිවෙළ කථාව වදාළ සේක. හෙතෙම පිරිවර සමග සිව්පිළිසිඹියාව සමග රහත් විය. ශාස්තෲන් වහන්සේ ඒ කුලපුත්‍රයන්ගේ පෙර සිරිත බලනසේක් ඍද්ධිමය පාසිවුරුවලට හේතුසම්පත් දැක දකුණු අත දිගුකොට 'මහණෙනි, එව්' යැයි වදාළහ. එකෙණෙහි ම සියලු දෙන ඍද්ධිමය පාසිවුරු දරන්නෝ සැටවයස් තෙරුන් මෙන් ආකල්ප සම්පන්නව බුදුන් වැඳ පිරිවරා ගත්හ. මෙය උන්වහන්සේගේ තුන්වන ශ්‍රාවක සන්නිපාතය විය. යම්සේ අන් බුදුවරුන්ට හාත්පස අසූරියනක් පමණ ම ශරීර ප්‍රභාවක් වේ ද? උන්වහන්සේට එසේ නොවී ය. ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශරීරප්‍රභාව වනාහි හැමකල්හි ම දශසහස්‍රී ලෝකධාතුව පැතිර සිටියේ ය. වෘක්ෂ-පෘථුවි පර්වත-සමුද්‍රාදිය යටත් පිරිසෙයින් සැළි ආදිය පවා රන්පටින් වැසූවා මෙන් විය. උන්වහන්සේගේ ආයුෂ ප්‍රමාණය වනාහි අවුරුදු අනූදහසක් විය. එතෙක් කල් සඳහිරු ආදීහු තමාගේ ප්‍රභාවෙන් බබළන්නට නොහැකි වූහ. රෑ දාවල් පිරිසිඳීමක් නො පැනිණි. සත්ත්වයෝ දහවල් සූර්යාලෝකයෙන් මෙන් බුද්ධාලෝකයෙන් ම හැසුරුණහ. සවස පිපෙන කුසුම්වලින් ද අලුයම රැවුදෙන පක්ෂීන්ගෙන් ද ලෝකවාසීහු රෑ දාවල් වෙනස දැනගත්හ. කිමෙක් ද? අන් බුදුවරුන්ට වනාහි මේ ආනුභාවය නැද්ද? නැත්තේ නො වේ. උන්වහන්සේලා ද බලාපොරොත්තු වන්නාහු නම් දස දහසක් ලෝකධාතුව හෝ ඊටත් වැඩියෙන් හෝ ආලෝකය පතුරන්නාහ.

මංගල බුදුරජාණන් වහන්සේගේ වනාහි පූර්ව ප්‍රාර්ථනා වශයෙන් අන් බුදුවරුන්ගේ ඛ්‍යාමප්‍රභාව මෙන් ශරීරප්‍රභාව නිතරම දසදහසක් ලෝකධාතුව පැතිර සිටියේ ය. උන්වහන්සේ වනාහි බෝධිසත්ත්ව චර්යා කාලයෙහි වෙසතුරු සමාන ආත්මභාවයෙහි සිටිසේක් අඹුදරුවන් සමග වංක පර්වතය සමාන පර්වතයක විසූ සේක. ඉක්බිති ඛරදාඨික නම් යක්‍ෂයෙක් මහා පුරුෂයාණන්ගේ දානධ්‍යාසය අසා බමුණු වෙසකින් අවුත් මහබෝසතුන්ගෙන් දරු දෙදෙන ඉල්ලී ය. මහබෝසතාණන් වහන්සේ බමුණාට දරුවන් දෙමියි තුටුපහටුව ජලය කෙළවර කොට ඇති පොළොව කම්පා කෙරෙමින් දරුවන් දෙදෙනා ම දුන් සේක. යක්‍ෂ තෙම සක්මන කෙළවර ආලම්බන ඵලකය ඇසුරුකොට සිටියේ මහසතුන් බලා සිටියදීම අල පොකුරක් මෙන් දරු දෙදෙන කෑයේ ය. යකු බලා, විවෘත කළ කල්හි ගිනිජාලාවක් මෙන් ලේ දහර වගුරුවන ඔහුගේ මුව දැක ද බෝසතුන්ට කෙසඟක් පමණකුදු දොම්නසක් නූපන්නේ ය. ඒකාන්තයෙන් මා විසින් මනාව දෙන ලද දානයකැයි සිතන්නා වූ උන්වහන්සේගේ ශරීරයෙහි මහත් ප්‍රීතියක්, සොම්නසක් උපන්නේ ය. උන්වහන්සේ මාගේ ක්‍රියාවෙන් අනාගතයේ දී මේ ආකාරයෙන් ම ශරීරයෙන් රශ්මි නික්මේවායි ප්‍රාර්ථනා කළහ. උන්වහන්සේගේ ඒ ප්‍රාර්ථනාව නිසා බුදු වූ උන්වහන්සේගේ සිරුරින් රශ්මි නික්ම මෙතෙක් තැන පැතිරිණ. උන්වහන්සේගේ තවත් පූර්ව චරිතයක් ඇත. උන්වහන්සේ වනාහි බෝසත් කල්හි එක් බුදුකෙනෙකුන්ගේ සෑයක් දැක මේ බුදුන්ට මා විසින් ජීවිතය පරිත්‍යාග කරන්නට වටනේයැයි දඬු පහනක් වෙළන අයුරින් සියලු සිරුර වෙළවා රියනක් පමණ මොට්ටුවක් තබා ලක්‍ෂයක් අගනා රන් පාත්‍රයක් ගිතෙලින් පුරවවා එහි දහසක් වැටි දල්වවා එය හිසින් ගෙන සියලු සිරුර දල්වවා ගෙන සෑය පැදකුණු කරනුයේ මුළු රැය ගෙවූහ. මෙසේ අරුණු නැගෙන තෙක් ම මාත්‍රයකුදු උණුසුම් නො වීය. පියුම් ගැබකට පිවිසි කලක් මෙන් විය. මේ ධර්මය වනාහි තමා රක්නහු රක්නේ ය. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ.

ධම්මො හවෙ රක්ඛති ධම්මචාරිං
ධම්මො සුචිණ්ණො සුඛමාවහාති
එසානිසංසො ධම්මෙ සුචිණ්ණෙ
න දුග්ගතිං ගච්ඡති ධම්මචාරී යනුයි.

ධර්මය ඒකාන්තයෙන් ධර්මයෙහි හැසිරෙන්නහු රකී. මනාව පුහුණු කළ ධර්මය සැප ගෙනදෙයි. මේ මනාව පුහුණු කළ ධර්මයෙහි අනුසස් ය. ධර්මයෙහි හැසිරෙන්නා දුගතියට නො යයි.

මේ කර්මයේ ආනිසංසයෙන් ද ඒ භාග්‍යවතුන් වහන්සේගේ ශරීරාලෝකය දසදහසක් ලෝකධාතුව පැතිර සිටියේ ය. එකල අපගේ බෝසතාණෝ සුරුචි නම් බමුණෙක් ව බුදුන් නිමන්ත්‍රණය කරමියි එළඹ මිහිරි බණ කථාව අසා 'ස්වාමීනි, හෙට මාගේ දන් පිළිගන්නැයි කියා 'බමුණ, ඔබට කෙතෙක් භික්ෂූන් අවශ්‍යදැයි ඇසූ සේක. ස්වාමීනි, ඔබවහන්සේගේ පිරිවර භික්ෂූහු කොපමණද? ඇසීය.

එකල්හි බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම සන්නිපාතය ම වෙයි. එහෙයින් කෙළ ලක්ෂයකැයි වදාළහ. ස්වාමීනි, සියලු දෙනාම සමග මාගේ දානය පිළිගන්නැයි කීය. ශාස්තෲන් වහන්සේ ඉවසා වදාළ සේක. බමුණු තෙමේ පසුදින සඳහා ආරාධනා කොට ගෙට යනුයේ (මෙසේ) සිතී ය. මම මෙතෙක් භික්ෂූන්ට කැඳ බත් වස්ත්‍රාදිය දෙන්නට නො හැක්කෙම් නො වෙමි. හිඳිනා තැන් වනාහි කෙසේ වන්නේදැයි යනුයි. ඔහුගේ ඒ සිතුවිල්ල අසූහාරදහසක් යොදුන් මත්තෙහි සිටි සක්දෙව්රජුගේ පඬුපුල සෙලසුන උණු බව දැන්වීය. සක්දෙව්රජ 'කවරෙක් නම් මා මෙතැනින් සොලවනු කැමැත්තේ දැයි දිවැසින් ලොව බලනුයේ මහා පුරුෂයාණන් දැක 'සුරුචි බමුණා බුදුපාමොක් බික්සඟනට ආරාධනා කර හිඳුනා තැන් සිතී ය. මා ද එතැනට ගොස් පින් කොටසක් ගන්නට වටී යැයි වඩු වෙසක් මවාගෙන වෑ පොරෝ ගත් අතැතිව මහා පුරුෂයාණන් ඉදිරියේ පහළ විය. (පහළ වී) කිසිවෙකුට කුලියට කළයුතු වැඩක් ඇද්දැ'යි කීය. මහා පුරුෂයාණෝ ඔහු දැක 'කුමන වැඩක් කරන්නෙහිදැයි ඇසූහ. මා නො දන්නා ශිල්පයක් නම් නැත. ගෙයක් හෝ මඩුවක් හෝ යමෙක් යමක් කරවයි නම් ඔහුගේ ඒ වැඩය කරන්නට දනිමි'යි කීය. 'එසේ නම් මාගේ වැඩක් ඇතැයි කීය. 'ස්වාමීනි, කුමක්දැයි' ඇසී ය. 'මා විසින් හෙට දවස පිණිස කෙළ ලක්ෂයක් භික්ෂූන් වහන්සේලා ආරාධනා කරනු ලැබූහ. උන්වහන්සේලාට වැඩසිටිනට මඩුවක් කරන්නැ'යි කීහ. 'එසේ නම් මට කුලී ගෙවන්නට හැකිදැ'යි (ඇසී ය) 'දරුව, හැක්කේ වෙමි' කීහ. 'යහපත් කරමි'යි ගොස් එක් පෙදෙසක් බැලී ය. දොළොස් තෙළෙස් පමණ වූ පෙදෙස කිසුණු මඬලක් මෙන් සමතලා විය.

හෙතෙම මෙතෙක් තැන සත්රුවන්මය මඩුවක් පැනනගීවා'යි සිතා බැලී ය. එකෙණෙහි ම පොළොව බිඳගෙන මඩුවක් පැනනැගුණි. එහි රන්මුවා ටැම්වල රිදීමය කළස් විය. රිදීමය ටැම්වල රන්මුවා කළස් විය. මිණිටැම්හි පබළුමය (කළස්) විය. පබළු ටැම්හි මිණිමුවා (කළස්) විය. සත්රුවන්මුවා ටැම්හි සත්රුවන්මුවා කළස් විය. ඉක්බිති මඩුවෙහි අතරතුර කිකිණිදැල් එල්බේවායි බැලී ය. බැලීමත් සමගම කිකිණිදැල් එල්බිණ. ඒ කිකිණිදැල් මඳපවන් වැදෙනවිට පංචාංගික තූර්යයෙන් මෙන් මිහිරිහඬ නික්මෙයි. දිව්‍ය සංගීත පවත්වන කාලයක් මෙන් විය. අතරතුර සුවඳදම් මල්දම් එල්බේවායි සිතී ය. එකෙණෙහි ම (සුවඳදම් මල්දම්) එල්බිණ. ගණනින් කෝටිලක්ෂයක් වූ භික්ෂූන් වහන්සේලාට අසුන් සහ ආධාරක පොළොව බිඳගෙන පැනනගීවායි සිතී ය. එකෙණෙහි ම පැන නැගිණ. කොණක් කොණක් පාසා එක එක දියසැළි පැනනගීවායි සිතී ය. එකෙණෙහි ම දියසැළි පැන නැගිණ. මෙතෙක් දේ මවා බමුණා වෙත ගොස් එන්න ස්වාමීනි, ඔබගේ මඩුව බලා මාගේ කුලිය දෙන්නැයි කීය. මහා පුරුෂයාණෝ ගොස් මඩුව බැලූහ. බලන්නා වූ ම බෝසතුන්ගේ මුළු සිරුර පස්වනක් ප්‍රීතියෙන් අතරක් නැතිව ස්පර්ශ කරන ලද්දේ විය. ඉක්බිති මඩුව බලා බෝසතුන්ට මෙබඳු සිතක් විය. මේ මඩුව මිනිසකු විසින් කරන ලද්දක් නො වේ. මාගේ අදහසට මාගේ ගුණයට ඒකාන්තයෙන් ශක්‍රභවනය උණුවිය. ඉක්බිති සක්දෙව් රජු විසින් මේ මඩුව කරන ලද්දේය කියා යි. මා විසින් මේ මඩුවෙහි එක්දිනක් පමණක් දන් දීම යුතු නො වේ. සත්දිනක් දෙමියි සිතීය. බාහිර දේ දීමනම් කොතෙකුත් අයට සමාන ය. එය බෝසතුන් සතුටු කරන්න නොහැකි වෙයි. අලංකාර කරන ලද හිස් සිඳ අඳුනින් සැරසූ ඇස් උපුටා, හදමස් උපුටා දුන් කල්හි බෝසතුන්ට ත්‍යාගය නිසා සතුට ඇති වෙයි. අප බෝසතුන්ට ද සිවි ජාතකයෙහි දී දිනපතා කහවණු පස් අමුණක් වැයකොට නුවර දොර සතරේ ද නුවර මැද ද දන් දෙන්නා වූ බෝසතුන්ට ඒ දානය ත්‍යාගය පිළිබඳ සතුටක් උපදවන්නට නො හැකි විය. යම් අවස්ථාවක බමුණු වෙස් ගත් සක්දෙව්රජ පැමිණ ඇස් ඉල්ලී ද එදා ඒ ඇස් උපුටා දෙද්දී ම සතුට උපන්නේ ය. සිත කෙසගක් පමණකුදු වෙනසක් නොවී ය. මෙසේ දානය නිසා බෝසතුන්ට තෘප්තියක් නම් ඇති නො වේ. එහෙයින් ඒ මහා පුරුෂයාණෝ ද මා විසින් කෙළ ලක්ෂයක් භික්ෂූන්ට සත්දිනක් දන් දෙන්නට වටනේ යැයි සිතා ඒ මඩුවෙහි බුදුපාමොක් බික්සඟන වඩා හිඳුවා සත්දිනක් ගවපාන නම් දානයක් දුන්හ. ගවපානය නම් මහත් මහත් සැළිවල කිරි පුරවා උඳුන්වල තබා කිරි ඝන ව පැසුණු කල්හි සහල්

ටිකක් දමා පැසුණු මී සකුරු සුනු ගිතෙල් යන දෙයින් පිළියෙල කළ භෝජනයකැයි කියනු ලැබේ. මිනිස්සු පමණක් වළඳවන්නට නො හැකි වූහ. දෙවියෝ ද එක්පසෙකින් වැළඳවූහ. දොළොස් තෙළෙස් යොදුන් පමණ තැන ද භික්ෂූන් ගන්නට නො පොහොසත් වූයේ ම ය. ඒ භික්ෂූන් වහන්සේලා වනාහි තමන්ගේ ආනුභාවයෙන් වැඩසිටියාහු ය. අවසන් දිනයේ දී සියලු භික්ෂූන් වහන්සේලා පාත්‍ර සෝදවා බෙහෙත් පිණිස ගිතෙල් වෙඬරු තෙල් මී පැණියෙන් පුරවා තුන්සිවුරු සමග දුන්හ. සංඝ නවක භික්ෂූන් ලද සිවුරුසළු ලක්ෂයක් අගනේ විය. ශාස්තෲන් වහන්සේ අනුමෝදනාව කරනා සේක් මේ මහා පුරුෂයා මෙබඳු මහා දානයක් දුන්නේ ය. කවරෙක් නම් වන්නේදැයි සලකා බලන සේක් අනාගතයේ දෙයාසංඛ්‍ය කල්ප ලක්ෂයකින් මත්තෙහි ගෞතම නම් බුදුවන්නේ යැයි දැක මහාපුරුෂයා අමතා ඔබ මෙතෙක් නම් කල් ඉක්ම ගෞතම නමින් බුදු වන්නේ යැයි ප්‍රකාශ කළ සේක. මහා පුරුෂ තෙම ප්‍රකාශය අසා 'මම වනාහි බුදු වන්නෙමි. මාගේ ගිහි ගෙයි විසීමෙන් කවර ප්‍රයෝජනයක් ද? පැවිදි වන්නෙමියි සිතා එබඳු වූ සම්පත්තිය කෙළපිඩක් මෙන් අතහැර දමා බුදුන් වෙත පැවිදි වූහ. පැවිදි වී ද බුද්ධවචන ඉගෙන අභිඥාවන් හා සමාපත්තීන් උපදවා ගෙන ආයු කෙළවර බඹලොව උපන්හ.

මංගල බුදුරජාණන් වහන්සේට උත්තර නම් නුවරක් විය. පියා ද උත්තර නම් රජෙකි. මව ද උත්තරා නම් වූවා ය. සුදේවය, ධර්මසේනය යන අගසව් දෙනමක් වූහ. උපස්ථායකයන් වහන්සේ පාලිත නම් විය. සීවලිය, අශෝකාය යන අග්‍රශ්‍රාවිකාවෝ දෙදෙනෙක් වූහ. බෝධිය නා රුකකි. ශරීරය අසූඅට රියන් විය. උන්වහන්සේ අවුරුදු අනූදහසක් වැඩහිඳ පිරිනිවි කල්හි දසදහසක් සක්වල එක්වර ම ඒකාන්ධකාර විය. සියලු සක්වල මිනිසුන්ට මහත් හැඬීමක් වැළපීමක් විය.

මෙසේ දසදහසක් ලෝකධාතුව අඳුරුකොට ඒ බුදුරජාණන් වහන්සේගෙන් මෑත භාගයෙහි සුමන නම් වූ ශාස්තෲන් වහන්සේ පහළ වූ සේක. උන්වහන්සේට ද ශ්‍රාවක සන්නිපාත තුනක් විය. ප්‍රථම සන්නිපාතයේ දී කෝටි ලක්ෂයක් භික්ෂූහු වූහ. කාඤ්චන පර්වතයෙහිදී වූ දෙවන සන්නිපාතයේ දී අනූකෙළ දහසක් වූහ. තුන්වන සන්නිපාතයේ දී කෝටි අසූදහසක් වූහ. එකල්හි මහබෝසතුන් වහන්සේ මහත් ඍද්ධි ඇති මහත් ආනුභාව ඇති අතුල නම් නාගරාජයෙක් වූහ. උන්වහන්සේ බුදුන්වහන්සේ උපන්හයි අසා නා සමූහයා පිරිවරා නාග භවනයෙන්

නික්ම කෙළ ලක්‍ෂයක් භික්‍ෂු පිරිවර සහිත ඒ භාග්‍යවතුන් වහන්සේට දිව්‍යමය තූර්යයෙන් උපහාර කරවා මහදන් දී වෙනවෙනම වස්ත්‍ර යුගලදී සරණයෙහි පිහිටියහ. ඒ භාග්‍යවතුන් වහන්සේ ද ඒ බෝසතුන්ට අනාගතයේ දී බුදුවන්නේ යැයි ප්‍රකාශ කළ සේක. ඒ භාග්‍යවතුන් වහන්සේගේ නුවර මේඛල නම් විය. සුදත්ත නම් රජෙක් පියා විය. මව සිරිමා නම් වූවාය. සරණය, භාවිතත්තය යන අගසව් දෙනමක් වූහ. උපස්ථායකයන් වහන්සේ උදේන නම් විය. සේනාය, උපසේනාය යන අග්‍රශ්‍රාවිකාවෝ දෙනමක් වූහ. බෝධිය නා රුකෙකි. ශරීරය අනූරියන් උස විය. ආයු ප්‍රමාණය අවුරුදු අනූදහසක් ම වූයේ ය.

උන්වහන්සේ මෑත භාගයේ දී රේවත ශාස්තෘන් වහන්සේ පහළ වූ සේක. උන් වහන්සේට ද ශ්‍රාවක සන්නිපාත තුනක් විය. ප්‍රථම සන්නිපාතයේ දී ගණනක් නම් නැත. දෙවෙනි සන්නිපාතයේ දී කෝටි ලක්‍ෂයක් භික්‍ෂූහු වූහ. තුන්වැන්නේ ද එසේමය. එකල අප බෝසතුන් වහන්සේ අතිදේව නම් බමුණෙකු ව බුදුන්ගේ ධර්මදේශනාව අසා සරණයෙහි පිහිටා මුදුනෙහි ඇඳිලි බැඳගෙන ඒ බුදුන්ට කෙලෙස් නැසීමෙහි ගුණ කියා උතුරුසළුවෙන් පිදූහ. ඒ බුදුරජාණන් වහන්සේ ද ඒ බෝසතුන්ට බුදුවන්නේ යැයි ප්‍රකාශ කළ සේක. ඒ භාග්‍යවතුන් වහන්සේගේ නගරය සුධඤ්ඤවතී නම් විය. පියා විපුල නම් රජෙකි. මව විපුලා නම් වූවාය. වරුණාය, බ්‍රහ්මදේවය යන අග්‍රශ්‍රාවකයෝ දෙවැන්නෙක් වූහ. උපස්ථායකයන් වහන්සේ සම්භව නම් වූහ. භද්‍රාය, සුභද්‍රාය යන අග්‍ර ශ්‍රාවිකාවෝ දෙදෙනෙක් වූහ. බෝධිය නාරුකෙකි. ශරීරය අසූරියන් උස විය. හැටදහසක් අවුරුදු ආයු විය.

උන්වහන්සේට මෑත භාගයේදී සෝභිත නම් ශාස්තෘන් වහන්සේ පහළ වූ සේක. උන්වහන්සේට ද ශ්‍රාවක සන්නිපාත තුනක් විය. ප්‍රථම සන්නිපාත කෝටි සියයක් භික්‍ෂූහු වූහ. දෙවන සන්නිපාතයේ දී කෝටි අනූවකි. තුන්වැන්නේ දී කෝටි අසූවකි. දේශනාව අසා සරණයෙහි පිහිටා බුදුපාමොක් බික්සඟනට මහදන් දුන්හ. ඒ බුදුරජාණන් වහන්සේ මෙතෙම බුදුවන්නේ යැයි ප්‍රකාශ කළ සේක. ඒ භාග්‍යවතුන් වහන්සේගේ නුවර සුධර්ම නම් විය. පියා සුධර්ම නම් රජ කෙනෙකි. මව ද සුධර්මා නම් වූවා ය. අසමය සුනේත්‍රය යන අග්‍රශ්‍රාවකයන් වහන්සේලා දෙනමක් වූහ. නකුලාය, සුජාතාය යන අග්‍රශ්‍රාවිකාවෝ දෙනමක් වූහ. බෝධිය නා රුකෙකි. අවුරුදු අනූදහසක් විය.

උන්වහන්සේට මෑත භාගයේ දී එක් අසංඛ්‍යයක් ඉක්මවා එක්කපෙක්හි ම අනෝමදස්සී ය, පදුම ය, නාරදය යැයි බුදුවරු තුන්නමක් උපන්හ.

අනෝමදස්සී බුදුන්ට ශ්‍රාවක සන්නිපාත තුනකි. පළමුවැන්නෙහි භික්ෂූන් වහන්සේලා අටලක්ෂයක් වූහ. දෙවන සන්නිපාතයෙහි සත් ලක්ෂයෙකි. තුන්වන සන්නිපාතයේ දී හය ලක්ෂයෙකි. එකල්හි බෝසතාණෝ මහත් ඍද්ධි ඇති මහත් ආනුභාව ඇති නොයෙක් කෙළගණන් සතුන්ට අධිපති එක් සෙනෙවියෙක් වූහ. උන්වහන්සේ බුදුරජාණන් වහන්සේ උපන්හයි අසා අවුත් බුද්ධප්‍රමුඛ භික්ෂු සංඝයාට මහා දානයක් දුන්හ. ශාස්තෲන් වහන්සේ ද බෝසතුන්ට අනාගතයේ දී බුදුවන්නේ යැයි ප්‍රකාශ කළ සේක. අනෝමදස්සී බුදුරජාණන් වහන්සේට වනාහි චන්ද්‍රවතී නම් නුවරක් විය. පියා යසවත් නම් රජ කෙනෙකි. මව යශෝධරා නම් වූවා ය. නිසභය, අනෝමය යන අග්‍රශ්‍රාවකයන් වහන්සේලා දෙදෙනෙක් වූහ. උපස්ථායකයන් වහන්සේ වරුණ නම් වූහ. සුන්දරීය, සුමනාය යන අග්‍ර ශ්‍රාවිකාවෝ දෙදෙනෙක් වූහ. බෝධිය කුඹුක් රුකකි. සිරුර පනස් අටරියනක් විය. අවුරුදු ලක්ෂයක් ආයු විය යනුය.

උන්වහන්සේට මෑත භාගයෙහි පදුම නම් ශාස්තෲන් වහන්සේ පහළ වූහ. උන්වහන්සේට ද ශ්‍රාවක සන්නිපාත තුනෙකි. ප්‍රථම සන්නිපාතයේ දී කෝටි ලක්ෂයක් භික්ෂූහු වූහ. දෙවන සන්නිපාතයේ දී තුන් ලක්ෂයකි. තෙවැන්නේ දී නො ගම් අරනෙහි මහවන ලැහැබ වැසි භික්ෂූන්ගෙන් දෙලක්ෂයක් වූහ. එකල්හි තථාගතයන් වහන්සේ ඒ වන ලැහැබ්ම වැඩ වෙසෙද්දී බෝසතාණෝ සිංහයෙක්ව නිරෝධ සමාපත්තියට සමවන් බුදුන් දැක පැහැදුණු සිත් ඇතිව වැඳ පැදකුණු කොට හටගත් ප්‍රීති හා සොම්නස් ඇතිවම තුන්වරක් සිංහනාද කොට බුද්ධාලම්භන ප්‍රීතිය අත් නොහැර ප්‍රීති සැපයෙන් ම ගොදුරු පිණිස බැහැර නොගොස් ජීවිත පරිත්‍යාග කොට පයුරුපාසනය කෙරෙමින් සිටියහ. ශාස්තෲන් වහන්සේ සත්දින ඇවෑමෙන් නිරෝධ සමාපත්තියෙන් නැගී සිටිසේක් සිංහයා බලා භික්ෂු සංඝයා කෙරෙහි ද සිත පහදා සංඝයා වඳී යැයි භික්ෂු සංඝයා ඒවායි සිතූ සේක. භික්ෂූහු එකෙණෙහිම වැඩියහ. සිංහයා සංඝයා කෙරෙහි සිත පැහැදවීය. ශාස්තෲන් වහන්සේ ඔහුගේ සිත බලා අනාගතයේ දී බුදුවන්නේයැයි ප්‍රකාශ කළ සේක. පදුම බුදුරජාණන් වහන්සේට වනාහි චම්පක නම් නුවරක් විය. අසම නම් රජ

පියා විය. මව අසමා නම් වූවා ය. සාලය, උපසාලය යැයි අග්‍ර ශ්‍රාවකයන් වහන්සේලා දෙනමක් වූහ. උපස්ථායකයන් වහන්සේ වරුණ නම් වූහ. රාමාය, සුරාමාය යන දෙදෙනා අග්‍ර ශ්‍රාවිකාවෝ වූහ. බෝධිය තොටිල ගසෙකි. ශරීරය පන් අටරියන් විසිලක්ෂයක් ආයු විය.

උන්වහන්සේට මෑත භාගයේ දී නාරද නම් ශාස්තෘන් වහන්සේ පහළ වූහ. උන්වහන්සේට ද ශ්‍රාවක සන්නිපාත තුනකි. ප්‍රථම සන්නිපාතයේ දී කෙළ ලක්ෂයක් භික්ෂූහු වූහ. දෙවන සන්නිපාතයේ දී කෝටි අනූදහසකි. තුන්වැන්නේදී සන්ධි අසූදහසකි. එකල්හි බෝසතාණෝ ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව පංච අභිඥාවන්හි ද අෂ්ට සමාපත්තීන්හි ද පුරුදු කළ වසඟ ඇති ව බුදුපාමොක් බික්සඟනට මහදන් දී රත්සඳුනින් පූජා කළහ. ඒ බුදුරජාණන් වහන්සේ ද ඒ බෝසතුන්ට අනාගතයේ දී බුදුවන්නේ යැයි ප්‍රකාශ කළ සේක. ඒ භාග්‍යවතුන් වහන්සේට වනාහි ධඤ්ඤවතී නම් නුවර විය. සුදේව බමුණෙක් පියා විය. මව අනෝමා නම් වූවා ය. භද්‍රසාලය, ජිතමිත්‍රය යන අග්‍ර ශ්‍රාවකයෝ දෙදෙනෙක් වූහ. උපස්ථායකයන් වහන්සේ වාසෙට්ඨ නම් වූහ. උත්තරාය, එග්ගුණීය යන දෙදෙන අග්‍ර ශ්‍රාවිකාවෝ වූහ. බෝධිය මහා තොටිල්ල රුකකි. සිරුර අටඅසූරියන් විය. අනූදහසක් අවුරුදු ආයු විය.

නාරද බුදුන්ට මෑත භාගයේ දී එක් අසංඛ්‍යයක් ඉක්ම මෙයින් කල්ප ලක්ෂයකට මත්තෙහි එක් කපෙක්හි පදුමුත්තර නම් එක ම බුදුකෙනෙක් පහළ වූ සේක. උන්වහන්සේට ද ශ්‍රාවක සන්නිපාත තුනකි. ප්‍රථම සන්නිපාතයේ දී කෝටි ලක්ෂයක් භික්ෂූහු වූහ. වේභාර පර්වතයේ දී වූ දෙවන සන්නිපාතයේ දී කෝටි අනූදහසකි. තුන්වැන්නේ දී කෝටි ආයූ දහසකි. එකල්හි බෝසතාණෝ ජටිල නම් මහරැටියෙක්ව බුදුපාමොක් බික්සඟනට සිවුරු සහිත දන් දුන්හ. ඒ බුදුරජාණන් වහන්සේ ද ඒ බෝසතුන්ට මෙතෙම අනාගතයේ දී බුදුවන්නේ යැයි ප්‍රකාශ කළ සේක. පදුමුත්තර බුදුන්ගේ කාලයෙහි වනාහි තීර්ථකයෝ නොවූහ. සියලු දෙව් මිනිස්සු බුදුන් ම සරණ ගියහ. ඒ බුදුන්ගේ නුවර හංසවතී නම් විය. පියා ආනන්ද නම් ක්ෂත්‍රියෙකි. මව සුජාතා නම් වූවාය. දේවලය, සුජාතය යන අග්‍ර ශ්‍රාවකයන් වහන්සේලා දෙනමක් වූහ. උපස්ථායකයන් වහන්සේ සුමනා නම් වූහ. අමිතාය අසමාය යන දෙදෙන අග්‍ර ශ්‍රාවිකාවෝ වූහ. බෝධිය සල් රුකෙකි. සිරුර අසූ අටරියන් උස විය. ශරීරප්‍රභාව හාත්පස දොළොස් යොදුනෙක පැතිර ගත්තේ ය. අවුරුදු ලක්ෂයක් ආයු විය.

උන්වහන්සේට මෑත භාගයේ දී තිස්දහසක් කප් ඉක්මවා එක් කපෙක සුමේධය සුජාත යැයි බුදුවරු දෙනමක් උපන්හ. සුමේධ බුදුන්ට ශ්‍රාවක සන්නිපාත තුනක් විය. ප්‍රථම සන්නිපාතයේ දී සුදර්ශන නගරයේ කෝටි සියයක් රහතන් වහන්සේලා වූහ. දෙවන සන්නිපාතයේ දී අනූ කෝටියකි. තුන්වැන්නෙහි දී අසූකෝටියකි. එකල්හි බෝසතාණෝ උත්තර නම් මානවකයෙක් ව නිදන්කොට තබන ලද්දා වූම අසූකෙළක් ධනය වියදම් කොට බුදුපාමොක් බික්සඟනට මහදන් දී බණ අසා සරණයෙහි පිහිටා (ගිහි ගෙයින්) නික්ම පැවිදි විය. ඒ බුදුරජාණන් වහන්සේ ද ඒ බෝසතුන් අනාගතයේ දී බුදු වන්නේ යැයි ප්‍රකාශ කළ සේක. සුමේධ බුදුන්ට සුදර්ශන නම් නුවරක් විය. සුදත්ත නම් රජ පියා විය. මව ද සුදත්තා නම් වූවා ය. සරණාය, සබ්බකාම යැයි අග්‍ර ශ්‍රාවකයෝ දෙදෙනෙක් වූහ. උපස්ථායකයන් වහන්සේ සාගර නම් වූහ. රාමා, සුරාම යැයි අග්‍ර ශ්‍රාවිකාවෝ දෙදෙනෙක් වූහ. මහ මිදෙල්ල ගසක් බෝධිය විය. ශරීරය අසූ අට රියන් විය. අවුරුදු අනූදහසක් ආයු විය.

උන්වහන්සේට මෑත භාගයේ දී සුජාත නම් ශාස්තෘන් වහන්සේ පහළ වූ සේක. උන්වහන්සේට ද ශ්‍රාවක සන්නිපාත තුනකි. ප්‍රථම සන්නිපාතයේ දී භික්ෂූන් වහන්සේලා සැටනමක් වූහ. දෙවන සන්නිපාතයේදී පනස් ලක්ෂයක් වූහ. සතරවන සන්නිපාතයේ දී හතළිස් ලක්ෂයක් වූහ. එකල්හි බෝසතාණෝ සක්විති රජෙක්ව බුදුරජාණන් වහන්සේ උපන් සේක අසා (බුදුන් වෙත) එළඹ බණ අසා බුදුපාමොක් බික්සඟනට සප්තවිධ රත්නයන් සමග සිවුමහ දිවයිනේ රාජ්‍යය දී බුදුන් වෙත පැවිදි වූහ. මුළු නුවරවැසියෝ රටෙහි උපදනා අය ගෙන ආරාමික කටයුතු සිදුකෙරෙමින් බුදුපාමොක් බික්සඟනට නිතර මහදන් දුන්හ. ඒ බුදුරජාණන් වහන්සේ ද බෝසතුන්ට බුදුවන්නේ යැයි ප්‍රකාශ කළහ. ඒ බුදුන්ගේ නුවර සුමංගල නම් විය. උග්‍රසේන නම් රජ පියා විය. මව පභාවතී නම් වූවා ය. සුදර්ශනය, සුදේවය යන අග්‍ර ශ්‍රාවකයන් වහන්සේලා දෙනමක් වූහ. උපස්ථායකයන් වහන්සේ නාරද නම් වූහ. නාගා, නාගසමාලා යන දෙදෙනා අග්‍ර ශ්‍රාවිකාවෝ වූහ. බෝධිය මහ උණ රැකක් විය. ඒ බෝධිය වනාහි මඳ සිදුර ඇතියේ ඝන වූ කඳ ඇතියේ මත්තෙහි නිකුත් වූ අතුවලින් මොනර පිල් කලඹක් මෙන් බැබළිණ. ඒ බුදුන්ගේ ශරීරය පනස්රියන් උස විය. අවුරුදු අනූදහසක් අසූ විය.

ඒ බුදුන්ට මෑත භාගයේ දී කල්ප අටළොසකින් මත්තෙහි එක්

කපෙක පියදස්සී, අත්ථදස්සී, ධම්මදස්සී යන බුදුවරු තුන්නමක් උපන්හ. පියදස්සී බුදුන්ට ද ශ්‍රාවක සන්නිපාත තුනක් විය. ප්‍රථම සන්නිපාතයේ දී කෙළ ලක්‍ෂයක් භික්‍ෂූහු වූහ. දෙවැන්නේ කෝටි අනූවකි. තුන්වැන්නේ අසූ කෝටියකි. එකල්හි බෝසතාණෝ කාශ්‍යප නම් මානවකයෙක් ව ත්‍රිවේදයෙහි කෙළ පැමිණ බුදුන්ගේ ධර්මදේශනාව අසා කෙළ ලක්‍ෂයක් ධන පරිත්‍යාගයෙන් සංඝාරාමයක් කරවා සරණයෙහි ද සීලයෙහි ද පිහිටියහ. ඉක්බිති බුදුරජාණෝ ඒ බෝසතුන් මින් අටළොස් කපක් ඇවෑමෙන් බුදුවන්නේ යැයි ප්‍රකාශ කළහ. ඒ බුදුන්ගේ නුවර අනෝම නම් විය. පියා සුදින්න නම් රජෙකි. මව චන්ද්‍රා නම් වූවා ය. පාලිත, සබ්බදස්සී යන අගසව් දෙනමක් වූහ. උපස්ථායකයන් වහන්සේ සෝභිත නම් වූහ. සුජාතා, ධම්මදින්නා යන අග්‍රශ්‍රාවිකාවෝ දෙනමක් වූහ. බෝධිය පුවඟු රුකෙකි. සිරුර අසූරියන් උස විය. අනූදහසක් අවුරුදු ආයු විය යනුයි.

උන්වහන්සේට මෑත භාගයේ දී අත්ථදස්සී නම් භාග්‍යවතුන් වහන්සේ පහළ වූ සේක. උන්වහන්සේට ද ශ්‍රාවක සන්නිපාත තුනක් විය. පළමුවැන්නෙහි භික්‍ෂූහු අනූඅටදහසක් වූහ. දෙවැන්නෙහි අසූඅට දහසකි. තුන්වැන්නේ ද එසේමය. එකල්හි බෝසතාණෝ මහත් ඍද්ධි ඇති සුසීම නම් තවුසකු ව දෙව්ලොවින් මදාරා මල් ඡත්‍රයක් ගෙනවුත් බුදුන්ට පිදූහ. ඒ බුදුරජාණන් වහන්සේ ද, බෝසතුන් බුදුවන්නේ යැයි ප්‍රකාශ කළහ. ඒ බුදුන්ට ශෝභන නම්නුවරක් විය. පියා සාගර නම් රජෙකි. මව සුදර්ශනා නම් වූවා ය. ශාන්ත, උපශාන්ත යන දෙනම අග්‍ර ශ්‍රාවකයෝ වූහ. උපස්ථායකයන් වහන්සේ අභය නම් වූහ. ධර්මා, සුධර්මා යන දෙදෙන අග්‍රශ්‍රාවිකාවෝ වූහ. බෝධිය සපු රුකකි. සිරුර අසූරියන් උස විය. ශරීර ප්‍රභාව හැමකල්හි ම යොදුනක් තැන පැතිර සිටියේ ය. අවුරුදු ලක්‍ෂයක් ආයු විය. උන්වහන්සේට මෑත භාගයේ දී ධම්මදස්සී නම් බුදුරජාණන් වහන්සේ පහළ වූහ. උන්වහන්සේට ද ශ්‍රාවක සන්නිපාත තුනෙකි. ප්‍රථම සන්නිපාතයේ දී භික්‍ෂූහු කෝටි සියයක් වූහ. දෙවැන්නේ කෝටි හැත්තෑවකි. තුන්වැන්නේ කෝටි අසූවකි. එකල්හි බෝසතාණෝ සක්දෙව් රජව දිව්‍යමය සුවඳින් ද මලින් ද තූර්යයෙන් ද පූජා කළහ. ඒ බුදුරජාණන් වහන්සේ ද බෝසතුන්ට විවරණ දුන්හ. ඒ බුදුන්ට සරණ නම් නුවරක් විය. පියා සරණ නම් රජෙකි. මව සුනන්දා නම් වූවාය. පදුමය, ඵුස්සදේවය යන අග්‍ර ශ්‍රාවකයෝ දෙදෙනෙක් වූහ. උපස්ථායකයන් වහන්සේ සුනේත්‍ර නම් වූහ. ඛේමාය, සච්චනාමා ය යන දෙදෙන අග්‍ර ශ්‍රාවිකාවෝ වූහ. බෝධිය

රත්කරව් රුකකි. කුඹුක් රුකකැයි ද කෙම් රුකකැයි ද කියනු ලැබේ. උන්වහන්සේගේ ශරීරය වනාහි අසූරියන් උස විය. අවුරුදු ලක්‍ෂයක් ආයු විය.

උන්වහන්සේට මෑත භාගයෙහි මෙයින් අනූහතර කපකට මත්තෙහි එක්කපෙක සිද්ධාර්ථ නම් එකම බුදුකෙනෙක් පහළ වූහ. උන්වහන්සේට ද ශ්‍රාවක සන්නිපාත හතකි. ප්‍රථම සන්නිපාතයේ දී කෙළ ලක්‍ෂයක් භික්‍ෂූන් වහන්සේලා වූහ. දෙවන සන්නිපාතයේ දී අනූකෙළකි. තුන්වැන්නේ දී අසූකෙළක් වූහ. එකල බෝසතාණෝ උග්‍ර තේජස් ඇති අභිඥා බලයෙන් යුත් මංගල නම් තවුසෙක්ව මහ දඹ ඵලයක් ගෙනවුත් බුදුන්ට දුන්හ. ශාස්තෘන් වහන්සේ එය වළඳ අනූහතර කපකින් මත්තෙහි බුදු වන්නේයැයි බෝසතුන්ට ප්‍රකාශ කළ සේක. ඒ බුදුන්ගේ නුවර වේභාර නම් විය. ජයසේන නම් රජ පියා විය. මව ඵුස්සා නම් වූවා ය. සම්බලය, සුමිත්‍රය යන දෙනම අග්‍ර ශ්‍රාවකයෝ වූහ. උපස්ථායකයන් වහන්සේ රේවත නම් වූහ. සීවලාය, සුරාමාය යන දෙදෙන අග්‍රශ්‍රාවිකාවෝ වූහ. බෝධිය කිණිහිරි රුකකි. ශරීරය හැටරියන් උස විය. අවුරුදු ලක්‍ෂයක් ආයු විය.

ඒ බ්‍රහ්ම මෑත භාගයේ දී මෙයින් දෙයානූ කපකින් මත්තෙහි එකම කපෙක තිස්සය, ඵුස්සය යන බුදුවරු දෙනමක් උපන්හ. තිස්ස බුදුන්ට වනාහි ශ්‍රාවක සන්නිපාත තුනකි. ප්‍රථම සන්නිපාතයේ දී කෝටි සියයක් භික්‍ෂූන් වහන්සේලා වූහ. දෙවැන්නෙහි අනූකෙළකි. තුන්වැන්නෙහි අසූකෙළකි. එකල්හි බෝසතාණෝ මහත් භෝග ඇති මහත් කීර්ති ඇති සුජාත නම් ක්‍ෂත්‍රියෙක් ව ඍෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදි ව මහත් ඍද්ධිමත් ව බුදුරජාණන් වහන්සේ උපන්හයි අසා දිව මදාරා පියුම් කුසුම් ගෙනවුත් සිවුපිරිස මැද වඩනා බුදුන්ට පූජා කළහ. අහසෙහි මල් වියනක් මෙන් කළේ ය. ඒ ශාස්තෘන් වහන්සේ ද මෙයින් කල්ප අනූදෙකකින් මත්තෙහි බුදුවන්නේ යැයි ප්‍රකාශ කළ සේක. ඒ බුදුන්ගේ නුවර ඛේම නම් විය. පියා ජනසන්ධ නම් ක්‍ෂත්‍රියෙකි. මව පදුමා නම් වූවා ය. බ්‍රහ්මදේවය, උදයය යන දෙදෙනා අග්‍ර ශ්‍රාවකයෝ වූහ. උපස්ථායකයන් වහන්සේ සුමංගල නම් වූහ. ඵුස්සාය, සුදත්තාය යන දෙදෙන අග්‍ර ශ්‍රාවිකාවෝ වූහ. බෝධිය පියා ගසෙකි. ශරීරය සැට රියන් උස විය. අවුරුදු ලක්‍ෂයක් ආයු විය.

උන්වහන්සේට මෑත භාගයෙහි ඵුස්ස නම් ශාස්තෲන් වහන්සේ පහළ වූ සේක. උන්වහන්සේට ද ශ්‍රාවක සන්නිපාත තුනකි. ප්‍රථම සන්නිපාතයෙහි භික්ෂූන් වහන්සේලා සැටලක්ෂයක් වූහ. දෙවැන්නෙහි පනස් ලක්ෂයකි. තෙවැන්නෙහි දෙතිස් ලක්ෂයකි. එකල බෝසතාණන් වහන්සේ විජිතාවී නම් ක්ෂත්‍රියෙක්ව මහත් වූ රාජ්‍යය හැරපියා බුදුන් වෙත පැවිදිව ත්‍රිපිටකය ඉගෙන මහජනයාට බණකථාකීහ. සීල පාරමිතාව ද පිරූහ. ඒ බුදුරජාණන් වහන්සේ ද බෝසතුන්ට එසේම (අනාගතයේ බුදු වන්නේ යැයි) ප්‍රකාශ කළහ. ඒ බුදුන්ට කාසි නම් නුවරක් විය. ජයසේන නම් රජ පියා විය. මව සිරිමා නම් වූවා ය. සුරක්ඛිතය, ධර්මසේනය යන දෙදෙන අග්‍ර ශ්‍රාවකයෝ වූහ. උපස්ථායකයන් වහන්සේ සභිය නම් වූහ. චාලාය, උපචාලාය යන දෙදෙන අග්‍ර ශ්‍රාවිකාවෝ වූහ. බෝධිය නෙල්ලි ගසකි. සිරුර පනස්අට රියන් විය. අවුරුදු අනූදසක් ආයු විය.

උන්වහන්සේට මෑත භාගයෙහි මෙයින් අනූ එක්වැනි කපෙහි විපස්සි නම් භාග්‍යවතුන් වහන්සේ පහළ වූ සේක. උන්වහන්සේට ද ශ්‍රාවක සන්නිපාත තුනකි. ප්‍රථම සන්නිපාතයෙහි හැට අට දහසක් භික්ෂූන් වහන්සේලා වූහ. දෙවැන්නෙහි එක්ලක්ෂයකි. තුන්වැන්නෙහි අසූ දහසෙකි. එකල බෝසතාණෝ මහත් ඍද්ධි ඇති මහත් ආනුභාව ඇති අතුල නම් නා රජෙක්ව සත්රුවන් එබ්බූ රන්මුවා මහ පුටුවක් බුදුන්ට දුන්හ.

ඒ බුදුරජාණන් වහන්සේ ද බෝසතුන්ට මෙයින් අනූඑක්වන කපෙහි බුදුවන්නේ යැයි ප්‍රකාශ කළහ. ඒ බුදුන්ට බන්ධුමතී නම් නුවරක් විය. බන්ධුමතී නම් රජ පියා විය. මව බන්ධුමතී නම් වූවාය. ඛණ්ඩය, තිස්සය යන දෙදෙන අග්‍ර ශ්‍රාවකයෝ වූහ. උපස්ථායකයන් වහන්සේ අසෝක නම් විය. චන්ද්‍රාය, චන්ද්‍රමිත්තාය යන දෙදෙන අග්‍ර ශ්‍රාවිකාවෝ වූහ. බෝධිය පළොල් රුකකි. ශරීරය අසූ රියන් උස විය. ශරීරප්‍රභාව හැටකල්හිම සත්යොදුනෙක පැතිර සිටියේ ය. අවුරුදු අසූදහසක් ආයු විය.

උන්වහන්සේට මෑත භාගයෙහි මෙයින් තිස්එක්වන කපෙහි සිඛිය, වෙස්සභූය යන බුදුවරු දෙනම පහළ වූහ. සිඛී බුදුන්ට ද ශ්‍රාවක සන්නිපාත තුනකි. ප්‍රථම සන්නිපාතයෙහි භික්ෂූන් වහන්සේලා ලක්ෂයක් වූහ. දෙවැන්නෙහි අසූ දහසකි. තුන්වැන්නෙහි හැත්තෑ දහසකි. එකල බෝසතාණෝ අරින්දම නම් රජෙක් ව බුදුපාමොක් භික්සඟනට සිවුරු

සහිත මහදන් දී සත්රුවනින් සරහන ලද ඇත්රුවන දී ඇතු පමණට කැප බඩු ද දුන්හ. ඒ බුදුරජාණන් වහන්සේ ද බෝසතුන්ට මෙයින් එක්තිස්වන කපෙහි බුදුවන්නේ යැයි ප්‍රකාශ කළහ. ඒ බුදුරජාණන් වහන්සේට අරුණවතී නම් නුවර විය. අරුණ නම් ක්‍ෂත්‍රියෙක් පියා විය. මව ප්‍රභාවතී නම් වූවාය. අභිභූය, සම්භවය යන දෙදෙනා අග්‍ර ශ්‍රාවකයෝ වූහ. මඛිලාය, පදුමාය යන දෙදෙන අග්‍ර ශ්‍රාවිකාවෝ වූහ. බෝධිය ඇටඹ රුකකි. සිරුර හැත්තෑ රියන් උස විය. ශරීරප්‍රභාව යොදුන් තුනෙක පැතිර සිටියේ ය. අවුරුදු හැත්තෑ දහසක් ආයු විය.

උන්වහන්සේට මෑත භාගයෙහි වෙස්සභූ නම් ශාස්තෘන් වහන්සේ පහළ වූහ. උන්වහන්සේට ද ශ්‍රාවක සන්නිපාත තුනකි. ප්‍රථම සන්නිපාතයෙහි භික්‍ෂූන් වහන්සේලා අසූදහසක් වූහ. දෙවැන්නෙහි හැත්තෑ දහසකි. තුන්වැන්නෙහි හැටදහසකි. එකල බෝසතාණෝ සුදර්ශන නම් රජ ව බුදුපාමොක් භික්සඟනට මහදන් දී ඒ බුදුන් වෙත පැවිදිව ආචාර ගුණයෙන් යුතුව ගෞරව සම්ප්‍රයුක්ත ප්‍රීතිබහුල වූවෙක් වූහ. ඒ භාග්‍යවතුන් වහන්සේ ද බෝසතුන්ට මෙයින් තිස්පස්වන කපෙහි බුදුවන්නේ යැයි ප්‍රකාශ කළහ. ඒ භාග්‍යවතුන් වහන්සේට අනෝම නම් නුවරක් විය. සුප්‍රතීත නම් රජ පියා විය. මව යසවතී නම් වූවා ය. සෝණය, උත්තරාය යන දෙදෙන අග්‍ර ශ්‍රාවකයෝ වූහ. උපස්ථායකයන් වහන්සේ උපසාන්ත නම් වූහ. දාමාය, සමාලාය යන දෙදෙන අග්‍ර ශ්‍රාවිකාවෝ වූහ. බෝධිය සල් රුකකි. සිරුර සැටරියන් උස විය. අවුරුදු හැටදහසක් ආයු විය.

උන්වහන්සේට මෑත භාගයෙහි මෙම කල්පයෙහි කකුසන්ධය, කෝණාගමනය, කාශ්‍යපය, අපගේ භාග්‍යවතුන් වහන්සේ ය යන බුදුවරු සතරදෙනෙක් උපන්හ. කකුසඳ, බුදුන්ට ශ්‍රාවක සන්නිපාත එකකි. එහි භික්‍ෂූන් වහන්සේලා සතළිස් දහසක් වූහ. එකල බෝසතාණෝ ඛේම නම් රජ ව බුදුපාමොක් භික්සඟනට පාසිවුරු සහිත මහදන් ද අඳුන් ආදී බෙහෙත් ද දී බුදුන්ගේ ධර්මදේශනාව අසා පැවිදි වූහ. ඒ භාග්‍යවතුන් වහන්සේ ද බෝසතුන්ට බුදුවන්නේ යැයි ප්‍රකාශ කළ සේක. කකුසඳ බුදුන්ට ඛේම නම් නුවරක් විය. අග්ගිදත්ත නම් බමුණා පියා විය. විශාඛා නම් බැමිණිය මව වූවාය. මධුරය, සංජීවය යන දෙදෙන අග්‍ර ශ්‍රාවකයෝ වූහ. උපස්ථායකයන් වහන්සේ බුද්ධිජ නම් වූහ. රාමාය, ගම්භාය යන දෙදෙන අග්‍ර ශ්‍රාවිකාවෝ වූහ. බෝධිය මහා මාරා රුකකි. සිරුර හතළිස් රියන් උස විය. අවුරුදු හතළිස් දහසක් ආයු විය.

උන්හන්සේට මෑත භාගයෙහි කෝණාගමන නම් ශාස්තෲන් වහන්සේ පහළ වූ සේක. උන්වහන්සේට ද මහා ශ්‍රාවක සන්නිපාත එකකි. එහි භික්ෂූන් වහන්සේලා තිස්දහසක් වූහ. එකල බෝසතාණෝ පර්වත නම් රජ ව ඇමති ගණයා පිරිවරා බුදුන් වෙත ගොස් බණ අසා බුදුපාමොක් බික්සඟනට ආරාධනා කොට මහදන් දී පත්තුන්න වස්ත්‍ර, චීන වස්ත්‍ර, පට්ට වස්ත්‍ර, කෝශෙය්‍ය වස්ත්‍ර, කම්බිලි දුහුල් මෙන් ම රන්පටක් ද දී බුදුන් වෙත පැවිදි වූහ. ඒ ශාස්තෲන් වහන්සේ ද බෝසතුන්ට (අනාගතයේ දී බුදුවන්නේ යැයි) ප්‍රකාශ කළ සේක. ඒ භාග්‍යවතුන් වහන්සේට සෝභාවතී නම් නුවරක් විය. යඤ්ඤදත්ත නම් බ්‍රාහ්මණයෙක් පියා විය. උත්තරා නම් බැමිණිය මව වූවා ය. භීසෝස, උත්තර යන දෙනම අග්‍ර ශ්‍රාවකයන් වහන්සේලා වූහ. උපස්ථායකයන් වහන්සේ සොත්‍ථිජ නම් වූහ. සමුද්‍රා, උත්තරා යන දෙදෙන අග්‍ර ශ්‍රාවිකාවෝ වූහ. බෝධිය දිඹුල් රුකකි. සිරුර තිස් රියනක් උස විය. අවුරුදු තිස්දහසක් ආයු විය.

උන්වහන්සේට මෑත භාගයේ දී කාශ්‍යප නම් ශාස්තෲන් වහන්සේ පහළ වූහ. උන්වහන්සේට ද එක ම ශ්‍රාවක සන්නිපාතයකි. එහි භික්ෂූන් වහන්සේලා විසිදහසක් වූහ. එකල බෝසතාණෝ ජෝතිපාල නම් මාණවකයෙක්ව ත්‍රිවේදයෙහි කෙළ පැමිණ පොළොවෙහි ද අහසෙහි ද ප්‍රකට ඝටීකාර නම් කුම්භකාරයාගේ මිත්‍රයෙක් වූහ. බෝසතාණෝ ඔහු සමග බුදුන් වෙත එළඹ බණ අසා පැහැද පැවිදිව පටන්ගත් වීර්ය ඇතිව තුන් පිටකය ඉගෙන වත්පිළිවෙත්වලින් බුදුසසුන හෙබවූහ. ඒ ශාස්තෲන් වහන්සේ ද බෝසතුන්ට (අනාගතයේ දී බුදුවන්නේ යැයි) ප්‍රකාශ කළහ. ඒ භාග්‍යවතුන් වහන්සේ ගේ උපන් නුවර බරණැස් නම් විය. බ්‍රහ්මදත්ත නම් බමුණෙක් පියා විය. ධනවතී නම් බැමිණිය මව වූවාය. තිස්සය, භාරද්වාජය යන දෙදෙන අග්‍ර ශ්‍රාවකයෝ වූහ. උපස්ථායකයන් වහන්සේ සර්වමිත්‍ර නම් වූහ. අනුලා, උරුවෙලා යන දෙදෙන අග්‍ර ශ්‍රාවිකාවෝ වූහ. බෝධිය නුග රුකකි. සිරුර අසූරියන් උස විය. අවුරුදු විසිදහසක් ආයු විය.

ඒ භාග්‍යවතුන් වහන්සේට මෑත භාගයෙහි අප ගෞතම සම්මා සම්බුදුජාණන් වහන්සේ හැර වෙනත් බුදුකෙනෙක් නම් නැත. මේ දීපංකර ආදී වූ සූවිසි බුදුවරුන් විසින් ලබන ලද විවරණ ඇති බෝසතාණෝ යම් ඒ.

මනුස්සත්තං ලිංගසම්පත්ති හෙතු සත්ථාර දස්සනං
පබ්බජ්ජා ගුණසම්පත්ති අධිකාරො ච ඡන්දතා
අට්ඨධම්ම සමොධානා අභිනීහාරො සමිජ්ඣතීති

යනුවෙන් කී මිනිසත් බව, පුරුෂලිංග සම්පත්තිය ඒ ආත්මයේදීම ලොව්තුරා බුදුවීමට ඇති හේතු සම්පත්තිය බුදුවරයකු දැකීම පැවිද්ද, පංච අභිඥා අෂ්ට සමාපත්ති ලාභියෙකු වීම බුදුබව පැතීම, බුදුවීමට කැමැත්ත යන මේ අෂ්ට ධර්මයන් ප්‍රාර්ථනාව සමෘද්ධ වන්නේයැයි (දැක්වූ පරිදි)

මේ අෂ්ට ධර්මයන් ගළපා දීපංකර බුදුන්ගේ පාදමූලයේ දී කරන ලද ප්‍රාර්ථනාවෙන් 'ඒකාන්තයෙන් බුද්ධකාරක ධර්මයන් ඔබ මොබ සොයමි'යි උත්සාහකොට විචිනනෙතා තදා දක්ඛිං පඨමං දාන පාරමිං' යැයි දාන පාරමිතාව ආදී වූ බුද්ධකාරක ධර්මයයෝ දක්නා ලදහ. එකී පාරමී ධර්මයන් පුරමින් වෙසතුරු අත්බව දක්වා ආ සේක. එසේ එන්නා වූ ද කරන ලද ප්‍රාර්ථනා ඇති බෝසතුන්ගේ යම් ආනිසංසයක් වේද, එකී ආනිසංස (මෙසේ) වර්ණනා කරන ලදී.

මෙසේ සියලු අංගයන්ගෙන් යුක්ත මනුෂ්‍යයෝ (බෝසත්වරු) සසර කල්පකෝටි සියගාණක් දීර්ඝ කාලයක් සැරිසරන්නෝ වුව ද අවීචියෙහි නූපදිත්. එසේ ම ලෝකාන්තරික නරකයෙහි ද (නූපදිත්) නිජ්ඣාම තණ්හී නම් ප්‍රේතයෝ නොවෙත්. ඛුප්පිපාස නම් ප්‍රේතයෝ නො වෙත්. කාලකඤ්ජික නම් ප්‍රේත අසුරයෝ නො වෙත්.

දුගතියේ උපනත් ක්ෂුද්‍රක ප්‍රාණීහු නොවෙත්. මනුෂ්‍යයන් අතර උපදනා ඔව්හු ජාත්‍යන්ධයෝ නො වෙත්.

ඔවුන් කන් විකල බවක් (බිහිරි බවක්) නැත. (ඔව්හු) ගොළුවෝ නො වෙත්. (ඔව්හු) ස්ත්‍රීභාවයට නො යත්. උභතෝබ්‍යඤ්ජකයෝ නොවෙත්. නපුංසකයෝ නො වෙත්.

බෝධියට නියත වූ ඒ මනුෂ්‍යයෝ (බෝසත්වරු) ආනන්තරිය කර්ම කළෝ නො වෙත්. සියලු තැන්හි ම ශුද්ධ වූ ගෝචර ඇති (ඒ බෝසත්හු) ආනන්තරිය කර්මයන්ගෙන් මිදුණාහු ය.

කර්මඵල දක්නා වූ ඔව්හු මිථ්‍යා දෘෂ්ටිය සේවනය නො කරත්. ස්වර්ගයෙහි වසත් නමුදු අසංඥතලයෙහි නූපදිත්. සුද්ධාවාස දෙවියන් කෙරෙහි ඉපදීමේ හේතුවක් නැත. නෛෂ්ක්‍රම්‍යයට නැඹුරු වූ සත්පුරුෂයෝ භවයන්හි නො ඇලුණාහ. (ඔව්හූ) ලෝකාර්ථ චර්යාවෙහි හැසිරෙත්. සියලු පාරමී ධර්මයන් පුරත් යනුයි.

එකී ආනිසංසයන්ට පැමිණ ම ආ සේක. පාරමී ධර්මයන් පුරන්නා වූ උන්වහන්සේගේ අකිත්තිබ්‍රාහ්මණ කාලයෙහි, සංඛ නම් බ්‍රාහ්මණ කාලයෙහි, ධනංජය රාජ කාලයෙහි, මහා සුදර්ශන රාජ කාලයෙහි මහා ගෝවින්ද කාලයෙහි, නිමි මහරජ කල්හි, සඳකුමර කල්හි, විසය්හ සිටු කල්හි, සිවිරාජ කාලයෙහි, වෙස්සන්තර රාජකාලයේ දැයි (යන මේ කාලයන්හි) දාන පාරමිතාව පිරීමේ ප්‍රමාණයක් නම් නැත. මට පමණකින් වනාහි උන්වහන්සේගේ සස පණ්ඩිත ජාතකයෙහි,

**භික්ඛාය උපගතං දිස්වා සකත්තානං පරිච්චජිං**
**දානෙන මෙ සමො නත්ථි එසා මෙ දානපාරමී ති**

සිඟීම පිණිස පැමිණියාහු දැක ස්වකීය ආත්මය පරිත්‍යාග කෙළෙමි. දානයෙන් මට සමාන වූවෙක් නැත. මේ මාගේ දාන පාරමිතාවයි යනුයි.

මෙසේ ආත්ම පරිත්‍යාගය කරන්නා වූ බෝසතුන්ගේ දාන පාරමිතාව පරමාර්ථ පාරමිතාව නම් විය. එසේම සීලව නාගරාජ කාලයෙහි, චම්පෙය්‍ය නාගරාජ කාලයෙහි භූරිදත්ත නාගරාජ කාලයෙහි, ඡද්දන්ත නාගරාජ කාලයෙහි ජයද්දිස රාජපුත්‍ර කාලයෙහි, අලීනසත්තු කුමාර කාලයෙහි දැයි සීල පාරමිතාව පිරීමේ ප්‍රමාණයක් නම් නැත. මෙපමණකින් වනාහි උන්වහන්සේ ගේ සංඛපාල ජාතකයෙහි,

**සූලෙහි විජ්ඣයන්තෙපි කොට්ටයන්තෙපි සත්තිහි**
**භොජපුත්තෙ න කුප්පාමි එසා මෙ සීලපාරමීති**

හුල්වලින් විදිද්දීත් ආයුධවලින් කොටද්දීත් භෝජපුත්‍රයන් කෙරෙහි නො කිපෙමි. මේ මාගේ සීල පාරමිතාවයි යනුයි.

මෙසේ ආත්ම පරිත්‍යාගය කරන්නා වූ බෝසතුන්ගේ සීල පාරමිතාව පරමාර්ථ පාරමිතා නම් විය. එසේ ම සෝමනස්ස කුමාර කාලයෙහි හත්ථිපාල කුමාර කාලයෙහි අයෝඝර පණ්ඩිත කාලයේදැයි මෙසේ මහා රාජ්‍යය අතහැර නෛෂ්ක්‍රම්‍යය පාරමිතාව පිරීමේ ප්‍රමාණයක් නම් නැත. මෙපමණකින් උන්වහන්සේගේ චූළ සුතසෝම ජාතකයෙහි,

මහාරජ්ජං හත්ථගතං ඛෙලපිණ්ඩංව ඡඩ්ඩයිං
චජතො න හොති ලග්ගනං එසා මෙ නෙක්ඛම්ම පාරමිතී

අතට පත් මහාරාජ්‍යය කෙලපිඩක් මෙන් අත්හළෙමි. අත්හරිද්දී ඇලීමක් නො වෙයි. මේ මාගේ නෛෂ්ක්‍රම්‍ය පාරමිතාවයි යනුයි.

මෙසේ නො ඇලීමෙන් රාජ්‍යය හැරපියා නික්මෙන්නා වූ බෝසතුන්ගේ නෛෂ්ක්‍රම්‍ය පාරමිතාව පරමාර්ථ පාරමිතා නම් විය. එසේ ම විධුර පණ්ඩිත කාලයෙහි, මහා ගෝවින්ද පණ්ඩිත කාලයෙහි, කුද්දාල පණ්ඩිත කාලයෙහි, අරක පණ්ඩිත කාලයෙහි, බෝධිපරිව්‍රාජක කාලයෙහි, මහෞෂධ පණ්ඩිත කාලයෙහි දැයි මෙසේප්‍රඥා පාරමිතාව පිරීමේ ප්‍රමාණයක් නම් නැත. මෙපමණකින් ශත්තුභස්ත්‍රා ජාතකයෙහි සේනක පණ්ඩිත කාලයෙහි,

පඤ්ඤාය මෙ විචිනනෙතා බ්‍රාහ්මණං මොචයිං තදා
පඤ්ඤාය මෙ සමො නත්ථි එසා මෙ පඤ්ඤා පාරමීති

මාගේ ප්‍රඥාවෙන් පරීක්ෂණ කරමින් බමුණා දුකින් මුදවීමි. ප්‍රඥාවෙන් මට සමාන වූවෙක් නැත. මේ මාගේ ප්‍රඥා පාරමිතාවයි යනුයි.

භස්ත්‍රාවට (පසුම්බියට) ඇතුළුව සිටි සර්පයා දක්වන්නා වූ බෝසතුන්ගේ ප්‍රඥා පාරමිතාව පරමාර්ථ පාරමිතා නම් විය. එසේ ම වීර්ය පාරමිතාදීන්ගේ ද පිරීම පිළිබඳ ප්‍රමාණයක් නම් නැත. මෙපමණකින් උන්වහන්සේගේ මහාජනක ජාතකයෙහි,

අතීරදස්සී ජලමජ්ඣෙ හතා සබ්බෙව මානුසා
චිත්තස්ස අඤ්ඤථා නත්ථි එසා මෙ විරිය පාරමීති

තෙරක් නො පෙනෙන ජලය මැද සියලුම මනුෂ්‍යයෝ නටහ. (මාගේ) සිතේ වෙනසක් නැත. මේ මාගේ වීර්ය පාරමිතාවයි යනුයි.

මෙසේ මහ සමුදුර තරණය කරන්නා වූ බෝසතුන්ගේ වීරිය පාරමිතාව පරමාර්ථ පාරමිතාව නම් විය. ක්ෂාන්තිවාදී ජාතකයෙහි,

**අචෙතනංව කොට්ටෙන්ත නිසිතෙන ඵරසුනා මමං**
**කාසිරාජෙ නකුප්පාමි එසා මෙ ඛන්තිපාරමී'ති**

සිත් නැත්තෙකුට මෙන් මට තියුණු පොරොවෙන් කොටද්දී කසීරජු කෙරෙහි නො කිපෙමි. මේ මාගේ ක්ෂාන්ති පාරමිතාවයි.

මෙසේ අචේතනික බවෙන් යුතු ව මෙන් මහා දුක් ඉවසන්නා වූ බෝසතුන්ගේ ක්ෂාන්ති පාරමිතාව පරමාර්ථ පාරමිතා නම් විය. මහා සුතසෝම ජාතකයෙහි,

**සච්චවාචං අනුරක්ඛන්තො චජිත්වා මම ජීවිතං**
**මොචෙසිං එකසතං ඛත්තියෙ පරමත්ථ සච්ච පාරමී'ති**

සත්‍ය වචනය රකිමින් මාගේ ජීවිතය පරිත්‍යාගකොට එක්සියක් ක්ෂත්‍රියන් මිදවීමි. මේ පරමාර්ථ සත්‍ය පාරමිතාවයි යනුයි.

මෙසේ ජීවිතය පරිත්‍යාගකොට සත්‍යය රක්නා වූ බෝසතුන්ගේ සත්‍ය පාරමිතාව පරමාර්ථ පාරමිතා නම් විය. මූගපක්ඛ ජාතකයෙහි,

**මාතා පිතා න මෙ දෙස්සා න මෙ දෙස්සං මහායසං**
**සබ්බඤ්ඤුතං පියං මය්හං තස්මා වතමධිට්ඨහින්ති**

මට මව්පියෝ අප්‍රිය නො වෙත්. මට මහත් අප්‍රිය නැත. මට බුදුබව ප්‍රිය වෙයි. එහෙයින් ව්‍රතය අධිෂ්ඨාන කෙළෙමි යනුයි.

මෙසේ ජීවිතය අතහැර ව්‍රතය අධිෂ්ඨාන කරන්නා වූ බෝසතුන්ගේ අධිෂ්ඨාන පාරමිතාව පරමාර්ථ පාරමිතා නම් විය. ඒකරාජ ජාතකයෙහි,

**න මං කොචි සනතසති නපිහං භායාමි කසසචි**
**මෙතතා බලෙනුපපථ්ථෙධො රමාමි පවනෙ තදා ති**

කිසිවෙක් මා බය නො කරයි. මම ද කිසිවෙකුටත් බිය නො වෙමි. මෛත්‍රී බලයෙන් දැඩි වූ මම එකල වනයෙහි රමනය කෙළෙමි යනුයි.

මෙසේ ජීවිතය ද නොබලා මෛත්‍රිය වඩන්නා වූ බෝසතුන්ගේ මෙත්තා පාරමිතාව පරමාර්ථ පාරමිතා නම් විය. ලෝමහංස ජාතකයෙහි,

**සුසානෙ සෙය්‍යං කපෙපමි ඡවට්ඨිකං උපනිධායහං**
**ගොමණ්ඩලා උපගනත්වා රූපං දසෙසනති නපපකනති**

මම මිනී ඇටයක් කොට්ටය මෙන් තබාගෙන සොහොනෙහි සයනය කරමි. ගොපලු දරුවෝ ළඟට අවුත් නොයෙක් විකාර රූප දක්වත් යනුයි.

මෙසේ ගම්දරුවන් කෙලගැසීම ආදියෙන් මෙන් ම මල් සුවඳ ආදියෙන් ද සැපදුක් උපදවන කල්හි ද උපේක්ෂාව නො ඉක්මවන්නා වූ බෝසතුන්ගේ උපේක්ෂා පාරමිතාව පරමාර්ථ පාරමිතා නම් විය. මෙය මෙහි සංක්‍ෂේපයයි. මේ අර්ථය විස්තර වශයෙන් චරියා පිටකයෙන් ගතයුතුයි. මෙසේ පාරමී පුරා වෙසතුරු අත්බැව්හි සිටියේ,

**අචෙතනායං පඨවී අවිඤ්ඤාය සුඛං දුඛං**
**සාපි දාන බලා මයහං සතතකඛතතං පකමපථා'ති**

සුවදුක් නොදත් අචේතනික වූ මේ පොළොව සත්වරක් කම්පා විය. එය ද මාගේ දාන බලයයි යනුයි.

මෙසේ මහපොළොව කම්පා කරවන්නා වූ මහපින්කම් කොට ආයු කෙළවර ඉන් චුතව තුසිත භවනයෙහි උපන්හ. එහිදී කරුණු දසයකින් අන් දෙවියන් ඉක්මවා ආයු ඇති තෙක් දිව සැපත් අනුභව කරනුයේ දැන් මිනිස් ගණනින් සත්දිනෙකින් ආයුක්‍ෂයට පැමිණේයැයි ද වස්ත්‍ර කිලිටු වෙයි. මල් මැලවෙයි. කිසිලිවලින් ඩාදිය නික්මෙයි. ශරීරය විවර්ණා බවට පත්වෙයි. දෙවියා දිව්‍යාසනයෙහි නො පිහිටයි යන මේ පස්වැදෑරුම්

පෙරනිමිති උපන් කල්හි ඒවා දැක පින්වත්නි, ඒකාන්තයෙන් ස්වර්ගය හිස් වන්නේයැයි සංවේගයට පත් දෙවියන් මහ බෝසතුන් පුරන ලද පාරමිතා ඇති බව දැන දැන් මෙයින් වෙනත් දෙව්ලොවකට නොගොස් මිනිස්ලොව ඉපිද බුදු වූ කල්හි පින්කොට චුතවන, චුතවන මනුෂ්‍යයෝ දෙව්ලොව පුරවත් යැයි සිතා,

මම තුසිත දිව්‍ය ලෝකයෙහි වූ කල්හි සන්තුසිත නම් දෙවියෙක් වීමි. (එකල) දසදහසක් සක්වළ දෙවියෝ රැස්ව ඇඳිලි බැඳ මාගෙන් මෙසේ ඉල්ලති.

මහාවීරයන් වහන්ස, මේ ඔබට (බුදුවීමට) කාලයයි. මව්කුස ඉපදුන මැනවි. දෙවියන් සහිත ලෝකයා සසරින් එතර කරමින් අමෘතපදය (නිවන) අවබෝධ කරගන්න යනුයි.

මෙසේ බුදුබව පිණිස ආරාධනා කරන ලදුව කාලය, දීපය, දේශය, කුලය, මවගේ ආයු ප්‍රමාණය දැයි යන මේ පස්මහබැලුම් බලා කරන ලද තීරණ ඇතියේ එයින් චුතව ශාක්‍ය රාජකුලයෙහි පිළිසිඳගෙන එහි මහත් සැපතින් වැඩෙනුයේ පිළිවෙළින් සොඳුරු යොවුන් බවට පැමිණියේ ය. මේ අතර 'ආනන්දය, බෝසත්තෙම සිහි ඇති ව සම්‍යක් ප්‍රඥා ඇති ව තුසිත දෙව්ලොවින් චුතව මව්කුස පිළිසිඳ ගත්තේ ය' යන ආදී වශයෙන් සූත්‍රාන්ත පදයන්ගේ ද එම අට්ඨකථාවන්ගේ ද වශයෙන් විස්තර දතයුතුයි. ඒ බෝසත් තෙම තුන් සමතුන්ට සුදුසු වූ තුන්පායෙහි දෙව්ලෝ සිරිය වැනි රජසිරි විඳිනුයේ උයන්කෙළියට යන සමයෙහි පිළිවෙළින් ජීර්ණ, ව්‍යාධි, මෘත යන ත්‍රිවිධ දේවදූතයන් දැක හටගත් සංවේග ඇති ව නැවතී සතරවන වාරයෙහි පැවිද්දකු දැක පැවිද්ද යහපතැයි පැවිද්දෙහි රුචිය උපදවා උයනට ගොස් එහි දවල් කාලය ගෙවා මගුල්පොකුණු තෙර හුන්නේ කපුවෙස් ගෙන ආ විස්කම් දෙව්පුත් විසින් අලංකාර කොට සරහන ලද්දේ, රහල් කුමරුන් උපන් අස්න අසා පුත්‍රශෝභයේ බලවත් බව දැන 'මේ බන්ධන වැඩෙන්නට පෙර එය සිඳිම්'යි සිතා සවස නුවරට පිවිසෙනුයේ

**නිබ්බුතා නූන සා මාතා නිබ්බුතා නූන සො පිතා**
**නිබ්බුතා නූන සා නාරි යස්සායං ඊදිසො පතී ති**

(යම් මවකට මෙබඳු පුතෙක් වේ නම්) ඒ මව ඒකාන්තයෙන් නිවුණාය. (යම් පියෙකුට මෙබඳු පුතෙක් වේ නම්) ඒ පියා ඒකාන්තයෙන් නිවුණේය. යම් භාර්යාවකට මෙබඳු මේ ස්වාමියා වේනම් ඒ ස්ත්‍රිය ඒකාන්තයෙන් නිවුණාය යනුයි.)

කිසාගෝතමී නම් වූ නැන්දනියගේ දුව විසින් කියන ලද මේ ගාථාව අසා මම මැය විසින් නිබ්බුතපදය අස්වන ලද්දේ වෙමියි ලක්‍ෂයක් අගනා මුතුහර ග්‍රීවයෙන් මුදා ඇයට යවා තමාගේ භවනට පිවිස සිරියහන්හි හිඳ නිද්‍රා වශයෙන් කෙරෙන නාටක ස්ත්‍රීන්ගේ විකාර දැක කළකිරුණු සිත් ඇති ව ඡන්න අවදි කරවා කන්ථක අසු ගෙන්වාගෙන කන්ථක අසුපිට නැග ඡන්න සහාය කොටගෙන ම දසදහසක් ලෝකධාතුවල දේවතාවන් පිරිවර කොටගෙන මහබිනික්මන් කොට එම රාත්‍රියේ ඉතිරි භාගයේ ම මහාරාජ්‍යයන් තුනක් ඉක්මවා අනෝම නදී තීරයේ දී පැවිදි ව අනුක්‍රමයෙන් රජගහ නුවරට ගොස් එහි පිඬු පිණිස හැසිර පාණ්ඩව පර්වත ලඳුව එය ප්‍රතික්‍ෂේප කොට, බුදුව ඔහුගේ රටට ඒම පිණිස ඔහු විසින් ගන්නා ලද ප්‍රතිඥා ඇති ව, ආලාරකාලාම හා උද්දකාරාමපුත්‍ර යන තවුසන් වෙත පැමිණ ඔවුන් වෙතින් අවබෝධ කරගත් අෂ්ට සමාපත්තීන් ගෙන් සතුටට පත් නොවූ සේක් සාවුරුද්දක් මහත් වීර්යය කොට වෙසඟ පුන්පොහෝදා උදෑසනින් ම සේනානි නියම් ගමෙහි සුජාතා ව විසින් දෙන ලද කිරිපිඬු වළඳ නේරංජරා නදියෙන් ස්වර්ණ පාත්‍රය පාකර යවා, නේරංජරා නදී තීරයෙහි මහත් වනලැහැබෙක නොයෙක් සැපතින් දවල්කාලය ගෙවා සවස් භාගයෙහි සොත්ථිය නම් බමුණා විසින් දෙන ලද කුසතණ අටමිට ගෙන කාල නම් නා රජු විසින් ස්තුති කරන ලද ගුණ ඇති ව, බෝමැඩ අරා තණ අතුරා 'යම්තාක් මාගේ සිත තෘෂ්ණාදියෙන් දැඩිකොට නොගෙන කෙලෙසුන්ගෙන් නො මිදේ ද ඒතාක් මේ පළඟ නොබිඳමි යි ප්‍රතිඥා කොටගෙන නැගෙනහිර දිසාවට මුහුණලා වැඩහුන් සේක් හිර බැසයාමට පළමුවෙන් ම මාරබලය පරදා, ප්‍රථමයාමයේ දී පෙර විසූ කඳපිළිවෙළ දක්නා නුවණට ද, මධ්‍යම යාමයේ දී චුතුපපාත ඥානයට ද පැමිණ පශ්චිම යාමාවසානයෙහි දී දශබල චතුර්වෛශාරද්‍ය ආදී සියලු බුදුගුණ වලින් හෙබි සර්වඥතාඥානය ප්‍රතිවේධ කරන සේක් ම මේ අභිධර්මය සාගරය අධිගම කළ සේක. මෙසේ උන්වහන්සේගේ අධිගම නිදානය දතයුතුයි.

මෙසේ අභිධර්මය අධිගම කළසේක් එක්පලඟෙහි ම වැඩසිටි සතිය, අනිමිස සතිය සහ රුවන් සක්මන් සතිය ද ගෙවා සතරවන සතියෙහි ස්වයම්භූඥාන අධිගමයෙන් අභිධර්මය පරීක්‍ෂා කර බලා, අජපාල, මුචලින්ද, රාජායතන යන ස්ථානයන්හි අවශේෂ වූ සති තුන ගෙවා අටවෙනි සතියෙහි අජපල් නුගරුක මුල වැඩසිටි සේක් ධර්මයෙහි ගැඹුරුබව ප්‍රත්‍යවේක්‍ෂා කිරීමෙන් මන්දෝත්සාහී බවට පැමිණ, දසදහසක් සක්වළ මහා බ්‍රහ්මයන් පිරිවරාගත් සහම්පතී බ්‍රහ්මයා විසින් ධර්මදේශනා කිරීමට කරන ලද ආරාධනා ඇති ව බුදුඇසින් ලොව බලා වදාරා බ්‍රහ්මයාගේ ආරාධනාව පිළිගෙන 'මම කාහට නම් පළමු ව දහම් දෙසන්නෙම්'දැයි බලනසේක් ආලාරකාලාම, උද්‍රකරාමපුත්‍ර දෙදෙනා කළුරිය කළ බව දැන, පස්වග මහණුන් බොහෝ උපකාර කළ බව සිහිකොට අසුනෙන් නැගී කසීපුරයට වඩනා සේක් අතරමගදී උපක නම් ආජීවකයා සමග මන්ත්‍රණය කොට, ඇසළ පුන්පොහෝ දිනයෙහි ඉසිපතන මිගදායෙහි පස්වග මහණුන් වෙසෙන තැනට පැමිණ (තමන්වහන්සේ පිළිබඳ) නුදුසුදු ආචාරයෙන් හැසිරුණු ඔවුන්ට තමන් වහන්සේ බුද්ධත්වයට පත්වූ බව හඟවා දම්සක් පවත්වන සේක් අඤ්ඤාකොණ්ඩඤ්ඤ තෙරුන් ප්‍රමුඛ කොටගත් දහඅට කෙළක් බ්‍රහ්මයන් අමාමහ නිවනට පත්කළ සේක.

මෙසේ දම්සක් පැවැත්වීම තෙක් දේශනා නිදානය දතයුතුයි. මේ මෙහි සංක්‍ෂේපයයි. විස්තරය වනාහි අටුවා කථා සහිත අරියපරියේසන සූත්‍රය, පබ්බජ්ජා සූත්‍රය ආදියේ වශයෙන් දතයුතුයි. මෙසේ අධිගම නිදානය, දේශනා නිදානය යන නිදානයන්ගෙන් යුත් මේ අභිධර්මයට වනාහි දූරේ නිදානය, අවිදූරේ නිදානය සහ සන්තිකේ නිදානය යන අන්‍ය වූ ද නිදාන තුනකි. එහි දීපංකර පාදමූලයේ පටන් තුසිතපුරය තෙක් දූරේනිදානය දතයුතුයි. තුසිතපුරයේ පටන් බෝමැඩ දක්වා අවිදූරේ නිදානය යි. 'එකං සමයං භගවා දෙවෙසු විහරති තාවතිංසෙසු පාරිච්ඡත්තක මූලෙ පණ්ඩුකම්බලසිලායං, තත්‍ර ඛො භගවා දෙවානං තාවතිංසානං අභිධම්මංකථං කථෙසි' ති යනු මෙහි සන්තිකේ නිදානයයි. මේ නිදාන කථාවයි.

**නිදාන කථාව නිමියේ ය.**

දැන්:-

**ඉති මෙ භාසමානස්ස අභිධම්මකථං ඉමං**
**අවික්ඛිත්තා නිසාමෙථ දුල්ලභා හි අයං තථා ති**

මෙසේ මා විසින් කියනු ලබන මේ අභිධර්ම කථාව අවික්ෂිප්ත සිතින් යුතුව අසව්, මේ අභිධර්ම කථාව වනාහි දුර්ලභ ය.

මෙසේ ප්‍රතිඥා දුන් අභිධර්ම කථාව කීමට අවකාශ පැමිණියේ ය. එක් අභිධර්මය නම් ධම්මසංගණී ආදී වූ සප්තප්‍රකරණයෝ යි. ධම්ම සංගිණියද චිත්තෝත්පාද කාණ්ඩය ආදී වශයෙන් කාණ්ඩ සතරකි. චිත්තෝත්පාද කාණ්ඩය ද මාතිකා පදභාජනීය වශයෙන් දෙවැදෑරුම්ය. එහි මාතිකා පළමුවෙන් එයි. එකී මාතිකා ද තිකමාතිකා දුකමාතිකා යැයි දෙවැදෑරුම්ය. එහි තිකමාතික පළමුව එයි. තික මාතිකාවේ ද කුසලත්තිකය පළමුව එයි. කුසලත්තිකයෙහි ද 'කුසලාධම්මා' යන මේ පදයයි.

එහෙයින් :-

**ඉතො පට්ඨාය ගම්භීරං අභිධම්මකථං ඉමං**
**වුච්චමානං නිසාමෙථ එකග්ගා සාධු සාධවො ති**

සත්පුරුෂයෙනි, මෙතැන් පටන් කියනු ලබන ගැඹුරු වූ මේ අභිධර්ම කථාව එකඟ වූ සිත් ඇතිව මනාව අසව්.

'කුශල ධර්මයෝ ය, අකුශල ධර්මයෝ ය, අව්‍යාකෘත ධර්මයෝයැ'යි යන මේ වනාහි ආදි පදයෙන් නම් ලද කුශලත්‍රිකය නම් වේ.

සැප වේදනාවෙන් යුත් ධර්මයෝ ය. දුක් වේදනාවෙන් යුත් ධර්මයෝ ය. දුක් නොවූත් සැප නොවූත් වේදනාවෙන් යුත් ධර්මයෝ ය යන මෙය සියලු පදයන්ගේ ලද නම් ඇති වේදනාත්‍රිකය නම් වෙයි. මෙසේ ආදිපද වශයෙන් හෝ සියලු පද වශයෙන් හෝ සියලු ම තික දුකයන් නාමය දතයුතුයි. මේ සියල්ල ම පරිච්ඡේද පසළොසකින් වෙන් වෙන්කරන ලදී. ත්‍රිකයන්ට එක් පරිච්ඡේදයකි. ද්විකයන්ට තුදුසකි. 'හේතු ධර්මයෝ ය, නහේතු ධර්මයෝ යැ'යි යන ආදිය වනාහි ද්වික ෂට්කය යි.

ග්‍රන්ථ වශයෙන් ද අර්ථ වශයෙන් ද ඔවුනොවුන් ගේ සම්බන්ධයෙන් කෙමියක් මෙන් ද සමූහයක් මෙන් ද වී සිටි හෙයින් හේතුගොච්ඡකයැයි කියනු ලැබේ. එයින් අන්‍ය වූ සප්‍රත්‍ය ධර්මයෝ ය. අප්‍රකට ධර්මයෝ ය යන ආදී එකිනෙකට සම්බන්ධ නොවූ හුදෙක් සාමාන්‍ය දුක වශයෙන් රැස්කොට වෙන් වෙන් ව ගොච්ඡ අතර තැබූ හෙයින් ද අන්‍ය වූ මහන්තර දුකයන් අතරෙහි සුළු හෙයින් චූල්ලන්තර දුක යැයි දතයුතුයි. ඉන් පසුව ආසව දුකාදී ෂට් ද්විකයන්ගේ වශයෙන් ආසව ගොච්ඡිතය ද සංයෝජනාදීන්ගේ වශයෙන් සංයෝජන ගොච්ඡකය ද, එසේ ම ගන්ථ ඕඝ යෝග නීවරණ දුකාදීන්ගේ වශයෙන් ගන්ථ ඕඝ යෝග නීවරණ ගොච්ඡකයෝ ද පරාමාස දුකාදී පස්වැදෑරුම් දුකයන්ගේ වශයෙන් පරාමාස ගොච්ඡකයැයි ද සියලුම සප්ත ගොච්ඡකයෝ දතයුතුයි. ඉන්පසුව 'සාරම්මණා ධම්මා' යන ආදීහු තුදුස් මහන්තර දුකයෝ නම් වෙත්. ඉක්බිති උපාදාන දුකාදී ෂට්ද්වික උපාදාන ගොච්ඡක නම්. ඉක්බිති දස්සනෙන පහාතබ්බ දුකාදි අටළොස් දුක අභිධර්ම මාතෘකාවේ අවසානයේ තැබූ හෙයින් පිට්ඨිත දුක නම් වෙයි. 'විද්‍යාභාගීය ධර්මයෝ ය, අවිද්‍යාභාගීය ධර්මයෝ ය' යන ආදී දෙසාළිස් දුක වනාහි සූත්‍රාන්තික ද්විත නම් වෙයි. මෙසේ මේ සියල්ලම පරිච්ඡේද පසළොසකින් වෙන් කරන ලදැයි දතයුතුයි.

මෙසේ වෙන්කරන ලද මේවා සප්‍රදේශ, නිෂ්ප්‍රදේශ වශයෙන් කොටස් දෙකක් වෙයි. මේවා අතුරෙන් තික නවයත් දුක සැත්තෑඑකත් සප්‍රදේශ වූ රූපාරූප ධර්මයන් ගන්නා ලද හෙයින් සප්‍රදේශ නම් වෙයි. අවශේෂ වූ තික තෙළෙස ද සැත්තෑඑක් දුකයෝ ද නිෂ්ප්‍රදේශ නම් වෙයි. එහි ත්‍රිකයන් අතරෙහි වනාහි වේදනාත්‍රිකය, විතර්කත්‍රිකය, ප්‍රීතිත්‍රිකය, උත්පන්න ත්‍රිකය, අතීත ත්‍රිකය, ආරම්මණ ත්‍රික සතරය යන මේ ත්‍රික නවය සප්‍රදේශ නම් වෙයි. දුකයන් අතුරෙන් උපාදාන ගොච්ඡකය කෙළවර කොට ඇති හේතුගොච්ඡකය ආදී නව ගොච්ඡකයන් කෙළවර තුන තුන බැගින් වූ දුක ද, කිලේස ගොච්ඡක අවසානයේ වූ දුක සතර ද 'චිත්ත සම්පයුත්තා ධම්මා, චිත්ත විප්පයුත්තා ධම්මා චිත්ත සංසට්ඨා ධම්මා චිත්තවිසංසට්ඨා ධම්මා' යන මහන්ත දුක දෙක ද, සුත්තන්තික දුකයන් අතුරෙන් අධිවචන දුකය, පඤ්ඤත්ති දුකය, නිරුත්ති දුකය, නාමරූප දුකය දැයි යන මේ දුක සතර හැර ඉතිරි අටතිස් දුකදැයි යන මේවා සප්‍රදේශ නම්. කියන ලද අවශේෂ සියලු ම ත්‍රික ද්වික නිෂ්ප්‍රදේශ යැයි දතයුතුයි.

දැන් 'කුසලා ධම්මා' යන ආදී මාතෘකා ආරෝග්‍යය අනවද්‍ය, ඡේකය, සැපවිපාකය යන අර්ථයන්හි දක්නා ලැබේ. මේ වනාහි 'කච්චිනු හොතො කුසලං? කච්චිනු හොතො අනාමයංනති' ආදී තැන්හි ආරෝග්‍යයෙහි දක්නා ලැබේ. 'කතමො පන භනෙව, කායසමාචාරො කුසලො, යො ඛො මහාරාජ, කායසමාචාරො අනවජ්ජොති ච, පුන ච පරං භනෙත එතදනුත්තරියං යථා භගවා ධම්ම දෙසෙති කුසලෙසු ධම්මෙසු' යන මේ ආදියෙහි අනවද්‍යයෙහිය. 'කුසලො ත්වං රථස්ස අංගප්‍ප සංගානං කුසලා නච්චගීතස්ස, සික්ඛිතා චාතුරත්ථියො' යන මේ ආදියෙහි දක්‍ෂබවෙහි වේ. 'කුසලානං භික්ඛවෙ ධම්මානං සමාදාන හෙතු, කුසලස්ස කම්ම කතත්තා උපචිතත්තා' යන ආදියෙහි සැප විපාකයෙහි වේ. එය මෙහි ආරෝග්‍යයෙහි ද, අනවද්‍යයෙහි ද සැප විපාකයෙහි ද වැටේ. මේ ධර්ම ශබ්දය වනාහි පර්යාප්ති, හේතු, ගුණ නිස්සත්ත නිජ්ජීවතාදියෙහි දක්නා ලැබේ. මෙය වනාහි 'ධම්මං පරියාපුණාති සුත්තං ගෙය්‍යං යන ආදියෙහි පර්යාප්තියෙහි දක්නා ලැබේ. 'හෙතුම්හි ඤාණං ධම්මපටිසම්භිදා' යන ආදියෙහි හේතුවෙහි වැටේ.

නහි ධම්මො අධම්මො ච උභො සමවිපාකිනො
අධම්මො නිරයං නෙති ධම්මො පාපෙති සුගතිනති

(ධර්මයත් අධර්මයත් යන දෙක සමවිපාක ඇත්තේ නො වේ. අධර්මය නිරයට පමුණුවයි. ධර්මය සුගතියට පමුණුවයි.)

ආදියෙහි ගුණයෙහි වැටේ. 'තස්මිං ඛොපන සමයෙ ධම්මා හොනති, ධම්මෙසු ධම්මානුපස්සී විහරති' යන ආදියෙහි නිස්සත්ත නිජ්ජීවතාවෙහි වැටේ. එය මෙහිදී ද නිස්සත්ත නිජ්ජීවතාවෙහි ම වැටේ. මෙහි වචනාර්ථය නම් ලාමක වූ පාපධර්මයන් චලනය කෙරේනුයි, කම්පා කෙරේනුයි විනාශ කෙරේනුයි = කුසල් නම්. නින්දිත ආකාරයෙන් සයනය කෙරේනුයි=කුස නම්. අකුසල නම් වූ ඒ කුසයන් සිඳිනුයි කුසල නම් වේ. පාපධර්මයන් තුනී කරන හෙයින් අවසාන කරන හෙයින් ඥාණය කුස නම් වේ. එකී කුස සංඛ්‍යාත ඥානයෙන් සිඳිය යුතු හෙයින් හෝ කුසල නම් වෙයි. ගතයුතුය, පැවැත්විය යුතුය යන අර්ථයි. යම් සේ කුස දෙපසට ම හසු වූ අත් පෙදෙස කපයි. මෙ පරිද්දෙන් උපන් නූපන් වශයෙන් වූ උභ භාගගත ක්ලේශ පක්‍ෂය කපයි. එහෙයින් කුස මෙන් සිඳිනුයි - කුසල නම් වේ. තමාගේ ස්වභාවය දරානුයි ධර්ම නම්. ප්‍රත්‍යයන්

විසින් දරනු ලැබේනුයි හෝ යථා ස්වභාවයෙන් දරනු ලැබේනුයි හෝ දර්ම නම්. කුසල් නො වූයේ = අකුසල් නම්. මිත්‍රයන් ප්‍රතිපක්ෂ වූ අමිත්‍රයෝ මෙනි. ලෝභාදීන්ට ප්‍රතිපක්ෂ වූ අලෝභාදිය මෙනි. කුසලයන්ට ප්‍රතිපක්ෂ යන අර්ථයි. ඔවුනතුරෙන් වනාහි අනවද්‍ය සුඛවිපාක ලක්ෂණ ඇතියේ කුසල්ය. සාවද්‍ය දුක්ඛවිපාක ලක්ෂණ ඇතියේ අකුසල් ය. අවිපාක ලක්ෂණ ඇතියේ අව්‍යාකෘතයි. කිං 'කුසලාති වා ධම්මාති වා' යන මේ ආදිය ඒකාර්ථ ද? නැතහොත් නානාර්ථ ද? කිම? මෙහි දී යම්හෙයකින් ඒකාර්ථවත් නම් 'කුසල ධම්මා' යන මෙය 'කුසලා කුසලා' යැයි කීම සමාන වේ ද, නැතහොත් නානාර්ථ වේ නම්, තික දුකයන්ගේ ඡක්ක චතුක්කභාවයට පැමිණීම වෙයි. පදයන්ගේ අසම්බන්ධය ද වෙයි. යම්සේ 'කුසලා රූපං චක්ඛුමා' යැයි කී කල්හි අර්ථ වශයෙන් ඔවුනොවුන් නො බලන පදයන්ගේ කිසි ම සම්බන්ධයක් නො වේ. මෙසේ මෙහි ද පදයන්ගේ අසම්බන්ධය වෙයි. පූර්වාපර සම්බන්ධ රහිත පද නිෂ්ප්‍රයෝජන වෙයි. එකී (කුසලා) යන මෙය පරව (යොදා) 'කතමෙ ධම්මා කුසලා'යි විචාරන ලද්දේ එය සමග විරෝධය පැමිණි ධර්මයෝ කුසලයෝ නො වන්නාහ කියායි. එසේ වුව ද 'කතමෙ ධම්මා කුසලා' යන මෙය කියනු ලැබේ.

තවත් නයකි. ඉදින් මේවා ඒකාර්ථවත් නම් ධර්මත්‍රයේ ම එකඟ බවක් වෙයි. කුසලාදීන්ගේ ද එක්බවක් වෙයි. කුසලාදියෝ පර ධර්මත්‍රයේම ධර්ම බැවින් එක්බවක් වෙයි. එහෙයින් ධර්මත්‍රය සමග අර්ථ වශයෙන් නානත්වයක් නැති කුසලාදීන්ගේ ද ඒකත්වය වෙයි. යමක් කුසල් ද, එය අකුසල් ය. එය අව්‍යාකෘත ය යනුවෙනි. එසේ නම් ධර්මත්‍රයේ එක්බවක් නොපිළිගනුව, කුසල යනුවෙන් පර වූ ධර්මය අනිකකි. අකුසල යන්නෙන් පර වූ ධර්මය අනිකකි. අව්‍යාකෘත යන්නෙන් පරවූයේ අනිකෙකැයි කියම්. එසේ නම් ධර්ම යනු භාවයෙකි. භාවයෙන් අන්‍ය වූයේ අභාවයි. කුසල යන්නෙන් පර වූවෝ භාව සංඛ්‍යාත ධර්මයෝ යි. අන්‍ය වූ අකුසලයන්ගෙන් පර වූ ධර්මය අභාව නම් වන්නේ ය. අව්‍යාකත පර වූයේ ද එසේම ය. එයින් අන්‍ය වූ කුසලපර වූයේ ද එසේම ය. මෙසේ අභාවයට පැමිණි ධර්මයන්ගෙන් අන්‍ය වූ කුසලාදිය ද අභාවයෝම යැයි යන මේ සියල්ල අකාරණ ය. කවර හෙයින් යථානුමති වෝහාර සිද්ධියෙහි, ව්‍යවහාරය වනාහි යම් යම් අයුරින් අර්ථයන්හි අනුමතයැයි පිළිගන්නා ලදද ඒ ඒ පරිදි ම සිද්ධ ය. 'කුසලා ධම්මා' යන මේ ආදියෙහි ධර්මාභිලාෂය (=ධර්මය යන වචනය) කුශල පූර්වය, කුශලාභිෂය ධර්මයන් පරකොට

ඇත්තේ ය. යම්සේ කුසලා කුසලා යැයි මෙසේ අර්ථ විශේෂයක් නොමැති බැවින් මෙය පණ්ඩිතයන් විසින් නොපිළි ගන්නා ලදී. කුසලා රූපං චක්ඛුං, ශබ්දය මෙන් ඔවුනොවුන් (දෙස) නොබලන අරුත් ඇති බැවින් නො වේ. මෙහි කුශල ශබ්දය වනාහි අනවද්‍ය සුඛවිපාක සංඛ්‍යාත අර්ථය බබුළුවන බැවින් පිළිගන්නා ලදී. අකුශල ශබ්දය සාවද්‍ය දුක්ඛ විපාකාර්ථ ජ්‍යාතනය කරන බැවින් පිළිගන්නා ලදී. අව්‍යාකෘත ශබ්ද අවිපාකාර්ථ ජ්‍යාතනය කරන ලද බැවින් පිළිගන්නා ලදී. ධර්ම ශබ්දය ස්වභාව සාධාරණ ආදී අර්ථ ජ්‍යාතනය කරන ලද හෙයින් පිළිගන්නා ලදී. ඒ ධර්ම ශබ්දය මොවුන්ගෙන් අන්‍යතරයකු අතුරෙහි කියනු ලබනුයේ තමාගේ අර්ථ සාම්‍යය (සමාන බව) දක්වයි. මේ සියල්ලෝ ම ස්වභාව ධාරණාදී ලක්‍ෂණයෙන් ධර්මයෝ යි. කුශලාදී ශබ්දයෝ ද ධර්ම ශබ්දය පූර්වයෙන් කියනු ලබන්නාහු තමන්ගේ අර්ථ විශේෂය එයට දක්වත්. ධර්මය වනාහි කුසලයෝ වෙයි. අකුසල හෝ වෙයි. අව්‍යාකෘත හෝ වෙයි. මෙසේ මෙකී ශබ්දයන් සමග වෙන වෙනම කියනු ලබන්නාහු තම තමන්ගේ අර්ථ මාත්‍රය දැක්වීමෙන් පිළිගන්නා ලදහ. ධර්ම ශබ්දය සමග කියනු ලබන්නාහු තම තමන්ගේ සාමාන්‍ය අර්ථය හෝ අර්ථ විශේෂය හෝ දක්වන බැවින් ලෝකයෙහි පණ්ඩිතයන් විසින් පිළිගන්නා ලදහ. එබැවින් මෙහි දී යමක් ඒකාර්ථ බවත් නානාර්ථ බවත් විකල්පනය කොට දෝෂාරෝපණයට හේතු කියන ලදී. මේ සියල්ල අකාරණ ය. මේ වනාහි කුශලත්‍රිකය සම්බන්ධ පිළිවෙළ පද වර්ණනාව ය. මේ නයින් ම සෙසු තික දුකයන්ගේ ද නය දතයුතුයි. මින් මතු වනාහි විශේෂ මාත්‍රය පමණක් ම කියමි.

'**සුඛාය වෙදනාය සම්පයුත්තා**' යන ආදියෙහි සුඛ ශබ්දය වනාහි සුඛ වේදනා, සුඛමූල, සුඛාරම්මණ, සුඛහේතු සුඛ ප්‍රත්‍යස්ථාන, අව්‍යාපාද, නිර්වාණ ආදියෙහි දක්නා ලැබේ. මෙය වනාහි 'සුඛස්ස ච පහාණා' යන ආදියෙහි සුඛ වේදනාවෙහි දක්නා ලැබේ. 'සුඛො බුද්ධානං උප්පාදො, සුඛා විරාගතා ලොකෙ' යන ආදියෙහි සුඛ මූලයෙහි දක්නා ලැබේ. 'යස්මා ච ඛො මහාලී, රූපං සුඛං සුඛානුපතිතං සුඛාවක්කන්තං' යනාදියෙහි සුඛාරම්මණයෙහි දක්නා ලැබේ. 'සුඛස්සෙතං භික්ඛවෙ, අධිවචනං යදිදං පුඤ්ඤානි' යන ආදියෙහි සුඛ හේතුවෙහි දක්නා ලැබේ. 'යාවඤ්චිදං භික්ඛවෙ න සුකරං අක්ඛානෙන පාපුණිතුං යාව සුඛා සග්ගා, න තෙ සුඛං පජානන්ති යෙ න පස්සන්ති නන්දනං' යන ආදියෙහි සුඛ ප්‍රත්‍ය ස්ථානයෙහි දක්නා ලැබේ. 'දිට්ඨ ධම්ම සුඛවිහාරා එතෙ ධම්මා' යන ආදියෙහි

අව්‍යාපාදයෙහි දක්නා ලැබේ. 'නිබ්බාණං පරමං සුඛං' යන ආදියෙහි නිර්වාණයෙහි දක්නා ලැබේ. මෙහිදී වනාහි මෙය සුඛ වේදනාවෙහි ම දතයුතුයි. වේදනා ශබ්දය 'විදිතා මෙ වෙදනා උප්පජ්ජන්ති' යන ආදියෙහි වේදයිතයිතයෙහි (විඳිය යුත්තෙහි) ම වැටේ. 'දුක්ඛ' ශබ්දය දුක්ඛ වේදනා, දුක්ඛ වත්‍ථු, දුක්ඛාරම්මණ, දුක්ඛප්පච්චය දුක්ඛප්පච්චයට්ඨාන ආදියෙහි දක්නා ලැබේ. මෙය වනාහි 'දුක්ඛස්ස ච පහාණා' යන ආදියෙහි දුඃඛවේදනාවෙහි දක්නා ලැබේ. 'ජාතිපි දුක්ඛා' යන ආදියෙහි දුඃඛ වස්තුවෙහි දක්නා ලැබේ. 'යස්මා ච ඛො මහාලි, රූපං දුක්ඛං දුක්ඛානුපතිතං දුක්ඛාව ක්කන්තං' යන ආදියෙහි දුඃඛාරම්මණයෙහි දක්නා ලැබේ. 'දුක්ඛො පාපස්ස උච්චයො' යන ආදියෙහි දුඃඛ ප්‍රත්‍යයෙහි දක්නා ලැබේ. 'යාවඤ්චිදං භික්ඛවෙ න සුකරං අක්ඛානෙන පාපුණිතුං සාව දුක්ඛා නිරයා' යන ආදියෙහි දුඃඛ ප්‍රත්‍ය ස්ථානයෙහි දක්නා ලැබේ. මෙහි වනාහි මෙය දුක් වේදනාවෙහිම දතයුතුයි. මෙහි වචනාර්ථය වනාහි සැප කෙරේනුයි සුඛා නම්. දුක් කෙරේනුයි දුක්ඛා නම්. සුවදුක් නොවුයේ නුයි අදුක්ඛමසුඛ නම්. ම කාරය පදසන්ධි වශයෙන් කියන ලදී. සියලු ම අරමුණු රස විඳිත්නුයි අනුභව කෙරෙත්නුයි වේදනා ය. ඔවුනතුරෙන් ඉෂ්ට අනුභවන ලක්‍ෂණය ඇත්තේ සුඛයයි. අනිෂ්ට අනුභවන ලක්‍ෂණය ඇත්තේ දුඃඛය. මෙකී දෙකින් වෙනස් අනුභවන ලක්ෂණ ඇත්තේ අදුක්ඛමසුඛය. මෙකී පද තුනෙහිම යම් ඒ 'සම්ප්‍රයුත්ත' ශබ්දයක් වේද එහි අර්ථය :- සම වූ ආකාරයකින් යෙදුණෝනුයි = සම්ප්‍රයුක්තයෝ ය. කවර නම් ආකාරයන්ගෙන් ද යත්, ඒකුප්පාදතා ආදී වශයෙනි. කිසියම් ධර්ම කෙනෙකුන් සමග සම්ප්‍රයුක්ත වූ එසේය. ප්‍රශ්න කරන්නවුනි, කිසියම් ධර්ම කෙනෙක් නැද්දැයි මේ ප්‍රශ්නය ප්‍රතික්‍ෂේප කිරීමේ දී කිසියම් ධර්ම කෙනෙකුන් හා සහගත වූ සහජාත වූ සම්මිශ්‍ර වූ එක්ව උපන් එක්ව නිරුද්ධ වන ඒකවස්තුක වූ ඒකාරම්මණ වූ කිසියම් ධර්ම කෙනෙක් ඇත්තේ නොවේදැයි මෙසේ ඒකෝත්පාදාදීන්ගේ වශයෙන් සම්ප්‍රයෝගාර්ථය කියනලදී. මෙසේ මේ ඒකෝත්පාදාදී සමග සම වූ ප්‍රකාරයෙන් යුක්ත වූවෝනුයි සම්ප්‍රයුක්තයෝය.

විපාක ත්‍රිකයෙහි ඔවුනොවුන්ට විශිෂ්ට වූ කුශලා කුශලයන්ගේ පාකය (පැසීම) විපාක නම්. විශේෂයෙන් පැසුණු බවට පත් වූ අරූප ධර්මයන්ට මේ නමෙකි. විපාක ධම්මා යනු විපාකයන්ගේ ස්වභාව ධර්මය යි. යම්සේ ජාතිය, ජරාව ස්වභාවකොට ඇති, ජාතිය, ජරාව ප්‍රකෘති කොට ඇති සත්ත්වයෝ ජාතිය ස්වභාවකොට ඇත්තාහ. ජරාව ස්වභාවකොට ඇත්තාහ කියනු ලබත්. මෙසේ විපාක ජනකාර්ථයෙන්

විපාක ස්වභාවකොට ඇති විපාක ප්‍රකෘති කොට ඇති ධර්මයෝ ය යන අර්ථය තුන්වන පදය උභය ස්වභාවය ප්‍රතික්ෂේප වශයෙන් කියන ලදී.

උපාදින්න උපාදානීය ත්‍රිකයෙහි අරමුණු කිරීම් වශයෙන් තෘෂ්ණාදීන්ගෙන් යුක්ත වූ කර්මය විසින් ගන්නා ලද ඵලභාවයෙන් ගන්නා ලද්දෝනුයි = උපාදින්න නම්. අරමුණු බවට පැමිණ උපාදානයන්ට සම්බන්ධ වීමෙන් උපාදානයන්ය. හිත වූවෝනුයි = උපාදානීය නම් වෙත්. උපාදානයන්ට ආරම්මණ ප්‍රත්‍ය වූවන් මෙය නමකි. උපාදින්නයෝත් ඔව්හුය. උපාදානීයයෝත් ඔව්හුය. අධි උපාදින්නුපාදානීයයෝ යි. ආශ්‍රව සහිත කර්මයන්ගෙන් උපන් රූපාරූප ධර්මයන්ට මේ නමෙකි. මේ නයින් සෙසු පද දෙකෙහි ද ප්‍රතිෂේධ සහිත අර්ථය දතයුතු ය. 'සංකිලිට්ඨ සංකිලෙස' ත්‍රිකයෙහි කෙලෙසානුයි = සංකිලෙස නම්. බාධා කෙරෙයි හෝ තවයිනුයි යන අර්ථයි. කෙලෙසීමෙන් යුක්තවූවෝ සංකිලිෂ්ටයෝයි. තමා අරමුණුකොට පැවතීමෙන් කිලිටුවීමට සුදුසු වෙත්, එහි අරමුණු බව නො ඉක්මවීමෙන් කෙලෙසීමේ නියුතු වූවෝ නුයි = සංකිලෙයිකයෝයි. කෙලෙසීමට අරමුණු - ප්‍රත්‍යවූවන්ට මේ නමෙකි. සංකිලිෂ්ටයෝත් ඔව්හුය. සංක්ලේෂිකයෝත් ඔව්හුය නුයි සංකිලිෂ්ට සංක්ලේශිතයෝ යි. සෙසු පද දෙක ද පළමු ත්‍රිකයෙහි කී නයින් ම දතයුතුයි.

විතර්කත්‍රිකයෙහි සම්ප්‍රයෝග වශයෙන් පවත්නා විතර්කය සමග වූවෝ = සවිතර්කයෝ ය. විචාරය සමග වූවෝ = සවිචාරයෝ ය. විතර්ක සහිත වූවෝත් ඔව්හුය. විචාර සහිත වූවෝත් ඔව්හුය නුයි = සවිතක්කය විචාරයෝ යි. උභය රහිත වූවෝ අවිතක්ක අවිචාරයෝ යි. විතර්ක විචාර අතුරෙන් විචාරයට ප්‍රමාණ වූයේ පරම වූයේ මොවුන්වනුයි = විචාරමත්තාය. විචාරයෙන් මත්තෙහි විතර්කය සමග එක්වීමට නොයත්නුයි අර්ථයි. අවිතර්කයෝත් ඔව්හුය. විචාර මාත්‍රයෝත් ඔව්හුය නුයි = අවිතක්ක විචාර වත්තයෝ ය.

ප්‍රීති ත්‍රිකයෙහි ප්‍රීතිය සමග ඒකෝත්පාදී භාවයට ගියෝනුයි ප්‍රීති සහගතයෝ ය. ප්‍රීති සම්ප්‍රයුක්තයෝ යන අර්ථයි. සෙසු පද දෙකෙහි ද මේ නයයි. මෙහි උපේක්ෂා යනු දුක් නොවූත් සැප නොවූත් වේදනාව කියන ලදී. එය වනාහි සැපදුක් ආකාර වූ පැවැත්ම උපේක්ෂා කරයි. මධ්‍යස්ත ආකාරයෙන් සිටි බැවින් ඒ අයුරින් පවතීනුයි උපේක්ෂා නම්.

මෙසේවේදනා ත්‍රිකයෙන් පද දෙකක්ම ගෙන නිෂ්ප්‍රීතික සුඛයට සප්‍රීතික සුවයෙන් වෙනස දැක්වීම් වශයෙන් මේ ත්‍රිකය කියන ලදී.

දර්ශන ත්‍රිකයෙහි දස්සනේන යනු සෝවාන් මගිනි. එය වනාහි පළමුවෙනි නිවන දක්නා හෙයින් දර්ශනයැයි කියන ලදී. ගෝත්‍රභූ සිත වනාහි පළමුවෙන් කිසිවක් දකී. යම් සේ වනාහි කිසියම් කරුණක් සඳහා රජු වෙත ආ පුරුෂයෙක් දුරදීම වීථියෙහි හැසිරෙන ඇතුපිට හුන් රජු දැකත් තා විසින් රජ දක්නා ලදැයි විචාරන ලදුව කළයුතු කිස නො කළ හෙයින් නො දකිමියි කීය. මෙපරිද්දෙන් ම නිවන් දැක කළයුතු වූ ක්ලේශ ප්‍රහාණය නොවූයෙන් දර්ශනයක් නැතැයි කියනු ලැබේ. ඒ ඥානය වනාහි මාර්ගය ආවර්ජනය කරන ස්ථානයේ සිටී. භාවනාය යනු සෙසු මාර්ගත්‍රයෙනි. සෙසු මාර්ගත්‍රය වනාහි ප්‍රථම මාර්ගයෙන් ධර්මය අවබෝධ කරගත් කල්හි භාවනා වශයෙන් උපදී. නො දුටු විරූ කිසිවක් නො දකී. එහෙයින් භාවනායැයි කියනු ලැබේ. තෙවන පදය උභය ප්‍රතික්ෂේප වශයෙන් කියන ලදී.

තදනන්තර ත්‍රිකයෙහි දර්ශනයෙන් පහ කළයුතු හේතු මොවුන්ට නුයි = දසසනෙන පහාතබබහෙතුකා යි දෙවන පදයෙහි ද මේ නයමය. තෙවන පදයෙහි දර්ශනයෙනුත් පහකළ නොහැකි භාවනාවෙනුත් පහකළ නො හැකි හේතු මොවුන්ටනුයි යන මේ අර්ථය නො ගෙන දර්ශනයෙනුත් පහකළ නො හැකි භාවනාවෙනුත් පහකළ නොහැකි මොවුන්ට ඇත යන මේ අර්ථය ගතයුතුයි. අන් පරිද්දෙකින් වීනම් අහේතුකයින්ගේ නො ගැනීම වන්නේ ය. ඔවුන් හේතුව ම නැත. යමක් දර්ශන භාවනාවන් ගෙන් පහ කළයුතු වේද, සහේතුකයන්හිදී ද හේතු වර්ජකයින්ගේ ග්‍රහණයට පැමිණෙයි. හේතුන්ගේ ගැනීමක් නො වෙයි. මොවුන්ගේ හේතුව ම දර්ශනයෙනුත් භාවනාවෙනුත් පහ කළයුතු නොවේයැයි කියන ලදී. ඒ ධර්මයෝ නො වෙත්. මේ දෙක ම බලාපොරොත්තු නො වේ. එහෙයින් දර්ශනයෙනුත් භාවනාවෙනුත් පහ නොකළ යුතු හේතු මොවුන් ඇත්තේනුයි = **'නෙවදසසනෙන නභාවනාය පහාතබබහෙතුකා'** යන මේ අර්ථය ගතයුතුයි.

ආචයගාමී ත්‍රිකයෙහි කර්ම ක්ලේශයන් විසින් රැස්කරනු ලැබේනුයි = ආචයයි. ප්‍රතිසන්ධි චුති ගති පැවතීම් ඇතියනට මේ නමකි. එයට කරුණු වී නිපදවන බැවින් එය රැස්කිරීමට පැමිණෙත්. යමෙකුගේ හෝ

පවතිත් ද, ඒ පුද්ගලයා කියන ලද පරිදිම රැස්කිරීමට පමුණුවත්නුයි ආචයගාමී නම් වේ. ආශ්‍රව සහිත කුශලාකුශලයන්ට මේ නමකි. එහෙයින්ම ආචය සංඛ්‍යාත රැස්කිරීමෙන් පහවූ බැවින් නිවන පහවූ රැස්කිරීම් ඇත්තේනුයි = අපචයයි. එය අරමුණුකොට පවත්නා හෙයින් අපචය නම් වූ නිවනට යෙත්නුයි = අපචයගාමීහු ය. මෙය ආර්ය මාර්ගයන්ට නමකි. තව ද උළු වඩුවකු ප්‍රාකාරය මෙන් පැවැත්ම (ඉදිරි ගමන) රැස් කරමින් යෙත්නුයි = ආචයගාමීහුය. ඔහු විසින් රැස්කරන රැස්කරන ලද්ද විද්වංශනය කරන පුරිසයකු මෙන් ඒ පැවැත්ම ම විනාශ කරමින් යෙත්නුයි = අපචයගාමීහු ය. තෙවන පදය උභය ප්‍රතික්ෂේපයෙන් කියන ලදී.

ශෛක්ෂත්‍රිකයෙහි ත්‍රිවිධ ශික්‍ෂාවන්හි උපන්නාහු නුයි = ශෛක්‍ෂයෝ ය. මොව්හු සප්ත ශෛක්‍ෂයන්ට අයත්නුයි යනුවෙන් ද, ශෛක්‍ෂයෝ ය. සම්පූර්ණ නො කළ ශික්‍ෂා ඇති බැවින් තමා ම හික්මෙත්නුයි ද ශෛක්‍ෂයෝ ය. මතුයෙහි හික්මිය යුතු බවක් නැතිහෙයින් ශෛක්‍ෂයෝ නොවෙත්නුයි = අශෛක්‍ෂයෝ ය. වෘද්ධියට පැමිණියෝ හෝ අශෛක්‍ෂයෝ නුයි = අශෛක්‍ෂයෝ ය. අර්හත්ඵලය ස්වභාවකොට ඇතියනට මේ නමෙකි. තෙවන පදය උභය ප්‍රතික්ෂේප වශයෙන් කියන ලදී.

පරිත්ත ත්‍රිකයෙහි හාත්පසින් ඛණ්ඩනය කළ හෙයින් ස්වල්පමාත්‍රය, ස්වල්පය යැයි කියනු ලැබේ. ස්වල්ප වූ ගොමපිඩය ආදියෙහි මෙනි. මොවුහු ද අල්පානුභාව බැවින් ස්වල්ප වූවෝ වැනි නුයි = පරිත්තයෝ ය. කාමාවචර ධර්මයන්ට මේ නමෙකි. ක්ලේශ විෂ්කම්භනය සමර්ථ බැවින්ද, මහත් වූ ඵල ඇති හෙයින් ද, දීර්ඝ වූ සන්තාන ඇති හෙයින් ද මහත්භාවයට ගියෝ ය. මහත් අය විසින් හෝ මහත් වූ ඡන්‍ද, වීර්ය, චිත්ත, ප්‍රඥා ඇති අය විසින් යන ලදහ. පිළිපන්නා ලදහනුයි = මහත්ගතයෝය. රාගාදී ධර්මයෝ ප්‍රමාණකරයහ. ප්‍රමාණ නම් අරමුණු වශයෙන් හෝ සම්ප්‍රයෝග වශයෙනි. මොවුන්ට ප්‍රමාණයක් නැත්තේ ය. ප්‍රමාණයට ප්‍රතිපක්‍ෂයෝ ය නුයි = අප්‍රමාණයෝ ය.

පරිත්තාරම්මණත්‍රිකයෙහි ස්වල්ප වූ අරමුණු මොවුන්ට නුයි පරිත්තාරම්මණයෝ ය. සෙසු පද දෙකේ ද මේ නය ම ය.

හීනත්‍රිකයෙහි හීනා යනු ලාමක වූ අකුශල ධර්මයෝ ය. හීන ප්‍රණීතයන්ගේ මධ්‍යයෙහි වූවෝනුයි = මධ්‍යමයෝ ය. අවශේෂ වූ

ත්‍රෛභූමක ධර්මයෝ උක්තමාර්ථයෙන් අනල්පකාර්ථයෙන් ද = ප්‍රණීත යෝ ය. ලෝකෝත්තර ධර්මයෝ ය.

මිථ්‍යා භාවත්‍රිකයෙහි මොව්හු හිතසුව ගෙන දෙන්නෝ වන්නාහයි මෙසේ ආශිංසනය කරනු ලද්දෝ නමුදු එසේ නොමැති හෙයින් අශුභාදියෙහි ම ශුභය ආදී විපරීත පැවතීම් ඇති හෙයින් ද මිථ්‍යා ස්වභාව ඇත්තෝ නුයි මිච්ඡත්තය, විපාකදීම ඇතිකල්හි ස්කන්ධ භේදයට අනන්තරවම විපාකදීම ඇති හෙයින් නියතයෝ ය. මිථ්‍යා ස්වභාව ඇත්තෝත් නියතයෝත් ඔව්හුමනුයි මිච්ඡත්ත නියතයෝය කියන ලද්දට විපරීත වූ අර්ථයෙන් සම්‍යක් ස්වභාව ඇත්තේනුයි = සම්මත්තයෝ ය. අනන්තරවම විපාක දීමෙන් සම්මත්ත වූවෝත් නියත වූවෝත් ඔව්හුමනුයි = සම්මත්ත නියතයෝ ය. උභයාකාරයෙන් ම නියත නොවූවෝනුයි අනියතයෝ ය.

මාර්ගාරම්මණාත්‍රිකයෙහි නිවන සොයායි ගවේෂණය කෙරේනුයි ක්ලේශයන් මරමින් හෝ යෙයි නුයි = මාර්ගයි. මාර්ගය, අරමුණ වූයේ මොවුන්ට නුයි = මාර්ගාරම්මණායෝ ය. අෂ්ටාංගික මාර්ගය ම ප්‍රත්‍යාර්ථයෙන් මොවුන්ට හේතුය නුයි = මග්ග හේතුකයෝ ය. මාර්ග සම්ප්‍රයුක්ත වූ හේතුය. මාර්ගයෙහි හෝ හේතුය නුයි = මග්ග හේතුය. ඔව්හු මොවුන්ට හේතු යනුයි = මග්ග හේතුකයෝ ය. මැඩගෙන පවත්නා අර්ථයෙන් මාර්ගය මොවුන්ට අධිපතිනුයි = මාර්ගාධිපතීහු ය. උත්පන්න ත්‍රිකයෙහි ඉපදීමේ පටන් බිඳීම දක්වා උඩට පැමිණියාහු, ගියාහු පැමිණියාහු නුයි = උත්පන්නයෝ ය. නූපන්නෝ නුයි = අනුත්පන්න යන, නිම වූ කාරණා ඒකදේශත්වයෙන් අවශ්‍යයෙන් ම උපදින්නෝ ය නුයි = උපපාදිනනයහ. (උපදින්නෝ ය.)

අතීත ත්‍රිකයෙහි තමාගේ ස්වභාවයට හෝ උත්පාදාදී ලක්‍ෂණයට හෝ පැමිණ ඉක්මූවෝ නුයි = අතීතයහ. එකී දෙකට ම නො ආවාහු = අනාගතයහ. ඒ ඒ කාරණය නිසා උපන්නාහු = පච්චුප්පන්නයෝ ය.

තදනන්තර ත්‍රිකයෙහි අතීතාරම්මණය මොවුන්ටනුයි = අතීතාරම්මණයෝ ය. සෙසු පද දෙක්හි ද මේ නයම ය.

ආධ්‍යාත්ම ත්‍රිකයෙහි මෙසේ පවත්නා වූ අපි ආත්මය යන

ග්‍රහණයට යන්නෙමුයැයි මේ අදහසින් මෙන්ම තමා පාලනය කරගෙන පැවැත්තාහු නුයි = ආධ්‍යාත්මයෝ ය. මේ 'අජ්ඣත්ත' ශබ්දය වනාහි ගෝචර අජ්ඣත්තය, නියත අජ්ඣත්තය, අජ්ඣත්ත අජ්ඣත්තය, විසය අජ්ඣත්තය යන සතර අර්ථයන්හි දක්නා ලැබේ. 'තෙනා නන්ද, භික්ඛුනා තස්මිංයෙව පුරිමස්මිං සමාධි නිමිත්තෙ අජ්ඣත්තමෙව චිත්තං සණ්ඨපෙතබ්බං, අජ්ඣත්තතො සමාහිතො' යන ආදියෙහි වනාහි මෙය ගෝචර අජ්ඣත්තයෙහි දක්නා ලැබේ. 'අජ්ඣත්තං සම්පසාදනං, අජ්ඣත්තං වා ධම්මෙසු ධම්මානුපස්සී විහරති' යන ආදියෙහි නියකජ්ඣත්තයෙහි වැටේ. 'ඡ අජ්ඣත්තිකානි ආයතනානි' යන ආදියෙහි අජ්ඣත්ත අජ්ඣත්තයෙහි ය. අයං ඛො පනානන්ද විහාරො තථාගතෙන අභිසම්බුද්ධො යදිදං සබ්බනිමිත්තානං අමනසිකාරා අජ්ඣත්තං සුඤ්ඤතං උපසම්පජ්ජ විහරති' යන ආදියෙහි විසයජ්ඣත්තයෙහි ය. අධිපති ස්ථානයෙහි යන අර්ථයි. ඵල සමාපත්තිය වනාහි බුදුවරුන්ට අධිපති ස්ථානය නම් වේ. මෙහි වනාහි නියතජ්ඣත්තයෙහි අදහස් කෙරේ. එහෙයින් ස්වසන්තානයෙහි පැවති පෞද්ගලික වූ ධර්මයෝ ආධ්‍යාත්මයෝයැයි දතයුතු යි. එයින් බාහිර වූවෝ වනාහි ඉන්ද්‍රියබද්ධ වූවෝ හෝ ඉන්ද්‍රියබද්ධ නො වූවෝ හෝ බහිද්ධා (බාහිර) නම් වේ. තෙවන පදය ඒ උභය වශයෙන් කියන ලදී.

අනන්තරත්‍රිකය එකී තෙවැදෑරුම් ධර්මයන් ම අරමුණු කොට පැවතීම් වශයෙන් කියන ලදී.

සන්දර්ශනත්‍රිකයෙහි දතයුතුබවැයි කියන ලද නිදසුන් සහිත යනුයි= සන්දර්ශනයි. නසන බවැයි කියන ලද ප්‍රතිඝය සමග යනුයි. = සප්‍රඝය, සනිදර්ශන වූවෝත්, සප්‍රඝ වූවෝත් ඔව්හුය යනු = සනිදර්ශන සප්‍රඝයහ, දතයුතු බවැයි කියන ලද නිදර්ශනයක් මොවුන්ට නැත්තේ ය යනුයි. = අනිදර්ශනයහ. අනිදර්ශනයෝත් ඔව්හු ය. කියන ලද ක්‍රමයෙන් ම සප්‍රඝයෝත් ඔව්හුම යනුයි = අනිදර්ශන සප්‍රඝයෝ ය. තෙවන පදය උභය ප්‍රක්ෂේප වශයෙන් කියන ලදී. මේ වනාහි තික ඛාතිකාවෙයි අනුපූර්ව පද වර්ණනාව යි.

දුක මාතිකාවෙහි වනාහි ත්‍රිකයන්හි ආ පදවර්ණනාවම කරන්නෙමු. හේතු ගොච්ඡකයෙහි වනාහි හේතුධම්මා යනු මූලාර්ථයෙන් හේතුයැයි කියන ලද ධර්මයෝ ය. 'හේතුධම්මා' යනු ද පාඨයෙකි. 'නහෙතු' යනු ඔවුන්ගේ ම ප්‍රතික්ෂේප වචනය යි. සම්ප්‍රයෝග වශයෙන් පැවැත්මෙන්

හේතුව සමග නුයි = සහේතුකයෝ ය. එසේ ම මොවුන්ට හේතු පැවැත්මෙක් නැත්තේ නුයි = අහේතුකයෝ ය.

එක්ව උපදනා බැවින් හේතුව සමග එක්ව යෙදුණේ නුයි = හේතු සම්ප්‍රයුක්තයෝ ය. හේතුවෙන් වෙන් වූවෝ නුයි = හේතු විප්‍රයුක්ත යෝය. මේ දුක දෙකේ ම අර්ථ වශයෙන් කිසිදු නානත්වයක් (වෙනසක්) නැත. දේශනා විලාසයෙන් වනාහි එසේ අවබෝධ කරගන්නා වූ හෝ පුද්ගලයන්ගේ අදහස් වශයෙන් කියන ලදී. ඉන් අනතුරු ව ප්‍රථම දුකය ද්විතීය තෘතීය දුකයන් සමග යොදා ඔවුන්ගේ 'හේතු' 'නහේතු' ආදී පදයන්ගේ වශයෙන් එසේ හටගත්තා වූ අපර වූ ද දුක තුනක් කියන ලදී. එහි යම් සේ ධර්මයෝ හේතු ද සහේතුක යන මෙය වේ ද එසේ ම ධර්මයෝ හේතු ද අහේතුක ද වෙත් යන මෙය වේ. එසේ ම සහේතුක ධර්මයෝ ය. නො ද හේතුක ද වෙත් යන මෙය වෙයි. එසේ ම අහේතුක ධර්මයෝ ය. නො ද හේතුක ද වෙත් යන මෙය වෙයි. හේතුසම්ප්‍රයුක්ත දුකය සමග යෙදීමේ දී ද මෙම ක්‍රමයමැයි. එහි න හේතුක ධර්මයෝය. සහේතුකයෝ ය. අහේතුකයෝ යැයි යන මෙය සිද්ධ වූ කල්හි යළිදු නො ද හේතු ධර්මයෝය යන මෙය වනාහි අතිරික්තයකැයි කියන ලදී. ඒ අනුව මේ අතිරේකාර්ථය සංග්‍රහ කරන ලද්දේයැයි දතයුතුයි. කෙසේද? හුදෙක් නහේතු ධර්මයෝ ම නො වෙත්. එසේ නම් අතිකූත් නො ද සහේතු අහේතුකයෝ ය යන වශයෙනි. තව ද වෙනත් අයුරකින් ද මෙය කියන ලද්දේ වෙයි. නහේතු ධර්මයෝය, සහේතුකයෝ ය. අහේතුකයෝ ය (යන මේ ධර්මයෝ) යම්සේ ද හේතුධර්මයෝ ද සහේතුකයෝ ද අහේතුකයෝ ද එසේ ය. නහේතු ධර්මයෝ ද හේතුසම්ප්‍රයුක්තයෝ ද හේතු විප්‍රයුක්තයෝ ද මෙසේ ම ය.

චුල්ලන්තර දුකයෙහි තමාගේ නිෂ්පාදක වූ ප්‍රත්‍යය සමග නුයි = සප්‍රත්‍යයෝ ය. මොවුන්ට උත්පාදයෙහි හෝ ඨිතියෙහි හෝ ප්‍රත්‍යය නැත්තේ නුයි = අප්‍රත්‍යයෝ ය. ප්‍රත්‍යයන් සමග එක්ව අවුත් කරන ලද්දේනුයි = සංඛතයෝ ය. සංඛත නොවූවෝ යනු = අසංඛතයෝ ය. වෙන් කළ නො හැකි අයුරින් රූපය මොවුන්ට ඇත යනුයි = රූපීහුය. මොවුන් එවැනි රූපයක් නැත්තේ නුයි අරූපීහු ය. වෙනස්වීම ලක්‍ෂණ කොට ඇත්තේ හෝ රූපයි. එය මොවුන්ට ඇත්තේ නුයි = රූපීහු ය. රූපී නො වූවෝ = අරූපීහු ය. විනාශවීම, බිඳවැටීම යන අර්ථයෙන් (සංසාර) වෘත්තය ලෝකය යැයි කියනු ලැබේ. එහි අන්තර්ගත බැවින් ලෝකයෙහි

නියුතු වූවෝ නුයි = ලෞකිකයහ. එයින් එතරවූවෝ - ගොඩනැගුණෝනුයි = උත්තරයහ. ලෝකයෙහි නියුතු නොවූ බැවින් ලෝකයෙන් එතර වූවෝනුයි = ලෝකුත්තරයහ. 'කෙන චි විඤ්ඤෙය්‍යා' යනු චක්ෂුර්විඥානාදී වූ කිසියම් එකකින් චක්ෂුර් විඥානයෙන් හෝ ශ්‍රෝත විඥානයෙන් හෝ දතයුතු. 'කෙනචි න විඤ්ඤෙය්‍යා' යනු කිසියම් චක්ෂුර්විඥානයෙන් හෝ ශ්‍රෝත විඥානයෙන් හෝ නොදතයුතු, මෙසේ ඇති කල්හි පද දෙකේම අර්ථ වෙනසින් ද්විකයක් වෙයි.

ආසව ගොච්ඡකයෙහි වැගිරේනුයි = ආසවයෝ ය. ඇසින් ද -පෙ- මනසින් ද වැගිරෙත්. ගලාබසිත් යැයි කියන ලද්දේ වෙයි. ධර්ම වශයෙන් ගෝත්‍රභූ සිත තෙක් ද අවකාශයෙන් භවාග්‍රය දක්වා ද වැගිරෙත්නුයි හෝ = ආශ්‍රවයෝ ය. මේ ධර්මයන් ද මේ අවකාශය ද ඇතුළත්කොට පවත්නාහු ය යන අර්ථයි. අන්තර් කරණාර්ථය වනාහි මේ ආකාර ඇත්තේ ය. බොහෝකල් පැසවීමෙන් රා ආදිය ආසව යැයි කියනු ලැබේ. එහෙයින් ම බොහෝකල් පැසවීමෙන් මොව්හු ද ආසව ම වීමට සුදුස්සෝය. මෙය ද කියන ලද්දේමැයි. 'මහණෙනි, මින් පෙර අවිද්‍යාව නොවීයැයි අවිද්‍යාවේ මුල කෙළවර නොපැනේ.' යන ආදියයි. දිගට හෝ සසර දුක ගලා බසී. විශේෂයෙන් ගලාබසීනුයි = ආසවයෝ ය. එයින් අන්‍යයෝ නො ආසව නම්. තමන් අරමුණුකොට පවත්නා ආසවයන් සමගනුයි = සාසවයෝ යි. මෙසේ පවත්නාහු මොවුන්ට ආසවයෝ නැත්නුයි අනාසවයහ. සේසස හේතුගොච්ඡකයෙහි කියන ලද ක්‍රමයෙන් ම දතයුතුයි. මේ වනාහි වෙනසකි. යම් සේ එහි යළි හේතු නොවූ සහේතුක ද වූ ධර්මයෝයැ. අහේතුක ද ධර්මයෝ ය යන මේ ඕඝාතදුකය පඨම දුකයාගේ දෙවන පදය මුලින් යොදා කියන ලදී. මෙසේ මෙහි දී යළිදු ආස්‍රව නොවූ ද සාස්‍රව වූ ද අනාස්‍රව වූ ද ධර්මයෝ නො කියන ලදහ. එසේ නො කියන ලද නමුත් යළිදු මෙය ද අනිකුත් භේදයෝ ද එහි කියන ලද නයින් ම දතයුතුයි.

සංයෝජන ගොච්ඡකයෙහි යමෙකුට විද්‍යමාන වෙත් ද, ඒ පුද්ගලයා සසර යොදත් යොදත්නුයි, බඳිත්නුයි = සංයෝජනයෝ ය. එයින් අන්‍ය වූවෝ සංයෝජන නොවූවෝ නම් වෙත්. අරමුණු බවට පැමිණ සංයෝජනයන් සංවර්ධනයෙන් සංයෝජනයන්ට හිතවූවෝ යනු = සංයෝජනීයයෝ ය. සංයෝජනයන්ගේ අරමුණුවලට ප්‍රත්‍ය වූවන්ට මෙය

නමකි. සංයෝජන නොවූවෝ = අසංයෝජනීයයෝ ය. සෙස්ස හේතුගොච්ඡකයෙහි කී නයින් ම දතයුතුයි.

ග්‍රන්ථ ගොච්ඡකයෙහි යමෙකුට විද්‍යමාන වෙත් ද ඔහු චුති ප්‍රතිසන්ධි වශයෙන් සසර වෙළත්නුයි ගටත්නුයි = ග්‍රන්ථයෝ ය. එයින් අන්‍ය වූවෝ ග්‍රන්ථ නොවූවෝ ය. අරමුණු කිරීම් වශයෙන් ග්‍රන්ථයන් සමග වෙළිය යුත්තෝ = ග්‍රන්ථනීයයෝ ය. සෙස්ස හේතුගොච්ඡකයෙහි කී නයින් ම යෙදිය යුතුය. මෙහි යම්සේ ද එපරිද්දෙන් මෙයින් පර තැන්හි දී කියා ඉතිරිය ඒ ඒ තැන්හි කී නයින්ම දතයුතුයි.

ඕඝ ගොච්ඡකයෙහි යමෙකුට විද්‍යමාන වෙත්ද ඔහු සසර ම නතර කරත්නුයි, ගිලාබස්වත්නුයි = ඕඝයෝ ය. අරමුණු කොට ඉක්මවිය යුතු හෙයින් ඕඝයන්විසින් ඉක්මවියයුත්තෝ නුයි = ඕඝනීයයෝය. ඕඝයන්ගේ ආරම්මණ ධර්මයෝ මෙසේ දතයුත්තාහ.

යෝග ගොච්ඡකයෙහි සසර යොදත්නුයි = යෝගයෝ යි. යෝගනීයයෝ ඕඝනීයයන් මෙන් දතයුත්තාහ.

නීවරණ ගොච්ඡකයෙහි සිත වළක්වත්නු යි, හාත්පසින් වසත්නු යි = නීවරණයෝ ය. සංයෝජනීයයන් මෙන් දතයුත්තාහ.

පරාමාස ගොච්ඡකයෙහි ධර්මයන්ගේ තත්වාකාර වූ අනිත්‍යාදී ආකාරය ඉක්මවා නිත්‍යය ආදී වශයෙන් පවත්නාහු පරවසයෙන් (පිටත්හි) ආමර්ශනය (අතපතගෑම) කෙරෙත්නුයි = පරාමාසයෝයි. පරාමාසයන් සමග අරමුණු කිරීම් වශයෙන් පරාමර්ශනය කළ හෙයින් = පරාමට්ඨයෝ ය.

මහන්තර දුකයෙහි අරමුණ නො ගෙන 'නො පවත්නා හෙයින් අරමුණ සමග යනුයි = සාරම්මණයෝ ය. මොවුන්ට අරමුණ නැත්නුයි = අනාරම්මණයෝ ය. සිතීම් අර්ථයෙන් = සිතය. විචිත්‍රාර්ථයෙන් හෝ සිතය. වියෝග නොවීම් වශයෙන් සිතෙහි නියුතු වූවෝ නුයි = චෛතසිකයෝ ය. නිරතුරුව ම සමීපයට ඒමෙන් ඉපැත්මේ පටන් භංගය තෙක් සිත සමග මිශ්‍ර වූයෝ = චිත්ත සංසට්ඨයෝ ය. එක්ව පවත්නේ නමුදු නිරන්තර භාවයකට නො පැමිණ සිත සමග මිශ්‍ර නො වූවෝ නුයි = චිත්ත විසංසට්ඨයෝ ය. මෙයින් උපදිත්නුයි = සමට්ඨානය, මොවුන්ගේ

හටගැන්ම සිත ය යනුයි = චිත්ත සමුට්ඨානයෝ ය. එක්ව වෙත්නුයි = සහභූහුය. සිත සමග එක්වූවෝ චිත්ත සහභූහු ය. අනුව පෙරළෙත්නුයි = අනුපරිවර්තීහු ය. කුමක් අනුව පෙරළෙත් ද, සිතයි. (අනුව යි.) සිතට අනුව පෙරළෙන්නෝ = චිත්ත පරිවර්තීහු ය. සිත හා මිශ්‍ර වූවෝ ද සිතින් උපන්නෝ ද ඔව්හු නුයි = චිත්ත සංසට්ඨ සමුට්ඨානයෝ යි. සිත හා මිශ්‍ර වූවෝ ද සිතින් උපන්නෝ ද සිත සමග වූවෝමය යනුයි = චිත්ත සංසට්ඨ සමුට්ඨාන සහභූහු ය. සිත හා මිශ්‍ර වූවෝ ද සිතින් උපන්නෝ ද සිත අනුව පරිවර්තනය වන්නෝ මය යනුයි. චිත්ත සංසට්ඨ සමුට්ඨාන අනුපරිවර්තීහු ය. සෙසු සියලු පද ද කියන ලද ප්‍රතික්ෂේප වශයෙන් දතයුතුයි. ආධ්‍යාත්ම ආධ්‍යාත්මයන් සඳහා ආධ්‍යාත්ම ත්‍රිකයෙහි කී වශයෙන් ආධ්‍යාත්මයෝ ද = ආධයාත්මිකයෝ ය. එයින් පිටත්හි වූවෝ නුයි = බාහිරයතා දැඩිව ගන්නා වූ භූතයන් භූත නොවූවන් මෙන් දැඩිව ගනිත්නුයි = උපාදාය, දැඩිව නො ගන්නන් හෝ යනුයි = නො උපාදායය.

උපදාන ගොච්ඡකයෙහි දැඩිව ගනිත්නුයි = උපාදානයෝ ය. දැඩිකොට ගනිත් යන අර්ථයි. ඉන් අන්‍ය වූවෝ නො උපාදානයෝ ය.

ක්ලේශ ගොච්ඡකයෙහි සංකිලිට්ඨත්තිකයෙහි කියන ලද අයුරින් අර්ථය දතයුතුයි.

පිට්ඨි දුකයෙහි කාම භවයෙහි හැසිරෙත්නුයි = කාමාවචරයෝ ය. රූප භවයෙහි හැසිරෙත් නුයි = රූපාවචරයෝ ය. අරූප භවයෙහි හැසිරෙත්නුයි = අරූපාවචරයෝ ය. මේ මෙහි සංක්ෂේපය යි. විස්තරය වනාහි මත්තෙහි දැක්වෙන්නේ ය.

ත්‍රෛභූමක වෘත්තයෙහි යෙදුණෝ ඇතුළත් වූවෝ නුයි = පරියාපන්නයෝ ය. එහි නො යෙදුණෝ යනු = අපරියාපන්නයෝ ය. සසර මුල් සිඳිමින් නිවන් අරමුණු කොට සසරින් නික්මෙත් යනු = නීය්‍යානිකයෝ ය. මේ ලක්ෂණයෙන් නො නික්මෙත් යනු = අනිය්‍යානිකයෝ ය. චුතියෙහි හෝ තමාගේ පැවැත්මේ දී හෝ අනතුරු ව ඵලදානයෙහි නියත බැවින් = නියතයෝ ය. එසේ අනියත බැවින් = අනියතයෝ ය. අන්‍ය ධර්මයන් තරණය කෙරෙත්. දුරුකෙරෙත්නුයි = උත්තරයෝ ය. තමන් එතර කරන්ට සමත් වූ උත්තරයන් සමග යනුයි. සඋත්තරයහ.

මොවුන්ට උත්තරයෝ නැත්තාහ යනුයි. = අනුත්තරයෝ ය. මොවුන් සමග යුද්ධ කෙරෙත් නුයි = රණයෝ ය. යම් කෙනෙකුන් විසින් මඩනා ලද සත්ත්වයෝ නන් අයුරින් හඬත් ද වලපිත්ද, ඒ රාගාදීන්ට මේ නමකි. සම්ප්‍රයෝග වශයෙන් ද ප්‍රහාණයේ දී එක්වීම් වශයෙන් ද රණයන් සමග නුයි = සරණයෝ ය. ඒ කාරණයෙන් මොවුන්ට රණයෝ නැත්නුයි = අසරණයෝ ය.

සූත්‍රාන්තික දුකයන්හි සම්ප්‍රයෝග වශයෙන් විද්‍යාව භජනය කෙරෙත්නුයි = විද්‍යාභාගිහු ය. විද්‍යාභාගයෙහි විද්‍යා කොට්ඨාශයෙහි පවතිත් යනු ද = විද්‍යාභාගීහු ය. එහි විදර්ශනා ඥානය, මනෝමය ඍද්ධි ඥානය, ෂට් අභිඥාය යනු අෂ්ටවිද්‍යාවෝ ය. පළමු අර්ථයෙන් ඒවා සමග යෙදුණු ධර්මයෝ ද විද්‍යාභාගීහු ය. පශ්චිම අර්ථයෙන් ඒවා අතුරෙන් යම්කිසි එක් විද්‍යාවක් විද්‍යාය, සෙස්සෝ විද්‍යාභාගීහුයැයි මෙසේ විද්‍යාව ද විද්‍යාව හා සම්ප්‍රයුක්ත ධර්මයෝ ද විද්‍යාභාගීහුම යැයි දතයුත්තාහ. මෙහි වනාහි සම්ප්‍රයුක්ත ධර්මයෝ ද අභිප්‍රේතයි. (බලාපොරොත්තුය) සම්ප්‍රයෝග වශයෙන් ම අවිද්‍යාව භජනය කෙරෙත්නුයි = අවිජ්ජාභාගීහු ය. අවිද්‍යාභාගයෙහි, අවිද්‍යා කොට්ඨාශයෙහි පවතිත් යනු ද = අවිජ්ජාභාගීහු ය. එහි දුක වසාලන අවිද්‍යාවය. සමුදයාදිය වසාලන අවිද්‍යාව යැයි අවිද්‍යාව සතරෙකි. පළමු නයින් ම ඒවා සමග සම්ප්‍රයුක්ත ධර්මයෝ ද අවිද්‍යාභාගීහු ය. පශ්චිම අර්ථයෙන් ඒවා අතුරෙන් යම්කිසි එක් අවිද්‍යාවක් අවිද්‍යාය, සෙස්සෝ අවිද්‍යා භාගීහු යැයි මෙසේ අවිද්‍යාව ද අවිද්‍යා සම්ප්‍රයුක්ත ධර්මයෝ ද අවිද්‍යාභාගීහුම යැයි දතයුතුයි. මෙහි වනාහි සම්ප්‍රයුක්ත ධර්මයෝ ද අභිප්‍රේතයෝ ය. නැවත නො වසාගෙන සිටින බැවින් ක්ලේශාන්ධකාරය විධ්වංසනය කරන්නට අසමර්ථ හෙයින් විදුලිය උපමාව මොවුන්ටනුයි = විජ්ජූපමාය, නිරවශේෂ කොට විධ්වංසනය කිරීමට සමර්ථ බැවින් වජිරෝපමාව මොවුන්ටනුයි = වජිරෝපමාය, බාලයන් කෙරෙහි සිටි බැවින් බාලයෝ ය. යම්තැනක සිටියාහු ඊට උපචාර වශයෙන් බාලයහ. පණ්ඩිතයන් කෙරෙහි සිටි බැවින් පණ්ඩිතයහ. බාලයන් බවට පත්කරන හෙයින් බාලයහ. පණ්ඩිතයන් බවට පත්කරන හෙයින් පණ්ඩිතයහ. තණ්හා යනු කළු වූවෝ ය. සිත අප්‍රභාස්වර කරන්නෝ ය. සුක්ත යනු සුදුය. එසේ ම සිත ප්‍රභාස්වර කරන්නෝ ය. විශේෂයෙන් කළුව උපන් හෙයින් හෝ කෘෂ්ණයහ. විශේෂයෙන් සුදුව උපන් හෙයින් හෝ ශුක්ලයහ. මෙලොව මෙන් ම

පරලොව ද තවත් නුයි = තපනීයයෝ ය. තපනීය නොවූවෝ = අතපනීයයෝ ය.

අධිවචන දුකාදී තුන අර්ථ වශයෙන් නානත්වයක් නැත්තාහ. මෙහි වෙනස අකුරු පමණි. 'සිරිවඩ්ඪක ධනවඩ්ඪක' යන මේ ආදීහු වනාහි වචන මාත්‍රය ම අධිපති කොට පැවතියාහු අධිවචනයෝ නම් වෙත්. අධිවචනයන්ගේ පථයෝ අධිවචන පථයෝ ය. 'අභිසංඛරොනති ඛො භික්ඛවෙ, තසමා සංඛාරා' යැයි මෙසේ උපුටා සහේතුක කොට කියනු ලබන්නා වූ අභිලාසයෝ නිරුක්ති නම් නිරුක්තීන්ගේ පථයෝ = නිරුක්ති පථයෝ යි. තර්කය, විතර්කය, සංකල්පය යැයි මෙසේ ඒ ඒ ප්‍රකාරයෙන් ඇඟවීම ප්‍රඥප්ති නම්. ප්‍රඥප්තීන්ගේ පථයෝ = ප්‍රඥප්ති පථයෝ ය. මෙහි ද දුකය, දුකය යැයි කියා ද අන්‍ය වචනයන්ගේ ප්‍රයෝජනය හේතුගොච්ඡකයෙහි කියන ලද නයින් ම දතයුතුයි.

නාමරූප දුකයෙහි නම්කිරීම් අර්ථයෙන් ද නැමීම් අර්ථයෙන් ද නැමවීම් අර්ථයෙන් ද නාමය, වෙනස්වන අර්ථයෙන් රූපය, මේ මෙහි සංක්ෂේපය යි. විස්තර වනාහි නික්ෂේප කාණ්ඩයෙහි මතු එන්නේ ය. අවිජ්ජා යනු දුක්ඛාදියෙහි නො දැනීමයි. භව තණ්හා යන භවය පිළිබඳ ප්‍රාර්ථනාවයි. භවදිට්ඨි යනු ශාස්වත (දෘෂ්ටි) ය භව ය යැයි කියනු ලැබේ. ශාස්වත වශයෙන් උපදනා දෘෂ්ටිය යි. විභව දෘෂ්ටි නම් උච්ඡේදය (උච්ඡේද දෘෂ්ටිය) විභව යැයි කියනු ලැබේ. (එනම්) උච්ඡේද වශයෙන් උපදනා දෘෂ්ටිය යි. ආත්මයත් ලෝකයත් ශාස්වතයැයි පවත්නා දෘෂ්ටිය ශාස්වත දෘෂ්ටිය යි. සිඳෙනු ලැබේ යැයි පවත්නා දෘෂ්ටිය උච්ඡේද දෘෂ්ටිය යි. කෙළවරක් ඇත්තේ යන පවත්නා දෘෂ්ටිය අන්තවත් දෘෂ්ටියයි. අනන්තයැයි පවත්නා දෘෂ්ටිය අනන්තවත් දෘෂ්ටිය යි. පූර්වාන්තය අනුව ගිය දෘෂ්ටිය පූර්වාන්තානුදෘෂ්ටිය යි. අපරාන්තය අනුව ගිය දෘෂ්ටිය අපරාන්තානු දෘෂ්ටිය යි. අහිරික යනු යමක් ලජ්ජා විය යුත්තෙන් ලජ්ජා නො වේදැයි මෙසේ විස්තර කරන ලද නිර්ලජ්ජි බවයි. අනොත්තප්ප යනු බියවිය යුත්තෙන් යමක් බිය නොවේදැයි මෙසේ විස්තර කරන ලද බිය නොවන ආකාරය යි. ලජ්ජාවීම හිරියයි. බියවීම ඔත්තප්පය යි. දුර්වච බව ආදියෙහි දුක් වචනය විප්පටිකුලගාහී වූ විරුද්ධ වූ අනාදර වූ මේ පුද්ගලයා කෙරෙහිය යනුයි. දුර්වචයි. ඔහුගේ කර්මය දුර්වච බවයි. ඔහුගේ භාවය දෝවචස්සතාවයි. පාපි අශ්‍රද්ධා ආදී පුද්ගලයෝ මොහුගේ මිත්‍රයෝනුයි = පාපමිත්‍රයා යි. ඔහුගේ භාවය පාපමිත්‍රතාව යි. සුවච බව ද

කල්‍යාණමිත්‍රතාව ද කී දේට ප්‍රතිපක්‍ෂ නයින් දතයුතුයි. පංචාපත්ති ස්කන්ධයෝ ද ආපත්තිහු ය. සප්තාපත්තිස්කන්ධයෝ ද ආපත්තීහුයැයි මෙසේ කියන ලද ආපත්තීන්හි කුසලභාවය ආපත්ති කුසලතාවයි. ඒ ආපත්තීන්ගෙන් නැගිටීමේ කුසලභාවය ආපත්ති වුට්ඨාන කුසලතාවයි. සමාපත්තීන්හි කුසලභාවය සමාපත්ති කුසලතාවයි. සමාපත්තීන්ගේ අර්පණා පරිච්ඡේද ප්‍රඥාවට මෙය නමකි. සමාපත්තීන්ගෙන් නැගිටීමේ කුසලභාවය සමාපත්තිවුට්ඨාන කුසලතාවයි. අෂ්ටාරස ධාතූන්හි කුසලභාවය ධාතු කුසලතාවයි. එකී ධාතූන්ගේ ම මෙනෙහි කිරීමේ කුසලභාවය මනසිකාර කුසලතාවයි. චක්‍ෂුර් ආයතනාදියෙහි කුසලභාවය ආයතන කුසලතාව යි. ද්වාදසාංග පටිච්ච සමුප්පාදයෙහි කුසලභාවය පටිච්ච සමුප්පාද කුසලතාවයි. ඒ ඒ තන්හි කුසලභාවය ඨාන කුසලතාවයි. ඨාන යනු කාරණය යැයි කියනු ලැබේ. එහිදී වනාහි එයට අයත් පැවැත්මෙහි ඵලය තිට්ඨති නම්. එහෙයින් ඨාන යැයි කියන ලදී. අට්ඨානයෙහි කුසලභාවය අට්ඨාන කුසලතාවයි. ඍජු බව අජ්ජවයි. මෘදුබව මද්දවයි. අධිවාසන නම් වූ ඉවසන බව ඛන්තියයි. කීකරුබව සෝරච්චයි. සතුටු කරවන මෘදුභාව සංඛ්‍යාත සඛිලභාවය සාඛල්‍යයයි. යම්සේ අනුන් සමග තමාගේ සිදුරක් නොවේ ද එසේ ධර්මාමිසයෙන් සංග්‍රහ කිරීම පටිසන්ධිථාරයයි. ඉන්ද්‍රිය සංවර සංඛ්‍යාත මනස සවැනි කොට ඇති ඉන්ද්‍රියයන්හි නොවසන ලද දොර ඇති බව ඉන්ද්‍රියයන්හි අගුත්තද්වාරතාවයි. පිළිගැනීම පරිභෝජනය වශයෙන් භෝජනයෙහි පමණ නො දන්නා බව භෝජනයේ අමත්තඤ්ඤුතාවයි.

අනන්තර දුකය කියන ලද්දට ප්‍රතිපක්‍ෂ නයින් දතයුතුයි. සිහියෙන් වෙන්වීම නම් වූ මුළා සිහි බව මුට්ඨ සච්චයයි. විමසන නුවණ නැති බව අසම්පජඤ්ඤය යි. සිහි කෙරේනුයි = සතිය යි. මනාසේ දනීනුයි = සම්පජඤ්ඤයි. නුවණින් සලකා නො බැලීමේ කම්පා නොවීම් අර්ථයෙන් පටිසංඛාන නම් වූ බලය පටිසංඛාන බලය යි. වීර්ය ශීර්ෂයෙන් සප්තබෝධ්‍යාංගයන් වඩන්නාට උපන් බලය භාවනා බලය යි. විරුද්ධ ධර්මයන් සමනය කෙරේනුයි = සමථයි. අනිත්‍යාදී වශයෙන් විවිධාකාරයෙන් බලයිනුයි විපස්සනාය, සමථය ද ඒ ආකාරය ගෙන නැවත පැවැත්විය යුතු වූ සමථයාගේ නිමිත්ත වශයෙන් සමථ නිමිත්තයි. පග්ගාහ නිමිත්තෙහි ද මේ නයමැයි. සම්ප්‍රයුක්ත ධර්මයෙහි උත්සාහ කෙරේනුයි = පග්ගාහයි. වික්ෂේප නොවේනුයි = අවික්ෂේපයි. සීල විනායක

අසංවරය නම් වූ සීලයාගේ විපත්තිය සීල විපත්තියයි. සම්‍යක් දෘෂ්ටිය විනාශකරන මිථ්‍යාදෘෂ්ටි සංඛ්‍යාත වූ දෘෂ්ටියේ විනාශය දිට්ඨි විපත්තිය යි. කීකරු බව ම සීලය සම්පාදනය කරන බැවින් සීලය පරිපූරණය කරන හෙයින් සීලයාගේ සම්පදාවනුයි = සීලසම්පදායි. දෘෂ්ටියේ පරිපූර්ණය වූ ඥානය දෘෂ්ටියේ සම්ප්‍රදාව නුයි = දිට්ඨිය සම්පදායි. විසුද්ධිභාවයට පැමිණි ශීල සංඛ්‍යාත වූ ශීලයාගේ විශුද්ධිය ශීල විසුද්ධිය යි. නිර්වාණ සංඛ්‍යාත වූ විශුද්ධියට පමුණුවන්නට සමර්ථ වූ දර්ශන සංඛ්‍යාත වූ දෘෂ්ටිය පිළිබඳ විශුද්ධිය දෘෂ්ටි විශුද්ධිය යි. 'දිට්ඨි විසුද්ධි ඛොපන යථා දිට්ඨිස්ස ච පධානං' යනු කර්ම ස්වකෘත ඥානය ආදී නම් වූ දෘෂ්ටි විශුද්ධියත් යථා දෘෂ්ටි ඇත්තාහුගේ - අනුරූප දෘෂ්ටි ඇත්තාහුගේ (එනම්) කල්‍යාණ දෘෂ්ටි ඇත්තාහුගේ සම්ප්‍රයුක්ත ඒ ප්‍රධන් වීර්යය යි. 'සංවෙගො' යනු ජාති ආදීන් නිසා උපන් භය සංඛ්‍යාත වූ කළකිරීමයි. 'සංවෙජනීයට්ඨානං' යනු සංවේගජනක ජාති ආදී කාරණාය, 'සංවිග්ගස්ස ච යොනිසො පධානං' යනු මෙසේ සංවේගයට පත්වූවහුගේ සම්‍යක් ප්‍රධානය යි. 'අසන්තුට්ඨිතා ච කුසලෙසු ධම්මෙසු' යනු කුශල ධර්මයන් පිරීමේ නො සතුටු බව යි. 'අප්පටිවානිතා ච පධානස්මිං' යනු රහත්බවට නො පැමිණ ප්‍රධන්වීර්යයෙහි නො නවත්නා බව යි. නො පසුබස්නා බවයි. දැනගන්නා හෙයින් විද්‍යාවයි. මිදෙන බැවින් විමුක්තිය යි. 'ඛයෙ ඤාණං' යනු ක්ලේශයන් ක්ෂය කරන ආර්ය මාර්ගයෙහි ඥානයයි.' 'අනුප්පාදෙ ඤාණං' යනු ප්‍රතිසන්ධි වශයෙන් නූපදනා වූ ඒ ඒ මාර්ගයන් විසින් විනාශ කරන ලද ක්ලේශයන්ගේ නො ඉපැත්ම කෙළවර උපන් ආර්ය ඵලයෙන් ඥානය යි. මේ මාතෘකාවේ අනුපූර්ව වර්ණනාව යි.

දැන් පිළිවෙළින් තබන ලද මාතෘකාවෙහි සංග්‍රහ කරන ලද ධර්මයන් ප්‍රභේද වශයෙන් දක්වන්නට 'කතමෙ ධම්මා කුසලා' යන මේ පදභාජනීය ආරම්භ කරන ලදී. එහි 'යම් සමයෙක්හි කාමාවචර කුසල සිත උපන්නේ වේද, යන මේ ප්‍රථම කාමාවචර කුශල සිත දක්වන ලදී. එහි නිර්දේශයෙහි වනාහි ධර්ම ව්‍යවස්ථානවාර ය, සංග්‍රහ වාරය ශූන්‍යවාරය යැයි මහාවාර තුනක් වෙයි. ඔවුනතුරෙන් ධර්ම ව්‍යවස්ථාන වාරය උද්දේස නිද්දේස වශයෙන් දෙයාකාරයකින් සිටියේ ය. ඔවුනතුරෙන් උද්දේස වාරයෙහි පුච්ඡා, සමය නිද්දේස, ධම්මුද්දේස අප්පණා යැයි පරිච්ඡේද සතරෙකි. ඔවුනතුරෙන් 'කවර ධර්මයෝ කුශලයෝ ද, යන මෙය පුච්ඡා නම්. 'යම් සමයෙක්හි කාමාවචර -පෙ- එසමයෙහි' යන මෙය සමය නිද්දේසය නම්. 'ස්පර්ශය වෙයි.' -පෙ- අවික්ෂේපය වෙයි.' යන මෙය සමුද්දේස

නම්. 'එසමයෙහි වෙනත් යම් ප්‍රතීත්‍ය සමුත්පන්න අරූපී ධර්මයෝ ඇත් ද, මේ ධර්මයෝ කුශලයෝ ය' යන මෙය අර්පණා නම්. මෙසේ සතර පරිච්ඡේදයකින් සිටි උද්දේස වාරයාගේ මේ ප්‍රථම පෘච්ඡා පරිච්ඡේදයයි. එහි 'කතමෙ ධම්මා කුසලා' යන මෙය කථේතුකම්‍යතා පුච්ඡාවයි. පෘච්ඡාව පංචවිධය. අදිට්ඨජොතනා පුච්ඡා, දිට්ඨ සංසන්දනා පුච්ඡා, විමතිච්ඡෙදනා පුච්ඡා, කථේතුකම්‍යතා පුච්ඡා යනුවෙනි. මේ ඔවුන්ගේ නානත්වයයි. 'අදිට්ඨජොතනා පුච්ඡාව' කුමක්ද? ප්‍රකෘතියේ ලක්‍ෂණය නොදන්නා ලද්දේ ද, නොදක්නා ලදද, තුලනය නො කරන ලදද, තීරණය නො කරන ලද ද, ප්‍රකට නොවී ද, භාවනා වශයෙන් නො වඩනා ලද ද, එය දැනගැනීම පිණිස, දැකීම පිණිස, තුලනය කිරීම පිණිස, තීරණය පිණිස, ප්‍රකට කිරීම පිණිස, විශේෂයෙන් වැඩීම පිණිස ප්‍රශ්න අසයි ද මේ අදිට්ඨජොතනා පුච්ඡාවයි. දිට්ඨ සංසන්දනා පුච්ඡාව කවරේද? ප්‍රකෘතියේ ලක්‍ෂණය දන්නා ලද්දේ වේ ද, දක්නා ලද ද, තුලනය කරන ලද ද, තීරණය කරන ලද ද, ප්‍රකට කරන ලද ද, භාවනා වශයෙන් වඩනා ලද ද, හෙතෙම එය අන් පණ්ඩිතයන් සමග සංසන්දනය කිරීම පිණිස ප්‍රශ්න අසා ද මේ දිට්ඨ සංසන්දනා පුච්ඡාවයි. විමතිච්ඡෙදනා පුච්ඡාව කවරේ ද? ප්‍රකෘතිය පිළිබඳ සැකයට වැටුණෝ වේ ද, විමතියට වැටුණෝ සැක ඇතිවූයේ මෙසේ ද, මෙසේ නොවේ ද, කිමෙක් ද, කෙසේදැයි හෙතෙම විමතිය සිඳීම පිණිස ප්‍රශ්න විචාරයි ද මේ විමතිච්ඡේදන පුච්ඡාවයි. අනුමති පුච්ඡාව කවරේ ද? භාග්‍යවතුන් වහන්සේ භික්‍ෂූන්ගේ අනුමතිය පිණිස ප්‍රශ්න විචාරණ සේක. 'මහණෙනි, මෙය කෙසේ හඟිමු ද? රූපය නිත්‍ය ද, අනිත්‍ය ද', 'ස්වාමීනි, අනිත්‍යය' 'යමක් අනිත්‍යය නම් එය දුක ද සැප ද', 'ස්වාමීනි දුකය', 'යමක් දුක ද අනිත්‍ය ද වෙනස්වන ස්වභාවය ඇත්තේ ද එය මේ මාගේය. මේ මම වෙමි. මේ මාගේ ආත්මයයි දැකීම සුදුසු ද? 'ස්වාමීනි, එය එසේ නොවේ යනුවෙනි.' මේ අනුමති පුච්ඡාවයි. කථේතුකම්‍යතා පුච්ඡාව කවරේ ද? භාග්‍යවතුන් වහන්සේ භික්‍ෂූන්ට දේශනා කිරීමේ (කීවේ) කැමැත්තෙන් ප්‍රශ්න විචාරන සේක. 'චත්තාරෝ මෙ භික්ඛවෙ' සතිපට්ඨානා, කතමෙ චත්තාරෝ? යනුවෙනි. මේ කථේතුකම්‍යතා පුච්ඡාවයි. එහි බුදුවරුන්ට පළමු පෘච්ඡා තුන නැත. කවර හෙයින් ද, බුදුවරුන්ට වනාහි තුන් කල් පිළිබඳ කිසිත් සකස්කරන ලද්දක්, කාලවිමුක්ත වූවක් හෝ අසංඛතයක් නොදුටු දෙයක් නොදත් දෙයක් නො පැහැදිලි දෙයක් අතුලිතයක් තීරණය නො වූ දෙයක්, ප්‍රකට නො වූවක්, භාවනා වශයෙන් නො වඩන ලද්දක් නම් නැත. එහෙයින් ඒවා පිළිබඳ නො දුටු දේ පැහැදිලි කිරීම පිළිබඳ

පෘච්ඡාවක් (විචාරීමක්) නැත. යමක් වනාහි භාග්‍යවතුන් වහන්සේ විසින් තමාගේ ඥානයෙන් ප්‍රතිවේධ කරන ලද ද ඒ පිළිබඳව අන්‍ය ශ්‍රමණයකු සමග හෝ බ්‍රාහ්මණයකු සමග හෝ සංසන්දනය කිරීමක් නැත. එහෙයින් උන්වහන්සේට දෘෂ්ටි සංසන්දනා පෘච්ඡාවක් නැත. යම්හෙයකින් උන්වහන්සේ අකථං කථී - කෙසේ ද කෙසේදැයි අසන්නෙක් නොවූ සේක් ද, සියලු ධර්මයන්හි සැකයෙන් තොරවූ සේක් ද, විගතසංසය ඇතිසේක් ද එහෙයින් උන්වහන්සේට විමතිච්ඡේදන පෘච්ඡාවක් නැත. අනෙක් පෘච්ඡා දෙක භාග්‍යවතුන් වහන්සේට ඇත. ඒවා අතුරෙන් මෙය කථෙතුකම්‍යතා පෘච්ඡාවයැයි දතයුතුයි.

එහි 'කතමෙ' යන පදයෙහි විස්තර කරන ලද ධර්මයන් විචාරයි. 'ධමෙම කුසලා' යන වචන මාත්‍රයෙන් කුමක් කරන ලද්දාහු ද, කුමක් හෝ කරත්දැයි දැනගන්නට නො හැකි ය. 'කතමෙ' යැයි කී කල්හි වනාහි ඒ ධර්මයන් පිළිබඳ විචාළ බව පැනෙයි. එහෙයින් කතමෙ යන පදයෙන් විස්තර කළයුතු ධර්මයන් විචාරයි යැයි කියන ලදී. 'ධම්මා කුසලා' යන පද දෙකින් පෘච්ඡාවෙහි විචාළ ධර්මයන් දක්වයි. ඒවා පිළිබඳ අර්ථය යට ප්‍රකාශ කරන ලද්දේම ය. මෙහිදී කවර හෙයකින් වනාහි මෘතෘකාවෙහි මෙන් 'කුසලා ධම්මා' යැයි නො කියා 'ධමම කුසලා' යනුවෙන් පද පිළිබඳ කරන ලද ද? ප්‍රභේද වශයෙන් ධර්මයන්ගේ දේශනය දක්වා ප්‍රභේදවන්තයා දැක්වීම පිණිස යි. මේ අභිධර්මයෙහි වනාහි ධර්මයෝ ම දෙසිය යුත්තාහ. ඒ ධර්මයෝ ද කුශලාදී ප්‍රභේද වශයෙන් අනේක ප්‍රභේද ඇත්තාහ. එහෙයින් මෙහිදී ධර්මයෝ ම දෙසිය යුත්තාහ. මේ ව්‍යවහාර දේශනා නොවේ. ඒ දේශනාවෝ ද අනේකප්‍රභේද වශයෙන් සත බව වෙන්කරන ප්‍රතිසම්භිදා ඥානය ගෙන දෙන්නාහ. 'කුසලා ධම්මා' යැයි මෙසේ ප්‍රභේද වශයෙන් ධර්මයන්ගේ දේශනය නො දක්වා දැන් ඒ ප්‍රභේදයෙන් දෙසිය යුතු යම් ධර්මයෝ වෙත් ද ඒ ධර්මයන් දැක්වීමට 'කතමෙ ධම්මා කුසලා' යන මේ පද පිළිබඳ කරන ලදැයි දතයුතුයි. ප්‍රභේද ලත් ධර්මයන් දැක්වූ කල්හි ප්‍රභේද දැක්වීම යෙදේ. මනාව දතයුත්තේ ද වෙයි යනුයි. දැන් 'යසමිං සමයෙ කාමාවචරං කුසලං චිතතං' යි මෙහි :

මුනීන්ද්‍රයන් වහන්සේ අර්ථප්‍රභේද වශයෙන් ධර්මයෙන් නියමකොට දක්වන්නට සමයෙහි සිත ද (සමය නියමිත) සිත සමග සමය ද විස්තර කළ සේක.

'තස්මිං සමයෙ කාමාවචරං කුසලං චිත්තං' යනු විස්තර කරන භාග්‍යවතුන් වහන්සේ සමයෙහි සිත විස්තර කළ සේක. කවර හේතුවකින් ද? සමය නිමිති කරගත් ඒ සිත සමග කෙළවරදී 'තස්මිං සමයෙ' යැයි මෙසේ සමය (කාලය) නියමකොට නැවත සමය නානත්වය ඇති කල්හි ද යම් සමයෙක් සිත වේද එම සමයෙහි ම ස්පර්ශය වෙයි. වේදනාව වෙයි යැයි මෙසේ ඒ චිත්ත නියමිත සමයෙහි සන්තති, සමූහ, කිච්ච, ආරම්මණ ඝන වශයෙන් දුරවබෝධ ප්‍රභේද ඇති මේ ස්පර්ශ වේදනාදී ධර්මයන් අවබෝධ කරවන්නට ය යනු අර්ථයි. දැන් යස්මිං සමයේ යනාදීන්හි මේ අනුපූර්ව වර්ණනාවයි. 'යස්මි' යනු අනියම් වශයෙන් භුම්ම (සත්තමී) නිර්දේශයයි. 'සමයෙ' යනු අනියමින් පෙන්වන ලද්ද දැක්වීමයි. මෙපමණකින් අනියමින් සමය දක්වන ලද්දේ වෙයි. මෙහි සමය ශබ්දය :-

එක්රැස්වීමෙහි, ක්‍ෂණයෙහි, කාලයෙහි, සමූහයෙහි හේතු දෘෂ්ටීන්හි ප්‍රතිලාභයෙහි ප්‍රහාණයෙහි ද ප්‍රතිවේධයෙහි ද දක්නා ලැබේ.

ඒ එසේමැයි. 'අප්පෙව නාම සෙවපි උපසංකමෙය්‍යාව කාලඤ්ච සමයඤ්ච උපාදාය' යන මේ ආදීන්හි මෙහි සමවාය අර්ථයයි. 'එකො'ච බො භික්ඛවෙ ඛණො ච සමයො ච බ්‍රහ්මචරිය වාසාය' යන ආදියෙහි ක්‍ෂණයයි. 'උණ්හසමයො පරිළාහ සමයො' යන ආදියෙහි කාලයයි. 'මහාසමයො පවනස්මිං' යන ආදියෙහි සමූහයයි. 'සමයොපි බො තෙ භද්දාලී අප්පටිවිද්ධො අහොසි භගවාපි බො සාවත්ථියං විහරති භගවාපි මං ජානිස්සති භද්දාලි නාම භික්ඛු සත්ථුසාසනෙ සික්ඛාය අපරිපූරකාරීති, අයම්පි බො තෙ භද්දාලි සමයො අප්පටිවිද්ධො අහොසි' යන ආදියෙහි හේතුවයි. 'තෙන බො පන සමයෙන උග්ගහමානවො පරිබ්බාජකො සමණ මණ්ඩිකා පුත්තො සමයප්පවාදකෙ තින්දුකාචීරෙ එකසාලාය මල්ලිකාය ආරෙ මෙ පටිවසති' යන ආදියෙහි දෘෂ්ටියයි.

දිට්ඨෙව ධම්මෙ යො අත්ථො යොචත්ථො සම්පරායිකො
අත්ථාභිසමයා ධීරො පණ්ඩිතොති පවුච්චති

ආදියෙහි ප්‍රතිලාභයයි. 'සම්මා මානාභිසමයා අන්තමකාසි දුක්ඛස්ස' යන ආදියෙහි ප්‍රහාණයයි. 'දුක්ඛස්සකාසි දුක්ඛස්ස' යන ආදියෙහි ප්‍රහාණයයි. 'දුක්ඛස්ස පළනට්ඨො සංඛතට්ඨො සන්තාපට්ඨො විපරිනාමට්ඨො

අභිසමයටෙඨා' යන ආදියෙහි ප්‍රතිවේධය යි. මෙසේ නොයෙක් සමයන් අතුරෙහි,

මෙහි සමවාය, ක්‍ෂණය, කාලය, සමූහය, මෙන්ම හේතුව යන මේ පස්වැදෑරුම් සමයයෝ පණ්ඩිතයන් විසින් දතයුත්තාහ.

'යස්මිං සමයෙ කාමාවචරං කුසලං' යන මෙහි වනාහි කුශලාධිකාර වූ එකී භවසමයන් අතුරෙහි සමාවායාදී මේ පංච සමයයෝ පණ්ඩිතයා විසින් දතයුත්තාහ.

ඔවුනතුරෙන් ප්‍රත්‍යය සාමග්‍රීය, සමවාය ක්‍ෂණය නවැන්න (ප්‍රතිවේධය) හා චක්‍ර සතර ද එකක් ම යැයි දතයුතුයි.

සාධාරණ ඵල නිෂ්පාදක බැවින් සිටියා වූ යම් ඒ සාමග්‍රියක් වේ ද එය මෙහි සමවාය යැයි දතයුතු යි. 'මහණෙනි, බ්‍රහ්මචරිය වාසය පිණිස ක්‍ෂණයත් සමයත් එකක්ම යැ' මෙසේ වදාළ නවවැන්න ද වනාහි එක් ක්‍ෂණයකැයි දතයුතුයි. 'මහණෙනි, මේ චක්‍ර සතරෙකි. ඒවායින් යුත් දෙවිමිනිසුන්ට චක්‍ර සතරක් පවතී'යැයි මෙහි ප්‍රතිරූප දේශවාසය, සත්පුරුෂයන් හා එක්වීම, තම සිත මනාව පිහිටුවීම, පෙර කළ පින් ඇති බව දැයි යම් ඒ චක්‍ර සතරක් කියන ලද ද ඒ සියල්ල ද එකතුකොට අවකාශ වශයෙන් ක්‍ෂණය යැයි දතයුතුයි. ඔව්හු වනාහි කුසල් ඉපැත්මට අවකාශ වූවාහු ය. මෙසේ සමවායත් ක්‍ෂණයත් දැන ආ තැන්හි :-

ඒ ඒ කරුණු සලකා ව්‍යවහාර මාත්‍රකව කාලය පණවන ලදී. එය ස්පර්ශාදී ධර්මයන්ගේ පුඤ්ජයකි. සමූහයකැයි දක්වන ලදී.

'චිත්ත කාලය රූපකාලය' යන ආදී නයින් ධර්මයෙහි ද වැටේ. 'අතීතය අනාගතය' යන ආදී නයින් ධර්මයේ පැවැත්ම හෝ වැටේ. 'බීජ කාලය, අංකුර කාලය' යන ආදී නයින් ධර්ම පටිපාටිය හෝ වැටේ. 'උත්පාද කාලය ජරා කාලය' ආදී නයින් ධර්ම ලක්‍ෂණයෙහි වැටේ. 'වේදියත කාලය, සඤ්ජානන කාලය' යන ආදී නයින් ධර්මකෘත්‍යයෙහි හෝ වැටේ. 'ගමන කාලය, ඨාන කාලය' යන ආදී නයින් ඉරියව් හෝ ගැනෙයි. 'පෙරවරුවය, සවසය, දවාලය, රාත්‍රිය' යන ආදි නයින් චන්ද්‍ර සූර්යයන්ගේ පැවැත්ම හෝ ගැනේ. 'අඩමස' ආදී නයින් දිවා රාත්‍රී

සංඛ්‍යාත කාලසමය හෝ යැයි මෙසේ ඒ ඒ ගෙන පණවන ලද්දේ කාලය නම්. ඒ මේ කාලය වනාහි ස්වභාවයෙන් අවිද්‍යමාන බැවින් ප්‍රඥප්ති මාත්‍රයක් පමණකැයි දතයුතුයි. ස්පර්ශ වේදනාදී ධර්මයන්ගේ යම් ඒ පුංජයක් වේද එය මෙහිදී සමූහ යැයි සලකන ලදී. මෙසේ කාල සමූහයන් ද දැන ඉතිරිය වනාහි :-

මෙහි වනාහි ප්‍රත්‍යය ද හේතු නම්. ඒ පිළිබඳ අනේකභාවය ද්වාරයන්ගේ හෝ ප්‍රත්‍යයන්ගේ වශයෙන් දතයුතුයි.

මෙහි වනාහි ප්‍රත්‍යය ද හේතු නම්. ඒ පිළිබඳව ද්වාරයන්ගේ හෝ ප්‍රත්‍යයන්ගේ වශයෙන් අනේකභාවය දතයුතුයි. කෙසේද? චක්ෂුර් ද්වාරාදීන්හි උපදනා වූ චක්ෂුර් විඥානාදීන්ගේ චක්ෂු රූප ආලෝක මනසිකාරාදි ප්‍රත්‍යයෝ, මහා ප්‍රකරණයෝ ද, 'හේතු ප්‍රත්‍යය ආරම්මණ ප්‍රත්‍යය' යන ආදී නයින් සූවිසි ප්‍රත්‍යයෝ කියන ලදහ. ඔවුනතුරෙන් විපාක ප්‍රත්‍යයත් පච්ඡාජාත ප්‍රත්‍යයත් හැර සෙස්සෝ කුශල ධර්මයන්ට ප්‍රත්‍යය වෙත්ම ය. ඒ සියල්ලෝ ම මෙහි හේතුයැයි අභිප්‍රේතයහ. මෙසේ මේ පිළිබඳ ව ද්වාර වශයෙන් හෝ ප්‍රත්‍යය වශයෙන් හෝ අනේකභාවය දතයුතුයි. මෙසේ සමවායාදී පංච අර්ථයෝ මෙහි සමය ශබ්දයෙන් පරිගෘහීත යැයි දතයුත්තාහ. මොවුනතුරෙන් යම්කිසි එකක් පරිග්‍රහණය නොකොට සියල්ලන්ගේ පරිග්‍රහණය කරන ලදද යත්, ඒ ඒ ප්‍රත්‍යයෙන් ඒ ඒ අර්ථ විශේෂයන් ගේ දැක්වීම් වශයෙනි. මොවුන් අතුරෙහි සමවාය සංඛ්‍යාත සමයවනාහි නොයෙක් හේතුවෙන් පැවැත්ම දක්වයි. එහෙයින් ඒක කාරණවාදය ප්‍රතිෂේධ කරන ලද්දේ වෙයි. සමවාය නම් සාධාරණ ඵල නිෂ්පාදනයෙහි දී ඔවුනොවුන් අපේක්ෂා කරන්නේ වෙයි. එහෙයින් එකම කර්තෘ කෙනෙක් නම් නැතැයි මේ අර්ථය ද දක්වයි. ස්වභාවයෙන් කරන්නකු නැතිකල්හි වනාහි කාරණයාගේ අන්තරාපේක්ෂාව අයුතුය යනුයි. මෙසේ කිසියම් එක් කාරකයකුගේ අභාවය දැක්වීමෙන් ස්වයංකෘත සැපය දුකයැයි ආදිය ප්‍රතිෂේධ වෙයි.

එහි අනේක හේතුවෙන් පැවැත්ම දක්වයි යන යමක් කියන ලද්දේ වේද, එය යුතු නො වේ. කවර හේතුවෙන් ද? අසාමග්‍රියෙහිත් අහේතුන්ගේ සාමග්‍රියෙහිත් අහේතුභාවයට පැමිණෙන හෙයිනි. එක් අන්ධයකු දකින්නට නො හැකි කල්හි අන්ධයන් සියයක් දකී යනු නො වේ. (එය) අයුතු නො වේද, සාධාරණඵල නිෂ්පාදනාර්ථයෙන් සිටින බව වනාහි

සාමාග්‍රිය යි. නොයෙක් දෙනාගේ සමෝධාන මාත්‍රයක් නො වේ. අන්ධයන්ගේ දර්ශනය යනු සාධාරණඵලයක් නො වේ. කවරහෙයින් ද, අන්ධයින් සියයක් ඇතිකල්හි ද එහි අභාවය නිසා ය. ඇස් ආදීන්ට වනාහි එය සාධාරණ ඵලයකි. ඔවුන් භාවයන් ඇතිහෙයින් අසාමග්‍රියෙහි අහේතුන්ට ද සාමග්‍රියෙහි හේතුභාවය සිද්ධ යි. ඒ මෙය අසාමග්‍රියෙහි ඵල අභාව වශයෙන් ද එහි සාමග්‍රියේ (ඵල) භාවයෙන් ද දතයුතුයි. ඇස් ආදීන්ගේ විකලබව ඇතිකල්හි චක්‍ෂුර්විඥානාදීන්ගේ අභාවය ද විකල නො වූ කල්හි භාව ද ලෝකයාට ප්‍රත්‍යක්‍ෂ සිද්ධය. මේ වනාහි සමවාය සංඛ්‍යාත සමය යන්නෙන් දක්වන ලද අර්ථය යි.

අෂ්ට අක්‍ෂණයන්ගෙන් තොර ප්‍රතිරූප දේශවාසාදී වූ ද චතුෂ්ක සංඛ්‍යාත යම් ඒ නවවන ක්‍ෂණයක් වේ ද එය අවකාශාර්ථයෙන් ක්‍ෂණය යැයි කියන ලදී. එය මනුෂ්‍යත්වය, බුද්ධෝත්පාදය, සම්‍යක්දෘෂ්ටිය යැයි මේ ආදී ක්‍ෂණසාමග්‍රියෙන් තොරව නැත. කනකැස්බෑ උපමා ආදියෙන් මනුෂ්‍යාත්වභාවය ආදීන්ගේ දුර්ලභභාව (දක්වන ලදී) මෙසේ ක්‍ෂණය දුර්ලභ හෙයින් ලෝකෝත්තර හෙයින් ලෝකෝත්තර ධර්මයන්ට උපකාර වූ ක්‍ෂණය (ක්‍ෂණ සම්පත්තිය) ට අයත් වූ කුසලය ද දුර්ලභ ම ය. මෙසේ මේවා අතුරෙන් ක්‍ෂණ සංඛ්‍යාත සමය කුසලයාගේ ඉපැත්මට දුර්ලභ බව දක්වයි. මෙසේ දක්වන ලද මෙයින් ලබාගත් ක්‍ෂණ ඇති ක්‍ෂණයට ම අයත් වූ ඒ කුසලයාගේ නො ගැටී සිටීමෙන් ක්‍ෂණය හිස් කරන්නවුන්ගේ ප්‍රමාද විහාරය ප්‍රතිෂේධ කරන ලද්දේ විය. ක්‍ෂණ සංඛ්‍යාත සමයෙන් මේ අර්ථය දක්වන ලදී. මේ කුසල චිත්තයාගේ යම් ප්‍රවෘත්ති කාලයක් නම් වේ ද එය ඉතා ස්වල්ප ය. ඒ චිත්තයාගේ අති ස්වල්ප බව ද 'මහණෙනි, චර්පුරිෂයාගේ ජවය යම්සේ ද, චන්ද්‍ර සූර්යයන්ගේ ජවය යම්සේ ද, යාම දේවතාවෝ චන්ද්‍ර සූර්යයන්ට ධාවනය කරත්. ඒ දේවතාවන්ගේ ජවය යම්සේ ද ඊට වඩා ශීඝ්‍රතරව ආයු සංස්කාරයෝ ක්‍ෂය වෙත්' යන මේ සූත්‍රයාගේ අර්ථකථා වශයෙන් දතයුත්තාහ. එහි වනාහි ජීවිතාශ්‍රයයාගේ එතරම් ස්වල්ප කාලයක් කියන ලද ද, උපන් නැවිය යම්තාක් පවතී ද ඒ තෙක් (කාලය තුළ) සිත් සොළසක් ඉපිද බිඳෙයි. මෙසේ ඔවුන්ගේ කාල පරිත්තාමය පිළිබඳ උපමාවක් ද නැත. එහෙයින් ම කීහ.

'යාවඤ්චිදං භික්ඛවෙ උපමාපි තංසුකරා යාව ලහුපරිවත්තං චිත්තං' (මහණෙනි, මේ සිත යම්තාක් ලහු පරිවත්තං චිත්තං' (මහණෙනි, මේ සිත යම්තාක් ලහු පරිවර්ති ද එබඳු උපමාවක් (දැක්වීම) සූකර නො වේ.)

යනුයි. මෙසේ මොවුනතුරෙන් කාලසංඛ්‍යාත වූ සමය කුසල සිත පවත්නා කාලයට වඩා ඉතා ස්වල්ප බව දක්වයි. මෙසේ දක්වනු ලබන්නා වූ ද මේ ඉතා ස්වල්ප කාල බැවින් විදුලි ආලෝකයෙන් මුතු අමුණන්නාක් මෙන් මේ සිත අවබෝධ කරගැනීම දුෂ්කර ය. එහෙයින් මේ චිත්තයාගේ ප්‍රතිවේධයේ දී මහත් උත්සාහයක් ද ආදරයක් ද කළයුතු යැයි අවවාද දෙන ලද්දේ වෙයි. කාලසංඛ්‍යාත සමය යන්නෙන් මේ අර්ථය දක්වන ලදී. සමූහ සංඛ්‍යාත සමය යන්න නොයෙක් නොයෙක් ධර්මයන්ගේ සහෝත්පත්තිය දක්වයි. ස්පර්ශාදී ධර්මයන්ගේ පුඤ්ජය වනාහි සමූහයැයි කියන ලදී. එහි උපදින සිත ද ඒ ධර්මයන් සමග උපදී යැයි නොයෙක් ධර්මයන්ගේ සහෝත්පත්තිය දක්වන ලදී. මෙසේ දක්වනු ලබන මෙයින් එක ම ධර්මයක්හුගේ උත්පත්තිය ප්‍රතිෂේධ කරන ලද්දේ වෙයි. සමූහ සංඛ්‍යාත සමය යන්නෙන් මෙ අර්ථය දක්වන ලදී. හේතුසංඛ්‍යාත සමය යන්න වනාහි පරායත්ත වෘත්ති ඇති බව දක්වයි. **'යසමිං සමයෙ'** යන පදයාගේ වනාහි යම් හෙයකින් යම් හේතුවක් ඇති කල්හි උපන්නේ වෙයි යන මේ අර්ථයි. එහෙයින් හේතුවක් ඇති කල්හි පැවති හෙයින් පරායත්ත වෘත්ති බව දක්වන ලදී. මෙසේ දක්වන මෙයින් ධර්මයන්ගේ ස්ව වසවර්ති අභිධානය ප්‍රතිෂේධ කරන ලද්දේ වෙයි. හේතු සංඛ්‍යාත සමය යන්නෙන් මේ අර්ථය දක්වන ලද්දේ වෙයි. එහි **'යසමිං සමයෙ'** යන කාල සංඛ්‍යාත සමය ශබ්දයාගේ වශයෙන් යම් කලෙක්හි යන අර්ථයි. සමූහ සංඛ්‍යාත සමය ශබ්දයාගේ යම් සමූහයෙක්හි යනු ක්‍ෂණ සමවාය හේතු සංඛ්‍යාත වූ යම් ක්‍ෂණයක් ඇතිකල්හි, යම් සාමග්‍රියක් ඇති කල්හි, යම් හේතුවක් ඇති කල්හි කාමාවචර කුසල සිතක් උපන්නේ වේද එය ම ඇති කල්හි ස්පර්ශාදීහු ද යනු මේ අර්ථය දතයුතුයි. අධිකරණය වනාහි කාලසංඛ්‍යාත වූ ද සමූහ සංඛ්‍යාත වූ ද සමයයි. එහි 'වුත්ත ධම්මානං' යනු මෙහි භුම්‍යයි. ඛණ සමවාය හේතු සංඛ්‍යාත යමයාගේ භාවයෙන් ඔවුන්ගේ භාවය (වීම) ලක්වේනුයි යන භාවයෙන් භාව ලක්‍ෂණ වශයෙන් මෙහි භුමම නම් වේ.

කාමාවචරං යනු කාමාවචර ධර්මයෝ කවරහු ද? 'යටින් අවීචි නිරයත් උඩින් පරනිර්මිත වසවර්තියත් කෙළවර කොට' යන ආදී නයින් කියන ලද ධර්මයන්හි අන්තර්ගත, මේ එහි වචනාර්ථයි. උද්දාන - එකට සම්බන්ධ වූ වස්තුකාම, ක්ලේශකාම යන කාමයෝ දෙදෙනෙකි. එහි ක්ලේශභාවය යනු ඡන්දරාගයයි. වත්ථුකාම නම් ත්‍රෛභූමක වෘත්තය යි. මෙහි ක්ලේශකාමය නම් කැමති වේනුයි = කාමය යි. අනෙක වනාහි

කැමති කරවානුයි = කාම නම් වේ. යම් පෙදෙසක මෙකී දෙවැදෑරුම් කාමය සපැමිණි පැවතීම් වශයෙන් හැසිරේ ද, ඒ ප්‍රදේශය සතර අපායන් මනුෂ්‍යයන් සදෙව්ලොව දෙවියන් වශයෙන් එකොළොස් වැදෑරුම් ය. මෙය කාමය හැසිරේනුයි = කාමාවචරය. සසත්‍ථාවචර මෙනි. යම් පෙදෙසක වනාහි ආයුධ සහිත පුරුෂයෝ හැසිරෙත් ද අන්‍ය වූ දෙපා සිවුපා සතුන් හැසිරෙන්නවුන් ඇති කල්හිත් ඔවුන් (ආයුධ සහිත පුරුෂයන්) විශේෂයෙන් ඉලක්ක වූ හෙයින් ඒ ප්‍රදේශය සසත්‍ථාවචර යනුයි ම කියනු ලැබේ. මෙසේ එහි හැසිරෙන රූපාවචරාදී අන්‍යයන් ඇති කල්හි ද ඒ කාමාවචරයන් අභිලක්‍ෂිත හෙයින් මේ ප්‍රදේශය කාමාවචර යැයි ම කියනු ලැබේ. එය රූපභවය යම්සේ රූප වී ද, එසේ උත්තරපදය ලොප් කොට කාම යැයි ම කියනු ලැබේ. මෙසේ මේ සිත මේ ඒකාදශ සංඛ්‍යාත කාම ප්‍රදේශයෙහි හැසිරේනුයි = කාමාවචරය, යම්හෙයකින් මේ සිත රූපා රූප භවයන්හි ද හැසිරේ නමුත්, යම්සේ වනාහි සංග්‍රාමයෙහි හැසිරෙන හෙයින් සංග්‍රාමවචර යැයි නම් ලද ඇතා නගරයේ හැසිරෙතත් සංග්‍රාමාවචර යැයි ම කියනු ලැබේ. ගොඩදිය හැසිරෙන ප්‍රාණීහු ථල අජල වූ තැන්හි සිටියත් ථලචර ජලචර යැයි ම කියනු ලබත්. මෙසේ මේ සිත අන්තැනක හැසිරේ නමුදු කාමාවචර ම යැයි දතයුතුයි. අරමුණු කිරීම්වශයෙන් හෝ මෙහි කාමය හැසිරේනුයි ද = කාමාවචරයි. මේ කාමය ද රූප අරූපාවචරයන් හැසිරේදැයි යම් සේ කියා ද = වස්සා පොළොවෙහි සයනය කෙරේ නුයි = මහිස යැයි කී කල්හි යම්තාක් සත්ත්වයෝ පොළොවෙහි සයනය කෙරෙත් යැයි කීම ද ඒ සියල්ලවුන්ටම එකී නම නො වේ. මෙය (කාමාවචර යනු) ද මෙසේ සිදු වූ බව දතයුතුයි. තව ද, කාමසසංඛ්‍යාත වූ කාම (භව) යෙහි ප්‍රතිසන්ධිය වශයෙන් හැසිරීම ද = කාමාවචරයි. **කුසලං** යනු පිළිකුල් වූ අකුසලයන්ගේ විනාශ කිරීම ආදී අර්ථයන්ගෙන් කුසලයඃ තව ද නිරෝගී අර්ථයෙන් ද නිර්වද්‍ය අර්ථයෙන් ද දක්‍ෂභාවයෙන් හටගත් අර්ථයෙන් ද කුසලය, යම්සේ වනාහි '**කච්චි භොතො කුසලං, කච්චි අනාමයං**'යැයි රූප කයෙහි අනාතුර බැවින් නොගිලන් බැවින් නිර්ව්‍යාධි බැවින් ආරෝග්‍යා අර්ථයෙන් කුසල කියන ලදී. මෙසේ අරූපී ධර්මයන් ද කෙලෙස් ආතුර බැවින් ද, කෙලෙස් ගිලන් බවේ ද, කෙලෙස් රෝගී බවේ ද අභාවයෙන් ආරෝග්‍ය අර්ථයෙන් කුසල යැයි දතයුතුයි. කෙලෙසින් තොර වූවහුගේ වනාහි ක්ලේශ දෝෂයාගේ ක්ලේශ දාහයාගේ ද අභාවයෙන් නිරවද්‍ය අර්ථයෙන් ද කුසලය, ප්‍රඥාව කෝශල්‍ය යැයි කියනු ලැබේ. ප්‍රඥාවෙන් හටගත් හෙයින් ප්‍රඥාවෙන් හටගත් අර්ථයෙන් කුසලය ඥාන සම්ප්‍රයුක්තය වනාහි මෙසේ මේවා,

ඥාන විප්‍රයුක්තය මෙසේ ද යත්? එය ද ආරූඪාර්ථයෙන් කුසල ම ය. යම්සේ වනාහි තලකොළවලින් නො කොට කලාල ආදියෙන් කරන ලද්ද ද එය හා සමාන බැවින් ආරූඪ ශබ්දයෙන් තල්වැට ම යැයි කියනු ලැබේ ද, මෙසේ ඥාන විප්‍රයුක්ත වූයේ ද කුසලය ම යැයි දතයුතුයි. නිෂ්පරියාය වශයෙන් වනාහි ඥාන සම්ප්‍රයුක්තය ආරෝග්‍යාර්ථයෙන් නිරවද්‍යාර්ථයෙන් ප්‍රඥාවෙන් හටගත් අර්ථයෙන් දැයි තුන් අයුරින් ම කුසල යන නම ලබයි. ඥාන විප්‍රයුක්තය ද දෙයාකාරයෙන් ම ලබයි. මෙසේ යමක් ජාතක පරියායෙන් ද යමක් බාහිර සූත්‍ර පරියායෙන් ද යමක් අභිධර්ම පරියායෙන් ද කුසලයැයි කියන ලද ද ඒ සියල්ල ත්‍රිවිධ අර්ථයෙන් ම මේ සිතෙහි ලැබේ. ඒ මේ කුසල සිත ලක්ෂණාදී වශයෙන් නිවැරදි සැපවිපාක ලක්ෂනයි. අකුසලය විනාශ කිරීම රසය යි. කෙලෙසුන්ගෙන් පිරිසිදුවීම එළඹ සිටින ආකාස යි. නුවණින් මෙනෙහි කිරීම ආසන්න කාරණය යි. සාවද්‍ය බවට ප්‍රතිපක්ෂ හෙයින් හෝ නිරවද්‍ය ලක්ෂණය ම කුශලය යි. පිරිසිදු බව රසය යි. ඉෂ්ට විපාකය එළඹ සිටින ආකාරය යි. ඉහත කියන ලද්ද ම ආසන්න කාරණය ම ය. ලක්ෂණ ආදියෙහි වනාහි ඒ ඒ ධර්මයන් ගේ ස්වභාවය හෝ සමාන බව හෝ ලක්ෂණ නම්. කෘත්‍යය හෝ සම්පත්තිය හෝ රස නම්. එළඹෙන ආකාරය හෝ ඵලය පච්චුපට්ඨාන නම්. ආසන්න කාරණය පදට්ඨාන නම්. මෙසේ යම් යම් තැනෙක ලක්ෂණාදිය කියවුද, ඒ ඒ තැන මේ නයින් ම ඔවුන්ගේ නානත්වය - වෙනස දතයුතුයි.

චිත්තං - සිත යනු අරමුණ සිතානුයි චිත්තය, දනී යන අර්ථයි. යම්හෙයකින් හෝ චිත්ත සිත යන මේ ශබ්දය සර්ව සාධාරණ ද එහෙයින් මෙහි යම් ලෞකික කුසලාකුසල මහාකිරිය සිතක් වේද එය ජවනවීථි වශයෙන් සිය සන්තානය රැස් කෙරේනුයි = සිතය, විපාකය කර්ම ක්ලේශයන් සමග රැස් කෙරේනුයි = සිතය. තව ද සියල්ල ම ස්ථානුරූපව විචිත්‍ර බැවින් = සිත ය. විසිතුරු කරන බැවින් සිතයැයි මෙසේ ද මෙහි අර්ථය දතයුතුයි. එහි යම්හෙයකින් සරාග සිත අනිකක්වය, සදොස සිත අනිකකි. සමෝහ සිත අනිකකි. කාමාවචර සිත අනිකකි. රූපාවචරාදී භේද අනිකකි. රූපාරම්මණය අනිකකි. ශබ්දාරම්මණ අනිකකි. රූපාරම්මණයන්හි ද මේ නය මය. මේ සියල්ලෙහි ම හීනය අනිකකි. මධ්‍යමය අනිකකි. ප්‍රණීතය අනිකකි (යැයි) හීනාදීන්හි ද ඡන්දාධිපත්‍යය අනිකකි. වීර්යාධිපත්‍යය අනිකකි. චිත්තාධිපත්‍යය අනිකකි. වීමංසාධිපත්‍යය අනිකකි. එහෙයින් මේ චිත්තයාගේ මේ සම්පුත්ත, භූමි, ආරම්මණ, හීන,

මධ්‍යම, ප්‍රණීත අධිපතීන්ගේ වශයෙන් විචිත්‍රත්වය දතයුතුයි. ඒකාන්තයෙන් මෙහි එකං සිත පමණක් නො වෙයි. චිත්‍රයන්ගේ ඇතුළත්වීම නිසා මොවුනතුරේන් යම්කිසි එකක් හෝ විචිත්‍ර හෙයින් චිත්‍රයැයි කියන්නට වටී. මෙසේ වනාහි විසිතුරු බැවින් චිත්‍රයි.

චිත්‍රකරණය සඳහා යනු කෙසේ ද? ලෝකයෙහි වනාහි චිත්‍රකරණයට වැඩි වෙනත් විසිතුරු දෙයක් නම් නැත. එහි යෙදීම-හැසිරීම පවා විසිතුරු ය. අතිශයින් විසිතුරු ම වෙයි. එය කරන්නා වූ සිත්තරුන්ට මෙහි මෙබඳු රූප කළයුතු යැයි චිත්ත සංඥාවක්-හැඟීමක් උපදී. ඒ චිත්ත සංඥාවෙන් ඉරි ඇඳීම්, සායම් කිරීම බැබළවීම පැවැත්වීම ආදිය නිෂ්පාදනය කරන චිත්ත ක්‍රියාවෝ උපදිත්. ඉක්බිති චරණ සංඛ්‍යාත සිතෙහි එක්තරා විසිතුරු රූපයක් නිෂ්පාදනය වෙයි. ඉක්බිති මේ රූපයට මත්තෙහි මෙය වේවා, යටින් මෙයයි දෙපස මෙය යැයි සිතා සිතන ලද චිත්‍ර කර්මය අනුව සෙසු චිත්‍රරූප නිෂ්පාදනය වෙයි. මෙසේ ලෝකයෙහි යම්කිසි විසිතුරු ශිල්ප ජාතයක් වේ නම් ඒ සියල්ල සිතින් ම කරනු ලැබේ. මේ මේ කරණ විචිත්‍රතාවෙන් ඒ ඒ චිත්‍රයාගේ නිෂ්පාදක චිත්තය ද එසේ ම විසිතුරු වේ. සිතන ලද්දා වූ සියල්ල නිෂ්පාදනය කරන හෙයින් හෝ එයින් ද සිතම චිත්‍රතරය. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ වදාළහ. 'මහණෙනි, තොප විසින් චරණය නම් චිත්‍රයකැයි දක්නා ලදද? එසේ ය ස්වාමීනි, මහණෙනි! ඒ චරණය-චිත්‍රය සිතින් ම විසිතුරු කරන ලදී. මහණෙනි, ඒ මරණයේ විචිත්‍රතාව නිසා ම සිතම විචිත්‍රතරය' යනුයි. එසේ ම දිව්‍ය-මනුෂ්‍ය-නිරය-තිරශ්චීන යන භේද ඇති ගතිවල කර්ම-ලිංග-සංඥා-ව්‍යවහාර ආදී භේද ඇති යම් යම් ආධ්‍යාත්මික සිතක් වේද එයද සිතින්ම කරන ලදී. කාය කර්මාදි භේද ඇති දාන සීල හිංසා, සොරකම් ආදී නයින් පැවති කුසලාකුසල කර්මය වනාහි සිතින් නිපදවන ලද කර්මනානත්වයයි. කර්ම නානත්වයෙන් ම ඒ ඒ ගතීන්හි අත් පා කන් උදර ග්‍රීවා මුඛ ආදි සටහන්වලින් භින්න වූ ලිංග නානත්වය වේ. ලිංග නානත්වයෙන් එසේ ගන්නා ලද සටහන් වශයෙන් මේ සතිය, මේ පුරුෂයන් යන උපදනා සංඥාවෙන් සංඥා නානත්වය වේ. සංඥා නානත්වයෙන් සංඥාවට අනුරූප වූ ස්ත්‍රිය යැයි හෝ පුරුෂයා යැයි හෝ ව්‍යවහාර කරන්නවුන්ගේ ව්‍යවහාර නානත්වය ඇති වේ. ව්‍යවහාර නානත්වය වශයෙන් වනාහි යම්හෙයකින් ස්ත්‍රියක් වෙමි. පුරුෂයෙක් වෙමි. ක්ෂත්‍රියෙක් වෙමි. බ්‍රාහ්මණයෙක් වෙමි යැයි මෙසේ ඒ ඒ ආත්මභාවයාගේ ජනක කර්මය කරනු ලැබේ. එහෙයින් ව්‍යවහාර නානත්වයෙන් ම කර්ම නානත්වය

වේ. පතන ලද අයුරින් භවය භවය නිපදවන්නා වූ ඒ ඒ කර්ම නානත්වය යම්හෙයකින් ගති වශයෙන් නිපදවයි ද, එහෙයින් කර්ම නානත්වයෙන් ගති නානත්වය ඇති වේ. කර්ම නානත්වයෙන් ම ඒ ඒ සත්ත්වයන්ගේ ඒ ඒ ගතියෙහි (අපාදික ද්විපාදකතාව, ඒ ඒ උත්පත්තීන්හි) උස් පහත් බව, ඒ ඒ ආත්ම භාවයෙහි සුවර්ණ දුර්වණතාව ආදිය (ලෝක ධර්මයන්හි) ලාභාලාභාදිතාව ද පැනෙයි. එහෙයින් දිව්‍ය මනුෂ්‍ය නිරය තිරශ්චීන භෙද ඇති ගතීන්හි කර්ම ලිංග සංඥා ව්‍යවහාර ආදී භේද ඇති මේ සියලු ම ආධ්‍යාත්මික සිත (සිතින් ම කරන) ලදැයි දතයුතු යි. මේ අර්ථය සංගීතියට ආරූඪ නො කරන ලද මේ සූත්‍රයාගේ වශයෙන් දතයුතුයි. මෙය කියන ලද්දේ ම ය. 'කර්ම නානත්ව පෘථුත්ව ප්‍රභේද ව්‍යවස්ථාන වශයෙන් ලිංග නානත්ව පෘථුත්ව ප්‍රභේද ව්‍යවස්ථානය වෙයි. ලිංග නානත්ව පෘථුත්ව ප්‍රභේද ව්‍යවස්ථාන වශයෙන් සංඥා නානත්ව පෘථුත්ව භේද ව්‍යවස්ථානයෙන් ව්‍යවහාර නානත්ව පෘථුත්ව ප්‍රභේද ව්‍යවස්ථානය වෙයි. ව්‍යවහාර නානත්ව පෘථුත්ව ප්‍රභේද ව්‍යවස්ථාන වශයෙන් කර්ම නානත්ව පෘථුත්ව ප්‍රභේද ව්‍යවස්ථානය වෙයි. කර්ම නානාකරණය නිසා සත්ත්වයන්ගේ ගතියෙහි නානාකරණය පැනේ. අපාදකයෝ ය. ද්විපාදකයෝ චතුෂ්පාද සත්ත්වයෝ ය. බහුපපාද සත්ත්වයෝ ය. රූපීහුය. අරූපීහුය. සංඥීහුය. අසංඥීහු ය. නෙවසංඥාසංඥීහු ය. (යන වශයෙන්) කර්ම නානාකරණය වශයෙන් සත්ත්වයින්ගේ උත්පත්තියෙහි නානාකරණයක් දක්නා ලැබේ. උස්පහත් බව, හීණප්‍රණීත බව, 'සුගත දුගත බව යන කර්ම නානාකරණය නිසා සත්ත්වයන්ගේ ආත්මභාවයෙහි නානාකරණය පැනේ. ස්වර්ණ දුර්වර්ණ බව, සුජාත දුර්ජාත බව මනාසේ පිහිටීම, නපුරු ලෙස පිහිටීම යන මේවා කර්ම නානාකරණය නිසා සත්ත්වයන්ගේ ලාභාලාභ යස අයස, නින්දා ප්‍රශංසා, සැපදුක් යන ලෝකධර්මයෙහි නානාකරණය පැනේ. අනෙකක් ද කියන ලදී.

කම්මතො ලිංගතො චෙව ලිංගසඤ්ඤා පවත්තරෙ
සඤ්ඤාතො භෙදං ගච්ඡන්ති ඉත්ථායං පුරිසොති වා
කම්මනා වත්තතෙ ලොකො කම්මනා වත්තතෙ පජා
කම්මනිබන්ධනා සත්තා රථස්සාණීව යායතො

කම්මෙන කිත්තිං ලභතෙ පසංසං
කම්මෙන ජානිඤ්ච වධඤ්ච බන්ධං
තං කම්මනානාකරණං විදිත්වා
කස්මා වදෙ නත්ථි කම්මන්ති ලොකෙ

කර්මයෙන් මෙන් ම ලිංගයෙන් ලිංග (යන) සංඥාව පවතී. සංඥාවෙන් මේ ස්ත්‍රියක හෝ මේ පුරුෂයෙකි යන භේදයට පැමිණෙත්.

කර්මයෙන් ලෝකය පවතී. කර්මයෙන් ප්‍රජාව පවතී. ගමන් කරන්නා වූ රථයට ඇණය මෙන් සත්ත්වයෝ කර්මයෙන් බැඳුණාහු ය.

කර්මයෙන් කීර්තිය ද ප්‍රශංසාව ද ලබයි. කර්මයෙන් හානිය ද වධය ද බන්ධනය ද වෙයි. ඒ කර්ම නානාකරණය දැන කවරහෙයින් ලෝකයෙහි කර්මය නැතැයි කියයි ද,

'මානවය! සත්ත්වයෝ කර්මය ස්වකීයකොට ඇත්තාහ. කර්මය දායාදකොට ඇත්තාහ. කර්මය උත්පත්තිස්ථාන කොට ඇත්තාහ. කර්මය බන්ධුකොට ඇත්තාහ. කර්මය පිළිසරණ කොට ඇත්තාහ. කර්මය සත්ත්වයන් හීනප්‍රණීත (උස්පහත්) යන මේ වශයෙන් ද බෙදයි' යැයි මෙසේ මේ කරණ විචිත්‍රත්‍වයෙන් ද සිතේ විචිත්‍රත්‍වය දතයුතු යි. මේ සියලු ම විචිත්‍රයෝ වනාහි සිතින් ම කරන ලදහ. නො ලබන ලද අවකාශ ඇති සිතට වනාහි යම් හෝ අවශේෂ ප්‍රත්‍ය විකලයක් වේ ද එය ද යම්කිසි විසිතුරුකිරීමක් බැවින් සිතින් කරන ලද යම් මේ ආධ්‍යාත්මික චිත්‍රයක් කියන ලද ද එයින් ද සිත ම චිත්‍රතර ය. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ (මෙසේ) වදාළහ. 'මහණෙනි! මම සිත හා සමාන වෙනත් එකම නිකායක් (සමූහයක්) වත් නො දකිමි. මහණෙනි, යම් ඒ තිරිසන්ගත ප්‍රාණීහු වෙත් ද, මහණෙනි, ඒ තිරිසන්ගත ප්‍රාණීන් අතුරෙන් ද සිත ම විසිතරුතර ය' යනුයි.

**උප්පන්නං හොති** යන මෙහි වර්තමාන උප්පන්න, භූතාර්ගත උප්පන්න, ඕකාසකතුප්පන්න, භූමිලද්ධුප්පන්න වශයෙන් උප්පන්නං යන්න අනේකවිධ ප්‍රභේද ඇත්තේ ය. එහි උත්පාද-ජරා භංගයන්ගේ එක්වීම් සංඛ්‍යාත වූ සියල්ල ම වර්තමාන උත්පන්න නම් වේ. ආරම්මණ රසය විඳ නිරුද්ධ වූ අනුභූතාපගත සංඛ්‍යාත කුසලාකුසල ද උත්පාදාදිත්‍රයට නො පැමිණ නිරුද්ධ වූ භූතාපගත සංඛ්‍යාත සෙසු සංඛත ද භූතාපගතුප්-පන්න නම්. **'යානිස්ස සානි පුබ්බෙ කතානි කම්මානී'**ති (පෙර කරන ලද යම් ඒ කර්මයෝ වෙත් ද) යනාදී නයින් කියන ලද අතීත වූ කර්ම ද අන්‍යවිපාක වළක්වා තම විපාකයට අවකාශ අවකාශ කොට සිටි හෙයින් එසේ කරන ලද අවකාශ ඇති නූපන්නා වූ විපාකය ද මෙසේ කරන ලද

අවකාශ ඇති කල්හි ඒකාන්තයෙන් උපදනා හෙයින් ඔකාසකතුප්පන්න නම් වෙයි. ඒ ඒ භූමීන්හි අසමූහතාවට පත් අකුසලය භූමිලද්ධුප්පන්න නම්. මේ භූමියෙහි ද භූමිලද්දහුගේ වෙනස දතයුතුයි. භූමි යනු විදර්ශනාවට අරමුණු වූ ත්‍රෛභූමක පංචස්කන්ධයෝ ය. භූමිලද්ධ නම් එකී ස්කන්ධයන්හි උත්පත්තියට සුදුසු වූ කෙලෙස් සමූහය යි. එහෙයින් මෙය භූමිලද්ධ නම් වෙයි. එහෙයින් භූමිලද්ධ යැයි කියනු ලැබේ. මෙසේ මෙකී චතුර්විධ උත්පන්නයන් අතුරෙහි මෙහි වර්තමානුත්පන්න ය අභිප්‍රේතයි. මේ එහි වචනාර්ථය යි. පූර්වාන්තයෙන් උඩට උපැත්ම ආදිකොට අභිමුඛ කොට පැමිණියේ නුයි = උප්පන්නං, මේ උප්පන්න ශබ්දය වනාහි අතීතය, පටිලද්ධය, සමුට්ඨිතය, අවික්ඛම්භිතය, අසමුච්ඡින්නය, ඛණත්තයගත යැයි නොයෙක් අර්ථයන් දක්නා ලැබේ. මෙය වනාහි 'තෙන ඛො පන භික්ඛවෙ! සමයෙන කකුසන්ධො භගවා අරහං සම්මා සම්බුද්ධො ලොකෙ උප්පන්නො' යන මෙහි අතීතයෙහි ආයේ ය. 'ආයස්මතො ආනන්දස්ස අතිරේක චීවරං උප්පන්නං හොති' යන මෙහි පටිලද්ධ (අර්ථයෙහි) ය, 'සෙය්‍යථාපි භික්ඛවෙ! උප්පන්නං මහාමෙඝං තංඛෙ මහාවාතො අන්තරායෙව අන්තරධාපෙති' යන මෙහිසමුට්ඨිතයෙහි ය' 'උප්පන්නං ගම්ය චිත්තං දුප්පටිවිනොදනීයං, උප්පන්නුප්පන්නෙ පාපකෙ අකුසලෙ ධම්මෙ ඨානසො අන්තරපෙති' යන මෙහි අවික්ඛම්භිතයෙහි ය. 'අරියං අට්ඨංගිකං මග්ගං භාවෙන්තො බහුලීකරොන්තො උප්පන්නුප්පන්නෙ පාපකෙ අකුසලෙ ධම්මෙ ඨානසො අන්තරායෙ ව අන්තරධාපෙති' යන මෙහි අසමුච්ඡින්නයෙහි ය. 'උප්පජ්ජමානං උප්පන්නං ආමන්තා' යන මෙහි ඛණත්තයගතයෙහි ය. ඒ මෙය මෙහි ද ඛණත්තයගතයෙහි ම දතයුතුයි. එහෙයින් උප්පන්නං හොති යන මෙහි ඛණත්තයගත වෙයි. වර්තමාන වෙයි. ප්‍රත්‍යුත්පන්න වෙයි යනු මෙම් සංක්ෂේපාර්ථ යි.

**චිත්තං උප්පන්නං හොති** යන මෙය ද දේශනා ශීර්ෂයමය. සිත වනාහි එකලාව ම නූපදී. කවර හෙයින් ද? යම්සේ රජ ආයේයැයි කී කල්හි පිරිස හැර එකලාව ආයේ නොවේ. රාජ පිරිස සමගම ආයේ යැයි පැනේ. මෙසේ මෙය ද පනසකට අධික කුශල ධර්මයන් සමග ම උපන්නේ යැයි දතයුතුයි. පූර්වංගමනාර්ථයෙන් වනාහි සිත උපන්නේ වෙයි යැයි කියන ලදී. සිත වනාහි ලෞකික ධර්මයට පැමිණ ජ්‍යෙෂ්ඨය, සිත ප්‍රධානය. සිත පූර්වාංගමය, ලෝකෝත්තර ධර්මයට පැමිණ ප්‍රඥාව ජ්‍යෙෂ්ඨය, ප්‍රඥාව ප්‍රධානය, ප්‍රඥාව පූර්වංගම ය, එහෙයින් ම භාග්‍යවතුන් වහන්සේ විනය පරියායට පැමිණ ප්‍රශ්න විචාරන සේක් කිං එසෙසාසි තිං වෙදනොසි?

කිං සඤ‍්ඤාසි? කිං චෙතනොසි? (කිම ස්පර්ශයෙන් යුක්ත වන්නෙහි ද? කිම වේදනාවෙන් යුක්ත වන්නෙහි ද? කිම සංඥාවෙන් යුක්ත වන්නෙහි ද? කිම චේතනාවෙන් යුක්ත වන්නෙහි ද) යැයි නො විචාරා 'කිං චිත්තොසි ත්වං භික්ඛු?' (කිම මහණ ඔබ සිතින් යුක්ත වූවෙහි ද?) යැයි සිත ම ප්‍රධාන කොට ගෙන වදාරන සේක. 'අථෙය්‍ය චිත්තො අහං භගවා' (භාග්‍යවතුන් වහන්ස, මම සොර සිත් ඇත්තෙම් නො වෙමි යැයි කී කල්හි ද 'අනාපත්ති අථෙය්‍යස්ස' (සොර නො වූවහුට ඇවැත් නැතැයි) යනාදිය නො වදාරා 'අනාපත්ති භික්ඛු! අථෙය්‍යං චිත්තස්ස' (මහණ! සොර සිත් නැත්තාට ඇවැත් නැත) යැයි වදාරණ සේක. හුදෙක් විනය පර්යායෙහි ම නොව වෙනත් ලෞකික දේශනා දෙසන සේක් සිත ම ප්‍රධාන කොටගෙන දෙසන සේක. එහෙයින් ම (මෙසේ) වදාළහ. 'මහණෙනි! අකුසල් වූ අකුසලභාගිය වූ අකුසලපාක්ෂික වූ යම්කිසි ධර්ම කෙනෙක් වෙත්නම් ඒ සියල්ලෝ ම සිත පූර්වංගම ය, සිත ඒ ධර්මයන්ට පළමු ව උපදී.'

**මනො පුබ්බංගමා ධම්මා මනො සෙට්ඨා මනොමයා**
**මනසා චෙ පදුට්ඨෙන භාසති වා කරොතිවා**
**තතො නං දුක්ඛමන්වෙති චක්කං ව වහතො පදං**

**මනො පුබ්බංගමා ධම්මා මනො සෙට්ඨා මනොමයා**
**මනසා චෙ පසන්නෙන භාසති වා කරොති වා**
**තතො නං සුඛමන්වෙති ඡායාව අනපායිනි**

**චිත්තෙන නීයති ලොකො චිත්තෙන පරිකස්සති**
**චිත්තස්ස එකධම්මස්ස සබ්බෙව වසමන්වගූ**

ධර්මයෝ සිත පූර්වංගම කොට ඇත්තාහ. සිත ශ්‍රේෂ්ඨ කොට ඇත්තාහ. සිතෙහි ම උපන්නාහ. ඉදින් දූෂිත වූ සිතින් කියයි නම් හෝ කරයි නම් හෝ ඒ හේතුවෙන් ඒ පුද්ගලයා කරා දුක අනුව යෙයි. ගැල අදනා ගොනාගේ පිය අනුව යන රියසක මෙනි.

ධර්මයෝ සිත පූර්වංගම කොට ඇත්තාහ. සිත ශ්‍රේෂ්ඨ කොට ඇත්තාහ. සිතෙහි ම උපන්නාහ. ඉදින් ප්‍රසන්න වූ සිතින් කියයි නම් හෝ කරයි නම් ඒ හේතුවෙන් සැපය ඒ පුද්ගලයා අනුව යෙයි. (තමා)

අත්නොහැර පවත්නා සෙවණැල්ල මෙනි. ලෝකය සිතින් ගෙනයනු ලැබේ. සිතින් අදිනු ලැබේ. සියල්ලෝ ම එකට ධර්මය වූ සිතේ වසඟයට ගියාහු ය.

'මහණෙනි! සත්ත්වයෝ සිත කිලිටුවීමෙන් කෙලෙසෙත්. සිත පිරිසිදු වීමෙන් පිරිසිදු වෙත්. මහණෙනි මේ සිත බබළනසුළුය. එය වනාහි ආගන්තුක වූ උපක්ලේශයන් විසින් කෙලෙසන ලදී. ගෘහපතිය! සිත ආරක්ෂා නො කළ කල්හි කාය කර්මය ද නොරක්නා ලද්දේ වෙයි. වාක් කර්මය ද නො රක්නා ලද්දේ වෙයි. මනෝ කර්මය ද නො රක්නා ලද්දේ වෙයි. ගෘහපතිය! සිත ආරක්ෂා කළ කල්හි -පෙ- ගෘහපතිය! සිත ව්‍යාපාදයට පත් කල්හි -පෙ- ගෘහපතිය සිත ව්‍යාපාදයට පත්නොවූ කල්හි -පෙ- ගෘහපතිය! සිත කාමාශාවන්ගෙන් වැඩුණු කල්හි -පෙ- ගෘහපතිය! සිත කාමාශාවන්ගෙන් නො මැඩුණු කල්හි කාය කර්මය ද කාමාශාවන්ගෙන් නො මැඩුණේ වෙයි. මනෝ කර්මය ද කාමාශාවන්ගෙන් නො මැඩුණේ වෙයි' යනුයි. මෙසේ ලෞකික ධර්මයට පැමිණ සිත ජ්‍යෂ්ඨ වෙයි. සිත ප්‍රධාන වෙයි. සිත පූර්වංග ම වෙයි යැයි දතයුතුයි. මෙකී සූත්‍රයන්හි වනාහි එකක් හෝ දෙකක් නො ගෙන සූත්‍රානුරක්‍ෂණය පිණිස සියල්ල ම ගන්නා ලදැයි දතයුතුයි. ලෝකෝත්තර ධර්මය විචාරන සේක් වනාහි 'කතරඵසසං අධිගතොසි කතරවෙදනං කතරසඤ‍ඤං කතරචෙතනං කතරචිත්තං' (කවර ස්පර්ශයක් කවර වේදනාවක් කවර සංඥාවක් කවර චේතනාවක් කවර සිතක් අධිගම කෙළෙහි දැ)යි කිම ප්‍රථම මාර්ග ප්‍රඥාව ද නැතහොත් දෙවන -පෙ- තෙවන සතරවන මාර්ග ප්‍රඥාව අධිගම කෙළෙහිදැ'යි ප්‍රඥාව ජ්‍යෂ්ඨ කරගෙන ප්‍රඥාව ප්‍රධාන කරගෙන විචාරන සේක.

'ප්‍රඥාව උසස් කරගත් සියලු කුසල ධර්මයෝ නොපිරිහෙත්. ප්‍රඥාව වනාහි කුමක් සඳහා ද? මහණෙනි, ප්‍රඥාවන්ත ආර්ය ශ්‍රාවකයාට ඒ අනුව ගිය ශ්‍රද්ධාව පිහිටයි. ඒ අනුව ගිය සමාධිය පිහිටයි', යැයි මෙහිදී මේ ආදී සූත්‍ර දතයුතුයි. මෙසේ ලෝකෝත්තර ධර්මයට පැමිණ ප්‍රඥාව ජ්‍යෂ්ඨ වෙයි. ප්‍රඥාව ප්‍රධාන වෙයි. ප්‍රඥාව පූර්වංගම වෙයි යැයි දතයුතුයි. මේ වනාහි ලෞකික දේශනාවකි. එහෙයින් සිත ප්‍රධාන කොටගෙන දේශනා කරන සේක් 'චිත්තං උප්පන්නං හොති' (සිතක් උපන්නේ වෙයි) යැයි වදාළහ.

සොමනසස සහගතං යනු සැපමිහිරි වේදනා සංඛ්‍යාත සොම්නස සමග එකෝත්පාද ආදී බවට ගිය, මෙකී සහගත ශබ්දය වනාහි ඒ බව, ගැවසීම, ආශ්‍රය, අරමුණ, මිශ්‍රවීම යන මේ අර්ථයන්හි දක්නා ලැබේ. එහි 'යායං තණ්හා පොනොභවිකා නන්දිරාග සහගතා' යනු තද්භාවයෙහි දතයුතුයි. තෘෂ්ණාව සමග වූ යන අර්ථයි. 'යායං භික්ඛවෙ! වීමංසා කොසජ්ජ සහගත කොසජ්ජ සම්පයුත්තා' (මහණෙනි, කුසීතබව සමග වූ කුසීත බැවින් යුක්ත වූ යම් ඒ වීමංසාවක් වේද) යනු ගැවසීමෙහි (යැයි) දතයුතුයි. අතරතුර උපදනා කුසීතබැවින් ගැවසීගත් යනු මෙය මෙහි අර්ථයි. 'අට්ඨික සඤ්ඤා සහගතං සතිසම්බොජ්ඣංගං භාවෙති' (අට්ඨිකසඤ්ඤා, සහගත වූ සතිසම්බොජ්ඣංගය වඩයි) යන මෙහි ඇසුරු කිරීමෙහි (යැයි) දතයුතු යි. අස්ථික සංඥාව වඩා ඇසුරුකොට අස්ථික සංඥාව වඩා ලබන ලද යන අර්ථයි. 'ලාභී හොති රූප සහගත වූ හෝ අරූප සහගත වූ සමාපත්තීන් ලබන්නෙක් වෙයි' යන මෙහි අරමුණෙහි (යැයි) දතයුතුයි. රූපාරූප ආරම්මණයන්ගේ යනු අර්ථයි.

'මේ සැපය මේ ප්‍රීතිය සමග වූයේ වෙයි. එක් ව උපන්නේ වෙයි. මිශ්‍ර වූයේ වෙයි. එකට යෙදුනේ වෙයි' යනු සංසට්ඨයෙහි ය. මේ පදයෙහි ද මේ අර්ථයම අභිප්‍රේතයි. (බලාපොරොත්තුයි) සොමනසස සංසට්ඨං යන්න වනාහි මෙහිදී සොමනසස සහගතයැයි කියන ලදී. මේ සංසට්ඨ ශබ්දය ද සමාන, කාමාශාවෙන් වැඩුණු, මිත්‍රසන්ථවය, සහජාතය යන බොහෝ අර්ථයන්හි දක්නා ලැබේ. මෙය වනාහි 'කිසෙ ථූලෙ ච වජ්ජෙත්වා සංසට්ඨා යොජිතා හයා' (කෘශ වූවන් ද ස්ථූල වූවන් හැර සමාන වූ අශ්වයෝ යොදන ලදහ) යන මෙහි සමාන අර්ථයෙහි ආයේ ය. 'සංසට්ඨාව තුම්හෙ අය්‍යො විහරථ' (ආචාර්යවරුනි, තෙපි කාමාශාවෙන් මැඩුණේ ව ම වාසය කරන්නාහු ය) යනු කාමාශාවෙන් මැඩුණු යන (අර්ථයෙහි ය.) 'ගිහී සංසට්ඨො විහරති (ගිහියන් හා එක්ව වාසය කරයි) යනු මිත්‍ර සන්ථවයෙහි ය. 'ඉදං සුඛං ඉමාය පීතියා සහගතං හොති සහජාතං සංසට්ඨං සම්පයුත්තං' (මේ සැපය මේ ප්‍රීතිය සමග එක්වූයේ වෙයි. සහජාත වූයේ වෙයි. මිශ්‍ර වූයේ වෙයි. සම්ප්‍රයුක්ත වූයේ වෙයි.) යනු සහජාතයෙහි ය. මෙහි ද සහජාතයෙහි අභිප්‍රේතයි. එහි සහගත සහජාත යනු අසංසට්ඨ අසම්පයුත්ත නම් නැත. සහජාතය වනාහි සංසට්ඨ පම්පයුත්ත වන්නේ ද නො වන්නේ ද වෙයි. රූපාරූප ධර්මයන් අතුරෙහි වනාහි එකට උපන්නවුන් අතුරෙන් රූපය අරූපය සමග සහජාත වෙයි. මිශ්‍ර නොවෙයි. සම්පයුත්ත නො වෙයි. අරූපය රූපය සමගත් රූපය ද

රූපය සමගත් එසේ ම ය. අරූපය වනාහි අරූපය සමග නියමයෙන් ම සහජාත වූයේ සහජාත වූයේ මිශ්‍ර වූයේ සම්ප්‍රයුක්ත වූයේ ම ද වෙයි යනුයි. ඒ සඳහා **සොමනස්ස සහගත** යැයි කියන ලදී.

**ඤාණසම්පයුත්තං** යනු ඥානය සමග එකට යෙදුණු සමග එකට ඉපදීම ආදී ප්‍රකාරයන්ගෙන් යුක්ත යන අර්ථයි. මෙහි දී වනාහි යමක් කියයුතු වේ ද එය මාතෘකා වර්ණනාවේ වේදනාත්‍රිකයෙහි කියන ලද ක්‍රමයමැයි. එහෙයින් ඒකුප්පාද, ඒකනිරෝධ, ඒකවත්ථුක ඒකාරම්මණ යැයි යන මේ ලක්ෂණයෙන් සම්ප්‍රයුක්ත යැයි දතයුතු යි. මෙය ඉතා උසස් පෙන්වීමක් ද වෙයි. අරූපයෙහි වනාහි ඒකවස්තුක භාවයක් නැතිව ද සම්ප්‍රයෝගය ලබයි. මෙපමණකින් කුමක් කියන ලද ද? කාමාවචර කුසලයන් අතුරෙහි සෝමනස්ස සහගත ත්‍රිහේතුක ඥාන සම්ප්‍රයුක්ත අසංඛාරික මහාසිත කියන ලදී. 'කතමෙ ධම්මා කුසලා' (කුශල ධර්මයෝ කවරහු ද?) යැයි මෙසේ අනියමිත විචාරීමෙන් චාතුර්භූමක කුශලය ගන්නා ලදී. 'කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති' (කාමාවචර කුසල සිතක් උපන්නේ වෙයි.) යන වචනයෙන් වනාහි ත්‍රෛභූමක කුශලය අතහැර අටවැදෑරුම් කාමාවචර කුශලය ම ගන්නා ලදී. 'සොමනස්ස සහගතං' (සොම්නස් සහගත) යන වචනයෙන් එයින් චතුර්විධ උපේක්ෂා සහගතය අතහැර චතුර්විධ සෝමනස්ස සහගතය ම ගන්නා ලදී. 'ඤාණ සම්පයුත්තං' යන වචනයෙන් එයින් දෙවැදෑරුම් ඤාණ විප්‍රයුක්තය අතහැර ඥාන සම්ප්‍රයුක්ත ද්වයම ගන්නා ලදී. නොගන්නා ලද නමුත් පරව වනාහි සසංඛාරෙන යැයි කියන හෙයින් මෙහි අසංඛාරෙන යැයි නො කී කල්හි ද අසංඛාර භාව දතයුතුයි. සම්මා සම්බුදුරජාණන් වහන්සේ වනාහි මුලින් ම මේ මහා සිත බෙදා දක්වන්නට නියමකොට ම මේ දේශනාව ආරම්භ කළසේකැයි ද මෙසේ මෙහි සනිටුහන් කළ සේකැයිද දතයුතුයි.

දැන් එම සිත ම අරමුණු වශයෙන් දක්වන්නට **රූපාරම්මණං වා** යන ආදිය වදාළහ. භාග්‍යවතුන් වහන්සේ වනාහි අරූප ධර්මය දක්වන සේක් වස්තු වශයෙන් හෝ අරමුණු වශයෙන් හෝ වස්තු අරමුණු වශයෙන් හෝ ස්වකීය කෘත්‍යය වශයෙන් හෝ දක්වන සේක. 'චක්ඛු සම්ඵස්සො -පෙ- මනො සම්ඵස්සජා වෙදනා, චක්ඛු විඤ්ඤාණං -පෙ- මනො විඤ්ඤාණං' යන ආදීන්හි වනාහි වස්තුවෙන් අරූප ධර්ම දක්වන ලදී. 'රූප සඤ්ඤා -පෙ- ධම්ම සඤ්ඤා රූප සංචෙතනා -පෙ- ධම්ම

සඤ්චෙතනා' යන ආදීන්හි අරමුණු වශයෙනි. 'චක්ඛුඤ්ච පටිච්ච රූපෙ - චුප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං, තිණ්ණං සංගති ඵසෙසා, -පෙ- මනඤ්ච පටිච්ච ධම්මෙ චුප්පජ්ජති මනො විඤ්ඤාණං, තිණ්ණං සංගති ඵසෙසා' (ඇස හේතුකොටගෙන රූපයත් චක්ෂුර් විඥානයත් උපදී. තිදෙනාගේ එක්වීමෙන් ස්පර්ශය වෙයි. සිත හේතු කොටගෙන ධර්ම ද මනෝ විඤ්ඤාණය ද උපදී. තිදෙනාගේ එක්වීමෙන් ස්පර්ශය වෙයි) යන ආදීන්හි වස්තු-අරමුණුවලින් දක්වන ලදී. 'අවිජ්ජා පච්චයා භික්ඛවෙ සංඛාරා සංඛාර පච්චයා විඤ්ඤාණං' (මහණෙනි, අවිද්‍යාව හේතුවෙන් සංස්කාරයෝ හටගනිත්. සංස්කාර හේතුවෙන් විඤ්ඤාණය හටගනී) යන ආදීන්හි ස්වකීය කෘත්‍යය වශයෙන් අරූප ධර්මයෝ දක්වන ලදහ. මේ ස්ථානයේදී වනාහි අරමුණු වශයෙන් දක්වන සේක් 'රූපාරම්මණංවා' (රූපාරම්මණය හෝ) යන ආදිය වදාළහ.

එහි චතුසමුට්ඨාන වූ අතීත අනාගත වර්තමාන රූපය ම **රූපාරම්මණ** යයි. ද්විසමුට්ඨාන වූ අතීත අනාගත වර්තමාන ශබ්දය ම **ශබ්දාරම්මණ** යයි. චතුසමුට්ඨාන වූ අතීත අනාගත වර්තමාන වූ ගන්ධයම **ගන්ධාරම්මණ** යයි. චතුසමුට්ඨාන වූ අතීත, අනාගත, වර්තමාන රසය ම **රසාරම්මණ** යයි. චතුසමුට්ඨාන වූ අතීත අනාගත වර්තමාන පොට්ඨබ්බය ම **පොට්ඨබ්බාරම්මණ** යයි. එකසමුට්ඨාන, ද්විසමුට්ඨාන තිසමුට්ඨාන චතුසමුට්ඨාන, නකුතො චි සමුට්ඨිත (කොතැනකවත් හට නොගත්) අතීත අනාගත වර්තමාන වූ (චිත්ත චෛතසිකයෝ) ද එසේ නො කිය යුතු කියා අවශේෂ වූ චිත්තගෝචර නම් වූ ධර්මයෝ ම **ධම්මාරම්මණ** යි. ඉන්ද්‍රියගෝචර වූ යම් රූපාදීහු වෙත් නම් (ඔවුහු ද) ධම්මාරම්මණම යැයි කියත්. ඔව්හු මේ සූත්‍රයෙන් ප්‍රතික්ෂේප කළයුත්තෝය. මෙය ද කියන ලදී. 'ඇවැත්නි, නානා විෂය ඇති, නානාගෝචර වූ ඔවුනොවුන්ගේ ගෝචරවිෂය අනුභව නො කරන්නා වූ මේ පංචෙන්ද්‍රියන්ට වනාහි සිත පිළිසරණය. සිත ඔවුන්ගේ ගෝචර විෂය අනුභව කෙරෙයි' යනු මෙ රූපාරම්මණ ආදීන්ගේ ගෝචර විෂය නමි. ඒවා සිතින් අනුභව කරනු ලබන නමුදු රූපාරම්මණ ආදිය ම යැයි යන මේ අර්ථය සිද්ධ වෙයි. දිව්‍යචක්ෂුරභිඥානය ආදියට ද රූපාදිය අරමුණු බැවින් මේ අර්ථය සිද්ධ වේ ම ය. ඉන්ද්‍රිය විෂය වූ ම රූපාරම්මණ ආදිය වනාහි දිවැස් ආදීන්ට අරමුණු ය. ඒවා ධර්මය අරමුණු කරගන්නේ නො වේ යැයි කී නයින් ම ආරම්මණ ව්‍යවස්ථානය (අරමුණු නිශ්චය කිරීම) දතයුතුයි.

එහි එක් එක් අරමුණු ද්වාර දෙක්හි දෙක්හි (වශයෙන්) ඉන්ද්‍රිය විෂයට පැමිණෙයි. රූපාරම්මණය වනාහි චක්ෂුප්‍රසාදය ගටා එකෙණෙහි ම මනෝද්වාරයෙහි ඉන්ද්‍රිය විෂයට පැමිණෙයි. භවංග චලනයට ප්‍රත්‍යය වෙයි යනු අර්ථයි. ශබ්ද ගන්ධ රස පොට්ඨබ්බ යන ආරම්මණයන්හි ද මේ ක්‍රමය ම ය. යම්සේ වනාහි පක්ෂියෙක් අහසින් අවුත් ගසක අග සැගවෙත් ම වෘක්ෂ ශාඛාව ද ගැටෙයි. උගේ ඡායාව ද පොළොවෙහි හැපෙයි. ශාඛා ගැටුම හා ඡායාව පැතිරීම නො පෙර නො පසුව එක් ක්ෂණයේ ම වෙයි. මෙසේ වර්තමාන රූපාදීන් සමග චක්ෂු ප්‍රසාදාදියේ ගැටුම ද භවංග චලනයට සමත් මනෝද්වාරයෙහි ඉන්ද්‍රිය විෂයවීම ද නො පෙර නො පසුව එක් ක්ෂණයෙහි ම වෙයි. ඉක්බිති භවංග සිත සිඳ චක්ෂු ද්වාරාදියෙහි උපන්නා වූ වොත්ථපනය අවසන් කොට ඇති ආවර්ජනාදීන්ගේ අතර ඒ ආරම්මණයන්ගේ එකෙක මේ මහා සිත උපදී.

ශුද්ධ මනෝ ද්වාරයෙහි වනාහි (චක්ෂුර් ප්‍රසාදා දී) ප්‍රසාදනයන් ගැටීමක් (ගැටීම් කිසක්) නැත. ප්‍රකෘතියෙන් දිට්ඨ, සුත, ඝායිත, සායිත, ඵුට්ඨ (දුටු ඇසූ ආඝ්‍රාණය කළ, රසවිඳි, ස්පර්ශ කළ)වශයෙන් මෙකී අරමුණු ඉන්ද්‍රිය විෂය බවට පත්වෙයි. කෙසේ ද? මෙහි ඇතැම් කෙනෙක් හුණුපිරියම් කළ, රත්සිරියෙල් ආදී වර්ණයෙන් විසිතුරු කළ, නානාප්‍රකාර ධව්ජපතාක ඔසවන ලද මල්දම් ඔතා බඳනා ලද, මලින් වැසූ අති මනරම් සිරියෙන් බබළන, අලංකාර කොට පිළියෙළ කළ මහසෑය පැදකුණුකොට සොළොස් පාද පීඨිකාවන්හි පසග පිහිටුවා වැඳ ඇඳිලි බැඳගෙනබලනුයේ බුද්ධාලම්භන ප්‍රීතියට පත් ව සිටී. මෙසේ සෑය බලා බුද්ධාලම්භන ප්‍රීතිය උපදවා මෑතභාගයේ දී යම්කිසි තැනකට ගොස් රෑ වෙසෙන තැන්හි දවල් වෙසෙන තැන්හි හිඳ ආවර්ජනය කරන ඕහුට අලංකාර කොට පිළියෙල කරන ලද මහාසෑය චක්ෂුර් ද්වාරයෙහි (ඇසෙහි) ඉන්ද්‍රියවිෂය වූ මෙන් වෙයි. පැදකුණු කොට සෑය වඳිනා කාලය මෙන් වෙයි. මෙසේ වනාහි දැකීම් වශයෙන් රූපාරම්මණය ඉන්ද්‍රිය විෂය බවට පැමිණේ.

මිහිරි හඬින් දහම් දෙසන ධර්මකථිකයන් වහන්සේ කෙනෙකුන්ගේ හෝ (මිහිරි) හඬින් කියන සරභාණකයන් වහන්සේ කෙනෙකුන්ගේ හෝ ශබ්දය අසා මෑත භාගයේ දී යම්කිසි තැනක හිඳ ආවර්ජනය කරන්නාට ධර්මකථාව හෝ හඬනගා කීම ශ්‍රෝතද්වාරයෙහි ඉන්ද්‍රියවිෂය වූ සේ වෙයි. සාධුකාර දී අසන කල මෙන් වෙයි. මෙසේ ශ්‍රැත වශයෙන් ශබ්දාරම්මණය ඉන්ද්‍රිය විෂය බවට පැමිණේ.

සුවඳවත් ගඳක් හෝ මල් හෝ ලැබ අසුනෙහි හෝ සෑයෙහි ගන්ධය අරමුණු කරගත් සිතින් පූජාකොට මෑතභාගයේ දී යම්කිසි තැනෙක හිඳ ආවර්ජනය කරන්නාට ගන්ධාරම්මණය ඝාණද්වාරයෙහි ඉන්ද්‍රියවිෂය වූ මෙන් වෙයි. පූජා කරන කල මෙන් වෙයි. මෙසේ ආඝ්‍රායිත වශයෙන් ගන්ධාරම්මණය ඉන්ද්‍රිය විෂයට පැමිණේ.

ප්‍රණීත වූ කෑයුතු දෙයක් හෝ බුදිය යුතු දෙයක් සබ්‍රම්සරුන් සමග බෙදාගෙන අනුභවකොට මෑත භාගයේ දී යම්කිසි තැනක දී කුරහන් ආදී වූ බොජුනක් ලැබ අසවල් කාලයේ දී ප්‍රණීත භෝජනයක් සබ්‍රම්සරුන් සමග බෙදාගෙන පරිභෝග කරන ලදැයි ආවර්ජනය කරන්නහුට ඒ රස අරමුණ දිව්හා ද්වාරයෙහි ඉන්ද්‍රිය විෂය වූවාක් මෙන් වෙයි. මෙසේ රස විඳීම් වශයෙන් රස අරමුණ ඉන්ද්‍රිය විෂයට පැමිණෙයි.

මෘදු වූ සුවපහස් ඇති ඇඳ පුටු හෝ ඇතිරිලි පොරෝනා හෝ පරිභෝග කොට මෑතභාගයේ දී යම්කිසි තැනක දී දුක් සයනයක් කොට අසුවල් කාලයේ දී මා විසින් මෘදු වූ ඇඳපුටු ඇතිරිලි පෙරවිලි පරිභෝග කරන ලදැයි ආවර්ජනය කරන්නහුට ඒ පොට්ඨබ්බාරම්මණය (ස්පර්ශය පිළිබඳ අරමුණ) කාය ද්වාරයෙහි ඉන්ද්‍රිය විෂය වූවාක් මෙන් වෙයි. මෙසේ ස්පර්ශ කළ දේ වශයෙන් ස්පර්ශාරම්මණය ඉන්ද්‍රිය විෂයට පැමිණෙයි. මෙසේ පිරිසිදු මනෝද්වාරයෙහි ප්‍රසාද ඝර්ෂණ කෘත්‍යයක් නැත. ප්‍රකෘතියෙන් දුටු ඇසූ ආඝාණය කළ ස්පර්ශ කළ වශයෙන් ම මේ අරමුණු ඉන්ද්‍රිය විෂයට පැමිණේයැයි දතයුතුයි.

දැන් ප්‍රකෘතියෙන් දුටු ආදීන්ගේ වශයෙන් ඉන්ද්‍රිය විෂයට පැමිණීමේ දී අට්ඨකථාවන්හි කියන ලද මේ වෙනත් නයක් ද වෙයි. දිට්ඨ, සුත හා උභය සම්බන්ධ යන මේ වනාහි දිට්ඨාදිය යැයි දතයුතු යි. එහි දිට්ඨ නම් පංචද්වාර වශයෙන් ගන්නා ලද්ද ය. සුත යනු ප්‍රත්‍යක්ෂ වශයෙන් නො දැක ඇසීම් වශයෙන් ගන්නා ලද රූපාදිය යි. මේ දෙකෙන් ම සම්බන්ධ වූයේ උභය සම්බන්ධ නම්. මෙසේ මේ දිට්ඨාදීන්ගේ වශයෙන් මේවා මනෝ ද්වාරයෙහි ඉන්ද්‍රිය විෂයට පැමිණේ යැයි දතයුතු යි. එහි දිට්ඨ වශයෙන් ඉන්ද්‍රිය විෂයට පැමිණීම වනාහි යට පස්නයින් කියන ලද ම ය. ඇතැමෙක් වනාහි භාග්‍යවතුන් වහන්සේ ගේ අතිශය පින්පලයෙන් උපන් රූපය නම් මෙසේ ය. ශබ්දය ඉතා මිහිරි ය. කිසියම් පෙදෙසක කිසියම් මල් වර්ගයෙක සුවඳ ඉතා මනහර ය. කිසියම් ඵලවර්ගය රසය ඉතා මිහිරි ය.

කිසියම් පෙරවිලි ආදියක පහස ඉතා සුවයැයි අසයි. ඔහුට චක්ෂු ප්‍රසාදීන්ගේ ගැටීමකින් තොර ව ඇසූ පමණින් ඒවා මනෝ ද්වාරයෙහි ඉන්ද්‍රිය විෂය බවට පැමිණෙයි. ඉක්බිති ඔහුගේ ඒ සිත එම රූපයෙහි හෝ ශබ්දයෙහි හෝ ප්‍රසාද වශයෙන් හෝ සුවඳ ආදියෙහි ආර්යයන්ට සිතුකාමතා (දීමේ කැමති බව) වශයෙන් හෝ, අන්‍යයන් විසින් දෙන ලද දැයෙහි අනුමෝදනා වශයෙන් හෝ පවතී. මෙසේ ශ්‍රුත වශයෙන් මේවා මනෝ ද්වාරයෙහි ඉන්ද්‍රිය විෂය බවට පැමිණේ. අනෙකෙකු විසින් වනාහි පළමු කියන ලද රූපාදිය දක්නා ලද්දේ හෝ අසන ලද්දේ හෝ වේ ද, ඔහු මෙබඳු රූපයක් මතු උපදනා බුදුකෙනෙකුටත් වන්නේ යැයි ආදී නයින් චක්ෂු ප්‍රසාදාදියේ ගැටීමෙන් තොර ව දිට්ඨ, සුත සම්බන්ධයෙන් ම ඒවා මනෝද්වාරයෙහි ඉන්ද්‍රිය විෂය බවට පැමිණේ. ඉක්බිති ඔහුට යට කියන ලද නයින් ම එකී අරමුණු අතුරෙන් එක්තරා අරමුණක් ද මේ සිත ද පවතී. මෙසේ උභය සම්බන්ධ වශයෙන් මේවා මනෝ ද්වාරයෙහි ඉන්ද්‍රිය විෂය බව පැමිණේ. මෙය ද මුඛ මාත්‍රයක් ම ය.

ශ්‍රද්ධාව ආදීන්ගේ වශයෙන් වනාහි විස්තර වශයෙන් මොවුන්ගේ මනෝ ද්වාරයෙහි ඉන්ද්‍රිය විෂයට පැමිණීම දතයුතු ම ය. යම්හෙයකින් වනාහි මෙසේ ඉන්ද්‍රිය විෂයට එන්නා වූ භූතයෝ ද අභූතයෝ ද වෙත් ද, එහෙයින් මේ නය අට්ඨකථාවන්හි නො ගන්නා ලදී. මෙසේ ඒකාරම්මණ ජවනය ද්වාර දෙක්හි දෙක්හි උපදියැයි දතයුතු ය. රූපය අරමුණු කරගත් ජවනය චක්ෂු ද්වාරයෙන් මෙන් ම මනෝ ද්වාරයෙහි ද උපදී. ශබ්දාදී ආරම්මණයන් හි ද මේ නය මැයි.

එහි මනෝද්වාරයෙහි උපදනා රූපය අරමුණු කරගත් ජවන් සිත දානමය සීලමය භාවනාමය යැයි ත්‍රිවිධ වෙයි. ඔවුන් අතුරෙන් එකක් එකක් කායකර්ම වචීකර්ම මනෝකර්ම යැයි ත්‍රිවිධ ම වෙයි. ශබ්ද ගන්ධ රස ස්පර්ශ හා ධර්මාරම්මණයන්හි ද මේ ක්‍රමය ම ය.

එහි වනාහි රූපය අරමුණු කොටගෙන උපදනා මේ මහා කුසල් සිත නිල් කහ රතු සුදු යන වර්ණයන්ගෙන් යුත් මල් වස්ත්‍ර ධාතු යන මේවා අතුරෙන් සුභනිමිති සංඛ්‍යාත ඉෂ්ට වූ ප්‍රිය වූ මන වඩන්නා වූ ඇලීම් ඇතිකරන එක්තරා වර්ණයක් අරමුණුකොට උපදී. මේ සිත කෙසේ කුසල නම් වී ද යත්? නිමිත්ත වශයෙන් පිරිනැමීම් වශයෙන් හැසිරීම් වශයෙන් හා ආභෝග වශයෙනි. මා විසින් වනාහි කුසලයක් ම කළයුතු

යැයි යමෙකුට කුසල් කිරීමෙහි සිත නියමිත වෙයි ද, අකුසල් කිරීමෙන් නැවති කුසල් කිරීමෙහි ම පරිණායම වෙයි ද, නින්දා කිරීම් වශයෙන් කුසලයෙහි හැසිරීම් වශයෙන් හැසිරෙන ලද ද, ප්‍රතිරූප දේශවාසය, සත්පුරුෂ ආශ්‍රය, සද්ධර්ම ශ්‍රවණය, පෙර කරන ලද පින් ඇති බව ආදී වූ හේතුසම්පත් වලින් ද නුවණින් ආභෝගය (වෙළා ගැනීම) ද පවතී. මෙකී නියම කිරීම් වශයෙන්, පරිණාම වශයෙන් සමුදාචාර වශයෙන් හා ආභෝග වශයෙන් ඔහුට කුසලය උපන්නේ නම් වෙයි. මෙහිවනාහි අරමුණු වශයෙන් සෝමනස්ස සහගත භාවය දතයුතු යි. මෙය වනාහි ඉෂ්ටාරම්මණයෙහි උපන් බැවින් සොම්නස් සහගත විය. මෙහි දී ශ්‍රද්ධා බහුලතාම ආදිය ද කරුණුම ය. අපේ ශ්‍රද්ධාවතුන්ට මෙන් ම මිථ්‍යා දෘෂ්ටිකයන්ට ද ඒකාන්ත ඉෂ්ටාරම්මණ වූ තථාගතරූපයක් දැක ද සොම්නස නූපදීම ය. කුසල පැවැත්මෙහි අනුසස් නො දකිත්. අනුන් විසින් උත්සාහ කරනු ලදු ව කුසල් කරන්නවුන්ට ද සොම්නසක් නූපදී. එහෙයින් ශ්‍රද්ධා බහුල බව සම්‍යක් දෘෂ්ටි ඇති බව, අනුසස් දක්නා බව යැයි මෙසේ ද මෙහි සොම්නස් සහගත බව දතයුතුයි. තව ද බුද්ධානුස්සතිය, ධම්මානුස්සතිය -පෙ- සංඝ - සීල - චාග - දේවතා - උපසමානුසසතිය, රළු පුද්ගලයන් වර්ජනය කරන බව, සිනිඳු පුද්ගලයන් සේවනය කරන බව පැහැදීම ගෙනදෙන සූත්‍රාන්තයන් ප්‍රත්‍යවේක්‍ෂා කරන බව, එහි අධික ලෙස ඇලුණු බව යන මේ කරුණුවලින් ද මෙහි සොම්නස් සහගත බව දතයුතු යි. මේවා පිළිබඳ විස්තර බොජ්ඣංග විභංගයෙහි මතු පහළ වන්නේ ය.

මෙහි දී වනාහි කර්මයෙන් උත්පත්තියෙන් ඉන්ද්‍රියන්ගේ මුහුකිරීමෙන් කෙලෙස් දුරුවීමෙන් යන මේ කාරණයන්ගෙන් ඥාන සම්ප්‍රයුක්ත බව දතයුතු යි. යමෙක් වනාහි අනුන්ට ධර්මදේශනා කරයි ද, නිවැරදි ශිල්පායතන කර්මාන්තායතන විද්‍යාස්ථාන හික්මවයි ද, ධර්මකථිකයෙකුට සත්කාර කොට ධර්මය දේශනා කරවයි ද, මත්තෙහි ප්‍රඥාවන්තයෙක් වෙමි යි ප්‍රාර්ථනාකොට නානාප්‍රකාර දන් දෙයි ද, මෙබඳු කර්ම නිසා ඔහුට උපදනා කුසලය ඥාන සම්ප්‍රයුක්තව උපදී. අව්‍යාපාද ලෝකයෙහි උපන්නා වූ ද ඔහුට සැපවත් ධර්මපද කියවෙයි. 'මහණෙනි, සත්ත්වයාගේ උපත දණ්ඩය (මෝඩය) එසේ නමුදු ඒ සත්ත්වයා වහාම විශේෂභාගී (විශේෂ ඥානයට කොටස්කරුවෙක්) වෙයි.' යන මේ නයින් උපත නිසා උපදනා කුසලය ඥාන සම්ප්‍රයුක්ත ව උපදී. එසේ ම ඉන්ද්‍රියන්ගේ මේරීමට

පැමිණි ප්‍රඥා දශකයට පත් අයගේ ඉන්ද්‍රිය පරිපාකය නිසා ද උපදනා කුසලය ඥාන සම්ප්‍රයුක්ත ව උපදී.

යම් කෙනෙකුන් විසින් වනාහි කෙලෙස් යටපත් කරන ලද ද, ඔවුන්ගේ කෙලෙස් දුරුකිරීම නිසා ද උපදනා කුසලය ඥාන සම්ප්‍රයුක්තව උපදී. මෙය ද කියන ලදී. 'යොගා වෙ ජායතන භූරී අයොගා භූරී සංඛයො' (යෙදීමෙන් වනාහි බොහෝසෙයින් හටගනී. නො යෙදීමෙන් බොහෝ සෙයින් ක්ෂය වෙයි) යැයි මෙසේ කර්මයෙන් උත්පත්තියෙන් ඉන්ද්‍රිය පරිපාකයෙන් කෙලෙස් දුරුවීමෙන් යැයි යන මේ කරුණුවලින් ඥාන සම්ප්‍රයුක්ත බව දතයුතුයි. තව ද විචාරණ බව, වස්තුව පිරිසිදු කිරීම, ශ්‍රද්ධාදී ඉන්ද්‍රියයන් සම්පූර්ණයෙන් ප්‍රතිපාදනයකිරීම, අඥාන පුද්ගලයන් වර්ජනය කිරීම, ප්‍රඥාවන්ත පුද්ගලයන් සේවනය කිරීම, ගම්භීර ඥානයෙන් යුක්ත ආචාර්යවරයන් ප්‍රත්‍යවේක්ෂා කිරීම එහි දැඩිව යෙදීම යන සප්ත ධර්මයෝ ධම්මවිචය සම්බොජ්ඣංගය ඉපදීම සඳහා පවතී. මේ කරුණු වලින් ද ඥාන සම්ප්‍රයුක්ත බව දතයුතු යි. මේවා පිළිබඳ විස්තරය බොජ්ඣංග විභංගයෙහි මතු පළවන්නේ ය.

මෙසේ ඥාන සම්ප්‍රයුක්ත ව උපන්නා වූ ද මෙය අසංස්කාරික ව (අනුන්ගේ) ප්‍රයෝගයක් නැති ව අනුන්ගේ එල්බගැන්මක් නැති ව සිතීමෙන් උපන්හෙයින් අසංස්කාර නම් විය. එය සිත් අලවන වර්ණාරම්මණයක් ව උපදනේ ම දානමය හෝ සීලමය හෝ භාවනාමය හෝ ත්‍රිවිධ නියමයෙන් උපදී. කෙසේ ද, යම්කලෙක වනාහි නිල් කහ රතු සුදු මල් වස්ත්‍ර ආදීන්ගෙන් යමක් ලැබ වර්ණ වශයෙන් ගෙන මාගේ වර්ණ දානයයැයි බුද්ධ රත්නාදිය පුදයි ද එකල්හි දානමය වෙයි. මේ එහි වස්තුව යි. භාණ්ඩාගාරික සංඝමිත්‍ර වනාහි එබ්බූ එක් වස්ත්‍රයක් ලැබ මේ වස්ත්‍රයත් රන්වන්ය. සම්මා සම්බුදුරජාණන් වහන්සේ ද රන්වන් ය. රන්වන් වස්ත්‍රය රන්වන් වූ බුදුන්ට ම සුදුසු ය. අපට ද වර්ණදානයක් වන්නේ යැයි (එය) මහසෑයෙහි නැංවී ය. මෙවන් කල්හි දානමය වන්නේ යැයි දතයුතු යි. යම්කලෙක වනාහි එවැනි ම දෙය්‍ය ධර්මයක් (දිය යුතු දෙයක්) ලැබ මාගේ කුලවංශය, පෙළපත, කුල ප්‍රවේණිය මෙයයි. කුලවත මෙයයැයි බුද්ධ රත්නාදිය පුදයි ද, එකල්හි සීලමය වෙයි. යම්කලෙක වනාහි එවැනි ම වස්තුවකින් රත්නත්‍රයට පූජාකොට මේ වර්ණය ක්ෂයබව පැමිණෙයි. ව්‍යයට පැමිණෙයි යැයි ක්ෂය ව්‍යයයෙහි පිහිටයි. එකල්හි වනාහි භාවනාමය වෙයි. දානමය වී පවත්නා කර්මය ද වනාහි යම්කලෙක ත්‍රිවිධ රත්නයසියතින් පුදන්නාට

පවතී ද (සියතින් පුදන විට) එකල්හි කාය කර්මයෙහි වේ. යම්කලෙක අඹුදරු දැසි කම්කරු පුරුෂාදීන් ද අණවා පූජා කරවයි ද, එකල්හි වචී කර්මයෙහි වෙයි. යම්කලෙක වනාහි කියන ලද ආකාර ඇති පවත්නා වූ එම වස්තුව ම අරබයා වර්ණදානයක් දෙමියි සිතයි ද, එකල්හි මනෝ කර්මයක් වෙයි. විනය පර්යායට පැමිණ වනාහි දෙමි කරමි යනු වාග්භේදය වේයැයි යන මේ ලක්‍ෂණයෙන් දානමය නම් වේ. අභිධර්ම පර්යායට පැමිණ වනාහි පවත්නා වස්තුවක් අරබයා දෙමියි සිතින් සිතූ කාලයේ පටන් කුසල් වේ. අපර භාගයෙහි කයින් හෝ වචනයෙන් හෝ කළයුත්තක් කරමි යි කියන ලදී. මෙසේ දානමය (කුසලය) කාය - වචී - මනෝ කර්ම වශයෙන් ම ත්‍රිවිධ වෙයි. යම්කලෙක වනාහි කියන ලද ආකාර ඇති එම වස්තුව ලැබ කුලවංසාදී වශයෙන් සියතින් රත්නත්‍රය පුදයි ද, එකල්හි සීලමය කාය කර්මය වෙයි. යම්කලෙක කුලවංශාදී වශයෙන් ම අඹුදරු ආදීන් ද අණවා පූජා කරවයි ද එකල්හි වාක් කර්මය වෙයි. යම්කලෙක මාගේ කුලවංශය පෙළපත කුලප්‍රවේණිය මෙයයි. මේ කුලයේ පැවැත්ම යැයි පවත්නා වස්තුවක් අරබයා වර්ණාදානයක් දෙමියි සිතයි ද, එකල්හි මනෝකර්මය වෙයි. මෙසේ ශීලමය (කුශලය) කාය වාක් මනෝකර්ම වශයෙන් ත්‍රිවිධ වෙයි. යම්කලෙක වනාහි කියන ලද ආකාර ඇති එම වස්තුව ලැබ තෙරුවන් පුදා සක්මන් කරනුයේ ක්‍ෂය ව්‍යයයෙහි පිහිටුවයි. එකල්හි භාවනාමය කාය කර්මයක් වෙයි. වචනයෙන් විමසා බැලීමෙහි පිහිටන්නාට වාක් කර්මය වෙයි. කායාංග වාචාංගයන් නො සොලවා සිතින් ම සම්මර්ශනය පිහිටුවන්නාට මනෝකර්මය වෙයි. මෙසේ භාවනාමය කාය-වචී-මනෝකර්ම වශයෙන් ත්‍රිවිධ වෙයි. මෙසේ මෙහි දී ධර්මරාජයාණෝ රූපාරම්මණ කුසලය ත්‍රිවිධ පුණ්‍ය ක්‍රියාවස්තු වශයෙන් කර්මද්වාර නවයකින් බෙදා දැක්වූ සේක. ශබ්දාරම්මණ ආදීන්හි ද මේ ක්‍රමය මය.

බෙරහඬ ආදියෙහි දී වනාහි සිත් අලවන ශබ්දය අරමුණු කොට යට කී නයින් ම තුන් නියමයන්ගෙන් මේ කුසලය උපදී. එහි ශබ්දය අලමුල් මෙන් උපුටා හෝ නිලුපුල් මිටක් මෙන් අතේ තබා හෝ දෙන්නට නම් නො හැකි ය. වස්තු සහිත කොට දෙන්නා වනාහි ශබ්ද දානය දෙන්නේ නම් වෙයි. එහෙයින් යම්කලෙක ශබ්ද දානය දෙමියි බෙර මිහිඟු බෙර ආදියෙහි එක්තරා තූර්යයකින් ත්‍රිවිධරත්නයට උපහාර කෙරේද, මේ මාගේ ශබ්දදානය යැයි බෙර ආදිය තබවයි ද, ධර්මකථික භික්‍ෂූන් වහන්සේලාගේ කණ්ඨ ස්වරය පිණිස වූ තෙල්බෙහෙත් පැණි ආදිය

දෙයි ද, ධර්මශ්‍රවණ ඝෝෂා කරවයි ද, මිහිරිහඬින් කියයි ද, ධර්මකථා කියයි ද, ළඟ හුන් අයට කථා කියයි ද, අනුමෝදන කථා කරයි ද, එකල්හි දානමය ම වෙයි. යම්කලෙක මේ විධානය ම කුලවංශාදී වශයෙන් හෝ වත් වශයෙන් කරයි ද, එකල්හි ශීලමය වෙයි. යම්කලෙක මේ සියල්ල ම කොට මේ මෙතෙක් වූ ශබ්දය බ්‍රහ්මලෝකය ප්‍රමාණ විද ක්ෂයට යන්නේ ය. ව්‍යයට යන්නේ යැයි සම්මර්ශනය තබන්නේ ද, එකල්හි භාවනාමය වෙයි. එහි දානමය (කර්මය) වනාහි යම්කලෙක බෙර ආදිය ගෙන සියතින් උපහාර කෙරේ ද, නිතර උපහාර කිරීම පිණිස තබන්නේ තමුදු සියතින් තබයි ද, ශබ්ද දානය මගේයැයි ධර්මශ්‍රවණය ඝෝෂා කිරීමට යයි ද ධර්ම කථාව හඬ නැංවීම කිරීමට හෝ යයි ද, එකල්හි කායකර්මය වෙයි. යම්කලෙක්හි දරුවෙනි, යව් අපගේ ශබ්දදානය ත්‍රිවිධ රත්නයට උපහාර (පූජා) කරව් යැයි අණ කරයි ද, මාගේ ශබ්ද දානයයි. සෑමළුවෙහි මේ බෙරය, මේ මිහිඟු බෙරය තබව්යැයි අණ කරයි ද, තෙමේ ම ධර්මශ්‍රවණ ඝෝෂා කරවයි ද, ධර්මකථා කියයි ද, හඬනගා කියයි ද, එකල්හි වාක්කර්මය වෙයි. යම්කලෙක කායාංග වාචාංග නො සොල්වා ශබ්දදානය දෙමියි පවත්නා වස්තුව සිතින් පරිත්‍යාග කෙරේ ද, එකල්හි මනෝකර්මය වෙයි. සීලමය ද වෙයි. ශබ්දදානය නම් මාගේ කුලවංශයයි. කුල පෙළපතයි. කුල ප්‍රවේණිය යැයි බෙර ආදියෙන් සියතින් උපහාර කරන්නාට බෙර ආදිය සියතිස් සෑමළු ආදියෙහි තබන්නාට ධර්මකථිකයන්ට ස්වර බෙහෙත් සියතින් දෙන්නාට, වත් වශයෙන් බණ ඇසීම ඝෝෂණය බණ කථා කීම හඬ නගා කීම පිණිස යන්නාට ද කායකර්මය වෙයි. ශබ්ද දානය නම් අපගේ කුලවංශයයි. අපගේ පෙළපතයි. අපගේ ප්‍රවේණිය යි. දරුවෙනි, යම් බුද්ධරත්නාදියට උපහාර කරව් යැයි අණ කරන්නාට ද, කුලවංශ වශයෙන් ම තමාගේ බණකථාව හෝ හඬනගා කීම හෝ කරන්නාට ද වාක්කර්මය වෙයි. ශබ්ද දානය නම් මාගේ කුලවංශයයි. ශබ්ද දානය දෙමියි කාය වාචාංගයන් නො සොල්වා සිතින් ම පවත්නා වස්තුව පරිත්‍යාග කරන්නාට මනෝකර්මය වෙයි. භාවනාමය ද යම්කලෙක්හි සක්මන් කරමින් ශබ්දයෙහි ක්ෂයය, ව්‍යයය තබයි ද එකල්හි කාය කර්මය වෙයි. කායාංගය වනාහි නො සොල්වා සිතින් ම ශබ්දායතනය සම්මර්ශනය කරන්නාට මනෝකර්මය වෙයි. මෙසේ ධර්මරාජන් වූ භාග්‍යවතුන් වහන්සේ ශබ්දාරම්මණ කුසලය ද ත්‍රිවිධ පුණ්‍යක්‍රියා වස්තු වශයෙන් කර්මද්වාර නවයකින් බෙදා දැක්වූ සේක.

මූලගන්ධාදිය අතුරෙන් ද සිත් අලවන ගන්ධයක් අරමුණු කොට යට කී නයින් ම තුන් නියමයන්ගෙන් මේ කුසලය උපදී. එහි දී යම්කලෙක මූලගන්ධාදිය අතුරෙන් යම්කිසි ගඳක් ලැබ ගන්ධ වශයෙන් ගෙන මාගේ ගන්ධදානය යැයි බුද්ධ රත්නාදිය පුදයි ද, එකල්හි දානමය වෙයි. සියල්ල වර්ණ දානයෙහි කී නයින් ම විස්තර වශයෙන් දතයුතුයි. මෙසේ ධර්මරාජන් වූ භාග්‍යවතුන් වහන්සේ ගන්ධාරම්මණ කුශලය ද ත්‍රිවිධ පුණ්‍යක්‍රියා වශයෙන් දැක්වූ සේක.

මූල රසාදිය අතුරෙන් වනාහි සිත්ගන්නා වූ රසයක් අරමුණු කොට යට කී නයින් ම ත්‍රිවිධ නියමයන්ගෙන් කුසලය උපදී. එහි දී යම්කලෙක මූලරසාදිය අතුරෙන් යම්කිසි සිත්ගන්නා රස වස්තුවක් ලැබ රස වශයෙන් ගෙන මාගේ රසදානය යැයි දෙයි ද, පරිත්‍යාග කරයි ද, එකල්හි දානමය වේයැයි සියල්ල වර්ණදානයෙහි කී නයින් ම විස්තර වශයෙන් දතයුතුයි.

මෙහි දී ශීලමය කුශලයෙහි වනාහි සංඝයාට නො දී පරිභෝග කිරීම නම් අපට නුපුරුදුයැයි දොළොස් දහසක් භික්ෂූන්ට දෙවා මිහිරි රස අනුභව කළ දුට්ඨගාමිණී අභය රජුගේ වස්තුව ආදිකොට ඇති වස්තු මහා අට්ඨකථාවෙහි ආයේ ය. විශේෂය මෙය ම ය. මෙසේ ධර්මරාජන් වූ භාග්‍යවතුන් වහන්සේ රසාරම්මණ කුශලය ද ත්‍රිවිධ පුණ්‍යක්‍රියා වස්තු වශයෙන් කර්මද්වාර නවයකින් බෙදා දැක්වූ සේක.

ස්පර්ශාරම්මණයෙහි ද පෘථුවිධාතු තේජෝ ධාතු වායෝ ධාතු යන මහාභූත ත්‍රය ස්පර්ශාරම්මණ නම්. මෙතැන දී මොවුන්ගේ වශයෙන් යෝජනා නො කොට ඇඳ පුටු ආදීන්ගේ වශයෙන් කළයුතුයි. යම්කලෙක වනාහි ඇඳපුටු ආදියෙහි යම්කිසි සිත් අලවන ස්පර්ශ වස්තුවක් ලැබ පොට්ඨබ්බ වශයෙන් ගෙන මාගේ පොට්ඨබ්බදානය යැයි දෙයි ද පරිත්‍යාග කරයි ද, එකල්හි දානමය වේයැයි සියල්ල වර්ණදානයෙහි කීනයින් ම විස්තර වශයෙන් දතයුතුයි. මෙසේ ධර්මරාජන් වූ භාග්‍යවතුන් වහන්සේ පොට්ඨබ්බාරම්මණා කුසලය ද ත්‍රිවිධ පුණ්‍යක්‍රියා වස්තු වශයෙන් නවද්වාරයෙහි බෙදා දැක්වූ සේක.

ධර්මාරම්මණයෙහි ආධ්‍යාත්මික ආයතන සිය ත්‍රිලක්ෂණ අරූපී ස්කන්ධ තුන සියුම් රූප පසළොස නිර්වාණ ප්‍රඥාප්තිය යන මේ ධර්මයන්හි ඇතුළත් වූ ද ඇතුළත් නො වූ ද ධර්මයෝ ධර්මාරම්මණ

නම්. මෙතැන දී වනාහි මොවුන්ගේ වශයෙන් යෝජනා නො කොට ඕජදාන පානදාන ජීවිතදාන වශයෙන් කළයුතුයි. ඕජාදියෙහි වනාහි සිත් අලවන ධර්මාරම්මණයක් අරමුණුකොට යට කියන ලද නයින් ම තුන් නියමයන්ගෙන් මේ කුශලය උපදී. එහි දී යම්කලෙක මාගේ ඕජදානය යැයි ගිතෙල් වෙඬරු ආදිය දෙයි ද පාන දානයයැයි අෂ්ටවිධ පානයන් දෙයි ද, ජීවිතදානය යැයි සලාක බත් පාක්ෂික (පක්ෂයකට වරක් මැන) බත් සඟබත් ආදිය දෙයි ද අපහසුවෙන් වෙසෙන භික්ෂූන්ට බෙහෙත් දෙයි ද, වෙදුන් වෙත පමුණුවයි ද, දැල් විවෘත කරවයි ද, කෙමන් විනාශ කරවයි ද, සකුණපඤ්ජර (කුරුලු කූඩු) කුරුල්ලන් බැම්වලින් මිදීම කරවයි ද, මාඝාත බෙර (මැරීම තහනම් කරන බෙර) හසුරුවයි ද, ජීවිත ආරක්ෂාව පිණිස වූ මෙවැනි වෙනත් කර්ම කරයි ද, එකල්හි දානමය වෙයි. යම්කලෙක වනාහි ඕජදානය පානදානය ජීවිතදානය යන මේවා මාගේ කුලවංශයයි. කුල පෙළපතයි. කුල ප්‍රවේණියයි යනුවෙන් වත් වශයෙන් ඕජ දානාදිය පවත්වයි ද, එකල ශීලමය වෙයි. යම්කලෙක ධර්මාරම්මණයෙහි ක්‍ෂය ව්‍යය පිහිටුවයි ද, එකල්හි භාවනාමය වෙයි. දානමය වී පවත්නා කුසලය ද යම්කලෙක ඕජදාන පානදාන ජීවිතදාන සියති දෙයි ද, එකල්හි කායකර්ම වෙයි. යම්කලෙක පුත්‍රදාරාදීන් කැඳවා අණවා දෙවයි ද, එකල්හි වචීකර්ම වෙයි. යම්කලෙක කායාංග වාචාංගයන් නො සොල්වා ඕජදාන පානදාන ජීවිත දාන වශයෙන් පවත්නා වස්තුව දෙමියි සිතින් සිතයි ද, එකල්හි මනෝකර්මය වෙයි. යම්කලෙක වනාහි කියන ලද ආකාර ඇති පවත්නා වස්තුව කුලවංශාදී වශයෙන් සියතින් දෙයි ද, එකල්හි ශීලමය කාය කර්මයක් වෙයි. යම්කලෙක කුලවංශාදී වශයෙන් පුත්‍රදාරාදීන් අණවා දෙවයි ද, එකල්හි වාක්කර්ම වෙයි. යම්කලෙක කුලවංශාදී වශයෙන් ම යට කී ආකාර ඇති පවත්නා වස්තුව දෙමියි සිතින් සිතයි ද, එකල්හි මනෝකර්ම වෙයි. සක්මන් කරමින් ධර්මාරම්මණයෙහි ක්‍ෂය ව්‍යය පිහිටුවන්නාට වනාහි භාවනාමය කායකර්මය වෙයි. කායාංග නො සොල්වා වචනයෙන් ක්‍ෂය ව්‍යයය පිහිටුවන්නාට වාක් කර්මය වෙයි. කායාංග වාචාංගයන් නො සොල්වා සිතින් ම ධර්මාරම්මණයෙහි ක්‍ෂය ව්‍යයය පිහිටුවන්නාට මනෝකර්මය වෙයි. මෙසේ භාවනාමය කුශලය කාය වචී මනෝකර්ම වශයෙන් ත්‍රිවිධ වේ. මෙසේ මෙහිදී ධර්මරාජන් වූ භාග්‍යවතුන් වහන්සේ ධර්මාරම්මණ කුශලය ද ත්‍රිවිධ පුණ්‍යක්‍රියා වස්තු වශයෙන් කර්මද්වාර නවයකින් බෙදා දැක්වූ සේක.

මෙසේ මේ සිත නානා වස්තූන්හි නානාරම්මණ වශයෙන් දක්වන ලදී. මෙය වනාහි එක් වස්තුවක් වෙත ද නානාරම්මණ වශයෙන් ලැබේ ම ය. කෙසේ ද? සිව්පසය අතුරෙන් සිවුරෙහි අරමුණු සයක් ලැබේ. අභිනවයෙන් පඬු පෙවූ සිවුරෙහි වර්ණය වනාහි මනාප වූයේ ද දර්ශනීය වූයේ ද වෙයි. මේ වර්ණාරම්මණයයි. පරිභෝග කරන කල්හි පටපට යන ශබ්ද කෙරෙයි. මේ ශබ්දාරම්මණයයි. එහි යම් කළුවැල් ගස් ආදියක ගඳක් වේ නම් එය ගන්ධාරම්මණයයි. රසාරම්මණය වනාහි පරිභෝග රස වශයෙන් කියන ලදී. එහි යම් සුවපහස් බවක් වේ ද එය පොට්ඨබ්බාරම්මණයයි. සිවුර නිසා උපන් සැප වේදනාවක් වේ නම් එය ධර්මාරම්මණයයි. පිණ්ඩපාතයෙහි රසාරම්මණය නිරායාශයෙන් ම ලැබෙයි. මෙසේ සිවුපසයෙහි නානාරම්මණ වශයෙන් යොදා දානමයාදි භේදය දතයුතුයි.

මේ සිතට වනාහි අරමුණ ම නිබද්ධය, අරමුණින් තොරව නූපදනා හෙයිනි. ද්වාරය වනාහි අනිබද්ධය කවර හෙයින්ද? කර්මය අනිබද්ධ බැවිනි. කර්මය අනිබද්ධ කල්හි වනාහි ද්වාරය ද අනිබද්ධ ම වෙයි.

මෙහි අර්ථය ප්‍රකාශ කිරීම පිණිස මෙතැන දී මහා අට්ඨකථාවේ ද්වාරකථාව කියන ලදී. එහි කර්ම තුනකි. කර්මද්වාර තුනකි. විඥාන පසෙකි. විඥාන ද්වාර පසෙකි. ස්පර්ශ සයෙකි. ස්පර්ශද්වාර පසෙකි. අසංවර අටෙකි. සංවර අටෙකි. සංවරද්වාර අටෙකි. කුශල කර්මපථ දශයෙකි. අකුශල කර්මපථ දශයෙකි යැයි මෙය මෙතෙක් ද්වාර කථාවෙහි මාතෘකා තැබීම නම්. එහි දී කර්මත්‍රය පළමුවෙන් කියන ලද නමුදු ඒවා තබා පළමුවෙන් කර්මද්වාරත්‍රය බෙදා දක්වන ලදී. කවර තුනෙක් ද? කාය කර්මද්වාරය වචීකර්මද්වාරය, මනෝකර්මද්වාරය යනුයි. එහි උපාදින්නක ආහාර සමුට්ඨාන, උතු සමුට්ඨාන, චිත්ත සමුට්ඨාන යැයි කාය චතුර්විධය. එහි චක්ෂුරායතනය ආදිකොට ඇති ජීවිතේන්ද්‍රිය කෙළවරකොට ඇති අට ද කම්ම සමුට්ඨාන රූපයෝද කම්ම සමුට්ඨානයෝ ම ය. සතරධාතු වර්ණ ගන්ධ රස ඕජා යන අට උපාදින්නකාය නම්. ආහාරයෙන් හටගත් ඒ අට ම ආහාර සමුට්ඨානික කාය නම්. ඍතුයෙන් හටගත් අට උතුසමුට්ඨානික කාය නම්. සිතින් හටගත් අට චිත්ත සමුට්ඨානික කාය නම්. ඔවුනතුරෙන් කාය කර්මද්වාර යනු උපාදින්නක කායට නමක් නොවේ ම ය. අන් ඒවාට ද නමක් නො වේ. චිත්ත සමුට්ඨාන වූ රූප අටෙහි එක් විඥප්තියක් ඇත. එය

කාය කම්මද්වාර නම්. එය සඳහා කියන ලදී. 'ඒ රූපකාය විඥප්තිය කුමක් ද? කුශල සිතේ හෝ අකුශල සිතේ හෝ අව්‍යාකෘත සිතේ හෝ ඉදිරියට යන්නාගේ හෝ ආපසු එන්නාගේ හෝ ඉදිරිය බලන්නාගේ හෝ ආපසු බලන්නාගේ හෝ හකුළන්නාගේ හෝ දිග හරින්නාගේ කයෙහි දැඩිවීමක් විශේෂයෙන් දැඩිවීමක් දැඩි වූ බවක් විඥප්තියක් විඥාපනයක් විඥාපිත බවක් වේ ද, ඒ මේ රූපය කාය විඥප්තිය යි යනුයි. ඉදිරියට යමි. ආපසු එමි යැයි උපදනා සිත රූපය උපදවයි.

එහි පඨවී ධාතු ආපෝ ධාතු තේජෝ ධාතු වායෝ ධාතු ඒ ඇසුරු කළ වර්ණ ගන්ධ රස ඕජා යන අට වැදෑරුම් රූපයන්ගේ අභ්‍යන්තරයෙහි සිතින් උපදනා යම් වායෝ ධාතුවක් වේ ද එය තමා සමග උපන් රූපකාය දැඩි කරවයි දරයි සොලවයි ඉදිරියට යවයි ආපසු එවයි, එහි ඒකාවර්ජන වීථියෙහි ජවන් සිත් සතෙහි පළමු සිතින් උපදවන ලද වායෝ ධාතුව (තමා සමග එකට උපන් රූපකාය) දැඩි කරන්නට දරන්නට හැකිවෙයි. ඔබමොබ චලනය කරන්නට නො හැකි වෙයි. ද්විතීයාදියෙහි ද මේ ක්‍රමයම ය. සත්වන සිතින් උපන් (වායෝ ධාතුව) වනාහි යට සිත් සයෙන් උපදවන ලද වායෝධාතුව උපස්ථම්භ ප්‍රත්‍යය ලැබ තමා සමග සහජාත රූපකාය දැඩි කරන්නට දරන්නට චලනය කරන්නට ඉදිරියට යවන්නට ආපසු එවන්නට ඉදිරිය බලන්නට ආපසු බලන්නට හකුළුවන්නට දිගහැරවන්නට හැකිවෙයි. එයින් යෑම (ගමන) නම් ඇතිවෙයි. ඒම (ආගමන) නම් ඇතිවෙයි. (ගමනාගමනය නම් ඇතිවෙයි) යොදුනක් ගියේ ය. දසයොදුනක් ගියේයැයි කියයුතු බවට පමුණුවයි. යම්සේ වනාහි විය සතකින් ඇදිය යුතු ගැලෙහි පළමුවියෙහි යෙදූ ගොන්නු විය දරන්නට පමණක් හැකි වෙති. සක වනාහී නො පෙරළත්. දෙවැන්න ආදියෙහි ද මේ නයම ය. සත්වන වියෙහි වනාහි ගොනුන් යොදා දක්‍ෂ රථාචාර්යයෙක් වියගසෙහි හිඳ රැහැන් ගෙන සියල්ලන්ට පළමු (ගොනාගේ) පටන් කෙවිටෙන් අනී. එකල්හි සියලු ම ගොන්නු ඒකබලව විය ද දරත්. චක්‍ර ද පෙරළත්. ගැල ගෙන දස යොදුනක්, විසි යොදුනක් ගියහයි කිවයුතු බවට පැමිණෙත්. මෙය ද මෙසේ සිද්ධයැයි දතයුතුයි.

එහි යම් චිත්ත සමුට්ඨානික නයක් වේ ද එය විඥප්තිය නො වේ. සිතින් උපන් වායෝ ධාතුව සමග වනාහි සහජාත වූ රූපකාය දැඩි කරන්නට දරන්නට චලනය කරන්නට ප්‍රත්‍යය වන්නට සමත් එක් ආකාර විකාරයක් ඇත. මෙය විඥප්තිය නම්. එය අෂ්ටරූපයන් මෙන් සිතින්

උපන්නේ නො වේ. යම් සේ වනාහි අනිත්‍යාදී ප්‍රභේද ඇති ධර්මයන්ගේ ජරාමරණ බැවින් 'මහණෙනි, ජරාව මරණය අනිත්‍යයයි. හේතූන්ගෙන් හටගන්නා ලදී' යන ආදිය කියන ලදී. මෙසේ චිත්ත සමුට්ඨාන රූපයන්ගේ විඥප්ති භාවය නිසා එය ද චිත්ත සමුට්ඨාන නම් වෙයි. මෙය විඥාපනය කරයි ද, එකක් කායික කරණයයි. ඇස් හමුවෙහි සිටි අයෙක් වනාහි අතක් හෝ පයක් හෝ ඔසවත් ද, හිස හෝ බැම හෝ සොලවත් ද, මේ හස්තාදීන්ගේ ආකාරය චක්ෂුර්විඥය වෙයි. විඥප්තිය වනාහි චක්ෂුර්විඥෙය්‍ය නො වේ. මනෝ විඥෙය්‍ය ම ය, ඇසින් වනාහි හස්ත විකාරාදී වශයෙන් ස්පන්දනය වන (ගැහෙන-දඟලන) වර්ණාරම්මණය ම දක්නා ලැබේ. විඥප්තිය වනාහි මනෝද්වාරික සිතින් සිතා මෙතෙම මේ මේ දේ කරවයි යැයි හඟිම්යි යැයි දනියි. යම්සේ වනාහි නියං සමයෙහි වනයෙහි දිය ඇති තැන මිනිස්සු මේ සලකුණින් දිය ඇති බව දනිත්යැයි ගස් අග තලපත් ආදිය බඳවත් ද, සුරාසැල්දොර ධ්වජ නංවාලත් ද, වාතය පහර දී ගස මුදුන සොලවයි ද, දිය තුළ මසුන් දඟලද්දී බුබුළු නඟී ද, මහෝඝයත් (මහදිය දහරක්) ගලාගිය මාර්ගයෙහි තෘණ පත්‍ර සමූහය ගොඩ ගැසුනේ වෙයි ද, එහි දී තලපත් ධ්වජ ශාඛා චලන දියබුබුලු තෘණ පත්‍ර සමූහයන් දැක ඇසින් නො දක්නා ලද දෙය ද යම්සේ මෙහි (ජලය වන්නේ ය, සුරාව වන්නේ ය, මේ වෘක්ෂය වාතයෙන් පහරන ලද්දේ වෙයි. දිය තුළ මත්ස්‍යයෙක් වන්නේ ය. මෙතෙක් තැන් පැතිර දියදහර ගියේ වන්නේයැයි මනෝවිඥානයෙන් දනී. මෙපරිද්දෙන් ම විඥප්තිය ද චක්ෂුවිඥෙය්‍ය නො වේ. මනෝවිඥෙය්‍යම ය. ඇසින් වනාහි හස්තවිකාරාදී වශයෙන්) ස්එන්දනය වන වර්ණාරම්මණයම දකී, විඥප්තිය වනාහි මනෝද්වාරික සිතින් සිතා මෙතෙම මේ මේ දේ කරවයි සිතයි යැයි දැනගනී. හුදෙක් මෙය විඥාපනයෙන් ම විඥප්ති නම් නො වේ. දතයුතු බැවින් ද වනාහි විඥප්ති ම නම් වන්නේ ය. මෙය වනාහි අන්‍යයන්ගේ ද යටත්පිරිසෙයින් තිරිසන්ගත සතුන්ගේ ද ප්‍රකට වෙයි. ඒ ඒ තැන්හි රැස් වූ බලුසිවල් කපුටුගොන් ආදීහූ දණ්ඩක් හෝ කැටක් ගෙන පහර දෙන අයුරු දැක්වූ කල්හි මෙතෙම අපට පහර දෙනු කැමැත්තේ යැයි දැන එහෙ මෙහෙ පලායත්, ප්‍රාකාර බිත්ති ආදියෙන් මුවහ වූ අන්‍යයාගේ අප්‍රකට කාලයක් ද ඇත. එකෙණෙහි අප්‍රකට වූයේ නමුදු හමු වූවන්ගේ වනාහි ප්‍රකටභාවයෙන් විඥප්ති නම ම වේ.

චිත්ත සමුට්ඨානික කාය චලනය වෙද්දී වනාහි ඔවුන්ගේ උට්ඨානිකයා චලනය වේද චලනය නො වේ ද යත්, හේද එසේ ම

චලනය වෙයි. එය අනුව යන්නේ එය අනුව පවත්නේ වෙයි. ඒ මෙසේ ය ජලය ගමන් කරද්දී ජලයෙහි වැටුණු වියළි දඬු තෘණ පර්ණාදිය ද ජලය අනුව යන්නේ ම වෙයි. ජලය ගමන් කරද්දී ගමන් කරයි. සිටි කල්හි සිටී. මෙය ද එසේ සිදුවන බව දතයුතුයි. මෙසේ මෙය චිත්ත සමුට්ඨාන රූප අතුරෙන් විඥපති කායකර්ම ද්වාරය නමැයි දතයුතුයි. එම ද්වාරයෙහි සිද්ධ වූ යම් චේතනාවක් වේ ද යම් චේතනාවකින් ප්‍රාණඝාතය කෙරේ ද නුදුන් දේ ගනී ද මිථ්‍යාවෙහි හැසිරේ ද, ප්‍රාණඝාතාදියෙන් වළකී ද මෙය කායකර්ම නමි.

මෙසේ පරවාදයක් ඇතිකල්හි කාය ද්වාරයයි. එම ද්වාරයෙහි සිද්ධ වූ චේතනාව කාය කර්මයයි. කුශල හෝ අකුශලයැයි තැබිය යුතුයි. පරවාදයක් නැතිකල්හි වනාහි අව්‍යාකෘතයදැයි ත්‍රිකය සම්පූර්ණකොට තැබිය යුතුයි. එහි දී යම්සේ නගර ද්වාරයක් කළතැන ම සිටී. අඟලක් පමණවත් ඔබමොබ සක්මන් නො කරයි. ඒ ඒ ද්වාරයෙන් වනාහි මහජනයා හැසිරෙත්. මෙසේ ද්වාරයේ දී ද්වාරය නො හැසිරෙයි. කර්මය වනාහි ඒ ඒ ද්වාරයෙහි ඉපදීම් වශයෙන් හැසිරෙයි. එහෙයින් පෝරාණයෝ කීහ.

> දවාරෙ චරනති කමමානි දවාරා දවාරචාරිනො
> තසමා දවාරෙහි කමමානි අඤඤමඤඤං වවතථිකාති

කර්මයෝ ද්වාරයෙහි හැසිරෙත්. ද්වාරයෝ ද්වාරචාරීහු නො වෙත්. එහෙයින් කර්මයෝ ද්වාරයන්ගෙන් ඔවුනොවුන් වෙන්කරන ලදහ යනුයි.

එහිදී කර්මයෙන් ද්වාරය නම් ලබයි. ද්වාරයෙන් කර්මය ද (නම් ලබයි.) ඒ මෙසේයි. විඥානාදීන් උපදනා තැන් විඥානද්වාරය ස්පර්ශ ද්වාරය අසංවර ද්වාරය සංවර ද්වාරය යැයි නම් ලබයි. මෙසේ කායකර්මය උපදනා තැන කාය කර්මද්වාරය යැයි නම ලබයි. වචී මනෝ කර්මාදීන්හි දී ද මේ නය මැයි. යම්සේ වනාහි ඒ වෘක්ෂයන්හි අධිගෘහීත දේවතාවෝ හිඹුල් දෙවියා පලා දෙවියා කොහොඹ දෙවියා කොළොම් දෙවියා යැයි ඒ ඒ රුකින් නම් ලබත්. මෙපරිද්දෙන් ම කාය ද්වාරයෙන් කරන ලද කර්මය ද කාය කර්මය යැයි ද්වාරයෙන් නම ලබයි. වචීකර්ම මනෝ කර්මයන්හි ද මේ නය මැයි. එහි දී කය අනෙකකි. කර්මය අනෙකකි. කයින් කළ හෙයින් වනාහි කායකර්මය යැයි කියනු ලැබේ. එහෙයින් අර්ථකථාචාර්යවරු මෙසේ කීහ.

සූචියා චෙ කතං කම්මං සූචිකම්මනති වුච්චති
සූචි ච සූචිකම්මඤ්ච අඤ්ඤඤ්ඤමඤ්ඤඤ්ඤං වවත්ථිතා

වාසියා චෙ කතං කම්මං වාසිකම්මනති වුච්චති
වාසි ච වාසිකම්මඤ්ච අඤ්ඤඤ්ඤමඤ්ඤඤ්ඤ වවත්ථිතා

පුරිසෙන චෙ කතං කම්මං පුරිසකම්මනති වුච්චති
පුරිසො ච පුරිසකම්මඤ්ච අඤ්ඤඤ්ඤමඤ්ඤඤ්ඤං වවත්ථිතා

එවමෙවං:-

කායෙන චෙ කතං කම්මං කායකම්මනති වුච්චති
කායො ච කායකම්මඤ්ච අඤ්ඤඤ්ඤමඤ්ඤඤ්ඤං වවත්ථිතා'ති

'ඉඳිකටුවෙන් කරන ලද කර්මය (වැඩය) සූචි කර්මය (ඉඳිකටුවෙන් කළ වැඩය) යැයි කියනු ලැබේ. ඉඳිකටුවත් එයින් කළ වැඩයත් එකිනෙක වෙන්කරන ලදී.

වෑයෙන් කරන ලද වැඩය වාසිකර්මයැයි කියනු ලැබේ. වෑය ද වෑයෙන් කළ වැඩය ද එකිනෙක වෙන්කරන ලදී. පුරුෂයා විසින් කරන ලද වැඩය පුරුෂ කර්මය යැයි කියනු ලැබේ. පුරුෂයාත් පුරුෂ කර්මයත් එකිනෙක වෙන් කරන ලදී.

එපරිද්දෙන් ම:-

'කයින් කරන ලද කර්මය කායකර්මය යැයි කියනු ලැබේ. පුරුෂයාගේ පුරුෂ කර්මයත් එකිනෙක වෙන් කරන ලදී' යනුයි.

එසේ ඇතිකල්හි ද්වාර ව්‍යවස්ථානයක් නො යෙදේ ම ය. කෙසේ ද? කාය විඥප්තියෙහි වනාහි 'දවාරෙ චරනති කම්මානි' (කර්මයෙන් ද්වාරයෙහි හැසිරෙත්) යන වචනයෙන් වාක් කර්මය ද පවතී. එහෙයින් එයට කාය කර්මද්වාරය යැයි ව්‍යවස්ථානය යුතු නො වේ. කායකර්මය ද වචී විඥප්තියෙහි ද පවතී. එහෙයින් එයට කාය කර්මය යැයි ව්‍යවස්ථානය (නිගමනය) නො යෙදේ යත්, නො යුතු ද නො වේ. කවර හෙයින් ද? බොහෝසෙයින් කියා ඇතිහෙයින් මෙන්ම එය බහුල වශයෙන් කියන ලද හෙයින් ය. බොහෝසෙයින් ම වනාහි කායකර්මය ම කාය විඥප්තියෙහි පවතී. අන්‍යයෝ නො පවතිත්. එහෙයින් කාය කර්මය බොහෝසෙයින් පවත්නා හෙයින් එහි කායකර්මද්වාරභාවය සිද්ධ ය. බ්‍රාහ්මණ ග්‍රාමය,

අඹවනය, නාගවනය ආදීන්ගේ බ්‍රාහ්මණග්‍රාම ආදී භාවය මෙන් ද්වාර ව්‍යවස්ථානය (යෙදීම) යෙදේ. කායකර්මය වනාහි කාය ද්වාරයෙහි ම බහුල ව පවතී. වචී ද්වාරයෙහි අල්පය. එහෙයින් කායද්වාරයෙහි බහුල ව පවත්නා හෙයින් මෙහි කාය කර්මභාවය සිද්ධ ම ය. වනචරක පුල්ලකුමාරිකා ආදී ගෝචර කොට ඇත්තවුන්ගේ වනචරක ආදීභාවය මෙනැයි මෙසේ කර්ම ව්‍යවස්ථානය ද යෙදේ යනුයි.

කාය කම්මද්වාර කථා නිමියේ ය.

වචීකර්මද්වාර කථාවෙහි වනාහි චේතනා විරති ශබ්ද වශයෙන් වාචා යන්න ත්‍රිවිධය. 'මහණෙනි, අංග සතරකින් සමන්විත වචනය සුභාෂිත වෙයි. දුර්භාෂිත නො වෙයි. නුවණැතියන් විසින් අනුගමනය කරන ලද්දේ ද වෙයි' යනුයි. චේතනා වාචා නම්. 'සතර දුශ්චරිතයන්ගෙන් හෝ යම් ඉවත්වීමක් නො ඇලීමක් වේ ද, -පෙ- මෙය 'වාචා වචනය වාග්පථය කීම ඝෝෂාව ඝෝෂාකිරීම වචනය වචීභේදය යන මෙය ශබ්දවාචා නම්. මොවුනතුරෙහි වචීකර්මද්වාර යනු චේතනාවට නමක් නම් නො වේ ම ය. විරතියට ද නමක් නො වේ. ශබ්දය සමග වනාහි එක් විඥප්තියක් ඇත. මෙය වචීකර්මද්වාර නම් වේ. එය සඳහා (මෙසේ) කියන ලදී. 'ඒ වචී විඥප්ති රූපය කවරේ ද? කුසල සිතේ හෝ අකුසල සිතේ හෝ අව්‍යාකෘත සිතේ හෝ යම් වාචාවක් වචනයක් වාග්පථයක් කීමක් ඝෝෂාවක් ඝෝෂණ කර්මයක් වාචාවක් වාග් භේදයක් වේද මෙය වාචා යැයි කියනු ලැබේ. ඒ වාචාව පිළිබඳ යම් විඥප්තියක් විඥාපනයක් විඥාපනය කළ බවක් වේ ද, ඒ මෙය වචී විඥප්ති රූපයි' යනුයි. 'මෙය කියමි' එය කියමි' යැයි විතර්කනය කරන්නාට විතර්ක විස්ඵාර ශබ්දය (විතර්කය පැතිරෙන ශබ්දය) නම් ශබ්දයක් උපදී. මෙය 'සොත විඥෙය්‍ය නො වේ. මනෝ විඥෙය්‍යය' යැයි මහාට්ඨ කථාවෙහි ආයේ ය. ආගමට්ඨ කථාවන්හි වනාහි විතක්ක විප්ඵාර සද්ද යනු විතර්ක විස්ඵාර වශයෙන් උපන් දොඩවන්නවුන්ගේ නින්දෙන් ප්‍රවත්ත වූවන්ගේ ශබ්දය යි. සුත්වා යනු එය අසා යි. යමක් විතර්කනය කරන්නාගේ ඒ ශබ්ද උපන්නේ එය අනුව 'ඔබගේ සිත මෙසේ ය. ඔබගේ මෙබඳුය' යැයි කියයි යැයි කියා

වස්තු ද කියන ලදී. පට්ඨාන ප්‍රකරණයෙහි ද 'චිත්තය සමුට්ඨාන වූ සද්දායතනය සෝත විඤ්ඤාණයට ආරම්මණ පච්චය වශයෙන් ප්‍රත්‍ය වේ' යැයි ආයේ ය. එහෙයින් සෝත විඤ්ඤත්ති සට්ටනයකින් තොරව උපදනා අසෝක විඤ්ඤෙය්‍ය විතර්ක විස්ථාර ශබ්දයක් නම් නැත. 'මෙය කියමි' 'එය කියමි'යි උපදනා සිත වනාහි පඨවි ධාතු ආපෝ ධාතු තේජෝ ධාතු වණ්ණ ගන්ධ රස ඕජා යන අෂ්ටරූපයන් උපදවයි. ඔවුන්ගේ අභ්‍යන්තරයෙහි චිත්ත සමුට්ඨාන වූ පඨවි ධාතුව උපාදින්නක සිත සංඝට්ටනය වෙමින් ම උපදී. එම ධාතු සමුට්ඨාන සද්ද නමි. මෙය විඥප්තිය නො වේ. එම චිත්ත සමුට්ඨාන පඨවි ධාතුවේ වනාහි උපදින්නකය හා ගැටීමට හේතුභූත එක් ආකාර විකාරයෙක් ඇත. මෙය වචී විඤ්ඤත්තිය නමි. මෙයින් පසුව 'එය අෂ්ට රූපයන් මෙන් චිත්ත සමුට්ඨාන නො වේ' යන ආදි සියල්ල යට කියන ලද නයින් ම දතයුතුයි. මෙහි ද වනාහි තිස්සය, දත්තය, මිත්‍රය, යැයි කැඳවන්නාගේ ශබ්දය අසා විඥප්තිය මනෝද්වාරික සිතින් සිතා මෙතෙම මේ මේ දේ කරයි. සිතයි යැයි දනී. කාය විඥප්තිය මෙන් මෙය ද තිරිසන්ගත සතුන්ගේ ද ප්‍රකට වෙයි. එව යව යන ශබ්ද අසා තිරිසන්ගත සත්තු ද මෙතෙම මෙය කරයි හඟියි දැන එන්නාහු යන්නාහු වෙත්. ඔව්හු සමුට්ඨානික කාය චලනය කරත් ද, චලනය නො කරත් ද යන මේ වාරය වනාහි මෙහි නො ලබයි. පළමු චිත්ත සමුට්ඨානයෙන් උපත්ථම්භක කිසක් ද නැත. ඒ වචී ද්වාරයෙහි සිද්ධ යම් චේතනාවක් වේද එයින් බොරු කියයි ද කේලාම් කියයි ද එරුෂ වචන කියයි ද ප්‍රලාප දොඩයි ද මුසාවාදාදියෙන් වළකීද මේ වචීකර්ම නමි. මෙයින් මතු සියලු කර්ම ව්‍යවස්ථානයත් ද්වාර ව්‍යවස්ථානයත් යට කී නයින් ම දතයුතුයි යනුයි.

## වචී කම්මද්වාර කථා නිමියේ ය.

මනෝකර්මද්වාර කථාවෙහි වනාහි කාමාවචරාදී වශයෙන් සිව් වැදෑරුම් වූයේ මනස නම් වේ. එහි කාමාවචර (සිත) සිව්පනස් වැදෑරුම් වේ. රූපාවචර (සිත) පසළොස් වැදෑරුම් ය. අරූපාවචර (සිත) දොළොස් වැදෑරුම්ය. ලෝකෝත්තර (සිත) අටවැදෑරුම්යැයි සියල්ල ම අසූනව වැදෑරුම් වෙයි. මෙහි දී මෙය මනෝද්වාරය නම් නො වේයැයි නො කිවයුතු ය. එසේ ම මේ චේතනාව නම් කර්මය නො වේයැයි

නො කිව යුතු ය. යටත් පිරිසෙයින් පංච විඥාන සම්ප්‍රයුක්ත චේතනාව ද කර්මය මැයි මහා ප්‍රකරණයෙහි දක්වන ලදී. එපරිද්දෙන් ම මේ මනස නම් මනෝ ද්වාරය නො වේයැයි නො කිවයුතුයි. මෙහි දී (මෙසේ) කියන ලදී. මේ කර්මය කුමක් නම් කෙරේ ද යනුයි. රැස්කරයි. අභිසංස්කරණය කරයි. (පිඩු කරයි) සිතයි. කල්පනය කරයි. ප්‍රකල්පනය කරයි යනුයි. එසේ ඇතිකල්හි පංචවිඥාන චේතනාව කුමක් රැස් කරයිද? කුමක් අභිසංස්කරණය කරයි ද, කුමක් පිඩු කරයි ද, (සිතයි ද, කල්පනය කරයි ද ප්‍රකල්පනය කරයි ද?) යනුයි. ඒ චේතනාව වනාහි සහජාත ධර්මයන් සහජාත සම්ප්‍රයුක්ත ස්කන්ධයන් රැස්කරයි. අභිසංස්කරණය කරයි. පිඩු කරයි. සිතයි. කල්පනය කරයි. ප්‍රකල්පනය කරයි. මේ වාදයෙන් (ප්‍රයෝජන) කිම? මෙය සර්ව සංග්‍රාහක වශයෙන් කියන ලදී. මෙය වනාහි මෙහි තීරණයයි. ත්‍රෛභූමක කුසල් හා අකුසල් විසිනව වැදෑරුම් මනස මනෝකර්මද්වාර නම්.

ඒ මනෝ ද්වාරයෙහි සිද්ධ වූ යම් චේතනාවක් වේ ද, යම් චේතනාවකින් අභිධ්‍යා ව්‍යාපාද මිථ්‍යා දර්ශනයන් මෙන් ම අනභිධ්‍යා අව්‍යාපාද සම්‍යක් දර්ශනයක් ද ගනීද, මෙය මනෝකර්මය නම්. මින්පසුව සියලු කර්ම ව්‍යවස්ථානය මෙන් ම ද්වාර ව්‍යවස්ථානය ද යටකියන ලද නයින් ම දතයුතුයි යනුයි.

**මනෝ කර්මද්වාර කථාව නිමියේ ය.**

**මේ තුන කර්මද්වාර නම්.**

දැන් යම් කර්මත්‍රයක් තබා මේ කර්මද්වාර දක්වන ලදී. ඒවා මුල්කොට අවශේෂ ද්වාරකථාව පිළිබඳ මාතෘකාව තැබීමට විස්තර කථාවක් වෙයි. කාය කර්මය, වචී කර්මය, මනෝ කර්මයැයි කර්ම තුනකි. මේ කර්මය යනු කුමක් ද? චේතනාව හා චේතනා සම්ප්‍රයුක්ත වූ ඇතැම් ධර්මයෝ ය. එහි චේතනාවෙහි කර්මභාවය පිළිබඳ මේ සූත්‍රයෝ ය.

'මහණෙනි! මම චේතනාව කර්මය යැයි කියමි. සිතා කයින් වචනයෙන් මනසින් කර්ම කරයි.'

'ආනන්දය! කය ඇති කල්හි වනාහි කාය සංචේතනා හේතුවෙන් ආධ්‍යාත්මික සැපදුක් උපදී. ආනන්දය, වචනය ඇතිකල්හි වනාහි වචී සංචේතනා හේතුවෙන් ආධ්‍යාත්මික සැපදුක් උපදී. ආනන්දය! මනස ඇතිකල්හි වනාහි මනෝසංචේතනා හේතුවෙන් අධ්‍යාත්මික සැපදුක් උපදී.'

'මහණෙනි, කාය සංචේතනාව ත්‍රිවිධ ය. අකුසල කාය කර්මය දුක් උපදවන්නේ ය. දුක්විපාක ඇත්තේ ය. මහණෙනි, වචී සංචේතනාව චතුර්විධය. -පෙ- මහණෙනි, මනෝ සංචේතනාව ත්‍රිවිධ ය. කුසල මනෝ කර්මය සැප උපදවන්නේ ය. සැපවිපාක ඇත්තේ ය.'

'ඉදින් ආනන්දය! සමිද්ධි මෝඝපුරුෂ තෙමේ මෙසේ විචාරන ලදුව පෝතලීපුත්‍ර පරිව්‍රාජකයාට මෙසේ ප්‍රකාශ කරන්නේ ය. ඇවැත් පෝතලී පුත්‍රයෙනි, කයින් වචනයෙන් (හෝ) මනසින් සිතිය යුතු සැප වේදනා මෑත කර්මයක් කොට හෙතෙම සැප විඳී. -පෙ- අදුක්ඛමසුඛ වේදනීය (කර්මයක් කොට) හෙතෙම අදුක්ඛමසුඛ වේදනාවක් විඳී යනුයි. ආනන්දය! මෙසේ ප්‍රකාශ කරන්නා වූ සමිද්ධි මෝඝපුරුෂ තෙමේ පොතලිපුත්‍ර පරිව්‍රාජකයාට මනාව ප්‍රකාශ කරන්නේ ය' යනුයි.

මේ වනාහි චේතනාවෙහි කර්මභාවය පිළිබඳ සූත්‍රයෝ යි. චේතනා සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ කර්මභාවය වනාහි කර්ම චතුෂ්කයෙහි දක්වන ලදී. මෙය ද කියන ලදී.

'මහණෙනි, මා විසින් තමා විසින් විශේෂයෙන් ප්‍රත්‍යක්ෂ කොටගෙන ප්‍රකාශ කරන ලද කර්ම සතරෙකි. කවර සතරක් ද? මහණෙනි, අකුසල වූ අකුසල විපාක ඇති කර්මයක් ඇත. මහණෙනි, කුසල වූ කුසලවිපාක ඇති කර්මයක් ඇත. මහණෙනි, අකුසල් වූ ද කුසල් වූද අකුසල විපාක ද කුසල විපාක ද ඇති කර්මයක් ඇත. මහණෙනි, අකුසලක් නො වූ කුසලක් නො වූ අකුසලුත් නො වූ කුසලුත් නො වූ විපාක ඇති කර්මයක් ඇත. (එම) කර්මය කර්මක්ෂය පිණිස පවතී. මහණෙනි! කුසලාකුසල නො වූ කුසලාකුසල විපාක නැති කර්මක්ෂය පිණිස පවත්නා (ඒ) කර්මය කවරේ ද? මේ සපත්බෝධ්‍යාංගයෝ ය. සති සම්බොජ්ඣංගය -පෙ- උපේක්ෂා සම්බෝධ්‍යාංග යයි, මහණෙනි! මේ කර්මය අකුසල් හා කුසල් නො වූ අකුසලවිපාක නො වූ කර්මක්ෂය පිණිස පවත්නා කර්මය යැයි

කියනු ලැබේ. මහණෙනි, අකුසල් හෝ කුසල් නො වූ අකුසල හෝ කුසල විපාක නැති කර්මක්ෂය පිණිස පවත්නා කර්මය කවරේ ද? මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයමැයි, ඒ කවරේද යත්? සම්‍යක් දෘෂ්ටිය -පෙ- සම්‍යක් සමාධිය යි මහණෙනි, මෙය අකුසලයක් නො වූ කුසලක් නො වූ අකුසල හා කුසල විපාකත් නැති කර්මක්ෂය පිණිස පවත්නා කර්මයැයි කියනු ලැබේ' යනුයි.

මෙසේ බෝධාංග මාර්ග ප්‍රභේදයෙන් මේ පසළොස් ධර්මයෝ වනාහි කර්ම චතුෂ්කයෙහි දක්වන ලදී. අභිධ්‍යා ව්‍යාපාද මිථ්‍යාදෘෂ්ටි අනභිධ්‍යා අව්‍යාපාද සම්‍යක්දෘෂ්ටි යන මේ සයත් සමග විසිඑකක් චේතනා සම්ප්‍රයුක්ත ධර්මයෝ දතයුත්තාහ. එහි දී ලෝකෝත්තර මාර්ගය භජනය කරනුයේ කාය කර්මාදී ත්‍රිවිධ කර්මයන් භජනය කරයි. යමෙක් වනාහි දුශ්ශීල බවක හැසිරේ ද, එයින් සංවරවීම කායික සංවරය යැයි දතයුතුයි. යමෙක් වනාහි වචනයෙන් දුශ්ශීල බව වෙත හැසිරේ ද, එයින් සංවරවීම වාචසික සංවරය යැයි දතයුතුයි. මෙසේ සම්‍යක් කර්මාන්තය කාය කර්මයයි. සම්‍යක් වචනය වාක් කර්මයයි. මේ දෙක ගත් කල්හි සම්‍යක් ආජීවය එහි ඇතුළත් හෙයින් ගන්නා ලද්දේ ම වෙයි. යමෙක් වනාහි සිතින් දුශ්ශීලබවෙහි හැසිරේ ද, එයින් සංවරවීම මානසික (සංවරය) යැයි දතයුතුයි. එය දෘෂ්ටි සංකල්ප ව්‍යායාම සති සමාධි වශයෙන් පංචවිධ වෙයි. මේ පංචවිධය ද මනෝකර්ම නම්. මෙසේ ලෝකෝත්තර මාර්ගය භජනය කරවනු ලබන්නේ කර්මත්‍රය භජනය කරයි.

මේ ස්ථානයෙහි කර්ම සංසන්දනය නම් වෙයි. කායවාක් ද්වාරයන්හි වනාහි චලනයට පැමිණ කර්මපථයට නො පැමිණි (කර්මයක්) ඇත, මනෝද්වාරයෙහි ද හැසිරීමට පැමිණ කර්මපථයට නො පැමිණි (කර්මයක්) ඇත. එය ගෙන ඒ ඒ ද්වාරපාක්ෂිකය ම කළාහ. මේ එහි නයයි. යමෙක් මුව දඩයමෙහි යම්යි දුන්න සදයි. දුනුදිය ඔතයි. ශාස්ත්‍රය ගනී. බත් අනුභව කරයි. වස්ත්‍රයක් අඳී. මෙපමණකින් කායද්වාරයෙහි චලනයට පැමිණියේ වෙයි. හෙතෙම වනයෙහි දවස (ම) හැසිර යටත්පිරිසෙයින් සාවෙකු බළලෙකු පමණකුත් නො ලබයි. මේ අකුසලය කාය කර්මයක් වේ ද, නො වේ ද? නො වේය යනුයි. කවර හෙයින් ද ? කර්මපථයට නො පැමිණි හෙයින්, හුදෙක් වනාහි කාය දුශ්චරිතය නම් වන්නේයැයි දතයුතුයි. මත්ස්‍ය ගහණා දී ප්‍රයෝගයන්හි ද මේ නයමැයි. වාග් ද්වාරයෙහි ද මුව දඩයමෙහි යන්නෙමියි වහා දුනු ආදිය සදව් යැයි අණවා පළමු

නයින් ම වනයෙහි කිසිත් නො ලබන්නාට වාග් ද්වාරයෙහි යම්කිසි චලනයකට පැමිණිය ද, කර්මපථයට නො පැමිණි හෙයින් වනාහි වාක් කර්මයක් නො වෙයි. හුදෙක් වාක් දුශ්චරිතයක් නම් වන්නේයැයි දතයුතුයි. මනෝද්වාරයෙහි වනාහි වංක චේතනාව උපන් පමණකින් ම කර්මපථ භේදය ම වන්නේ ය. එය ද වනාහි ව්‍යාපාද වශයෙන්, ප්‍රාණඝාත වශයෙන් නො වේ. අකුශල කායකර්මය වනාහි කාය වාක් ද්වාරයන්හි උපදී. මනෝ ද්වාරයෙහි නූපදී. අකුශල වාක් කර්මය ද එසේ ය. අකුශල මනෝ කර්මය වනාහි ද්වාරත්‍රයෙහි ම උපදී. අකුශල කායවාක් මනෝ කර්මයෝ ද එසේ ය. කෙසේ ද? සියතින් ප්‍රාණඝාතනය කරන්නාගේ නුදුන් දේ ගන්නා ගේ මිථ්‍යාවේ හැසිරෙන්නාගේ කර්මය වනාහි කාය කර්මය ම වෙයි. ද්වාරය ද කායද්වාරය ම ය. මෙසේ වනාහි අකුශල කායකර්මය කාය ද්වාරයෙහි උපදී. ඒ සිත් හා සහජාත (එකට උපන්) අභිධ්‍යා ව්‍යාපාද මිථ්‍යාදෘෂ්ටීහු වනාහි චේතනා පාක්ෂික හෝ ගණන් නොගත යුත්තෝ වෙත්. යව අසුවල් නම් ඇත්තා දිවි තොර කරන්න. අසුවල් නම් ඇති භාණ්ඩය පැහැර ගන්නැයි අණ කරන්නාගේ කර්මය වනාහි කාය කර්මය වෙයි. ද්වාරය වාග් ද්වාරයයි. මෙසේ අකුශල කාය කර්මය වාග් ද්වාරයෙහි උපදී. ඒ සිත් හා සහජාත අභිධ්‍යා ව්‍යාපාද මිථ්‍යා දෘෂ්ටීහු වනාහි චේතනා පාක්ෂික හෝ ගණන් නො ගත යුත්තෝ වෙත්. ආචාර්යවරුන්ගේ සමානාර්ථ කථා මෙපමණි. විතණ්ඩවාදියා (මෙසේ) කී ය. 'අකුසල කාය කර්මය මනෝද්වාරයෙහි ද උපදී' යනුයි. හෙතෙම සංග්‍රහත්‍රයෙහි (=ත්‍රිපිටකයෙහි) ආරූඪ වූ සූත්‍රයක් ගෙනහැර දක්වයි කියන ලදුව මේ කුලුම්බ නම් සූත්‍රය ගෙනහැර දැක්වීය.

'මහණෙනි! නැවත අනිකක් කියමි. මේ ලෝකයෙහි ඍද්ධිමත් චේතෝවසීප්‍රාප්ත වූ ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් කුස තුළ වූ මේ ගැබ සුවසේ නො නික්මේ නම් ඉතා යෙහෙකැයි අනිකකගේ කුසෙහි වූ ගැබක් ලාමක වූ, සිතින් උපේක්ෂා කරන්නේ නො වේ ද, මහණෙනි! මෙසේ කුලුම්බයාගේ (ගර්භයාගේ) නැසීම වෙයි' යනුයි. මේ සූත්‍රය ගෙනහැර දක්වා (මෙසේ) කී ය. මෙසේ සිතූ පමණකින් ම අනුන්ගේ කුසෙහි වූ ගර්භය පෙණ පිඩක් මෙන් විනාශ වෙයි. මෙහි කායාංග චලනයන් හෝ වාචාංග චලනයක් හෝ කොයින් ද මේ අකුශල කාය කර්මය වනාහි මනෝ ද්වාරයෙහි ම උපදී යනුයි. ඔබගේ සූත්‍රයාගේ ඒ මේ අර්ථය තුලනය කරන්නෙමුයි කියා මෙසේ තුලනය කළහ. ඔබ ඍද්ධියෙන් අනුන් නැසීම කියයි. මේ ඍද්ධිය නම් අධිෂ්ඨාන ඍද්ධිය

විකුර්වණ ඍද්ධිය මනෝමය ඍද්ධිය ඥානවිස්ථාර ඍද්ධිය (සමාධි විස්ථාර ඍද්ධිය) ආර්ය ඍද්ධිය කර්මවිපාකජ ඍද්ධිය පුණ්‍යවතුන්ගේ ඍද්ධිය විද්‍යාමය ඍද්ධිය භාවනාමය ඍද්ධිය ඒ ඒ තන්හි සම්‍යක් ප්‍රයෝග හේතුවෙන් සමෘද්ධවීම් වශයෙන් වන ඍද්ධිය යැයි දශවිධය. එහි කවර ඍද්ධියක් (ඔබ) කියයි ද? යනුයි. භාවනාමය ඍද්ධියයි. කිම භාවනාමය ඍද්ධියේත් පරූපඝාත කර්මයක් වේ ද? එසේ ය, ඇතැම් ආචාර්යවරු එක්වරක් වේයැයි කියත්, යම්සේ වනාහි අනුන්ට පහරදෙනු කැමැත්තෙන් දියෙන් පිරුණු කළයක් දැමූ කල්හි කළයත් බිඳෙයි. දියත් නැසෙයි. මෙපරිද්දෙන් භාවනාමය ඍද්ධියෙන් එක්වරක් පරූපඝාත කර්මය වෙයි. එතැන් පටන් වනාහි එය නස්නේ ය යනුයි. ඉක්බිති භාවනාමය ඍද්ධියෙන් එක්වරක්වත් දෙවරක්වත් ඒ පරූපඝාත කර්මය නො වේයැයි කියා ඒ දැන්වීමට එන්නාහු විචාළහ. කිම භාවනාමය ඍද්ධිය කුසල ද අකුසල ද අව්‍යාකෘත ද සැපවේදනා සහගත ද දුක්වේදනා සහගත ද අදුක්ඛමසුඛ වේදනා සහගත ද සවිතර්ක සවිචාර ද අවිතර්ක අවිචාර ද රූපාවචර ද අරූපාවචර ද යනුයි.

මේ ප්‍රශ්නය යමෙක් දනී ද හෙතෙම මෙසේ කියයි. භාවනාමය ඍද්ධිය කුසල හෝ (අකුසල හෝ) අව්‍යාකෘත වෙයි. අදුක්ඛමසුඛ වේදනීයමය. අවිතර්ක අවිචාරමය, රූපාවචරමය යනුයි. හෙතෙම මෙසේ කිවයුත්තේ ය. ප්‍රාණඝාත චේතනාව කුශලාදිය අතුරෙහි කවර කොට්ඨාශයක් භජනය කෙරේ ද? කියායි. දන්නා තැනැත්තේ (මෙසේ) කියයි. ප්‍රාණඝාත චේතනාව අකුශලමය, දුඃඛවේදනීය ම ය. සවිතර්ක සවිචාර ම ය. කාමාවචරමය යනුයි. මෙසේ ඇතිකල්හි ඔබගේ ප්‍රශ්නය කුශලත්‍රිකය හා නො ගැළපේ ම ය. වේදනාත්‍රිකය සමග ද නොගැළපේ ම ය. විතර්කත්‍රිකය සමග ද නොගැළපේ ම ය. භූම්‍යන්තර සමග ද නො ගැළපේ ම ය. කිමෙක් ද මෙබඳු මහා සූත්‍රයක් නිරර්ථක ද, නිරර්ථක නො වේ. ඔබ වනාහි මෙහි අර්ථය නො දනී. 'ඉද්ධිමා චෙතොවසිප්පතෙතා' යන මෙහි භාවනාමය ඍද්ධිය අදහස් නො කෙරේ. අථර්වණ (ඉන්ද්‍රජාලික) ඍද්ධි ම අපේක්ෂිතයි. මෙහි දී වනාහි ලැබෙනුයේ එයයි. එය වනාහි කාය වාක් ද්වාරයන් හැර කළ නො හැකි ය. අථර්වන් ඍද්ධිකයෝ වනාහි සත්දිනක් ලුණු රහිත ආහාර අනුභව කොට කුසතණ අතුරා පොළොවෙහි සයනය කෙරෙමින් තපසෙහි හැසිර සත්වන දිනයෙහි සොහොන්බිම සරසා සත්වන පියවරෙහි සිට අත පෙරළමින් මුවින් විද්‍යාව ජපකරත්. ඉක්බිති ඔවුන්ගේ කර්මය සමෘද්ධ වෙයි. මෙසේ මේ ඍද්ධියත් කාය වාක් ද්වාරයත්

හැර කළ නො හැකි ය. කාය කර්මය මනෝ ද්වාරයෙහි නූපදීයැයි මෙහි නිගමනයට එළඹිය යුතුයි.

හස්ත මුද්‍රාවෙන් මුසාවාදාදිය කියන්නාගේ කර්මය වනාහි වචී කර්මයයි. ද්වාරය වනාහි කායද්වාරය වෙයි. මෙසේ අකුශල වචීකර්මය ද කායද්වාරයෙහි උපදී. ඒ සිත් හා එකට උපන් අභිධ්‍යා ව්‍යාපාද මිථ්‍යාදෘෂ්ටීහු වනාහි චේතනාපාක්ෂික හෝ අභ්‍යවහාරිකයෝ වෙත්, වාග්භේද කොට මුසාවාදාදිය කියන්නාගේ කර්මය ද වචීකර්මයි. ද්වාරය ද වාග්ද්වාරය මය. මෙසේ අකුශල වාක් කර්මය වාග් ද්වාරයෙහි උප දී. ඒ සිත් හා එකට උපන් අභිධ්‍යා ව්‍යාපාද මිථ්‍යාදෘෂ්ටීහු වනාහි චේතොපාක්ෂික හෝ අබ්‍යවහාරිකයෝ වෙත්. මෙපමණක් ආචාර්යවරුන්ගේ සමානාර්ථ කථා නම්.

විතණ්ඩවාදියා වනාහි (මෙසේ) කී ය. 'අකුශල වචීකර්මය මනෝ ද්වාරයෙහි ද උපදී' යනුයි. සංග්‍රහත්‍රයෙහි ඇතුළත් සූත්‍රයක් ගෙනහැර දක්වයි කියන ලද හෙතෙම උපොසථක්ඛන්ධකයෙක් මේ සූත්‍රය ගෙනහැර දැක්වී ය. 'යම් භික්ෂුවක් වනාහි තුන්වාරය දක්වා අසවනු ලබද්දී සිහිකරනුයේ පවත්නා වූ ඇවත ප්‍රකට නො කරන්නේ නම් මුසාවාදය සිදුවන්නේ ය' යන මේ සූත්‍රය ගෙනහැර දක්වා කී ය. මෙසේ ඇවත ප්‍රකට නො කරනුයේ නිහඬව ම වෙනත් ඇවතට පැමිණෙයි. මෙහි කායාංග චලනයක් හෝ වාචාංග චලනයක් හෝ කොයින් ද? මේ අකුශල වාක්කර්මය වනාහි මනෝද්වාරයෙහි ම උපදී යනුයි. හෙතෙම (මෙසේ) කිවයුත්තේ ය. කිම මේ සූත්‍රය වනාහි පැමිණවිය යුතු අර්ථ ඇත්තේ ද නැතහොත් පමුණුවන ලද අර්ථ ඇත්තේ ද යනුයි. මාගේ සූත්‍රය පමුණුවන ලද අර්ථ ඇත්තේම ය යනුයි. හෙතෙම මෙසේ නො කියව, මෙහි අර්ථය තුලනය කරමුයි කියා මෙසේ විචාරිය යුතුයි, දැන දැන බොරු කීමෙහි කුමක් වේ ද? කියායි. දන්නා තැනැත්තේ සම්පජාන මුසාවාදයෙහි දුක්කටාපත්තිය වේයැයි කියයි. ඉක්බිති (මෙසේ) කිවයුතුයි. විනයෙහි මූල දෙකකි. කය ද වචනය ද යනුයි. සම්මා සම්බුදුන් විසින් වනාහි සියලු ආපත්තීහු මේ ද්වාර දෙකෙහි ම පණවන ලදහ. මනෝ ද්වාරයෙහි ආපත්ති පැණවීමක් නම් නැත. ඔබ විනයෙහි ඉතා ම ප්‍රකට දැනුමක් ඇත්තෙකි. යමෙක් ශාස්තෘන් වහන්සේ විසින් නො පණවන ලද තැන්හි ආපත්ති පණවයි ද සම්මා සම්බුදුන් අභිභවා කියයි. ජින චක්‍රයට පහර දෙයි යන ආදී වචනවලින් නිග්‍රහ කොට මත්තෙහි ප්‍රශ්නයක් ඇසිය

යුතුයි. සම්පජාන මුසාවාදය කිරීමෙන් උපදී ද නැතහොත් නො කිරීමෙන් දැයි කියායි. දන්නා තැනැත්තේ කිරීමෙනියි කියයි. ඉක්බිති (මෙසේ) කිවයුතුයි. ප්‍රකට නො කරන තැනැත්තා කවර ක්‍රියාවක් කරයි ද, කියායි. ඒකාන්තයෙන් ක්‍රියාව නො දක්නේ විනාශයට පැමිණෙන්නේ ය. ඉක්බිති මේ සූත්‍රයාගේ අර්ථයෙන් දැක්විය යුතුයි. මේ වනාහි මෙහි අර්ථයයි. යම් සම්පජාන මුසාවාදයක් වේ යැයි කියන ලද ද එය ආපත්ති වශයෙන් කුමක් වේද කවර ආපත්තියක් වේ ද යනු අර්ථයි. දුක්කටාපත්තියක් වෙයි. එය ද වනාහි මුසාවාද ලක්‍ෂණයෙහි, භාග්‍යවතුන් වහන්සේගේ වචනයෙන් වනාහි වචී ද්වාරයෙහි අකිරිය ව උපදනා ආපත්ති වේයැයි දතයුතුයි. මෙය ද කියන ලදී :-

අකාලපනෙනතා මනුජෙන කෙනචි
වාචා ගිරං නො ච පරෙ භණෙය්‍ය
ආපජ්ජෙය්‍ය වාචසිකං න කායිකං
පඤ්හාවෙසා කුසලෙහි චින්තිතා'ති

කිසියම් මනුෂ්‍යයකු සමග කථා නො කරන්නේ අන්‍යයන්ට වචනයක් නො කියයි ද වාචසික ඇවතට පැමිණෙන්නේ ය. කායික ඇවතට නො පැමිණෙන්නේ ය යන මේ ප්‍රශ්නය දක්‍ෂයන් විසින් සිතන ලදී යනුයි.

මෙසේ අකුශල වචීකර්මය මනෝද්වාරයෙහි නූපදී යැයි මෙහි නිගමනයට පැමිණිය යුතුයි. යම් කලෙක්හි වනාහි අභිධ්‍යා සහගත සිතින් කායාංග චලනය කරනුයේ අත්ගැනීම් ආදිය කරයි ද, ව්‍යාපාද සහගත සිතින් දඬු පරාමර්ශනය ආදිය කරයි ද, මිථ්‍යාදෘෂ්ටි සහගත සිතින් කඳකුමර ශිව ආදීහු ශ්‍රේෂ්ඨයයි ඔවුන්ට වැඳීම ඇඳිලි බැඳීම භූතයන් සඳහා දෙන පිඬු දීම පිරිබඩ කිරීම ආදිය කරයි ද, එකල්හි කර්මය මනෝකර්ම වෙයි. ද්වාරය වනාහි කාය ද්වාරයයි. මෙසේ අකුශල මනෝකර්මය කාය ද්වාරයෙහි උපදී. මෙහි චේතනා වනාහි අබ්බොහාරිකය. යම්කලෙක්හි වනාහි අභිධ්‍යා සහගත සිතින් වාචාංග චලනය කරනුයේ යමක් අනුන්ට (අයත්) වේද එය මට (අයත්) වේ නම් ඉතා යහපතැයි අන්‍යයාගේ ධනය උපකරණ පිළිබඳව දැඩිව ලෝභ කරයි ද, ව්‍යාපාද සහගත සිතින් මේ සත්ත්වයෝ නැසෙත්වා. වඳ වෙත්වා. විනාශ වෙත්වා. නැතිවෙත්වා යි කියයි ද, මිථ්‍යාදෘෂ්ටි සහගත සිතින් දුන් දෙයෙහි විපාක නැත. යාගයෙහි විපාක නැත ආදිය කියයි ද, එකල්හි

කර්මය මනෝකර්ම වෙයි. ද්වාරය වනාහි වචී ද්වාරයයි. මෙසේ අකුශල මනෝකර්මය වචී ද්වාරයේ උපදී. මෙහි චේතනාව වනාහි ගණන් නො ගත යුතු ය. යම්කලෙක වනාහි කායාංග වාචාංගයන් චලනය නො කොට රහසිගත ව හිඳ අභිධ්‍යා ව්‍යාපාද මිථ්‍යාදෘෂ්ටි සහගත සිත් උපදවයි ද එකල්හි කර්මය මනෝ කර්මයි. ද්වාරය ද මනෝද්වාරය ම ය. මෙසේ අකුශල මනෝකර්මය මනෝද්වාරයෙහි උපදී. මෙතැන වනාහි චේතනාව ද චේතනා සම්ප්‍රයුක්ත ධර්මයෝ ද මනෝ ද්වාරයෙහි ම උපදිත්. මෙසේ අකුශල මනෝකර්මය ද්වාරත්‍රයෙහි ම උපදීයැයි දතයුතුයි.

'කාය වාක් මනෝකර්ම වූ කුශලයෝ ද එසේ යැ'යි යමක් කියන ලද ද, එහි මේ නයයි. යම්කලෙක්හි වනාහි කිසියම් හේතුවකින් කියන්නට නො හැකි ව ප්‍රාණඝාත අදින්නාදාන කාමමිථ්‍යාචාරයන්ගෙන් වෙන්වෙමියි මේ ශික්ෂාපදයන් හස්තමුද්‍රාවෙන් ගනී ද, එකල්හි කර්මය කායකර්මයි. ද්වාරය ද කායද්වාරය ම ය. මෙසේ කුශල කායකර්මය කායද්වාරයෙහි උපදී. ඒ සිත් සමග වූ අභිධ්‍යාදීහු චේතනාපාක්ෂික හෝ අබ්බෝහාරික වෙත්. යම්කලෙක වනාහි ඒ ශික්ෂාපදයන් ම වාග්භේද කොට ගනී ද, එකල්හි කර්මය කායකර්මයි. ද්වාරය වනාහි වචීද්වාරය වෙයි. මෙසේ කුශල කායකර්මය වාග් ද්වාරයෙහි උපදී. ඒ සිත් හා සහගත වූ අනභිධ්‍යාදීහු චේතනා පාක්ෂික හෝ අබ්බෝහාරික වෙත්. යම්කලෙක වනාහි ඒ ශික්ෂාපදයන් දෙනුලබන කල්හි කාය වාචාංගත් චලනය නො කොට සිතින් ම ප්‍රාණඝාත අදින්නාදාන කාමමිථ්‍යාචාරයන්ගෙන් වෙන්වෙමියි ගනී ද, එකල්හි කර්මය කායකර්මයි. ද්වාරය වනාහි මනෝද්වාරය වෙයි. මෙසේ කුශල කායකර්මය මනෝද්වාරයෙහි උපදී. ඒ සිත් හා සහගත වූ අනභිධ්‍යාදීහු චේතනාපාක්ෂික හෝ අබ්බෝහාරික වෙත්. මුසාවාද වේරමණී ආදී වූ සතර ශික්ෂාපදයන් කියන ලද ක්‍රමයෙන් ම කායාදියෙන් ගන්නාගේ කුශල වචීකර්මය ද්වාත්‍රයෙහි ම උපදී යැයි දතයුතුයි. මෙහි දී අනභිධ්‍යාදීහු චේතනා පාක්ෂික හෝ අබ්බෝහාරික වෙත්. අනභිධ්‍යාදිය සහගත වූ සිතින් කායාංගය චලනයකොට සෑමළු හැමදීම සුවඳමල් ආදිය පිදීම, චෛත්‍ය වන්දනා ආදිය කරන්නාගේ කර්මය මනෝකර්මය වෙයි. මෙසේ කුශල මනෝකර්මය කායද්වාරයෙහි උපදී. මෙහි චේතනාව වනාහි අබ්බෝහාරික ය. අනභිධ්‍යාසහගත සිතින් වාචාංග චෝපනය කොට අන්‍යයාගේ යම් ධනයක් උපකරණයක් වේ නම් එය මාගේ වේවායි විෂම ලෝභ නො කරන්නාගේ අව්‍යාපාද සහගත සිතින් සියලු සත්ත්වයෝ අවෛරී වූවාහු ව්‍යාපාද රහිත වූවාහු නිදුක් වූවාහු සුවසේ තමන් පරිහරණය

කෙරෙත්වායි කියන්නාගේ, සම්‍යක් දෘෂ්ටි සහගත සිතින් දුන් දෙයෙහි විපාක ඇතැයි ආදිය කියන්නාගේ කර්මය මනෝකර්මය වෙයි. ද්වාරය වනාහි වචී ද්වාරයයි. මෙසේ කුශල මනෝකර්මය වචී ද්වාරයෙහි උපදී. මෙහි චේතනාව වනාහි අබ්බොහාරිකය. කායාංග වාචාංගයන් චලනය නො කොට රහසිගතව හිඳ සිතින් ම අනභිධ්‍යාදි සහගත සිත් උපදවන්නාගේ කර්මය මනෝකර්මයයි. ද්වාරය ද මනෝද්වාරයමය. මෙසේ කුශල මනෝකර්මය මනෝද්වාරයෙහි උපදී. මෙතැන වනාහි චේතනාව ද චේතනා සම්ප්‍රයුක්ත ධර්මයෝ ද මනෝද්වාරයෙහි ම උපදිත්. එහි අණ කිරීමකින් උපන් ප්‍රාණඝාත අදින්නාදාන ආදියෙහි කර්මය ද කායකර්මයයි ද්වාරය ද කර්ම වශයෙන් ම කායද්වාරය යැයි කියනුයේ කර්මය රකී. ද්වාරය බිඳී නම්, හස්තමුද්‍රාවෙන් උපන් මුසාවාදාදියෙහි ද්වාරය ද කායද්වාරයයි. කර්මය ද ද්වාර වශයෙන් ම කියනුයේ ද්වාරය රකී කර්මය බිඳී නම් වේ. එහෙයින් කර්මය රකිම්යි ද්වාරය නො බිඳිය යුතුයි. ද්වාරය රකිම්යි කර්මය නො බිඳිය යුතුයි. මේ කියන ලද නයින් ම වනාහි කර්මය ද ද්වාරය ද දතයුතුයි. මෙසේ කියනුයේ වනාහි කර්මයත් නො බිඳී ද්වාරයත් නො බිඳී යනුයි.

කර්ම කථාව නිමියේ ය.

දැන් පංචවිඤ්ඤාණ පංචවිඤ්ඤාණද්වාර ආදියෙහි චක්ඛු විඤ්ඤාණය සෝත විඤ්ඤාණය ඝාණ විඤ්ඤාණය ජිව්හා විඤ්ඤාණය කාය විඤ්ඤාණය යන මේවා පංච විඤ්ඤාණ නම් වේ. චක්ඛු විඤ්ඤාණ ද්වාරය සෝත - ඝාණ - ජිව්හා කාය විඤ්ඤාණ ද්වාරය යැයි යන මේවා පංච විඤ්ඤාණ ද්වාර නම් වේ. මේ පංච ද්වාරයන්ගේ වශයෙන් උපන් චේතනාව කායකර්මය නො වේ ම ය. වචී කර්මය ද නො වේ. මනෝකර්මය ම වන්නේයැයි දතයුතුයි. චක්ඛු සම්ඵස්සය සෝත-ඝාණ-ජිව්හා-කාය සම්ඵස්ස යන මේවා වනාහි ෂඩ් ස්පර්ශයේ නම්. චක්ඛු සම්ඵස්ස ද්වාරය යන මේවා ෂට් ස්පර්ශද්වාර නම් වේ. චක්ඛු අසංවරය, සෝත-ඝාණ-ජිව්හා-පසාද කාය-චෝපන කාය අසංවරය, වාචා අසංවරය, මනෝ අසංවරය යන මේ අට අසංවර නමි. ඔව්හු අර්ථ වශයෙන් දුශ්ශීල බව, සිහිමුළා බව, අඥාන බව, නො ඉවසීම, කුසීත බව යන මේ පංච ධර්මයෝ වෙත්. ඔවනතුරෙන් එක් ධර්මයක්වත් පංචද්වාරයෙහි වොත්ථපනය අවසන්කොට ඇති සිත්වල නූපදී. ජවන ක්‍ෂණයෙහි ම

උපදී. ජවනයෙහි උපන්නේ ද පංචද්වාරයෙහි අසංවර යැයි කියනු ලැබේ. චක්ඛු විඤ්ඤාණ සහජාත වූ ඵස්සය වනාහි චක්ඛු සම්ඵස්ස නම්. චේතනාව මනෝකර්ම නම්. ඒ සිත මනෝකම්මද්වාර නම්. චේතනාව මනෝකම්ම නම්. එහි පංචවිධ අසංවරය නැත. සම්පටිච්ඡනය සමග උපන් ඵස්ස මනෝ සම්ඵස්ස නම්. චේතනාව මනෝකර්ම නම්. ඒ සිත මනෝකර්ම ද්වාර නම්. මෙහි ද අසංවරයක් නම් නැත. සන්තීරණ වොත්ථපනයන්හි ද මේ නයම ය. ජවනය සමග උපන් ඵස්සය වනාහි මනෝසම්ඵස්ස නම්. චේතනාව මනෝකර්ම නම්. සිත මනෝකර්මද්වාර නම්. මෙහි අසංවරය චක්ඛු අසංවර නම් වෙයි. සෝත - ඝාණ - ජිව්හා පසාද කාය ද්වාරයන්හි ද මේ නය ම ය. යම්කලෙක වනාහි රූපාදිය අතුරෙන් එක්තරා අරමුණක් ඇති මනෝද්වාරික ජවනය වචී ද්වාරයෙන් තොර ව සුද්ධකායද්වාර සංඛ්‍යාත චලනයට පමුණුවමින් උපදී ද, එකල්හි ඒ සිත සමග සහජාත වූ ඵස්සය මනෝ සම්ඵස්සය නම්. චේතනාව කාය කර්මය නම්. ඒ සිත වනාහි අබ්බොහාරිකය, චලනය උපන් බැවින් මනෝද්වාර යන නමට පැමිණෙයි. මෙහි අසංවරය සෙලවෙන කාය අසංවරය නම්. යම්කලෙක එවැනිම ජවනයක් කායද්වාරයෙන් තොරව සුද්ධ වචීද්වාර සංඛ්‍යාත සෙලවීමට පමුණුවමින් උපදී ද එකල්හි ඒ සිත හා සහජාත වූ ඵස්සය මනෝ සම්ඵස්සය නම්. චේතනාව වචීකර්මය නම්. ඒ සිත වනාහි අබ්බොහාරිකය. චලනය උපන් හෙයින් මනෝද්වාර යන නමට නො පැමිණෙයි. මෙහි අසංවරය වාචා අසංවරය නම්. යම්කලෙක වනාහි ජවන සිත කායවචී ද්වාරයන්ගෙන් තොර ව සුද්ධ මනෝද්වාරය ම වී උපදී ද එකල්හි ඒ සිත සමග සහජාත වූ ස්පර්ශය මනෝ මනෝසම්ඵස්සය නම්. චේතනාව මනෝකර්මය නම්. සිත මනෝකර්මද්වාරය නම්. මෙහි අසංවරය මනෝ අසංවරය නම්. මේ අට අසංවරයන්ගේ වශයෙන් චක්ඛු අසංවර ද්වාරය සෝත-ඝාණ-ජිව්හා-පසාදකාය-චෝපනකාය-වාචා-මනෝ අසංවර ද්වාරය යැයි මේ අට අසංවරයෝ දතයුත්තාහ. චක්ඛු සංවරය සෝත - ඝාණ ජිව්හා - පසාදකාය - චෝපනකාය - වාචා මනෝ අසංවර ද්වාරය යැයි මේ අට අසංවරයෝ දතයුත්තාහ. චක්ඛු සංවරය සෝත-ඝාණ-ජිව්හා-පසාදකාය-චෝපනකාය-වාචා-මනෝ සංවරයැයි යන මේවා වනාහි අෂ්ට සංවර නම්. ඔව්හූ අර්ථ වශයෙන් සීල සති ඤාණ ඛන්ති විරිය යැයි මේ පංච ධර්මයෝ වෙත්. ඔවුනතුරෙන් ද එකම ධර්මයක්වත් වොත්ථපනය කෙළවර කොට ඇති පංචද්වාර සිත්හි නූපදී. ජවන ක්ෂණයෙහිම උපදී. ජවනයෙහි උපන්නේ නමුදු පංචද්වාරයෙහි සංවරය යැයි කියනු ලැබේ. ඒ සියල්ලන්ගේ ම චක්ඛුවිඤ්ඤාණ සහජාත ස්පර්ශය

වනාහි චක්ඛු සම්ඵස්සයයි යන ආදියෙන් අසංවරයෙහි කියන ලද නයින්ම උත්පත්තිය දතයුතුයි. මෙසේ මේ අටවැදෑරුම් සංවරයන්ගේ වශයෙන් චක්ඛු සංවර ද්වාරය -පෙ- මනෝසංවර ද්වාරය යැයි මේ අට සංවරයෝ යැයි දතයුත්තාහ.

ප්‍රාණඝාතය, අදින්නාදානය, කාමමිථ්‍යාචාරය, මුසාවාදය, කේළාම් කීම, ඵරුෂවචන කීම, සම්පප්‍රලාපය, අභිධ්‍යාව, ව්‍යාපාදය, මිථ්‍යාදෘෂ්ටිය යැයි මේ වනාහි දශ අකුශල කර්මපථයෝ නම් වෙත්. එහි ප්‍රාණියකුගේ නැසීම පාණාතිපාත නම්. ප්‍රාණවධය ප්‍රාණඝාතයැයි කියන ලද්දේ වෙයි. මෙහි ප්‍රාණ යනු ව්‍යවහාර වශයෙන් සත්වයායි. පරමාර්ථ වශයෙන් ජීවිතින්ද්‍රිය යි. ඒ ප්‍රාණියා කෙරෙහි ප්‍රාණියෙක යන හැඟීම ජීවිතේන්ද්‍රිය සිඳීම වූ උපක්‍රමයෙන් උපදවන ලද කායවාක් ද්වාරයන්ගෙන් එක්තරා ද්වාරයෙක පැවති වධක චේතනාව පාණාතිපාතයයි. එය ගුණවිරහිත තිරිසන්ගත ආදී ප්‍රාණීන් අතුරෙහි කුඩා ප්‍රාණීන් කෙරෙහි අල්පසාවද්‍යයි. මහාප්‍රාණීන් කෙරෙහි මහාසාවද්‍යයයි. කවර හෙයින් ද? ප්‍රයෝගය මහත් බැවිනි. ප්‍රයෝගය සමවුව ද වස්තු මහත් බැවිනි. ගුණවත් මනුෂ්‍යාදීන් අතුරෙහි අල්පගුණ ඇති ප්‍රාණීන් විෂයෙහි අල්පසාවද්‍යය. මහාගුණ ඇති ප්‍රාණීන් විෂයෙහි මහාසාවද්‍යයි. ශරීර ගුණයන්ගේ ස්වභාවය ඇතිකල්හි වනාහි ක්ලේශයන්ගේ හා උපක්‍රමයන්ගේ මෘදු බැවින් අල්පසාවද්‍යයි. තීව්‍ර බව ඇතිකල්හි මහා සාවද්‍යයැයි දතයුතුයි. එයට වනාහි ප්‍රාණියකු වීම ප්‍රාණියෙක යන හැඟීම වධක සිත උපක්‍රමය ඒ උපක්‍රමයෙන් මරණය (සිදුවීම) යැයි කරුණු පසෙක් වෙයි. සාහත්ථික (සියතින් මරණය සිදුකිරීම)ය, ආණත්තක (අණ කිරීමෙන් මරණය සිදුකිරීම) ය, නිස්සග්ගිය (ඉබේ මැරෙන්නට ඉඩ හැරීම) ස්ථාවරය, විද්‍යාමය, ඍද්ධිමය යැයි ප්‍රයෝග සයෙකි. මෙහි දී මෙය විස්තර කිරීම වනාහි අතිශයින් ප්‍රමාදයක් වෙයි. එහෙයින් එය විස්තර නො කරමු. මෙවැනි වෙනත් (විස්තර) ද අවශ්‍ය අය විසින් සමන්තපාසාදිකා නම් විනය අටුවාව බලාගත යුතුයි.

නුදුන් දෙය ගැනීම අදින්නාදානය යි. අනුන්ගේ දෙය පැහැරගැනීම සොරකම චෝරිකාව (සොරකම) යැයි කියන ලද්දේ වෙයි. එහි අදින්න යනු අනුන් විසින් අයිති කරගත් දෙයයි. යම් වස්තුවෙක්හි අන්‍යයා කැමති සේ ක්‍රියා කළහැකි තත්වයට පැමිණෙනුයේ අදණ්ඩාරහව (දඬුවමට නුසුදුසුව) නිදොස් වූයේ ද වෙයිද, අනුන් අයත් ඒ වස්තුවෙහි වනාහි අනුන් අයත්ය යන සංඥාව ඇති ව එය ගැනීමේ උපක්‍රමයෙන් උපදවන

ලද සොර චේතනාව අදින්නාදානයයි. එය හීන වූ පරසන්තක වස්තුවෙහි අල්පසාවද්‍යය, උසස් වූ වස්තුවෙහි මහාසාවද්‍යයය, කවර හෙයින් ද? වස්තුවේ උසස් බව නිසාය. වස්තුව සම ව ඇතිකල්හි ගුණාධිකයන් සතු වස්තුවෙහි මහාසාවද්‍ය වේ. ඒ ඒ ගුණාධිකයන් ගෙන එයින් හීනගුණ ඇතියා සතු වස්තුවෙහි අල්පසාවද්‍ය වේ. අන්‍යයා අයත් වස්තුවක් වීම අන්‍යයා අයත් වස්තුවක් ය යන හැඟීම සොරසිත් උපක්‍රමය එයින් පැහැරගැනීම යැයි එයට කරුණු පසෙකි. සාහත්ථිකාදී ප්‍රයෝග ද සයෙකි. ඔව්හු ද වනාහි පිළිවෙළින් ථෙය්‍යාවහාරය පසය්‍යාවහාරය යැයි මේ පංච අවහාරයන්ගේ වශයෙන් පවතිත්. මේ මෙහි සංක්ෂේපයයි. විස්තරය වනාහි සමන්තපාසාදිකාවෙහි කියන ලදී.

කාමේසු මිච්ඡාචාරො යන මෙකී වනාහි කාමේසු යනු මෛථුන හැසිරීම්වල ය. මිච්ඡාචාර යනු ඒකාන්තයෙන් නින්දිත ලාමක හැසිරීමයි. ලක්‍ෂණ වශයෙන් වනාහි අසද්ධර්ම අදහසින් කායද්වාරයෙහි පවත්නා නොයා යුතු තැන් ඉක්මවීමේ චේතනාව කාම මිථ්‍යාචාරයයි. මෙහි නො යා යුතු තැන් නම් පුරුෂයින්ට වනාහි මව විසින් රකිනු ලබන ස්ත්‍රිය, පියා විසින් රකිනු ලබන ස්ත්‍රිය, මව හා පියා විසින් රකිනු ලබන ස්ත්‍රිය, සහෝදරයා විසින් රකිනු ලබන ස්ත්‍රිය, සහෝදරිය විසින් රකිනු ලබන ස්ත්‍රිය, ඥාතීන් විසින් රකිනු ලබන ස්ත්‍රිය, ගෝත්‍රිකයන් විසින් රකිනු ලබන ස්ත්‍රිය, ධර්මයෙන් රකිනු ලබන ස්ත්‍රිය, ආරක්ෂා සහිත ස්ත්‍රිය සපරිදණ්ඩ ස්ත්‍රිය යැයි මාතුරක්ඛිතා ආදි දසදෙනා ය. ධනක්කීත ඡන්දවායිනී භොගවාසිනී පටවාසිනී ඔදපත්තකිනී ඔහට චුම්බටය, දාසි භාර්යාවය, කම්කරු භාර්යාවය, ඔජාහටය, මුහුක්ති කාය යන මේ ධනක්කීතාදි දසදෙනාය යන විසිවැදෑරුම් ස්ත්‍රීහුය. ස්ත්‍රීන් අතුරෙහි වනාහි සාරක්ඛ සපරිදණ්ඩ යන දෙදෙනාට ද ධනක්කීතාදි දසදෙනාටය යන දොළොස්දෙනාට මේ අන්‍ය පුරුෂයන්ට නොයා යුතු තැන් නම්. ඒ මිථ්‍යාචාර්ය වනාහි සීලාදී ගුණරහිත නොයා යුතු තැන්හි අල්ප සාවද්‍යය, සීලාදි ගුණ සම්පන්න අය කෙරෙහි මහා සාවද්‍යය. නොයා යුතු වස්තුවය. එය සේවනය කිරීමේ සිතය. සේවනය පිළිබඳ ප්‍රයෝගය, මාර්ගයෙන් මාර්ගය පැමිණවීම ඉවසීම යැයි එහි කරුණු සතරකි. එක් ප්‍රයෝගයක් සාහත්ථික ම ය.

මුසා යනු බොරුකීම පෙරදැරිකොට ගත්තහුගේ ඇති දෙය නැතිකරන වාක් ප්‍රයෝගය හෝ කාය ප්‍රයෝගය යි. බොරු කීමේ අදහසින්

එකිනෙකාට බොරු කියන කාය වාක් ප්‍රයෝගයෙන් උපන් චේතනාව මුසාවාදයයි. තවත් නයකි. මුසා යනු නොවූ අසත්‍ය වස්තුවකි. වාද යනු එය සිදුවූවක් ලෙසින් සත්‍ය ලෙසින් හැඟවීමයි. ලක්‍ෂණ වශයෙන් වනාහි අසත්‍ය වස්තුවක් සත්‍ය වශයෙන් අන්‍යයාට ඇඟවීමට කැමැත්තහුගේ එසේ ඇඟවීමේ දී උපන් චේතනාව මුසාවාදය යි. එය යම් අර්ථයක් විනාශ කරයි ද, එහි අල්ප බව අනුව අල්පසාවද්‍ය වෙයි. මහත්බව අනුව මහාසාවද්‍ය වෙයි. තව ද ගිහියන්ට තමන් සතු දෙය නො දෙනු කැමැත්තෙන් නැතැයි ආදී නයින් පැවතියේ අල්පසාවද්‍යය. සාක්‍ෂිව සිට අර්ථ විනාශය පිණිස කියන ලද්දේ මහා සාවද්‍යයි. පැවිද්දන්ට ස්වල්ප වූ හෝ තෙලක් හෝ ගිතෙල් හෝ ලැබ සිනා අදහසින් අද ගමේ තෙල් ගඟක් ගලන්නාක් මෙනැයි සිතේයැයි පුරාණ කථා නයින් පැවතියේ අල්පසාවද්‍යයි. නුදුටු දෙයක් ම වනාහි දක්නා ලද්දේ ය යන ආදී නයින් කියන්නවුන්ට මහා සාවද්‍යයි. එයට කරුණු සතරක් වෙයි. බොරු වස්තුවක් වීම, බොරු කීමේ සිත එයින් උපන් ව්‍යායාමය, අන්‍යයා ඒ අර්ථය ගැනීම යනුවෙනි. එක් ප්‍රයෝගයක් සාහත්ථික ම ය. එය කයින් හෝ කය පිළිබඳ වචනයෙන් හෝ අන්‍යයා විසංවාදන ක්‍රියාවක් කිරීමෙහි දතයුතුයි. ඉදින් ඒ ක්‍රියාවෙන් අන්‍යයා ඒ කාරණය දනී ද මෙය ක්‍රියාවෙන් උපදවන ලද චේතනා ක්‍ෂණයෙහි ම මුසාවාද ක්‍රියාව හා බැඳේ. යම්හෙයකින් වනාහි එසේ කය පිළිබඳ වචනයෙන් අන්‍යයාට බොරු කියයි ද, එසේ ම මොහුට මෙසේ කියවයි. අණ කරන්නේ ද පනත් ලියා ඉදිරියෙහි තබන්නේ ද මේ අර්ථය මෙසේ දතයුතුයැයි බිත්ති ආදියෙහි තබන්නේ ද (මෙසේ ම ය.) එහෙහයින් මෙහි ඈණවීම නිස්සග්ගිය. (තබා යාම) ස්ථාවර යන ප්‍රයෝග ද යෙදේ. අර්ථකථාවන්හි නො පැමිණි හෙයින් (විමසා) ගතයුතුයි.

පිසුණාවාචා යන ආදියෙහි යම් වචනයකින් යමෙකුට ඒ වචනය කියයි ද, ඔහුගේ හෘදයෙහි තමාට ප්‍රියභාවයත් අන්‍යයාට ප්‍රිය ශුන්‍යභාවයත් කෙරෙයි ද එය පිසුණාවාචාවයි. යම් වචනයකින් තමාත් අන්‍යයාත් ඵරුෂ (රළු) කෙරේ ද, යම් වචනයක් තමාත් ඵරුෂ ද කනට සැප නො වේ ද හෘදයංගම නො වේ ද මේ ඵරුසාවාචා නම්. යමෙකු විසින් යම්හෙයකින් නිරර්ථක හිස් වචනයක් කියයි ද, එය සම්පප්ඵලාපය යි. ඒවා මුල් වූ චේතනාවක් වේ ද එය ද පිසුනාවාචාදී නාමයම ලබයි. මෙහි දී ද එය ම අභිප්‍රේතයි යනුයි. එහි කිලිටි වූ සිත් ඇත්තහුගේ අනුන් බිඳවීම පිණිස හෝ තමාගේ ප්‍රියබව කැමැත්තෙන් හෝ කායවාක්

ප්‍රයෝගයෙන් උපදවන ලද චේතනාව පිසුණාවාචා ය. එය යමෙකු භේද කරයි ද ඔහුගේ අල්පගුණ බැවින් අල්ප සාවද්‍ය ය. මහත්ගුණ බැවින් මහාසාවද්‍ය ය. අන්‍යයා බිඳිය යුතු ය. මෙසේ මොව්හු නානත්වයට පැමිණෙත්. (වෙන්වීමට පැමිණෙත්) යැයි බිඳවීම පෙරදැරි කරගත් බව මෙසේ මම ප්‍රිය වෙමි. විශ්වාස වෙමි යි ප්‍රියයෙකු වීමේ කැමති බව එයින් උපන් උත්සාහය ඒ බව දැනගැනීම යැයි එයට කරුණු සතරකි. අන්‍යයා නො බිඳුණු කල්හි වනාහි කර්මපථ භේදයක් නැත. බිඳුණු කල්හි ම (කර්මපථ භේදය) වෙයි. අන්‍යයාගේ ධර්මස්ථාන සිඳින්නාක් වැනි (ඉතා නපුරු) කායවාක් ප්‍රයෝගයෙන් උපදවන ලද ඒකාන්තයෙන් පරුෂ වූ චේතනාව ඵරුෂාවාචාවයි. එය ප්‍රකට කිරීමපිණිස මේ වස්තුවකි. එක් දරුවෙක් වනාහි මවගේ වචනය නො පිළිගෙන වනයට යයි. ඔහු නැවැත්විය නො හැකි වූ මව කුළු මීදෙනක් හා ලුහුබඳීවායි ආක්‍රෝෂ කළා ය. ඉක්බිති ඔහුට එසේ ම මීදෙනක් මතුවිය. (හමුවිය) දරුවා මගේ මව යමක් විසින් කීවා ද එය නො වේවා. යමක් සිතින් සිතී ද එය වේවායි සත්‍යක්‍රියා කළේ ය. මීදෙන එහි ම බඳනා ලද්දක මෙන් සිටියාය. මෙසේ ධර්මච්ඡේදක ප්‍රයෝගයක් පවා සිතේ මෘදුබැවින් ඵරුෂවචන නොවෙයි. මව්පියෝ ඇතැම් විටෙක දරුවන්ට මෙසේ ද කියත්. සොරු තොප කැබලි කැබලි කරත්වා යනුයි. (එසේ නමුදු) ඔවුන් මත නෙළුම් පෙත්තකුදු වැටෙනු නො කැමති වෙත්. ආචාර්ය උපාධ්‍යායවරු ද කිසිවිටෙක ඇසුරු කරන්නවුන්ට (අතවැසියන්ට) මෙසේ කියත්, කිම මොව්හු නිර්ලජ්ජීහු ය. පවට බිය නැත්තෝ ය. මොවුන් බැහැර කරව යැයි කියත්. එසේ නමුදු ඔවුන්ගේ ආගමාධිගම සම්පත්තිය කැමති වෙත්. යම් සේ සිතේ මෘදුබැවින් ඵරුෂවචනය සිදු නො වේ ද? එසේ වචනයේ මෘදු බැවින් අඵරුෂ වචනය ද නො වේ. මරවනු කැමැත්තහුට මොහු සුවසේ සයනය කරවයි යන වචනය අඵරුෂ වචනයක් නො වේ. සිතේ රළු බැවින් මෙය වනාහි ඵරුෂවචන ම ය. එය යමක් සඳහා පවතී ද එය ඒ පිළිබඳ අල්පගුණතාවෙන් අල්පසාවද්‍ය වේ. මහත් ගුණතාව අනුව මහාසාවද්‍ය වේ. අන්‍යයා ආක්‍රෝෂ කළයුතු බව කිපුණු සිත ආක්‍රෝෂ කිරීම යැයි එයට කරුණු තුනකි.

අනර්ථයක් අඟවන කායවාක් ප්‍රයෝගයන්ගෙන් උපන් අකුශල චේතනාව සම්පප්‍රලාපයයි, එය භාවිතයේ මඳබැවින් අල්පසාවද්‍යය, භාවිතයේ මහත් බැවින් මහා සාවද්‍යය, භාරත යුද්ධය, සීතාහරණය ආදී නිරර්ථක කථා පෙරදැරි කරගත් බව එවැනි කථා කීමයැයි මෙයට කරුණු

දෙකකි. අන්‍යයන් එම කථාව නො පිළිගන්නා කල්හි කර්මපථ භේදයක් නැත. අන්‍යයා විසින් සම්පප්‍රලාපය ගත් කල්හි ම (කර්මපථ භේද) වේ.

දැඩිලෙස ආශා කෙරේනුයි අභිජ්ඣාවයි. පරභණ්ඩාභිමුඛව එයට නැඹුරුව පවතී යන අර්ථයි. එය මෙය මාගේ වන්නේ නම් ඉතා යෙහෙකැයි අන්‍යයාගේ භාණ්ඩය කෙරෙහි දැඩි ලෙස ආශා කරන ලක්ෂණ ඇත්තේ ය. අදින්නාදානය මෙන් අල්පසාවද්‍ය ද මහාසාවද්‍ය ද වෙයි. එයට කරුණු දෙකකි. පරභාණ්ඩයක් වීම හා තමාට අයත්කර ගැනීම යනුයි. පර භාණ්ඩයක් වූ වස්තුවෙහි ලෝභය උපන් කල්හි ද මෙය මාගේ වන්නේ නම් ඉතා යෙහෙකැයි යන්න යම්තාක් තමාට අයත් නොවේ ද ඒ තාක් කර්මපථ භේදය නො වෙයි.

හිත සුවයට බාධා කෙරේනුයි ව්‍යාපාදය යි. එය අන්‍යයා විනාශ කිරීම පිණිස සිත දූෂණය කරන ලක්ෂණ ඇත්තේ ය, ඵරුෂවචනය මෙන් අල්පසාවද්‍ය හා මහාසාවද්‍ය ඇත්තේ ය. පර සතකු වීම ඔහු විනාශ කිරීමේ සිත ද යනුවෙන් එයට කරුණු දෙකකි. පර සතකු වූ වස්තුවෙහි ක්‍රෝධය උපන්න ද යම්තාක් මොහු සිඳෙන්නේ නම් විනාශ වන්නේ නම් ඉතා යෙහෙකැයි ඔහුගේ විනාශය නො සිතයි ද, එතෙක් කර්මපථ භේදය නො වෙයි.

සත්‍ය වශයෙන් ගනිමින් මිථ්‍යාව දකීනුයි මිථ්‍යාදෘෂ්ටිය යි. එය දෙන ලද්දෙහි විපාක නැත ආදී නයින් විපරීත දර්ශන ලක්ෂණකොට ඇත්තේ ය. සම්පප්‍රලාපය මෙන් අල්පසාවද්‍ය හෝ මහාසාවද්‍ය වන්නේ ය, තව ද අල්පසාවද්‍යය අනියතය. මහාසාවද්‍ය නියතය. වස්තුව ගන්නා ලද ආකාරයේ විපරීත බව, යම් ආකාරයකින් එය ගනීනම් එය සත්‍ය ලෙස වැටහීම යැයි එයට කාරණා දෙකකි. එහි නාස්තික අහේතුක ආකතිය යන දෘෂ්ටීන්ගෙන් ම කර්මපථ භේදය වෙයි. අන්‍ය දෘෂ්ටීන්ගෙන් නො වේ.

මේ දශ අකුශල කර්මපථයන්ගේ විනිශ්චය වනාහි ධර්ම වශයෙන් කොට්ඨාශ වශයෙන් අරමුණු වශයෙන් වේදනා වශයෙන් මූල වශයෙන් යැයි පස් අයුරකින් දතයුතුයි. එහි ධම්මතො යනු මොවුනතුරෙහි වනාහි පිළිවෙළින් චේතනා ධර්ම සතක් වෙයි. අභිධ්‍යා ආදී චේතනා සම්ප්‍රයුක්ත තුන ද, කොට්ඨාශ වශයෙන් යනු පිළිවෙළින් සප්ත මිථ්‍යාදෘෂ්ටිදැයි යන

මේ අට කර්මපථයෝ ම වෙත්. මූලයෝ නො වෙත්. අභිධ්‍යා හා ව්‍යාපාද භූත කර්මපථ මෙන් ම මූල ද වෙයි. අභිධ්‍යාව වනාහි මූලයක් බවට පැමිණි ලෝභය අකුශල මූල වෙයි. ව්‍යාපාද (නම් වූ) ද්වේෂය අකුශල මූලය, ආරම්මණතො යනු ප්‍රාණඝාතය ජීවිතින්ද්‍රියාරම්මණ වශයෙන් සංස්කාරාරම්මණ වෙයි. අදින්නාදානය සංඛාරම්මණ හෝ සංස්කාරා රම්මණය, ඇතමෙක් සත්වාරම්මණයැයි ද කියත්. මුසාවාදය සත්‍වාරම්මණ හෝ සංස්කාරාරම්මණ වේ. එසේ ම පිසුණාවාචා ඵරුෂාවාචා (දෙක) සත්‍වාරම්මණමය, සම්පප්‍රලාපය දිට්ඨ සුත මුත විඤ්ඤාත වශයෙන් සත්‍වාරම්මණ හෝ සංස්කාරාරම්මණ වෙයි. එසේ ම අභිධ්‍යා ව්‍යාපාද (දෙක) සත්‍වාරම්මණ මය, මිථ්‍යාදෘෂ්ටිය තෛභූමක ධර්ම වශයෙන් සංස්කාරාරම්මණ ම ය. වේදනාතො යනු ප්‍රාණඝාතය දුක්වේදනා ඇත්තේ වෙයි. රජවරු සොරා දැක සිනාසෙන්නෝ නමුදු යම් ඔහු මරව් යැයි කියත්. ඔවුන්ගේ තීරණය කිරීම පිළිබඳ චේතනාව වනාහි දුඃඛ සම්ප්‍රයුක්ත ම වෙයි. අදින්නාදානය ත්‍රිවේදනානය, එය වනාහි පර භාණ්ඩයක් දැක සතුටු සිතින් ගන්නහුට සැප වේදනා වෙයි. බියෙන් තැතිගෙන ගන්නහුට දුක්වේදනා වෙයි. එසේ ම විපාකය ගලා ඒමේ ඵලයන් ප්‍රත්‍යවේක්‍ෂා වනාහි අදුක්ඛමසුඛවේදනාව වෙයි. මිථ්‍යාචාරය සුඛ මධ්‍යස්ථ වශයෙන් ද්විවේදනා ඇත්තේ වෙයි. මුසාවාදය අදින්නාදානයෙහි කී නයින් ම ත්‍රිවේදනා ඇත්තේ වෙයි. එසේ ම පිසුණාවාචා ඵරුසාවාචා දෙක දුක්වේදනා ඇත්තේ වෙයි. සම්පප්‍රලාපය ත්‍රිවේදනා ඇත්තේ ය. අන්‍යයන් සාධුකාර දේදදී වස්ත්‍රාදිය දමද්දී සීතාහරණ භාරත යුද්ධාදිය කියන කල්හි හෙතෙම (සතුටු සිත් ඇත්තේ වෙයි.) සැප වේදනා ඇත්තේ වෙයි. පළමුව දෙන ලද දැන්වීමෙන් එකෙකු පසුව අවුත් මුලපටන් කියවයි කී කල්හි අනුසන්ධි සහිත ප්‍රකීර්ණක කථාව කියම්දෝයි දොම්නස් වූවහු කියන කල්හි දුක්වේදනා ඇත්තේ වෙයි. අභිධ්‍යා සුඛ මධ්‍යස්ථ වශයෙන් ද්විවේදනාය, එසේ ම මිථ්‍යාදෘෂ්ටි ව්‍යාපාද ඇත්තේ දුඃඛ වේදනා ඇත්තේ වෙයි. මූලතොයනු ප්‍රාණඝාතය ද්වේෂ මෝහ වශයෙන් හෝ ලෝභ මෝහ වශයෙන් හෝ වෙයි. මිථ්‍යාචාරය ලෝභ මෝහ වශයෙනි. මුසාවාදය ද්වේෂ මෝහ වශයෙන් හෝ ලෝභ මෝහ වශයෙන් වෙයි. පිසුණාවාචා හෝ සම්පප්‍රලාපය ද එසේ ය. ඵරුෂාවාචාව ද්වේෂ මෝහ වශයෙන්, අභිධ්‍යාව මෝහ වශයෙන් ඒකමූලය, එසේ ම ව්‍යාපාද මිථ්‍යාදෘෂ්ටි (දෙක) ලෝභ මෝහ වශයෙන් ද්විමූලය යනුයි.

අකුශල කර්මපථ කථා නිමි.

ප්‍රාණඝාතාදියෙන් වෙන්වීම අනභිධ්‍යා අව්‍යාපාද සම්‍යග්දෘෂ්ටි දැයි යන දහය දශකුශල කර්මපථයෝ ය. එහි ප්‍රාණඝාතාදිය කියන ලද අර්ථ ඇත්තේ ම ය. ප්‍රාණඝාතාදියෙන් මෙයින් වළකිත්. තෙමේ හෝ වළකී. මේ වෙන්වීම් මාත්‍රය මැයි හෝ විරතිය. ප්‍රාණඝාතයෙන් වෙන්වන්නා සේ 'එ සමයෙහි යම් ප්‍රාණඝාතයෙන් ඉවත්වීමක් වෙන්වීමක් වේ දැයි' මෙසේ කියන ලද කුශල සම්ප්‍රයුක්ත විරතියක් වේ ද, එය භේද වශයෙන් ත්‍රිවිධ වෙයි. සම්පත්ති විරති සමාදාන විරති සමුච්ඡේද විරති යනුවෙනි. එහි ශික්ෂාපද සමාදන් නො වූ තමාගේ ජාතිය වයස බහුශ්‍රැත බව ආදිය සිහිකොට අපට මෙවැන්නක් කිරීම අයුතුයැයි එළඹි වස්තුව නො ඉක්මවන්නවුන්ට උපදනා විරතිය සම්පත්ති විරතියැයි දතයුතුයි. සිංහල ද්වීපයෙහි චක්කන උපාසක හට මෙනි. ඔහු ළදරු කල්හි ම මවට රෝගයක් උපන්නේ ය. වෙදා විසින් අමු හාමස් ලබන්නට වටී. (අවශ්‍යයැයි) කියන ලදී. ඉක්බිති චක්කනගේ සොහොයුරා මලණුවනි, කෙතට ගොස් ඇවිදින්නැයි චක්කන යැවී ය. හෙතෙම එහි ගියේ ය. එකල්හි එක් සාවෙක් ළා ගොයම් කෑමට ආවේ ය. සාවා ඔහු දැක වේගයෙන් දුවන්නේ වැල්වල පැටී කිරි කිරි යැයි ශබ්ද කෙළේ ය. චක්කන ඒ හඬින් ගොස් ඌ අල්වාගෙන මවට බෙහෙත් කරන්නෙමියි සිතී ය. නැවත (මෙසේ) සිතීය. මම මව ජීවත් කිරීම පිණිස අනිකෙකුගේ ජීවිතය තොර කරන්නෙම් නම් එය මට සුදුසු නො වේ කියායි. ඉක්බිති 'යන්න වනයේ සාවුන් සමග තණ පැන් පරිභෝග කරවයි' ඌ මිදීය. සහෝදරයා විසින් කිම මලණුවනි, සාවකු ලබන ලදදැයි අසසන ලදුව ඒ පුවත කී ය. ඉක්බිති සහෝදරයා ඔහුට අපහාස කෙළේ ය. හෙතෙම මව වෙතට ගොස් 'මම උපන්දා පටන් දැන ප්‍රාණියෙකු ජීවිතයෙන් තොර කළ බවක් නො දනිමි' සත්‍යය කියා සිටියේ ය. (සත්‍යක්‍රියා කළේය) එකෙණෙහි ම ඔහුගේ මව නිරෝගී වූවා ය. ශික්ෂාපද සමාදන්ව ශික්ෂාපද සමාදානයේ දී ද ඉන් මතු තමාගේ ජීවිතය ද පරිත්‍යාගයෙන් වස්තුව නො ඉක්මවන්නා උපදනා විරතිය සමාදාන විරතිය යැයි දතයුතුයි. උත්තර වඩ්ඪමාන පර්වත වැසි උපාසකයාට මෙනි. හෙතෙම වනාහි අම්බරිය විහාරවාසී පිංගල බුද්ධරක්ඛිත තෙරුන් වෙත ශික්ෂාපද ගෙන (සමාදන්ව) කුඹුර සායි. ඉක්බිති ඔහුගේ ගොනෙක් නැති විය. හෙතෙම ඌ සොයමින් උත්තර වඩ්ඪමාන පර්වතයට නැංගේ ය. එහිදී මහා සර්පයෙක් ඔහු අල්ලා ගත්තේ ය. හෙතෙම මේ තියුණු අවියෙන් මුගේ හිස සිඳිමියි සිතීය. නැවත මෙසේ සිතීය. මම සම්භාවනීය ගුරුවරයකු වෙත ශික්ෂාපද සමාදන් ව (එම ශික්ෂාපද) බිඳීම් නම් එය මට සුදුසු නො

වේ. කියා යි. මෙසේ තුන්වන වාරය දක්වා සිතා ජීවිතය පරිත්‍යාග කරමි. ශික්ෂාපද නො සිඳිමියි අංශයෙහි තබන ලද දණ්ඩ සහ වැය කැළයට දැමී ය. එකෙණෙහි ම ඒ මහා සර්පයා ඔහු මුදා ගියේ ය. ආර්යමාර්ග විරතිය සමුච්ඡේද විරතිය යැයි දතයුතුයි. එහි උත්පත්තියේ පටන් ආර්ය පුද්ගලයන්ට ප්‍රාණියෙකු ඝාතනය කෙරෙමියි සිතකුදු නූපදී යනුයි.

දැන් අකුසලයන්ගේ (විනිශ්චය) යම්සේ ද මේ කුශල කර්ම පථයන්ගේ විනිශ්චය ද ධර්ම වශයෙන් කොට්ඨාශ වශයෙන් ආරම්මණ වශයෙන් වේදනා වශයෙන් මූල වශයෙන්දැයි පස් අයුරකින් දතයුතුයි. එහි ධම්මතෝ යනු මේවා කෙරෙහිදු පිළිවෙළින් සප්ත චේතනාවෝ ද විරතීහු ද වැටෙත්. අන්තයෙහි චේතනා සම්ප්‍රයුක්ත තුන ද (වෙයි) කොට්ඨාසතෝ යනු පිළිවෙළින් සප්ත කර්මපථයෝ ම ය. මූල නො වේ. අන්තයෙහි කර්මපථ තුන මෙන්ම මූලයෝ ද වෙත්. අනභිධ්‍යාව වනාහි මූලයට පැමිණ අලෝභය කුශලමූලය වෙයි. අව්‍යාපාදය අදෝෂය කුශල මූලය, සම්‍යක්දෘෂ්ටිය අමෝහය කුශල මූලය, ආරම්මණතෝ යනු ප්‍රාණඝාතාදීන්ගේ අරමුණු ම මොවුන්ගේ අරමුණු වෙයි. ව්‍යතික්‍රමණය (ඉක්මවීම) කළයුතු හෙයින් ම වනාහි වේරමණී නම් වෙයි. යම් සේ වනාහි නිවන් අරමුණු කරගත් ආර්යමාර්ගය කෙලෙස් දුරුකරයි ද එමෙනි. මෙසේ ජීවිතින්‍ද්‍රිය ආදී අරමුණු පහ වූ කල්හි කර්මපථයෝ ප්‍රාණඝාතාදී වූ දුශ්ශීල්‍යයන් අත්හරිත් යැයි දතයුතුයි. වේදනාතෝ යනු සියලු ම සැප වේදනා හෝ මධ්‍යස්ථ වේදනාවෝ වෙත්, කුශලයට පැමිණ දුක්වේදනා නම් නැත. මූලතෝ යනු පිළිවෙළින් සප්තකර්මපථයෝ ඥාන සම්ප්‍රයුක්ත සිතින් වළකින්නාට අලෝභ අද්වේෂ අමෝහ වශයෙන් ත්‍රිමූල වෙත්. ඥාන විප්‍රයුක්ත සිතින් වළකින්නාට මූල දෙකකි. ඥාන සම්ප්‍රයුක්ත සිතින් වළකින්නාගේ අනභිධ්‍යාව ද්විමූල වෙයි. මෙතැන ඤාණ සම්ප්‍රයුත්තයැයි පෙළපොතේ ඇත. එය මුද්‍රණ දෝෂයකැයි හැඟේ. ඥාන විප්‍රයුක්ත සිතින් (වළකින්නාට) එක් මූලයකි. අලෝභය වනාහි තමා ම තමාට මූලය නො වේ. අව්‍යාපාදයෙහි ද මේ නය ම ය. සම්‍යක් දෘෂ්ටිය අලෝභ අද්වේෂ වශයෙන් ද්විමූල ම වෙයි. මේ දශකුශල කර්මපථ නම්.

දැන් මෙතැන්හි කර්මපථ සත්සන්දනය නමැයි දතයුතුයි. පංච ස්පර්ශද්වාර වශයෙන් උපන් අසංවර සිත අකුශලය (කර්මය ම වෙයි. මනෝ ස්පර්ශද්වාර වශයෙන් උපන්නේ තුනම) කර්ම ම වෙයි. කාය ද්වාරයෙහි චලනයට පැමිණි එය වනාහි අකුශල කාය කර්මය වෙයි. වචී

ද්වාරයෙහි අකුශල වාක් කර්මය, දෙපසම චලනයට නොපැමිණියේ අකුශල මනෝකර්මය වෙයි. පංච අසංවර ද්වාර වශයෙන් උපන්නේ ද අකුශල මනෝකර්ම ම වෙයි. චෝපනකාය අසංවරද්වාර වශයෙන් උපන්නේ අකුශල කායකර්ම ම වෙයි. වාචා මනෝ අසංවරද්වාර වශයෙන් උපන්නේ අකුශල වචීකර්ම ම වෙයි. මනෝ අසංවර ද්වාර වශයෙන් උපන්නේ අකුශල මනෝකර්මය ම වෙයි. ත්‍රිවිධ කාය දුශ්චරිතය අකුශල කාය කර්මය ම වෙයි. චතුර්විධ වාග් දුශ්චරිතය අකුශල වචීකර්ම ම වෙයි. ත්‍රිවිධ මනෝ දුශ්චරිතය අකුසල මනෝකර්ම ම වෙයි. පංචස්පර්ශ වශයෙන් සංවරය ද කුශල මනෝකර්ම ම වෙයි. මනෝ ස්පර්ශ ද්වාර වශයෙන් උපන් මෙය ද වනාහි අසංවරය මෙන් කර්ම තුනම වෙයි. පංච සංවරද්වාර වශයෙන් උපන්නේ ද කුශල මනෝකර්මය ම වෙයි. චෝපන කාය සංවරද්වාර වශයෙන් කුශලය කායකර්ම ම වෙයි. වාක් සංවර ද්වාර වශයෙන් උපන් කුශලය වචීකර්ම ම වෙයි. මනෝසංවර ද්වාර වශයෙන් උපන් කුශලය මනෝකර්ම ම වෙයි. ත්‍රිවිධ කාය සුචරිතය කුශල කාය කර්ම ම වෙයි. චතුර්විධ වාක් සුචරිත කුශලය වාක් කර්ම ම වෙයි. ත්‍රිවිධ මනෝ සුචරිත කුශලය මනෝකර්මය ම වෙයි. අකුශල කාය කර්මය පංච ස්පර්ශද්වාර වශයෙන් නූපදී. මනෝ ස්පර්ශද්වාර වශයෙන් උපදී. අකුශල වාක් කර්මය ද එසේ ය. අකුශල මනෝකර්මය වනාහි ෂට් ස්පර්ශද්වාර වශයෙන් උපදී. එය කායවාක් ද්වාරයන්හි චලනයට පැමිණියේ අකුශල කාය වාක් කර්ම වෙයි. චලනයට නොපැමිණියේ අකුශල මනෝකර්මයම වෙයි. යම් සේ මෙසේ ස්පර්ශද්වාර වශයෙන් ද මෙසේ පංච අසංවරද්වාර වශයෙන් ද අකුශල කායකර්මය නූපදී ද, නමුත් චෝපන කාය අසංවර ද්වාර වශයෙන් වනාහි වාක් අසංවර ද්වාර වශයෙන් ද උපදී. මනෝ අසංවර ද්වාර වශයෙන් නූපදී. (අකුශල වචී කර්මය ද පංච අසංවර ද්වාර වශයෙන් නූපදී. චෝපනකායවාචා අසංවර ද්වාර වශයෙන් උපදී. මනෝ අසංවර ද්වාර වශයෙන් නූපදී. අකුශල මනෝ කර්මය) අෂ්ට අසංවර ද්වාර වශයෙන් ද උපදී ම ය. කුශලකාය කර්මාදීන්හි ද මේ නය ම ය. මේ වනාහි වෙනස්ය. යම්සේ අකුශල කායකර්ම වචී කර්මයෝ මනෝ අසංවර ද්වාර වශයෙන් නූපදිත් ද මොව්හු එසේ නො වෙත්. මොව්හු වනාහි කායාංග වාචාංගයන් චලනය නොකොට ශික්ෂාපද ගන්නහුගේ මනෝ සංවර ද්වාරයෙහි ද උපදිත් ම ය. එහි කාමාවචර කුශල සිත ත්‍රිවිධ කර්මද්වාර වශයෙන් උපදී. පංචවිඥානද්වාර වශයෙන් නූපදී. එය චක්ෂු ස්පර්ශ ප්‍රත්‍යයෙන් උපදී. විඳිය යුතු සුඛ දුඃඛ අදුඃකඛමසුඛ යන මේ නයින් ෂට් ස්පර්ශද්වාර වශයෙන් උපදී. අෂ්ට අසංවරද්වාර වශයෙන් නූපදී.

අෂ්ට සංවරද්වාර වශයෙන් උපදී. දශඅකුශල කර්මපථ වශයෙන් නූපදී. දශකුශල කර්මපථ වශයෙන් උපදී. එහෙයින් මේ සිත ද ත්‍රිවිධ කර්මද්වාර වශයෙන් හෝ උපන්නේ වෙයි. ෂට් ස්පර්ශද්වාර වශයෙන් හෝ අෂ්ට අසංවරද්වාර වශයෙන් හෝ දශකුශල කර්මපථ වශයෙන් හෝ (උපන්නේ වෙයි) 'කාමාවචර කුශල සිත උපන්නේ වෙයි. -පෙ- රූපාරම්මණය හෝ -පෙ- ධර්මාරම්මණය හෝ' යැයි කී කල්හි සියල්ල කියන ලද්දේම වෙයි.

## ද්වාර කථා නිමියේ ය.

**යං යංවා පන ආරබ්භ** යන මෙහි මේ යෝජනාවයි යටකියන ලද රූපාරම්මණාදියෙහි රූපාරම්මණය හෝ අරබයා, අරමුණු කොට යන අර්ථයි. **ශබ්දාරම්මණයක් හෝ -පෙ- ධර්මාරම්මණයක් හෝ** අරබයා උපන්නේ වෙයි. මෙපමණකින් එක් සිතකට මේ ආරම්මණයන්හි යම්කිසි එකම අරමුණක් අනුදත් සමාන වෙයි. මෙය ද එක් අවස්ථාවෙක්හි එක් පුද්ගලයෙකුගේ හෝ රූපාරම්මණයක් අරබයා උපන්නේ ය. නැවත අන් සමයෙක්හි අන් පුද්ගලයෙකු ගේ හෝ ශබ්දාදීන්හි එක්තරා අරමුණක් අරබයා උපදී. මෙපරිද්දෙන් උපදනා මොහුගේ එක් භවයෙක්හි පළමු, රූපාරම්මණය අරබයා පැවැත්ම වෙයි. පසුව ශබ්දාරම්මණය යැයි මෙය ද ක්‍රමයෙක් නැත. රූපාදීන්හි ද පළමුව නීලාරම්මණය පසුව පීතාරම්මණය යැයි මෙය ද නියමයක් නැත. මෙසේ මේ සියලු ආරම්මණයන්ගේ ද ක්‍රමභාවයත් ක්‍රමභාවයෙහි ද නීලපීතාදීන්හි නියම අභාවය දැක්වීමට **යං යං වා පනාරබ්භ** යැයි කී ය. මෙය (ද) කියන ලද්දේ වෙයි. මේ රූපාදියෙහි යම්කිසි එකක් ම නැත. ඉක්බිති යමක් යමක් අරබයා උපන්නේ වේ ද මෙසේ උපදනේ ද පළමුව රූපාරම්මණය පසුව ශබ්දාරම්මණය අරබයා යැයි මෙසේ ද නො ඉපිද යමක් යමක් හෝ අරබයා උපන්නේ වේ ද ප්‍රතිලෝම වශයෙන් හෝ අනුලෝම වශයෙන් එකක් හැර එකක් දෙකක් හැර එකක් ආදී නයින් හෝ රූපාරම්මණාදීන්හි යම් කිසිවක් අරමුණු කොට උපන්නේ වේ යනු අර්ථයි. රූපාරම්මණයෙහි ද පළමුව පළමුව නීලාරම්මණය පසුව පීතාරම්මණය යැයි යන මේ නියමයෙන් නො ඉපිද යමක් යමක් හෝ අරබයා නීලපීතාදී අරමුණුවල යම් ඒ රූපාරම්මණයක් අරබයා උපන්නේ වේ යනු අර්ථයි. ශබ්දාරම්මණාදියෙහි ද මේ නය මැයි. මේ වනාහි එක් යෝජනාවකි. මේ අනෙකකි. රූපය අරමුණ වූයේ

මොහුට නුයි රූපාරම්මණයි. -පෙ- ධර්මය අරමුණ වූයේ මොහුටනුයි = ධම්මාරම්මණයි. මෙසේ රූපාරම්මණ හෝ -පෙ- ධර්මාරම්මණ වූ හෝ සිතක් උපන්නේ වේයැයි කියා නැවත **'යමක් යමක් හෝ අරබයා වනාහි'** යැයි කීය. එහි අර්ථය මේ රූපාදියෙහි යට කියන ලද නයින්ම යමක් යමක් අරබයා උපන්නේ වෙයි යනුයි. මහා අට්ඨකථාවෙහි යමක් යමක් හෝ වේ නම් වනාහි එය අභිනව නැත. යට ගන්නා ලද්දම ගන්නා ලදැයි කියා රූපය හෝ අරබයා -පෙ- ධර්මය හෝ අරබයා මෙය හෝ මෙය අරබයා යැයි කියන්නට මෙය කියන ලදැයි මෙපමණක් ම ආයේ ය.

**තසමිං සමයෙ** යන මෙය අනියමින් දක්වන ලද සමය ශබ්දයාගේ නියම වශයෙන් ප්‍රතිනිර්දේශ (නැවත දැක්වීම) වචනයකි. එහෙයින් යම් සමයෙක්හි කාමාවචර කුශල සිතක් උපන්නේ වේද, එ සමයෙහි ම ස්පර්ශය වෙයි -පෙ- අවික්ෂෙපය වෙයි යන මේ අර්ථය දතයුතුයි. එහි සිත යම්සේද ස්පර්ශාදියෙහි ද මෙසේ ස්පර්ශය වෙයි. කුමක් වේ ද, කාමාවචර වෙයි. කුසල වෙයි. උපන්නේ වෙයි. සොම්නස් සහගත වෙයි යන ආදී නයින් ලබන පද වශයෙන් යෝජනා කළයුතුයි. වේදනාවෙහි වනාහි සොම්නස් සහගත යනු පඤ්ඤින්ද්‍රියෙහි ද ඥාන සම්ප්‍රයුක්තයැයි නො ලැබේ. එහෙයින් ලබන ලද පද වශයෙනි යැයි කියන ලදී. මෙය අර්ථකථාවෙන් තොර ආචාර්ය මතයකි. මෙය වනාහි සාර වශයෙන් නොගත යුතුයි. එහෙයින් මෙහිදී වනාහි ස්පර්ශය ම පළමුව කියන ලද ද, සිතට පළමුවෙන් වැටෙන හෙයිනි. ස්පර්ශය වනාහි අරමුණේදී සිතට පළමුවෙන් වැටී අරමුණ ස්පර්ශ කෙරෙමින් උපදී. එහෙයින් පළමුව කියන ලදී. ස්පර්ශයෙන් ස්පර්ශකොට වේදනාව විසින් විඳිනු ලැබේ. වේදනාව විසින් හැඳිනගනු ලැබේ. චේතනාවෙන් සිතනු ලැබේ. එහෙයින් (මෙසේ) කියන ලදී. 'මහණෙනි, ස්පර්ශ කරන ලද්දේ විඳී. ස්පර්ශ කරන ලද්දේ හැඳින ගනී. ස්පර්ශ කරන ලද්දේ සිතයි' යනුයි. තව ද මේ ස්පර්ශය නම් යම් සේ ප්‍රාසාදයට පැමිණ ටැඹ නම් සෙසු ද්‍රව්‍ය සම්භාරයන්ට බලවත් සාධකය වෙයි ද, තලාඳ මූට්ටු, අත්තිවාරම් බිත්ති කර්ණිකා ගොනැසි පැලැන්පෝරු මුවවිටි ආදීහු ටැඹෙහි බඳනා ලදුව ටැඹෙහි පිහිටියාහු ද, එපරිද්දෙන් සහජාත සම්ප්‍රයුක්ත ධර්මයන්ට (ස්පර්ශය) බලවත් ප්‍රත්‍ය වෙයි. මෙය වනාහි ටැඹ සමානය. අවශේෂයෝ ද්‍රව්‍ය සම්භාර සමානයහ යනුයි. එහෙයින් ද පළමුව කියන ලදී. මෙය වනාහි කාරණයක් නො වේ. එකම සිතෙක උපන් ධර්මයෝ වනාහි මෙය පළමුව උපන්නේ ය. මෙය පසුව යැයි මෙය කියන්නට නො ලබන්නෝ ය.

බලවත් ප්‍රත්‍යය බවෙහිදු ස්පර්ශයට කරුණක් නො පෙනේ. දේශනාවාර වශයෙන් ම වනාහි ස්පර්ශය පළමුව කියන ලදී. වේදනාව වෙයි ස්පර්ශය වෙයි. සංඥාව වෙයි ස්පර්ශය වෙයි. චේතනාව වෙයි ස්පර්ශය වෙයි. සිත වෙයි ස්පර්ශය වෙයි. වේදනාව වෙයි සංඥාව වෙයි. චේතනාව වෙයි විතර්කය වෙයි යැයි දක්වන්නට වටනේ ය. දේශනා වාරයෙන් වනාහි ස්පර්ශය ම පළමුව කියන ලදැයි දතයුතුයි. මෙහි යම්සේ ද මෙසේ සෙසු ධර්මයන්හි ද පූර්වාපර ක්‍රමයක් නම් නො සෙවිය යුතුයි. වචනාර්ථ ලක්‍ෂණ රසාදියෙන් වනාහි ධර්මයෝ ම සෙවිය යුත්තාහ. ඒ කෙසේද යත්,

ස්පර්ශ කෙරේනුයි ඵසසයි. එය ස්පර්ශ කරන ලක්‍ෂණ ඇත්තේ ය. එකට ගැටීම රසයයි. එක්වීම එළඹ සිටි ආකාරයයි. ඉදිරියට පැමිණි විෂය ආසන්න කාරණය යි. මේ වනාහි අරූප ධර්මය ද සමානය. අරමුණුවල ස්පර්ශ කරන අයුරින් පවතීනුයි ඵුසන ලක්‍ෂණය යි. එක් අතෙකින් නො ඇලෙන්නේ නමුදු ඇස රූපය මෙන් කන ශබ්ද මෙන් ද සිතත් අරමුණත් ගැටේනුයි සංඝටන රසය යි. වස්තු අරමුණු එකම ගැටීමෙන් ම උපන්හෙයින් සම්පත්ති අර්ථයෙන් රසය හා ගැටෙන රසය යැයි දතයුතු යි. අට්ඨකථාවෙහි ද මෙය කියන ලදී. 'චාතුර්භූමක ස්පර්ශය ස්පර්ශ කරන ලක්‍ෂණ නැත්තේ නම් නො වේ. සංඝටන රසය වනාහි පංච ද්වාරික ම වෙයි. පංචද්වාරිකයට වනාහි ඵුසන ලක්‍ෂණය යනු ද සංඝටන රසය යනු ද නාමයි. මනෝද්වාරිකයට ඵුසන ලකඛණ යනුම නාමයි. සංඝට්ඨන රසය නොවේ' යනුයි. මෙය ද කියා මේ සූත්‍රය ගෙනහැර දක්වන ලදී. 'මහරජ, යම්සේ එළුවෝ දෙදෙනෙක් යුද්ධ කරත්ද, එක් එළුවෙක් යම්සේ ද ඇස එසේ යැයි දතයුතුයි. දෙවන එළුවා යම්සේ ද රූපය එසේ යැයි දතයුතුයි. ඔවුන්ගේ එක්වීම යම්සේ ද ස්පර්ශය එසේයැයි දතයුතුයි. (මෙසේ ස්පර්ශය ස්පර්ශ කරන ලක්‍ෂණ ඇත්තේ ය. සංඝට්ටන රසය ම ය.) මහරජ, යම්සේ කයිතාලම් දෙකක් වාදනය වේ ද, අත් දෙකක් වාදනය වේ ද, එක් අතක් යම්සේ ද ඇස එසේ යැයි දතයුතුයි. දෙවන අත යම්සේ ද රූපය එසේ යැයි දතයුතුයි. ඔවුන්ගේ එක්වීම යම්සේ ද, ස්පර්ශය එසේ යැයි දතයුතුයි. මෙසේ ස්පර්ශය ඵුසන ලක්‍ෂණ ද සංඝට්ටන රස ද ඇත්තේ ය යනු 'විස්තරයි. යම්සේ වනාහි 'ඇසින් රූපය දැක' යන ආදීන්හි චක්‍ෂුර් විඥානාදිය චක්‍ෂු ආදී නමින් කියන ලදී. මෙසේ මෙහි ද ඒවා චක්‍ෂු ආදී නමින් කියන ලදැයි දතයුතුයි. එහෙයින් මෙසේ ඇස දතයුතු ය යන ආදීන්හි චක්‍ෂුර්විඥානය මෙසේ දතයුතු

යැයි මේ නයින් අර්ථය දතයුතුයි. මෙසේ ඇතිකල්හි චිත්තාරම්මණ සංඝටනයෙන් මේ සූත්‍රයෙහි ද කෘත්‍යාර්ථයෙහි රසයෙන් සංඝටන රසයක් සිද්ධ නො වේ ම ය. තික සන්නිපාත සංඛ්‍යාත තම කාරණයාගේ වශයෙන් කියන ලද හෙයින් සන්නිපාතයේ එළඹීමයි. මෙය වනාහි ඒ ඒ තැන්හි තිදෙනාගේ එක්වීම ස්පර්ශයයි. මෙසේ කාරණයාගේ ම වශයෙන් ප්‍රකාශ කරන ලදැයි මේ සූත්‍රපදයාගේ ද තිදෙනාගේ එක්වීම ස්පර්ශයි යන මේ අර්ථයි. ස්පර්ශය යනු සංගතිමාත්‍රය ම නො වේ. මෙසේ ප්‍රකාශ කරන ලද හෙයින් වනාහි ඒ ආකාරයෙන් ම එළඹ සිටී යැයි සන්නිපාත පච්චුට්ඨාන යැයි කියන ලදී. ඵලාර්ථයෙන් වනාහි එළඹ සිටීමේ දී මෙය වේදනා පච්චුට්ඨාන නම් වෙයි. මෙය වේදනාව එළඹවයි. උපදවයි යන අර්ථයි. උපදවනු ලබන්නේ ද යම්සේ බාහිර උණුසුම හේතුවෙන් ද ලාඛාසංඛ්‍යාත ධාතු නිශ්‍රිත උණුසුම තමා නිශ්‍රිතයෙහි මෘදුභාවකාරී වෙයි. තමාට ප්‍රත්‍යභූත වූ ද බාහිර පහව ගිය දැල් ඇති අඟුරු සංඛ්‍යාත උෂ්ණ භාවයෙහි නො වේ. මෙසේ වස්තු ආරම්මණ සංඛ්‍යාත සමාන වූ අන් ප්‍රත්‍ය ද සිත ඇසුරු කළ හෙයින් තමාට නිශ්‍රය වූ සිතෙහි ම වේදනා උත්පාද වෙයි. තමාට ප්‍රත්‍යයවූ වස්තුවෙහි හෝ ඉෂ්ටාරම්මණයෙහි හෝ නො වේ යැයි දතයුතුයි. එයින් ඉපිද එක්තැන් වූ ඉන්ද්‍රිය විසින් පිළියෙළ කළ විෂයෙහි වනාහි අනතුරුවම උපදනා හෙයින් එළඹුණු විෂය ආසන්න කාරණා කොට ඇත්තේ යැයි කියනු ලැබේ.

විඳිනු ලැබේ නුයි = වේදනා ය. එය විඳීම් ලක්‍ෂණ කොට ඇත්තේ ය. අනුභවන රස ඇත්තේ ය. ඉෂ්ටාකාර සම්භෝග රස ඇත්තේ හෝ වෙයි. චෛතසික ආස්වාදය එළඹ සිටි කාරණා කොට ඇත්තේ ය. නිවීම ආසන්න කාරණා කොට ඇත්තේ ය. චාතුර්භූමක වේදනාව වනාහි වේදයිත ලක්‍ෂණ නැත්තේ නම් නො වේ. අනුභවන රසතාව වනාහි සැපවේදනාවේම ලැබේයැයි කියා නැවත ඒ වාදය ප්‍රතික්‍ෂේප කොට සැපවේදනාව හෝ වේවා දුක්වේදනාව හෝ වේවා. අදුක්ඛමසුඛ වේදනාව හෝ වේවා සියල්ල ම අනුභවන රස ඇත්තේයැයි කියා මේ අර්ථය දක්වන ලදී. සෙසු සම්ප්‍රයුක්ත ධර්මයෝ අරමුණු රස අනුභව කරන තැනට පැමිණ ඒකදේශ මාත්‍රයක් ම අනුභව කරත්. ස්පර්ශයට වනාහි ස්පර්ශ කිරීම් මාත්‍රයක්ම වෙයි. සංඥාවෙන් හැඳිනීම් මාත්‍රයක් පමණි. චේතනාවට චේතනා මාත්‍රය පමණි. විඥානයට දැනීම් පියවිතාවයෙන් ස්වාමිභාවයෙන් වනාහි වේදනාව ද අරමුණු රසය අනුභව කරයි. වේදනාව වනාහි රජ මෙනි. සෙසු ධර්මයෝ සූදයා මෙනි. යම්සේ සූදයා නානාරස

භෝජන සපයා පේළාවක බහා මුද්‍රා තබා රජු වෙතබහා මුද්‍රා බිඳ පේළාව විවෘත කොට සියලු සූපව්‍යඤ්ජනවලින් උඩින් උඩින් ගෙන බඳුනෙක බහා සදොස් නිදොස් බව විමසීම සඳහා ගිලී, ඉක්බිති රජුට නානාරස බොජුන් එළවයි. රජ අධිපති බැවිනුත් ස්වාමී ව කැමති කැමති දේ අනුභව කරයි. එහි අවශේෂ ධර්මයන්ගේ ආරම්මණ රසය පිළිබඳ ඒකදේශානුභාවය සූදයාගේ බත් විමසීම් මාත්‍රය මෙනි. සූදයා වනාහි යම්සේ බතේ ඒකදේශ මාත්‍රයක් ම විමසයි ද, මෙසේ සෙසු ධම්මයෝ ද ආරම්මණ ඒකදේශයක් ව අනුභව කරත්. යම්සේ රජ වනාහි අධිපති බැවින් හා නිර්භීත බැවින් ස්වාමීව කැමති දෙයක් අනුභව කරයි. එහෙයින් අනුභවන රස යැයි කියනු ලැබේ. දෙවන අර්ථ විකල්පයෙහි මෙය මෙහි අභිප්‍රේතයි. වේදනාව යම් යම් ලෙසින් ආරම්මණ රසයාගේ ඉෂ්ටාකාරය ම අනුභව කෙරේනුයි ඉෂ්ටාකාර සම්භෝග රස ඇත්තේයැයි කියන ලදී. මෙය වනාහි චෛතසික ආස්වාදයෙන් තමාගේ ස්වභාවයෙන් ම එළඹීම නිසා චෛතසික ආස්වාදය වැටහීම් කොට ඇත්තේයැයි කියන ලදී. යම්සේ වනාහි නිවුණු කය ඇත්තේ සැප විඳී ද, එහෙයින් නිවීම ආසන්න කාරණය කොට ඇත්තේ යැයි දතයුතුයි.

නීලාදී ප්‍රභේද ඇති අරමුණ හැඳිනගනීනුයි සංඥාවයි. එය හැඳිනගැනිම ලක්‍ෂණකොට ඇත්තේ ය. නැවත සලකුණු කරගැනීම රසකොට ඇත්තේ ය. චාතුර්භූමක සංඥාව වනාහි සංජානන ලක්‍ෂණ නැත්තේනම් නො වේ. සියල්ලම සංජානන ලක්‍ෂණ ඇත්තේ ය. මෙහි වනාහි යමක් සලකුණින් හැඳිනගනීද එය පච්චභිඤ්ඤාණරස නම් වේ යනුයි. එහෙයින් වඩුවාගේ දැවයෙහි සලකුණක් කොට නැවත ඒ සලකුණින් එය පසුව දැනගන්නා කල්හි, රජුගේ පළඳනා රක්නා භාණ්ඩාගාරිකයාගේ ඒ ඒ පළඳනාවෙහි නාමපත්‍රිකාවක් බැඳ අසවල් නම් පළඳනාව ගෙනෙවයි කී කල්හි පහන දල්වා රුවන්ගැබට පිවිස පත්‍රිකාව කියවා ඒ ඒ පළඳනා ගෙනෙන කල්හි ද පැවැත්ම දතයුතුයි. තවත් නයක් ඇත, සර්වසංග්‍රාහක වශයෙන් වනාහි හැඳිනගැනීම ලක්‍ෂණකොට ඇත්තේ සංඥාවයි. නැවත දැනගන්නා නිමිති කිරීම රසය යි. දැව ආදියෙන් වඩු ආදීන් මෙනි. ගන්නා ලද නිමිති වශයෙන් වැඳගැනීම් කිරීම එළඹසිටි කාරණය කරගන්නා ඇතා දක්වන අන්ධයන් මෙන් ද අරමුණෙහි නො බැස ගන්නා පැවතීම් ඇති බැවින් කල් නො පැවැත්ම එළඹ සිටි කාරණය කරගත් විදුලිය මෙන් ද යම්සේ එළඹ සිටි විෂය ආසන්න කාරණය කරගත් තිණපුරුෂයන් (පඹයන්) කෙරෙහි පුරුෂයෝ යැයි මුවපොව්වන්ට

උපන් සංඥාව ද මෙනි. එය වනාහි මෙහිදී ඥානසම්ප්‍රයුක්ත වෙයි. ඒ සංඥාව ඥානය අනුව ම පවතී. එය සසම්භාර (පිරිවර සහිත) පෘථුවි ආදියෙහි සෙසු ධර්මයන්ගේ පෘථුවි ආදීන් මෙනැයි දතයුතුයි.

සිතානුයි= චේතනාවයි. තමා හා සමග සම්ප්‍රයුක්ත ධර්මයන් අරමුණෙහි ගළපයි යන අර්ථයි. එය සිතීම ලක්ෂණකොට ඇත්තේ ය. සිතන බව ලක්ෂණකොට ඇත යන අර්ථයි. රැස්කිරීම රසය කොට ඇත්තේ ය. චාතුර්භූමක චේතනා වනාහි සිතීම් ලක්ෂණ නැත්තෝ ම නො වෙත්. සියල්ලෝ සිතීම් ලක්ෂණ ඇත්තාහ. ආයූහන රසතාව වනාහි කුසලාකුසලයන්හි ම වෙයි. කුශලා කුශල කර්ම රැස්කරන තැනට පැමිණ වනාහි සෙසු සම්ප්‍රයුක්ත ධර්මයන්ට ඒකදේශමාත්‍ර කෘත්‍යයක් ම වෙයි. චේතනාව වනාහි අතිරේක උත්සාහ අතිරේක ව්‍යායාම ආදී දෙගුණ උත්සාහ දෙගුණ ව්‍යායාම ඇත්තේ ය. එහෙයින් පොරාණයෝ (පෞරාණික ආචාර්යවරු) මෙසේ කීහ. මේ චේතනාව වනාහි කුඹුරු හිමියකුගේ ස්වභාවයෙහි සිටියේය යනුයි. ඨාවරිය යනු කුඹුරුහිමියා යැයි කියනු ලැබේ. යම්සේ කුඹුරුහිමි පුරුෂයා පනස්පහක් බලවත් පුරුෂයන් ගෙන (ගොයම්) කපමියි එක්ව කෙතට බසීද, ඔහුට අතිරේක උත්සාහයක්, අතිරේක ව්‍යායාමයක් දෙගුණ වූ උත්සාහයක්, දෙගුණ වූ ව්‍යායාමයක් වේ ද, නිතර ගනිව් යන ආදිය කියයි. සීමාව කියයි. ඔවුන්ට (අවශ්‍ය) සුරා බත් ගඳමල් ආදිය දනී. මග සම කරයි. මෙය ද මෙසේ සිද්ධයැයි දතයුතුයි. චේතනාව වනාහි කුඹුරු හිමි පුරුෂයා මෙනි. චිත්තාංග වශයෙන් උපන් පස් පනස් කුශල ධර්මයෝ පස්පනස් පලවත් පුරුෂයන් මෙනි. කුශලාකුශල කර්ම රැස්කරන තැනට පැමිණ චේතනාවගේ දෙගුණ වූ උත්සාහය දෙගුණ වූ ව්‍යායාමය කුඹුරු හිමි පුරුෂයාගේ දෙගුණ ව උත්සාහ කරන දෙගුණව ව්‍යායාම කරන කාලය මෙන් වෙයි. මෙසේ මෙහි ආයූහන රසතාව දතයුතුයි. ඒ මේ චේතනාව වනාහි සංවිධානයට එළඹ සිටී. සංවිධාන කරනුයේ වනාහි මෙහි උපස්ථාන කරයි යනු ස්වකීය කෘත්‍යයන් අන්‍යයන්ගේ භාෂයත් සිදුකරන දෙටු සිසු මහවඩු ආදීන් මෙන් වෙයි. යම්සේ වනාහි ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයා උපාධ්‍යායන් දුරින් එනු දැක තමා අධ්‍යයන කරනුයේ අන්‍ය දරුවන් ද තම තමන්ගේ අධ්‍යයන කටයුතුවල යොදවයි. ඔහු අධ්‍යයනය පටන්ගත් කල්හි ඔව්හුද අධ්‍යයනය කරති. (ඒ) ඔහු අනුව පවත්නා පවත්නා හෙයිනි. යම්සේ මහවඩු තෙමේ තමන් වැඩකරන්නේ අන්වඩුවන් ද තම තමන්ගේ වඩු කර්මාන්ත කටයුතුවල යොදවයි. ඔහු සස්නට පටන්ගත් කල්හි ඔහු අනුව

පවත්නා හෙයින් ඔවුහු ද සසිත්. යම් සේ යෝධ නායකයා තෙමේ යුද කරනුයේ අන්‍ය යෝධයන් ද එම ප්‍රහාර වෘත්තියෙහි (පහරදීමේ යොදවයි. ඔහු යුද කරන්ට පටන්ගත් කල්හි වනාහි ඔව්හු ද ඔහු අනුව පවත්නා හෙයින් නො නවතිමින් යුද කරත්. මෙසේ මේ චේතනාව ද තමාගේ කෘත්‍යයෙන් යුතුව අරමුණෙහි පවත්නේ අන් සම්ප්‍රයුක්ත ධර්මයන් ද තම තමන්ගේ ක්‍රියාවන්හි පවත්වයි. එහෙයින් සියකිස පරකිස සිදුකරන දෙටුසිසු මහවඩු ආදීහු මෙනැයි කියන ලදී. ඉක්මන් කර්ම අනුස්මරණාදියෙහි ද වනාහි මෙය සම්ප්‍රයුක්තයන් උත්සාහවත් කරමින් පවතිනු ප්‍රකට වේයැයි දතයුතුයි යනුයි.

අරමුණ සිතානුයි = සිතය. යන ආදී නයින් සිතේ අර්ථය කියන ලද්දේ ම ය. ලක්‍ෂණ වශයෙන් වනාහි දැනගැනීම් ලක්‍ෂණ ඇත්තේ සිතයි. පූර්වාංගම රසයයි. ගැළපීම එළඹ සිටි කාරණයයි. නාමරූප ආසන්න කාරණයයි. චාතුර්භූමක සිත වනාහි විජාන ලක්‍ෂණ නැත්තේ නම් නොවේ. සියල්ල විජානන ලක්‍ෂණමය. සිත වනාහි ද්වාරයට පැමිණ අරමුණ ප්‍රකට කිරීම් අර්ථයෙන් පූර්වාංගම ද පුරේචාරික (පෙරටුව හැසිරෙන්නා) ද වෙයි. ඇසින් දක්නා ලද රූපාරම්මණය සිතින්ම දැනගනී. -පෙ- මනසින් දැනගත් ධර්මාරම්මණය සිතින් ම දැනගනී. නගරගුත්තිකයා වනාහි සතරමං සන්ධියෙහි හිඳ මෙතෙම නේවාසිකයෙකි. මෙතෙම ආගන්තුකයෙක් වශයෙන් ආ ආ ජනයා සලකා බලයි. තීරණය කරයි. මෙය ද මෙසේ සම්පූර්ණයෙන් පැහැදිළිව දතයුතුයි. (නාගසේන) තෙරුන් විසින් ද මෙය කියන ලදී. 'මහරජ, යම්සේ නගරගුත්තිකයෙක් නුවර මැද සතරමංසන්ධියෙහි හුන්නේ නැගෙනහිරින් පුරුෂයකු එනු දකීද, පැළදිගින් - දකුණුදිගින් - උතුරුදිගින් පුරුෂයකු එනු දකීද, මහරජ, එපරිද්දෙන් වනාහි ඇසින් යම් රූපයක් දකී ද, එය විඤ්ඤාණයෙන් දැනගනී. කණින් යම් ශබ්දයක් අසයි ද, නාසයෙන් ගඳක් ආඝ්‍රාණය කරයි ද, දිවෙන් රසක් ආස්වාදනය කරයි ද, කයින් ස්පර්ශයන් ස්පර්ශ කෙරේ ද මනසින් ධර්මයක් දැනගනී ද එය විඤ්ඤාණයෙන් දැනගනී යැයි මෙසේ ද්වාරයට පැමිණ අරමුණ ප්‍රකාශ කරන ස්ථානයෙහි සිත ම පූර්වාංගමය, සිත පූර්වයෙන් යන්නා වෙයි. එහෙයින් පූර්වාංගම රසය යැයි කියනු ලැබේ. ඒ මේ සිත පසු පසුව උපදනහුට නිරතුරුකොට ගැළපීමට එළඹ සිටීනුයි සන්දහන පච්චුපට්ඨානයි. පංචවෝකාර භවයෙහි වනාහි එහි නියමයෙන් නාමරූප මැතද චතුවෝකාර භවයෙහි නාමය මද ආසන්න කාරණය වෙයි. එහෙයින් නාමරූප ආසන්න කාරණ කොට ඇතැයි කියන ලදී. මේ වනාහි කිම

සිත පළමු සිත සමග එකක් ම ද? නැතහොත් අනිකක් ද එකක්මය. එසේ නම් කවර හෙයකින් පළමු දක්වන ලද්ද නැවත කියන ලදද? මෙය අට්ඨකථාවෙහි විචාරණය නොකරන ලදී. මේ වනාහි මෙහි යුක්තියයි. යම් සේ රූපාදිය ගෙන පණවන ලද සූර්යාදීහු අර්ථයෙන් රූපාදීන්ගෙන් අන්‍යයෝ නොවෙත් ද එහෙයින් ම යම් අවස්ථාවෙක සූර්යයා උදාවෙයිද එසමයෙහි ඔහුගේ තේජසංඛ්‍යාත රූපය ද (වෙයි) දැයි මෙසේ කියනු ලබද්දී රූපාදීන්ගෙන් අන්‍ය වූ සූර්යයෙක් නම් නැත. එසේ ම සිත ස්පර්ශාදී ධර්මයන් ගෙන පණවනු ලැබේ. මෙය වනාහි අර්ථයෙන් ඔවුන්ගෙන් අනෙකක් ම ය. එහෙයින් යම් අවස්ථාවෙක්හි සිත උපන්නේ වේ ද ඒකාන්තයෙන් ම ඒ අවස්ථාවෙහි අර්ථයෙන් ස්පර්ශාදියෙන් එය අනෙකක් ව වේයැයි මෙහි අර්ථය දැක්වීම පිණිස මෙය කියන ලදැයි දතයුතුයි. යම්සේ යම් අවස්ථාවෙක රූපෝත්පත්තිය පිණිස මාර්ගය වඩයි ද -පෙ- පඨවි කසිණය, එසමයෙහි ස්පර්ශය වේ යැයි යන ආදියෙහි වනාහි වඩන්නා විසින් ව්‍යවස්ථාපනය කරන සමයෙහි යමෙක් වඩයිද, හෙතෙම අර්ථ වශයෙන් උපදීනම් නොවේ. එහෙයින් ම එහි යම්සේ ස්පර්ශය වේද වේදනාව වේදැයි කියන ලදී. එසමයෙහි කාමාවචර කුශල සිත උපන්නේ වේදැයි යන ආදියෙහි වනාහි සිතින් ව්‍යවස්ථාපනය කරන ලද සමයෙහි සම්‍ය ව්‍යවස්ථාපිත සිතක් එසේ අර්ථ වශයෙන් නූපදී නම් නොවේ. යම් සේ වනාහි එකල්හි ස්පර්ශය වෙයි ද වේදනාව වෙයි ද එසේ ම සිතක් වේයැයි මේ අර්ථය ද දැක්වීම පිණිස මෙය කියන ලදැයි දතයුතුයි.

මෙහිදී මේ නිශ්චය වනාහි උද්දේසවාරයෙහි සංග්‍රහ කිරීම පිණිස ද නිද්දේස වාරයෙහි බෙදීම පිණිසද පළමු චිත්ත ශබ්දය සමග හුදෙක් සමය (ශබ්දය) ව්‍යවස්තාපනය කරන ලදී. ඒ සිත සමග ව්‍යවස්ථාපනය කරන ලද සමයෙහි වනාහි ධර්මයෝ වෙත්. ඔවුන් දැක්වීම පිණිස ස්පර්ශය වේ යන ආදිය පටන් ගන්නා ලදී. එසමයෙහි වනාහි සිත ද ධර්මය. එහෙයින් එයද සංග්‍රහ කිරීම පිණිස මෙය නැවත කියන ලදී. මෙතැන දී ද මෙය නොකියන කල්හි එසමයෙහි කවර සිතක්දැයි නිර්දේශවාරයෙහි විභජනය කරන්නට නොහැකි වන්නේ ය. මෙසේ මෙහි විභජනය ම පිරිහෙන්නේ ය. එහෙයින් නිර්දේශ වාරයෙහි එය විභජනය පිණිස ද මෙය ද කියන ලදැයි දතයුතුයි. යම්හෙයකින් හෝ උපන්නේ වේදැයි යන මෙහි සිත උපන්නේ ය යන මෙය දේශනා ශීර්ෂ ම ය. සිත එකක්මයැයි (වනාහි නොවේ.) අට්ඨකථාවෙහි සලකා

බලා ලදී. එහෙයින් සිත උපන්නේ ය යන මෙහි ද චිත්තමාත්‍රය ම නොගෙන පනසකට අධික කුශල ධර්මයන් සමගම සිත ගන්නා ලදී. මෙසේ එහි සංක්ෂේප වශයෙන් සියලුම චිත්ත චෛතසික ධර්මයන් ගෙන මෙහි ස්වරූප වශයෙන් ප්‍රභේද වශයෙන් දක්වන්නට ස්පර්ශ වෙයි යන ආදිය පටන්ගන්නා ලදී. මෙසේ ස්පර්ශාදිය මෙන් සිත ද කියන ලද ම යැයි දතයුතුයි.

විතර්කනය (කල්පනා කිරීම) කෙරේනුයි = විතර්කයයි. විතර්කනය හෝ විතර්කයයි. කල්පනා කිරීම යැයි කියනු ලද්දේ වෙයි. ඒ මේ විතර්කය සිත අරමුණට යොමු කිරීම ලක්‍ෂණකොට ඇත්තේ ය. එය වනාහි සිත අරමුණෙහි ආරෝපණය කරයි. යම් සේ කිසිවෙක් රාජවල්ලභ වූ ඥාතියකු හෝ මිත්‍රයකු නිසා රජගෙට නගීද, මෙසේ විතර්කය නිසා සිත අරමුණට නගී. එහෙයින් එය අරමුණේදි සිතට ආරෝපණය කිරීම ලක්‍ෂණකොට ඇත්තේ යැයි කියන ලදී. නාගසේන ස්ථවිරයන් වහන්සේ වනාහි මෙසේ වදාළහ. 'විතර්කය ආකෝටන (තට්ටු කිරීම) ලක්‍ෂණ කොට ඇත. මහරජ, යම්සේ තට්ටුකරන ලද බෙරය පසුව ඒ අනුව හැසිරේද, අනුව ශබ්ද කෙරේද, මහරජ. එපරිද්දෙන් තට්ටුකාරීව යම්සේද විතර්කය ද එසේයැයි දතයුතුයි. පසුව අනුරාවය වීම අනුව ශබ්දවීම යම්සේද විචාරය එසේයැයි දතයුතුයි යනුයි. ඒ මේ විතර්කය හැප්පීම හාත්පසින් හැප්පීම රසය කොට ඇත්තේ ය. යම්සේ වනාහි යෝගාවචර තෙම එයින් අරමුණට විතර්කයෙන් පහර දෙන ලද්දක් විතර්කයෙන් විශේෂයෙන් පහරදෙන ලද්දක් කෙරේයැයි කියනු ලැබේ. අරමුණෙහි සිත ගෙනයාම වැටහීම කොට ඇත්තේ ය.

(අරමුණෙහි එය සමග සිත) හැසිරේනුයි = විචාරයයි. විචාරණය හෝ විචාරණය හෝ විචාරයයි. අනුව සංචාරය කිරීමයැයි කියන ලද්දේ වෙයි. ඒ මේ විචාරය අරමුණ පිරිමැදීම ලක්‍ෂණකොට ඇත්තේ ය. එහිදී සහජාතයන් අනුව යෙදීම රසය කොට ඇත්තේ ය. සිතට අනුව බැඳීම වැටහීම කොට ඇත්තේ ය. කිසියම් තැනෙක එක්වීමක් ඇතිකල්හි ද ඕලාරිකාර්ථයෙන් පූර්වාංගමාර්ථයෙන් ඝණ්ඨාව ගැසීමක් මෙන් විශේෂයෙන් ආරෝපණය කිරීම් අර්ථයෙන් ද සිතට පළමුවැටීම විතර්කයයි. සියුම් අර්ථයෙන් ද පිරිමැදීම් ස්වභාවාර්ථයෙන් ද ඝණ්ඨා අනුරාවය මෙන් අනුව බැඳෙනුයේ විචාරයයි. මෙහිදී විචාරය පැතිරවීම ඇත්තේය. පළමු උපන් කල්හි සිත ස්පන්දනය කරන සුලුය. අහසෙහි උඩ නගිනු

කැමති පක්ෂිකයෙකුගේ පියාපත් වික්ෂේපය (කලබලය) මෙන් ද සුවඳ අනුව බැඳුණු සිත් ඇති බඹරාගේ පියුමට අභිමුඛව වැටීම මෙන් ද වෙයි. ශාන්ත පැවතුම් ඇති විචාරය සිත අතිශයින් ස්පන්දනය කරන ස්වභාවය ඇත්තේ නොවේ. අහසට නැගුණු පක්ෂියාගේ පියාපත් ගැසීම මෙන්ද පියුමට අභිමුඛව බස්නා බඹරාගේ පියුමට මතු භාගයෙහි පරිභ්‍රමණය මෙන් ද වෙයි. අට්ඨකථාවෙහි වනාහි, අරමුණෙහි සිත ආරෝපණය කිරීම් වශයෙන් පවත්නා විතර්කය අහසෙහි යන මහා පක්ෂියකු දෙපියාපතින් වාතය ගෙන පියා සන්සිඳුවාගෙන ගමන්කිරීම මෙනි. එය වාතය ගැනීම පිණිස පියාසලන්නහුගේ ගමන මෙන් එකඟව පැමිණෙයි. පිරිමැදීම් වශයෙන් පවත්නේ විචාරයයි. එය වනාහි අරමුණ පිරිමදී යැයි කියන ලදී. එය අනුව බැඳීමෙන් පැවැත්මෙහි අතිශයින් ම යෙදේ. ඔවුන්ගේ මේ විශේෂය වනාහි ප්‍රථම ද්විතීය ධ්‍යානයන්හි ප්‍රකට වෙයි. තවද විතර්කය යම්සේ මලබැඳුණ රන්බඳුන එක් අතකින් දැඩිව ගෙන අනික් අතින් චූර්ණ තෙල් (සහිත) බුරුසුවකින් පිරිමදින්නාගේ දැඩිව ගත් අතුරෙහි, විචාරය පිරිමදිනා අත මෙනි. එසේ ම විතර්කය දඬුපහරින් සක කරකවා භාජනයත් සාදන කුඹල්කරුගේ පෙළන අත මෙනි. විචාරය ඔබ මොබ හසුරුවන අත මෙනි. එසේ ම සිත අරමුණට නංවන විතර්කය, මණ්ඩලයක් කරන්නාගේ මැද නතරකිරීමට සිටි කටුව (කුඤ්ඤං) මෙනි. පිරිමදිනාසුලු විචාරය පිටත කරකවන කටුව (කුඤ්ඤය) මෙන්.

පිණවානුයි = ප්‍රීතියය. එය ප්‍රිය කිරීම ලක්ෂණකොට ඇත්තේය. කය සිත පිණවීම හෝ ඵරණය (පැතිරීම) රසය කොට ඇත්තේ ය. ඔදවැඩි බව එළඹ සිටි කාරණ කොට ඇත්තේ ය. ඒ මේ ප්‍රීතිය වනාහි ඛුද්දකාපීති, ඛණිකාපීති, ඔක්කන්තිකාපීති, උබ්බේගාපීති, ඵරණාපීති යනුවෙන් පස්වැදෑරුම් වෙයි. එහි ඛුද්දිකා පීතිය ශරීරයෙහි ලොමුදැහැ ගැනීමට පමණක් කරන්ට හැකිවෙයි. ඛණිකාපීතිය ක්ෂණයෙන් ක්ෂණය විදුලි කෙටීම සමාන වෙයි. ඔක්කන්තිකා පීතිය සමුද්‍ර තීරයෙහි රළ මෙන් වැදි වැදි බිඳෙයි. ශරීරය අග උඩට කොට අහසෙහි නැංවීමට තරම් වූ උද්වේග ප්‍රීතිය බලවත් වෙයි. ඒ එසේමැයි :- පුණ්ණවල්ලික වැසි මහාතිස්ස ස්ථවිරයන් වහන්සේ පසළොස්වක දිනයෙහි සවස සෑමළුවට ගොස් සඳඑළිය දැක මහසෑයට අභිමුඛ ව මේ වේලාවෙහි වනාහි සිව්වනක් පිරිස මහසෑය වඳිත්යැයි ප්‍රකෘතියෙන් දුටු අරමුණු වශයෙන් බුද්ධාලම්භන උද්වේග ප්‍රීතිය උපදවාගෙන සුණුතලයෙක්හි ගසන ලද පන්දුවක් මෙන් අහසෙහි පැනනැගී මහසෑමළුයෙහි ම පිහිටියහ.

එසේ ම ගිරිකණ්ඩක විහාරයට සමීපයෙහි චිත්තකාල ගමෙහි එක් කුලදුවක් ද බලවත් වූ බුද්ධාලම්බන උද්වේග ප්‍රීතියෙන් අහසට පැන්නාය. ඇගේ මවුපියෝ වනාහි සවස බණ ඇසීමට විහාරයට යන්නාහු දුව, ඔබ ගැබ්බරය, අකාලයෙහි ඇවිදින්නට නො හැක්කෙහි ය. අපි ඔබ සඳහා පින්කොට බණ අසන්නෙමුයැයි (කියා) ගියහ. ඕ තොමෝ යනු කැමතිවද ඔවුන්ගේ වචනය වළක්වන්නට නොහැකි ව නැවතී ගෙයි දොර සිට සඳඑළියෙන් ගිරිකණ්ඩක අහසෙහි සෑමළුව බලන්නී සෑයෙහි පහන්පූජාව දුටුවාය. සිව්වනක් පිරිස මල්ගඳ ආදියෙන් සෑය පුදා පැදකුණු කරනු ද භික්ෂු සංඝයා ගණ සජ්ඣායනා කරන ශබ්දය ද කරනු ද භික්ෂු සංඝයා ගණ සජ්ඣායනා කරන ශබ්දයද ඇසුවාය. ඉක්බිති යම් මනුෂ්‍ය කෙනෙක් විහාරයට ගොස් මෙබඳු සෑමළුයෙහි ඇවිදින්නටත් මෙබඳු මිහිරි බණ කථා අසන්නට ලබත් ද, ඔව්හු ඒකාන්තයෙන් භාග්‍යවන්තයෝ යැයි මුතුරැසක් වන් සෑය බලත්ම ඇයට උද්වේග ප්‍රීතිය පහළවිය. ඕ තොමෝ අහසට පැන මව්පියන්ට පළමුවෙන්ම අහසින් සෑමළුවෙහි බැස සෑය වැඳ බණ අසමින් සිටියාය. ඉක්බිති මව්පියෝ අවුත් දුව, ඔබ කවර මාර්ගයෙකින් ආයේදැයි ඇගෙන් විචාළහ. ඕ තොමෝ අහස් මගින් ආවෙමි කියා 'දුව, රහත්හු නම් අහසින් යති. ඔබ කෙසේ ආයේදැයි' විචාරන ලදුව 'සඳඑළියෙන් සෑය බලමින් සිටි මට බුද්ධාලම්බනයෙහි බලවත් ප්‍රීතියක් උපන්නේ ය. ඉක්බිති මම තමා සිටි බවක් හෝ හුන් බවක් නො දනිමි. ගන්නා ලද නිමිත්තෙන් ම වනාහි අහසට පැන සෑමළුවෙහි පිහිටියෙමි'යි කීවාය. මෙසේ උද්වේග ප්‍රීතිය අහසට පැන්නවීමට ප්‍රමාණ වෙයි. ඵරණප්‍රීතිය උපන් කල්හි වනාහි මුළු සිරුර පිඹ පුරවන ලද වස්තියක් මෙන් ද දිය පහරක් බහාලූ පර්වත ගැබක් මෙන් ද පිරී ඉතිරී ගියේ වෙයි. ඒ මේ පංචවිධ ප්‍රීතිය ගැබ්ගත්තේ මේරීමට යන්නේ කායපස්සද්ධිය චිත්තපස්සද්ධිය යන දෙවැදෑරුම් පස්සද්ධිය සම්පූර්ණ කරයි. පස්සද්ධිය ගැබ්ගනුයේ මේරීමට යනුයේ කායික චේතසික යන දෙවැදෑරුම් සුවය සම්පූර්ණ කරයි. සුවය ගැබ්ගනුයේ මේරීමට යනුයේ ක්ෂණික සමාධිය උපචාර සමාධිය අර්පණා සමාධිය යන ත්‍රිවිධ සමාධි සම්පූර්ණ කරයි. ඒවා අතුරෙන් අර්පණා සමාධිය සම්පූර්ණ කිරීම හැර ඉතිරි දෙක ම මෙහි යෙදේ.

සැපත් කෙරේනුයි = සුවයය, යමෙකුට උපදී ද ඔහු සුවපත් කෙරෙයි යනු අර්ථයි. කායික මානසික ආබාධයක් මනාව කා දමයි. සාරා දමයි නුයි සුඛයයි. සොම්නස් වේදනාවට මෙය නමකි. එහි ලක්ෂණාදිය වේදනා

පදයෙහි කියන ලද නයින් දතයුතුයි. තවත් නයකි, සැපය ලක්ෂණකොට ඇත්තේ සුඛයයි. සම්ප්‍රයුක්ත ධර්මයන් වැඩීම රසයයි. අනුග්‍රහණය එළඹ සිටි කාරණයයි. කිසියම් තැනක ඒ ප්‍රීතිසුඛ දෙදෙනාගේ වෙන් නොවීමක් ඇති කල්හි ද ඉෂ්ටාරම්මණ ප්‍රතිලාභයෙහි සතුට ප්‍රීතියයි. ලබන ලද රසය අනුභව කිරීම සැපයයි. යම්තැනෙක ප්‍රීතිය වේද එහි සැපය වේ. යම්තැනෙක සැපය වේද එහි ප්‍රීතිය වේ. යම්තැනෙක සැපය වේද එහි නියම වශයෙන් ප්‍රීතිය නොවේ. ප්‍රීතිය සංස්කාර ස්කන්ධයෙහි සංගෘහිතයි. සැපය වේදනා ස්කන්ධයෙහි සංගෘහීතයි. ප්‍රීතිය කාන්තාරයෙහි මුළා වූවෙකුට වනාන්තරයේ ජලය දැකීම හා ඇසීම මෙනි. සැපය වනසෙවණට පිවිසීම ජලය පරිභෝග කිරීමේදී මෙනි. යම්සේ වනාහි මහා කාන්තාර මාර්ගයකට පිළිපන් ග්‍රීෂ්මයෙන් පෙළුණු බියටපත් පිපාසිත පුරුෂයෙක් ඉදිරිමගදී පුරුෂයකු දැක කොතැන පැන් ඇද්දැයි අසයි. හෙතෙම වනයෙන් එතරව විලක් හා වනරොදක් ඇත. එහි ගොස් (ගියවිට) ජලය ලැබෙන්නේ යැයි කියයි. හෙතෙම ඔහුගේ කථාව අසා තුටුපහටු වන්නේ ය. එයින් යන්නේ බිම වැටුණු උපුල්දලිය වැල්පත් ආදිය දැක වඩාත් තුටුපහටුව යන්නේ කෙත් වස්ත්‍ර ඇති තෙත් කෙස් ඇති පුරුෂයන් දක්නේ ය. වලිකුකුළු වනමොනර ආදීන්ගේ ශබ්දය අසන්නේ ය. විල් කෙළවර හටගත් මිණිදැලක් සමාන නිල් වනරොද දක්නේ ය. විලෙහි හටගත් උපුල් පියුම් කුමුදු ආදිය දක්නේ ය. පිරිසිදු ඉතා පැහැදිලි ජලය දක්නේ ය. හෙතෙම බොහෝසෙයින් තුටුපහටුව විලට බැස රිසි සේ නා (පැන්) බී නිවන ලද වෙහෙස ඇතිව නෙළුම්අල පුෂ්කරාදිය කා නිලුපුල් ආදිය පැළඳ මදාරා ගසක මුලක් කර තබාගෙන එතරවී සළුව ඇඳ දියසළුව අව්වේ වනා සිහිල් සෙවණෙහි මඳසුළං හමද්දී වැදහොත්තේ අනේ සැපයි අනේ සැපයි යැයි කියන්නේ ය.

මෙය ද මෙසේයැයි දතයුත්තේ ය. ඒ පුරුෂයාට විල වනරොද පිළිබඳව ඇසීමේ පටන් ජලය දක්නා තෙක් තුටුපහටු කාලයේ මෙනි. පූර්වභාග ආරම්මණයෙහි තුටුපහටු ආකාර ඇති ප්‍රීතිය, බලවත් සේ පැවති අරමුණෙහි රස අනුභව කරන ආකාරයෙන් සිටි සැපය හා (ජලය) බී සිහිල් සෙවණෙහි මඳ සුළං හමද්දී අනේ සැපයි අනේ සැපයි කියමින් වැදහොත් කාලය මෙනි. ඒ ඒ අවස්ථාවෙහි ප්‍රකට බැවින් මෙය කියන ලදැයි දතයුතුයි. යම්තැනෙක වනාහි ප්‍රීතිය වේද, සැපය ද එහි ඇතැයි මෙය කියන ලද්දේ ම ය.

**චිත්තස්ස එකග්ගතා** යනු සිතේ එකඟ බවයි. මෙය සමාධියට නමකි. මෙහි ලක්ෂණාදිය වනාහි පළමුවෙන් අට්ඨකථාවෙහි කියන ලදී. සමාධිය ප්‍රමුඛ ලක්ෂණය ද අවික්ෂේප ලක්ෂණය ද ඇත්තේ ය. යම්සේ වනාහි කුළුගෙයි කැණිමඬල සෙසු ද්‍රව්‍ය සමූහය හාත්පසින් බැඳීමෙන් ප්‍රමුඛ වේද, මෙපරිද්දෙන් සියලු කුශල ධර්මයන් සමාධි සිතින් ඉටුවන හෙයින් ඒ සියලුම ධර්මයන්ට සමාධිය ප්‍රමුඛ වේ. එහෙයින් ම 'මහරජ, යම්සේ කූටාගාරයක යම්කිසි ගොනැසි වේද ඒ සියල්ල මුදුන හා සම්බන්ධ වේද, මුදුනට සවි වේද, මුදුනට එක්රැස් වේද (එහෙයින්) කූටය ඔවුන්ට අග්‍රයැයි කියනු ලැබේ. මහරජ, එපරිද්දෙන් වනාහි යම්කිසි කුශල ධර්මයෝ වෙත් ද ඒ සියල්ලෝ ම සමාධිය වෙත නිම්න වූවෝ වෙත්. සමාධියට නැමුණෝ වෙත්. සමාධි ප්‍රාග්භාර වෙත්. සමාධිය ඔවුන්ට අග්‍රයැයි කියනු ලැබේ' යැයි කියනු ලැබේ. යම්සේ වනාහි රජ සෙනග අතරට පැමිණ යම් යම් තැන්වල සෙනග කිදාබසීද (නතර වේද) ඒ ඒ තැන්වලට යයි. ඔහු ගිය ගිය තැන සෙනග පිරෙයි. පරසෙනග බිඳ රජු අනුවම පවතී. මෙපරිද්දෙන් සහජාත ධර්මයන්ට වික්ෂේප වන්නට විසිරෙන්නට නොදෙන හෙයින් සමාධිය අවික්ෂේප ලක්ෂණ ඇත්තේ නම් වෙයි යනුයි.

තවත් නයකි. සිතේ එකඟ බව නම් වූ මේ සමාධිය නම් නො විසුරුවන ලක්ෂණ හෝ අවික්ෂේප ලක්ෂණ ඇත්තේ ය. නානු සුණුවලට ජලය මෙන් සහජාත ධර්මයන් පිඬුකිරීම රසකොට ඇත්තේ ය. සන්සිඳීම එළඹ සිටි කාරණා කොට ඇත්තේ ය. ඤාණය එළඹ සිටි කාරණය කොට හෝ ඇත්තේ ය. එකඟ වූයේ තත්ත්වාකාරයෙන් දැනගනී. දකී යැයි කියන ලදී. විශේෂයෙන් සැපය ආසන්න කාරණය කොට ඇත්තේ වාතය රහිත තැන පහන් සිලුවල ධීතිය මෙන් සිතේ නොසැලී සිටීම යැයි දතයුතුයි.

මෙයින් අදහති. තෙමේ හෝ අදහයි. මෙය ඇදහීම් මාත්‍රයෙහි යනු හෝ = **ශ්‍රද්ධාවයි**. එය ද ශ්‍රද්ධා නැත්හු අභිභවනය කරන හෙයින් අධිපති අර්ථයෙන් **ඉන්ද්‍රිය** වෙයි. නිශ්චය ලක්ෂණයෙන් හෝ ප්‍රධානත්වය කෙරේනුයි හෝ = **ඉන්ද්‍රියයි**. ශ්‍රද්ධාව ම ඉන්ද්‍රිය වූයේ = **සද්ධින්ද්‍රියයි**. ඒ මේ ශ්‍රද්ධාව වනාහි විශේෂයෙන් පහදවන ලක්ෂණය ද ජනිත ලක්ෂණය ද ඇත්තේ ය. යම්සේ වනාහි සක්විති රජුගේ උදක ප්‍රසාදක මාණික්‍යය දියෙහි දමන ලද්දේ ගොහොරුමඩ සෙවෙල් පහකර මඩ කිඳ බස්වයිද, ජලය පිරිසිදු කරයි. පැහැදිලි කෙරේ ද, නොකැළඹුණු බවට පත්කෙරේ ද,

එපරිද්දෙන් ශ්‍රද්ධාව උපදිනුයේ නීවරණයන් යටපත් කෙරෙයි. කෙලෙස් යටපත් කෙරෙයි. සිත පහදවයි. නොකැළඹුණු බවට පත් කෙරෙයි. මෙපරිද්දෙන් ශ්‍රද්ධාව උපදිනුයේ නීවරණයන් යටපත් කෙරෙයි. කෙලෙස් සංසිඳුවයි. සිත පහදවයි. නොකැළඹුණු බවට පත්කෙරෙයි. යෝගාවචර කුලපුත්‍ර තෙමේ දන් දෙයි. සිල් සමාදන් වෙයි. පෙහෙවස් රකියි. භාවනාව ආරම්භ කරයි. මෙසේ වනාහි ශ්‍රද්ධාව විශේෂයෙන් පහදවන ලක්‍ෂණ ඇත්තේයැයි දතයුතුයි. එහෙයින් නාගසේන ආයුෂ්මතුන් වහන්සේ මෙසේ වදාළහ.

'යම්සේ මහරජ! සක්විති රජ සිවුරඟ සෙනඟ (සමග දීර්ඝ මාර්ගයට පිළිපන්නේ) ස්වල්ප වූ දියපාරකින් එතර වෙයිද, එහි ජලය ඇතුන්ගෙන්ද අසුන්ගෙන් ද රථවලින් ද පාබල සෙනඟින් ද කැළඹුණේ වෙයි ද, මඩවූයේ වෙයිද, එතරවුණු රජ 'බොලව්, බීමට පැන් ගෙනෙව්'යැයි මිනිසුන්ට අණ කරන්නේ ය. රජුටද උදකප්‍රසාදන මාණික්‍යයක් ඇත්තේය. ඒ මිනිස්සු 'එසේය දේවයන් වහන්සැ'යි රජුට පිළිතුරු දී ඒ උදක ප්‍රසාදක මාණික්‍යය ජලයෙහි බහාලන්නාහුය. (එය) දියෙහි බහාලූ පමණින් වහාම මඩසෙවෙල් යටපත් වේද, පිරිසිදු වේද, ජලය පැහැදිලි වේද, නොකැළඹුණේ වෙයිද, ඉන්පසු දේවයන් වහන්ස, පැන් පානය කරන්නැයි රජුට පැන් පිරිනමන්නාහුය. මහරජ, ජලය යම්සේ ද සිත එසේයැයි දතයුතුයි. ඒ මිනිස්සු යම්සේද, යෝගාවචරයා එසේයැයි දතයුතුයි. ගොහොරු මඩ සෙවෙල් නොකර මඩ යම්සේද කෙලෙස් එසේයැයි දතයුතුයි. උදක ප්‍රසාදක මාණික්‍යය යම්සේ ද ශ්‍රද්ධාව එසේයැයි දතයුතුයි. උදක ප්‍රසාදක මාණික්‍යය බහාලූ කල්හි ගොහොරුව සෙවෙල් නොකර මඩ ද පහවෙයි ද ජලය පිරිසිදු වෙයි ද, ජලය පැහැදුණේ නො කැළඹුණේ වෙයි ද, මහරජ, මෙපරිද්දෙන් වනාහි ශ්‍රද්ධාව උපදිනුයේ නීරණයන් පහකෙරයි. සිත නීවරණයන්ගෙන් තොර වෙයි. පිරිසිදු වූයේ පැහැදිලි වූයේ නොකැළඹුණේ වෙයි යනුයි. යම් සේ වනාහි කිඹුල් මකර ආදීන්ගෙන් ගහණ රාක්‍ෂසාදීන්ගෙන් සංකීර්ණ වූ පිරුණු මහනදියක් වෙත පැමිණ බියට පත් මහජනයා දෙතෙර සිටිත්ද, සංග්‍රාම සූර වූ මහා යෝධයෙක් අවුත් කවර හෙයින් සිටින්නහුදැයි විචාරා ප්‍රතිභය සහිත බැවින් තරණය කරන්නට අසමර්ථයම්හයි කී කල්හි ඉතා සියුම් කඩුවක් ගෙන මා පස්සෙන් එව්. බිය නොවව් යැයි කියා නදියට බැස ආ කිඹුල් ආදීන් වළක්වා මෙතෙර මිනිසුන් සුවපත් කෙරෙමින් එතෙරට පමුණුවයි ද, එතෙරින් ද සුවසේ මෙතෙරට පමුණුවයි ද මෙපරිද්දෙන් දන් දෙන්නාගේ සිල්

රකින්නාගේ පෙහෙවස් රකින්නාගේ භාවනාව අරඹන්නාගේ ශ්‍රද්ධාව පූර්වාංගම වෙයි. ඉදිරියෙන් හැසිරෙන්නා වෙයි. එහෙයින් 'ශ්‍රද්ධා පන්න ලක්ෂණ ඇත්තේ යැයි' කියන ලදී. තවත් නයක් (එනම්) ශ්‍රද්ධාව ඇදහීම් ලක්ෂණකොට ඇත්තේ හෝ පවට බියබව ලක්ෂණකොට ඇත්තේ වෙයි. උදක ප්‍රසාදක මැණික මෙන් පැහැදවීම රසකොට ඇත්තේ ය. ඕඝතරණය මෙන් පැනීම රසකොට ඇත්තේ ය. නොකිලිටි බව එළඹ සිටින ආකාරයයි. අධිෂ්ඨානය හෝ එළඹ සිටින ආකාරයයි. ඇදහිය යුතු වස්තුව හෝ සෝතාපත්තියංගය ආසන්න කාරණයයි. සියතින් දමන ලද බීජ මෙනැයි දතයුතුයි.

වීරයාගේ භාවය = **වීර්යයයි.** වීරයාගේ කර්මය හෝ = **වීර්යයයි.** ක්‍රමයෙන් හෝ නයින් හෝ උපායෙන් සෙලවිය යුතුයි. පැවැත්විය යුතුයි නුයි. = **වීර්යයයි.** එයම කුසීතබව මඩනා හෙයින් අධිපති අර්ථයෙන් **ඉන්‍ද්‍රියයි.** උත්සාහ කිරීම් ලක්ෂණයෙහි හෝ අධිපති බව කරවානුයි = **ඉන්‍ද්‍රියයි.** වීර්යයම ඉන්‍ද්‍රිය වූයේ = **විරියින්‍ද්‍රියයි.** ඒ මේ වීර්යය උපකාරවීම් ලක්ෂණය ද උත්සාහවත් කිරීමේ ලක්ෂණය ද ඇත්තේ ය. යම්සේ දිරූ ගෙයක් ආගන්තුක වූ ටැඹක උපකාරයෙන් සිටී ද, මෙපරිද්දෙන් යෝගාවචර තෙමේ වීර්යයේ උපකාරයෙන් රුකුල් ලැබ සියලු කුශල ධර්මයන්ගෙන් නොපිරිහේ ද, වෙසෙසින් නො පිරිහේද මෙපරිද්දෙන් වනාහි එහි උපත්ථම්භන ලක්ෂණය දතයුතුයි. එහෙයින් නාගසේන ස්ථවිරයන් වහන්සේ මෙසේ කීහ. 'මහරජ, යම්සේ ගෙයක් වැටෙද්දී වෙනත් දැවයකින් රුකුල් දෙනුයේ ද, රුකුල් දෙනු ලැබුවා වූ ම ඒ ගෙය නො වැටේද, මහරජ, එපරිද්දෙන් වනාහි වීර්යය උපකාර වන ලක්ෂණ ඇත්තේ ය. වීර්යයෙන් උපස්ථම්භිත සියලු කුශල ධර්මයෝ (නො පිරිහෙත්) වෙසෙසින් නො පිරිහෙත්' යනුයි. යම් සේ වනාහි කුඩා වූ ද මහත් වූ ද සේනාවක් අතර සංග්‍රාමයක් පවත්නා කල්හි කුඩා සේනාව පසුබස්නේ ද, එවිට රජුට දැනුම් දෙයි. රජ බලසෙනග හා වාහන එවන්නේ ද, එයින් ධෛර්යවත් වූ ස්වකීය සේනාව පරසේනාව පරාජය කරන්නේ ය. මෙපරිද්දෙන් වීර්යය සහජාත සම්ප්‍රයුක්ත ධර්මයන්ට පසුබසින්නට නො දෙයි. ඔසවා තබයි. උත්සාහවත් කරයි. එහෙයින් කියන ලදී. 'වීර්යය උත්සාහවත් කිරීම ලක්ෂණකොට ඇත්තේය' යනුයි. තවත් නයකි. 'වීර්යය උත්සාහවත් කිරීම ලක්ෂණකොට ඇත්තේය. සහජාත ධර්මයන්ට උපස්ථම්භනය වීම රසයකොට ඇත්තේ ය. පසුබට නොවන බව එළඹසිටි කාරණයයි. 'සංවේගයට පත්වූයේ නුවණින් උත්සාහ කරයි' යන කීම අනුව සංවේගය

ආසන්න කාරණයයි. වීර්යාරම්භයට වස්තුව වීම හෝ ආසන්න කාරණයි. මනාසේ අරඹන ද සියලු සම්පත්තීන්ට මූලය වේයැයි දතයුතුයි.

මෙයින් හැසිරෙත්. තෙමේ හෝ හැසිරෙයි. මෙය හැසිරීම් මාත්‍රයමය යනුයි. = **සති** යයි. එය සිහිමුළා බව මැඩපවත්වන හෙයින් අධිපති අර්ථයෙන් = **ඉන්ද්‍රිය** යයි. සතියම ඉන්ද්‍රිය වූයේ = **සතින්ද්‍රියයි.** ඒ මේ සතිය නො ඉල්පීම ලක්ෂණකොට ඇත්තේ හෝ සිහිගැන්වීම ලක්ෂණකොට ඇත්තේ ය. යම්සේ රජුගේ භාණ්ඩාගාරිකයා වනාහි දශවිධ රත්නයන් ආරක්ෂා කරමින් උදේ ද සවස ද රජුට ඓශ්වර්ය සම්පත්තිය සලකවයි. සිහිගන්වයි. මෙපරිද්දෙන් සතිය කුශල කර්මයන් සලකවයි. සිහිගන්වයි. එහෙයින් (නාගසේන) ස්ථවිරයන් වහන්සේ (මෙසේ) වදාළහ. 'මහරජ, යම්සේ රජුගේ භාණ්ඩාගාරිකයා සක්විති රජුට උදේ ද සවස ද දේවයන් වහන්ස, ඇත්තු මෙපමණය. (අශ්වයෝ මෙපමණය. රිය මෙපමණය. පාබළ සෙනග මෙපමණය.) අමුරන් මෙපමණය. සනරන් මෙපමණය. සියලු සම්පත්තිය මෙපමණය. එය දේවයන් වහන්සේ සිහිකෙරෙත්වා යි කියායි.

මහරජ, මෙපරිද්දෙන් වනාහි සතිය මේ සතර සතිපට්ඨානයෝ ය. මේ සතර සම්‍යක් ප්‍රධානයෝ ය. මේ සතර ඍද්ධිපාදයෝ ය. මේ පංචෙන්ද්‍රියයෝ ය. මේ පංච බලයෝ ය. මේ සප්ත බෝධ්‍යාංගයෝ ය. මේ ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. මේ සමථයයි. මේ විදර්ශනාවයි. මේ විමුක්තියයි. මේ ලෝකෝත්තර ධර්මයෝ යැයි කුශල ධර්මය සිහි ගන්වයි. මහරජ, මෙපරිද්දෙන් වනාහි සතිය සිහිගන්වන ලක්ෂණ ඇත්තේය යනුයි.' යම්සේ වනාහි සක්විති රජුගේ පරිනායක රත්නය රජුට අහිතයන් ද හිතයන් ද දැන අහිතයන් බැහැර කරයි. හිතයන් ළංකරවයි ද මෙපරිද්දෙන් සතිය හිතාහිත ධර්මයන්ගේ ගතිය සොයාබලා මේ කාය දුශ්චරිතාදී ධර්මයෝ අහිතයෝ යැයි අහිත ධර්මයන් පහකරයි. මේ කාය සුචරිතාදී ධර්මයෝ හිතයෝ යැයි හිත ධර්මයන් ළංකර ගනී. එහෙයින් තෙරුන් වහන්සේ මෙසේ වදාළහ. 'මහරජ, යම්සේ රජුගේ පරිනායක රත්නය රජුට හිතාහිතයන් මොව්හු රජුට හිතයෝය. මොවුහු අහිතයෝය. මොව්හු උපකාරකයෝය. මොව්හු අනුපකාරකයෝ යැයි දැනගනී. ඉක්බිති අහිතයන් පහකරයි. හිතයන් ළංකර ගනී. මහරජ, මෙපරිද්දෙන් වනාහි උපදනා සතිය හිතාහිත ධර්මයන්ගේ ගති සලකා බලයි. මේ ධර්මයෝ හිතයෝය. මේ ධර්මයෝ අහිතයෝය. මේ ධර්මයෝ උපකාරකයෝ ය. මේ ධර්මයෝ

අනුපකාරකයෝය යනුවෙනි. ඉක්බිති අහිත ධර්මයන් පහකරයි. හිත ධර්මයන් ළංකර ගනී. මහරජ, මෙපරිද්දෙන් වනාහි සතිය (හිත ධර්මයන්) ළංකරගන්නා ලක්ෂණ ඇත්තේය' යනුයි. තවත් නයකි, සතිය සිහිගන්වන ලක්ෂණ ඇත්තේ ය. මුළානොවීම රසය කොට ඇත්තේය. ආරක්ෂාව එළඹ සිටින ආකාරයයි. විෂයට අභිමුඛ වන බව හෝ එළඹ සිටින ආකාරයයි. ස්ථිර සංඥාව ආසන්න කාරණයයි. කායාදී සතිපට්ඨාන හෝ ආසන්න කාරණයයි. අරමුණෙහි දැඩි ලෙස පිහිටි බැවින් වනාහි ඉන්ද්‍රඛීලයක් මෙන් ද චක්ෂුර්ද්වාරාදිය රක්නා හෙයින් ද්වාර පාලකයකු මෙන් ද දතයුතුයි.

අරමුණෙහි සිත මනාව පිහිටුවානුයි තබානුයි = **සමාධියයි.** එය ද වික්ෂේපනය මඩනා හෙයින් අධිපති අර්ථයෙන් = **ඉන්ද්‍රියයි.** අවික්ෂේප ලක්ෂණයෙහි හෝ ප්‍රධානත්වය කෙරේනුයි = **ඉන්ද්‍රියයි.** සමාධියම ඉන්ද්‍රිය වූයේ = **සමාධින්ද්‍රියයි.** මෙහි ලක්ෂණාදිය වනාහි යට කියන ලද නයින්ම දතයුතුයි.

විශේෂයෙන් දැනගනීනුයි = **ප්‍රඥාවයි.** කුමක් විශේෂයෙන් දැනගනී ද? මේ දුකය යන ආදී නයින් ආර්ය සත්‍යයන් (විශේෂයෙන් දැනගනී) අට්ඨකථාවෙහි වනාහි පනවානුයි ප්‍රඥා යැයි කියන ලදී. කුමක් පණවයිද යතහොත්, අනිත්‍යය, දුඃඛය අනාත්මය යැයි පනවයි. එය ද අවිද්‍යාව මැඩපවත්වන හෙයින් අධිපති අර්ථයෙන් = **ඉන්ද්‍රිය** වේ. දර්ශන ලක්ෂණයෙහිදු අධිපති බව කරවානුයි ද = **ඉන්ද්‍රිය** වේ. ප්‍රඥාව ම ඉන්ද්‍රිය වූයේ = **ප්‍රඥෙන්ද්‍රිය** යයි. ඒ මේ ප්‍රඥාව වනාහි බබළවන ලක්ෂණ ද විශේෂයෙන් දැනගන්නා ලක්ෂණ ද ඇත්තේ ය. යම්සේ වනාහි සිව් බිත්තියකින් යුත් ගෙයක රාත්‍රී කාලයෙහි පහන් දැල්වූ විට අඳුර නැතිවෙයි. ආලෝකය පහළ වෙයි. මෙපරිද්දෙන් ප්‍රඥාව බබළවන ලක්ෂණ ඇත්තේය. ප්‍රඥා ආලෝකය සමාන ආලෝකයක් නම් නැත. එක් පළඟින් හුන් ප්‍රඥාවන්තයාට වනාහි දසදහසක් ලෝකධාතුව ඒකාලෝක වෙයි. එහෙයින් (නාගසේන) තෙරුන්වහන්සේ මෙසේ වදාළහ. 'මහරජ, යම්සේ පුරුෂයෙක් අඳුරු ගෙයකට තෙල්පහනක් පිවිසවයි ද පිවිසවන ලද පහන අඳුර නසයි ද, බැබළවීම ඇතිකෙරේ ද, ආලෝකය විහිදවයි ද, රූපයන් ප්‍රකට කරයි ද මහරජ? මෙපරිද්දෙන් වනාහි උපදනා ප්‍රඥාව අවිද්‍යා අන්ධකාරය නසයි. විද්‍යා ඕභාසය දනවයි. ඥානාලෝකය විහිදුවයි. ආර්ය සත්‍යයන් ප්‍රකට කරයි. මහරජ, මෙපරිද්දෙන් වනාහි ප්‍රඥාව බබළවන ලක්ෂණ ඇත්තේය' යනුයි. යම්සේ වනාහි දක්ෂ

වෙදෙක් ආතුරයන් හිතකර හිතකර බොජුන් දනීද, මෙපරිද්දෙන් උපදනා ප්‍රඥාව කුසල් අකුසල් සේවනය කළයුතු සේවනය නොකළයුතු හීනප්‍රණීත කෘෂ්ණ ශුක්ල සප්‍රතිභාග (අප්‍රතිභාග) ධර්මයන් විශේෂයෙන් දැනගනී. දම්සෙනෙවි සැරියුත් තෙරුන් විසින් මෙය ද වදාරන ලදී. 'ඇවැත්නි, විශේෂයෙන් දැනගනී. එහෙයින් ප්‍රඥාව යැයි කියනු ලැබේ. කුමක් විශේෂයෙන් දැනගනී ද, මෙය දුකයැයි විශේෂයෙන් දැන ගනී', යැයි විස්තර කළයුතුයි. මෙසේ ප්‍රඥාවගේ විශේෂයෙන් දැනගන්නා ලක්ෂණය දතයුතුයි. තවත් නයකි. ප්‍රඥාව යථා ස්වභාවය ප්‍රතිවේධ කරන ලක්ෂණ ඇත්තේ හෝ නොපැකිළ ප්‍රතිවේධ කරන ලක්ෂණ ඇත්තේ හෝ දුන්නෙන් නිකුත්වන ඊය මෙන් ප්‍රතිවේධ කරන ලක්ෂණ ඇත්තේය. පහනක් මෙන් විෂය ආලෝකවත් කිරීම රසයකොට ඇත්තේය. වනගත වූ ප්‍රදේශවැසියකු මෙන් මුළාවෙන් තොරව වැටහෙන ලක්ෂණ ඇත්තේය.

සිතයිනුයි = මන යි දනී යන අර්ථයි. අර්ථකථාචාර්යවරු මෙසේ කීහ. නැළියෙන් මනින්නාක් මෙන් ද මහා තුලාවෙන් දරන්නාක් මෙන්ද අරමුණ මනී දැනගනීනුයි = මන ය යනුයි. එයම මැනීම් ලක්ෂණයෙන් ප්‍රධාන බවක් කරවානුයි = **ඉන්‍ද්‍රියයි.** මනස ම ඉන්‍ද්‍රිය වූයේ = **මනින්‍ද්‍රියයි.** යට කියන ලද සිතට මෙය පරියාය වචනයකි. ප්‍රීති සෝමනස්ස සම්ප්‍රයෝගයෙන් සෝභන වූ මනයක් මොහුට ය යනු = **සුමනයි.** සුමනගේ භාවය **සෝමනස්ස** ය. සැප ලක්ෂණයෙහි ආධිපත්‍යය කරවානුයි = **ඉන්‍ද්‍රියයි.** සොම්නසම ඉන්‍ද්‍රිය වූයේ = **සෝමනස්සින්‍ද්‍රියයි.** යට කියන ලද වේදනාවටම මෙය පරියාය වචනයකි.

එය හා සම්ප්‍රයුක්ත ධර්මයෝ එයින් ජීවත් වෙත්නුයි = **ජීවිතයයි.** අනුපාලන ලක්ෂණයෙහි ආධිපත්‍යය කරවානුයි = ඉන්‍ද්‍රියයි. ජීවිතයම ඉන්‍ද්‍රිය වූයේ = **ජීවිතින්‍ද්‍රිය යයි.** එය නිරන්තර ව පවත්නා ආධිපත්‍යයක් වෙයි. ලක්ෂණාදි වශයෙන් වනාහි තමා හා වෙන්නොවී පවත්නා ධර්මයන් පාලනය කරන ලක්ෂණ ඇත්තේ ජීවිතින්‍ද්‍රිය යි. ඔවුන්ගේ පැවැත්වීම රසයයි. ඔවුන්ගේ ම තැබීම එළඹ සිටින ආකාරයයි. පැවැත්විය යුතු ස්වභාවය ආසන්න කාරණයයි. අනුපාලන ලක්ෂණාදිය ඇතිකල්හි ද විධානය ඇතිවිට ම එය ඒ ධර්මයන් පාලනය කරයි. ජලය උපුල් ආදිය මෙන්, තම තමන්ට අයත් පරිදි ධර්මයන් එළඹ සිටි කල්හි ද කිරිමව දරුවකු (පාලනය කරන්නාක් මෙන්) මෙන් පාලනය කරයි. තෙමේ පවත්නා ධර්මයන්ට සම්බන්ධව ම පවතී. නියාමකයා (නැව) මෙනි.

භංගයෙන් මත්තෙහි නො පවත්වයි. තමාගේ ද පැවැත්විය යුතු ධර්මයන්ගේ ද අභාවයෙනි, තමාද බිඳෙනා හෙයින් භංගක්‍ෂණයෙහි නො පිහිටුවයි. ක්‍ෂය වන පහන්වැටියෙහි තෙල පහන් සිළුව මෙනි. අනුපාලන පවත්තන ඨපන ආනුභාව තොර වූයේ පළමු කියන ලද ක්‍ෂණයෙහි ඒ ඒ ධර්මයන්ට සාධන වශයෙන් නොවේයැයි දතයුතුයි.

සම්මා දිට්ඨි ආදියෙහි දර්ශනාර්ථයෙන් = **සමමා දිටඨියයි.** සිත අරමුණට යොමුකිරීම් අර්ථයෙන් **සමමා සංකලපයයි.** වැටහීම් අර්ථයෙන් **සමමා සතියයි.** චංචල නොවන අර්ථයෙන් = **සමමා සමාධි** යැයි දතයුතුයි. වචනාර්ථ වශයෙන් වනාහි මනාව දකී හෝ එයින් මනාව දකිත්නුයි = **සමමා දිටඨියයි.** මනාව සංකල්පනය කෙරෙයි හෝ එයින් මනාව සංකල්පනා කරත්නුයි = **සමමා සංකපප** යි. මනාව උත්සාහ කෙරෙයි හෝ එයින් මනාව උත්සාහ කරත්නුයි = **සමමා වායාමයි.** මනාව සිහිකරයි හෝ එයින් මනාව සිහි කරත්නුයි = **සමමා සතියයි.** මනාව සමාධියට පත්වෙයි හෝ එයින් මනාව සමාධියට පත්වෙත්නුයි = **සමමා සමාධියි.** තව ද ප්‍රශස්ත වූ හෝ සුන්දර වූ දෘෂ්ටිය **සමමා දිටඨි** යැයි. මේ නයින්ද ඔවුන්ගේ වචනාර්ථය දතයුතුයි. ලක්‍ෂණාදිය වනාහි යට කියන ලදමය.

ශ්‍රද්ධා බල ආදියෙහි ද ශ්‍රද්ධා ආදිය කියන ලදම ය. කම්පා නොවන අර්ථයෙන් වනාහි බලය දතයුතුයි. මෙසේ මොවුනතුරෙහි නො ඇදහිය යුත්තෙහි කම්පා නොවේ නුයි = **සද්ධා බලයයි.** කුසීත බවෙහි කම්පා නොවේ නුයි = **විරිය බලයයි.** සිහි මුළා බවෙහි කම්පා නොවේනුයි = **සති බලයයි.** නොසන්සුන් බවෙහි කම්පා නොවේනුයි = **සමාධි බලයයි.** අවිද්‍යාවෙහි කම්පා නොවේනුයි = **පඤ්ඤා බලයයි.** අලජ්ජාවෙහි කම්පා නොවේනුයි = **හිරි බලයයි.** පවට බිය නොවීමෙහි කම්පා නොවීම = **ඔතතපප බලයැයි** මේ උභයපද වශයෙන් අර්ථ වර්ණනාව වෙයි. එහි පළමු පස යට ලක්‍ෂණාදියෙන් ප්‍රකාශ කරන ලද්දේමය. පශ්චිම ද්වයෙහි කාය දුශ්චරිතාදියෙන් ලජ්ජා වේනුයි = **හිරි** යයි. මෙය ලජ්ජාවට නමකි. ඒවායින් ම බියවේනුයි = **ඔතතපපයි.** පවින් උද්වේගයට පත්වීමට මෙය නමකි. ඔවුන්ගේ ම නානත්වය දැක්වීමට සමුට්ඨාන අධිපති ලජ්ජා භය **ලක්‍ෂණ** යන මේ මාතෘකාව තබා මේ විස්තර කථාව කියන ලදී. ආධ්‍යාත්මයෙහි හටගනුයේ **හිරි** නම්. පිටත හටගනුයේ **ඔතතපප** නම්. ආත්මාධිපති වූයේ **හිරි** නම්. ලෝකය අධිපති කොට ඇත්තේ **ඔතතපප**

නම්. සස්වාමික බව ලක්‍ෂණ කොට ඇත්තේ හිරි නම්. වරදෙහි බිය බව බය දක්නා බව ලක්‍ෂණ කොට ඇත්තේ ඔත්තප්ප නම්.

එහි ආධ්‍යාත්මයෙහි උපදනා ලජ්ජාව කාරණා සතරකින් උපදවයි. ජාතිය ප්‍රත්‍යවේක්‍ෂා කොට වයස ප්‍රත්‍යවේක්‍ෂා කොට 'ශූරභාවය ප්‍රත්‍යවේක්‍ෂා කොට බහුශ්‍රැත බව ප්‍රත්‍යවේක්‍ෂා කොට (යනුවෙනි.) කෙසේද යත්? මේ පව්කිරීම නම් ජාති සම්පන්නයන්ගේ කර්මයක් නොවේ. මෙය හීන ජාති ඇති කෙවුල් ආදීන්ගේ කර්මයකි. මා වැනි ජාති සම්පන්නයකු මේ කර්මය කිරීම යුතු නොවේ යැයි මෙසේ වනාහි ජාතිය ප්‍රත්‍යවේක්‍ෂා කොට ප්‍රාණඝාතාදී පව් නොකරනුයේ ලජ්ජාව උපදවයි. එසේ ම මේ පව් කිරීම නම් ළදරුවන් විසින් කළයුතු කර්මයකි, මා වැනි (වැඩිහිටි) වයසෙහි සිටියකු මේ කර්මය කිරීම යුතු නොවේ යැයි මෙසේ වයස ප්‍රත්‍යවේක්‍ෂා කොට ප්‍රාණඝාතාදී පව් නො කරනුයේ ලජ්ජාව උපදවයි. එසේ ම මේ පව්කම් නම් දුබල ජාතීන්ගේ කර්මයකි. (ශූරභාවය ඇති අයගේ ක්‍රියාවක් නොවේ) මා වැනි ශූරභාවයෙන් යුු අයකු මේ කර්මය කරනු යුතු නොවේ යැයි මෙසේ ශූරභාවය ප්‍රත්‍යවේක්‍ෂා කොට ප්‍රාණඝාතාදී පව් නොකරනුයේ ලජ්ජාව උපදවයි. එසේම මේ මේ පාපකර්මය නම් අන්‍ධ බාලයින්ගේ කර්මයකි. පණ්ඩිතයන්ගේ කර්මයක් නොවේ. මා වැනි පණ්ඩිතයකු බහුශ්‍රැතයකු මේ කර්මය කිරීම යුතු නොවේයැයි මෙසේ බහුශ්‍රැත බව ප්‍රත්‍යවේක්‍ෂා කොට ප්‍රාණඝාතාදී පව් නොකරනුයේ ලජ්ජාව උපදවයි. උපදවා ද වනාහි තම සිතෙහි ලජ්ජාව පිවිසුවා පව්කම් නො කරයි. මෙසේ ආධ්‍යාත්මයෙහි උපදිනුයේ හිරි නම් වෙයි.

පිටත උපදිනුයේ ඔත්තප්ප නම් වනුයේ කෙසේද? යත්, ඔබ පව්කම් කරන්නේ නම් සිවුපිරිසෙහි ගර්හාවට පත්වන්නේය.

**ගරහිස්සන්ති තං විඤ්ඤූ අසුචිං නාගරිකො යථා**
**වජ්ජිතො සීලවන්තෙහි කථං භික්ඛු කරිස්සසී'ති**

'නාගරිකයකු අශුචියක් මෙන් නුවණැත්තෝ ඔබට ගර්හා කරත්. සිල්වතුන් විසින් වර්ජනය කරන ලද්දේ ය. මහණ කෙසේ නම්, (මහණකම) කරන්නෙහි ද?'

මෙසේ ප්‍රත්‍යවේක්ෂා කරන්නා වනාහි බාහිරව උපන් ඔත්තප්පය නසා පව්කම් නො කරයි. මෙසේ බාහිරව උපන්නේ ඔත්තප්ප නම් වෙයි.

හිරිය ආත්මාධිපති නම් වූයේ කෙසේ ද? මේ ශාසනයෙහි ඇතැම් කුලපුත්‍රයෙක් තමා අධිපති කොට තමා ජ්‍යෙෂ්ඨ කොට ශ්‍රද්ධාවෙන් පැවිදි වූ බහුශ්‍රැත වූ ධුතාංගධර වූ මා වැනි අයෙකුට පව්කිරීම යුතු නොවේ යැයි පව් නොකරයි. මෙසේ ලජ්ජාව ආත්මාධිපති නම් වෙයි. එහෙයින් භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ. 'හෙතෙම තමා ම අධිපති කොට ජ්‍යෙෂ්ඨ කොට අකුසල් දුරුකරයි. කුසල් වඩයි. සාවද්‍ය දුරුකරයි. නිරවද්‍ය වඩයි. පිරිසිදු වූ ආත්මය පවත්වාගෙන යයි' යනුයි.

ඔත්තප්පය කෙසේ නම් ලෝකාධිපති වේද, මේ ශාසනයෙහි ඇතැම් කුලපුත්‍රයෙක් ලෝකය අධිපති කොට ලෝකය ජ්‍යෙෂ්ඨ කොට පව්කම් නොකරයි. මෙසේ ද කීහ. 'මේ ලෝක සන්නිවාසය (ලෝක සමාජය වනාහි) විශාලය. මහත් වූ ලෝක සන්නිවාසයෙහි වනාහි ඍද්ධිමත් දිවැස් ඇති පරසිත් දන්නා මහණ බමුණෝ ඇත. ඔව්හු දුර සිට ම දකිත්. ආසන්නයේ දී නො පෙනෙත්. (තමන්ගේ) සිතින් (අන්‍යයන්ගේ) සිත දැනගනිත්. ඔව්හු ද මා මෙපරිද්දෙන් දැනගනිත්. පින්වත, ශ්‍රද්ධාවෙන් ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදි ව ලාමක වූ අකුශල ධර්මයන්ගෙන් ගැවසී ගෙන වාසය කරයි බලව් කියායි. ඍද්ධිමත් දිවැස් ඇති පරසිත් දන්නා දේවතාවෝ ඇත. ඔව්හු දුරදී දකිත්. ආසන්න වූවෝ නොපෙනෙත්. සිතින් සිත දනිත් ඔව්හු ද පින්වත, ශ්‍රද්ධාවෙන් ගිහිගෙයින් නික්ම සස්නෙහි පැවිදිව ලාමක වූ අකුශල ධර්මයන්ගෙන් ගැවසී වාසය කරන මේ කුලපුත්‍රයා බලව් මා දැනගනිත් යැයි හෙතෙම ලෝකයම අධිපති කොට ජ්‍යෙෂ්ඨ කොට අකුසල් දුරුකරයි. කුසල් වඩයි. සාවද්‍ය දුරලයි. නිවරද්‍ය වඩයි. පිරිසිදු තමා පරිහරණය කරයි' යනුයි. මෙසේ ඔත්තප්පය ලෝකාධිපති නම් වෙයි.

ලජ්ජා ස්වභාවයෙන් සිටියේ හිරියයි. භය ස්වභාවයෙන් සිටියේ ඔත්තප්පයයි. මෙහි වනාහි ලජ්ජා යනු ලජ්ජාවන ආකාරයයි. ඒ ස්වභාවයෙන් සිටියේ හිරියයි. බිය යනු අපාය බියයි. ඒ ස්වභාවයෙන් සිටියේ ඔත්තප්පයයි. ඒ දෙකම පවින් තොරවීමේදී ප්‍රකට වේ. ඇතැමෙක් වනාහි (මෙසේ ද කියයි.) එක් කුලපුත්‍රයෙක් මලමූත්‍ර පහකිරීම් ආදිය කරනුයේ ලජ්ජා විය යුතු එකකු දැක ලජ්ජාවන ආකාරයට පත්වූයේ

යම්සේ ලජ්ජා වූයේ වෙයිද, මෙ පරිද්දෙන් තමා ලජ්ජා ධර්මයට බැසගෙන පව්කම් නො කෙරේ. ඇතැමෙක් අපායබයින් බිය වූයේ පව්කම් නො කෙරේ. එහිදී මේ උපමාවකි. යම්සේ වනාහි ලෝගුලි දෙකකින් එකක් සිහිල් වූයේ අසූචි තැවරුණේ වේද, එකක් රත්වූයේ ගිනිගත්තේ වේද, එහිදී පණ්ඩිතයා සිහිල් වූ අසූචි තැවරුණු ලොහොගුළිය පිළිකුල් කරමින් නොගනී. අනෙක දාහබියෙන් නොගනී. එහිදී තමා ලජ්ජාවට පැමිණ පව් නොකිරීම සිහිල් ලෝගුලිය අසූචි තැවරීමේ පිළිකුළින් නොගැනීම මෙන්ද අපාය බියෙන් පව් නොකිරීම රත්වූ ලෝගුලිය දාහ බියෙන් නොගැනීම මෙනැයි ද දතයුතුයි. ස්වප්‍රධාන බව ලක්‍ෂණ කොට ඇත්තේ හිරියයි. වරදෙහි බියවන බියදක්නා සුලු බව ඔත්තප්පයයි. මෙසේ මේ දෙකම පව් දුරුකිරීමේදී ම ප්‍රකට වෙයි. ඇතැමෙක් වනාහි ජාතිමහත්‍වය ප්‍රත්‍යවේක්‍ෂා කිරීමෙන් ද ශාස්තෘ මහත්වය ප්‍රත්‍යවේක්‍ෂා කිරීමෙන් ද සම්පත් මහත්වය ප්‍රත්‍යවේක්‍ෂා කිරීමෙන් ද සබ්‍රම්සරුන්ගේ මහත්වය ප්‍රත්‍යවේක්‍ෂා කිරීමෙන්දැයි යන සතර කාරණයෙන් ස්ව ප්‍රධානත්වය ලක්‍ෂණකොට ඇති ලජ්ජාව උපදවා පව් නොකරයි. ඇතැමෙක් තමා නිසා ඇතිවන බිය, අනුන් නිසා ඇතිවන බිය, දඬුවම් බිය, දුගති බිය යන සතර කරුණින් වරදට බියවීම බියදක්නා බව ලක්‍ෂණකොට ඇති ඔත්තප්පය උපදවාගෙන පව් නොකරයි. එහි ජාති මහත්වය ප්‍රත්‍යවේක්‍ෂා කිරීම ආදිය මෙන් ම ආත්මානුවාදභය ආදිය ද විස්තර කොට කිය යුතුයි.

මෙයින් ආශා නො කෙරෙත්. තමා හෝ ලෝභ නො කෙරේ. එය ආශා නො කිරීම් මාත්‍රයමය හෝ නුයි = **අලෝභයයි.** අදෝෂ අමෝහයන්හි ද මේ නය මය. ඔවුනතුරෙන් අලොභය අරමුණෙහි සිත ගිජු නොකරන ලක්‍ෂණ ඇත්තේ ය. නො ලැගෙන බව හෝ ලක්‍ෂණ කොට ඇත්තේය. පියුම්පතෙහි දියබිඳු මෙනි. අල්වා නොගැනීම රසය කොට ඇත්තේ (කෙලෙසුන්ගෙන්) මිදුණු භික්‍ෂුව මෙනි. නොඇලෙන බව එළඹ සිටි කාරණයයි. අසූචියෙහි වැටුණු පුරුෂයකු මෙනි. අදෝෂය චණ්ඩි නොවන බව ලක්‍ෂණ කොට ඇත්තේ ය. අනුකූල මිත්‍රයකු මෙන් විරුද්ධ නොවීම හෝ ලක්‍ෂණකොට ඇත්තේ ය. ක්‍රෝධය යටපත් කිරීම රසයයි. පරිළාහය (මානසික දැවිල්ල) දුරුකිරීම හෝ රසයයි. සඳුන් මෙනි. සෞම්‍යභාවය එළඹ සිටි කාරණයයි. පුන්සඳ මෙනි. අමෝහ ලක්‍ෂණාදිය යට පඤ්ඤින්ද්‍රිය පදයෙහි ප්‍රකට කරන ලද්දේ ම ය. මෙසේ මේ තුනෙහි අලෝභය මසුරුමලට ප්‍රතිපක්‍ෂය, අද්වේෂය අද්වේෂය

දුසිල්මලට ද අමෝහය කුශලධර්මයන් නොවැඩීමට ප්‍රතිපක්ෂය. මෙහි අලෝභය දානයට හේතුය. අද්වේෂය සීලයට හේතුය. අමෝහය භාවනාවට හේතුය. ඔවුනතුරෙන් අලෝභී පුද්ගලයා විසින් ලෝභියාගේ අධික ග්‍රහණයට වඩා අධික නොවූවක් ගනු ලැබේ. අද්වේෂී පුද්ගලයා විසින් ද්වේෂී පුද්ගලයාගේ ඌන ග්‍රහණයට වඩා අනූන වූවක් ගනු ලැබේ. අමෝහී පුද්ගලයා විසින් මෝහී පුද්ගලයාගේ විපරීතග්‍රහණයට වඩා අවිපරීතයක් ගනු ලැබේ. මෙහිදී ද අලෝභී පුද්ගලයා විසින් පවත්නා වූ ද්වේෂය ද්වේෂය වශයෙන් ම දරමින් ද්වේෂය ලෙසින් පවත්වනු ලැබේ. ලෝභී පුද්ගලයා වනාහි ද්වේෂය වසයි. අද්වේෂී පුද්ගලයා විසින් පවත්නා ගුණය ගුණය වශයෙන් දරමින් ගුණයෙහිලා පවත්වනු ලැබේ. ද්වේෂී පුද්ගලයා වනාහි ගුණය මකාදමයි. අමෝහී පුද්ගලයා විසින් යථා ස්වභාවය යථා ස්වභාවයෙන් දරමින් යථා ස්වභාවයෙහි පවත්වනු ලැබේ. මුළා වූ පුද්ගලයා වනාහි සත්‍යය අසත්‍යයැයි ද අසත්‍යය සත්‍යයැයි ද ගනී. අලෝභයෙන් ප්‍රිය විප්‍රයෝග දුක ඇති නොවේ. ලෝභියාගේ ප්‍රිය ස්වභාවයෙන් ප්‍රිය විප්‍රයෝගය මනා ඉවසන නිසා (ප්‍රිය විප්‍රයෝග දුක ඇතිවේ. අද්වේෂයෙන් අප්‍රිය සම්ප්‍රයෝග දුක ඇති නොවේ. ද්වේෂී පුද්ගලයාට වනාහි අප්‍රිය ස්වභාවය නිසා අප්‍රිය සම්ප්‍රයෝගය නොඉවසන හෙයින් අප්‍රිය සම්ප්‍රයෝග දුක ඇතිවේ.) අමෝහයෙන් කැමති දේ නොලැබීමෙන් දුක ඇති නොවේ. මුළා නොවූ පුද්ගලයාට වනාහි එය මෙහිදී කොයින් ලැබේදැයි යන මේ ආදිය ප්‍රත්‍යවේක්ෂා කරන ස්වභාවය ඇති හෙයිනි. මෙහිදී අලෝභයෙන් ජාති දුක ද ඇති නොවේ. අලෝභය තෘෂ්ණාවට ප්‍රතිපක්ෂ නිසා හා ජාති දුකට තෘෂ්ණාව මුල්වන නිසාත්ය. අද්වේෂයෙන් ජරාදුක ඇති නොවේ. තියුණු ද්වේෂී පුද්ගලයාට වහා ජරාව ඇතිවන හෙයිනි. අමෝහයෙන් මරණ දුක ඇති නොවේ. සම්මෝහ මරණය වනාහි දුකකි. මුළා නොවූවහුට මෙය නොවෙයි. අලෝභයෙන් ගිහියන්ටත් අමෝහයෙන් පැවිද්දන්ටත් අද්වේෂයෙන් වනාහි සියලු ම දෙනාටත් සුඛ සංවාසයක් ඇතිවෙයි.

මෙහි දී විශේෂයෙන් අලෝභයෙන් ප්‍රේත විෂයෙහි උත්පත්තිය නොවේ. සත්ත්වයෝ වනාහි බොහෝසෙයින් තෘෂ්ණා හේතුවෙන් ප්‍රේත විෂයෙහි උපදිත්. අලෝභය තෘෂ්ණාවට ද ප්‍රතිපක්ෂය. අද්වේෂයෙන් නිරයෙහි උත්පත්තිය නොවේ. ද්වේෂයෙන් වනාහි චණ්ඩජාතික බැවින් ද්වේෂය හා සමාන වූ නිරයෙහි උපදිත්. අද්වේෂය ද්වේෂයට ප්‍රතිපක්ෂය. අමෝහයෙන් තිරිසන් යෝනියෙහි උපැත්ම නොවේ. මෝහයෙන් වනාහි

නිතර මුළාවන තිරිසන් යෝනියෙහි උපදිත්. මෝහයට ප්‍රතිපක්‍ෂ වූයේ අමෝහයයි. මොවුනතුරෙන් ද අලෝභය රාග වශයෙන් එළඹීමට අභාවතරය. අද්වේෂය ද්වේෂ වශයෙන් පහව යාමට අභාවතරය. අමෝහය මෝහ වශයෙන් මධ්‍යස්ථවීමට අභාවතරය. මේ තුනෙන් ම පිළිවෙළින් නෛෂ්ක්‍රම්‍ය සංඥාව, අව්‍යාපාද සංඥාව අවිහිංසා සංඥාව යන මේ තුන ද අශුභ සංඥාව අප්‍රමාණ සංඥාව, ධාතු සංඥාව යන මේ තුන ද සංඥාවෝ වෙත්. අලෝභයෙන් වනාහි කාමසුඛල්ලිකානු යෝග අන්තයේ ද, අද්වේෂයෙන් අත්තකිලමථානුයෝග අන්තයේ ද දුරුකිරීම වෙයි. අමෝහයෙන් මධ්‍යම ප්‍රතිපදාව පිළිපැදීම වෙයි. එසේම අලෝභයෙන් අභිධ්‍යා කායග්‍රන්ථයාගේ බිඳීම වෙයි. අද්වේෂයෙන් ව්‍යාපාද කාය ග්‍රන්ථයාගේ ද අමෝහයෙන් සෙසු ග්‍රන්ථද්වයේ ද බිඳීම වෙයි. පළමු සතිපට්ඨාන දෙක පළමු දෙකෙහි ආනුභාවයෙන් ද පශ්චිම සතිපට්ඨාන දෙක පශ්චිමයේ (අමෝහයේ) ආනුභාවයෙන් ද ඉෂ්ට වෙයි. මෙහිදී අලෝභය ආරෝග්‍යයට හේතු වෙයි. නිර්ලෝභී පුද්ගලයා වනාහි ලෝභ කටයුතු වූද අයෝග්‍ය ආහාරාදිය සේවනය නොකරයි. එහෙයින් වනාහි රෝග නැත්තෙක් වෙයි. අද්වේෂය යෞවන බවට හේතුවෙයි. අද්වේෂී පුද්ගලයා වනාහි රැළිවැටීම පැසීම ගෙනදෙන ද්වේෂාග්නියෙන් නොදැවෙන්නේ බොහෝ කලක් තරුණයෙක් වෙයි. අමෝහය දීර්ඝායුෂ බවට හේතුවෙයි. මුළා නොවූ පුද්ගලයා වනාහි හිතාහිත දෙය දැන අහිත දෙය වර්ජනය කරමින් හිත දෙය සේවනය කරන්නේ දීර්ඝායුෂ ඇත්තේ වෙයි. මෙහිදී අලෝභය ද භෝග සම්පත්තියට හේතුවෙයි. ත්‍යාගයෙන් භෝග ප්‍රතිලාභය වන බැවිනි. අද්වේෂය මිත්‍ර සම්පත්තියට හේතුවෙයි. මෛත්‍රියෙන් මිත්‍ර ප්‍රතිලාභය මෙන් ම අපරිහානීය බව ද වෙයි. අමෝහය ආත්ම සම්පත්තිය පිණිස වේ. මුළා නොවූයේ වනාහි තමාට හිතයක්ම කරනුයේ ආත්මය සම්පාදනය කරයි. අලෝභය ද දිව්‍ය විහරණයට හේතු වෙයි. අද්වේෂය බ්‍රහ්ම විහරණයට හේතු වෙයි. අමෝහය ආර්ය විහරණයට හේතුවෙයි.

මෙහිදී (භෝග සම්පත්තියෙහි) ලෝභ නො කිරීමෙන් ද ස්ව පක්‍ෂයෙහි සත්ව සංස්කාරයන්හි නිවීම වේ. ඔවුන්ගේ විනාශයෙන් ඇලීමට හේතුවූ දුඃඛයාගේ අභාවයෙනි. අද්වේෂයෙන් පර පක්‍ෂයන්හි නිවීම වේ. අද්වේෂී පුද්ගලයාට වෛරී පුද්ගලයන් කෙරෙහි ද වෛරී සංඥාවගේ අභාවයෙනි. අමෝහයෙන් උදාසීන පක්‍ෂයන්හි ද නිවීම වේ. මුළා නොවූවහුට සියල්ලෙහි ම ඇලීමේ අභාවයෙනි. අලෝභයෙන් අනිත්‍ය

දර්ශනය ද ඇතිවෙයි. ලෝභී පුද්ගලයා වනාහි උපභෝග සම්පත්ති ආශාවෙන් අනිත්‍ය වූ සංස්කාරයන් ද අනිත්‍ය වශයෙන් නො දකී. අද්වේෂයෙන් දුඃඛ දර්ශනය ඇතිවේ. අද්වේෂී අදහස් ඇත්තේ වනාහි ආඝාත වස්තු අල්වාගැනීම හැරදමන ලද්දේ සංස්කාරයන් ම දුක් වශයෙන් බලයි. අමෝහයෙන් අනාත්ම දර්ශනය ඇතිවෙයි. මුළා නොවූයේ වනාහි තත්වාකාරයෙන් ගැනීමේ දක්‍ෂ වූයේ ප්‍රධානියෙකු නැති (ස්කන්ධ පංචකය) ප්‍රධානියෙකු නැති ලෙසින් අවබෝධ කරගනී. මොවුන් සමග යම් අනිත්‍ය දර්ශනාදියක් වේද, එසේම ඒවාද අනිත්‍ය දර්ශනාදිය සමග වෙයි. අනිත්‍ය දර්ශනයෙන් වනාහි අලෝභය ඇතිවෙයි. දුඃඛ දර්ශනයෙන් අද්වේෂය ඇතිවේ. අනාත්ම දර්ශනයෙන් අමෝහය ඇතිවේ. කවරෙක් නම් මෙය අනිත්‍යයැයි මනාව දැන ඒ සඳහා ආශාව උපදවයි ද, සංස්කාරයන් හෝ දුක්යැයි දන්නේ අන්‍ය දේත් අනිත්‍යයැයි දන්නේ තියුණු ක්‍රෝධ දුක උපදවයිද, ආත්ම ශූන්‍යතාව අවබෝධ කොට නැවත මුළාවට පැමිණේද (නො පැමිණේමය) යනුයි.

දැඩි ලෝභය නො කෙරේනුයි = අනභිජ්ඣාවයි. කායික චෛතසික සැපයයි. මෙලොවට පරලොවට හිත දැද ගුණානුභාවයෙන් ලද කීර්ති ශබ්දය ද විපතට පත් නො කෙරේනුයි අව්‍යාපාදයයි. මනාව දකී. ශෝභන වූ හෝ දෘෂ්ටියයි නුයි = සම්‍යක් දෘෂ්ටියයි. මේවා අලෝභාදීන්ට ම නම්ය. යටදී වනාහි මේවා මූල වශයෙන් ගන්නා ලදී. මෙහිදී කර්මපථ වශයෙන් යැයි දතයුතුයි. හිරි ඔතප් ද යට බල වශයෙන් ගන්නා ලදී. මෙහිදී ලෝකපාලන (ධර්ම) වශයෙන් (ගන්නා ලදී.) මේ ධර්ම දෙක වනාහි ලෝකය පාලනය කරයි. මෙසේ ද වදාළහ. 'මහණෙනි, මේ කුශල ධර්මයෝ දෙදෙනෙක් ලොව පාලනය කරත්. කවර දෙදෙනෙක්ද යත්? ලජ්ජාව ද බිය ද යන මේ ධර්මයෝ ය. මහණෙනි, මේ කුශල ධර්මයෝ දෙදෙන ලොව පාලනය කෙරෙති. මහණෙනි, මේ කුශල ධර්මයෝ දෙදෙන ලොව පාලනය නො කෙරෙත් නම් මේ ලෝකයෙහි මව ය කියා හෝ මවගේ සහෝදරිය කියා හෝ නැන්දා කියා හෝ ආචාර්යවරයාගේ භාර්යාව කියා හෝ ගරුකළයුත්තාගේ භාර්යාව කියා හෝ (වෙනසක්) නො පෙනෙන්නේ ය. එළුවෝ බැටළුවෝ කුකුළෝ ඌරෝ බල්ලෝ සිවල්ලු යම්සේ වෙත් ද, එපරිද්දෙන් ලෝකය (ආචාර ධර්ම) බිඳීමට පැමිණෙන්නේ ය. මහණෙනි, යම්හෙයකින් වනාහි මේ කුශල ධර්මයෝ දෙදෙන ලොව පාලනය කෙරෙත් ද එහෙයින් ම මවය කියා හෝ මවගේ සහෝදරිය කියා හෝ නැන්දා කියා හෝ

ආචාර්යවරයාගේ භාර්යාව කියා හෝ ගරුකළ යුත්තාගේ භාර්යාව කියා හෝ (වෙනස) පෙනෙන්නේ ය.' යනුයි.

කය සංසිඳුවීම = **කාය පස්සද්ධියයි.** සිත සංසිඳුවීම **චිත්ත පස්සද්ධියයි.** මෙහි කාය යනු වේදනාදී ස්කන්ධත්‍රයයි. මේ දෙදෙනාම එක්කොට කාය චිත්ත දාහයන් සංසිඳුවීම ලක්‍ෂණකොට ඇත්තේ කාය චිත්ත පස්සද්ධීහුය. කාය චිත්ත දාහයන් මර්දනය කිරීම රසය කොට ඇත්තාහ. කායචිත්තයන් කම්පා නොකරන සිහිල් බව එළඹ සිටි කාරණය කොට ඇත්තාහ. කායචිත්ත දෙක ආසන්න කාරණය, කය සිත නොසන්සිඳුවන උද්ධච්ච ආදී ක්ලේශයන්ට ප්‍රතිපක්‍ෂ වූවාහු යැයි දතයුත්තාහ. කයෙහි සැහැල්ලු බව = **කාය ලහුතාවයි.** සිතෙහි සැහැල්ලු බව = **චිත්ත ලහුතාවයි.** ඒ දෙදෙන කාය චිත්තයන්ගේ බර බව සංසිඳුවීම ලක්‍ෂණකොට ඇත්තාහ. කාය චිත්තයන්ගේ බර බව මර්දනය කිරීම රසය කොට ඇත්තාහ. කාය චිත්තයන්ගේ දක්‍ෂ බව එළඹ සිටි කාරණාකොට ඇත්තාහ. කායචිත්ත ආසන්න කාරණා කොට ඇත්තාහ. කාය චිත්තයන්ගේ බර බව තද බව ඇතිකරන ථීන මිද්ධාදී ක්ලේශයන්ට ප්‍රතිපක්‍ෂ වූවෝ යැයි දතයුතුයි. කයෙහි මෘදුබව = **කායමුදුතාය,** සිතෙහි මෘදු බව = **චිත්ත මුදුතාය,** කාය චිත්තයන්ගේ තදබව සිදුවීම ලක්‍ෂණකොට ඇත්තාහ. කාය චිත්තයන්ගේ තදබව මර්දනය කිරීම රසයකොට ඇත්තාහ. නොහැපීම එළඹ සිටි කාරණය කොට ඇත්තාහ. කාය චිත්තයෝ ආසන්න කාරණ කොට ඇත්තාහ. කාය චිත්තයන්ගේ තදබව ඇතිකරන දිට්ඨිමානාදී ක්ලේශයන්ට ප්‍රතිපක්‍ෂ වූවාහුයැයි දතයුතුයි. කයෙහි වැඩට සුදුසු බව = **කාය කම්මඤ්ඤතාවයි.** සිතෙහි වැඩට සුදුස බව = **චිත්ත කම්මඤ්ඤතාවයි.** ඒ දෙදෙන කාය චිත්තයන්ගේ අකර්මණ්‍යතාව. සංසිඳුවීම ලක්‍ෂණකොට ඇත්තාහ. කාය චිත්තයන්ගේ අකර්මණ්‍යභාවය මර්දනය කිරීම රසයකොට ඇත්තාහ. කාය චිත්තයන්ගේ ආරම්මණකරණ සම්පත්තිය එළඹසිටි කාරණය කොට ඇත්තාහ. කායචිත්ත ආසන්න කාරණය කොට ඇත්තාහ. කාය චිත්තයන් අකර්මණයභාවයට පත්කරන අවශේෂ නීවරණයන්ට ප්‍රතිපක්‍ෂ වූවෝ යැයි දතයුතුයි. ඔව්හු ප්‍රසාදනීය වස්තූන් කෙරෙහි ප්‍රසාදය ගෙනදෙන්නේ ය. හිතක්‍රියාවන්හි යෙදීමේ දක්‍ෂ බව ගෙන දෙන්නාහ. ස්වර්ණයෙන් විශුද්ධිය මෙනැයි දතයුතුයි. කයෙහි ප්‍රගුණ බව = **කාය පාගුඤ්ඤතාවයි.** සිතෙහි ප්‍රගුණ බව = **චිත්ත පාගුඤ්ඤතාවයි.** ඒ දෙදෙන කාය චිත්තයන්ගේ නොගිලන්බව ලක්‍ෂණකොට ඇත්තාහ. කාය චිත්තයන්ගේ ගිලන්බව මර්දනය කිරීම රසය කොට ඇත්තාහ.

ආදීනවයන්ගෙන් තොර බව එළඹ සිටි කාරණය කොට ඇත්තාහ. කාය චිත්තයන් ගිලන් කරන අශ්‍රද්ධා බව වැනි ක්ලේශයන්ට ප්‍රතිපක්ෂ වූවාහු යැයි දතයුතුයි. කයෙහි ඍජු බව = **කායුජ්ජුකතාවයි.** සිතෙහි ඍජුබව = **චිත්තජ්ජුකතාවයි.** ඒ දෙදෙන කායචිත්තයන්ගේ ඍජුබව ලක්ෂණකොට ඇත්තාහ. කාය චිත්තයන්ගේ කුටිල බව මර්දනය කිරීම රසයකොට ඇත්තාහ. ඇදැහැති බව එළඹ සිටි කාරණය කොට ඇත්තාහ. කායචිත්ත ආසන්න කාරණා කොට ඇත්තාහ. කායචිත්තයන්ගේ කුටිලබව ඇතිකරන මායාව කෛරාටික බව ආදී (ක්ලේශයන්)ට ප්‍රතිපක්ෂ වූවාහුයැයි දතයුතුයි. සිහි කෙරේනුයි = **සතියයි.**, මනාව දැනගනීනුයි = **සම්පජඤ්ඤයයි.** හාත්පසින් පිළිවෙළින් දැනගනී යන අර්ථයි. සාත්ථක සම්පජඤ්ඤය සප්පායසම්පජඤ්ඤය ගොචර සම්පජඤ්ඤය අසම්මොහ සම්පජඤ්ඤය යන මේ සතරදෙනාගේ වශයෙන් මෙහි ප්‍රභේද දතයුතුයි. මොවුන්ගේ ලක්ෂණාදිය වනාහි සතින්ද්‍රිය පඤ්ඤින්ද්‍රියන්හි කියන ලද නයින්ම දතයුතුයි. මෙසේ යට කියන ලද්දා වූම මේ ධර්මද්වය නැවත මෙතැනදී උපකාර වශයෙන් ගන්නා ලදී. කාමච්ඡන්දාදී ප්‍රතිවිරුද්ධ ධර්මයන් සමනය කෙරේනුයි = **සමථයයි.** අනිත්‍යාදී වශයෙන් විවිධාකාරයෙන් ධර්මයන් දකීනුයි = **විපස්සනාය.** මෙය ප්‍රඥාවමය. අර්ථ වශයෙන් මේ දෙදෙනාගේ ලක්ෂණාදිය යට කියන ලදමය, මෙහිදී වනාහි මේ දෙදෙන එකට බැඳී සිටිනවුන් වශයෙන් ගන්නා ලදහ. සහජාත ධර්මයන් උත්සාහත් කෙරේනුයි = **පග්ගාහයි.** උද්ධච්ච නම් වූ කලබල වන ගතියට ප්‍රතිපක්ෂ බැවින් වික්ෂේප (කලබල) නොවීම යනු = **අවික්ෂේපයයි.** මොවුන්ගේ ද ලක්ෂණාදිය යට කියන ලදමය. මෙහිදී වනාහි මේ දෙක වීර්යය හා සමාධිය යෙදීම සඳහා ගන්නා ලදැයි දතයුතුයි.

**එසමයෙහි වනාහි පටිච්ච සමුප්පන්න වූ** (හේතුන්ගෙන් උපන්) **අන්‍ය වූ ද යම් ඒ අරූපී ධර්මයෝ ඇද්ද මේ ධර්මයෝ කුශලයෝය** යනුයි. 'ස්පර්ශය වෙයි. -පෙ- අවික්ෂේපය වෙයි' යනු හුදෙක් පද පිළිවෙළින් දක්වන ලද්දෝ නොවෙත්. මොව්හු පනසකට අධික වූ ධර්මයෝ මය. ඉක්බිති යම් සමයෙක්හි කාමාවචර ත්‍රිහේතුක සොම්නස් සහගත පළමුවන අසංස්කාරික මහාසිත උපන්නේ වෙයි ද, එසමයෙහි වනාහි ඒ ස්පර්ශාදිය හා සම්ප්‍රයුක්තව පවත්නා තමතමන්ට අනුරූප ප්‍රත්‍ය නිසා උපන් රූපයක් නැති හෙයින් අරූපී ස්වභාවයෙන් පවත්නා (ලැබෙන්නා වූ) යම් ඒ අන්‍ය වූ ද ධර්මයෝ වෙත් ද මේ සියලුම ධර්මයෝ කුශලයෝ ය. බුදුරජාණන් වහන්සේ මෙපමණකින් චිත්තාංග වශයෙන් පාළියෙහි ආරූඪ වූ පනසකට

අධික ධර්මයන් දක්වා යෙවාපතක (යෙවා පන) වශයෙන් අන්‍ය වූ ද ධර්ම නවයක් දක්වන සේක. ඒ ඒ සූත්‍ර පදන්හි වනාහි ඡන්‍ද අධිමොක්ඛ මනසිකාර තත්‍රමජ්ඣත්තතා කරුණා මුදිතා කායදුච්චරිත විරති වචී දුච්චරිතවිරති මිච්ඡාජීවවිරති යන මේ නවධර්මයෝ පැනෙත්. මේ මහා සිතෙහි ද කත්තු කම්‍යතා කුසල ධම්මච්ඡන්‍දය ඇත. චිත්තාංග වශයෙන් වනාහි පාළියට නොනැඟිණ. එය මෙහිදී යේවාපනක වශයෙන් ගන්නා ලදී. අධිමොක්ඛය ඇත. මනසිකාරය ඇත. තත්‍රමජ්ඣත්තතාව ඇත. මෙත්තාපුබ්බ භාගය ඇත. උපෙක්ඛා පුබ්බභාගය ද ඇත. එය වනාහි තත්‍ර මජ්ඣත්තතාව ගත් හෙයින් ගන්නා ලද්දේ ම වෙයි. සම්මා වාචාව ඇත. සම්මා කම්මන්තය ඇත. සම්මා ආජීවය ඇත. චිත්තාංග වශයෙන් වශයෙන් වනාහි පාළියට ආරූඪ නොවීය. එය ද මෙහිදී යේවාපනක වශයෙන් ගන්නා ලදී. මේ නවය අතුරෙන් ඡන්‍ද අධිමොක්ඛ මනසිකාර තත්‍රමජ්ඣත්තතා යන මේ සතර එක් ක්ෂණයකදීම ලැබෙත්. සෙස්සෝ නානාක්ෂණයන්හි දී ලැබෙත්. යම්කලෙක වනාහි මේ සිතින් මිථ්‍යා වචනය දුරුකෙරේද, විරති වශයෙන් සම්‍යක් වචනය පිරෙයි ද, එකල්හි ඡන්‍දාදිය ද සතර සම්‍යක් වචනයෝදැයි මේ පස්දෙනා ඒක ක්ෂණයෙහි ම ලැබෙත්. යම් අවස්ථාවෙක මිථ්‍යා කර්මාන්තය දුරුකරයි ද විරති වශයෙන් විරති වශයෙන් සම්‍යක් කර්මාන්තය පිරෙති. -පෙ- මිථ්‍යා ආජීවය දුරුකරයි ද, විරති වශයෙන් සම්‍යක් ආජීවය පිරෙයි. කරුණාවෙන් පරිකර්ම කෙරේද, මුදිතාවෙන් පරිකර්ම කෙරේ ද, එකල්හි ඡන්‍දාදී සතර ද සම්‍යක් වචනය ද යන මේ පස ඒකක්ෂණයෙහි ලැබෙත්. මෙයින් මිදී දන්දෙන්නහුට සිල් පුරන්නහුට භාවනා කර්ම කරන්නහුට සතර අපණ්ණකාංගයේ නෙ ලැබෙත් ම ය.

මෙසේ මේ යොවාපනක ධර්මයන් අතුරෙහි ඡන්‍දො යන මෙය කත්තුකම්‍යතාවට නමකි. එහෙයින් එය කත්තුකම්‍යතාව ලක්ෂණකොට ඇත්තේ ය. ඡන්‍දය අරමුණු සෙවීම රසයකොට ඇත්තේ ය. අරමුණ සමග ඇති බව එළඹ සිටි බවයි. එය ම එයට ආසන්න කාරණයයි. මෙය අරමුණු ගැනීමේදී ද චිත්තයාගේ (සිතේ) අත දිගහැරීම මෙනැයි දතයුතුයි. ස්ථිර ලෙස පිහිටීම = අධිමෝක්ෂයයි. එය අධිෂ්ඨානය ලක්ෂණකොට ඇත්තේ ය. නොසැලීම රසයකොට ඇත්තේය. නිශ්චය එළඹ සිටි කාරණයයි. නිශ්චය කළයුතු ධර්ම ආසන්න කාරණා කොට ඇත්තේ ය. අරමුණෙහි නිශ්චල බැවින් ඉන්‍ද්‍රඛීලයක් මෙනැයි දතයුතුයි.

ක්‍රියා කරන්නා - සිතෙහි කරන්නා **මනසිකාරයයි.** පළමු සිතට සමාන නොවූ සිතක් කෙරේ යනු ද = **මනසිකාරයි.** ඒ මේ මනසිකාරය අරමුණු ප්‍රතිපාදකය. වීථි ප්‍රතිපාදකය. ජවන ප්‍රතිපාදකය යැයි ත්‍රිවිධය. එහිදී ආරම්මණ ප්‍රතිපාදකය, සිතෙහි කරන්නාය යනු **මනසිකාරයි.** එය අරමුණු සහිත බව ලක්ෂණකොට ඇත්තේය. සම්ප්‍රයුක්තයන් අරමුණෙහි යෙදීම රසයකොට ඇත්තේ ය. අරමුණට අභිමුඛභාවය එළඹ සිටි කාරණකොට ඇත්තේ ය. සංස්කාර ස්කන්ධයට අන්තර්ගතය. අරමුණු ප්‍රතිපාදක බැවින් සම්ප්‍රයුක්ත ධර්මයන්ට රියදුරකු මෙනැයි දතයුතුයි. වීථිප්‍රතිපාදක යන මෙය වනාහි පංච ද්වාරාවර්ජනයට නමකි. ජවන ප්‍රතිපාදක යනු මනෝද්වාරාවර්ජනයට නමකි. ඒවා මෙහි දී අභිප්‍රේත නොවේ.

ඒ ධර්මයන්හි මධ්‍යස්ත බව **තත්‍රමජ්ඣත්තතාවයි.** එය චිත්ත චෛතසිකයන් එක්රැස් කිරීම ලක්ෂණකොට ඇත්තේ ය. ඌනාධික නිවාරණය රසයකොට ඇත්තේ ය. පක්ෂපාත බව සිඳීම හෝ රසය කොට ඇත්තේ ය. මධ්‍යස්ථ බව එළඹ සිටි කාරණය කොට ඇත්තේ ය. චිත්ත චෛතසිකයන්ට මධ්‍යස්ථ වශයෙන් පවතින ආජනීය අශ්වයට මධ්‍යස්ථවන රියදුරකු මෙනැයි දතයුතුයි. **කරුණා මුදිතා** දෙක බ්‍රහ්මවිහාර නිර්දේශයෙහි මතු පළවන්නේ ය. හුදෙක් ඒ දෙක වනාහි ධ්‍යානප්‍රාප්ත රූපාවචරයෝ ය. මෙහිදී කාමාවචරය යන මෙය ම වෙනසයි. කාය දුශ්චරිතයෙන් වැළකීම = **කාය දුච්චරිත විරතියයි.** සෙසු පද දෙක්හි ද මේ නයම ය. මේ තුනම වනාහි ලක්ෂණාදී වශයෙන් කායදුශ්චරිතාදී වස්තූන් නො ඉක්මවීම ලක්ෂණකොට ඇත. මර්දනය නො කිරීම ලක්ෂණකොට ඇතැයි කියන ලද්දේ වෙයි. කාය දුශ්චරිතාදී වස්තු හැකිළවීම රසය කොට ඇත. අක්‍රිය බව එළඹ සිටි කාරණ කොට ඇත. ශ්‍රද්ධා හිරි ඔතප් අපිස් බව ආදි ගුණ ආසන්න කාරණ කොට ඇත. පාපක්‍රියාවෙන් සිත විමුඛිභාවයට පත්විණැයි දතයුතුයි. මෙසේ ස්පර්ශාදී සපනය ද යේවාපනක වශයෙන් කියන ලද නවයදැයි යන මේ සියල්ල ම මේ ධම්මුද්දෙස වාරයෙහි ධර්මපද සැටපහක් වෙයි.

නිසිකලෙක එක් ක්ෂණයෙක්හි ඔවුනතුරෙන් එක්සැටක් වෙයි. කිසිකලෙක සමසැටක් වෙයි. ඒවා වනාහි සම්මා වාචා පූරණාදී වශයෙන් උපතේදී එක්සැටක් වෙයි. ඔවුන්ගෙන් බිඳුණු කල්හි එක්තැනක සිවසැටක් වෙයි. යේවාපනකයන් හැර ගත් කල්හි වනාහි පාළියෙහි දක්වන ලද

අයුරින් ගනු ලබන පනස්හයක් ම වෙයි. මෙහිදී වනාහි අංගහිතගහණ වශයෙන් ස්පර්ශ පංචකය විතර්කය විචාරය ප්‍රීතිය චිත්තෙකග්‍රතාව පංචෙන්ද්‍රිය හිරිබලය ඔත්තප්ප බලය යන බලදෙක අලෝභ අදෝස යන මූල දෙක කායපසසදධිය චිත්තපසසදධිය ආදී දොළොස් ධර්ම යන සමතිසක් ධර්ම වෙයි. ඒ සමතිස් ධර්ම අතුරෙන් ධර්ම අටළොසක් නො බෙදන ලද්දේ වෙයි. දොළොසක් සවිභත්තික වෙයි. කවර දහඅටක් ද, ස්පර්ශය සංඥාව චේතනාව විචාරය ප්‍රීතිය ජීවිතින්ද්‍රිය කායපස්සද්ධිය ආදී වූ දොළොස් ධර්මයෝ යැයි මේ දහඅට අවිභත්තිකයහ. වේදනාව චිත්තය විතර්කය චිත්තෙකග්‍රතාව සද්ධින්ද්‍රිය විරියින්ද්‍රිය සතින්ද්‍රිය පඤ්ඤින්ද්‍රිය හිරිබලය ඔතතපප බලය අලෝභය අදෝසය යන මේ දොළොස් ධර්ම සවිභක්තික ය.

ඔවුනතුරෙන් ධර්ම සතක් දෙතැනකදී බෙදන ලදී. එකක් ස්ථාන තුනකදී ද දෙකක් ස්ථාන සතරකදී ද එකක් ස්ථාන සයකද එකක් ස්ථාන සතකද බෙදන ලදී. කෙසේද යත්, චිත්තය විතර්කය ශ්‍රද්ධාව හිරිය ඔත්තප්පය අලෝභය අදෝසය මේ ධර්ම සත ස්ථාන දෙකකදී බෙදන ලදී. මොවුනතුරෙන් සිත වනාහි ඵස්ස පංචකයට පැමිණ සිත වේයැයි කියන ලදී. ඉන්ද්‍රියන්ට පැමිණ මතින්ද්‍රිය යැයි කියන ලදී. විතර්කය ධ්‍යානාංගයන්ට පැමිණ විතර්කය වේයැයි කියන ලදී. මාර්ගාංගයන්ට පැමිණ සම්මා සංකප්පයැයි කියන ලදී. ශ්‍රද්ධාව ඉන්ද්‍රියන්ට පැමිණ සද්ධින්ද්‍රිය වේයැයි කියන ලදී. බලයන්ට පැමිණ ශ්‍රද්ධා බලය යැයි කියන ලදී. හිරිය බලයන්ට පැමිණ හිරිබලය වේයැයි කියන ලදී. ලෝකපාල දුකයට පැමිණ හිරියැයි කියන ලදී. ඔත්තප්පයෙහිද මේ නය ම ය. අලෝභය වනාහි මූලයට පැමිණ අලෝභය වේයැයි කියන ලදී. කර්මපථයට පැමිණ අනභිජ්ඣා වේයැයි කියන ලදී. අදෝසය මූලයට පැමිණ අදෝසය වේයැයි කියන ලදී. කර්මපථයට පැමිණ අව්‍යාපාදය යැයි කියන ලදී. මේ සත ස්ථාන දෙකකදී බෙදන ලදී.

වේදනාව වනාහි ඵස්ස පංචකයට පැමිණ වේදනා (නම්) වේයැයි කියන ලදී. ධ්‍යානාංගයන්ට පැමිණ සුඛයැයි ද ඉන්ද්‍රියන්ට පැමිණ සෝමනස්සින්ද්‍රිය යැයි ද කියන ලදී. මෙසේ එක් ධර්මයක් ස්ථාන තුනෙක බෙදන ලදී. වීර්යය වනාහි ඉන්ද්‍රියට පැමිණ විරියින්ද්‍රිය වේයැයි කියන ලදී. මාර්ගාංගයන්ට පැමිණ සම්මා වායාම යැයි ද බලයට පැමිණ විරියබලය යැයි ද පිට්ඨි දුකයට පැමිණ පග්ගාහය යැයි ද කියන ලදී. සතියද

ඉන්ද්‍රියයන්ට පැමිණ සතින්ද්‍රිය නම් වේයැයි කියන ලදී. මාර්ගාංගයන්ට පැමිණ සම්මා සතිය යැයි ද බලයන්ට පැමිණ සතිබලය යැයි ද පිට්ඨිදුකයට පැමිණ සතිය (නම්) වේයැයි කියන ලදී. මෙසේ මේ ධර්ම දෙක ස්ථාන සතරෙක බෙදන ලදී.

සමාධිය වනාහි ධ්‍යානාංගයන්ට පැමිණ චිත්තසෙසකගතා (නම්) වේයැයි කියන ලදී. ඉන්ද්‍රියයන්ට පැමිණ සමාධි ඉන්ද්‍රිය යැයි ද මාර්ගාංගයන්ට පැමිණ සම්මා සමාධිය යැයි ද, බලයන්ට පැමිණ සමාධි බලය යැයි ද, පිට්ඨි දුකයට පැමිණ සමථය අවික්ෂෙපය යැයි ද කියන ලදී. මෙසේ අපි එක (ම) ධර්මය ස්ථාන සයෙක බෙදුවෙමු.

ප්‍රඥාව වනාහි ඉන්ද්‍රියයන්ට පැමිණ පඤ්ඤින්ද්‍රිය (නම්) වේයැයි කියන ලදී. මාර්ගාංගයන්ට පැමිණ සම්මා දිට්ඨිය යැයි ද, බලයන්ට පැමිණ පඤ්ඤා බලය යැයි ද, මූලයන්ට අමෝහය යැයි ද කර්මපථයට පැමිණ සම්මා දිට්ඨිය යැයි ද, පිට්ඨි දුකයට පැමිණ සම්පජඤ්ඤය විපස්සනාව යැයි ද (කියන ලදී) මෙසේ එක (ම) ධර්මය ස්ථාන සතක බෙදන ලදී.

ඉදින් කිසිවෙක් වනාහි මෙහි අනුපූර්වයක් නැත. යට ගන්නා ලද්ද ම ගෙන ඒ ඒ තැන්හි පද පුරවන ලදී. අනුසන්ධියක් නැති කථාවකි. පිළිවෙළ රහිතව සොරුන් විසින් ගෙනෙන ලද බඩු සමාන ය. ගොන් රැළ ගිය මග විසුරුවන ලද තෘණ සමානය. නොදැන කියන ලදැයි කියන්නේ නම් හෙතෙම එසේ නොවේයැයි ප්‍රතිෂේධ කොට කිවයුත්තේය. බුදුවරුන්ගේ අනුසන්ධි නැති දේශනා නම් නැත. සියල්ල දැනගෙනම කියන ලදී. සම්මා සම්බුදුරජාණන් වහන්සේ වනාහි ඒ ඒ ධර්මයන්ගේ කිස දන්නා සේක. එය දැන කෘත්‍යය වශයෙන් විභක්තියට ආරෝපණය කරන සේක් අටළොස් ධර්මයෝ එක එක කෘත්‍යය ඇත්තාහයි දැන එක් එක් තැන්හි විභක්තියට ආරෝපණය කළ සේක. ධර්ම සතක් කෘත්‍ය දෙක බැගින් ඇතැයි දැන ස්ථාන දෙකක වශයෙන් විභක්තියට නැගුහ. (වේදනාව කෘත්‍යය තුනක් ඇතැයි දැන ස්ථාන තුනෙක විභක්තිය නැගුහ. වීර්යය සතිය කෘත්‍යය සතරක් ඇතැයි දැන) සතර සතර තැන්හි විභක්තියට නැගුහ. සමාධිය කෘත්‍ය සයක් ඇතැයි දැන ස්ථාන සයෙක විභක්තියට නැගුහ. ප්‍රඥාව කෘත්‍යය සතක් ඇතැයි දැන ස්ථාන සතෙක විභක්තියට නැගුහ.

එහිදී මේ උපමාවෙහි එක් පණ්ඩිත රජෙක් රහසිගතව මෙසේ සිතීය. රාජකුලය සන්තක මේ (ධනය) කෙසේ හෝ (නොසැලකිල්ලෙන්) කාදැමිය යුතු නොවේ. ශිල්පයන්ට අනුරූප වේතනයක් වර්ධනය කරන්නෙමියි කියා යි. හෙතෙම සියලු ශිල්පීන් රැස්කරවා එක් එක් ශිල්පය දන්නවුන් කැඳවව් යැයි කීය. මෙසේ කැඳවන විට දහඅට දෙනෙක් ඉදිරිපත් වූහ. ඔවුන් එක එක කොටස බැගින් දෙවා පිටත්කොට යැවීය. ශිල්ප දෙක බැගින් දන්නෝ එත්වායි කී කල්හි වනාහි සත්දෙනෙක් ආවාහුය. ඔවුන් කොටස් දෙක බැගින් දෙවීය. ශිල්ප තුනක් දන්නෝ එත්වායි කී කල්හි එකෙක් පමණක් ආවේය. ඔහුට කොටස් තුනක් දෙවීය. ශිල්ප සතරක් දන්නෝ එත්වායි කී කල්හි දෙදෙනෙක් ආවාහුය. ඔවුන් කොටස් සතරක් දෙවීය. ශිල්ප පහක් දන්නෝ එත්වායි කීකල්හි එක් අයෙක්වත් නො පැමිණියහ. ශිල්ප හයක් දන්නෝ එත්වා කී කල්හි එක් අයෙක් පමණක් පැමිණියහ. ඔහුට කොටස් හයක් දෙවීය. ශිල්ප සතක් දන්නෝ එත්වායි කී කල්හි එකෙක් පමණක් ආවේය. ඔහුට කොටස් සතක් දෙවීය. එහිදී අනුත්තර වූ ධර්මරාජයාණන් වහන්සේ පණ්ඩිත රජු මෙනි. චිත්ත චිත්තාංග වශයෙන් උපන් ධර්මයෝ ශිල්ප දන්නන් මෙනි. ඒ ඒ ධර්මයන් කෘත්‍ය වශයෙන් විභජනයට නැංවීම ශිල්පයන්ට සුදුසු පරිදි වේතනය වැඩීම මෙනි. මේ සියලුම ධර්මයෝ වනාහි ස්පර්ශපඤ්චක වශයෙන් ධ්‍යානාංග වශයෙන් ඉන්ද්‍රිය වශයෙන් මාර්ග වශයෙන් බල වශයෙන් මූල වශයෙන් කර්මපථ වශයෙන් ලෝකපාල වශයෙන් ප්‍රශ්‍රද්ධි වශයෙන් ලහුතා වශයෙන් මුදිතා වශයෙන් කර්මන්‍යතා වශයෙන් ප්‍රගුණ්‍යතා වශයෙන් ඍජුකෘතතා වශයෙන් ස්මෘතිය සම්ප්‍රජනා වශයෙන් සමථ විදර්ශනා වශයෙන් උත්සාහ විදර්ශනා වශයෙන්දැයි සප්තරස රාශීහු වෙත් යනුයි.

**ධම්මුද්දේසවාර කථා නිමි.**

දැන් සමුද්දෙස වාරයෙහි පාළියට ආරූඪකළ ඒ සපනස් පදයක් ම බෙදා දක්වන්නට **කතමො තස්මිං සමයෙ ඵස්සො හොති** යන ආදී නයින් නිර්දේශවාරය පටන්ගන්නා ලදී. එහිදී පළමුකොට මේ විචාරීමේ අර්ථයි. යම් අවස්ථාවෙක සොම්නස් සහගත ත්‍රිහේතුක අසංස්කාරික කාමාවචර මහා කුසල සිත උපදීද, ඒ අවස්ථාවෙහි ස්පර්ශය වේයැයි කියන ලදී. ඒ ස්පර්ශය කවරේදැයි යන මේ නයින් සියලු විචාරීම්වල

අර්ථය දතයුතුයි. **යො තස්මිං සමයෙ ඵස්සො** යන එසමයෙහි ස්පර්ශ කිරීම් වශයෙන් උපන් යම් ස්පර්ශයක් වේද, **ස්පර්ශය** යනු එයයි. මෙය ස්පර්ශයාගේ ස්වභාවය දක්වන හෙයින් සභාව පදනම්. **ඵුසනා** යනු ස්පර්ශ කරන ආකාරයයි. **සම්ඵුසනා** යනු ද ස්පර්ශ කරන ආකාරයම ය. උපසර්ගයෙන් පදය දියුණුකර කියන ලදී. **සම්ඵුසිතත්තං** යනු ස්පර්ශ කළ බවයි. මේ වනාහි මෙහි යෝජනාවයි. එසමයෙහි ස්පර්ශ කිරීම් වශයෙන් යම් **ස්පර්ශයක්** වේද, එසමයෙහි යම් **ස්පර්ශයක්** වේද, එසමයෙහි යම් **සම්ඵුසනයක්** වේද, එසමයෙහි යම් **සම්ඵුසිත** බවක් වේද, නැතහොත් එසමයෙහි ස්පර්ශකිරීම් වශයෙන් **ඵස්සයක්** වේද, අන්‍ය වූද පර්යායකින් **ඵුසනා සම්ඵුසනා සම්ඵුසිතත්තං** යැයි ද කියනු ලැබේ. එසමයෙහි ස්පර්ශය වේයැයි දැක්වූයේ මෙයයි. වේදනාදීන්ගේ නිර්දේශයන්හි ද මේ නයින් ම පද යෝජනාව දතයුතුයි. මේ වනාහි මෙහි සර්වසාධාරණ විභක්ති විනිශ්චයයි.

පළමුවෙන් කාමාවචර මහා කුසල සිත බෙදා දක්වන්නා වූ භාග්‍යවතුන් වහන්සේ විසින් යම් ඒ අතිරේක පද පනසක් මාතෘකා වශයෙන් තබා නැවත එක් එක් පදය ගෙන බෙදීමට නංවන ලද ද බෙදීමට පැමිණෙන ඒ පද වනාහී කරුණු තුනකින් බෙදීමට පැමිණෙයි. විවිධ වූ පද කරුණු සතරකින් විවිධ වෙයි. මෙහි වෙනත් දැක්වීමක් දෙතැනකට යයි. කෙසේද, මොව්හු වනාහි ව්‍යඤ්ජන වශයෙන් උපසර්ග වශයෙන් අර්ථ වශයෙන් යැයි මේ කරුණු තුනෙන් බෙදීමට පැමිණෙත්. එහි 'කොධො කුජ්ඣනා කුජ්ඣිතත්තං දොසො දුස්සනා දුස්සිතත්තං' යැයි මෙසේ ව්‍යඤ්ජන වශයෙන් බෙදීමට පැමිණීම දතයුතුයි. මෙහි වනාහි එකම ක්‍රෝධය ව්‍යඤ්ජන වශයෙන් මෙසේ බෙදීමට ගියේය. 'චාරො විචාරො අනුවිචාරො (උප විචාරො) යැයි මෙසේ උපසර්ග වශයෙන් බෙදීමට යෑම දතයුතුයි. 'පණ්ඩිච්චං කොසල්ලං නෙපුඤ්ඤං වෙභව්‍යා චින්තා උපපරික්ඛා' යැයි මෙසේ අර්ථ වශයෙන් බෙදීමට යෑම දතයුතුයි.

ඔවුනතුරෙහි ඵස්සපද නිර්දේශයෙහි වනාහි මේ බෙදීම් තුනම ලැබේ. **ඵස්සො ඵුසනා** යැයි ව්‍යඤ්ජන වශයෙන් බෙදීමට යෑම වෙයි. **සම්ඵුසනා** යනු උපසර්ග වශයෙන්, **සම්ඵුසිතත්තං** යනු අර්ථ වශයෙනි. මේ නයින් සියලු පද නිර්දේශයන්හි විභක්ති ගමන දතයුතුයි. විවිධ වන පදයෝ ද වනාහි නාම නානත්වයෙන් ලක්ෂණ නානත්වයෙන් කෘත්‍යය

නානත්වයෙන් ප්‍රතික්ෂේප නානත්වයෙන් දැයි මේ සතර කාරණයෙන් විවිධ වෙත්. එහි 'කතමො තස්මිං සමයෙ බ්‍යාපාදො හොති, **යො තස්මිං සමයෙ දොසො දුස්සනා** යන මෙහි ව්‍යාපාදය යනු ද ද්වේෂය යනු ද මේ දෙකම ක්‍රෝධයමය. නාමයෙන් නානාත්‍වයට ගියහයි මෙසේ නාමනානත්‍වයෙන් නානත්‍වය දතයුතුයි. රාශි අර්ථයෙන් ද පංච ස්කන්ධයෝ ම එවිට ස්කන්ධයක් වෙයි. මෙහි වනාහි රූපය වෙනස්වන එකම ස්කන්ධයක් වෙයි. මෙහි වනාහි රූපය වෙනස්වන ලක්‍ෂණ ඇත්තේය. වේදනාව විඳීම් ලක්‍ෂණ ඇත්තේ ය. සංඥාව හැඳිනගැනීම ලක්‍ෂණකොට ඇත්තේ ය. චේතනාව සිතීම ලක්‍ෂණකොට ඇත්තේ ය. විඥානය දැනගැනීම ලක්‍ෂණකොට ඇත්තේ ය යැයි මේ ලක්‍ෂණ නානත්වයෙන් පංචස්කන්ධයෝ වෙත්. මෙසේ ලක්‍ෂණ නානත්වයෙන් නානත්වය දතයුතුයි.

සම්‍යක් ප්‍රධාන සතරෙකි. මේ සාසනයෙහි භික්‍ෂුතෙම නූපන් ලාමක අකුශල ධර්මයන් නූපදවීමට -පෙ- සිත ඔසවා තබයි. උත්සාහ කරයි යැයි එකම වීර්යය කෘත්‍ය නානත්වයෙන් සිවුතැනෙක ආයේ ය. කෘත්‍ය නානත්වයෙන් නානත්වය දතයුතුයි. අසද්ධර්ම සතරෙකි. ක්‍රෝධගරුක බව සද්ධර්ම ගරුක නොවීම, මක්ඛ (ගුණමකු) ගරුක බව සද්ධර්මගරුක නොවීම, ලාභගරුක බව, සද්ධර්ම ගරුක නොවීම, සත්කාර ගරුකබව සද්ධර්ම ගරුක නොවීම' යන මේ ආදීන්හි වනාහි ප්‍රතික්ෂේප නානත්වයෙන් නානත්වය දතයුතුයි. මෙකී නානත්ව සතර වනාහි ස්පර්ශයෙහි පමණක් ලැබෙන්නක් නොවේ. සියලුම ඵස්ස පංචකාදීන්හි ලැබේ. ස්පර්ශයට වනාහි ඵස්ස යනු නමයි -පෙ- සිතට සිත යනු ද (නමයි.) ස්පර්ශය ද ස්පර්ශ කිරීම ලක්‍ෂණකොට ඇත්තේ ය. වේදනාව විඳීම ලක්‍ෂණකොට ඇත්තේ ය. සංඥාව හැඳිනීම ලක්‍ෂණකොට ඇත්තේ ය. චේතනාව සිතීම ලක්‍ෂණකොට ඇත්තේ ය. විඥානය දැනගැනීම ලක්‍ෂණකොට ඇත්තේ ය. එසේම ස්පර්ශය ස්පර්ශ කිරීම කෘත්‍යය කොට ඇත්තේ ය. වේදනාව අනුභව කිරීම කෘත්‍යය කොට ඇත්තේ ය. සංඥාව හැඳිනගැනීම කෘත්‍යය කොට ඇත්තේ ය. චේතනාව සිතීම කෘත්‍යය කොට ඇත්තේ ය. විඥානය දැනගැනීම කෘත්‍යය කොට ඇත්තේයැයි මෙසේ කෘත්‍යය නානත්වයෙන් නානත්වය දතයුතුයි. ප්‍රතික්ෂේප නානත්වය ස්පර්ශ පංචකයෙහි නැත.

අලෝභාදී නිර්දේශයෙහි වනාහි අලෝභය අලෝභී වීම අලෝභී බව යැයි ආදී නයින් ලැබේයැයි මෙසේ ප්‍රතික්ෂේප නානත්වයෙන්

නානත්වය දතයුතුයි. මෙසේ සර්වපද නිර්දේශයන්හි ලැබෙන සැටියෙන් චතුර්විධ නානත්වය දතයුතුයි. වෙනත් දැක්වීමක් නම් **පදත්‍ථුත** හෝ වෙයි. **දළ්හිකම්ම** හෝ වෙයි යැයි මෙසේ දෙතැනකට පැමිණේ. සැරයටි කෙළවරින් පෙළන්නකු මෙන් එක්වරක් පමණක් ඵස්ස යැයි කී කල්හි මේ පදය පිපිණේ සැරසුණේ අලංකාර වූයේ නම් නොවේ. නැවත නැවත ව්‍යඤ්ජන වශයෙන් උපසර්ග වශයෙන් අර්ථ වශයෙන් ඵස්සො ඵුසනා සම්ඵුසනා සම්ඵුසිතත්තං යැයි කී කල්හි පිපිණු සැරසුණු අලංකාර වූවක් නම් වෙයි. යම්සේ වනාහි තරුණ කුමරකු නාවා සිත්කලු වස්ත්‍ර අඳවා මල් පළඳවා ඇස් අඳුනින් සරසා ඉක්බිති ඔහුගේ නළලෙහි එකම හිරියල් බින්දුවක් තබත් ද, මෙපමණකින් හෙතෙම චිත්‍රතිලක (විසිතුරු තිලක ඇත්තේ නම් නොවේ. නොයෙක් වර්ණයන් පිරිවරා එයින් බින්දු තැබූ කල්හි චිත්‍රතිලක නම් වෙයිද, මෙය ද මෙසේ සිද්ධයැයි දතයුතුයි. මේ පදත්‍ථුතිය නම් ව්‍යඤ්ජන වශයෙන් ද උපසර්ග වශයෙන් ද අර්ථ වශයෙන් ද නැවත නැවත කීම ම ය. දළ්හිකම්ම නම්, යම්සේ ඇවැත්නි යැයි හෝ ස්වාමීනි යැයි හෝ යක්‍ෂයෙකැයි හෝ සර්පයෙක යැයි හෝ කී කල්හි දළ්හිකම්ම නම් නොවේ. ඇවැත්නි ඇවැත්නි, ස්වාමීනි ස්වාමීනි, යක්‍ෂයෙක් යක්‍ෂයෙක්, සර්පයෙක් සර්පයෙක් යැයි කී කල්හි වනාහි දළ්හිකම්ම නම් වෙයි. මෙපරිද්දෙන් වරක් පමණක් සැරයටි කෙළවරින් පෙළන්නකු මෙන් ඵස්ස යැයි කී කල්හි පදය දළ්හිකම්ම නම් නොවේ. නැවත නැවත ව්‍යඤ්ජන වශයෙන් උපසර්ග වශයෙන් අර්ථ වශයෙන් ඵස්සො ඵුසනා සම්ඵුසනා සම්ඵුසිතත්තං යැයි කී කල්හි ම දළ්හිකම්ම නම් වේයැයි මෙසේ අපරදීපතාව දෙතැනකට යයි. මේ ආදී වශයෙන් ද ලැබෙන පද නිර්දේශයන්හි සැමතැන්හිම අර්ථය දතයුතුයි. **අයං තස්මිං සමයෙ ඵසෙසා හොති** යනු යම් සමයෙක්හි ප්‍රථම කාමාවචර මහා කුසල චිත්තය උපදී ද, එසමයෙහි මේ ස්පර්ශය නම් වේයැයි යන මෙය වනාහි ස්පර්ශ පද නිර්දේශයෙහි වර්ණනාවයි. මෙයින් පසු වේදනාදී පදයන්ගේ නිර්දේශයන්හි වනාහි විශේෂ මාත්‍රය පමණක් වර්ණනා කරමි. සෙස්ස මෙහි කියන ලද නයින් ම දතයුතුයි.

**යං තස්මිං සමයෙ** යන මෙහි කතමා **තස්මිං සමයෙ** වෙදනා යැයි පටන්ගන්නා ලද්දේ වී නමුත් රසපද වශයෙන් 'යං' යැයි කියන ලදී. **තජ්ජා මනොවිඤ්ඤාණ ධාතු සම්ඵස්සං** යන මෙහි ඒ සාතයට සැපයට සුදුසු වූ සාරූප්‍ය වූයේ **තජ්ජා** යැයි කියනු ලැබේ. මේ **තජ්ජා** ශබ්දය

වනාහි අනුවජ්ජිකාර්ථ ඇත්තේ වෙයි. මෙසේ ද කීය. 'තජ්ජං තස්සාරුප්පං කථං මනෙතති' යනුයි. මේ සැපයට ද හේතු වූ ඒ රූපාදී අරමුණු සමග උපන්නේ යනු ද තජ්ජාය, මනො විඤ්ඤාණය ම නිස්සත්ත අර්ථයෙන් ධාතු යනුයි = **මනො විඤ්ඤාණ ධාතුයි.** ස්පර්ශයෙන් උපන්නේ හෝ ස්පර්ශයෙන් උපන්නේ **සම්ඵස්සජයි.** සිත ඇසුරු කළ හෙයින් **චෙතසිකයි.** මධුරාර්ථයෙන් **සාතයි.** මෙය කියන ලද්දේ වෙයි. 'එසමයෙහි කියන ලද අර්ථයෙන් සාරුප්‍ය වූ මනෝවිඥාන ධාතුවෙහි ස්පර්ශයෙන් යම් මිහිරි චෛතසිකයක් වේද, එය එසමයෙහි වේදනාව වෙයි' යනුයි. මෙසේ සියලු පදයන් සමග යෝජනාව දතයුතුයි. දැන් **චෙතසිකං සුඛං** යන ආදියෙහි චේතසික යන පදයෙන් කායික සැපය ප්‍රතික්ෂේප කෙරෙයි. සුඛ යන පදයෙන් චෛතසික දුක ප්‍රතික්ෂේප කෙරෙයි. **චෙතො සම්ඵස්සජං** යනු චිත්ත ස්පර්ශයෙහි හටගත් යනුයි. **සාතං සුඛං වෙදයිතං** යනු මිහිරි වින්දනයකි. අමිහිරි වින්දනයක් නොවේ. සැප වින්දනයකි. දුක් වින්දනයක් නොවේ. පරව පද තුනක් ස්ත්‍රීලිංග වශයෙන් කියන ලදී. සාතා වෙදනා න අසාතා, සුඛා වේදනා න දුක්ඛා යනුයි. මෙය ම මෙහි අර්ථයි.

සංඥා නිර්දේශයෙහි **තජ්ජා මනොවිඤ්ඤාණ ධාතු සම්ඵස්සජා** යනු ඒ කුශල සංඥාවට සුදුසු වූ මනෝවිඤ්ඤාණ ධාතුවේ ස්පර්ශයෙහි හටගත්, **සඤ්ඤා** යනු ස්වභාව නාමයයි. **සඤ්ජානනා** යනු හැඳිනගන්නා ආකාරයයි. **සඤ්ජානිතත්තං** යනු හැඳිනගත් බවයි. චේතනා නිර්දේශයෙහිද මේ නයින් ම දතයුතුයි.

චිත්ත නිර්දේශයෙහි චිත්‍රික බැවින් විචිත්‍රික බැවින් **චිත්තය** අරමුණ මනින බව දනීනුයි = **මන** ය. **මානය** යනු ද මන යනුමය. 'අන්තලික්ඛ චරො පාසො ය්වායං චරති මානසො' යන මෙහි වනාහි සම්ප්‍රයුක්ත ධර්මය මානය යැයි කියන ලදී.

**කථං හි භගවා තුය්හං සාවකො සාසනෙ රතො**
**අප්පත්තමානසො සෙඛො කාලං කයිරා ජනෙසුතො'ති**

'භාග්‍යවතුන් වහන්ස, ඔබවහන්සේගේ ශාසනයෙහි ඇලුණු නොපැමිණි අර්හත්ඵල ඇති ජනයා අතර ප්‍රසිද්ධ වූ ශෛක්ෂ වූ ශ්‍රාවක තෙම කෙසේ නම් කාලක්‍රියා කෙරේද' යනුයි.

මෙහි අරහත් මනසැයි කියන ලදී. මෙහි වනාහි මන යනු ම මනසයි. මේ පදය වනාහි ව්‍යඤ්ජන (අකුරු) වශයෙන් වැඩිණ. හදයං යනු සිතයි. 'චිත්තං වා තෙ ඛිපිස්සාමි හදයං වා තෙ ඵාලෙස්සාමි' යන මෙහි උර-හෘදය යැයි කියන ලදී. 'හදයං හදයං මඤ්ඤෙ අඤ්ඤාය තච්ඡති' යන මෙහි සිතය, 'වක්කං හදයං' යන මෙහි හෘදය වස්තුවයි. මෙහි වනාහි අභ්‍යන්තර අර්ථයෙන් සිතම හදය යැයි කියන ලදී. එයම පරිශුද්ධාර්ථයෙන් පණ්ඩරය, භවාංග සිත සඳහා මෙය කියන ලදී. මෙසේ ද කියන ලදී. 'මහණෙනි, මේ සිත ප්‍රභාස්වරය. එය ද වනාහි ආගන්තුක වූ උපක්ලේශයන් විසින් කිලිටු කරන ලදී යනුයි. එයින් නික්මුණු බැවින් වනාහි අකුසලය ද (පණ්ඩර ම විය) ගංගා නදියෙන් නික්මුණු නදියක් ගංගා වූවාක් මෙන් ද ගෝධාවරියෙන් නික්මුණු නදිය ගෝධාවරී ව වූවාක් මෙන් ම පණ්ඩර ම යැයි කියන ලදී.

**මනො මනායතනං** යන මෙහි මනෝග්‍රහණය වනාහි මග යන්නෙහි ම ආයතන භාවය දැක්වීම පිණිසය. එහෙයින් මෙය දක්වයි. මෙය දේවායතනයක්-දේවාලයක් මෙන් මනසට ආයතනයක් නිසා මනායතන නම් නොවෙයි. එසේ නම් මන ම ආයතනය වූයේ මනායතන යනුයි. එහි නිවාස ස්ථානය යන අර්ථයෙන් ද ආකරය යන අර්ථයෙන් ද එක්රැස්වන ස්ථානය යන අර්ථයෙන් ද උපන් දේශය යන අර්ථයෙන් ද කාරණය යන අර්ථයෙන් ද ආයතන යන්න දතයුතුයි. ඒ එසේ ම ය. 'ලෝකයෙහි ඊශ්වරායතනය වාසුදේව (විෂ්ණු) ආයතනය යන ආදීන්හි නිවාසනස්ථානය ආයතනය යැයි කියනු ලැබේ. සුවණ්ණායතනය රතනායතනය යන ආදීන්හි ආකරයයි. ශාසනයෙහිවනාහි 'මනොරමෙ ආයතනෙ සෙවන්ති නං විහංගමා' යන ආදීන්හි එක්රැස්වන ස්ථානයයි. 'දක්ඛිණා පථො ගුත්තං ආයතනං' යන ආදීන්හි උපන් දේශයයි. 'තත්‍ර තත්‍රෙව සක්ඛිභබ්බතං පාපුණාති සති සති ආයතනෙ' යන ආදීන්හි කාරණයයි. මෙහි වනාහි උපන් දේශය යන අර්ථයෙන් ද එක්රැස්වන ස්ථානය යන අර්ථයෙන් ද කාරණය යන අර්ථයෙන් ද යන ත්‍රිවිධ අර්ථම වටී. මෙහි වනාහි ස්පර්ශාදී ධර්මයෝ උපදිත් යැයි උපන් දේශය වශයෙන් ද මෙය ආයතන නම් වෙයි. මෙහි වනාහි බාහිර රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශයෝ අරමුණු වශයෙන් එක්රැස්වෙත් යැයි එක්රැස්වන ස්ථානය යන අර්ථයෙන් ද ආයතන නම් වෙයි. ස්පර්ශාදීන්ට වනාහි සහජාතාදී ප්‍රත්‍ය වශයෙන් කාරණ බැවින් කාරණාර්ථයෙන් ද ආයතනයැයි දතයුතුයි. **මනින්ද්‍රිය** කියන ලද අර්ථ ඇත්තේ ම ය.

දැනගනී නුයි = විඤ්ඤාණයි. විඤ්ඤාණයම ඛන්ධ වූයේ විඤ්ඤාණක්ඛන්ධයයි. එහි රාශි ආදී වශයෙන් අර්ථය දතයුතුයි. මහා උදක ස්කන්ධයක්ම යැයි ව්‍යවහාරයට යේ යනුයි. මෙහි වනාහි රාශි යන අර්ථයෙන් ඛන්ධ යැයි කියන ලදී. 'ශීල ස්කන්ධය සමාධි ස්කන්ධය යන ආදීන්හි ගුණාර්ථයෙනි. 'අද්දසා බො භගවා මහන්තං දාරුක්ඛන්ධං' යන මෙහි ප්‍රඥප්ති මාත්‍රාර්ථයෙනි. මෙහි වනාහි වැඩුණු කඳක් කියන ලදී. රාශි අර්ථයෙන් වනාහි විඥාන ස්කන්ධයාගේ ඒකදේශයක් එක් විඥානයකි. එහෙයින් යම්සේ රුකෙක එක් දෙයක් සිඳිනවිට රුක සිඳී යැයි කියනු ලැබේද, විඥාන ස්කන්ධයාගේ ඒකදේශයක් වූ එක් විඥානයකුදු නැගුණේ විඤ්ඤාණඛන්ධය යැයි කියන ලදී.

තජ්ජා මනොවිඤ්ඤාණ ධාතු යනු ඒ ස්පර්ශාදී ධර්මයන්ට සුදුසු වූ මනෝවිඥාන ධාතුවයි. මේ පදයෙහි වනාහි එකම සිත (අරමුණ) සිතීම් අර්ථයෙන් මන (නම් වෙයි.) දැනගැනීම් අර්ථයෙන් විඥාන යි. ස්වභාවර්ථයෙන් හෝ නිස්සත්වාර්ථයෙන් ධාතු යැයි ද නම් තුනකින් කියන ලදී. මෙසේ මේ ස්පර්ශ පංචකයෙහි ස්පර්ශය වනාහි යම්හෙයකින් ස්පර්ශය මද තජ්ජා මනොතජ්ජා මනෝ විඤ්ඤාණ ධාතුව ම වේද, එහෙයින් පද දෙක්හි තජ්ජා මනෝ විඤ්ඤාණ ධාතු සම්ඵස්සජ ප්‍රඥප්තිය ආරෝපණය නො කරන ලදී. විතර්ක පදාදියෙහි වනාහි ලැබෙනුයේ නමුදු මෙහි පිරිසිඳින ලද බැවින් මෙහිදී උපුටා නොදක්වන ලදී. මේ ස්පර්ශ පංචක ධර්මයන් වෙන වෙන ම බෙදා වෙන්කොට ප්‍රඥප්තිය උපුටා දක්වන භාග්‍යවතුන් වහන්සේ විසින් දුෂ්කර දෙයක් කරන ලදී. නොයෙක් ජලය හෝ නොයෙක් තෙල් හෝ එක් භාජනයක දමා දවසක් මථනය කළ වර්ණ ගන්ධ රසයන්ගේ නානත්වය දැක හෝ ආඝ්‍රාණය කොට හෝ රස විඳ හෝ නානත්වය දැන ගන්නට හැකි වේ. එසේ ඇති කල්හිදු එය දුෂ්කරයැයි කියන ලදී. සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් වනාහි එක් අරමුණෙක පවත්නා මේ අරූපී චිත්ත චෛතසික් ධර්මයන් වෙන් වෙන් වශයෙන් බෙදා වෙන්කොට ප්‍රඥප්ති උපුටා දැක්වීමේදී ඉතා දුෂ්කර කාර්යයක් කරන ලදී. ආයුෂ්මත් නාගසේන තෙරණුවෝ එහෙයින් මෙසේ කීහ.

මහරජ! භාග්‍යවතුන් වහන්සේ විසින් කිරීමට අපහසු කාර්යයක් කරන ලදී යනුයි. ස්වාමීනි, නාගසේනයන් වහන්ස, භාග්‍යවතුන් වහන්සේ විසින් කිනම් දුෂ්කරයක් කරන ලදද, එක අරමුණෙහි පවත්නා මේ අරූපී

චිත්ත චෛතසික ධර්මයන් පිළිබඳව මේ ස්පර්ශය මේ මේ වේදනාවය. මේ සංඥාවය. මේ චේතනාවය. මේ සිතයැයි යම් බෙදීමක් කරන (කියන) ලදද, මරහජ, භාග්‍යවතුන් වහන්සේ විසින් එවැනි දුෂ්කරයක් කරන ලදී යනුයි. ස්වාමීනි, උපමාවක් කියන්න. (කරන්න) මහරජ, යම්සේ කිසියම් පුරුෂයෙක් නැවකින් සමුද්‍රයට වැද අත්පුටයෙන් දෝතින් ජලය ගෙන රස බලා මේ ගංගා නදියේ ජලයයි. මේ යමුනා නදියේ ජලයයි. මේ අචිරවතී නදියේ ජලයයි. මේ සරභූ නදියේ ජලයයි. මේ මහී නදියේ ජලයයි දැනගනීද, ස්වාමීනි, නාගසේනයන් වහන්ස! දැනගැනීම දුෂ්කරය. මහරජ, මේ අරූපී චිත්ත චෛතසික ධර්මයන් පිළිබඳව -පෙ- මේ සිතයැයි (බෙදා දක්වන) බුදුරජාණන් වහන්සේ විසින් ඊට වඩා දුෂ්කර කාර්යයක් කරන ලදී යනුයි.

විතර්ක නිර්දේශයෙහි සිතාබැලීම් වශයෙන් තර්කය, ඔහුට කෙතෙක් සිතාබැලීද කළයක් සිතා බැලීය. ගැලක් සිතා බැලීය. යොදුනක් සිතා බැලීය. අඩයොදුනක් සිතා බැලීය යැයි මෙසේ තර්කන වශයෙන් පැවැත්ම දතයුතුයි. මේ තර්කය පිළිබඳ ස්වභාව පදයයි. විතර්ක වශයෙන් විතර්කයයි. වඩාත් බලවත් තර්කයට මේ නමකි. මනාව කල්පනා කිරීම් වශයෙන් **සංකපපය** එකඟ සිත අරමුණෙහි තබාතුයි = **අපපණාය**, දෙවන පදය උපසර්ගයෙන් වර්ධනය කරන ලදී. බලවත් වූ හෝ අර්පණාව = **ව්‍යපපණාවයි.** සිත අරමුණෙහි රෝපණය කරයි පිහිටුවයි යනු = **චෙතසො අභිනිරොපණාය,** තථ්‍යාකාරයෙන් ද නිවන් සලසා දෙන බැවින් ද කුසල බවට පැමිණි ප්‍රශස්ත වූ සංකල්පය යනු = **සමමා සංකපපයයි.**

විචාර නිර්දේශයෙහි අරමුණෙහි හැසිරෙන්නා වශයෙන් **චාරය** මේ එහි ස්වභාව පදයයි. විචරණක වශයෙන් **විචාරයි** අනුව ගොස් හැසිරීම් වශයෙන් **අනුවිචාරය,** වෙතට ගොස් හැසිරීම් වශයෙන් **උපවිචාරය** යැයි උපසර්ග වශයෙන් හෝ පද වැඩිණ. ඊය දුනුදියෙහි මෙන් සිත අරමුණෙහි ගළපා තබන හෙයින් **විතතසස අනුසනධානතාය** අරමුණ විමසා බලන්නකු මෙන් සිටීනුයි = **අනුපෙකඛණතාය,** හැසිරීම් වශයෙන් හෝ මධ්‍යස්ථ බව = **අනුපෙකඛණතාය,** ප්‍රීති නිර්දේශයෙහි **පීති** යනු ස්වභාව පදයි. ප්‍රමුඛ වූවහුගේ භාවය = **පාමොජ්ජයි.** ප්‍රීතිවන ආකාරය **ආමොදනාය,** ප්‍රමෝදනාකරය = පාමොජජය, ආමෝදනාකාරය = **ආමොදනාය,** ප්‍රමෝදනාකාරය = **පමොදනාය,** යම්සේ බෙහෙත් හෝ තෙල් හෝ උණුදිය සිහිල් දිය හෝ එකට කිරීම මෝදන යැයි කියනු

ලැබේ. මෙසේ මෙය ද ධර්මයන්ගේ එකට එකට කිරීමෙන් මෝදනාය, උපසර්ග වශයෙන් වනාහි දියුණුකොට ආමෝදනා පමෝදනා යැයි කියන ලදී. සතුටු කරවානුයි = **හාසය,** ප්‍රකර්ෂයෙන් සතුටු කරවානුයි = **පහාසය,** තුටුපහටු ආකාරයන්ට මේ නමකි. ධනය ඇත්තේනුයි = **විත්තය** මෙය ධනයට නමකි. මෙය වනාහි සොම්නස හේතුකොට ඇතිහෙයින් ධනයට සමාන බැවින් **විත්ති** යම්සේ වනාහි ධනවතුන්ට ධනය නිසා සොම්නස උපදී. එහෙයින් විත්තියැයි කියනු ලැබේ. සතුටු ස්වභාවයෙහි සිටි හෙයින් ප්‍රීතියට මෙය නමකි. ප්‍රීතිමත් පුද්ගලයා වනාහි උසස් හෙයින් උඩට නැගුණු හෙයින් උදග්ග (ඔද වැඩි) යැයි කියනු ලැබේ. ඔදවැඩියහුගේ භාවය = **ඔදග්ගයයි.** තමාගේ මනසෙහි භාවය = **අත්තමනතාය** නො ඇලුණහුගේ මනස වනාහි දුකට හේතුවන හෙයින් තමාගේ මනස නම් නොවේ. ඇලුණුහුගේ (මනස) සැපයට හේතුවන හෙයින් තමාගේ මන නම් වේ. මෙසේ තමාගේ මනසෙහි භාවය = **අත්තමනතාය** ස්වකීය මනතාව ස්වකීය මනසේ භාවය යනු අර්ථයි. එය වනාහි යම්හෙයකින් අන් කිසිවකුගේ අත්තමනතාවක් නොවේ. මේ භාවය වනාහි සිතේමය. එය චෛතසික ධර්මයකි. එහෙයින් **අත්තමනතා චිත්තස්ස** යැයි කියන ලදී.

එකග්ගතා නිද්දෙසයෙහි නොසැලෙන සේ අරමුණෙහි සිටී යනු = **ඨිතයයි.** උපසර්ග වශයෙන් පර පද දෙක ගෙන වර්ධනය කරන ලදී. තව ද සම්ප්‍රයුක්ත ධර්මයන් අරමුණෙහි සම්පිණ්ඩනය කොට සිටී යනු = **සණ්ඨිති** යයි. අරමුණට බැසගෙන ඇතුළට පිවිසගෙන සිටී යනු = **අවට්ඨිතියයි.** කුශල පක්ෂයෙහි වූ ශ්‍රද්ධා ස්මෘති සමාධි ප්‍රඥා යන සතර ධර්මයෝ අරමුණට බැසගනිත්. එහෙයින් ම ශ්‍රද්ධාව ඔකප්පනා (ඇදහීම) යැයි ද ස්මෘතිය අපිලාපනතා (නො ඉල්පෙන බව) යැයි ද සමාධිය අවට්ඨිති (පිවිස සිටීම) යැයි ද ප්‍රඥාව පරියොගහනා (සම්පූර්ණයෙන් බැසගැනීම) යැයි ද කියන ලදී. අකුශල පක්ෂයෙහි වනාහි තෘෂ්ණා දෘෂ්ටි අවිද්‍යා යන ධර්ම තුනක් අරමුණට බැස ගනී. එහෙයින්ම ඒවා ඕඝ යැයි කියන ලදී. මෙහිදී වනාහි චිත්තෙකාග්‍රතාව බලවත් නොවේ. යම්සේ වනාහි දූලි මතුවන තැනෙක දිය ඉස හැමදි කල්හි මදවේලාවක් ම දූලි සන්සිඳේ. වියළෙත් වියළෙත් ම නැවත පියෙවි ලෙසින් පැන නගී. මෙපරිද්දෙන් අකුශල පක්ෂයෙහි චිත්තෙකාග්‍රතාව බලවත් නොවේ. යම්සේ වනාහි එම ස්ථානය කළවලින් දිය ඉස උදැල්ලෙන් කැණ කැළීම් මැදීම් හැපීම් කොට ආලේප කළ කල්හි කැඩපතෙහි මෙන් ඡායාව පෙනෙයිද

අවුරුදු සියයක් ගතවුවද ඒ මොහොතේ කළා මෙන් වෙයිද, මෙපරිද්දෙන් කුශල පක්ෂයෙහි චිත්තේකාග්‍රතාව බලවත් වෙයි. උද්ධච්ච විචිකිච්ඡා වශයෙන් පැවති විසාහාරයට (සිත ඔබ මොබ ගෙනයාම) ප්‍රතිපක්ෂ හෙයින් **අවිසාහටමානතා, සමථ** යනු චිත්ත සමථය අධිකරණ සමථය සබ්බ සංඛාර සමථ යැයි සමථ ත්‍රිවිධය. එහි අෂ්ට සමාපත්තීන්හි සිතේ එකඟ බව චිත්ත සමථ නම්. එය වනාහි අවුත් සිතේ චලනය සිතේ කම්පනය සමනය කෙරෙයි සංසිඳුවයි. එහෙයින් එය චිත්තයම එය යැයි කියනු ලැබේ. විනයාදිය පිළිබඳව සම්මුඛයේ දී කරනු ලබන සප්තවිධ (සමථය) අධිකරණ සමථ නම්. එයට පැමිණ ඒ ඒ අධිකරණයන් සමනය කරයි සංසිඳුවයි. ඒ නිසා එය අධිකරණ සමථය යැයි කියනු ලැබේ. සියලු සංස්කාරයෝ යම්හෙයකින් නිවනට පැමිණ සමනය වෙත් ද, සංසිඳෙත්ද, එහෙයින් එය සබ්බසංඛාර සමථය යැයි කියනු ලැබේ. මේ අර්ථයෙහි චිත්ත සමථය අදහස් කරන ලදී. සමාධි ලක්ෂණයෙහි ඉන්ද්‍රාත්‍ථීය (ප්‍රධානත්වය) කෙරේනුයි = **සමාධින්ද්‍රියයි.** උද්ධච්චයෙහි කම්පා නොවේනුයි = **සමාධි බලයයි. සම්මා සමාධි** යනු යථාව සමාධි නිය්‍යානික සමාධි කුසල සමාධියි.

සදධින්ද්‍රිය නිර්දේශයෙහි බුද්ධාදී ගුණයන් ඇදහීම් වශයෙන් ශ්‍රද්ධාවයි. බුද්ධාදී රත්න හෝ අදහස් පැමිණෙයිනුයි = ශ්‍රදධාය, සද්දහනා යනු අදහන ආකාරයයි. බුද්ධාදීන්ගේ ගුණයන්ට බැසගනී. බිඳගෙන මෙන් ඇතුළට පිවිසෙයි නුයි = **ඔතපපනාය,** මෙයින් සත්ත්වයෝ බුද්ධාදීන්ගේ ගුණයෙහි ඉතාම පැහැදෙත්. තෙමේ හෝ අතිශයින් පැහැදේනුයි = **අභිපපසාදයි.** දැන් යම්හෙයකින් සද්ධින්ද්‍රියාදී සමාස පදයන්ගේ වශයෙන් අන්‍ය පර්යායෙක්හි පටන් ගත් කල්හි ආදිපදය ගෙන ම පදභාජනය කරනු ලැබේ. මේ අභිධර්මයෙහි ධර්මතාවයි. එහෙයින් නැවත ශ්‍රද්ධා යැයි කියන ලදී. යම් සේ වනාහි ඉත්ථියා ඉන්ද්‍රිය ඉත්ථින්ද්‍රියං කියා වේද මෙය එසේ නොවේ. මෙය වනාහි ශ්‍රද්ධාවම ඉන්ද්‍රිය වූයේ = ශ්‍රද්ධෙන්ද්‍රිය යැයි මෙසේ සමානාධිකරණභාවය හැඟවීමට ද සද්ධා යැයි කියන ලදී. අධිමෝක්ෂ ලක්ෂණයෙහි ආධිපත්‍යය කෙරේනුයි = **සදධින්ද්‍රියයි.** ශ්‍රද්ධා නැති බවෙහි කම්පා නොවේනුයි = **සදධා බලයයි.** විරියින්ද්‍රිය නිර්දේශයෙහි **චෙතසික** යනු මේ වීර්යයාගේ නියමයෙන් චෛතසික භාවය දැක්වීමට කියන ලදී. මේ වීර්යය වනාහි 'මහණෙනි, යම් කායික වීර්යයක් වේද, එය ද විරිය සම්බොජ්ඣංගය, යම් චෛතසික වීර්යයක් වේද එය ද විරිය සම්බොජ්ඣංගය යැයි මෙසේ මෙය උදෙසීමට එයි' යන මේ ආදී

සූත්‍රයන්හි සක්මන් ආදිය කරන්නාට උපන්හෙයින් කායිකයැයි කියන්නා වූ ද, කාය විඤ්ඤාණය මෙන් කායික නම් නැත. මෙය වනාහි චෛතසිකම යැයි දක්වන්නට චෛතසිකයැයි කියන ලදී. **විරියාරම්භො** යනු වීර්ය සංඛ්‍යාත ආරම්භයයි. මෙයින් සෙසු ආරම්භයන් ප්‍රතික්ෂේප කරයි. මේ ආරම්භ ශබ්දය වනාහි කර්මයෙහි ඇවතෙහි ක්‍රියාවෙහි වීර්යයෙහි හිංසාවෙහි විකාරයට පත්කිරීම යන නොයෙක් අර්ථයෙහි ආයේ ය.

**යං කිඤ්චි දුක්ඛං සම්භොති සබ්බං ආරම්භ පච්චයා**
**ආරම්භානං නිරොධෙන නත්ථි දුක්ඛස්ස සම්භවො'ති**

යම්කිසි දුකක් හටගනී නම් (ඒ) සියල්ල කර්ම හේතුවෙනි. කර්මයන්ගේ නිරෝධයෙන් දුක් හටගැනීමක් නැත' යනුයි.

මෙහි වනාහි කර්මය ආරම්භය යැයි ආයේය. 'අරබ්භා ච හොති විප්පටිසාරී ච හොති' යන මෙහි ආපත්තියයි. 'මහාසඤ්ඤා මහාරම්භා නතෙ හොන්ති මහප්ඵලා' යන මෙහි යාගසම්භය එසවීම ආදී ක්‍රියාය, 'ආරභථ නික්ඛමථ යුඤ්ජථ, බුද්ධසාසනෙ' යන මෙහි වීර්යයයි, 'සමණං ගොතමං උද්දිස්ස පාණං ආරභන්ති' යන මෙහි හිංසාවයි. 'බීජගාම භූතගාම සමාරම්භා පටිවිරතො හොති' යන මෙහි සිඳීම් බිඳීම් ආදී කඩාබිඳ දැමීමය. මෙහි වනාහි වීර්යය ම බලාපොරොත්තු විය. එහෙයින් වදාළහ. 'වීර්යාරම්භය නම් වීර්යය නම් වූ උත්සාහයයි.' යැයි යනුයි. වීර්යය වනාහි ආරම්භ කරන්නා වශයෙන් ආරම්භ යැයි කියනු ලැබේ. මේ මෙහි ස්වභාව පදයයි. කුසීතබවෙන් නික්මීම් වශයෙන් = **නික්ඛම** ය, සතුරු සතුරු වූ ස්ථාන ආක්‍රමණ වශයෙන් = **පරක්කම ය**, උඩට නැගි යන යානයක් වශයෙන් **උය්‍යාම ය**, ව්‍යායාම කිරීම් වශයෙන් = **වායාමය**, උත්සාහ කිරීම් වශයෙන් = **උස්සාහ ය** අධික මාත්‍ර උත්සාහ කිරීම් වශයෙන් **උස්සොළ්හිය**, වීරභාය යන අර්ථයෙන් = **ථාමය**, චිත්ත චෛතසිකයන් දැරීම් වශයෙන් නොසිඳීමෙන් හෝ පැවතීම් වශයෙන් කුසල සන්තානය දරයි යනු = **ධිති** යයි. තවත් නයකි මේ නික්ඛමය වනාහි කාමයන්ගේ දුරුකිරීම පිණිසය. මේ පරක්කමය බන්ධන සිඳීම පිණිසය. මේ උය්‍යාමය ඕඝතරණය පිණිසය. මේ ව්‍යායාමය පරතෙරට යෑම් අර්ථයෙනි. මේ උය්‍යාමය පූර්වාංගමාර්ථයෙනි. මේ උස්සොළ්හි යන්න අධිමත්ත අර්ථයෙනි. මේ ථාමය බාධක නමැති දොරපොල්ල ගළවාදැමීම පිණිසය. මේ ධිතිය (ස්ථිරව) සිටීමේ කාර්යය සඳහාය යනුයි.

ඒකාන්තයෙන් සම ද නහර ද ඇට ද ඉතිරිවේවායි මෙසේ පැවති කාලයෙහි ලිහිල් නොවූ පරාක්‍රමණ වශයෙන් = **අසිථිලපරක්කමතාය**, ස්ථිර පරාක්‍රමය දැඩි පරාක්‍රමය යන අර්ථයි. යම්හෙයකින් වනාහි මේ වීර්යය කුශල කර්මයන් කරන තැනදී ඡන්දය හැර නො දමයි ද වීර්යය බැහැර නො කරයි ද නො බස්වයි ද අත්නොහරී ද නොපසුබස්නා මනසක් ඇතිබවක් උසුළයි එහෙයින් **අනික්ඛිත්ත ඡන්දතා අනික්ඛිත්ත ධුරතා** යැයි කියන ලදී. යම්සේ වනාහි නදී ආදියෙහි දියෙන් බිඳුණු තැනදී බර උසුළන ගොනකු ගනිව්යැයි කියත්. හෙතෙම දණින් බිම පැහැර හෝ බර උසුළයි. බිම වැටෙන්නට නොදෙයි. මෙපරිද්දෙන් වීර්යය කුශල කර්මයන් කරන තැනදී වීර්යය දරයි. උත්සාහවත් වෙයි. එහෙයින් **ධුර සම්පග්ගාහ** බර ඉසිළීම යැයි කියන ලදී. ඔසවා තබන ලක්‍ෂණයේදී ප්‍රධානත්වය කරවානුයි = **විරියින්ද්‍රියයි.** කුසීතබවෙහි කම්පා නොවේනුයි **විරිය බලයයි.** තත්වාකාරයෙන් ම සසරින් මුදන කුශලයෙහි උත්සාහවත් බැවින් **සම්මා වායාම** ය.

සතින්ද්‍රිය නිර්දේශයෙහි සිහිකරන්නා වශයෙන් **සති** යයි. මේ සතියෙහි ස්වභාව පදයයි. නැවත නැවත සිහිකරන බැවින් අනුස්සරණ වශයෙන් **අනුස්සතියයි.** ඉදිරියට ගොස් සිහි කරන්නාක් මෙන් අභිමුඛව සිහිකරන හෙයින් **පටිස්සති** යයි. මෙය උපසර්ග වශයෙන් වැඩීම් මාත්‍රයෙකි. සිහිකරන ආකාරය **සරණතාය**, යම්හෙයකින් වනාහි සරණ යනු ත්‍රිවිධ සරණයට ද නමක් වේද, එහෙයින් එය ප්‍රතිෂේධය කිරීම පිණිස නැවත සතිග්‍රහණය කරන ලදී. සති සංඛ්‍යාත සරණතාව යන මෙය වනාහි මෙහි අර්ථයයි. 'අසන ලද පර්යාප්ති ධර්මය ග්‍රහණ ධාරණ වශයෙන් **ධාරණතාය** ඇතුළට පිවිසීම යැයි කියන ලද බැසගැනීම් අර්ථයෙන් උඩ නො ඉල්පෙන බව **අපිලාපනතාය**, ලබුකබල් ආදිය වනාහි යම්සේ ජලයෙහි ඉල්පේද, ඇතුළට නො පිවිසේද සතිය අරමුණේදී එසේ නොවේ. මේ සතිය වනාහි අරමුණට ම පිවිසෙයි. එහෙයින් **අපිලාපනතා** යැයි කියන ලදී. වීරයන් විසින් කරන ලද වීර භාසිතයන්ගේ අමතක වීමක් නොවේද (එවැනි බව) **අපම්මුසනතාය** එළඹ සිටි ලක්‍ෂණයෙහි (බැබළවීම් ලක්‍ෂණයෙහි ද) අධිපති අර්ථය කරවානුයි = **ඉන්ද්‍රියයි.** සතිය නම් වූ ඉන්ද්‍රිය = **සතින්ද්‍රියයි.** ප්‍රමාදයෙහි කම්පා නොවේනුයි සති බලයයි. යථාවසති නියාානික සති කුසල සති යනු **සම්මා සතියයි.**

**පඤ්ඤින්ද්‍රිය** නිද්දෙසයෙහි ඒ ඒ අර්ථය ප්‍රකට කිරීම යැයි කියන ලද

පැණවීම් අර්ථයෙන් **පඤ්ඤාය** අනිත්‍යාදී වූ ඒ ඒ ආකාරයෙන් ධර්මයන් දැනගනී යනු ද = පඤ්ඤාය, මේ මෙහි ස්වභාවපදයයි. දැනගන්නා ආකාරය පජානනාය. අනිත්‍යාදිය විමසානුයි = **විචයයි. පවිචයො** යනු උපසර්ග වශයෙන් පදය වර්ධනය කරන ලදී. චතුරාර්ය හා ධර්මයන් විමසානුයි = **ධම්මවිචයයි**. අනිත්‍යාදිය සලකාබැලීම් වශයෙන් = **සල්ලක්ඛණායි**. එයම උපසර්ග නානත්වයෙන් උපලක්ඛණා පච්චුපලක්ඛණා යැයි කියන ලදී. පණ්ඩිතයාගේ භාවය = **පණ්ඩිච්ච ය**, නිපුණයාගේ භාවය = **නෙපුඤ්ඤය**, අනිත්‍යාදීන්ගේ ප්‍රකට කිරීම් වශයෙන් **වෙභව්‍යා ය**, අනිත්‍යාදීන් සිතීම් වශයෙන් **චිනතාය**, යමෙකුට හෝ උපදී ද එය එයට අනිත්‍යාදී ලක්ෂණ චින්තන කරවානුයි හෝ = **චිනතාය**, අනිත්‍යාදිය විමසා බලයිනුයි = **උප පරික්ඛාය**, **භූරි** යනු පෘථුවියට නමකි. මෙය ද සියුම් යන අර්ථයෙන් ද පැතිරුණු අර්ථයෙන් ද පොළොව මෙනැයි යැයි **භූරි ය**. එහෙයින් කියන ලදී. 'භූරි යැයි කියනුයේ පොළොවයි. ඒ පොළොව මෙන් පැතිරුණු මහත් වූ ප්‍රඥාවෙන් යුක්තය යනු **භූරිපඤ්ඤය**, තව ද මේ භූරි යන්න පඥාවට නමකි. පවත්නා අර්ථයෙහි රමණය කෙරේ යනු ද **භූරිය**. පර්වතයෙහි හෙනයක් මෙන් ක්ලේශයන් මැඩපවත්වයි. හිංසාකරයි නුයි = **මෙධාය**, වහා ග්‍රහණ ධාරණ කරන අර්ථයෙන් හෝ **මෙධාය**, යමෙකුට එය උපදී නම් ඔහු ආත්මහිත ප්‍රතිපත්තියෙහිත් සම්ප්‍රයුක්ත ධර්මයන් යථාලක්ෂණ අවබෝධයෙහිත් මෙහෙයවා නුයි = **පරිණායිකාය**, අනිත්‍යාදී වශයෙන් ධර්මයන් දකීනුයි = **විපස්සනා**, මනා ආකාරයෙන් අනිත්‍යාදීන් දකී නුයි = **සම්පජඤ්ඤාය**, වැරදිමගට පිළිපන් සෛන්ධවයන් වීථියෙහි යෙදවීමට විදින (අනින) කෙවිටක් මෙන් නොමග දුවන කුළු සිත වීථියෙහි යෙදවීමට කෙවිටක් මෙන් විදී විදීනුයි = **පතොදය**, දර්ශන ලක්ෂණයෙහි ප්‍රධානත්වය කරවා නුයි = **ඉන්‍ද්‍රියයි**. ප්‍රඥා සංඛ්‍යාත ඉන්‍ද්‍රිය = **පඤ්ඤින්‍ද්‍රිය** යයි. අවිද්‍යාවෙහි කම්පා නොවේනුයි = **පඤ්ඤාබලයය** කෙලෙස් සිඳිනා අර්ථයෙන් ප්‍රඥාවම ශාස්ත්‍රයක් වූයේ = **පඤ්ඤාසත්ථය** අතිශයින් ම උඩට නැගුණු අර්ථයෙන් ප්‍රඥාව ප්‍රාසාදයක් වූයේ = **පඤ්ඤාපාසාදය**, ඉදිරිය බලන අර්ථයෙන් ප්‍රඥාව ම ආලෝකය වූයේ = **පඤ්ඤා ආලෝකය** බබුළුවන අර්ථයෙන් ප්‍රඥාව ම ඔභාසය වූයේ = **පඤ්ඤා ඔභාසය**, දැල්වෙන අර්ථයෙන් ප්‍රඥාවම පජ්ජෝත වූයේ = **පඤ්ඤා පජ්ජෝතය**, එක් පළඟින් හුන් ප්‍රඥාවන්තයාට වනාහි දහසහශ්‍රී ලෝකධාතුව එකම ආලෝකයක් එක ම ඕභාසයක් එක ම පහනක් වෙයි.

එහෙයින් මෙය කියන ලදී. මේ පද තුනෙන් එක් පදයකින් ම මේ

අර්ථය සිද්ධ කල්හි යම් මේ 'මහණෙනි, මේ ආලෝක සතරෙකි. චන්ද්‍රාලෝකය සූර්යාලෝකය අග්නි (ගිනි) ආලෝකය ප්‍රඥා ආලෝකය කියායි. මහණෙනි, මේ ආලෝක සතරයි. මහණෙනි, මේ ආලෝක සතර අතුරෙන් මේ ප්‍රඥාලෝකය අග්‍රය' කියා ද එසේ ම 'මහණෙනි, මේ ඕභාස සතරෙකි -පෙ- මහණෙනි, මේ පහන් සතරෙකි' යැයි ද සත්ත්වයන්ගේ අදහස් වශයෙන් සූත්‍ර දේශනා කරනලදී. එයට අනුරූපව මෙහි ද දේශනා කරන ලදී. අර්ථය වනාහි නොයෙක් අයුරින් බෙදනුයේ මනාව බෙදන ලද්දේ වෙයි. එකෙක් එක් අයුරකින් අවබෝධ කරගනී. තවත් එකෙක් තවත් අයුරකින් අවබෝධ කරගනී. ඇලුම් කරන අර්ථයෙන් ද රතිදායකාර්ථයෙන් ද රතිය උපදවන අර්ථයෙන් ද විසිතුරු කරන ලද්දේය යන අර්ථයෙන් ද දුර්ලභ දේ පහළ කරන අර්ථයෙන් ද අතුල්‍යාර්ථයෙන් ද අලාමක (උසස්) සත්ත්වයින් විසින් පරිභෝග කරනු ලබන අර්ථයෙන් ද වනාහි ප්‍රඥාව ම රත්නයක් වූයේ නුයි = **පඤ්ඤාරතන** යි එයින් සත්ත්වයෝ මුළා නොවෙත්. තෙමේ හෝ අරමුණෙහි මුළා නොවේ නුයි = **අමෝහයි.** ධම්මවිචය පදය කියන ලද අර්ථ ඇත්තේ ම ය. කවර හෙයින් මෙය නැවත කියන ලද ද? යත්, අමෝහයාගේ මෝහ ප්‍රතිපක්ෂ භාවය දැක්වීම පිණිසයි. එහෙයින් මෙය දක්වයි. යම් ඒ අමෝහයක් වේද එය හුදෙක් මෝහයෙන් අන්‍ය වූ ධර්මයක් නොවේ. මෙහි දී වනාහි මෝහයට ප්‍රතිපක්ෂ වූ ධර්මවිචය සංඛ්‍යාත වූ අමෝහය ම අදහස් කරන ලදී යනුයි. **සම්මා දිට්ඨි** යනු යථාර්ථයෙන් ම සසරින් මිදීම ලබාදෙන කුශල දෘෂ්ටියයි.

ජීවිතේන්ද්‍රිය නිර්දේශයෙහි **යො තෙසං අරූපීනං ධම්මානං ආයු** යනු ඒ සම්ප්‍රයුක්ත වූ අරූපී ධර්මයන්ගේ යැපීම් අර්ථයෙන් යමක් වේනම් **ආයු** ය. එය ඇතිකල්හි වනාහි අරූප ධර්මයෝ යැපෙත්. ගමන් කරත්. පවතිත්. එහෙයින් ආයු යැයි කියනු ලැබේ. මේ මෙහි ස්වභාව පදයයි. යම්හෙයකින් වනාහි මේ ධර්මයෝ ආයුෂය ම ඇති කල්හි සිටිත්ද, ගමන් කරත් ද යැපෙත් ද ඉරියව් පවත්වත් ද පවතිත් ද පාලනය වෙත් ද එහෙයින් **ඨිති** යැයි යන ආදිය කියන ලදී. මෙහි වචනාර්ථය වනාහි මෙයින් සිටිත්නුයි = **ඨිති,** යැපෙත්නුයි = **යපනාය, යාපනා** මෙනි. මෙසේ අවබෝධ කරගන්නවුන්ගේ වශයෙන් පළමු පදයේ හ්‍රස්වත්‍වය කරන ලදී. මෙයින් ඉරියව් පවත්වත්නුයි = **ඉරියනා** ය. පවතිත්නුයි = **වත්තනාය,** පාලනය කෙරෙත්නුයි = **පාලනාය,** මෙයින් ජීවත් වෙත්නුයි= **ජීවිතයයි.** අනුපාලන ලක්ෂණයෙහි අධිපතිත්වය කරවානුයි = **ජීවිතින්ද්‍රියයි.**

හිරිබල නිර්දේශයෙහි **යං තස්මිං සමයෙ** යනු එසමයෙහි යම්කිසි ධර්මයකින්, එසමයෙහි යම් ධර්මයක් ලිංග විපර්යාසයක් හෝ කොට යැයි අර්ථය දතයුතුයි. **හිරීයිතබ්බෙන** යනු උපයෝගාර්ථයෙහි කරණ වචනයි. ලජ්ජා වියයුතු කාය දුශ්චරිතාදී ධර්මයට ලැජ්ජා වෙයි. පිළිකුල් කෙරෙයි යන අර්ථයි. **පාපකානං** යනු ලාමක වූ, **අකුසලානං ධම්මානං** යනු අකුශල භාවයෙන් හටගත් ධර්මයන්ගේ, **සමාපත්තියා** යන මෙය ද උපයෝගාර්ථයෙහි කරණ වචනයි. ඒ ඒ ධර්මයන්ට පැමිණීමේ ප්‍රතිලාභයෙන් යුක්ත බවට ලජ්ජාවෙයි. පිළිකුල් කෙරෙයි යනු අර්ථයි.

ඔත්තප්පබල නිර්දේශයෙහි **ඔත්තප්පෙන** යනු හේත්වර්ථයෙහි කරණ වචනයි. බියවිය යුතු වූ බියට හේතුභූත වූ කාය දුශ්චරිතාදී වූ උක්තප්‍රකාර බියට හේතුභූත වූ සමාපත්තියකින් ඔත්තප්පයට පත්වෙයි. බියවෙයි යනු අර්ථයි.

අලෝභ නිර්දේශයෙහි අලෝභවීම් වශයෙන් **අලෝභයි.** ලෝභ නො කෙරේ යනු ද = **අලොභය,** මෙය ද ස්වභාව පදයෙකි. **අලුබ්භනා** යනු ලෝභ නොවන ආකාරයයි. ලෝභයෙන් යුක්ත පුද්ගලයා ලුබ්භිත (ලෝභ වූ) නම් වේ. ලුබ්භිත නොවූයේ අලුබ්භිතය. අලුබ්භිතයාගේ භාවය = **අලුබ්භිතත්තය,** සාරාග ප්‍රතික්ෂිප්ත හෙයින් නසාරාගනුයි **අසාරාගය, අසාරජ්ජනතා** යනු නො ඇලෙන ආකාරයයි. දැඩි ලෙස ආසා නො කෙරේනුයි = **අනභිජ්ඣා ය, අලොභො කුසලමූලං** යනු අලෝභ සංඛ්‍යාත කුසලමූලයයි. අලෝභය වනාහි කුශල ධර්මයන්ට මූලහේතුව වන අර්ථයෙන් ද = **කුසලමූලය,** කුසල ද එයයි. මූලහේතුව යන අර්ථයෙන් මූලය දැයි ද = **කුසලමූලය.**

අදෝෂ නිර්දේශයෙහි දූෂ්‍ය නොවීම් වශයෙන් **අදෝෂය,** දූෂ්‍ය නොවේ නුයි ද **අදොසය,** මේ මෙහි ස්වභාව පදයයි. **අදුස්සනා** යනු දූෂ්‍ය නොවන ආකාරයයි. දූෂ්‍ය නොවන බව = **අදුස්සිතත්තය,** ව්‍යාපාදය ප්‍රතික්ෂේප කරන හෙයින් ව්‍යාපාද නොවූයේ - **අබ්‍යාපාදය,** ක්‍රෝධදුඃඛය ප්‍රතික්ෂේප හෙයින් ව්‍යාපාද නොවූයේ **අබ්‍යාපජ්ඣය,** අද්වේෂ සංඛ්‍යාත කුසලමූලය **අදොසකුසලමූලයයි.** එය කියන ලද අර්ථ ඇත්තේ ම ය.

කාය ප්‍රශ්‍රද්ධාදී නිර්දේශයන්හි යම්හෙයකින් කාය යනු ත්‍රිවිධ ස්කන්ධයෝ බලාපොරොත්තු වූවාහු ද එහෙයින් **වෙදනාක්ඛන්ධස්ස** යන

ආදිය කියන ලදී. මෙයින් ඒ ධර්මයෝ සංසිඳෙත්. පහවූ පීඩා ඇත්තෝ වෙත්. ආස්වාසයට පත්වූවෙත්නුයි = **පසසද්ධිය,** දෙවන පදය උපසර්ග වශයෙන් වඩන ලදි. **පසසමභන** යනු සංසිඳෙනාකාරයයි. දෙවන පදය උපසර්ග වශයෙන් වඩන ලදී. සංසිඳීමෙන් යුත් සංසිඳුණු ස්කන්ධත්‍රයාගේ භාවය **පටිපපසසමභිතතතය,** සියලු පදයන්හිම ස්කන්ධත්‍රයාගේ ක්ලේශදරථ සංසිඳීම ම කියන ලදී. දෙවන නයින් විඥාන ස්කන්ධයාගේ පීඩාවන් සංසිඳීම කියන ලදී. **ලහුතා** යනු සැහැල්ලු බවේ ආකාරයයි. **ලහුපරිණාමතා** යනු වහා වෙනස්වීම මේ ධර්මයන්ගේ නුයි = ලහුපරිණාමයෝ ය. ඔවුන්ගේ භාවය = **ලහුපරිණාමතාය,** වහා වහා පරිවර්තනයට සමර්ථයෝ යැයි කියන ලද්දේ වෙයි. **අදන්ධනතා** යන මෙය බර බව ප්‍රතික්ෂේප වචනයකි. නොබර බව යන අර්ථයි. **අවිත්ථතතා** යනු මානාදී ක්ලේශ භාරයාගේ අභාවයෙන් (ඇතිවන) නො තද බවයි. මෙසේ පළමුවැන්නෙන් ස්කන්ධත්‍රයාගේ ලහුතාකාරය කියන ලදී. දෙවැන්නෙන් විඥාන ස්කන්ධයාගේ ලහුතාකාරය කියන ලදී. **මුදුතා** යනු මෘදුබවයි. **මද්දවතා** යනු සිනිඳු වූයේ මට වූයේ මද්දව යැයි කියනු ලැබේ. මෘදු වූවහුගේ භාවය = **මද්දවතාය, අකකබලතා** යනු කර්කශ නොවන බවයි. **අකථිනතා** යනු නොතද බවයි. මෙහි ද පළමුනයින් ස්කන්ධත්‍රයාගේ පශ්චිම නයින් විඥාන ස්කන්ධයාගේ මුදුතාකාරය කියන ලදී. **කමමඤ්ඤතා** යනු ක්‍රියාවෙහි යහපත් බවයි. කුශලක්‍රියාවෙහි යෙදීමේ සමර්ථ බවයැයි අර්ථයි. සෙසු පද දෙක ව්‍යඤ්ජන වශයෙන් වර්ධනය කරන ලදී. පද දෙකින් ම පළමු නයින් ස්කන්ධත්‍රයාගේ පශ්චිම නයින් විඥාන ස්කන්ධයාගේ කර්ම නීයාකාරය කියන ලදී.

**පගුණතා** යනු ප්‍රගුණභාවයයි. **අනාතුර** බව නොගිලන් බව යනු අර්ථයි. ඉතිරි දෙක ඛ්‍යඤ්ජන වශයෙන් වඩන ලදී. මෙහි ද පළමු නයින් ස්කන්ධත්‍රයාගේ පශ්චිම නයින් විඥාන ස්කන්ධයාගේ නොගිලන් අයුරු කියන ලදී. **උජුකතා** යනු ඍජුභාවයයි. ඍජු ආකාරයෙන් පවත්නා බව යන අර්ථයි. ඍජු වූ ස්කන්ධත්‍රයාගේ ද විඥාන ස්කන්ධයාගේ ද භාවය **උජුකතාය, අජිමහතා** යනු ගෝමුත්‍ර වක්‍රභාව ප්‍රතික්ෂේපයයි. **අවංකතා** යනු චන්ද්‍රලේඛා වක්‍රභාව ප්‍රතික්ෂේපයයි. **අකුටිලතා** යනු නගල් කෙළවර වක්බව ප්‍රතික්ෂේපය යි.

**යමෙක් පවක් කොට ද නොකරමි යි කියයි. හෙතෙම ගොස් පසුබස්නා** බැවින් ගොමුත්තවංක තම් වෙයි. **යමෙක් පවක් කරමින් ම**

මම පවට බිය වෙමියි කියයි. හෙතෙම බොහෝසෙයින් ම කුටිල හෙයින් චන්‍දලේඛාවංක නම් වෙයි. යමෙක් පව් කරමින් ම කවරෙක් නම් පවට බිය නොවේදැයි කියයි. හෙතෙම ඉතා කුටිල නොවන හෙයින් නංගලකෝටිවංක නම් වෙයි. යමෙකුගේ කර්මද්වාරත්‍රය ම අපිරිසිදු ද හෙතෙම ගෝමුත්තවංක නම් වේ. යමෙකුගේ යම්කිසි ද්වාර දෙකක් අපිරිසිදු ද හෙතෙම චන්‍දලේඛාවංක නම්. යමෙකුගේ යම්කිසි එක් ද්වාරයක් අපිරිසිදු ද හෙතෙම නංගලකෝටිවංක නම්. දීඝභාණකයෝ වනාහි මෙසේ කීහ. ඇතැම් භික්ෂුවක් ප්‍රථම වයසේදී එක්විසි නුසුදුසු හැසිරීම්වල ද සයවැදෑරුම් අගෝචරයන්හි ද හැසිරේ ද මෙතෙම ගොමුත්තවංක නම් වේ. එක් භික්ෂුවක් ප්‍රථම වයසේදී සිව්පිරිසිදු සීලය පුරයි ද පවට ලජ්ජා ඇත්තේ වේද කුකුසින් යුක්ත වේද ශික්ෂාකාමී වේද මධ්‍යම පශ්චිම වයස්හිදී පළමු භික්ෂුව සමාන වේද මෙතෙම චන්‍දලේඛවංක නම් වේ. එක් භික්ෂුවක් ප්‍රථම වයසේදීත් මධ්‍යම වයසේදීත් සිව්පිරිසිදු සීලය පුරයිද, ලජ්ජී වේද කුකුසින් යුක්ත වේද ශික්ෂාකාමී වේද, පශ්චිම වයසේදී පළමු භික්ෂුව හා සමාන වේද, මේ භික්ෂුව නංගලකෝටිවංකක නම්. ඒ ඔහුගේ කෙලෙස් වශයෙනි. මෙසේ වංක වූ පුද්ගලයාගේභාවය ජිම්හතා වංකතා කුටිලතා යැයි කියනු ලැබේ. ඒවාට ප්‍රතික්ෂේප වශයෙන් අජිම්හතා ආදිය කියන ලදී. ඛන්‍ධාසිට්ඨා නම් දේශනාවක් කරන ලද මේ අජිම්හතා ආදිය වනාහි ස්කන්ධයන්ටය. පුද්ගලයාට නොවේ යනුයි. මෙසේ මේ පද සියල්ලෙන් ම පළමු නයින් ස්කන්ධත්‍රයාගේ ද පශ්චිම නයින් විඥාන ස්කන්ධයාගේ දැයි අරූපී ධර්මයන්ගේ නික්ලේශීභාවය ද ඍජුකා කාරයද කියන ලදැයි දතයුතුයි. දැන් යම් ඒ යේවාපනා යන අර්පණාවාරය කියන ලදී. එහෙයින් ධම්මුද්දෙසවාරයෙහි දක්වන ලද යේවාපනකයන්ගේම සංක්ෂේප නිර්දේශය කියන ලද්දේ වෙයි යනුයි.

**නිද්දේසවාර කථා නිමියේ ය.**

මෙතෙකින් පෘච්ඡා සමය නිර්දේශ ධම්මොද්දෙශ අර්පණා යැයි උද්දේස වාරයෙහි පරිච්ඡේද සතරකින් ද පෘච්ඡා සමය නිර්දේශ ධර්ම නිර්දේශ අර්පණා යැයි නිර්දේශ වාරයෙහි පරිච්ඡේද සතරකින්දැයි පරිච්ඡේද අටකින් ප්‍රතිමණ්ඩිත ධර්මව්‍යවස්ථාපන වාරය නිමියේ වෙයි.

දැන් තසමිං ඛොපන සමයෙ චත්තාරො ඛන්ධා හොන්ති යැයි සංග්‍රහවාරය පටන්ගන්නා ලදී. එය උද්දේස නිද්දේස පටිනිද්දේස වශයෙන් ත්‍රිවිධ වෙයි. එහි තසමිං ඛො පන සමයෙ චත්තාරො ඛන්ධා යන මේ ආදී වූ උද්දේසයයි. (කතමෙ තසමිං සමයෙ චත්තාරො ඛන්ධා යන ආදිය නිර්දේශය) කතමො තසමිං සමයෙ වෙදනාක්ඛන්ධො යන ආදී වූයේ ප්‍රතිනිර්දේශය යැයි දතයුතුයි. එහි උද්දේසවාරයෙහි චත්තාරො ඛන්ධා යන ආදී කොටස් තෙවිස්සක් වේ. ඔවුන්ගේ අර්ථය මෙසේ දතයුතුයි. යම් අවස්ථාවෙක පළමුවන කාමාවචර මහා කුශල සිත උපදී ද, එසමයෙහි චිත්තාංග වශයෙන් උපන් යේවාපනකයන් හැර පාළියට නැගුණු අතිරේක වූ යම් ධර්ම පනසෙක් වේද ඒ ඒ සියල්ලන් ද සංග්‍රහ කෙරෙමින් රාශි වශයෙන් ස්කන්ධ සතරෙක් වෙයි. යට කියන ලද ආයතනාර්ථයෙන් ආයතන දෙකක් වෙයි. ස්වභාවාර්ථයෙන් ශූන්‍යතාර්ථයෙන් සත්‍වාර්ථයෙන් (ධාතු දෙකක් ද වෙයි. ප්‍රත්‍යය සංඛ්‍යාත ආහාරණාර්ථයෙන්) මෙහිදී ද ධර්ම තුනක් ආහාර වෙයි. අවශේෂ ධර්ම ආහාර නොවේ. කිම, මෙහිදී ඔවුනොවුන්ට හෝ එයින් හටගන්නා රූපයට හෝ ප්‍රත්‍යය නොවේද යත්, නොවන්නේ නොවේ. මේවා වනාහි එසේ ද වෙයි. අන් අයුරෙකින් හෝ සමාන ප්‍රත්‍යාර්ථයෙහි අතිරේක ප්‍රත්‍ය හෝ වෙයි. එහෙයින් ආහාර යැයි කියන ලදී. කෙසේද? මොවුනතුරෙන් වනාහි ස්පර්ශාහාර යම් ධර්මයන්ට ද අවශේෂ චිත්ත චෛතසික ප්‍රත්‍යය වෙයි. ඔවුන්ටද ප්‍රත්‍යය වෙයි. වේදනාත්‍රය ද උපදවයි. මනෝ සංචෙතනාහාරය ඔවුන්ට ද ප්‍රත්‍යය වෙයි. (ත්‍රිවිධ භවයන් ද ගෙනදෙයි. විඤ්ඤාණාහාරය ඔවුන්ට ප්‍රත්‍ය වෙයි.) ප්‍රතිසන්ධි නාමරූප ද ගෙනදෙයි. මෙය වනාහි කුසල විඤ්ඤාණයයි. එය විපාකය නොවේද? කුසල විඤ්ඤාණය වූයේ නමුදු එය මාන බැවින් විඤ්ඤාණාහාරය ම යැයි කියන ලදී. උපස්ථම්භකාර්ථයෙන් වුව ද මේ තුන ආහාරයැයි කියන ලදී. මේවා වනාහි කබලීකාහාරය රූපකායට මෙන් සම්ප්‍රයුක්ත ධර්මයන්ට උපස්ථම්භක ප්‍රත්‍යය වෙයි. එහෙයින් ම කියන ලදී.

'අරූපී ආහාර සම්ප්‍රයුක්ත ධර්මයන්ටත් එයින් උපදනා රූපයන්ටත් ආහාරප්‍රත්‍යය වශයෙන් ප්‍රත්‍යය වෙයි' යනුයි.

තවත් නයෙක් වෙයි. ආධ්‍යාත්මික සන්තතියට විශේෂ ප්‍රත්‍යය වන හෙයින් කබළීකාහාරයත් මේ ධර්මත්‍රයත් ආහාරයැයි කියන ලදී. විශේෂ ප්‍රත්‍යය නම් - කබළීකාහාරභක්ෂක සත්ත්වයින්ගේ රූපකායට

කබළීකාහාරය ආහාරය වේ. නාමකායෙහි වේදනාවට ස්පර්ශය ආහාරය වේ. විඥානයට මනෝසංචේතනාව ආහාරයයි. නාමරූපයට විඥානය ආහාරය වේ. මෙසේ ද කියන ලදී. 'මහණෙනි, යම්සේ මේ කය ආහාරටඨිකද, ආහාරය නිසා සිටී ද, ආහාරයෙන් තොරව නොසිටීද, එසේම ස්පර්ශ ප්‍රත්‍යයෙන් වේදනාවද සංස්කාර ප්‍රත්‍යයෙන් විඥානය ද විඥාන ප්‍රත්‍යයෙන් නාමරූපය ද සිටී' යනුයි. අධිපති අර්ථයෙන් වනාහි ධර්ම අටක්ම ඉන්‍ද්‍රිය වෙයි. අවශේෂ ධර්ම ඉන්‍ද්‍රිය නොවෙයි. එහෙයින් කියන ලදී. '**ඉන්ද්‍රියයෝ අටක් වෙත්**' යනුයි. නැවත නැවත සිහිකිරීම් අර්ථයෙන් ධර්මපහක් පමණක් ධ්‍යානාංග වෙයි. එහෙයින් කියන ලදී. **පඤ්චංගිකං ඣානං හොති** යනුයි. නෛර්යානිකාර්ථයෙන් ද හේත්වර්ථයෙන් ද ධර්ම පහක් පමණක් මාර්ගාංග වෙයි. එහෙයින් කියන ලදී. **පංචංගිකො මග්ගො** යනුයි. ආර්යමාර්ගය අෂ්ටාංගික වුව ද ලෞකික සිතෙහි වනාහි එක් ක්ෂණයෙක්හි විරති තුන නොලැබේ. එහෙයින් **පංචංගිකො** යැයි කියන ලදී.

'මහණ, යථාගත මගග යනු ආර්ය අෂ්ටාංගික මාර්ගයට නමකි' යන මේ සූත්‍රයෙහි යම්සේ ලෝකෝත්තර මාර්ගය අෂ්ටාංගික ද, එසේම පූර්වභාග විදර්ශනා මාර්ගය ද අෂ්ටාංගිකය, යැයි යථාගතමග්ග යන වචනයෙන් මේ අර්ථය දැක්වූ හෙයින් ලෞකික මාර්ගයද අෂ්ටාංගික වියයුතු නොවේද? නොවිය යුතුයි. මේ සූත්‍රාන්තික දේශනා නම් පරියාය දේශනාය, එහෙයින් කීහ. 'පළමුවෙන් ම වනාහි ඔහුගේ කායකර්මය වාක් කර්මය ආජීවය පිරිසිදු වේ යැ'යි යන මෙය වනාහි නිෂ්පරියාය දේශනාය. ලෞකික සිතෙහි වනාහි ත්‍රිවිධ විරති එක් ක්ෂණයෙක්හි නොලැබේ. එහෙයින් පංචාංගිකයම කියන ලදී යනුයි. **සත්වයන්** කම්පනය නොවන අර්ථයෙන් ධර්මයෝ බලයෝ වෙත්. මූලාර්ථයෙන් ධර්මත්‍රයම හේතුය. ස්පර්ශ කිරීම් අර්ථයෙන් එකම ධර්මයක් **ඵස්සය**, වේදයිතාර්ථයෙන් එකම ධර්මයක් **වේදනාය**, සඤ්ජානනාර්ථයෙන් එකම ධර්මයක් **සඤ්ඤාය**, සංචේතනාර්ථයෙන් එකම ධර්මයක් **චේතනාය**, චිත්‍ර විචිත්‍රාර්ථයෙන් එකම ධර්මයක් **චිත්තය**, රාශිවීම් අර්ථයෙන් සඤ්ජානනාර්ථ යෙන්ද එක ම ධර්මයක් **සඤ්ඤාක්ඛන්ධය**, රාශිවීම් අර්ථයෙන් ද අභිසංස්කරණාර්ථයෙන් ද එකම ධර්මයක් **සංඛාරක්ඛන්ධය**, රාශිවීම් අර්ථයෙන් චිත්‍රවිචිත්‍රාර්ථයෙන් ද එකම ධර්මයක් **විඤ්ඤාණක්ඛන්ධය**, විජානනාර්ථයෙන් මෙන් ම යට කියන ලද ආයතනාර්ථයෙන් **මනායතනය**, විජානනාර්ථයෙන් ද අධිපති අර්ථයෙන් ද එකම ධර්මයක් **මනින්ද්‍රිය** ය, විජානාර්ථයෙන් ද ස්වභාවශූන්‍ය

නිඃසත්වාර්ථයෙන් ද එක ම ධර්මයක් මනෝ විඤ්ඤාණ ධාතු නම් වෙයි. සෙස්සෝ නො වෙත්. සිත හැර කියන ලද අර්ථය පරිදි සෙසු සියලු ම ධර්ම එක ම ධර්මායතනය එකම ධර්මධාතුව වේ යනුයි. යෙවා පන තසමිං සමයෙ යන මෙයින් වනාහි අර්පණාවාරයෙන් මෙහි ද යට කියන ලද යෙවාපනක සංගෘහීතමය. මෙහි යම්සේ ද හැමතැන්හිම එසේය. මෙයින් පසු වනාහි මෙපමණකුදු නො විචාරමු. නිර්දේශ ප්‍රතිනිර්දේශ වාරයන්හි යට කියන ලද නයින්ම අර්ථය දතයුතුයි.

සංග්‍රහ වාරය නිමියේ ය.

කොට්ඨාස වාරය යනු ද මෙයට ම නමි.

දැන් තසමිං ඛො පන සමයෙ ධම්මා හොන්ති යැයි සුඤ්ඤතවාරය පටන් ගන්නා ලදී. එය උද්දේස නිද්දේස වශයෙන් දෙයාකාරයකින් වෙන්කරන ලදී. එහි උද්දේස වාරයෙහි ධම්මා හොන්ති යන මෙය සමග කොටස් සූවිස්සක් වෙයි. සියලු කොට්ඨාසයන්හි ද සතර දෙක තුන යැයි ගණන පරිච්ඡේදයක් නො කියන ලදී. කවර හෙයින් ද යත්? සංග්‍රහ වාරයෙහි පිරිසිඳිනා ලද හෙයිනි. මෙහි ද වනාහි එහිදී පරිච්ඡේද කරන ලද ධර්මයෝ ම කියන ලද හ. මෙහි සත්ත්වයෙක් හෝ භාවයක් හෝ ආත්මයක් නො ලැබේ. මේ ධර්මයෝ ද ධර්මමාත්‍රයහ. අසාරයහ. අපරිණාසකයහයි මෙහි ශූන්‍යතාව දැක්වීම පිණිස කියන ලදී. එහෙයින් මෙහි අර්ථය මෙසේ දතයුතුයි. යම් අවස්ථාවෙක ප්‍රථම කාමාවචර මහා කුසල චිත්තය උපදී ද, එසමයෙහි චිත්තාංග වශයෙන් උපන් අතිරේක ධර්ම පනස ස්වභාවාර්ථයෙන් ම ධර්මයෝ ම වෙත්. අන් කිසි සත්ත්වයෙක් හෝ භාවයක් හෝ පුරුෂයෙක් හෝ පුද්ගලයෙක් නොවේ යනුයි. එසේ ම රාශ්‍යර්ථයෙන් ස්කන්ධයෝ ද වෙත් යනුයි. මෙසේ පළමු නයින් ම සියලු පදයන්හි අර්ථ යෙදීම දතයුතුයි. යම්හෙයකින් වනාහි ධ්‍යානයෙන් අන්‍ය වූ ධ්‍යානාංගයක් හෝ මාර්ගයෙන් අන්‍ය වූ මාර්ගාංගයක් හෝ නැද්ද එහෙයින් ධ්‍යානය වෙයි. මාර්ගය වෙයි යනු ම කියන ලදී. නැවත නැවත සිහිකිරීම් අර්ථයෙන් වනාහි ධ්‍යානය ම හේත්වර්ථයෙන් මාර්ගය වෙයි. අන්කිසි සත්ත්වයෙක් හෝ භාවයක් හෝ නොවේයැයි මෙසේ

සියලු පදයන්හි අර්ථයේදීම කළයුතුයි. නිර්දේශවාරය නොගැඹුරු අර්ථ ඇත්තේමය යනුයි.

**සුඤ්ඤත වාරය නිමියේ ය.**

**මහාවාර තුනකින් සරසා දක්වන ලද ප්‍රථම චිත්තයාගේ අර්ථ වර්ණනාව ද නිමියේ ය.**

දැන් දෙවන සිත ආදිය දැක්වීමට **කතමෙ ධම්මා** යනු පළමුව පටන්ගන්නා ලදී. ඒ සියල්ලෙහි ම පළමු සිතෙහි කී නයින් ම මහාවාර තුන තුන බැගින් දතයුතුයි. හුදෙක් මහාවාර පමණක් නොවේ. පළමු සිතෙහි කීවාට සමාන සියලු පදයන්ගේ අර්ථය ද කී නයින් ම දතයුතුයි. මෙයින් මතු ද අනුපූර්ව පද වර්ණනාව ම කී නයින් ම දතයුතුයි. මෙයින් මතු ද අනුපූර්ව පද වර්ණනාව ම කරමි. මෙහිදී වනාහි දෙවන චිත්ත නිර්දේශයෙහි **සසංඛාරෙන** යන මෙය ම අපූර්වය, එහි අර්ථය සංස්කාරය සමග වූයේ නුයි = සසංඛාරය, එය සමග **සසංඛාරෙනය.** උත්සාහය සමගින් ප්‍රයෝග සමගින් උපාය සමගින් ප්‍රත්‍යය ග්‍රහණයෙන් යනු අර්ථයි. යම් ආරම්මණාදී ප්‍රත්‍ය ග්‍රහණයෙන් ප්‍රථම මහා චිත්තය උපදී. ප්‍රයෝග සහිත වූ උපාය සහිත වූ එයින් ම මෙය උපදී. එහි උත්පත්තිය මෙසේ දතයුතුයි. මේ ශාසනයෙහි එක්තරා භික්ෂුවක් වෙහෙර කෙළවර වසනුයේ සැමළුව හමදනා වේලාව හෝ ස්ථවිර උපස්ථාන වේලාව හෝ පැමිණි කල්හි ද ධර්මශ්‍රවණ දිනය පැමිණි කල්හි හෝ ගොස් ආපසු එන මට ඉතා දුර වන්නේය. නොයමි යි සිතා නැවත මෙසේ සිතීය. භික්ෂුවට වනාහි සැමළුවට හෝ ස්ථවිරෝප ස්ථානයට හෝ ධර්මශ්‍රවණයට හෝ නොයෑම අසාරුප්පය යන්නෙමි යයි ඔහුට මෙසේ තමාගේ ප්‍රයෝගයෙන් හෝ අන්‍යයකු විසින් හෝ වත් ආදිය නො කිරීමේ ආදීනව ද කිරීමෙහි අනුසස් ද දක්වා අවවාද කරන්නා නිග්‍රහ වශයෙන් හෝ එව මෙය කරවයි කරවනු ලබන්නහුට උපන් කුසල සිත සංස්කාරයෝ ප්‍රත්‍යග්‍රහණයෙන් උපන්නේ නම් වෙයි යනුයි.

**දෙවන සිත නිමියේ ය.**

තුන්වැන්නෙහි ඥානයෙන් විප්‍රයුක්ත වූයේ **ඤාණ විපපයුතතය,** මෙය ද වනාහි අරමුණෙහි තුටුපහටු වූයේ වෙයි. මෙහි වනාහි පිරිසිඳිනා නුවණ නොවේ. එහෙයින් මෙය ළදරු කුමරුවන් භික්ෂුවක දැක මේ තෙරුන් වහන්සේ මාගේ යැයි වඳිනා කල්හි ද ඒ නයින් ම චෛත්‍ය වන්දනා ධර්මශ්‍රවණ කරන කල්හි ද උපදීයැයි දතයුතුයි. මෙහි පාළියෙහි වනාහි ස්ථාන සතෙක ප්‍රඥාව පිරිහෙයි. සෙස්ස ප්‍රකෘතිමය ය යනුයි.

තුන්වන සිතයි.

සතරවන සිතෙහි ද මේ නය මය . මෙය වනාහි **සසංඛාරෙන** යන වචනයෙන් යම් කලෙක මව්පියෝ ළදරු කුමරුවන් හිසින් ගෙන චෛත්‍යාදිය වන්දවත් ද ඔව්හු ද අනර්ථික වූවෝ ද තුටුපහටුව වඳිත්. මෙබඳු කාලයෙහි (සසංඛාරික සිත) ලැබේ යැයි දතයුතුයි.

පංචිමෙ **උපෙකඛා සහගතං** යනු උපේක්ෂා වේදනාවෙන් යුක්ත වූයේය. මෙය වනාහි අරමුණෙහි මධ්‍යස්ථ වෙයි. මෙහිදී වනාහි පිරිසිඳිනා ඥානය වන්නේ ම ය. මෙහි පාළියෙහි වනාහි ධ්‍යාන චතුෂ්කයෙහි උපේක්ෂාව වෙයි. ඉන්‍ද්‍රියවර්‍ගයෙහි උපෙකඛින්‍ද්‍රිය වේයැයි කියා වේදනාදී සියලු ම පදයන්ගේ නිර්දේශයෙහි සාතාසාත සුඛදුඃඛප්‍රතික්ෂේප වශයෙන් දේශනාව කොට අදුඃකඛමසුඛ වේදනාව කියන ලදී. එහි මධ්‍යස්ථ ලක්ෂණයෙහි අධිපති අර්ථ කාරණ වශයෙන් උපේක්ෂා ඉන්‍ද්‍රියභාවය දතයුතුයි. එක්තැනෙක පද පිළිවෙළින් ද ප්‍රීතිය පිරිහිණ. එහෙයින් චිත්තාංග වශයෙන් පාළියට නැගුණු පස්පනසක්ම ධර්මයෝ වෙත්. ඔවුන්ගේ වශයෙන් සියලු කොට්ඨාශයන්හි ද සියලු වාරයන්හි ද විනිශ්චය දතයුතුයි.

ෂෂ්ටම සප්තම අෂ්ටමයෝ ද්විතීය තෘතීය චතුර්ථයන්හි කියන ලද නයින් ම දතයුත්තාහ. හුදෙක් මොවුන්ගේ වේදනා පරිවර්තනය ද ප්‍රීති පරිහානිය ද වෙයි. උත්පත්ත නය සමග සෙස්ස එබඳුමය. කරුණා මුදිතා පරිකර්ම කාලයෙහි ද වනාහි මොවුන්ගේ උත්පත්තිය මහාට්ඨ කථාවෙහි අනුදත්තේ ම ය. මේ අට කාමාවචර කුසල් සිත් නම්.

ඒ සියල්ලමත් දසපින් කිරියවත් සමග දැක්විය යුතුයි. කෙසේද? දානමය පින්කිරිය වත, සීලමය - භාවනාමය - අපචිති සහගත -

වෙයාාවච්ච සහගත - පත්තානුමෝදනා - අබ්භනුමෝදනා - දේශනාමය - ශ්‍රවණමය - දිට්ඨුජ්ජුකම්ම පින්කිරියවත යැයි මේ දසපින්කිරියවත් නම්. එහි දානයම දානමයයි. පුණාක්‍රියාවත් එයයි. ඒ ඒ ආනිසංසයන්ට වස්තුව වූයේත් එයයි යනු = පුඤ්ඤකිරිය වත්‍ථුය. අවශේෂයන්හි ද මේ නයමය. එහි චීවරාදී සිව්පසයන්හිද රූපාදී වූ ෂඩාරම්මණයන්හි ද ආහාරාදී වූ දශදාන වස්තූන්හි ද ඒ ඒ වස්තූන් දෙන්නහුගේ ඒ ඒ වස්තූන් ඉපදවීමේ පටන් පූර්වභාගයෙහිත් පරිත්‍යාග කාලයෙහිත් පසුවත් සොම්නස් සහගත සිතින් අනුස්මරණය කරන කාලයෙහිදැයි තුන්කල්හි පවත්නා චේතනාව දානමය පින්කිරියවත නම්.

පන්සිල් අටසිල් දසසිල් සමාදන් වන්නාගේ, පැවිදි වෙමියි විහාරයට යන්නාගේ, පැවිදි වන්නාගේ, මනදොළ මුදුන් පමුණුවාගෙන ඒකාන්තයෙන් පැවිදිවීම්. සාධු යහපති යැයි ආවර්ජනා කරන්නාගේ, ප්‍රාතිමෝක්‍ෂ සංවරණය කරන්නාගේ චීවරාදී ප්‍රත්‍යයන් ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාගේ, ඉන්ද්‍රිය විෂය වූ රූපාදී අරමුණු කෙරෙහි චක්‍ෂුරාදී ඉන්ද්‍රියයන් සංවර කරන්නාගේ හා ආජීවය පිරිසිදු කරන්නාගේ ද පවත්නා චේතනාව සීලමය පුඤ්ඤකිරිය වත්‍ථු නම්.

ප්‍රතිසම්භිදා නයින් කියන ලද විදර්ශනා මාර්ගයෙන් ඇස අනිත්‍ය වශයෙන් දුක් වශයෙන් අනාත්ම වශයෙන් භාවනා කරන්නාගේ -පෙ- සිත - රූප -පෙ- ධර්ම = චක්‍ෂුර්විඥානය -පෙ- මනෝ විඥානය -පෙ- චක්‍ෂු ස්පර්ශය -පෙ- මනෝ ස්පර්ශය - චක්‍ෂුර් ස්පර්ශජ වේදනාව -පෙ- මනෝ ස්පර්ශජ වේදනාව -පෙ- රූප සංඥාව -පෙ- ජරා මරණ අනිත්‍ය දුක්ඛ අනාත්ම වශයෙන් භාවනා කරන්නා තුළ පවත්නා චේතනාව, අටතිස් ආරම්මණයන්හි අර්පණාවට නො පැමිණි සියලුම චේතනාද භාවනාමය පුණ්‍යක්‍රියා වස්තු නම්.

මහලු භික්‍ෂුවක දැක පෙරගමන් කිරීම පාසිවුරු පිළිගැනීම වැඳීම මගපෙන්වීම ආදී වශයෙන් (වූයේ) අපචිති සහගත යැයි දතයුතුයි. වෘද්ධතරයින්ට වත්පිළිවෙත් කිරීම් වශයෙන් ගමට පිඬු පිණිස පිවිසි භික්‍ෂුවක දැක පාත්‍රය ගෙන ගමෙහි ආහාර සමාදන් කරවා ළඟට පැමිණවීම් වශයෙන් යව භික්‍ෂූන්ගේ පාත්‍රය ගෙනෙවයි යනු අසා වේගයෙන් ගොස් පාත්‍රය ගෙනයාම් වශයෙන් ද කායික වතාවත් කරන කාලයෙහි ද වෙයාාවච්ච සහගතය දතයුතුයි.

දන් දී සුවඳ ආදියෙන් පූජාකොට අසුවලාට පින් ලැබේවා හෝ සියලු සත්ත්වයන්ට වේවායි හෝ පින්දෙන්නාගේ පත්තානුප්පදානය දතයුතුයි. කිම දෙන්නහුගේ මේ පින ක්‍ෂයවීමක් වේද? නොවේ. යම්සේ වනාහි එක් පහනක් දල්වා ඉන් පහන් දහසක් දල්වන්නාගේ පළමු පහන ක්‍ෂය වේයැයි නො කියයුතුයි. පළමු ආලෝකයත් සමග ම වනාහි පසුව ඇති වූ ආලෝකය එක් වී ඉතා මහත් වෙයි. එපරිද්දෙන් පින් දෙන්නහුගේ පිරිහීමක් නම් නැත. වර්ධනයක් ම වේයැයි දතයුතුයි.

අනුන් විසින් දෙන ලද පිනින් හෝ වෙනත් පින්කමකින් හෝ සාධු යහපතැයි අනුමෝදන වශයෙන් අබ්භනුමෝදනාව දතයුතුයි. එක් (භික්‍ෂුවක්) මෙසේ මා ධර්මකථිකයෙකැයි දැනගනිත් යැයි ඉච්ඡාවෙන් සිට ලාභගරුකව දේශනා කෙරේද, එය මහත්ඵල නොවේ. එක් අයෙක් තමාට ප්‍රගුණ ධර්මය (ලාභාදිය) බලාපොරොත්තුවකින් තොරව විමුක්ති කාරණයක් වශයෙන් අන්‍යයන්ට දේශනා කෙරෙත්ද, මේ දේශනාමය පුඤ්ඤකිරියවත්‍ථු නම්. එකී අය (බණ) අසනුයේ මෙසේ මා ශ්‍රද්ධා ඇත්තෙකැයි දැනගනිත් යැයි අසත්ද එය මහත්ඵල නොවේ. එතෙක් මෙසේ මට මහත්ඵල වන්නේ යැයි හිත පතුරුවමින් මෘදු සිතින් බණ අසයි ද මෙය සවණාමය පුඤ්ඤකිරිය වත්‍ථු නම්. දෘෂ්ටිය ඍජු කරන්නාගේ දෘෂ්ටිය ඍජුකිරීම පුඤ්ඤකිරිය වත්‍ථු නම්. දීඝභාණකයෝ වනාහි මෙසේ කීහ. 'දෘෂ්ටි ඍජුකර්මය සියල්ලන්ට ම නියම ලක්‍ෂණයකි. යම්කිසි පුණ්‍යකර්මයක් කරන්නාගේ වනාහි දෘෂ්ටි ඍජුකභාවයෙන් මහත්ඵල වේය' යනුයි.

මේ පින් කිරිය වත් අතුරෙන් දානමය වනාහි දන් දෙමියි සිඟන්නාට උපදී, දන් දෙන්නාට උපදී, මා විසින් දෙන ලදැයි ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාට උපදී. මෙසේ පූර්වචේතනාය මුඤ්චන චේතනාය අපර චේතනායැයි චේතනා තුනම එක්ව දානමය පින්කිරියවත නම් වෙයි. සීලමයං යනු සිල් පුරමියි සිතන්නාට උපදී. සිල් පුරන කල්හි උපදී. මා විසින් පුරන ලදැයි ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාට උපදී යැයි ඒ සියල්ලම එක්කොට සීලමය පින් කිරියවත නම් වෙයි. -පෙ- දෘෂ්ටි ඍජුකර්මයද දෘෂ්ටිය ඍජු කරමියි සිතන්නාට උපදී. දෘෂ්ටිය ඍජු කරන්නාට උපදී. මා විසින් දෘෂ්ටිය ඍජු කරන ලදැයි ප්‍රත්‍යවේක්‍ෂා කරන්නාට උපදී. ඒ සියල්ලම එක්කොට දෘෂ්ටි ඍජුකම පින්කිරිය වත නම් වේ.

සූත්‍රයෙහි වනාහි පින්කිරියවත් තුනක් පමණක් ආයේය. ඔවුනතුරෙහි අන් පින්කිරියවත්වල සංග්‍රහය දතයුතුයි. අපචිති වෙය්‍යාවච්ච දෙක සීලමයෙහි සංග්‍රහයට යෙයි. පත්තානුප්පදාන අබ්භනුමෝදනා දෙක දානමයෙහි ය. දේශනා සවණ දිට්ඨිජ්ජුකම යන තුන භාවනාමයෙහිය. ඇතැම් කෙනෙක් වනාහි දිට්ඨිජ්ජුකම්මය සියල්ලන්ට ම නියම ලක්‍ෂණයක් යැයි කියත්. ඔවුන්ගේ එය තුනෙහි ම සංග්‍රහයට යෙයි. මෙසේ මේවා සංක්‍ෂේප වශයෙන් තුනක් වී විස්තර වශයෙන් දහයක් වෙයි.

ඔවුනතුරෙහි දන් දෙමියි සිතනුයේ අටවැදෑරුම් කාමාවචර කුසල සිත් අතුරෙන් එක්තරා සිතකින් ම සිතයි, දෙන්නේ ද ඔවුනතුරෙන් ම එක්තරා සිතකින් දෙයි, මා විසින් දනක් දෙන ලදැයි ප්‍රත්‍යවේක්‍ෂා කරන්නේ ද ඔවුනතුරෙන් එක්තරා සිතකින් ම ප්‍රත්‍යවේක්‍ෂා කරයි. සිල් පුරන්නෙමියි සිතන්නේ ද ඒ සිත්වලින් එක්තරා සිතකින් ම සිතයි. සිල් පුරන්නේ ඒ සිත්වලින් එක්තරා සිතකින් ම පුරයි. මා විසින් සිල් පුරන ලදැයි ප්‍රත්‍යවේක්‍ෂා කරන්නේ ද ඒ සිත්වලින් එක්තරා සිතකින් ම ප්‍රත්‍යවේක්‍ෂා කරයි. භාවනා වඩන්නෙමියි සිතන්නේ ද ඒ සිත් අතුරෙන් එක්තරා සිතකින් ම සිතයි. භාවනා කරනුයේ ද ඒ සිත්වලින් එක්තරා සිතකින් ම භාවනා කරනුයේ ද ඒ සිත්වලින් එක්තරා සිතකින් ම භාවනා කරයි. මා විසින් භාවනා වඩන ලදැයි ප්‍රත්‍යවේක්‍ෂා කරනුයේ ද ඒ සිත්වලින් එක්තරා සිතකින් ම ප්‍රත්‍යවේක්‍ෂා කරයි. ජ්‍යෙෂ්ඨයන් පිදීම කරමියි සිතන්නේ ද ඒ සිත්වලින් එක්තරා සිතකින් ම සිතයි. කරනුයේ ද ඒ සිත්වලින් එක්තරා සිතකින් ම කරයි. මා විසින් කරන ලදැයි ප්‍රත්‍යවේක්‍ෂා කරන්නේ ද ඒ සිත්වලින් එක්තරා සිතකින් ම ප්‍රත්‍යවේක්‍ෂා කරයි. කායවෙය්‍යාවතික කර්මය කරමියි සිතන්නේ ද කරනුයේ ද මා විසින් කරන ලදැයි ප්‍රත්‍යවේක්‍ෂා කරනුයේ ද ඒ සිත්වලින් එක්තරා සිතකින් ම ප්‍රත්‍යවේක්‍ෂා කරයි. පින් දෙමියි සිතන්නේ ද දෙනුයේ ද මා විසින් දෙන ලදැයි ප්‍රත්‍යවේක්‍ෂා කරනුයේ ද පින් හෝ සෙසු කුසල් හෝ අනුමෝදන් වන්නෙමියි සිතනුයේ ද ඒ සිත්වලින් එක්තරා සිතකින් ම සිතයි. අනුමෝදන් වනුයේ ද ඒ සිත්වලින් එක්තරා සිතකින් ම අනුමෝදන් වෙයි. මා විසින් අනුමෝදන් වන ලදැයි ප්‍රත්‍යවේක්‍ෂා කරනුයේ ද ඒ සිත්වලින් එක්තරා සිතකින් ම ප්‍රත්‍යවේක්‍ෂා කරයි. ධර්මය දේශනා කරන්නෙමි සිතනුයේ ද ඒ සිත්වලින් එක්තරා සිතකින් ම සිතයි, දේශනා කරනුයේ ඒ සිත්වලින් එක්තරා සිතකින් ම දේශනා කරයි, මා විසින් දේශනා කරන ලදැයි ප්‍රත්‍යවේක්‍ෂා කරනුයේ ද ඒ සිත්වලින් එක්තරා සිතකින් ම ප්‍රත්‍යවේක්‍ෂා

කරයි. ධර්මය අසන්නෙමියි සිතන්නේ ද ඒ සිත්වලින් එක්තරා සිතකින් ම සිතයි, අසනුයේ ද ඒ සිත්වලින් එක්තරා සිතකින් ම අසයි, මා විසින් අසන ලදැයි ප්‍රත්‍යවේක්ෂා කරනුයේ ද, ඒ සිත්වලින් එක්තරා සිතකින් ම ප්‍රත්‍යවේක්ෂා කරයි. දෘෂ්ටිය ඍජුකරමින් සිතනුයේ ද ඒ සිත්වලින් එක්තරා සිතකින් ම සිතයි. ඍජු කරනුයේ වනාහි ඥාන සම්ප්‍රයුක්ත සිත් සතරෙන් එක්තරා සිතකින් කරයි. මා විසින් දෘෂ්ටිය ඍජු කරන ලදැයි ප්‍රත්‍යවේක්ෂා කරනුයේ කාමාවචර කුසලසිත් අටෙන් එක්තරා සිතකින් ප්‍රත්‍යවේක්ෂා කරයි.

මෙතැනදී සතර අනන්ත ගන්නා ලදී. සතර අනන්ත නම්, ආකාසය අනන්තය, චක්‍රවාටයේ අනන්තයහ, සත්‍වනිකාය අනන්තය, බුද්ධඥානය අනන්තය, ආකාසයෙහි වනාහි නැගෙනහිර දිසාවෙන් හෝ බටහිර උතුරු දකුණු දිසාවලින් හෝ යොදුන් සියගණනින් මෙතෙකැයි කියා හෝ යොදුන් දහස් ගණනින් මෙතෙකැයි කියා හෝ සීමාවෙක් නැත. මහමෙර යකුළක් වුව ද දමන ලද්දේ පොළොව දෙකඩකොට පහළට බස්නේමය. ප්‍රතිෂ්ඨාවක් නොලබන්නේ ය. මෙසේ අහස අනන්ත නම් වන්නේ ය. චක්‍රවාටයන්ගේ ද සියගණනින් දහස් ගණනින් පිරිසිඳීමෙක් නම් නැත.

යම්හෙයකින් වනාහි අකනිටා බඹලොව උපන්, දැඩි ස්වභාවයෙන් විදින ධනුර්ධරයකු වේගවත් ඊයකින් තල්ගසක සෙවණ හරහා ඉක්මවන ලක්‍ෂයක් සක්වළ ඉක්මවීමට සමත් ජවයකින් යුත් මහා බ්‍රහ්මයෝ සත්දෙනෙක් සක්වළ කෙළවරදකින්නෙමුයි එම ජවයෙන් දුවත් නමුදු සක්වළ කෙළවර නොදැකම පිරිනිවන්පාන්නාහුය. මෙසේ සක්වළ අනන්ත නම් වේ. මෙපමණ චක්‍රවාටයන්හි දියෙහි වූත් ගොඩෙහි වූත් සත්ත්වයන්ගේ ප්‍රමාණයක් නැත. මෙසේ සත්ත්වනිකාය අනන්ත නම්. එයිනුදු බුද්ධඥානය අනන්තමය, මෙසේ අප්‍රමාණ චක්‍රවාටයන්හි අප්‍රමාණ සත්ත්වයින්ගෙන් එකෙකුට බොහෝ කාමාවචර සෝමනස්ස සහගත ඥානසම්ප්‍රයුක්ත අසංස්කාරික කුසලසිත් උපදී. බොහෝදෙනාට ද බොහෝ (සිත්) උපදී. ඒ සියල්ල මත් කාමාවචරාර්ථයෙන් ද සෝමනස්ස සහගතාර්ථයෙන් ද ඥාන සම්ප්‍රයුක්තාර්ථයෙන් ද අසංස්කාරිකාර්ථයෙන් ද එක්බවට පැමිණේ. එකම සෝමනස්ස සහගත ත්‍රිහේතුක අසංස්කාරික මහාසිත වෙයි. එසේ ම සසංස්කාරික මහා සිත -පෙ- එසේ ම උපේක්‍ෂා සහගත ඥාන සම්ප්‍රයුක්ත ද්විහේතුක සසංස්කාරික සිත යනුයි. මෙසේ සම්මා සම්බුදුරජාණන් වහන්සේ අප්‍රමාණ චක්‍රවාටයන්හි අප්‍රමාණ සත්ත්වයන්ට උපදනා සියලු ම

කාමාවචර කුසල සිත් මහතුලාවෙක (තරාදියක) ල කිරා බලන්නාක් මෙන් ද ලාහෙක ලා මනින්නාක් මෙන් ද සර්වඥතා ඥානයෙන් පිරිසිඳ ඒවා අටෙකැයි සමකිරීමේ අර්ථයෙන් කොටස් අටක් ම කොට දැක්වූ සේක.

නැවත මේ ස්ථානයේදී පින් රැස්කිරීම නම් සය ආකාරයෙකින් ගන්නා ලදී. ස්වයංකාර පින් ඇත, පරංකාර පින් ඇත. සාහත්ථික පින් ඇත. ආණත්තික පින් ඇත. සම්පජානන පින් ඇත. අසම්පජානන පින් ඇත යනුයි. එහි තමාගේ ස්වභාවයෙන් කරන ලද්දේ ස්වයංකාරය, අන්‍යයා කරනු දැක කරන ලද්දේ පරංකාරය, සියතින් කරන ලද්දේ සාහත්ථිකය. අණවා කරවන ලද්දේ ආණත්තිකය, කර්මයත් ඵලයත් අදහා සම්පජානකත නම්. කර්මයත් ඵලයත් නො දැන කරන ලද්දේ අසම්පජානකත නම්. මේ අතුරෙන් සයංකාර පින කරනුයේ ද මේ කුසල් සිත් අටෙන් එක්තරා සිතකින් ම කරයි. පරංකාර පින කරනුයේ ද සාහත්ථිකය කරනුයේ ද අණකොට කරනුයේ ද මේ කුසලසිත් අටෙන් එක්තරා සිතකින් ම කරයි. සම්පජාන කරණය වනාහි ඥාන සම්ප්‍රයුක්ත සතරින් වෙයි. අසම්පජාන කරණය ඥාන විප්‍රයුක්ත සතරින් (වෙයි.)

මෙතැන දී ප්‍රත්‍යයන්ගේ ධාර්මිකතාව චේතනා මහත්වය වස්තු සම්පත්තිය ගුණාතිරේකතාව යැයි අන්‍ය වූ ද දක්ෂිණා විශුද්ධි සතරක් ගන්නා ලදී. එහි දැහැමෙන් සෙමෙන් උපන් ප්‍රත්‍යය ධම්මිකා නම්. අදහාගෙන විශ්වාස කොටගෙන දෙන්නාට වනාහි චේතනා මහත්වය වෙයි. ක්ෂීණාශ්‍රවභාවය වත්‍ථු සම්පත්ති නම්. ක්ෂීණාශ්‍රවයන් වහන්සේගේම නිරෝධ සමාපත්තියෙන් නැගිටි බව ගුණාතිරේකතා නම්. මේ සතර ගළපා දෙන්නට හැකිවන්නාගේ කාමාවචර කුසලය මේ ආත්මභාවයේදී ම විපාක දෙයි. පූර්ණක සිටු කාකවල්ලිය සුමනමාලාකාරාදීන්ට මෙනි.

සංක්ෂේප වශයෙන් වනාහි මේ සියලු ම කාමාවචර කුසල සිත විචිත්‍ර යැයි ගෙන චිත්ත විචිත්‍රාර්ථයෙන් එකක් ම වෙයි. වේදනා වශයෙන් සෝමනස්ස සහගතය උපේක්ෂා සහගතයැයි දෙවැදෑරුම් වේ. ඥාන විභක්ති දේශනා වශයෙන් චතුර්විධ වෙයි. සෝමනස්ස සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංස්කාරික මහා සිතත් උපේක්ෂා සහගත ඥාන සම්ප්‍රයුක්ත අසංස්කාරික මහා සිතත් ඥාන සම්ප්‍රයුක්තාර්ථයෙන් ද අසංස්කාරිකාර්ථ යෙන් ද එකක් ම වෙයි. එසේ ම ඥාන සම්ප්‍රයුක්ත අසංස්කාරිකය ඥාන

සම්ප්‍රයුක්ත සසංස්කාරිකය ඥාන විප්‍රයුක්ත අසංස්කාරිකය ඥාන විප්‍රයුක්ත සසංස්කාරිකය ඥාන විප්‍රයුක්ත අසංස්කාරිකය ඥාන විප්‍රයුක්ත සසංස්කාරිකය යැයි මෙසේ ඥාන විභක්ති දේශනා වශයෙන් චතුර්විධ වූ මෙහි වනාහි අසංස්කාර සසංස්කාර විභක්ති වශයෙන් අසංස්කාරික සතරෙක සසංස්කාරික සතරෙකැයි කුසලසිත් අටක් ම වෙයි.

එකී සිත් තත්වාකාරයෙන් දැන සර්වඥ වූ ගණිවර වූ මුනිශ්‍රේෂ්ඨ වූ භාග්‍යවතුන් වහන්සේ දක්වන සේක. දෙසන සේක. පනවන සේක. පිහිටුවන සේක. විස්තර කරන සේක. බෙදන සේක. නොගැඹුරු කරන සේක යනුයි.

කාමාවචර කුසල නිර්දේශය නිමියේ ය.

දැන් රූපාවචර කුශලය දැන්වීමට කතමෙ ධම්මා කුශලා යන ආදිය පටන්ගන්නා ලදී. එහි **රූපූපපත්තියා මග්ගං භාවෙති** යන මෙහි රූපභාවය රූපය යැයි කියනු ලැබේ. **උපපත්ති** යනු ඉපදීමයි. හටගැනීමයි. විශේෂයෙන් හටගැනීමයි. **මග්ගො** යනු උපායයි. මෙහි වචනාර්ථය වනාහි ඒ උත්පත්තිය සොයයි. ගවේෂණය කරයි. උපදවයි. නිෂ්පාදනය කරයිනුයි **මග්ගය,** මෙය කියන ලද්දේ වෙයි. යම් මාර්ගයකින් රූප භවයෙහි උත්පත්තියත් නිබ්බත්තියත් හටගැනීමත් විශේෂයෙන් හටගැනීමත් වේද ඒ මාර්ගය වඩයි යනුයි. කිම මේ නියමයෙන් වනාහි රූප භවයෙහි උත්පත්තිය වේද? නො වෙයි. 'මහණෙනි, සමාධිය වඩව්. සමාධියට පත්වූයේ තත්වාකාරය දැනගනී දකී' යැයි මෙසේ කියන ලද නිර්වේදභාගිය මාර්ගයෙන් වනාහි රූපභවය ඉක්මවීමක් ද වේ. රූප භවයෙහි ඉපදීම පිණිස වනාහි මෙයින් අන්‍ය වූ මාර්ගයක් නම් නැත. එහෙයින් කියන ලදී. 'රූප භවයෙහි ඉපදීම පිණිස මාර්ගය වඩයි' යන අර්ථයෙන් ද මේ මාර්ගය නම් චේතනාව ද වෙයි. චේතනාව හා සම්ප්‍රයුක්ත ධර්මයෝත් යන ඒ දෙකක්මත් වෙයි. 'සාරිපුත්‍රය, මම නිරයත් නිරයගාමී මාර්ගයත් දනිමි' යන මෙහි වනාහි මාර්ගය නම් චේතනාවයි.

සද්ධා හිරියං කුසලං ච දානං
ධම්මා එතෙ සප්පුරිසානුයාතා
එතං හි මග්ගං දිවියං වදන්ති
එතෙන හි ගච්ඡති දෙවලොකන්ති

'ශ්‍රද්ධාව හිරිය කුසලය සහ දානය ද යන මේ ධර්මයෝ සත්පුරුෂයන් විසින් අනුගමනය කරන ලදහ. මේ මාර්ගය වනාහි දිව්‍යයැයි කියත්. මෙයින් වනාහි දෙව්ලොවට යන්නේ ය.' යනුයි.

මෙහි චේතනා සම්ප්‍රයුක්ත ධර්මයෙන් මාර්ග නම්. 'මහණෙනි, මේ මාර්ගයයි. මේ ප්‍රතිපදාවයි' යන සංස්කාරෝත්පත්ති සූත්‍රාදියෙහි චේතනා ද චේතනා සම්ප්‍රයුක්ත ධර්මයෝ ද මාර්ග නම්. මේ ස්ථානයෙහි වනාහි නිධානය යන වචනයෙන් චේතනා සම්ප්‍රයුක්ත ධර්මයෝ අභිප්‍රේතයහ. යම්හෙයකින් වනාහි ධ්‍යාන චේතනාව ප්‍රතිසන්ධිය ඇදගනීද, එහෙයින් චේතනාවත් චේතනා සම්ප්‍රයුක්ත ධර්මයෝත් සුදුසු වෙත්මය. භාවෙති යනු ජනනය කරයි. උපදවයි. වඩයි. මෙහි මෙය වනාහි භාවනාවෙහි අර්ථයි. අන් තැන්හි වනාහි උපසර්ග වශයෙන් සම්භාවනා පරිභාවනා විභාවනා යැයි (ද වේ) මෙසේ වෙනත් අයුරින් ද අර්ථය වෙයි. එහි 'උදායි, මේ ශාසනයෙහි මාගේ ශ්‍රාවකයෝ ශ්‍රමණ ගෞතමයන් වහන්සේ සිල්වත්ය. පරම වූ ශීලස්කන්ධයෙන් යුක්තයහ. අධිශීලයන් වර්ණනා කරත් ද,' යන මේ සම්භාවනා නම්. විශ්වාස කිරීම යන අර්ථයි. 'ශීලය වඩනා ලද්දේ සමාධිය මහත්ඵල වෙයි. මහානිසංස වෙයි. සමාධිය වඩනා ලද්දේ ප්‍රඥාව මහත්ඵල වෙයි. මහානිසංස වෙයි. ප්‍රඥාව වඩනා ලද සිත මනාකොට ආශ්‍රවයන්ගෙන් මිදෙයි' යන මේ පරිභාවනා නම් වාසනා යන අර්ථයි. 'එසේනම් රූපය අතුරුදන් කරන්න වේදනාව සංඥාව සංස්කාර විඥානය අතුරුදන් කරන්න' යනු මේ විභාවනා නම්. අතුරුදන් කිරීම යන අර්ථයි. 'උදායි, නැවත අනිකක් කියමි. මා විසින් ශ්‍රාවකයන් ප්‍රතිපදාව කියන ලදී. ඒ අනුව පිළිපන් මාගේ ශ්‍රාවකයෝ සතර සතිපට්ඨානයන් වඩත්' යන මෙය වනාහි උත්පාදන වර්ධන අර්ථයෙන් භාවනා නම්. මේ ස්ථානයේ ද මෙය ම අදහස් කරන ලදී. එහෙයින් මෙය කියන ලදී. 'භාවෙති යනු ජනනය කරයි. උපදවයි. වඩයි' යනුයි. මෙහිදී වනාහි කවරහෙයකින් කාමාවචර කුශල නිර්දේශයෙහි ධර්ම පූර්වාංගම ව දේශනාව කළ පරිදි නොකොට පුද්ගල පූර්වාංගම ව කරන ලද ද ? යනුයි. ප්‍රතිපදාවෙන් සිද්ධ කළයුතු බැවිනි. මෙය වනාහි චතුර්විධ

ප්‍රතිපදා අතුරෙන් එක්තරා ප්‍රතිපදාවකින් සිද්ධ කළයුතුයි. කාමාවචර කුශලය මෙන් ප්‍රතිපදාවෙන් තොරව නූපදී. මේ ප්‍රතිපදාව නම් පිළිවදනවුන් ඇති කල්හි වේය යන මේ කාරණය දැක්වීමට පුද්ගල පූර්වාංගම දේශනාව කරන සේක් **රූපූපපත්තියා මග්ගං භාවෙති** යැයි වදාළහ.

**විවිච්චෙව කාමෙහි** යනු කාමයන්ගෙන් තොරව වෙන් ව පහව, මෙහි වනාහි යම් ඒවකාරයක් වේද එය නියමාර්ථය යැයි දතයුතුයි. යම්හෙයකින් නියමාර්ථය වේද එහෙයින් එසමයෙහි ප්‍රථමධ්‍යානය පැමිණ වාසය කරන කල්හි අවිද්‍යමාන වූ කාමයන් ඒ ප්‍රථමධ්‍යානයට ප්‍රතිපක්ෂ භාවයක් කාමපරිත්‍යාගයෙන් ඔහුගේ අධිගමයත් දක්වයි. කෙසේද? විවිච්චෙව කාමෙහි යැයි මෙසේ නියමයකරවන කල්හි වනාහි මෙය පැනේ. මේ ධ්‍යානයට කාමයෝ ප්‍රතිපක්ෂ නොවූවෝ ද? යම් ධර්මයන් ඇති කල්හි මෙය නොපවතීද? අන්ධකාරය ඇතිකල්හි ප්‍රදීපාලෝකය මෙනි. ඔවුන්ගේ පරිත්‍යාගයෙන් ම එහි අධිගමය වෙයි. මෙතෙර පරිත්‍යාගයෙන් පරතෙරට මෙනි. එහෙයින් නියමය කෙරේ යනුයි. එහි මෙවැන්නක් වන්නේ ය. කවර හෙයින් මෙය පූර්ව පදයෙහි ම කියන ලදද? කවර හෙයින් උත්තර පදයෙහි නොකියන ලද ද? කිම අකුසල ධර්මයන්ගෙන් තොර නොවී ධ්‍යානයට පැමිණ වාසය කරන්නේ ද? මෙය වනාහි එපරිද්දෙන් නොදත යුතුයි. එය පහකරන හෙයින් මෙය පූර්වපදයෙහි කියන ලදී. කාමධාතු සමතික්‍රමණයෙන් ද කාමරාග ප්‍රතික්ෂේපයෙන් ද මේ ධ්‍යානය කාමයන්ගෙන් ම නික්මෙයි. එය මෙසේ කීහ. 'නෙක්ඛම්ම යන මෙය කාමයන්ගේ නික්මීමයි' යනුයි. උත්තරපදයෙහි වනාහි මෙසේ ය. 'මහණෙනි, ප්‍රථම ශ්‍රමණයාත් මේ ශාසනයෙහිය. ද්විතීය ශ්‍රමණයාත් මේ ශාසනයෙහිමය' යනුයි. මෙහි ඒවකාරය ගෙනහැර දක්වන ලදී. මෙසේද කිවයුතුයි. මෙයින් අන්‍ය වූ ද නීවරණ සංඛ්‍යාත අකුශල ධර්මයන්ගෙන් වෙන් නොවී ධ්‍යානයට සමවැද වාසය කළ නො හැකිය. එහෙයින් කාමයන්ගෙන් වෙන්වම අකුශල ධර්මයන්ගෙන් වෙන්වම යැයි මෙසේ පද දෙකෙහි ම මෙය දතයුතුයි. පද දෙකෙහි ම කිසිසේත් විවිච්ච යන මේ සාධාරණ වචනයෙන් තදංග විවේකාදිය ද කායවිවේක යනාදිය ද යන සියලු ම විවේකයෝ සංගෘහීත වෙත්. එසේ වුව ද කාය විවේකය, චිත්ත විවේකය, විෂ්කම්භන විවේකය යන තුන ම මෙහි දී දතයුතුයි. කාමෙහි යන මේ පදයෙන් නිද්දේස පාළියෙහි 'කතමෙ වත්‍ථුකාමා මනාපියා' යන ආදී නයින් යම් වස්තුකාමයෝ කියන ලද්දාහුද, එහි ම විභංගයෙහි 'ඡන්දො කාමො රාගො කාමො ඡන්දරාගො කාමො

සංකප්පො කාමො රාගො කාමො සංකප්පරාගො කාමො ඉමෙ වුච්චන්ති කාමා' යැයි මෙසේ යම් ක්ලේශකාමයෝ කියන ලද්දාහු ද ඒ සියලුම කාමයෝ සංග්‍රහ කරන ලදහමයැයි දතයුත්තාහ. මෙසේ ඇතිකල්හි වනාහි විවිච්චේව කාමෙහි යනු වස්තුකාමයන්ගෙන් ද වෙන්ව ම යැයි අර්ථය යෙදේ. එයින් කාය විවේකය කියන ලද්දේ වෙයි.

විවිච්ච අකුසලෙහි ධම්මෙහි යනු ක්ලේශකාමයන්ගෙන් හෝ සියලු අකුශලයන්ගෙන් වෙන් ව යැයි අර්ථය යෙදේ. එයින් චිත්ත විවේකය කියන ලද්දේ වෙයි. මෙහි පළමුවෙන් ද වස්තුකාමයන්ගෙන් වෙන්ව යන වචනයෙන් ම කම්සැප අත්හැරීම (ප්‍රකාශ කරන ලද්දේ වෙයි) දෙවැන්නෙන් ක්ලේශ කාමයන්ගෙන් වෙන්ව යන වචනයෙන් නෛෂ්ක්‍රම්‍ය සුඛ පරිත්‍යාගය ප්‍රකාශ කරන ලද්දේ වෙයි. මෙසේ වස්තුකාම ක්ලේශකාම විවේකය යන වචනයෙන්, මෙසේ ද මොවුන්ගෙන් පළමුවැන්නෙන් සංක්ලේශ වස්තු ප්‍රහාණය ද දෙවැන්නේ සංක්ලේශ ප්‍රහාණය ද පළමුවැන්නේ ලොල්බවේ හේතු ප්‍රහාණය ද, දෙවැන්නෙන් බාල භාවයාගේ ද පළමුවැන්නෙන් ප්‍රයෝග ශුද්ධිය ද, දෙවැන්නෙන් ආසය පෝෂණය ද ප්‍රකාශ කරන ලද්දේ වෙයි යැයි දතයුතුයි. මේ නය වනාහි මෙහි කාමෙහි යැයි කී කාමයන් අතුරෙන් වස්තුකාම පක්ෂයෙහි ය. ක්ලේශකාම පක්ෂයෙහි වනාහි ඡන්ද යැයි ද රාග යැයි ද මේ ආදියෙන් නොයෙක් භේද ඇති කාමච්ඡන්දය ම කාම යැයි අදහස් කරන ලදී. යමක් වනාහි අකුශලයෙහි ඇතුළත් වූයේ ද 'තත්ථ කතමො කාමචඡන්දො කාමො' යන ආදී නයින් විභංගයෙහි ධ්‍යාන ප්‍රතිපක්ෂ වශයෙන් වෙනම කියන ලදී. පළමු පදයෙන් ක්ලේශ මාත්‍රයෙන් හෝ කියන ලදී. අකුශලයෙහි ඇතුළත් හෙයින් දෙවන පදයෙහි නොයෙක් භේදවලින් මෙයට කාමතො යැයි නොකියා කාමෙහි යැයි කියන ලදී. අන්‍ය ධර්මයන්ගේ ද අකුශල භාවයක් විද්‍යමාන කල්හි 'තත්ථ කතමෙ අකුශලා ධම්මා කාමචඡන්දො' යන ආදී නයින් විභංගයෙහි උපරිධ්‍යානාංගයන්ට විරුද්ධයනට ප්‍රතිපක්ෂ භාවය දැක්වීම වශයෙන් නීවරණයෝ ම කියන ලදහ. නීවරණයෝ වනාහි ධ්‍යානාංගයන්ට විරුද්ධයහ. ධ්‍යානාංගයෝ ම ඔවුන්ට ප්‍රතිපක්ෂයෝය. විනාශකාරීහුය. නාශකයෝයැයි කියන ලද්දේ වෙයි. යම්සේ වනාහි සමාධිය කාමච්ඡන්දයට ප්‍රතිපක්ෂය, ප්‍රීතිය ව්‍යාපාදයට ද, විතර්කය ථීනමිද්ධයට ද, සුඛය උද්ධච්චකුක්කුච්චයට ද, විචාරය විචිකිච්ඡාවට ද (ප්‍රතිපක්ෂය) යැයි පේටකෝපදේසයෙහි කියන ලදද, එසේ ම මෙහි

'විවිච්චෙව කාමෙහි' යැයි මෙයින් කාමච්ඡන්දයාගේ විෂ්කම්භන විවේකය කියන ලද්දේ වෙයි.

**විවිච්ච අකුසලෙහි ධම්මෙහි** යන මෙයින් පංච නීවරණයන්ගෙන් ද නොගත් ඒවා ගැනීමෙන් වනාහි ප්‍රථමධ්‍යානයෙන් කාමච්ඡන්දයාගේ ද දෙවැන්නෙන් සෙසු නීවරණයන් ගේ ද එසේ ම ප්‍රථමධ්‍යානයෙන් ත්‍රිවිධ අකුශල මූලයන්හි පංචකාමගුණ භේදයන්ට විෂය වූ ලෝභයාගේ ද, දෙවැන්නෙන් ආඝාත වස්තු විෂය වූ ද්වේෂ මෝහයන්ගේ ද, පළමුවන්නෙන් ඕඝාදී ධර්මයන් අතුරෙහි කාමෞඝ - කාමයෝග - කාමාස්වාද - කාමූපාදාන - අභිධ්‍යාකායග්‍රන්ථ - කාමරාග සංයෝජනයන්ගේ ද, දෙවැන්නෙන් අවශේෂ ඕඝ-යෝග-ආසව-උපාදාන-ග්‍රන්ථ සංයෝජන-යන්ගේ ද, පළමුවැන්නෙන් තෘෂ්ණාවගේ ද එය හා සම්ප්‍රයුක්තයන්ගේ ද, දෙවැන්නෙන් අවිද්‍යාවගේත් එය හා සම්ප්‍රයුක්තයන්ගේත් ද තව ද පළමුවැන්නෙන් ලෝභ සම්ප්‍රයුක්ත අෂ්ට චිත්තෝත්පාදයන්ගේ ද දෙවැන්නෙන් සෙසු සතර අකුසල චිත්තෝත්පාදයන්ගේ විෂ්කම්භන විවේකය ද කියන ලද්දේ වේයැයි දතයුතුයි. මේ වනාහි 'විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි' යන මෙහි අර්ථ ප්‍රකාශනයයි.

මෙපමණකින් ප්‍රථමධ්‍යානයෙහි ප්‍රහාණාංග දක්වා දැන් යෝගාංග දැක්වීමට **සවිතක්කං සවිචාරං** යන ආදිය කියන ලදී. එහි යට කියන ලද ලක්ෂණාදී විභාගයෙන් අර්පණා සම්ප්‍රයෝගයෙන් රූපාවචර භාවයට පත් විතර්කය මෙන් ම විචරය ද සමග පවතී. විතර්ක විචාර සහිත මේ ධ්‍යානය මලින් හා ඵලයෙන් යුත් රුකක් මෙනැයි කියනු ලැබේ. විභංගයෙහි වනාහි 'මේ විතර්කයෙනුත් මේ විචාරයෙනුත් යුක්ත වූයේ වෙයි. විශේෂයෙන් යුක්ත වූයේ වෙයි' යන ආදියෙන් නයින් පුද්ගලාධිෂ්ඨාන දේශනා කරන ලදී. එහි ද අර්ථය වනාහි මෙසේම දතයුතුයි. **විවෙකජං** යන මෙහි වෙන්වීම විවේකයයි. නීවරණයන් පහවීම යන අර්ථයි. වෙන් වූයේ යනු හෝ විවේකයයි. නීවරණයන්ගෙන් තොර වූ ධ්‍යාන සම්ප්‍රයුක්ත ධර්මරාශිය යන අර්ථයි. ඒ විවේකයෙන් හෝ එම විවේකයෙහි හටගත් යනු **විවේකජ ය. පීතිසුඛං** යන මෙහි ප්‍රීතිසුඛයෝ යට ප්‍රකාශ කරන ලද්දාහු ම ය. ඔවුනතුරෙන් වනාහි කියන ලද ආකාර ඇති පස්වනක් ප්‍රීතින්ගෙන් අර්පණාව තෙක් සමාධියට මුල්ව වඩනු ලබන සමාධිය හා එක්ව ගියේ ඵරණා ප්‍රීතියයි. මෙය මේ ස්ථානයෙහි අදහස් කරන ලද ප්‍රීතියයි. මෙසේ මේ ප්‍රීතිය ද මේ සුවය ද මේ ධ්‍යානයාගේ හෝ මේ

ධ්‍යානයෙහි ඇතැයි යනු මේ ධ්‍යානය පීතිසුඛ යැයි කියනු ලැබේ. නොහොත් පීති ච සුඛං ච = පීතිසුඛං ය. ධම්මවිනයාදිය මෙනි. විවේකයෙන් උපන් ප්‍රීතිසුඛය මේ ධ්‍යානයට මේ ධ්‍යානයෙහි හෝ ඇත යැයි මෙසේ ද විවෙකජං පීතිසුඛං ය, ධ්‍යානය වනාහි යම් සේද මෙහි පීතිසුඛ ද විවේකජම වෙයි. එය ද එයට ඇත. එහෙයින් විවෙකජං පීතිසුඛං යැයි එක් පදයකින්ම කීම යෙදේ. විභංගයෙහි වනාහි 'ඉදං පන සුඛං ඉමාය පීතිසා සහගතං' යන ආදී නයින් කියන ලදී. එහි ද අර්ථය එපරිද්දෙන් ම දතයුතුයි.

මෙහි පඨමං ඣානං යනු ගණනයේ අනුපිළිවෙළින් පඨමය, පළමුව උපන්නේ ද පඨමය, පළමුවෙන් සමවැදිය යුතු යනු ද පඨමය, මෙය වනාහි ඒකාන්ත ලක්‍ෂණයක් නොවේ. පුරුදු කළ වසීභාවය ඇති අෂ්ට සමාපත්තිලාභී පුද්ගලයා වනාහි මුලපටන් මුදුන් පමුණුවමින් සමවදනට හැක්කේ වෙයි. මස්තයෙහි පටන් මුලට පැමිණෙමින් සමවදනට ද හැක්කේ වෙයි. අතරතුර බැසගන්නට හැක්කේ වෙයි. මෙසේ පළමුව උපන් යන අර්ථයෙන් වනාහි පළමු නම් වෙයි. ඣානං යනු ආරම්ම නූපනිජ්ඣාන ලකඛනූපනිජ්ඣායැයි ධ්‍යානය දෙවැදෑරුම්ය. එහි අෂ්ට සමාපත්ති පඨවි කසිණාදී අරමුණු නැවත නැවත සිහිපත් කෙරේනුයි ආරම්මණූපනිජ්ඣාන නම්හ. එහි විදර්ශනා මාර්ගඵලයෝ වනාහි ලක්ඛනූපනිජ්ඣාන නම්හ. එහි විදර්ශනාව අනිත්‍යාදි ලක්‍ෂණ නිතර නිතර සිහිපත් කරන හෙයින් ලක්ඛනූපනිජ්ඣානය, විදර්ශනාවෙන් කරන ලද කෘත්‍යයාගේ මාර්ගයෙන් ඉෂ්ටවන හෙයින් මාර්ගය ලක්ඛනූපනිජ්ඣානය, ඵලය වනාහි නිරෝධ සත්‍යය, තථ ලක්‍ෂණය, නැවත නැවත සිහිපත් කෙරේනුයි = ලක්ඛනූප නිජ්ඣානය නම්. ඔවුනතුරෙන් මේ අර්ථයෙහි ආරම්මනූපනිජ්ඣාය අභිප්‍රේතය. එහෙයින් අරමුණ නැවත නැවත සිහිකරන හෙයින් හෝ සතුරන් දවන හෙයින් හෝ ඣාන යැයි දතයුතුයි. උපසම්පජ්ජ යනු ළඟට අවුත්, පැමිණ යැයි කියන ලද්දේ වෙයි. සම්පාදනය කර හෝ නිෂ්පාදනය කර යැයි කියන ලද්දේ වෙයි. විභංගයෙහි වනාහි 'උපසම්පජ්ජා යනු ප්‍රථම ධ්‍යානය ලැබීම ප්‍රතිලාභය පැමිණීම සපැමිණීම ස්පර්ශය ප්‍රත්‍යක්‍ෂ කිරීම උපසම්පදා'යැයි කියන ලදී. එහි ද මෙපරිද්දෙන් ම අර්ථය දතයුතුයි. විහරති යනු එයට අනුරූප වූ ඉරියව් විහරණයෙන් මෙසේ කියන ලද ආකාර ඇති ධ්‍යානාංගවලින් සමන්විතව ආත්මභාවය පිළිබඳ ක්‍රියා පැවැත්වීම පැවැත්ම පාලනය යැපීම යාපනය කිරීම හැසිරීම විහරණය නිෂ්පාදනය කරයි. විභංගයෙහි මෙය කියන ලද්දේ ම ය.

'විහරතී ති ඉරියති වත්තති පාලෙති යාපෙති චරති විහරති තෙන වුච්චති විහරතී' යනුයි.

**පඨවි කසිණං** යන මෙහි සකලාර්ථයෙන් පෘථුවි මණ්ඩලය ම පඨවි කසිණය යැයි කියනු ලැබේ. එය නිසා ලද නිමිත්ත ද පෘථුවි කසිණ නිමිත්තෙහි ලද ධ්‍යානය ද පඨවි කසිණයැයි කියනු ලැබේ. එහිදී මේ අර්ථයෙහි ධ්‍යානය ද පෘථුවි කසිණයැයි දතයුතුයි. පඨවි කසිණ සංඛ්‍යාත ධ්‍යානයට පැමිණ වාසය කෙරේ යනු මෙය වනාහි මෙහි සංක්ෂේපාර්ථයයි. මේ පඨවි කසිණයෙහි පරිකර්ම කොට සතරවන පස්වන ධ්‍යානයන් උපදවා ධ්‍යානය ආසන්න කාරණය කොටගත් විදසුන් වඩා අර්හත්වයට පැමිණෙනු කැමති කුලපුත්‍රයා විසින් කුමක් කළ යුතු ද?, පළමුවෙන් වනාහි ප්‍රාතිමෝක්ෂ සංවර ඉන්ද්‍රිය සංවර ආජීව පාරිශුද්ධි ප්‍රත්‍යය සන්නිශ්‍රිත සංඛ්‍යාත සතර සංවර සීලයන් පිරිසිදු කොට සීලයෙහි පිරිසිදුව සිටි කල්හි ඔහුට ආවාසාදී දසපළිබෝධයන් අතුරෙන් යම් පළිබෝධයක් වේ නම් එය සිඳ දමා කර්මස්ථානදායක කල්‍යාණ මිත්‍රයකු වෙත එළඹ පාළියෙහි ආ අටතිස් කමටහන් අතුරෙන් තමාගේ චරියාවට අනුකූල වූ කර්මස්ථානයක් පරීක්ෂා කරන්නා ඉදින් මේ පඨවි කසිණය අනුකූල වේ නම්, මේ කර්මස්ථානය ම ගෙන ධ්‍යාන භාවනාවට සුදුසු නොවූ විහාරය හැර සුදුසු වූ විහාරයක වෙසෙමින් කුඩා පළිබෝධයන් සිඳ දමා තියුණු පිරියම් නිමිත්ත රැකීම සප්ත අසත්ප්‍රායයන් දුරුකිරීම සප්තසත්ප්‍රායන් සේවනය කිරීම දශවිධ අර්පණා කෞශල්‍යප්‍රභේද සියලු භාවනා විධාන නොපිරිහෙළමින් ධ්‍යානාධිගමය පිණිස පිළිපැදිය යුතුය. මේ මෙහි සංක්ෂේපයයි. විස්තරය වනාහි විශුද්ධි මාර්ගයෙහි කී නයින් ම දතයුතුයි. මෙහි යම්සේ ද මෙසේ මෙයින් අන්‍ය වූ ද සියලු කර්මස්ථානයන් පිළිබඳ සියලු භාවනාවිධාන වනාහි අර්ථකථා නයින් ගෙන විශුද්ධි මාර්ගයෙහි විස්තර කරන ලදී. එය තැන් තැන්වල නැවතත් කීමෙන් ප්‍රයෝජන කිම්දැයි එය නැවත විස්තර නොකරමු. යට පාළියෙහි නොආ අර්ථය වනාහි නොපිරිහෙළා නිතර ම අනුපද වර්ණනාව ම කරන්නෙමි.

**තස්මිං සමයෙ** යනු ප්‍රථමධ්‍යානයට සපැමිණ වාසය කරන ඒ සමයෙහි **ඵස්සො හොති -පෙ- අවික්ඛෙපො හොති** යනු මේ කාමාවචර ප්‍රථම කුශල චිත්තයෙහි කියන ලද ආකාර පද පිළිවෙළින් සපනස් ධර්මයෝ වෙත්. හුදෙක් ඒ වනාහි කාමාවචරය මොවුහු භූම්‍යන්තර වශයෙන් මහත්ගතයහ. රූපාවචරයහ යන මෙය මෙහි වෙනසයි. සෙස්ස එබඳුමය.

මෙහි වනාහි ඡන්දාදී සතර සේවාපතකයෝ ද ලැබෙත්. කොට්ඨාසවාර සුඤ්ඤතවාරයෝ ප්‍රකෘති ස්වභාව ඇත්තාහු ම ය. යනුයි.

ප්‍රථමය යි.

ද්‍විතිය ධ්‍යාන නිර්දේශයෙහි **විතක්ක විචාරානං වූපසමා** යනු විතර්ක විචාර යන මේ දෙදෙනාගේ සංසිඳීමෙන් දුරලීමෙන් ද්විතීය ධ්‍යාන ක්‍ෂණයෙහි නො පහළවන හෙයින් යැයි කියන ලද්දේ වෙයි. එහි ද්විතීය ධ්‍යානයෙහි කිසිසේත් සියලුම ප්‍රථමධ්‍යාන ධර්මයෝ නැත්තාහ. ප්‍රථමධ්‍යානයෙහි ස්පර්ශාදීහු අන්‍යයෝමය. මෙහි අන්‍යයෝ ය. ඖළාරික වූ අංගයාගේ දුරලීමෙන් ප්‍රථමධ්‍යානයෙන් අන්‍ය වූ ද්විතීය ධ්‍යානාදීන්ගේ අධිගමය වේයැයි දැක්වීම පිණිස විතක්ක විචාරානං වූපසමා යැයි මෙසේ කියන ලදැයි දතයුතුයි. **අජ්ඣත්තං** යැයි මෙහි ස්වකීය ආධ්‍යාත්මය අභිප්‍රේතයි. විභංගයෙහි වනාහි 'අජ්ඣත්ත පච්චත්තං' යන මෙපමණක්ම කියන ලදී. යම්හෙයකින් ස්වකීය ආධ්‍යාත්මය අභිප්‍රේත ද එහෙයින් තමා කෙරෙහි හටගත් තමාගේ සන්තානයෙහි උපන් යන මෙය මෙහි අර්ථයි. **සම්පසාදනං** යනු සම්පසාදන නම් ශ්‍රද්ධාව යැයි කියනු ලැබේ. සම්පසාදන යනු යෙදීමෙන් ධ්‍යානය ද සම්පසාදනය, නීල වර්ණය යෙදීමෙන් නීල වස්ත්‍රය මෙනි. යම්හෙයකින් හෝ ඒ ධ්‍යානය සම්ප්‍රසාදනයෙන් යුක්ත හෙයින් ද විතර්ක විචාර කැළඹීමෙන් හා සංසිඳවීමෙන් ද සිත පහදවයි ද එහෙයින් ද සම්පසාදන යැයි කියන ලදී. මෙහි ද අර්ථ යෙදීමේ දී සම්පසාදනං චෙතසො යැයි මෙසේ පද සම්බන්ධය දතයුතුයි. පළමු අර්ථ යෙදීමේදී **චෙතසො** යන මෙය එකොදිභාවෙන යන්න සමග යෙදිය යුතුයි. මේ එහි අර්ථ යෝජනාවයි.

ශ්‍රේෂ්ඨ ව උදාවෙයි යනු = **එකොදි ය,** විතර්කවිචාරයන් ආරූඪ නොවූ හෙයින් අග්‍රව ශ්‍රේෂ්ඨ ව උදාවෙයි යන අර්ථයි. ලෝකයෙහි ශ්‍රේෂ්ඨයා ද ඒක යැයි කියනු ලැබේ. විතර්කවිචාර විරහිතව හෝ හුදකලාව අසහාය ව යැයි කියන්නට වටී. නොහොත් සම්ප්‍රයුක්ත ධර්මයන් උදා කෙරේනුයි = උදිය, නැගිටුවයි යන අර්ථයි. ශ්‍රේෂ්ඨාර්ථයෙන් ඒක වූයේ ද උදි වූයේ ද හෙතෙමේනුයි **එකොදිය** මේ සමාධියට නමකි. මෙසේ මෙය එකෝදිස භාවනා කරය. වඩයි යැයි මේ ද්වතීය ධ්‍යානය **එකොධිභාවය** ඒ මේ එකෝදිය යම්හෙයකින් සිත පිළිබඳ ද සත්ත්වයෙකුට නොවේ ද,

ජීවයකට නොවේ ද, එහෙයින් එහෙයින් මෙය චෙතසො එකොදිභාවං යැයි කියන ලදී. මේ ශ්‍රද්ධාව ප්‍රථමධ්‍යානයෙහි ද ඇත්තේ නොවේ ද, මෙය ද එකොදිභාවනාමක සමාධියකි. එසේ නම් කවර හෙයින් මෙය ම සම්පාසාදනං චෙතසො එකොදිභාං ච යැයි (කියන ලදද) කියනු ලැබේද? මේ ප්‍රථමධ්‍යානය වනාහි විතර්ක විචාරයන් ගෙන් කැළඹීමෙන් රළ පතරින් ගැවසුණු ජලයක් මෙන් සුප්‍රසන්න නොවේ. එහෙයින් ශ්‍රද්ධාව ඇති කලද සම්පසාදන යැයි නොකියන ලදී. සුප්‍රසන්න නොවන හෙයිනි. මෙසේ මෙහි සමාධිය ද මනාව ප්‍රකට නො වේ. එහෙයින් එකොදිභාවං යනු ද නො කියන ලදී. මේ ධ්‍යානයෙහි වනාහි විතර්ක විචාර පළිබෝධයන්ගේ අභාවයෙන් ලබන ලද අවකාශ ඇති බලවත් ශ්‍රද්ධාවගේ සහාය ලැබීමෙන් ම සමාධිය ද ප්‍රකටය. එහෙයින් මෙයම කියන ලදැයි දතයුතුයි. විභංගයෙහි වනාහි 'සමපසාදනනති යා සදධා සදදහනා ඔකපපනා අභිපපසාදො, චෙතසො එකොදිභාවනති යා චිතතසස ඨිති -පෙ- සමමා සමාධි' යන මෙපමණක් ම කියන ලදී. මෙසේ කියන ලද මෙයත් සමග වනාහි මේ අර්ථ වර්ණනාව යම් සේ විරුද්ධ නොවේ ද, අන් අයුරකින් සංසන්දනය කරත් නමුදු සමවන්නේ යැයි මෙසේ දතයුතුයි.

**අවිතකකං අවිචාරං** යනු භාවනාවෙන් ප්‍රහීණ වූ හෙයින් මෙහි හෝ මෙයට විතර්කය නැත යනු අවිතකකය මේ නයින් ම ම අවිචාරය විභංගයෙහි ද (මෙසේ) කියන ලදී. මෙසේ මේ විතර්කයත් මේ විහාරයත් ශාන්තවෙත්ද සමනය වෙත් ද සංසිඳුණෝ වෙත් ද අස්තයට ගියෝ වෙත්ද විශේෂයෙන් අස්තයට ගියාහුද සමාධිගත වූවාහුද විශේෂයෙන් සමාධිගත වූවාහු ද වියළන ලද්දාහුද විශේෂයෙන් වියළන ලද්දාහුද විශේෂයෙන් දුරුකරන ලදහ. එහෙයින් අවිතක්කය අවිචාර යැයි කියනු ලැබේ' යනුයි. මෙහිදී මෙසේ කියන ලදී. විතක්ක කියනු ලැබේ' යනුයි. මෙහිදී මෙසේ කියන ලදී. විතක්ක විචාරානං වූපසමා යන මෙයින් ද මේ අර්ථය සිද්ධවූයේ නොවේද? එසේ කවර හෙයින් නැවත අවිතක්කං අවිචාරං යැයි කියන ලද ද? මෙය මෙසේ කියනු ලැබේ. මේ අර්ථය සිද්ධමය. මේ වනාහි තදත්ථදීපක නොවේ. 'ඖළාරික අංගයාගේ දුරලීමෙන් ප්‍රථමධ්‍යානයෙන් පර ද්විතීය ධ්‍යානාදීන්ගේ අධිගමය වේ යැයි දැක්වීම පිණිස විතක්ක විචාරානං වූපසමා යැයි මෙසේ කියන ලදී' යැයි කීවමෝ නොවමුද? තවද මේ සම්පසාදනය විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙනි ක්ලේශයන්ගෙන් කිලිටු වූවහුට නොවේ. එකොදිභාවය (සමාධිය) ද විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් උපචාර ධ්‍යානය මෙන් නීවරණ

ප්‍රහාණයෙන් නොවේ. ප්‍රථමධ්‍යානය මෙන් අංගපාතුභාවයෙන් ද (නොවේ) යැයි මෙසේ මෙය සම්පසාදන එකොදිභාවයන්ගේ හේතු දක්වන වචනයකි. එසේ ම විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් මේ අවිතර්ක අවිචාරයන්ගේ තෘතීය චතුර්ථ ධ්‍යානයන් මෙන් ද චක්ෂුර් විඥානාදිය මෙන් ද අභාවයෙන් යැයි මෙසේ අවිතර්ක අවිචාර භාවයට හේතු දැක්වීම ද වේ. විතර්ක විචාර අභාව මාත්‍රය දැක්වීම නොවේ. අවිතක්කං අවිචාරං යන මේ වචනය වනාහි විතර්ක විචාරයන්ගේ අභාවමාත්‍රය දැක්වීමක් ම ය. එහෙයින් පළමුවෙන් කියාද නැවත කිවයුතුමය යනුයි. **සමාධිජං** යනු ප්‍රථමධ්‍යාන සමාධියෙන් හෝ සම්ප්‍රයුක්ත සමාධියෙන් උපන් යන අර්ථයි. එහි කිසිහෙයකින් පළමුවැන්න ද සම්ප්‍රයුක්ත සමාධියෙන් උපන්නේ ය. එසේ වුවද මෙය ම සමාධිය සමාධිය යැයි කිවයුතු බවට සුදුසුය. විතර්ක විචාරයන්ගේ කැළඹීමෙන් තොර බැවින් අතිශයින් ම අචල බැව් හා සුප්‍රසන්න ද බැවිනි. එහෙයින් මෙහි වර්ණනාව කීම පිණිස මෙය ම සමාධිජ යැයි කියන ලදී. **පීතිසුඛං** යන මෙය කියන ලද නය ඇත්තේමය. **දුතියං** යනු ගණන අනුපූර්වතාවෙන් දුතියං යි, මෙය දෙවනුව සමවදී යැයි ද, = **දුතියං තස්මිං සමයෙ එසෙසා හොති** යන ආදීන්හි ධ්‍යාන පංචකයෙහි විතක්ක විචාර පද ද මග්ගපංචයෙහි සම්මා සංකප්ප පදයද පිරිහිණ. ඔවුන්ගේ වශයෙන් සවිභක්තික අවිභක්තික පද විනිශ්චය දතයුතුයි. කොට්ඨාශ වාරයෙහි ද ධ්‍යානය තිවංගික වෙයි. මාර්ගය චතුරංගික වෙයි යැයි ආයේය. සෙස්ස ප්‍රථමධ්‍යානය සමානමය යනුයි.

දෙවැන්න යි.

තෘතීය ධ්‍යාන නිර්දේශයෙහි **පීතියා ච විරාගා** යැයි විරාගය නම් කියන ලද ආකාර ඇති ප්‍රීතිය පිළිකුල් කිරීම හෝ ඉක්මවීමයි. දෙදෙනා අතර ච ශබ්දය සම්පිණ්ඩනාර්ථය, එය වූපසමය පිඩු කිරීම හෝ කරයි. විතක්ක විචාරයන්ගේ සංසිඳීම හෝ කරයි. එහිදී යම්කලෙක වූපසමය ම පිඩු කෙරේ ද එකල්හි ප්‍රීතියෙන් වෙන්වීමෙන් ද මදක් හෝ බොහෝසෙයින් සංසිඳීමෙන්දැයි මෙසේ යෝජනාව දතයුතුයි. මේ යෝජනාවේදී විරාගය ජිගුච්ඡනාත්ථි වෙයි. එහෙයින් ප්‍රීතියෙනුත් පිළිකුල් කිරීමෙනුත් සංසිඳීමෙන් දැයි මේ අර්ථය දතයුතුයි. යම්කලෙක වනාහි විතර්ක විචාරයන්ගේ සංසිඳීම පිඩු කෙරේ ද එකල්හි ප්‍රීතියෙන් වෙන්වීමෙන් ද මදක් හෝ බොහෝසෙයින් විතර්ක විචාරයන්ගේ ද සංසිඳීමෙන් දැයි මෙසේ ද

යෝජනාව දතයුතුයි. මේ යෝජනයෙන් ද විරාග යනු සමතික්කමාර්ථය වේය. එහෙයින් ප්‍රීතිය ඉක්මවීමෙන් ද විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් යැයි මේ අර්ථය දතයුතුයි. ඒකාන්තයෙන් මේ විතර්ක විචාරයෝ ද්විතීය ධ්‍යානයේ දී ම සංසිඳෙත්. මේ ධ්‍යානයාගේ වනාහි මාර්ගය දැක්වීම පිණිසද වර්ණනාව කීම සඳහා ද මෙය කියන ලදී. විතර්ක විචාරයන්ගේ සංසිඳීමෙන් යැයි කී කල්හි ද මෙය පැනේ. විත්ක විචාරයන්ගේ වූපසමය මේ ධ්‍යානයට මාර්ගය නොවේද? යම්සේ වනාහි තුන්වන ආර්ය මාර්ගයේදී අප්‍රහීණ වූ සක්කාය දිට්ඨි ආදී පංච ඕරම්භාගීය සංයෝජනයන්ගේ ප්‍රහාණයෙන් යැයි මෙසේ ප්‍රහාණය කියනුයේ වර්ණාහරණය වෙයි. එය අධිගමය පිණිස උත්සාහ කරන්නවුන්ට උත්සාහ ජනකය. මෙපරිද්දෙන් මෙහි නොසන්සිඳුණු විතර්ක විචාරයන්ගේ ද සංසිඳීම කියනු ලබනුයේ වර්ණාභණනය වෙයි. එහෙයින් ප්‍රීතිය දුරලීමෙන් ද විතර්ක විචාරයන්ගේ සංසිඳවීමෙන් දැයි යන මේ අර්ථය කියන ලදී.

**උපෙකඛා ච විහරති** යන මෙහි වෙතට පැමිණීම වශයෙන් බලානුයි = උපෙකඛාය, සමව බලයි. අපක්ෂපාතීව බලයි යන අර්ථයි. පිරිසිදු වූ මහත් වූ වීර්යයෙන් යුක්ත බැවින් තෘතීය ධ්‍යානයෙන් යුක්ත උපේක්ෂකයා යැයි කියනු ලැබේ.

උපේක්ෂාව වනාහි දශවිධ වෙයි. ඡළංගුපෙකඛා බ්‍රහ්මවිහාරුපෙකඛා බෙජකඩංගුපෙකඛා විරියුපෙකඛා සංඛාරුපෙකඛා වෙදනානුපෙකඛා විපසසනානුපෙකඛා තත්‍රමජඣතතුපෙකඛා ඣානුපෙකඛා පාරිසුදධුපෙකඛා යනුයි. එහි 'මෙහි ක්ෂීණාශ්‍රව භික්ෂුව ඇසින් රූපයක් දැක සතුටු සිත් ඇත්තේ ද නොවෙයි. අසතුටු සිත් ඇත්තේ ද නොවෙයි. සිහියෙන් යුතුව සම්‍යක් ප්‍රඥාවෙන් යුතුව උපේක්ෂකව ම වාසය කරයි' මෙසේ ආ ක්ෂීණාශ්‍රවයන් වහන්සේගේ ෂට් ද්වාරයන්හි ඉෂ්ටානිෂ්ට ෂඩාරම්මණයන් ආපාථගත වීමේදී පිරිසිදු පියෙව්බව අත්නොහරනා යම් උපේක්ෂාවක් වේද මෙය ඡළංගුපෙකඛා නම්, 'උපේක්ෂා සහගත සිතින් එක් දිසාවක් පතුරුවා වාසය කරයි' මෙසේ ආවා වූ සත්ත්වයන් කෙරෙහි මධ්‍යස්ථාකාර වූ යම් උපේක්ෂාවක් වේද, මෙය වනාහි බ්‍රහ්මවිහාර උපේක්ෂාව නම්. 'විවේක නිශ්‍රිත උපේක්ෂා සම්බෝධ්‍යාංගය වඩයි' යැයි මෙසේ ආවා වූ සහජාත ධර්මයන්ට මධ්‍යස්ථාකාර වූ යම් උපේක්ෂාවක් වේ නම් මෙය බෝධ්‍යාංගුපේක්ෂා නම්. 'කලින් කල උපේක්ෂා නිමිත්ත මෙනෙහි කරයි' මෙසේ ආවා වූ ඉතා දැඩිත් නොවූ ඉතා ස්ථිලත් නොවූ යම් උපේක්ෂාවක්

වේද මෙය වනාහි වීර්යෝපේක්ෂා නම් වේ. 'කෙතෙක් සංස්කාරුපේක්ෂාවෝ විදර්ශනා වශයෙන් උපදිත් ද, කෙතෙක් සංස්කාරුපේක්ෂාවෝ විදර්ශනා වශයෙන් උපදිත් ද, සංස්කාරුපේක්ෂාවෝ දසදෙනෙක් විදර්ශනා වශයෙන් උපදිත්' යැයි මෙසේ ආවා වූ නීවරණාදීන් නුවණින් සලකා තීරණය කිරීමේදී මධ්‍යස්ථ වූ යම් උපේක්ෂාවක් වේද මෙය සංස්කාරුපේක්ෂා නම්. 'යම් සමයෙක්හි උපේක්ෂා සහගත කාමාවචර කුශල සිත උපන්නේ වේද' යැයි මෙසේ ආවා වූ අදුක්ඛමසුඛ සංඛ්‍යාත යම් උපේක්ෂාවක් වේද මේ වනාහි වේදනූපේක්ෂා නම්. 'යමක් වීද එය දුරුකරයි. උපේක්ෂාව ලබයි' යැයි යමක් ඇද්ද' යන මේ ආකාරයෙන් ආවා වූ තෝරාගැනීම් මධ්‍යස්ථ වූ යම් උපේක්ෂාවක් වේද මෙය දර්ශනාපේක්ෂා නම්. ඡන්දාදීන්හි ද ස්වාපනකයන්හි ද ආ සහජාතයන් එක්වන යම් උපේක්ෂාවක් වේද, මේ වනාහී තත්‍රමජ්ඣත්තුපෙක්ඛා නම්. 'උපෙක්ඛ කො ච විහරති' යැයි මෙසේ ආ අත්‍යන්ත අග්‍ර සැපයක් ඇති කල්හිදු එහි අපක්ෂපාත බව උපදවන යම් උපේක්ෂාවක් වේද, මේ ඣානුපෙක්ඛා නම්, 'උපෙක්ඛා සතිපාරිසුද්ධිං චතුත්ථජ්ඣානං' යැයි මෙසේ ආ සියලු විරුද්ධ ධර්මයන්ගෙන් පිරිසිදු වූ විරුද්ධ ධර්මයන් සංසිඳුවීමේ උත්සාහයක් නැති යම් උපේක්ෂාවක් වේද මෙය වනාහි පාරිසුද්ධුපෙක්ඛා නම්.

එහි ඡළංගුපෙක්ඛා බ්‍රහ්මවිහාරුපෙක්ඛා බොජ්ඣංගුපෙක්ඛා තත්‍රමජ්ඣත්තුපෙක්ඛා ඣානුපෙක්ඛා පාරිසුද්ධුපෙක්ඛා හා තත්‍රමජ්ඣත්තුපෙක්ඛාව ද අර්ථයෙන් එකක් වෙයි. ඒ ඒ අවස්ථාභේදය අනුව එහි මේ භේදය වෙයි. එක ම පුද්ගලයා පිළිබඳව කුමාර යුවරාජ සේනාපති රාජාදී වශයෙන් වූ භේදය මෙනි. එහෙයින් ඒවා අතුරෙහි යම් තැනෙක ඡළංගුපෙක්ඛාව නො වේද එතැන බොජ්ඣංගුපෙක්ඛාදිය වෙයි. යම් තැනෙක බොජ්ඣංගුපෙක්ඛාව නොවේ ද එහි වනාහි ඡළංගුපෙක්ඛාදිය වෙයි යැයි දතයුතුයි. යම්සේ මොවුන්ගේ අර්ථයෝ එක්බවක් වේද, සංඛාරුපෙක්ඛා විපස්සනූපෙක්ඛාවන්ගේ ද එසේ මය. මේ ප්‍රඥාව පමණක් දෙයාකාරයකින් බිඳුණෝ ය.

සවස ගෙට පිවිසි සර්පයකු අජපද දණ්ඩක් (සර්පයින් අල්ලන අඬුවක්) ගෙන සොයන පුරුෂයකුට ඌ දහයියා කොටුවෙහි වැදහොත්තාහු දැක සර්පයෙක් ද නොවේදැයි බලනවිට සෝවැත්ත (නයාගේ පෙණයෙහි ලකුණ) දැක විමතිය නැති වූ කල්හි සර්පයෙක් ද නොවේදැයි සෙවීමේ යම්සේ මධ්‍යස්ථ වෙයි ද, මෙපරිද්දෙන් විදර්ශනාව

පටන් ගත්තහුට විදර්ශනා ඥානයෙන් ත්‍රිලක්‍ෂණය දුටුකල්හි සංස්කාරයන්ගේ අනිත්‍යභවාදිය සෙවීමෙහි මධ්‍යස්ථ බව උපදී. මේ විපස්සනුපෙක්ඛාවයි. අජපද දණ්ඩෙන් සර්පයා දැඩිව ගත් ඒ පුරුෂයාට කිම මම මේ සර්පයාගේ නො වෙහෙසවා තමාත් මූ ලවා දෂ්ට නොකරවාගෙන මුදන්නෙම් දැයි මුදනා ආකාරය ම සොයද්දී (සර්පයා) ගැනීම පිළිබඳ යම් මධ්‍යස්ථ බවක් ඇතිවේද, මෙපරිද්දෙන් ත්‍රිලක්‍ෂණයන් දුටු හෙයින් ත්‍රිවිධ භවයන් ගිනි ඇවිල මෙපරිද්දෙන් ත්‍රිලක්‍ෂණයන් දුටු හෙයින් ත්‍රිවිධ භවයන් ගිනි ඇවිලගත් සේ බලන්නාට සංස්කාර ග්‍රහණයෙහි යම් මධ්‍යස්ථ බවක් වේද, මෙය සංඛාරුපෙකඛාවයි. මෙසේ විපස්සනුපෙකඛාව සිද්ධ කල්හි සංඛාරු පෙකඛාවද සිද්ධවූයේ ම වෙයි. විචිනන ග්‍රහණයන් මධ්‍යස්ථ සංඛ්‍යාත මේ කෘත්‍යයෙන් මෙය දෙයාකාරයකින් බිඳුණේය යනුයි. විරියුපෙකඛාව සහ වෙදනූපෙකඛාව ද ඔවුනොවුන් ද අවශේෂයන් සමග අර්ථයෙන් භින්නයහ මය යනුයි. මෙසේ දස උපෙක්ඛාවන් අතුරෙන් මෙහි ඣානුපෙක්ඛාව අභිප්‍රේතය. එය මධ්‍යස්ථ ලක්‍ෂණ ඇත්තේය. සොයාබැලීම රසය කොට ඇත්තේ ය. උත්සාහ නොවීම එළඹ සිටි කාරණයයි. ප්‍රීතියෙන් වෙන්වීම ආසන්න කාරණයයි යනුයි. මෙහිදී මෙසේ කියන ලදී. මෙය අර්ථ වශයෙන් තත්‍ර මජ්ඣතාව ම නොවේද එය ද ප්‍රථම ද්විතීය ධ්‍යානයන්හි ඇතිහෙයින් එහිදී ද මධ්‍යස්ථව ම එය ද ප්‍රථම ද්විතීය ධ්‍යානයන්හි ඇතිහෙයින් එහිදී ද මධ්‍යස්ථව ම වාසය කෙරෙයි යැයි මෙය කිවයුතු වෙයි. කවරහෙයින් නොකියන ලදද යනුයි. අව්‍යක්ත කෘත්‍ය ඇති හෙයිනි. ඒ ධ්‍යානයාගේ කෘත්‍ය විතර්කාදීන් විසින් මඩනා ලද හෙයින් කෘත්‍යය අපරිව්‍යක්තය, මෙහිදී වනාහි එය විතර්කවිචාර ප්‍රීතීන් විසින් නොමඩනා ලද හෙයින් හිස එසවූවකු මෙන් ව්‍යක්ත කෘත්‍ය ඇත්තේ විය. එහෙයින් කියන ලදී යනුයි.

### උපෙකඛකොච විහරති යන මෙහි අර්ථ වර්ණනාව සියලු ආකාරයෙන් නිමවන ලදී.

දැන් **සතො ච සම්පජානො** යන මෙහි හැසිරේනුයි = සතො මනාව දැනගනී යනු = සම්පජානයි. පුද්ගලයාය, සතිය වත් සම්පජඤ්ඤයවත් නොකියන ලදී. එහි සතිය හැසිරීම ලක්‍ෂණකොට ඇත්තේය. සිහි නැති නොවීම රසය කොට ඇත්තේය. ආරක්ෂාව එළඹ සිටි කාරණය කොට ඇත්තේ ය. සම්‍යක් ප්‍රඥාව මුළා නොවීම

ලක්ෂණකොට ඇත්තේ, තීරණය රසය කොට ඇත්තේ ය. පරීක්ෂා කිරීම එළඹසිටි කාරණය කොට ඇත්තේ ය. එහි මේ සතිය හා සම්පජඤ්ඤය පළමු ධ්‍යානයන්හි ද ඇත්තේ වී නමුදු මුළාසිහි ඇති සම්පජඤ්ඤයෙන් තොර පුද්ගලයාට වනාහි උපචාර මාත්‍රයකුදු නො සැදේ. සමාධිය කියනුම කවරේ ද? ඒ ධ්‍යානයන් ඕළාරික බැවින් භූමියෙහි පුරුෂයාට මෙන් අභ්‍යක්ත බැවින් සිතේ ගතිය සැප වෙයි. එහි ස්මෘති ස්මප්‍රජන්‍ය කෘත්‍යය ඕළාරිකාංග ප්‍රහාණය නිසා ධ්‍යානය සියුම් බැවින් පුරුෂයාට දැලිපිහි මුවහතෙහි ගමන මෙන් ස්මෘති සම්ප්‍රජන්‍ය කෘත්‍යය පිළිගන්නා ලදී. මෙසේ සිතේ ගතිය කැමතිවිය යුතුයැයි මෙහි ම කියන ලදී. තවදුරටත්, දෙන අනුව යන වස්සෙක් දෙනගෙන් ඉවත්ව ගියේ නො රකිනු ලබනුයේ නැවතත් යම්සේ දෙන වෙතට පැමිණේ ද, මෙසේ මේ තෘතීයධ්‍යාන සුවය ද ප්‍රීතියෙන් පහව ගියේ සතිසම්පජඤ්ඤ රැක්මෙන් නොරකිනු ලබනුයේ නැවතත් ඒ ප්‍රීතිය වෙත පැමිණෙයි. ප්‍රීතිසම්ප්‍රයුක්ත වූයේ ම වෙයි. සත්ත්වයෝ සැපයෙහි ද ඇලුනේ මෙය ද ඉතා මිහිරි සුවයෙකි. එයින් එපිට සුවයක් නැති හෙයිනි. මෙහිදී වනාහි සති සම්පජඤ්ඤයන්ගේ ආනුභාවයෙන් සැපයෙහි නො ඇලීම වෙයි. අන් අයුරෙක් නොවෙයි යැයි මෙයද අති විශේෂ කොට දැක්වීමට මෙය මෙහිදීම කියන ලදැයි දතයුතුයි.

දැන් **සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති** යන මෙහි තෘතීය ධ්‍යානයට සම්බන්ධ සුව විඳීම පිළිබඳ සිතා බැලීමක් කිසිසේත් ම නැත. එසේ ඇති කල්හිදු ඔහුගේ ඒ නාම කාය සමග සම්ප්‍රයුක්ත සුවයක් වේද ඔහුට එය ඉපදීමෙන් ඉතා ප්‍රණීත රූපකායක් සමග රූපකාය ස්පර්ශ වූයේ කය ස්පර්ශ කළහෙයින් ධ්‍යානයෙන් නැගී සිටියේ ද සුවය විඳින්නේ ය. එහෙයින් මේ කාරණය දක්වමින් සුඛඤ්ච කායෙන පටිසංවෙදෙති යැයි කීහ. දැන් **යං තං අරියා ආචික්ඛන්ති උපෙක්ඛකො සතිමා සුඛවිහාරී** යන මෙහි යමෙක් ධ්‍යානයට හේතු ද යමෙක් ධ්‍යානයට කාරණ ද තෘතීය ධ්‍යානයන්ගෙන් යුක්ත ඒ පුද්ගලයා බුද්ධාදී ආර්යයෝ දක්වත්. දේශනා කරත්. පනවත්. පිහිටුවත්. විස්තර කරත්. බෙදත්. නොගැඹුරු කරත්. ප්‍රකාශ කරත්. ප්‍රශංසා කරත් යනු අදහසයි. උපෙක්ඛකො සතිමා සුඛවිහාරී යනු එයයි. ඒ **තෘතීය ධ්‍යානයට පැමිණ වාසය කරයි** යැයි මෙසේ මෙහි යෝජනාව දතයුතුයි. කවර සෙයකින් වනාහි ඒ ආර්යයෝ ඔහු ප්‍රශංසා කරත්ද? ප්‍රශංසාර්ශ හෙයිනි. තෘතීය ධ්‍යානයෙහි උපේක්ෂාවට පැමිණියේ මෙතෙම වනාහි ඉතා මිහිරි සුවයෙහි සුඛ පාරප්‍රාප්ත වූ කල්හි ද එහි

සුඛාභිසංගයෙන් ඇදගනු නො ලැබේ. එසේ ම ප්‍රීතිය ද නූපදී. මෙසේ එළඹ සිටි ඇති බැවින් **සතිමා** ය. එහෙයින් ආර්ය ජනකාන්තය ආර්යජන සේවිතමය නො කිලිටි සුවයක් නාමකායයෙන් විඳී. එහෙයින් ප්‍රශංසාර්හ හෙයින් ප්‍රශංසාර්හය. ආර්යයෝ ඔහුට 'මෙසේ ප්‍රශංසාවට හේතු වූ ඒ ගුණයන් ප්‍රකාශ කරමින් උපේක්‍ෂක වූ සිහි ඇති සුඛවිහාරියා යැයි' මෙසේ ප්‍රශංසා කරත් යැයි දතයුතුයි. **තතියං** යනු ගණනින් අනුපූර්වතාවෙන් තෘතීයය, මෙයට තෙවෙනුව සමවැදේ යනුවෙන් ද **තතිය** ය, **තසමිං සමයෙ එසෙසා හොති** යන ආදීන්හි ද ධ්‍යාන පංචයෙහි පීති පදය ද පිරිහිණ. ඒ වශයෙන් ද සවිභක්තික අවිභක්තික පද විනිශ්චය දතයුතුයි. කොට්ඨාසවාරයෙහි ද ද්වංගික ධ්‍යානය වේයැයි ආයේය යනුයි. සෙස්ස ද්විතීය ධ්‍යාන සමාන මය යනුයි.

## තුන්වැන්නයි.

චතුර්ථධ්‍යාන නිර්දේශයෙහි **සුඛසස ච පහාණා දුකඛසස ච පහාණා** යනු කායික සුවයේ ද කායික දුකේ ද ප්‍රහාණයෙන්, **පුබෙබව** යනු එය ද වනාහි පළමුවෙනි, චතුර්ථධ්‍යාන ක්‍ෂණයෙහි නොවේ. **සොමනසස දොමනසසානං අතථංගමා** යනු චෛතසික සුවයාගේත් චෛතසික දුඃඛයාගේත් යන මේ දෙදෙනාගේ ම පූර්වයෙන් ම අස්තංගමයෙන් ප්‍රහාණයෙන් යනුම කියන ලද්දේ වෙයි. කවර අවස්ථාවෙක වනාහි මොවුන්ගේ ප්‍රහාණය වේද? සතර ධ්‍යානයන්ගේ උපචාරක්‍ෂණයෙහි ය. සොම්නස් දොම්නස් දෙක ප්‍රථම ද්විතීය තෘතීය ධ්‍යානයන්ගේ උපචාර ක්‍ෂණයන්හි ය. මෙසේ මොවුන්ගේ ප්‍රහාණ ක්‍රමයෙන් නොකියන ලද්දවුන්ගේ ද ඉන්ද්‍රිය විභංගයෙහි වනාහි ඉන්ද්‍රියන්ගේ උද්දේශ ක්‍රමයෙන් ම මෙහිදී ද කියන ලද්දා වූ සෝමනස්ස දෝමනස්සයන්ගේ ද ප්‍රහාණය දතයුතුයි. ඉදින් මොව්හු වනාහි ඒ ඒ ධ්‍යානයන්ගේ උපචාර ක්‍ෂයෙහිම ප්‍රහීණ වෙත් ද, එසේනම් කවර හෙයින් 'කවර තැනෙක උපන්නා වූ දුකඛින්ද්‍රියයක් නිරවශේෂයෙන් නිරුද්ධ වේද? මහණෙනි, මේ ශාසනයෙහි භික්‍ෂු තෙම කාමයන්ගෙන් වෙන්ව ම -පෙ- ප්‍රථමධ්‍යානයට පැමිණ වාසය කෙරේද? මෙහිදී ද උපන් දුක්ඛින්ද්‍රියය නිරවශේෂයෙන් නිරුද්ධ වෙයි. කවර නම් තැනෙක උපන්නා වූ දෝමනස්සින්ද්‍රිය සුඛෙන්ද්‍රියය සෝමනස්සින්ද්‍රියය නිරවශේෂයෙන් නිරුද්ධ වේද? මහණෙනි, මේ

ශාසනයෙහි භික්ෂු තෙම සුවයාගේ ද ප්‍රහාණයෙන් -පෙ- චතුර්ථ ධ්‍යානයට පැමිණ වාසය කරයි. මෙහිදී ද උපන් සෝමනස්සින්ද්‍රියය නිරවශේෂයෙන් නිරුද්ධ වේ' යැයි මෙසේ ධ්‍යානයන්හි ම නිරෝධය කියන ලද්දේ වේද යනුයි. අතිශය නිරෝධය හෙයිනි. අතිශය නිරෝධය වනාහි ඔවුන්ගේ ප්‍රථම ධ්‍යානාදීන්හිය. නිරෝධය පමණක් ම නොවේ. නිරෝධය පමණක් වනාහි උපචාර ක්ෂණයෙහි ය. අතිශය නිරෝධය නො වේ.

ඒ එසේමය. නානාවර්ජන ප්‍රථමධ්‍යානුපචාරයෙහි නිරුද්ධ වූද දුක්ඛින්ද්‍රිය ය, ඩංසමකසාදීන්ගේ ස්පර්ශයෙන් හෝ විෂමානුතාපයෙන් හෝ උත්පත්තිය වන්නේය. අර්පණාව තුළ නොවේමය. ප්‍රතිපක්ෂය විසින් නොනසන ලද හෙයින් උපචාරයෙහි නිරුද්ධ වූ ද එය මනාව නිරුද්ධ නොවේ. අර්පණාව තුළ වනාහි ප්‍රීතිය පැතිරීමෙන් මුළු කය සුවයට බැසගත්තේ වෙයි. ප්‍රතිපාක්ෂිකයා විසින් දුක්ඛින්ද්‍රිය නසන ලද හෙයින් නානාවර්ජන ද්විතීය ධ්‍යානුපචාරයෙහිදී ම ප්‍රහීණ කළ දෝමනස්සින්ද්‍රිය ඇති සුවයට බැසගත් කය මනාව නිරුද්ධ වෙයි. එහෙයින් මෙය විතර්ක විචාරයන්ට ප්‍රත්‍යය වූ කාය කිලමථ චිත්තුපඝාතයන් ඇති කල්හි ද උපදී. විතර්ක විචාරයන්ගේ අභාවය ඇති කල්හි නො උපදිත්ම ය. යම්තැනක උපදී නම් විතර්ක චොරයන්ගෙන් තොර ඒ ද්විතීයධ්‍යාන උපචාරයෙහි විතර්ක විචාරයෝ අප්‍රහීණම ය යනුයි. එහි ඔහුගේ උත්පත්තිය වන්නේය. ප්‍රහීණ වූ ප්‍රත්‍යය ඇති හෙයින් ද්විතීය ධ්‍යානයෙහි නොවේමය. එසේ ම තෘතීය ධ්‍යානුපචාරයෙහි දී ප්‍රහීණ වූ සුඛෙන්ද්‍රිය ප්‍රීතියෙන් හටගත් ප්‍රණීත රූපයක ස්පර්ශය ඇති කල්හි උපදනේය. තෘතීය ධ්‍යානයෙහි නූපදනේමය. තෘතීය ධ්‍යානයෙහි සුඛයට ප්‍රත්‍යය වූ ප්‍රීතිය සර්වප්‍රකාරයෙන් නිරුද්ධය යනුයි. චතුර්ථධ්‍යානුපචාරයෙහි ප්‍රහීණ වූ සෝමනස්සින්ද්‍රියට ආසන්න හෙයින් ද අර්පණාප්‍රාප්ත උපේක්ෂාවගේ අභාවෙන් මනාව නොඉක්මවූ හෙයින් ද උත්පත්තිය වන්නේය. චතුර්ථධ්‍යානයෙහි නොවේමය. එහෙයින්ම මෙහි උපන් දුක්ඛින්ද්‍රිය නොසොයමින් නිරුද්ධ වේ යනුයි. ඒ ඒ තැන නිරවශේෂ ග්‍රහ කරන ලදී.

මෙහිදී කිය : ඉක්බිති මෙසේ ඒ ඒ ධ්‍යානයාගේ උපචාරයෙහි ප්‍රහීණ වූ ද මේ වේදනාවෝ මෙහි කවර හෙයින් ගෙනෙන ලද ද? යනුයි. පහසුවෙන් ගැනීම පිණිසයි. මෙය අදුක්ඛමසුඛයැයි යම් අදුක්ඛමසුඛ වේදනාවක් කියන ලදද, එය සියුම්ය. දැනගැනීමට දුෂ්කරය. පහසුවෙන් ග්‍රහණය කළ නොහැකිය. එහෙයින් යම්කිසි ආකාරයකින් ළඟට පැමිණ

අල්ලාගත නොහැකි කිපුණ ගොනකු අල්ලාගැනීම පිණිස ගොපල්ලා එක් ගැලෙක්හි සියලු ගොනුන් එක්රැස් කරයි. ඉක්බිති එක එකා බැහැර කරනුයේ පිළිවෙළින් ආ ඒ ගොනා මූ ගනුවයි හෙතෙම ගන්නට සලස්වයි. එපරිද්දෙන් භාග්‍යවතුන් වහන්සේ සුඛග්‍රහණය සඳහා මේ සියල්ල එක්කොට ගෙනහැර දැක්වූ සේක යනුයි. මෙසේ එක්කරන ලද මේ වේදනාවන් දක්වා යමක් සැපක් නොවේද දුකක් නොවේද සොම්නසක් නොවේද දොම්නසක් නොවේද මෙය අදුක්ඛමසුඛා වේදනාවයැයි මෙය ගන්වන්නට හැකිවෙයි. තව ද අදුක්ඛමසුඛ චේතොවිමුක්තියට ප්‍රත්‍යය දැක්වීම පිණිසද මේවා කියන ලදැයි ද දතයුතුයි. සුඛදුක්ඛ ප්‍රහාණාදිය ද වනාහි එයට ප්‍රත්‍යයෝය. මෙසේ කීහ. 'ඇවැත්නි, අදුක්ඛමසුඛ චේතෝ විමුත්ති සමාපත්තියට වනාහි මේ ප්‍රත්‍යයෝ සතරදෙනෙකි. ඇවැත්නි, මේ ශාසනයෙහි භික්‍ෂුතෙම සැපයේ ද ප්‍රහාණයෙන් -පෙ- චතුර්ථ ධ්‍යානයට සමවැද වාසය කරයි. ඇවැත්නි, මේ වනාහි අදුක්ඛමසුඛ චේතෝවිමුත්ති සම්පත්තියට ප්‍රත්‍යය සතරයි' යනුයි. යම්සේ අන්තැනෙක ප්‍රහීණ වූද සක්කාය වුට්ඨි ආදිය තෘතීය මාර්ගයාගේ විස්තර කීම පිණිස එහිදී ප්‍රහීණ වීයැයි කියන ලදී. මෙසේ ඒ ධ්‍යානයාගේ විස්තර කීම පිණිස ඒවා මෙහිදී කියනලදැයි දතයුතුයි. ප්‍රත්‍යයන් නැසීමෙන් හෝ රාගදෝසයන්ගේ අතිදූරභාවය දක්වන්නට ද මේවා මෙහිදී කියන ලදැයි දතයුතුයි. මොවුනතුරෙන් වනාහි සුඛය සොම්නසට ප්‍රත්‍යය, සොම්නස රාගයට ප්‍රත්‍යය, දුක දොම්නසට ප්‍රත්‍යය, දොම්නස ද්වේෂයට ප්‍රත්‍යය, සුඛ ආදිය නැසීමෙන් ද ප්‍රත්‍යය සහිත රාගදෝසයෝ නසන ලදැයි යනු ඉතා දුර වෙයි යනුයි.

**අදුකඛමසුඛං** යනු දුඃඛයාගේ අභාවයෙන් අදුකඛය සුඛයාගේ අභාවයෙන් අසුඛය, මෙයින් මෙහි සුඛදුක්ඛයන්ට ප්‍රතිපක්‍ෂ වූ තුන්වන වේදනාවක් දක්වයි. දුක අසුඛයාගේ අභාවමාත්‍රය පමණක් නොවේ. තුන්වන වේදනාව නම් අදුක්ඛමසුඛය, උපේක්‍ෂාව යැයිද කියනු ලැබේ. එය ඉෂ්ටානිෂ්ට විපරීත අනුභවන ලක්‍ෂණකොට ඇත්තේය. මධ්‍යස්ථරසය කොට ඇත්තේය. අප්‍රකට බව එළඹ සිටි කාරණයකොට ඇත්තේ ය. සුඛදුක්ඛ නිරෝධය ආසන්න කාරණය කොට ඇත්තේයැයි දතයුතුයි. **උපෙකඛා සතිපාරිසුඬිං** යනු උපේක්‍ෂාවෙන් හටගත් සිහියෙන් වූ පාරිසුද්ධියයි. මේ ධ්‍යානයෙහි වනාහි සතිය සුපරිසුද්ධය. ඒ සතියෙහි යම් පාරිසුද්ධියක් වේද එය උපේක්‍ෂාව විසින් කරන ලදී. අනෙකකු විසින් නොවේ. එහෙයින් මෙය උපෙකඛාසතිපාරිසුද්ධි යැයි කියනු ලැබේ.

විභංගයෙහි ද මෙසේ කියන ලදී. 'මේ සතිය මේ උපේක්ෂාව විසින් විවෘත වූයේ වෙයි. පිරිසිදු වූයේ වෙයි. අතිශයින් ම පිරිසිදු වූයේ වෙයි. එහෙයින් උපෙක්ඛා සතිපාරිසුද්ධි යැයි කියනු ලැබේ' යනුයි. මෙහි යම් උපේක්ෂාවකින් සතියෙහි පාරිසුද්ධියක් වේද, එය අර්ථ වශයෙන් තත්‍රමජ්ඣත්තතා යැයි දතයුතුයි. මෙහි හුදෙක් එයින් සතිය පමණක් පිරිසිදු වූයේ නොවේ. තව ද සියලුම සම්ප්‍රයුක්ත ධර්මයෝ ද පිරිසිදු වෙත් යැයි සති ශීර්ෂයෙන් දේශනාව කරන ලදී. එහි යම්හෙයකින් මේ උපේක්ෂාව යට ද ත්‍රිවිධ ධ්‍යානයන්හි විද්‍යමාන වේ. යම් සේ වනාහි දවල් කාලයෙහි සූර්යයාගේ ප්‍රභාවෙන් බැබලීම නිසාත් තමාගේ සෞම්‍යභාවය නිසාත් උපාකා වශයෙන් සභාග වූ රාත්‍රිය නො ලැබීමෙන් ද දවල්කාලයෙහි පවත්නා වූද චන්ද්‍රලේඛාව අපිරිසිදු වූයේ ද අතිශයින් ම අපිරිසිදු වූයේ ද වෙයි. එපරිද්දෙන් මේ තත්‍රමජ්ඣත්තුපෙක්ඛාව ද චන්ද්‍රලේඛාව මෙන් විතර්ක ද්විරුද්ධ ධර්මතේජසින් මැඩලීම නිසා සහායක උපේක්ෂාවේදනා නමැති රාත්‍රිය නොලැබීමෙන් පවත්නා වූ ද ප්‍රථමධ්‍යානාදී භේදයන්හි අපිරිසිදු ම වෙයි. එය අපිරිසිදු කල්හි දවල් කාලයේ අපිරිසිදු චන්ද්‍රලේඛාවගේ ප්‍රභාව මෙන් සහජාත වූ සති ආදීහුද අපිරිසිදු ම වෙත්. එහෙයින් ඔවුනතුරෙන් එකකුදු උපෙක්ඛාසතිපාරිසුද්ධිය යැයි නොකියන ලදී. මෙහි වනාහි විතර්කාදී විරුද්ධ ධර්මයන්ගේ මැඩලීමෙන් තොර බැවින් ද සහායක උපේක්ෂා වේදනා රාත්‍රිය ලැබීමෙන් ද මේ තත්‍රමජ්ඣත්තුපෙක්ඛා නමැති චන්ද්‍රලේඛාව අතිශයින් ම පිරිසිදු ය. එය පිරිසිදු බැවින් පිරිසිදු චන්ද්‍රලේඛාවේ ප්‍රභාව මෙන් සහජාත සති ආදීහු ද පිරිසිදු වෙත්. අතිශයින්ම පිරිසිදු වෙත්. එහෙයින් මෙය ම උපෙක්ඛාසතිපාරිසුද්ධිය යැයි කියන ලදැයි දතයුතුයි. **චතුත්ථං** යනු ගණන අනුපූර්වතාවෙන් චතුර්ථය, මෙය සතරවෙනුවට සමවදී යනුවෙන් ද = **චතුත්ථය, ඵස්සො හොති** යන ආදියෙහි ද ඵස්සපංචකයෙහිය. **වේදනා** යනු උපේක්ෂා වේදනාව දතයුතුයි. ඣානපංචක ඉන්ද්‍රියට්ඨකයන්හි වනාහි උපේක්ෂාව වෙයි. උපේක්ඛින්ද්‍රිය වෙයි යැයි කියන ලදමය. තෘතීය ධ්‍යානයෙහි පිරිහුණු සෙසු පද මෙහි ද පිරිහුණේම ය. කොට්ඨාස වාරයෙහි ද දුවංගිකං ඣානං යනු උපේක්ෂා චිත්තෛකාග්‍රතා වශයෙන් ම දතයුතුයි. සෙසු සියල්ල තෘතීය ධ්‍යානය සමානමය යනුයි.

**චතුෂ්ක නය නිමියේ ය.**

දැන් කතමෙ ධම්මා කුසලා යැයි පංචක නය පටන්ගන්නා ලදී. කෙසේද යතහොත්? පුද්ගලාධ්‍යාසය වශයෙන් හා දේශන විලාසයෙන් රැස්ව සිටි දෙව් පිරිසෙහි වනාහි ඇතැම් දෙවියන්ට විතර්කය ම ඕළාරිකව වැටහිණ. විචාර පීති සුඛ ඒකග්ගතා ශාන්තව වැටහිණ. ශාස්තෲන් වහන්සේ ඔවුන්ට සත්ප්‍රාය වශයෙන් චතුරංගික වූ විතර්ක රහිත අවිචාර මාත්‍ර ද්විතීය ධ්‍යානය බෙදා දැක්වූ සේක ඇතැම් අයෙකුට විචාරය ඕළාරික වශයෙන් වැටහිණ. ප්‍රීති සුඛ චිත්තෛකාග්‍රතා ශාන්තව වැටහිණ. ඔවුන්ට සත්ප්‍රාය වශයෙන් ත්‍රයංගික තෘතීය ධ්‍යානය බෙදා දැක්වූ සේක. ඇතැම් දෙව් කෙනෙකුන්ට ප්‍රීතිය ඕළාරික වශයෙන් වැටහිණ. සුඛ චිත්තෛකාග්‍රතා ශාන්තව වැටහිණ. ඔවුන්ට සත්ප්‍රාය වශයෙන් ද්වංගික චතුර්ථධ්‍යානය බෙදා දැක්වූ සේක. ඇතැම් දෙව් කෙනෙකුන්ට සුඛය ඕළාරිකව වැටහිණ. උපේක්ෂා හා චිත්තෛකාග්‍රතා ශාන්ත වශයෙන් වැටහිණ. ඔවුන්ට සත්ප්‍රාය වශයෙන් ද්වංගික පංචමධ්‍යාන බෙදා දැක්වූ සේක. මේ වනාහි පුද්ගලාධ්‍යාසයයි. යම් ධර්මධාතුවක් මනාව ප්‍රතිවේධ කළහෙයින් වනාහි දේශනා විලාසප්‍රාප්ත නම් වෙයි. තථාගතයන් වහන්සේ විසින් එය මනාව අවබෝධ කරන ලදී. එහෙයින් ඥාන මහන්තත්වය නිසා දේශනා විධානයෙහි දක්ෂ වූ දේශනා විලාසප්‍රාප්ත වූ ශාස්තෲන් වහන්සේ යම් යම් අංගයක් ලබයි ද, ඒ ඒ වශයෙන් යම් යම් අයුරකින් කැමති වේද, ඒ ඒ අයුරින් දේශනාව නියම කරන සේක යනුයි.

උන්වහන්සේ මෙහිදී පංචාංගික වූ ප්‍රථමධ්‍යානය බෙදා දැක්වූහ. චතුරංගික වූ අවිතර්කවිචාරමාත්‍ර වූ ද්විතීය ධ්‍යානය බෙදා දැක්වූහ. ත්‍රයංගික තෘතීයධ්‍යානය බෙදා දැක්වූ සේක. ද්වංගික චතුර්ථධ්‍යානය ද ද්වංගික ම වූ පංචමධ්‍යානය ද බෙදා දැක්වූ සේක. මේ දේශනා විලාස නම්. තව ද භාග්‍යවතුන් වහන්සේ විසින් 'මහණෙනි, සවිතර්ක සවිචාර සමාධිය අවිතර්ක විචාරමාත්‍ර සමාධිය අවිතර්ක අවිචාර සමාධිය' යැයි සූත්‍රාන්තයෙහි යම් සමාධි තුනක් දේශනා කරන ලදද, ඔවුනතුරෙන් යට සවිතර්ක සවිචාර සමාධිය ද අවිතර්ක අවිචාර සමාධිය ද බෙදා දක්වන ලදී. අවිතර්ක විචාරමාත්‍ර සමාධිය නො දක්වන ලදී. එය දක්වන්නට ද මේ පංචක නය පටන්ගන්නා ලදැයි දතයුතුයි. එහි ද්විතීයධ්‍යාන නිර්දේශයෙහි ස්පර්ශාදියෙහි විතර්කමාත්‍රය පිරිහෙයි. කොට්ඨාශවාරයෙහි චතුරංගික ධ්‍යානය වෙයි. චතුරංගික මාර්ගය වෙයි යන මෙය ම විශේෂයයි. සෙසු සියල්ල ප්‍රථමධ්‍යානය සමානමය. චතුෂ්ක නයෙහි යම් ද්විතීය

තෘතීය චතුෂ්කයෝ වූ නම් ඔව්හු ම මෙහි තෘතීය චතුෂ්ක පංචමයෝය. ඔවුන්ගේ අධිගම පිළිවෙළ දැක්වීම පිණිස මේ නය දතයුතුයි.

එක් ඇමති පුත්‍රයෙක් වනාහි රජුට උපස්ථාන කරන්නට ජනපදයෙන් නගරයට පැමිණියේ ය. හෙතෙම එක ම දවසක් රජු දැක පානව්‍යසනයෙන් (සුරාපීමෙන් සියලු සම්පත් සමූහය විනාශ කෙළේය. එක්දිනෙක සුරාමදයෙන් මත් වූ ඔහු නිරුවත් කොට දිරූ කලාලයකින් වසා පානාගාරයෙන් බැහැර කළහ. ශරීරලක්‍ෂණ බලා ශුභාශුභ කියන්නෙක් කසළගොඩෙහි වැදහෙව නිදන ඔහු දැක මේ පුරුෂයා මහජනයාට උපකාර කරන්නෙක් වන්නේය. මෙතෙම පිළිදැගුම්කළයුත්තේ යැයි නිශ්චය කොටගෙන මැටියෙන් (මැටිගා) නහවා ස්ථූල සළු යුවලක් අඳවා නැවත සුවඳදියෙන් නහවා සියුම් දුහුල් යුවලක් අඳවා පහයට නංවා මනා බොජුන් අනුභව කරවා මෙපරිද්දෙන්ඔහු පිරිවරව් යැයි පිරිවර ජනයාට පවරා ගියේ ය. ඉක්බිති ඔවුහු සයනයකට නැංවූහ. පානාගාරයට යෑම වැළැක්වීම සඳහා සතරදෙනෙක් අත්පා සතරින් ඔහු දැඩිව ගෙන සිටියාහුය. එක් පුරුෂයෙක් පා පිරිමැද්දේ ය. එක් පුරුෂයෙක් තල්වැටක් ගෙන පවන් සැලී ය. එක් පුරුෂයෙක් වීණාවක් වයමින් ගයමින් හුන්නේ ය. එහෙත් යහනට පැමිණීමෙන් පහව ගිය වෙහෙස ඇතිව මඳක් නිදා නැගිටියේ අත්පා දැඩිව ගැනීම ඉවසිය නොහී කවරෙක් මාගේ අත්පා පෙළයි ද පහව යවයි තර්ජනය කෙළේ ය. ඔව්හු එක වචනයෙන් ම පහව ගියහ. ඉක්බිති යළිත් මඳක් නිදා නැගිටියේ පා පිරිමැදීම නො ඉවසනුයේ කවරෙක් මාගේ පා පිරිමදී ද පහව යවයි කීය. හෙතෙමේ ද එක වචනයෙන් ම පහව ගියේ ය. නැවත මඳක් නිදා නැගිටියේ සුළං හිත වැස්සක් මෙන් තල්වැට වාතය නො ඉවසනුයේ මේ කවුද ඉවතයවයි කීය. හෙතෙමේ ද එකවචනයෙන් ම ඉවත්ව ගියේ ය. නැවත මඳක් නිදා නැගිටියේ කනෙහි වූ හුලක් මෙන් ගී හා වාදන ශබ්දය නො ඉවසනුයේ වීණා වාදකයාට තර්ජනය කෙළේ ය. හෙතෙමේ ද එකවචනයෙන් ම ඉවත්විය. ඉක්බිති මෙසේ අනුක්‍රමයෙන් ප්‍රහීණ වූ වෙහෙස, දැඩිව පෙළීම, පිරිමැදීම, වාපහර, ගීත වාදන ශබ්ද, උපද්‍රව ඇතිව සුවසේ නිදා නැගිට රජු වෙතට ගියේය. රජ ද ඔහුට මහත් ඉසුරු දුන්නේ ය. හෙතෙම මහජනයාට උපකාරී අයෙක් විය.

එහි නොයෙක් ව්‍යසනයෙන් කරදරයට පත් සරාවාසගත කුලපුත්‍රයා පාන ව්‍යසනයෙන් කරදරයට පත් ඒ ඇමති පුත්‍රයා මෙනැයි දතයුතුයි.

තථාගතයන් වහන්සේ අංගවිද්‍යාපාඨක පුරුෂයා මෙනි. මේ කුලපුත්‍රයා මහජනයාට ප්‍රයෝජනවත් වන්නේය. පැවිද්දට සුදුසුයැයි තථාගතයන් වහන්සේගේ නිශ්චය කිරීම මේ මහජනයාට ප්‍රයෝජනවත් වන්නේ ය. පිළිදැගුම් කරන්නට සුදුසුයැයි ඒ පුරුෂයාගේ නිශ්චය මෙනි. කුලපුත්‍රයාගේ පැවිද්ද ලැබීම ඒ අමාත්‍ය පුත්‍රයාගේ මැටියෙන් පමණක් නැහැවීම මෙනි. ඉක්බිති මොහුගේ දශ ශික්ෂාපද සංඛ්‍යාත ශීලවස්ත්‍රය හැඳීම ඔහුගේ ස්ථූලසාටක නිවාසනය මෙනි. මොහුගේ ද ප්‍රාතිමෝක්ෂ සංවරාදී ශීල සුගන්ධ ජලයෙන් නැහැවීම නැවත ඔහුගේ සුවඳ ජලයෙන් නැහැවීම මෙනි. මොහුගේ ද කියන ලද පරිදි ශීලපඤ්ඤා සම්පදා සංඛ්‍යාත දුහුල් ඇඳීම නැවත ඔහුගේ සියුම් දුහුල් ඇඳීම මෙනි. ශීල විසුද්ධි දුහුල් අඳනා ලද මොහුගේ සමාධි භාවනා ප්‍රාසාදයට නැගීම දුහුල් අඳනා ලද ඔහුගේ ප්‍රාසාදයට නැගීම මෙනි. ඉක්බිති මොහුගේ ද සමාධි උපකාරකවූ සති සම්පජඤ්ඤාදී ධර්මාවෘත පරිභෝජනය ඒ පුරුෂයාගේ මනා බොජුන් අනුභව කිරීම මෙනි. විතර්කාදීන් විසින් මොහු උපචාර ධ්‍යානයට ආරෝපණය කිරීම ආහාර අනුභව කළ ඇමතිපුත්‍රයා පිරිවර ජනයා විසින් සයනයට නැංවීම මෙනි. මේ කුලපුත්‍රයාගේ කාමසංඥාවන් ඉදිරියට යෑම වැළැක්වීම පිණිස සිත අරමුණෙහි දැඩිව යෙදීම කරන නෛෂ්ක්‍රම්‍යය විතර්කය ඒ ඇමතිපුත්‍රයා නැවත පානාගාරයට යෑම වැළැක්වීමට අත්පා දැඩිව ගෙන සිටි පුරුෂයන් සතරදෙනා මෙනි. මොහුගේ සිත අරමුණෙහි පිරිමැදීම කරන විචාරය ඒ ඇමතිපුත්‍රයාගේ පා පිරිමදනා පුරුෂයා මෙනි. මොහුගේ සිහල්බව සිහිල්බව දෙන ප්‍රීතිය ඒ ඇමතිපුත්‍රයාගේ තල්වැටදරන්නා මෙනි. මොහුගේ සිතට අනුග්‍රාහක වූ සොම්නස ඇමතිපුත්‍රයාගේ කනට අනුග්‍රාහක වූ ගාන්ධර්ව පුරුෂයා මෙනි. උපචාර ධ්‍යානය ඇසුරෙන් පහකරන ලද නීවරණ වෙහෙස ඇති මොහුගේ ප්‍රථමධ්‍යානයට පැමිණීම ඒ ඇමතිපුත්‍රයාගේ යහනට පැමිණීමෙන් වෙහෙසපහවී නින්දට පැමිණීම මෙනි. ප්‍රථමධ්‍යානයෙන් නැගිටි මොහුගේ සිත පෙළන විතර්කය නොඉවසීමෙන් විතර්කයේ දොස් දැකීමත් විතර්කය ප්‍රහාණය කිරීමෙන් නැවත විතර්කරහිත විචාරමාත්‍රධ්‍යානයට පැමිණීම ඉක්බිති නිදා නැගිටි ඒ ඇමතිපුත්‍රයා අත්පා පෙළීම නො ඉවසීමෙන් අත්පා පෙළුවන්ට තර්ජනය කොට ඔවුන් පහව යෑමෙන් නැවත මදක් නින්දට පැමිණීමත් මෙනි. ද්විතීයාදී ධ්‍යානයන්ගෙන් නැවත නැවත නැගිටි මොහු ද කියන ලද විචාරාදී දෝෂයන් නො ඉවසීමෙන් පිළිවෙළින් විචාරාදී දෝෂයන් දැකීම ඒ ඒ දෝෂයන් ප්‍රහාණයෙන් නැවත නැවත අවිතර්ක අවිචාර නිෂ්ප්‍රීතික ප්‍රහීණ සොම්නස ඇති ධ්‍යානයට පැමිණීම,

ඉක්බිති නැවත නැවත නිදා නැගිටි ඒ ඇමතිපුත්‍රයා කියන ලද ක්‍රමයෙන් පා පිරිමැදීම් ආදිය නොඉවසීමෙන් පිළිවෙළින් පාපිරිමදින්නන් ආදීන්ට තර්ජනය කිරීම ඒ ඒ අය පහව යෑමෙන් නැවත නැවත මදක් නින්දට යෑම මෙනි, පංචමධ්‍යානයෙන් නැගිටි ප්‍රථමධ්‍යානයට පැමිණි මොහුගේ අර්හත්වයට පැමිණීම යහනින් නැගිට රජු වෙත ගිය ඇමති පුත්‍රයාගේ ඓශ්වර්යයට පැමිණීම මෙනි. අර්හත්වයට පැමිණි මොහුගේ බොහෝදෙනාට ප්‍රයෝජනවත් බව ඓශ්වර්යයට පැමිණි ඇමති පුත්‍රයාගේ බොහෝදෙනාට ප්‍රයෝජනවත් වීම මෙනැයි දතයුතුයි. මෙපමණකින් වනාහි මේ අර්හත් පුද්ගලයා අනුත්තර පුණ්‍යක්ෂේත්‍ර නම් වන්නේ ය යනුයි.

### පංචක නය නිමියේ ය.

මෙතෙකින් චතුෂ්ක පංචක නයදෙකින් භේද වූ ශුද්ධික නවකය ප්‍රකාශ කරන ලද්දේ වෙයි. මෙය වනාහි අක්ෂි වශයෙන් පංචක නයෙහි චතුෂ්කනයට පිවිසි හෙයින් ධ්‍යාන පංචයමැයි දතයුතුයි. දැන් යම්හෙයකින් මේ ධ්‍යානය නම් ප්‍රතිපදා ක්‍රමයෙන් සිද්ධ වේද, එහෙයින් එහි ප්‍රතිපදා භේදය දැක්වීමට නැවත **කතමෙ ධම්මා කුසලා** යන ආදිය පටන්ගන්නා ලදී. එහි සුඛ ප්‍රතිපදාව මොහුට නුයි = **දුක්ඛා පටිපදාය දන්ධ** අභිඥාව මොහුටනුයි = **දන්ධාභිඥය,** මෙසේ දුක්ඛාපටිපදං යනු හෝ දන්ධාභිඤ්ඤං යනු හෝ පඨවිකසිණං යනු හෝ මේ තුන ම ධ්‍යානයට නම්ය. **දුක්ඛා පටිපදං ඛිප්පාභිඤ්ඤං** යන ආදින්හිද මේ නය මය. එහි පළමු සිත එකඟ කරගැනීමේ පටන් යම්තාක් ඒ ඒ ධ්‍යානයාගේ උපචාර සමාධිය උපදීද, එතෙක් පැවති ධ්‍යානභාවනාව පටිපදාව යැයි කියනු ලැබේ. උපචාරයෙහි පටන් අර්පණා සමාධිය තෙක් පැවති ප්‍රඥාව වනාහි අභිඥාවයැයි කියනු ලැබේ. ඒ මේ ප්‍රතිපදාව වනාහි ඇතමෙකුට දුක් වෙයි. නීවරණාදී විරුද්ධ ධර්මයන්ගේ හැසිරීම් ගහණ බැවින් දුක්ය. අසුඛ සේවනා යනු අර්ථයි. ඇතමෙකුට එය නැති බැවින් සුඛය. ඇතමෙකුට අභිඥාව ද දන්ධය. මන්දය ශීඝ්‍රව නොපවත්නේ ය. ඇතමෙකුට වහා සිදුවෙයි. අමන්දය, ශීඝ්‍රව පවත්නේ ය. එහෙයින් යමෙක් ආදියෙහි පටන් ක්ලේශයන් විෂ්කම්භනය කරමින් දුකින් සසංස්කාරිකව සප්‍රයෝගීව වෙහෙසෙමින් විෂ්කම්භනය කරයි ද, ඔහුගේ ප්‍රතිපදාව දුක්ඛා පටිපදා (නම්) වෙයි. යමෙක් වනාහි විෂ්කම්භනය කරන ලද කෙලෙස් ඇත්තේ අර්පණා

පරිවාසයෙහි යෙදෙන්නේ බොහෝ කලක් ගතකිරීමෙන් අංග පහළ කරගනීද, ඔහුගේ අභිඥාව දන්ධාභිඤ්ඤා නම් වෙයි. යමෙක් වහා අංග පහළකර ගනීද, ඔහුගේ අභිඥාව ඛිප්පාභිඤ්ඤා නම් වෙයි. යමෙක් ක්ලේශ විෂ්කම්භනය කරනුයේ සුවසේ නො වෙහෙසෙමින් විෂ්කම්භනය කෙරේ ද ඔහුගේ ප්‍රතිපදාව සුඛාපටිපදා නම් වෙයි. එහි යම් සත්ප්‍රාය අසත්ප්‍රායයෝ ද පළිබෝධ සිඳීත් ආදී පූර්වකෘත්‍යයෝ ද අර්පණා කුශලතාවෝ වෙත් ද ඔවුහු විශුද්ධි මාර්ගයෙහි චිත්ත භාවනා නිර්දේශයෙහි දක්වන ලදහ. ඔවුනතුරෙන් යමෙක් (දශ) අසත්ප්‍රායසේවී වේද ඔහුට දුඃඛ ප්‍රතිපදා ද දන්ධාභිඥා ද වෙයි. සත්ප්‍රායසේවියාට සුඛප්‍රතිපදා ද ශිප්‍රාභිඥා ද වෙයි. යමෙක් වනාහි පූර්වභාගයෙහි හෝ අසත්ප්‍රාය සේවනය කොට අපරභාගයෙහි සත්ප්‍රායයේවී වෙයිද, පූර්වභාගයෙහි හෝ සත්ප්‍රාය සේවනය කොට අපරභාගයෙහි අසත්ප්‍රායේවී වෙයිද ඔහුගේ මිශ්‍රබව දතයුතුයි. යම්සේ පළිබෝධ නැසීම් ආදී පූර්ව කෘත්‍යය නොසපයා භාවනාවේ යෙදුණහුට දුඃඛප්‍රතිපදා වෙයි. විපරීත වශයෙන් සුඛප්‍රතිපදා ද වේ. අර්පණ කුශලතාවන් සම්පාදනය නො කරන්නාට වනාහි දන්ධාභිඥා වෙයි. සම්පාදනය කරන්නාට ශිප්‍රාභිඥා වෙයි.

තව ද තෘෂ්ණා අවිද්‍යා වශයෙන් ද සමථ විදර්ශනා (කෘත්‍ය) ධිකාර වශයෙන්දැයි මොවුන්ගේ ප්‍රභේද දතයුතුයි. තෘෂ්ණාවෙන් මඩනා ලද්දහුට වනාහි දුක්ඛා ප්‍රතිපදා වෙයි. නොමඩනා ලද්දහු සුඛා ප්‍රතිපදාය, අවිද්‍යාවෙන් මඩනා ලද්දහුට ද දන්ධාභිඥා වෙයි. (නොමඩනා ලද්දහුට ඛිපපා භිඤ්ඤාය) යමෙක් වනාහි සමථයෙහි නොකරන ලද ප්‍රාර්ථනා ඇත්තේ ද ඔහුට දුක්ඛා පටිපදා වෙයි. කරන ලද ප්‍රාර්ථනා ඇත්තහුට සුඛ පටිපදාය, යමෙක් වනාහි විදර්ශනාවෙහි නො කරන ලද ප්‍රාර්ථනා ඇත්තේ වේද, ඔහුට දන්ධාභිඥා වෙයි. කෘතාධිකාරී පුද්ගලයාට ශිප්‍රාභිඥාය.

ක්ලේශ ඉන්ද්‍රිය වශයෙන් ද මොවුන්ගේ ප්‍රභේදය දතයුතුයි. තීව්‍ර ක්ලේශී මෘදු ඉන්ද්‍රිය ඇත්තහුට වනාහි දුක්ඛා පටිපදා වෙයි. දන්ධාභිඥා ද වෙයි. තියුණු ඉන්ද්‍රිය ඇත්තාට වනාහි ශිප්‍රාභිඥාය, මද කෙලෙස් ඇති මෘදු ඉන්ද්‍රිය ඇත්තාට ද සුඛා පටිපදා ද දන්ධාභිඥා ද වෙයි. තියුණු ඉන්ද්‍රිය ඇත්තහුට වනාහි ශිප්‍රාභිඥා යැයි මෙසේ මේ ප්‍රතිපදා අභිඥාවන්හි යම් පුද්ගලයෙක් දුක්ඛ ප්‍රතිපදාවෙන් දන්ධ අභිඥාවෙන් ධ්‍යානයට පැමිණේද ඔහුගේ ඒ ධ්‍යානය දුක්ඛා පටිපදා දන්ධාභිඥා යැයි කියනු ලැබේ. සෙසු තැන්හි ද මේ නයම ය. එහිදී ප්‍රතිපත්තියක් වශයෙන් සතිය පිහිටයි.

ප්‍රඥාව ද ඨිතිභාගී වෙයි. (පිහිටයි.) යැයි මෙසේ කියන ලද සතියෙන් ඒ ඒ ධ්‍යානයන්හි තෘෂ්ණාව විෂ්කම්භනය කළ කල්හි ප්‍රතිපදාව ද ඒ ඒ ධ්‍යානූපචාරයට පැමිණි අර්පණා පරිවාසයෙහිදී අභිඥාව ද දතයුතුයි. ආගමන වශයෙන් ද ප්‍රතිපදා අභිඥාවෝ වෙත්ම ය. දුක්ඛා පටිපදාව වනාහි දන්ධාභිඥා ප්‍රථමධ්‍යානයට පැමිණ පැවතියේය. ද්විතීයධ්‍යානය එබඳු ම වෙයි. තෘතීය චතුර්ථ ධ්‍යානයන්හි ද මේ නයමය. චතුෂ්ක නයෙහි යම්සේ ද පංචක නයෙහි ද මෙසේ ප්‍රතිපදා වශයෙන් සතර ආකාර භේදය දතයුතුයි. මෙසේ ප්‍රතිපදා වශයෙන් ද නවක සතරක් කියන ලද්දේ වෙයි. එහි පාඨ වශයෙන් සිත් සතිසෙකි. අර්ථ වශයෙන් වනාහි චතුෂ්කනය පංචක නයෙහි පිවිසි හෙයින් විස්සක් ම වෙයි යනුයි.

## ප්‍රතිපදා නිමියේ ය.

දැන් ධ්‍යානය නම් ප්‍රතිපදා භේදයෙන් යම්සේ ද මෙසේ ආරම්මණ භේදයෙන් ද චතුර්විධ වෙයි. එහෙයින් එහි ඒ ප්‍රභේදය දක්වන්නට නැවත කතමෙ ධම්මා කුසලා යන ආදිය පටන්ගන්නා ලදී. **පරිත්තං පරිත්තාරම්මණං** යන ආදීන්හි යම් අල්පගුණයක් වේද මතු ධ්‍යානයට ප්‍රත්‍යය වීමට නොහැකි වෙයි ද මේ පරිත්ත නම්. යමක් නොවැඩූ කල්හි වනාහි කුල්ලක් පමණ වූ හෝ නැඹිලියක් පමණ වූ හෝ අරමුණෙහි පැවති ඒ ස්වල්ප අරමුණ මොහුට යනු = **පරිත්තාරම්මණ** වේ. යම් අරමුණක් ප්‍රගුණ ද මනාව වඩනා ලදද මතු ධ්‍යානයට ප්‍රත්‍යය වීමට හැක්කේ වේද මෙය **අප්පමාණ** නම්. යමක් මහත් වූ අරමුණෙහි පැවතියේ ද වෘද්ධියෙන් ප්‍රමාණ හෙයින් අප්‍රමාණ වූ ඒ අරමුණ මොහුගේ යනු = **අප්පමාණාරම්මණ** වේ. කියන ලද ලක්‍ෂණ මිශ්‍ර හෙයින් වනාහි වෝමිස්සක නය දතයුතුයි. මෙසේ ආරම්මණ වශයෙන් ද නවක සතර කියන ලද්දේ වෙයි. මෙහි සිත් ගණනින් ද පළමු සමානමය යනුයි.

## ආරම්මණ චතුෂ්ක නය නිමියේ ය.

දැන් ආරම්මණාප්‍රතිපදා මිශ්‍රක සෝළසවාර නය දැක්වීමට නැවත **කතමෙ ධම්මා කුසලා** යන ආදිය පටන්ගන්නා ලදී. එහි පළමු නයෙහි කියන ලද ධ්‍යානය දුක්ඛාපටිපදා හෙයින් ද දන්ධාභිඥා හෙයින් ද පරිත්ත

හෙයින් ද පරිත්තාරම්මණ හෙයින්දැයි කරුණු සතරකින් හීනය, සොළොස්වන නයෙහි කියන ලද ධ්‍යානය සුඛාපටිපදා හෙයින් ද ඛිප්පාභිඤ්ඤා හෙයින් ද අප්‍රමාණ හෙයින් ද අප්‍රමාණ ආරම්මණ හෙයින්දැයි කරුණු සතරකින් ප්‍රණීතය. සෙසු දහහතරෙහි කරුණු එකෙන් දෙකක් තුනෙන් හා සතරෙන් හීනප්‍රණීත බව දතයුතුයි. කවරහෙයින් වනාහි මේ නය දේශනා කරන ලදීද? යත්, ධ්‍යානෝත්පත්ති කාරණයෙනි. සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් වනාහි පඨවි කසිණයෙහි ශුද්ධිකධ්‍යානය චතුෂ්කනය වශයෙන් ද (පංචකනය වශයෙන් ද) දක්වන ලදී. එසේ ම ශුද්ධිකප්‍රතිපදාවත් ශුද්ධිකාරම්මණයත් දක්වන ලදී. එහි යම් දේවතා කෙනෙක් චතුෂ්කනය වශයෙන් දේශනා කරනු ලබන පඨවි කසිණයෙහි ශුද්ධිකධ්‍යානය අවබෝධ කරගන්නට හැකිවෙත්ද, ඔවුන්ට සත්ප්‍රාය වශයෙන් ශුද්ධිකධ්‍යානයෙහි චතුෂ්කනය දේශනා කරන ලදී, යම් දේවතා කෙනෙක් පංචකනය වශයෙන් දෙසීම අවබෝධ කරගන්නට හැකිවෙත්ද ඔවුන්ට සත්ප්‍රාය වශයෙන් පංචකනය දේශනා කරන ලදී. යම් දේවතා කෙනෙක් ශුද්ධික ප්‍රතිපදාවෙහි -පෙ- ශුද්ධිකාරම්මණයෙහි චතුෂ්කනය වශයෙන් දෙසීම අවබෝධ කරගන්නට හැකි වෙත්ද ඔවුන්ට සත්ප්‍රාය වශයෙන් (ශුද්ධික ප්‍රතිපදාවෙහි) ශුද්ධිකාරම්මණයෙහි චතුෂ්කනය දේශනා කරන ලදී. යම් දේවතා කෙනෙක් පංචකනය වශයෙන් දෙසීම අවබෝධ කරගන්න හැකිවෙත්ද, ඔවුන්ට සත්ප්‍රාය වශයෙන් පංචකනය දැයි මෙසේ යට පුද්ගලාධ්‍යාශය වශයෙන් දේශනා කරන ලදී. දේශනා විලාසප්‍රාප්ත ප්‍රතිසම්භිදා ප්‍රභේදගත දශබල චතුර් වෛශාරද්‍යාදියෙහි පිරිසිදු ඥාන ඇති සර්වඥයන් වහන්සේ ධර්මයන් යථාවසරස ලක්‍ෂණ මනාව අවබෝධ කරගත් හෙයින් ද ධර්මප්‍රඥප්ති කුශලතාවෙන් ද යම් යම් නය ලැබේ නම් ඒ ඒ නය වශයෙන් දේශනා නියම කරන්නට හැකිවන සේක. එහෙයින් උන්වහන්සේ විසින් මේ දේශනා විලාස ප්‍රාප්තියේ දී ද පඨවි කසිණයෙහි ශුද්ධික චතුෂ්කනයාදී වශයෙන් දේශනා කරන ලදී. යම් හෙයකින් වනාහි යම්කිසි කෙනෙක් ධ්‍යානය උපදවත් නම්, ඔව්හු ආරම්මණ ප්‍රතිපදාවෙන් තොරව උපදවන්නට නො හැකි වෙත්. එහෙයින් නියම වශයෙන් ධ්‍යානෝත්පත්ති කාරණ හෙයින් මේ මේ සෝළස වාර නය දේශනා කරන ලදී. මෙපමණකින් ශුද්ධික නවකය ප්‍රතිපදා නවක සතර ආරම්මණ නවක සතර සහ මේ සොළොස් නවකදැයි පස්විසි නවක කියන ලද්දේ වෙයි. එහි එක් එක් නවකයෙහි චතුෂ්ක පංචක වශයෙන් නය දෙක දෙක දැයි නය පනසෙකි. එහි පස්විසි චතුෂ්ක නයෙහි සියයෙකි. පහත් ධ්‍යාන සිත් වෙයි. පංචක නයෙහි වනාහි චතුෂ්ක

නයක් ඇතුළත් හෙයින් අර්ථ වශයෙන් සිත් එකසිය විසිපස ම වෙයි. පෙළෙහි යම් ඒ දෙසිය විසිපනස් සිත් වේද, නිර්දේශයෙහි ඔවුනතුරෙන් එක එකට ධර්ම ව්‍යවස්ථානාදී මහාවාර තුන තුන බැගින් වෙයි. ඒවා වනාහි ඒ ඒ තැන්හි නය මාත්‍රයෙන් දක්වා සංක්ෂේප කරන ලදී.

## පඨවි කසිණය නිමියේ ය.

දැන් යම්හෙයකින් ආපෝ කසිණාදියෙහි ද මේ ධ්‍යානයෝ උපදිත් ද, එහෙයින් ඔවුන් දැක්වීම පිණිස නැවත **කතමෙ ධම්මා කුසලා** යන ආදිය පටන්ගන්නා ලදී. එහි සියලු පාළි නය ද අර්ථ විස්තර ද සිත් ගණනය ද වාර සංක්ෂේපය ද පඨවි කසිණයෙහි කියන ලද නයින් ම දතයුතුයි. කසිණ පරිකර්මය ආදිකොට ඇති සියලු භාවනා නය වනාහි විශුද්ධි මාර්ගයෙහි ප්‍රකාශ කරන ලද්දේ ම ය. දස කසිණයෝ වනාහි මහා සකුලුදායි සූත්‍රයෙහි කියන ලදහ. ඔවුනතුරෙහි විඤ්ඤාණ කසිණය ආකාශයෙහි පවත්වන ලද මහග්ගත විඤ්ඤාණය ද එහි කසිණ පිරියම් කොට උපදවන ලද විඤ්ඤාණඤ්චායතන සමාපත්තිය ද වේයැයි සර්වප්‍රකාරයෙන් ම ආරුප්ප දේශනය ම භජනය කරයි. එහෙයින් මෙතැනදී නො කියන ලදී. ආකාස කසිණය යනු වනාහි කසිණුග්ඝාටික ආකාශය ද එය අරමුණු කොට පැවති ස්කන්ධ ද බිත්ති සිදුරු ආදී යම්කිසි තැනක ගතයුතු නිමිත්තේ පරිච්ඡේද ආකාසය ද එය අරමුණු කොට උපන් සතරවන පස්වන ධ්‍යාන ද කියනු ලැබේ. එහි පළමුනය ආරුප්ප දේසනය භජනය කරයි. අවසන් නය රූපාවචර දේසනය භජනය කරයි. මෙසේ මිශ්‍ර හෙයින් මෙය රූපාවචර දේශනයට ආරූඪ නො කරන ලදී. පරිච්ඡේදාකාසයෙහි උපන් ධ්‍යානය වනාහි අරූපෝත්පත්තියට මාර්ගය වෙයි. එහෙයින් එය ගතයුතුයි. එහි වනාහි චතුෂ්ක පංචකධ්‍යාන ම උපදී. අරූප ධ්‍යානය නූපදී. කවර හෙයින්? කසිණුග්ඝාටනයට නො ලැබෙන හෙයිනි. එය වනාහි නැවත නැවත උද්ඝාටනය කරනු ලැබුවත් ආකාසය වේ යනුයි. එහි කසිණුග්ඝාටනය නො ලබයි. එහෙයින් එහි උපන් ධ්‍යානය මෙලොව සැප විහරණය සඳහා පවතී. අභිඥාපාදක නොවේ. විදර්ශනා පාදක වේ. නිරෝධපාදක නො වේ. මෙහි අනුපූර්ව නිරෝධය වනාහි පංචමධ්‍යානය තෙක් ලැබේ. වට්ටපාදක වේ ම ය. මෙය යම්සේ ද පළමු කසිණයන්හි උපන් ධ්‍යානය ද එසේ ම ය. මෙහි නිරෝධ පාදක භාවය

වනාහි වෙනසයි. මෙහි සෙස්ස ද ආකාස කසිණයෙහි කිවයුතු යමක් වේ නම් ඒ සියල්ල ද විශුද්ධි මාර්ගයෙහි කියන ලද්දේ ම ය.

'එකො හුත්වා බහුධා හොති' යන ආදී නය වනාහි විකුර්වණා කැමතිවන්නා විසින් පළමු කසිණ අටෙහි අෂ්ට සමාපත්තීන් උපදවා කසිණ අනුලෝම වශයෙන් කසිණ පටිලෝම වශයෙන් කසිණ අනුලෝම පටිලෝම වශයෙන් ධ්‍යාන අනුලෝම වශයෙන් ධ්‍යාන පටිලෝම වශයෙන් ධ්‍යාන අනුලෝම පටිලෝම වශයෙන් ධ්‍යානය උපුටා දැමීමෙන් කසිණය උපුටා දැමීමෙන් (ධ්‍යාන කසිණ උපුටා දැමීමෙන්) අංග සංක්‍රාන්තියෙන් ආරම්මණ සංක්‍රාන්තියෙන් අංග ආරම්මණ සංක්‍රාන්තියෙන් අංග ව්‍යවස්ථාපනයෙන් ආරම්මණ ව්‍යවස්ථාපනයෙන් ද යන මේ තුදුස් ආකාරයෙන් සිත දමනය කළයුතුයි. ඔවුන්ගේ විස්තර කථාව විශුද්ධි මාර්ගයෙහි කියන ලද්දේ ම ය.

මෙසේ තුදුස් ආකාරයෙන් සිත් දමනය නො කොට පෙර නො කරන ලද භාවනා ඇති ආදිකර්මික යෝගාවචරයා ඍද්ධි විකුර්වණය සම්පාදනය කරයි යන මේ කාරණය නො වන්නකි. ආදිකර්මිකයාට වනාහි කිසුණු පිරියම ද බරය. සියයකින් දහසකින් එකෙක් ම හැක්කේ වෙයි. කළ කිසුණු පිරියම් ඇත්තාට ද නිමිත්ත ඉපදවීම බරය. සියයකින් දහසකින් එකෙක් ම හැක්කේ වෙයි. නිමිත්ත උපන් කල්හි ද (එය) එය වඩා අර්පණාධිගමය බරය. සියයකින් දහසකින් එකෙක් ම හැක්කේ වෙයි. අර්පණාධිගමය කළ පුද්ගලයාට තුදුස් ආකාරයෙන් සිත දමනය කිරීම බරය. සියයකින් දහසකින් එකෙක් ම හැක්කේ වෙයි. තුදුස් ආකාරයෙන් සිත දමනය කළ පුද්ගලයාට ද ඍද්ධි විකුර්වණය නම් බරය, සියයකින් දහයකින් එකෙක් ම හැක්කේ වෙයි. විකුර්වණප්‍රාප්ත පුද්ගලයාට ද වහාහිදී ම බරය. සියයකින් දහසකින් එකෙක් ම වහා හුන්නේ වෙයි. ථෙරම්භත්ථලයෙහි මහාරෝහණගුත්ත තෙරුන්ට ගිලානෝපස්ථානයට පැමිණි තිස්දහසක් පමණ වූ ඍද්ධිමතුන් අතුරෙන් උපසම්පදාවෙන් අටවස් වූ රක්‍ෂිත ස්ථවිරයන් වහන්සේ මෙන්, (සියලු) වස්තුව විශුද්ධි මාර්ගයෙහි විස්තර කරන ලද්දේ ම ය.

**කසිණ කථාව නිමියේ ය.**

මෙසේ අටකසිණයන්හි රූපාවචර කුසලය විස්තර කොට දැන් යම්හෙයකින් සමාන වූ අරමුණෙහි ද භාවනාව පිළිබඳ අසමානතා නිසා මේ අටකසිණයන්ගේ අභිභායතන නම් වූ වෙනත් රූපාවචර කුසල් පවතී ද, එහෙයින් එය දැක්වීමට නැවත **කතමෙ ධම්මා කුසලා** යන ආදිය පටන් ගන්නා ලදී. එහි **අජ්ඣත්තං අරූපසඤ්ඤී** යැයි නොලැබෙන හෙයින් හෝ හෝ නොමැති හෙයින් හෝ ආධ්‍යාත්ම රූපයෙහි පරිකර්ම සංඥා විරහිතය. **බහිද්ධා රූපානි පස්සති** යනු බාහිර අටකසිණයන්හි පරිකර්ම කරන ලද හෙයින් පරිකර්ම වශයෙන් ද අර්පණා වශයෙන් ද ඒවා බාහිර අටකසිණයන්හි රූප දකී. **පරිත්තානි** යනු නොවැඩුණු, **තානි අභිභුය්‍ය** යනු යම්සේ බඩගිනි ඇතිතෙක් හැන්දක් පමණ බත් ලැබ කිම මෙහි අනුභව කළයුත්තකුත් ඇත්දැයි එකතු කර එකම පිඩක් කරයිද, මෙපරිද්දෙන් ඥානයෙන් උසස් ප්‍රකට ඥානයෙන් යුත් පුද්ගලයා කිම මේ අල්ප වූ අරමුණෙහි සමවැදිය යුත්තක් ඇද්ද, මෙය මට බරක් නොවේයැයි ඒ රූපයන් අභිබවා සමවදී ද, නිමිත්ත ඉපිදවීමක් සමගම මෙහි අර්පණාව උපදවන්නේ ය යන අර්ථයි. **ජානාමි පස්සාමි** යන මෙයින් ඔහුගේ පූර්වභාගය කියන ලදී. ආගමට්ඨ කථාවන්හි වනාහි 'මෙයින් වනාහි මොහුගේ සිතා බැලීම කියන ලදී. එය ද වනාහි සමවතින් නැගී සිටියහුටය සමාපත්තිය තුළ සිටියහුට නොවේ' කියන ලදී. **අප්පමාණානි** යනු වඩනා ලද ප්‍රමාණයෝ ය. **අභිභුය්‍ය** යනු මෙහි වනාහි බොහෝ අනුභව කරන පුරුෂයෙක් යම්සේ එක් බත් පංගුවක් ලැබ තරමක් දෙන්න මෙය මට කුමකටදැයි එය මහත්සේ නො දකී ද, මෙපරිද්දෙන් උසස් ඥානයෙන් යුත් ප්‍රකට ඥානයෙන් යුත් පුද්ගලයා මෙහි කුමක් සමවැදිය යුත්තේ ද මෙය මට අප්‍රමාණ නොවේ සිත එකඟ කරගැනීමේ බරකුත් ඇත්දැයි ඒවා අභිබවා සමවදී ද, නිමිත්ත ඉපදීමක් සමග ම මෙහි අර්පණාව උපදී යන අර්ථයි.

**පරිත්තං පරිත්තාරම්මණං අප්පමාණං පරිත්තාරම්මණං** යන මෙහි පරිත්තානි යැයි ආ හෙයින් අප්‍රමාණ ආරම්මණ බව නො ගන්නා ලදී. පරව අප්පමාණානි යැයි ආ හෙයින් පරිත්තාරම්මණ බව ද නො ගන්නා ලදී. අට්ඨකථාවෙන් වනාහි මෙසේ කියන ලදී. 'මෙතැන දී අරමුණු සතර සතර බැගින් නොගෙන දෙක දෙක බැගින් ම ගන්නා ලදී, කවර හේතුවක් නිසාද? සතර බැගින් ගත්කල්හි වනාහි දේශනා සෝළසවාරික වෙයි. ශාස්තෘන් වහන්සේ විසින් ද යට පැදුරෙහි වනන්නාක් මෙන් සෝළසවාරික දේශනා විස්තර වශයෙන් දේශනා කරන ලදී. එය මෙතැනදී අටවරක්

දේශනා කිරීම අදහසයි. එහෙයින් දෙක දෙක බැගින් ගන්නා ලදැයි දතයුතුයි. '**සුවණ්ණ දුබ්බණ්ණානි**' යනු පිරිසිදු අපිරිසිදු වර්ණයෝ ය. පාරිශුද්ධ වර්ණයෝ වනාහි නීලාදී මනා වර්ණයෝ ය. අපරිශුද්ධ වර්ණයෝ නම් දුර්වර්ණයෝ යැයි මෙහි අභිප්‍රේතයහ. ආගමට්ඨ කථාවන්හි වනාහි 'මනාවර්ණ වේවා දුර්වර්ණ වේවා මේ අභිභායතන පරිත්ත අප්‍රමාණ වශයෙන් ම දේශනා කරන ලදී' යැයි කියන ලදී. මේ සතරෙහි වනාහි පරිත්තාරම්මණය විතර්කචරිත වශයෙන් ආයේය. අප්‍රමාණාරම්මණය මෝහචරිත වශයෙන් ආයේය, ස්වර්ණය ද්වේෂ චරිත වශයෙන් ආයේය. දූර්වර්ණය රාගචරිත වශයෙන් ආයේය. මොවුන්ට වනාහි මේවා සත්ප්‍රාය නමි. ඔවුන්ගේ ඒ සත්ප්‍රායතාව විස්තර වශයෙන් විශුද්ධි මාර්ගයෙහි චරියා නිර්දේශයෙහි කියන ලදී. කවර හෙයකින් වනාහි සූත්‍රාන්තයෙහි යම්සේ 'අජ්ඣත්තං රූපසඤ්ඤී එකො බහිද්ධා රූපානි පස්සති පරිත්තානි' යන ආදිය දේශනා කරන ලද ද? මෙහිදී එසේ දේශනා නොකොට අභිභායතන සතරෙහි ද ආධ්‍යාත්ම රූපසංඥතාව දේශනා කරන ලදද යනුයි. ආධ්‍යාත්ම රූපයන් අනභිභවනීය හෙයිනි. එහි හෝ මෙහි වනාහි බාහිර රූපයෝ ම අභිභවනය කළයුත්තෝය, එහෙයින් ඔව්හු නියම වශයෙන් කිවයුත්හයි එහිත් මෙහිත් කියන ලදහ. **අජ්ඣත්තං රූපසඤ්ඤී අරූපසඤ්ඤී** යන මෙය වනාහි ශාස්තෘන් වහන්සේ ගේ දේශනා විලාසමාත්‍රයක් මය. මේ වනාහි සතර අභිභායතනයන්හි අපූර්පද වර්ණනාවයි. මෙහි ශුද්ධික නය ප්‍රතිපදා භේදය වනාහි පඨවි කසිණයෙහි කියන ලද නයින් ම එක් එක් අභිභායතනයෙහි දී දතයුතුයි. හුදෙක් මෙහි වනාහි ආරම්මණ චතුෂ්කය හා ආරම්මණ දුකය ද වෙයි. සොළසකබත්තු කය ද අටඨකබතුකය ද වෙයි. සෙස්ස එබඳු ම ය.

මෙසේ මෙහි එක් එක් අභිභායතනයෙක්හි සුද්ධිකනවක එකකි. පටිසම්භිදානවක සතරෙකි. ආරම්මණ නවක දෙකකි. ආරම්මණ පටිපදා මිස්සකයෙහි නවක අටකැයි නවක පසළොසක් දෑ (අභිභායත) සතරෙහි සම සැටක් නවක දතයුතුයි.

පස්වන අභිභායතනාදීන්හි **නීලානි** යනු සර්ව සංග්‍රාහික වශයෙන් කියන ලදී. **නීලවණ්ණානි** යනු වර්ණ වශයෙනි. **නීලනිදස්සනානි** යනු නිදර්ශන වශයෙනි. නොපැනෙන සිවුරු නොබිඳුණු වර්ණ එකම නිලක්ව දක්වා ලැබෙයැයි කියන ලද්දේ වෙයි. **නීලනිභාසානි** යන මෙය වනාහි බැබළීම් වශයෙන් කියන ලදී. නීල ආලෝක නීලප්‍රභා යුතු යන අර්ථයි.

මෙයින් ඔවුන්ගේ ඉතා පිරිසිදු බව දක්වයි. මේ අභිභායතන සතර වනාහි සුවිශුද්ධ වර්ණ වශයෙන් කියන ලදී. **පීතානි** යන ආදීන්හි ද මේ නයින් ම අර්ථය දතයුතු යි. නීලකසිණය උගන්නා තැනැත්තේ නිලෙහි නිමිත්ත තම්, මලෙක හෝ වස්ත්‍රයෙක හෝ වර්ණ ධාතුවෙක හෝ යන මෙහි කසිණ කරණයක් පරිකර්මයක් අර්පණා විධානයක් යන සියල්ල විශුද්ධි මාර්ගයෙහි විස්තර වශයෙන් කියන ලද්දේ ම ය. පඨවි කසිණයෙහි මෙන් මෙහි ද එක් එක් අභිභායතනයෙහි (පස්විසි) පස්විසි නවක දතයුතු යි

## අභිභායතන කථාව නිමියේ ය.

දැන් යම්හෙයකින් මේ රූපාවචර කුශලය නම් හුදෙක් ආරම්මණ සංඛ්‍යාත ආයතනයන් අභිභවනය කරන හෙයින් ම අභිභායතන වශයෙන් උපදනේ නො වේ. තව ද විමෝක්ෂ වශයෙන් ද උපදී. එහෙයින් ඒ නය ද දැක්වීමට යළිත් **කතමෙ ධම්මා කුසලා** යන ආදිය පටන්ගන්නා ලදී. කිනම් අර්ථයකින් විමෝක්ෂය දතයුතු ද? අධිමුඤ්චනාර්ථයෙනි. මේ අධිමුඤ්චනාර්ථය නම් කවරේ ද? විරුද්ධ ධර්මයන්ගෙන් මනාව නිදහස් වීම යන අර්ථයයි. අරමුණෙහි ද අභිරති වශයෙන් මනාව පිහිටීම යන අර්ථයි. පියාගේ ඇකයෙහි විසුරුවන ලද අඟපසඟ ඇති දරුවාගේ සයනය මෙන් නිග්‍රහ නොකරන ලද බැවින් ද සැක නැති බැවින් ද යුතුව අරමුණෙහි පවතී යැයි කියන ලද්දේ වෙයි. විමෝක්ෂභාවප්‍රාප්ත රූපාවචර කුශලය වනාහි මෙවැනි ලක්ෂණ ඇත්තේයැයි දක්වන්නට මේ නය පටන්ගන්නා ලදී. එහි **රූපී** යනු ආධ්‍යාත්මික කේශාදියෙහි උපදවන ලද රූප ධ්‍යානය රූපයයි. එය මොහුට ඇත යනු = **රූපී** ය. ආධ්‍යාත්මය පිළිබඳ නීල පරිකර්මය කරනුයේ වනාහි කේශයෙහි හෝ පිතෙහි හෝ ඇසේ ඉංගිරියාවේ හෝ කරයි, පීත පරිකර්මය කරනුයේ මේදයෙහි හෝ සිවියෙහි හෝ ඇස්වල කහපැහැති තැන්වල හෝ කරයි. ලෝහිත පරිකර්මය කරනුයේ මසෙහි හෝ ලෙයෙහි හෝ දිවෙහි හෝ අතුල්පතුල්වල හෝ ඇස්වල රතුපැහැති තැන්වල හෝ කරයි. ඕදාත පරිකර්මය කරනුයේ ඇටවල හෝ දත්වල හෝ නියවල හෝ ඇස්වල සුදු තැන්හි හෝ කරයි. මෙසේ කර්ම කොට උපන් ධ්‍යානයෙන් යුක්ත අය සඳහා මෙය කියන ලදී. **රූපානි පස්සති** යනු පිටත ද නීලකසිණාදී රූප ධ්‍යාන ඇසින් බලයි.

මෙයින් ආධ්‍යාත්මික බාහිර වස්තූන් පිළිබඳ කසිණයන්හි ධ්‍යාන ප්‍රතිලාභය දක්වන ලදී. **අජ්ඣත්තං අරූපසඤ්ඤී** යනු ආධ්‍යාත්මයෙහි රූපසංඥා නැත්තේ ය. තමාගේ කේශාදියෙහි නූපදවන ලද රූපාවචර ධ්‍යාන ඇත්තේ යන අර්ථයි. මෙයින් බාහිර පරිකර්ම කොට බාහිර ම ලබන ලද ධ්‍යාන ඇති බව දක්වන ලදී. **සුභං** යන මෙයින් ඉතා පිරිසිදු වූ නීලාදී වර්ණ කසිණයන්හි ධ්‍යාන දක්වන ලදී. එහි කිසිසේත් අර්පණාව ඇතුළත සුභයැයි සිතාබැලීමක් නැත. යමෙක් වනාහි ඉතා පිරිසිදු ශුභ කසිණය අරමුණු කොට වාසය කෙරේ ද, හෙතෙම යම්හෙයකින් ශුභ යැයි -පෙ- ප්‍රථම ධ්‍යානයට පැමිණ වාසය කෙරේද එසේ ම ද්විතීය ධ්‍යානාදියට පැමිණ වාසය කෙරේද, එහෙයින් මෙසේ දේශනාව කරන ලදී. පටිසම්භිදා මග්ගයෙහි වනාහි 'සුභය යනුම අධිමුත්ත නම් වේනම් විමොක්ඛ යනු කෙසේ ද? මේ ශාසනයෙහි භික්ෂු තෙම මෛත්‍රී සහගත සිතින් එක් දිසාවක් -පෙ- වාසය කෙරේ ද, මෛත්‍රිය භාවනා කළ හෙයින් සත්ත්වයෝ අප්පටිකූල වෙත්, කරුණා මුදිතා - උපේක්‍ෂා සහගත සිතින් එක් දිසාවක් -පෙ- වාසය කරයි. උපේක්‍ෂාව භාවනා කළ හෙයින් සත්ත්වයෝ අප්පටිකූල වෙත්. මෙසේ සුභ යනුම අධිමුත්ත වෙයි. විමොක්ඛ වෙයි' කියන ලදී. මෙහි මත්තෙහි වනාහි පාළියෙහිම බ්‍රහ්මවිහාරයන් ආ හෙයින් ඒ නය ප්‍රතික්‍ෂේප කොට සුනීලක සුපීතක සුලෝහිතක සුංදාතක පාරිශුද්ධනීලක පාරිශුද්ධපීතක පාරිශුද්ධ ලෝහිතක පාරිශුද්ධංදාතක වශයෙන් ම ශුභ විමෝක්‍ෂය අනුදන්නා ලදී. මෙසේ කසිණය යනු හෝ අභිභායතන යනු හෝ විමෝක්‍ෂ යනු හෝ රූපාවචර ධ්‍යානය මය. එය වනාහි අරමුණෙහි සාකල්‍යාර්ථයෙන් කසිණ නම්. අරමුණු අභිභවනය කරන අර්ථයෙන් අභිභායතන නම්. අරමුණ දැඩිව ගන්නා අර්ථයෙන් ද ප්‍රතිවිරුද්ධ ධර්මයන්ගෙන් මිදෙන අර්ථයෙන් ද විමෝක්‍ෂ (නම්) යැයි ද කියන ලදී. එහි කසිණ දේසනාව අභිධර්ම වශයෙනි. වෙනත් දේසනා සූත්‍රාන්ත වශයෙන් කියන ලදැයි දතයුතුයි. මෙය මෙහි අපූර්ව පද වර්ණනාවයි. එක් එක් විමෝක්‍ෂයෙහි වනාහි පඨවි කසිණයෙහි මෙන් පස්විස්ස පස්විස්ස වශයෙන් කොට සැත්තෑපහක් නවකයෝ දතයුත්තාහ යනුයි.

**විමෝක්‍ෂ කථා නිමියේ ය.**

දැන් මෙත්තාදී බ්‍රහ්මවිහාර වශයෙන් පවත්නා රූපාවචර කුසලය දක්වන්නට නැවත කතමෙ ධම්මා කුසලා යන ආදිය පටන්ගන්නා ලදී. එහි මෙත්තා සහගතා යනු මෛත්‍රියෙන් යුක්ත,පරව එන කරුණා- කරුණා සහගතාදියෙහි ද මේ නය ම ය. මෙතෙම වනාහි යම් විධානයකින් අනුව පිළිපන්නේ මෛත්‍රිය සහගත ආදී ධ්‍යානයන්ට පැමිණ වාසය කරයි ද, මෛත්‍රී ආදීන් පිළිබඳ ඒ සියලු භාවනා විධාන විශුද්ධි මාර්ගයෙහි විස්තර කරන ලද්දේම ය. අවශේෂ පාළියෙහි අර්ථය පඨවි කසිණයෙහි කියන ලද නයින් ම දතයුතුයි. හුදෙක් පඨවි කසිණයෙහි වූ පංචවීසති නවකයෝ මෙහි පළමු තැනෙහි ත්‍රිකචතුෂ්ක ධ්‍යානික වශයෙන් සප්තක පස්විස්සෙකි. උපේක්ෂාවෙහි ඒකක පස්විස්සෙකි. කරුණා මුදිතාවන්හි ද ඡන්දාදී සතර සමග කරුණා මුදිතා යැයි මොව්හු ද යේවාර්තකයන් ලබත්. මෙහි දුක්ඛා පටිපදාදී භාවය ද මෛත්‍රියෙන් වනාහි ව්‍යාපාද විෂ්කම්භන වශයෙන් ද කරුණාවෙන් විහිංසා විෂ්කම්භන වශයෙන් ද මුදිතාවෙන් අරති විෂ්කම්භන වශයෙන් ද උපේක්ෂාවෙන් රාග ප්‍රතිඝ විෂ්කම්භන වශයෙන් ද දතයුතුයි. පරිත්තාරම්මණාව වනාහි බහුසත්වාරම්මණ වශයෙන් නො වේ. අප්පමාණාරම්මණතාව බහුසත්වාරම්මණ වශයෙන් වෙයි යැයි මෙය වෙනසයි. සෙස්ස එලෙසම ය. මේ වනාහි පෙළ වශයෙන් ම ය.

**බ්‍රහ්මුත්තමෙන කථිතෙ බ්‍රහ්මවිහාරෙ ඉමෙ ඉති විදිත්වා**
**භිය්‍යො එතෙසු අයං පකිණ්ණා කථා පි විඤ්ඤෙය්‍යා**

'මෙහි ධර්මයන් බ්‍රහ්මවිහාරයැයි දැන බ්‍රහ්ම - උත්තම වශයෙන් කී කල්හි මෙය මේවා අතුරෙහි බොහෝසෙයින් ප්‍රකීර්ණක කථාව ද දතයුතුයි.'

මේ මෙත්තා, කරුණා, මුදිතා, උපේක්ෂාවන්හි වනාහි පළමුවෙන් අර්ථ වශයෙන් ප්‍රේමකරයි යනු = **මෙත්තා** ය. ස්නේහ කරයි යන අර්ථයි. මිත්‍රයා තුළ හටගත් හෝ මෙය මිත්‍රයා තුළ පවතී යනු හෝ **මෙත්තා** ය. අනුන්ට දුකක් ඇතිකල්හි සත්පුරුෂයන් හෘදය කම්පා කෙරෙයි යනු = **කරුණාය**. අනුන්ගේ දුක මිලදී ගනී. හිංසා කරයි. විනාශ කරයි යනු = **කරුණාය**. දුකට පත්වූවන් කෙරෙහි පැතිරීම් වශයෙන් දිගහරිනු ලැබේනුයි ද = **කරුණා** ය. එය හා එක්වූවත් සතුටු කරත්. තමා හෝ සතුටු වෙයි. එය චෝදනා මාත්‍රයක් පමණකැයි ද = **මුදිතා** ය. වෛර නොකරන්නෝ

වෙත්වායි ආදී වශයෙන් ව්‍යාපාදය ප්‍රහීණ කිරීමෙන් මැදහත් බවට පැමිණීමෙන් ද උපේක්ෂාවේ යනු = **උපෙක්ඛා** ය.

මෙහි ලක්ෂණාදී වශයෙන් වනාහි මෛත්‍රිය හිතකාර පැවතීම ලක්ෂණකොට ඇත්තේ ය. හිත වූ ධර්මයන් එක්රැස් කිරීම රසය කොට ඇත්තේ ය. වෛරය දුරුකිරීම එළඹ සිටි කාරණය කොට ඇත්තේ ය. සත්ත්වයන්ට මනාපභාවය දැක්වීමට ආසන්න කාරණය කොට ඇත්තේ ය. ව්‍යාපාදය සංසිඳුවීම මෙහි සම්පත්තියයි. ස්නේහය හටගැනීම විපත්තිය යි. කරුණාව දුක පහකරන ආකාරයෙන් පැවතීම ලක්ෂණකොට ඇත්තේ, අනුන්ගේ දුක නො ඉවසීම රසය කොට ඇත්තේ ය. අවිහිංසාව එළඹ සිටි කාරණය කොට ඇත්තේ ය. දුකින් මඩනා ලද්දවුන්ගේ අනාථභාවය දැක්ම ආසන්න කාරණය කොට ඇත්තේ ය. විහිංසාව සංසිඳවීම එහි සම්පත්තියයි. ශෝකය හටගැනීම විපත්තියයි. (සතුරන් කෙරෙහි) සතුටුවීම ලක්ෂණකොට ඇත්තේ මුදිතාවයි. ඊර්ෂ්‍යා නොකිරීම රසයකොට ඇත්තේ ය. අරති විඝාතය එළඹ සිටි කාරණයයි. සත්ත්වයන්ගේ සම්පත්තිය දැකීම ආසන්න කාරණයයි. අරතිය සංසිඳවීම එහි සම්පත්තියයි. ප්‍රහාසය හටගැන්ම විපත්තියයි. සත්ත්වයන් කෙරෙහි මධ්‍යස්ථ ආකාරයෙන් පැවැත්ම ලක්ෂණකොට ඇත්තේ උපේක්ෂාවයි. සත්ත්වයන් කෙරෙහි ස්වභාවය දැකීම රසයකොට ඇත්තේය. පටිඝානුසය සංසිඳවීම එළඹසිටි කාරණයයි. සත්ත්වයෝ කර්මය ස්වකීය කොට ඇත්තාහ. ඔව්හු කාගේ නම් රුචියෙන් සුවපත් වූවෙක් ද දුකින් හෝ මදෙන් ද ලද සැපතින් හෝ නො පිරිහෙත් දැයි මෙසේ පැවති කම්මස්ස කතා දර්ශනය ආසන්න කාරණයයි. පටිඝානුසය සංසිඳීම එහි සම්පත්තියයි. ගේහසිත ප්‍රේමය නොදන්නා උපේක්ෂාව හටගැනීම විපත්තියයි.

විදර්ශනා සුවයත් භව සම්පත්තියත් මේ සතර බ්‍රහ්මවිහරණයන්ගේ ම සාධාරණ ප්‍රයෝජනයයි. ව්‍යාපාද නැසීම ආවේණිකය. මෙහි මෛත්‍රිය වනාහි ව්‍යාපාදය නැසීම ප්‍රයෝජන කොට ඇත්තේ ය. ඉතිරි තුන විහිංසා අරති රාග නැසීම ප්‍රයෝජන කොට ඇත. මෙය ද කියන ලදී. 'ඇවැත්නි, යම් ඒ මෛත්‍රියෙන් ලබන චේතෝ විමුක්තියක් වේද මෙය වනාහි ව්‍යාපාදයෙන් නිදහස්වීමකි. ඇවැත්නි, යම් ඒ කරුණාවෙන් ලබන චේතෝ විමුක්තියක් වේද එය වනාහි විහිංසාවෙන් නිදහස් වීමකි. ඇවැත්නි, මුදිතාවෙන් ලබන යම් ඒ චේතෝ විමුක්තියක් වේද එය වනාහි අරතියෙන් නිදහස් වීමකි. ඇවැත්නි, උපේක්ෂාවෙන් ලබන යම් ඒ

චේතෝ විමුක්තියක් වේද එය වනාහි රාගයෙන් නිදහස් වීමකි' යනුයි. මෙහි ද එකිනෙකාට ආසන්න දූර වශයෙන් සතුරෝ දෙදෙනා බැගින් වෙත්.

පුරුෂයෙකුට සමීපව හැසිරෙන සතුරෙකු මෙන් මෛත්‍රී බ්‍රහ්ම විහරණයට වනාහි ගුණ දර්ශනයෙන් සමාන වූ රාගය ආසන්න සතුරාය. හෙතෙම වහා බැසගැනීම ලබයි. (එහෙයින්) මෛත්‍රිය එහිත් මනාව රැකගත යුතුයි. පුරුෂයෙකුට පර්වතාදී ගහණයන් ඇසුරුකළ සතුරෙකු මෙන් සභාගයන්ට විරුද්ධ වූ ව්‍යාපාදය දුරින් සිටිනා සතුරෙකි. (එහෙයින්) එයින් බිය නොවී මෙත් වැඩිය යුතුයි. මෛත්‍රිය ද කරයි. කෝපයද කරන්නේ ය යන මෙය නො සිදුවිය හැක්කේ ය.

කරුණා බ්‍රහ්ම විහරණයට 'ඉෂ්ට වූ කාන්ත වූ මන වඩනා වූ මනරම් වූ ලෝකාමිසයෙන් යුක්ත වූ චක්ෂුර් විඥේය වූ රූපයන්ගේ නො ලැබීම නොලැබීම් වශයෙන් බලන්නාට හෝ පෙර හෝ ලැබූ විරූ අතීත වූ නිරුද්ධ වූ විපර්යාශයට පැමිණි හෝ (ආරම්මණයන්) සිහි කරන්නාට හෝ දොම්නස උපදී. මෙබඳු වූ යම් දොම්නසක් වේ නම් එය ගේහසිත දෝමනස්සය යැයි කියනු ලැබේ' යන ආදී නයින් ආ ගේහසිත දෝමනස්සය විපත්ති දර්ශනය සමාන හෙයින් ආසන්න සතුරාය. සභාග විසභාග වශයෙන් වන වෙහෙස දුරින් වූ සතුරාය. එහෙයින් එයින් බිය නොවී කරුණාව වැඩිය යුතුය. කරුණාවත් කරන්නේ නම් අත් ආදියෙනුත් වෙහෙසෙන්නේ ය යන මෙය නොවිය හැක්කකි.

මුදිතා බ්‍රහ්ම විහාරයට 'ඉෂ්ට වූ කාන්ත වූ මන වඩන්නා වූ මනරම් වූ ලෝකාමිස ප්‍රතිසංයුක්ත වූ චක්ෂුර් විඥෙය වූ රූපයන්ගේ ලැබීම හෝ ලැබීම් වශයෙන් බලන්නාට පෙර හෝ ලදවිරූ අතීත වූ නිරුද්ධ වූ විපර්යාශයට පැමිණි දේ හෝ බලන්නාට සොම්නසක් උපදී ද මෙබඳු වූ යම් සොම්නසක් වේ නම් එය ගේහසිත සෝමනස්සය යැයි කියනු ලැබේ' යනාදී නයින් ආ ගේහසිත සෝමනස්සය සම්පත්ති දර්ශනයට සමාන හෙයින් ආසන්න සතුරාය. සමාන අසමානතාවෙන් විරතිය දුරින් වූ සතුරාය. එහෙයින් එයින් බිය නොවී මුදිතාව වැඩිය යුතුයි. මුදිතයෙක් ද වන්නේ ය. ප්‍රාන්ත සේනාසනයන්හි (අධි කුශල ධර්මයන්හිද) කළකිරෙන්නේ ය යන මෙය නොවිය හැක්කකි.

උපේක්ෂා බ්‍රහ්ම විහාරයට වනාහි 'බාල වූ මූඪ වූ පෘථග්ජන වූ අවස්ථා ජයග්‍රහණය නො කළ කර්මඵල නොදත් ආදීනව නො දක්නා අශ්‍රැතවත් පෘථග්ජනයාට ඇසින් රූපයක් දැක උපේක්ෂාවක් උපදී ද එබඳු වූ ඒ උපේක්ෂාව රූපය නො ඉක්මවයි. එහෙයින් ඒ උපේක්ෂාව ගේහසිත යැයි කියනු ලැබේ' යන ආදී නයින් ආ ගේහසිත අඥානුපේක්ෂාව දෝෂ ගුණයන් අවිචාරණ වශයෙන් සමාන හෙයින් ආසන්න සතුරාය. සමාන අසමාන හෙයින් රාග පටිඝය දුරින් වූ සතුරෝ ය. එහෙයින් එයින් නොබියව උපේක්ෂාව වැඩිය යුතුය. උපේක්ෂා කෙරේ නම් ඇලෙන්නේ ය. ඝාතනය කරන්නේ ය යනු නොවිය හැකි ය. මේ සියල්ලන්ට ම කත්තුකම්‍යතා ඡන්දය ආදියයි. නීවරණාදීන් විෂ්කම්භනය මධ්‍යයයි. අර්පණාව අවසානයයි. ප්‍රඥප්ති ධර්ම වශයෙන් එක් සතෙකු හෝ නොයෙක් සත්ත්වයන් හෝ අරමුණයි. උපචාරය හෝ අර්පණාව පැමිණි කල්හි අරමුණ වැඩීම වේ.

මේ එහි වැඩීම් ක්‍රමයයි. යම් සේ වනාහි දක්ෂ. ගොවියා සෑයුතු තැන් පිරිසිඳ සායිද, මෙසේ පළමුවෙන් ම එක් ආවාසයක් පිරිසිඳගෙන එහි සත්ත්වයන් කෙරෙහි මේ ආවාසයෙහි සත්ත්වයෝ අවෛරී වෙත්වායි ආදී නයින් මෛත්‍රිය වැඩිය යුතුය. එහි සිත මෘදුකොට කර්මනීය කොට ආවාස දෙකක් පිරිසිඳිය යුතුය. ඉක්බිති අනුක්‍රමයෙන් තුනක් සතරක් පහක් හයක් හතක් අටක් නවයක් දහයක් එක් වීදියක් ගමකින් අඩක් ගමක් ජනපදයක් රාජ්‍යයක් එක් දිසාවක් යැයි මෙසේ එක් සක්වළක් එයින් බොහෝ චක්‍රවාටයන්හි ඒ ඒ තැන්වල සත්ත්වයන් කෙරෙහි මෛත්‍රිය වැඩිය යුතු ය. එසේ කරුණා ආදිය යැයි මේ මෙහි අරමුණු වඩනා ක්‍රමයයි. යම් සේ වනාහි කසිණයන්ගේ ඵලය අරූප ධ්‍යානයයි. සමාධීන්ගේ ඵලය නේවසඤ්ඤානාසඤ්ඤායතනයයි. විදර්ශනාවන්ගේ ඵලය ඵල සමාපත්තියයි. සමථ විදර්ශනාවන්ගේ ඵලය නිරෝධ සමාපත්තියයි. මෙසේ මෙහි බ්‍රහ්මවිහාරත්‍රයෙහි ඵලය උපේක්ෂා බ්‍රහ්ම විහාරයයි. යම් සේ වනාහි ටැම් නොනංවා නො ඔසවා අහසෙහි කුළු ගොනැසි තැබිය නොහැකිද එපරිද්දෙන් පළමු ධ්‍යානයන් අතුරෙන් තෘතීය ධ්‍යානය නොමැතිව චතුර්ථ ධ්‍යානය වැඩිය නො හැකි ය. විසභාග අරමුණු හෙයින් කසිණ භාවනාවෙහි උපන් තෘතීය ධ්‍යානයෙහි ද මෙය නූපදී යනුයි.

මෙහි මෙවැන්නක් වන්නේ ය. කවර හෙයකින් වනාහි මේ මෛත්‍රී කරුණා මුදිතා උපේක්ෂාවෝ බ්‍රහ්මවිහාරයෝ යැයි කියත් ද? කවර හෙයින් සතරක් ම වී ද? මොවුන්ගේ ක්‍රමය කුමක් ද? විභංගයෙහි වනාහි කවර හෙයින් අප්පමඤ්ඤායැයි කියන ලද ද යනුයි. මෙහිදී ශ්‍රේෂ්ඨාර්ථයෙන් ද නිර්දෝෂ භාවයෙන් ද බ්‍රහ්මවිහාර යැයි දතයුතුයි. මේ විහාරයෝ සත්ත්වයන් කෙරෙහි මනාව පිළිපන් බැවින් ශ්‍රේෂ්ඨයහ. යම්සේ බ්‍රහ්මයෝ නිදොස් සිතින් යුතුව වෙසෙත් ද, මෙසේ මේ බ්‍රහ්මවිහාරයන්ගෙන් යුත් යෝගීහූ බ්‍රහ්මයන්ට සමානව වෙසෙත් යැයි ශ්‍රේෂ්ඨාර්ථයෙන් නිර්දෝෂ භාවයෙන් බ්‍රහ්ම විහාරයැයි කියනු ලැබේ.

කවර හෙයින් සතරක් වීද යනාදී ප්‍රශ්නයට මේ විසඳුමයි.

විසුද්ධිමග්ගාදි වසා චතස්සො
හිතාදි ආකාරවසා පනෙසං
කමො පවත්තන්ති ච අප්පමාණො
තා ගොචරෙ යෙන තදප්පමඤ්ඤා

මොවුන්ගේ හිතාදී ආකාර වශයෙන් ද විශුද්ධි මාර්ගාදී වශයෙන් ද සතරෙකි. යම්හෙයකින් ඔව්හු අප්‍රමාණ විෂයෙහි ක්‍රමය පවත්වත්ද එහෙයින් අප්‍රමාණ්‍යයෝ ය.

මොවුනතුරෙන් වනාහි මෛත්‍රිය ව්‍යාපාද බහුලයාට ද කරුණාව විහිංසා බහුලයාට ද, මුදිතාව අරති බහුලයාට ද උපේක්ෂාව රාග බහුලයාට ද විශුද්ධි මාර්ගය වේ. තව ද හිතූපසංහාර අහිතාපන යන සම්පත්තිමෝදන අනාභෝග වශයෙන් ද සත්ත්වයන් කෙරෙහි මෙනෙහි කිරීම චතුර්විධ ම වේ. යම් සේ මවක් වනාහි ළදරු ගිලන් යොවුන්පත් වැඩෙහි යෙදුණු යන පුතුන් සතරදෙනා කෙරෙන් ළදරුවාගේ අභිවෘද්ධි කැමති වෙයිද, ගිලන්හුගේ ගිලන්බව දුරුකිරීමට කැමති වෙයිද යොවුන්පත්හුගේ යෞවන සම්පත්තියෙහි චිරස්ථිතිය කැමති වෙයිද වැඩක යෙදුණාහුගේ කිසියම් කටයුත්තක ව්‍යාවෘත නොවෙයි ද, එසේම අප්පමඤ්ඤාවිහාරිකයා විසින් ද සියලු සත්ත්වයන් කෙරෙහි මෛත්‍රී ආදී වශයෙන් විය යුතුයි. එහෙයින් මෙයින් විශුද්ධිමාර්ගාදී වශයෙන් ද අප්පමඤ්ඤාව චතුර්විධ ය.

එහෙයින් වනාහි මේ සතරම වඩනු කැමැත්තා විසින් පළමුව හිතකර පැවතීම් වශයෙන් සත්ත්වයන් කෙරෙහි පිළිපැදිය යුතුය, මෛත්‍රිය

හිතාකාර පැවතුම් ලක්‍ෂණ ඇත්තේය. කරුණාව ඉක්බිති මෙසේ පතන ලද හිත ඇති සත්ත්වයින්ගේ දුකින් මැඩීම දැක හෝ අසා හෝ සලකා හෝ දුකින් පහකිරීමේ අයුරින් පැවතීම් වශයෙන්, දුකින් පහකිරීමේ ආකාරයෙන් පැවතීම ලක්‍ෂණකොට ඇත්තේය. මුදිතාව මෙසේ පතන ලද හිත ඇති පතන ලද දුක් පහකිරීම ද ඇති ඔවුන්ගේ සම්පත්තිය දැක සම්පත්තියෙහි සතුටුවීම් වශයෙන් ප්‍රමෝදන ලක්‍ෂණ ඇත්තේ ය. ඉන්පසුව වනාහි කළයුත්තක් නොමැති හෙයින් අධිඋපේක්‍ෂා සංඛ්‍යාත මධ්‍යස්ථාකාරයෙන් පැවතිය යුතුයි. උපේක්‍ෂාව මධ්‍යස්ථාකාර පැවතුම් ඇත්තේ ද වෙයි. එහෙයින් මොවුනතුරෙන් හිතාදි ආකාරයෙන් පැවති මෛත්‍රිය පළමුව කියන ලදී. ඉක්බිති කරුණා මුදිතා උපේක්‍ෂා යැයි මේ ක්‍රමය දතයුතුයි.

යම්හෙයකින් වනාහි මේ සියල්ලෝ ම අප්‍රමාණ ගෝචරයෙහි පවතිත් ද එහෙයින් අප්පමඤ්ඤා යැයි කියනු ලබත්. අප්‍රමාණ සත්ත්වයෝ වනාහි මොවුන්ට ගෝචර වූවාහු ය. එක් සත්ත්වයෙකුට ද මෙපමණ ප්‍රදේශයක මෛත්‍රියක ආදිය වැඩිය යුතුයැයි මෙසේ ප්‍රමාණයක් නොගෙන සියල්ලන් කෙරෙහි පැතිරීම් වශයෙන් පැවතියේ ය යනුයි. එහෙයින් කියන ලදී.

**විසුද්ධිමග්ගාදි වසා චතසෙසා**
**හිතාදි ආකාරවසා පනාසං**
**කමො පවත්තනති ච අපපමාණො**
**තා ගොචරෙ යෙන තදපපමඤඤා ති**

මොවුන් ගේ වනාහි විශුද්ධි මාර්ගාදී වශයෙනුත් හිතාදි ආකාර වශයෙනුත් ක්‍රම සතරෙකි. ඔව්හූ අප්‍රමාණ ගෝචරයෙහි ද පවතිත්. එහෙයින් ඒ අප්පමඤ්ඤා ය.

මෙසේ අප්‍රමාණ ගෝචර බැවින් ද ඒකලක්‍ෂණ වූ මොවුනතුරෙන් පළමු තිදෙන ත්‍රිකචතුෂ්ක ධ්‍යානිකයෝ වෙත්. කවර හෙයින්ද? සොම්නසින් වෙන් නොවීමෙනි. මේ කවර හෙයින් සොම්නසින් අවිප්‍රයෝගද? දොම්නසින් උපන් බ්‍යාපාදාදීන්ගෙන් හා පශ්චිම වූ අවශේෂ ධ්‍යානිකයන්ගෙන් ද නික්මෙන හෙයිනි. කවර හෙයින්ද? උපේක්‍ෂාව

වේදනා සම්ප්‍රයුක්ත හෙයිනි. සත්ත්වයන් කෙරෙහි මධ්‍යස්ථාකාරයෙන් පවත්නා බ්‍රහ්මවිහාර උපේක්ෂාව උපේක්ෂා වේදනාවෙන් තොරව නො පවතී යනුයි.

## බ්‍රහ්මවිහාර කථා නිමියේ ය.

දැන් රාගචරිත සත්ත්වයන්ට ඒකාන්ත හිත වූ නානාරම්මණයන්හි එක් එක් ධ්‍යාන වශයෙන් පවත්නා රූපාවචර කුශල ද දැක්වීමට නැවත කතමෙ ධම්මා කුසලා යන ආදිය පටන්ගන්නා ලදී. එහි **උද්ධුමාතක සඤ්ඤාසහගතං** යන ආදියෙහි මුළු සිරුරම ක්‍රමයෙන් වායුවෙන් උඩට ඒමෙන් මල්ලක් මෙන් ඉදිමුණු බැවින් ඉදිමුණ නිසා = උද්ධුමාතය, උද්ධුමාතය ම = **උද්ධුමාතකය,** එබඳු මළසිරුරකට මෙය නමකි. විවිධාකාර බෙදුණු වර්ණ ඇතියේ විනීලයැයි කියනු ලැබේ. විනීල ම = **විනීලකය.** පිළිකුල් හෙමයින් හෝ පිළිකුල් වූයේ විනීලය යනු = **විනීලකය.** මස් උස්ව සිටි තැන්වල රක්ත වර්ණ වූ සැරව එක්වූ තැන්හි ශ්වේත වර්ණ වූ නිල්වන් තැන්වල බොහෝසෙයින් නිල්වන් වූ නිල් සළුවක් පෙරවූවක් වැනි මළසිරුරට මේ නමකි. බිඳුණු තැන්වලින් වැගිරෙන සැරව ඇතියේ = විපුබ්බය. විපුබ්බ යනුම = **විපුබ්බකය,** පිළිකුල් හෙයින් හෝ නින්දිත විපුබ්බය යනු හෝ = **විපුබ්බකය.** එබඳු වූ මළ සිරුරකට මේ නමකි. දෙකඩ වීමෙන් විනාශව ගියේ විච්ඡිද්ද යැයි කියනු ලැබේ. විච්ඡිද්ද ම = **විච්ඡිද්දකය,** පිළිකුල් බැවින් හෝ නින්දිත වූ විච්ඡිද්දය යනු = **විච්ඡිද්දකය,** මැදින් බිඳුණු මළ සිරුරට මේ නමකි.

එහෙන් මෙහෙන් විවිධාකාරයෙන් බලුසිවලුන් කන ලද්දේ = වික්ඛායිතය, වික්ඛායිතය ම = **වික්ඛායිතකය,** පිළිකුල් බැවින් හෝ නින්දිත වූ වික්ඛායිතය යනු = **වික්ඛායිතකය,** එබඳු මළ සිරුරකට මේ නමකි. විවිධව විසුරුණේ = වික්ඛිත්තය, වික්ඛිත්තයම = **වික්ඛිත්තකය,** පිළිකුල් හෙයින් හෝ නින්දිත වූ වික්ඛිත්තය යනු = **වික්ඛිත්තකය, අඤ්ඤෙන හත්ථං අඤ්ඤෙන පාදං අඤ්ඤෙන සීසං** යැයි මෙසේ ඒ ඒ තැන විසුරුණු මළසිරුරට මේ නමකි. විනාශ වූයේ ද පළමු නයින් ම විසුරුණෝ ද එය යනු = **හතවික්ඛිත්ත** ය, කාකපාදාකාර ආයුධයකින් පහර දී පෙර කියන ලද නයින් විසුරුවන ලද මළසිරුරට මේ නමකි. ලේ ගලයි. විසිරෙයි.

ඔබ මොබ ද වැගිරෙයි යනු = ලෝහිතකය, වැගිරෙන ලේ තැවරුණු මළ සිරුරට මේ නමකි. කෘමීහු පුළව යැයි කියනු ලබත්. පණුවන් වැගිරේනුයි= පුළවකය, කෘමීන් පිරුණු මළසිරුරට මේ නමකි. ඇට ම = අට්ඨිකය, පිළිකුල් හෙයින් හෝ නින්දිත වූ ඇට යනු = අට්ඨිකය, ඇටසැකිල්ලට ද එක් ඇටයකට ද මේ නමකි. උද්ධුමාතකාදී මේවා නිසා උපන් නිමිතිවලටද නිමිතිවලින් ලබන ලද ධ්‍යානයන්ට ද මේ නාමයෝ ම වෙති. එහි උද්ධුමාතක නිමිත්තෙහි අර්පණා වශයෙන් උපන් සංඥාව උද්ධුමාතක සංඥාවයි. ඒ උද්ධුමාතක සංඥාවේ සම්ප්‍රයෝගාර්ථ සහගත වූයේ උද්ධුමාතක සඤ්ඤා සහගත, විනීලක සඤ්ඤා සහගත ආදීන්හි ද මේ නය ම ය.

මෙහිදී වනාහි යම් භාවනා විධානයක් කිවයුතු වන්නේ ද, එය සර්වාකාරයෙන් විශුද්ධි මාර්ගයෙහි කියන ලද්දේම ය. පාළි වර්ණනාව යට කියන ලද නයින් ම දතයුතුයි. හුදෙක් මෙහි වනාහි චතුර්ථ ධ්‍යාන වශයෙන් උපේක්ෂා බ්‍රහ්ම විහාරයෙහි මෙන් ප්‍රථමධ්‍යාන වශයෙන් එක එකේ ඒකකයෝ පස්විස්සක් වෙත්. අශුභාරම්මණය ද නොවඩනා හෙයින් පරිත්ත වූ උද්ධුමාතක ස්ථානයෙහි උපන් නිමිත්ත පරිත්තාරම්මණය මහත් වූ ස්ථානයෙහි අප්පමාණාරම්මණය දතයුතුයි. සෙසු තැන්හි ද මේ නයම ය.

**ඉති අසුභානි සුභගුණො දස දසසත ලොචනෙන ථුතකිත්ති**
**යානි අවොච දසබලො එකෙකජ්ඣාන හෙතුනි**

**එවං පාළිනයෙනෙව තාව සබ්බානි තානි ජානිත්වා**
**තෙසෙව්ව අයං භියොා පකිණ්ණක කථාපි විඤ්ඤෙය්‍යා**

ශුභගුණ ඇති සක්දෙව් රජුන් විසින් ස්තුති කරන ලද කීර්ති ඇති දශබල වූ භාග්‍යවතුන් වහන්සේ මෙසේ අශුභ වූ යම් එක් එක් ධ්‍යාන හේතුන් වදාළ සේක් ද,

මෙසේ පළමුකොට ඒ සියල්ල පාළි නයින් ම දැන ඔවුනතුරෙහි ම වූ මේ ප්‍රකීර්ණක කථාව ද බොහෝසෙයින් දතයුතුයි.

මේ අතුරෙහි යම්කිසි අරමුණෙක් අධිගම කරන ලද ධ්‍යාන ඇති

පුද්ගලයා මනාව විෂ්කම්භනය කරන ලද රාග ඇති හෙයින් වීතරාගියකු මෙන් ලොල්නොවූ පැවතුම් ඇත්තේ වෙයි. මෙසේ ඇති කල්හිදු යම් ඒ අශුභ භේදයක් කියන ලද ද එය ශරීර ස්වභාවයට පැමිණීම් වශයෙන් ද රාගචරිත භේද වශයෙන් දැයි දතයුතුයි. මළසිරුර වනාහි පිළිකුල් බවට පැමිණෙන්නා වූ හෝ ඉදිමීම් ස්වභාවයට පැමිණියේ හෝ වන්නේ ය. විනීලකාදී එක්තරා ස්වභාවයකට පැමිණි හෝ වෙයි. මෙසේ යම් යම් ආකාර මළසිරුරු ලබන්නට හැකි වේද, එබඳු එබඳු උද්ධුමාතක පටිකකූලය විනීලක පටිකකූලය යැයි මෙසේ නිමිත්ත ගතයුතුම යැයි ශරීර ස්වභාවයන්ට පැමිණීම් වශයෙන් අශුභ ප්‍රභේදය දශ ආකාරයකින් කියන ලදැයි දතයුතුයි.

මෙහි ද විශේෂයෙන් උද්ධුමාතකය ශරීර සටහන පිළිබඳ විපත්තිය ප්‍රකාශ කරන හෙයින් ශරීර සටහනට ඇලීම කරන්නාට සත්ප්‍රාය වේ. විනීලකය ඡවි වර්ණයේ විපත්තිය ප්‍රකාශ කරන හෙයින් ශරීර වර්ණයට ඇල්ම කරන්නාට සත්ප්‍රාය වේ. විපුබ්බකය කායවර්ණය පිළිබඳ දුගඳ බව ප්‍රකාශ කරන හෙයින් මාලාගන්ධාදී වශයෙන් ඉපිදවූ ශරීර ගන්ධයට ඇල්ම කරන්නාට සත්ප්‍රාය වේ. විච්ඡිද්දකය ඇතුළත සිදුරු බව ප්‍රකාශ කරන හෙයින් ශරීරයෙහි ඝනභාවයට ඇල්ම කරන්නාට සත්ප්‍රාය වේ. වික්ඛායිතකය එක්රැස්කිරීම් සම්පත්තිය විනාශවීම ප්‍රකාශ කරන හෙයින් පියොවුරු ආදී ශරීර ප්‍රදේශයන්හි මස් රැස්වීමෙහි ඇල්ම ඇත්තාට සත්ප්‍රාය වේ. වික්ඛිත්තකය අංග ප්‍රත්‍යංගන්ගේ වික්ෂේපය ප්‍රකාශකරන හෙයින් අංග ප්‍රත්‍යංග විලාසයෙහි ඇල්ම ඇත්තාට සත්ප්‍රාය වේ. හතවික්ඛිත්තකය ශරීර සම්බන්ධය බිඳීමෙන් විකාරය ප්‍රකාශ කරන හෙයින් ශරීර සම්බන්ධ සම්පත්තියෙහි ඇල්ම ඇත්තාට සත්ප්‍රාය වේ. ලෝහිතකය ලේ තැවරීමෙන් වන පිළිකුල් බව ප්‍රකාශකරන හෙයින් අලංකාරයෙන් හටගන්නා ශෝභාවට ඇලම කරන්නාට සත්ප්‍රාය වේ. පුළවකය ශරීරය නොයෙක් කෘමි කුලයන්ට සාධාරණ බව ප්‍රකාශ කරන හෙයින් කයෙහි මමත්වය ඇල්ම කරන්නාට සත්ප්‍රාය වේ. අට්ඨිකය ශරීරයෙහි ඇට පිළිබඳ පිළිකුල් බව ප්‍රකාශ කරන හෙයින් දන්ත සම්පත්තියෙහි ඇල්ම කරන්නාට සත්ප්‍රාය වේයැයි මෙසේ රාගචරිත වශයෙන් ද අශුභ ප්‍රදේශය දශාකාරයකින් කියන ලදැයි දතයුතුයි.

යම්හෙයකින් වනාහි මේ දශවිධ අශුභයන්හි නොසිටි ජලයෙන් යුත් වේගවත් සැඩපහර ඇති නදියෙක හබලේ බලයෙන් ම නැව සිටීද, හබලෙන් තොරව තබන්නට යම්සේ නම් නොහැකි වේද, එපරිද්දෙන් ම අරමුණ දුබලහෙයින් විතර්කයේ බලයෙන් ම සිත එකඟ වී සිටී. විතර්කයෙන්

තොරව තබන්නට නොහැකි වෙයි. එහෙයින් මෙහි ප්‍රථමධ්‍යානය ම වෙයි. ද්විතීයාදී ධ්‍යානයෝ නොවෙත්. පිළිකුල් වූ ද මේ අරමුණෙහි දී ඒකාන්තයෙන් මේ ප්‍රතිපදාවෙන් ජරාමරණයෙන් මිදෙමියි මෙසේ ආනිසංස දක්නා බැවින් ද නීවරණ සන්තාපයන් ප්‍රහාණයෙන් ද ප්‍රීතිය හා සොම්නස උපදී. දැන් බොහෝ වැටුප් ලබන්නෙමි'යි ආනිසංස දක්නා කසළ ඉවත් කරන්නාට අශුචි රාශියක මෙනි. සන්සිඳී ගිය ව්‍යාධි දුක් ඇති රෝගියකුට වමනය විරේකය පැවැත්වීමේදී ද මෙනි. දශවිධ ම වූ මේ අශුභය ලක්‍ෂණ වශයෙන් එකක් ම වෙයි. දශවිධ වූ ද මේ අශුභයාගේ අපවිත්‍ර බව දුඟඳ ජුගුප්සාව පිළිකුල් බව ම ලක්‍ෂණයයි. මෙය මේ ලක්‍ෂණයෙන් යුක්ත වූයේ හුදෙක් මෘත ශරීරයේ පමණක් නොවේ. දත් ඇටයේ දක්නා වූ චේතිය පබ්බතවාසී මහාතිස්ස තෙරුන්ට මෙන් ද ඇතුපිට සිටි රජු බලන්නා වූ සංඝරක්ෂිත තෙරුන්ගේ උපස්ථායක වූ සාමණේරයන් වහන්සේට මෙන් ද ජීවමාන ශරීරයෙහි ද වැටහෙයි. මෘතශරීරය යම්සේ ද මෙසේ ම ජීවමාන ශරීරය ද අශුභමය. මෙහි අශුභ ලක්‍ෂණය වනාහි ආගන්තුක අලංකාරයේ වැසුණු නොපෙනේ යනුයි.

**අශුභ කථා නිමියේ ය.**

කිම මේ රූපාවචරධ්‍යානය පඨවි කසිණය ආදිකොට අස්ථික සංඥාව කෙළවර කොට ඇත්තේ ද? නැතහොත් වෙනත් ධ්‍යානයෝ ඇද්ද යනුයි. ඇත, ආනාපාන ධ්‍යානය ද කායගතාසති භාවනාවද වනාහි මෙහි නොකියන ලදී. නොකියන ලද්දේ වී නමුදු, වායෝ කසිණය ගත්කල්හි වනාහි ආනාපාන ධ්‍යානය ගන්නා ලද්දේම ය. වර්ණ කසිණය ගත්කල්හිද කේශාදීන්හි චතුෂ්ක පංචක ධ්‍යාන වශයෙන් උපන් කායගතා සතිය ද දශ අශුභයන් ගත් කල්හි ද්වතිංසාකාරයෙහි පටික්කූල මනසිකාර ධ්‍යාන වශයෙන් මෙන් ම නවසීවථිකා වර්ණධ්‍යාන වශයෙන් ද පැවති කායගතාසතියද ගන්නා ලදී. මෙසේ සියලු ම රූපාවචර අර්පණාවෝ මෙහි කියන ලද්දෝ ම වෙත් යනුයි.

**රූපාවචර කුසල කථා නිමියේ ය.**

දැන් අරූපාවචර කුශලය දක්වන්නට නැවතත් **කතමෙ ධම්මා කුසලා** යන ආදිය පටන් ගන්නා ලදී. එහි **අරූපූපපත්තියා** යනු අරූපභවය අරූපයි. අරූපයෙහි උත්පත්තිය = අරූපූපපත්තිය, එයට **අරූපූපපත්තියා, මග්ගභාවෙති** යනු උපාය හේතු කරුණු උපදවයි. වඩයි, **සබ්බසො** යනු සියලු ආකාරයෙන්, සියල්ලන්ගේ හෝ අනවසේසයන්ගේ යන අර්ථයි. **රූපසඤ්ඤානං** යනු සංඥා ශීර්ෂයෙන් කියන ලද රූපාවචර ධ්‍යානයන්ගේ මෙන්ම තදාරම්මණයන්ගේ ද, රූපාවචර ධ්‍යානයන්ට ද රූපයැයි කියනු ලැබේ. 'රූපී රූපානි පස්සති' යන ආදීන්හි එහි අරමුණද 'බහිද්ධා රූපානි පස්සති සුවණ්ණ දුබ්බණ්ණානි' යන ආදීන්හිද, එහෙයින් මෙහි රූපෙ සඤ්ඤා රූපසඤ්ඤා යැයි මෙසේ සංඥා ශීර්ෂයෙන් රූපාවචර ධ්‍යානයට මේ නමකි. රූපය යන සංඥාව මොහුට ය යනු = රූපසඤ්ඤාය, රූප යනු මෙහි නාමය යැයි කියන ලද්දේ වෙයි. මෙසේ පඨවි කසිණාදී භේද ඇති තදාරම්මණයට ද මෙය නමකැයි දතයුතුයි. **සමතික්කමා** යනු විරාගයෙන් ද නිරෝධයෙන් ද කුමක් කියන ලද්දේ වේ ද? මොවුන්ගේ කුශල විපාක ක්‍රියා වශයෙන් පසළොස් ධ්‍යාන සංඛ්‍යාත රූප සංඥාවන්ගේද පඨවි කසිණාදී වශයෙන් වූ අටවැදෑරුම් ආරම්මණ සංඛ්‍යාත මේ රූප සංඥාවන්ගේ ද සර්වාකරයෙන් නිරවශේෂව වෙන්වීමෙන් නිරෝධයෙන් ද විරාගයට මෙන් ම නිරෝධයටද හේතුවූ ආකාසානඤ්චායතනය පැමිණ වාසය කරයි. සර්වාකාරයෙන් රූප සංඥාව නොඉක්මවූවහු විසින් මේ ධ්‍යානයට පැමිණ වාසය කරන්නට නොහැක්කේ ය යනුයි. යම්හෙයකින් අරමුණෙහි ඇලුණහුට සංඥා සමතික්‍රමයක් නොවේ ද, සමතික්‍රමය කළ සංඥාවන්හි ද අරමුණ සමතික්‍රමය වූයේ ම වෙයි ද, එහෙයින් ආරම්මණ සමතික්‍රමය නොකියා '(එහි) රූපසංඥාව කවරේද, රූප සමාපත්තියට සමවැදුනහුට හෝ සමාධිය උපන්නකුට හෝ දිට්ඨධම්ම සුඛවිහාරියකුට හෝ සංඥාවක් දැනීමක් දැනුණු බවක් වේද මේ රූපසංඥා යැයි කියනු ලැබේ. මේ රූපසංඥා ඉක්මවූයේ වේද ව්‍යතික්‍රමය කෙළේ වේද සමතික්‍රමය කෙළේ වේද එහෙයින් සර්වාකාරයෙන් රූපසංඥාවන් සමතික්‍රමයෙන් යැයි කියනු ලැබේ' යනුයි යැයි මෙසේ විභංගයෙහි සංඥාවන්ගේ ම සමතික්‍රමය කියන ලදී. යම්හෙයකින් වනාහි ආරම්මණ සමතික්‍රමෙන් පැමිණිය යුතු මේ සමාපත්තීහු ප්‍රථමධ්‍යානාදීන් මෙන් එක් අරමුණෙකම නොවේද එහෙයින් මේ අර්ථ වර්ණනාව ආරම්මණ සමතික්‍රම වශයෙන් ද කරන ලදැයි දතයුතුයි.

**පටිඝ සඤ්ඤානං අත්‍ථංගමා** යනු චක්‍ෂුරාදී වස්තූන්ගේ ද රූපාදී ආරම්මණයන්ගේ ද ගැටීමෙන් උපන් සංඥාවෝ ප්‍රතිඝ සංඥාවෝ ය. රූප සංඥාදීන්ට මේ නමකි. මෙසේ ද කීහ. 'එහි ප්‍රතිඝ සංඥාව ස්පර්ශ සංඥාව යන මේවා ප්‍රතිඝ සංඥායැයි කියනු ලැබේ' යනුයි. ඒ කුශලවිපාක පසේ ද අකුශලවිපාක පසේ දැයි සර්වාකාරයෙන් දශ ප්‍රතිඝ සංඥාවන්ගේ අස්තංගමයෙන් ප්‍රහාණයෙන් නොඉපිදවීමෙන් නොපැවැත්ම කොට යැයි කියන ලද්දේ වෙයි. ප්‍රථමධ්‍යානාදියට සමවැදුණවුන්ට කාම සංචේතනාවෝ නැත්තාහ. එසමයෙහි සිත පංචද්වාර වශයෙන් නො පවතී. මෙසේ ඇති කල්හි ද අන්තැනක ප්‍රහීණ වූ සුඛදුඃඛාදීන්ගේ ද චතුර්ථධ්‍යානයේදී මෙන් ද සක්කායදිට්ඨි ආදීන් තෘතීයධ්‍යාන මාර්ගයේ මෙන් ද මේ ධ්‍යානයෙහි උත්සාහ ඉපදවීම පිණිස ද මේ ධ්‍යානයට ප්‍රශංසා වශයෙන් මොවුන් පිළිබඳව මෙහිදී කීම දතයුතුයි. නොහොත් රූපාවචරයම සමවැදුණහුට ඔව්හු නැද්ද, එසේත්නැතිනම් ප්‍රහීණ හෙයින් නැද්ද, රූප විරාග හෙයින් රූපාවචර භාවනාවක් නැත. මොවුන්ගේ පැවැත්ම රූපයට අයත්මය. මේ භාවනාව වනාහි රූප විරාගය පිණිස පවතී. එහෙයින් මෙහිදී මොව්හු ප්‍රහීණයහයි කියන්නට වටී. හුදෙක් කියන්නට පමණක් නොවේ. ඒකාන්තයෙන් ම මෙසේ දරන්නට ද වටී. මීට පෙර වනාහි ඔවුන් අප්‍රහීණ හෙයින් ම ප්‍රථමධ්‍යානයට සමවැදුණහුට ශබ්දය කටුවක් මෙනැයි භාග්‍යවතුන් වහන්සේ විසින් වදාරන ලදී. මෙහි ද ප්‍රහීණ හෙයින් ම අරූප සමාපත්තීන්ගේ නොසැලෙන බව ද ශාන්ත විමෝක්‍ෂය ද කියන ලදී. අරූපධ්‍යානයට සමවන් ආලාරකාලාම අසලින් ගිය පන්සියයක් පමණ ගැල් නො දුටුවේ ය. ශබ්දය ද නෑසිය යනුයි.

**නානත්තසඤ්ඤානං අමනසිකාරා** යනු වෙනස් බවෙන් යුත් අරමුණෙහි පැවති සංඥාවන්ගේ හෝ නානත්වයෙන් යුත් සංඥාවන්ගේ යම්හෙයකින් වනාහි මොව්හු 'තත්‍ථ කතමා නානත්තසඤ්ඤා අසමාපන්නස්ස මනොධාතුසමංගිස්ස වා මනොවිඤ්ඤාණධාතුසමංගිස්ස වා සඤ්ඤා සඤ්ජානනා සඤ්ජානිතත්තං, ඉමා වුච්චන්ති නානත්තසඤ්ඤායො' යැයි මෙසේ විභංගයෙහි බෙදා කියන ලද්දාහු මෙහි අදහස් කරන ලදී. සමාහිත නොවූවහුගේ මනෝධාතුව ද මනෝවිඤ්ඤාණ ධාතුවෙන් යුත් සංඥාව ද රූපාදිභේදයෙන් නානත්වයෙන් යුත් නානාස්වභාවයෙන් යුත් ගෝචරයෙහි පවතිත්. යම්හෙයකින් මේ අෂ්ට කාමාවචර කුශල සංඥාවෝ ද, ද්වාදශ අකුශල සංඥාවෝ ද, ඒකාදශ කාමාවචර කුශල

විපාක සංඥාවෝ ද අකුශල විපාක සංඥාවෝ දෙදෙනා ද ඒකාදශ කාමාවචර ක්‍රියා සංඥාවෝ දැයි මෙසේ සතළිස් සතරක් වූ සංඥාවෝ ම නානත්වයෙන් යුක්තයහ. නානා ස්වභාවයෙන් යුත්තයහ. ඔවුනොවුන්ට අසමානයහ. එහෙයින් නානත්තසඤ්ඤා යැයි කියන ලදහ. ඒ නානත්ව සංඥාවන් සර්වප්‍රකාරයෙන් මෙනෙහි නො කිරීමෙන් යම්හෙයකින් ඒවා ආවර්ජනා නොකෙරේ ද මෙනෙහි නො කරයි ද ප්‍රත්‍යවේක්ෂා නොකෙරේද, එහෙයින් මෙසේ කියන ලද්දේ වෙයි. මෙහිදී යම්හෙයකින් පළමු රූපසංඥාවද ප්‍රතිඝ සංඥාවද මේ ධ්‍යානයෙන් උපන් භවයෙහි ද විද්‍යමාන නොවේනම් ඒ භවයෙහි මේ ධ්‍යානයට පැමිණ වාසය කරන කාලයෙහි කියනුම කවරේ ද? එහෙයින් ඔවුන්ගේ දුරලීම අස්තංගමය යන දෙයාකාරයෙන් ම අභාවය ම කියන ලදී. නානත්ව සංඥාවන් යම්හෙයකින් වනාහි නානත්ව සංඥාවන් අතුරෙහි අෂ්ට කාමාවචර කුශල සංඥා නවක්‍රියා සංඥා සහ දශඅකුශල සංඥා යන මේ සත්විසි සංඥාවෝ මේ ධ්‍යානයෙන් උපන් භවයෙහි විද්‍යමාන වෙත්ද, එහෙයින් ඔවුන් මෙනෙහි නො කිරීමෙන් යැයි කියන ලදැයි දතයුතුයි. එහිදී ද වනාහි මේ ධ්‍යානයට පැමිණ වාසය කරනුයේ ඔවුන් මෙනෙහි නො කිරීමෙන් ම එළඹ වාසය කරයි. ඒ සංඥාවන් මෙනෙහි කරනුයේ අසමාපන්න වේයැයි මෙහි සංක්‍ෂේප වශයෙන් ද 'රූපසඤ්ඤානං සමතික්කමා' යැයි මෙයින් සියලු රූපාවචර ධර්මයන්ගේ ප්‍රහාණය කියන ලදී. 'පටිඝ සඤ්ඤානං අත්ථංගමා නානත්ත සඤ්ඤානං අමනසිකාරා' යන මෙයින් සියලු කාමාවචර චිත්ත චෛතසිකයන්ගේ ද ප්‍රහාණය අමනසිකාරය යැයි ද කියන ලදැයි දතයුතුයි.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ පසළොස් රූපසංඥාවන් ඉක්මවීමෙන් දශ ප්‍රතිඝ සංඥා අස්තංගමයෙන් සතළිස් නානත්ව සංඥාවන් මෙනෙහි නොකිරීමෙන්දැයි පද තුනකින් ආකාසඤ්චායතන සමාපත්තියෙහි ගුණ වදාළහ. කවර කාරණයෙකින් ද යත්, අසන්නවුන්ට උත්සාහ ඇතිකිරීම පිණිසත් පෙළඹවීම සඳහාත්ය. යම්හෙයකින් කිසියම් අපණ්ඩිත කෙනෙක් ශාස්තෲන් වහන්සේ ආකාසානඤ්චායතන සමාපත්තිය නිපදවන්නැයි වදාරති. මෙය නිපදවීමෙන් අවර අර්ථයක් ද? කවර ආනිසංසයක්දැයි කියන්නාහුය. ඔව්හු එසේ කියන්නට නො ලබත්වායි මේ ආකාරවලින් සමාපත්තියෙහි ගුණ වදාළහ.

එය අසා ඔවුන්ට මෙබඳු අදහසක් වන්නේ ය. මේ සමාපත්තිය වනාහි ශාන්තය. මෙය ප්‍රණීතය. එය උපදවවුයි ද, ඉක්බිති නිපදවීමට

උත්සාහ කරන්නැයි පෙළඹවීමට ද ඔවුන්ට මෙහි ගුණය වදාළහ. විසකණ්ටක වෙළෙන්දා මෙනි. උක්සකුරු වෙළෙන්දා විසකණ්ටක වෙළෙන්දා නමැයි කියනු ලැබේ. හෙතෙම වනාහි උක්සකුරු පැණිකැබලි සකුරු ආදිය ගැලින් ගෙන පිටිසර ගමකට ගොස් (විසකණ්ටක ගන්න) විසකණ්ටක ගන්නැයි හඬනගා කීය. එය අසා ගැමියෝ විෂ නම් කර්කශය යමෙක් එය කයි නම් හෙතෙම මැරෙයි. කටුව ද විද මරයි. මේ දෙකම කර්කශය මෙහි ආනිසංසය කුමක්දැයි ගෙවල් දොරවල් වැසූහ. දරුවන් ද පලවා හැරියහ. වෙළෙන්දා එය දැක අපොයි! මේ ගම්වැසියෝ ව්‍යවහාරයෙහි අදක්‍ෂයෝ ය. ඔවුන් උපායකින් ගනිමියි ඉතා මිහිරක් ගන්නා ඉතා රසවත් දෙයක් ගන්න උක්සකුරු පැණිසකුරු සමාන මිලකට ලැබේ. කූටමාසක කූටකහාපණ ආදිය ද ලැබේ යැයි ඝෝෂා කෙළේ ය. ගම්වැසියෝ එය අසා තුටුපහටුව නික්ම ගොස් බොහෝ මුදල් ද දී ගත්හ. ගන්නැයි එහි ආකාසානඤ්චායතනය උපදවන්නැයි තථාගතයන් වහන්සේගේ වචනය විසකණ්ටක ගන්නැයි යන වෙළෙන්දාගේ ඝෝෂණය මෙනි. භාග්‍යවතුන් වහන්සේ ආකාසානඤ්චායතනය නිපදවන්නයි වදාළහ. මෙහි ආනිශංසයකුමක් ද? මෙහි ගුණය නො දනිමුයි යන ශ්‍රෝතෘන්ගේ වචනය මේ දෙකම රළුය මෙහි ආනිසංසය කුමක්දැයි යන ගම්වැසියන්ගේ චින්තනය මෙනි. ඉක්බිති භාග්‍යවතුන් වහන්සේගේ රූපසංඥාව ඉක්මවීම ආදී ආනිසංස ප්‍රකාශනය ඉතා මිහිරක් ගන්න ඉතා රසවත් දෙයක් ගන්නැයි ආදී වෙළෙන්දාගේ වචනය මෙනි. එය අසා බොහෝ මුදල් දී උක්සකුරු ගත් ගම්වැසියන් මෙන් මේ ආනිසංසයෙන් පොළඹවන ලද සිත් ඇත්තෝ මහත් උත්සාහ කොට මේ සමාපත්තිය උපදවත්යැයි උත්සාහ ඉපිදවීම පිණිස පෙළඹවීමට ද මෙය වදාළ සේක.

**ආකාසානඤ්චායතන සඤ්ඤාසහගතං** යන මෙහි මෙයට අන්තයක් නැත යනු = අනන්තය, ආකාසය අනන්තය යනු = ආකාසානන්තය, ආකාසානන්තය ම = ආකාසානඤ්චය, ඒ ආකාසානඤ්චයයි. දෙවියන්ට දේවායතනය මෙන් සම්ප්‍රයුක්ත ධර්මයන් සහිත මේ ධ්‍යානයට අධිෂ්ඨාන අර්ථයෙන් ආයතනයක් මෙනි යනු = ආකාසානඤ්චායතනයයි. (මෙසේ ආකාසානඤ්චයත් ආයතනයත් එයමය යනු = ආකාසානඤ්චයතනයයි.) කසිණය ඉගිළූ ආකාසයට මෙය නමකි. ඒ ආකාසානඤ්චායතනයෙහි අර්පණාවටපැණේ. සංඥාවෙන් යුක්ත වූයේ = **ආකාසානඤ්චායතන සඤ්ඤාසහගතයයි**, යම්සේ වනාහි අන්තැනෙක 'අනන්තො ආකාසො' යැයි කියන ලදී. මෙසේ මෙහි අනන්තයැයි හෝ ස්වල්ප යැයි හෝ

නොගන්නා ලදී. කවර හෙයින්ද? අනන්තය ගත්කල්හි වනාහි පරිත්තය නොගනී. පරිත්තය ගත්කල්හි අනන්තය නොගනී. මෙසේ ඇතිකල්හි ආරම්මණ චතුෂ්කය නො පිරෙයි. දේශනාව සොළසක්ඛත්තුක නොවෙයි. බුදුරජාණන් වහන්සේගේ අදහස ද මෙහිදී දේශනාව සෝළසක්ඛත්තුක කිරීම ය. එහෙයින් අනන්තයැයි හෝ පරිත්තයැයි හෝ නො වදාරා **ආකාසානඤ්චායතන සඤ්ඤා සහගතං** යැයි වදාළහ. මෙසේ ඇතිකල්හි වනාහි දෙකම ගන්නා ලද්දේ ම වෙයි. ආරම්මණ චතුෂ්කය පිරෙයි. දේශනාව සොළක්ඛත්තුක බවට සපැමිණේ. අවශේෂ පාළි අර්ථය යට කියන ලද නයින් ම දතයුතුයි. චතුර්ථධ්‍යානය පිළිබඳ ආශාව විනාශ කිරීමේ දුක නිසා මෙහිද දුක්ඛාපටිපදාය, විනාශකරන ලද තෘෂ්ණාව ඇතියහුට අර්පණා පරිවාස දන්ධත්වයෙන් දන්ධභිඥ වෙයි. විපර්යාස වශයෙන් සුඛාපටිපදා, ඛිප්පාභිඤ්ඤා ද දතයුතුයි. අල්ප වූ කසිණය ඉගිළුෑ අහසෙහි වනාහි පැවති ධ්‍යානය පරිත්තාරම්මණය, මහත් වූ කසිණය ඉගිළුෑ අහසෙහි පැවතියේ අප්පමාණාරම්මණයැයි ද දතයුතුයි. උපේක්ෂා බ්‍රහ්ම විහාරයෙහි මෙන් මෙහි ද චතුර්ථධ්‍යාන වශයෙන් ඒකක පස්විස්සක් වෙයි. මෙහි යම්සේ ද මෙසේ මින් පසුව ද ඒවා පිළිබඳ විශේෂ මාත්‍රය වර්ණනා කරමි.

**ආකාසානඤ්චායතනං සමතික්කමා** යන මෙහි වනාහි පළමු කියන ලද නයින් ම ආකාසානඤ්ච ආයතනය මොහුගේ අධිෂ්ඨානයෙහි යැයි ධ්‍යානය ද ආකාසානඤ්චායතනය, කියන ලද නයින් ම ආරම්මණය ද එසේ ය. මෙසේ මේ ධ්‍යානය ද අරමුණදැයි දෙක ම නො පැවැත්ම කිරීමෙන් ද මෙනෙහි නොකිරීමෙන් ද ඉක්මවා ද මේ විඤ්ඤාණඤ්චායතනයට පැමිණ විසිය යුතුයි. එහෙයින් මේ දෙකම එක්කොට **ආකාසානඤ්චායතනං සමතික්කමා** යන මෙය කියන ලදැයි දතයුතුයි.

**විඤ්ඤාණඤ්චායතන සඤ්ඤා සහගතං** යන මෙහි අනන්ත යැයි මෙනෙහි කළයුතු වශයෙන් මොහුට අන්තයක් නැත යනු = අනන්තය, අනන්තය ම = ආනඤ්ච යයි, විඤ්ඤාණ ආනඤ්චය = විඤ්ඤාණඤ්ච යැයි නො කියා විඤ්ඤාණඤ්චයැයි කියන ලදී. මේ වනාහි මෙහි ආරූඪ ශබ්දයකි. එයම විඤ්ඤාණඤ්චය අධිෂ්ඨාන අර්ථයෙන් මේ සංඥාවෙන් ආයතනය යනුයි = **විඤ්ඤාණඤ්චායතන සහගතයි.** ආකාශයෙහි පැවති විඤ්ඤාණය අරමුණු කොටගත් ධ්‍යානයට මේ නමකි. මෙහිදී

ආකාසානඤ්චායතන සමාපත්තියෙහි ආශාව විනාශකර දැමීම දුක් හෙයින් දුක්ඛාපටිපදාය, විනාශකර දමන ලද තෘෂ්ණාවගේ අර්පණා පරිවාය දන්ධතාවෙන් දන්ධාභිඥය, විපර්යාශයෙන් සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා ද වෙයි. පරිත්ත කසිණය ඉගිළූ ආකාසාරම්මණය සමාපත්තිය ඇරැඹ පැවැත්වීමේදී පරිත්තාරම්මණතාවයි. විපරීත වශයෙන් අප්පමාණාරම්මණතාව ද දතයුතුයි. සෙස්ස පෙර සේ ම ය.

**විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම** යනු මෙහිද පෙර කියන ලද නයින් ම මොහුගේ විඤ්ඤාණවං ආයතනය අධිෂ්ඨානාර්ථයෙන් ධ්‍යානය ද විඤ්ඤාණඤ්චායතනයි. කියන ලද ක්‍රමයෙන් ආරම්මණය ද එසේය. මෙසේ මේ ධ්‍යානයත් ආරම්මණයත් යන දෙකම නො පැත්ම කිරීමෙන්ද මෙනෙහි නොකිරීමෙන් ද ඉක්මවා ද යම්හෙයකින් මේ ආකිඤ්චඤ්ඤායතනයට පැමිණ විසිය යුතුද, එහෙයින් මේ දෙකම එක්කොට **විඤ්ඤාණඤ්චායතනං සමතික්කම්ම** යන මෙය කියන ලදැයි දතයුතුයි.

**ආකිඤ්චඤ්ඤායතන සඤ්ඤාසහගතං** යන මෙහි වනාහි මොහුට කිසිවක් නැත යනු = අකිඤ්චනය, යටත්පිරිසෙයින් මොහුගේ භවාංග මාත්‍රයකුදු නැතැයි කියන ලද්දේ වෙයි. ආකිඤ්චනයේ භාවය = ආකිඤ්චඤ්ඤය, ආකාසානඤ්චායතනයේ විඤ්ඤාණපගමනයට මේ නමකි. ඒ ආකිඤ්චඤ්ඤාය අධිෂ්ඨානාර්ථයෙන් මේ සංඥාවට ආයතනය යනු = ආකිඤ්චඤ්ඤායතනයයි. ඒ ආකිඤ්චඤ්ඤායතනයේ පැවති සංඥාවෙන් යුක්තය යනු = ආකිඤ්චඤ්ඤායතන සඤ්ඤා සහගතයි, ආකාසයෙහි පැවති විඤ්ඤාණය පහවූ අරමුණ ඇති ධ්‍යානයට මේ නමකි. මෙහි විඤ්ඤාණඤ්චායතන සමාපත්තිය පිළිබඳ ආශාව විනාශ කිරීම දුක්හෙයින් දුක්ඛා පටිපදාය, නසන ලද ආසවගේ අර්පණා පරිවාය දන්ධතාව නිසා දන්ධාභිඤ්ඤාය, විපරීත වශයෙන් සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා ද වේ. පරිත්ත කසිණය ඉගිළූ ආකාසයෙහි පැවති විඤ්ඤාණාපගම අරමුණ හෙයින් පරිත්තරම්මණතාය, විපරීත වශයෙන් අප්පමාණාරම්මණතාව ද දතයුතුයි. සෙස්ස පෙර හා සමාන ම ය.

ආකිඤ්චායතනං සමතික්කම්මා යන මෙහි ද පළමු කී නයින් ම ආකිඤ්චඤ්ඤං ආයතනයනමස්ස අධිට්ඨානෙන යනු මොහුගේ ධ්‍යානයත් ආකිඤ්චඤ්ඤායතනය යි. කියන ලද නයින්ම අරමුණත් එසේ ය. මෙසේ මේ ධ්‍යානයත් අරමුණත් යන දෙකම නො පැවතීම කිරීමෙන් ද මෙනෙහි

නො කිරීමෙන් ද ඉක්මවා ද යම්හෙයකින් මේ නේවසඤ්ඤානාසඤ්ඤායතනයට සපැමිණ වාසය කළයුතුයි. එහෙයින් මේ දෙකම එක්කොට **ආකිඤ්චඤ්ඤායතනං සමතික්කම්මා** යන මෙය කියන ලදැයි දතයුතුයි.

**නෙවසඤ්ඤානාසඤ්ඤායතන සඤ්ඤාසහගතං** යන මෙහි වනාහි ඒ සංඥාවගේ ස්වභාවයෙන් එය නේවසඤ්ඤානාසඤ්ඤායතන යැයි කියනු ලැබේ. යම් අයුරකින් පිළිපන්නෙකුට ඒ සංඥාව වේද පළමු ව එය දැක්වීමට විභංගයෙහි 'නෙවසඤ්ඤී හොති' යැයි උපුට ඒ ආකිඤ්චඤ්ඤායතනය ම ශාන්ත වශයෙන් මෙනෙහි කරයිද සංස්කාරාවශේෂ සමාපත්තිය වඩයි ද එහෙයින් නේවසඤ්ඤී නාසඤ්ඤී යැයි කියනු ලැබේ යැයි කියන ලදී. එහි **සන්තතො මනසිකරොති** යනු මේ සමාපත්තිය ඒකාන්තයෙන් ශාන්ත ය. එහි වනාහි නත්‍ථිභාවය ද අරමුණුකොට සිටීයැයි මෙසේ ශාන්ත අරමුණු ඇති හෙයින් එය ශාන්ත යැයි මෙනෙහි කරයි. ශාන්ත වශයෙන් හෝ මෙනෙහි කරයි. කෙසේ නම් සමතික්‍රමය වේ ද? ආවර්ජනයට නොනැවති බැවිනි. හෙතෙම වනාහි යම්ලෙසකින් එය මෙනෙහි කරයිද, ඉක්බිති ඔහුට මම මෙය ආවර්ජනය කරමි. සමවදිමි. අධිෂ්ඨාන කරමි. නැගිටිමි. ප්‍රත්‍යවේක්ෂා කරමි යන මේ සිතාබැලීමක් එක්තැන් කිරීමක් මෙනෙහි කිරීමක් නො වේ. කවරහෙයින් ද? ආකිචඤ්ඤායතනයට වඩා නේවසඤ්ඤා, නාසඤ්ඤායතනයේ අතිශයින් ම ශාන්ත අතිශයින් ම ප්‍රණීතතාව නිසා ය. යම්සේ වනාහි මහත් වූ රාජානුභාවයෙන් යුත් රජ ඇතුපිට නැඟී නුවර වීථියෙහි හැසිරෙනුයේ එක් වස්ත්‍රයක් දැඩිව හැඳ එකකින් හිස වෙළා දත්සුනු ආදිය තැවරුණු ශරීර ඇති නොයෙක් දළ කැටයම් ආදිය කරන දන්තකාරාදී ශිල්පීන් දැක බොලව් ඒකාන්තයෙන් පුදුමයි. දක්‍ෂ ආචාර්යවරු මෙබඳු වූද ශිල්ප කරන්නෝ යැයි මෙසේ ඔවුන්ගේ දක්‍ෂතාවෙහි සතුටු වෙයි. ඔහුට මම රාජ්‍යය හැර මෙබඳු වූ ශිල්පියෙක් වන්නේ නම් ඉතා හොඳය යන මෙබඳු අදහසක් නො වන්නේ ය. එයට හේතු කවරේ ද? රාජ්‍යශ්‍රීයෙහි මහානිසංසතාවෙනි. හෙතෙම ශිල්පීන් ඉක්මවාම යයි. මෙපරිද්දෙන් මෙතෙම ඔහුට මම මේ සමාපත්තිය ආවර්ජනා කරමි. සමවදිමි. අධිෂ්ඨාන කරමි. නැගිටිමි. ප්‍රත්‍යවේක්ෂා කරමියි යන මේ සිතාබැලීමත් සිත එක්තැන් කිරීමත් මෙනෙහි කිරීමත් නොවේ ම ය. හෙතෙම එය ශාන්ත වශයෙන් මෙනෙහි කරනුයේ පළමු කී නයින් ම ඒ අතිශයින් ම සියුම් සමාධිගත සංඥාවට පැමිණෙයි. හෙතෙම නේවසඤ්ඤී-

නාසඤ්ඤී නම් වෙයි. සංස්කාරාවශේෂ සමාපත්තිය යනු අතිශයින් ම සියුම් බවට පැමිණි සංස්කාර ඇති චතුර්ථ අරූප සමාපත්තියයි.

දැන් මෙසේ අධිගම කළ සංඥාවෙහි වශයෙන් යම් ඒ නේවසඤ්ඤානාසඤ්ඤායතනය යැයි කියනු ලැබේද, එය අර්ථ වශයෙන් දක්වන්නට නේවසඤ්ඤානාසඤ්ඤායතන යනු නේවසඤ්ඤානාසඤ්ඤායතනයට සමවැදුණහුගේ හෝ පැමිණියහුගේ හෝ මෙලොව සැපවිහරණයෙහි යෙදුණෙකුගේ හෝ චිත්ත චෛතසික ධර්මයෝයැයි කියන ලදී. ඔවුනතුරෙන් මෙහිදී සමවැදුණහුගේ චිත්ත චෛතසික ධර්මයෝ අභිප්‍රේතයහ. මෙහි වචනාර්ථය වනාහි ඖළාරික සඤ්ඤාවගේ අභාවයෙන් ද සියුම් සඤ්ඤාව හෝ ඇති බැවින් ද මේ සය සම්ප්‍රයුක්ත ධර්මයන්ගෙන් යුත් ධ්‍යානයට සංඥා නැත්තේය. අසංඥ ද නොවේ යනු = නේවසඤ්ඤානාසඤ්ඤාය, ඒ නේවසඤ්ඤානාසඤ්ඤායතනය ද මනායතන ධම්මායතනයන්හි ඇතුළත් හෙයින් ආයතන ද වේ යනු = නේවසඤ්ඤානාසඤ්ඤායතනය, නොහොත් මෙහි යම් සංඥාවක් වේද, එය පටු සංඥා කෘත්‍යයක් කරන්නට අසමර්ථ හෙයින් නේවසඤ්ඤාය, සංස්කාරවශේෂ සූක්ෂම භාවයෙන් (සංඥාවක්, විද්‍යාමාන හෙයින් නාසඤ්ඤා යැයි නේවසඤ්ඤානාසඤ්ඤාය, නේවසඤ්ඤානාසඤ්ඤ ද වූ එය සෙසු ධර්මයන් අධිෂ්ඨානාර්ථයෙන් ආයතන ද වෙයි යනු = නේවසඤ්ඤානාසඤ්ඤායතනයයි, හුදෙක් මෙහි සංඥාව පමණක් මෙබඳු නොවේ. එසේ ම වේදනාව ද වේදනාත් නොවේ. වේදනා නොවන්නෙත් නොවේ. සිත ද සිතක් නොවේ. සිත නො වන්නේ ද නොවේ. ස්පර්ශය ද ස්පර්ශයත් නොවේ. ස්පර්ශ නො වන්නේ ද නොවේ. සෙසු සම්ප්‍රයුක්ත ධර්මයන්හි ද මේ නයම ය. මේ දේශනාව වනාහි සංඥාව මුල්කරගෙන කරන ලදැයි දතයුතුයි.

පාත්‍රයෙහි තවරන කෙල ආදිකොට ඇති උපමාවලින් මේ අර්ථය පැහැදිලි කරගත යුතුයි. සාමණේර නමක් වනාහි පාත්‍රයේ තෙල් තවරා තැබී ය. කැඳ වළඳන වෙලාවෙහි තෙරණුවෝ පාත්‍රය ගෙනෙවයි සාමණේර නමට කීහ. සාමණේර නම පාත්‍රයෙහි තෙල් ඇතැයි කී ය. සාමණේරය, එසේ නම් ගෙනෙන්න. තෙල් බෝතලය පුරවමුයි කී කල්හි ස්වාමීනි, නැතැයි කීය. යම්සේ එහි ඇතුළත තැවරී ඇති හෙයින් කැඳත් සමග නො ගැළපෙන හෙයින් තෙල් ඇත්තේ ද වෙයි. බෝතලය පිරවීම ආදියට (අභාව) වශයෙන් නැත්තේ ද වෙයි. මෙසේ ඒ සංඥාව ද පටු

සංඥා කෘත්‍යයක් කරන්නට අසමර්ථ හෙයින් නේවසඤ්ඤාය, සංස්කාරාවශේෂ සූක්ෂම බැවින් විද්‍යමාන නිසා නාසඤ්ඤා වේ. මෙහි වනාහි සංඥාකෘත්‍යය යනු කුමක් ද? අරමුණ හැඳිනගැනීම මෙන්ම විදර්ශනාවේ ද විෂයභාවයට පැමිණ කළකිරීම ඇතිකිරීම ද සිහිල්දියෙහි දැවීම් කිස මෙන් තේජෝධාතුව හැඳිනගැනීම් කිස පවා මේ සංඥාව දක්‍ෂව කරන්නට නො හැක්කේ වෙයි. සෙසු සමාපත්තීන්හි සංඥාව මෙන් විදර්ශනාවෙහි විෂයභාවයට පැමිණ නිර්වේදජනනය කිරීමටද නො හැක්කේ ය. අන්‍ය ස්කන්ධයන්හි නො කළ පිවිසීම් ඇති භික්‍ෂුව නේවසඤ්ඤානාසඤ්ඤායතන ස්කන්ධයන් සම්මර්ශනය කොට කළකිරීමට පත්වීමට සමර්ථ නම් නැත. තවද ශාරිපුත්‍රා යුෂ්මතුන් වහන්සේ ප්‍රකෘතියෙන් විදර්ශකයාන කෙනෙකි. මහාප්‍රාඥයාණ කෙනෙකි. ශාරිපුත්‍රයන් සමාන කෙනෙක් ම හැකිවෙත්, හෙතෙමේ ද මේ ධර්මයෝ වනාහි මෙසේ නැති වී හටගනිත් හටගෙන නැතිවෙත් නැසෙත්යැයි මෙසේ කලාප සම්මර්ශන වශයෙන් ය. අනුපද ධර්ම විදර්ශනා වශයෙන් නොවේ. මේ සමාපත්තිය මෙසේ සියුම්බවට පැමිණියේ ය.

යම්සේ පාත්‍රයෙහි තැවරුණු තෙලෙහි උපමාවෙන් විස්තර කරන ලදද, එසේම මාර්ගයෙහි දිය උපමාවෙන් ද මේ අර්ථය විස්තර කළ යුතුයි. මාර්ගයට පිළිපන් තෙරනමකගේ ඉදිරියෙන් වඩනා සාමණේරනමක් දිය ස්වල්පයක් දැක ස්වාමීනි, වතුර, පාවහන් ඉවත්කරන්නැයි කීහ. ඉක්බිති තෙරුන් වහන්සේ ජලය තිබේ නම් දියසළුව ගෙනෙන්න නාමුයැයි කී කල්හි නැත ස්වාමීනියි කීහ. මෙහිදී යම්සේ පාවහන් තෙමෙන (පමණ) යන අර්ථයෙන් ජලය ඇත්තේයැයි වේද නෑමේ අර්ථයෙන් නැතැයි වේද, මෙසේ ද ඒ සංඥාව පටු සංඥා කෘත්‍යයක් කරන්නට අසමත් බැවින් නේවසඤ්ඤාය, සංස්කාරවශේෂ සූක්‍ෂමතාවෙන් විද්‍යමාන හෙයින් නාසඤ්ඤා ද වෙයි. හුදෙක් මොවුන් සමග පමණක් නොවේ. අන්‍ය වූද අරූප උපමාවන් සමගද මේ අර්ථය විස්තර කළයුතුයි. මෙසේ මේ නේවසඤ්ඤානාසඤ්ඤායතනයෙහි පැවති සංඥාව සමග හෝ නේවසඤ්ඤානාසඤ්ඤායතන වූ සංඥාව සමග හෝ සහගත වූයේ යනු නේවසඤ්ඤානාසඤ්ඤායතන සඤ්ඤා සහගතය. ආකිඤ්චඤ්ඤායතන සමාපත්තිය අරමුණු කරගත් ධ්‍යානයට මේ නමකි. මෙහිදී ආකිඤ්චඤ්ඤා-යතන සමාපත්තිය පිළිබඳ ආශාව නැතිකිරීම දුක් බැවින් දුක්ඛා පටිපදා වෙයි. නැතිකරන ලද තෘෂ්ණාව පිළිබඳ අර්පණාපරිවාස දන්ධත්වයෙන් දන්ධාභිඤ්ඤා වෙයි. විපරීත වශයෙන් සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා ද

වෙයි. පරිත්ත කසිණය ඉගිළු ආකාසයෙහි පැවති විඤ්ඤාණාපගත අරමුණු කරගත් සමාපත්තිය අරබයා පැවති හෙයින් පරිත්තාරම්මණතාය, විපරීත වශයෙන් අප්පමාණාරම්මණතාව දතයුතුයි. සෙස්ස පෙරසේ ම ය.

**අසදිසරූපො නාථො ආරුප්පං යං චතුබ්බිධං ආහ**
**තං ඉති ඤත්වා තස්මිං පකිණ්ණක කථා පි විඤ්ඤෙය්‍යා**

අසමාන රූප ඇති නාථ වූ බුදුරජාණන් වහන්සේ චතුර්විධ වූ යම් අරූප සමාපත්තියක් වදාළ සේක් ද, එහිදී එය මෙසේ දැන ප්‍රකීර්ණක කථා ද දතයුතුයි.

අරූප සමාපත්තීහු වනාහි :-

**ආරම්මණාතික්කමතො චතස්සොපි භවන්තිමා**
**අංගාතික්කම මෙතාසං න ඉච්ඡන්ති විභාවිනො**

ආරම්මණාතික්‍රම වශයෙන් භවත්තිම වූ අරූප සමාපත්තීහුද සතර දෙනෙකි. පණ්ඩිතයෝ මොවුන්ගේ අඞ්ගාතික්‍රමය නො කැමති වෙත්.

මොවුනතුරෙන් වනාහි රූප නිමිත්ත අතික්‍රමයෙන් පළමුවැන්න ද, ආකාශාතික්‍රමයෙන් දෙවැන්න ද ආකාශයෙහි පැවති විඤ්ඤාණාතික්‍රමයෙන් තුන්වැන්න ද ආකාශයෙහි පැවති විඤ්ඤාණයාගේ අපගම අතික්‍රමයෙන් සතරවැන්නදැයි මෙසේ සර්වප්‍රකාරයෙන් ආරම්මණා වශයෙන් භවත්තිම වූ අරූප සමාපත්ති සතරම දතයුතුයි. පණ්ඩිතයෝ වනාහි මොවුන්ගේ අංගතික්‍රමය නො කැමති වෙත්. රූපාවචර සමාපත්තීන්හි මෙන් මේ සමාපත්තීන්හි අංගාතික්‍රමයක් නොමැත. මේ සියල්ලෙහි ම වනාහි උපෙක්ඛා චිත්තෙකග්ගතා යන ධ්‍යානාංග දෙකක් ම වෙයි. එසේ ඇතිකල්හිදු :-

**සුපණීතතරා හොන්ති පච්ඡිමා ඉධ**
**උපමා තත්ථ විඤ්ඤෙය්‍යා පාසාදතල සාටිකා**

මෙහි පශ්චිම පශ්චිමයෝ අතිශයින් ම ප්‍රණීත වෙත්. එහි පාසාදතල සාටිකා උපමාව දතයුතුයි.

යම්සේ වනාහි සිව්බුමුපායෙක යටම තලයෙහි දෙව්මුවා නැටුම් ගැයුම් වැයුම් මනාසුවඳ මල් මිහිරි රස පාන බොජුන් යහන් ඇඳුම් වශයෙන් ප්‍රණීත පංචකාම ගුණයෝ එළඹ සිටියෝ වෙත් ද දෙවන තලයෙහි ඊට වඩා ප්‍රණීතතරය. තුන්වැන්නෙහි ඊටත් වඩා ප්‍රණීතතමය. සතරවැන්නෙහි සියල්ලට ම වඩා ප්‍රණීතය. එහි ඒ සතරම ප්‍රාසාදතලයෝ ය. ප්‍රසාදතල භාවයෙන් ඔවුන්ගේ කිසිදු වෙනසක් නැත. පංචකාමගුණ සමෘද්ධිය වශයෙන් වනාහි යටමහලින් (යටමහලින්) මතුමත්තට ප්‍රණීතතර වෙයි. එසේම එක් ස්ත්‍රියකට කටින ලද ස්ථූල සියුම් සියුම්තර සියුම්තම නූලින් කළ පලම් සතර පලම් තුන පලම් දෙක පලම් එක (බරින් යුතු) දිගින් ද පළලින් සසමාන ප්‍රමාණයෙන් යුත් සළු විය. ඒ සළු සතර ම දිගින්ද පළලින් ද සමප්‍රමාණ බැවින් ඒවා ප්‍රමාණයෙන් වෙනසක් නැත. සුවපහසින් සියුම් බැවින් හා මහ බැවින් වනාහි පළමු පළමු වස්ත්‍රයන්ට වඩා පසු පසුව කී වස්ත්‍ර ප්‍රණීතතර වෙයි. මෙපරිද්දෙන් ම මේ සතරෙහි ද උපේක්ෂා ඒකාග්‍රතාව ද මේ අංග දෙකින් ම යුක්ත වෙයි. එහෙයින් භාවනා වශයෙන් ඒ අංගයන්ගේ ප්‍රණීත ප්‍රණීතතර භාවයෙන් සුප්‍රණීතතර වෙයි. පශ්චිම පශ්චිම අංග මෙහි ද දතයුතුයි. මෙසේ පිළිවෙළින් ප්‍රණීත ප්‍රණීත වන මේ අංග :-

**අසුචිම්හි මණ්ඩපෙ ලග්ගො එකො තන්නිස්සිතො පරො,**
**අඤ්ඤො බහි අනිස්සාය තං තං නිස්සාය චාපරො**
**ඨිතො චතූහි එතෙහි පුරිසෙහි යථාක්කමං**
**සමානතාය ඤාතබ්බා චතස්සොපි විභාවනා**

අසූචි සහිත ප්‍රදේශයක මඩුවෙක අසූචියෙහි ඇලුණු එකෙකි, අනෙකා ඔහු ඇසුරු කෙළේ ය. අනෙකා ඔහු ඇසුරු නොකොට පිටත ද තවෙකෙක් ඔහු ඇසුරු කොට ද සිටියේ ය. මේ පුරුෂයන් සතරදෙනාගෙන් සමානත්වයේ විස්තර පිළිවෙළින් දතයුතු යි.

මේ එහි අර්ථ යෝජනාවයි. අශුචි ප්‍රදේශයක වනාහි එක් මඩුවක් වෙයි. ඉක්බිති එක් පුරුෂයෙක් අවුත් ඒ අශුචිය පිළිකුල් කරමින් ඒ මඩුව අතින් එල්බගෙන එහි ඇලී ඇලුණකු මෙන් සිටියේ ය. ඉන් තවත් එකෙක් අවුත් ඒ මඩුවෙහි ඇලුණු පුරුෂයා ඇසුරු කෙළේ ය. නැවත අනිකෙක් අවුත් මෙසේ සිතී ය. මේ මඩුවෙහි ඇලුණු පුරුෂයාත් ඔහු ඇසුරු කළ පුරුෂයාත් යන මේ දෙදෙනා ම නපුරු ලෙස සිටියාහු ය.

ඔවුන් මඩුව පල්ලට වැටීම ඒකාන්ත ය. එහෙයින් මම පිටත ම සිටිමියි, හෙතෙම ඔහු ඇසුරු කළහු ඇසුරු නොකොට පිටත ම සිටියේ ය. ඉන්පසු වෙනත් අයෙක් අවුත් මඩුවෙහි ඇලුණාහුගේත් ඔහු ඇසුරු කළහුගේත් බිය සහිත බව සිතා පිටත සිටියහු මනාව සිටි බව ද දැන ඔහු ඇසුරුකොට සිටියේ ය. එහි අශුචි ප්‍රදේශයෙහි මඩුව මෙන් කසිණය ඉගිළූ ආකාසය දතයුතු ය. අශුචියට පිළිකුලින් මඩුවෙහි ඇලුණු පුරුෂයා මෙන් රූපනිමිත්තෙහි පිළිකුලින් ආකාසය අරමුණු කරගත් ආකාසානඤ්චායතනය දතයුතුයි. මඩුවෙහි ඇලුණු පුරුෂයා ඇසුරුකළහු මෙන් ආකාසය අරමුණු කරගත් ආකාසානඤ්චායතනය අරබයා පැවති විඤ්ඤාණඤ්චායතනය දතයුතුයි. ඒ දෙදෙනාගේ ම බිය සහිත බව සිතා මඩුවෙහි ඇලුණු ඔහු ඇසුරු නොකොට පිටත සිටියහු මෙන් ආකාසානඤ්චායතනය දතයුතුයි. මඩුවෙහි ලැග්ගහුගේ ද ඔහු ඇසුරු කළහුගේ ද බිය සහිත බව සිතා පිටත සිටියහු මනාව සිටියේයැයි දැන ඔහු ඇසුරුකොට සිටියහු මෙන් විඤ්ඤාණභාව සංඛ්‍යාත පිට පෙදෙසෙහි සිටි ආකිඤ්චඤ්ඤායතනය අරබයා පැවති නේවසඤ්ඤානාසඤ්ඤායතනය දතයුතුයි. මෙසේ පවත්නා වූ ද,

> ආරම්මණං කරොතෙව අඤ්ඤාභාවෙන තං ඉදං
> දිට්ඨදොසම්පි රාජානං වුත්තිහෙතු යථාජනො

ඒ නේවසඤ්ඤානාසඤ්ඤායතනය අනෙකක් නැති බැවින් මේ ආකිඤ්චඤ්ඤායතනය ඇසුරු කෙරේමය. යම්සේ ජනයා පැවැත්ම හේතුවෙන් දක්නා ලද දොස් ඇත්තා වූද රජු ඇසුරු කරන්නාක් මෙනි.

මේ නේවසඤ්ඤානාසඤ්ඤායතනය වනාහි මේ සමාපත්තිය ආසන්න විඤ්ඤාණඤ්චායතනයට සතුරු යැයි මෙසේ දක්නා ලද දොස් ඇති ආකිඤ්චඤ්ඤායතනය වෙනත් අරමුණක් නැතිහෙයින් අරමුණු කෙරේමය, කුමක් මෙන්ද? දිට්ඨදොසම්පි රාජානං වුත්තිහෙතු යථාපනො (යනුවෙන්) යම්සේ වනාහි අසංයත වූ ඵරුෂ වූ කාය වාක් මනෝ සමාචාර ඇති මුළු දිවයිනට ම අධිපති වූ කිසියම් රජෙකු මෙතෙම ඵරුෂ සමාචාර ඇත්තේයැයි මෙසේ දක්නා ලද දොස් ඇතිව ද අන්තැනක වෘත්තියක් නො ලබන්නා වූ ජනයා වෘත්ති හේතුව ඇසුරුකොට පවතී. මෙසේ දක්නා ලද දොස් ඇතිව ද ඒ ආකිඤ්චඤ්ඤායතනය අන් අරමුණක්

නො ලබන මේ නේවසඤ්ඤානාසඤ්ඤායතනය අරමුණු කෙරේමය. මෙසේ කරන්නා වූ ද,

ආරූළ්හො දීඝ නිසෙසණිං යථා නිසෙසණිබාහුකං
පබ්බතග්ගඤ්ච ආරූළ්හො යථාපබ්බතමත්ථකං

යථා වා ගිරිමාරූළ්හො අත්තනො යෙව ජණ්ණුකං
ඔලුබ්භති තමථ්වෙතං ඣාන මොලුබ්භ වත්තතී ති

දිග ඉනිමඟකට නැගුණේ යම්සේ ඉනිමං අත එල්බගනී ද පර්වත මුදුනකට නැගුණේ පර්වත මුදුන එල්බගනීද ගල්මුදුනකට නැගුණේ යම්සේ තමාගේ දණ ම එල්බේද එසේම මෙය ද ධ්‍යානය අරමුණුකොට පවතී යනුයි.

අරූප කුසල කථා නිමියේ ය.

දැන් යම්හෙයකින් මේ සියලු ම ත්‍රෛභූමක කුශලයෝ හීනාදී ප්‍රභේදයෙන් යුතුව පවතිත් ද, එහෙයින් ඔවුන්ගේ ඒ ප්‍රභේදය දක්වන්නට නැවත කතමෙ ධම්මා කුසලා යන ආදිය පටන්ගන්නා ලදී. එහි හීන ලාමකය. එය රැස්කිරීම් වශයෙන් දතයුතුයි. හීන උත්තම මධ්‍යයෙහි වූයේ මධ්‍යමය, ප්‍රධානත්වයට පමුණුවන ලද්දේ ප්‍රණීතය, උත්තම යන අර්ථයි. ඒවාද ආයූහන වශයෙන් දතයුතුයි. යමෙකුගේ වනාහි ආයූහණක්ෂණයෙහි ඡන්දය හෝ වීර්යය හෝ චිත්තය හෝ වීමංසාව හෝ හීන වේද, එය හීන නම්. යමෙකුගේ ඒ ධර්මයෝ මධ්‍යම ද ප්‍රණීත ද වෙත් ද ඒ මධ්‍යම ද ප්‍රණීත ද වෙයි. යමක් වනාහි කත්තුකම්මතා නම් වූ ඡන්දය, ප්‍රධාන වූ ඡන්දය, ජ්‍යෙෂ්ඨ වූ ඡන්දය පූර්වාංගම කොට රැස්කරන ලදද, එය ඡන්දාධිපත්‍යයෙන් ආ හෙයින් ඡන්දාධිපතෙය්‍ය නම්. විරියාධිපතෙය්‍ය ආදියෙහි ද මේ නය ම ය.

මෙතැන සිට වනාහි නය ගණනය කළයුතුයි. සියල්ලට වනාහි බෙදන ලද්දේ එකම නයකි. හීන යනු එකකි. මධ්‍යම යනු එකකි. ප්‍රණීත යනු එකකි. ඡන්දාධිපතෙය්‍ය යනු එකකි. මේ වනාහි ඡන්දාධිපතෙය්‍ය

පංච නයයි. මෙසේ විරියාධිපතෙය්‍ය ආදියෙහි ද පංචක සතරක් වශයෙන් විස්සක් වෙයි. පළමුවැන්න එක් සුද්ධික නයකි. හීනං යනාදී තුනෙකි. දොළොසක්දැයි මෙසේ ද නය විස්සක් වේ. මේ මහානය විස්ස කොහිදී බෙදන ලදද යත්? මහා ප්‍රකරණයෙහි හීනත්‍රිකයේදී බෙදන ලදී. මෙතැනදී වනාහි හීනත්‍රිකයෙන් මධ්‍යම රාශිය ගෙන හීන මධ්‍යම ප්‍රණීත වශයෙන් කොටස් තුනක් කළයුතුයි. එයින් ද මධ්‍යම රාශිය හැර හීනප්‍රණීත රාශි ගෙන කොටස් නවය නවය වශයෙන් කළයුතුයි. හීනයෙහි ම වනාහි හීනයක් ඇත. මධ්‍යමයත් ඇත. ප්‍රණීතයත් ඇත. ප්‍රණීතයෙහි ද හීනයත් ඇත. මධ්‍යමයත් ඇත. ප්‍රණීතයත් ඇත. ප්‍රණීතයෙහි ද හීනයත් ඇත. මධ්‍යමයත් ඇත. ප්‍රණීතයත් ඇත. එසේ ම හීන හීනයෙහි හීනය, හීන හීනයෙහි මධ්‍යමය, හීන හීනයෙහි ප්‍රණීත ය, හීන මධ්‍යමයෙහි හීන ය, හීන මධ්‍යමයෙහි මධ්‍යම ය, හීන මධ්‍යමයෙහි ප්‍රණීත ය. හීන ප්‍රණීතයෙහි හීන ය, හීන ප්‍රණීතයෙහි මධ්‍යම ය, හීන ප්‍රණීතයෙහි ප්‍රණීතය යැයි මේ එක් නවකයෙකි. ප්‍රණීත හීනයෙහි ද හීනයක් නම් ඇත. ප්‍රණීත හීනයේ ද මධ්‍යමයෙක, ප්‍රණීත මධ්‍යමයෙහි හීනයක, ප්‍රණීත මධ්‍යමයෙහි මධ්‍යම ය, ප්‍රණීත මධ්‍යමයෙහි ප්‍රණීත ය, ප්‍රණීත ප්‍රණීතයෙහි හීන ය, ප්‍රණීත ප්‍රණීතයෙහි මධ්‍යමය, ප්‍රණීත ප්‍රණීතයෙහි ප්‍රණීතයැයි මේ දෙවන නවකයැයි නවක දෙකකි. දහඅටකි. මේ දහඅට කර්මද්වාර නම්. මොවුන්ගෙන් ප්‍රභාවිත හෙයින් මොවුන්ගේ වශයෙන් ක්‍ෂත්‍රියෙන් දහඅටෙක බමුණෝ දහඅටෙක වෛශ්‍යයෝ දහඅටෙක ශුද්‍රයෝ දහඅටෙක (මෙසේ) හතළිස් අටක් ගෝත්‍ර චරණයෝ දතයුත්තාහ.

මේ ත්‍රෛභූමක කුශලයන් අතුරෙන් කාමාවචර කුශලය වනාහි ද්වි හේතුක ද ත්‍රිහේතුක ද වෙයි. රූපාවචරය ඥාන සම්ප්‍රයුක්ත විප්‍රයුක්ත වශයෙන් රූපාවචරය වනාහි ත්‍රිහේතුකමය, ඥාන සම්ප්‍රයුක්තමය, මෙහිදී කාමාවචරය අධිපතියා සමග ද අධිපතියාගෙන් තොරව ද උපදී. රූපාවචර අරූපාවචර අධිපති සම්පන්න ම වෙයි. මෙහි කාමාවචර කුශලයෙහි ද ආරම්මණාධිපති සහජාතාධිපති යන අධිපතීහු දෙදෙනා ම ලැබෙත්. රූපාවචර අරූපාවචරයන්හි ආරම්මණාධිපති නොලැබෙයි. සහජාතාධිපති ම ලැබෙයි. එහි සිත පිළිබඳව සිතේ අධිපති බව සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ වශයෙන් කියන ලදී. සිත්දෙක එකට නොවීමෙන් සම්ප්‍රයුක්ත සිතට චිත්තාධිපති නම් නැත. ඡන්දාදීන්ට ඡන්දාධිපති ආදිය ද එසේය. ඇතැම් අයෙක් වනාහි සිත ඇත්තහුට කුසල් වේ නම් මටත් වන්නේ යැයි මෙසේ යම් සිතක් ප්‍රධාන කොට ජ්‍යෙෂ්ඨ කොට වෙනත් කුසල්

සිතක් එක්කරන ලද ද, ඔහුගේ ඒ පළමු සිත චිත්තාධිපති නම් වෙයි. එයින් ආ හෙයින් මෙය චිත්තාධිපතෙය්‍ය නමැයි මෙසේ ආගමන වශයෙන් ද අධිපති නම් කැමති වෙත්, මේ නය වනාහි පාළියෙහි වත් අටුවාවෙහි වත් නො දැක්වේ. එහෙයින් කියන ලද නයින් ම අධිපතිභාවය දතයුතුයි. මේ එකුන්විසි මහ නයෙහි ද පළමු සුද්ධිකනයෙහි කියන ලද ප්‍රමාණ ම සිත් ද නවක ද පාඨවාර ද වෙයි. එහෙයින් ඥාන සම්ප්‍රයුක්තයන්හි කියන ලද ප්‍රමාණයට වඩා චිත්ත නවකවාර භේදයෙහි විසිගුණයක් ද ඥාන සම්ප්‍රයුක්ත සතරෙහි සොළොස් ගුණයක් ද දතයුතුයි. මේ ත්‍රෛභූමක කුශලයෙහි ප්‍රකීර්ණක කථා නමි.

### ත්‍රෛභූමක කුශලය නිමියේ ය.

මෙසේ භවත්‍රය පිළිබඳ සම්පත් නිපදවන කුසල් දක්වා දැන් සියලු භවයන් ඉක්මවීම පිණිස ලෝකෝත්තර කුසල් දැක්වීමට නැවත **කතමෙ ධම්මා කුසලා** යන ආදිය පටන් ගන්නා ලදී. එහි **ලොකුත්තරං** යනු කවර අර්ථයකින් ලෝකුත්තර ද, ලෝකය තරණය කරයි යනු = ලොකුත්තරය, ලෝකය එතරකරයි යනු = **ලොකුත්තරය,** ලෝකය සමතික්‍රමණය කොට මැඩගෙන සිටීනුයි = **ලොකුත්තරය,** ධ්‍යානය වඩයි යනුදු ඒකචිත්ත ක්ෂණික අර්පණාධ්‍යානය (වඩයි) උපදවයි. වර්ධනය කරයි. ලොවින් නික්මයයි. වෘත්තයෙන් නික්මයයි යනු = **නිය්‍යානිකය,** මෙයින් නික්මවනු ලබයි හෝ = **නිය්‍යානිකය,** එයින් යුත් පුද්ගලයා වනාහි දුක විශේෂයෙන් දන්නේ නික්මෙයි, සමුදය දුරුකෙරෙමින් නික්මෙයි, නිරෝධය සාක්ෂාත් කෙරෙමින් නික්මෙයි. මාර්ගය වඩමින් නික්මෙයි. යම්සේ වනාහි ත්‍රෛභූමක කුශලය සසර චුති ප්‍රතිසන්ධීන් රැස්කෙරෙයි. වඩයි යනු = ආචයගාමී නම් වෙයි. මෙය එසේ නොවේ. මෙය වනාහි යම්සේ ආචයගාමී නම් වෙයි. මෙය එසේ නොවේ. මෙය වනාහි යම්සේ එක් පුරුෂයකු අටළොස් රියන් පවුරක් ගොඩනගද්දී අනෙකක් මහ මුගුරක් ගෙන ඔහු විසින් ගොඩනැගු ගොඩනැගු තැන් බිඳ දමමින් විනාශ කෙරෙමින් ම යෙයි ද, මෙපරිද්දෙන් ත්‍රෛභූමක කුශලය විසින් රැස්කරන ලද චුති ප්‍රතිසන්ධීන් ප්‍රත්‍යය විකල කිරීමෙන් විසුරුවමින් විනාශ කරමින් යෙයි යනු **අපචය ගාමීය, දිට්ඨිගතානං පහාණාය** යන මෙහි දෘෂ්ටීහුම = දිට්ඨිගතයෝ ය. ගුථගතං මුපාගතං යන ආදිය මෙනි, දෙසැට දෘෂ්ටියෙහි

හෝ දෘෂ්ටීන්ට හෝ ඇතුළත් හෙයින් දෘෂ්ටීන්හි ගියාහු යනුදු = දිට්ඨිගතානුගය, දෘෂ්ටිසමාන ගමන් ඇත්තාහ. දෘෂ්ටීන් සමාන පැවතුම් ඇත්තාහ යන අර්ථයි. ඒකවරහු ද? සසම්ප්‍රයුක්ත වූ සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බතපරාමාස අපායගාමිනිය වූ රාග දෝස මෝහ යන අකුසලයෝ ය, ඔවුහු වනාහි ප්‍රථමමාර්ග භාවනාව තෙක් පැවැත්ම සම්භාවිත හෙයින් දෘෂ්ටිසමාන පැවැත්ම ඇත්තාහ යි කියනු ලබත්. මෙසේ දෘෂ්ටීහු ද දෘෂ්ටිගතයෝ ද =දිට්ඨිගතයෝ ය. ඔවුන්ගේ **දිට්ඨිගතානං, පහාණාය** යනු සිඳදැමීම් වශයෙන් ම දුරුකිරීම පිණිස ය. **පඨමාය** යනු ගණන වශයෙන් ද ප්‍රථම උත්පත්ති වශයෙන් ද ප්‍රථම වූ, **භූමියා** යනු 'අනන්තර හිතාය භූමියා' යන ආදීන්හි වනාහි මේ මහපොළොව භූමි යැයි කියනු ලැබේ. 'සුඛභූමියං කාමාවචරෙ' යන ආදීන්හි චිත්තොත්පාදයයි. මෙහි වනාහි ශ්‍රාමණ්‍ය ඵලය අභිප්‍රේතයි. එය වනාහි සම්ප්‍රයුක්තයන්ට නිශ්‍රය බැවින් ඒ ධර්මයෝ මෙහි වෙත් යනු = භූමි ය. යම්හෙයකින් හෝ සමාන වූ ලෝකෝත්තර භාවයන් ඇතිකල්හි තෙමේ ද උපදී. නිවන මෙන් පහළ නොවීමක් නො වේ. එහෙයින් ද භූමි යැයි කියනු ලැබේ. ඒ ප්‍රථම භූමියෙහි, **පත්තියා** යනු ශ්‍රෝතාපත්තිඵලසංඛ්‍යාත වූ ප්‍රථම ශ්‍රාමණ්‍යඵලයට පැමිණීම පිණිස ප්‍රතිලාභය පිණිස යැයි මෙසේ මෙහි අර්ථය දතයුතුයි. **විවිච්ච** යනු සිඳදැමීම් වශයෙන් වන විවේකයෙන් විවේකයට පැමිණ වෙන්ව, දැන් යම්හෙයකින් ලෞකික ධ්‍යානය ද ප්‍රතිපදාවෙන් තොරව සිද්ධ නො වේ නම්, එසේ ඇතිකල්හි ද මෙහිදී ශුද්ධික නය හැර ප්‍රතිපදාව සහිතව ම ලෝකෝත්තර ධ්‍යානය ගරුකොට දේශනා කරනු කැමැත්තෙන් **දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං** යන ආදිය වදාළහ.

එහිදී යමෙක් මුලපටන් ම ක්ලේශයන් විෂ්කම්භනය කරමින් දුකින් සසංඛාරික ව ප්‍රයෝග සහිතව වෙහෙසෙනුයේ විෂ්කම්භනය කෙරේද, ඔහුට දුක්ඛාපටිපදා (වෙයි), විෂ්කම්භනය කරන ලද කෙලෙස් ඇති යමෙක් වනාහි විදර්ශනා පරිවාස වසනුයේ බොහෝ කලෙකින් මාර්ග පහළවීමට පත්වේද, ඔහුට දන්ධාභිඤ්ඤා වෙයි. මෙසේ කිසියම්වාරයක් දුක්ඛාපටිපදා දන්ධාභිඤ්ඤා යැයි නම් කරන ලදී. කවර නම් වාරයක් රුචි කරත් ද, යම්තැනක වරක් විෂ්කම්භනය කරන ලද ක්ලේශයෝ හැසිරෙත් ද, දෙවන වරද විෂ්කම්භනය කරන ලදුව නැවතත් හැසිරෙත් ද, තුන්වෙනු විෂ්කම්භනය කරන ලදුව වනාහි එසේ විෂ්කම්භනය කෙළේම කොට මාර්ගයෙන් වැනසීමට පැමිණෙයි. මේ වාරය රුචි කළහ. මේ වාරයට

දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා යැයි නම් කරන ලදී. මෙපමණකින් වනාහි ප්‍රකට නො වේ. එහෙයින් මෙහිදී මෙසේ මුලපටන් විස්තරය දතයුතුයි.

යමෙක් වනාහි සතරමහා භූතයන් පරීක්‍ෂා කොට උපාදා රූපය පරීක්‍ෂා කරයි, අරූපය පරීක්‍ෂා කරයි, රූපාරූපයන් පරීක්‍ෂා කරනුයේ වනාහි දුකින් කරදරයෙන් වෙහෙස වෙමින් (පරීක්‍ෂා කරන්නට හැකි වෙයි. ඔහුට දුක්ඛා පටිපදා නම් වෙයි. පරිග්‍රහණය කරන ලද රූපාරූපයන් පිළිබඳ විදර්ශනා පරිවාසයෙහි මාර්ගය පහළවීමේ දන්ධතාවෙන් දන්ධාභිඤ්ඤා නම් වෙයි. යමෙක් රූපාරූපයන් පරිග්‍රහණය කොට නාමරූපයන් ව්‍යවස්ථාපනය කරනුයේ දුකින් කරදරයෙන් වෙහෙසෙමින්) ව්‍යවස්ථාපනය කරයි. නාමරූපයන් ව්‍යවස්ථාපනය කළ කල්හි ද විදර්ශනා පරිවාස කරනුයේ දීර්ඝ කාලයකින් මාර්ගය උපදවන්නට හැකිවෙයි. ඔහුට ද දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා වෙයි. තවෙකෙක් නාමරූපයන් ද ව්‍යවස්ථාපනය කොට ප්‍රත්‍යයන් පරිග්‍රහණය කරනුයේ දුකින් කරදරයෙන් වෙහෙසෙමින් පරිග්‍රහණය කරයි. ප්‍රත්‍යයන් ද පරිග්‍රහණය කොට විදර්ශනා පරිවාසයෙහි වෙසෙනුයේ දීර්ඝ කාලයකින් මාර්ගය උපදවයි. මෙසේ ද දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා නම් වෙයි. තවෙකෙක් ප්‍රත්‍යයන් ද පරිග්‍රහණය කොට ලක්‍ෂණයන් ප්‍රතිවේධ කරමින් දුකින් කරදරයෙන් වෙහෙසෙනුයේ ප්‍රතිවේධ කරයි. ප්‍රතිවේධ කරන ලද ලක්‍ෂණ ඇත්තේ ද විදර්ශනා පරිවාස වෙසෙනුයේ දීර්ඝ කාලයකින් මාර්ගය උපදවයි. මෙසේ ද දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා නම් වෙයි. තවෙකෙක් ලක්‍ෂණයන් ද ප්‍රතිවේධ කොට විදර්ශනා ඥානය තියුණුව ශූරව ප්‍රසන්නව උසුලද්දී උපන් විදර්ශනාව පිළිබඳ දැඩි ආශාව හාත්පසින් මඩිමින් දුකින් කරදරයෙන් වෙහෙසෙමින් මැඩලයි. තෘෂ්ණාව ද මැඩලා විදර්ශන පරිවාසය වසනුයේ බොහෝ කලෙකින් මාර්ගය උපදවයි. මෙසේ ද දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා නම් වෙයි. මේ වාරය රුචි කළහ. මේ වාරයට මේ නම කරන ලදී. මේ උපායෙන් ද පර වශයෙන් ප්‍රතිපදා තුනක් දතයුතුයි.

එසෙසාහොති යන ආදීන්හි අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියය සම්මා වාචා සම්මා කම්මන්ත සම්මා ආජීව යන පද සතර අධිකය, නිර්දේශ වාරයෙහි ද විතර්කාදී නිර්දේශයන්හි මග්ගංග යන ආදී පද ද අධිකය. සෙසු සියල්ල යට කියන ලද්ද සමානමය. භූම්‍යන්තර වශයෙන් වනාහි ලෝකෝත්තරතාව ම මෙහි විශේෂයි. එහි අනඤ්ඤාතඤ්ඤස්සාමීතින්ද්‍රියං යන අනමතාග්‍ර සංසාර වෘත්තයෙහි නොදත් අමෘත පදය, චතුරාර්ය

සත්‍ය ධර්මය ම දැනගන්නෙමියි පිළිපන්නහුට මේ පූර්ව සිතා බැලීමෙන් උපන් ඉන්‍ද්‍රියයි. මෙහි ලක්‍ෂණාදිය වනාහි යට ප්‍රඥෙන්‍ද්‍රියයෙහි කියන ලද නයින් ම දතයුතුයි.

සුන්දර වූ හෝ ප්‍රශස්ත වූ වාචාව = **සම්මා වාචාය,** වාග් දුශ්චරිතය උපුටා දැමූ මිථ්‍යා වාචා විරතියට මේ නමකි. එය විමසීම ලක්‍ෂණකොට ඇත්තේ ය. වෙන්වීම රසයකොට ඇත්තේ ය. මිථ්‍යාවාචා ප්‍රහාණය එළඹසිටි කාරණය කොට ඇත්තේ ය. සුන්දර වූ හෝ ප්‍රශස්ත වූ කර්මාන්තය = **සම්මා කම්මන්තය,** මිථ්‍යා කර්මාන්ත සමුච්ඡේදක වූ ප්‍රාණඝාතාදීන්ගෙන් වෙන්වීමට මේ නමකි. එය නැඟීසිටීම ලක්‍ෂණකොට ඇත්තේ ය. වෙන්වීම රසයකොට ඇත්තේ ය. මිථ්‍යා කර්මාන්ත ප්‍රහාණය එළඹසිටි කාරණය කොට ඇත්තේ ය. මිථ්‍යා කර්මාන්ත ප්‍රහාණය එළඹසිටි කාරණය කොට ඇත්තේ ය. සුන්දර වූ හෝ ප්‍රශස්ත වූ ආජීවය = **සම්මා ආජීවයයි.** මිථ්‍යා ආජීවයෙන් වෙන්වීමට මේ නමකි. එය පිරිසිදු බව ලක්‍ෂණකොට ඇත්තේය. න්‍යායාජීව ප්‍රවෘත්තිය රසයකොට ඇත්තේ ය. මිථ්‍යාජීව ප්‍රහාණය එළඹ සිටි කාරණය කොට ඇත්තේ ය. තව ද යට විරතිත්‍රයෙහි කී පරිදි මෙහි ලක්‍ෂණාදිය දතයුතුයි. මෙසේ මේ ධර්මත්‍රයේ වශයෙන් යට කියන ලද මාර්ග පංචකය ද මෙහි මාර්ග අෂ්ටකය ද දතයුතුයි. යේවාපනකයන්හි ද මොවුන්ගේ අභාවය වෙයි. කරුණා මුදිතාවන් පිළිබඳව ද එසේම ය. මේ ධර්ම තුන වනාහි පාළියෙහි ආ හෙයින් ද යේවාපනකයන්හි නොගන්නා ලදී. කරුණා මුදිතා දෙක වනාහි සත්ත්වාරම්මණය, මේ ධර්මයෝ නිර්වාණය අරමුණුකොට ඇත්තාහයි ඒ ධර්මයෝ ද මෙහිදී නො ගන්නා ලදහ. මේ වනාහි උද්දේස වාරයෙහි විශේෂාර්ථයයි.

නිද්දේසවාරයෙහි වනාහි **මග්ගඞ්ගං මග්ගපරියාපන්නං** යන මෙහි වනාහි මාර්ගයා ගේ අංගය යනු = **මග්ගඞ්ගයයි.** මාර්ග කොට්ඨාශය යනු අර්ථයයි. යම්සේ වනාහි ආරණ්‍යයට ඇතුළු වූයේ අරඤ්ඤ පරියාපන්න නම් වේද, මෙසේ මෙසේ මාර්ගයෙහි ඇතුළත් ය යනු = **මග්ග පරියාපන්න ය,** මාර්ගය ඇසුරු කෙළේ යනු අර්ථයයි. **පීති සම්බොජ්ඣඞ්ගො** යන මෙහි ප්‍රීතිය ම සම්බොජ්ඣංගය වූයේ = **පීති සම්බොජ්ඣංගයයි.** මෙහි බෝධියෙහි හෝ බෝධියගේ අංගය යනු බොජ්ඣංගයයි. මෙය කියන ලද්දේ වෙයි. යම් මේ යම් සාමග්‍රියක් වේද එහි ලෝකෝත්තර මාර්ගක්‍ෂණයෙහි උපදනා ථීනමිද්ධ උද්ධච්චයන්ගේ පිහිටීම රැස්කිරීම සාමසුඛය අත්තකිලමථානුයෝග උච්ඡේද ශාස්වත දෘෂ්ටීන්ගේ ඇතුළුවීම

ආදී වූ නොයෙක් උපද්‍රවයන්ට ප්‍රතිපක්ෂ වූ සති ධම්මවිචය විරිය පීති පස්සද්ධි සමාධි උපෙක්ඛා සංඛ්‍යාත වූ ධර්මසාමග්‍රියෙන් ආර්යශ්‍රාවක තෙමේ අවබෝධ කරගනී යැයි (අදහස්) කොට බෝධි යැයි කියනු ලැබේ. බුජ්ඣති යනු කෙලෙස් සිතුවිලි නින්දෙන් නැගිටියි. සතර ආර්ය සත්‍යයන් හෝ ප්‍රතිවේධ කරයි. නිවන ම හෝ ප්‍රත්‍යක්ෂ කරයි. එහෙයින් ධර්මසාමග්‍රී සංඛ්‍යාත බෝධියගේ අංගයයි යනු ද = බොජ්ඣංගය, ධ්‍යානාංග මාර්ගාංගාදිය මෙනි. යම් මේ ආර්යශ්‍රාවකයෙක් කියන ලද ආකාර ඇති මේ ධර්මසාමග්‍රියෙන් අවබෝධ කරගනී යැයි (අදහස්) කොට ආර්ය ශ්‍රාවකයා ද බෝධිය යැයි කියනු ලැබේ. ඒ බෝධිහුගේ අංග යනු ද = බොජ්ඣංගය, සේනාංග රථ ආදිය මෙනි. එහෙයින් අර්ථකථාචාර්යවරු මෙසේ කීහ. 'අවබෝධ කරගන්නා වූ පුද්ගලයාගේ අංගයෝ යනු හෝ = **බොජ්ඣංගයෝ ය**' යනුයි. තව ද බෝධ්‍යාංගයෝ යනු කවර අර්ථයකින් බෝධ්‍යාංගයෝ ද? බෝධිය පිණිස පවතිත් යනු ද = බෝධ්‍යාංගයෝ ය. අවබෝධ කරගනිත් යනු ද = බොජ්ඣංගයෝ ය.අනුබෝධ කරගනිත් යනු ද = බොජ්ඣංගයෝ ය. ප්‍රතිබෝධ කරගනිත් යනු ද = බොජ්ඣංගයෝ ය. මනාසේ අවබෝධ කරගනිත් යනු ද = බොජ්ඣංගයෝ ය යන මේ පටිසම්භිදා නයින් ද බෝධ්‍යාංගාර්ථ දතයුතුයි. ප්‍රශස්ත වූ හෝ සුන්දර වූ බොජ්ඣංගය යනු = සම්බොජ්ඣංගයයි, මෙසේ ප්‍රීතියම සම්බොජ්ඣංගය වූයේ = **පීති සම්බොජ්ඣංග** යයි. චිත්තෛකාග්‍රතා නිර්දේශාදීන්හි ද මේ නයින් ම අර්ථය දතයුතුයි.

**තෙසං ධම්මානං** යනු එසමයෙහි යම් චතුරාර්ය සත්‍ය ධර්මයෝ ප්‍රතිවේධයට පැමිණෙත් ද, ඒ ධර්මයන්ගේ, **අඤ්ඤාතානං** යනු කිසි ලෙසකින් ප්‍රථම මාර්ගයෙන් ඒ ධර්මයෝ අවබෝධ කරගත්තාහු නම් වෙත්. යම්සේ වනාහි ප්‍රකෘති නොපැමිණි විහාරයකට අවුත් විහාර මධ්‍යයෙහි සිටියා වූ ද පුද්ගලයෙක් ප්‍රකෘතියෙන් නො පැමිණි බව සලකා නො පැමිණි තැනකට ආවෙමියි කියයි. යම්සේ ප්‍රකෘතියෙන් නො ලද විරූ මල්දමක් පැළඳ නො හඳනා ලද වස්ත්‍රයක් හැඳ - නො බුදිනා ලද භෝජනයක් අනුභවකොට ප්‍රකෘතියෙන් අනුභව නො කළ බව සලකා නො බුදි බොජුනක් අනුභව කෙළෙමි යි කියයි. මෙසේ මෙහි ද යම්හෙයකින් මේ පුද්ගලයා විසින් මේ ධර්මයෝ අඥාත පූර්වයහ. එහෙයින් **අඤ්ඤාතානං** යැයි කියන ලදී. අදිට්ඨ ආදීන්හි ද මේ නය ම ය.

එහි **අදිට්ඨානං** යනු මින් පෙර ප්‍රඥා ඇසින් නො දුටු ධර්මයන්ගේ,

**අපපත්තානං** යනු අධිගම වශයෙන් නො පැමිණි ධර්මයන්ගේ, **අවිදිතානං** යනු ඥානයෙන් ප්‍රකට නො කළ ධර්මයන්ගේ, **අසච්ඡිකතානං** යනු ප්‍රත්‍යක්ෂ නො කළ ධර්මයන්ගේ, **සච්ඡිකිරියාය** යනු ප්‍රත්‍යක්ෂ කිරීම පිණිස, මේ පදය සමග යම් සේද, සෙසු පද සමග ද මෙසේ අවබෝධ නො කළ ධර්මයන්ගේ (අවබෝධ පිණිස) නො දුටු ධර්මයන් දැකීම පිණිස නො පැමිණි ධර්මයන්ට පැමිණීමට ද නො දත් ධර්මයන් දැනගැනීමට යැයි යෝජනාව කළයුතුයි. චතුහි **වචිදුච්චරිතෙහි** යන ආදීන්හි වචී යනු වාක් විඥප්තිය දතයුතුයි. ත්‍රිවිධ දෝෂයන්ගෙන් යම්කිසිවකින් (සිදුවන) දුෂ්ට හැසිරීම් යනු = දුශ්චරිතයි, වචනයෙන් පවත්වන දුශ්චරිත = වචී දුෂ්චරිතය, වචනයෙන් හෝ උපදනා දුශ්චරිතය = වචී දුශ්චරිතය, ඔවුන්ගෙන් **වචී දුච්චරිතෙහි**, ඇලීමෙන් දුරුව යනු = **ආරති** ය, ඇල්මෙන් තොරව යනු = **විරති ය.** උපසර්ග වශයෙන් පදය වැඩිණ. මේ සියල්ල ම නොඇලෙන බවට නම් ය. වෙන්වීම සිතයි. විනාශ කරයි යනු = **වෙරමණී** මෙය ද නො ඇලීමට ම පරියාය වචනයකි. යම් චේතනාවකින් වනාහි මුසාවාද ආදිය කියනුයේ කරොති (කරයි) නම් මේ ලෝකෝත්තර විරතිය උපදවා ඒ ක්‍රියාව කරන්නට නො දෙයි. ක්‍රියාපථය සිඳී යනු = **අකිරියා ය,** එසේම එම ක්‍රියාව කරන්නට නො දෙයි. ක්‍රියාපථය සිඳ දමයි යනු = අකරණය, යම් චේතනාවකින් චතුර්විධ වාක් දුශ්චරිතය කියනුයේ වරදට පැමිණේ නම්, මෙය ඉපිද එසේ වරදට පැමිණීමට නො දෙයි යනු = **අනජ්ඣාපත්තිය, වෙලා අතික්කමො** යනු මෙහි 'තාය වෙලාය' යන ආදීන්හි වනාහි කාලය වෙලා යනුවෙන් ආයේය, 'උරුවෙලායං විහරති' යන මෙහි රාශියයි. 'ඨිතධම්මො වෙලානාතිවත්ති' යන මෙහි සීමාවයි. මෙහි දර්ශිමාවචය, නො ඉක්මවිය යුතු අර්ථයෙන් වනාහි සතර වචී සුචරිත වෙලා යැයි අදහස් කරන ලදී. මෙසේ යම් චේතනාවකින් සතර වචී දුශ්චරිතයන් කියමින් සීමාව ඉක්මයි නම්, මෙය ඉපිද ඒ සීමාව ඉක්මවන්නට නො දෙයි යනු **වෙලාඅනතික්කමො** යැයි කියන ලදී. විනාශ කෙරේ හෝ **වෙලා ය,** නසයි විනාශ කරයි යන අර්ථයි. කුමක් විනාශ කෙරේ ද? චතුර්විධ වාක් දුශ්චරිතයයි. මෙසේ විනාශ කරන හෙයින් වෙලාය, පුරුෂයාගේ හිතසුව, නො ඉක්මවා පවතී යනු = **අනතික්කමො** ය, මෙසේ මෙහි පද ද්වය වශයෙන් ද අර්ථය දතයුතුයි.

වස්තුව නසයි යනු = **සෙතුඝාතය,** සතර වචී දුශ්චරිතයන්ගේ පද ඝාත ප්‍රත්‍යය ඝාතය යන අර්ථය, මෙහි ප්‍රත්‍යය වනාහි සෙතු යැයි අදහස් කරන ලදි. මේ එහි වචනාර්ථයි. රාගාදීහු චතුර්විධ වාක් දුශ්චරිතයන්ට

ප්‍රත්‍යය, පුද්ගලයා සසර රඳවයි. බදී යනු = සෙතු ය, සේතුව ඝාතනය කරනුයේ = **සෙතුඝාතය,** වාක් දුශ්චරිත (ප්‍රත්‍යය) උපුටා දමන විරතියට මෙය නමකි. සම්මා වාචා සංඛ්‍යාත මේ විරතිය වනාහි පූර්වභාගයෙහි නොයෙක් සිත්හි ලැබේ. මුසාවාදා විරමතිය වනාහි අන්‍ය වූ සිතත් සමග ම ය. පේසුඤ්ඤාදිය අනෙකක් සමගය, ලෝකෝත්තර මාර්ගක්ෂණයෙහි වනාහි එක් චිත්තක්ෂයෙහි ම ලැබේ. චතුර්විධ වචී දුශ්චරිත චේතනාවගේ පදච්ඡේදය කරන මාර්ගාංගය පුරන එක ම එකම විරතියක් උපදී. **කාය දුච්චරිතෙහි** යනු කයින් පවත්වන කයින් නිෂ්පාදිත හෝ ප්‍රාණඝාතාදී දුශ්චරිතවලින්, සෙස්ස පළමු නයින් ම දතයුතුයි. සම්මා කම්මන්ත සංඛ්‍යාත මේ විරතිය ද පූර්වභාගයෙහි නානාසිත්හි ලැබේ. පාණාතිපාතා විරමතිය වනාහි අන් සිතක් සමග ම ය. අදින්නාදාන මිථ්‍යාචාරයන් අනිකක් සමගය, ලෝකෝත්තර මාර්ගක්ෂණයෙහි වනාහි එක්සිතකම ලැබේ. ත්‍රිවිධ කායදුශ්චරිත චේතනාවන්ගේ පදච්ඡේදය කරන මාර්ගාංගය පුරන එක ම විරතියක් උපදී.

සම්මා ආජීව නිර්දේශයෙහි **අකිරියා** යන ආදීන්හි යම් චේතනාවකින් මිථ්‍යා ආජීවය කරමින් ක්‍රියාව කරන්නේ නම්, මෙය ඉපිද ඒ ක්‍රියාව කරන්නට නොදෙයි යනු අකිරියා යැයි මේ නයින් යෝජනාව දතයුතුයි. ආජීව නම් මෙය ද වෙන් වෙන්ව නැත. වාචා කම්මන්තයන් ගත්කල්හි ගන්නා ලද්දේ ම වෙයි. එය ප්‍රතික්ෂේප කළ හෙයිනි. මේ වනාහි ධ්‍රැව පටිසේවන වශයෙන් එයින් වෙන්කොට දක්වන ලදී යැයි මෙසේ ඇතිකල්හි සම්මා ආජීවය සකිච්චක කෘත්‍ය සහිත නො වේ. මාර්ගාංග අට සම්පූර්ණ නො වේ. එහෙයින් සම්මා ආජීවය කෘත්‍ය සහිත කළයුතුයි. මාර්ගාංග අට සම්පූර්ණ කළයුතුයි.

මේ එහි නයයි. ආජීවය බිඳෙනුයේ නම් කායද්වාර වචී ද්වාරයන්හි ම බිඳෙයි. මනෝද්වාරයෙහි නම් ආජීව භේදයක් නැත. පුරනුයේ ද ඒ ද්වාර දෙක්හිම පුරයි. මනෝද්වාරයෙහි ආජීව පූරණයක් නම් නැත. කාය ද්වාරයෙහි වීතික්‍රමය වනාහි ආජීව හේතුකවත් වෙයි. ආජීව හේතුක නැතිවත් වෙයි. වචී ද්වාරයෙහි ද එසේම ය. එහි ක්‍රීඩා පරවශ වූ රාජරාජ මහාමාත්‍යයෝ ශූරභාවය දක්වමින් යම් මුව දඩයමක් හෝ මංපැහැරීමක් හෝ පරදාර සේවනයක් හෝ කෙරෙත්ද, මේ අකුශල කර්මය කායකර්ම නම්. එයින් වෙන්වීම ද සම්මා කම්මන්ත නම්. ආජීව හේතුකව චතුර්විධ වූ යම්කිසි වචී දුශ්චරිතයක් කෙරෙත්ද, මේ අකුශල වචීකර්ම නම්. එයින්

වෙන්වීම සම්මා වාචා නම්. වැදිකෙවුල් ආදීහු ආජීව හේතුවෙන් යම් ප්‍රාණයක් නසත් ද, නුදුන් දෙය පැහැර ගනිත්ද, මිථ්‍යාචාරයෙහි හැසිරෙත් ද, මේ මිථ්‍යා ආජීව නම්. එයින් වෙන්වීම සම්මා ආජීව නම්. යම් අල්ලසක් ගෙන බොරු කියත් ද, කේලාම් ඵරුෂවචන සම්පප්‍රලාප කියත් ද, මෙය ද මිථ්‍යා ආජීව නම්. එයින් වෙන්වීම සම්මා ආජීව නම්. මහාසිව තෙරණුවෝ මෙසේ වදාළහ. 'කාය වාක් ද්වාරයන් ව්‍යතික්‍රමය ආජීවහේතුක වේවා. ආජීව හේතුක නො වේවා. අකුශල කාය කර්මය අකුශල වචීකර්මය යන සංඛ්‍යාවට ම යෙයි. එයින් වෙන්වීම ද සම්මා කම්මන්ත සම්මා වාචා යැයි ම කියනු ලැබේ' යනුයි. ආජීවය කොතැනදැයි කී කල්හි වනාහි ත්‍රිවිධ කුහන වස්තූන් ඇසුරුකොට සිව්පසය උපදවා ඒ සිව්පසය පරිභෝගය යැයි කීහ. මෙය කෙළ පැමිණි මිථ්‍යා ආජීවයයි. එයින් වෙන්වීම සම්මා ආජීවය නම්. මේ සම්මා ආජීවය ද පූර්ව භාගයෙහි නොයෙක් සිත්හි ලැබෙයි. කායද්වාර ව්‍යතික්‍රමයෙන් වෙන්වීම අන්‍ය වූ ම සිතක් සමගය. මනෝද්වාර ව්‍යතික්‍රමය අන් සිතක් සමගය. ලෝකෝත්තර මාර්ගක්‍ෂණයෙහි වනාහි එක් සිතක ම ලැබේ. කායවාක් ද්වාරයන්හි වනාහි සප්ත කර්මපථ වශයෙන් උපන් මිථ්‍යා ආජීව සංඛ්‍යාත දුශ්ශීල චේතනාව පදච්ඡේද කෙරෙමින් මාර්ගාංගය පුරමින් එකම විරතියක් උපදී යන මෙය නිද්දේස වාරයෙහි වෙනස ය. ඉන්ද්‍රියන් අතුරෙන් වනාහි යම් ඒ අඤ්ඤඤ්ඤස්සාමීති ඉන්ද්‍රියක් වඩනා ලද ද, මාර්ගාංගයන් අතුරෙන් සම්මා වාචා ආදිය ද ඔවුන්ගේ වශයෙන් සංග්‍රහ වාරයෙහි නව ඉන්ද්‍රියයෝ ද අෂ්ටාංගික මාර්ගයයැයි කියන ලදී. සුඤ්ඤතවාරය ප්‍රකෘතිකම යැයි යන මෙය වනාහි ශුද්ධික ප්‍රතිපදාවෙහි විශේෂයයි. මෙයින් පසුව ශුද්ධික ශූන්‍යතාව ශූන්‍යතා ප්‍රතිපදාව ශුද්ධික අප්‍රණිහිත අප්‍රණිහිත ප්‍රතිපදායැයි මේ දේශනා භේදය වෙයි.

එහි **සුඤ්ඤතා** යනු ලෝකෝත්තර මාර්ගයට නමකි. එය වනාහි ආගමන වශයෙන් සගුණ වශයෙන් ආරම්මණ වශයෙනැයි කරුණු තුනකින් නාමය ලබයි. කෙසේද? මේ ශාසනයෙහි භික්‍ෂුතෙම අනත්ත වශයෙන් පිහිටා සංස්කාරයන් අනත්ත වශයෙන් බලයි. යම්හෙයකින් වනාහි අනාත්ම වශයෙන් දුටුපමණින් ම මාර්ගයෙන් නැගිටීමක් නම් නොවේ. අනිත්‍ය වශයෙන් ද දුක් වශයෙන් ද දක්නට ම වටනේය, එහෙයින් අනිච්චං දුක්ඛං අනත්තා යන ත්‍රිවිධ අනුපස්සනාවට නඟා සම්මර්ශනය කරමින් හැසිරේ ද, ඔහුගේ වුට්ඨානගාමිනී විපස්සනාව වනාහි ත්‍රෛභූමක සංස්කාරයන් ශූන්‍ය වශයෙන් දකී ද මේ විදර්ශනාව ශූන්‍යතා නම් වෙයි. මේ විදර්ශනාව

ආයුතු තැන සිට තමාගේ මාර්ගයට ශූන්‍යතාව යන නම දෙයි. මෙසේ මාර්ගය ආයුතු හෙයින් ශූන්‍යතා නාමය ලබයි. යම්හෙයකින් එය වනාහි රාගාදීන්ගෙන් ශූන්‍ය ද, එහෙයින් ස්වගුණයෙන් ම ශූන්‍යතා නාමය ලබයි. නිවන ද රාගාදීන්ගෙන් ශූන්‍ය හෙයින් ශූන්‍යතා යැයි කියනු ලැබේ. එය අරමුණු කොට උපන් හෙයින් මාර්ගය අරමුණු වශයෙන් ශූන්‍යතා නාමය ලබයි.

එහි සූත්‍රාන්තික පර්යයෙන් ස්වගුණයෙන් ද ආරම්මණයෙන් ද නම ලබයි. මෙය වනාහි පරියාය දේශනයකි. අභිධර්ම කථාව වනාහි නිෂ්පර්යාය දේශනාවකි. එහෙයින් මෙහි ස්වගුණයෙන් හෝ ආරම්මණයෙන් හෝ නාමය (නො) ලබයි. ආගමනයෙන් ම ලබයි. ආගමනය ම වනාහි ප්‍රධානය. එය විදර්ශනාගමනය, මාර්ගාගමනයැයි දෙවැදෑරුම්ය. එහි මාර්ගය පැමිණි තැන විදර්ශනාගමනය ප්‍රධානය. ඵලය පැමිණි තැන මාර්ගාගමනය ප්‍රධානය. මෙහි මාර්ගය පැමිණි තැන විදර්ශනාගමනය ම ප්‍රධාන විය.

**අප්පණිහිතං** යන මෙහි ද අප්පණිහිතං යනු මාර්ගයට ම නමකි. මාර්ගය මේ නම ද කරුණු තුනෙන් ම ලබයි. කෙසේ ද? මේ ශාසනයෙහි භික්ෂු තෙම ආදියෙන් ම දුක් වශයෙන් පිහිටුවා සංස්කාරයන් දුක් වශයෙන් ම දකී ද, යම්හෙයකින් වනාහි දුක් වශයෙන් දුටු පමණින් ම මාර්ගයෙන් නැගිටීමක් නම් නොවේ ද, අනිත්‍ය වශයෙන් ද අනාත්ම වශයෙන් ද දක්නට වටනේ ම ය. එහෙයින් අනිච්චං දුක්ඛං අනත්තා යැයි ත්‍රිවිධ අනුපස්සනාවට නඟා සම්මර්ශනය කරමින් හැසිරේ ද, ව්‍යුත්ථානගාමිනී විදර්ශනාව වනාහි එයට හේතුභූමක වූ සංස්කාරයන්හි ප්‍රාර්ථනාව වියලා මැඩපවත්වා හැරදමයි. මේ විදර්ශනාව අප්පණිහිතා නම් වෙයි. එය ආගමනීය ස්ථානයෙහි සිට තමාගේ මාර්ගයට අප්පණිහිත යන නම දෙයි. මෙසේ මාර්ගය ආගමනයෙන් අප්පණිහිත යන නම ලබයි. යම් හෙයකින් වනාහි මෙහි රාග, දෝස, මෝහ ප්‍රාර්ථනා නැද්ද, එහෙයින් ස්වගුණයෙන් ම අප්පණිහිත නාමය ලබයි. ඒ ප්‍රණිධීන්ගේ අභාවයෙන් නිවන ද අප්පණිහිත යැයි කියනු ලැබේ. එය අරමුණුකොට උපන් හෙයින් මාර්ගය අප්පණිහිත නාමය ලබයි.

එහි සූත්‍රාන්තික පර්යායයෙන් ස්වගුණ වශයෙන් ද, ආරම්මණ වශයෙන් ද නම ලබයි. මෙය වනාහි පර්යාය දේශනාය, අභිධර්මකථාව

වනාහි නිෂ්පර්යාය දේශනා ය. එහෙයින් මෙහි ස්වගුණ වශයෙන් හෝ අරමුණු වශයෙන් හෝ නම නො ලබයි. ආගමනයෙන් ම ලබයි. ආගමනයම වනාහි ධුරයයි. එය ද්විධ වෙයි. විදර්ශනාගමනය මාර්ගාගමනය යනුවෙනි. එහි මාර්ගය ආ තැනදී විදර්ශනාගමනය ප්‍රධානය. ඵලය ආ තැනදී මාර්ගාගමනය ප්‍රධානය. මෙහි දී මාර්ගය ආ හෙයින් විදර්ශනාගමනය ම ප්‍රධාන විය. 'සුඤ්ඤතය අනිමිත්තය අප්පණිහිත' යැයි යන තුනම මාර්ගයට නම් නො වේද? මෙසේ කියන ලදී. 'මහණෙනි, මේ විමෝක්ෂ තුනකි. ශූන්‍යතා විමෝක්ෂය අනිමිත්ත විමෝක්ෂය අප්‍රණිහිත විමෝක්ෂය යනුවෙනි.' ඔවුනතුරෙන් මෙහිදී මාර්ග දෙකක් ගෙන කවරහෙයින් අනිමිත්ත නො ගන්නා ලද ද? ආගමන අභාවයෙනි. අනිමිත්ත විදර්ශනාව වනාහි තෙමේ ආගමනීය ස්ථානයෙහි සිට තමාගේ මාර්ගයට නම දෙන්නට නො හැක්කේ වෙයි. සම්මා සම්බුදුරජාණන් වහන්සේ වනාහි තම පුත් රාහුල තෙරුන්ට :-

> අනිමිත්තඤ්ච භාවෙහි මානානුසයමුජ්ජහ
> තතො මානාභිසමයා උපසන්තො චරිස්ස සි' ති

'අනිමිත්ත ද වඩන්න. මානානුසය දුරලන්න, ඉක්බිති මානාවබෝධයෙන් උපශාන්ත ව හැසිරෙන්නැ'යි.

අනිමිත්ත විදර්ශනාව වදාළහ. විදර්ශනාව වනාහි නිත්‍යය යන නිමිත්ත (ධ්‍රැව නිමිත්ත) සුඛ නිමිත්ත හා ආත්ම නිමිත්ත ද ගලවා දමයි. එහෙයින් අනිමිත්තා යැයි කියන ලදී. එය ද යම්හෙයකින් ඒ නිමිත්ත ගලවා දමයි ද, නමුත් තමා වනාහි නිමිත්ත ධර්මයන්හි හැසිරේනුයි සනිමිත්ත ම වෙයි. එහෙයින් තෙමේ ආගමනීය ස්ථානයෙහි සිට තමාගේ මාර්ගයට නාමය දෙන්නට නො හැක්කේ ය. තවත් නයෙකි, අභිධර්මය නම් පරමාර්ථ දේශනා ය, අනිමිත්ත මාර්ගයට ද පරමාර්ථ හෙයින් හේතුවෛකල්‍යය ම වෙයි. කෙසේ ද? අනිච්චානුපස්සනාවේ වශයෙන් වනාහි අනිමිත්ත විමෝක්ෂය කියන ලදී. ඒ විමෝක්ෂයෙන් ද ශ්‍රද්ධෙන්ද්‍රිය අධිමාත්‍ර වෙයි. එය ආර්ය මාර්ගයෙහි එක ම අංගයකුදු නොවෙයි. අමාර්ගාංග හෙයින් තමාගේ මාර්ගයට පරමාර්ථ වශයෙන් ද නාමයක් දෙන්නට නො හැකි වෙයි. අනෙක් දෙකෙහි වනාහි අනත්තානුපස්සනාවේ වශයෙන් ශූන්‍යතා විමෝක්ෂයත් දුක්ඛානුපස්සනාවේ වශයෙන් අප්‍රණිහිත විමෝක්ෂයත් කියන ලදී. ඔවුනතුරෙන් ශූන්‍යතා විමෝක්ෂයෙන් ප්‍රඥෙන්ද්‍රිය

අධිමාත්‍ර වෙයි. අප්‍රණිහිත විමෝක්ෂයෙන් සමාධින්ද්‍රිය අධිමාත්‍ර වෙයි. ඒවා ආර්ය මාර්ගයාගේ අංග හෙයින් තමාගේ මාර්ගයට පරමාර්ථ වශයෙන් නාමය දෙන්නට හැකිවෙයි. මාර්ගාරම්මණත්‍රිකයෙහි ද වනාහි මාර්ගාධිපති ධර්ම විභජනයේ දී ඡන්ද චිත්තයන්ගේ අධිපති කාලයෙහි ඒ ධර්මයන්ට අමාර්ග බැවින් ද මාර්ගාධිපතිභාවය නො කියන ලදී. මෙය මෙසේ සිදුවී යැයි දතයුතුයි. මෙය වනාහි මෙහි අට්ඨකථා මුත්තක එක් ආචාර්යවරයෙකුගේ මති විනිශ්චයකි.

මෙසේ සර්වප්‍රකාරයෙන් ම අනිමිත්ත විදර්ශනාව තෙමේ ආගමනීය ස්ථානයෙහි සිට තමාගේ මාර්ගයට නමක් දෙන්නට නො හැකි වේ යැයි අනිමිත්ත මාර්ගය නො ගන්නා ලදී. ඇතැම් අයෙක් වනාහි අනිමිත්ත මාර්ගය ආගමනයෙන් නාමයක් නො ලබන්නේ නමුදු සූත්‍රාන්තික පර්යාය වශයෙන් ස්වගුණයෙන් ද ආරම්මණ වශයෙන් ද නමක් ලබයි යැයි කීහ. ඔව්හු මෙය කියා ප්‍රතික්ෂේප කළහ. අනිමිත්ත මාර්ගයෙහි ස්වගුණ වශයෙන් ද ආරම්මණ වශයෙන් ද නාමය ලබද්දී ශූන්‍යතා අප්‍රණිහිත මාර්ගයෝ ද ස්වගුණ වශයෙන් වෙන් ව ආරම්මණ වශයෙන් ද මෙහිදී නාමය ලබන්නාහුද, නො ලබත් ම ය. කවර හෙයින් ද? මේ මාර්ගය කරුණු දෙකකින් නාමය ලබයි. ස්වරය වශයෙන් හා ප්‍රත්‍යනික වශයෙනි. ස්වභාවයෙන් හා ප්‍රතිපක්ෂ බවෙන් ද යනු අර්ථයි. එහි ශූන්‍යතා අප්‍රණිහිත යන මාර්ගයෝ ස්වරසයෙන් හා ප්‍රතිපක්ෂ භාවයෙන් නමලබත්. ශූන්‍යතා අප්‍රණිහිත මාර්ගයෝ වනාහි රාගාදීන්ගෙන් ශූන්‍යයෝ ය. රාගප්‍රාර්ථනා ආදියෙන් ද වෙන්වූවාහු යැයි මෙසේ ස්වරස වශයෙන් ද නම ලබත්. ශූන්‍ය වශයෙන් ද ආත්මාභිනිවේශයට ප්‍රතිපක්ෂය අප්‍රණිහිත වශයෙන් ප්‍රණිධියට ද ප්‍රතිපක්ෂ යැයි මෙසේ ප්‍රත්‍යනීක වශයෙන් නම ලබත්. අනිමිත්ත මාර්ගය වනාහි භග නිමිති ද නිත්‍ය නිමිති ද අභාවයෙන් ස්වරස වශයෙන් ම නාමය ලබයි. ප්‍රතිපක්ෂ වශයෙන් නො ලබයි. එය සංස්කාර නිමිත්ත අරමුණු කරගත් අනිත්‍යානුපස්සනාවට ප්‍රතිපක්ෂ නොවේ. අනිත්‍යානුපස්සනාව වනාහි මෙයට අනුලෝම ව සිටියේ යැයි මෙසේ සර්වප්‍රකාරයෙන් ම අභිධර්ම පර්යාය වශයෙන් අනිමිත්ත මාර්ගයක් නම් නැතැයි වෙයි. සූත්‍රාන්තික පර්යාය වශයෙන් මෙසේ ගෙනහැර දක්වන ලදී. යම්වරෙක මාර්ගයෙන් නැගිටීමක් වේද, ත්‍රිලක්ෂණයෝ ඒකාවර්ජනයෙන් මෙන් ඉදිරියට පැමිණෙත්. තිදෙනාගේ එකට හමුවීමක් නම් නැත. කර්මස්ථානයාගේ ප්‍රකට බව දැක්වීම පිණිස මෙය කියන ලදී. ආදියෙහි වනාහි යම්කිසි තැනක පිහිටුවීමක් වේවා, වුත්ථානගාමිනී

විදර්ශනාව වනාහි යමක් යමක් සම්මර්ශනය කොට නැඟිටී ද, ඒ ඒ වශයෙන් ම ආගමනීය ස්ථානයෙහි සිට තමාගේ මාර්ගයට නම දෙයි. කෙසේ ද? අනිත්‍යාදිය අතුරෙන් යම්කිසි තැනක පිහිටා ඉතිරි ලක්‍ෂණ දෙක ද දක්නට වටී. මෙසේ එක් ලක්‍ෂණයක් දැකීම් පමණකින් ම වනාහි මාර්ග වුට්ඨානයක් නම් නොවේ. එහෙයින් අනිත්‍ය වශයෙන් පිහිටි භික්‍ෂුව හුදෙක් අනිත්‍යයෙන් ම නො නැඟිටී. දුක්ඛ වශයෙන් ද නැඟිටී. අනත්ත වශයෙන් ද නැඟිටීම ය. දුක් වශයෙන් අනාත්ම වශයෙන් පිහිටි කල්හි ද මේ නයමය. මෙසේ මුලින් යම්කිසි තැනක පිහිටීම වේවා, වුට්ඨානගාමිනී විදර්ශනාව වනාහි යමක් යමක් සම්මර්ශනය කොට නැඟිටී ද, ඒ ඒ වශයෙන් ආගමනීය ස්ථානයෙහි සිට තමාගේ මාර්ගයට නම දෙයි යනුයි. එහිදී අනිත්‍ය වශයෙන් නැඟිටින්නාගේ මාර්ගය අනිමිත්තය. දුක්ඛ වශයෙන් නැඟිටින්නාගේ මාර්ගය අප්පණිහිතය. අනාත්ම වශයෙන් නැඟිටින්නාගේ මාර්ගය සුඤ්ඤතය. මෙසේ සූත්‍රාන්ත පර්යායයෙන් ගෙනහැර දක්වන ලදී.

වුට්ඨානගාමිනී විදර්ශනාව වනාහි කුමක් අරමුණු කොට ඇත්තේ ද? ලක්‍ෂණාරම්මණ කොට ඇත්තේ ය. ලක්‍ෂණය නම් ප්‍රඥප්ති ගතිකය, කිවයුතු ධර්මයක් නොවේ. යමෙක් වනාහි අනිත්‍යය, දුඃඛය, අනාත්මය යැයි ත්‍රිලක්‍ෂණයන් සලකයි ද, ඔහුට පංචස්කන්ධයෝ ගෙල බැඳි කුණ මෙන් වෙත්. සංස්කාරාරම්මණ ඥාණයම සංස්කාරයෙන් නැඟිටී. යම්සේ වනාහි එක් භික්‍ෂුවක් පාත්‍රයක් මිලදී ගනු කැමැත්තේ පාත්‍ර වෙළෙන්දෙකු පාත්‍රයක් රැගෙන ආවහු දැක තුටුපහටුව ගනිමියි සිතා විමසනුයේ සිදුරු තුනක් දක්නේ ය. හෙතෙම ඡිද්‍රයන්හි නිරාලය නො වෙයි. පාත්‍රයෙහි ම නිරාලය වෙයි. මෙපරිද්දෙන් ත්‍රිලක්‍ෂණයන් සලකා සංස්කාරයන් කෙරෙහි නිරාලය වෙයි. සංස්කාරයන් අරමුණු කරගත් ඥානයෙන් ම සංස්කාරයන්ගෙන් නැඟිටී යැයි දතයුතුයි. දුස්සෝපමාවේ ද මේ නයම ය.

මෙසේ භාග්‍යවතුන් වහන්සේ ලෝකෝත්තර ධ්‍යාන බෙදන සේක් ශුද්ධික ප්‍රතිපදාවෙහි චතුෂ්කනය ය පංචකනය යැයි නය දෙකම ගෙනහැර දැක්වූ සේක. එසේ ම සුද්ධික සුඤ්ඤතාව පිළිබඳ සුඤ්ඤත පටිපදාවේ ද අප්පණිහිතයෙහි අප්පණිහිත පටිපදාවගේ ද නය දැක්වූ සේක. කුමක් හෙයින් එසේ දැක්වූ සේක් ද? පුද්ගල අධ්‍යාශය වශයෙන් හා දේශනා විලාසයෙනි. ඒ දෙකම යට කියන ලද නයින් ම දතයුතුයි. මෙසේ **ලෝකුත්තරං ඣානං භාවෙති** යන මෙහි ශුද්ධික ප්‍රතිපදාවෙහි චතුෂ්ක

පංචක වශයෙන් ම නය දෙකකි. තථාසෙසෙසු යනු සියලු ම පංච කොට්ඨාසයන්හි නය දසයක් බෙදන ලදී. මේ එහි ප්‍රකීර්ණකයයි :-

> **අජ්ඣත්තඤ්ච බහිද්ධා ච රූපාරූපෙසු පඤ්චසු**
> **සත්තට්ඨංග පරිණාමං නිමිත්තං පටිපදා පතී ති**

ආධ්‍යාත්මික වූ ද බාහිර වූ ද පංචවිධ රූපයන්හි සප්ත අෂ්ට අංගයන්ගේ පරිණාමය ද වුට්ඨාන නිමිත්ත ද ප්‍රතිපදාවන්ගේ හා අධිපතීන්ගේ චලතාචලනය (හැසිරීම) ද දතයුතුයි.

ලෝකෝත්තර මාර්ගයෙහි ආධ්‍යාත්මය පිහිටා ආධ්‍යාත්මයෙහි නැඟිටී. ආධ්‍යාත්මයෙහි පිහිටා පිටත නැඟිටී. පිටත පිහිටා පිටත නැඟිටී. පිටත පිහිටා ආධ්‍යාත්මයෙහි නැඟිටී. රූපයෙහි පිහිටා රූපයෙන් නැඟිටී. රූපයෙහි පිහිටා අරූපයෙන් නැඟිටී. අරූපයෙහි පිහිටා අරූපයෙන් නැඟිටී. අරූපයෙහි පිහිටා රූපයෙන් නැඟිටී. එක්වර ම පංචස්කන්ධයෙන් නැඟිටී. සත්තට්ඨාංග පරිණාමං යනු ඒ මේ මාර්ගය වනාහි අෂ්ටාංගික ද වෙයි. සප්තාංගික ද වෙයි. බොජ්ඣංගයෝ ද සතක් හෝ හයක් වෙත්. ධ්‍යානය වනාහි පංචාංගික හෝ චතුරංගික හෝ තිවංගික හෝ (දුවංගික) වේ. මෙසේ සප්ත අෂ්ටාදී අංගයන්ගේ පරිණාමය දතයුතුයි යන අර්ථයි. නිමිත්තං පටිපදා පති යන තුනෙහි නිමිත්තං යනු යමකින් (නියත) නැඟිටීමක් වේද, පටිපදා පති යනු ප්‍රතිපදාවේද අධිපතීහුගේ චලනාචලනය දතයුතුයි.

එහි අජ්ඣත්තං අභිනිවිසිත්වා අජ්ඣත්තං වුට්ඨාති යන ආදීන්හි වනාහි මේ ශාසනයෙහි ඇතැම් පුද්ගලයෙක් පළමුවෙන් ම ආධ්‍යාත්මික පංචස්කන්ධයෙහි පිහිටයි. පිහිටා ඒ පංචස්කන්ධයන් අනිත්‍යාදී වශයෙන් බලයි. යම්හෙයකින් වනාහි පිරිසිදු ආධ්‍යාත්ම දර්ශන මාත්‍රයෙන් මාර්ගයෙන් නැඟිටීමක් නො වේ. පිටත ද දැකිය යුතු ම ය. එහෙයින් අන්‍යයාගේ ස්කන්ධයන්හි ද අනුපාදින්න සංස්කාරයන්හි ද අනිත්‍යය දුක්ඛය අනාත්මය යැයි දකී. හෙතෙම කලක ආධ්‍යාත්මය සම්මර්ශනය කරයි. කලෙක පිටත සම්මර්ශනය කරයි. මෙසේ සම්මර්ශනය කරන ඔහු ආධ්‍යාත්මය සම්මර්ශනය කරන කාලයෙහි විදර්ශනාව මාර්ගය සමග හැඟෙයි. මෙසේ ආධ්‍යාත්මයට පිවිස ආධ්‍යාත්මයෙන් නැඟිටී නම් වෙයි. යම්හෙයකින් වනාහි ඔහු පිටත සම්මර්ශනය කරන කාලයෙහි විදර්ශනාව

මාර්ගය සමග ගැටෙයි. මෙසේ ආධ්‍යාත්මයට පිවිස පිටත නැගිටී නම් වෙයි. පිටත පිවිස පිටත මෙන් ම ආධ්‍යාත්මයෙහි ද නැගිටීමෙහි ද මේ නය මය. තවෙකෙක් මුලින් ද රූපයෙහි පිවිසෙයි. (පිහිටයි) පිවිස භූතරූපයන් ද උපාදාය රූපයන් ද පිරිසිඳ අනිත්‍යාදී වශයෙන් දකී. යම්හෙයකින් වනාහි ශුද්ධරූප දර්ශන මාත්‍රයෙන් ම පිහිටීම නොවේ. අරූප ද දැකිය යුතුය. එහෙයින් රූපය අරමුණුකොට උපන් වේදනාව සංඥාව සංස්කාර හා විඥානය ද මේ අරූපය යැයි පිරිසිඳ අනිත්‍යාදී වශයෙන් දකී. හෙතෙම කලකදී රූපය සම්මර්ශනය කරයි. කලකදී අරූපය සම්මර්ශනය කරයි. ඔහු මෙසේ රූප සම්මර්ශනය කරන කාලයෙහි විදර්ශනාව මාර්ගය සමග ගැටෙයි. රූපයෙහි පිහිටා රූපයෙන් නැගිටී යනු මෙසේය. ඉදින් වනාහි අරූප සම්මර්ශනය කරන කාලයෙහි ඔහුගේ විදර්ශනාව මාර්ගය සමග ගැටේ නම් එසේ වීම අරූපයෙහි පිහිටා අරූපයෙන් නැගිටී නම්, අරූපයෙහි පිහිටා අරූපයෙන් නැගිටීම ද රූපයෙහි පිහිටා රූපයෙන් නැගිටීමේදී ද මේ නයම ය. හටගැනීම ස්වභාවකොට ඇති කිසිවක් වේ නම් ඒ සියල්ල නිරුද්ධවීම ස්වභාවකොට ඇතැයි මෙසේ පිහිටා මෙපරිද්දෙන් ම නැගිටිනා කල්හි වනාහි එකපැහැරම පංචස්කන්ධයන්ගෙන් නැගිටී නම් මේ තීක්ෂණ විදර්ශක මහාප්‍රාඥ භික්ෂුවගේ විදර්ශනාවයි. යම්සේ සයින් පෙළෙන ආධ්‍යාත්මයක් ඇති පුරුෂයකු ඉදිරිපිට අශුචි පිඩක් තබා නොයෙක් අග්‍ර රස භෝජනයෙන් පිරුණු පාත්‍රයක් ඉදිරිපත් කරන්නහු ද, හෙතෙම අතින් ව්‍යඤ්ජන විසුරුවන්නේ ඒ අශුචි පිඩ දැක මෙය කුමක්දැයි විචාරා අශුචි පිඩකැයි කී කල්හි චී චී මෙය ඉවත් කරව් යැයි බතෙහි ද පාත්‍රයෙහි ද නිරාලය වේ ද, මෙය ද මෙසේ යැයි දතයුතුයි. මේ භික්ෂුව බාල පෘථග්ජන කාලයෙහි පංචස්කන්ධයන් මමය මාගේයැයි ගත් කාලය භෝජන පාත්‍රය දැකීමේදී ඔහු ප්‍රීතියට පත් කාලය මෙනි. ත්‍රිලක්ෂණ සලකන ලද කාලය අශුචි පිඩ දුටු කාලය මෙනි. තීක්ෂණ විදර්ශක මහාප්‍රාඥ භික්ෂුව යංකිඤ්චි සමුදය ධම්මං සබ්බං තං නිරොධධම්මං යැයි පඤ්චස්කන්ධයන්ගෙන් එකපැහැර නැගිටි කාලය බතෙහි ද පාත්‍රයෙහි ද නිරාලය කාලය මෙනැයි දතයුතුයි. සත්තට්ඨංග පරිණාමං යන මෙහි මේ කියන ලද ප්‍රභේද ඇති අංග පරිණාමය යම්සේ වේද, එසේ දතයුතුයි.

සංස්කාරුපේක්ෂා ඥානය ම වනාහි ආර්ය මාර්ගයාගේ බෝධ්‍යංග මාර්ගාංග හා ධ්‍යානාංග විශේෂ නියම කරයි. ඇතැම් තෙරවරු බෝධ්‍යංග මාර්ගාංග ධ්‍යානාංග විශේෂ පාදක ධ්‍යානය නියම කෙරේ යැයි කියත්.

ඇතැම් කෙනෙක් විදර්ශනාවට අරමුණු වූ ස්කන්ධයෝ නියම කෙරෙත්යැයි කියත්. ඇතැම් කෙනෙක් පුද්ගලාධ්‍යාශය නියම කරයි යැයි කියත්. ඔවුන්ගේ වාදයන් අතුරෙන් ද මේ සංස්කාරුපේක්ෂා සංඛ්‍යාත පූර්වභාග ව්‍යුත්ථානගාමිනී විදර්ශනාවම නියම කෙරේ යැයි දතයුතුයි. මේ එහි පිළිබඳ කථාවයි. විදර්ශනා නියමයෙන් වනාහි ශුෂ්ක විදර්ශකයාට උපන් මාර්ගයත් සමාපත්තිලාභියාට ධ්‍යානය පාදක නො කොට උපන් මාර්ගයක් ප්‍රථමධ්‍යානය පාදක කොට ප්‍රකීර්ණක සංස්කාරයන් සම්මර්ශනය කොට උපදවන ලද මාර්ගයත් ප්‍රථමධ්‍යානිකම වෙයි. සප්තබෝධාංග අෂ්ට මාර්ගාංග පංචධ්‍යානාංග සියල්ලෙහි වෙයි. ඔවුන්ගෙන් ද පූර්වභාග විදර්ශනාව වනාහි සොම්නස් සහගතව ද උපේක්ෂා සහගතව ද වී වුට්ඨාන කාලයෙහි සංස්කාරෑපේක්ෂාභාවයට පැමිණ සොම්නස් සහගතම වෙයි. පංචකනයෙහි ද්විතීයධ්‍යාන තෘතීයධ්‍යාන චතුර්ථ ධ්‍යානයන් පාදක කොටගෙන උපදවන ලද මාර්ගයන්හි පිළිවෙළින්ම ධ්‍යානය චතුරංගික තිවංගික දුවංගික ද වෙයි. සප්ත මාර්ගාංගයෝ වනාහි සියල්ලෙහි වෙත්. බෝධ්‍යංග සයක් සතරවැන්නෙහි වෙයි. මේ වෙනස පාදකධ්‍යාන නියමයෙන් ද විදර්ශනා නියමයෙන් ද වෙයි. ඔවුන්ගෙන් ද පූර්වභාග විදර්ශනාව වනාහි සොම්නස් සහගතව ද උපේක්ෂා සහගතව ද වෙයි. පංචමධ්‍යානය පාදක කොටගෙන උපදවන ලද මාර්ගයෙහි වනාහි උපේක්ෂා චිත්තෙකාග්‍රතා වශයෙන් ධ්‍යානාංග දෙකක් ද, බෝධ්‍යාංග සයක් ද මාර්ගාංග සතක් ද වුට්ඨානගාමිනී සෝමනස්ස සහගතම ය. මේ විශේෂය ද උභය නියමය වශයෙන් වෙයි. මේ නයෙහි වනාහි පූර්වභාග විදර්ශනාව සෝමනස්ස සහගත හෝ උපේක්ෂා සහගත හෝ වුට්ඨාන උපේක්ෂා සහගත ද වෙයි. අරූප ධ්‍යානයන් පාදක කොටගෙන උපදවන ලද මාර්ගයෙහි ද මේ නයම ය. මෙසේ යම්කිසි කෙනෙක් පාදක ධ්‍යානයෙන් නැඟිට සංස්කාරයන් සම්මර්ශනය කොට උපදවන ලද මාර්ගයට ආසන්න පෙදෙසෙක නැගිටියාහු සමාපත්තිය තමා හා සමබව කරයි. ගොයාගේ වර්ණයට භූමි වර්ණය මෙනි.

ද්විතීය ස්ථවිරවාදයෙහි වනාහි යම් යම් සමාපත්තියකින් නැඟිට යම් යම් සමාපත්ති ධර්මයන් සම්මර්ශනය කොට මාර්ගය උපදවන ලද්දේ වේද, ඒ මාර්ගය ද ඒ ඒ සමාපත්තිය සමාන වේ. සම්මර්ශනය කළ සමාපත්තිය සමානය යන අර්ථයි. ඉදින් වනාහි කාමාවචර ධර්මයන් සම්මර්ශනය කෙරේද, ප්‍රථමධ්‍යානිකයෙක් ම වෙයි. එහි ද විදර්ශනා නියමය කියන ලද නයින් ම දතයුතුයි.

තෘතිය ස්ථවිරවාදයෙහි මම සප්තාංගික මාර්ගයට පැමිණෙන්නෙම් නම් අෂ්ටාංගික මාර්ගයට පැමිණෙන්නෙම් ඉතා යෙහෙකැයි තමාගේ අභයට අනුරූපව යම් යම් ධ්‍යානයක් පාදක කොට යම් යම් ධ්‍යාන ධර්මයන් සම්මර්ශනය කොට මාර්ගය නිපදවන ලද ද (ඒ මාර්ගය) ඒ ඒ ධ්‍යාන සත සමාන ම වෙයි. ඒ පාදක ධ්‍යානය හෝ සම්මර්ශනය කළ ධ්‍යානය වනාහි අධ්‍යාශය මාත්‍රයෙන් තොරව සමෘද්ධ නො වෙයි. ඒ මේ අර්ථය නන්‍දකෝවාද සූත්‍රයෙන් දැක්විය යුතුයි. මෙය ද වදාරන ලදී. 'මහණෙනි, යම්සේ පසළොස්වක පොහොයෙහි බොහෝ දෙනාට චන්ද්‍රයා අඩු ද? නැතහොත් චන්ද්‍රයා සම්පූර්ණමය යන සැකයක් හෝ විමතියක් නො වෙයි. එසේ නම් චන්ද්‍රයා සම්පූර්ණමය යන අදහස ම වෙයි. මහණෙනි, එපරිද්දෙන් ඒ භික්ෂුණීහු නන්‍දකගේ ධර්මදේශනාවෙන් සතුටුවූවාහු මෙන් ම පූර්ණ සංකල්ප ඇත්තෝ ද වූහ. මහණෙනි, ඒ පන්සියයක් භික්ෂුණීන් අතුරෙන් පශ්චිමක භික්ෂුණී තොමෝ අපායෙහි නූපදින ස්වභාවය ඇති නියත වශයෙන් ම සම්බෝධිය (අර්හත්වය) පිහිට කොට ඇති ව සෝවාන් වූවාය' යනුයි. ඔවුනතුරෙහි යම් භික්ෂුණියකට වනාහි සෝවාන් ඵලයට හේතුසම්පත් වීද ඕ තොමෝ සෝවාන් ඵලයෙන් ම පරිපූර්ණ සංකල්ප ඇතිවූවාය. යම් භික්ෂුණියකට =පෙ= අර්හත්වයට හේතුසම්පත් වීද ඕ තොමෝ අර්හත්වයෙන් ම පරිපූර්ණ සංකල්ප ඇතිවූවාය. මෙපරිද්දෙන් තම අදහසට අනුරූපව යම් යම් ධ්‍යානයක් පාදක කොට යම් යම් ධ්‍යාන ධර්මයන් සම්මර්ශනය කොට මාර්ගය උපදවන ලද ද ඒ මාර්ගය ඒ ඒ ධ්‍යාන හා සමාන ම වෙයි. පාදක ධ්‍යානය හෝ සම්මර්ශිත ධ්‍යාන අධ්‍යාශය මාත්‍රයකින් තොරව එය සමෘද්ධ නොවේ යනුයි. මෙහි ද විදර්ශනා නියමය කියන ලද නයින් ම දතයුතුයි.

එහිදී පාදක ධ්‍යානය ම නියම කරයි යන මේ වාද ඇති ත්‍රිපිටක චූළනාග තෙරුන්ගෙන් අතවැසියෝ මෙසේ ඇසූහ. ස්වාමීනි, යම්තැනෙක වනාහි පාදකධ්‍යානය ඇත්තේ ද එහි එය නියම කරන්නට පාදක ධ්‍යානය යම්තැනක පාදක ධ්‍යානය නැත්තේ ද ඒ අරූප භවයෙහි කුමක් නියම කෙරේද කියායි. ඇවැත්නි, එහි ද පාදක ධ්‍යානය ම නියම කරයි. අෂ්ට සමාපත්තිලාභී යම් භික්ෂුවක් වනාහි ප්‍රථමධ්‍යානය පාදක කොට සෝවාන් මාර්ගඵල උපදවා නොපිරිහුණු ධ්‍යාන ඇති ව කලුරිය කොට අරූප භවයෙහි උපන්නේ ප්‍රථමධ්‍යානික සෝතාපත්තිඵල සමාපත්තියෙන් නැගිට

විදර්ශනාවෙහි පිහිටා මත්තෙහි ත්‍රිවිධ මාර්ගඵල උපදවයි ද, ඔහුගේ ඒ මාර්ගඵල ප්‍රථමධ්‍යානික වෙයි. ද්විතීය ධ්‍යානිකාදීන්හි ද මේ නයම ය.

අරූපයෙහි ත්‍රික චතුෂ්ක ධ්‍යාන උපදී. එය ද වනාහි ලෝකෝත්තරය. ලෞකික නො වේ. ඇවැත්, මෙසේ එහි ද පාදක ධ්‍යානය ම නියම කරයි යනුයි. ස්වාමීනි, ප්‍රශ්නය මනාව කියන ලදී යනුයි. විදර්ශනාව අරමුණු වූ ස්කන්ධයෝ නියම කෙරෙත්. යම් යම් (පංච ස්කන්ධයන්) සම්මර්ශනය කොට නැගිටීද, මාර්ගය එය එයම සමාන වේ යන වාද ඇති මෝරවාපී වාසී මහාදත්ත තෙරුන්ට ම අතවැසියෝ මෙසේ කීහ. ස්වාමීනි, ඔබවහන්සේගේ වාදයෙහි දොසක් පෙනේ. රූපය සම්මර්ශනය කොට නැගිටි භික්ෂුව වනාහි රූපයට සමාන අව්‍යාකෘත මාර්ගිකයකු විය යුතුයි. නේවසඤ්ඤානාසඤ්ඤායතනය නය වශයෙන් පරිග්‍රහණය කොට නැගිටියාහු එය හා සමාන වූ නේවසඤ්ඤා නාසඤ්ඤායතන භාවයට පැමිණි (මාර්ගිකයකු) විය යුතුයි. ඇවැත්නි, එසේ නොවෙයි. අර්පණාවට නො පැමිණි ලෝකෝත්තර මාර්ගයක් නම් නැත. එහෙයින් රූපය සම්මර්ශනය කොට නැගිටියහුට අෂ්ටාංගික සෝමනස්ස සහගත මාර්ගයක් වෙයි. නේවසඤ්ඤානාසඤ්ඤායතනය සම්මර්ශනය කොට නැගිටියහුටද සර්වාකාරයෙන් එසේ නොවේ. සප්තාංගික උපේක්ෂා සහගත මාර්ගය වනාහි වේ යනුයි.

පුද්ගලාධ්‍යාශය නියම කෙරේ යන වාද ඇති චූලාභය තෙරුන්ගේ ද වාදය ගෙනහැර දක්වා ත්‍රිපිටකචූළනාග තෙරුන්ට කීහ. උන්වහන්සේ මෙසේ කීහ. යමෙකුට වනාහි පාදකධ්‍යානය ඇද්ද ඔහුට පුද්ගලාධ්‍යාශය නියම කෙරේවා යමෙකුට එය නැද්ද ඔහුට කවර නම් අධ්‍යාශයක් නියම කෙරේද නිර්ධන පුද්ගලයා දියුණුව සොයන කාලය මෙන් වෙයි කියාය. ඒ කථාව ගෙනහැර දක්වා නැවත ත්‍රිපිටචූළාභය තෙරුන්ට කීවාහුය. උන්වහන්සේ ඇවැත්නි, මෙය පාදකධ්‍යාන ඇත්තහුට කියන ලදී යැයි කියන ලදී යැයි කීහ. පාදකධ්‍යාන ඇත්තහුට වනාහි යම්සේ ද, සම්මර්ශන ධ්‍යාන ඇත්තාට ද එසේ ම දතයුතුයි. පංචමධ්‍යානයෙන් නැගිට ප්‍රථමධ්‍යානාදිය සම්මර්ශනය කරන්නාට උපන්මාර්ගය වනාහි ප්‍රථම ස්ථවිරවාදය සමග ද පංචමධ්‍යානිකයා ප්‍රථමධ්‍යානිකයා (බවට) පැමිණේ යන්න ද්විතීයවාදය සමග ඇයි වාද දෙක ම විරුද්ධ වේ. මෙහි තුන්වන වාදයෙන් වනාහි යමෙකු කැමති වේද ඒ ධ්‍යානිකයා මේ මේ වාද විරුද්ධ නොවේ. අදහස ද සාර්ථක වේ යනුයි. මෙසේ තෙරවරු තිදෙනා ම

පණ්ඩිතයහ. ව්‍යක්තයහ. බුද්ධි සම්පන්නයහ. එහෙයින් උන්වහන්සේලාගේ වාදය පාළියට නඟා තැබූහ. මෙහි වනාහි අර්ථය ම උපුටා මේ වාද තුනම විදර්ශනාව ද නියම කෙරේ යැයි දක්වන ලදී.

දැන් **නිමිත්තං පටිපදා පති** යන මෙහි මෙසේ අංග පරිණාමය ඇත්තහුගේ මාර්ගය උපදනා කාලයෙහි ගෝත්‍රභූඥානය කොහි නැගිටීද? මාර්ගය කොහිද? ගෝත්‍රභූඥානය වනාහි නිමිත්තෙන් නැගිටී. පැවැත්ම සිඳින්නට නොහැකි වෙයි. එකට නැඟිටින මේ මාර්ගය වනාහි නිමිත්තෙන් පැනනගී. පැවැත්ම ද සිඳී මේ වනාහි උභය වශයෙන් නැගිටී මේ ඔවුන්ගේ උත්පත්තිනයයි. යම් වාරයෙක වනාහි මාර්ගයෙන් නැඟීමක් වේද, එහි අනුලෝම එකක් ම නොවේ. පංචම නය ද නො වේ. එක් ආසේවනයක් වනාහි නොලබයි. පංචමනය ජවනයට ආසන්න හෙයින වෙව්ලයි. එකල්හි වනාහි ජවනයට වැටුණේ නම් වෙයි. එහෙයින් එකක් නොවේ ම ය. පංචමය ද ගෝත්‍රභූ සිතයි. සතරවැන්න මාර්ග සිතයි. ඵලසිත් තුනය, ඉන්පසු භවංගයට වැටීමයි. මධ්‍යම ප්‍රාඥයාට අනුලෝම තුනක් වෙයි. සතරවැන්න ගෝත්‍රභූ සිතයි. පස්වැන්න මාර්ග සිත ඵල දෙකයි. ඉක්බිති භවංගයට වැටීමයි. මන්‍දප්‍රාඥයාට අනුලෝම සතරක් වෙයි. පස්වැන්න ගෝත්‍රභූ සිතයි. සයවැන්න මාර්ග සිතයි. සත්වැන්න ඵලයයි. ඉක්බිති භවංගයට වැටීමය. එහිදී මහා ප්‍රාඥ මන්‍දප්‍රාඥ වශයෙන් නොකියා මධ්‍යම ප්‍රාඥයාගේ වශයෙන් කිවයුතුයි.

යම්වරෙක වනාහි මාර්ගයෙන් නැගිටීම වේද (එහි) ක්‍රියාහේතුක මනෝවිඥාණ ධාතුව උපේක්‍ෂා සහගත මනෝද්වාරාවර්ජනය වී විදර්ශනාගෝචර ස්කන්ධයන් අරමුණුකොට භවංගයට පෙරළෙයි. ඊට අනතුරුව ඒ ආවර්ජනයෙන් ම ගන්නා ලද ස්කන්ධයන් ගෙන උපදී. ප්‍රථම ජවනය අනුලෝමඥානයයි. එය ඒ ස්කන්ධයන්හි අනිත්‍යයැයි හෝ දුඃඛයැයි හෝ අනාත්මයැයි හෝ පැවති ඕළාරික ඕළාරික වූ සත්‍යය ප්‍රතිච්ඡාදනය කරන අන්‍ධකාරය දුරුකොට ත්‍රිලක්‍ෂයන් බහුල වශයෙන් ප්‍රකට කොට නිරුද්ධ වෙයි. ඉන් අනතුරුව ද්විතීය අනුලෝම ඥානය උපදී. ඔවුනතුරෙන් පළමුවෙන් ආසේවනය නොවූයේ දෙවැන්නට පළමුවෙන් සේවනය වෙයි. එය ද ලබන ලද සේවනය ඇති හෙයින් තීක්‍ෂණව ශූරව ප්‍රසන්නව ඒ අරමුණෙහි ම ඒ ආකාරයෙන් ම පැවති මධ්‍යමප්‍රමාණ වූ සත්‍යය ප්‍රතිච්ඡාදනය කරන අඳුර දුරුකොට ත්‍රිලක්‍ෂයන් බොහෝසෙයින් ප්‍රකට කොට නිරුද්ධ වෙයි. ඉන් අනතුරු ව

තෘතීයානුලෝමඥානය උපදී. එයට දෙවැන්න ආසේවනය වෙයි. එයද ලබන ලද සේවනය ඇති හෙයින් තීක්ෂණව ශූරව ප්‍රසන්නව ඒ අරමුණෙහි ම ඒ අයුරින් ම පැවතී එයින් ඉතිරි වූ අණුසහගත සත්‍ය ප්‍රතිච්ඡාදක වූ අඳුර ඉතිරි නොකොට දුෂ්කර ත්‍රිලක්‍ෂයන් බොහෝසෙයින් ප්‍රකට කොට නිරුද්ධ වෙයි. මෙසේ ත්‍රිවිධ අනුලෝමයන් විසින් සත්‍ය ප්‍රතිච්ඡාදක අඳුර දුරුකළ කල්හි ඉන් අනතුරුව නිර්වාණය අරමුණු කරමින් ගෝත්‍රභූඥානය උපදී.

එහි දී මේ උපමාවකි. එක් ඇස් ඇති පුරුෂයෙක් නැකත් යෝගයක් දැනගනිමියි රාත්‍රියෙහි නික්ම සඳ බැලීමට උඩ බැලී ය. වලාකුළින් වැසී තිබුණු හෙයින් ඔහුට සඳ නො පෙනිණ. ඉක්බිති එක් වාතයක් පැනනැඟී මහ වලාකුළු වැනසීය. තවත් වාතයක් මධ්‍යප්‍රමාණ වලාකුළුද, තවත් වාතයත් සියුම් වලාකුළු ද වැනසී ය. ඉක්බිති ඒ පුරුෂයා පහව ගිය වලාකුළු ඇති අහසෙහි සඳ දැක නැකත් යෝගයක් දැනගත්තේ ය. එහි සත්‍යප්‍රච්ඡාදක වූ ස්ථූල මධ්‍යම සූක්‍ෂම ක්ලේශාන්ධකාරයෝ වලාකුළු තුන මෙනි. අනුලෝම සිත් තුන වාත තුන මෙනි. ගෝත්‍රභූ ඥානය ඇස් ඇති පුරුෂයා මෙනි. නිර්වාණය සඳ මෙනි. එක් එක් අනුලෝම සිතක සත්‍යය වසාගෙන සිටි අඳුර දුරුවීම එක් එක් වාතයට පිළිවෙළින් වලාකුළු තුන විනාශවීම මෙනි. සත්‍යය වසාලන අඳුර පහව ගිය කල්හි ගෝත්‍රභූ ඥානයට අතිශයින් පිරිසිදු නිවන අරමුණු කිරීම වලාකුළු පහව ගිය අහසෙහි ඒ පුරුෂයා පිරිසිදු සඳ දැකීම මෙනි. යම්සේ වාත තුන වනාහි සඳ වසාගෙන සිටි වලාකුළු විනාශ කරන්නට ම සමත් වුවත් සඳ දකින්නට සමත් නොවෙයි. මෙසේ අනුලෝම සිත් සත්‍යය වසාගෙන සිටි අඳුර දුරු කරන්නට සමත් වෙයි. නිවන් අරමුණු කරන්නට සමත් නොවෙයි. යම්සේ ඒ පුරුෂයා සඳ දකින්නට මිස වලාකුළු විනාශ කරන්නට සමත් නොවේ ද, මෙසේ ගෝත්‍රභූඥානය නිවන අරමුණු කරන්නට ම සමත් වෙයි. කෙලෙස් අඳුර නසන්නට සමත් නොවෙයි. මෙසේ අනුලෝම සිතට සංස්කාර අරමුණු වෙයි. ගෝත්‍රභූ ඥානයට නිවන අරමුණු වෙයි. යම්හෙයකින් වනාහි ගෝත්‍රභූ ඥානයට නිවන අරමුනු වෙයි. යම්හෙයකින් වනාහි ගෝත්‍රභූඥානය අනුලෝම සිතින් ගන්නා ලද අරමුණ ගනී ද, අනුලෝමය නැවත එය ලුහුබඳින්නේ යැයි මාර්ගයෙන් නැගිටීම ම වන්නේ ය. ගෝත්‍රභූඥානය වනාහි අනුලෝම සිතේ අරමුණ නො ගෙන එය පසුව පවතින්නක් නොකොට තමා ආවර්ජනරහිත වූයේ ම ආවර්ජන ස්ථානයෙහි සිට මෙසේ උපදවන්නැයි මාර්ගයට සංඥා දී මෙන් නිරුද්ධ වෙයි. මාර්ගය ද එයින් දුන් සංඥාව අත නොහැර ම අතරක් නැති

පැවතීම් වශයෙන් ඒ ඥානය ලුහුබඳනේවිනිවිද නොගිය විරූ නොපැළූ විරූ ලෝභ ස්කන්ධය ද්වේෂ ස්කන්ධය මෝහ ස්කන්ධය විනිවිද යමින් ද පළාලමින් ද උපදී.

එහි මේ උපමා කථාවක්, එක් දුනුවායෙක් වනාහි දුනුසියයක් මත පලිස්සියයක් තබා වස්ත්‍රයකින් මුව වෙළා ඒ සන්නද්ධව චක්‍රයන්ත්‍රයෙහි සිටියේ ය. අන් පුරුෂයෙක් චක්‍රයන්ත්‍රය කරකවා පලිස් සියය දුනුවායාට අභිමුඛ වනවිට දණ්ඩකින් එහි සංඥා කරයි. දුනුවායා දුඬ සංඥාව නොඉක්මවා ම ඊය දමාගසා පලිස් සියය විනිවිද යවයි. ගෝත්‍රභූඥානය එහි දඬු සංඥාව මෙනි. මාර්ගඥානය දුනුවායා මෙනි. මාර්ගඥානයට ගෝත්‍රභූඥානයෙන් දෙනලද සංඥාව නො ඉක්මවා ම නිවන අරමුණුකොට විනිවිද නො ගිය විරූ නො පළාදැමූ විරූ ලෝභ ස්කන්ධාදීන් විනිවිද යෑම පළාදැමීම දුනුවායා දඬු සංඥාව නො ඉක්මවා ම පලිස් සියය විදීම මෙනි. භූමිලද්ධ වට්ටසෙතු සමුඝාත තරණය (භූමිහෙි පිහිටි සංසාර හෙය උපුටා දැමීම) යනු ද මේය ම ය. මාර්ගයට ඇති එකම කෘත්‍යය අනුසය දුරුකිරීමයි. (මෙසේ) ඒ මාර්ගඥානයඅනුසයන් දුරුකරමින් නිමිත්තෙන් නැගිටීම නම්. පැවැත්ම සිඳීමයි. නිමිත්ත යනු රූප වේදනා සංඥා සංස්කාර විඥාන නිමිත්ත ය. පැවැත්ම යනු ද රූප වේදනා සංඥා සංස්කාර විඥානයන්ගේ පැවැත්ම ම ය. එය උපාදින්නකය අනුපාදින්නක යැයි දෙවැදෑරුම් ය. ඔවුනතුරෙන් මාර්ගය අනුපාදින්නකයෙන් නැගිටිනා ඡායාව පෙනේ යැයි කියා අනුපාදින්නකයෙන් නැගිටීයැයි කීහ. සෝවාන් මගින් දෘෂ්ටි සම්ප්‍රයුක්ත සිත් සතරත් විචිකිච්ඡා සහගත සිතත් යන සිත් පහ ප්‍රහීණ වෙයි. ඔව්හු රූපය උපදවත්, ඒ අනුපාදින්නක රූපස්කන්ධයයි, ඒ සිත් විඥාන ස්කන්ධය යි. එය හා සම්ප්‍රයුක්ත වූවෝ වේදනා සංඥා සංස්කාර යන ත්‍රිවිධ අරූපස්කන්ධයෝ ය.

ශ්‍රෝතාපන්නයා ශ්‍රෝතාපත්ති මාර්ගය නො වැඩුවේ වීනම් ඒ පස්වැදෑරුම් සිත් ෂඩාරම්මණයන්හි නැගිටීමට පැමිණෙයි. ශ්‍රෝතාපත්ති මාර්ගය වනාහි ඔවුන්ගේ නැගිටීමත් පැවැත්මත් වළක්වමින් හේතු සමිද්ඝාතය අභව්‍යෝත්පත්තික භාවය කිරීම උපාදින්නකයෙන් නැගිටී යනුයි. සකෘදාගාමී මාර්ගයෙන් දෘෂ්ටි විප්‍රයුක්ත සිත් සතර ද දෞර්මනස්ස සහගත සිත් දෙකදැයි ඕළාරික කාමරාග බ්‍යාපාද වශයෙන් වූ ඒ සිත් සය ප්‍රහීණ වෙයි. අනාගාමී මාර්ගයෙන් අනුසහගත වූ කාමරාග ව්‍යාපාද වශයෙන් වූ ඒ සිත් සය ම ප්‍රහීණ වෙයි. අර්හත් මාර්ගයෙන් දිට්ඨි

විප්පයුත්ත සිත් සතර ද උද්ධච්ච සහගතයැ යන අකුසල් සිත් පහ ප්‍රහීණ වෙයි. එහිදී ඒ ආර්යයන්ගේ ඒ මාර්ග නො වඩනා ලද්දේ වේ නම්, ඒ සිත් ෂඩාරම්මණයන්හි නැගිටීමට පැමිණෙයි. ඔව්හු වනාහි ඔවුන්ගේ මාර්ගයෙන් නැගිට පැවැත්ම වළක්වමින් සේතුසමුද්ඝාතය අභව්‍යෝත්පත්තිකභාවය කරනුයේ අනුපාදින්නකයෙන් නැගිටිත් නම්. උපාදින්නකයෙන් නැගිටින ඡායාව දකින්නේයැයි කියා උපාදින්නකයෙන් නැගිටී යැයි කීහ.

යම්හෙයකින් ශ්‍රෝතාපත්තයා ශ්‍රෝතාපත්ති මාර්ගය නොවඩනා ලද නම් අනවරාග්‍ර සංසාරයෙහි සත් භවයක් පමණක් උපාදින්නකයන් පැවැත්ම කරන්නේ ය. කවර හෙයින් ද, ඒ පැවැත්මට හේතු ඇති හෙයිනි. සක්කාය දිට්ඨි ආදී සංයෝජන තුන දිට්ඨානුසය විචිකිච්ඡානුසය යන මේ පංච ක්ලේශයන් ශ්‍රෝතාපත්ති මාර්ගය උපදිත් ම විනාශ කෙරේ. දැන් (එවැනි පැවැත්මක්) කොයින් ද, ශ්‍රෝතාපන්නයාට අනවරාග්‍ර සංසාරයෙහි සත්භවයක් හැර උපාදින්නකයන්ගේ පැවැත්ම නො වන්නේ ය. මෙසේ ශ්‍රෝතාපත්ති මාර්ගය උපාදින්නකයන්ගේ පැවැත්ම නවත්වමින් උපාදින්නකයෙන් නැගිටී නම් වේ. යම් හෙයකින් සකෘදාගාමියා සකෘදාගාමී මාර්ගය නො වැඩුයේ වී නම් පංච භවයන්ගෙන් දෙකක උපාදින්නකයන්ගේ පැවැත්ම කරන්නේ ය. කවරහෙයින් ද ඒ පැවැත්මට හේතු ඇති බැවිනි. ඖළාරික වූ කාමරාගපටිඝ සංයෝජන ඖළාරික වූ කාමරාගානුසය පටිඝානුසය යන මේ කෙලෙස් සතර ඒ මාර්ගය උපදිත් ම විනාශ කෙරේ. දැන් සකෘදාගාමියාට පංච භවයන්ගෙන් දෙකක මිස උපාදින්නකයන්ගේ පැවැත්මක් කොයින් ද? මෙසේ සකෘදාගාමී මාර්ගය උපාදින්නක පැවැත්ම නැති කරමින් උපාදින්නකයෙන් නැගිටී නම් වේ.

අනාගාමිකයා අනාගාමී මාර්ගය නො වඩනා ලද්දේ නම් එක් භවයක් හැර දෙවන භවයෙහි උපාදින්නක පැවැත්ම කරන්නේ ය. කවර හෙයින් ද? එහි පැවැත්මට හේතු ඇති බැවිනි. අණුසහගත කාමරාග පටිඝ සංයෝජන අණුසහගත කාමරාගානුසය පටිඝානුසය යන මේ කෙලෙස් සතර වනාහි ඒ මාර්ගය උපදිත්ම විනාශ කෙරෙයි. දැන් අනාගාමිකයාට එකභවය මිස දෙවන භවයෙහි උපාදින්නක පැවැත්මක් කොයින් ද, මෙසේ අනාගාමී මාර්ගය උපාදින්නක පැවැත්ම නැති කෙරෙමින් උපාදින්නකයෙන් නැගිටී නම් වේ. අර්හත් පුද්ගලයා අර්හත්

මාර්ගය නො වැඩුයේ නම් රූපාරූප භවයන්හි උපාදින්නක පැවැත්ම කරන්නේ ය. කවර හෙයින් ද? ඒ පැවැත්මට හේතු ඇති බැවිනි. රූප රාගය අරූප රාගය මානය උද්ධච්චය අවිද්‍යාව මානානුසය භවරාගානුසය අවිද්‍යානුසය යන මේ අෂ්ට ක්ලේශයෝ මාර්ගය උපදිත්ම විනාශ කෙරේ. දැන් ක්‍ෂීණාශ්‍රවයාට පුනර්භවයක උපාදින්නක පැවැත්මක් නම් කොයින් ද? මෙසේ අර්හත්මාර්ගය උපාදින්නක පැවැත්ම නැතිකෙරෙමින් උපාදින්නකයෙන් නැගිටී නම්. මෙහිදී ශ්‍රෝතාපත්ති මාර්ගය අපාය භවයෙන් නැගිටී. සකෘදාගාමී මාර්ගය සුගති කාමභයේ ඒකදේශයකින් නැගිටී. අනාගාමී මාර්ගය කාමභවයෙන් නැගිටී. අර්හත්මාර්ගය රූපාරූප භයෙන් නැගිටී. සියලු භවයන්ගෙන් ම නැගිටීයැයි මෙසේ කියත්. මෙහි අර්ථය විස්තර කිරීම පිණිස මේ පාළියයි.

ශ්‍රෝතාපත්ති මාර්ග ඥානයෙන් අභිසංස්කාර විඥානයාගේ නිරෝධයෙන් අනවරාග්‍ර සංසාර වෘත්තයෙහිසත් භවයක් හැර නාමරූපයෝ උපදින් නම් මෙහිදී ඔව්හු නිරුද්ධ වෙත්. සංසිඳෙත් අස්තයට යෙත් සම්පූර්ණයෙන් ම සංසිඳෙත්. අනාගාමී මාර්ගඥානයෙන් අභිසංස්කාර විඥානයාගේ නිරෝධයෙන් එක් භවයක් හැර (කාමධාතුවෙහි) භව දෙක්හි යම් නාමරූපයෝ උපදිත් නම් ඔව්හු මෙහිදී නිරුද්ධ වෙත්. සංසිඳෙත්. අස්තයට යෙත්. විශේෂයෙන් ම සංසිඳෙත්. අර්හත්මාර්ග ඥානයෙන් අභිසංස්කාර විඥානයාගේ නිරෝධයෙන් රූප ධාතුවෙහි හෝ අරූප ධාතුවෙහි යම් නාමරූපයෝ උපදිත් නම් ඔව්හු මෙහිදී නිරුද්ධ වෙත්. සංසිඳෙත්. අස්තයට යෙත්. විශේෂයෙන් සංසිඳෙත්. අනුපාදිශේෂ පරිනිර්වාණ ධාතුවෙන් පිරිනිවන්පාන රහත්හුගේ අවසන් විඥානයාගේ නිරෝධයෙන් මෙහිදී ප්‍රඥාව සතිය නාමය රූපය යන මොව්හු නිරුද්ධ වෙත්. සංසිඳෙත්. අස්තයට යෙත්. සම්පූර්ණයෙන් ම සංසිඳෙත් යන මෙය වනාහි නිමිති විනිශ්චය යි.

**පටිපදාපති** යන මෙහි වනාහි ප්‍රතිපදාව චලනය වේද චලනය නො වේ ද? යත්, සැලෙයි. තථාගතයන් වහන්සේටත් සාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේටත් වනාහි මාර්ග සතරම සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා ද වෙයි. මහා මෞද්ගල්‍යායන ස්ථවිරයන් වහන්සේට ප්‍රථම මාර්ගය සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤ විය. මතු මාර්ග (තුන) දුක්ඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා විය. කවර හෙයින් ද? නින්දෙන් මඩනා ලද හෙයිනි. සම්මා සම්බුදුරජාණන් වහන්සේ වනාහි (සත්දිනක්) ළදරු කුමරෙකු මෙන් තෙරුන් රැකබලා

ගත්හ. තෙරුන්වහන්සේ ද එක්දිනෙක නිදමින් හුන් සේක. ඉක්බිති ශාස්තෲන් වහන්සේ තෙරුන්ට මෞද්ගල්‍යානය? මෞද්ගල්‍යායනය! නිදා වැටෙනවා නො වේ ද ඔබ බමුණෙක් නො වේදැයි වදාළහ. මහිඥාප්‍රාප්ත වූ මෙබඳු ශ්‍රාවකයෙකුගේ පවා ප්‍රතිපදාව සැලෙයි. කිම, සෙස්සන්ගේ නො සැලේ ද? ඇතැම් (භික්ෂුවකට) වනාහි මාර්ග සතරම දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා වෙයි. ඇතැමෙකුට දුක්ඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා වෙයි. ඇතැමෙකුට සුඛා පටිපදා දන්ධාභිඤ්ඤා වෙයි. ඇතැමෙකුට සුඛාපටිපදා ඛිප්පාභිඤ්ඤා වෙයි. ඇතැමෙකුට ප්‍රථම මාර්ගය දුක්ඛා පටිපදා දන්ධාභිඤ්ඤා වෙයි. දෙවන මාර්ගය දුක්ඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා වෙයි. තුන්වන මාර්ගය සුඛා පටිපදා දන්ධාභිඤ්ඤා වෙයි. සතරවන මාර්ගය සුඛා පටිපදා ඛිප්පාභිඤ්ඤා වෙයි යනුයි. ප්‍රතිපදාව යම්සේ ද අධිපති ද එසේ ම සැලෙයි. මෙසේ ඇතැම් භික්ෂුවකට මාර්ග සතරම ඡන්දාධිපති වෙයි. ඇතැම් භික්ෂුවකට වීර්යාධිපති වෙයි. එක් භික්ෂුවකට චිත්තාධිපති වෙයි. ඇතැම් භික්ෂුවකට වීමංසාධිපති වෙයි. ඇතැම් භික්ෂුවකට වනාහි ප්‍රථම මාර්ගය ඡන්දාධිපති වෙයි. දෙවැන්න වීර්යාධිපති වෙයි. තෙවැන්න චිත්තාධිපති වෙයි. සතරවැන්න වීමංසාධිපති වෙයි යනුයි.

ප්‍රකීර්ණක කථා නිමියේ ය.

දැන් යම්හෙයකින් ලෝකෝත්තර කුශලය භාවනා කරන්නා හුදෙක් නිතර නිතර සිහිකිරීම් වශයෙන් ධ්‍යානය ම වඩන්නේ නොවෙයි. සසරින් නික්ම යෑමෙ අර්ථයෙන් මාර්ගය ද වඩයි. එළඹ සිටීම් අර්ථයෙන් සතිපට්ඨානය ද උත්සාහ කිරීම් අර්ථයෙන් සම්‍යක්ප්‍රධානය ද, සමෘද්ධවීම් අර්ථයෙන් ඍද්ධිපාදය ද ආධිපත්‍යාර්ථයෙන් ඉන්ද්‍රිය ද අකම්පාාර්ථයෙන් බලය ද, අවබෝධ කිරීම් අර්ථයෙන් බෝධ්‍යාංගද, තථාර්ථයෙන් සත්‍යය ද, වික්ෂිප්ත නොවීම් අර්ථයෙන් සමථය ද, ශූන්‍යතාර්ථයෙන් නිස්සත්වාර්ථයෙන් ධාතු ද, ප්‍රත්‍යාර්ථයෙන් ආහාරය ද, ස්පර්ශනාර්ථයෙන් ස්පර්ශය ද, වේදයිතාර්ථයෙන් වේදනාව ද, හැඳිනගැනීම් අර්ථයෙන් සංඥාව ද, චේතයිතාර්ථයෙන් චේතනාවද, විජානනාර්ථයෙන් සිත ද වඩයි. එහෙයින් එකුන්විසි නය දැක්වීම පිණිස නැවත කතමෙ ධම්මා කුසලා යන ආදිය දේශනා කරන ලදී. මෙසේ මෙයත් වඩයි. මෙයත් වඩයි යැයි පුද්ගලාධ්‍යාශය වශයෙන් ද දේශනා විලාසයෙන් ද නය විස්සක් දේශනා

කරන ලද්දේ වෙයි. බණ ඇසීමට උන් පිරිසෙහි වනාහි යම් අයෙක් උපනිධ්‍යානාර්ථයෙන් ලෝකෝත්තර ධ්‍යානය යැයි කී කල්හි අවබෝධ කරගනිත් ද? ඔවුන්ට සත්ප්‍රාය වශයෙන් ධ්‍යානය යැයි වදාරන ලදී. -පෙ- යමෙක් විජානනාර්ථයෙන් චිත්තයැයි කී කල්හි අවබෝධ කරගනිත් ද? ඔවුන් සත්ප්‍රාය වශයෙන් චිත්තං යැයි වදාරන ලදී. මේ මෙහි පුද්ගල අදහසයි. සම්මා සම්බුදුරජාණන් වහන්සේ වනාහි තමන්වහන්සේගේ බුද්ධ සුබෝධිතාවෙන් දශබල චතුර් වෛශාරද්‍යය චතුප්‍රතිසම්භිදාතාවෙන් ෂට් අසාධාරණඥානයෙන් ද දේශනාව යදිච්ඡකව නියමකොට දක්වන සේක. කැමතිවන සේක් ලෝකෝත්තර ධ්‍යානය උපනිධ්‍යානාර්ථයෙන් යැයි දක්වන සේක. කැමතිවන සේක් සසරදුකින් නික්මීම් අර්ථයෙන් -පෙ- විජානනාර්ථයෙන් ලෝකෝත්තර සිතයැයි දැයි මේ දේශනා විලාස නම්. එහි ලෝකෝත්තර ධ්‍යානයැයි කී තැන යම්සේ දසනයක් බෙදන ලදද, මෙසේ මාර්ග ආදියෙහි ද ඒ නයම දතයුතුයි. මෙසේ විසිතැනෙක දහය දහය කොට නය දෙසියයක් බෙදන ලද්දේ වෙයි.

දැන් අධිපතිභේදය දක්වන්නට නැවත කතමෙ ධම්මා කුසලා?යි ආදිය පටන්ගන්නා ලදී. එහි ඡන්දය ප්‍රධානකොට ජ්‍යෙෂ්ඨ කොට පූර්වාංගම කොට උපදවන ලද ලෝකෝත්තර ධ්‍යානය ඡන්දාධිපතෙය්‍ය නම්. සෙස්සෙහි ද මේ නයමය. මෙසේ ධර්මරාජයන් වහන්සේ පුරිම ශුද්ධිකයෙහි නය දෙසියයකි. ඡන්දාධිපති ආදීන්හි ද දෙක දෙක යැයි නය දහසකින් බෙදා ප්‍රථම මාර්ගය දැක්වූ සේක.

### ප්‍රථම මාර්ගය යි.

දැන් ද්විතීය මාර්ගාදීන් දැක්වීම පිණිස නැවත කතමෙ ධම්මා **කුසලා** යන ආදිය පටන්ගන්නා ලදී. එහිදී **කාමරාග** ව්‍යාපාදානං **පතනුභාවාය** යනු මේ ක්ලේශයන්ගේ තුනීකිරීම පිණිස ය. එහි කරුණු දෙකකින් තුනී බව දතයුතුයි. හේතු රහිතව ඉපදීමෙන් හා නැඟී සිටීමේ මන්දතාවෙනි. සකෘදාගාමියාට වනාහි සසර සැරිසරන මහජනයාට මෙන් කෙලෙස් නිතර නූපදී. ඉඳහිට උපදී. (උපදින්නේ ද) විරලාකාරව (උපදී) විරලව වපුරන ලද කෙතෙහි අංකුර මෙනි. උපදිනුයේ ද සසර සැරිසරන මහජනයාට මෙන් මර්දනය කෙරෙමින් පැතිරෙමින් වසමින් අන්ධකාර

කරමින් නූපදී. මාර්ග දෙකකින් ප්‍රහීණ වූ හෙයින් මඳ මඳව උපදී. තුනී ආකාරයෙන් (උපදී) වලාපටලයක්මැසි පිහාටුවක් ද මෙනි. එහිදී ඇතැම් තෙරවරු මෙසේ කියත්. සකෘදාගාමියාට බොහෝ කලකින් කෙලෙස් උපන්නත් බහලව ම උපදී. එසේ ම ඔහුට දූපුත්තු ද පෙනෙත් යනුයි. මෙය වනාහි අප්‍රමාණ ය. දූපුත්තු වනාහි අඟපසඟ පිරිමැදීම් මාත්‍ර ද මෙනි. මාර්ග දෙකින් ප්‍රහීණවූ හෙයින් කෙලෙසුන්ගේ බහලතාවක් නැත. හේතුරහිත උත්පත්තිය හා නැගිටීමේ වන්දනාව යන කරුණු දෙකින් ම කෙලෙසුන්ගේ තුනී බව දතයුතුයි. **දුතියාය** යනු ගණන වශයෙන් ද දෙවන උත්පත්තිය වශයෙන් ද දුතියාය ය. **භූමියා පත්තියා** යනු මාර්ගඵල ප්‍රතිලාභය පිණිසය. තෘතීය චතුර්ථයන්හිද මේ නයම ය. විශේෂ මාත්‍රයක් පමණක් කියමි. **අඤ්ඤින්ද්‍රියං** යනු දන්නා ඉන්ද්‍රියයි. ප්‍රථම මාර්ගයෙන් අවබෝධ කරගත් සීමාව නො ඉක්මවා ඔවුන්ගේ ඒ මාර්ගයෙන් ම අවබෝධ කරගත් චතුරාර්ය සත්‍යය දක්නා ඉන්ද්‍රිය යැයි කියන ලද්දේ වෙයි. මෙහි නිර්දේශ වාරයෙහි ද මේ නයින් ම අර්ථය දතයුතුයි. කොට්ඨාස වාරයෙහි ද මෙය සමග ඉන්ද්‍රියයෝ නවදෙනෙක් වෙත්. සෙස්ස පළමු නයින් ම දතයුතුයි.

**දෙවන මාර්ගය නිමියේ ය.**

තුන්වැන්නෙහි **අනවසෙසප්පහාණාය** යනු සකෘදාගාමි මාර්ගයෙන් තුනී වූ ඒ සංයෝජනයන්ගේ ම නිරවශේෂ ප්‍රහාණය පිණිස, සතරවැන්නෙහි **රූපරාග අරූප රාග මාන උද්ධච්ච අවිජ්ජාය අනවසෙස පහාණාය** යනු මේ පස්වැදෑරුම් උද්ධම්භාගීය සංයෝජනයන්ගේ නිරවශේෂ ප්‍රහාණය පිණිස, එහි **රූපරාගො** යනු රූපභවයෙහි ඡන්දරාගයයි. **අරූපරාගො** යනු අරූප භවයෙහි ඡන්දරාගයයි. **මානො** යනු අර්හත් මාර්ගයෙන් නැසිය යුතු මානය මය. **උද්ධච්චාවිජ්ජා** ද එසේය. මේ මාර්ග දෙකෙහි නවවැන්න අඤ්ඤින්ද්‍රිය ම වෙයි. සියලු මාර්ගයන්හි පද පිළිවෙළින් වූ සමසැටක් පද අපණ්ණකාංග සතරක් සමග සූසැටක් වෙයි. අසම්භින්න වශයෙන් වනාහි තිස්තුනකි. කොට්ඨාසවාර සුඤ්ඤත වාරයෝ ප්‍රකෘතියෙන් යුක්තයහ. ධර්මරාජන් වූ බුදුරජාණන් වහන්සේ ප්‍රථම මාර්ගයෙහි මෙන් ම ද්විතීයාදීන්හි ද මෙසේ නය දහසක්මයැයි සතර මාර්ගයන් නය සාරදහසකින් බෙදා දැක්වූ සේක.

සච්ච විභංගයෙහි වනාහි ලෝකෝත්තර නය සැටදහසක් මොවුන්ගේ වශයෙන් ම බහාලන ලදී. සතිපට්ඨාන විභංගයෙහි ලෝකෝත්තර නය විසිදහසක්, සම්‍යක්ප්‍රධාන විභංගයෙහි විස්සක් ඍද්ධිපාද විභංගයෙහි දෙතිසක් - බෝධ්‍යාංග විභංගයෙහිදෙතිසක් - මාර්ග විභංගයෙහි ලෝකෝත්තර නය විසිඅටදහසක් ද මොවුන්ගේ වශයෙන් ම බහාලන ලදී. මෙහි මාර්ග සතරෙහි වනාහි නය සාරදහසක් ම ය. ඔවුනතුරෙන් ප්‍රථමධ්‍යානික ප්‍රථම මාර්ගයෙහි අෂ්ටාංග බෙදන ලදී. ද්විතීයාදීන්හි ද එසේ ම ය. එහි ප්‍රථම මාර්ගයෙහි සම්‍යක් දෘෂ්ටිය දුරු කෙරේ යනු = සම්මා දිට්ඨි යයි. සම්‍යක් සංකල්ප ආදිය ද මිථ්‍යා සංකල්පාදීන් දුරුකිරීම් අර්ථයෙන් ම දතයුතුයි. මෙසේ ඇතිකල්හි ප්‍රථම මාර්ගයෙන් ම දෙසැටක් දෘෂ්ටි සහගතයන් ප්‍රහීණ හෙයින් මතු මාර්ග තුනෙන් ප්‍රහීණ කළයුතු දෘෂ්ටි නම් නැත. එහි සම්මා දිට්ඨි යන නාමය කෙසේ වේ ද යත්, යම්සේ විසක් ඇතත් නැතත් බෙහෙත බෙහෙතම යැයි කියනු ලැබේ. මෙසේ මිථ්‍යා දෘෂ්ටිය ඇතත් නැතත් මෙය සම්‍යක් දෘෂ්ටිය ම නමි. එසේ නම් මෙය නාම මාත්‍රයක් ම වේද, මතු මාර්ග තුනේදී සම්‍යක් දෘෂ්ටිය කෘත්‍ය රහිත බවට පැමිණෙයි. මාර්ගාංග සම්පූර්ණ නො වෙයි. එහෙයින් සම්‍යක් දෘෂ්ටිය කෘත්‍ය සහිත කළයුතුයි. මාර්ගාංග සම්පූර්ණ කළයුතුයි. මෙහිදී සම්‍යක් දෘෂ්ටියේ කෘත්‍ය සහිත බව යථාලාභ නියමයෙන් (ලැබෙන පරිදි) දැක්විය යුතුයි. මතු මාර්ග තුනෙන් නැසිය යුතු එක් මානයක් ඇත. එය දෘෂ්ටි ස්ථානයෙහි සිටී. ඒ සම්‍යක් දෘෂ්ටිය ඒ මානය දුරු කෙරේනුයි = සම්මා දිට්ඨිය, ශ්‍රෝතාපත්ති මාර්ගයේදී වනාහි සම්‍යක් දෘෂ්ටිය මිථ්‍යා දෘෂ්ටිය දුරුකරයි. ශ්‍රෝතාපන්නයාගේ වනාහි සකෘදාගාමී මාර්ගයෙන් නැසිය යුතු මානයක් ඇත. (එය දෘෂ්ටි ස්ථානයෙහි සිටී. එය) ඒ මානය දුරුකෙරේ යනු = සමමා දිට්ඨි ය. එයට ම අකුසල චිත්ත සහජාත සංකල්ප සතක් ඇත. එහෙයින් ම සිත්වලින් වාචාංග චලනය කිරීමක් ඇත. කායාංග චලනය කිරීමක් ඇත. ප්‍රත්‍යය පරිභෝගයක් ඇත. සහජාත ව්‍යායාමයක් ඇත. සිහි නැති බවක් ඇත. සහජාත චිත්තේකග්ගතාවක් ඇත. මොව්හු මිත්‍යා සංකල්පාදීහු නම් වෙත්. සකෘදාගාමී මාර්ගයේ සම්මා සංකල්පාදීහු ඔවුන්ගේ ප්‍රහාණයෙන් සම්මා සංකල්පාදීහුයැයි දතයුත්තාහ.

මෙසේ සකෘදාගාමි මාර්ගයේ අෂ්ටාංගයෝ කෘත්‍ය සහිත කොට ආවාහුය. අනාගාමි මාර්ගයේදී නැසිය යුතු මානයක් සකෘදාගාමී මාර්ගයට ඇත. එය දෘෂ්ටි ස්ථානයෙහි සිටී. එයට ම සිත් සත සමග සහජාත

සංකල්පාදීහු වෙත්ද අනාගාමී මාර්ගයේදී ඔවුන්ගේ ප්‍රහාණයෙන් අෂ්ටාංගයන්ගේ කෘත්‍ය සහිත බව දතයුතුයි. අනාගාමී මාර්ගයට අර්හත් මාර්ගයෙන් නැසිය යුතු මානයක් ඇත. එය දෘෂ්ටි ස්ථානයේ සිටී. එයට යම් අකුසල් සිත් පහක් ඔවුන් සමග සහජාත සංකල්පාදීහු වෙත් ද ඔවුන්ගේ ප්‍රහාණයෙන් අර්හත් මාර්ගයේ අෂ්ටාංගයන්ගේ කෘත්‍ය සහිත බව දතයුතුයි.

මේ මාර්ගයන් අතුරෙන් ද ප්‍රථම මාර්ගයෙන් සතර සත්‍යයෝ දක්නා ලදහ. මතු මාර්ග තුන දක්නා ලද්දම දකී ද නො දක්නා ලද්දක් දකී ද යත්, දක්නා ලද්ද ම දකී. මෙය ආචාර්යවරුන්ගේ සමානාර්ථ කථාවයි. විතණ්ඩවාදීහු වනාහි මෙසේ කීහ. 'නුදුටු දෙයක් දකී' යනුයි. ප්‍රථම මාර්ගයේදී කවර ඉන්‍ද්‍රියක් බෙදන්නෙහි දැයි ඔහුගෙන් ඇසිය යුතුය. දන්නේ නම් අඤ්ඤාතඤ්ඤස්සාමීතින්‍ද්‍රිය යැයි කියයි. මතු මාර්ගයන්හි කවරේදැයි කී කල්හි ද අඤ්ඤින්‍ද්‍රියයැයි කියයි. නො දුටු සත්‍ය දර්ශනය ඇති කල්හි මතු මාර්ගයන්හි ද අඤ්ඤාතඤ්ඤස්සාමීතින්‍ද්‍රිය යම බෙදන්නෙහිය. මෙසේ ඔබගේ ප්‍රශ්නය සමනය වේද අවබෝධ කරගත් පුද්ගලයා අවබෝධ කරගත් ක්ලේශයන් ප්‍රහීණ කරයි ද ප්‍රහීණ වූ කෙලෙස් ම දුරුකරයිදැයි ඔහු විමසයි යුතුයි. අන්‍යයෙක් අන්‍ය වූ කෙලෙස් ප්‍රහීණ කරයි යනුයි. අවබෝධ කළ පුද්ගලයා අවබෝධ වූ අප්‍රහීණ කෙලෙස් දුරුකරයි නම්, නො දක්නා ලද සත්‍යයනුත් දකීයැයි යන වාද ඇති පුද්ගලයාගෙන් (මෙය) ඇසිය යුතුයි. සත්‍යයෝ (නම්) කෙතෙක් ද කියායි. දන්නේ නම් සතරකැයි කියයි. ඔහුට මෙසේ කිවයුතුයි. ඔබගේ වාදයෙහි සත්‍යයෝ සොළසක් පැමිණෙත්. බුදුන් විසිනුදු නොදක්නා ලද්දක් දක්නෙහි ය. ඔබ බහුසච්චක නම් වෙයි. (මෙසේ) නොගනුව, සත්‍ය දර්ශනය නම් අපූර්වයක් නැත. අප්‍රහීණ ක්ලේශයන් ම දුරුකරයි.

(එහි) එහි සත්‍යදර්ශයාගේ අපූර්ව භාවයෙහි පේළෝපමාව ගන්නා ලදී. එක් පුද්ගලයෙකුට වනාහි සාර ගර්භයෙහි තබන ලද පෙට්ටි සතරක් ඇත. හෙතෙම රාත්‍රි කාලයෙහි පෙට්ටි පිළිබඳ කටයුතු ඇති වූ කල්හි දොර හැර පහන් දල්වා පහනින් අඳුර පහවී පෙට්ටි ප්‍රකට වූ කල්හි ඒවා පිළිබඳ කටයුතු කොට දොර වසා ගියේය. නැවත අන්ධකාරය පැතිර ගියේ ය.දෙවන වරද තෙවන වර ද එසේ ම කෙළේ ය. සතරවනවර (දොර) විවර කළ කල්හි අඳුරෙහි පෙට්ටි නො පෙනේ යැයි විමසද්දී ම

ඉර උදාවිය. සූර්යාලෝකයෙන් අඳුර පහව ගිය කල්හි පෙට්ටි පිළිබඳ කටයුතු කොට ගියේ ය.

එහි සත්‍ය සතර පෙට්ටි හතර මෙනි. සෝවාන් මාර්ගය පිළිබඳ විදර්ශනාව පවත්වාගෙන ගිය කාලය පෙට්ටි පිළිබඳ කෘත්‍යය උපන්කල්හි දොර විවර කරන කාලය මෙනි. සත්‍යය වසාලන අඳුර අන්ධකාරය මෙනි. ශ්‍රෝතාපත්ති මාර්ගාලෝකය පහන් එළිය මෙනි. මාර්ගඥානයට සත්‍යය ප්‍රකටවීම අඳුර පහව ගිය කල්හි ඒ පුරුෂයාට පෙට්ටි පෙනීයෑම මෙනි. මාර්ගඥානයට ප්‍රකට වූ දේ (වනාහි) මාර්ගයෙන් සමංගත පුද්ගලයාට ද ප්‍රකට වේ ම ය. සෝවාන් මාර්ගය පිළිබඳව තමා විසින් පහ කළයුතු ක්ලේශයන් දුරුකොට නිරුද්ධ වූ කාලය පේළාවන් පිළිබඳ කටයුතු කොට ගිය කාලය මෙනි. මතු මාර්ග තුනෙන් නැසිය යුතු සත්‍යය වසාලන අඳුර නැවත දුරුව පැතිරගිය කාලය මෙනි. සකෘදාගාමී මාර්ගය පිළිබඳ විදර්ශනාව පවත්වාගෙන යන කාලය දෙවන වාරයේදී දොර විවරකිරීම මෙනි. සකෘදාගාමී මාර්ගොභාසය පහන් එළිය මෙනි. සකෘදාගාමි මාර්ගය පිළිබඳව තමා විසින් පහ කළයුතු ක්ලේශයන් දුරුකොට නිරුද්ධ කාලය පේළාවන් පිළිබඳ කෘත්‍යය කොට ගිය කාලය මෙනි. මතු මාර්ග දෙකින් නැසිය යුතු සත්‍යය වසාලන අඳුර නැවත අඳුරු පැතිරයෑම මෙනි. අනාගාමි මාර්ගයට විදර්ශනාව පවත්වාගෙන යෑම තුන්වෙනි වර දොර විවර කරන කාලය මෙනි. අනාගාමි මාර්ගය පිළිබඳව තමා විසින් පහකළයුතු ක්ලේශයන් පහකොට නිරුද්ධ කාලය පේළාවන් පිළිබඳ කෘත්‍යය කොට ගිය කාලය මෙනි. මත්තෙහි අර්හත් මාර්ගයෙන් විනාශ කළයුතු සත්‍යය වසාලන අඳුර නැවත අඳුර පැතිරීම මෙනි. අර්හත් මාර්ගය පිළිබඳ විදර්ශනාව පවත්වාගෙන යන කාලය සතරවන වාරයෙහි දොර විවරකරන කාලය මෙනි.

අර්හත් මාර්ගය ඉපදීම සූර්යෝද්ගමනය මෙනි. අර්හත් මාර්ගයාගේ සත්‍යය වසාලන මෝහාන්ධකාරය දුරුකිරීම අඳුර දුරුකිරීම මෙනි. අර්හත් මාර්ග ඥානයට චතුරාර්යය සත්‍යය ප්‍රකටවීම අඳුර පහව ගිය කල ඔහුට පේළාවන් ප්‍රකටවීම මෙනි. ඥානයට ප්‍රකට වූ සත්‍යයෝ පුද්ගලයාට ද ප්‍රකට වූවාහු වෙත්. අර්හත් මාර්ගයාගේ සියලු කෙලෙස් ක්‍ෂය වීම පේළාවන් පිළිබඳ කටයුතු කොට ගිය කාලය මෙනි. අර්හත්මාර්ගය උපන් කාලයේ පටන් නැවත සත්‍යය වසාලන අඳුරු බව සූර්යෝද්ගමනයේ පටන් ආලෝකයව පැවති කාලය මෙනි. මේ වනාහි සත්‍ය දර්ශනයාගේ

අපුබ්බ භාවයෙහි උපමාවයි. දක්නා ලද්දම දකී. රහත් තෙම චනාහි අවබෝධ කරගත් කෙලෙස් දුරුකරයි යනුයි.

මෙහි දී ඛාරොපමාව ද ගන්නා ලදී. එක් පුරුෂයෙක් කිලිටු වස්ත්‍රයක් රජකයාට දුන්නේ ය. රජත තෙම කරමැටිඅළු දරඅළු ගොමඅළු යන අළු වර්ග තුන දමා අළු කාවැදුණු බව දැන දියෙහි සෝදා ඕළාරික ඕළාරික කුණු පාකර හැරියේ ය. ඉක්බිති තවමත් පිරිසිදු නොවීයැයි දෙවනවර ද එසේ ම අළු දමා දියෙහි සෝදා එයින් ඉතා සියුම් නොවූ මල සෝදා හැරියේ ය. ඉක්බිති තවමත් පිරිසිදු නොවිණැයි තුන්වන වර ද ඒ අළු දමා දියෙහි සෝදා එයින් ඉතා සියුම් වූ මල සෝදා හැරියේ ය. ඉක්බිති තවත් පිරිසිදු නොවිණැයි සතරවන වර ද ඒ අළු දමා දියෙහි සෝදා අභ්‍යන්තරගත අංශු මාත්‍රයකුදු ඉතිරි නො කොට මල සෝදා හැර ස්වාමියාට දුන්නේ ය. හෙතෙම සුවඳ කරඬුවෙක බහා කැමති කැමති විටදී අඳී. කෙලෙස් අනුව ගිය සිත එහි කිලිටු වස්ත්‍රය මෙනි. ත්‍රිවිධ අනුපස්සනාවන්හි කර්ම පවත්වන කාලය ත්‍රිවිධ අළු දමන කාලය මෙනි. සෝවාන් මාර්ගයෙන් පංචවිධ ක්ලේශයන් සෝදා හැරීම දියෙහි සෝදා ඕළාරික මල සෝදාහැරීම මෙනි. තවමත් මේ සිත අපිරිසිදු යැයි ඒ ත්‍රිවිධ අනුපස්සනාවන්හි ම කර්ම පැවැත්මීම දෙවන වර ද ඒ අළු දැමීම මෙනි. සකෘදාගාමි මාර්ගයෙන් ඕළාරික සංයෝජන දෙක ක්‍ෂය කර දැමීම ඉක්බිති ඉතා සියුම් නොවූ මල සෝදාහැරීම මෙනි. මේ සිත තවමත් පිරිසිදු නොවිණැයි ඒ ත්‍රිවිධ අනුපස්සනාවන්හි කර්ම පැවැත්වීම ඉක්බිති තවමත් වස්ත්‍රය පිරිසිදු නො විනැයි නැවතත් අළු දැමීම මෙනි. අනාගාමි මාර්ගයෙන් අනුසහගත සංයෝජන දෙක ක්‍ෂය කර දැමීම ඉක්බිති ඉතා සියුම් මල සෝදාහැරීම මෙනි. මේ සිත තවමත් පිරිසිදු නො විනැයි ඒ ත්‍රිවිධ අනුපස්සනාවන්හි කර්ම පැවැත්වීම වස්ත්‍රය තවමත් පිරිසිදු නො විනැයි නැවත අළු වර්ග තුන දැමීම මෙනි. අර්හත් මාර්ගයෙන් අටවැදෑරුම් කෙලෙස් ක්‍ෂය කළ හෙයින් පිරිසිදු රහතන් වහන්සේ කැමති කැමති විටෙක පලසමවත් විහරණයෙන් කාලය ගෙවීම ඉක්බිති සේදීමෙන් අභ්‍යන්තරගත අංශුමාත්‍ර වූත් මල පාකර හැර පිරිසිදු රිදීපටක් සමාන සුවඳ කරඬුවේ බහාලූ වස්ත්‍රය කැමති කැමති විටෙක හැඳීම මෙනි. මෙහි මේ උපමාව අඤ්ඤෙන අඤ්ඤා, කිලෙසො පජහති යනු මෙහි උපමාවයි.

මෙය ද කියන ලදී. 'ඇවැත්නි, යම්සේ කිලිටි වූ මල බැඳුණු වස්ත්‍රයක් වේද, හිමියෝ එය පිරිසිදු කිරීම රජකයාට දෙන්නාහ. රජකතෙම

එය කරමැටියෙහි හෝ අළුවල හෝ ගොමවල හෝ උලා පිරිසිදු ජලයෙහි සෝදයි. ඒ වස්ත්‍රය පිරිසිදු වූයේ නමුදු මනාව පිරිසිදු වූයේ නමුදු එහි නොනසන ලද අනුසහගත කරමැටි ගඳ හෝ අළුගඳ හෝ ගොමගඳ හෝ වේ මය. රජකතෙම එය හිමියන්ට දෙයි. හිමියෝ එය සුවඳ කවන ලද කරඬුවෙහි බහාලති. එහි නො නසන ලදුව අනුසහගත වූ කරමැටි ගඳක් හෝ අළුගඳක් හෝ ගොමගඳක් හෝ වේ නම් එය විනාශවී යයි. ඇවැත්නි, එපරිද්දෙන් වනාහි ආර්ය ශ්‍රාවකයාගේ පංච ඕරම්භාගිය සංයෝජන ප්‍රහීණ වුවද ඉක්බිති ඔහුගේ නො නසන ලද අනුසහගත පංචස්කන්ධයන් පිළිබඳ (මම) වෙමි යන මානය (මම) වෙමි යන ඡන්දය (මම) වෙමි යන අනුසය වෙයි. හෙතෙම පසුකලෙක රූපය මෙසේ ය. රූපයාගේ හටගැනීම මෙසේ ය. රූපයාගේ අස්තංගය මෙසේ ය. වේදනාව මෙසේ ය. සංඥාව මෙසේ ය. සංස්කාරයෝ මෙසේ ය. විඥානය මෙසේ ය. විඥානයාගේ හටගැනීම මෙසේ ය. විඥානයාගේ අස්තංගමය මෙසේ යැයි පංච උපාදානස්කන්ධයන්හි උදයව්‍යය අනුව බලමින් වාසය කරයි. මෙසේ මේ පංච උපාදානස්කන්ධයන්හි උදයව්‍යය අනුව බලමින් වාසය ඔහුගේ නොනසන ලදුව අනුසහගතව ආ පංච උපාදානස්කන්ධයන් පිළිබඳ (මම) වෙමි යන යම් මානයක් (මම) වෙමි යන යම් ඡන්දයක් (මම) වෙමි යන යම් අනුසයක් වේ නම් එය විනාශයට පැමිණේ' යනුයි.

එහි ශ්‍රෝතාපත්ති මාර්ගයෙන් චිත්තාංග වශයෙන් උපදනා පාප ධර්මයන් සමග පංච අකුශල සිත් ප්‍රහීණ වෙයි. සකෘදාගාමී මාර්ගයෙන් චිත්තාංග වශයෙන් උපදනා පාපධර්මයන් සමග ද්වේෂ සහගත සිත් දෙක තුනී වෙයි. අනාගාමී මාර්ගයෙන් සම්ප්‍රයුක්ත ධර්මයන් සමග ඒ දොම්නස් සහගත සිත් ප්‍රහීණ වෙයි. අර්හත් මාර්ගයෙන් චිත්තාංග වශයෙන් උපදනා පාපධර්මයන් සමග පංච අකුශල චිත්තයෝ ප්‍රහීණ වෙත්. මේ දොළොස් අකුසල සිත් ප්‍රහීණ වූ කාලයේ පටන් ක්ෂීණාශ්‍රවයාට නැවත පසුව පවතින කෙලෙස් නම් නො වෙයි.

එහිදී මේ උපමාවකි. එක් මහරජ කෙනෙක් ප්‍රත්‍යන්තයෙහි ආරක්ෂාව යොදා මහ නගරයෙහි ඉසුරු අනුභව කරමින් වාසය කරති. ඉක්බිති ඔහුට ප්‍රත්‍යන්තය කිපුණේ ය. එසමයෙහි සොර දෙටුවෝ දොළොස් දෙනෙක් නොයෙක් දහස්ගණන් පුරුෂයින් සමග රට පැහැර ගනිත්. ප්‍රත්‍යන්තවාසී මහඇමතියෝ ප්‍රත්‍යන්තය කිපිණැයි රජුට දැන්වූහ. රජ තෙමේ විශ්වාස අය ගනුව. මම නුඹලාට කළයුතු දේ කරමියි හස්නක්

යැවී ය. ඔව්හු පළමු ප්‍රහාරයෙන් ම නොයෙක් දහස් ගණන් පුරුෂයින් සමගින් සොරදෙටුවන් පස්දෙනෙකු ඝාතනය කළහ. ඉතිරි සත්දෙන (තම) තමන්ගේ පිරිස ගෙන පර්වතයට පිවිසියහ. ඇමතියෝ ඒ පුවත රජුට දැන්වූහ. රජතෙමේ නුඹලාට කළයුතු දේ මම දනිමි. ඔවුන් ගනුවයි ධනය යැවීය. ඔව්හු දෙවන ප්‍රහාරයෙන් සොරදෙටුවන් දෙදෙනෙකු නැසූහ. ඔවුන්ගේ පිරිවර ද දුර්වල කළහ. ඒ සියල්ලෝ ද පලාගොස් පර්වතයට පිවිසියහ. ඇමතියෝ ඒ පුවත ද රජුට දැන්වූහ. රජ නැවතත් විශ්වාසයන් ගනුවයි ධනය යැවීය. ඔව්හු තුන්වන ප්‍රහාරයෙන් සහායක පුරුෂයන් සමග සොරදෙටුවන් දෙදෙනෙකු ඝාතනය කොට ඒ පුවත ද රජුට දැන්වූහ. රජ නැවතත් සෙසු විශ්වාස අය ගනුවයි ධනය යැවීය. ඔව්හු සතරවන ප්‍රහාරයෙන් පිරිවර සහිත ව සොරදෙටුවන් පස්දෙනෙකු ඝාතනය කළහ. සොරදෙටුවන් දොළොස් දෙනා ඝාතනය කළ තැන් පටන් කිසිම සොරෙක් නම් නැත. භයරහිත ජනපද වැසියෝ දරුවන් ළෙහි නටවමින් වාසය කෙරෙත් යැයි සිතමි. රජතුමා විජිත සංග්‍රාම ඇති යෝධයින් පිරිවරා උතුම් ප්‍රාසාද ගතවූයේ මහත් සම්පත් අනුභව කෙළේ ය.

එහි බුදුරජාණන් වහන්සේ රජු මෙනි. යෝගාවචර කුලපුත්‍රයෝ ප්‍රත්‍යන්ත වැසි ඇමතියන් මෙනි. දොළොස් අකුසල් සිත් සොරදෙටුවන් දොළොස් දෙනා මෙනි. චිත්තාංග වශයෙන් උපදනා පාපධර්මයෝ ඔහුගේ සහායක නොයෙක් දහස් ගණන් පුරුෂයන් මෙනි. අරමුණෙහි ක්ලේශයන් උපන් කල්හි 'ස්වාමීනි, මම ක්ලේශයක් උපනැ'යි බුදුන්ට දන්වන කාලය ප්‍රත්‍යන්තය කිපිණැයි රජුට දැන්වූ කාලය මෙනි. මහණ කෙලෙසුන් නිග්‍රහ කරවයි බුදුන් විසින් කර්මස්ථාන දීම විශ්වාසයන් ගනුවැයි ධනය දීම මෙනි. සෝවාන් මාර්ගයෙන් සසම්ප්‍රයුක්ත පංච අකුශල චිත්තයන්ගේ ප්‍රහාණය පිරිවර සහිත සොරදෙටුවන් පස්දෙනා ඝාතනය කළ කාලය මෙනි. ලබන ලද ගුණය බුදුන්ට දැන්වීම නැවත රජුට ප්‍රවෘත්ති දැන්වීම මෙනි. බුදුරජාණන් වහන්සේ සකෘදාගාමි මාර්ගයට විදර්ශනා දෙසීම සෙස්සන් ද ගනුවයි නැවත ධනය දීම මෙනි. සකෘදාගාමි මාර්ගයෙන් සසම්ප්‍රයුක්ත දෝමනස්ස සහගත සිත් දෙක තුනීබවට පත්කිරීම දෙවන ප්‍රහාරයෙන් පිරිවර සහිත සොරදෙටුවන් දෙදෙනා දුබලකිරීම මෙනි. බුදුරජාණන් වහන්සේට ලබන ලද ගුණය දැන්වීම නැවත රජුට ප්‍රවෘත්ති දැන්වීම මෙනි. බුදුරජාණන් වහන්සේ අනාගාමි මාර්ගයට විදර්ශනා දේශනා කිරීම විශ්වාසයන් ගනුවයි නැවත ධනය දීම මෙනි. අනාගාමි මාර්ගයෙන් සසම්ප්‍රයුක්ත දොම්නස් සිත් දෙක ප්‍රහාණය කිරීම තුන්වන

ප්‍රහාරයෙන් පිරිවර සහිත සොරදෙටුවන් දෙදෙනා ඝාතනය කිරීම මෙනි. ලබන ලද ගුණය බුදුන්ට දැන්වීම නැවත රජුට ප්‍රවෘත්ති දැන්වීම මෙනි. භාග්‍යවතුන් වහන්සේ අර්හත් මාර්ගයට විදර්ශනා දේශනා කිරීම විශ්වාසයන් ගනුවයි නැවත ධනය දීම මෙනි. අර්හත් මාර්ගයෙන් සසම්ප්‍රයුක්ත පංච අකුශල චිත්තයන් ප්‍රහීණ වූ කල්හි දොළොස් අකුසල සිත් ප්‍රහීණ වූ කාලයේ පටන් නැවත චිත්තාංග වශයෙන් උපදනා අකුශල ධර්මයන්ගේ අභාවය සතරවන ප්‍රහාරයෙන් පිරිවර සහිත සොරදෙටුවන්පස්දෙනා ඝාතනය කළ තැන් පටන් ජනපදයේ ක්ෂේම කාලය මෙනි. රහතුන් පිරිවැරූ බුදුරජාණන් වහන්සේ සුඤ්ඤත අනිමිත්ත අප්පණිහිත භේදයන්ගෙන් යුත් සමවත් සුව අතුරෙන් කැමති කැමති සුව අනුභව කිරීම දිනන ලද සංග්‍රාම ඇති ඇමති ගණයා පිරිවැරූ රජු වරප්‍රසාදයෙන් මහත් සැප අනුභව කිරීම මෙනැයි දතයුතුයි.

කුසලාධම්මා යන පදයේ වර්ණනාව නිමියේ ය.

දැන් අකුශල (ධර්ම) පදය බෙදා දක්වන්නට කතමෙ ධම්මා අකුසලා යන ආදිය පටන්ගන්නා ලදී. එහි ධර්ම ව්‍යවස්ථානාදීවාර ප්‍රභේදය ද යට ආ පදයන්ගේ අර්ථ විනිශ්වය ද යට කියන ලද නයින් ම දතයුතුයි. ඒ ඒ ගැන විශේෂය පමණක් වර්ණනා කරමු. එය සමය ව්‍යවස්ථානයේ පමණක් යම්හෙයකින් (කුසලයට මෙන්) අකුසලයට භූමි භේදයක් නැද්ද, එහෙයින් ඒකාන්තයෙන් (කාමාවචරය ද මෙය සමානය) කාමාවචර යැයි (නො) කියන ලදී. **දිට්ඨිගත සම්පයුත්තං** යන මෙහි දිට්ඨිය ම =දිට්ඨිගතය, ගූථගතං මුත්තගතං ආදීන් මෙනි. යායුත්තක් නැති බැවින් හෝ මෙය දෘෂ්ටියට යෑම පමණි යැයි ද = දිට්ඨිගත ය. එයින් යුක්ත වූයේ = **දිට්ඨිගත සම්පයුත්තය,** එහි අසද්ධර්මය ඇසීම පාපමිත්‍රතාව ආර්යයන් නො දැකීමේ කැමැත්ත ආදී නුනුවණින් මෙනෙහි කිරීම යන මේ ආදී කරුණුවලින් මේ දෘෂ්ටිගත නම් වූ මිථ්‍යා දර්ශනයාගේ උත්පත්තිය දතයුතුයි. මේ දෘෂ්ටිවාදවලින් යම් අසද්ධර්ම වේනම් ඒ ධර්මයන්ට බුහුමන් කිරීම මුල් කරගත් මධ්‍යස්ථභාවය ඉක්මවීමෙන්, පරීක්ෂාවෙන් තොරව ඇසීමෙන් විපර්යාස වූ දෘෂ්ටි ඇති පාපමිත්‍රයන්ට අවනතවීම නම් පාපමිත්‍ර සේවනයෙන්, බුද්ධාදී ආර්යයන් මෙන් ම සත්පුරුෂයන් දැකීමට නො කැමති බැවින්, සතර සතිපට්ඨාන ආදී වූ ආර්ය ධර්මයන්හි අදක්ෂ

බැවින්, ප්‍රාතිමෝක්ෂ සංවරය ඉන්‍ද්‍රිය සංවරය සති සංවරය ඥාන සංවරය ප්‍රහාණ සංවරය යන ප්‍රභේදවලින් යුත් ආර්ය ධර්මයෙහි මෙන් ම සත්පුරුෂ ධර්මයෙහි ද සංවරභේද නය නම් වූ අවිනයෙන් ද එම කරුණුවලින් ම දියුණු කරන ලද අයෝනිසෝ මනසිකාරයෙන් ද කෝතුහල මංගලාදීන්හි යෙදීමෙන් ද (යන මේ කරුණුවලින්) මෙය උපදීයැයි දතයුතුයි. මේ සිත පිළිබඳ අසංස්කාරභාවය යට කියන ලද නයින් ම දතයුතුයි.

සමුද්දෙස වාරයෙහි **ඵස්සො** යනු අසල සිත සමග උපන් ස්පර්ශයයි. **වෙදනා** ආදියෙහි ද මේ නය ම ය. මෙසේ මොවුන්ගේ පළමු ධර්මයන්ගෙන් වෙනස අකුසල යන්න පමණි. **චිත්තස්සෙකග්ගතා හොති** යනු ප්‍රාණඝාත ආදීන්හි ද අවික්ෂිප්ත භාවයේ සිතේ එකඟ බව ඇතිවෙයි. මිනිස්සු වනාහි සිත එකඟකොට අවික්ෂිප්තව නිවැරදි ආවුධයන් ප්‍රාණීන්ගේ ශරීරයන්හි හෙළත්, මනාව එකඟ වූ සිත් ඇතිව අන්සතු දේ පැහැර ගනිත්. ඒකරස වූ සිතින් මිථ්‍යාචාරයේ හැසිරෙත්. මෙසේ අකුසල පැවැත්මේදී ද සිතේ එකඟබව ඇතිවේ. **මිච්ඡාදිට්ඨි** යනු අයථා දෘෂ්ටියයි. වරදවා ගන්නා හෙයින් හෝ විෂම වූ දෘෂ්ටිය = **මිච්ඡාදිට්ඨි** යයි. අනර්ථය ගෙන දෙන පණ්ඩිතයන් විසින් පිළිකුල් කරන ලද දෘෂ්ටිය යනු ද = **මිච්ඡාදිට්ඨි ය.** මිච්ඡා සංකප්ප ආදීන්හි ද මේ නය ම ය. තව ද වරදවා බලනහෙයින් තෙමේ ද වැරදි ලෙස බලයි. මෙය මිථ්‍යා පමණය යනු ද **මිච්ඡා දිට්ඨි** ය. එය නුනුවණින් ඇතුළුවීම ලක්ෂණකොට ඇත්තේ ය. පරාමර්ශනය රසයකොට ඇත්තේ ය. මිථ්‍යා ලෙස ඇතුළුවීම එළඹසිටි කාරණය කොට ඇත්තේ ය. ආර්යයන් නො දැකීමේ කැමතිබව ආදිය ආසන්න කාරණය කොට ඇත්තේ ය. මෙය පරම වරදයැයි දතයුතුයි. **මිච්ඡා සංකප්ප** ආදීන්හි මිච්ඡා යන පදමාත්‍රය වෙනසයි. සෙස්ස කුසලාධිකාරයෙහි කියන ලද නයින් ම දතයුතුයි.

**අහිරිකබලං අනොත්තප්පබලං** යන මෙහි බලය යන්නෙහි අර්ථය නිර්දේශවාරයෙහි මතු දැක්වෙයි. අන් තැන්වල වනාහි ලජ්ජා නො වේ යනු = **අහිරිකො** ය. අහිරිකයාගේ භාවය, **ඔත්තප්ප** නොවූයේ **අනොත්තප්ප** ය, ඔවුනතුරෙන් අහිරිකය කාය දුශ්චරිතාදියෙන් පිළිකුල් නොවන ලක්ෂණය හෝ ලජ්ජා නො වන ලක්ෂණයයි. **අනොත්තප්පය** ඒවායින් බිය නො වන ලක්ෂණයයි. තැති නො ගන්නා ලක්ෂණ හෝ යි. අහිරිකයම බලය වූයේ = **අහිරික බලං** ය. **අනොත්තප්පය** ම බලය වූයේ

= අනොත්තප්පබලං ය. මේ මෙහි සංක්ෂේපයයි. විස්තරය වනාහි යට කියන ලද්දට ප්‍රතිපක්ෂ වශයෙන් දතයුතුයි.

එයින් ලෝභ කරනු ලබත්. තෙමේ හෝ ලෝභ කෙරේ. එය ලෝභ කිරීම් මාත්‍රයක්ම ය යනු = ලොභො යි. එයින් මුළාවෙත් තෙමේ හෝ මුළාවෙයි. එය මුළාවීම් මාත්‍රයක්මය යනු = මොහො ය. ඔවුනතුරෙන් ලෝභය අරමුණ ග්‍රහණය කිරීම ලක්ෂණකොට ඇත්තේ ය. මකුළුවාගේ ආලේපය මෙනි. රත් වූ කබලෙහි දමන ලද මාංශපේශියක් මෙන් ඇලීම රසය කොට ඇත්තේ ය. අත්නොහැරීම එළඹසිටි කාරණය කොට ඇත්තේ ය. තෙල් හා අඤ්ජන රාගය මෙනි. සංයෝජනීය ධර්මයන්හි රසවිඳීම ආසන්න කාරණය කොට ඇත්තේය. (එය) තෘෂ්ණා නදිය ස්වභාවයෙන් වැඩෙමින් ශීඝ්‍ර සැඩපහර ඇති නදියක් මුහුදට යන්නා මෙන් අපායට ම ගෙනයයි යැයි දතයුතුයි. මෝහය සිතේ අන්ධභාවය ලක්ෂණකොට ඇත්තේ ය. නො දැනීම ලක්ෂණකොට හෝ ඇත්තේ ය. ප්‍රතිවේධ නො වීම රසය කොට ඇත්තේ ය. අරමුණෙහි ස්වභාවය වැසීම හෝ රසය කොට ඇත්තේ ය. මිථ්‍යා ප්‍රතිපත්තිය එළඹ සිටි කාරණය කොට ඇත්තේ ය. අන්ධකාරය හෝ එළඹසිටි කාරණය කොට ඇත්තේ ය. අයෝනිසෝ මනසිකාරය ආසන්න කාරණය කොට ඇත්තේ ය. සියලුම අකුශලයන්ගේ මූලය යැයි දතයුතුයි.

එයින් දැඩි ලෙස ලෝභ කෙරෙත් තෙමේ හෝ දැඩි ලෙස ලෝභ කෙරේයි මෙය දැඩිලෙස ලෝභ කිරීම පමණකි යනු = අභිජ්ඣා ය, එය අනුන්ගේ සම්පත් තමා සතුකර ගැනීමේ කැමැත්ත ලක්ෂණකොට ඇත්තේ ය. ඒ අයුරින් ම සොයන බව රසයකොට ඇත්තේ ය. අනුන්ගේ සම්පත්වලට සමීපවීම එළඹසිටි කාරණය කොට ඇත්තේ ය. අනුන්ගේ සම්පතෙහි දැඩි ඇල්ම ආසන්න කාරණය කොට ඇත්තේ ය. එය වනාහි අනුන්ගේ සම්පතට අභිමුඛ වීම ම යැයි වැටහේ. එහි ද අභිරතිය ඇතිකල්හි පවතී. පරසම්පත්තීන්හි සිතින් අත දිගුකිරීම මෙනැයි දතයුතුයි. සමථො හොති යන ආදීන්හි අන් කෘත්‍යයන්හි වික්ෂේපය සමනය වන හෙයින් = සමථො යි, අකුසල පැවැත්මෙහි ඔසවා තබයි යනු = පග්ගාහ ය, වික්ෂේප නොවේ යනු අවික්ඛෙප ය, මේ සිතෙහි සද්ධා සති පඤ්ඤා ආදී ෂට්යුගලය යන ධර්මයෝ නො ගන්නා ලදී. කවර හෙයින් ද යත්, ශ්‍රද්ධාවෙන් තොර සිතෙහි ප්‍රසාදයක් නම් නැත. එහෙයින් ම නො ගන්නා ලදී. කිම දෘෂ්ටිගතිකයෝ වනාහි තම තමන්ගේ ශාස්තෘන් නො අදහත් ද? අදහත් එය

වනාහි ශ්‍රද්ධාව නො වේ. එය පිළිගැනීම් මාත්‍රයක් ම ය. එය අර්ථ වශයෙන් පරීක්ෂා නො කිරීම හෝ දෘෂ්ටිය හෝ වෙයි. අශ්‍රද්ධාවත් සිතෙහි වනාහි සතිය නැතැයි නො ගන්නා ලදී. කිම දෘෂ්ටිගතිකයෝ තමන් කළ කර්මය සිහි නො කරත් ද යත්, සිහිකරත්, එය වනාහි සතිය නම් නො වේ. හුදෙක් සතියේ ආකාරයෙන් අකුශල චිත්ත ප්‍රවෘත්තියක් පමණි. එහෙයින් සතිය නො ගන්නා ලදී. එසේ නම් කවරහෙයින් සූත්‍රාන්තයෙහි මිච්ඡා සති යැයි කියන ලද ද? (එය වනාහි) අකුශල ස්කන්ධයන් සතියෙන් තොර හෙයින් ද සතියට ප්‍රතිපක්ෂ හෙයින් ද මිථ්‍යා මාර්ගය කැමති වන්නන් පිරවීම පිණිස එහි පර්යාය වශයෙන් (දේශනා කරන ලදී. නිෂ්පර්යාය වශයෙන්) වනාහි මෙය නැත. එහෙයින් නො ගන්නා ලදී. අන්ධබාල සිතෙහි වනාහි ප්‍රඥාව නැතැයි එය නො ගන්නා ලදී. කිම දෘෂ්ටි ගතිකයන්ගේ වංචනා ප්‍රඥාව නැද්ද යත්, ඇත්‍ති, එය වනාහි ප්‍රඥාව නො වේ. එය වාසව නම් වේ. එය අර්ථ වශයෙන් තෘෂ්ණාව මය. මේ සිත වනාහි දාහ සහිතය. ගරුකය. බරපතළය. කර්කශය. තදය. අකර්මණ්‍යය. ගිලන්ය. වක්‍රය. කුටිලය. එහෙයින් එයට ශ්‍රද්ධාදී (ෂට්) යුගල නොගන්නා ලදී.

මෙපමණකින් පද පිළිවෙළින් චිත්තාංග වශයෙන් පාළියෙහි ආරූඪ වූ දෙතිස් පද දක්වා දැන් යේවාපනක ධර්මයන් දක්වන්නට **යෙවා පන තස්මිං සමයෙ** යන ආදිය වදාළහ. එහි සියලුම අකුසල සිත්හි ඡන්දය අධිමොක්ඛය මනසිකාරය මානය ඉස්සාය මච්ඡරිය ථීනය මිද්ධය උද්ධච්චය කුක්කුච්චය යන යේවාපනක ධර්ම දහයක් ම වෙත්. සූත්‍රාන්ත (ඒ ධර්ම) සූත්‍රපදයන්හි දක්නා ලැබේ යැයි කියන ලදී. මේ සිතෙහි වනාහි ඡන්දය අධිමොක්ඛය මනසිකාරය උද්ධච්චය යන අපණ්ණක නම් වූ මේ යේවාපනක සතර වෙයි. එහි ඡන්දාදිය යට කියන ලද නයින් ම දතයුතුයි. හුදෙක් ඔව්හු වනාහි කුශලයෝ ය. මොව්හු අකුශලයෝ ය. අනෙක වනාහි නොසන්සුන් වූවහුගේ භාවය = උද්ධච්ච යයි. එය (සිතෙහි) නො සන්සුන් බව ලක්ෂණකොට ඇත්තේ ය. වාතයෙන් පහර ලද සැලෙන ජලය මෙනි. නො නැවතීම රසයකොට ඇත්තේ ය. වාතයෙන් පහර ලැබ සැලෙන ධවජ පතාකා මෙනි. භ්‍රාන්තිය එළඹ සිටි කාරණයයි. ගලකින් පහර ලැබ ඇවිසුණු අළු මෙනි. සිතේ නො සන්සුන් බව අයෝනිසෝ මනසිකාරය ආසන්න කාරණයයි. චිත්ත වික්ෂේපය යැයි දතයුතුයි. මෙසේ ස්පර්ශාදි දෙතිස යේවාපනක වශයෙන් කියන ලද සතර ද යන මේ සියල්ලත් මේ ධර්ම සමුද්දේශ වාරයෙහි සතිසක්

ධර්මපදයෝ වෙත්. අපණ්ණකාංග සතර හැර පාළියෙහි ආ දෙතිසක් මෙහිදී වනාහි අගෘහීතග්‍රහණ වශයෙන් ඵස්ස පංචකය විතර්කය විචාරය ප්‍රීතිය චිත්තෙකග්‍රතාව විරියින්ද්‍රිය ජීවිතින්ද්‍රිය මිථ්‍යාදෘෂ්ටිය ලෝභය මෝහය අහිරිකය අනොත්තප්පය ය සොළොස් ධර්මයෝ වෙත්.

එම සොළොස් ධර්මයන් අතුරෙන් ධර්ම සතක් අවිභක්තිකය. නවයක් සවිභක්තික වෙයි. කවර සතක්ද? ඵස්සය සඤ්ඤාය චේතනාය විචරය පීතිය ජීවිතින්ද්‍රිය මෝහය යන මේ ධර්ම යන අවිභක්තිකය, වේදනාය චිත්තය විතර්කය චිත්තෙකාග්‍රතාවය ජීවිතින්ද්‍රිය මිථ්‍යාදෘෂ්ටිය අහිරිකබලය අනොත්තප්ප බලය ලෝභය යන මේ නවය සවිභක්තිකය. ඔවුනතුරෙන් ධර්ම සයක් දෙතැනෙක බෙදන ලදී. එකක් තුන්තැනෙකද එකක් සතර තැනක ද එකක් සයතැනෙකද බෙදන ලදී. කෙසේද? චිත්තය විතර්කය මිච්ඡාදිට්ඨිය අහිරික බලය අනොත්තප්ප බලය ලෝභය යන මේ සය දෙතැනක බෙදන ලදී. මොවුනතුරෙන් වනාහි සිත පමණක් ඵස්ස පංචකයට පැමිණ චිත්ත වේයැයි කියන ලදී. ඉන්ද්‍රියන්ට පැමිණ මනින්ද්‍රිය විය. විතර්කය ධ්‍යානාංගයන්ට පැමිණ විතර්කය වේයැයි කියන ලද්දේ වෙයි. මාර්ගාංගයන්ට පැමිණ මිච්ඡා සංකප්පය විය. මිච්ඡා දිට්ඨිය මාර්ගාංගයන්හි ද කර්මපථයෙහි ද මිච්ඡා දිට්ඨිය ම ය. අහිරිකය බලයන්ට පැමිණ අහිරික බලය වේයැයි කියන ලදී. ලෝකනායක දුකයට පැමිණ අහිරික විය. අනොත්තප්පයෙහි ද මේ නයම ය. ලෝභය මූලයට පැමිණ ලෝභය වේයැයි කියන ලදී. කර්මපථයට පැමිණ අභිජ්ඣා වේ. මේ සය දෙතැනක බෙදන ලදී. වේදනාව වනාහි ඵස්ස පංචකයට පැමිණ වේදනාව වේයැයි කියන ලදී. ධ්‍යානාංගයන්ට පැමිණ සුඛයැයි කියන ලදී. ඉන්ද්‍රියන්ට පැමිණ සෝමනස්සින්ද්‍රිය යැයි කියන ලදී. මෙසේ එකම ධර්මය තුන්තැනෙක බෙදන ලදී. විරිය වනාහි ඉන්ද්‍රියන්ට පැමිණ විරියින්ද්‍රිය වේයැයි කියන ලදී. මාර්ගාංගයන්ට පැමිණ මිච්ඡාවායාම වෙයි. බලයන්ට පැමිණ විරියබල යැයි ද පිට්ඨි දුකයට පැමිණ පග්ගාහ යැයි ද කියන ලදී. මෙසේ මේ එකම ධර්මය ස්ථාන සතරෙක බෙදන ලදී. සමාධිය වනාහි ධ්‍යානාංගයන්ට පැමිණ චිත්තෙකග්ගතා වේයැයි කියන ලදී. ඉන්ද්‍රියන් පැමිණ සමාධින්ද්‍රිය යැයි ද මාර්ගාංගයන්ට පැමිණ මිච්ඡා සමාධි යැයිද, බලයන්ට පැමිණ සමාධිබලය යැයි ද පිට්ඨි දුකයට පැමිණ දුතිය දුකයෙහි ඒකක වශයෙන් ම සමථ යැයි ද තුන්වැන්නෙහි අවික්ඛෙප යැයි කියන ලදී. මෙසේ මේ එකම ධර්මය ස්ථාන සයෙක බෙදන ලදී. මේ සියලුම ධර්මයෝ වනාහි ස්පර්ශ පංචක වශයෙන් ධ්‍යානාංග වශයෙන් ඉන්ද්‍රිය

වශයෙන් මාර්ගාංග වශයෙන් බල වශයෙන් මූල වශයෙන් කර්මපථ වශයෙන් ලෝකනායක වශයෙන් පිට්ඨිදුක වශයෙන්දැයි රාශි නවයක් වෙත්. එහි යමක් කිවයුතු නම් ඒ ප්‍රථම කුශල නිර්දේශයෙහි කියන ලදම ය.

ධම්මුද්දෙසවාර කථා නිමියේ ය.

නිර්දේශ වාරයෙහි චිත්තෙකාග්‍රතා නිර්දේශයෙහි වනාහි **සණ්ඨිති අවට්ඨිති** යන මේ දෙක ඨිති යන්නට පර්යාය වචන ම ය. යමක් වනාහි කුශල නිර්දේශයෙහි අරමුණට බැසගෙන පිවිසගෙන සිටීනුයි = (අවට්ඨිති) යැයි කියන ලදී. මෙහිදී එය නො ලැබෙයි. අකුශලයෙහි වනාහි චිත්තෙකාග්‍රතාව දුර්වලයැයි යට දක්වන ලද්දේම ය. උද්ධච්ච විචිකිච්ඡා වශයෙන් පැවති විසාහාරයට ප්‍රතිපක්ෂ වශයෙන් අවිසාහාරයැයි මෙබඳු අර්ථයක් ද මෙහිදී ලැබෙයි. සහජාත ධර්මයන් එක් නොකෙරේ නුයි = අවිසාහාරො ය. වික්ෂේප නො කෙරේ යනු **අවික්ඛෙපො** ය. අකුශල චිත්තෙකාග්‍රතා වශයෙන් එක් නො වූ මනසෙහි භාවය = **අවිසාහටමානසතා** ය. සහජාත ධර්මයන්හි කම්පා නොවේනුයි = **සමාධි බලයයි**. අයථා සමාධානයෙන් මිච්ඡා සමාධියැයි මෙහිදී මෙසේ අර්ථය දතයුතුයි.

වීරියෙන්ද්‍රිය නිර්දේශයෙහි යට කියන ලද යම් නිෂ්ක්‍රමයක් වේනම් එය ද කාමානංපනුදතාය යන ආදී නයක් වේ ද එය ද මෙහි නොලැබේ. සහජාත ධර්මයන්හි කම්පා නො වන අර්ථයෙන් ම විරිය බලය දතයුතුයි.

මිථ්‍යාදෘෂ්ටි නිර්දේශයෙහි අයථා දර්ශනය යන අර්ථයෙන් මිථ්‍යා දෘෂ්ටියයි. දෘෂ්ටිගත මේ දර්ශනය දෙසැටක් දෘෂ්ටීන්හි ඇතුළත් හෙයින් = දිට්ඨිගතය. යට ද මෙහි අර්ථය කියන ලද්දේම ය. දෘෂ්ටිය ම දුරතික්‍රමාර්ථයෙන් ඉක්මවීම දුෂ්කරය යන අර්ථයෙන් දිට්ඨිසහගතය. තිණාගහන වනගහන පබ්බත ගහනයන් මෙනි. සැක සහිතය. බිය සහිතය යන අර්ථයෙන් = **දිට්ඨිකන්තාර**, සොරුන්ගෙන් යුත්කාන්තාරය ව්‍යාඝ්‍රාදීන් යුත් කාන්තාරය වැලි කාන්තාරය ජල රහිත කාන්තාරය දුර්භික්ෂ කාන්තාරය මෙනි. සම්‍යක් දෘෂ්ටිය විනිවිද යන අර්ථයෙන් ද විරුද්ධ වන අර්ථයෙන් ද = **දිට්ඨි විසූකායිකය**, මිථ්‍යා දෘෂ්ටිය උපදිත් ම සම්‍යක්

දර්ශනය විනිවිද යයි. එසේ ම එයට විරුද්ධ වෙයි. කලෙක ශාස්වත දෘෂ්ටියේ ද කලෙක උච්ඡේද දෘෂ්ටියේ ද ග්‍රහණයෙන් දෘෂ්ටියේ විරූප වීමක් චලනයක් ඇතිවේ යනු = **දිට්ඨි විප්ඵන්දිතය**, දෘෂ්ටිගතික වූයේ වනාහි එකක පිහිටීමට නො හැක්කේ වෙයි. ඇතැම්විටෙක ශාස්වත දෘෂ්ටියට වැටෙයි. ඇතැම් විටෙක උච්ඡේද දෘෂ්ටියට වැටෙයි. බන්ධනාර්ථයෙන් දෘෂ්ටිය ම සංයෝජනය වේනුයි = **දිට්ඨි සංයෝජනය**, කිඹුල් ආදීන් පුරුෂයකු මෙනි. අරමුණ දැඩිව ගනී යනුයි = **ගාහො** ය. ස්ථිරව පිහිටන අර්ථයෙන් = **පතිට්ඨාහ** ය, මෙය වනාහි බලවත්ව පවත්නා බැවින් ස්ථිරව පිහිටා ගනී. නිත්‍යාදි වශයෙන් ඇතුළු වේනුයි = **අභිනිවෙසො ය**, ධර්ම ස්වභාවය ඉක්මවා නිත්‍යාදී වශයෙන් පරාමර්ශනය කෙරේනුයි = **පරාමාසො ය**, අනර්ථ ගෙන දෙන හෙයින් නින්දිත මාර්ගය හෝ නින්දිත වූ අපායන්ට මාර්ගය යනු = **කුම්මග්ගො** යනු අයථා මාර්ගයක් හෙයින් = **මිච්ඡාපථො ය**, යම් සේ වනාහි දිසා මුළාවූවෙකු මේ අසවල් නම් ගමට මාර්ගය යැයි ගන්නා ලද්දේ නමුදු ඒ ගමට නො පැමිණේ. මෙසේ දෘෂ්ටිගතිකයා සුගති මාර්ගය යැයි ගන්නා ලද දෘෂ්ටිය සුගතියට නො පමුණුවයි යනුයි. අයථා මාර්ගය = **මිච්ඡා පථො ය**. මිථ්‍යා ස්වභාවය හෙයින් = **මිච්ඡත්තං** ය. එහිම පරිභ්‍රමණයෙන් මෙහි බාලයෝ එතර වෙත් යනු = **තිත්ථය**, මෙය තීර්ථය මෙන්ම අනර්ථයන්ට ආයතනය යි යනු = **තිත්ථායතනං ය**. තීර්ථකයන්ගේ උපන් දේශය හෝ වාසස්ථානය යන අර්ථයෙන් ද ආයතනය යනු ද = **තිත්ථායතනං ය**. විපර්යාශ වූ ග්‍රාහය (විපර්යාශ වශයෙන් හෝ ග්‍රාහය යනු) **විපරියෙස ගාහො ය**. විපර්යාශ ග්‍රාහය යන අර්ථයි. අහිරික අනොත්තප්ප නිර්දේශයන්හි හිරොත්තප්ප නිර්දේශ විපර්යාශ වශයෙන් අර්ථය දතයුතුයි. සහජාත ධර්මයන්හි වනාහි අකම්පනාර්ථයෙන් අහිරික බලයත් අනොත්තප්ප බලයත් දතයුතුයි.

ලෝභ මෝහ නිර්දේශයන්හි ලෝභ කෙරේ යනු = **ලොභො** ය. **ලුබ්භනා** යනු ලෝභ කරන ආකාරයයි. ලෝභ සම්ප්‍රයුක්ත සිත හෝ පුද්ගලයා ලුබ්භිතය. ලුබ්භිතගේ භාවය = **ලුබ්භිතත්තං** ය, ඇලෙයි යනු = **සාරාගො** ය. සාරජ්ජනාකාරය = **සාරජ්ජනා ය**. සාරජ්ජිතයාගේ භාවය **සාරජ්ජිතත්තං ය**. දැඩිව ලෝභ කිරීම් අර්ථයෙන් = **අභිජ්ඣා ය**, නැවත ලෝභය කීමේ කාරණය කියන ලද ම ය. අකුසලය වූයේත් මූලය වූයේත් එයයි. අකුසලයන්ගේ මූලය හෝ එයයි යනු = අකුසල මූලං ය.

ඥානදර්ශනයට ප්‍රතිපක්ෂ හෙයින් **අඤ්ඤාණය අදස්සනය**, ඉදිරියට අවුත් ධර්මයන් සමනය නො කෙරෙයි. එක්තැන් නොවෙයි යනු = **අනභිසමය** ය, සුදුසු පරිදි ධර්මයන් අවබෝධ කෙරේ යනු = **අනුබෝධෝ** ය, එය ප්‍රතික්ෂේප බැවින් **අනනුබොධො** ය. අනිත්‍යාදියසමග යොදා අවබෝධ නො කෙරේ යනු = **අසම්බොධො** ය. නැත්තක් අසම වූවක් අවබෝධ කෙරේ යනු ද = **අසම්බොධො** ය. චතුස්සත්‍ය ධර්මය ප්‍රතිවේධ නොකෙරේ යනු = **අප්පටිවෙධො** ය. රූපාදීන් අතුරෙන් ඒක ධර්මයක්වත් අනිත්‍යාදී ශ්‍රමණ ධර්ම වශයෙන් නො ගනී යනු = **අසංගහණා** ය. එම ධර්මය නොබැස ගනී = **අපරියොගහණා** ය. සමව නොබලයි යනු = **අසමපෙක්ඛණා** ය. ධර්මයන්ගේ ස්වභාවය අනුව නොබලයි යනු = **අපච්චවෙක්ඛණා** ය, කුශලාකුශල ධර්මයන්හි විපරීත පැවැත්ම ඇති හෙයින් ස්වභාව ග්‍රහණ භාවයෙන් හෝ එක් කර්මයක් හෝ මොහුට ප්‍රත්‍යක්ෂ නැත. තමා හෝ කිසියම් කර්මයක් ප්‍රත්‍යක්ෂ කිරීමක් නම් නොවේ යනු = **අපච්චක්ඛකම්මං ය,** මෙය නූපදනා කල්හි යම් චිත්ත සන්තානයක් මේධ්‍යයක් පිරිසිදු වූවක් වේද මෙයින් අපිරිසිදු වූවක් වේ යනු = **දුම්මෙජ්ඣං** ය. බාලයන්ගේ භාවය යනු = **බාල්‍යය**, මුළාවේ යනු = **මොහො** ය. හාත්පසින් මුළා වේ යනු = **සම්මොහො** ය. විද්‍යාවට ප්‍රතිපක්ෂ හෙයින් විද්‍යාව නොවේ යනු = **අවිජ්ජා** ය. ඕඝ යෝගයන්ගේ අර්ථය කියන ලද්දේමය. බලවත් බවට පැමිණියේ ය යන අර්ථයෙන් අනුව සයනය කෙරේ යනු = **අනුසයො ය.** සිත මැඩගෙන නැඟී සිටී. අභිභවනය කරයි යනු = **පරියුට්ඨානං ය.** හිතග්‍රහණයක් නැති බැවින් හිතද ඉදිරියට යන්නට නොහැකි වෙයි. අන්තැනෙක ඇලේමය = **ලඞ්ගීය**, කොර ගසමින් යයි යන අර්ථයි. ගළවා දැමීම දුෂ්කරය යන අර්ථයෙන් ද = **ලඞ්ගී ය**, යම්සේ වනාහි මහා එලිපත නම් වූ ලඞ්ගීය උදුරාදැමීම දුෂ්කර වේද, මෙසේ මෙය ද එලිපත වැනිය යනු = **ලඞ්ගිය**, සෙස්ස ප්‍රකට අර්ථ ඇත්තේ ම ය. සංග්‍රහවාර ශූන්‍යතා වාර ද යට කියන ලද නයින් ම අර්ථ වශයෙන් දතයුතුයි.

**ප්‍රථම සිත නිමියේ ය.**

දෙවන සිතෙහි **සසංඛාරෙන** යන පදය ද විශේෂය. එය ද යට කියන ලද අර්ථ ඇත්තේ ම ය. මේ සිත වනාහි ඇතැම්විට ෂඩාරම්මණයන්හි සොම්නසට පත්වූවහුට ලෝභය උපදවා සත්ත්වයෙක් සත්ත්වයෙක් යන ආදී නයින් පරාමර්ශනය කරන්නාට උපදී. එසේම

සසංඛාරික හෙයින් ප්‍රයෝග සහිතව උපාය සහිතව උපදනා හෙයිනි. යම්කලෙක කුලපුත්‍රයෙක් මිථ්‍යාදෘෂ්ටික කුලයක කුමරියක පතයි ද, ඔවුහු ද තෙපි මිථ්‍යා දෘෂ්ටිකයහයි නොදෙත් ද, ඉක්බිති අන් නෑයෝ තෙපි යම් යම් දේ කරව් නම් මෙතෙමේ ද එය කරයි යැයි දෙවත්. හෙතෙම ඔවුන් සමග තීර්ථකයන් වෙත එළඹෙයි. මුලදීම විමතියට පත්වෙයි. කල් යත් යත් ම මොවුන්ගේ ක්‍රියා මනාපයැයි ලබ්ධිය රුචි කෙරෙයි. දෘෂ්ටිය ගනී. මෙවැනි කාලයේදී මෙය ලැබේයැයි දතයුතුයි. මෙහි වනාහි යේවාපනකයන් අතුරෙහි ථීනමිද්ධය අධිකය. එහි මැළිබව = ථීනය, නිදිමත බව = මිද්ධ ය, උත්සාහ නොවන බව ශක්තිය විනාශවීම යනු අර්ථයි. ථීනය ද මිද්ධය ද ථීනමිද්ධං ය. එහි ථීනය උත්සාහය ලක්‍ෂණකොට ඇත. වීර්යය දුරුවීම රසය කොට ඇත්තේ ය. කිඳාබැසීම එළඹ සිටි කාරණයයි. මිද්ධය අකර්මණ්‍යතාව ලක්‍ෂණකොට ඇත. වෙළීම රසයයි. සැඟවුණු බව එළඹසිටි කාරණයයි. නිදාවැටීම නින්ද හෝ එළඹසිටි කාරණයයි. දෙකම අරතිය නිදිමත ඈනුම්යෑම ආදීන්හි අයෝනිසෝ මනසිකාරය ආසන්න කාරණය කොට ඇත.

දෙවැන්නයි.

තුන්වැන්න ෂඩාරම්මණයන්හි සොම්නසට පැමිණ ලෝභය උපදවා සත්ත්වයෙක් සත්ත්වයෙක් ආදී නයින් පරාමර්ශනය කරන්නාට රාජ මල්ල යුද්ධ නෘත්‍ය උත්සව ආදිය බලන්නාට මනාප ශබ්ද ඇසීම ආදියෙහි යෙදුණාහුට හෝ උපදී. මෙහි මානය සමග පංච අපණ්ණකාංගයෝ වෙත්. එහි හරීනුයි = **මානො ය.** එය උන්නතිය ලක්‍ෂණකොට ඇත. තමා ඔසවා තැබීම රසයකොට ඇත්තේය. ප්‍රසිද්ධිය කැමතිවීම එළඹසිටි කාරණය කොට ඇත්තේ ය. දෘෂ්ටියෙන් තොර ලෝභය ආසන්න කාරණය කොට ඇත්තේ ය. උමතුව මෙනැයි දතයුතුයි.

තුන්වැන්නයි.

උක්තප්‍රකාර ස්ථානයන්හි දී ම යම් අවස්ථාවෙක හිසෙහි කෙළ ගසත්ද, පයින් පස් විසුරුවත් ද, එකල්හි ඒ ඒ ක්‍රියාවන් පවත්වාගැනීම පිණිස ස්වෝත්සාහයෙන් අතරතුරින් බලන්නවුන්ටද රාජනාටකාදීන්

නික්මෙද්දී පිරිස ඉවත්කරන විට ඒ ඒ අවසරයෙන් බලන්නවුන්ට ද මේ ආදී ස්ථානයන්හි ද සතරවැන්න උපදී. මෙහිදී වනාහි ථීනමිද්ධයන් සමග සප්ත යේවාපනකයෝ වෙත්. දෙතැනදීම මිථ්‍යා දෘෂ්ටිය පිරිහෙයි. එය හැර සෙස්සන්ගේ වශයෙන් ධර්ම ගණනය දතයුතුයි.

සතරවැන්නයි.

ෂඩාරම්මණයන්හි වේදනා වශයෙන් මධ්‍යස්ථ වූවහුට ලෝභය උපදවා සත්ත්වයෙක් සත්ත්වයෙක් යන ආදී නයින් පරාමර්ශනය කරන්නාට පස්වැන්න (උපදී) මෙහිදී වනාහි (සොම්නස් තැන) උපේක්‍ෂා වේදනාව වෙයි. ප්‍රීතිපදය පිරිහෙයි. සෙසු සියල්ල පළමු සිත සමානම ය.

පස්වැන්නයි.

සවන සත්වන අටවන සිත් ද වේදනාව හැර ප්‍රීතිපදය ද පිරිහෙළා දෙවන තුන්වන සතරවන සිත්වලදී කියන ලද නයින් ම දතයුතුයි. මේ ලෝභ සහගත සිත් අටෙහි සහජාතාධිපති ආරම්මණාධිපති යන අධිපතීහු දෙදෙනාම ලැබෙත්. නවවැන්න ෂඩාරම්මණයන්හි දොම්නස් ව පටිඝය උපදවන්නා උපදී. ඔහුට සමය ව්‍යවස්ථාපන වාරයෙහි වනාහි දුෂ්ට මතයක් වේ. හීන වේදනා ඇති හෙයින් නින්දිත මනසක් හෝ වේ යනු = **දුම්මනො ය.** නො සතුටු සිත් ඇත්තහුගේ භාවය = **දොමනස්සං** ය. එයින් යුක්ත වූයේ යනු = **දොමනස්ස සහගතං ය.** අප්‍රිය වන අයුරෙන් අරමුණෙහි ගැටේ යනු = පටිඝං ය. එයින් සම්ප්‍රයුක්ත වූයේ යනු = **පටිඝ සම්පයුත්තං** ය. ධර්මෝද්දේශයෙහි ස්ථාන තුනෙහි දීම දෝමනස්ස වේදනාව ම ආවේය. එහි වේදනාපදයේ අර්ථය කියන ලද්දේම ය. දුක්ඛ දෝමනස්ස පදයෝ ද එසේම ය. දොම්නස වනාහි ලක්‍ෂණාදි වශයෙන් අනිෂ්ටාරම්මණානුභවනය ලක්‍ෂණකොට ඇත්තේ ය. කෙසේ හෝ අනිෂ්ටාකාර සම්භෝගය රසයකොට ඇත්තේ ය. චෛතසිකාබාධය එළඹසිටි කාරණය කොට ඇත්තේ ය. ඒකාන්තයෙන් ම හෘදයවස්තුව ආසන්න කාරණය කොට ඇත්තේ ය. පළමු සිත්වල යම්සේ ලෝභය වේද මූලකර්ම පථයන්හි අභිධ්‍යාව වේයැයි ආයේ ය. මෙසේ ද්වේෂය වෙයි. ව්‍යාපාදය වෙයි යැයි කියන ලදී. එහි එයින් දූෂ්‍ය වෙත්. තෙමේ

හෝ දූෂ්‍ය වෙයි. එය දූෂ්‍ය මාත්‍රයක්මය යනු = **දොසො** ය. එය චණ්ඩි බව ලක්‍ෂණකොට ඇත්තේ ය. පහර ලද සර්පයකු මෙනි. දැගලීම රසයකොට ඇත්තේ ය. විෂ නිපාතයක් මෙනි. තමාගේ නිශ්‍රයෙන්දැවීම හෝ රසයකොට ඇත්තේ ය. ලැව්ගින්නක් මෙනි. දූෂ්‍යවීම එළඹ සිටි කාරණයයි. අවකාශ ලත් සතුරකු මෙනි. ආඝාත වස්තුව ආසන්න කාරණය කොට ඇත්තේය. විෂ සමග හැනූ ගවමුත්‍ර මෙන් ද දතයුතුයි.

එයින් සිත නපුරු බවට පැමිණෙයි. කුණු බවට පැමිණෙයි. නපුරුබවට පමුණුවයි.විනය ආචාරය රූප සම්පත්තිය හිතසුව ආදිය විනාශයට පත්කරයි යනු = **ව්‍යාපාදය,** මෙය වනාහි අර්ථවශයෙන් ද්වේෂයම ය. මෙහි (පද) පිළිවෙළින් පද විසිනවයක් වෙයි. අගහිත ග්‍රහණයෙන් තුදුසක් වෙයි. ඔවුන්ගේ වශයෙන් සවිභක්තික අවිභක්තික රාශිභේදය දතයුතුයි. යේවාපනකයන් අතුරෙන් ඡන්ද දෝස අධිමොක්ඛ මනසිකාර උද්ධච්ච යන නියතයෝ ඉස්සා මච්ඡරිය කුක්කුච්චයන් අතුරෙන් අන්‍යතරයක් සමග පසක් පසක් ව උපදිත්. මෙසේ මේ ධර්ම තුන වනාහි අනියත යේවාපනක නම්. ඔවුනතුරෙන් අනුන්ගේ යහපත නො ඉවසයි යනු = **ඉසසා ය.** එය අනුන්ගේ සම්පත් නො ඉවසීම ලක්‍ෂණකොට ඇත්තේ ය. එහි නො ඇලීම ම රසයකොට ඇත්තේ ය. එයින් ඉවත බැලීම එළඹ සිටි කාරණය කොට ඇත්තේ ය. අනුන්ගේ සම්පත ආසන්න කාරණය කොට ඇත්තේ ය. සංයෝජන යැයි දතයුතුයි. මාත්සර්යයෝ භාවය = **මච්ඡරියං** ය, එය ලැබුණු හෝ ලැබිය යුතු තමාගේ සම්පත් සැඟවීම ලක්‍ෂණකොට ඇත්තේ ය. එම සම්පත්තීන් ම අන්‍යයන් හා සාධාරණවීම නො කැමති රසය කොට ඇත්තේ ය. කෝපවීම එළඹසිටි කාරණය කොට ඇත්තේ ය. රළුබව සන්නාහය කරගැනීම හෝ එළඹසිටි කාරණය කොට ඇත්තේ ය. ආත්ම සම්පත්තිය ආසන්න කාරණය කොට ඇත්තේ ය. සිතෙහි විරූප බව යැයි දතයුතුයි. නින්දිත ලෙස කරන ලද්දේ = කුහක ය. එහි භාවය = **කුකකුචචං** ය. එය පසුව තැවීම ලක්‍ෂණය කොට ඇත්තේ ය. කළ නොකළ දෙය අනුව ශෝක වීම රසයකොට ඇත්තේ ය. විපිළිසර ය එළඹසිටි කාරණය කොට ඇත්තේ ය. කළ නො කළ දෙය ආසන්නකාරණය කොට ඇත්තේ ය. දාසබව මෙනැයි දතයුතුයි. මේ වනාහි උද්දේශ වාරයෙහි විශේෂයයි.

නිර්දේශ වාරයෙහි වේදනා නිර්දේශයෙහි **අසාතං** සාතයට - සැපයට ප්‍රතිපක්‍ෂ වශයෙන් දතයුතුයි. ද්වේෂ නිර්දේශයෙහි දූෂ්‍ය වේ යනු =

දොසො ය. **දුස්සනා** යනු දූෂ්‍යවන ආකාරයයි. **දුස්සිතත්තං** යනු දූෂිත බවයි. ප්‍රකෘතිභාවය අතහරිනා අර්ථයෙන් ව්‍යාපාදයට පත්වීම = **බ්‍යාපත්ති** ය, **බ්‍යාපජ්ජනා** යනු ව්‍යාපාදයට පත්වන ආකාරයයි. විරුද්ධ වේ යනු = **විරොධො** ය, නැවත නැවත විරුද්ධ වේ යනු = **පටිවිරොධො** ය. විරුද්ධාකාර හෝ ප්‍රතිවිරුද්ධාකාර වශයෙන් මෙය කියන ලදී. චණ්ඩ වූ තද පුද්ගලයා චණ්ඩික්ක යැයි කියනු ලැබේ. ඔහුගේ භාවය = **චණ්ඩික්ක** ය. මොහු විසින් වචන මනාව වඩනා ලද්දේ නොවේ නපුරු ලෙස කියන ලද්දේ ය. අසම්පූර්ණව ම කියන ලද්දේ වෙයි යනු = **අසුරො පො** ය. කිපුණු කල වනාහි පරිපූර්ණ වචනයක් නම් නැත. යම්කිසිවෙකුට ඇතත් එය ප්‍රමාණවත් නො වේ. තවත් කෙනෙක් වනාහි කඳුළු උපදවන හෙයින් කඳුළු රෝපණය කරන හෙයින් අස්සුරොපො යැයි කියත්. එය කාරණයක් නො වේ. සොම්නසට පත්වූවහුට ද කඳුළු උපදනා හෙයිනි. යට කියන ලද සතුටු සිත් ඇති බවට ප්‍රතිපක්ෂ හෙයින් සතුටු සිත් ඇති බව නොවේ යනු = **අනත්තමනතා** ය, එය වනාහි යම්හෙයකින් සිතට ම ද, සත්ත්වයාට නො වේ ද, එහෙයින් **චිත්තස්ස** යැයි කියන ලදී. මෙහි සෙස්ස සංග්‍රහ ශූන්‍යතා වාරයන්හි ද යට කියන ලද නයින් ම දතයුතුයි.

නවවැන්නයි.

දසවැන්න සසංඛාර හෙයින් අනුන් විසින් උත්සාහවත් කරනු ලැබූවකුට හෝ අනුන්ගේ අපරාධයක් සිහි කරන්නෙකුට හෝ අනුන්ගේ අපරාධයක් සිහිකරමින් කිපෙන්නෙකුට හෝ උපදී. මෙහි ද පද පිළිවෙළින් විසිනවයක් ද අගෘහීත ග්‍රහණ වශයෙන් ද පද තුදුසක් වේ ම ය. යේවාපනකයන්හි වනාහි ථීනමිද්ධය ද ලබයි. එහෙයින් මෙහි ඉස්සා මච්ඡරිය, කුක්කුච්ච යන සය හැර අපණ්ණකංග ද, ථීනමිද්ධය යන මේ සය හෝ ඉස්සා ආදීන් උපදනා කල්හි ඔවුන්ගෙන් අන්‍යතරයක් සමග යේවාපනක සක සත හෝ උපදිත්. සෙසු සියල්ල සියලු වාරයන්හි නවම ය. සමානම ය. මේ දොම්නස් සිත් දෙකෙහි සහජාතාධිපති ම ලැබෙයි. ආරම්මණාධිපති නොවේ. කිපි තැනැත්තේ කිසි කෙනෙකුටත් ගරු නො කරයි.

**දසවැන්න යි.**

එකොළොස්වැන්න ෂඩාරම්මණයන්හි වේදනා වශයෙන් මධ්‍යස්ථවූවහුට සැකය පවත්නා කාලයෙහි උපදී. ඔහුගේ සමය ව්‍යවස්ථානයෙහි විචිකිච්ඡා සම්පයුත්තං යන පදය අපුබ්බ ය. එහි අර්ථය විචිකිච්ඡාය සම්පයුත්තං යනු = **විචිකිච්ඡා සම්පයුත්තං** ය. ධම්මුද්දෙසයෙහි විචිකිච්ඡා හොති යන පදය පමණක් විශේෂයයි. එහි පහවූ විචිකිච්ඡා යනු = **විචිකිච්ඡා** ය. ස්වභාවය සොයමින් මෙයින් දුකට පත්වෙයි ක්ලාන්ත වෙයි හෝ = **විචිකිච්ඡා** ය. එය සැකය ලක්‍ෂණකොට ඇත්තේ ය. කම්පනය රසයකොට ඇත්තේ ය. අවිනිශ්වය එළඹ සිටි කාරණය කොට ඇත්තේ ය. අනේකාංශග්‍රාහය හෝ එළඹසිටි කාරණය කොට ඇත්තේ ය. නුනුවණින් මෙනෙහි කිරීම ආසන්න කාරණය කොට ඇත්තේ ය. ප්‍රතිපත්ති අන්තරාය කරයැයි දතයුතුයි. මෙහි පද පිළිවෙළින් පද තෙවිස්සක් වෙයි. අගහීත ග්‍රහණයෙන් තුදුසෙකි. ඔවුන්ගේ වශයෙන් සවිභත්තික අවිභත්තික රාශි විනිශ්වය දතයුතුයි. මනසිකාර උද්ධච්ච වශයෙන් යේවාපනක දෙකක් ම ය.

මෙහි නිර්දේශවාරය පිළිබඳ චිත්තෙකාග්‍රතා නිර්දේශයෙහි යම්හෙයකින් මේ දුර්වල සිත ප්‍රවෘත්ති සර්වතිමාත්‍රයක් ම වේද, එහෙයින් සණ්ඨිති ආදීන් නො කියා චිත්තස්සඨිති යන එක ම පදය කියන ලදී. එම කාරණයෙන් ම උද්දේසවාරයෙහි ද සමාධින්ද්‍රියංආදිය නො කියන ලදී. විචිකිච්ඡා නිර්දේශයෙහි සැක කිරීම් වශයෙන් = **කඞ්ඛා** ය, සැකය ගෙන එයි යනු = **කඞ්ඛායනාය**, පළමු සැකය වනාහි මතු සැකය ගෙන එන්නේ නම් වෙයි. ආකාර වශයෙන් හෝ මෙය කියන ලදී. සැකයෙන් යුක්ත වූ සිත සැකය ගෙන එන හෙයින් කඞ්ඛායිත නම් වෙයි. එහි භාවය = **කඞ්ඛායිතත්තං ය, විමති** යනු ප්‍රඥාව නැත යනුයි. **විචිකිච්ඡාව** කියන ලද අර්ථ ඇත්තේ ම ය. කම්පනාර්ථයෙන් දෙයාකාරයකින් සැක කෙරේනුයි = **දෙව ළහකං** ය, හැසිරීම වැළැක්වීමෙන් දෙමංසන්ධියක් මෙනි යනු = **ද්විධා පථො** ය, මෙය නිත්‍ය ද? නැතහොත් අනිත්‍යද? යන ආදී වශයෙන් ප්‍රවෘත්තියෙහි එක් ආකාරයකින් සිටින්නට අසමර්ථ හෙයින් හාත්පසින් සයනය කෙරේ යනු = **සංසයො ය**, එක් අංශයක් ගන්නට අසමර්ථ හෙයින් ඒකාංශග්‍රාහී නොවේ යනු = **අනෙකංසගාගො ය**, නිශ්වල කළ නො හැකිව අරමුණෙන් ඉවතට යයි යනු = ආසප්පනා ය, බැසගන්නට නො හැකි ව (පරි) හාත්පස ඇවිදී යනු = **පරිසප්පනා ය**, සම්පූර්ණයෙන් අවබෝධ කරගැනීමට අසමර්ථ හෙයින් = **අපරියොගාහණා ය**, නිශ්වය වශයෙන් අරමුණෙහි පවතින්නට අසමර්ථ හෙයින් = **ථම්භිතත්තය**, සිතේ තදබව යනු අර්ථයි. විචිකිච්ඡාව වනාහි ඉපිද ඉපිද සිත තද කරයි,

යම්හෙයකින් මේ විචිකිච්ඡාව උපදිනවිට අරමුණ ගෙන සිත පහුරු ගාන්නාක් මෙන් වේ, එහෙයින් මනො විලෙඛො යැයි කියන ලදී. සෙස්ස සියලුතැන්හි නො ගැඹුරු අර්ථ ඇත්තේ ම ය.

## එකොළොස් වැන්නයි.

දොළොස්වැන්නට සමය ව්‍යවස්ථානයෙහි උද්ධච්චය සමග සම්ප්‍රයුක්ත වූයේ යනු = **උද්ධච්ච සම්පයුත්තං** ය, මේ සිත වනාහි ෂඩාරම්මණයන්හි වේදනා වශයෙන් මධ්‍යස්ථව උද්ධත වෙයි. (මෙහි) සමුදෙදසයෙහි විචිකිච්ඡා ස්ථානයෙහි උද්ධච්චය වේයැයි ආවේ ය. පද පිළිවෙළින් පද අටවිස්සක් වෙයි. අගෘහීත ග්‍රහණයෙන් තුදුසකි. සවිභක්තික අවිභක්තිකයන්ගේ රාශි විධානය ඔවුන්ගේ වනයෙන් දතයුතුයි. අධිමොක්ඛ මනසිකාර යන දෙක ම යේවාපනකයෝ ය.

නිර්දේශ වාරයාගේ උද්ධච්ච නිර්දේශයෙහි **චිත්තස්ස** යනු සත්ත්වයෙකුට නො වේ. පුරුෂයෙකුට නො වේ. **උද්ධච්චං** යනු නොසන්සුන් ආකාරයයි. නො සන්සිඳුණේ යනු = **අවූපසමො** ය, සිත වික්ෂෙප වේ යනු = **චෙතසො වික්ඛෙපො** ය, **භන්තත්තං චිත්තස්ස** යනු සිතේ භ්‍රාන්ත භාවයයි. භ්‍රාන්තයාන භ්‍රාන්ත ගොන් ආදීන් මෙනි. මෙයත් එක් අරමුණෙක විෂ්ඵන්දනය ම කියන ලදී. උද්ධච්චය වනාහි එක් අරමුණෙක විෂ්ඵන්දනය වේ. විචිකිච්ඡාව නානාරම්මණයෙහි විෂ්ඵන්දනය වේ. සෙස්ස සියලු වාරයන්හි යට කියන ලද නයින් ම දතයුතුයි. දැන් මේ සිත් දෙකෙහි ප්‍රකීර්ණක විනිශ්චය වෙයි. අරමුණෙහි පෙරළෙන සිත් කෙතෙක් නම් වේදැයි කීමෙහි දී වනාහි මේ දෙකම යැයි කිවයුතුයි. එහි විචිකිච්ඡා සහගත සිත ඒකාන්ත වශයෙන් පෙරළේ උද්ධච්ච සහගතය වනාහි ලබ්ධාධිවිමෝක්ෂ බැවින් ලබන ලද ප්‍රතිෂ්ඨාවෙන් පෙරළේ. යම්සේ වනාහි වටවූත් සතරැස් වූත් මැණික් දෙකක් අතුරෙන් බෑවුම් තැනෙක පෙරළා දැමූ වටමැණික ඒකාන්තයෙන් ම පෙරළෙයි. සිවුරැස් මැණික හිට හිට පෙරළෙයි. මෙය ද මෙබඳු යැයි දතයුතුයි.

සියල්ලෙහි ම හීනාදිභේදය මතුකොට නො දක්වන ලදී. සියල්ල ම ඒකාන්ත හීන බැවින් සහජාතාධිපති ලැබෙද්දීත් යටදක්වන ලද නය ඇතිහෙයින් මතුකොට නො දක්වන ලදී. මෙහි වනාහි ඤාණාභාවය

නිසා විමලසාධිපති නම් නොවේ. පශ්චිම ද්වයෙහි සෙස්ස ද නැත්තේම ය. කවර හෙයින් ද? කිසියම් ධර්මයක් ප්‍රධාන කොටගෙන නූපදනා හෙයිනුත් පට්ඨානයෙහි ද සිද්ධ කොට ඇති හෙයින් ය. මේ දොළොස් අකුසල චිත්තයන් විසින් කර්ම රැස් කළ කල්හි උද්ධච්ච සහගත සිත හැර සෙසු එකොළොස ම ප්‍රතිසන්ධිය දෙසට අදී. නො ලබන ලද අධිෂ්ඨාන ඇති දුර්වල වූ විචිකිච්ඡා සහගත සිත ප්‍රතිසන්ධිය දෙසට අදිද්දී ලබන ලද අධිෂ්ඨාන ඇති (බලවත්) උද්ධච්ච සහගත සිත කවර හෙයින් නො අදී ද යත්? සෝවාන් මාර්ග ඥානයෙන් පහකළ යුත්තක් නැති හෙයිනි. යම්හෙයකින් අදී ද, (ඒ පිළිබඳව) සෝවාන් මාර්ග ඥානයෙන් පහකළයුතු පද පිළිබඳ විභංගයෙහි එන්නේ ය. එහෙයින් එය හැර සෙසු එකොළොස ඇදගනී. ඔවුනතුරෙන් යම්කිසිවෙකු විසින් කර්මයන් රැස්කළ කල්හි ඒ චේතනාවෙන් සතර අපායෙහි ප්‍රතිසන්ධිය වෙයි. අකුසල විපාකයන් අතුරෙන් අහේතුක මනෝ විඤ්ඤාණ ධාතුව උපේක්ෂා සහගත ප්‍රතිසන්ධිය ගනී. අනෙකට ද මෙහි ම ප්‍රතිසන්ධි දානය වන්නේ ය. යම්හෙයකින් වනාහි එය නැද්ද, එහෙයින් දස්සනෙන පහාතබ්බ පද විභාගයෙහි නාවේය.

**අකුසලා ධම්මා යන පදය පිළිබඳ වර්ණනාව නිමියේ ය.**

දැන් අබ්‍යාකත යන පදය බෙදා දක්වන්නට **කතමෙ ධම්මා අබ්‍යාකතා** යන ආදිය පටන්ගන්නා ලදී. එහි විපාක කිරිය රූප නිබ්බාණ යැයි අව්‍යාකෘතය චතුර්විධය. ඔවුනතුරෙන් විපාබ්‍යාකතය විපාකාබ්‍යාකතයෙහි ද කුසල විපාකය, එහි ද පරිත්ත විපාකය (එහි ද අහේතුකය, අහේතුකයෙහි ද පංච විඤ්ඤාණය) එහි ද ද්වාර පටිපාටියෙන් චක්ඛු විඤ්ඤාණය, එහි ද ද්වාරා රම්මණාදි සාධාරණප්‍රත්‍යය හැර අසාධාරණ කර්මප්‍රත්‍ය වශයෙන් ම උත්පත්තිය දක්වන්නට **කාමාවචරස්ස කුසලස්ස කම්මස්ස කතත්තා** යන ආදිය කියන ලදී. එහි **කතත්තා** යනු කළ කාරණයෙන්, **උපචිතත්තා** යනු රැස්කරන ලද හෙයින් වර්ධනය කරන ලද හෙයින්, **චක්ඛු විඤ්ඤාණං** යනු හේතුභූත චක්ෂුස පිළිබඳ විඥානය, චක්ෂු සිත් පැවති හෝ චක්ෂුසෙහි ආශ්‍රිත වූ හෝ විඥානය යනු චක්ඛු විඤ්ඤාණ යයි. අන්‍ය වූ ශ්‍රෝත විඥානාදියෙහි ද මේ නයම ය. එහි චක්ෂුස නිශ්‍රිත රූප දැනගැනීම ලක්ෂණකොට ඇත්තේ චක්ඛු විඤ්ඤාණයයි. රූපමාත්‍ර අරමුණ ම රසයකොට ඇත්තේ ය. රූපයට අභිමුඛ වීම එළඹ සිටි කාරණය කොට ඇත්තේ ය. රූපාරම්මණාකිරිය මනෝ ධාතුවෙන්

පහවයෑම ආසන්න කාරණය කොට ඇත්තේ ය. පිටතින් පැමිණි ශ්‍රෝතාදිය ඇසුරු කළ ශබ්දාදිය දැනගැනීම ලක්‍ෂණකොට ඇත්තෝ ශ්‍රෝත ඝ්‍රාණ ජිව්හාකාය විඥානයෝ ය. ශබ්දාදී වස්තු අරමුණු කරගැනීම රසයකොට ඇත්තාහ. ශබ්දාදියට අභිමුඛ වීම එළඹසිටි කාරණය කොට ගත්තෝ ය. ශබ්දාදිය අරමුණු කොටගත් කිරිය මනෝධාතුන්ගෙන් පහවීම ආසන්න කාරණය කොට ඇත්තාහ. මෙහි වනාහි (පද) පිළිවෙළින් පද දසයක් වෙයි. අගෘහීත ග්‍රහණයෙන් සතකි. ඔවුනතුරෙන් පසක් අවිභක්තිකය දෙකක් සවිභක්තිකය. ඔවුනතුරෙන් සිත ඵස්සපඤ්චමක වශයෙනුත් ඉන්ද්‍රිය වශයෙනුත් දෙතැනක බෙදීමට යෙයි. වේදනාව ඵස්ස පඤ්චමක ඣානඞ්ග ඉන්ද්‍රිය වශයෙන් ස්ථාන තුනෙක ම ය. මේ තුන ම රාසි ද වෙයි. එක ම මනසිකාරය යේවාපනක ය.

නිර්දේශ වාරයෙහි චක්‍ෂුර් විඥානය පණ්ඩර යැයි වස්තු වශයෙන් කියන ලදී. කුසලය වනාහි තමාගේ පරිශුද්ධතාවෙන් පණ්ඩර නම් වෙයි. වස්තු පණ්ඩරත්වය නිසා භවාංග නිර්දේශයෙහි අකුසලය අවිපාකය, චිත්තෛකාග්‍රතා නිර්දේශයෙහි චිත්තස්ස ඨිති යන එකම පදය කියන ලදී. මේ දුර්වල සිත ද මෙහිදී ප්‍රවෘත්ති ස්ථිති මාත්‍රය ම ලබයි. සංස්ථිති අවස්ථිති භාවයට පැමිණීමට නො හැකි වෙයි.

සංග්‍රහ වාරයෙහි ධ්‍යානාංග මාර්ගාංගයෝ මතුකොට නො දක්වන ලදහ. කවර හෙයින්? ධ්‍යානය වනාහි විතර්ක පශ්චිමක නමි. මාර්ගය නම් හේතුපශ්චිමකය. ප්‍රකෘතියෙන් විතර්ක රහිත සිතෙහි ධ්‍යානාංගය නොලැබෙයි. අහේතුක සිතෙහි ද මාර්ගාංග නො ලැබෙයි. එහෙයින් මෙහි දෙක ම මතුකර නො දක්වන ලදී. මෙහිදී සංස්කාර ස්කන්ධය ද චතුරංගිකව ම බෙදන ලදී. ශූන්‍යතා වාරය ප්‍රකෘතික මය. ශ්‍රෝත විඥානාදී නිර්දේශ ද මේ නයින් ම දතයුතුයි. චක්‍ෂුර් විඥානාදියෙහි උපේක්‍ෂාව හුදෙකලාව ම බෙදන ලදී. කාය විඥානයෙහි සුඛං යන මෙහි විශේෂයයි. එය ද ඝර්ෂණ (වශයෙන්) වේයැයි දතයුතුයි. චක්‍ෂුර් ද්වාරාදී සතරෙහි වනාහි උපාදා රූපය ම උපාදා රූපයෙහි ගැටෙයි. උපාදා රූපයෙහි ම උපදා රූපය ගැටෙනවිට ප්‍රතිඝර්ෂණය උරාගැනීම බලවත් නොවේ. කිණිහිරි සතරක් මත කපු පුලුන්පිඩු සතරක් තබා පුලුන් පිඩුවලින් ම පහර දුන් කල මෙන් ස්පර්ශ මාත්‍රය ම වෙයි. වේදනාව මධ්‍යස්ථ ස්ථානයෙහි සිටී. කාය ද්වාරයෙහි වනාහි බාහිර මහා භූතාරම්මණ ආධ්‍යාත්මික කාය ප්‍රසාදය ගටා ප්‍රසාදප්‍රත්‍යය වූ මහාභූතයන්හි ගැටෙයි ද, (එය) යම්සේ

කිණිහිර මත කපුපුලුන් පිඩක් තබා කුළෙකින් පහරදෙනවිට (කපු) පුලුන්පිඩ බිඳගෙන කළ කිණිහිර ගනීද මෙසේ ගැටීම බලවත් වේ. මෙසේ ම ප්‍රතිසර්ෂණා උරාගැනීම බලවත් වේ. ඉෂ්ටාරම්මණයෙහි සුඛ සහගත කාය විඥානය උපදී. අනිෂ්ටාරම්මණයෙහි දුඃඛසහගත කායවිඥානය උපදී. මේ සිත්පස පිළිබඳ වස්තුද්වාර ආරම්මණයෝ බැඳුණාහු ම වෙත්. මෙහි වස්තු ආදීන්ගේ සංක්‍රමණයක් නම් නැත. කුශලවිපාක චක්‍ෂුර් විඥානය වනාහි චක්‍ෂු ප්‍රසාදය වස්තුකොට ඉෂ්ට වූද ඉෂ්ට මධ්‍යස්ථ වූ ද චතුසමුට්ඨානික රූපාරම්මණයෙහි දර්ශන කෘත්‍යය සිදුකරමින් චක්‍ෂුර් ද්වාරයෙහි සිට විපාක දෙයි. ශ්‍රෝත විඥානාදිය ශ්‍රෝත ප්‍රාසාදාදිය වස්තුකොට ඉෂ්ටානිෂ්ට මධ්‍යස්ථ ශබ්දාදීන්හි ශ්‍රාවණඝ්‍රායන සායන ස්පර්ශන කෘත්‍යයන් සිදු කෙරෙමින් ශ්‍රෝත ද්වාරාදීන්හි සිට විපාක දෙයි. මෙහි ශබ්දය වනාහි ද්වි සමුට්ඨානික ම වෙයි.

මනෝධාතු නිර්දේශයෙහි ස්වභාව ශූන්‍යත නිඃසත්වාර්ථයෙන් මනසම ධාතුව වූයේ = **මනොධාතු ය,** එය චක්‍ෂුර් විඥානාදීන්ට අනතුරුව රූපාදීන් හඳුනාගැනීම ලක්‍ෂණකොට ඇත්තේ ය. රූපාදීන් පිළිගැනීම රසය කොට ඇත්තේ ය. එසේ බව එළඹ සිටි කාරණය කොට ඇත්තේ ය. චක්‍ෂුර් විඥානාදි අපගමය ආසන්න කාරණය කොට ඇත්තේ ය. මෙහි ධර්මෝද්දේශයෙහි පද දොළොසක් වෙයි. අගෘහීත ග්‍රහණයෙන් නවයෙකි. ඔවුනතුරෙන් අවිභක්තික සතකි. සවිභක්තික දෙකකි. අධිමොක්ඛ මනසිකාර යන දෙක යේවාපනකය. විතර්ක නිර්දේශය අභිනිරෝපණයට පමුණුවා තබන ලදී. යම්හෙයකින් මේ සිත කුසල් ද නො වේද අකුසල් ද නො වේද, එහෙයින් සම්මා සංකප්ප යැයි හෝ මිච්ඡා සංකප්ප යැයි හෝ නො කියන ලදී. සංග්‍රහවාරයෙහි ලැබෙන්නා වූ ද ධ්‍යානාංගය පංචවිඥාන ශ්‍රෝතසට වැටී ගියේයැයි (උපුටා නො දක්වන ලදී) මාර්ගාංගය වනාහි ලැබෙන්නේ ම යැයි උපුටා නො දක්වන ලදී. ශූන්‍යතවාරය ප්‍රකෘතික ම ය. මේ සිතට නිබද්ධ වස්තුව හෘදය වස්තුව ම වෙයි. ද්වාරාරම්මණයෝ අනිබද්ධයහ. එහිදී ඇතැම්විට ද්වාරාරම්මණයෝ සංක්‍රමණය වෙත්. ස්ථානය වනාහි එකකි. මෙය වනාහි සම්පටිච්ඡන කිසම වෙයි. මෙය වනාහි පංචද්වාරයෙහි පංචාරම්මණයන්හි සම්පටිච්ඡනය වී විපාක දෙයි. කුශලවිපාක චක්‍ෂුර් විඥානාදීන් නිරුද්ධ වූ කල්හි එයට අනතුරුව ඒ ස්ථානයන්ට ම පැමිණි රූපාරම්මණාදීන් සම්පටිච්ඡනය (පිළිගැනීම) කරයි.

මනෝ විඥාන ධාතු නිර්දේශයන්හි ප්‍රථම මනෝ විඥාන ධාතුවෙහි පීතිපදය අධිකය. වේදනාව ද සෝමනස්ස වේදනාව වෙයි. මෙය වනාහි ඉෂ්ටාරම්මණයෙහි ම පවතී. ද්විතීය මනෝවිඥාන ධාතුව ඉෂ්ට මධ්‍යස්ථාරම්මණයෙහි පවතී. ද්විතීය මනෝවිඥාන ධාතුව ඉෂ්ට මධ්‍යස්ථාරම්මණයෙහි පවතී. එහෙයින් එහි උපෙක්ඛා වේදනාහොති යන පද මනෝධාතු නිර්දේශය සමාන ම ය. දෙතැන්හිම පංචවිඥාන ශ්‍රෝතයෙහි වැටී ගිය හෙයින් ම ධ්‍යානාංග මතුකොට නො දක්වන ලදී. මාර්ගාංග නො ලැබෙන හෙයින් ම මතුකොට නො දක්වන ලදී. සෙස්ස සියලුතන්හි කියන ලද නයින් ම දතයුතුයි. අහේතුක විපාක වූ මේ ද්විවිධ මනෝවිඥාන ධාතුව ලක්ෂණාදී වශයෙන් ෂඩාරම්මණයන් දැනගැනීම ලක්ෂණකොට ඇත්තේ ය. සන්තීරණය රසය කොට ඇත්තේ ය. ඒ බව එළඹ සිටි කාරණය කොට ඇත්තේ ය. හෘදය වස්තුව ආසන්න කාරණය කොට ඇත්තේ යැයි දතයුතුයි. එහි පළමුවැන්න දෙතැනකදී විපාක දෙයි. එය වනාහි පංචද්වාරයෙහි දී කුශලවිපාක චක්ෂුර් විඥානාදියට අනතුරුව විපාක මනෝ විඥානධාතුවෙහි ඒ අරමුණ පිළිගෙන නිරුද්ධ වූ ඒ අරමුණෙහි ම සන්තීරණ කෘත්‍යය සිදුකෙරෙමින් පංචද්වාරයෙහි සිට විපාක දෙයි. ෂට් ද්වාරයන්හි වනාහි බලවත් අරමුණෙහි තදාරම්මණය වී විපාක දෙයි. කෙසේද යත්, යම් සේ වනාහි සැඩ දියපහරෙක සරව යන නැවකින් දිය බිඳී මදක් තැන් නැව ලුහුබැඳ ගොස් (යළිත්) දියපහර අනුවම යයි ද, මෙසේ ම ෂට් ද්වාරයන්හි පොළොඹවනු ලබන බලවත් අරමුණක් ඉන්ද්‍රිය විෂය වූ කල්හි ජවන් සිත දුවයි. එය ජවනය වූ කල්හි භවංගයට වාරයයි. මේ සිත වනාහි භවංගයට ඉඩ නොදී ජවනය විසින් ගන්නා ලද අරමුණ ගෙන චිත්තවාර එකක් දෙකක් පැවතී භවංගයට ම බැසගනී. ගවයකු පිට නදියක් තරණය කරද්දී ද මෙපරිද්දෙන් ම උපමාව විස්තර කළයුතුයි. මෙසේ මෙය ජවනය විසින් ගන්නා ලද අරමුණ ම ගත්හෙයින් තදාරම්මණ නම්ව විපාක දෙයි. දෙවැන්න වනාහි ස්ථාන පසෙක විපාක දෙයි. කෙසේද යත්, මනුෂ්‍ය ලෝකයෙහි වනාහි උපතින් අන්ධ, උපතින් බිහිරි, උපතින් ජඩ, උපතින් උමතු, උභතෝබ්‍යඤ්ජනක, නපුංසක යන අය පිළිසිඳ ගන්නා කාලයෙහි ප්‍රතිසන්ධිය වී විපාක දෙයි. ඉෂ්ට මධ්‍යස්ථ පංචාරම්මණයන්හි සන්තීරණය වී (විපාක දෙයි) බලවත් අරමුණෙහි ෂට් ද්වාරයන්හි තදාරම්මණය (වී) මරණය කාලයෙහි චුතිය වී යැයි මේ ස්ථාන පසෙහි දී විපාක දෙයි.

**මනෝවිඤ්ඤාණ ධාතු දෙක නිමියේ ය.**

දැන් අෂ්ටමහා විපාක සිත් දක්වන්නට නැවත කතමෙ ධම්මා අබ්‍යාකතා යන ආදිය පටන්ගන්නා ලදී. එහි පාළියෙහි නයමාත්‍රය දක්වා සියලුවාර සංක්ෂේප කරන ලදී. ඔවුන්ගේ අර්ථය යට කියන ලද නයින් ම දතයුතුයි. මෙහි යමක් වෙනස් වී නම් එය දක්වන්නට අලොභො අබ්‍යාකත මූලං යන ආදිය කියන ලදී. යමක් නොකියන ලද නම් එය මෙසේ දතයුතුයි. කාමාවචර කුශලයන්හි කර්මද්වාර කර්මපථ පුණ්‍යක්‍රියා වස්තු පිළිබඳ යම් භේදයක් කියන ලද ද? එය මෙහි නැත. කවර හෙයින් ද? අවිඥප්තිජනක වශයෙනුත් අවිපාක ධර්ම වශයෙනුත් එසේ නො පවත්නා හෙයිනුත් ය. යේවාපනකයන්හි යම් ඒ කරුණා මුදිතා කියන ලද ද ඒවා සත්ත්වාරම්මණ බැවින් විපාකයන්හි නො මැත. ඒකාන්ත පරිත්තාරම්මණ වූ කාමාවචරයෝත්, හුදෙක් කරුණා මුදිතා පමණක් නොව විරතීහු ද මෙහි නොවෙත්. පංච ශික්ෂාපද කුසලමයැයි කියන ලදී. මෙහි අසංඛාර සසංඛාර විධානයත් කුශල වශයෙන් මෙන් ම ප්‍රත්‍ය භේදයෙන් ද දතයුතුයි. අසංඛාරික කුසලයට අසංඛාරික විපාකම ය. සසංඛාරිකයට සසංඛාරික විපාකය. අසංඛාරික බලවත් හේතූන්ගෙන් උපන්නේ ය. අන්‍ය වූ සසංඛාරිකය අන්‍ය වූ දුර්වල ප්‍රත්‍යයන්ගෙනි. හීනාදී භේදයෙහි ද මොව්හු හීනමධ්‍යම ප්‍රණීත වූ ඡන්දාදීන් විසින් නූපදවන ලද හෙයින් හීන මධ්‍යම ප්‍රණීත නම් නො වෙත්. හීන අකුසලයාගේ විපාකය වනාහි හීනය. මධ්‍යමයාගේ විපාකය මධ්‍යමය. ප්‍රණීතයාගේ ප්‍රණීතය. මෙහි අධිපතීහු නැත්තාහ. කවරහෙයින් ද යත්, ඡන්දාදීන් අධිපති කොට නූපදිය යුතු හෙයිනි. සෙසු සියල්ල අෂ්ට කුශලයන්හි කියන ලද්ද සමාන ම ය.

දැන් මේ මහා විපාක සිත් අට විපාක දෙන තැන දතයුතුයි. මේ සිත් ප්‍රතිසන්ධිය භවංගය චුතිය හා තදාරම්මණය ස්ථාන සතරෙහි විපාක දෙයි. කෙසේද යත්, මනුෂ්‍යයන් අතරෙහි හා කාමාවචර දෙවියන් අතුරෙහි ද ද්විහේතුක ත්‍රිහේතුක පුණ්‍යවන්තයන්ට පිළිසිඳ ගන්නා කාලයෙහි ප්‍රතිසන්ධිය වී විපාක දෙයි. ප්‍රතිසන්ධිය ඉක්මවා පැවැත්මේදී අවුරුදු හැටක් හෝ අසූවක් හෝ අසංඛ්‍යයක් හෝ ආයු කාලයෙහි භවංගය වී ද බලවත් අරමුණෙහි ෂට් ද්වාරයන්හි තදාරම්මණය වී ද මරණ කාලයෙහි චුතිය වීදැයි මෙසේ සිව් තැනෙක විපාක දෙයි. එහිදී සියලුම සර්වඥ බෝධිසත්ත්වවරු (පශ්චිම) ප්‍රතිසන්ධි ග්‍රහණයෙහි දී පළමුවන සොම්නස් සහගත ත්‍රිහේතුක අසංස්කාරික මහාවිපාක සිතින් පිළිසිඳ ගනිත්. එය වනාහි මෛත්‍රී පූර්වභාග සිතට විපාකය වෙයි. එයින් දෙන ලද ප්‍රතිසන්ධියෙන් ආයු අසංඛ්‍යයකි. නැවත කාල වශයෙන් පරිණාමය වෙයි.

මහාසිව ස්ථවිරයන් වහන්සේ මෙසේ වදාළහ. සොමනස්ස සහගත සිතට වඩා උපේක්ෂා සහගත සිත බලවතරය. එයින් පිළිසිඳ ගනිත්. එයින් එයින් ගන්නා ලද ප්‍රතිසන්‍ධියෙන් වනාහි මහා අදහස් ඇත්තෝ වෙත්. දිව්‍යමය ආරම්මණයන්හි පවා අධික ප්‍රීති ඇත්තෝ නොවෙත්. ත්‍රිපිටක චූලනාග ස්ථවිරාදීන් මෙති. අටුවාවෙහි වනාහි තෙරුන්ට මේ මනෝරථය නැතැයි එය ප්‍රතික්ෂේප කොට සර්වඥ බොධිසත්ත්ව වරයන්ගේ හිතෝපචාරය බලවත් වෙයි. එහෙයින් මෛත්‍රී පූර්වභාග කාමාවචර කුශලවිපාක සෝමනස්ස සහගත ත්‍රිහේතුක අසංස්කාරික සිතින් පිළිසිඳ ගනිත් යැයි කියන ලදී.

දැන් විපාකුද්ධාරකථාවෙහි මාතෘකාව තැබිය යුතුයි. ත්‍රිපිටක චූළනාග තෙරණුවෝ (වනාහි) මෙසේ වදාළහ. 'එක් කුසල චේතනාවක විපාක සිත් සොළොසක් උපදී. ද්වාදසක මාර්ග ද අහේතුක ස්ථාන ද මෙහිම ය' යනුයි. මෝරවැව වැසි මහාදත්ත තෙරණුවෝ වනාහි මෙසේ වදාළහ. 'එක් කුසල චේතනාවක විපාකසිත් දොළොසක් උපදී. දසක මාර්ග ද අහේතුකස්ථ ද මෙහිම ය' යනුයි. ත්‍රිපිටක මහා ධම්මරක්ඛිත තෙරණුවෝ මෙසේ කීහ. එක් කුසල චේතනාවක විපාක සිත් දහයක් උපදී. අහේතුකස්ථ ද මෙහිම ය' යනුයි. මෙතැනදී සාකේත නම් ප්‍රශ්නය ගත්හ. සාකේත නුවර උපාසකවරු වනාහි ශාලාවෙක හිඳ කිමෙක් ද, එක් චේතනාවෙක කර්ම රැස්කළ කල්හි එක් ප්‍රතිසන්ධියක් වේද, නැතහොත් නානාප්‍රතිසන්‍ධි වේද, යන ප්‍රශ්නය නඟා නිශ්චය කළ නොහැකිව ආභිධම්මික තෙරවරුන් වෙත එළඹ විචාළාහුය. තෙරවරු 'යම් සේ එක අඹ බීජයකින් එක අඹ අංකුරයක් නික්මේද, මෙසේ එකම ප්‍රතිසන්ධියක් වේ' යැයි ඇඟවූහ. නැවත එක්දිනෙක කිමෙක් ද නානා චේතනාවන් විසින් කර්ම රැස්කළ කල්හි නානාප්‍රතිසන්ධි වේද, නැතහොත් එකක් ද? යන ප්‍රශ්නය නඟා නිශ්වය කළ නොහැකිව තෙරවරුන් විචාළහ. තෙරවරු 'යම්සේ බොහෝ අඹ බීජ රෝපණය කළ කල්හි බොහෝ අංකුර නික්මේද, මෙසේ බොහෝ ප්‍රතිසන්ධි වේ' යැයි ඇඟවූහ.

මෙහි දී තවත් අධික බව කීමක් ගන්නා ලදී. මේ සත්ත්වයන්ගේ වනාහි ලෝභයත් උත්සන්න වෙයි. ද්වේෂයත් උත්සන්න වෙයි. මෝහයත් උත්සන්න වෙයි. අලෝභයත් උත්සන්න වෙයි. අද්වේෂයත් උත්සන්න වෙයි. අමෝහයත් උත්සන්න වෙයි. ඔවුන්ගේ ඒ මේ උත්සන්නභාවය අධිකභාවය කවරෙක් නියම කරයි? යනුයි. පූර්වහේතුව නියම කරයි.

කර්මායූහන ක්‍ෂණයෙහි (කර්මයන් රැස්කරන ක්‍ෂණයෙහි) ම නානත්වය වෙයි. කෙසේ ද? කර්මායූහනක්‍ෂණයෙහි වනාහි යමෙකුගේ ලෝභය බලවත් වේද, අලෝභය දුර්වල වේද, අදෝෂ අමෝහ බලවත් වේද, ද්වේෂ මෝහ දුර්වල වේද, ඔහුගේ දුර්වල අලෝභය ලෝභය මැඩලන්නට නොහැක්කේ වෙයි. බලවත් අදෝස අමෝහ වනාහි දෝස මෝහයන් මැඩලන්නට සමත් වෙයි. එහෙයින් හෙතෙම ඒ කර්මයෙන් දෙන ලද ප්‍රතිසන්ධි වශයෙන් උපන්නේ ලෝභී වෙයි. සුඛශීලී වෙයි. ක්‍රෝධ නොකරන්නෙක් වෙයි. වජ්‍රෝපම ප්‍රඥාවන්තයෙක් (වෙයි) යනුයි.

යමෙකු කර්ම රැස්කරන අවස්ථාවෙහි (ක්‍ෂණයෙහි ලෝභ ද්වේෂ බලවත් වේද අලෝභ අද්වේෂ දුර්වල වේද, අමෝහය බලවත්ව මෝහය දුර්වල වේද, හෙතෙම පළමු නයින් ම ලෝභියෙකු මෙන් ම දුෂ්ටයෙක් වෙයි. වජ්‍රෝපමඥාන ඇති ප්‍රඥාවන්තයෙක් ද වෙයි. දත්තාභය තෙරුන් මෙනි. යමෙකු කර්ම රැස්කරන අවස්ථාවෙහි ලෝභ ද්වේෂ මෝහ බලවත් වේද අන්‍ය මූල දුර්වල වේද හෙතෙම පළමු නයින් ම ලෝභියෙකු මෙන්ම මෝඩයෙක් වෙයි. ක්‍රෝධ නො කරන්නෙකු මෙන් ම (සුඛ)ශීලී අයෙක් ද වෙයි.

එසේ ම යමෙකු කර්ම රැස්කරන අවස්ථාවෙහි ලෝභ ද්වේෂ මෝහ යන අකුශල මූල තුනම බලවත් වේද, අලෝභාදිය දුර්වල වේද, හෙතෙම පළමු නයින් ම ලෝභියෙකු දුෂ්ටයෙකු මෙන් ම මෝඩයෙක් ද වෙයි. යමෙකු කර්ම රැස්කරන අවස්ථාවෙහි අලෝභ ද්වේෂ මෝහ බලවත් වේද, අන්‍ය වූ මූල දුර්වල වේද, හෙතෙම පළමු නයින් ම දිව අරමුණ පවා දැක නොසැලෙන මඳ කෙලෙස් ඇත්තෙක් වෙයි. මඳ නුවණ ඇති දුෂ්ටයෙක් ද වෙයි.

යමෙකු කර්ම රැස්කරන අවස්ථාවේදී අලෝභ අද්වේෂ මෝහ බලවත් වේද, අන්‍යමූල දුර්වල වේද, හෙතෙම පළමු නයින් ම අලෝභියෙකු මෙන් ම (සුඛ) ශීලී මෝඩයෙක් ද වෙයි. එසේ ම යමෙකු කර්ම රැස්කරන අවස්ථාවෙහි අලෝභ ද්වේෂ අමෝහ බලවත් වේද අන්‍ය මූල දුර්වල වේද, හෙතෙම පළමු නයින් ම අලෝභී ප්‍රඥාවන්තයෙක් වෙයි. එසේ ම ක්‍රෝධ කරන දුෂ්ටයෙක් ද වෙයි.

යමෙකු කර්ම රැස්කරන අවස්ථාවෙහි අලෝභාදී තුන ම බලවත්

වේද, ලෝභාදිය දුර්වල වේද, හෙතෙම මහා සංඝරක්ෂිත ස්ථවිරයන් මෙන් අලෝභී අද්වේෂී ප්‍රඥාවන්තයෙක් වෙයි.

මෙහිදී වෙනත් හේතු කථනයක් ද ගන්නා ලදී. (ත්‍රිහේතුකය වනාහී) ත්‍රිහේතුක ද ද්විහේතුක ද අහේතුක ද විපාක දෙයි. ද්විහේතුක කර්මය ත්‍රිහේතුක විපාක නො දෙයි. අනෙක් විපාකය දෙයි. ත්‍රිහේතුක කර්මයෙන් දෙන ප්‍රතිසන්ධිය ත්‍රිහේතුක මෙන් ම ද්විහේතුක ද වෙයි. අහේතුක නොවෙයි. ද්විහේතුක කර්මයෙන් දෙන ප්‍රතිසන්ධිය ද්විහේතුක මෙන් ම අහේතුක ද වෙයි. ත්‍රිහේතුක නො වෙයි. අසංස්කාරිකය. අසංස්කාරික මෙන් ම සසංස්කාරික විපාක ද දෙයි. සසංස්කාරිකය සසංස්කාරික මෙන් ම අසංස්කාරික විපාක ද දෙයි.

අරමුණෙන් වේදනාව පරිවර්තනය කළයුතුයි. ජවනයෙන් තදාරම්මණය නියම කළයුතුයි. දැන් ඒ ඒ තෙරවරුන්ගේ වාදයෙහි ෂෝඩස මාර්ගාදිය දතයුතුයි. ප්‍රථම කාමාවචර කුශලයට සමානව ප්‍රථම මහා විපාක සිතින් ගන්නා ලද ප්‍රතිසන්ධි ඇති, ගර්භාවාසයෙන් නික්ම සංවරා සංවරයෙහි පිහිටුවන්ට සමර්ථ බවට පැමිණි, චක්ෂුර් ද්වාරයෙහි ඉෂ්ටාරම්මණයෙහි ආපාථගත කිරිය මනෝධාතුව භවංගයෙහි වැටෙන්නට පළමුවෙන් ම ඉක්මවන ආරම්මණයන්ගේ ප්‍රමාණයක් නැත. කවර හෙයින් මෙසේ වේද? අරමුණ දුබල හෙයිනි. මේ වනාහි එක් මෝඝ වාරයෙකි.

ඉදින් භවාංගාවර්තනය වේද, කිරිය මනෝධාතුව භවංගයෙහි වැටුණු කල්හි වොත්ථපනයට නො පමුණුවා ම අතරදී චක්ෂුර් විඥානයෙහි හෝ සන්තීරණයෙහි තබා නවතී යන මේ කරුණ නොවන්නකි. වොත්ථපනයෙහි සිට සිත් එකක් හෝ දෙකක් පවතී. එයින් ආශ්‍රය ලැබ ජවන ස්ථානයෙහි සිට නැවත භවංගයට බසී. මෙය ද අරමුණෙහි දුබල බැවින් ම වෙයි. මේ වාරය වනාහි මා විසින් දක්නා ලද්දක් මෙනි. මා විසින් අසන ලද්දක් මෙන් ආදිය කියන කල්හි ලැබේ. මෙය ද දෙවන මෝඝවාරයයි.

වෙනත් කිරිය මනෝධාතුවක භවංගයෙහි වැටුණු කල්හි වීථි සිත් උපදී. ජවනය දුවයි. ජවනය අවසානයෙහි දී වනාහි තදාරම්මණයට වාරයයි. එය උපදින්නට පළමුවෙන් ම භවංගයට බසී. එහිදී මේ උපමාවකි. යම්සේ නදියෙක අමුණක් බැඳ මහ ඇළට දිය හැරවූ කල්හි ජලය ගලා

ගොස් දෙතෙර කුඹුරු පුරවා ඉතිරිය කකුළු මං ආදියෙන් පිට වී නැවත නදියට ම බසී ද මෙය ද මෙසේ දතයුතුයි. මෙහි දී වනාහි භවංග වීථිය (පවත්නා කාලය) නදියෙහි ජලය පවත්නා කාලය මෙනි. කිරිය මනෝධාතුව භවංගයට වැටෙන කාලය අමුණ බඳිනා කාලය මෙනි. වීථි සිත් පැවැත්ම මහ ඇළෙහි දිය පවතින කාලය මෙනි. ජවනය දෙතෙර කුඹුරු පිරීම මෙනි. ජවනය ධාවනය වී තදාරම්මණය පවතිද්දීම නැවත භවංගයට බැසීම කකුළු මං ආදියෙන් පිට වී නැවත ජලය නදියට බැසීම මෙනි. මෙසේ භවංගයට බසිනා සිත් පිළිබඳ ගණන පථයක් නම් නැත. මෙය ද අරමුණෙහි දුබලතාවෙන් ම වෙයි. මේ තුන්වන මෝඝ වාරයයි.

ඉදින් බලවත් අරමුණක් ආපාථගත වේද, (එවිට) කිරිය මනෝධාතුව භවංගයෙහි වැටුණු කල්හි චක්ෂුර් විඥානාදිය උපදී. ජවන ස්ථානයේදී පළමු කාමාවචර කුසල සිත ජවනය වී සය සත් විටක් දිවැ තදාරම්මණයට ඉඩ දෙයි. තදාරම්මණය පිහිටත්ම එබඳුම මහාවිපාක සිත පිහිටයි. මෙය නම් දෙකක් ලබයි. ප්‍රතිසන්ධි සිත හා සමාන හෙයින් මූල භවංගය යැයි ද ජවනය විසින් යම් අරමුණක් ගන්නා ලද ද එය ගත්හෙයින් තදාරම්මණ යැයි ද යනුවෙනි. මෙතැනදී චක්ඛු විඤ්ඤාණය සම්පටිච්ඡනය සන්තීරණය හා තදාරම්මණය යන විපාක සිත් සතර ගණනයට පැමිණියේ වෙයි.

යම් අවස්ථාවෙක දෙවන කුසල සිත ජවනය වේද (එකල්හි) එබඳු දෙවන විපාක සිත ම තදාරම්මණය වී පිහිටයි. මෙය ද නම් දෙකක් ලබයි. ප්‍රතිසන්ධි සිත හා අසමාන හෙයින් ආගන්තුක භවංගය යැයි ද පළමු නයින් ම තදාරම්මණ ද යනුවෙනි. මෙය සමග පළමු සතර පසෙක් වෙයි.

යම්විටෙක තෙවන කුසල සිත ජවනය වේද, (එවිට) එබඳු තුන්වන විපාක සිත තදාරම්මණය වී පිහිටයි. මෙය ද කියන ලද නයින් ම ආගන්තුක භවංගය තදාරම්මණය යන නම් දෙක ලබයි. මෙය සමග පළමු පස සයෙක් වෙයි.

යම්විටෙක සතරවන කුසල සිත ජවනය වේද (එවිට) එබඳු සතරවන විපාක සිත තදාරම්මණය වී පිහිටයි. මෙය ද කියන ලද නයින් ම ආගන්තුක භවංගය තදාරම්මණය යන නම් දෙක ලබයි. මෙය සමග පළමු සය සතෙක් වෙයි.

යම් අවස්ථාවෙක යම් ද්වාරයෙක ඉෂ්ට මධ්‍යස්ථ අරමුණක් ආපාථගත වේද, එහි ද කියන ලද නයින් ම මෝඝවාර තුනක් ලබයි. යම්හෙයකින් අරමුණ සමග වේදනාව පරිවර්තනය වේද එහෙයින් එහි සන්තීරණය උපේක්ෂා සහගතය. උපේක්ෂාසහගත මහා කුසල ජවන් සතර කෙළවර උපේක්ෂා සහගත මහාවිපාක සිත් සතර ම තදාරම්මණ වශයෙන් පිහිටයි. ඒවා ද කියන ලද නයින් ම ආගන්තුක භවංගය තදාරම්මණයැයි නම් දෙකක් ලබයි. පිට්ඨිභවංගයැයි ද කියනු ලැබේම ය. මෙසේ මේ පස පළමු සත සමග දොළොසක් වෙයි. මෙසේ චක්ෂුර් ද්වාරයෙහි දොළොසෙක ශ්‍රෝතද්වාරාදීන්හි (දොළොස) දොළොස යැයි සමසැටක් වෙයි. මෙසේ එක් චේතනාවකින් කර්මයන් රැස්කළ කල්හි සමසැටක් විපාක සිත් උපදී. අගහිත ගහණයෙන් වනාහි චක්ෂුර් ද්වාරයෙහි දොළොසෙක ශ්‍රෝතඝ්‍රාණ ජිව්හා කාය විඥානාදීන් සතරදැයි සොළසක් වෙයි.

මෙහිදී අම්බෝපමාව ගත්හ. එක් පුරුෂයෙක් ඵලගත් අඹගසක් මුල හිසපටන් පෙරවාගෙන වැදහෙව නිදයි. ඉක්බිති එක් ඉදුණු අඹ ගෙඩියක් නටුවෙන් ගිලිහී ඔහුගේ කන්පෙත්ත පිසගෙන මෙන් 'මං' යන ශබ්දයෙන් බිම වැටිණ. හෙතෙම එහි ශබ්දයෙන් පිබිද ඇස් ඇර බැලීය. ඉක්බිති අත දිගුකොට ගෙඩිය ගෙන මිරිකා සිඹ පරිභෝග කෙළේය. එහිදී භවංග සමංගත කාලය ඒ පුරුෂයා අඹරුකමුල නිදන කාලය මෙනි. අරමුණ ප්‍රසාදයෙහි ගැටෙන කාලය අඹගෙඩිය නටුවෙන් මිදී කන්පෙත්ත පිසගෙන වැටෙන කාලය මෙනි. (කිරිය) මනෝධාතුව භවංගයට ආවර්තනය වන කාලය ඒ ශබ්දයෙන් පුබුදින කාලය මෙනි. චක්ෂුර්විඥානය දර්ශනකෘත්‍යය සිදුකරන කාලය ඇස ඇර බලන කාලය මෙනි. විපාක මනෝධාතුව අරමුණ පිළිගන්නා කාලය අත දිගහැර ගන්නා ලද කාලය මෙනි. විපාක මනෝවිඥාන ධාතුව අරමුණ සන්තීරණය කරන කාලය ගෙන මිරිකූ කාලය මෙනි. කිරිය මනෝ විඤ්ඤාණ ධාතුව අරමුණ ව්‍යවස්ථාපිත කාලය සිඹි කාලය මෙනි. ජවනය අරමුණු රසය අනුභව කළ කාලය පරිභෝග කළ කාලය මෙනි. මේ උපමාව කුමක් දක්වයිද? අරමුණ ප්‍රසාදයෙහි ගැටීම ම කෘත්‍යයයි. එයින් ප්‍රසාදයෙහි ගැටුණු කල්හි කිරිය මනෝධාතුව භවංගාවර්තනය ද, චක්ෂුර් විඥානයාගේ දර්ශනමාත්‍රය ද විපාක මනෝධාතුව අරමුණ පිළිගැනීම් මාත්‍රය ද, කිරිය මනෝ විඤ්ඤාණ ධාතුව අරමුණ ව්‍යවස්ථාපනය කිරීම් මාත්‍රය ද කෘත්‍යයි. ඒකාන්තයෙන් ම ජවනය ම ආරම්මණාරසය අනුභව කෙරේයැයි දක්වයි.

මෙහිදී ද තෝ භවංගය නම් වෙව, තෝ ආවර්ජනය නම් වෙව, තෝ දර්ශන නම් වෙව, තෝ සම්පටිච්ඡන නම් වෙව, තෝ සන්තීරණ නම් වෙව, තෝ වොත්ථපන නම් වෙව, තෝ ජවනය නම් වෙව යැයි කරන හෝ කරවන කිසිවෙක් නැත.

මෙතැනදී බීජ නියාමය උතු නියාමය කම්ම නියාමය ධම්ම නියාමය චිත්ත නියාමය යන පංචවිධ නියාමය ගත්හ. එහි කොල්ලු පැළැටිය උතුරට හැරෙන බව, දකුණට යන වැල් දකුණුපසින් වෘක්ෂ පරිහරණය කිරීම සූර්යාවර්ති පුෂ්ප සූර්යාභිමුඛවීම මාලුවා ලතාව රුකකට අභිමුඛව යෑම පොල්ගෙඩිය මත සිදුරක් හටගැනීම යනු ද ඒ ඒ බීජයන්ට ඒ සමානඵල දානය ද බීජ නියාමය නම්. ඒ ඒ කාලයට ඒ ඒ වෘක්ෂයන්ගේ එක්වර ම මල් පලු කය (ද්විහේතුක විපාක ද) (අහේතුකය) (අහේතුක) විපාක ද දෙයි. ද්විහේතුක කර්මය ද්විහේතුක විපාක දෙයි. ත්‍රිහේතුක විපාක නොදෙයි යැයි ඒ ඒ කර්මයට ඒ ඒ සමාන විපාක ම දීම කර්ම නියාම නම්. කර්මයට සමාන විපාක වශයෙන් ම අන්‍ය වූ ද කර්ම නියාමය වෙයි.

එය දැක්වීම පිණිස මේ වස්තුව කියත්. සබ්‍රම්සරුන්ගේ කාලයෙහි සැවැත් නුවර ද්වාරග්‍රාමය දැවිණි. එයින් ගිනිගත් තණ කැරැල්ලක් පැන නැගී අහසින් යන කපුටෙකුගේ ගෙල බැඳිණි. හෙතෙම හඬ නගමින් බිම වැටී කලුරිය කෙළේ ය. මහ මුහුදේ දී ද එක් නැවක් නිශ්චලව සිටියේ ය. යට කිසිවෙකු විසින් නතර කළ බවක් නොදක්නාහු කාලකණ්ණික සලාකය දැමූහ. එය නාවිකයාගේ උපාසිකාවගේ ම අතෙහි වැටුණේ ය. ඉක්බිති එකියක නිසා සියල්ලෝ නො නැසෙත්වා. ඇය දියට දමමුයි කීහ. නැවියා මැය දියෙහි පාවෙනු දැකිය නො හැකියැයි ගෙලෙහි වැලි කළයක් බැඳ (දියෙහි) දැම්මවීය. එකෙණෙහි ම විදින ලද ඊයක් මෙන් නැව නික්මිණි.

එක් භික්ෂුවක් ලෙණක වාසය කරයි. මහත් ගල්කුළක් වැටී දොර වැසිණ. සත්වනදිනයෙහි එය ඉබේ ම ඉවත්විය. ජේතවනාරාමයෙහි වැඩසිට දහම් දෙසන බුදුන්ට මේ කථා තුන එක්වර ම දැනුම් දුන්හ. ශාස්තෘන් වහන්සේ මෙය අන්‍යයන් විසින් කරන ලද්දේ නො වේ. ඔවුන් විසින් කරන ලද කර්මය ම යැයි අතීතය ගෙනහැර දක්වමින් මෙසේ වදාළහ.

කපුටා පෙර ආත්මභාවයෙහි මිනිසෙකු වී එක් නපුරු ගොනෙකු දමනය කළ නො හැකි ව ගෙලෙහි පිදුරු වෙණියක් බැඳ ගිනි තැබී ය. ගොනා එයින් ම මළේ ය. දැන් ඒ කර්මය මොහුට අහසින් යද්දීත් මිදෙන්නට නොදුන්නේ ය. ඒ ස්ත්‍රිය ද පෙර ආත්මභාවයෙහි එක් ස්ත්‍රියක්ම ය. එක් බල්ලෙක් ඇය සමග පුරුදු වී කැලයට යද්දී සමගම යයි. සමගම ආපසු එයි. මිනිස්සු (දැන්) නික්මෙනුයේ අපගේ බලුවැද්දා යැයි කවටකම් කරත්. එයින් කරදරයට පත් ඕ තොමෝ බල්ලා වැළැක්විය නො හැකි ව වැලි කළයක් ගෙලෙහි බැඳ දියෙහි දැමුවා ය. ඒ කර්මය ඇයට මුහුද මැදදීත් මිදෙන්නට නොදුනි. ඒ භික්ෂුව ද පෙර ආත්මයෙක ගොපල්ලෙකුව ගොයකු බිලට පිවිසි කල්හි කොළ මිටකින් දොර වැසීය. සත්වන දින හෙතෙම අවුත් තමා ම විවෘත කෙළේ ය. ගොයා වෙවුලමින් නික්මියේ ය. කරුණාවෙන් ඌ නො මැරී ය. ඒ කර්මය පර්වතයක් ඇතුළට පිවිස සිටියදීත් ඔහුට මිදෙන්නට නුදුන්නේ ය. මේ වස්තු තුන සමෝධානය කොට මේ ගාථාව වදාළහ.

න අන්තලික්ඛෙ න සමුද්දමජ්ඣෙ
න පබ්බතානං විවරං පවිස්ස
න විජ්ජතෙ සො ජගතිප්පදෙසො
යත්ථට්ඨිතො මුච්චෙය්‍ය පාපකම්මාති

පාප කර්මයෙන් මිදී සිටිය හැකි තැනක් ලෝකයෙහි දක්නට නැත. අහසෙහිත් නැත. මුහුද මැදත් නැත. පර්වත විවරයකට පිවිසියත් නැත.

මෙය ද කර්ම නියාමය ම නමි.

මෙබඳු වෙනත් වස්තු ද කිවයුතුයි. බෝධිසත්ත්වයන් වහන්සේලාගේ පිළිසිඳ ගැනීමේදී මව්කුසින් බිහිවීමේදී බුද්ධත්වයට පත්වීමේදී තථාගතයන් වහන්සේ ගේ දම්සක් පැවැත්වීමේදී ආයු සංස්කාරය හැර දැමීමේ දී සහ පරිනිර්වාණයේ දී ද දසදහසක් සක්වළ කම්පාවීම (යන මේ) ධර්මනියාම නම් වේ. අරමුණ ප්‍රසාදයෙහි ගැටුණු කල්හි ඔබ ආවර්ජනය නම් වෙව -පෙ- ඔබ ජවනය නම් වෙවයි කරන හෝ කරවන කිසිවෙක් නැත. (තම) තමාගේ ධර්මතාවෙන් ම අරමුණ ප්‍රසාදයෙහි ගැටුණු අවස්ථාවේ පටන් කිරිය මනෝධාතුව භවංගයට වැටෙයි. චක්ෂුර්විඥානය දර්ශන කෘත්‍යය

සිදුකරයි. විපාක මනෝධාතුව (සම්පටිච්ඡන කෘත්‍යය සිදුකරයි. විපාක මනෝවිඥාන ධාතුව) සන්තීරණ කෘත්‍යය සිදුකරයි. කිරිය මනෝ විඤ්ඤාණ ධාතුව වොත්ථපන කෘත්‍යය සිදුකරයි. ජවනය ආරම්මණ රසය අනුභව කරයි යන මෙය චිත්තනියාම නම්. මෙහිදී මෙය අදහස් කරන ලදී.

සසංස්කාරික ත්‍රිහේතුක කුශලයෙන් ද උපේක්‍ෂා සහගත අසංස්කාරික සසංස්කාරික කුශල සිත් වලින් ද කර්ම රැස්කළ කල්හි ඒ හා සමාන විපාක සිත්වලින් දෙන ලද ප්‍රතිසන්ධියේදී ද මේ නය ම ය. උපේක්‍ෂා සහගත දෙකෙහි වනාහි පළමුවන ඉෂ්ට මධ්‍යස්ථ අරමුණු වශයෙන් පැවැත්ම දක්වා පසුව ඉෂ්ටාරම්මණ වශයෙන් දැක්විය යුතුයි. මෙසේ ද එක් එක් ද්වාරයෙහි දොළොස දොළොස වී සමසැටක් වෙයි. අගහිත ගහණයෙන් සොළොස් විපාකසිත් උපදී.

මෙහිදී පංචනාළි යන්ත්‍ර උපමාව ගත්හ. උක් මිරිකන සමයෙහි එක් ගමකින් යන්ත්‍ර වාහකයෝ එකොළොස් දෙනෙක් පිටත් ව එක් උක්කොටුවක් දැක එය පැසුණු බව දැන උක්හිමියා වෙත පැමිණ අපි යන්ත්‍ර වාහකයෝ වෙමුයි දැන්වූහ. හෙතෙම මමත් නුඹලා ම සොයමින් සිටියෙමියි (ඔවුන්) උක් ශාලාවට ගෙන ගියේය. ඔව්හු එහි නාළි යන්ත්‍රය සවිකොට අපි එකොළොස් දෙනෙක් වෙමු. තවත් අයෙක් ගතයුතුයි. වැටුප් දී ගන්නැයි කීහ. උක්හිමියා මම ම සහාය වෙමියි ශාලාවෙහි උක් පුරවා ඔවුන්ට සහාය විය. ඔව්හු (තම) තමාගේ වැඩ කොට පැණි උණු කරන්නා විසින් ම උක්රස උණු කළ කල්හි හකුරු මුල් බැඳ, උක් හිමියා කිරා කොටස් කර දුන් කල්හි තම තමන්ගේ කොටස් ගෙන උක්ශාලාව හිමියාට භාරදී මේ උපායෙන් ම තවත් ශාලා සතරෙක වැඩකොට ගියහ. එහි පංචප්‍රසාද යන්ත්‍රශාලා පස මෙන් දතයුතුයි. අරමුණු පස උක්කොටු පස මෙනි. එකොළොස් විපාක සිත් එකොළොස් සංචාරක යන්ත්‍ර වාහකයන් මෙනි. පංච විඥානයෝ උක්ශාලා හිමියන් පස්දෙනා මෙනි. එකොළොස් විපාක සිත් චක්ෂුර් විඥානය සමග එක්ව චක්ෂුර් ද්වාරයෙහි වූ රූපාරම්මණයෙහි ස්වකීය ස්වකීය කෘත්‍යය කරන කාලය පළමු ශාලාවෙහි හිමියා සමග දොළොස්දෙනා එක්ව කළ වැඩ පිළිබඳ කොටස් ගන්නා කාලය මෙනි. චක්ෂුර් විඥානයාගේ ද්වාර සංක්‍රාන්තිය නො කිරීම ශාලා හිමියා ශාලාම ආපසු භාරගත් කාලය මෙනි. එකොළොස් විපාක සිත් කාය විඥානය සමග එක්ව කායද්වාරයෙහි වූ පොට්ඨබ්බාරම්මණයෙහි

ස්වකීය ස්වකීය කෘත්‍ය කරන කාලය දෙවන තුන්වන සතරවන හා පස්වන ශාලාවන්හි දොළොස් දෙන එක්ව කළ වැඩ පිළිබඳ කොටස් ගන්නා කාලය මෙනි. කාය විඥානය ද්වාර සංක්‍රාන්ති අකරණය ශාලා හිමියාට ශාලාව නැවත භාරදෙන කාලය මෙන් යැයි දතයුතුයි. මෙපමණකින් ත්‍රිහේතුක කර්මයෙන් ප්‍රතිසන්ධිය ත්‍රිහේතුක වේ යන වාරය කියන ලදී. එයින් යම් ද්විහේතුක ප්‍රතිසන්ධියක් වේද, එය ප්‍රතිච්ඡන්නව ම ගියේ ය.

දැන් ද්විහේතුක කර්මයෙන් ද්විහේතුක ප්‍රසන්‍ධිය වේ යන වාරය කිවයුතුයි. ද්විහේතුක සෝමනස්ස සහගත අසංඛාරික සිතින් කර්ම රැස්කළ කල්හි එය සමාන වූ ම ද්විහේතුක විපාක සිතින් ගන්නා ලද ප්‍රතිසන්ධි ඇත්තහුට කියන ලද නයින් ම චක්ෂුර් ද්වාරයෙහි ඉෂ්ටාරම්මණයක් ආපාථගත වූ කල්හි මෝඝවාර තුනෙකි. ද්විහේතුක සෝමනස්ස සහගත අසංස්කාරික ජවනාවසානයෙහි එබඳුම වූ මූලභවංග සංඛ්‍යාත තදාරම්මණය ද සසංඛාරික ජවනාවසානයෙහි එය හා සමාන ම ආගන්තුක භවංග සංඛ්‍යාත තදාරම්මණය ද ඉෂ්ට මධ්‍යස්ථ අරමුණෙහි උපේක්ෂා සහගත ජවන දෙකෙහි අවසානයෙහි එබඳු ම වූ තදාරම්මණ දෙකද උපදී. මෙහි එක් ද්වාරයෙක්හි අට අට වශයෙන් සිත් සමසතළිසක් වෙයි. අගහිත ගහණයෙන් වනාහි චක්ෂුර් ද්වාරයෙහි අටක් ද ශ්‍රෝත ඝ්‍රාණ ජිව්හා කාය යන විඥාන සතරදැයි දොළොසක් වෙයි. මෙසේ එක් චේතනාවකින් කර්ම රැස්කළ කල්හි විපාක සිත් දොළොසක් උපදී. අම්බෝපම පංච නියාමක කථාව ප්‍රකට ම ය. ද්විහේතුක සෙසු සිත් තුන සමාන විපාකය විසින් ගන්නා ලද ප්‍රතිසන්‍ධිකයෙහි ද මේ නය ම ය. මෙහි වනාහි යන්ත්‍රෝපමාවෙහි යන්ත්‍ර වාහකයෝ සත්දෙනෙකි. ඔවුන් විසින් අත් යන්ත්‍ර සෑදූ කල්හි ශාලා හිමියා අටවැන්නා කොට කියන ලද්ද අනුසාරයෙන් යෝජනාව දතයුතුයි. මෙතෙකින් ද්විහේතුක කර්මයෙන් ද්විහේතුක ප්‍රතිසන්ධිය වේ යන වාරය කියන ලදී.

දැන් අහේතු ප්‍රතිසන්ධි කථාව වෙයි. ද්විහේතුක කුශල සිත් සතර අතුරෙන් එක්තරා සිතකින් කර්ම රැස්කළ කල්හි කුශල විපාක උපේක්ෂා සහගත අහේතුක මනෝවිඥාන ධාතු සිතින් ගන්නා ලද ප්‍රතිසන්ධි ඇත්තහුගේ ප්‍රතිසන්ධිය කර්මය සමානයැයි නොකිය යුතුයි. කර්මය වනාහි ද්විහේතුකය. ප්‍රතිසන්ධිය අහේතුක ය. වෘද්ධියට පත් ඔහුගේ චක්ෂුර් ද්වාරයෙහි ඉෂ්ට මධ්‍යස්ථ අරමුණක් ආපාථගත වූ විට පළමු

නයින් ම මෝසවාර තුනක් දතයුතුයි. ද්විහේතුක කුශලසිත් සතර අතුරෙන් එක්තරා ජවනයක අවසානයෙහි අහේතුක සිත තදාරම්මණභාවයෙන් පිහිටයි. එය මූලභවංගය තදාරම්මණය යන නම් දෙක ලබයි. මෙසේ මෙහි චක්ෂුර් විඥානය ද සම්පටිච්ඡනය ද උපේක්‍ෂා සහගත සන්තීරණය ද තදාරම්මණය ද උපේක්‍ෂා සහගතමය. ඔවුනතුරෙන් එකක් ගෙන ගණනයට පත් තුනක් ම වෙයි. ඉෂ්ටාරම්මණයෙහි වනාහි සන්තීරණයද තදාරම්මණය ද සෝමනස්ස සහගත ම ය. ඔවුනතුරෙන් එකක් ගෙන පළමු තුන සතරක් වෙයි. මෙසේ පංච ද්වාරයන්හි සතර සතර කොට එක් චේතනාවකින් කර්ම රැස්කළ කල්හි විපාක සිත් විස්සක් උපදීයැයි දතයුතුයි. අගහිත ගහණයෙන් වනාහි චක්‍ෂුර් ද්වාරයෙහි සතරෙක ශ්‍රෝත ඝ්‍රාණ ජිව්හාකාය යන විඥාන සතරයැයි අටක් වෙයි. මේ අහේතුක අෂ්ටකය නම්, මෙය මිනිස්ලොවෙහි නො ගන්නා ලදී. සතර අපායන්හි පැවති කාලයෙහි ලැබේ. මහ මුගලන් තෙරණුවෝ වනාහි යම් අවස්ථාවෙක නිරයෙහි පියුමක් මවාගෙන පියුම් කෙමියෙහි වැඩහිඳ නේරයික සතුන්ට දහම් දෙසූ සේක් ද, එකල තෙරුන් දක්නා (ඔවුන්ට) කුශල විපාක චක්ෂුර් විඥානය උපදී. ශබ්දය අසන්නවුන්ට ශ්‍රෝත විඥානය ද, සඳුන් වනයෙහි දිවා විහරණය පිණිස වැඩහිඳ වැඩියා වූ උන්වහන්සේ ගේ සිවුරු සුවඳ ආඝ්‍රාණය කරන කාලයෙහි ඝාණ විඥානය ද, නිරාගින්න නිවන්නට වැසි වස්වා පැන් දෙන කාලයෙහි ජිව්හා විඥානය ද, මඳ මඳ සුළඟ නැගෙන කල්හි කාය විඥානයදැයි මෙසේ චක්ෂුර් විඥානාදී පස ද එක් සම්පටිච්ඡනයක් ද සන්තීරණ දෙකක් දැයි අහේතුක අෂ්ටකය ලැබේ. නාගුරුළු විමාන ප්‍රේතයින්ට ද අකුශලයෙන් ප්‍රතිසන්ධිය ලැබේ. ප්‍රවෘත්තියේ දී කුශල විපාකය ලැබේ. සක්විති රජුගේ මංගල හස්ති අශ්වාදීන්ට ද එසේ ය.

මේ වනාහි (ඉෂ්ට) ඉෂ්ට මධ්‍යස්ථ අරමුණෙහි කුශල ප්‍රවෘත්ති වශයෙන් කථා මාර්ගයයි. ඉෂ්ටාරම්මණයෙහි වනාහි සොම්නස් සහගත කුසල සිත් සතර (ජවනය වූ කල්හි) කුසල විපාක සොම්නස් සහගත අහේතුක සිත තදාරම්මණය වෙයි. ඉෂ්ට මධ්‍යස්ථ අරමුණෙහි උපේක්‍ෂා සහගත ලෝභ සම්ප්‍රයුක්ත සතර ජවනය වූ කල්හි කුසලවිපාක උපේක්‍ෂා සහගත අහේතුක සිත තදාරම්මණය වෙයි.

ජවනයෙන් තදාරම්මණය නියම කළයුතුයැයි යමක් කියන ලද ද, එය කුශලය සඳහා කියන ලදැයි දතයුතුයි. දොම්නස් සහගත ජවනයට

අනතුරුව උපදනා තදාරම්මණය කුමක් වේද යත්, අකුසල විපාක අහේතුක මනෝවිඥාන ධාතු සිත උපදී.

මේ ජවනය වනාහි කුසල බවට හෝ අකුසල බවට කවරෙක් නියම කෙරේද යත්, ආවර්ජනය හා වොත්ථපනයයි. ආවර්ජනය විසින් නුවණින් ආවර්ජනය කල කල්හි වොත්ථපනය විසින් නුවණින් ව්‍යවස්ථාපනය කළ කල්හි වනාහි ජවනය අකුසල වේය යනු සිදු නො වන්නකි. ආවර්ජනය විසින් නුනුවණින් ආවර්ජනය කල කල්හි වොත්ථපනය විසින් නුනුවණින් ව්‍යවස්ථාපනය කළ කල්හි ජවනය කුසල වේය යන මෙයද සිදු නො වන්නක් ම ය. දෙකින් ම නුවණින් ආවර්ජනය කළ කල්හිත් ව්‍යවස්ථාපනය කළ කල්හිත් ජවනය කුසල වෙයි. නුනුවණින් අකුසලය වේයැයි දතයුතුයි. ඉෂ්ටාරම්මණයෙහි සැකකරන උද්ධතයාගේ තදාරම්මණය කුමක් වේද යත්, ඉෂ්ටාරම්මණයෙහි සැක කෙරේවා. නො කෙරේවා. උද්ධතයෙක් හෝ වේවා නො වේවා. කුසල විපාක අහේතුක සොම්නස් සිත ම තදාරම්මණය වේ. ඉෂ්ට මධ්‍යස්ථ අරමුණෙහි කුසල විපාක අහේතුක උපෙක්ඛා සහගත යැයි යන මෙය වනාහි මෙහි සංක්ෂේපයෙන් අර්ථ දක්වන මහා ධර්ම රක්ෂිත ස්ථවිර වාදය නමි.

සොම්නස් සහගතයෙහි ජවනය දිවූ කල්හි වනාහි තදාරම්මණ පසක් සෙවිය යුතුය. උපේක්ෂා සහගතයෙහි (ජවනය) දිවූ කල්හි සයක් සෙවිය යුතුයි. තව ද යම්කලෙක සොම්නස් සහගත ප්‍රතිසන්ධිය ඇතිකල්හි ධ්‍යාන උපදවා ප්‍රමාදයෙන් පිරිහුණු ධ්‍යාන ඇතිව මාගේ ප්‍රණීත ධර්මය පිරිහිණැයි ප්‍රත්‍යවේක්ෂා කරන්නාට විපිළිසර වශයෙන් දොම්නසක් උපදී ද එවිට කුමක් උපදී ද යත්, සොම්නසට අනතුරුව දොම්නස ද දොම්නසට අනතුරුව සොම්නස ද උපදී. පට්ඨානයෙහි සිද්ධ මහද්ගත ධර්මය අරභයා ජවනය දිවූ කල්හි තදාරම්මණයත් එහි ම සිද්ධ ද? කුසලවිපාක හෝ අකුසල විපාක හෝ උපෙක්ඛා සහගත අකුසල මනෝ විඤ්ඤාණ ධාතුව උපදී. එහි ආවර්ජනය කුමක් ද? (භවංගාවර්ජනයයි.) මෙයට භවංගාවර්ජනයන්ට මෙන් ආවර්ජන කෘත්‍යයක් නැත, මොව්හු වනාහි තමාට නැඹුරු බැවිනුත් රුස්කළ බැවිනුත් සමුදා චරිත බැවිනුත් උපදිත්වා. මෙය කෙසේ උපදීද යත්, යම්සේ නිරෝධයට නේවසඤ්ඤා නාසඤ්ඤායතනය අනන්තර ප්‍රත්‍යය වේද, (එසේම) නිරෝධයෙන් නැගිටින්නාට සමාපත්ති සිත ද, ආර්ය මාර්ග සිත ද, මාර්ගයන්ට අනතුරුව ඵලසිත් ද උපදී. එසේ (ආවර්ජනයන්) නැති කල්හි ද නිවණට බර වූ

හැසිරීමෙන් යුක්තව උපදී. ආවර්ජනයෙන් තොරව ද සිත උපදී. අරමුණෙන් තොරව වනාහි නූපදී. එසේ නම් මෙයට අරමුණ කුමක්ද? රූපාදී පරිත්තාරම්මණයන්ගෙන් අන්‍යතරයකි. මොවුනතුරෙන් යමක් එසමයෙහි ආපාථගත වේ ද, එය අරබයා මේ සිත උපදීයැයි දතයුතුයි. දැන් මේ සියලුම සිත් ප්‍රකට කිරීම පිණිස මේ ප්‍රකීර්ණකනය කියන ලදී.

**සුත්තං දොවාරිකො ච ගාම්ලෙලා**
**අම්බො කොලියකෙන ච,**
**ජච්චන්‍ධො පීඨසප්පී ච**
**විසයග්ගාහො ච උපනිස්සයමත්ථතො ති**

සූත්‍ර (මකුළුහුය) උපමාව, දොරටුපාල උපමාව, ගැමිදරු උපමාව කෝලියක (උක්යන්ත්‍ර) උපමාව සමග අම්බෝපමාව ද, ජාත්‍යන්ධයා සහ කොරා පිළිබඳ උපමාව ද උපනිශ්‍රය වශයෙනුත් අර්ථ වශයෙනුත් විෂයග්‍රාහය ද (දතයුතුයි.)

එහි සුත්තං යනු :- එක් මකුළුවෙක් දිසාපසෙක නූල් දිගහැර දැලක් සාදා එය මැද වැදහොත්තේ ය. පළමු දිසාවෙහි දිගහරින ලද නූලෙහි ප්‍රාණියෙකු හෝ පළගැටියෙකු හෝ මැස්සෙකු හෝ ගැටුණු කල්හි වැදහොත් තැනින් චලනය වී නික්ම සූත්‍රානුසාරයෙන් ගොස් උගේ යූෂ බී නැවත අවුත් එහි ම වැදහෙයි, දෙවන ආදී සූත්‍රයන්හි ගැටුණු කල්හි ද මෙසේ ම කරයි. පංචප්‍රසාදයෝ එහි දිසා පසෙහි දිගහරින ලද නූල් මෙනි. සිත මැද හොත් මකුළුවා මෙනි. අරමුණ සමග ප්‍රසාද ගැටෙන කාලය ප්‍රාණකාදීන් සූත්‍රයෙහි ගැටෙන කාලය මෙනි. ප්‍රසාදයෙහි ගැටෙන අරමුණ ගෙන කිරියමනෝධාතුව භවංගයට ආවර්තනය වූ කාලය මැද වැදහොත් මකුළුවාගේ චලනය මෙනි. වීථි සිතේපැවැත්ම සූත්‍රානුසාරයෙන් යන කාලය මෙනි. ජවනය අරමුණෙහි දිවූ කාලය හිස විද යූෂ බීම මෙනි. සිත හෘදයවස්තුව ම ඇසුරුකොට වැටීම නැවත අවුත් මැද වැදහෝණා කාලය මෙනි. මේ උපමාව කුමක් දක්වයිද? අරමුණ ප්‍රසාදයෙහි ගැටුණු කල්හි ප්‍රසාද වස්තුක සිතට පළමුවෙන් හෘදය වස්තුව සිත උපදී යන්න දක්වයි. එක් එක් අරමුණ ද්වාර (දෙක්හි) ආපාථගත වේයැයි දක්වයි.

දොවාරිකො යනු, එක් රජෙක් යහන්ගතව නිදයි. ඔහුගේ සේවකයා

පා පිරිමදිමින් හුන්නේ ය. බිහිරි දොරටුපාලකයා දොරටුවෙහි සිටියේ ය. ආරක්‍ෂකයෝ තිදෙනෙක් පිළිවෙළින් සිටියහ. ඉක්බිති ප්‍රත්‍යන්ත වැසියෙක් පඬුරු ගෙනවුත් දොරට තට්ටු කෙළේ ය. බිහිරි දොරටු පාලකයාට ශබ්දය නෑසේ. පා පිරිමදින්නා ඉඟියක් දුන්නේ ය. ඒ සංඥාවෙන් දොර හැර බැලීය. පළමු ආරක්‍ෂකයා පඬුරු ගෙන දෙවැන්නාට දුන්නේ ය. දෙවැන්නා තුන්වැන්නාට දුන්නේ ය. තුන්වැන්නා රජුට දුන්නේ ය. රජ පරිභෝග කෙළේ ය. එහි ජවනය ඒ රජු මෙන් දතයුතු යි. ආවර්ජන සිත පා පිරිමදින්නා මෙනි. චක්‍ෂුර් විඥානය බිහිරි දොරටු පාලකයා මෙනි. සම්පටිච්ඡනාදී සිත් තුන ආරක්‍ෂකයන් තිදෙනා මෙනි. අරමුණ ප්‍රසාදයෙහි ගැටීම ප්‍රත්‍යන්ත වැසියන් පඬුරු ගෙනවුත් දොරට තට්ටුකිරීම මෙනි. කිරිය මනෝධාතුව භවංගාවර්තනය වූ කාලය පා පිරිමදින්නා සංඥාව දුන් කාලය මෙනි. චක්‍ෂුර් විඥානය අරමුණෙහි දර්ශන කෘත්‍යය සිද්‍ධකරන කාලය ඔහු විසින් දෙන ලද සංඥාවෙන් බිහිරි දොරටු පාලකයා දොර විවර කරන කාලය මෙනි. විපාක මනෝධාතුව අරමුණ පිළිගන්නා කාලය පළමු ආරක්‍ෂකයා විසින් පඬුරු ගත් කාලය මෙනි. විපාක මනෝවිඥාන ධාතුව අරමුණ සන්තීරණය කළ කාලය පළමුවන ආරක්‍ෂකයා විසින් දෙවන ආරක්‍ෂකයාට දුන් කාලය මෙනි. කිරිය මනෝවිඥාන ධාතුව (අරමුණ ව්‍යවස්ථාපනය කළ කාලය) දෙවැන්නා තුන්වැන්නාට දුන් කාලය මෙනි. (වොත්ථපනය විසින් ජවනයට පවරා දුන් කාලය තුන්වැන්නා විසින් රජුට දුන් කාලය මෙනි. ජවනය අරමුණු රසය අනුභව කරන කාලය රජු පරිභෝග කරන කාලය මෙනි. මේ උපමාව කුමක් දක්වයිද? අරමුණ ප්‍රසාදයෙහි හැඟීම ම (කෘත්‍යයයි) කිරිය මනෝධාතුව භවංගාවර්තන මාත්‍රය ම ය. චක්‍ෂුර් විඥානාදීන්ගේ දස්සන සම්පටිච්ඡන සන්තීරණ වොත්ථපන මාත්‍රයෝ ම කෘත්‍යයෝ ය. ඒකාන්තයෙන් වනාහි ජවනය ම ආරම්මණ රසය අනුභව කෙරේ යන්න මෙය දක්වයි.

ගාම්ලෙලා යනු, බොහෝ ගැමිදරුවෝ අතුරු වීථියෙහිවැලි කෙළෙති. එහි එක් අයෙකුගේ අතෙහි කහවණුවක් හැපුණේ ය. හෙතෙම මාගේ අතෙහි හැපුණු මෙය කුමක්දැයි කීය. ඉක්බිති එකෙක් එය සුදුයැයි කීය. තවෙකෙක් එය පසුත් සමග දැඩිව ගත්තේ ය. තවත් එකෙක් මෙය මහත්ය, සිවුරැස් යැයි කීය. තවෙකෙක් මෙය කහවණුවෙකැයි කීය. ඉක්බිති එය ගෙන ගොස් මවට දුන්නේ ය. ඕතොමෝ එය කාර්මිකයා වෙතට දුන්නා ය. භවංග සිත පැවති කාලය එහි බොහෝ දරුවන් අතුරු වීථියෙහි කෙළිමින් සිටි කාලය මෙනි. අරමුණ ප්‍රසාදයෙහි ගැටුණු කාලය

කහවණුව අතෙහි හැපුණු කාලය මෙනි. ඒ අරමුණ ගෙන කිරියමනෝධාතුව භවංගාවර්තනය වූ කාලය මෙය කුමක්දැයි කී කාලය මෙනි. චක්‍ෂුර් විඥානය දර්ශන කෘත්‍යය සිදුකළ කාලය මෙය සුදුසුයැයි කී කාලය මෙනි. විපාක මනෝවිඤ්ඤාණ ධාතුව අරමුණ පිළිගත් කාලය පසුත් සමග දැඩිව ගත් කාලය මෙනි. විපාක මනෝවිඤ්ඤාණ ධාතුව අරමුණ සන්තීරණය කළ කාලය මෙය මහතය සතරැස්ය කී කාලය මෙනි. කිරිය මනෝවිඤ්ඤාණ ධාතුව අරමුණ ව්‍යවස්ථාපනය කළ කාලය එකෙකු මෙය කහවණුවෙකැයි කී කාලය මෙනි. ජවන් සිත අරමුණු රසය අනුභව කිරීම මව එය කාර්මිකයාට එළවූ කාලය මෙනියි දතයුතුයි. මේ උපමාව කුමක් දක්වයිද යත්, කිරිය මනෝධාතුව නොදැක ම භවංගාවර්තනය වෙයි. විපාක මනෝධාතුව නොදැක ම පිළිගනී. විපාක මනෝවිඤ්ඤාණ ධාතුව නො දැක ම සන්තීරණය කරයි. කිරිය මනෝවිඤ්ඤාණ ධාතුව නොදැක ම ව්‍යවස්ථාපනය කරයි. ජවනය නො දැක ම අරමුණු රසය අනුභව කරයි. මෙපමණින් වනාහි චක්‍ෂුර් විඥානය ම දර්ශනකෘත්‍යය සිද්ධ කෙරේ යැයි දක්වයි.

අමෙබා කොලියතෙන යන මෙය යන කියන ලද අම්බෝපමාවත් උක් කර්මාන්ත සාලාහිමියා පිළිබඳ උපමාවත් සඳහා කියන ලදී.

ජාත්‍යන්ධයා සහ කොරා යනු, මේ දෙදෙන ම නුවර දොර අසල ශාලාවෙහි හුන්හ. කොරා මෙසේ කීය. පින්වත් අන්ධය, ඔබ කවර හෙයින් මෙහි වේලෙමින් හැසිරේද, අසවල් ප්‍රදේශය සුභික්‍ෂය. බොහෝ ආහාරපාන ඇත. කිම එහි ගොස් සුවසේ ජීවත්වන්නට නො වටී ද කියායි. ඔබ මට කී ලෙස ම ඔබටත් එහි ගොස් සුවසේ ජීවත්වන්නට නොවටීදැයි අන්ධයා ඇසී ය. මට ද බලන්නට ඇස් නැතැයි කීය. එසේ නම් ඔබට පා ඇත. මට ඇස් ඇතැයි දෙදෙනා ම හොඳයි යැයි පිළිගෙන ජාත්‍යන්ධයා කොරා කරට නංවාගත්තේ ය. හෙතෙම ඔහුගේ කරේ හිඳ වම් අතින් ඔහුගේ හිස අල්ලාගෙන දකුණු අතින් මෙතැන මුලක් පැතිරී තිබේ. මෙතැන ගලෙකි. වම්පස අතහැර (දකුණට හැරෙන්න) දකුණ හැර වමට හැරෙන්නැයි මඟ නියමකොට කියයි. මෙසේ ජාත්‍යන්ධයාගේ පා ය කොරාගේ ඇස් යන දෙකේ එක්වීමෙන් කැමති තැනකට ගොස් සුවසේ ජීවත්වූහ. එහි රූපකාය ජාත්‍යන්ධයා මෙනි. අරූපකාය කොරා මෙනි. අරූපයෙන් තොරව රූපයට ආදානග්‍රහණයට පැමිණෙන්නට අසමර්ථ බව ජාත්‍යන්ධයාට කොරා නැතිව දිසාවන්හි යෑමක් ගමන් පිළිවෙළක්

නැතිව සිටි කාලය මෙනි. පංචවෝකාරයෙහි රූපයෙන් තොරව අරූපයාගේ නො පැවැත්ම ජාත්‍යන්ධයා නැතිව කොරාට දිවාවන්හි යෑමක් හෝ ගමන් පිළියෙළක් නැතිබව මෙනි. රූපාරූප ධර්මයන් ඔවුනොවුන්ගේ සංයෝගයෙන් සියලු කෘත්‍යයන්හි ප්‍රවෘත්ති සම්භවය දෙදෙනාගේ එක්වීමෙන් කැමති තැනකට ගොස් සුවසේ ජීවත් වූ කාලය මෙනි. මේ ප්‍රශ්නය පංචවෝකාර (භව) වශයෙන් කියන ලදී.

විසයගාහො යනු ඇස රූපවිසය ගනී. ශ්‍රෝතාදිය ශබ්දාදී විසයන් ගනී. උපනිස්සයමත්‍ථතො යනු උපනිශ්‍රය වශයෙන් හා අර්ථ වශයෙනි. එහි චක්‍ෂුස අසම්භින්න හෙයින් ද රූප ආපාතගත හෙයින් ද ආලෝක සන්නිශ්‍රිත මනසිකාර හේතුක චක්‍ෂුර් විඥානය සම්ප්‍රයුක්ත ධර්මයන් සමග ප්‍රත්‍යය සතරකින් උපදී. එහි මළහුගේ ඇස ද සම්භින්නය. ජීවත් වන්නහුගේ නිරුද්ධ වූ ද පිතෙන් සෙමෙන් හෝ ලෙයින් බාධා වූ ද චක්‍ෂුර් විඥානයට ප්‍රත්‍යය වන්නට නොහැකි වූයේ ද සම්භින්න නම් වේ. හැකිවූයේ අසම්භින්න නම්. ශ්‍රෝතාදීන්හි ද මේ නයමැයි. ඇස අසම්භින්නව තිබුණත් බාහිර රූපාරම්මණ ආපාථගත නො වන විට චක්‍ෂුර්විඥානය නූපදී. එය ආපාථගත වූ කල්හි ද ආලෝක සන්නිශ්‍රිය නැති කල්හි නූපදී. එය ඇති කල්හි ද කිරියමනෝධාතුව භවංගයෙහි අනාවෘත්ත කාලයෙහි නූපදී. ආවෘත කාලයේ ම උපදී. මෙසේ උපදිනුයේ සම්ප්‍රයුක්ත ධර්මයන් සමගම උපදී. මෙසේ චක්‍ෂුර් විඥානය මේ ප්‍රත්‍යය සතර ලැබ උපදී. ශ්‍රෝතය අසම්භින්න හෙයින් ශබ්දයන් ආපාථගත වීමෙන් ආකාශ සන්නිශ්‍රිත මනසිකාර හේතුක ශ්‍රෝත විඥානය සම්ප්‍රයුක්ත ධර්මයන් සමග උපදී. එහි ආකාසනනිස්සිතං යනු ආකාශ සන්නිශ්‍රිය ලැබම උපදී. එයින් තොරව නූපදී. වසන ලද කන්සිදුරු ඇත්තහුගේ ශ්‍රෝත විඥානය නො පවතී. සෙස්ස පළමු නයින් ම දතයුතුයි.

මෙහි යම්සේ ද මෙයින් පරතැන්හි ද මෙසේ ය. විශේෂ මාත්‍රයක් පමණක් කියමි. ඝ්‍රාණය අසම්භින්න හෙයින් ද ගන්ධයන් ආපාථගත හෙයින් ද වායෝ සන්නිශ්‍රිත මනසිකාර හේතුක ඝාණ විඥානය සම්ප්‍රයුක්ත ධර්මයන් සමග සතර ප්‍රත්‍යයෙන් උපදී. එහි වායො සනනිස්සිතං යනු කන් සිදුරට වායුව පිවිසෙත් ම උපදී. එය නැතිකල්හි නූපදී යන අර්ථයි.

දිව අසම්භින්න හෙයින් ද රසයන් ආපාතගත හෙයින් ද ආපෝ සන්නිශ්‍රිත වූ මනසිකාර හේතුක වූ ජිව්හා විඤ්ඤාණය සම්ප්‍රයුක්ත ධර්මයන්

සමග සතර ප්‍රත්‍යයෙන් උපදී. එහි **ආපො සන්නිස්සිතං** යනු දිව තෙමන ආපය (ජලය) ලැබ ම උපදී. එයින් තොරව නූපදී. වියලි දිව ඇත්තවුන්ගේ දිවෙහි රසවත් කැවිල්ලක් තැබූ කල්හි ද ජිව්හා විඤ්ඤාණය නූපදී ම ය.

කය අසම්භින්න හෙයින් ද ස්පර්ශයන් ආපාථගත හෙයින් ද පෘථිවි සන්නිශ්‍රිත වූ මනසිකාර හේතුක වූ කාය විඤ්ඤාණය සම්ප්‍රයුක්ත ධර්මයන් සමග සිව්පසයෙන් උපදී. එහි **පඨවි සන්නිස්සිතං** යනු කායප්‍රසාදයට හේතු වූ පෘථිවි සන්නිශ්‍රය ලැබ ම උපදී. එයින් තොරව නූපදී. බාහිර මහාභූතාරම්මණය කායද්වාරයෙහි ආධ්‍යාත්මික කායප්‍රසාදයෙහි ගැටී ප්‍රසාද ප්‍රත්‍ය වූ මහාභූතයන්හි හැපේ.

මනස අසම්භින්න බැවින් ද ධර්මයන් ආපාථගත හෙයින් ද වස්තු සන්නිශ්‍රිත වූ මනසිකාර හේතුක වූ මනෝවිඤ්ඤාණය සම්ප්‍රයුක්ත ධර්මයන් සමග සිවුපසයෙන් උපදී. එහි **මනො** යනු භවංග සිතයි. එය නිරුද්ධ වූවක් ආවර්ජන සිතට ප්‍රත්‍යය වන්නට අසමත් ව මන්‍දතරගතව පවත්නේ වුවත් සම්භින්න නම් වෙයි. ආවර්ජනයට ප්‍රත්‍යය වන්නට සමත්වූයේ අසම්භින්න නම්. **ආපාතගතත්තා ධම්මානං** යනු ධර්මාරම්මණා ආපාථගත වූ කල්හි, **වත්‍ථුසන්නිස්සිතං** යනු හෘදයවස්තුව සන්නිශ්‍රිය ලැබ ම උපදී. එයින් තොර ව නූපදී. මේ ප්‍රශ්නයත් පංචවෝකාරභවය සඳහා කියන ලදී. **මනසිකාරහෙතුකං** යනු කිරියමනෝවිඤ්ඤාණ ධාතුව භවංගාවර්තනය වූ කල්හිම උපදී යනු අර්ථයි. මෙය වනාහි උපනිශ්‍රය අර්ථ වශයෙනැයි මෙහි උපනිශ්‍රය වර්ණනාවයි. අර්ථ වශයෙන් වනාහි ඇස දර්ශනාර්ථය කන ශ්‍රවණාර්ථය නාසය ආඝාණාර්ථය දිව සායනාර්ථය කය ස්පර්ශනාර්ථය සිත විජානනාර්ථය එහි දර්ශනය මොහුගේ අර්ථයයි. ඔහු විසින් එය නිෂ්පාදනය කළයුතුයි යනු = දස්සනත්‍ථං ය, සෙසු තැන්හි ද මේ නයම ය. මෙතෙකින් ත්‍රිපිටක චූළනාග ස්ථවිරවාදයෙහි සෝළසක මාර්ගය ද්වාදශක මාර්ගයත් අහේතුකටඨකයත් සමග නිමියේ ය.

දැන් මොරවැව වැසි මහාදත්ත ස්ථවිරවාදයෙහි ද්වාදසක මග්ග කථාව වෙයි. එහි සාතෙතපඤ්හ උසසද කිත්තන සහ හෙතුකිත්තන ප්‍රකටමය. මේ ස්ථවිරයන් වහන්සේ වනාහි අසංඛාරික සසංඛාරිකයන්ගේ දෝෂය දැක අසංඛාරිකය අසංඛාරික විපාක ම දෙයි. සසංඛාරික විපාක නොදෙයි. සසංඛාරිකය ද සසංඛාරික විපාක ම දෙයි. අසංඛාරික විපාක නොදෙයි යැයි කීහ. උන්වහන්සේ ජවනයෙන් ද චිත්තනියාමය නො කියති.

අරමුණෙන් වනාහි වේදනා නියමය කියති. එහෙයින් උන්වහන්සේගේ විපාකද්ධාරයෙහි ද්වාදශක මාර්ගයක් විය. දශක මාර්ගයන් අහේතුකට්ඨකයක් මෙහි ම පිවිසවන ලදී.

මේ එහි නයයි. සෝමනස්ස සහගත ත්‍රිහේතුක අසංඛාරික සිතින් කර්ම රැස්කළ කල්හි වනාහි එබඳුම විපාක සිතකින් පිළිසිඳගෙන වැටුණාහුගේ චක්ෂුර් ද්වාරයෙහි ඉෂ්ටාරම්මණයක් ආපාතගත වූ කල්හි යට කියන ලද නයින් ම මෝඝවාර තුනක් වෙයි. එහි කුසල වශයෙන් සෝමනස්ස සහගත සතරක් ද අකුසලයන් සතරක් ද කිරිය වශයෙන් පසක්දැයි මේ තෙළෙස් සිත් අතුරෙන් එකකින් වූ ජවනය කෙළවර පිහිටන තදාරම්මණය ද සෝමනස්ස සහගත අසංඛාරික ත්‍රිහේතුක සිත ද දුහේතුක සිත ද පිහිටයි. මෙසේ ඔහුගේ චක්ෂුර්ද්වාරයෙහි චක්ෂුර් විඥානාදී සිත් තුන ද තදාරම්මණ දෙකදැයි ගැණුනු සිත් පසක් වෙයි. අරමුණ විසින් වේදනාවට පරිවර්තනය කොට කුසලයෙහි සතරකින් ද අකුසලයෙන් සතරකින් ද කිරිය සිත්වලින් සතරකින්දැයි දොළොස් උපේක්ෂා සහගත සිත් අතුරෙන් එක්තරා සිතකින් ජවනය වී අවසානයේ දී උපේක්ෂා සහගත ත්‍රිහේතුක අසංස්කාරික ජවනය වී අවසානයේ දී උපේක්ෂා සහගත ත්‍රිහේතුක අසංස්කාරික විපාක සිත ද ද්විහේතුක අසංස්කාරික විපාකය ද තදාරම්මණය වී උපදී. මෙසේ ඔහුගේ චක්ෂුර් ද්වාරයේ දී උපේක්ෂා සහගත සන්තීරණය ද මේ තදාරම්මණ දෙක ද යන තුන ද ගණනය වූ සිත් වෙයි. ඒ තුන පළමු පසත් සමග අටකි. ශ්‍රෝත ද්වාරාදීන්හි ද අට අට යැයි එක් චේතනාවකින් කර්ම රැස්කළ කල්හි සිත් සමසතළිසක් උපදී. අගහිත ගහණයෙන් වනාහි චක්ෂුර් ද්වාරයෙහි අටෙක ශ්‍රෝත විඥානාදී සතරෙකැයි දොළොසක් වෙයි. එහි මූලභවංගතාව හා ආගන්තුක භවංගතාව ද අම්බෝපම නියාම කථාව ද කියන ලද නයින් ම දතයුතුයි.

සෝමනස්ස සහගත ත්‍රිහේතුක සසංස්කාරික කුසල සිත් කර්ම රැස්කළ කල්හි ද උපේක්ෂා සහගත ත්‍රිහේතුක අසංස්කාරික සිත්වලින් කර්ම රැස්කළ කල්හි ද මේ නයම ය. හස්ත යන්ත්‍රෝපමාවද මෙහි ප්‍රකටමය. මෙපමණකින් ත්‍රිහේතුක කර්මයෙන් ත්‍රිහේතුක ප්‍රතිසන්ධිය වේය යන වාරය කියන ලදී. (ත්‍රිහේතුක කර්මයෙන්) ද්විහේතුක ප්‍රතිසන්ධිය යන වාරය වනාහි ප්‍රතිච්ඡතව ගියේ ය. දැන් ද්විහේතුක කර්මයෙන් ද්විහේතුක ප්‍රතිසන්ධි කථාව වෙයි. සෝමනස්ස සහගත ද්විහේතුක අසංස්කාරික සිතින් වනාහි කර්ම රැස්කළ කල්හි එබඳු ම විපාක සිතකින්

ගත් ප්‍රතිසන්ධිය ඇති ව වැඩුණෙකුගේ චක්‍ෂුර් ද්වාරයෙහි ඉෂ්ටාරම්මණයක් ආපාථගත වූ කල යට කියන ලද නයින් ම මෝඝවාර තුනක් වෙයි. ද්විහේතුකයාට වනාහි ජවන කෘත්‍යයක් නැත. එහෙයින් කුසලයෙන් සොම්නස් සහගත සතරක් ද අකුසලයෙන් සතරක්දැයි යන මේ අටෙන් අන්‍යතර ජවනයෙක අවසානයෙහි ද්විහේතුක ම සෝමනස්ස සහගත අසංස්කාරිකය තදාරම්මණය වෙයි. මෙසේ ඔහුගේ චක්‍ෂුර් විඥානාදී තුන ද මේ තදාරම්මණය ද යන සතර ද ගණනය වූ සිත් වෙයි.

ඉෂ්ට මධ්‍යස්ථ අරමුණෙහි වනාහි කුසලයෙන් උපේක්‍ෂා සහගත සතරකින් ද අකුසලයෙන් සතරකින් ද යන අටෙන් එක්තරා සිතකින් වූ ජවනය කෙළවරෙහි ද්විහේතුක ම උපේක්‍ෂා සහගත අසංස්කාරික තදාරම්මණය වෙයි. මෙසේ ඔහුට උපේක්‍ෂා සහගත සන්තීරණය ද මේ තදාරම්මණය ද යන දෙක ගණනය වූ සිත් වෙයි. එම සිත් පළමු සතරත් සමග සයෙක. සෝතද්වාරාදීන්හි ද සය සය බැගින් දැයි එක් චේතනාවකින් කර්ම රැස්කළ කල්හි සිත් සමගියක් උපදී. අගහිත ගහණයෙන් වනාහි චක්‍ෂුර් ද්වාරයෙහි සයෙක ශ්‍රෝත විඥතාදී සතරදැයි දහයක් වෙයි. අම්බෝපම නියාම කථාව පළමු පරිදි ම ය. යන්ත්‍රෝපමාව මෙහි නො ලැබේ යැයි කියන ලදී. සෝමනස්ස සහගත දුහේතුක සසංඛාරික කුසල සිතින් කර්ම රැස්කළ කල්හි ද උපෙක්ඛා සහගත දුහේතුක අසංඛාරික සසංඛාරික සිත්වලින් (කර්ම) රැස්කළ කල්හි ද මේ නය ම ය. මෙපමණකින් ද්විහේතුක කර්මයෙන් ද්විහේතුක ප්‍රතිසන්ධිය වේ යන වාරය කියන ලදී. අහේතුක ප්‍රතිසන්ධිය වේ යන වාරය ද මෙසේ දතයුතුයි. කුසලයෙන් ඥාන විප්‍රයුක්ත සතරින් කර්ම රැස්කොට කුසල විපාක අහේතුක මනෝවිඥාන ධාතුවෙන් උපේක්‍ෂා සහගත ප්‍රතිසන්ධියක් ගත් කල්හි ප්‍රතිසන්ධිය කර්මය සමාන යැයි නො කිය යුතුයි. මෙතැන් පටන් යට කියන ලද නයින් ම කියා ඉෂ්ටයෙහි ද ඉෂ්ට මධ්‍යස්ථයෙහි ද චිත්තෝත්පත්තිය දතයුතුයි. මේ තෙරුන්ගේ වාදයෙහි පිණ්ඩ ජවනය ම දිවෙයි. සෙසු ජවන කුසල බැවින් (හෝ අකුසල බැවින් හෝ) කවරෙක් නියම කෙරේදැයි යන පළමු කථා සියල්ල යට කියන ලද නයින් ම දතයුතුයි. මෙතෙකින් මොරවැව වැසි මහාදත්ත ස්ථවිරවාදයෙහි දශක මාර්ගය හා අහේතුකට්ඨකය සමග ද්වාදශක මාර්ගය නිමියේ ය.

දැන් මහා ධර්මරක්‍ෂිත ස්ථවිරවාදයෙහි දශක මාර්ග කථාව වෙයි. එහි සාකේත ප්‍රශ්නය හා උත්සද කීර්තය පළමු පරිදිමය. හේතුකීර්තනයෙහි

වනාහි මේ විශේෂය කි. ත්‍රිහේතුක කර්මය ත්‍රිහේතු විපාක ද ද්විහේතුක විපාක ද අහේතුක විපාක ද දෙයි. ද්විහේතු කර්මය ත්‍රිහේතුකය පමණක් නො දෙයි. අනෙක දෙයි. ත්‍රිහේතුක කර්මයෙන් වන ප්‍රතිසන්ධිය ත්‍රිහේතුක ම වෙයි. ද්විහේතු නොවෙයි. ද්විහේතු කර්මයෙන් ද්විහේතුක වෙයි. ත්‍රිහේතුක නො වෙයි. අසංස්කාරික කර්මය අසංස්කාරික විපාකය ම දෙයි. සසංස්කාරික විපාක නො දෙයි. සසංස්කාරිකය ද සසංස්කාරික (විපාක) ම දෙයි අසංස්කාරික විපාක නො දෙයි. අරමුණෙන් වේදනාව පරිවර්තනය කළයුතුයි. ජවනය පිණ්ඩජවනය ම ජවනය වෙයි. මුලපටන් සිත් කිවයුතුයි. මේ එහි කථාවයි. එකෙක් පළමු කුසල සිතින් කර්ම රැස් කරයි. පළමු සිතින් ම පිළිසිඳ ගනී. මේ කර්මය සමාන ප්‍රතිසන්ධියයි. වැඩුණු ඔහුගේ චක්‍ෂුර් ද්වාරයෙහි ඉෂ්ටාරම්මණයක් ආපාථගත වූ කල්හි කියන ලද නයින් ම මෝඝ වාර තුනක් වෙයි. ඉක්බිති ඔහුට යට කියන ලද තෙළෙස් සොම්නස් සහගත ජවනයන් අතුරෙන් එක්තරා ජවනයකින් ජවනය වී අවසානයෙහි පළමුවිපාක සිත ම තදාරම්මණය වෙයි. එය මූලභවංගය තදාරම්මණය යැයි නම් දෙකක් ලබයි. මෙසේ ඔහුට චක්‍ෂුර් විඥානාදී සිත් තුන ද මේ තදාරම්මණය ද යන සිත් සතර ගණනයට පැමිණෙයි. ඉෂ්ට මධ්‍යස්ථ අරමුණෙහි යට කියන ලද්දා වූ ම දොළොස් උපේක්‍ෂා සහගත ජවනයන් අතුරෙන් එක්තරා ජවනයක් ජවනය වූ අවසානයෙහි උපේක්‍ෂා සහගත ත්‍රිහේතුක අසංස්කාරික සිත තදාරම්මණය යන නම් දෙක ලබයි. මොහුට උපේක්‍ෂා සහගත සන්තීරණ එකක් ද මේ තදාරම්මණය ද යන ගණනය වූ සිත්ය, පළමු සතරත් සමග එය සයක් වෙයි. මෙසේ එක් චේතනාවකින් කර්ම රැස්කළ කල්හි පංචද්වාරයන්හි සිත් සමතිසක් උපදී. අගහිත ගහණයෙන් ද චක්‍ෂුර් ද්වාරයෙහි සය ද සෝත විඤ්ඤාණාදී සතරදැයි දහසක් වෙයි. අම්බෝපම නියාම කථාව පෙරසේමය. දෙවන තෙවන හා සතරවන කුසල සිත්වලින් කර්ම රැස්කළ කල්හි ද මෙපමණ ම විපාකසිත් වෙයි. උපේක්‍ෂා සහගත සිත් සතරින් රැස්කළ කල්හි ද මේ නය ම ය. මෙහිදී ඉෂ්ට මධ්‍යස්ථ ආරම්මණය දැක්විය යුතුයි. පසුව ඉෂ්ටාරම්මණායෙන් වේදනාව පරිවර්තනය කළයුතුයි. අම්බෝපම නියාම කථාව පළමුසේ ම ය. යන්ත්‍රෝපමාව නොලැබේ. කුසලයෙන් ද ඥාන විප්‍රයුක්ත සතර අතුරෙන් එක්තරා සිතකින් කර්ම රැස්කළ කල්හි ද මෙතැන් පටන් සියල්ල විස්තර කොට අහේතුකට්ඨකය කිවයුතුයි. මෙතෙකින් මහා ධර්මරක්‍ෂිත ස්ථවිරවාදයෙහි අහේතුකට්ඨකය සමග දශකර්මාර්ගය නිමියේ ය.

මේ තෙරවරුන් තිදෙනාගෙන් කවරෙකුගේ වාදය ගතයුතුද යත්, ඒකාන්ත වශයෙන් කිසිවෙකුගේත් වාද නො ගතයුතුයි. සියල්ලන්ගේ ම වාදයන්ගෙන් යුක්තිය ගතයුතුයි. ප්‍රථමවාදයෙහි වනාහි සංස්කාර අසංස්කාරවිධානය ප්‍රත්‍යය භේදයෙන් අභිප්‍රේතයි. එහෙයින් මෙහි අසංස්කාරික කුශලයාට දුර්වල ප්‍රත්‍යයෙන් සසංස්කාරික විපාකය ද, සසසේකාරිකයාට දුර්වල ප්‍රත්‍යයෙන් උපන් අසංස්කාරික විපාකය ද ගෙන ලබන්නා වූ ද කිරිය ජවනයන් හැර කුසල ජවනයෙන් තදාරම්මණයද ආරම්මණයෙන් වේදනාව ද නියමකොට ශෛක්‍ෂ පෘථග්ජන වශයෙන් ෂෝඩෂ මාර්ගය කියන ලදී. මෙහි ද යමක් අකුසල ජවනාවසානයෙහි අකුසල විපාකය ම තදාරම්මණ වශයෙන් දක්වන ලදී. එය අන් තන්හි නොදක්වන ලදමය. එහෙයින් එයත් එහි ඒවාහි කියන ලද සහේතුක විපාකය ද මෙහි මේ සියල්ල ද ලැබේම ය. මේ එහි නයයි. යම් කලෙක වනාහි ජවන් අතුරෙහි අකුසලය ජවනය වේ ද, එකල්හි කුසලාවසානයෙහි ආචීර්ණ සමානව ම කුසලාවසානයෙහි සහේතුක තදාරම්මණය යුක්ත ය. යම්කලෙක නිතර අකුසලය ම වේ ද, එකල්හි අහේතුකය. මෙසේ වනාහි පළමු වාදයෙහි යුක්තිය ගතයුතුයි.

දෙවන වාදයෙහි වනාහි කුසලයෙන් සසංඛාර අසංඛාර විධානය අභිප්‍රේතය. එහෙයින් මෙහි අසංඛාරික කුසලයට අසංඛාරික ම විපාකයත් සංඛාරික කුසලයට ද සසංඛාරිකය මත් ගෙන ජවනයෙන් තදාරම්මණ නියමය නොකොට සියලු ම ශෛක්‍ෂ අශෛක්‍ෂ පෘථග්ජනයන්ගේ උත්පත්ති රහස ද පිණ්ඩ ජවන වශයෙන් ම ද්වාදශක මාර්ගයක් කියන ලදී. මෙහි ද ත්‍රිහේතුක ජවන වශයෙන් ත්‍රිහේතුක තදාරම්මණය යොදන ලදී. ද්විහේතුක ජවනය අවසානයෙහි ද්විහේතුකය යොදන ලදී. අහේතුක ජවනාවසානයෙහි අහේතුකය බෙදා නො කියන ලදී. මෙසේ දෙවන වාදයෙහි යුක්තිය ගතයුතුය.

තෙවන වාදයෙහි ද කුසලයෙන් ම අසංස්කාර සසංස්කාර විධානය අභිප්‍රේතය. ත්‍රිහේතුක කර්මය ත්‍රිහේතුක කර්මය ත්‍රිහේතුක විපාකයත් ද්විහේතුක විපාකයත් අහේතුක විපාකයත් දෙයි යන වචනයෙන් අසංස්කාරික ත්‍රිහේතුක ප්‍රතිසන්ධි ඇත්තාට අසංස්කාරික ද්විහේතුකයෙන් ද තදාරම්මණය විය යුතුයි. එය නො දක්වා හේතුව සමාන වූ ම තදාරම්මණයක් දක්වන ලදී. එය පළමු හේතුකීර්තන ලබ්ධිය සමග නො යෙදේ. හුදෙක් දශක මාර්ග විස්තරය පිණිස ම කියන ලදී. අනෙකද

ලැබේ ම ය. තුන්වන වාදයෙහි යුක්තිය ද මෙසේ ගතයුතුයි. මෙයත් (අන්) සියල්ලත් ප්‍රතිසන්ධි ජනක කර්මයාගේ විපාකය සඳහා තදාරම්මණ කථාය, 'සහෙතුකං භවංගං අහේතුකස්ස භවංගස්ස අනන්තර පච්චයෙන පච්චයො' යන කීමෙන් ද නානා කර්මයෙන් අහේතුක ප්‍රතිසන්ධියක් ඇත්තාට ද සහේතුක විපාක තදාරම්මණ විපාක තදාරම්මණය උපදී. ඔහුගේ උත්පත්ති විධානය මහා ප්‍රකරණයෙහි මතු එන්නේ ය.

කාමාවචර කුසලවිපාක කථාව නිමියේ ය.

දැන් රූපාවචරාදී විපාක දක්වන්නට නැවත කත මෙ ධම්මා අබ්‍යාකතා යන ආදිය පටන්ගන්නා ලදී. එහි යම්හෙයකින් කාමාවචර විපාකය තමාගේ කුසලය හා සමාන ද වෙයි. අසමාන ද වෙයි. එහෙයින් එය කුසලානුගතික කොට නොබෙදන ලදී. රූපාවචර අරූපාවචර විපාකය වනාහි යම්සේ ඇත් අස් පර්වත ආදීන්ගේ ඡායාව ඇත් ආදීන් සමාන ම වේද එසේ තමාගේ කුසලය සමාන ම වේද එසේ තමාගේ කුසලය සමාන ම වේයැයි කුසලානුගතික කොට බෙදන ලදී. කාමාවචර කර්මය ද යම්කිසි විටෙක විපාක දෙයි. රූපාවචර-අරූපාවචර වනාහි අනන්තර වශයෙන් දෙවන අත්බැව්හි විපාක දෙයි යැයි කුසලානුගතික කොට ම බෙදන ලදී. සෙස්ස කුසලයෙහි කියන ලද නයින් ම දතයුතුයි. මේ වනාහි විශේෂයයි. මෙහි ප්‍රතිපදාදී භේදය ද හීනප්‍රණීත මධ්‍යම භාවය ද ධ්‍යානාගමනයෙන් දතයුතුයි. ඡන්දාදීන් අතුරෙන් යමක් අධිපති කොට නූපදිය යුතු බැවින් මේවා නිරධිපතික ම වෙයි.

රූපාරූපාවචර විපාක කථාව නිමි.

ලෝකෝත්තර විපාකය ද කුශලය සමාන බැවින් කුශලානුගතිකම කොට බෙදන ලදී. යම්හෙයකින් වනාහි ත්‍රෛභූමක කුශලය ච්‍යුතිප්‍රතිසන්ධි වශයෙන් වෘත්තය රැස්කරයි ද වඩයි ද, එහෙයින් එහි කතත්තා උපචිතත්තා යැයි කියන ලදී. ලෝකෝත්තරය වනාහි එයින් රැස්කරන ලද්ද ද විනාශ කරයි. තෙමේ ද ච්‍යුති ප්‍රතිසන්ධි වශයෙන් රැස් (නො) කරයි. එහෙයින් මෙහිදී කතත්තා උපචිතත්තා යැයි නොකියා කතත්තා භාවිතත්තා යැයි කියන ලදී. සුඤ්ඤතං යන ආදීන්හි මාර්ගය වනාහි ආගමන වශයෙන්

සගුණ වශයෙන් ආරම්මණ වශයෙන් යන කරුණු තුනකින් නම් ලබයි යැයි මෙය යට කුශලාධිකාරයෙහි විස්තර කරන ලදී. එහි සූත්‍රාන්තික පර්යායයෙන් ස්වගුණ වශයෙන් ද ආරම්මණ වශයෙන් ද නම් ලබයි. මෙය වනාහි පර්යාය දේශනාවයි. අභිධර්මකථාව වනාහි නිෂ්පර්යාය දේශනා ය. එහෙයින් මෙහි ස්වගුණ වශයෙන් හෝ ආරම්මණ වශයෙන් නාමය නො ලබයි. ආගමන වශයෙන් ම ලබයි. ආගමනය ම අධිපති වෙයි. එය විදර්ශනාගමනය මාර්ගාගමනය යැයි දෙවැදෑරුම්ය. එහි මාර්ගය මාර්ගය පැමිණි තැන විදර්ශනාගමනය අධිපතිය ඵලය පැමිණි තැන මාර්ගාගමනය අධිපති යැයි මෙය ද යට කියන ලදමය. ඔවුනතුරෙන් මෙය ඵලය පැමිණි තැනයි. එහෙයින් මෙහි මාර්ගාගමනය අධිපතියැයි දතයුතුයි.

ඒ මේ මාර්ගය ද ආගමනයෙන් ශූන්‍යයැයි නාමය ලැබ ස්වගුණ වශයෙන් ද ආරම්මණ වශයෙන් ද අනිමිත්ත ය. අප්‍රණිහිත යැයි ද කියනු ලැබේ. එහෙයින් තමා ආ යුතු තැන සිට තමාගේ ඵලයට නම් තුනක් දෙයි. කෙසේ ද? මේ ශූන්‍යතා මාර්ගය ශුද්ධාගමන වශයෙන් ම ලබන ලද නාමයකි. තෙමේ ආගමනීය ස්ථානයෙහි සිට තම ඵලයට නාමය දෙනුයේ සුඤ්ඤත යැයි නම් කෙළේ ය. ශූන්‍යතා අනිමිත්ත මාර්ගය තෙමේ ආගමනීය ස්ථානයෙහි සිට තම ඵලයට නම් දෙනුයේ අනිමිත්ත යැයි නම් කෙළේ ය. ශූන්‍යතා අප්‍රණිහිත මාර්ගය තෙමේ ආගමනීය ස්ථානයෙහි සිට තම ඵලයට නම් දෙනුයේ අප්‍රණිහිත යැයි නම් කෙළේ ය. මේ නම් තුන වනාහි මාර්ගයන් අතර ඵල සිතෙහි ම මේ නයින් ලැබේ. අපර භාගයෙහි වළඳනා ඵලසමාපත්තියෙහි නො ලබයි. අපර භාගයෙහි වනාහි අනිත්‍යතා ආදී ත්‍රිවිධ විදර්ශනාවන්ගෙන් බලන්නට හැකිවෙයි. ඉක්බිති ඔහුට (නැඟිටි) නැඟිටි විදර්ශනා වශයෙන් අනිමිත්ත අප්‍රණිහිත ශූන්‍යතා සංඛ්‍යාත තිවිධ ඵල උපදී. ඔවුන්ට ඒ සංස්කාරම අරමුණු වෙයි. අනිත්‍යානු දර්ශනාදී ඥාන ගෝත්‍රභූ ඥාන නම් වෙයි. මෙය ද ශූන්‍යතා මාර්ගයෙහි කියන ලදී. අප්‍රණිහිත මාර්ගයෙහි ද මේ නයම ය.

මෙය ද සුද්ධාගමන වශයෙන් ලද නම් ඇති අප්‍රණිහිත මාර්ගය තෙමේ ආගමනීය ස්ථානයේ සිට තම ඵලයට නම් දෙනුයේ අප්‍රණිහිත යැයි නම් කෙළේ ය. අප්‍රණිහිත අනිමිත්ත මාර්ගය තෙමේ ආගමනීය ස්ථානයේ සිට තම ඵලයට නම් දෙනුයේ අනිමිත්ත යැයි නම් කෙළේ ය. අප්‍රණිහිත ශූන්‍යතා කර්මය තෙමේ ආගමනීය ස්ථානයෙහි සිට තම

ඵලයට ශූන්‍යතායැයි නම් කෙළේ ය. මේ නම් තුන ද මාර්ගයන් අතර ඵලසිතෙහි ම මේ නයින් ලබයි. අපරභාගයෙහි වළඤ්ජනක ඵල සමාපත්තියෙහි නො වේ. මෙසේ මේ විපාක නිර්දේශයෙහි ම කුසල සිත්වලින් ත්‍රිගුණ විපාක සිත් දතයුතුයි.

යම්සේ වනාහි ත්‍රෛභූමක කුශලයෝ තමාගේ විපාකයට අධිපතියෙකු ලබාදෙන්නට නො හැකි වෙත් ද, ලෝකෝත්තර (කුශලයෝ) එසේ නො වෙත්. කවර හෙයින් ද? ත්‍රෛභූමක කුශලයන්ගේ වනාහි ආයූහන කාලය අනෙකෙකි. විපාක කාලය අනෙකකි. එහෙයින් මොව්හු තමාගේ විපාකයට අධිපතියකු ලබාදෙන්නට නො හැකි වෙත්. ලෝකෝත්තර කුශලයෝ වනාහි ඒ ශ්‍රද්ධාව ඒ වීර්යය ඒ ස්මෘතිය ඒ සමාධිය ඒ ප්‍රඥාව නොසන්හුන් කල්හි අපණ්ණක - අවිරුද්ධ මාර්ගයට අනතුරුව ම විපාකය ලබත්. එහෙයින් තම විපාකයට අධිපතියෙකු ලබාදෙන්නට හැකිවෙත්. යම්සේ වනාහි ස්වල්ප වූ ගින්නක් ගිය තැන ගින්න තිවුණු සැනින් ම උණුබව නිවී කිසිවක් (ඉතිරි) නො වෙයි. ඇවිලුණු මහත් ගිනිකන්දක් නිවා ගොමපිරිබඩ කළ කල්හිද උණුසුම් බව නො සන්සිඳුණේ ම වෙයි. මෙපරිද්දෙන් ම ත්‍රෛභූමක කුශලයෙහි කර්මක්‍ෂණය කර්මක්‍ෂණය එකකි. විපාක ක්‍ෂණය අනෙකකි. ස්වල්ප වූ ගින්න තිබුණු තැන උණුසුම් බව නිවුණු කාලය මෙන් වෙයි. එහෙයින් එය තමාගේ විපාකයට අධිපතියකු ලබාදෙන්නට නො හැකි වෙයි. ලෝකෝත්තර කුශලයෙහි වනාහි ඒ ශ්‍රද්ධාව -පෙ- ඒ ප්‍රඥාව නො සන්හුන් කල්හි මාර්ගයට අනතුරු ව ම ඵලය උපදී. එහෙයින් එය තමාගේ විපාකයට අධිපතියකු ලබාදෙයි යැයි දතයුතුයි. එහෙයින් පොරාණයෝ (මෙසේ) කීහ. 'විපාකෙ අධිපති නත්‍ථි ඨපෙත්‍වා ලොකුත්තරං' යනුයි.

සතරවන මාර්ගඵල නිර්දේශයෙහි **අඤ්ඤාතාවින්‍ද්‍රියං** යනු චතුරාර්ය සත්‍යයෙහි නිමවන ලද ඥානකෘත්‍ය ඇති සම්පූර්ණයෙන් අවබෝධ කරගත්තහුගේ ඉන්ද්‍රියයි. චතුස්සත්‍යයන්හි නිමවන ලද කෘත්‍ය ඇති චතුස්සත්‍යය දැන ප්‍රතිවේධකර සිටි එය සම්පූර්ණයෙන් දත් අයගේ ධර්මයන් අතර ඉන්‍ද්‍රාර්ථ සාධනයෙන් ඉන්‍ද්‍රියයි. නිර්දේශවාරයෙහි ද මෙය **අඤ්ඤාතාවීනං** යනු දැන සිටියවුන්ගේ, **ධම්මානං** යනු සම්ප්‍රයුක්තක ධර්මයන්ගේ අභ්‍යන්තරයෙහි, **අඤ්ඤා** යනු දැනීමයි. **පඤ්ඤා පජානනා** යනාදිය කියන ලද අර්ථ ඇත්තේම ය. **මග්ගංගං මග්ගපරියාපන්නං** යනු ඵලමාර්ගයේ අංගයයි. ඵලමාර්ගයට ඇතුළත් යන අර්ථයි. තව ද මෙහි

මෙය ප්‍රකීර්ණකය. එක් ඉන්ද්‍රියක් එක්තැනකට යයි. එකක් සයතැනකට යයි. එකක් එක්තැනකට යයි. එකක් වනාහි අඤ්ඤඤ්ඤතඤ්ඤස්සාමීති ඉන්ද්‍රියයි. එකක් ශ්‍රෝතාපත්ති මාර්ගස්ථානයට යයි. එකක් අඤ්ඤින්ද්‍රිය ය, යට තුන්ඵලක් මතු තුන් මාර්ගත් සතැනකට යයි. එක් අඤ්ඤාතාවින්ද්‍රියක් එක්තැනකට යයි. ඒ අර්හත්ඵලයයි. සියලු ම මාර්ගඵලයන්හි ඉන්ද්‍රිය අට අට බැගින් සූසැටක් ලෝකෝත්තර ඉන්ද්‍රියයෝ කියන ලදහ. පාළියෙන් වනාහි නවය නවය වශයෙන් ගෙන දෙසැත්තෑවක් වෙයි. මාර්ග මාර්ගාංගයැයි කියන ලදී. ඵල ද මාර්ගාංගයැයි කියන ලදී. මාර්ග බොජ්ඣංගයැයි කියන ලදී. ඵල බොජ්ඣංගයැයි කියන ලදී. මාර්ග ක්‍ෂණයෙහි ආරති විරති යැයි කියන ලදී. ඵලක්‍ෂණයෙහි ද ආරති විරති යැයි කියන ලදී. එහි මාර්ගය මාර්ග බැවින් ම මාර්ගය, ඵලය වනාහි මාර්ගය සමාන හෙයින් මාර්ගය නම් වෙයි. ඵල මාර්ගය ඵලයෙහි අන්තර්ගතයැයි කියන්නට ද වටී. මාර්ග අවබෝධ කරගන්නාගේ අංගයැයි සම්බොජ්ඣංගය, ඵල අවබෝධ කරගත්තහුගේ අංගය යැයි සම්බොජ්ඣංගය, මාර්ග ආරමණ විරමණ වශයෙන් ම ආරති විරතිය, ඵල ද ආරති විරති වශයෙනි.

## ලෝකුත්තර විපාක කථා නිමි.

මෙයින් පරව එන අකුසල විපාක වූ චක්‍ෂු සොත ඝාණ ජිව්හා කාය විඤ්ඤාණ පස ද මනෝධාතු එකක් ද මනෝ විඤ්ඤාණධාතු එකක්දැයි යන මේ සිත් සත පාළියෙන් ද අර්ථයෙන් ද යට කියන ලද එබඳු ම වූ කුසලවිපාක සිත් හා සමාන ය. හුදෙක් ඒවා කුශල කර්මප්‍රත්‍යය, (මේවා අකුශල කර්ම ප්‍රත්‍යය) ඒවා ද ඉෂ්ට ඉෂ්ට මධ්‍යස්ථ ආරම්මණයන්හි පවතී. මේවා අනිෂ්ට අනිෂ්ට මධ්‍යස්ථ ආරම්මණයන්හි පවතී. එහිදු සුඛසහගත කාය විඤ්ඤාණයයි. මෙහි දුඃඛ සහගතයයි. එහිදු උපේක්‍ෂා සහගත මනෝවිඥානධාතුව මිනිසුන් අතර ජාත්‍යන්ධාදීන්ගේ ප්‍රතිසන්ධිය ආදිකොට ස්ථාන පසෙක විපාක දෙයි. මෙහි වනාහි ඒකාදශවිධ අකුසල සිතින් කර්ම රැස්කල කල්හි කර්ම කර්මනිමිති ගතිනිමිති අතුරෙන් එකක් අරමුණුකොට සතර අපායෙහි පිළිසිඳගෙන විපාක දෙයි. දෙවනවාරයේ පටන් දිවි ඇති තෙක් භවංගය වීද අනිෂ්ට මධ්‍යස්ථ අරමුණ පිළිබඳ පංච විඤ්ඤාණ වීථියෙහි සන්තීරණය වී ද බලවත් අරමුණ පිළිබඳ ෂට්ද්වාරයන්හි

තදාරම්මණය වී ද මරණය කාලයෙහි චුතිය වීදැයි මෙසේ ස්ථාන පසකම විපාක දෙයි.

## අකුසල විපාක කථාව නිමි.

දැන් කිරිය අව්‍යාකෘත බෙදා දක්වන්නට නැවත කතමෙ ධම්මා අබ්‍යාකතා යන ආදිය පටන්ගන්නා ලදී. එහි කිරියා යනු කරණ මාත්‍රයයි. සියලුම කිරියයන් අතුරෙන් යමක් වනාහි ජවන භාවයට නොපැමිණියේද, එය වාත පුෂ්පයක් මෙනි. යම් සිතක් ජවනභාවයට පැමිණියේ ද එය මුල්සිඳින ලද රුකක පුෂ්පයක් මෙන් ඵලරහිත වෙයි. ඒ ඒ කෘත්‍ය සාධන වශයෙන් පැවතියේ වනාහි කරණ මාත්‍රය ම වෙයි. එහෙයින් කිරියා යැයි කියන ලදී. නෙවකුසලා (නාකුසලා) යන ආදීන්හි කුසලමූල නම් කුසල හේතුවගේ අභාවයෙන් නෙවකුසලා ය. අකුසල මූලනම් වූ අකුසල හේතුවගේ අභාවයෙන් නෙවඅකුසලා ය. යෝනිසෝ මනසිකාර අයෝනිසෝ මනසිකාර නම් වූ ද කුසලාකුසල හේතුන්ගේ අභාවයෙන් නෙවකුසලා නාකුසලා ය. කුසලාකුසල නම් වූ ජනක හේතුවගේ අභාවයෙන් නෙවකම්ම විපාකා ය.

මෙහි ද චිත්තෙකාග්‍රතා නිර්දේශයෙහි ප්‍රවෘත්ති ස්ථිති මාත්‍රය ම ලැබේ. පංචවිඥාන දෙකය. මනෝධාතු තුන ය. මනෝවිඥානධාතු තුන ය. විචිකිච්ඡා සහගතය යන මේ සතළොස් සිත් දුර්වල හෙයින් සණ්ඨිති අවට්ඨිති ආදිය නොලබයි. සෙසු සියල්ල විපාක මනෝධාතු නිර්දේශයෙහි කියන ලද නයින් ම දතයුතුයි. උත්පත්ති ස්ථාන අන්තැනෙකය. ඒ සිත වනාහි පංච විඥඥාණයට අනතුරුව උපදී. මෙය වනාහි පංච ද්වාරයෙහි වළඤ්ජන ප්‍රවෘත්ති කාලයෙහි සියල්ලට (පෙර) උපදී. කෙසේද? චක්ෂුර් ද්වාරයෙහි වනාහි ඉෂ්ට ඉෂ්ට මධ්‍යස්ථ අනිෂ්ට අනිෂ්ට මධ්‍යස්ථ රූපාරම්මණයන් අතුරෙන් යම්කිසිවක් ප්‍රසාදයෙහි ගැටුණු කල්හි ඒ අරමුණ ගෙන ආවර්ජන වශයෙන් පුරෝගාමිකව භවංගය වැටෙමින් උපදී. ශ්‍රෝත ද්වාරයෙහි ද මේ නය ම ය.

## කිරිය මනෝධාතු සිත නිමියේ ය.

මනො විඤ්ඤාණධාතු, උප්පන්නා හොති -පෙ- සොමනස්ස සහගතා යන මේ සිත අන්‍යයන්ට අසාධාරණය. රහතන් වහන්සේට ම පෞද්ගලිකය. ෂට්ද්වාරයෙහි ලැබේ. චක්ෂුර් ද්වාරයෙහි වනාහි වීර්යය වැඩීමට සුදුසු ස්ථානයක් දැක ක්ෂීණාශ්‍රවයන් වහන්සේ මේ සිතින් සොම්නස් වූවෝ වෙති. ශ්‍රෝතද්වාරයෙහි බඩු බෙදන තැනකට පැමිණ මහත් ශබ්දකොට ලෝභී ලෝභී අය ගනිද්දී මාගේ මෙවැනි ලොල්වීමේ තෘෂ්ණාව ප්‍රහීණයැයි මේ සිතින් සොම්නස් වූවෝ වෙති. ඝාණ ද්වාරයෙහි ගඳින් හෝ මලින් සෑයක් පුදා මේ සිතින් සොම්නස් වූවෝ වෙති. ජිව්හා ද්වාරයෙහි රස සම්පන්න පිණ්ඩපාතයක් ලැබ බෙදා පරිභෝග කරනුවෝ මා විසින් සිහිකටයුතු ධර්මයන් පුරන ලදැයි මේ සිතින් සොම්නස් වූවෝ වෙති. කායද්වාරයෙහි ආභිසමාචාරික (උසස් හැසිරීමට සම්බන්ධ) වතක් කරනසේක් මා විසින් කායද්වාරයෙහි වතක් පුරනලදැයි මේ සිතින් සොම්නස් වූවෝ වෙති. මෙසේ වනාහි පංච ද්වාරයෙහි ලැබේ. මනෝද්වාරයෙහි ද අතීත අනාගත අරබයා උපදී.

ජෝතිපාල මානව මඛාදේව රාජ කණ්හ තාපස ආදී කාලයන්හි කරන ලද කරුණු ද ආවර්ජනය කොට තථාගතයන් වහන්සේ සිනා පහළ කළ සේක. එය වනාහි පූර්වේනිවාසානුස්මෘති ඥානය සර්වඥතා ඥානය යන ඥානයන්ගේ කෘත්‍යයයි. ඒ ඥානද්වයේ ඊස්කිරීම කෙළවර සිනාවෙමින් මේ සිතින් උපදී. අනාගතයෙහි තන්තිස්වර මුදිංගස්වර නම්. පසේබුදුවන්නේයැයි සිනා පහළ කළ සේක. එය ද අනාගත ඥාන සර්වඥතා ඥානයන්ගේ කෘත්‍යයයි. ඒ ඥානයන්ගේ ඊස්කිරීම කෙළවර සිනහවෙමින් මේ සිත උපදී. නිර්දේශ වාරයෙහි වනාහි මෙය සෙසු අහේතුක සිත්වලට වඩා බලවතර හෙයින් චිත්තෙකාග්‍රතාව සමාධි බලයට පමුණුවා තබන ලදී. (වීර්යය ද වීර්ය බලයට පමුණුවා තබන ලදී.) උද්දේශ වාරයෙහි වනාහි සමාධි බලය වේ. වීර්ය බලය වේ යැයි නා හෙයින්, මේ දෙක සම්පූර්ණ බලාර්ථයෙන් බල නම් නොවේ. නෙවකුසලං නාකුසලං යැයි වේද එහෙයින් බලයැයි කියා තබන ලදී. නිෂ්පර්යාය වශයෙන් බලයැයි නොවන හෙයින් සංග්‍රහ වාරයෙහි ද බල දෙකක් වේයැයි නො කියන ලදී. සෙසු සියල්ල සොම්නස් සහගත අහේතුක මනෝවිඥාන ධාතු නිර්දේශයෙහි කියන ලද නයින් ම දතයුතුයි.

උපෙක්ඛා සහගතා යන මේ සිත ත්‍රිවිධ භවයන්හි සචිත්ත සියලු සතුන්ට සාධාරණය. සචිත්තක වූ (කිසිවෙකුට) නූපදනේ ද වේ. උපදිනොත්

පංචද්වාරයෙහි වොත්ථපනය වේ. මනෝද්වාරයෙහි ආවර්ජනය වේ. ෂට් අසාධාර ඥානයෝ ද මෙයින් ගන්නා ලද අරමුණ ම ගනිත්. මේ සිත මහාගජ නම්. මෙයට අරමුණු නොවන්නක් නම් නැත. සර්වඥතා ඥානය නොවූ සර්වඥතා ඥානගතික සිත කුමක්දැයි ඇසූකල්හි මෙය යැයි කිවයුතුයි. මෙහි සෙස්ස පළමුසිතෙහි කීනයින් ම දතයුතුයි. හුදෙක් එහි සර්වත්‍රික හෙයින් සංස්කාර ස්කන්ධය නවාංගිකව බෙදන ලදී. මෙහි නිෂ්ප්‍රීතික හෙයින් අෂ්ටාංගික ය.

දැන් කුශලයෙන් (යම්) මහා සිත් අටක් ම ක්ෂීණාශ්‍රවයන් වහන්සේට උපදනා හෙයින් කිරිය නම් වීද, එහෙයින් ඒ සිත් කුශල නිර්දේශයෙහි කියන ලද නයින් ම දතයුතුයි. මෙහි සිට හසනක සිත් සමෝධානය කළයුතුයි. මේ සිත් කෙතෙක් වේද යත්, තෙළෙසෙකැයි (කියනු ලැබේ) පෘථග්ජනයෝ වනාහි කුශලයෙන් සොම්නස් සහගත සිත් සතරකින්ද අකුශලයෙන් සතරකින් දැයි සිත් අටකින් සිනාසෙත්. ශෛක්ෂයෝ කුශලයෙන් සෝමනස්ස සහගත සිත් සතරකින් ද අකුශලයෙන් දිට්ඨි විප්පයුත්ත සොම්නස් සහගත දෙකකින්දැයි සිත් සයකින් සිනාසෙත්. ක්ෂිණාශ්‍රවයන් වහන්සේලා සෝමනස්ස සහගත කිරියසිත් පසකින් සිනාසෙත්යැයි රූපාවචර අරූපාවචර ක්‍රියා නිර්දේශයන්හි (දක්වන ලදී.) දිට්ඨධම්ම සුඛවිහාරං යනු දිට්ඨධම්මයෙහි මේ ආත්මභාවයෙහි ම සුඛවිහාර මාත්‍රයයි. එහි ක්ෂීණාශ්‍රවයන් වහන්සේ පෘථග්ජන කාලයෙහි උපදවන ලද සමාපත්තිය එයට සම නොවදනා තෙක් කුශලමය. සමවන් කල්හි ක්‍රියා වෙයි. උන්වහන්සේ ක්ෂීණාශ්‍රව කාලයෙහි උපදවන ලද සමාපත්තිය ක්‍රියා ම වෙයි. සෙසු සියල්ල ඒ හා සමාන හෙයින් කුශල නිර්දේශයෙහි කියන ලද නයින් ම දතයුතුයි.

**අත්ථසාලිනි ධම්මසංගණී අට්ඨකථාවේ චිත්තුපාද කථාව නිමි.**

**අබ්‍යාකත පදය වනාහි තවමත් නො නිමියේ ය.**

**චිත්තෝත්පාදකණ්ඩ වර්ණනාව සමාප්තයි.**

දැන් රූප කාණ්ඩය බෙදා දක්වන්නට නැවත **කතමෙ ධම්මා අබ්‍යාකතා** යන ආදිය පටන්ගන්නා ලදී. එහි යට චිත්තෝත්පාද කණ්ඩයෙහි විපාක අව්‍යාකෘතය මෙන් ම ක්‍රියා අව්‍යාකෘතය ද කිසිත් ඉතිරි නොකොට බෙදන ලදී. රූප අව්‍යාකෘත හා නිර්වාණ අව්‍යාකෘත නොකියන ලදී. ඒවා කියන්නට චතුර්විධ අව්‍යාකෘත ම සමෝධානය කොට දක්වා **කුසලාකුසලානං ධම්මානං විපාකා** යන ආදිය කීය. එහි **කුසලා කුසලානං** යනු චාතුර්භූමක කුශලයන්ගේ මෙන් ම අකුශලයන්ගේ ය. මෙසේ වනාහි විපාක අව්‍යාකෘතය. කුශලවිපාකය අකුශලවිපාකය වශයෙන් පද දෙකකින් සම්පූර්ණයෙන් ගෙන දක්වන ලදී. යම්හෙයකින් වනාහි ඒ සියල්ලම කාමාවචර හෝ රූපාවචරාදී අතුරෙන් අන්‍යතරයක් හෝ වෙයි ද, එහෙයින් ම **කාමාවචරා** ආදී නයින් ඒ විපාක අව්‍යාකෘතයම භූම්‍යන්තර වශයෙන් ද විස්තරකොට දක්වන ලදී. එහෙයින් එය වනාහි වේදනා ස්කන්ධය ද වෙයි. -පෙ- විඥාන ස්කන්ධය ද වෙයි. එහෙයින් නැවත සම්ප්‍රයුක්ත චතුස්කන්ධ වශයෙන් විස්තරකොට දක්වන ලදී. මෙසේ විපාක අව්‍යාකෘතය කුශලාකුශල වශයෙන් ද භූම්‍යන්තර වශයෙන් ද සම්ප්‍රයුක්ත ස්කන්ධ වශයෙන් දැයි නය තුනකින් විස්තර වශයෙන් දක්වා නැවත ක්‍රියා ව්‍යාකෘතය දක්වමින් **යෙ ච ධම්ම කිරියා** යන ආදිය කීය. එහි කාමාවචරය රූපාවචරය අරූපාවචරය වේදනා ස්කන්ධය -පෙ- විඥාන ස්කන්ධය යැයි ද කිවයුතු වන්නේ ය. යට වනාහි ගන්නා ලද්දේම යැයි නය දක්වා අත්හරින ලදී. දැන් නොබෙදන ලද්ද දක්වනුයේ **සබ්බඤ්ච රූපං අසංඛතා ච ධාතු** යැයි කීය. එහි සබ්බඤ්චරූපං යන පදයෙන් පස්විසි රූප ද සයානූ රූප කොට්ඨාස ද නිෂ්ප්‍රදේශ වශයෙන් ගන්නා ලදැයි දතයුතුයි. **අසංඛතා ච ධාතු** යන පදයෙන් නිවන නිෂ්ප්‍රදේශ වශයෙන් ගන්නා ලදී. මෙපමණකින් **අබ්‍යාකතා ධම්මා** යන පදය නිමියේ වෙයි.

**තත්ථ කතමං සබ්බං රූපං** යන මෙය කවර හෙයින් ගන්නා ලදද, යට රූප අව්‍යාකෘතය සංක්ෂේපයෙන් කියන ලදී. දැන් එය ඒකක දුක තික චතුක්ක -පෙ- ඒකාදශක වශයෙන් විස්තර වශයෙන් බෙදා දක්වන්නට මෙය ගන්නා ලදී. 'සබ්බඤ්ච රූපං අසංඛතා ච ධාතු' යැයි කියන ලද්දේ එහි අර්ථයයි. ඒ පද දෙකෙහි සබ්බං රූපං යනු කුමක් ද? දැන් එය බෙදා දක්වමින් **චත්තාරො මහාභූතා** යන ආදිය කීය. එහි **චත්තාරො** යනු ගණන පරිච්ඡේදයකි. එයින් ඔවුන්ගේ අඩුවැඩි බව වළක්වයි. චකාරය සම්පිණ්ඩනාර්ථයි. එයින් භූදෙක් රූපය යනු සතර මහාභූතයෝ පමණක්

නොවෙති. අන්‍ය වූ ද උපාදා රූප ඇතැයි සම්පිණ්ඩනය කරයි. මෙහි මහාභූතා යනු මහත්ව පහළවීම් ආදී කාරණයන්ගෙන් මහාභූතයෝ'යැයි දතයුතුයි. මේවා වනාහි මහත් සේ පහළවන හෙයින් මහාභූතයන්ට සමාන හෙයින් මහා පරිහාර ඇති හෙයින් මහාවිකාර හෙයින් ද මහත් වූ නිසා යන මේ කරුණුවලින් මහාභූත යැයි කියනු ලැබේ. එහි මහන්ත පාතුභාවතො යනු මේ මහාභූතයෝ වනාහි අනුපාදින්නක සන්තානයෙහිද (උපාදින්නක සන්තානයෙහිද) මහත් ව පහළවෙත්. අනුපාදින්නක සන්තානයෙහි ඔවුන්ගේ මහත් ව පහළවන බව මෙසේ දතයුතුයි. එක්සක්වළක් දිගින් ද පළලින් ද යොදුන් දොළොස් ලක්ෂ තුන්දාස් හාරසිය පනසකි.

පරික්ඛෙපතො :-

සබ්බං සතසහස්සානි ඡත්තිංස පරිමණ්ඩලං
දස චෙව සහස්සානි අඩ්ඪුඩ්ඪානි සතානි ච

වටින් :- සමස්ත පරිමණ්ඩලය යොදුන් තිස්හය ලක්ෂ දසදහස් තුන්සිය පනසකි.

තත්ථ :- දුවෙ සතසහස්සානි චත්තාරි නහුතානි ච
එත්තකං බහලත්තෙන සංඛාතායං වසුන්ධරා

එහි :- මේ මහපොළොව ඝනත්වයෙන් (යොදුන්) දෙලක්ෂ සතළිස් දහසකැයි මෙපමණකින් ගණනය කරන ලදී.

තස්සායෙව සන්ධාරකං :-

චත්තාරි සතසහස්සානි අට්ඨ ච නහුතානිච
එත්තකං බහලත්තෙන ජලං වාතෙ පතිට්ඨිතං

එහි ම සන්ධාරකය :-

බහලත්වයෙන් යොදුන් හාරලක්ෂ අසූදහසක් පමණ වූ ජලය වාතයෙහි පිහිටියේ ය.

තස්සාපි සන්ධාරකං :-

නවසතසහස්සානි මාළුතො නභමුග්ගතො
සට්ඨී චෙව සහස්සානි එසා ලොකස්ස සණ්ඨිති

එහි ද සන්ධාරකය :-

අහසට නැගුණු වාතය (යොදුන්) නවලක්ෂ හැටදහසකි.
මේ ලෝකයේ පිහිටීම ය.

එවං සණ්ඨිතෙ චෙත්ථ යොජනානං :-

චතුරාසීති සහස්සානි අජ්ඣොගාළ්හො මහණ්ණවෙ,
අච්චුග්ගතො තාවදෙව සිනෙරුපබ්බතුත්තමො

තතො උපඩ්ඪුපඩ්ඩෙන පමාණෙන යථාක්කමං
අජ්ඣොගාළ්හුග්ගතා දිබ්බා නානාරතනචිත්තිතා

යුගන්ධරො ඊසධරො කරවීකො සුදස්සනො
නෙමින්ධරො විනතකො අස්සකණ්ණො ගිරිබ්‍රහා

එතෙ සත්ත මහාසෙලා සිනෙරුස්ස සමන්තතො
මහාරාජාන මාවාසා දෙවයක්ඛ නිසෙවිතා

යොජනානං සතානුච්චො හිමවා පඤ්ච පබ්බතො
යොජනානං සහස්සානි තීනි ආයතවිත්ථතො

චතුරාසීති සහස්සෙහි කූටෙහි පතිමණ්ඩිතො
තිපඤ්චයොජනක්ඛන්ධ පරික්ඛෙපා නගව්හයා
පඤ්ඤාස යොජනක්ඛන්ධ සාඛායාමා සමන්තතො

සතයොජන විත්ථිණ්ණා තාවදෙව ච උග්ගතො
ජම්බු යස්සානුභාවෙන ජම්බුදීපො පකාසිතො

මෙසේ පිහිටි මෙහි ද යොදුන් වශයෙන් :-

උතුම් වූ මහාමේරු පර්වතය මහා සාගරයෙහි (යොදුන්)
අසූහාර දහසක් ගිලුණේය. එපමණ ම උඩට නැඟුණේ ය.

පිළිවෙළින් ප්‍රමාණයෙන් එයින් අඩින් අඩ වූ දිව්‍යමය විවිධ රත්නයන්ගෙන් විසිතුරු වූ යුගන්ධර ඊසධර කරවීක සුදර්ශන නේමින්ධර විනතක සහ අශ්ව කර්ණ යන මහා පර්වතයෝ (සමුද්‍රයෙහි) ගිලුණාහු මෙන් ම උඩට නැගුණාහු ද වෙත්. (සිවුවරම්) මහරජවරුන්ගේ ආවාස වූ දෙවියන් හා යක්‍ෂයින් විසින් ඇසුරු කරනු ලබන මේ සප්ත මහා පර්වතයෝ මහමෙර හාත්පස වූහ.

හිමාලය පර්වතය යොදුන් පන්සියක් උස ය. දිගින් හා පළලින් යොදුන් තුන්දහසකි. අසූහාර දහසක් කූටයන්ගෙන් ප්‍රතිමණ්ඩිතය. යොදුන් පසළොසක් කඳින් යුත් පර්වතයෝ පරික්ෂිප්ත වූහ.

පනස් යොදුන් කඳින් හා ශාඛාවලින් යුත් හාත්පසින් (යොදුන් සියයක් පැතිරුණු එපමණ ම උස් වූ දඹගසකි. එහි ආනුභාවයෙන් දඹදිව ප්‍රකාශයට පත්විය.)

අසුරයන්ගේ සිත්පළොල් රුක ද ගුරුළන්ගේ හිඹුල රුකක් අපරගෝයානයේ කොළොම් රුකක් උතුරුකුරු දිවයිනෙහි කප්රුකත් පූර්වවිදේහයෙහි මහරි රුකත් තව්තිසා දෙව්ලොව පරසතු රුකත් දඹරුක පමණම ය.

එහෙයින් පෝරාණයෝ මෙසේ කීහ :-

පාටලි සිම්බලී ජම්බූ දෙවානං පාරිච්ඡත්තකො
කදම්බො කප්පරුක්ඛො ච සිරීසෙන භවති සත්තමං

දෙව අසීතිසහස්සානි අජ්ඣො ගාළ්හො මහණ්ණවෙ
අච්චුග්ගතො තාවදෙව චක්කවාළ සිලුච්චයො
පරික්ඛිපිත්වා තං සබ්බං ලොකධාතුමයං ඨිතො ති

පළොල් රුක හිඹුල් රුක දඹරුක දෙවියන්ගේ පරසතු රුක කොළොම් රුක කප්රුක ද මහරි රුකෙන් සත්වැන්න ද වේ.

චක්‍රවාට පර්වතය (යොදුන්) අසූ දෙදහසක් මහා සාගරයෙහි ගිලුණේය. එපමණ ම උඩට නැගිණ. මේ සියල්ල වටකොට මේ ලෝකධාතුව සිටියේ ය යනුයි.

උපාදින්නක සන්තානයෙහි ද මස් කැසුබු දිව්‍ය අසුර වශයෙන් මහත්ව ම පහළ වූවෝ වෙත්. මෙය ද කියන ලද්දේ ය. 'සනතිහි භිකඛවෙ' මහා සමුදෙද යොජන සතිකා'පි අතතභාවා' යන ආදිය යි.

මහාභූතයන්ට සමාන හෙයින් මෙසේ මොව්හු යම්සේ මායාකාරයෙක් මැණික් නොවන්නක් උදක මාණික්‍යයන් කොට දක්වයිද, රන් නොවන්නා වූ ම මැටිකැටයක් රන්කොට දක්වයිද, යම් සේ තමා යකෙකු පක්ෂියෙකු නො වී යක්‍ෂභාවය ද පක්ෂිභාවය ද දක්වයි ද, මෙසේ ම තමා නිල් නො වී ම නීල උපාදා රූපයක් ලෙස දක්වති. කහවන් නොව ලෙහෙවන් නොව සුදුවන් නොව ම සුදුවන් උපාදා රූපයක් දක්වත් යැයි මායාකාර මහාභූතයන්ට සමාන හෙයින් මහාභූතයෝ ය.

යම්සේ යක්‍ෂාදී මහාභූතයෝ යමක් ගනිත් ද ඔවුන් ඔහුගේ ඇතුළත හෝ පිටත තැනක දක්නට නො ලැබේ. ඔහු ඇසුරු කොට නො සිටින්නෝ ද නො වෙත්. එපරිද්දෙන් මේ මහාභූතයෝ ද ඔවුනොවුන්ගේ ඇතුළත හෝ පිටත සිට දක්නට නො ලැබෙත්. ඔවුනොවුන් ඇසුරුකොට (නො) සිටින්නෝ ද නො වෙත්. නො සිතිය හැකි තැන් ඇති හෙයින් ද යක්‍ෂාදී මහාභූතයන්ට සමාන හෙයින් මහාභූතයෝ ය.

යම් සේ යක්ෂිනී සංඛ්‍යාත මහාභූතයෝ මනාප වූ වර්ණ සටහන් විකෘතිවලින් තමාගේ භයානක භාවය වසාගෙන සත්ත්වයන් රවටත්. මෙපරිද්දෙන් මොව්හු ද ස්ත්‍රීපුරුෂ ශරීරාදීන්හි මනාප ඡවි වර්ණයෙන් මනාප අංගප්‍රත්‍යංග සටහනින් මනාප වූ අත්පා ඇඟිලි බැම වික්‍ෂේපයෙන් තමාගේ කර්කශතාව ආදී භේදයෙන් යුත් ස්වරස ලක්‍ෂණ වසාගෙන බාලජනයා රවටත්. තමාගේ ස්වභාවය දකින්නට නො දෙති. මෙසේ වංචක බැවින් යක්ෂිනී මහාභූතයන්ට සමාන බැවින් ද මහාභූතයෝ ය.

මහා පරිහාරතො යනු මහත් ප්‍රත්‍යයන් පරිහරණය කළයුතු හෙයින්, මොව්හු වනාහි දිනපතා එළඹවිය යුතු හෙයින් මහත් වූ කෑම් ඇඳීම් ආදියෙන් භූතයෝ පවත්වත් යනු ද මහාභූතයෝ ය. මහා පරිහාර ඇති භූතයෝ යනු ද මහාභූතයෝ ය.

මහා විකාරතො යනු (භූතයන්ගේ මහාවිකාර හෙයින්) උපාදින්න වූ ද අනුපාදින්න වූ ද මොව්හු මහාවිකාර ඇත්තෝ වෙති. එහි

අනුපාදින්නයන්ගේ විකාර මහත් බව කප් නැඟීමේ දී ප්‍රකට වෙයි. උපාදින්නයන්ගේ ධාතුක්‍ෂෝභන කාලයේ ය. ඒ එසේ ම ය.

භූමිතො වුට්ඨිතා යාව බ්‍රහ්මලොකා විධාවති
අච්චි අච්චිමතො ලොකෙ දය්හමානම්හි තෙජසා

කොටිසතසහස්සෙකං චක්කවාළං විලීයති
කුපිතෙන යදා ලොකො සලිලෙන විනස්සති

කොටිසතසහස්සෙකං චක්කවාළං විකීරති
වායො ධාතුප්පකොපෙන යදා ලොකො විනස්සති

පත්ථද්ධො භවති කායො දට්ඨො කට්ඨමුඛෙන වා
පඨවි ධාතුප්පකොපෙන හොති කට්ඨමුඛෙ ව සො

පූතියො භවති කායො දට්ඨො පූතිමුඛෙන වා
ආපො ධාතුප්පකොපෙන හොති පූතිමුඛෙව සො

සන්තත්තො භවතිකායො දට්ඨො අග්ගිමුඛෙන වා
තෙජොධාතුප්පකොපෙන හොති අග්ගිමුඛෙ ව සො

සඤ්ඡින්නො භවති කායො දට්ඨො සත්ථමුඛෙන වා
වායො ධාතුප්පකොපෙන හොති සත්ථමුඛෙව සො

ගින්නෙන් ලොව දැවෙන කල්හි පොළොවෙන් නැගුණු ගින්නෙහි ගිනිදැල් බ්‍රහ්මලෝකය තෙක් දිවෙයි.

යම්කලෙක කිපුණු ජලයෙන් ලෝකය විනාශ වේ ද, එකල්හි කෙළ ලක්‍ෂයක් සක්වළ එක් සක්වළක් විනාශ වෙයි.

වායෝ ධාතුවෙන් ලොව විනාශවන කල්හි කෙළ ලක්‍ෂයක් සක්වළ එක් සක්වළක් විසිරෙයි.

පෘථුවි ධාතුව ප්‍රකෝප වීමෙන් දඬු මුවකින් සපාගත් කලෙක මෙන් කය තදවෙයි. එය කාෂ්ටමුඛයෙහි මෙන් වෙයි.

ආපෝධාතුව ප්‍රකෝපවීමෙන් කය කුණු මුවකින් සපාගත් කලෙක මෙන් වෙයි. එය කුණු මුවෙහි වූවාක් මෙන් වෙයි.

තේජෝ ධාතු ප්‍රකෝපයෙන් කය ගිනිමුවකින් සපාගත් කලෙක මෙන් අතිශයින් තැවේ. එය ගිනිමඩෙක මෙන් වෙයි.

වායෝධාතු ප්‍රකෝපයෙන් කය අවිමුවකින් ගත්තාක් මෙන් සිඳුණේ වෙයි. කය අවිමුවක වූවක් මෙන් වෙයි.

මෙසේ මහාවිකාර ඇතිභූතයෝ යනු මහාභූතයෝ ය. මොව්හු මහත් භූතයන් හෙයින් ද මහන්තයෝ ය. මහත් උත්සාහයෙන් පරිහරණය කළයුතු හෙයින් ද මහත් ව විද්‍යමාන හෙයින් ද (ඒ) භූතයෝ මහාභූතයෝය. මෙසේ මහත්ව පහළවීම් ආදී කාරණයන්ගෙන් ද මහාභූතයෝ ය.

**චතුන්නඤ්ච මහාභූතානං උපාදාය රූපං** යනු උපයෝගාර්ථයෙහි සාමි වචනයි. සතරමහා භූතයෝ උපාදාය ඇසුරුකොට නොමිදී පවත්නා රූප යන අර්ථයි. **ඉදං වුච්චති සබ්බං රූපං** යනු සතරමහාභූත රූප ද පිළිවෙළින් දක්වන ලද තෙවිසි උපාදා ද යන සත්විසි ප්‍රභේදයකින් යුත් වූ රූප **සබ්බං රූපං** නම්. දැන් එය විස්තර වශයෙන් දක්වන්නට ඒකවිධ ආදී වූ එකොළොස් සංග්‍රහයන් ගෙන් මාතෘකාව තබමින් **සබ්බං රූපං න හෙතු** ආදිය කීය. එහි **සබ්බං රූපං** යන මේ පදය සබ්බං රූපං න හෙතු සබ්බං රූපං අහෙතුකං යැයි මෙසේ සියලු පදයන් සමග යෙදිය යුතුයි. න හෙතු ආදී මේ සියලුම තෙතාළිස් පද දක්වන ලදී. පිළිවෙළින් ඔවුනතුරෙන් පද සතළිසක් මාතෘකා වශයෙන් ගෙන තබන ලදී. අවසාන තුන මාතෘකා මුක්තය. මෙසේ වනාහි ප්‍රථම සංග්‍රහයෙහි පාළි ව්‍යවස්ථාපනය ම දතයුතුයි.

ද්විතීය සංග්‍රහ ආදීන්හි ද එසේ ය. මේ එහි නයයි. ද්විතීය සංග්‍රහයෙහි වනාහි දුක එකසිය හතරෙකි. එහි **අත්‍ථි රූපං උපාදා අත්‍ථිරූපං නො පාදා** යන ආදී මුලින් වූ තුදුස් දුක අන්‍යොන්‍ය සම්බන්ධයෙන් තොර හෙයින් ප්‍රකීර්ණක දුක නම්. ඉක්බිති **අත්‍ථි රූපං චක්ඛුසම්ඵස්සස වත්‍ථු** යන ආදී

පස්විසි දුක වස්තු අවස්තු විමසා බැලීම් වශයෙන් පැවති හෙයින් වස්තු දුක නම්. ඉක්බිති **අත්ථි රූපං චක්ඛුසම්ඵස්සස්ස ආරම්මණං** යන ආදී පස්විස්ස ආරම්මණ අනාරම්මණ විමසාබැලීම් වශයෙන් පවත්නා හෙයින් ආරම්මණ දුක නම්. ඉක්බිති **අත්ථිරූපං චක්ඛායතනං** යනාදී දහය ආයතන ආයතන විමසා බැලීම් වශයෙන් පවත්නා හෙයින් ආයතන දුක නම්. ඉක්බිති **අත්ථිරූපං චක්ඛුධාතු** යන ආදී දහය ධාතු අධාතු විමසා බැලීම් වශයෙන් පවත්නා හෙයින් ධාතු දුක නම්. ඉක්බිති **අත්ථි රූපං චක්ඛුන්ද්‍රියං** යන ආදී අට ඉන්ද්‍රිය අනින්ද්‍රියයන් විමසා බැලීම් වශයෙන් පවත්නා හෙයින් ඉන්ද්‍රිය දුක නම්. ඉක්බිති **අත්ථි රූපං කාය විඤ්ඤත්ති** යන ආදි දොළොස (සුඛුම) අසුඛුම රූප විමසා බැලීම් වශයෙන් පවත්නා හෙයින් සුඛුම රූප දුක නමැයි යන මෙය ද්විතීය සංග්‍රහයෙහි පාළි ව්‍යවස්ථාපනයයි.

තෘතීය සංග්‍රහයෙහි තික එකසිය තුනකි. එහි ද්විතීය සංග්‍රහයෙහි කියන ලද තුදුස් ප්‍රකීර්ණක දුකයන් අතුරෙන් එකක් අජ්ඣත්තික දුකයයි. සෙසු තෙළෙස සමග යොදා **යං තං රූපං අජ්ඣත්තිකං තං උපාදා, යං තං රූපං බාහිරං තං අත්ථි උපාදා අත්ථි නො පාදා** යනාදී නයින් තබන ලද තෙළෙස ප්‍රකීර්ණක තික නම්. ඉක්බිති ඒ දුකය ම සෙසු දුකයන් සමග යොදා **යං තං රූපං බාහිරං තං චක්ඛු සම්ඵස්සස්ස න වත්ථු, යං තං රූපං අජ්ඣත්තිකං තං අත්ථි චක්ඛු සම්ඵස්සස්ස වත්ථු, අත්ථි චක්ඛු සම්ඵස්සස්ස න වත්ථු** යන ආදී නයින් සෙසු තිකය තබන ලද ද ඒ පිළිබඳ නම් ද ගණන ද ඒ වස්තු දුකාදීන්ගේ වශයෙන් ම දතයුතුයි යනු තෘතීය සංග්‍රහ වාරයෙහි පාළි ව්‍යවස්ථානයයි.

චතුෂ්ක සංග්‍රහයෙහි චතුෂ්ක දෙවිස්සකි. එහි සර්ව පශ්චිම චතුෂ්කය **අත්ථි රූපං උපාදා අත්ථිරූපං නො පාදා** යැයි මෙසේ මෙහි කියන ලද මාතෘකාව ස්පර්ශ නො කොට තබන ලදී. අන් ඒවා ස්පර්ශ කොට තබන ලදී. කෙසේ ද යත්, (මෙහි) දෙවදෑරුම් සංග්‍රහයෙහි ප්‍රකීර්ණකයන්හි ආදියෙහි යම් දුක තුනක් වීද, ඔවුනතුරෙන් එක එක ගෙන **යං තං රූපං උපාදා තං අත්ථි උපාදින්නං අත්ථි අනුපාදින්නං** යන ආදී නයින් දුක පහක් පහක් සමග යොදා ද්විකත්‍රය මූලක වූ චතුෂ්ක පසළොස ආදියෙහි තබන ලදී. දැන් සතරවන සනිදර්ශන ද්වික යයි. එය යම්හෙයකින් **යං තං රූපං සනිදස්සනං තං අත්ථි සප්පටිඝං අත්ථි අප්පටිඝං** යනාදී නයින් ප්‍රථම ද්විකයන් සමග හෝ අසත්‍යභාවයෙන් (ඇත යන්නක් නැති බැවිනි) ක්‍රමාභාවයෙන් විශේෂා භාවයෙන් ද යෝගයකට නො පැමිණේ.

සනිදර්ශනය වනාහි අප්‍රතිඝ නම් නොපාදා නම් හෝ වෙයි නැත යයි අසත්‍යභාවයෙන් යෝගයකට නොපැමිණේ. සියලුම ද්විකයෝ වනාහි පශ්චිම පශ්චිමයන් සමග ම යොදන ලදහ. මේ මෙහි ක්‍රමයයි. පළමු ද්විකයන් සමග ක්‍රමාභාවය වේ යනුයි. ඇත යන අර්ථයෙහි ක්‍රමාභාවය කාරණයක් නොවේ. එහෙයින් (උපාදින්න ආදී පදයන් සමග යෙදිය යුතුයි. එය සමග විශේෂයක් නොමැති හෙයින්) උපාදින්න ආදී පද වනාහි මේ සමග යොදන ලදී.

එහි උපාදින්න යනුත් සනිදර්ශනය සනිදර්ශන යනුත් උපාදින්න යැයි කී කල්හි විශේෂයක් නැතැයි විශේෂාභාවයෙන් ද යෝගයට (නො) පැමිණේ. එහෙයින් ඒ චතුෂ්ක ද්විකය. ආමර්ශනය නොකොට ඉන් පර ද්විකයන් සමග **අත්‍ථි රූපං සප්පටිඝං** යන ආදී ද්විතත්‍රය සමග **යං තං රූපං සප්පටිඝං තං අත්‍ථි ඉන්‍ද්‍රියං (අත්‍ථි න ඉන්‍ද්‍රියං යං තං රූපං අප්පටිඝං තමපත්‍ථි ඉන්‍ද්‍රියං) අත්‍ථි න ඉන්‍ද්‍රියං** යන ආදී නයින් යොදන කල්හි ද්වික දෙක දෙක බැගින් යොදා චතුෂ්ක සයක් තබන ලදී. යම්සේ මේ චතුෂ්ක ද්විකය යෝගයකට නොයයි ද එසේ ම ආදි ද්විකය ද එය සමග නො යෙදේ. කවරහෙයින්ද යත්, අනුපාදින්න රූපය ඒකාන්තයෙන් අනිදර්ශන හෙයින්, එය වනාහි **යං තං රූපං නොපාදා තං අත්‍ථි සනිදස්සනං (අත්‍ථි අනිදස්සනං)** යැයි මෙසේ චතුර්ථිද්විකය සමග යොදනු ලබනුයේ යෝගයට නොපැමිණේ. එහෙයින් එය ඉක්මවා පංචමය සමග යොදන ලදී. මෙසේ යමක් යමක සමග යෝගයට පැමිණේ ද යමක් නො පැමිණේ ද එය දතයුතුයි යනුයි. මේ සතරවන සංග්‍රහයෙහි පාළි ව්‍යවස්ථානයයි. මෙයින් අන්‍ය වූ පංචවිධ සංග්‍රහ ආදී වූ සංග්‍රහ සත අමිශ්‍ර ම ය. මෙසේ මෙසේ සියලු ම මාතෘකාවන්ගේ පාළි ව්‍යවස්ථානය දතයුතුයි.

දැන් එහි අර්ථය බෙදා දක්වන්නට **සබ්බං රූපං නහෙතු මෙවාති** ආදිය පටන්ගන්නා ලදී. මෙහි දී වනාහි කවරහෙයකින් කතමං තං සබ්බං රූපං න හෙතු යැයි විචාරීම නොකරන ලද ද යත්, භේදයක් නැති හෙයිනි. යම්සේ වනාහි දුකාදීන්හි උපාදාරූපත් ඇත. නොඋපාදාරූපත් ඇත. මෙසේ මෙහි න හේතුත් සහේතුත් යන භේදය නැත. එහෙයින් විචාරීමක් නො කොට ම බෙදන ලදී. එහි **සබ්බං** යනු සියල්ලය. නිරවශේෂමය. **රූපං** යන මෙහි ශීතාදියෙන් වෙනස් වන බව දැක්වීම සමාන ලක්ෂණ දැක්වීමයි. **න හෙතුමෙව** යනු සාධාරණ හේතු ප්‍රතික්ෂේපණ නිර්දේශයයි. එහි හේතුහේතු පච්චය හේතු උත්තමහේතු සාධාරණ හේතු

යැයි හේතුව චතුර්විධය. ඔවුනතුරෙන් 'තයො කුසලහෙතු තයො අකුසල හෙතු තයො අබ්‍යාකතහෙතු' යන මෙය හේතුහේතු නම්.

'චත්තාරො බො මෙ භික්ඛු! මහාභූතා හෙතු චත්තාරො මහාභූතා පච්චයා රූපක්ඛන්ධස්ස පඤ්ඤාපනාය' යන මෙය පච්චයහේතු නම්' 'කුසලා කුසලං අත්තනො විපාකදානෙ උත්තමං ඉට්ඨාරම්මණං කුසලවිපාකට්ඨානෙ උත්තමං අනිට්ඨාරම්මණං අකුසලවිපාකට්ඨානෙ' යන මෙය උත්තමහේතු නම්. මෙසේ කියන ලදී. 'අතීතානාගතපච්චුප්පන්නානං කම්ම සමාදානානං ඨානසො හෙතුසො විපාකං යථාභූතං පජානාති' යනු ද 'එසෙව හෙතු එස පච්චයො සංඛාරානං යදිදං අවිජ්ජා' යනු ද 'අවිජ්ජා සංඛාරානං සාධාරණහෙතු හුත්වා පච්චයට්ඨං එරති' යන මෙය සාධාරණ හේතු නම්. යම්සේ පෘථිවි රසයත් ආපෝ රසයත් මිහිරි වූත් අමිහිරි වූත් (රසයන්ට) ප්‍රත්‍යය වේ ද මෙසේ අවිද්‍යාව කුශල සංස්කාරයන්ටත් අකුශල සංස්කාරයන්ටත් සාධාරණ ප්‍රත්‍ය වේ. මේ අර්ථයෙහි වනාහි හේතුහේතුව අභිප්‍රේතයි. මෙසේ හේතුධම්ම න හෙතුධම්ම යන මාතෘකාවේ ආ හේතුභාවය රූපයට නියම කොට ප්‍රතික්ෂේප කරමින් න හෙතුමෙව යැයි කීය. මේ නයින් සියලුම පදයන්හි ප්‍රතික්ෂේප නිර්දේශයත් අප්‍රතික්ෂේප නිර්දේශයත් දතයුතුයි.

සියලුපදයන්ගේ වචනාර්ථය වනාහි මාතෘකා වර්ණනාවෙහි කියන ලදම ය. සප්පච්චයමෙව යන මෙහි කර්ම සමුත්ථානය කර්මප්‍රත්‍යය ම වෙයි. ආහාර සමුත්ථානාදිය ආහාර ප්‍රත්‍යය ම වෙයි යනුයි. මෙසේ රූපය සඳහා ම කියන ලද චතුර්විධ ප්‍රත්‍යය වශයෙන් අර්ථය දතයුතුයි. රූපමෙව යනු රූපිනො ධම්මා අරූපිනො ධම්මං යනු මාතෘකාවෙහි කියන ලද අරූපභාවය ප්‍රතික්ෂේප කරයි. උප්පන්නං ඡහි විඤ්ඤාණෙහි යනු චක්ෂුර් විඥානාදී සයෙන් වර්තමාන රූපය ම දතයුතුයි. නියාමය වනාහි චක්ෂුර් විඥානාදීන් සඳහා (ගන්නා ලදී) ඔව්හු අතීත අනාගත නොදනිත්. මනෝවිඥානය වනාහි අතීතයත් අනාගතයත් දනී. එය මෙහිදී පංචවිඥාන ශ්‍රෝතයෙහි වැටුණු හෙයින් ශ්‍රෝතපත්තවම ගියේය. ඇතිවී නැතිවන හෙයින් වනාහි අනිත්‍යමය. ජරාවෙන් මැඩිය යුතු ස්වභාවය ඇතිහෙයින් ජරාභිභූතමය. රූපකායෙහි ජරාව ප්‍රකටවන හෙයින් ජරාභිභූතම යැයි කියන ලදී.

මෙසේ එකවිධෙන රූප සංගහො යන මෙහි විධා ශබ්දය මාන

සණ්ඨාන කොට්ඨාශයන්හි දක්නට ලැබේ. 'සෙය්‍යථා හම්සමීති විධා, සදිසො හමසමීති විධා' යනාදියෙහි වනාහි මානය විධා නම්. 'කථං විධං සීලවන්තං වදන්තං වදන්ති තථං විධං පඤ්ඤාවන්තං වදන්ති' යනාදියෙහි සණ්ඨාන යයි. කථං විධං යන පදයාගේ වනාහි කථං සණ්ඨානං යන අර්ථයි. 'එකවිධෙන ඤාණවත්ථු දුවිධෙන ඤාණවත්ථු' යන ආදියෙහි කොට්ඨාශය විධා නම්. මෙහි ද කොට්ඨාශය ම අභිප්‍රේතයි. සංග්‍රහ ශබ්දය ද සජාති සඤ්ජාති කිරිය ගණන වශයෙන් චතුර්විධ ය. 'සබ්බෙ ඛත්තියා අගච්ඡන්තු සබ්බෙ බ්‍රාහමණා ආගච්ඡන්තු සබ්බෙ වෙස්සා සබ්බෙ සුද්දා අගච්ඡන්තු, යා චාවුසො විසාඛ! සම්මා වාචා යො ච සම්මා කම්මන්තො යො ච සම්මා ආජීවො ඉමෙ ධම්මා සීලක්ඛන්ධෙ සංගහීතා' යන මෙය සජාති සංගහ නම්.' 'එකජාතිකා ආගච්ඡන්තු' යැයි කී තැන මෙන් මෙහි ද සියලු ජාතීහූ එකට සංග්‍රහ වූහ. 'සබ්බෙ කොසලකා ආගච්ඡන්තු සබ්බෙ මාගධකා - සබ්බෙ භාරුකච්ඡකා ආගච්ඡන්තු, යො චාවුසො! විසාඛ, සම්මා වායාමො යාච සම්මා සති යො ච සම්මා සමාධි ඉමෙ ධම්මා සමාධික්ඛන්ධෙ සංගහිත' යැයි කී තැන මෙන් මෙහි සියල්ලෝ උපන් තැනින් ද විසූ අවසරයෙන් ද ඒකසංග්‍රහයට ගියහ. සබ්බෙ හත්ථාරොහා ආගච්ඡන්තු, සබ්බෙ එස්සාරොහා - සබ්බෙ රථිකා ආගච්ඡන්තු යාචාවුසො, විසාඛ, සම්මා දිට්ඨි යො ච යො ච සම්මා සංකප්පො ඉමෙ ධම්මා පඤ්ඤාක්ඛන්ධෙ සංගහීතා' යන මෙය ක්‍රියාසංග්‍රහ නම්. මේ සියල්ලෝ ම වනාහි තමාගේ කාර්යයන් කිරීමෙන් ඒකසංග්‍රහයට ගියහ. 'චක්ඛායතනං කතමං සංඛගණං ගච්ඡති, චක්ඛායතනං රූපක්ඛන්ධ ගණනං ගච්ඡති, හඤ්චි චක්ඛායතනං රූපක්ඛන්ධගණං ගච්ඡති, තෙන වත රෙ වත්තබ්බෙ චක්ඛායතනං රූපක්ඛන්ධෙග සංගහීතං' යන මෙය ගණන සංග්‍රහ නම්. මෙය මෙහි අභිප්‍රේතයි. එක් කොටසකින් රූප ගණය යන මෙය මෙහි අර්ථයයි. සැමතැනක ම මේ නයයි.

දැන් ද්විධ සංග්‍රහ ආදියෙහි අත්ථිරූපං උපාදා අත්ථි රූපං නො උපාදා යැයි මෙසේ බෙදීම් වශයෙන් විචාරීම් පෙරදැරි කරගත් පද බෙදීම දක්වමින් **කතමං තං රූපං උපාදා,** යනාදිය කීය. එහි දැඩිව ගනී යනු = **උපාදා** ය. මහාභූතයන් ගෙන ඔවුන් නො මුදා ඔවුන් ඇසුරුකොට පවතී යනු අර්ථයි. දැන් ඔවුන් ප්‍රභේද වශයෙන් දක්වමින් **චක්ඛායතනං** ආදිය කීය. මෙසේ ඒ විසිවැදෑරුම් උපාදා රූප සංක්ෂේපයෙන් උදෙසා නැවත එය ම විස්තර වශයෙන් නිර්දේශ කරමින් **කතමං තං රූපං චක්ඛායතනං** යනාදිය කීය. එහි (ඇස) මසැස පැණැසයැයි දෙවැදෑරුම්ය. ඔවුනතුරෙන්

පැණැස බුදුඇස සමතැස නැණැස දිවැස සහ දහම් ඇසයැයි පස්වැදෑරුම්ය. එහි 'මහණෙනි, මම බුදුඇසින් ලොව බලන්නෙම් මඳ කෙලෙස් ඇත්තා වූ ද -පෙ- අවබෝධ කරවීමට දුෂ්කර වූ ද සත්ත්වයන් දුටිමි' යන මේ බුදුඇස නම්. 'සියල්ල දත් නුවණ සමන්තචක්ඛු යැයි කියනු ලැබේ' යන මේ සමතැස නම්. 'චක්ඛුං උදපාදි ඤාණං උදපාදි' යන මේ නැණැස නම්. 'අද්දසං ඛො අහං භික්ඛවෙ, දිබ්බේන චක්ඛුනා විසුද්ධෙනා' යන මේ දිවැස නම්. 'තස්මිං යෙවාසනෙ විරජං වීතමලං ධම්මචක්ඛුං උදපාදි' යන යට මඟ තුන නම් වූ මේ (ඥානය) දහම් ඇස නම්. මසැස ද සසම්භාර චක්ඛු පසාද චක්ඛු යැයි දෙයාකාර වේ. එහි යට ඇස්වල ඇටයෙන් ද මත්තෙහි බැම ඇටයෙන් ද දෙපස අක්ෂි කූටයන්ගෙන් ද අතර හිස්මොලයෙන් පිටත ඇස්ලොමින් පිරිසිඳිනා ලද යම් මස්පිඩුවක් වේද එය සංක්ෂේපයෙන් සතරධාතුය. වර්ණය ගන්ධය රසය ඕජාය සම්භවය සණ්ඨානය ජීවිතය භාවය කායප්‍රසාදය චක්ෂු ප්‍රසාදය යන තුදුස් සම්භාර ද විස්තර වශයෙන් සතරධාතු තදාශ්‍රිත වර්ණ ගන්ධ රස ඕජා සණ්ඨාන යන සයදැයි මේ දහය චතුසමුට්ඨානික හෙයින් සතළිසක් වෙයි. ජීවිතය භාවය කායප්‍රසාදය චක්ෂුප්‍රසාදය යන ඒකාන්ත කර්ම සමුස්ථාන සතර යන මේ සූසාළිස් රූපයන්ගේ වශයෙන් සූසාළිස් සම්භාරය ද, ලෝකයා ඇස සුදුය පළලය විශාලයැයි යම් ඇසක් ඇඳිනගනුයේ ඇස හැඳින ගනුයේ නො වෙයි. වස්තුව ඇස වශයෙන් හැඳිනගනී. ඒ මාංශපිණ්ඩය අක්ෂිකූපයෙහි පිහිටියේ ය. නහර හුයෙන් හිස්මොලයෙහි බැඳුණෝ ය. එහි සුදුපැහැය ද කළු පැහැය ද ලේපැහැය ද පෘථුවි ධාතුව ද ආපෝ ධාතුව ද තේජෝ ධාතුව ද වායෝධාතුව ද ඇත. එය සෙමබහුල හෙයින් සුදු වූයේ ද පිත බහුල හෙයින් කළුවූයේ ද රිහිරි බහුල හෙයින් ලේවන් වූයේ ද පෘථුවි බහුල හෙයින් පැතුරුණේ ද වෙයි ද ආපෝ බහුල හෙයින් වැගිරේ ද, තේජෝ බහුල හෙයින් දැවේ ද, වායෝ බහුල හෙයින් භ්‍රමණය වෙයි ද, මෙය සසම්භාර චක්ඛු නම්.

මෙහි යමක් සුදු ද මෙහි බැඳුණු සතරමහා භූතයන්ගේ උපාදාය ප්‍රසාදයක් වේ ද, මෙය ප්‍රසාදචක්ෂු නම්. මෙය ඒ සසම්භාර චක්ෂුසෙහි සෙවන මණ්ඩලයෙන් වටවුණු කෘෂ්ණා මණ්ඩලය මැද ඉදිරියෙහි සිටියවුන්ගේ ශරීර සටහන් උත්පාදන ප්‍රදේශය වූ දෘෂ්ටි මණ්ඩලයෙහි පුලුන්පටල සතෙක ඉසින ලද තෙල පුලුන්පටල (පැතිර පවත්නා) මෙන් ඇස්පටල සතෙහි පැතිර කිරිමවුන් සතරදෙනකුන් විසින් දැරීම නැවීම සැරසීම පවන්සැලීම යන කෘත්‍යයන්ගෙන් රජකුමරකු මෙන් දැරීම බැඳීම

පැසවීම කම්පනය යන කෘත්‍යයන්ගෙන් සතරධාතූන් විසින් කරන ලද උපකාර ඇති ව සෘතු චිත්තාහාරයන් විසින් උපස්ථම්භනය කරනු ලබමින් ආයුෂය විසින් පාලනය කරනු ලබමින් වර්ණගන්ධරසාදීන් විසින් පිරිවරන ලදුව ප්‍රමාණයෙන් උකුණුහිසක් පමණැතිව චක්ෂුර්විඥානාදීන්ට සුදුසු පරිදි වස්තුද්වාරභාවය සිදුකරමින් සිටී. මෙය දම්සෙනවි සැරියුත් තෙරුන් විසින් ද කියන ලදී.

**යෙන චක්ඛුප්පසාදෙන රූපානි මනුපස්සති**
**පරිත්තං සුඛුමං චෙතං ඌකායිරසමූපමනති**

යම් චක්ෂුප්‍රසාදයක් විසින් රූප දක්නා ලැබේ ද, එය කුඩාය සියුම්ය උකුණුහිසකට බඳු උපමා ඇත්තේ ය.

චක්ෂුවත් එයයි. ආයතනයත් එයයි යනු = චක්ඛායතනයයි. යං චක්ඛු චතුන්නං මහාභූතානං උපාදාය පසාදො යැයි මෙහි ද උපයෝගාර්ථයෙහි සාමිවචනය මය. සතරමහා භූතයින් දැඩිව ගෙන පවත්නා ප්‍රසාදය යන අර්ථයි. මෙයින් ප්‍රසාදචක්ෂුව ම ගනී. සෙසු චක්ෂුව ප්‍රතික්ෂේප කරයි. ඉන්ද්‍රියගෝචර සූත්‍රයෙහි 'එකං මහාභූතං උපාදාය පසාදො පඨවිධාතුයා තීහි මහාභූතෙහි සුසංගහීතො ආපොධාතුයා ච තෙජොධාතුයා ච වායොධාතුයා ච' (කියා ද) චතුපරිවත්ත සූත්‍රයෙහි 'ද්වින්නං මහාභූතානං උපාදාය පසාදො (චක්ඛුමෙව ගණ්හාති සෙස චක්ඛුං) පඨවි ධාතුයා ච ආපොධාතුයා ච ද්වීහි මහාභූතෙහි සුසංගහිතො තෙජොධාතුයා ච වායොධාතුයා ච' යැයි යමක් කියන ලද ද, එය පර්යාය වශයෙන් කියන ලදී. මේ වනාහි සූත්‍රාන්තික කථා නම් පර්යාය දේශනාය, සතරමහාභූතයන්ගේ යම් උපාදාය ප්‍රසාදයක් වේද එය ඔවුනතුරෙන් එකෙකුට එකෙකුට ද දෙදෙනෙකුට දෙදෙනෙකුට ද ප්‍රසාදය වේ මැයි මේ පර්යායයෙන් දේශනාව ආවේය.

අභිධර්මය වනාහි නිෂ්පර්යාය දේශනා නම් වේ. එහෙයින් **චතුන්නං මහාභූතානං උපාදාය පසාදො** යැයි කියන ලදී. බාලජනයා විසින් මේ මාගේ ආත්මය යැයි ගන්නා ලද හෙයින් ශරීරයක් ස්කන්ධ පංචයත් අත්තභාවය යැයි කියනු ලැබේ. එහි අන්තර්ගත වූයේ ය. එය ඇසුරුකරන ලද්දේය යනු = **අත්තභාව පරියාපන්නො** ය. ප්‍රතිඝට්ටනය උරාගැනීම මෙහි සිදුවේ යනු = **අනිදස්සනො ය.** ප්‍රතිඝට්ටනය උරාගැනීම මෙහි

සිදුවේ යනු = **සප්පටිඝය, යෙන** යනාදියෙහි මේ සංක්ෂේපාර්ථයයි. හේතුභූත යම් ඇසකින් මේ සත්ත්වයා කියන ලද ආකාර ඇති මේ රූපය අතීතයේ දුටුයේ හෝ වර්තමානයේ දක්නේ හෝ අනාගතයේ දකින්නේ හෝ වේ ද, ඔහුට අසම්භින්න චක්ෂුසක් වන්නේ ද, ඉක්බිති ආපාථගත රූපය දක්නේ හෝ අතීත රූපය අතීත ඇසින් දුටුයේ හෝ වේ ද, වර්තමාන රූපය වර්තමාන ඇසින් දක්නේ හෝ වේ ද, අනාගත රූපය අනාගත ඇසින් බලන්නේ හෝ වේ ද, ඒ රූපය ඇස් හමුවට පැමිණේ ද ඇසින් රූපය බලන්නේ ය යන මෙය මෙහි පරිකල්පන වචනය යි. දර්ශන පරිනායකාර්ථයෙන් මෙය **චක්ඛු** ය. ස්වජාතීන් එක්රැස් කිරීම් අර්ථයෙන් මෙය **චක්ඛායතන** ද වේ. ශූන්‍යතා ස්වභාවයෙන් නිස්සත්ත්වාර්ථයෙන් මෙය **චක්ඛුධාතු** ය. දර්ශන ලක්‍ෂණයෙහි අධිපති අර්ථය කරවයි යනු මෙය = **චක්ඛුන්ද්‍රියයි.** බිඳෙන විනාශවන අර්ථයෙන් මෙය = **ලොකො** ය. වලඤ්ජනාර්ථයෙන් මෙය = **ද්වාර** ද වෙයි. නො පිරවිය හැකි යන අර්ථයෙන් මෙය = **සමුද්ද** ද වෙයි. පරිශුද්ධාර්ථයෙන් මෙය **පණ්ඩර** ද වෙයි. ස්පර්ශාදීන්ගේ හටගැනීම් අර්ථයෙන් මෙය **ඛෙත්ත** ද වෙයි. ඔවුන්ටම ප්‍රතිෂ්ඨානයක යන අර්ථයෙන් මෙය **වත්ථු** ද වෙයි. සමවිසම දක්වන ආත්මභාවය පමුණයි යනු මෙය = **නෙත්ත** ද වෙයි. එම අර්ථයෙන් ම මෙය **නයන** ද වෙයි. සක්කායයෙහි අන්තර්ගත හෙයින් මෙය **ඔරිමංතීරං** ය. බහුසාධාරණ අර්ථයෙන් ද අස්වාධිකාර්ථයෙන් ද මෙය **සුඤ්ඤාගාමො** ද වෙයි. යැයි මෙතෙකින් පස්සි හෝ ආදී පද සතරෙන් **චක්ඛුමෙපතං** යනාදී තුදුස් නම් යොදා චක්ඛායතනයට ව්‍යවස්ථාපන නය සතරක් කියන ලදැයි දතයුතුයි. කෙසේ ද යත්, මෙය වනාහි **යෙන චක්ඛුනා අනිදස්සනෙන සප්පටිඝෙන රූපං සනිදස්සනං සප්පටිඝං පස්සි වා චක්ඛුමෙපතං -පෙ- සුඤ්ඤාගාමො පෙසො, ඉදං තං රූපං චක්ඛායතනං** යන මෙය එක් නයකි. සෙස්ස ද මෙසේ දතයුතුයි.

දැන් යම්හෙයකින් විදුලිය නික්මෙන කාලාදියෙහි නොබලනු කැමැත්තෙකුගේ චක්ෂුප්‍රසාදයෙහි රූපය ගැටෙයි. එහෙයින් ඒ ආකාරය දක්වන්නට ද්විතීය නිර්දේශවාරය පටන්ගන්නා ලදී. එහි **යම්හි චක්ඛුම්හි** යනු හේතුභූත යම් ඇසක, **රූපං** යන මෙය ප්‍රථමා වචනයි. එහි **පටිහඤ්ඤි වා** යනු අතීතාර්ථයයි. **පටිහඤ්ඤති වා** යනු වර්තමානාර්ථයි. **පටිහඤ්ඤිස්සති වා** යනු අනාගතාර්ථයි. **පටිහඤ්ඤෙ වා** යනු විකල්පනාර්ථයි. අතීත රූපය අතීත ඇසෙහි ගැටුණේ නම් වෙයි. වර්තමාන රූපය වර්තමාන ඇසෙහි ගැටෙයි නම් වේ. අනාගත රූපය අනාගත

ඇසෙහි ගැටෙන්නේය නම් වේ. ඒ රූපය ඇස් හමුවට පැමිණේ ද ඇසෙහි ගැටේ ද ඒ රූපයයි යනු මෙහි පරිකල්පයයි. අර්ථ වශයෙන් වනාහි ප්‍රසාදයෙහි ගැටෙන රූපය ම ගැටෙයි නම් වේ. මෙහි ද පළමු නයින් ම ව්‍යවස්ථාපන නය සතර දතයුතුයි.

දැන් යම්හෙයකින් තමාගේ කැමැත්තෙන් බලනු කැමති ව රූපයෙහි ඇස එළවන්නහුගේ ඇස රූපයෙහි ගැටෙයි. එහෙයින් ඒ ආකාරය දක්වන්නට තෙවන නිර්දේශවාරය පටන්ගන්නා ලදී. එය අර්ථ වශයෙන් ප්‍රකටමය. මෙහි වනාහි ඇස අරමුණ පිළිගනිත් ම රූපයෙහි ගැටෙන්නේ නම් වේ. මෙහි ද පළමු නයින් ම ව්‍යවස්ථාපන නය සතර දතයුතුයි. ඉන් පසු ව ඵස්ස පංචමකයන්ගේ උත්පත්ති දැක්වීම් වශයෙන් පසක් ද ඔවුන්ගේ ම අරමුණු පිළිබඳ උත්පත්ති දැක්වීම් වශයෙන් පසක්දැයි වාර දහයක් දක්වන ලදී.

එහි **චක්ඛු නිස්සාය** යනු ඇස නිශ්‍රය කොටගෙන ප්‍රත්‍යය කොටගෙන, **රූපං ආරබ්භ** යනු රූපාරම්මණයට පැමිණ සඳහා පිණිස, මේ චක්ෂුප්‍රසාදිය වස්තුකොටගත් ස්පර්ශාදීන්ට පූරේජාත ප්‍රත්‍යය වශයෙන් චක්ෂුද්වාර ජවන වීථියෙහි ඇතුළත් වූවන්ට ආරම්මණාධිපති ආරම්මණ උපනිශ්‍රය වශයෙන් රූපයාගේ ප්‍රත්‍යයබව දක්වන ලදී.

ඉතිරි පංච ද්වාරයන්හි රූපාරම්මණය මොහුටය යනු රූපාරම්මණො යැයි මෙසේ ආරම්මණ ප්‍රත්‍යය මාත්‍රයෙන් ම ප්‍රත්‍යය භාවය දක්වන ලදී. පළමු තුනෙහි මෙන් ම මේ (දස) වාරයන්හි (ද) ව්‍යවස්ථාපන නය සතර සතර බැගින් බව දතයුතුයි. මෙසේ **කතමං තං රූපං චක්ඛායතනං** යන විචාරීමෙන් උද්ධෘත චක්ඛුං ඉදං (යන) පාලිය නන්අයුරින් දක්වන්නට පළමු තුනත් මේ දහයත් යන තෙළෙස් නිර්දේශවාර දක්වන ලදී.

මෙහි ද එකෙක එකෙක ව්‍යවස්ථාපන නය සතර සතර බැගින් ආ හෙයින් දෙපනස් නයකින් සරසා ම දක්වන ලදැයි දතයුතුයි. මෙයින් පසු සෝතායතනාදී නිර්දේශයන්හි ද මේ නයම ය. මෙහි විශේෂමාත්‍රය මෙසේ දතයුතුයි. අසාතුයි = සොත ය. එය සසම්භාර කන්බිල තුළ ඇති තඹලොම් සමූහයකින් (කළ) ඇඟිලි වෙළුමක සටහන් ඇති පෙදෙසක උක්තප්‍රකාර ධාතූන් විසින් කරන ලද උපකාර ඇති ව සෘතු චිත්තාරයන් විසින් උපස්ථම්භනය කරනු ලබමින් ආයුෂය විසින් පාලනය කරනු

ලබමින් වර්ණාදීන් විසින් පිරිවරන ලද්‍ද ව ශ්‍රෝත විඥානාදීන්ට සුදුසු පරිදි වස්තු ද්වාරභාවය සිදුකරමින් සිටී. ආඝ්‍රාණය කෙරේ නුයි = **ඝාණ** ය. එය සසම්භාර නැහැබිලි තුළ එළුපා සටහන් ඇති පෙදෙසක පෙර කියන ලද ආකාර උපකාර උපස්ථම්භන අනුපාලන පිරිවරාගෙන ඝාණවිඥානාදීන්ට සුදුසු පරිදි වස්තුද්වාරභාවය සිදුකරමින් සිටී. සායනාර්ථයෙන් = **ජිව්හා** ය. එය සසම්භාර දිව මැද මත්තෙහි උපුල්පෙති අග සටහන් ඇති පෙදෙසක පූර්වෝක්තප්‍රකාර උපකාර උපස්ථම්භන අනුපාලන පිරිවරැති ව ජිව්හා විඥානාදීන්ට සුදුසු පරිදි වස්තුද්වාරභාවය සිදු කරමින් සිටී.

මේ කයෙහි යම්තාක් උපාදින්නක රූපය වේ ද (එය) කායායතනයෙහි සෑම තැනක ම කපු පටලයෙහි තෙල උක්තප්‍රකාර උපකාර උපස්ථම්භන අනුපාලන පරිවාර ම වී කායවිඥානාදියට සුදුසු පරිදි වස්තුද්වාර භාවය සිදුකරමින් සිටී. මේ මෙහි වෙනසයි. සෙසු පාලි ප්‍රභේද ද අර්ථය ද චක්‍ෂු නිර්දේශයෙහි කියන ලද නයින් ම දතයුතුයි. හුදෙක් මෙහි වනාහි චක්ඛු යන පදය යෙදූ තැන සොත ආදි පද ද රූප යන පදය යෙදූ තැන සද්‍ද ආදී පද ද පස්සි යන ආදීපදයන් යෙදූ තැන්වල ආදි යන පද තුන ද ආයේ ය. **නෙත්තමෙපතංනයනමෙපතං** යනමේ පදදෙක නැතිහෙයින් නාම දොළොස දොළොස බැගින් වෙයි. සෙස්ස සියලුතැන්හි කියන ලද්ද සමාන ම ය.

එහි මෙවැන්නක් වන්නේ ය. මේ කයෙහි කපු පටලයෙක තෙල් මෙන් කායායතනයෙහි සැමතැනම පැතිරුණු උපාදින්නක රූපයක් ඇද්ද, එසේ ඇතිකල්හි ලක්‍ෂණය සම්මිශ්‍රණයකට පැමිණේ ද යනුයි. (නො පැමිණේ) කවර හෙයින් ද? අන්තැනෙක අනිකෙකු නැතිහෙයිනි. එසේ නම් සැමතැන ම කායායතනය නොවේ ද යත්, පරමාර්ථ වශයෙන් නොවේ ම ය. සැමතැනම වෙන්කර මෙහි නානාකරණය පණවන්නට නො හැකි ය. එහෙයින් මෙසේ කියන ලදී. රූප රසාදිය වැලිසුණු මෙන් වෙන්කළ නො හැකි බැවින් ඔවුනොවුන් පැතිර පවතී යැයි කියනු ලැබේ. පරමාර්ථ වශයෙහි රසයක් නො මැත. ඉදින් වන්නේ නම් රූපග්‍රහණයෙන් ම ග්‍රහණයට යන්නේ ය. මෙසේ කායායතනය ද පරමාර්ථ වශයෙන් සැමතැනම (වෙන්කර) නැත. (සැමතැනම) නැත්තේ ද නො වේ. වෙන්කර දක්වන්නට නො හැකි බැවින් ය. මෙසේ මෙහි ලක්‍ෂණ සම්මිශ්‍රතාවක් නො වේයැයි දතයුතුයි. තව ද ලක්‍ෂණාදීන්ගේ ව්‍යවස්ථාපනයෙන් ද මොවුන්ගේ අසම්මිශ්‍රතාව දතයුතු යි.

මොවුනතුරෙන් රූපයෙහි ගැටීමට සුදුසු භූතප්‍රසාදය ලක්‍ෂණකොට ඇති හෝ දට්ඨුකාමතානිදාන වූ කම්මසමුට්ඨාන භූතප්‍රසාදය ලක්‍ෂණකොට ඇත්තේ හෝ චක්‍ෂුයයි. රූපයන්හි හැසිරීම රසයකොට ඇත්තේ ය. චක්‍ෂුර් විඥානයට ආධාරභාවය එළඹසිටි ආකාරයයි. දට්ඨුකාමතානිදාන කර්මජභූත ආසන්න කාරණය යි. ශබ්දයෙහි ගැටීමට සුදුසු භූත ප්‍රසාදය ලක්‍ෂණකොට ඇත්තේ හෝ සෝතුකාමතා නිදාන කම්මසමුට්ඨාන භූතප්‍රසාදය ලක්‍ෂණකොට ඇත්තේ හෝ ශ්‍රෝත්‍රයයි. ශබ්දයන්හි හැසිරීම රසයකොට ඇත්තේ ය. ශ්‍රෝත්‍රවිඥානයට ආධාර එළඹසිටි කාරණය කොට ඇත්තේ ය. සෝතුකාමතානිදාන කර්මජභූත ආසන්න කාරණය කොට ඇත්තේ ය. ගන්‍ධයෙහි ගැටීමට සුදුසු භූත ප්‍රසාද ලක්‍ෂණය හෝ ඝායිතුකාමතා නිදාන කම්ම සමුට්ඨානභූත ප්‍රසාදලක්‍ෂණය හෝ ඇත්තේ ඝාණයයි. ගන්‍ධයෙහි හැසිරීම රසයකොට ඇත්තේ ය. ඝාණ විඥානයට ආධාරවීම එළඹසිටි කාරණය කොට ඇත්තේ ය. ඝායිතුකාමතා නිදාන කර්මජභූත ආසන්න කාරණය කොට ඇත්තේ ය. රසයෙහි ගැටීමට සුදුසු භූත ප්‍රසාදය ලක්‍ෂණකොට ඇත්තා වූ හෝ සායිතුකාමතා නිදාන කම්ම සමුට්ඨාන භූතප්‍රසාදය හෝ ලක්‍ෂණකොට ඇත්තේ ජිව්හා ය. රසයන්හි හැසිරීම රසයකොට ඇත්තේ ය. ජිව්හා විඥානයට ආධාරභාවය එළඹසිටි කාරණය කොට ඇත්තේ ය. සායිතුකාමතා නිදාන කර්මජභූත ආසන්න කාරණය කොට ඇත්තේ ය. ස්පර්ශයෙහි ගැටීමට සුදුසු භූතප්‍රසාද ලක්‍ෂණය හෝ ඵුසිතුකාතොනිදාන කම්මසමුට්ඨාන ප්‍රසාද ලක්‍ෂණය හෝ ඇත්තේ කායයි. පොට්ඨබ්බයන්හි හැසිරීම රසයකොට ඇත්තේ ය. කාය විඥානයට ආධාරභාවය එළඹසිටි කාරණය කොට ඇත්තේ ය. ඵුසිතුකාමතානිදාන කර්මජභූත ආසන්න කාරණය කොට ඇත්තේ ය.

ඇතැම් කෙනෙක් තේජාධික භූතයන්ගේ ප්‍රසාදය චක්‍ෂුස ය, වායෝ පඨවි ආපෝ අධික භූතයන්ගේ ප්‍රසාදයෝ සෝත ඝාණ ජිව්හා යන මොව්හුය. කය සියල්ලගේ ම යැයි කියත්. තවත් කෙනෙක් තේජාධිකයන්ගේ ප්‍රසාදය චක්‍ෂුසය, විවරවායු ආප පඨවි අධිකයන්ගේ (ප්‍රසාදයෝ) සෝත ඝාණ ජිව්හා කාය යෝ යැයි කියත්. ඔව්හු නොකිය යුත්තක් ඉදිරිපත් කරත්. ඒකාන්තයෙන් සූත්‍රය නම් නො දකිත්. මෙහිදී තවත් කෙනෙක් තේජාදීන්ගේ ගුණයන් වූ රූපාදීන් සමග අනුග්‍රහ භාවයෙන් යැයි කරුණු කියත්. ඔව්හු ද රූපාදීහු තේජාදීන්ගේ ගුණයෝ යැයි කවුරු මෙසේ කියත්දැයි කිවයුත්තාහ. අවිනිර්භෝග භූතවිෂයෙහි (මෙය මෙහි ගුණයයි) මේ මෙහි ගුණයයි කියන්නට නො ලැබේ. යළිදු

ඒ ඒ සම්භාරයන්හි ඒ ඒ භූත අධිකත්වයෙන් පෘථුවි ආදීන්ගේ සන්ධාරණාදී කෘත්‍යයන් කැමතිවව් යැයි කියත් නම්, මෙසේ තේජාදිය අධික සම්භාරයන්හි රූපාදීන්ගේ අධිකභාවය දැක්වීමෙන් රූපාදීහු ඔවුන්ගේ ගුණයෝ ය යන්න කැමතිවිය යුතුය. කැමති වන්නෙමුයි ඔව්හු කිවයුත්තෝ ය. ආපෝ අධික ආශ්‍රවයේ ගන්ධයෙන් පෘථුවි අධික කපු පුලුනෙහි ගන්ධය අධිකතර වන්නේ නම්, ගන්ධයෙන් පෘථුවි අධික කපු පුලුනෙහි ගන්ධය අධිකතර වන්නේ නම් තේජෝ අධික උණුදියෙහි වර්ණයෙන් සිහිල් දියේ වර්ණය ද පිරිහෙන්නේ ය. යම්හෙයකින් මේ දෙක ම නැත්ද, එහෙයින් මොවුන්ට නිශ්‍රය වූ විශේෂ කල්පනය අත්හැර යම්සේ අවිශේෂ වූ ද (එක් කලාපයෙක) භූතයන්ගේ රූපරසාදිය ඔවුනොවුන්ට විසදෘශ වේ ද, මෙසේ චක්‍ෂු ප්‍රසාදාදීහු අන්‍යවිශේෂ කාරණයක් අවිද්‍යමාන (නැති) කල්හි ද මෙය ගතයුතුයි යනුයි. (එය) කිමෙක් ද යත්, යමක් ඔවුනොවුන්ට අසාධාරණ ද, කර්මය ම ඔවුන්ට විශේෂ කාරණයයි. එහෙයින් කර්ම විශේෂයෙන් මොවුන්ගේ වෙනස වෙයි. භූත විශේෂයෙන් නො වේ. භූත විශේෂයක් ඇතිකල්හි වනාහි ප්‍රසාදයද නූපදී. ප්‍රසාදය වනාහි සමානයන්ටය විෂමයන්ට නොවේ යැයි පුරාණයෝ කීහ. මෙසේ කර්ම විශේෂයෙන් විශේෂිත මොවුනතුරෙන් චක්‍ෂු ශ්‍රෝතයෝ විඥානහේතුක බැවින් තම නිශ්‍රය නො ඇලුණු නිශ්‍රය ඇති විෂයෙහි ම අසම්ප්‍රාප්ත විෂය ග්‍රාහකයෝ ය. ශ්‍රෝත ජිව්හා කායයෝ සම්ප්‍රාප්ත විෂයග්‍රාහකයෝ ය. විශේෂ ඥාන හේතුක බැවින් නිශ්‍රය වශයෙනුත් තමා ද තම නිශ්‍රය අල්ලිතයෙහි ම ය. අට්ඨකථාවෙහි වනාහි ආපාථගත හෙයින් ම අරමුණ සම්ප්‍රාප්ත නම් වෙයි. යොදුන් හතළිස් දෙදාහක් මත්තෙහි සිටි චන්ද්‍ර සූර්ය මණ්ඩලයන්ගේ වර්ණය චක්‍ෂු ප්‍රසාදයෙහි ගැටෙයි. එය දුරසිට පැනෙන්නේ නමුදු සම්ප්‍රාප්ත ම නම් වේ. එය ගෝචර හෙයින් චක්‍ෂුස සම්ප්‍රාප්තගෝචර ම නම්. දුර රුකක් සිඳිනවුන්ගේ ද වස්ත්‍ර සෝදන රජකයින්ගේ ද කාය විකාරය දුරදී ම පැනෙයි. ශබ්දය වනාහි ධාතු පරම්පරාවෙන් (අවුත්) (කනෙහි) ගටා හෙමින් ව්‍යවස්ථානයට යේ යැයි කියන ලදී.

එහි කිසිසේත් ආපාථගත හෙයින් අරමුණ සම්ප්‍රාප්ත යැයි කියන ලදී. චන්ද්‍රමණ්ඩලාදී වර්ණය වනාහි ඇසට නො පැමිණ දුර සිටියේ ම පැනෙයි. ශබ්දය ද හෙමින් එන්නා සේ ම කලක් ගතවී ඇසෙන්නේ ය. පරම්පරා ගැටුමෙන් අවුත් කනෙහි ගැටෙනුයේ අසවල් දිසාවේයැයි නම් නො පැනේ. එහෙයින් මොව්හු අසම්ප්‍රාප්තගෝචරයහ. මොව්හු

ස්පර්ශාදීන්ට සමානයහ. සර්පයා නම් යම්සේ දිය ඉස හමදිනා ලද තැන සිත් නො අලවයි ද, කුණුගොඩවල් තණකොළ ගහණයන් තුඹස්වලට ම පිවිස හොත්කල්හි සිත් අලවයි ද, එකඟබවට පැමිණෙයි ද, මෙසේ මේ සිත ද විසම අදහස් ඇත්තේ ය. මට වූ රත් බිත්ති ආදියෙහි නො ඇලේ. බලන්නට ද නො කැමති වෙයි. රූපචිත්‍ර පුෂ්පලතා විචිත්‍ර තැන්හි ම අභිරමණය කෙරේ ද, එවැනි තැන්වලදී ඇස ද නො පොහෝනා කල්හි වුව ද විවනාකොට බලනු කැමති වෙයි. කිඹුලා ද පිටත නික්මෙනවිට ගතයුත්ත නො දකී. ඇස් පියාගෙන හැසිරෙයි. යම් අවස්ථාවෙක බඹ සියයක් පමණ දියෙහි ගිලී බිලට පිවිස වැදහෝනේ වෙයි ද, එකල්හි උගේ සිත එකඟ වෙයි. සුවසේ නිදයි. එපරිද්දෙන් ම මේ කණ ද බිලෙහි හෝනේ ආකාශය ඇසුරු කරනුයේ කන් සිදුරු වළෙහි ම සයනය කරයි. කන් සිදුරු අහස ම එයට ශබ්ද ඇසීමෙහි ප්‍රත්‍යය වෙයි. අජටාකාශය ද වටනේ ම ය.

ලෙණක් තුළ සජ්ඣායනා කරද්දී ලෙණ පියස්ස බිඳගෙන ශබ්දය පිටතට (නො) නික්මෙයි. දොර වාකවුළුවක් ම නික් ම ධාතු පරම්පරාවෙන් ම ගැටෙමින් ගොස් ශ්‍රෝතප්‍රසාදයෙහි ගැටෙයි. ඉක්බිති එකල්හි අසවල් දෙය සජ්ඣායනා කරත්යැයි ලෙණපිට හුන්නාහු දැනගනිත්. එසේ ඇතිකල්හි සම්පත්තගෝචරතාව වෙයි. කිම මෙය සම්පත්තගෝචර ද? එසේය. සම්පත්තගෝචරය. එසේ නම් දුර බෙර ආදිය වයද්දී දුර ශබ්දයකැයි දැනීම වේද යත්, නො වන්නේ නො වේ. ශ්‍රෝත ප්‍රසාදයෙහි ගැටුණු කල්හි දුර ශබ්දයෙක ආසන්නයෙහි ශබ්දයෙක පරතෙර ශබ්දයෙක මෙතෙර ශබ්දයෙකැයි ඒ ඒ ආකාරයෙන් දැනෙන ආකාරය වෙයි. මෙය වනාහි ධර්මතාවකි. මෙම ධර්මතාවෙන් (පලය) කිම, සිදුර යම් යම් පමණ වේද ඇසීම ද ඒ ඒ පමණ වෙයි. චන්ද්‍ර සූර්යාදීන්ගේ දර්ශනය මෙහි මෙය අසම්පත්තගෝචරම ය.

පක්ෂියා ද රුකෙක හෝ භූමියෙහි රමණය නො කරයි. ලෙඩ්ඩුපාත (මැටි කැටයක් උඩ විසිකළවිට යන දුර) එකක් හෝ දෙකක් ඉහළ අජටාකාශයට නැඟිකල්හි ම සිත එකඟ බවට පැමිණෙයි. එපරිද්දෙන් ම ඝාණය ද අහස පිළිබඳ අදහස් ඇත්තේ වාතාශ්‍රිත ගන්ධය ම ගෝචරකොට ඇත්තේ ය. යම් සේ ගවයෝ අලුත්වැසි වට භූමියෙහි (ආඝ්‍රාණය කරමින්) ආඝ්‍රාණය කරමින් ආකාශාභිමුඛ ව වාතය ඇදගනී ද, ඇඟිලිවලින් සුවඳ

පිඬක් ගෙන සුවඳබලන කල්හි වාතය ඇදී නොඒ නම් එහි සුවඳ නො දනී ම ය.

බල්ලා ද පිටත හැසිරෙන විට අභය ස්ථානයක් නො දකී. කැටපහර ආදියකින් උපද්‍රවයට පැමිණේ ද, එවිට ඇතුළුගමට පිවිසි උදුනක් ඇති තැන අළු විසුරුවාගෙන හොත් කල්හි ම පහසුවට පැමිණෙයි. මෙපරිද්දෙන් ග්‍රාමාධ්‍යාසය ඇති දිව ආපෝ සන්නිශ්‍රිත රසය අරමුණුකොට ඇත්තේ ය. ඒ එසේම ය. තුන්යම් රැය මහණදම් කොට ද අලුයම පාසිවුරු ගෙන ගමට පිවිසිය යුතු වන්නේ ය. කෙලෙන් නො තෙමුණු වියළි ආහාරයෙහි රසය දැනගන්නට නො හැකි ය.

සිවලා ද පිටත හැසිරෙනුයේ රතියක් නො විඳී. අමුසොහොනෙහි මිනීමස් කා වැදහොත්තා වූ ම ඌට පහසුවක් වෙයි. මෙපරිද්දෙන් කය ද උපාදින්නකජ්ඣාසය ඇත්තේ පෘථුවිනිශ්‍රිත ස්පර්ශයට අරමුණුකොට ඇත්තේ ය. ඒ එසේමය. අන්‍ය වූ උපාදින්නකයක් නොලබන සත්ත්වයෝ සිය අත්ලෙහි ම හිස තබාගෙන වැදහොවිත්. ඔහුට පෘථුවි ආරම්මණ ග්‍රහණයෙහි දී ආධ්‍යාත්මික වූ ද බාහිර වූ ප්‍රත්‍ය වෙයි. මනාව අතුරන ලද සයනයෙහි අතෙහි සිටියා වූ ද එලාදියෙහි තදබව හෝ මොලොක්බව නොහිඳීමෙන් හෝ නො පෙළීමෙන් නොදත හැකි ය. ආධ්‍යාත්මික බාහිර පෘථුවිය මේ කායප්‍රසාදය ස්පර්ශය දැනීමෙන් ප්‍රත්‍යය වෙයි. මෙසේ මොවුන්ගේ ලක්ෂණාදි ව්‍යවස්ථානයෙන් ද අසම්මිශ්‍රතාව දතයුතුයි.

චක්ෂුප්‍රසාදයාගේ ලක්ෂණ රස ප්‍රත්‍යුපස්ථාන පදස්ථාන ගෝචර අධ්‍යාසය නිශ්‍රයයෝ අන්‍යයෝ ම ය. ශ්‍රෝතප්‍රසාදාදීන්ගේ ලක්ෂණාදීහු අන්‍යයෝමය. චක්ෂු ආයතන ආදීහු අසම්මිශ්‍රයෝ ම ය. තව ද ඔවුන්ගේ අසම්මිශ්‍රතාව පිළිබඳ ව මේ උපමාව ද දතයුතුයි. ඔසවන ලද පංචවර්ණ ධ්වජයන්ගේ ඡායාව යම්හෙයකින් ඒකාබද්ධව මෙන් වියහැකි වුවත් එකිනෙක අසම්මිශ්‍ර ම ය. යම්සේ පස් පැහැති කපුවලින් වැටි කොට පහන් දැල් වූ විට ජාලාව ඒකාබද්ධ මෙන් වුව ද, ඒ ඒ ජාලාවන්ගේ අංසු වෙන් වෙන් ම ය. ජාලාවෝ (ඔවුනොවුන්) අසම්මිශ්‍රයෝ ම ය. මෙපරිද්දෙන් මේ පංචායතනයෝ එක ආත්මභාවයෙක එක්රැස් වූවාහු නමුත් ඔවුනොවුන් අසම්මිශ්‍රයෝ ම ය. හුදෙක් මේ පස පමණක් නො වේ. සෙසු රූපයෝ ද අසම්මිශ්‍රයෝ ම ය. මේ ශරීරයෙහි වනාහි යටිකය, මැදිකය මතුකය යැයි කොටස් තුනකි. එහි නාභියේ පටන් යට යටිකය නම්. එහි කායදසකය

භාවදසකය ආහාර සමුට්ඨාන අටය. උතු සමුට්ඨාන අටය. චිත්ත සමුට්ඨාන අටයැයි රූප සතළිසෙකි. නාභියෙන් උඩ ගෙලවළුව දක්වා මැදිකය නම්. එහි කාය දසකය භාවදසකය වත්‍ථුදසකය ආහාර සමුට්ඨානාදී අට්ඨක (තුන) යැයි රූප පනස් හතරකි. ගලවළුයෙන් උඩ උපරිම කය නම්. එහි චක්ඛු දසකය සොත දසකය ඝාණ දසකය ජිව්හා දසකය කාය දසකය භාව දසකය ආහාර සමුට්ඨානාදි අට්ඨක තුන යැයි රූප අසූහතරකි. එහි චක්‍ෂුප්‍රසාදයට ප්‍රත්‍යය වූ සතරමහා භූතයෝ ය. වර්ණය ගන්ධය රසය ඕජාය ජීවිතේන්‍ද්‍රිය ය චක්‍ෂුප්‍රසාදය යන මෙය ඒකාන්ත වශයෙන් අවිනිර්භෝග දශ නිෂ්පන්න රූපයන්ගේ වශයෙන් චක්‍ෂු දශකය නම්. මේ නයින් සෙසු රූපයෝ ද දතයුතුයි.

ඔවුනතුරෙන් යටිකයෙහි රූපය මැදිකයෙහි උඩුකයෙහි රූපයත් සමග අසම්මිශ්‍රය. සෙසු දෙකයෙහි රූපය ද අන්‍යයන් සමග අසම්මිශ්‍රම ය. යම්සේ වනාහි සවස් කාලයෙහි පර්වත සෙවණැලි ද රුක් සෙවණැලි ද (යම් හෙයකින්) ඒකාබද්ධ මෙන් වෙයි. ඔවුනොවුන් අසම්මිශ්‍ර ම ය. මෙසේ මේ කායයන්හි ද සූසාළිස් සූපනස් හා සුවාසූ රූප ඇතැම්විට ඒකාබද්ධ මෙන් (වෙයි) ඔවුනොවුන් අසම්මිශ්‍ර ම ය.

රූපායතන නිර්දේශයෙහි වර්ණය ම = **වණ්ණ නිභා** ය, බබළයි යනු හෝ නිභාය, චක්‍ෂුර් විඥානයට ප්‍රකට වේ යනු අර්ථයි. වණ්ණො ච නිභා = **වණ්ණනිභා** යනු විග්‍රයි. නිදර්ශන සමග වූයේ = සනිදස්සනං, චක්‍ෂුර්විඥානය විසින් බැලිය යුතුයි යන අර්ථයි. ප්‍රතිඝය සහිත වූයේ = **සප්පටිඝය,** ප්‍රතිඝර්ෂණය උරාගැනීම සිදුකරන යන අර්ථයි. නීලාදීන්හි දියබෙරලිය මල් සමාන වූ **නීලය** යි. කිණිහිරිමල් සමාන වූයේ **පීතකය.** බඳුවදමල් සමාන වූයේ **ලොහිතකය,** ද්වහත්තරුව සමාන වූයේ **ඔදාතය.** දැවුණු අඟුරු සමාන වූයේ **මඤ්ජට්ඨක** ය. 'හරිත්තච, හෙමවණ්ණ, කාමං සුමුඛ පක්කම' යන මෙහි වනාහි හරි යනු රන් කියන ලද නමුත්, මෙයට පර වශයෙන් ජාතරූප ග්‍රහණයෙන් ගත්හෙයින් මෙහි එය හරි නම්. මොව්හු සත්ව වස්තුවක් ආමර්ශනය නොකොට ස්වභාවයෙන් ම දක්වන ලදහ. **හරිවණ්ණං** යනු කොළපැහැති නව තෘණ වර්ණයයි. **අම්බංකුරවණ්ණං** යනු අඹ අංකුරයකට සමාන වර්ණයයි. මේ වස්තු දෙක ආමර්ශනය කොට දක්වන ලදී. දීඝ ආදිය දොළොස ව්‍යවහාරයෙන් දක්වන ලදී. ඔවුන්ගේ ඒ ව්‍යවහාරය ද සසඳ බැලීමෙන් මෙන් ම පිහිටීම වශයෙන් සිද්ධය. දීර්ඝාදිය ඔවුනොවුන් සංසන්දනයෙන් සිද්ධය. වට්ට

ආදිය පිහිටීම අනුව සිද්ධය. එහි හ්‍රස්වය සලකා බලා එයින් උච්චතර වූයේ **දීඝ** ය. එය සලකා බලා එයින් නීචතර වූයේ **රස්සය** ය. ස්ථූල වූ දෙය සලකා බලා එයින් කුඩාතර වූයේ **අණු** ය. එය සලකා බලා එයින් මහන්තතර වූයේ **ථූල** ය. චක්‍ර සටහන් ඇත්තේ **වට්ට** ය. කුකුළු බිජුවක සටහන් ඇත්තේ **පරිමණ්ඩලය**, අංශ සතරකින් යුක්තවූයේ **චතුරස්සරං**, **ඡළංස** ආදියෙහි ද මේ නය ම ය.

**නින්නං** යනු පහතට නැමුණේ ය. **ථලං** යනු උස් ය. එහි දී යම්හෙයකින් දීර්ඝාදිය ස්පර්ශකොට දැනගත හැකි වුව ද, නීලාදිය වනාහි එසේ නො හැකි ය. එහෙයින් නිෂ්පර්යාය වශයෙන් දීර්ඝය රූපායතනයක් නො වේ. හ්‍රස්වාදිය ද එසේ ය. ඒ ඒ දෙය ඇසුරුකොට ඒ ඒ අයුරින් සිටියේ දීර්ඝය හ්‍රස්වය යැයි ඒ ඒ ව්‍යවහාරයෙන් මෙහිදී රූපායතනය ම කියන ලදැයි දතයුතුයි. **ඡායා අනපො** යන මෙය ඔවුනොවුන් පිරිසිඳින ලදී. **ආලොක අන්ධකාර** ද **අබ්භා මහිකා** යන ආදී සතර ද වස්තු වශයෙන් ම දක්වන ලදී. එහි **අබ්භා** යනු වලාකුළු ය. **මහිකා** යනු හිම ය. මේ සතරින් අබ්භාදීන්ගේ වර්ණය දක්වන ලදී. **චන්ද මණ්ඩලස්ස වණ්ණනිභා** යන ආදියෙන් ඒ ඒ වස්තූන්ගේ වර්ණප්‍රභාව දක්වන ලදී. එහි චන්ද්‍ර මණ්ඩලාදී වස්තූන්ගේ විශේෂය මෙසේ දතයුතුයි.

පිණිමුවා වූ රිදීපටකින් වැසුණු දිගින් හා පළලින් එකුන්පනස් යොදුන් වූ චන්ද්‍ර දිව්‍යපුත්‍රයාගේ විධානය සඳමඬල නම්. රන්මුවා වූ පළිඟුවෙන් වැසුණු දිගින් හා පළලින් සමපනස් යොදුන් වූ සූර්යදිව්‍ය පුත්‍රයාගේ විමානය ඉරමඬල නම්. සත්රුවන්මුවා වූ දිගින් හා පළලින් යොදුන් හත අට දහය හා දොළොස වශයෙන් වූ ඒ ඒ දිව්‍යපුත්‍රයන්ගේ විමාන තාරකාරූප නම්. එහි චන්ද්‍රයා යටය, සූර්යයා උඩින් ය. දෙදෙනා අතර යොදුනක් වෙයි. චන්ද්‍රයාගේ යටි කෙළවර සිට සූර්යයාගේ මතු කෙළවර අතර යොදුන් සියයක් වෙයි. දෙපසින් නැකත්කරු ගමන් කරයි. මේ තිදෙනා අතුරෙන් චන්ද්‍රයා මඳගමන් ඇත්තේ ය. සූර්යයා ශීඝ්‍රගාමීය. නැකත්තරු සියල්ල ශීඝ්‍රගාමීය. ඇතැම්කලෙක චන්ද්‍ර සූර්යයන්ට ඉදිරියෙන් ගමන්කරන අතර ඇතැම් කලෙක පසුව ගමන් කරයි. **ආදාස මණ්ඩලය** (කැඩපත) සර්වලෝහමය ය, **මණි** යනු වෛදූර්ය හැර සෙසු ජෝතිරසාදි නොයෙක් ප්‍රභේදය, **සංඛය** සමුද්‍රායෙහි උපන්නකි. **මුත්තා** යනු මුහුදෙහි හටගත් මුතු හා සෙසු මුතු ද වෙයි. **වෙළුරියො** යනු උණ වර්ණයෙන් යුත් මැණික්ය. ශාස්තෲන් වහන්සේගේ වර්ණය **ජාතරූප**

යැයි කියනු ලැබේ. ශාස්තෘන් වහන්සේ වනාහි ස්වර්ණ වර්ණයහ. ස්වර්ණය ද ශාස්තෘ වර්ණය. කහවණු තඹමසු දැවමසු ලාකඩමසු යන මේවා රජත යැයි කියනු ලැබේ. යම් කාසිවර්ග ව්‍යවහාරයට පැමිණේයැයි කියන ලද ද, ඒ සියල්ල ම මෙහි ගන්නා ලදී. යංවා පනඤ්ඤම්පි යන මෙයින් පාළියෙහි ආ දෙය හැර සෙසු තම්මික පිලෝතික කර්ණික වර්ණාදී භේදවලින් යුත් රූපද ගන්නා ලදී. ඒ සියල්ල ම යේවාපනකයන්හි ඇතුළත් ය. මෙසේ නීලාදී භේදයෙන් භින්න වූ ද මේ සියලු ම රූපය ලක්ෂණාදියෙන් අභින්න ම යැ.

මේ සියලු ම රූපය වනාහි ඇසෙහි ගැටීම ලක්ෂණ කොට ඇත්තේය. චක්ෂුර්විඥානයට විෂයවීම රසයකොට ඇත්තේ ය. එයට ම ගෝචරවීම එළඹසිටි කාරණය කොට ඇත්තේ ය. චාතුර්මහා භූතයන් ආසන්න කාරණය කොට ඇත්තේ ය. මෙය යම්සේ ද සියලු ම උපාදා රූපයෝ ද එසේ ය. යම්තැනෙක විශේෂයක් ඇතොත් (එය) එහිදී කියන්නෙමි. මෙහි ශේෂය චක්ෂුරායතන නිර්දේශයෙහි කියන ලද නයින් ම දතයුතුයි. හුදෙක් එහි නිර්දේශය චක්ෂු පූර්වාංගම ද, මෙහි රූපපූර්වාංග ම ය. එහි ද චක්ඛුමෙපතං යනාදී වූ නාම තුදුසෙකි. මෙහි දී රූපමෙපතං යනාදී නාම තුනකි. සෙස්ස එබඳු ම ය. යම්සේ වනාහි (සතර) සතර නයින් ප්‍රතිමණ්ඩිත කොට චක්ෂුස ව්‍යවස්ථාපනය කිරීමට තෙළෙස්වාරයක් කියන ලද ද, මෙහි ද එකී වාර එසේ ම කියන ලදී.

ශබ්දායතන නිර්දේශයෙහි **භෙරිසද්දො** යනු මහබෙර පටහබෙර වල ශබ්දයයි. **මුතිංගසංඛ පණාව** ශබ්දයෝ ද මුතිංගාදිය ප්‍රත්‍යයකොට ඇති ශබ්දයෝ ය. ගීත සංඛ්‍යාත ශබ්දය = **ගීත ශබ්දය,** කියන ලද අවශේෂ වූ තන්ත්‍රිබද්ධ වීණාදීන්ගේ ශබ්දය = **වාදිතසද්ද** නම්. **සම්ම සද්දො** යනු තස්තල දැවතල ශබ්දයයි. **පාණිසද්දො** යනු අත්පහර ශබ්දය යි. **සත්තානං නිග්ඝොසසද්දො** යනු රැස් වූ බොහෝ දෙනාගේ නො පැනෙන පදව්‍යඤ්ජන ඇති ඝෝෂාවේ ශබ්දයයි. **ධාතුනං සන්නිපාත සද්දො** යනු වෘක්ෂයන් ඔවුනොවුන් ගැටීම ගෙඩි (හිණඩා) ගැයීම ආදී ශබ්දය, හමන වාතයේ ශබ්දය **වාතසද්දාය** ගලාබස්නා වූ හෝ ගැටෙන්නා වූ ජලයේ ශබ්දය **උදකසද්දය,** මිනිසුන්ගේ කතාබහ ආදී ශබ්දය **මනුස්සසද්ද** යයි. එය හැර සෙසු සියල්ල ම **අමනුස්සසද්ද** යයි. මේ පද දෙකින් සියලු ම ශබ්ද ඉතිරි නොකොට ගන්නා ලදී. මෙසේ ඇති කල්හි ද උණදඬු පැළීම රෙදි ඉරීම ආදියෙහි පවත්නා පාළියෙහි නො ආ ශබ්ද යේවාපනකස්ථානයෙහි

පිවිසියේ යැයි දතයුතුයි. මෙසේ මේ ශබ්ද භේරිශබ්දා දී භේදයෙන් වෙන්වුව ද ලක්ෂණාදියෙන් වෙන් නොවූයේ ම ය. මේ සියලු ම ශබ්දය ශ්‍රෝත්‍රයෙහි ගැටීම ලක්ෂණකොට ඇත්තේය. ශ්‍රෝත විඥානයට විෂයවීම රසයකොට ඇත්තේ ය. එයට ම ගොදුරුවීම එළඹසිටි කාරණය කොට ඇත්තේ ය. ශේෂය චක්ෂුරායතන නිර්දේශයෙහි කියන ලද නයින් ම දතයුතුයි. මෙහිදී ද වනාහි (සතර) සතර නයින් ප්‍රතිමණ්ඩිත තෙළෙස් වාරයක් කියන ලදී. ඔවුන්ගේ අර්ථය කියන ලද නයින් ම දැනගත හැකියැයි විස්තර නො කරන ලදී.

ගන්ධායතන නිර්දේශයෙහි **මූලගන්ධො** යනු යම්කිසි මුලක් හේතුකොටගෙන උපන් ගන්ධයයි. **සාරගන්ධාදියෙහි** ද මේ නයම ය. සැඳූ හෝ වැරදි ලෙස සැඳූ පළාකොළ ආදීන්ගේ ගන්ධය **ආමක ගන්ධයයි.** මසුන්ගේ කොරපොතු කුණුමස් ආදියෙන් කිලිටිවුණු ගිතෙල් ආදීන්ගේ ගන්ධය **විසසගන්ධයයි, සුගන්ධො** යනු ඉෂ්ට ගන්ධයයි. **දුග්ගන්ධො** යනු අනිෂ්ට ගන්ධය යි. මේ පද දෙකින් සියලු ම ගන්ධ ගන්නා ලදී. මෙසේ ඇතිකල්හි ද කර්ණිකගන්ධ පිලෝතිකගන්ධ ආදී පාළි නො ආ සියලු ම ගන්ධයෝ යේවාපනකස්ථානයට ඇතුළු වූහයි දතයුතුයි. මෙසේ මේ ගන්ධය මූලගන්ධාදී භේදයෙන් බිඳුණේ නමුදු ලක්ෂණාදියෙන් නොබිඳුණේ ම ය. මේ සියලු ම ගන්ධය ඝ්‍රාණයෙහි ගැටීම ලක්ෂණකොට ඇත්තේ ය. ඝාණ විඥානයට විෂයවීම රසයකොට ඇත්තේ ය. එයට ම ගෝචරවීම එළඹ සිටි කාරණයකොට ඇත්තේ ය. සෙස්ස චක්ෂුණායතන නිර්දේශයෙහි කියන ලද නයින් ම දතයුතුයි. මෙහි ද වනාහි දෙපනස් නයකින් ප්‍රතිමණ්ඩිත තෙළෙස්වාරයක් කියන ලදී. ඒවා අර්ථ වශයෙන් ප්‍රකට ම ය.

රසායතන නිර්දේශයෙහි **මූලරසො** යනු යම්කිසි මූලයක් නිසා උපන් රසයයි. **ඛන්ධරස** ආදියෙහි ද මේ නය ම ය. **අම්බිලං** යනු කිරිමෝරු ඇඹුල් ආදියයි. **මධුරං** යනු ඒකාන්ත වශයෙන් ගිතෙල් ආදියයි. කසට රසෙන් යුත් මී වනාහි බොහෝ කලක් බහා තබන ලද්දේ කසට රස වෙයි. කර රසින් යුත් පැණි බොහෝකලක් බහාතබන ලද්දේ වර්ණගන්ධ අත්හරතේ නමුදු රසය අත නොහරී ය. එය ම ඒකාන්ත මධුර ය. **තිත්තක** යනු කොසඹ කොළ ආදියයි. **කටුක** යනු ඉඟුරු මිරිස් ආදිය යි. **ලොණික** යනු මුහුදුලුණු ආදියයි. **ඛාරික** යනු වම්බටුකරටි ආදියයි. **ලපිකං** යනු ඩෙබර නෙල්ලි දිවුල් සාලව ආදියයි. **කසාවං** යනු අරළු ආදියයි. මේ

සියලුම රස වස්තු වශයෙන් කියන ලදී. මෙහි දී වනා ඒ ඒ රසය වස්තු වශයෙන් අම්බිලාදී නාමයන්ගෙන් රසය ම කියන ලදැයි දතයුතුයි. සාදු යනු ඉෂ්ට රසයයි. අසාදු යනු අනිෂ්ට රසයයි. මේ පද දෙකින් සියලුම රසය හාත්පසින් ගන්නා ලදී. මෙසේ ඇති කල ද සාළියෙහි නො ආ ලෙඩ්ඩු රස හිත්තිරස පිලෝතිකරස ආදී සියලු ම රසයෝ යේවාපනක ස්ථානයට ඇතුළත් වූහයි දතයුතුයි. මෙසේ මේ රසය මූලරසාදී භේදයෙන් වෙන්වූයේ ද ලක්‍ෂණාදියෙන් වෙන්නොවූයේ ම ය. මේ සියලු ම රසය දිවෙහි ගැටීම ලක්‍ෂණකොට ඇත්තේ ය. ජිව්හා විඥානයට විෂයවීම රසයකොට ඇත්තේ ය. එයට ම ගෝචරවීම එළඹසිටි කාරණයකොට ඇත්තේ ය. ශේෂය චක්‍ෂුරායතන නිර්දේශයෙහි කී නයින් ම දතයුතුයි. මෙහි ද වනාහි එසේ ම දෙපනස් නයකින් ප්‍රතිමණ්ඩිත වාර තෙළෙසක් කියන ලදී.

ස්ත්‍රී ඉන්‍ද්‍රිය නිර්දේශයෙහි යං යනු කාරණ වචනයි. යම් කාරණයකින් ස්ත්‍රියගේ ස්ත්‍රීලිංගාදිය වේද යන මෙය අර්ථයයි. එහි ලිංගං යනු සටහනයි. ස්ත්‍රියගේ වනාහි අත්පා ග්‍රීවය උදරාදියෙහි සටහන පුරුෂයාගේ මෙන් නො වේ. ස්ත්‍රීන්ගේ වනාහි යටිකය ප්‍රකට වෙයි. උඩුකය අප්‍රකට වෙයි. අත්පා කුඩා ය. මුව කුඩාය. නිමිත්තං යනු හැඳිනගැනීමයි. ස්ත්‍රීන්ගේ වනාහි උරමාංශය අප්‍රකට වෙයි. මුහුණ දැළිරැවුලු රහිත ය. කෙස්බැඳීම හා වස්ත්‍ර හැඳීම ද පුරුෂයන්ගේ මෙන් නොවේ. කුත්තං යනු ක්‍රියාවයි. ස්ත්‍රීහු වනාහි ළදරු කාලයෙහි කුලුමෝල් ආදියෙන් ක්‍රීඩා කරති. බෝනික්කන් සමග ක්‍රීඩා කරති. මැටි වැහැරිවලින් නූල් කටිති. ආකප්පො යනු ගමන් ආදී ආකාරයි. ස්ත්‍රීහු වනාහි ඇවිදින්නෝ අවිසදව යෙති. සිටින්නෝ ද වැදහෝනෝ ද හිඳින්නෝ ද කන්නෝ ද බුදින්නෝ ද අප්‍රකටව බුදිත්. අවිසද පුරුෂයා දැක මාගමක් මෙන් යයි සිටී. වැදහෝයි හිඳී. කයි. බුදී යැයි කියත්. ඉත්ථත්තං ඉත්ථීභාවො යන දෙක ම ඒකාර්ථය. ස්ත්‍රී ස්වභාවය යනු අර්ථයි. මෙය කර්මජය ප්‍රතිසන්ධියෙන් හටගත්තේ ය. ස්ත්‍රීලිංගාදිය වනාහි (ස්ත්‍රී ඉන්‍ද්‍රිය නොවේ) ස්ත්‍රී ඉන්‍ද්‍රිය නිසා පැවැත්මේදී හටගත්තේය. යම්සේ වනාහි බීජය ඇතිකල්හි බීජය නිසා බීජ ප්‍රත්‍යයෙන් වෘක්‍ෂය වැඩී ශාඛා විටප සම්පන්නව අහස පුරා සිටී ද, මෙ පරිද්දෙන් ම ස්ත්‍රීභාව සංඛ්‍යාත ඉන්‍ද්‍රියය ඇතිකල්හි ස්ත්‍රීලිංගාදිය වෙයි. ස්ත්‍රී ඉන්‍ද්‍රිය වනාහි බීජය මෙනි. බීජය නිසා වැඩී අහස පුරා සිටි රුක මෙන් ස්ත්‍රී ඉන්‍ද්‍රිය නිසා ස්ත්‍රීලිංගාදිය පැවති කල්හි හටගනී. එහි ඉන්‍ද්‍රිය චක්‍ෂුර්විඥෙය්‍ය නො වේ. මනෝවිඥෙය්‍ය ම ය. ස්ත්‍රීලිංගාදිය චක්‍ෂුර් විඥෙය්‍ය ද මනෝ

විඥෙයෙය් ද වෙයි. ඉදං තං රූපං ඉත්ථින්ද්‍රියං යනු මේ ඒ රූපයයි. චක්ෂුරේන්ද්‍රියාදිය පුරුෂයාට ද ඇත. එසේ නො වේ. නියම වශයෙන් වනාහි ස්ත්‍රියගේ ම ඉන්ද්‍රියය = ඉත්ථින්ද්‍රිය යි. පුරිසින්ද්‍රියෙහි ද මේ නයමය. පුරුෂ ලිංගාදිය වනාහි ස්ත්‍රී ලිංගාදියට ප්‍රතිපක්ෂ වශයෙන් දතයුතු යි.

පුරුෂයාගේ වනාහි හස්තපාද උදර ග්‍රීවාදියෙහි සටහන ස්ත්‍රියගේ මෙන් නො වේ. පුරුෂයාගේ වනාහි උඩුකය ප්‍රකට වෙයි. යටිකය අප්‍රකට ය. අත් පා මහත් ය. මුහුණ මහත් ය. උරමාංශය සුවිසදය. දැළිරැවුලු හටගනී. කෙස් බැඳීම, වස්ත්‍ර හැඳීම ස්ත්‍රීන් මෙන් නොවේ. ළදරු කාලයෙහි රියනඟුල් ගෙන කෙළිති. වැලිවැටි දමා වැව් කණිති. ගමන් ආදිය ප්‍රකට වෙයි. විසදව ගමන් ආදිය කරන ස්ත්‍රියක දැක පුරුෂයකු මෙන් යයි යනාදිය කියති. සෙස්ස ස්ත්‍රී ඉන්ද්‍රියෙහි කියන ලද්ද සමාන ය. එහි ස්ත්‍රීභාව ලක්ෂණය ඉත්ථින්ද්‍රියයි. ස්ත්‍රියයැයි ප්‍රකාශ කිරීම රසයකොට ඇත්තේ ය. ස්ත්‍රීලිංග නිමිත්ත විලාස ආකල්පයන් කාරණකොට ඇතිබව එළඹසිටි කාරණය කොට ඇත්තේ ය. පුරුෂභාවය ලක්ෂණකොට ඇත්තේ පුරිසින්ද්‍රියයි. පුරුෂයා යැයි ප්‍රකාශ කිරීම රසයකොට ඇත්තේ ය. පුරුෂලිංග නිමිත්ත විලාස ආකල්පයන් කාරණකොට ඇතිබව එළඹසිටි කාරණය කොට ඇත්තේ ය. මේ දෙක ම එම කල්පිතයන්ට පහළවීමේ දී හටගනී. පසුකාලයේ දී ප්‍රතිසන්ධියේ දී (භවංග) ප්‍රතිසන්ධියේ දී හටගත්තේ ද පැවැත්මේදී චලනය වෙයි. පරිවර්තනය වෙයි. මෙසේ ද කියන ලදී. 'එසමයෙහි වනාහි එක්තරා භික්ෂුවකට ස්ත්‍රීලිංගය පහළ වූයේ වෙයි. එසමයෙහි වනාහි එක්තරා භික්ෂුණියකට පුරුෂලිංගය පහළවූයේ වෙයි' යන මේ දෙකෙහි ම පුරුෂලිංගය උත්තමය. ස්ත්‍රීලිංගය හීනය. එහෙයින් පුරුෂලිංගය බලවත් අකුශල කර්මයකින් අතුරුදහන් වෙයි. ස්ත්‍රීලිංගය දුර්වල කුශලයකින් පිහිටයි. ස්ත්‍රීලිංගය වනාහි අතුරුදහන් වනුයේ දුර්වල අකුශල කර්මයකින් අතුරුදහන් වෙයි. පුරුෂලිංගය බලවත් කුශලයකින් පිහිටයි. මෙසේ (මේ) දෙක ම අකුශලයෙන් අතුරුදහන් වෙයි. කුශලයෙන් පිහිටයි යැයි දතයුතුයි.

කිම උභතෝබ්‍යඤ්ජකයාට වනාහි එක් ඉන්ද්‍රියයක් ද නැතහොත් දෙකක්ද යත්, එකකි. එය ද වනාහි ස්ත්‍රී උභතෝබ්‍යඤ්ජනකයාට ස්ත්‍රී ඉන්ද්‍රියය යි. පුරුෂ උභතෝබ්‍යඤ්ජනකයාට පුරුෂින්ද්‍රියය යි. එසේ ඇතිකල්හි දෙවන බ්‍යඤ්ජනකයේ අභාවය සිදුවෙයි. ඉන්ද්‍රියය වනාහි බ්‍යඤ්ජන කාරණය යැයි කියන ලදද, එය ඔහුට නැද්ද යත්, ඔහුට ඉන්ද්‍රියය බ්‍යඤ්ජන

කාරණය නො වේ. කවර හෙයින් ද? සදා අභාව හෙයිනි. යම්කලෙක වනාහි ස්ත්‍රී උභතො බ්‍යඤ්ජනකයාට රාග සිත උපදී ද, එකල්හි ම පුරුෂ ව්‍යඤ්ජනය ප්‍රකට වෙයි. ස්ත්‍රී ව්‍යඤ්ජනය අප්‍රකට වූයේ වෙයි. සැඟවුණේ වෙයි. අනෙකාගේ අනික ද එසේය. යම්හෙයකින් වනාහි ඔවුන්ගේ ඉන්ද්‍රිය දෙවන ව්‍යඤ්ජනයට හේතු වේ ද, හැමකල්හි ම ව්‍යඤ්ජන දෙක තිබේද යත්, නො තිබේ ම ය. එහෙයින් මෙය දතයුතුයි. ඔහුගේ එය ව්‍යඤ්ජනකාරණය නො වේ. මෙහිදී වනාහි කර්මසහාය වූ රාගසිත ම කාරණය වෙයි. එහෙයින් ඔහුට එකම ඉන්ද්‍රියයක් වෙයි. එහෙයින් ස්ත්‍රී උභතෝබ්‍යඤ්ජනකයා තෙමේ ද ගැබ් ගනී. අන්‍යයා ද ගන්වයි. පුරුෂ උභතො බ්‍යඤ්ජනකයා අන්‍යයා ගැබ් ගන්වයි. තෙ මේ වනාහි නොගනී යනුයි.

ජීවිතේන්ද්‍රිය නිර්දේශයෙහි යමක් කිවයුතුද එය යට අරූප-අරූප ජීවිතේන්ද්‍රියයෙහි කියන ලදම ය. හුදෙක් එහි වනාහි **යො තෙසං අරූපීනං ධම්මානං** යැයි කියන ලද ද, මෙහි රූප ජීවිතින්ද්‍රිය බැවින් **යො තෙසං රූපීනං ධම්මානං** යන මෙය ම විශේෂයයි. මෙහි ලක්‍ෂණාදිය වනාහි මෙසේ දතයුතුයි. සහජ රූප අනුපාලනය ලක්‍ෂණකොට ඇත්තේ ජීවිතේන්ද්‍රියයි. ඔවුන් පැවැත්වීම රසයකොට ඇත්තේ ය. ඔවුන්ගේ ම ස්ථාපනය එළඹසිටි කාරණයකොට ඇත්තේ ය. යාපනය කළයුතු බව ආසන්න කාරණය කොට ඇත්තේ ය යනුයි.

කායවිඥප්ති නිර්දේශයෙහි **කාය විඤ්ඤත්ති** යන මෙහි වනාහි කයින් තමාගේ ස්වභාවය හඟවන්නවුන් අතුරෙන් තිරිසනුන් විසින් පුරුෂයන්ට ද පුරුෂයින් විසින් හෝ තිරිසනුන්ට ද කායග්‍රහණානුසාරයෙන් (කය හසුරුවන ආකාරයෙන්) ගන්නා ලද මේ විඥප්තියෙන් ස්වභාවය හැඟේ යනු = **විඤ්ඤත්තියයි**. තෙ මේ කායග්‍රහණානුසාරයෙන් හැඟේ යනු ද = **විඤ්ඤත්තියයි**. 'කායෙන සංවරො සාධු' යන ආදීන්හි ආ චෝපන සංඛ්‍යාත කයම විඤ්ඤත්තිය වූයේ = **කාය විඤ්ඤත්තියයි**. කය සැලීමෙන් අදහස් හැඟවීමට හේතුවන බැවින් තෙමේ ද එසේ හැඟෙවෙන හෙයින් කයින් හැඟවීම යනු ද = **කාය විඤ්ඤත්තියයි**. **කුසල චිත්තසස වා** යන ආදීන්හි කාමාවචර සිත් අට අභිඥා සිත යන සිත් නවය සමග කුශල සිතට හෝ, දොළොස් අකුශලසිත් සමග අකුශල සිතට හෝ, මහාකිරිය සිත් අට ය. පරිතකිරිය සිත් දෙකය. අභිඥාප්‍රාප්ත රූපාවචර කිරියසිත් එකය යන එකොළොස් සිත් සමග අබ්‍යාකත සිතට හෝ,

මෙයින් අන්‍ය වූ සිත් විඥප්තිය නූපදවයි. ශෛක්ෂ අශෛක්ෂ හා පෘථග්ජනයන්ට වනාහි මෙපමණක් ම සිත්වලින් විඥප්තිය වේයැයි මේ කුශලාදීන්ගේ වශයෙන් පද තුනෙන් හේතු වශයෙන් දක්වන ලදී.

දැන් සපදයෙන් ඵල වශයෙන් දක්වන්නට 'අභික්කමන්තස්ස' යන ආදිය කියන ලදී. අභික්කම ආදිය වනාහි විඥප්ති වශයෙන් පැවති හෙයින් විඥප්තිඵලය නම්. එහි **අභික්කමන්තස්ස වා** යනු ඉදිරියෙන් කය පෙරට ගෙන එන්නහුට, **පටික්කමන්තස්ස** යනු පසුපසින් ආපසු ගෙන එන්නහුට, **ආලොකෙන්තස්ස** යනු ඍජුව බලන්නහුට, **විලොකෙන්තස්ස** යනු ඔබමොබ බලන්නහුට, **සම්මිඤ්ජෙන්තස්ස** යනු සන්ධි හකුළුවන්නහුට, **පසාරෙන්තස්ස** යනු සන්ධි ඉදිරියට දිගහරින්නහුට,

දැන් සපදයෙකින් ස්වභාව වශයෙන් දක්වන්නට **කායස්ස ථම්භනා** යන ආදිය කියන ලදී. එහි **කායස්ස** යනු ශරීරයට, කය දැඩිකොට තදකෙරේ යනු = **ථම්භනා** ය, එය ම උපසර්ගයෙන් දියුණුකොට **සන්ථම්භනා** යැයි කීය. බලවතර වූ ථම්භනය හෝ = **සන්ථම්භනා** ය, **සන්ථම්භිතත්තං** යනු තදවූ බවයි. හැඟවීම් වශයෙන් **විඤ්ඤත්ති** යයි. **විඤ්ඤාපනා** යනු හඟවන ආකාරයයි. හඟවන ලද බව **විඤ්ඤාපිතත්තකය**, මෙහි අවශේෂ යමක් කිවයුතු නම් එය යට ද්වාරකථාවෙහි කියන ලද ම ය. වාග් විඥප්තීන්ගේ ද එසේම ය. **වචී විඤ්ඤත්ති** යන පදයාගේ ද නිර්දේශ පදයාගේ ද අර්ථය එහි නො කියන ලදී. එය මෙසේ දතයුතුයි. වචනයෙන් තමාගේ ස්වභාවය හඟවන්නවුන් අතුරෙන් තිරිසනුන් විසින් පුරුෂයන්ට ද පුරුෂයින් විසින් තිරිසනුන්ට ද වාග්ග්‍රහණානුසාරයෙන් ගන්නා ලද මෙයින් ස්වභාවය හැඟේ = **විඤ්ඤත්තියයි.** තෙමේ ද වාග්ග්‍රහණානුසාරයෙන් හැඟේ යනු ද = **විඤ්ඤත්තියයි.** 'සාධුවාචාය සංවරො' යන ආදීන්හි ආ වෝපනසංඛ්‍යාත වචනය ම විඤ්ඤත්ති යනු = **වචී විඤ්ඤත්තිය,** වාග් ඝෝෂාවෙන් අදහස හැඟවීමට හේතුවන හෙයින් ද තෙමේ ද එසේ දතයුතු හෙයින් ද වචනයෙන් හැඟවීම යනු ද **වචී විඤ්ඤත්තිය,** 'වාච ගිරා' ආදීන්හි කියයි යනු = **වාචාය,** ගිරීයත (කායයි) යනු ද = **ගිරා** ය, **බ්‍යප්පථො** යනු වෘක්ෂ විශේෂය, අර්ථය දැනගනු කැමැත්තවුන්ට දැන ගන්වනු කැමැත්තවුන්ටත් එය වචනයත් පථයත් වේ යනු **බ්‍යප්පථය,** කියයි යනු = **උදීරණයයි.** ඝෝෂා කෙරේ යනු = **ඝොස** ය, කෙරේ යනු = කම්මය, ඝොසය ද කම්මය ද = **ඝොසකම්මය** නන්අයුරින් කරන ලද ඝෝෂාව යන අර්ථයි. වචනයෙහි භේදය = **වචීභෙදය,** එය වනාහි

නො බිඳේ. ප්‍රභේදගත වචනය ම මෙසේ දැන්වීම පිණිස වාචා වචීභෙදො යැයි කියන ලදී. මේ සියලුම පදයන්ගෙන් ශබ්ද වචනය ම දක්වන ලදී. දැන් ඒ වචනය සමග යොදා යට කියන ලද අර්ථ ඇති විඥප්ති ආදී පදයන්ගේ වශයෙන් තුන් අයුරකින් ස්වභාව වශයෙන් එය දක්වන්නට යා තාය වාචාය විඤ්ඤත්ති ආදිය කියන ලදී. එය යට කියන ලද නය ඇතිහෙයින් ප්‍රකට අර්ථ ඇත්තේ ම ය.

දැන් විඥප්තියෙන් උපදවන ලද චිත්තයන්හි අසම්මෝහය පිණිස දෙතිස්, සවිසි, එකුන්විසි, සොළොස් පශ්චිමයන් යන මේ ප්‍රකීර්ණකය දතයුතුයි. දෙතිස් චිත්තයෝ වනාහි රූපය උපදවත්. ඉරියව්වලට ද උපස්ථම්භය වෙත්. දෙවැදෑරුම් විඥප්තිය ද උපදවත්. සවිසි විඥප්තිය ම නූපදවත්, අනෙක් දෙක කරත්. එකුන්විසි රූපය ම උපදවත්. ඉතිරි දෙක නො කරත්. සොළොස මේ තුනෙන් (එකක්වත්) නො කරයි. එහි දෙතිස යනු යට කියන ලද්දා වූ ම කාමාවචරයෙන් කුශල අට ද දොළොස් අකුශල ද කිරිය සිත්වලින් සිත් දසය ද ශෛක්‍ෂ පෘථග්ජනයන්ගේ අභිඥා සිත ද ක්‍ෂීණාශ්‍රවයන් වහන්සේලාගේ අභිඥා සිත ද යන සිත් ය. සවිස්ස යනු රූපාවචරයෙන් කුශල පස ද කිරිය සිත් පස ද අරූපාවචරයෙන් කුශල සතරද කිරිය සතර ද මාර්ගසිත් සතර ද ඵලසිත් සතර ද යන සිත්ය. එකුන්විස්ස යනු කාමාවචරකුශල විපාකයෙන් එකොළොස ද අකුශල විපාකයෙන් දෙකක් ද (කිරිය සිත්වලින්) කිරිය මනෝධාතුව ද රූපාවචරයෙන් විපාකසිත් පස ද යන මේවාය. සොළොස යනු පංචවිඥාන ද්වය ද සියලු සතුන්ගේ ප්‍රතිසන්ධි සිත ද ක්‍ෂීණාශ්‍රවයන් වහන්සේලාගේ චුතිසිත ද අරූපාවචරයෙහි විපාකසිත් සතර ද යන මේවා ය. මේ සොළොස රූප ඉරියාපථ විඥප්තීන්ගෙන් එකක් වත් නො කරයි. අරූපයෙහි උපන් අන්‍ය බොහෝ සිත් ද අවකාශ නැති හෙයින් රූප නූපදවයි. යම් සිත් කාය විඥප්තිය උපදවයි ද ඒවා ම වාග් විඥප්තිය උපදවයි.

ආකාශධාතු නිර්දේශයෙහි කර්ෂණය (ඇදීම) නො කෙරේ. නිෂ්කර්ෂණය (පිටතට ඇදීම) නො කෙරෙයි. අදින්නට සිඳින්නට විඳින්නට හෝ නොහැකිය යනු = **ආකාසය,** ආකාසය ම ආකාසහතය බෙලගතාදිය මෙනි. ආකාස යනු හෝ ගතං යනු = **ආකාසගතය,** නො නැසේ නුයි = **අඝය,** නො ගැටිය යුතු යන අර්ථයි. අඝ යනු ම = **අඝගත ය.** ඡිද්‍රය යන අර්ථයෙන් **විවර ය,** විවරය ම = **විවරගත ය, අසමඵුට්ඨං චතුහි මහාභූතෙහි**

යනු මොවුන් විසින් ස්පර්ශ නො කරන ලද ඒ වෙන් වූ ආකාසය කියන ලදී. ලක්ෂණාදී වශයෙන් වනාහි **ආකාසධාතුව** රූප පරිච්ඡේදය ලක්ෂණකොට ඇත්තේ ය. රූප පර්යන්තය ප්‍රකාශ කිරීම රසයකොට ඇත්තේ ය. රූප සීමාකිරීම එළඹසිටි කාරණය කොට ඇත්තේ ය. ස්පර්ශ නොකළ බව ඡිද්‍ර විවරභාවය හෝ එළඹසිටි කාරණය කොට ඇත්තේ ය. පිරිසිඳිනා ලද රූප ආසන්න කාරණය කොට ඇත්තේ ය. එයින් පිරිසිඳිනා ලද රූපයන්හි මෙය මෙයින් උඩය යටය සරස යැයි ද වෙයි.

මෙයින් පර වූ චිත්තස්ස ලහුතා ආදීන්හි **රූපස්ස ලහුතා** ආදීන්ගේ නිර්දේශ කියන ලද නයින් ම දතයුතුයි. මෙහිදී වනාහි ලක්ෂණාදී වශයෙන් **රූපස්ස ලහුතාව** අදන්ධතාව (මෝඩ නොවන බව) ලක්ෂණ කොට ඇත්තේ ය. රූපයන්ගේ ගරුභාවය දුරුකිරීම රසය කොට ඇත්තේ ය. වහා පරිවර්තනය වීම එළඹසිටි කාරණය කොට ඇත්තේ ය. සැහැල්ලු රූප ආසන්න කාරණය කොට ඇත්තේ ය. **රූපස්ස මුදුතාව** නො තදබව ලක්ෂණකොට ඇත්තේ ය. රූපයන්ගේ තදබව දුරුකිරීම රසයකොට ඇත්තේ ය. සියලු ක්‍රියාවන්හි අවිරෝධී බව එළඹසිටි කාරණය කොට ඇත්තේ ය. මෘදුරූප ආසන්න කාරණය කොට ඇත්තේ ය. ශරීර ක්‍රියාවන්ට අනුකූල කර්මණ්‍යතාව ලක්ෂණකොට ඇත්තේ **රූපස්ස කම්මඤ්ඤතා** වයි. අකර්මණ්‍යබව දුරුකිරීම රසයකොට ඇත්තේ ය. අදුර්වල බව එළඹ සිටි කාරණය කොට ඇත්තේ ය. කර්මණ්‍යරූප ආසන්න කාරණාකොට ඇත්තේ ය. මේ තුන වනාහි ඔවුනොවුන් අත් නො හරී.

මෙසේ ඇති කල ද නිරෝගී අයෙකුගේ මෙන් රූපයන්ගේ යම් සැහැල්ලු බවෙක් වේ ද, අදන්ධතා ලහුපරිවර්තන ප්‍රකාර ඇත්තේ ද, රූපදන්ධ බව ඇතිකරන ධාතුක්ෂෝභ ප්‍රතිපක්ෂ ප්‍රත්‍යයෙන් හටගත්තේ ද, ඒ රූපවිකාරය **රූපස්ස ලහුතාවයි.** මනා මදිනා ලද සමක් මෙන් රූපයන්ගේ යම් මෘදුභාවයක් වේ ද, සියලු ක්‍රියා විශේෂයන්හි රස සහිතව පවත්නා බවක් වේද වසයෙහි පවත්නා බව මෘදු බව ආකාරකොට ඇත්තේ ද, රූපයන්ගේ තදබව ඇතිකරන ධාතුක්ෂෝභ ප්‍රතිපක්ෂ ප්‍රත්‍යයන්ගෙන් හටගැනුණේ ද, ඒ රූපවිකාරය **රූපස්ස මුදුතාවයි.** පිරිසිදු කළ ස්වර්ණයක් මෙන් රූපයන්ගේ යම් කර්මණ්‍යභාවයක් වේද ශරීර ක්‍රියාවන්ට අනුකූල භවාකාරයක් ඇත්තේ ද ශරීර ක්‍රියාවන්ට අනුකූල නොවන ධාතුක්ෂෝභයන්ට ප්‍රතිපක්ෂ ප්‍රත්‍යයෙන් හටගත්තේ ද, ඒ රූප විකාරය **රූපස්ස කම්මඤ්ඤතාවයි.** මෙසේ මොවුන්ගේ වෙනස දතයුතුයි.

මේ තිදෙනා ම කර්ම කරන්නට නො හැක්කාහ. ආහාරාදිය ම කරත්. ඒ එසේමය. යෝගීහු අද අප භෝජන සත්ප්‍රාය ලබන ලදී. අපගේ කය සැහැල්ලු ය. මෘදු ය. කර්මණ්‍යය යැයි කියත්. අද ඍතු සත්ප්‍රාය ලබන ලදී. අද අපගේ සිත එකග ය. අපගේ කය සැහැල්ලු ය. මෘදුය. කර්මණ්‍යය යැයි කියත් යනුයි.

උපචයසන්තති නිර්දේශයන්හි **ආයතනානං** යනු අඩෙඩකාදස රූපායතනයන්ගේ, **ආචයො** යනු ඉපදීමය. **යො රූපස්ස උපචයො** යනු නැවත නැවත උපදනා ආයතනයන්ගේ යම් රැස්කිරීමක් වේද එයද රූපයන්ගේ රැස්කිරීමක් නම් වේ. වැඩීම යන අර්ථයි. **යො රූපස්ස උපචයො සා රූපස්ස සන්තති** යනු මෙසේ රැස්කරන ලද රූපයන්ගේ යම් වැඩීමක් වේද, එයින් උත්තරීතරව පවත්නා කාලයෙහි එය රූපයාගේ සන්තතිය නම් වේ. ප්‍රවෘත්තිය යන අර්ථයි. නදීතීරයක කළ ළිඳෙක දිය නැගෙන කාලය මෙන් ආචය උපදී. උපචය වෘද්ධිය පිරුණු කාලය මෙනි. සන්තතියේ ප්‍රවෘත්තිය පැතිර යන කාලය මෙන් යැයි දතයුතුයි. මෙසේ කුමක් කියන ලද්දේද යත්, ආයතනයෙන් ආචය කියන ලදී. ආචයෙන් ආයතනය කියන ලදී. ආචය ම කියන ලදී. ආයතනය ම කියන ලදී. මෙසේ කුමක් කියන ලදද යත්, සතර සන්තති රූපයන්ගේ ආචය උපචය උපැත්ම වැඩීම කියන ලදී. අර්ථ වශයෙන් වනාහි මේ දෙක ම ජාතිරූපයට ම නමකි. ආකාර නානත්වයෙන් ද වේනෙය්‍ය වශයෙන් ද වනාහි උපචය සන්තතිය යැයි උද්දේස දේශනය කොට යම්හෙයකින් මෙහි අර්ථ වශයෙන් වෙනසක් නැද්ද, එහෙයින් නිර්දේශයෙහි ද ආයතනයන්ගේ යම් රැස්කිරීමක් වේද එය රූපයාගේ උපචයයි. රූපයාගේ යම් උපචයක් වේද එය රූපයාගේ සන්තතිය යැයි කියන ලදී. යම්හෙයකින් මේ දෙකම ජාතිරූපයට ම නමක් වේ ද, එහෙයින් මෙහි ආචය ලක්‍ෂණය රූපයාගේ උපචයයි. පූර්වාන්තයෙන් රූපයන් මතුකිරීම රසයකොට ඇත්තේ ය. පවරාදීම හෝ පරිපූර්ණභාවය එළඹසිටි කාරණයකොට ඇත්තේ ය. උපචිත රූප ආසන්න කාරණය කොට ඇත්තේ ය. රූපයාගේ සන්තතිය ප්‍රවෘත්තිය (පැවැත්ම) ලක්‍ෂණකොට ඇත්තේ ය. නොසිඳී පැවැත්ම රසයකොට ඇත්තේ ය. අනුපච්ඡේදය එළඹසිටි කාරණය කොට ඇත්තේ ය. (නො සිඳී පවත්නා රූප ආසන්න කාරණයකොට ඇත්තේ යැයි) දතයුතුයි.

ජරතා නිර්දේශයෙහි **ජීර්ණක වශයෙන් ජරා ය.** මෙය මෙහි ස්වභාව

නිර්දේශයයි. ජීර්ණක ආකාරය **ජීරණතා** ය. **ඛණ්ඩිච්චං** යන ආදියෙහි (මුලින්) වූ (තුන) කාලාතික්‍රමයෙහි කෘත්‍ය නිර්දේශය, පසුව වූ දෙක ප්‍රකෘති නිර්දේශය, ජරා යන මෙය වනාහි මේ පදයෙන් ස්වභාව වශයෙන් දක්වන ලදී. එහෙයින් මෙය එහි ස්වභාව නිර්දේශයයි. **ඛණ්ඩිච්චං** යන මෙයින් කල්යෑමෙන් දන්ත තත්ත්වයන්ගේ කැඩෙන බව කාරීම කෘත්‍ය වශයෙනි. **පාලිච්චං** යන මෙයින් කේශ ලෝමයන්ගේ පැසෙන බව කිරීම කෘත්‍ය වශයෙනි. වලිත්තචතා යන මෙයින් මස් හකුළුවා සම රැලි බව කිරීම කෘත්‍ය වශයෙන් දක්වන ලදී. එහෙයින් මෙහි මේ ඛණ්ඩිච්චං ආදී (තුන) කාලාතික්‍රමයෙහි කෘත්‍ය නිර්දේශය, ඔවුන් විසින් මේ විකාරයන් දැක්වීම් වශයෙන් ප්‍රකට වූ ප්‍රකෘති ජරාව දක්වන ලදී.

යම්සේ වනාහි ජලයට හෝ ගින්නට තෘණ වෘක්ෂාදීන්ගේ කැඩී බිඳී යෑමෙන් හෝ දැවීමෙන් හෝ ගිය මාර්ගය ප්‍රකට වේ ද, ඒ ගිය මාර්ගය ඒ දිය ආදිය නොවේ ද මෙපරිද්දෙන් ජරාවෙන් දත් ආදියෙහි කැඩුණු බව ආදී වශයෙන් ගිය මඟ ප්‍රකට ය. ඇස ඇර ගනී. කැඩුණු බව ආදිය ජරාව නො වේ. ජරාව චක්ඛු විඤ්ඤෙය්‍ය නො වේ. **ආයුනො සංහානි ඉන්ද්‍රියානං පරිපාකො** යන මේ පදයන්ගෙන් වනාහි කාලාතික්‍රමයෙහි ම අභිව්‍යක්තතාවෙන් ප්‍රකෘතියෙන් දක්වන ලදී. එහෙයින් එහි මෙකී පශ්චිම දෙක ප්‍රකෘති නිර්දේශයැයි දතයුතුයි. එහි යම්හෙයකින් ජරාවට පැමිණියහුගේ ආයු පිරිහේද, එහෙයින් ජරාව **ආයුනො සංහානි** ය යැයි ඵලූපචාර වශයෙන් කියන ලදී. යම්හෙයකින් වනාහි තරුණ කාලයෙහි අතිශයින් ප්‍රසන්න වූ සියුම් දෙය පවා තමාගේ විෂයට සුවසේ ම ගැනීමට සමත් වූ චක්ෂුරාදී ඉන්ද්‍රියයෝ ජරාවට පැමිණියහුට පැසුණු කැලඹුණු අවිසද වූවාහු ඕළාරික දෙයක් පවා තමාගේ විෂයට ගැනීමට අසමර්ථයෝ වෙත්. එහෙයින් **ඉන්ද්‍රියානං පරිපාකො** යනු ද ඵලූපචාරයෙන් ම කියන ලදී.

මෙසේ දක්වන ලද ඒ මේ සියලුම ජරාව ද වනාහි ප්‍රකට ප්‍රතිච්ඡන්න යැයි දෙවැදෑරුම් වෙයි. එහි දත් ආදියෙහි කැඩුණු බව ආදිය දක්නා හෙයින් රූප ධර්මයන්හි ජරාව ප්‍රකට ජරාව නම්. අරූප ධර්මයන්හි ජරාව වනාහි එබඳු විකාර නො දක්නා හෙයින් ප්‍රතිච්ඡන්න ජරා නම්. නැවත සවීචි අවීචියැයි මෙසේ ද ද්‍රවිධ වෙයි. එහි රන් රිදී මැණික පබළු සඳ හිරු ආදීන්ගේ මෙන් ද ප්‍රාණීන්ගේ මන්ද දශකාදියෙහි මෙන් ද අප්‍රාණීන්ගේ මල්පල ළපලු ආදියෙහු මෙන් ද අතරතුර වර්ණ

විශේෂාදීන් ගේ ජරාව නොදත හැකි බැවින් අවීචි ජරා නම්. නිරන්තර (අතරක් නැති) ජරාව යනු අර්ථයි. ඉන් අන්තැන්හි වනාහි පළමු කියන ලද අතරතුර වර්ණ විශේෂාදීන්ගේ ජරාව මනාව දතහැකි බැවින් සවීචිජරා නමැයි දතයුතුයි. රූපයාගේ ජරතාව ලක්ෂණාදී වශයෙන් රූප පරිපාකය ලක්ෂණ කොට ඇත්තේ ය. සමීපයට ගෙන ඒම රසයකොට ඇත්තේ ය. ස්වභාව අගමයේදී ද නවභාවාපගමය එළඹසිටි කාරණය කොට ඇත්තේ ය. වී පරණවීම මෙන් පැසෙනු ලබන රූප ආසන්න කාරණය කොට ඇත්තේයැයි දතයුතුයි.

අතිතමතා නිර්දේශයෙහි ක්‍ෂයගමන වශයෙන් ඛයය, ව්‍යයගමන වශයෙන් වයය, බිඳීම් වශයෙන් **භෙද ය**, නොහොත් යම්හෙයකින් එයට පැමිණ රූපය ක්‍ෂය වේද ව්‍යය වේද බිඳේ ද එහෙයින් මෙහිදී ක්‍ෂය වේනුයි = **ඛයො** ය, මෙහිදී ව්‍යය වේනුයි = **වයො** ය. මෙහිදී බිඳේනුයි = **භෙදො** ය. උපසර්ග වශයෙන් පදය දියුණුකොට භේදය ම = පරිභෙදොය. ඇතිවී නැතිවන අර්ථයෙන් නිත්‍ය නොවූයේ යනු = **අනිච්චං** ය. ඒ අනිත්‍යයාගේ ස්වභාවය = **අනිච්චතා** ය. මෙහිදී අතුරුදහන් වේ යනු = **අනතරධානං** ය, රූපය වනාහි මරණයට පැමිණ අතුරුදහන් වෙයි. නොපෙනෙන බවට යයි. හුදෙක් රූපය පමණක් නො වේ. සියලුම පංචස්කන්ධයෝ අතුරුදහන් වෙති. එහෙයින් ස්කන්ධ පංචකයේ ම අනිත්‍යතාවෙහි මේ ලක්ෂණය මැයි දතයුතුයි. ලක්ෂණාදී වශයෙන් වනාහි රූපයාගේ අනිත්‍යතාව හාත්පසින් බිඳීම ලක්ෂණකොට ඇත්තේය. කිඳබැසීම රසයකොට ඇත්තේ ය. ක්‍ෂය ව්‍යයය දෙක එළඹසිටි කාරණ කොට ඇත්තේ ය. හාත්පසින් බිඳෙනු ලබන රූප ආසන්න කාරණ කොට ඇත්තේ ය. හාත්පසින් බිඳෙනු ලබන රූප ආසන්න කාරණය කොට ඇත්තේයැයි දතයුතුයි. යට ජාතිය (ගන්නා ලදී) ජරාව ගන්නා ලදී. මෙතැනදී මරණය ගන්නා ලදී. මේ ධර්ම තුන මේ සත්ත්වයින්ට ඔසවන ලද කඩු ඇති සතුරෝ තිදෙනෙක් අවකාශයක් සොයමින් හැසිරෙත් ද, ඔවුනතුරෙන් එකෙක් මෙසේ කියන්නේ ය. මොහු බැහැරකොට වනයට පිවිසවීම මට භාර වේවා කියාය. දෙවැන්නා වනයට ගියකල තළා බිම හෙළීම මට භාරයැයි කියයි. බිම හෙළූ තැන සිට කඩුවෙන් හිස සිඳීම මට භාරයැයි තුන්වැන්නා කියයි. මේ ජාති ආදීහු මෙබඳු ස්වරූප ඇත්තාහ. මෙහි ජාතිය වනාහි ඒ ඒ තැන උපදවනු ලබන හෙයින් බැහැරකොට වනයට පිවිසවන සතුරා සමානය. උපන් ස්කන්ධයන් දුබලබවට යටත්කොට සයනය පිහිට කොටගත් බවට

පත්කරන හෙයින් ජරාව වනයට ගියහු තළා බිමහෙළන සතුරා සමාන ය. ජරාවට පත් ස්කන්ධයන් ජීවිතක්‍ෂයට හෙළන හෙයින් මරණය වනයට ගියහුගේ හිස කඩුවෙන් සිඳිනා සතුරා සමානය යනුයි.

කබළිකාරාහාර නිර්දේශයෙහි පිඬුකරනු ලැබේ යනු = **කබළීකාර ය.** ගනු ලැබේ නුයි = **ආහාර ය.** පිඬු කොට ගිලිනු ලැබේ යනු අර්ථයි. රූපය උපදවයි යනු ද = **ආහාර ය.** මෙසේ වස්තු වශයෙන් නාමය උපුටා නැවත මෙය වස්තු වශයෙන් ම ප්‍රභේද වශයෙන් දක්වන්නට **ඕදනො කුම්මාසො** යන ආදිය කියන ලදී. ප්‍රණීත පර්යන්ත ඕදනාදී දොළොස වනාහි මෙහි අදහස්කරන ලද ආහාරයට වස්තුය. පාළියෙහි නොආ මූලඵලාදිය යේවාපනකයට ඇතුළත්ය. දැන් ඒ මූලඵලාදිය කර්තව්‍යය වශයෙන් දක්වන්නට **යම්හි යම්හි ජනපදෙ** යන ආදිය කීය. එහි මුවින් අනුභව කළයුතුය අනුභව කළයුතුය යනු **මුඛාසියං** ය. දත්වලින් විකිය යුතුය. (සපා කෑ යුතුය) යනු **දන්තවිඛාදනය,** ගෙලෙන් ගිලිය යුතුය යනු **ගලජ්ඣොහරණීය** ය, දැන් එය කෘත්‍යය වශයෙන් දක්වන්නට **කවඤ්චිත්ථමහනං** යනු කීය. මූලඵලාදිය හෝ බත් කොමු (පිට්ටු) ආදිය හෝ ගිලිනු ලැබූ ඒ කුස වනාහි පිම්බෙයි. මේ ඒ ආහාරයාගේ කෘත්‍යයයි. **යාය ඔජාය සත්තා යාපෙනති** යැයි යට සියලු පදයන්ගෙන් සවස්තුක ආහාරය දක්වා දැන් නිපදවන ලද ඕජාවම දක්වන්නට මෙය කියන ලදී. මෙහි වනාහි වස්තුවේ කෘත්‍යය කිම? ඕජාවෙහි උවදුරු හරණය පාලනය කිම? වස්තුව වනාහි උවදුරු හරණය කරයි. පාලනය කරන්නට නොහැක්කේ වෙයි. ඕජාව පාලනය කරයි. උවදුරු හරණය කරන්නට නො හැක්කේ වෙයි. දෙදෙනා ම එක් ව පාලනය කරන්නටත් උවදුරු හරණය කරන්නටත් හැකිවෙත්. මේ පරිස්සය නම් කවරෙක් ද? කර්මජ තේජසයි. කුස තුළ බත් ආදී වස්තුවක් නැතිකල්හි කර්මජ තේජස පැන නැගී උදර පටලය ගනී. බඩගිනි වූයෙමි. මට අහරක් දෙවයි කියවයි. අනුභව කළ කල්හි උදරපටලය මුදා වස්තුව ගනී. ඉක්බිති සත්ත්වයා එකග (සිත් ඇත්තේ) වෙයි. යම්සේ වනාහි (ඡායා රකුසෙක්) ඡායාවට පිවිසියකු ගෙන දිවසැකිල්ලෙන් බැඳ තමාගේ භවංගයෙහි සතුටුවන්නේ සාගිනි කල්හි අවුත් හිස ඩැහැගනී. ඩැහැගත් බැවින් හෙතෙම කෑගසයි. ඒ කෑගැසීම අසා මෙහි දුකට පැමිණියෙක් ඇතැයි ඒ ඒ දෙසින් මිනිස්සු එති. ඒ රකුසා ආ ආ අය ගෙන කා භවනයෙහි සතුටු වෙයි. මෙය ද එසේයැයි දතයුතුයි.

කර්මජ තේජස ඡායා රකුසා මෙනි. උදරපටලය දිවහැකිල්ලෙන් බැඳ තැබූ සත්ත්වයා මෙනි. බත් ආදී වස්තු නැවත ආ මිනිසුන් මෙනි.

කර්මජ තේජස වස්තුවෙන් මිදුණු උදරපටලය ගැනීම (සිය භවනයෙහි සතුටු වන්නහු විසින් සාගිනි කාලයෙහි) බැස හිස ඩැහැගැනීම මෙනි. ආහාර දෙවයි කියන කාලය ඩැහැගනු ලැබූවහු කෑගසන කාලය මෙනි. කර්මජ තේජස උදරපටලය මුදා වස්තුව ගත්කල්හි එකඟ වූ සිත් ඇති බව ඒ සංඥාවෙන් ආ ආ අය ගෙන කා භවනයෙහි සතුටුවන කාලය මෙනි. එහි ඖළාරික වස්තුවෙහි ඕජාව ඔදව වෙයි. සියුම් වස්තුවෙහි බලවත්ය. කුරක්කන් බත් ආදිය අනුභව කළ මොහොතකින්ම බඩගිනි වෙයි. ගිතෙල් ආදිය බී සිටියහුට දවස ම බත් රුචි නො වේ. මෙහි ද ඒ ඒ උපාදායයන්ගෙන් ඖළාරික සුඛුමතාව දතයුතුයි.

කිඹුලන්ගේ ආහාරය උපමාවට ගෙන මොනරුන්ගේ ආහාරය සියුම්ය. කිඹුල්ලු වනාහි ගල් ගිලිත්. ඒ ගල් ඔවුන්ගේ කුසට පැමිණ දියවෙයි. මොනරු සර්පගෝනුසු ආදී ප්‍රාණීන් කති. මොනරුන්ගේ ආහාරය උපමාවට ගෙන කළුහිස් වලසුන්ගේ ආහාරය සියුම්ය. ඔව්හු වනාහි තෙවසකට පෙර ඉවත දැමූ අං මෙන් ම ඇට ද කති. ඒවා ද ඔවුන්ගේ කෙළවලින් තෙමුණු පමණින් ම අලමුල් මෙන් මෘදු වෙයි. කළුහිස් වලසුන්ගේ ආහාරය උපමාවට ගෙන ඇතුන්ගේ ආහාරය සියුම්ය. ඔව්හු නො යෙක් වෘක්ෂ ශාඛාදිය කති. ඇතුන්ගේ ආහාරයට වඩා ගවර ගෝන මුව ආදීන්ගේ ආහාරය සියුම්ය. ඔව්හු නිසරු නොයෙක් වෘක්ෂ පර්ණාදිය කති. ඔවුන්ගේ ද ආහාරයට වඩා ගවයින්ගේ ආහාරය සියුම්ය. ඔව්හු තෙත් වියළි තෘණ කති. ඔවුන්ගේ ආහාරයට වඩා සාවුන්ගේ ආහාරය සියුම්ය. සාවුන්ගේ ආහාරයට වඩා පක්ෂීන්ගේ ආහාරය සියුම්ය. පක්ෂීන්ගේ ආහාරයට වඩා පිටිසර වාසීන්ගේ ආහාරය සියුම්ය. පිටිසර වාසීන්ගේ ආහාරයට වඩා ගම්මුලාදෑනීන්ගේ ආහාරය සියුම් ය. ගම්මුලාදෑනීන්ගේ ආහාරයට වඩා රාජරාජ මහාමාත්‍යාදීන්ගේ ආහාරය සියුම් ය. ඔවුන්ගේ ආහාරයටත් වඩා සක්විති රජුන්ගේ ආහාරය සියුම් ය. සක්විති රජුන්ගේ ආහාරයට වඩා චාතුර්මහාරාජික දෙවියන්ගේ ආහාරය සියුම් ය. මෙසේ පරනිර්මිත වසවර්ති දෙවියන්ගේ ආහාරය තෙක් විස්තර කළයුතුයි. ඔවුන්ගේ ආහාරය වනාහි සියුම්ම යැයි නිමාවට පැමිණියේ ය. ලක්ෂණාදී වශයෙන් ද කබළීකාර ආහාරය ඕජාව ලක්ෂණකොට ඇත්තේ ය. රූප ඉපදවීම රසයකොට ඇත්තේ ය. උපකාර වීම එළඹසිටි කාරණය කොට

ඇත්තේ ය. පිඬුකොට ගතයුතු වස්තු ආසන්න කාරණය කොට ඇත්තේ යැයි දතයුතුයි.

නො උපාදා නිර්දේශයෙහි යම්සේ උපාදාරූපය ගනු ලැබේ ම ද අනිකෙකු විසින් ගනු නො ලැබේ ද, මෙසේ මෙය ගනු නො ලැබේ හෝ යනු = **නො උපාදා** ය. ස්පර්ශ කළයුතුයි යනු = **පොට්ඨබ්බං** ය. ස්පර්ශ කොට දතයුතුය යන අර්ථයි. පොට්ඨබ්බයත් ආයතනයත් එය ය යනු = **පොට්ඨබ්බායතනයයි.** ආපය ද නිරිසත්ව ශූන්‍යතා ස්වභාවාර්ථයෙන් ධාතුවද එයය යනු = **ආපොධාතු** ය. දැන් යම්හෙයකින් රූපත්‍රය ස්පර්ශ කොට දතයුතුද, එහෙයින් ඒවා බෙදා දක්වන්නට **කතමං තං රූපං පොට්ඨබ්බායතනං පඨවිධාතු** යනාදිය කීය. එහි පෘථුවිධාතුව කර්කශත්වය ලක්ෂණකොට ඇත්තේය. පිහිටීම රසයකොට ඇත්තේය. පිළිගැනීම එළඹසිටි කාරණය කොට ඇත්තේ ය. **තෙජොධාතුව** උෂ්ණත්වය ලක්ෂණ කොට ඇත්තේ ය. පැසවීම රසයකොට ඇත්තේ ය. මෘදුබව ඉපදවීම එළඹසිටි කාරණය කොට ඇත්තේ ය. **වායෝධාතුව** පිම්බවීම ලක්ෂණකොට ැඅත්තේ ය. කම්පාවීම රසයකොට ඇත්තේ ය. පිටතට ගෙනයෑම එළඹසිටි කාරණය කොට ඇත්තේ ය. පළමු ආපෝධාතුව වනාහි වැගිරීම ලක්ෂණය කොට ඇත්තේ ය. වැඩීම රසයකොට ඇත්තේ ය. සංග්‍රහය එළඹසිටි කාරණය කොට ඇත්තේ ය. මෙහිදී වනාහි එකිනෙකා සෙසු තුනට ආසන්න කාරණයැයි දතයුතු යි.

**කක්ඛළං** යනු තදය, **මුදුකං** යනු නොතදය, මෘදු බවය. **සණ්හං** යනු මටසිලුටු බවය. **ඵරුසං** යනු රළුය, **සුඛසම්ඵස්සං** යනු සුඛවේදනාවට හේතු වූ ඉෂ්ට ස්පර්ශත්ව්‍යය, **දුක්ඛසම්ඵස්සං** යනු දුක්වේදනාවට හේතුවූ අනිෂ්ට ස්පර්ශිතව්‍යය, **ගරුකං** යනු බරය, **ලහුකං** යනු නො බරය. සැහැල්ලු යන අර්ථයි. මෙහි ද කක්ඛලං මුදුකං සණ්හං ඵරුසං ගරුකං ලහුකං යන පදවලින් පෘථුවිධාතුව ම බෙදන ලදී. යම්කලෙක මේ කය ආයුසහගත වූයේ ද උණුසුම් සහගත වූයේ ද විඥාන සහගත වූයේ ද වෙයි ද, එකල ලහුතර වූයේ ද මෘදුතර වූයේ ද කර්මණ්‍යතර වූයේ ද වෙයි. සූත්‍රාන්තයේ ද සැහැල්ලු වූ මෘදු වූ පෘථුවි ධාතුව සඳහා ම කියන ලදී. සුඛ සම්ඵස්සං දුක්ඛ සම්ඵස්සං යන පද දෙකෙන් වනාහි මහා භූතත්‍රය ම බෙදන ලදී. පෘථුවි ධාතුව සුඛ සම්ඵස්ස මෙන් ම දුක්ඛ සම්ඵස්ස ද වෙයි. තේජෝ ධාතු වායෝ ධාතු ද එසේ ය. එහි සුඛසම්ඵස්ස පඨවි ධාතුව මෘදු ළදරු අත් ඇති ළදරුවෙකු පාද සම්බාහනය කරනවිට ආස්වාදනය කර කර

දරුව, සම්බාහනය කරව, දරුව සම්බාහන කරව යි කියවන ආකාරයක් දක්වයි. සුඛ සම්ඵස්ස තේජෝ ධාතුව ශීත කාලයෙහි අඟුරු කබලක් ගෙන ශරීරය රත්කරද්දී ආස්වාදනය කරමින් (දරුව, රත්කරව) දරුව, රත්කරව යි කියවන ආකාරයක් දක්වයි. සුඛසම්ඵස්ස වායෝ ධාතුව උෂ්ණ සමයෙහි වත්සපත් ළදරුවෙකු විජිනිපතින් පවන් සලනවිට ආස්වාදනය කොට දැරව, පවන් සලවයි කියවන ආකාරයක් දක්වයි. තද අත් ඇති දරුවෙකු පා සම්බාහනය කරනවිට ඇට බිඳෙන කලෙක මෙන් වෙයි. හෙතෙමේ ද පහව යවයි කිවයුතු බවට පැමිණෙයි. උෂ්ණ සමයෙහි අඟුරු කබලක් ගෙන ආ විට එය ඉවත් කරවයි කිවයුතු බවට පැමිණෙයි. ශීත සමයෙහි විජිනිපතකින් පවන් සලනවිට ඉවතට යව, පවන් නොසලවයි කිවයුතු වෙයි. මෙසේ මොවුන්ගේ සුඛ සමඵසසතාවත් දුක්ඛ සම්ඵස්සතාවත් දතයුතුයි.

**යං ඵොට්ඨබ්බං අනිදස්සනං සප්පටිඝං** යනාදි නයින් කියන ලද සතර සතර නයින් සැදුණු තෙළෙස්වාර යට රූපායතනාදීන්හි කියන ලද නයින් ම දතයුතුයි. කිම, මේ තුන්මහා භූතයෝ එක්වරම ඉදිරියට පැමිණෙත් ද, නැතහොත් නො පැමිණෙත් ද, පැමිණෙත්. මෙසේ ආවාහු කායප්‍රසාදයෙහි ගැටෙත් ද (නො ගැටෙත් ද) යත්, ගැටෙත්. එක්වරම ඔවුන් අරමුණුකොට කාය විඥානය උපදී ද? නූපදී ද? නූපදී. වැළඳගැනීම් වශයෙන් හෝ තද වශයෙන් හෝ අරමුණු කිරීම වෙයි. එහි වැළඳ ගැනීම් වශයෙන් වනාහි පාත්‍රය බත් පුරවා ගෙනා කල්හි එක් බත් උළක් ගෙන තද ද මෘදුදැයි විමසනුයේ එහි තේජෝ ධාතුවත් වායෝ ධාතුවත් ඇතත් පඨවි ධාතුව ම වැළඳ ගනී. උණුදියෙහි අත ඔබා විමසනුයේ එහි පෘථුවි ධාතුවත් වායෝධාතුවත් ඇතත් තේජෝ ධාතුව ම වැළඳ ගනී. උණුසුම් සමයෙහි කවුළු හැර වාතයෙන් ශරීරය පහරමින් සිටියේ මඳ මඳව වාතය පහරද්දී එහි පෘථුවි ධාතුවත් තේජෝ ධාතුවත් ඇතත් වායෝ ධාතුව ම වැළඳ ගනී. මෙසේ වැළඳගැනීම් වශයෙන් අරමුණු කෙරේ නම්. යමෙක් පැකිළෙන්නේ හෝ හිසින් රුකක් පහරන්නේ හෝ, අනුභව කරන්නේ මැටි කැටයක් සපන්නේ හෝ වේ ද, හෙතෙම එහි තේජස ඇතත් වායුව ඇතත් බහුල වශයෙන් පෘථුවි ධාතුව ම අරමුණු කෙරේ. ගිනි පාගනුයේ එහි පෘථුවි ධාතුව ඇතත් ආපෝ ධාතුව බහුල වශයෙන් තේජෝධාතුව ම අරමුණු කෙරේ. බලවත් වාතය කන්පෙත්ත පැහැර බිහිරිබව කරද්දී එහි පෘථුවි ධාතුව ඇතත් තේජෝ ධාතුව ඇතත් බහුල වශයෙන් වනයෙන් වනාහි වායෝ ධාතුවම අරමුණු කෙරේ. යම්කිසි

ධාතුවක් අරමුණු ගන්නහුට කායවිඥානය ද එකවර නූපදී. ඉදිකටු මිටියකින් විදිනු ලැබූවහුට එක්වර කය ගැටෙයි. යම් යම් තැනෙක කායප්‍රසාදය බහුල වේද ඒ ඒ තැන කායවිඥානය උපදී. යම් යම් තැනෙක ප්‍රතිසට්ටනය ඉලීම බලවත් වේද ඒ ඒ තැන පළමුව උපදී. කුකුළුපතින් වණය සෝදනු ලබන කල්හි ද අංසු අංසු වශයෙන් කායප්‍රසාදය ගැටෙයි.

යම් යම් තැනෙක කායප්‍රසාදය අධික වේ. ඒ ඒ තැන කායවිඥානය උපදී. මෙසේ උස්සද වශයෙන් අරමුණු කෙරෙයි. උස්සද වශයෙන් ම කාය විඥානය ද උපදී නම් වේ. සිත කෙසේ නම් අරමුණෙන් සංක්‍රමණය වේද යත්, අදහස් වශයෙන් හෝ විෂය අධිකත්වයෙන් යන දෙයාකාරයෙන් වෙයි. විහාරපූජා ආදියේදී ඒ ඒ චෛත්‍යයන් මෙන් ම පිළිම ද වඳිමි. පොතලුකර්ම චිත්‍රකර්මයන් ද බලමියි යන අදහසින් ගියේ එකක් වැඳ හෝ බලා අනෙක වැඳීමට හෝ බැලීමට අදහස්කොට වඳින්නට බලන්නට ද යන්නේ ම ය. මෙසේ අදහස් වශයෙන් සංක්‍රමණය කරයි නම් වේ. කෛලාශකූට පර්වතය සමාන වූ මහසෑයක් බලමින් සිටියේ ද පසුව සියලු තූර්යවාදනය (පටන්) ගත්කල්හි රූපාරම්මණය අතහැර ශබ්දාරම්මණයට සංක්‍රමණය වෙයි. මනා සුවඳැති මල් සුවඳ ගෙනා කල්හි ශබ්දාරම්මණය අතහැර ගන්ධාරම්මණයට සංක්‍රමණය වෙයි. මෙසේ විෂය අධික භාවයෙන් සංක්‍රමණය වෙයි නම් වේ.

ආපෝධාතු නිර්දේශයෙහි ආපො යනු ස්වභාව නිර්දේශයයි. ආපය ම = ආපොගතං ය. තෙත්වීම වශයෙන් = **සිනෙහො** ය. සිනෙහය ම = **සිනෙහගතං** ය. **බන්ධනත්තං රූපස්ස** යනු පෘථුවිධාතු ආදී භූතරූප බඳිනා බවයි. ලෝපිඬු ආදිය ද ආපෝධාතුවෙන් සම්බන්ධ කර තද කරයි. එය සම්බන්ධ හෙයින් ඒ ලෝපිඬු තදවූයේ නම් වෙයි. පාෂාණ පර්වත තලඇට ඇත්දත් ගවඅං ආදියෙහි ද මේ නයම ය. මේ සියල්ල ම ආපෝ ධාතුවෙන් බැඳී තද වේ. ආපෝ ධාතුවෙන් බැඳුණු හෙයින් ම තද වෙයි. කිම පෘථුවිධාතුව සෙසු ධාතුන්ට පිහිට (වෙයි ද නො වෙයි යත්) වේ ද, ස්පර්ශ කොට වේ ද නැතහොත් ස්පර්ශ නො කොට වේ ද යත්, ආපෝධාතුව හෝ සෙසු ධාතුන් සම්බන්ධ කරනවිට ස්පර්ශකොට සම්බන්ධ කෙරේ ද, නැතහොත් ස්පර්ශ නොකොට ද, පෘථුවි ධාතුව වනාහි ආපෝධාතුව ස්පර්ශ නොකොට ම පිහිට වෙයි. තේජෝ ධාතුවෙන් ද වායෝධාතුවෙන් ද ස්පර්ශකොට පිහිට වෙයි. ආපෝධාතුව වනාහි පෘථුවි ධාතුව ද තේජෝ වායෝ ධාතුන් ද ස්පර්ශ නොකොට ම සම්බන්ධ

වෙයි. ස්පර්ශ කොට සම්බන්ධ වන්නේ නම් පොට්ඨබ්බායතනය නම් වන්නේ ය. තේජෝ ධාතු වායෝ ධාතූන්ගේ ද සෙසු ධාතූන්හි ස්වකීය ස්වකීය කෘත්‍යයන් කිරීමේදී මේ නය ම ය.

තේජෝ ධාතුව වනාහි පෘථුවි ධාතුව ස්පර්ශකොට දවයි. එය වනාහි උණුසුම් නො වී දැවෙයි. උණුසුම් ව දැවේ නම් උෂ්ණත්වය ලක්ෂණකොට ඇත්තේ නම් වන්නේ ය. ආපෝධාතුව වනාහි ස්පර්ශ නො කොට ම තවයි. එය ද තැවෙනුයේ උණුසුම් නොවීතැවේ. උණුසුම් ව තැවේ නම් උෂ්ණත්වය ලක්ෂණකොට ඇත්තේ නම් වන්නේ ය. (වායෝ ධාතුව වනාහි ස්පර්ශකොට ම තවයි. එය තැවෙනුයේ උණුසුම් නොවී තැවේ. උණුසුම් ව තැවේ නම්, උෂ්ණත්වය ලක්ෂණකොට ඇත්තේ නම් වෙයි.) වායෝධාතුව පෘථුවි ධාතුව ස්පර්ශකොට පුම්බයි. තේජෝධාතුවද එසේ ය. ආපෝධාතුව වනාහි ස්පර්ශ නො කොට ම පුම්බයි. උක්රස පිස පැණිපිඬු (සකුරු) කරද්දී ආපෝධාතුව තදවේද නො වේ ද යත්, නො වේ. එය වනාහි වැගිරෙන ලක්ෂණ ඇත්තේ ය. පෘථුවි ධාතුව කර්කශ ලක්ෂණ ඇත්තේ ය. අවමාත්‍ර ආපය අධිමාත්‍ර පෘථුවිගතික විය. එය වනාහි රසාකාරයෙන් සිටි බව අත්හරී. ලක්ෂණය අත් නො හරී. පැණිපිඬු දියවෙද්දී ද පෘථුවිධාතුව දිය නො වේ. පෘථුවිධාතුව වනාහි කර්කශ ලක්ෂණ ඇත්තේ ය. ආපෝධාතුව වැගිරෙන ලක්ෂණ ඇත්තේ ය. අවමාත්‍ර පෘථුවි ධාතුව අධිමාත්‍ර ආපෝගතික වෙයි. එය පිණ්ඩාකාරයෙන් සිටි බව අත්හරී. ලක්ෂණය අත් නොහරී. සතරමහාභූතයන්ගේ භාවය වනාහි වෙනස් ආකාර ම වෙයි. ලක්ෂණයන්ගේ වෙනස් බවක් නම් නැත. එහි අභාව අට්ඨාන පරිකප්ප සුත්තන්තයෙන් දක්වන ලදී. මෙය කියන ලද්දේ ම ය. 'සියා ඛොපනානන්‍ද චතුන්නං මහාභූතානං අඤ්ඤථත්තං, පඨවි ධාතුයා -පෙ- වායෝධාතුයා, නත්වෙව බුද්ධෙ අවෙච්චප්පසාදෙන සමන්නාගතස්ස අරියසාවකස්ස සියා අඤ්ඤථත්තං' යනුයි. මෙය වනාහි මෙහි අර්ථය 'ආනන්දය, පෘථුවි ධාතුව කර්කශ ලක්ෂණ ඇත්තේ ය. ආපෝධාතුව පරිවර්තනය වී වැගිරෙන ලක්ෂණය ඇත්තේ ආපෝධාතු නම් වන්නේ ය. ආර්යශ්‍රාවකයාගේ නම් වෙනස්වීමක් නැත්තේ ය' යනුයි. මෙසේ මෙහි අට්ඨානපරිකප්ප සූත්‍රයෙහි ආවේ ය.

මෙයින් පර උපාදින්න රූපාදි නිර්දේශයන් උපාදින්නාදීන්ගේ අර්ථය මාතිකා කථාවෙහි ආනයින් ම දතයුතුයි. චක්ඛායතනාදිය යට විස්තර කරන ලද්දේම ය. ඒ ඒ තැන්වල විශේෂ මාත්‍රය ම කියමි.

උපාදින්න නිර්දේශයෙහි වනාහි චක්ෂුරායතනාදිය ඒකාන්ත උපාදින්නක හෙයින් කියන ලදී. යම්හෙයකින් වනාහි රූපායතනාදිය ද උපාදින්න ද ඇත. (අනුපාදින්න ද ඇත) එහෙයින් ඒවා **යංවා පන** යැයි සංක්ෂේපයෙන් දක්වා නැවත **කම්මස්ස කතත්තා රූපායතනං** යනාදී නයින් විස්තර කරන ලදී. මේ උපායෙන් සියලු යේවාපනකයන්හි අර්ථය දතයුතුයි. කවරහෙයකින් වනාහි නිර්දේශයෙහි කම්මස්ස කතත්තා යැයි ද න කම්මස්ස කතත්තා යැයි ද ජරතාව ද අනිච්චතා ව ද (නො) ගන්නා ලදද යත්, **න කම්මස්ස කතත්තා** යන මෙහි වනාහි කර්මයෙන් වෙනත් ප්‍රත්‍යය හටගැනීම සංග්‍රහ කරන ලදී. **කම්මස්ස කතත්තා** යන මෙහි කම්ම සමුට්ඨාන ම ය. මේ රූප දෙක ද කර්මයෙන් හෝ වෙනත් රූපජනක ප්‍රත්‍යයකින් නූපදී. එහෙයින් නොගන්නා ලදී. එය ද ඔවුන්ගේ පැමිණීම ද පසුව පළවන්නේ ය. **අනුපාදින්නං** යන ආදීන්හි වනාහි හුදෙක් අනුපාදින්නාදි ග්‍රහණයෙන් කර්මදිසමුට්ඨානතා ප්‍රතික්ෂේප කරන ලදී. අන්‍ය ප්‍රත්‍ය සමුට්ඨානතාද අනුමත නොකරන ලදී. එහෙයින් එහිදී ගන්නා ලදැයි දතයුතුයි.

චිත්ත සමුට්ඨාන නිර්දේශයෙහි **කාය විඤ්ඤත්ති වචීවිඤ්ඤත්ති** යන මේ දෙක යම්හෙයකින් ඒකාන්ත චිත්ත සමුට්ඨාන භූතයන් සඳහා පැනේ ද එහෙයින් පරමාර්ථ වශයෙන් වනාහි එයට නිශ්‍රය වූ භූතයන් ම එය නිශ්‍රිත හෙයින් චිත්ත සමුට්ඨානයැයි කියන ලදී. යම්සේ අනිත්‍ය වූ රූපයට ජරාමරණ අනිත්‍ය නම් වේද, මෙසේ මෙය ද චිත්ත සමුට්ඨාන නම් විය. චිත්තසහභූත නිර්දේශයෙහි ද මේ නය ම ය. (සිත යම්තාක් ද ඒ තාක් පැනෙන හෙයින් මේ දෙක ම කියන ලදී. මෙය වනාහි සිත සමග සහභූතයන් මෙන් ද චේතනාදිය මෙන් ද නූපදී. සිත අනුව පරිවර්තනය වීමේදී ද මේ නය ම ය.)සිත යම්තාක් ද එතෙක් පැනෙන හෙයින් ම වනාහි මේ දෙක චිත්තානු පරිවත්ති යැයි කියන ලදී. **ඔළාරිකං** යනු වස්තුවට අරමුණු වූ ප්‍රසාදඝට්ටන වශයෙන් ගතයුතු හෙයින් ථූලය, කියන ලද්දට විපරීත වශයෙන් **සුඛුමං** (යනු) දතයුතුයි. **දූරෙ** යනු ඝට්ටන වශයෙන් නොගතයුතු හෙයින් දුර්විඥෙය භාවයෙන් සමීපයෙහි සිටියේ ද දූරෙ ය. අවනත වනාහි ඝට්ටන වශයෙන් ගතයුතු හෙයින් සුවිඥෙය භාවයෙන් දුර සිටියේ ද **සන්තිකෙය**. චක්ඛායතනාදී නිර්දේශ යට කියන ලද නයින් ම විස්තර වශයෙන් දතයුතුයි. මෙය වනාහි දෙවිදියකින් (දැක්වීම) රූපසංග්‍රහයෙහි විශේෂ මාත්‍රයෙකි, ත්‍රිවිධ සංග්‍රහය නොගැඹුරු අර්ථ ඇත්තේම ය. චතුර්ථ සංග්‍රහාවසානයෙහි දිට්ඨාදීන්ගේ පශ්චිම පදයාගේ භේදයක් නැති බැවින් මුලපටන් විචාරීමක් නො කොට ම

**රූපායතනං දිට්ඨං සද්දායතනං සුතං** යන ආදිය කියන ලදී. එහි රූපායතනය ඇසින් බලා දක්නට හැකියැයි **දිට්ඨං** නම් විය. ශබ්දායතනං කනින් අසා දැනගන්නට හැකියැයි **සුතං** නම් වීය. ගන්ධායතනාදී තුන ඝාණ ජිව්හා කායයන් විසින් පැමිණ ගතයුතු හෙයින් දැනගෙන දතයුතු හෙයින් **මුත** නම් විය. ස්පර්ශ කොට ද භූතෝත්පත්ති කාරණ හෙයින් මුත නමැයි ද කියන ලදී. සියලුම රූපය වනාහි මනෝවිඥානයෙන් දතයුතුයි යැයි **මනසා විඤ්ඤාතං** නම් විය.

පංචවිධ සංග්‍රහ නිර්දේශයෙහි **කක්ඛලං** යනු තදය, බර යනු ම බර **ගතය,** රළු යන අර්ථයි. ඉතිරි දෙක ද භාව නිර්දේශම ය. **අජ්ඣත්තිකං** යනු ස්වකීය ආධ්‍යාත්මය ම ය. **බහිද්ධා** යනු බාහිරය. **උපාදින්නං** යනු (න) කම්මසමුට්ඨාන ම ය. අවශේෂ වශයෙන් වනාහි මේ ග්‍රහණය ශරීරයෙහි පිහිටියහුටය. ශරීරයෙහි පිහිටියේ වනාහි උපාදින්නක වුවත් අනුපාදින්නක වුවත්, ආදින්නකයන් විසින් ගන්නා ලද පරාමර්ශන වශයෙන් සියල්ල ම උපාදින්න නම්. **තෙජොගතං** යනු සියලු තේජයන්හි ගිය, උෂ්ණත්ව ලක්‍ෂණ කොට ඇති තේජස ම හෝ තේජෝභාවයට ගියේ යනු = **තේජෝගතය. උස්මා** යනු උණුසුම් ආකාරයයි. **උස්මාගතං** යනු උණුසුම්බවට ගිය, මෙය උණුසුම් ආකාරයට නමකි. **උසුමං** යනු බලවත් උණුසුමයි. උණුසුම යනුම උණුසුමභාවයට ගියේ යනු = **උසුමගතං** ය. හැමීම් වශයෙන් **වායො** ය. වායුවම වායෝභාවයට ගියහෙයින් **වායොගතං** ය. **ථම්භිතත්තං** යනු වාතය පිරුණු උපුල් නළසම් ආදීන්ගේ මෙන් රූපයාගේ තදබවයි.

ඡබ්බිධාදී සංග්‍රහ තුනෙහි අවසාන පදයාගේ භේදයක් නැතිහෙයින් මුලපටන් නො විමසා ම නිර්දේශය කරන ලදී. එහි චක්‍ෂුර්විඥානයෙන් දැනගත හැකි යනු = **චක්ඛු විඤ්ඤෙය්‍යං** -පෙ- මනෝවිඥානයෙන් දැනගත හැකි යනු = මනොවිඤ්ඤෙය්‍යං ය. ත්‍රිවිධ මනෝවිඥානධාතුවෙන් දැනගත හැකි යනු = **මනොධාතු විඤ්ඤෙය්‍යං ය. සබ්බං රූපං** යන මෙහි මනෝ විඥාන ධාතුවෙන් දත නොහැකි එක ම රූපයක්වත් නැතිහෙයින් **සබ්බං රූපං** යැයි කියන ලදී. සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් වනාහි අභිධර්මයට පැමිණ නය කරන්නට යුතු තැන නය නො කරන ලද්දේ නම් නැත. මනෝවිඥාන ධාතුවෙන් නොදත යුතු එක ම රූපයකුදු නැති හෙයින් මෙය ද නය කරන්නට යුතු තැනක් නම් වෙයි. එහෙයින් නය කරනුයේ සබ්බං රූපං යැයි වදාළහ. **සුඛ සමඵස්සා** යනු සුඛවේදනා

ප්‍රතිලාභයට හේතු වූ, දුක්ඛ සමඵසෙසා යනු දුක්වේදනා ලැබීමට හේතු වූ, මෙහි ද සුඛදුඃඛ පිළිබඳ ස්පර්ශාරම්මණය වර්ණනා කිරීමට මේ නය දෙන ලදී. එහි ම (සප්පස) අප්පටිඝතාවෙන් දසකයෙහි නය දෙන ලදී. එකාදසකයෙහි අධෙඪාකාදස ආයතන බෙදන ලදී. ඔවුන්ගේ නිර්දේශවාර යට කියන ලද නයින් ම විස්තර වශයෙන් දතයුතු යි. සෙස්ස සියලුතැන්හි ප්‍රකට අර්ථ ඇත්තේ ම ය. මේ (රූපයන්හි) වනාහි අසම්මෝහය පිණිස 'සමොධානං සමුට්ඨානං පරිනිපඵන්නඤ්ච සංඛතං' යන මේ ප්‍රකීර්ණකය දතයුතුයි. එහි සමෝධානය යනු මේ සියලු ම රූපය සමෝධාන වශයෙන් චක්ෂුරායතනය -පෙ- කබලිකාර ආහාරය පොට්ඨබ්බායතනය ආපෝධාතුව යන පස්විසි ගණනක් වෙයි. එය වස්තුරූපයත් සමග ගණනින් විසිහයක් දතයුතුයි.

මෙයින් අන්‍ය වූ රූපයක් නම් නැත. ඇතැම් කෙනෙක් වනාහි මිද්ධරූපය නම් රූපයක් ඇතැයි කියති. ඔව්හු 'අද්ධා මුනිසි සම්බුද්ධො නත්‍ථි නීවරණා තවා' යනාදිය කියා මිද්ධරූපය නම් රූපයක් නැතැයි ප්‍රතිෂේධ කළයුත්තාහ. ඇතමෙක් වනාහි බලරූපය සමග සත්විස්සක් ද සම්භව රූපය සමග අටවිස්සක් ද ජාතිරූපය සමග විසිනවයක් ද රෝග රූපය සමග රූප සමතිසක්දැයි කියති. ඔව්හු ද එහි අභාවය වෙන් වශයෙන් දක්වා ප්‍රතික්ෂේප කළ යුත්තාහ. වායෝධාතුව ගත් කල්හි (බලරූපය ගන්නා ලද්දේම ය. අන්‍ය වූ) බලරූපයක් නම් නැත. ආපෝ ධාතුවෙන් යම් භව රූපයත් උපචය සන්තතීන්ගෙන් ජාතිරූපයත් ජරතා අනිච්චතා වලින් රෝග රූපයත් ගන්නා ලද්දේම ය. අන්‍ය වූ රෝග රූපයක් නම් නැත. කර්ණරෝගාදී යම් ආබාධයක් වේ නම්, එය ද විෂම ප්‍රත්‍යයෙන් හටගත් ධාතු මාත්‍රයක්ම ය. එහි අන්‍ය වූ රෝගයක් නම් නැත. එය සමෝධානයෙන් රූප සවිස්සක් මය. සමුට්ඨාන රූප යනු කෙතෙක්ද, ඒකසමුට්ඨාන දසයකි. ද්විසමුට්ඨාන එකකි. තිසමුට්ඨාන තුනකි. චතුසමුට්ඨාන නවයකි. කිසිවකිනුත් දෙකක් නොහටගැනේ. එහි චක්ෂුප්‍රසාදය -පෙ- ජීවිතේන්ද්‍රිය යන මේ අට ඒකාන්තයෙන් කර්මයෙන් හටගනී. කායවිඤ්ඤත්ති වචී විඤ්ඤත්ති යන දෙක ඒකාන්තයෙන් සිතින් හටගනීයැයි මේ දහය ඒකසමුට්ඨාන නමි. ශබ්දය ඍතුවෙනුත් සිතිනුත් හටගනීයැයි එකක් ද්විසමුට්ඨාන නම් වෙයි. එහි අවිඥානක ශබ්දය ඍතුවෙන් හටගනී. සවිඥානක ශබ්දය සිතින් ද, ලහුතාදී තුන වනාහි ඍතු චිත්ත ආහාරයන්ගෙන් හටගනීයැයි මේ තුන තිසමුට්ඨාන නම් වේ. අවශේෂ නවරූප ඔවුන්ගෙනුත් කර්මයෙනුත් දැයි සතරකින් හටගනීයැයි

(මේ) නවය චතුසමුට්ඨාන නම්. ජරතා අනිච්චතා දෙක වනාහි මේ එකකින්වත් නූපදී. මේ දෙක කිසිවකිනුත් නො හටගනී නම්, කවර හෙයින් ද? නො හටගන්නා හෙයිනි. මේවා නොහට ගනී. කවර හෙයින් ද? පාකභේදය නිසා ය. උපන්නා වූ රූපය හෝ අරූපය බිඳේ යන මෙය වනාහි අවශ්‍යයෙන් පිළිගත යුතු ය. උපන්නා වූ රූපයේ හෝ අරූපයේ ක්‍ෂය වීමක් පෙනේ. යම්තාක් නො බිඳේද එතෙක් එහි පාරිපාකය වේ යන මෙය සිදුවෙයි. හටගත්තහුගේ පාකභේදත්‍වයෙන් යනුයි. ඉදින් ඒවා උපදී නම් ඒවායේ පාකභේදය වන්නේ ය. පැසුණේ නො පැසෙයි. බිඳුණේ හෝ නො බිඳෙයි යන හටගත්තහුගේ පාකභේදයෙන් මේ දෙක හට නො ගනී.

එහි මෙසේ වන්නේ ය. යම් සේ කම්මස්ස කතත්තා යන ආදි නිර්දේශයන්හි **රූපස්ස උපචයො රූපස්ස සන්තති** යන වචනයෙන් ජාතිය හටගනී. පිළිගන්නා ලද්දේ වෙයි. මෙසේ පාකය ද පැසේවා. භේදය බිඳේවා යි එහි ජාතිය හටගනී යැයි නො පිළිගන්නා ලදී. යම් (ධර්මයෝ) වනාහි කර්මාදියෙන් උපදිත් ද, ඒවා හටගැනීමෙන් ජාතියට එය ප්‍රත්‍යය යන ව්‍යවහාරය අනුමතය. පරමාර්ථ වශයෙන් වනාහි උපදින්නහුට අභිනිෂ්පත්තිමාත්‍රය ජාති වේ.

එහි දී මෙසේ වන්නේ ය. යම්සේ වනාහි ඉපදීම යම් ධර්මයක අභිනිෂ්පත්ති යැයි ද, එහි හේතුව නැති වීම ද අභිනිෂ්පත්ති ව්‍යවහාරය ද ලබයි. පාක භේදය ද එසේ ය. යම් දහමක පාකභේදය ද එහි හේතුව නැසීමෙන් අභිනිෂ්පත්ති ව්‍යවහාරය ලබයි. මෙසේ මේ කරුණු දෙක කර්ම ආදියෙන් හටගන්නේ යැයි කී බැවින් පාක භේදයෝ ඒ නම නොලබති. කවර හෙයින් ද? ඒවා පහළවීමට හේතුවන කර්ම ආදි ප්‍රත්‍ය ඇති බැවිනි. ජනක ප්‍රත්‍යයන්ගෙන් උපන් විටම ඒවාට ආනුභාවය වෙයි. එයින් පසුව එම හේතු නිසා මතුවට උපදින දෙයට අභිනිෂ්පත්ති ව්‍යවහාරය නොලබයි. ඒ මොහොතේ ලබන ස්වභාවය එයට ලැබෙන බැවිනි. ඉතිරි ධර්ම දෙක නැතැයි සිතා හට නොගනී යයි නොකිය යුතු ය. '**ජරාමරණං භික්ඛවෙ අනිච්චං සංඛතං පටිච්ච සමුප්පන්නං**' යයි කී හෙයින් මේ දෙකෙහි ඉපදීම (ජරා මරණ) නොවේ. පර්යාය වශයෙන් දේශනා කරන ලද හෙයින් එහි ප්‍රත්‍යයන් නිසා හටගත් ජරා මරණ හටගත්තේ යැයි කියන ලදි. එසේ නම් මේ තුනත් නූපන් බැවින් අඟක් මෙන් මුලින් නො පෙනේද? නිවන මෙන් හෝ නිත්‍ය ද නැත. මන්ද, ඒවාට සම්බන්ධ පැවැතුම් ඇති

බැවිනි. ඉපදීමට හේතු ද ඇති බැවිනි. පෘථුවි ආදින්ගේ ඉපදීමට ජාති ආදි හේතු තුනක් පෙනෙයි. යම්හෙයකින් ඒවා නැතිනම් ඔවුන්ගේ අභාවයෙන් නොපෙනීමද, නිත්‍ය නොවීමද වේ. මෙය ද අභිනිවේෂය ප්‍රතිශේධ කිරීමට කියන ලද්දකි. 'ජරාමරණං භික්ඛවෙ, අනිච්චං සංඛතං පටිච්ච සමුප්පන්නං' යන මේ කියමනට අනුව ඒ (ජරා-මරණ) රූප දෙක හට නොගනී යයි දතයුතුය.

තව ද සමුට්ඨානං යන මෙහි මේ අන්‍ය වූ ද අර්ථයෙකි. මේ එහි මාතෘකාවයි. කර්මජය කර්මප්‍රත්‍යය කර්මප්‍රත්‍යය ඍතු සමුත්ථානය, ඍතු සමුත්ථාන ඍතු ප්‍රත්‍යය ඍතු ප්‍රත්‍යය ඍතු ප්‍රත්‍යය ඍතු සමුත්ථානය යනුයි. සමුත්ථාන චිත්ත ප්‍රත්‍යය චිත්ත ප්‍රත්‍යය චිත්ත ප්‍රත්‍යය ඍතු සමුත්ථානය යනුයි.

එහි හෘදය වස්තුවත් සමග චක්ෂු ප්‍රසාදාදී අෂ්ටවිධ රූප කර්මජ නම්. කෙස් රැවුලු ඇත්දත් අස්වලිග සෙමර වලිග යන මේ ආදිය කර්මප්‍රත්‍යය නම්. චක්‍රරත්නය දෙවියන්ගේ උයන් විමාන (ආදිය) ද යන මේ ආදිය කර්මප්‍රත්‍යය ඍතු සමුත්ථාන නම්. ආහාරයෙන් හටගත් ශුද්ධාෂ්ටකය ආහාර සමුත්ථාන නම්. කබළිකාර ආහාරය රූප සන්තති දෙකට ද ආහාර සමුත්ථානයට හා උපාදින්නයට ද ප්‍රත්‍යය වෙයි. ආහාර සමුත්ථානයට ජනක ව ප්‍රත්‍යය වෙයි. කර්මජයට අනුපාලක (වීදැයි) ප්‍රත්‍යය වේ. ආහාරානුපාලිත මේ කර්මජරූපය ආහාරප්‍රත්‍යය නම් වේ. විසභාග ආහාර සේවනය කොට අව්වේ යන්නාට (තිලක) කාළකුෂ්ටාදිය උපදී. මේ ආහාර ප්‍රත්‍යය ඍතු සමුත්ථාන නම්. ඍතුවෙන් හටගත් ශුද්ධාෂටකය ඍතු සමුත්ථාන නම්. එහිදී ඍතුව අන්‍ය වූ අෂ්ටකයක් උපදවයි. මෙය ඍතුප්‍රත්‍යය නම්. එහිදී ද අන්‍ය අෂ්ටකයක් උපදවයි. මෙය ඍතුප්‍රත්‍යය ඍතු සමුත්ථාන නම්.

මෙසේ සන්තති තුනම සට්ටන කරන්නට හැකිවෙයි. ඉන් මත්තෙහි නොවේ. මේ අර්ථය අනුපාදින්නකය සමග ද දක්වන්නට වටී. වලාකුල ඍතු සමුත්ථාන නම්. වැසි දහර ද ඍතුප්‍රත්‍යය නම්. වැසි වට කල්හි බීජ වැඩෙයි. පෘථුවි ගන්ධය මුදයි. පර්වත නිල්ව පෙනේ. සමුද්‍රය වැඩෙයි. මෙසේ ඍතු ප්‍රත්‍යය ඍතු සමුත්ථාන නම් වේ.

සිතින් උපන් ශුද්ධාෂටකය චිත්ත සමුට්ඨාන නම්. පසුව හටගත් චිත්ත චෛතසික ධර්මයෝ පළමුව උපන් මේ කයට පච්ඡා ත ප්‍රත්‍ය වශයෙන් ප්‍රත්‍යය වේදැයි මේ චිත්ත ප්‍රත්‍යය නම්. අන්තරීක්ෂ නම් වූ අහසෙහි ඇතෙකුදු දැක්වෙයි. අසෙකුදු දැක්වෙයි. රියකුදු දැක්වෙයි. විවිධ සෝතව්‍යුහද දැක්වෙයි. මේ චිත්තප්‍රත්‍යය ඍතුසමුට්ඨාන නම්.

පරිනිප්ඵන්තිං යනු පසළොස් රූපයෝ පරිනිෂ්පන්නයෝ නම් වෙති. දශ රූපයෝ අපරිනිෂ්පන්නයෝ නම් වෙති. දශ අපරිනිෂ්පන්නයෝ අසංඛතයෝ නම් වන්නාහු ද ඒ රූපයන්ගේ ම කායවිකාරය කාය විඤ්ඤත්ති නම් වෙයි. වචී විකාරය වචී විඤ්ඤත්ති නම් වෙයි. ඡිද්‍රය විවරය ආකාශධාතු නම් වෙයි. ලහුභාවය ලහුතා නම්. මෘදුභාවය මුදුතා නම්. කර්මණ්‍යභාවය කම්මඤ්ඤතා නම්. ඉපදීම උපචය නම්. පැවැත්ම සන්තති නම්. ජීරණාකාරය ජරතා නම්. ඇතිවී නැතිවන ආකාරය අනිච්චතා නමැයි පරිනිෂ්පන්න සියල්ල සංඛත ම වේ යනුයි.

## අට්ඨසාලිනී ධම්මසංගණී අට්ඨකථාවෙහි

## රූපකාණ්ඩ වර්ණනාව නිමියේ ය.

මෙතෙකින් සියලු කුශලාදී ධර්මයන්ගේ පදභාජන නයින් කුශලත්‍රිකය විස්තර කරන ලද්දේ වෙයි. යම් හෙයකින් වනාහි කුශලත්‍රිකය පිළිබඳ යම් ඒ විභාජනනයක් කියන ලද ද, අවශේෂ ත්‍රික ද්විකයන්ගේ ද මේ විභාජනය ම වෙයි. යම්සේ වනාහි මෙහි මෙසේ 'කතමෙ ධම්මා සුඛාය වෙදනාය සම්පයුත්තා යස්මිං සමයෙ කාමාවචරං උප්පන්නං හොති සොමනස්සසහගතං ඤාණ සම්පයුත්තං රූපාරම්මණං වා -පෙ- යෙවාපන තස්මිං සමයෙ අඤ්ඤෙපි අත්ථි පටිච්ච සමුප්පන්නා අරූපිනො ධම්මා ඨපෙත්වා වෙදනාක්ඛන්ධං, ඉමෙ ධම්මා සුඛාය වෙදනාය සම්පයුත්තා' යනාදී වශයෙන් අනුක්‍රමයෙන් සියලු ත්‍රික ද්විකයන්හි පණ්ඩිතයන් විසින් විභාජනනය සලකන්නට හැකි ය. එහෙයින් විස්තර දේශනාව බැහැරකොට ඉතා සංක්ෂේප ද විස්තර ද නො වූ අන්‍ය නයකින් සියලු ත්‍රික ද්වික ධර්ම

විභාගය දක්වන්නට කතමෙ ධම්මා කුසලා යැයි නික්ෂේප කාණ්ඩය පටන්ගන්නා ලදී. චිත්තෝත්පාද කාණ්ඩය වනාහි විස්තර දේශනාවකි. අර්ථකථාව සංක්ෂේප දේශනාවකි. මේ නික්ෂේප කාණ්ඩය වනාහි චිත්තෝත්පාද කාණ්ඩය සලකා සංක්ෂේපයැයි ද අර්ථකථා කාණ්ඩය සලකා විස්තරයැයි ද සංක්ෂේප විස්තර ස්වභාවය ඇත්තේ වෙයි. ඒ මේ විස්තර දේශනාව තබා දේශනා කළ හෙයින් ද යට කියන ලද කාරණ වශයෙන් ද නික්ෂේප කාණ්ඩය නමැයි දතයුතුයි. මෙය ද කියන ලද්දේය.

**මූලතො ඛන්ධතො චාපි ද්වාරතො චාපි භූමිතො**
**අත්ථතො ධම්මතො චාපි නාමතො චාපි ලිංගතො**
**නික්ඛිපිත්වා දෙසිතත්තා නික්ඛෙපොති පවුච්චතී ති**

මූල වශයෙන් ද ස්කන්ධ වශයෙන් ද ද්වාර වශයෙන් ද භූමි වශයෙන් ද අර්ථ වශයෙන් ද ධර්ම වශයෙන් ද නාම වශයෙන් ද ලිංග වශයෙන් ද නික්ෂේපකොට දේශනා කළ හෙයින් නික්ෂේපයැයි කියනු ලැබේ.

මෙය වනාහි තීණි කුසලමූලානි යන ආදීනයින් මූල වශයෙන් නික්ෂේප කොට දේශනා කරන ලදී. තංසම්පයුත්තං වෙදනාක්ඛන්ධො යැයි ස්කන්ධ වශයෙන් ද, තං සමුට්ඨානං කායකම්මං යැයි ද්වාර වශයෙන් ද, කායද්වාර පවත්තං හා කම්මං කාය කම්මන්ති වුච්චති, සුඛභූමියං කාමාවචරෙ යනාදී නයින් භූමි වශයෙන් ද නික්ෂේපකොට දේශනා කරන ලදී. ඒ ඒ තැන්හිදී වනාහි අර්ථ ධර්ම ලිංග නාමයන්ගේ වශයෙන් දේශනා කරන ලද හෙයින් අර්ථාදිය නික්ෂේප කොට දෙසන ලද නමැයි දතයුතුයි.

එහි කුශලපද නිර්දේශයෙහි වනාහි **තීණි** යනු ගණන පරිච්ඡේදයයි. කුශල වූයේත් ඒවාය. මූල වූයේත් ඒවාය. කුශල ධර්මයන්ගේ හේතුප්‍රත්‍ය ප්‍රභව ජනක සමුත්ථාන නිවෘත්ති කර්මාර්ථයෙන් මූල යනු = **කුසල මූලානිය.** මෙසේ අර්ථ වශයෙන් දක්වා දැන් නම් වශයෙන් දක්වන්නට **අලොභො අදොසො අමොහො** යැයි කීය. මෙතෙකින් මූලයෙන් තොර කුශලයක් නැතිහෙයින් ධර්මරාජන් වූ භාග්‍යවතුන් වහන්සේ චතුර්භූමක කුශලය මූලත්‍රය සමග සම්පූර්ණයෙන් ගෙන දැක් වූ සේක. **තංසම්පයුත්තා** යනු

ඒ අලෝභාදියසමග සම්ප්‍රයුක්ත වූ, එහි අලෝභය සමග සම්ප්‍රයුක්ත සංස්කාරස්කන්ධයෙහි අදෝෂ අමෝහයෝ ද අලෝභය සමග සම්ප්‍රයුක්ත සංස්කාරස්කන්ධ ග්‍රහණයට ම යති. අවශේෂ ද්වය වශයෙන් සම්ප්‍රයෝගයෙහි ද මේ නය ම ය. ධර්මරාජන්වූ බුදුරජාණන් වහන්සේ මෙසේ චාතුර්භූමක කුශලය නැවත සම්ප්‍රයුක්තක චතුස්කන්ධ වශයෙන් හාත්පසින් ගෙන දැක්වූ සේක. **තංසමුට්ඨානං** යනු එකී අලෝභාදියෙන් හටගත්, මේ නයින් ද බුදුරජාණන් වහන්සේ එම චාතුර්භූමක කුශලය ම ත්‍රිවිධ කර්මද්වාරයන්ගේ වශයෙන් හාත්පසින් ගෙන දැක්වූ සේක. මෙසේ ද වනාහි කුශලය ස්ථාන තුනක හාත්පසින් ගෙන දක්වන ලදී. අකුශලයෙහි ද මේ නය ම ය. බුදුරජාණන් වහන්සේ දොළොස් අකුසල සිත්වලින් එකක්වත් මූලයෙන් මිදුණේ නම් නැතැයි මූලය සමග හාත්පසින් ගෙන දැක්වූ සේක.

භාග්‍යවතුන් වහන්සේ සම්ප්‍රයුක්ත චතුෂ්ක ස්කන්ධයෙන් උඩ අකුසලයෙක් නම් නැතැයි ඒ දොළොස් අකුසල සිත් ම චතුෂ්ක ස්කන්ධ වශයෙන් හාත්පසින් ගෙන දැක්වූ සේක. භාග්‍යවතුන් වහන්සේ කායකර්මාදී වශයෙන් වනාහි ඔවුන්ගේ ප්‍රවෘත්ති ස්වභාවයෙන් කර්මද්වාර වශයෙන් හාත්පසින් ගෙන දැක්වූ සේක. මෙහි වනාහි **තදෙකට්ඨා කිලෙසා** යන ආදිය කියන ලද ද, එහි එක් සිතෙක හෝ පුද්ගලයෙකු කෙරෙහි සිටියේ යනු ඒකට්ඨය. එහි එක් සිතෙක සිටියේ සහජෙකට්ඨ නම් වෙයි. එක් පුද්ගලයෙකු කෙරෙහි සිටියේ පහාණෙකට්ඨ නමි. ඒ ලෝභාදිය සමග හෝ අනෙකෙක සමග හෝ ඒ ඒ තැන දක්වන ලද්ද සමග එක්තැනෙක සිටියේ යනු **තෙදෙකට්ඨං** ය.

එහි 'කතමෙ ධම්මා සංකිලිට්ඨ සංකිලෙසිකා, තීණි අකුසල මූලානි ලොභො දොසො මොහො, තදෙකට්ඨා ච කිලෙසා' යැයි සංකිලිෂ්ට ත්‍රිකයෙහි ද, 'කතමෙ ධම්මා හීනා තීණි අකුසලමූලානි ලොභො දොසො මොහො තදෙකට්ඨා ච කිලොස' යැයි හීනත්‍රිකයෙහි ද, 'කතමෙ ධම්මා අකුසලා, තීණි අකුසලමූලානි ලොභො දොසො මොහො, තදෙකට්ඨා ච කිලෙසා' කිලෙසා යැයි මේ කුශලත්‍රිකයෙහි ද, 'කතමෙ ධම්මා සංකිලිට්ඨා, තීණි අකුසලමූලානි ලොභො දොසො මොහො තදෙකට්ඨා ච කිලෙසා' යැයි සංකිලෙස ගොච්ඡකයෙහි ද, 'කතමෙ ධම්මා සරණා, තීණි අකුසලමූලානි ලොභො දොසො මොහො තදෙකට්ඨා ච කිලෙසා' යැයි සංකිලෙස ගොච්ඡකයෙහි ද, 'කතමෙ ධම්මා සරණා, තීණි අකුසල මූලානි

ලොභො දොසො මොහො තදෙකට්ඨා ච කිලෙසා' යැයි සරණා ද්විකයෙහි මෙකී මෙතෙක් තැන්වල සහජේකට්ඨය ආවේ ය.

දස්සනෙන පහාතබ්බත්තිකයෙහි වනාහි 'ඉමානි තීණි සංයොජනානි තදෙකට්ඨා ච කිලෙසා' යැයි ද (දස්සනෙන පහාතබ්බ හෙතුකත්තිකයෙහි ද 'ඉමානි තීණි සංයොජනානිතදෙකට්ඨා ච කිලෙසා' යැයි ද) නැවත එහි ම 'තීණි සංයොජනානි සක්කායදිට්ඨි විචිකිච්ඡා සීලබ්බත පරාමාසො, ඉමෙ ධම්මා දස්සනෙන පහාතබ්බා, තදෙකට්ඨා ච කිලෙසා ලොභො දොසො මොහො ඉමෙ ධම්මා දස්සනෙන පහාතබ්බහෙතූ, (තදෙකට්ඨා ච කිලෙසා තං සම්පයුත්තො වෙදනක්ඛන්ධො -පෙ- විඤ්ඤාණක්ඛන්ධො තං සමුට්ඨානං කායකම්මං වචීකම්මං මනොකම්මං, ඉමෙ ධම්මා දස්සනෙන පහාතබ්බහෙතුකා යැයි) සම්‍යක් ප්‍රධාන විභංගයෙහි 'තත්ථ කතමෙ ධම්මා පාපකා අකුසලා ධම්මා තීණි අකුසලමූලානි ලොභො දොසො මොහො තදෙකට්ඨා ච කිලෙසා' යැයි මෙකී මෙතෙක් තැන්වල පහාණෙකට්ඨය ආවේයැයි දතයුතුයි. අව්‍යාකෘත නිර්දේශයෙහි ප්‍රකට කරන ලද අර්ථ ඇත්තේ ම යැ. මෙකී ත්‍රිකයෙහි ත්‍රිලක්ෂණ ප්‍රඥප්තිත්‍රය කසිණය ඉගිළූ අහහ අජාකාසය ආකිඤ්චඤ්ඤායතන අරමුණ නිරෝධ සමාපත්තිය ද නොලබයි යැයි කියන ලදී.

වේදනාත්‍රික නිර්දේශයෙහි සුඛභූමි යන මෙහි යම්සේ තාමුභූමි කෘෂ්ණභූමි යැයි ද තාමුකෘෂ්ණභූමි යැයි ද කියත්. මෙසේ සුඛය ද සුඛභූමි නම්. යම් සේ උච්ඡුභූමි සාලභූමි යැයි උක් හැල් උපදනා තැන් කියත් ද, මෙසේ සැපයට උත්පත්තිස්ථාන වූ සිත ද සුඛභූමි නම්. මෙහිදී එය අදහස් කරන ලදී. යම්හෙයකින් වනාහි එය කාමාවචරයෙහි හෝ රූපාවචරයෙහි වේ ද, එහෙයින් එහි ඒ ප්‍රභේදය දක්වන්නට **කාමාවචරෝ** යන ආදිය කියන ලදී. **සුඛවෙදනං ඨපෙත්වා** යැයි යම් ඒ සුඛභූමියෙහි සුඛ වේදනාවක් වේද, එය හැර, **තංසම්පයුත්තො** යනු තබන ලද ඒ සුඛ වේදනාවෙහි ම සම්පයුක්ත ව, සෙසු පද දෙකෙහි ද මේ නයින් ම අර්ථය දතයුතුයි යනුයි. මේ ත්‍රිකයෙහි වේදනාත්‍රය සියලු රූප නිර්වාණය යන මෙය ද නො ලැබේ. මේ ත්‍රිකය වනාහි කුශලත්‍රිකයෙහි නො ලැබෙන මේ කොටස් තුනෙන් මිදුණෝ නම්. මෙයින් පර ත්‍රිකද්විකයන්හි වනාහි පාළියෙන් ද අර්ථයෙන් ද යමක් කිවයුතු වේ නම් ඒ සියල්ල පද පිළිවෙළින් මාතෘකා කථාවෙහි මෙන් ම කුශලාදීන්ගේ නිර්දේශයෙහි ද කියන ලද්දේ ම ය. යම්තැනක යම් විශේෂ මාත්‍රයක් වේ නම් එය ම කියමි.

එහි විපාකත්‍රිකයෙහි වනාහි අරූප ධර්ම මෙන් ම කර්ම සමුත්ථාන රූපධර්මයෝ ද ඇත්තාහ. ඔව්හු අණාරම්මණ හෙයින් කර්මසමාන නො වෙත් යැයි ද අරමුණු සහිත අරූප ධර්මයෝ කර්මසමාන හෙයින් විපාකයෝ යැයි ද කියන ලදහ. බීජසමාන ඵල මෙනි. ඇල් බිජුවට වපුළ කල්හි අංකුර පත්‍රාදිය නික්මෙද්දී ඇල් පල යැයි නො කියයි. ඇල් කරල පැසු මුහුකුරා ගියකල්හි බීජය සමාන ඇල් ම සාලිඵල යැයි කියයි. අංකුර පත්‍රාදිය වනාහි බීජයෙන් හටගත්තේ ය. බීජයෙන් උපන්නේයැයි කියත්. මෙසේ ම රූපය ද කර්මජයැයි හෝ උපාදින්නයැයි කියන්නට වටී.

උපාදින්න ත්‍රිකයෙහි ක්ෂීණාශ්‍රවයන් වහන්සේගේ ස්කන්ධයෝ අපගේ මයිල් තෙරණුවෝ ය. අපගේ සුළුපිය තෙරණුවෝ යැයි කියන්නා වූ අන්‍යයන්ගේ උපාදානයට ප්‍රත්‍යය වෙත්. නමුත්, මාර්ගඵල නිර්වාණ වනාහි නො ගන්නා ලදී. පරාමර්ශනය නො කරන ලදී. අනුපාදින්න ම ය. ඒවා වනාහි දවසක් රත්කළ ලෝගුලි යම්සේ මැස්සන්ට හිඳිනට ප්‍රතයය නො වේ ද, මෙපරිද්දෙන් තේජස අධික හෙයින් තෘෂ්ණා මාන දෘෂ්ටි වශයෙන් ග්‍රහණයට ප්‍රත්‍යය නොවේ. එහෙයින් 'ඉමෙ ධම්මා අනුපාදින්න අනුපාදානීයා' යැයි කියන ලදී. අසංකිලිට්ඨ අසංකිලෙසයන්හි ද මේ නය ම ය.

විතර්කත්‍රිකයෙහි විතර්කජාත විචාරය සමග කුශලත්‍රිකයෙහි නො ලබන්නේ ම නො ලබත්. ප්‍රීතිසහගත ත්‍රිකයෙහි ප්‍රීති ආදීහු තමා හා සහජාත ධර්මයන්ට ප්‍රීතිසහගතාදීභාවය දී තමා පිටත පවත්නාහු වූහ. මේ ත්‍රිකයෙහි වනාහි දෝමනස්ස සහගත චිත්තුප්පාද දෙක ද, දුක්ඛ සහගත කායවිඤ්ඤාණය උපෙක්ඛාසහගත වේදනාව රූප නිබ්බාණය මෙය ද නො ලැබේ. මේ ත්‍රිකය වනාහි කුශලත්‍රිකයෙහි ද නොලැබෙන මේ පස් කොටස්වලින් මිදුණේ නම් වෙයි. දස්සනෙන පහාතබ්බත්තිකයෙහි **සංයොජනානි** යනු බන්ධනයෝ ය. **සක්කායදිට්ඨි** යනු විද්‍යමානාර්ථයෙන් ස්කන්ධ සංඛ්‍යාත කය ඇතිකල්හි තෙමේ හෝ ඇතිකල්හි ඒ කයෙහි දෘෂ්ටිය යනු = **සක්කායදිට්ඨි** ය. ශීලයෙන් පිරිසිදුවිය හැකිය. ව්‍රතයෙන් පිරිසිදු වියහැකිය. ශීලව්‍රතයන්ගෙන් පිරිසිදු විය හැකියැයි ගන්නා ලද සමාදානය වනාහි **සීලබ්බත පරාමාසො** නම්. ඉධ යනු දේශය දැක්වීමේ නිපාතයකි. ඇතැම් තැනෙක මෙය ලෝකය සලකා කියනු ලැබේ. එහෙයින් මෙසේ වදාළහ. 'ඉධ තථාගතො ලොකෙ උප්පන්නො' යනුයි. ඇතැම් තැනෙක ශාසනය සලකා කියන ලදී. මෙසේ ද වදාළහ. 'ඉධෙව භික්ඛවෙ!

සමණො ඉධ දුතියො සමණො' යනුයි. කිසිතැනෙක අවකාශය සලකා කියන ලදී.

ඉධෙව තිට්ඨමානස්ස දෙවභූතස්ස මෙ සතො
පුනරායු ච මෙ ලද්ධො එවං ජානාහි මාරිසා ති

මෙහි ම සිටිනා වූ දෙවියෙකු වූ මට නැවත ආයුෂ ද ලැබිණ. නිදුකාණෙනි, මෙසේ දැනගන්න යනුයි.

ඇතැම් තැනෙක පද පූරණ මාත්‍රමය. මෙසේ ද වදාළහ. 'ඉධාහං භික්ඛවෙ භුත්තාවී අසසං පරිවාරිතො' යනුයි. මෙහි වනාහි ලෝකය සඳහා කියන ලදැයි දතයුතු යි.

අස්සුතවා පුථුජ්ජනො යන මෙහි ආගම අධිගමයෙන් තොර ශ්‍රොතෘ පෘථග්ජනයාය. යමෙකුට වනාහි ඛන්ධ ධාතු ආයතන පච්චයාකාර සතිපට්ඨාන ආදියෙහි උගෙනීම විචාරීම විනිශ්චය රහිත හෙයින් දෘෂ්ටියෙන් ප්‍රතිෂේධක වූයේ අධිගමයක් නැත්තේ ම ද, හෙතෙම ආගමාධිගමයෙන් තොර බැවින් ශ්‍රොතෘය ආශ්‍රිතය යනුයි. ඒ මේ පෘථග්ජන තෙමේ :-

පුථූනං ජනනාදීහි කාරණෙහි පුථුජ්ජනො
පුථුජ්ජනනෙතා ගධත්තා පුථුවායං ජනො ඉති

මහත් වූ නොයෙක් කෙලෙසුන් ඉපදවීම ආදී කරුණුවලින් පෘථග්ජනයා ය, පෘථග්ජනයන්ට ඇතුළත් හෙයින් ද මෙතෙම පෘථග්ජනය යනුයි. හෙතෙම වනාහි මහත් වූ නානාප්‍රකාර කෙලෙස් ඉපදවීම ආදී නොයෙක් කාරණාවලින් පෘථග්ජනය. මෙසේ ද වදාළහ. 'මහත් වූ නොයෙක් කෙලෙස් උපදවත්නුයි = පෘථග්ජනයහ. මහත් වූ නොනසන ලද සක්කාය දිට්ඨිය ඇත්තෝ යනු = පෘථග්ජනයහ. මහත් වූ නානාවිධ ශාස්තෘන්ගේ මුහුණ බලන්නෝ යනු ද = පෘථග්ජනයෝ ය. මහත් වූ සියලු ගතීන්ගෙන් වැසි නො ලද්දෝ (පිහිටක් නො ලැබුවෝ) යනු = පෘථග්ජනයෝ ය. මහත් වූ නොයෙක් අභිසංස්කාරයන් රැස්කෙරෙත් යනුද = පෘථග්ජනයෝ ය. මහත් වූ නානාංගයන්ගෙන් පාවෙත් = -පෙ- මහත් නානාවිධ සන්තාපයන්ගෙන් තැවෙත් යනු ද = පෘථග්ජනයෝ ය.

මහත් වූ නානාවිධ පරිළාහයන්ගෙන් දැවෙත් යනු ද = පෘථග්ජනයෝ ය. මහත් වූ පංචකාමගුණයන්හි ඇලුණෝ ය. ගිජුවූවෝ ය. ගැටුණෝ ය. මූර්ජා වූවෝ ය. බැසගත්තෝ ය. ඇලුණෝ ය. ලග්න වූවෝ ය. පලිබෝධ කරගත්තේ ය යනු = පෘථග්ජනයෝ ය. මහත් වූ පංචනීවරණයන්ගෙන් අමුණන ලද්දෝ ය. වටකරන ලද්දෝ ය. ආවරණය කරන ලද්දෝ ය. වසන ලද්දෝ ය. සැඟවුණෝ ය. යටිකුරු කරන ලද්දෝ යනු පෘථග්ජනයෝ ය. මහත් වූ ගණනපථය ඉක්ම වූ ආර්යධර්මයටපිටු පෑ නීච ධර්මයන්හි හැසිරෙන ජනයන්ට ඇතුළත් වූවෝ ය යනු ද පෘථග්ජනයෝ ය. මහත් වූ මොහු වෙන්ව ම ගැනුනේ ය. ශීල ශ්‍රැත ධූතාදී ගුණයන්ගෙන් යුක්ත ආර්යජනයා හා මිශ්‍ර නොවූයේ ය යනු ද = පෘථග්ජනය. මෙසේ මේ දෙපදයෙන් අශ්‍රැතවත් පෘථග්ජනයා (යැයි දතයුතුයි.) ඔව්හු නම්,

> දුවෙ පුථුජ්ජනා වුත්තා බුද්ධෙනාදිච්ච බන්ධුනා
> අන්‍ධො පුථුජ්ජනො එකො කල්‍යාණෙකො පුථුජ්ජනො

යනුයි. ආදිත්‍යබන්‍ධු (සූර්යවංශික) වූ බුදුන් විසින් අන්‍ධ පෘථග්ජනයාය කල්‍යාණ පෘථග්ජනයා යැයි පෘථග්ජනයෝ දෙදෙනෙක් වදාරණ ලදහ.

පෘථග්ජනයෝ දෙදෙනෙක් වදාරණ ලදී. ඔවුන් අතුරෙන් අන්‍ධ පෘථග්ජනයා කියන ලදැයි දතයුතුයි.

**අරියානං අදස්සාවී** යනාදීන්හි අරියා යනු ක්ලේශයන්ගෙන් දුරුවූ හෙයින් ද අනයෙහි නොයෙදෙන බැවින් ද (අයෙහි යෙදෙන බැවින්ද) දෙවියන් සහිත ලෝකයා විසින් පුදනු ලබන හෙයින් ද බුදුවරු ද පසේබුදුවරු ද බුද්ධශ්‍රාවකයෝ ද කියත්. මෙහි බුදුවරු හෝ ආර්යයෝ ය. මෙසේ ද වදාළහ. සදෙවකෙ භික්ඛවෙ, ලොකෙ -පෙ- තථාගතො අරියොති වුච්චති යනුයි. මෙහි වනාහි සත්පුරුෂයෝ යනු පසේබුදුවරු හා තථාගත ශ්‍රාවකයන් වහන්සේලා සත්පුරුෂයෝ යැයි දතයුත්තාහ. උන්වහන්සේලා වනාහි ලෝකෝත්තර ගුණයෝගයෙන් හොබනාහු සත්පුරුෂයෝ යනු = සත්පුරුෂයෝ ය. මේ සියල්ලෝ ම හෝ දෙයාකාරයෙන් කියන ලදහ. බුදුවරු ද පසේබුදුවරු ද බුද්ධශ්‍රාවකයෝ ද ආර්යහ. සත්පුරුෂයහ. මෙසේ ද කීහ. :-

යො වෙ කතඤ්ඤූ කතවෙදි ධීරෝ
කල්‍යාණමිත්තො දළ්හ භත්ති ච හොති
දුඛිතස්ස සක්කච්ච කරොති කිච්චං
තථාවිධං සප්පුරිසං වදන්ති ති

යමෙක් වනාහි කළගුණ දන්නේ ද කෘතවේදී ද පණ්ඩිත ද කල්‍යාණ මිත්‍රයෙක් ද දැඩි භක්තියෙන් යුක්තවූයේ වෙයි ද දුකට පත් වූවහුට මනාව කටයුතු කෙරේ ද එවැන්නා සත්පුරුෂයා යැයි කියත් යනුයි.

කල්‍යාණමිත්තො දළ්හභත්ති ච හොති යන මෙපමණකින් බුද්ධශ්‍රාවකයා කියන ලදී. කතඤ්ඤුතාදීන්ගෙන් පසේබුදුවරු ද බුදුවරු ද (කියන ලදහ) යනුයි. දැන් ඔවුනතුරෙන් යමෙක් ආර්යයන් නො දක්නා සුලු ද දර්ශනයේදී මනාව කටයුතු නො කෙරේ ද හෙතෙම **අරියානං අදස්සාවී** යැයි දතයුතුයි. හෙතෙම ඇසින් නො දක්නේ නුවණින් නො දක්නේ යැයි දෙයාකාරය. ඔවුනතුරෙන් ඥානයෙන් නො දක්නේ මෙහි අභිප්‍රේතයි. මසැසින් හෝ දිවැසින් ආර්යයෝ දක්නා ලද්දෝ නමුදු නො දක්නා ලද්දෝ ම වෙත්. ඔවුන්ගේ ඇස්වලින් වර්ණමාත්‍ර ග්‍රහණය පමණක් හෙයිනි. ආර්යභාවය ගෝචර නො වන හෙයිනි. බලුසිවල්ලු ද ඇසින් ආර්යයෝ දකිත්. ඔව්හු ආර්යයන් දක්නෝ නො වෙත්.

එහිදී මේ වස්තුවෙකි:- සිතුල්පව් වැසි රහත්තෙර කෙනෙකුන්ට උපස්ථායක වූ එක් මහලු පැවිද්දෙක් එක්දිනෙක තෙරුන් සමග පිඬු පිණිස හැසිර තෙරුන්ගේ පාසිවුරු ගෙන පිටිපසින් එන කල්හි ස්වාමීනි ආර්යයෝ නම් කෙබඳුදැයි තෙරුන් ගෙන් විචාළේ ය. තෙරණුවෝ මෙසේ වදාළහ. මෙහි එක් මහල්ලෙක් ආර්යයන්ගේ පාසිවුරු ගෙන වත්පිළිවෙත් කොට එකට හැසිරෙමින් ආර්යයන් නොදනී. ඇවැත්නි, මෙසේ ආර්යයෝ දැනගන්නට දුෂ්කරයහ යනුයි. මෙසේ කීකලද හෙතෙම නොදක්නේ ම ය. එහෙයින් ඇසින් දැකීම (දැකීමක්) නොවේ. ඥාන දර්ශනය ම දර්ශනයයි. මෙසේ ද වදාළහ. 'වක්කලිය! යමෙක් වනාහි ධර්මය දකී ද හෙතෙම මා දකී' යනුයි. එහෙයින් ඇසින් දක්නේ ද ඥානයෙන් ආර්යයන් විසින් දක්නා ලද අනිත්‍යාදී ලක්‍ෂණ නො දක්නේ ආර්යයන් විසින් අවබෝධ කරගත් ධර්මයට ද නොපැමිණෙන්නේ ආර්යතර ධර්මයන් ද ආර්ය ස්වභාවයද නොදුටු හෙයින් **අරියානං අදස්සාවී** යැයි දතයුතුයි. **අරියධම්මස්ස අකොවිදො** යනු සතිපට්ඨානාදී

ප්‍රභේද ඇති ආර්යධර්මයෙහි අදක්‍ෂ, අරියධම්මෙ අවිනීතො යන මෙහි වනාහි :-

**දුවිධො විනයො නාම එකමෙකෙත්ථ පඤ්චධා**
**අභාවතො තස්ස අයං අවිනීතොති වුච්චති**

විනය නම් දෙවැදෑරුම්ය. මෙහි ඒ එකක් එකක් පස්වැදෑරුම් ය. ඔහුට මෙය නැති හෙයින් මේ අවිනීතයා යැයි කියනු ලැබේ.

මේ විනය සංවර විනය පහාණ විනය යැයි දෙවැදෑරුම් ය. මේ දෙවැදෑරුම් විනයෙහි ද එක් එක් විනය පස් ආකාරයකින් බෙදේ. සංවරවිනය වනාහි සීල සංවරය, සති සංවරය, කාය සංවරය, ඛන්ති සංවරය, විරිය සංවරය යැයි පංචවිධ ය. පහාණවිනය ද තදංගප්පහාණය වික්ඛම්භණප්පහාණය සමුච්ඡෙදප්පහාණය පටිප්පස්සද්ධිප්පහාණය නිස්සරණප්පහාණ යැයි පංචවිධ ය. එහි 'මේ ප්‍රාතිමෝක්‍ෂ සංවරයෙන් යුක්තවූයේ වෙයි ද, විශේෂයෙන් යුක්තවූයේ වෙයි ද' මේ ශීල සංවරයයි.

'චක්‍ෂුරේන්ද්‍රිය රකී. චක්‍ෂුරේන්ද්‍රියයේ සංවරයට පැමිණෙයි' යන මෙය සති සංවරයයි.

**යානි සොතානි ලොකස්මිං (අජිතා ති භගවා) සති තෙසං නිවාරණං සොතානං සංවරං බ්‍රෑමි පඤ්ඤායෙතෙ පිථීයරෙ ති**

ලෝකයෙහි යම් ශ්‍රෝතයෝ වෙත්නම් (භාග්‍යවතුන් වහන්සේ දිනූහ.) සතිය ඔවුන්ගේ නිවාරණයයි. ශ්‍රෝතසුන්ගේ සංවරය කියමි. ප්‍රඥාවෙන් මොව්හු වසනු ලබත් යනුයි.

මේ ඥාන සංවරයයි. 'ඛමො හොති සීතස්ස උණ්හස්ස' යන මෙය ඛන්ති සංවරයයි. 'උප්පන්නං කාමවිතක්කං නාධිවාසෙති පජහති' යන මෙය විරිය සංවරයයි. මේ සියලු ම සංවරය තම තමාට අයත් පරිදි සංවර විය යුතු හික්මිය යුතු කාය දුෂ්චරිතාදීන්ගේ සංවරණයෙන් සංවරයැයි ද හික්මීමෙන් විනය යැයි ද කියනු ලැබේ. මෙසේ වනාහි සංවර විනය පංචවිධව බෙදේ යැයි දතයුතුයි.

එසේ ම යමක් නාමරූප පරිච්ඡේදාදීන්හි ද විදර්ශනා ඥානයන්හි ද ප්‍රතිපක්ෂ භාවයෙන් පහන් එළියෙන් අඳුර මෙන් ඒ ඒ විදර්ශනා ඥානයෙන් ඒ ඒ අනර්ථයාගේ ප්‍රහාණය වේ. ඒ කෙසේද යත්, නාමරූප ව්‍යවස්ථානයෙන් සත්කාය දෘෂ්ටියේ ද, ප්‍රත්‍යය පරිග්‍රහණයෙන් අහේතු විෂම හේතු දෘෂ්ටීන්ගේ ද, එහි ම පසුභාගය වූ කංඛාවිතරණ ඥානයෙන් කථං කථීභාවයාගේ ද, කලාප සම්මර්ශනයෙන් මමය මාගේය යන ග්‍රාහයාගේ ද, මාර්ගාමාර්ග ව්‍යවස්ථානයෙන් අමාර්ගයෙහි මාර්ගය යන සංඥාවගේ ද උදය දර්ශනයෙන් උච්ඡේද දෘෂ්ටියේ ද, ව්‍යය දර්ශනයෙන් ශාස්වත දෘෂ්ටියේ ද, භය දර්ශනයෙන් සභයයෙහි අභය සංඥාවේ ද, ආදීනව දර්ශනයෙන් ආස්වාද සංඥාවේ ද, නිර්වේදානු දර්ශනයෙන් අභිරති සංඥාවේ ද, මුඤ්චිතුකම්‍යතා ඥානයෙන් අමුඤ්චිතු කම්‍යතාවේ ද, උපේක්ෂා ඥානයෙන් අනුපේක්ෂාවේ ද, අනුලෝම ඥානයෙන් ධර්මස්ථිතියෙහි මෙන් ම නිර්වාණයේ ද ප්‍රතිලෝම භාවයෙහි ද, ගෝත්‍රභූ ඥානයෙන් සංස්කාර නිමිත්ත ග්‍රාහයේ ද ප්‍රහාණය වේ. මෙය තදංග ප්‍රහාණ නම් වේ.

උපචාර ප්‍රහාණ භේදය වූ සමාධියෙන් ප්‍රවෘත්තිභාවය නිවාරණයෙන් කළයේ පහරින් දියපිට සෙවෙල් ඔබ මොබ ඇත් වන්නා මෙන් ඒ ඒ නීවරණාදී ධර්මයන්ගේ යම් ප්‍රහාණයක් වේ නම් එය විෂ්කම්භනප්‍රහාණ නම් වේ. සතර ආර්යමාර්ගයන් වඩනා ලද බැවින් ඒ ඒ මාර්ග ඇත්තහුගේ තම සන්තානයෙහි දෘෂ්ටිගතයන්ගේ ප්‍රහාණය පිණිසයැයි ආදී නයින් කියන ලද සමුදයපාක්ෂික වූ ක්ලේශග්‍රහණයාගේ අත්‍යන්ත අප්‍රවෘත්ති භාවයෙන් යම් ප්‍රහාණයක් වේ නම් එය සමුච්ඡේද ප්‍රහාණ නම් වේ. ඵලක්ෂණයෙහි ක්ලේශයන් යම් සංසිඳීමක් වේ නම් එය ප්‍රතිප්‍රසබ්ධිප්‍රහාණය නම් වේ. හේතුවෙන් හටගත් සියල්ලේ නික්මුණු හෙයින් ප්‍රහීණ සියලු සංඛතයන් ඇති යම් නිවනක් වේ නම් එය නිස්සරණප්‍රහාණ නම් වේ.

මේ සියලු ම ප්‍රහාණය යම්හෙයකින් ත්‍යාගාර්ථයෙන් ප්‍රහාණ (නම්) වේද විනයාර්ථයෙන් විනය (නම්) වේ ද එහෙයින් ප්‍රහාණවිනය නම් වේයැයි කියනු ලැබේ. ඒ ඒ ප්‍රහාණයෙන් හෝ ඒ ඒ විනයාගේ ඇතිවීමෙන් ද මෙය ප්‍රහාණවිනය යැයි ද කියනු ලැබේ. මෙසේ ප්‍රහාණවිනය ද පස් අයුරකින් බෙදේයැයි දතයුතුයි. මෙසේ සංක්ෂේපයෙන් දෙයාකාර වූ ද භෙද වශයෙන් දසවිධ වූ විනය භින්නසංවර හෙයින් ද ප්‍රහාතව්‍යය අප්‍රහීණ බැවින් ද යම්හෙයකින් මේ අශ්‍රැතවත් පෘථග්ජනයාට

නැත්තේ ද එහෙයින් ඔහුට ඒ නැතිහෙයින් මෙතෙම අවිනීත යැයි කියනු ලැබේ. 'සප්පුරිසානං අදස්සාවී සප්පුරිස ධම්මස්ස අකොවිදො සප්පුරිසධම්මෙ අවිනීතො' යන මෙහි ද මේ නය ම ය. මෙය අර්ථයෙන් නානාකරණයක් නැත. මෙසේ ද කීහ. යම්කෙනෙක් ඒ ආර්යයෝ නම් ඒ සත්පුරුෂයෝත් ඔව්හු ම ය. ඒ සත්පුරුෂයෝ යම්කෙනෙක් නම් ඒ ආර්යයෝත් ඔව්හුමය. ඒ ආර්යයන්ගේ ධර්මය යමක් නම් ඒ සත්පුරුෂයන්ගේ ධර්මයත් එය ම ය. යමක් ඒ සත්පුරුෂයන්ගේ ධර්මය නම් ඒ ආර්යයන්ගේ ධර්මයත් එයමය. ඒ ආර්යයන්ගේ විනය යමක් නම් ඒ සත්පුරුෂයන්ගේ විනයත් එයම ය. ඒ සත්පුරුෂයන්ගේ විනය යමක් නම් ඒ ආර්යයන්ගේ විනයත් එයම ය. ආර්ය කියා හෝ සත්පුරුෂ කියා හෝ ආර්ය ධර්ම කියා හෝ සත්පුරුෂ ධර්ම කියා හෝ ආර්ය වින කියා හෝ සත්පුරුෂ විනය කියා හෝ ඒ ඒ එකක් ම ය. ඒකාර්ථමය. සමය සමභාගය එයින් උපන්නේ ය. එය ම ය යනුයි.

**රූපං අත්තතො සමනුපස්සති** යනු මෙහි එක් පුද්ගලයෙක් රූපය ආත්ම වශයෙන් සමව බලයි. රූපය යමක්ද ඒ මම ය. යමෙක් මම ද ඒ රූපයයි. රූපයත් ආත්මයත් දෙක සමව බලයි. යම්සේ වනාහි ඇවිලෙන තෙල්පහනක යම් ගින්නක් වේ ද එය වර්ණයයි. යම් වර්ණයක් වේ ද එය ගින්නයැයි ගින්නත් වර්ණයත් දෙකක් නැති සේ සමව බලයි ද, මෙපරිද්දෙන් මේ ලෝකයෙහි ඇතැම් පුද්ගලයෙක් රූපය ආත්මය වශයෙන් -පෙ- සමානව බලයි යැයි මෙසේ රූපය ආත්මයයැයි දෘෂ්ටි දර්ශනයෙන් බලයි. **රූපවන්තං වා අත්තානං** යනු ආත්මය අරූප යැයි ගෙන ඡායාව ඇති රුකක් මෙයත් එය රූපවන්තය සේ විමසා බලයි. **අත්තනි වා රූපං** යනු අරූපය ම ආත්මය යැයි ගෙන පුෂ්පයෙහි ගන්ධය මෙන් රූපය තමා කෙරෙහි යැයි විමසා බලයි. **රූපස්මිං අත්තානං** යනු අරූපය ම ආත්මය යැයි ගෙන කරඬුවෙක මැණිකක් සේ ආත්මය රූපයෙහි යැයි සලකා බලයි. වේදනාදීන්හි ද මේ නය ම ය. එහි **රූපං අත්තතො සමනුපස්සති** යනු ශුද්ධරූපය ම ආත්මය යැයි කියන ලදී. **රූපවන්තං වා අත්තානං, අත්තනි වා රූපං, රූපස්මිං වා අත්තානං, වෙදනං අත්තතො සමනුපස්සති, සඤ්ඤං - සංඛාරෙ - විඤ්ඤාණං අත්තතො සමනුපස්සති** යන මේ ස්ථාන සතෙහි අරූපය ආත්මය යැයි කියන ලදී. **වෙදනාවන්තං වා අත්තානං අත්තානං අත්තනි වා වෙදනං** වෙදනාය වා අත්තානං යැයි මෙසේ සතර ස්කන්ධයන්හි තුන තුන වශයෙන් දොළොස් තැනෙක ආත්මය රූපාරූප මිශ්‍රිතව කියන ලදී. එහි **රූපං අත්තතො - වෙදනා**

සඤ්ඤා - සංඛාරෙ - **විඤ්ඤාණං අත්තතො සමනුපස්සති** යන (මේ) ස්ථාන පසෙහි උච්ඡේද දෘෂ්ටිය කියන ලදී. අවශේෂ තැන්වල ශාස්වත දෘෂ්ටිය කියන ලදී. මෙසේ මෙහි භවදෘෂ්ටි පසළොසක් (විභව දෘෂ්ටි පසක්) වෙයි. ඒ සියල්ලම මාර්ගාවරණය, ස්වර්ගාවරණ නො වේ. ප්‍රථම මාර්ගය ම ද යැයි දතයුතුයි.

**සත්ථරි කංඛති** යනු ශාස්තෘන් වහන්සේගේ ශරීරයෙහි හෝ (උන්වහන්සේගේ) ගුණයෙහි හෝ දෙකෙහි ම සැක කරයි. ශරීරයෙහි සැක කරනුයේ ද්වාත්‍රිංශත්වර ලක්‍ෂණයෙන් ප්‍රතිමණ්ඩිත ශරීරයක් නම් ඇද්දෝ හෝ නැද්දැයි සැක කරයි. ගුණයෙහි සැක කරනුයේ අතීත අනාගත වර්තමානය දැනීමට සමත් සර්වඥතාඥානයක් ඇද්දෝ හෝ නැද්දෝ යි සැක කරයි. දෙතැන ම සැක කරනුයේ අසූ අනුව්‍යඤ්ජන ව්‍යාමප්‍රභාවෙන් රැඳුණු ශරීර නිෂ්පත්තියෙන් යුත් සියලු ඥෙය්‍ය මණ්ඩලය දැනීමට සමත් සර්වඥතාඥානය සිටි ලෝකයා තරණය කරන බුදුවරයෙක් ඇද්දෝ හෝ නැද්දෝ යි සැක කරයි. මේ වනාහි උන්වහන්සේගේ ආත්මභාවයෙහි ගුණයන් සැකකරන හෙයින් දෙතැන ම සැකකරයි නම්. **විචිකිච්ඡති** යනු අරමුණ නිශ්චය කළ නොහැකිව දුකට පත්වෙයි. වෙහෙසට පත්වෙයි. **නාධිමුච්චති** යනු එහි ම ස්ථිර පිහිටීමක් නො ලබයි. **න සම්පසීදති** යනු සිත නො කළඹා පැහැදෙන්නට නො හැකි වෙයි. ගුණයන්හි නො පහදී.)

**ධම්මෙ කංඛති** යනාදීන්හි වනාහි කෙලෙස් දුරුකරන කෙලෙස් සංසිඳවූ සතර ආර්ය මාර්ගයැයි කියන සතර ශ්‍රාමණ්‍ය ඵල ද මාර්ගඵලයන්ගේ ආරම්මණප්‍රත්‍ය වූ අමාමහ නිවන නම් ඇද්දෝ හෝ නැද්දෝ සැක කරනුයේ ද, මේ ධර්මය නෛර්යාණිකදෝ නැද්දෝ හෝයි සැක කරන්නේ ද **ධම්මෙ කංඛති** නම්. සතර මාර්ගස්ථ සතර ඵලස්ථ යැයි කියන මේ සංඝරත්නය ඇද්දෝ හෝ නැද්දෝයි සැක කරනුයේ ද මේ සංඝරත්නය සුප්‍රතිපන්න දෝ (දුෂ්ප්‍රති පන්න හෝ) යි සැක කරනුයේ ද මේ සංඝරත්නයෙහි දෙනලද දෙයෙහි ඵලවිපාක ඇද්දෝ හෝ නැද්දෝ යි සැකකරනුයේ ද ත්‍රිවිධ ශික්‍ෂා ශික්‍ෂිත ප්‍රත්‍යයෙන් අනුසස් ඇද්දෝ හෝ නැද්දෝ යි සැකකරනුයේ ද **සික්ඛාය කංඛති** නම්.

අතීත ස්කන්ධ ධාතු ආයතන පූර්වාන්තය යැයි කියනු ලැබේ. අනාගත ස්කන්ධ ධාතු ආයතන අපරාන්තයයි. එහි අතීත ස්කන්ධාදීන්හි

අතීදෝ නැද්දෝ යි සැක කරනුයේ **පුබ්බන්තෙ කංඛති** නම්. අනාගතයන්හි අනාගත දෝ නැද්දෝ යි සැකකරනුයේ **අපරන්තෙ කංඛති** නම්. ද්වාදශපදික ප්‍රත්‍යය වෘත්තය (පටිච්ච සමුප්පාදය) ඇද්දෝ හෝ නැද්දෝ යි සැක කරනුයේ **ඉදප්පච්චයතා පටිච්ච සමුප්පන්නෙසු ධම්මෙසු කංඛති** නම්.

මේ එහි වචනාර්ථයයි. මේ ජරාමරණාදීන්ට ප්‍රත්‍යයෝ = ඉදප්‍රත්‍යයෝ ය. ඉදප්‍රත්‍යයන්ගේ භාවය = ඉදප්‍රත්‍යයතාය, ඉදප්‍රත්‍යයෝ ම හෝ ඉදප්‍රත්‍යයතා ය. මෙය ජාති ආදීන්ට නමෙකි. ජාති ආදීන්හි ඒ ඒ අංග නිසා පැමිණ උපන්නෝ යනු = පටිච්ච සමුප්පන්නයෝ ය. මෙය කියන ලද්දේ වෙයි. ඉදප්‍රත්‍යතාවෙහි ද පටිච්චසමුප්පන්න ධර්මයන්හි ද සැක කරයි.

**සීලෙන** යනු ගෝසිලාදියෙන්, **වතෙන** යනු ගෝව්‍රතාදියෙන්, **සීලබ්බතෙන** යනු ඒ දෙකින් ම, **සුද්ධි** යනු ක්ලේශ ශුද්ධියයි. පරමාර්ථ ශුද්ධිය වූ නිර්වාණයමැයි. **තදෙකට්ඨා** යනු මෙහි ප්‍රහාණයේ දී එක්ව සිටි කාර්යයයි. මේ පාළියෙහි **දිට්ඨිකිලෙසො විචිකිච්ඡා කිලෙසා** යැයි දෙකක් ම ආයේ ය. ලෝභය ද්වේෂය මෝහය මානය ථීනය උද්ධච්චය අහිරිකය අනොත්තප්පය යන මේ අට නාවේය. අමුතුවෙන් ගෙන දැක්විය යුතුයි. මෙහිදී වනාහි දෘෂ්ටි විචිකිච්ඡා ප්‍රහීන වෙද්දී අපායගාමිනී වූ ලෝභ ද්වේෂ මෝහ මාන ථීන උද්ධච්ච අහිරික අනනොත්තප්ප යන මේ සියල්ලම ප්‍රහාණයේ දී එක්ව සිට ප්‍රහීණ වෙයි. **සහජේතස්ථයන** වනාහි අමුතුවෙන් ගෙන දැක්විය යුතුයි. ශ්‍රෝතාපත්ති මාර්ගයේදී වනාහි දෘෂ්ටි සහගත සතර ද විචිකිච්ඡා සහගතය ද යන සිත් පහ ප්‍රහීණ වෙයි. එහිදී අසංස්කාරික දෘෂ්ටි සිත් දෙක ප්‍රහීණ වෙද්දී ඒ සිත් සමග සහජාත වූ ලෝභය මෝහය උද්ධච්චය අහිරිකය අනොත්තප්පය යන මේ ක්ලේශයෝ **සහජේතස්ථ** වශයෙන් ප්‍රහීණ වෙත්. අවශේෂ දෘෂ්ටි ක්ලේශයෝ ද විචිකිච්ඡා ක්ලේශය ද පහාණෙකට්ඨ වශයෙන් ප්‍රහීණ වෙත්. දෘෂ්ටිසම්ප්‍රයුක්ත සසංස්කාරික සිත් ප්‍රහීණ වෙද්දී ඔවුන් හා සහජාත වූ ලෝභය මෝහය ථීනය උද්ධච්චය අහිරිකය අනොත්තප්පය යන මේ ක්ලේශයෝ **සහජෙකට්ඨ** වශයෙන් ප්‍රහීණ වෙත්. අවශේෂ දෘෂ්ටි සහ ක්ලේශ ද විචිකිච්ඡා ක්ලේශය ද පහාණොකට්ඨ වශයෙන් ප්‍රහීණ වෙයි. මෙසේ පහාණෙකට්ඨයෙහි ම සහජේකට්ඨය ද ලැබේයැයි මේ සහජේකට්ඨය ගෙන දැක්වූහ.

**තංසම්පයුත්තා** යනු තදේකට්ඨ වූ එයින් අන්‍ය වූ ඒ කෙලෙස් අට සමග සම්ප්‍රයුක්ත වූයේ, බෙදා වෙන්කොට හෝ ඒ ලෝභය සමග ඒ ද්වේෂය සමග යැයි මෙසේ එකින් එක සම්ප්‍රයුක්ත බව දැක්විය යුතුයි. එහිදී ලෝභය ගත්කල්හි මෝහය මානය ථීනය උද්ධච්චය අහිරිකය අනොත්තප්පය යන මේ ක්ලේශප්‍රහාණය ද්වේෂ සම්ප්‍රයුක්ත නම්. මෝහය ගත්කල්හි ලෝභය ද්වේෂය මානය ථීනය උද්ධච්චය අහිරිකය අනොත්තප්පය යන මේ ක්ලේශප්‍රහාණය මෝහ සම්ප්‍රයුක්ත නම් වේ. මානය ගත්කල්හි එය හා සම්ප්‍රයුක්ත ලෝභය මෝහය ථීනය උද්ධච්චය අහිරිකය අනොත්තප්පය යන මේ ක්ලේශප්‍රහාණය මාන සම්ප්‍රයුක්ත නම්. මේ උපායෙන් ඒ ථීනය සමග ඒ උද්ධච්චය සමග ඒ අහිරිකය සමග ඒ අනොත්තප්පය සමග සම්ප්‍රයුක්ත වූයේ **තංසම්පයුත්තා** යැයි යෝජනා කළයුතුයි. **තංසමුට්ඨානං** යනු ඒ මෝහය සමග -පෙ- ඒ අනොත්තප්පය සමග හටගත් යන අර්ථයි.

**ඉමෙ ධම්මා දස්සනෙන පහාතබ්බා** යන මෙහි දර්ශනය නම් සෝවාන් මගයි. එයින් පහකළයුතු යන අර්ථයි. කෙසේ නම් සෝවාන් මග දර්ශන නම් වී ද යත්, පළමුවෙන් නිවන් දක්නා හෙයිනි. ගෝත්‍රභූ ඥානය පළමුවෙන් නො දක්නේ ද? නො දක්නේ නොවේ. දැක ද කළයුතු කිස නො කරයි. සංයෝජනයන් අප්‍රහීණ හෙයිනි. එහෙයින් දකීයැයි නො කියයුතුයි. යම්කිසි තැනකදී රජු දැකත් පඬුරු දී කිස නිමවීමක් නො දුටු හෙයින් රජු නො දිටිමියි කියන ජානපදික පුරුෂයා අදත් මෙහිදී නිදසුනකි. **අවසෙසො ලොභො** යනු සෝවාන් මගින් ප්‍රහීණ කොට අවශේෂ වූ (ලෝභයයි) ද්වේෂ මෝහයන්හිද මේ නයමය. සෝවාන් මගින් අපායගාමී ක්ලේශයෝ ම ප්‍රහීණයහ. එයින් අන්‍ය කෙලෙස් දක්වන්නට මේ **තදෙකට්ඨා** යන්න කියන ලදී. පාළියෙහි ආ එකී ක්ලේශත්‍රය සමග සම්ප්‍රයුක්ත හෙයින් ද ප්‍රහාණයෙන් ද පංච ක්ලේශයෝ ඒකට්ඨයහ.

**නෙවදස්සනෙන න භාවනාය** යන මෙය සංයෝජනාදීන් මෙන් ඒ මාර්ගයන්ගෙන් ප්‍රහාණ නොකළ යුතු බව සඳහා කියන ලදී. ශ්‍රෝතාපත්ති මාර්ගඥානයෙන් අභිසංස්කාර විඥානය නිරෝධ කිරීමෙන් යම්කෙනෙක් අනවරාග්‍ර සංසාරයෙහි සත්භවයක් උපදිත් ද, එහිදී ඔව්හු නාමයත් රූපයත් නිරුද්ධ කෙරෙත් යැයි යනාදී නයින් කුශලාදීන්ගේ යම් ප්‍රහාණයක් අනුදන්නා ලද ද, එය යම්කෙනෙක් එකී මාර්ගයන් නොවැඩූ හෙයින්

උපදිත් ද ඔව්හු උපනිශ්‍රය ප්‍රත්‍යය වූ ක්ලේශයන්ගේ ප්‍රහාණයෙන් ප්‍රහීණයහයි මේ පර්යාය සඳහා කියන ලදැයි දතයුතුයි.

දස්සනෙන පහාතබ්බ හෙතුකත්තිකයෙහි ඉමෙ ධම්මා දස්සනෙන පහාතබ්බහෙතුකා යැයි නිමවා නැවත **තීණිසංයොජනානි** යනාදී ප්‍රහාතව්‍යයන් දක්වා තදේකස්ථභාවයෙන් හේතුවෙන් ම සහේතුකයන් ද දක්වන්නට කියන ලදී. එහි දර්ශනයෙන් ප්‍රහාතව්‍ය හේතූන් අතර ලෝභ සහගත මෝහය ලෝභය සමග සහේතුක වෙනත් ද්වේෂ සහගතය. ද්වේෂය සමග ද ලෝභ ද්වේෂ දෙක මෝහය සමගදැයි මොව්හු ප්‍රහාතව්‍යහේතුක ප්‍රදේශයෙහි ද සංග්‍රහයට ගියත්, විචිකිච්ඡා සහගත මෝහය වනාහි අන්‍ය සම්ප්‍රයුක්ත හේතුවක් නැතිහෙයින් හේතුව ම නහේතුකයැයි එහි ප්‍රහාණය දැක්වීමට නැවත **ඉමෙ ධම්මා දස්සනෙන පහාතබ්බහෙතු** යැයි කියන ලදී.

දෙවන පදයෙහි උද්ධච්ච සහගත මෝහයාගේ ප්‍රහාණය දක්වන්නට **ඉමෙ ධම්මා භාවනා පහාතබ්බහෙතු** යැයි කියන ලදී. එය වනාහි තමා සමග සම්ප්‍රයුක්ත ධර්මයන් සහේතුක කොට පිටත හැසිරෙන්නෙක් විය. විචිකිච්ඡා සහගත (මෝහය) මෙන් අන්‍ය සම්ප්‍රයුක්ත හේතුවක් නැතිහෙයින් පහාතබ්බහේතුක පදය භජනය නො කරයි. තෙවන පදයෙහි අවසෙසා අකුසලා යැයි නැවත අකුශල ග්‍රහණය යුක්ත හේතුහුගේ විචිකිච්ඡා උද්ධච්ච සහගත මෝහයන්ගේ සංග්‍රහය පිණිස කරන ලදී. ඔවුන් හා සම්ප්‍රහේතුවක් නැතිහෙයින් ප්‍රහාතව්‍ය හේතුකයෝ නම් නැත්තාහ.

පරිත්තාරම්මණාතිකයෙහි **අරබ්භ** යනු අරමුණුකොට, තමා වනාහි අල්ප හෝ මහග්ගත හෝ වෙත්වා අල්ප ධර්මයන් අරමුණුකොට උපන්නෝ **පරිත්තාරම්මණා** ය. මහද්ගතයන් අරමුණු කොට උපන්නෝ **මහග්ගතාරම්මණා** ය. අප්‍රමාණ ධර්මයන් අරමුණුකොට උපන්නෝ **අප්පමාණාරම්මණා** ය. ඔව්හු වනාහි ස්වල්ප ද මහද්ගත ද අප්‍රමාණ ද වෙත්.

මිථ්‍යාත්‍රිකයෙහි **ආනන්තරිකානි** යනු අනතුරුව ඵලගෙන දෙන්නා වූ, මාතෘඝාතක කර්මාදීන්ට මෙය නමෙකි. ඒ අතුරෙන් එක් කර්මයක් හෝ කළ කල්හි එය වළක්වා තම කර්මයට අවකාශ ලබාගැනීම අන්‍ය

කර්මයක් සමර්ථ නොවෙයි. මහමෙර පමණ ස්වර්ණ ස්තූප කොට ද සක්වළ පමණ රත්නමය ප්‍රකාර සහිත විහාරයක් කොට එය පුරවා වැඩසිටි බුදුපාමොක් බික්සඟනට දිව්හිමියෙන් සිව්පසය දෙන්නාගේ ද ඒ කර්මය ද මේ කර්මයන්ගේ විපාකය වළක්වන්ට නොහැක්කේ ම ය. **යාව මිච්ඡාදිට්ඨි නියතා** යනු අහේතුකවාදය අකිරිය වාදය නාස්තිකවාදය යන වාදයන් අතුරෙන් එක්තරා වාදයක්, එය ගෙන සිටි පුද්ගලයාට සියයක් බුදුවරු හෝ දහසක් බුදුවරු අවබෝධ කරවන්නට නො හැක්කෝ වෙත්.

මාර්ගාරම්මණත්‍රිකයෙහි **අරිය මග්ගං ආරබ්භ** යනු ලෝකෝත්තර මාර්ගය අරමුණු කොට, ඔව්හු වනාහි පරිත්ත ද මහද්ගතද වෙත්. මාර්ගහේතුක නිර්දේශයෙහි ප්‍රත්‍යාර්ථ හේතු වූ ප්‍රථම නයින් මාර්ග සම්ප්‍රයුක්ත ස්කන්ධයන්ගේ සහේතුකභාවය දක්වන ලදී.

සම්‍යක් දෘෂ්ටි සංඛ්‍යාත මාර්ගභූත හේතුව වූ ද්විතීය නයින් අවශේෂ මාර්ගයන්ගේ සහේතුකභාවය දක්වන ලදී. මාර්ගයෙහි උපන් හේතුන්ගෙන් සම්‍යක් දෘෂ්ටියෙහි සහේතුකභාවය දක්වන ලදැයි දතයුතුයි. **අධිපතිං කත්වා** යනු අරමුණ අධිපතිකොට, ඔව්හු වනාහි පරිණත ස්වභාවය ම ඇත්තෝ වෙත්. ආර්යශ්‍රාවකයන්ට වනාහි තමාගේ මාර්ගය ගරුකොට ප්‍රත්‍යවේක්ෂා කරන කාලයෙහි ආරම්මණාධිත්වය ලැබේ. ආර්යශ්‍රාවක තෙම චේතනාපරියා ඤාණයෙන් අන්‍යයාගේ මාර්ගය ප්‍රත්‍යවේක්ෂා කරනුයේ ගරු කරන්නේ නමුදු තමා විසින් ප්‍රතිවේධ කළ මාර්ගය (මෙන්) ගරු නො කරයි. යමාමහ පෙළහර පානා තථාගතයන් වහන්සේ දැක උන්වහන්සේගේ මාර්ගය ගරු කරයි ද, නො කරයිද යත්, කරයි. තමාගේ මාර්ගය මෙන් නොවේ. රහතන් වහන්සේ වනාහි මාර්ගඵලයත් නිවනත් හැර කිසිදු ධර්මයක් ගරු නො කරති. මෙහි ද මේ අර්ථයමය.

**වීමංසාධිපතෙය්‍යන** යන මෙය සහජාතාධිපති දක්වන්නට කියන ලදී. ඡන්දය ජ්‍යෙෂ්ඨ කොට මාර්ගය වඩන්නහුගේ වනාහි ඡන්දය අධිපති නම් වේ. මාර්ගය අධිපති නො වේ. සෙසු ධර්මයෝ ද ඡන්දාධිපති නම් වෙත්. මාර්ගාධිපති නො වෙත්. සිතෙහි ද මේ නය ම ය. වීමංසාව ජ්‍යෙෂ්ඨ කොට මාර්ගය වඩන්නහුට වීමංසාව මෙන් ම මාර්ගය ද අධිපති වෙයි. අවශේෂ ධර්මයෝ මාර්ගාධිපති නම් වෙත්. වීර්යයෙහි ද මේ නය ම ය.

උප්පන්නත්තික නිර්දේශයෙහි ජාතා යනු උපන්නෝ ය. ලබන ලද ආත්මභාවය ඇත්තෝ ය. භූතා යනාදීහු ද ඔවුන්ට ම පර්යාය වචනයෝ ය. ජාතයෝ ම වනාහි භාවොත්පතියෙන් භූතයහ. ප්‍රත්‍ය සංයෝගයෙහි උපන් හෙයින් සඤ්ජාතයහ. නිෂ්පත්ති ලක්‍ෂණප්‍රාප්ත හෙයින් නිබ්බත්තයහ. උපසර්ගයෙන් පදය දියුණුකොට නිබ්බත්තා යැයි කියන ලදී. පාකටභූතා යනු පහළවූවාහු ය. පූර්වාන්තයෙන් උඩට පත්වූවෝ යනු = උප්පන්නා ය. උපසර්ගයෙන් පදය දියුණුකොට සමුප්පන්නා යැයි කියන ලදී. නිෂ්පන්නාර්ථයෙන් ම උඩ සිටියාහු යනු උට්ඨිතා ය. ප්‍රත්‍යය සංයෝගයෙන් උඩ සිටියාහු යනු = සමුට්ඨිතා ය. නැවත උපන්නෝ යන වචනයෙහි කාරණය යට කියන ලද නයින් ම දතයුතුයි. උප්පන්නංසෙන සංගහීතා යනු උපන් කොටසින් ගණන් ගත්, රූපවෙදනා සඤ්ඤාය සංඛාර විඤ්ඤාණං යන මෙය ඔවුන්ගේ ස්වභාවය දැක්වීම ය. ද්විතීය පද නිර්දේශය කියන ලද්ද ප්‍රතිෂේධ නයින් දතයුතුයි. තෘතීයපද නිර්දේශය ප්‍රකට අර්ථ ඇත්තේ ම ය.

මේ ත්‍රිකය වනාහි අද්ධානද්වය වශයෙන් පුරවා දක්වන ලදී. ලබන ලද අවකාශ ඇති කර්මයාගේ විපාකය ක්‍ෂණප්‍රාප්තය අප්‍රාප්තය වශයෙන් ද්විධය. එහි උපන්නේ ක්‍ෂණප්‍රාප්ත නම්. අප්‍රාප්තවිපාකය සිත් අතර හෝ කල්ප ලක්‍ෂයක් ඉක්මවා හෝ උපන්නත් ධ්‍රැවප්‍රත්‍ය හේතුවෙන් නැත්තේ නම් නොවෙයි. උපදනා ධර්මයෝ නම් වෙයි. එහෙයින් මෙසේ වදාළහ. 'පොට්ඨපාදය, මේ අරූපී සංඥාමය ආත්මය ආත්මය සිටිනේ ම ය. ඉක්බිති මේ පුරුෂයාගේ අන්‍ය වූ ම සංඥාවෝ උපදිත්. අන්‍ය වූ ම සංඥාවෝ නිරුද්ධ වෙත්' යනුයි. මේ අරූපාවචරයෙහි කාමාවචර සංඥා ප්‍රවෘත්ති කාලයෙහි මූලභවංගසංඥා ද නිරුද්ධ වුවත්, කාමාවචර සංඥාව නිරුද්ධ කාලයෙහි වනාහි අවශ්‍යයෙන් ම එය උපදනේ යැයි ද අරූපසංඛ්‍යාත ආත්මය නැත්තේ ය යන ගණනට නොගොස් සිටිනේම යැයි නම් විය. මෙපරිද්දෙන් ලබන ලද අවකාශ ඇති කර්මයාගේ විපාකය ද්විධය. -පෙ- ධ්‍රැවප්‍රත්‍ය හේතුවෙන් නැත්තේ නම් නො වෙයි. උපදිනා ධර්මයෝ යැයි නම් විය.

යම්හෙයකින් වනාහි රැස්කරන ලද සියලු කුශලාකුශල කර්මය විපාක දෙන්නේ ද අන්‍ය කර්මයකට අවකාශ නො වන්නේ ද, එය වනාහි ධ්‍රැවවිපාක අධ්‍රැවවිපාක වශයෙන් ද්විධ වෙයි. එහි පංචානන්තරිය කර්ම අෂ්ට සමාපත්ති සතර ආර්යමාර්ගය යන මේ ධ්‍රැවවිපාක නමි. එය වනාහි ක්‍ෂණප්‍රාප්ත ද ඇත. අප්‍රාප්ත ද ඇත. එහි ක්‍ෂණ ප්‍රාප්තය උප්පන්න

නම්. අප්‍රාප්තය අනුප්පන්න නම්. එහි විපාකය චිත්තානන්තරයෙහි හෝ කල්ප ලක්‍ෂයක් ඉක්ම හෝ උපදීවා. ධ්‍රැව ප්‍රත්‍ය හේතුවෙන් අනුප්පන්න නම් නො වෙයි. උපදනා ධර්ම නම් විය. මෛත්‍රිය බෝසතුන්ගේ මාර්ගය නූපන්නේ නම්. ඵලය උපදනා ධර්මයෝ ම යැයි නම් විය.

අතීතත්‍රිකයෙහි **අතීතා** යනු ක්‍ෂණත්‍රය ඉක්මවූවෝ ය. **නිරුද්ධා** යනු නිරෝධයට පත්වූවෝ ය. **විගතා** යනු විභවයට (නැතිවීමට) ගියාහු, පහවගියෝ හෝ, **විපරිණාමා** යනු ප්‍රකෘතිය අතහැරීමෙන් විපරිණාමයට ගියාහු, නිරෝධසංඛ්‍යාත අස්තයට ගියාහු යනු = **අත්‍ථංගතා** ය. අබ්භත්‍ථංගමා යනු උපසර්ගයෙන් පදය දියුණු කරන ලදී. **උප්පජ්ජිත්වා විගතා** යනු ඉපිද පහව ගියාහුය. නැවත අතීත වචනයෙහි හේතුව යට කියන ලද ම ය. පරවූ අනාගතාදියෙහි ද මේ නය ම ය. **අතීතංසෙන සංගහීතා** යනු අතීත කොටසින් ගණනයට ගියාහු ය. **කතමෙ තෙ** යනු රූපය, වේදනාවය, සංඥාවය, සංස්කාරයෝ ය. විඥානය ය. පරවූ අනාගතාදියෙහි ද මේ නය ම ය.

අතීතාරම්මණත්‍රික නිර්දේශයෙහි **අතීතෙ ධම්මෙ ආරබ්භ** යන ආදීන්හි පරිත්ත මහද්ගත ධර්මයෝ ම දතයුතුයි. ඔවුහු අතීතාදිය අරබයා උපදිත්.

ආධ්‍යාත්මිකත්‍රික නිර්දේශයෙහි **තෙසං තෙසං** යන පද දෙකින් සියලු සත්ත්වයන් හාත්පසින් ගනී. **අජ්ඣත්තං පච්චත්තං** යන දෙක නියත ආධ්‍යාත්මයට නමයි. **නියතා** යනු තමා කෙරෙහි උපන්නාහු ය. **පාටිපුග්ගලිකා** යනු (වෙන්) වෙන් වූ පුද්ගලයන් සන්තක වූවාහු ය. **උපාදින්නා** යනු ශරීරයෙහි පිහිටියාහු ය. ඔව්හු වනාහි කර්මයෙන් උපන්නෝ හෝ නූපන්නෝ වෙත්වා. ආදින්නයන් විසින් ගන්නා ලද පරාමර්ශ වශයෙන් වනාහි මෙහි උපන්නාහු යැයි කියන ලදහ. **පරසත්තානං** යනු තමා හැර අවශේෂ සත්ත්වයින්ට, **පරපුග්ගලානං** යනු ද එයට ම පරියාය වචනයකි. අවශේෂය යට කියන ලද්ද සමාන ම ය. **තදුභයං** යනු එකී දෙකයි. ආධ්‍යාත්මාරම්මණත්‍රිකයෙහි ප්‍රථම පදයෙහි පරිත්ත මහද්ගත ධර්මයෝ දතයුත්තාහ. දෙවැන්නෙහි අප්‍රමාණයෝ ද තෙවැන්නෙහි පරිත්ත මහද්ගතයෝ ද දතයුත්තාහ. අප්‍රමාණයෝ වනාහි කලකදී බාහිර ද කලක දී ආධ්‍යාත්මය ද අරමුණු නො කරත්. සනිදර්ශනත්‍රික නිර්දේශය වනාහි ප්‍රකට ම ය.

දුකයන්හි අදෝෂ නිර්දේශයෙහි මෛත්‍රී කිරීම වශයෙන් = **මෙත්ති** ය. මෛත්‍රී ආකාරය = **මෙත්තායනා** යනු මෛත්‍රියෙහි යෙදුණාහුගේ මෛත්‍රියෙන් යුක්ත වූවහුගේ සිතෙහි ස්වභාවය = **මෙත්තායිතත්තං** ය. ආරක්ෂා කරයි යනු **අනුද්දාය**, රක්‍ෂා කරයි යන අර්ථයි. ආරක්ෂා කරන ආකාරය **අනුද්දයතා ය.** අනුද්දායිතහුගේ භාවය = **අනුද්දායිතත්තය**, හිතය සෙවීම් වශයෙන් = **හිතෙයිතා ය.** අනුකම්පා කිරීම් වශයෙන් = **අනුකම්පාය.** මේ සියලු ම පදයන්ගෙන් උපචාර අර්පණා ප්‍රාප්ත මෛත්‍රිය ම කියන ලදී. සෙසු පදයන්ගෙන් ලෞකික ලෝකෝත්තර අද්වේෂය කියන ලදී.

අමෝහ නිර්දේශයෙහි **දුක්ඛෙ ඤාණං** යනු දුඃඛසත්‍යයෙහි ප්‍රඥාවයි. **දුක්ඛ සමුදයෙ** යනාදීන්හි ද මේ නය ම ය. මෙහි ද දුඃඛසත්‍යයෙහි ඥානය ශ්‍රවණ සම්මර්ශන ප්‍රතිවේධ ප්‍රත්‍යවේක්‍ෂණයන්හි වැටේ. දුඃඛ සමුදයෙහි ද එසේ ම ය. නිරෝධයෙහි වනාහි ශ්‍රවණ ප්‍රතිවේධ ප්‍රත්‍යවේක්‍ෂණයන්හි ම ය. ප්‍රතිපදාවෙහි ද එසේම ය. **පුබ්බනෙත** යනු අතීත කොට්ඨාසයෙහි ය. **අපරනෙත** යනු අනාගත කොට්ඨාසයෙහි ය. **පුබ්බනතා පරනෙත** යනු ඒ දෙකෙහි ම ය. **ඉදප්පච්චයතා පටිච්ච සමුප්පන්නෙසු ධම්මෙසු ඤාණං** යනු මේ ප්‍රත්‍යයයි. (මේ ප්‍රත්‍යයෙන් උපන්නේය) මෙය නිසා මෙය උපන්නේයැයි මෙසේ ප්‍රත්‍යයන්හි ද ප්‍රත්‍යෝත්පන්න ධර්මයන් හි ද ඥානයයි.

ලෝභායතන නිර්දේශයෙහි ද යට නො ආ පදයන්ගේ මේ අර්ථයයි. සිත් ඇලවීම් වශයෙන් **රාගො** ය. (බලවත් රඳවන අර්ථයෙන් = **සාරොගො ය.** විෂයයන්හි සත්ත්වයන් මෙහෙයවන හෙයින් = **අනුනයො ය.** රුචි වේ යනු = **අනුරොධො ය**, කැමතිවේ යන අර්ථයි. සත්ත්වයෝ භවයෙහි යම්කිසි තැනෙක මෙයින් සතුටු වෙති තෙමේ හෝ සතුටුවෙයි යනු = නන්දිය, නන්දියත් එය ය. සිත් ඇලවීම් අර්ථයෙන් රාගයත් එයයි යනු = **නන්දිරාගො** එහිදී එක් අරමුණෙක වරක් උපන් තෘෂ්ණාව නන්දියයි. නැවත නැවත උපදින්නේ **නන්දිරාගො** යැයි කියනු ලැබේ. **චිත්තස්ස සාරාගො** ය එය යට දැඩිව සිත් අලවන අර්ථයෙන් සාරාගොයැයි කියන ලදී. එය සත්ත්වයාගේ නොවේ. ඒ රාගය චිත්තයාගේම ය යන අර්ථයි.

මෙයින් අරමුණු කැමතිවනු ලැබේ යනු = **ඉච්ඡාය**, බහුල වූ කෙලෙස් හෙයින් මෙයින් සත්ත්වයෝ මූර්ඡාවෙත් යනු = මුච්ඡා ය. ගිලී නිමාවට

පැමිණ ග්‍රහණය කිරීම් වශයෙන් = **අජ්ඣොසානය,** සත්ත්වයෝ මෙයින් ගිජුවෙත්. ගිජුබවට පැමිණෙත් යනු = **ගෙධ** ය. බහලාර්ථයෙන් හෝ **ගෙධො** ය. බහලාර්ථයෙන් ගෙධය ම හෝ වනලැහැබකැයි කියන ලදී. අනතුරු පදය උපසර්ග වශයෙන් දියුණු කරන ලදී. සර්වභාගයෙන් ම ගිජු වූයේ යනු හෝ = **පලිගෙධො** ය, මෙයින් ඇලෙත් යනු = **සංගො** ය. ඇලීම් අර්ථයෙන් හෝ **සංගො** ය. ගිලාබැසීම් අර්ථයෙන් **පංකො** ය. ඇදගැනීම් වශයෙන් = **එජා** ය. මෙයින් පුරුෂයා ඒ ඒ භවයෙහි උත්පත්තියට ඇදගනී යැයි කියන ලදී. වචනාර්ථයෙන් **මායා** ය. සසරෙහි සත්ත්වයන් උපදවන අර්ථයෙන් **ජනිකාය,** තෘෂ්ණාව පුරුෂයා උපදවයි. ඔහුගේ සිත දුවයි' යැයි ද කියන ලදී. සංසාරයෙහි සත්ත්වයන් දුකින් යොදමින් උපදවයි යනු = **සඤ්ජනනී** ය. ගැටීම් අර්ථයෙන් = **සිබ්බනී** ය. මෙය වනාහි සන්නාලියකු රෙදිකඩින් රෙදිකඩ ගෙන මසන්නාක් මෙන් සත්ත්වයන් සසර ච්‍යුතිප්‍රතිසන්ධ වශයෙන් වසයි. ඝටනය කරයි. එහෙයින් ඝටනාර්ථයෙන් **සිබ්බනි** යැයි කියන ලදී. අනේකප්‍රකාර විෂයජාලයත්, තෘෂණාවෙන් පන්නවා ඇතුළුකිරීම් සංඛ්‍යාත ජාලයක් හෝ මෙයට ඇත්තේය යනු හෝ = **ජාලිනී** ය. ඇදගැනීම් වශයෙන් වේගවත් සැඩපහර ඇති නදියක් වැනිය යනු = **සරිතා** ය. ඊයක් වැනිය යන අර්ථයෙන් ද = **සරිතා** ය. මෙය ද වදාරණ ලදී. 'සරිතානි සිනෙහිතානි සොමනසසානි භවනති ජනතුනො' (සත්ත්වයාට ගංගාවක් වැනි ස්නේහවත් සෝමනස්සයෝ වෙත්) යනුයි. තෙත් වූ මෙන් ම සිනිඳු වූ යනු මෙහි අර්ථයයි.

විසතා යනු **විසත්තිකා** (තෘෂ්ණාව) ය. විසමා යනු ද = **විසත්තිකා** (තෘෂ්ණාව) ය. විශාල වූයේ හෝ = **විසත්තිකාය.** හැකිවේ යනු ද =**විසත්තිකාය,** විසංවාදිකා යනු ද = **විසත්තිකාය,** එක්තැන් කරයි යනුද = **විසත්තිකාය,** විසමූල යනු ද **විසත්තිකාය,** විසඵල යනු ද **විසත්තිකාය,** විසපරිභෝග යනු ද = **විසත්තිකාය,** (දඟලයි යනු ද = **විසත්තිකාය**) ඒ තෘෂ්ණාව වනාහි පැතිරුණු හෙයින් හෝ රූප ශබ්ද ගන්ධ රස පොට්ඨබ්බ ධර්ම කුල ගණයන්හි පැතිරුණේ ය. විස්තාරණය වූයේ ය යනු ද = **විසත්තිකාය,** විපත්ති ව්‍යසනයන්ට පමුණුවන අර්ථයෙන් කළයක බඳනා ලද නූලක් මෙනි යනු = **සුත්ත** ය. මෙය ද වදාරන ලදී. 'සුත්තනති බො භිකඛවෙ, නන්දිරාගසෙසතං අධිවචනං' යනුයි. (මහණෙනි, සුත්ත යන මෙය නන්දිරාගයට නමකි.)

රූපාදීන්හි පැතිරෙන අර්ථයෙන් = විසමය, ඒ ඒ ප්‍රතිලාභයන් සඳහා සත්ත්වයන් රැස්කරවයි යනු = ආයූහණිය, කලකිරෙන්නට ඉඩ නොදීම් වශයෙන් සහායවන අර්ථයෙන් = දුතියා ය. මෙය වනාහි සත්ත්වයන්ට සසර කලකිරීමට නොදෙයි. ගිය ගිය තැන ප්‍රිය සහායකයකු මෙන් අභිරමණය කරවයි. එහෙයින් ම වදාරන ලදී.

**තණ්හා දුතියො පුරිසො දීඝමද්ධාන සංසරං**
**ඉත්ථභාවඤ්ඤථාභාවං සංසාරං නාතිවත්තතීති**

දීර්ඝමාර්ගයක (සසර) සැරිසරන පුරුෂයා තෘෂ්ණාව දෙවැන්නා (සහායකයා) කොට ඇත්තේ ය. මේ තත්ත්වය වෙනස් තත්ත්වයට (ඉපදෙමින් මැරෙමින් ගමන් කරන තත්ත්වය ඇති) පත්කරන සසර නො ඉක්මවයි යනුයි.

ප්‍රාර්ථනා කිරීම් වශයෙන් = **පණිධි ය, භවනෙත්ති** යනු භවරජ්ජුවයි. බවරැහැනයි. මෙයින් වනාහි රැහැනකින් බෙල්ලෙහි බැඳ ගවයින් කැමති කැමති තැන්වලට ගෙනයන්නාක් මෙන් සත්ත්වයෝ (කැමති කැමති තැන්වල) පමුණුවති. ඒ ඒ අරමුණට ආශාකරයි. භජනය කරයි ඇලෙයි යනු = **වනං** ය. (ඉල්ලයි) යාචනය කරයි යනු හෝ = **වනං** ය, **වනථා** යනු ව්‍යඤ්ජනයෙන් පදය දියුණු කරන ලදී. අනර්ථකාරී වෘක්ෂයන්ගේ මතුවීමෙන් හෝ ගහනවීම් අර්ථයෙන් ද වනයක් මෙනි යනු හෝ = **වනං** ය. මෙය බලවත් තෘෂ්ණාවට නමකි. ගහණතරාර්ථයෙන් හෝ එයට වඩා බලවතර වූයේ **වනථො** නම්. එහෙයින් කියන ලදී.

**වනං ඡින්දථ මා රුක්ඛං වනතො ජායතී භයං**
**ඡෙත්වා වනඤ්ච වනථඤ්ච නිබ්බාණා හොථ භික්ඛවොති**

වනය සිඳිව්. රුක නොසිඳිව්. වනයෙන් බිය ඇතිවේ. මහණෙනි, වනයත් වනථයත් සිඳ වනයෙන් නික්මුණෝ (නිවනට පත්වූවෝ) වව්.

**සන්ථවන** වශයෙන් **සන්ථවො** ය. සංසර්ගය යන අර්ථයි. එය තෘෂ්ණා සන්ථවය, මිත්‍ර සන්ථවය යැයි දුවිධය. ඔවුනතුරෙන් මෙහිදී තෘෂ්ණා සන්ථවය අභිප්‍රේතය. ස්නේහ වශයෙන් **සිනෙහො** ය. ආලය කිරීම් වශයෙන් අපේක්ෂා කෙරේ යනු = **අපෙක්ඛා** ය. මෙය ද වදාරන ලදී. 'ඉමානි තෙ දෙව,

චතුරාසීති නගර සහස්සානි කුසාවතී රාජධානිපමුඛානි. එත්ථ දෙව, ඡන්දං ජනෙහි විජිතෙ අපෙක්ඛං කරොහී'ති (දේවයන් වහන්ස, කුසාවතී රාජධානිය ප්‍රමුඛ කරගත් ඔබවහන්සේගේ මේ අසූහාරදහසක් රාජධානිය, දේවයන් වහන්ස, මෙහි කැමැත්ත උපදවන්න, රාජ්‍යයෙහි අපේක්‍ෂාව ඇතිකර ගන්න) යනුයි. මෙහි අර්ථය වනාහි ආලය කරන්න යනුයි.

වෙන් වෙන් වූ අරමුණෙහි බැඳේ යනු = **පටිබන්ධු** ය. ඥාති යන අර්ථයෙන් හෝ වෙන් වෙන් වූ බන්ධු යනු ද = **පටිබන්ධු** ය. නිතර ඇසුරු කිරීම් අර්ථයෙන් වනාහි සත්ත්වයින්ට තෘෂ්ණාව සමාන බන්ධු කෙනෙක් නම් නැත යනුයි. අරමුණ අනුභව කිරීම් වශයෙන් ආසනය වසාගෙන පැතිරෙන හෙයින් මෙන් ම තෘප්තියට නො පැමිණ හෙයින් ද යනු අර්ථයි. ආශිංසන වශයෙන් ආසිංසනාය, ආශිංසනය කරන ලද්දහුගේ භාවය ආසිංසිතත්තය, දැන් එය පවත්නා තැන දක්වන්නට රූපාසා යන ආදිය කියන ලදී. එහි ආශිංසන වශයෙන් (ආසා යැයි) ආසා යන්නේ අර්ථය ගෙන රූපයෙහි ආශාව රූපාසා යැයි මෙසේ පද නවයම දතයුතුයි. මෙහි ද පළමු පස පංචකාම ගුණ වශයෙන් කියන ලදී. සවැන්න පරිෂ්කාර ලෝභ වශයෙනි. එය විශේෂයෙන් පැවිද්දන්ට ය. අතෘප්තික වස්තු වශයෙන් ඉන් පරව වූ තුන ගිහියන්ටය. ඔවුන්ට ධනය පුත්‍රයෝ ය. ජීවිතය යන මේවාට වඩා ප්‍රියකර වූ (අන්‍ය වස්තුවක්) නො මැත. මේක මගේ ය. අරක මගේ යැයි හෝ අසවලා විසින් මෙය මට දෙන ලදී. මෙයත් දෙන ලදැයි හෝ මෙසේ සත්ත්වයන් ලවා නන් දොඩවානුයි = **ජප්පා** ය. පරව ඇති දෙපදය උපසර්ගයෙන් වඩන ලදී. ඉන් පරව අන්‍යාකාරයකින් බෙදන්නට පටන්ගත් හෙයින් නැවත **ජප්පා** යැයි කියන ලදී. නන් දොඩනාකාරය = **ජප්පනාය**, ජල්පිතයාගේ භාවය = **ජප්පිතත්තය**, නැවත නැවත විෂයන් පැහැරගනී ඇදගනී යනු = **ලොලුපො** ය. ලෝලුපයාගේ භාවය = **ලො ලුප්පං** ය. පැහැරගන්නා ආකාරය **ලොලුප්පායනාය**, පැහැර ගැනීමේ එක්වූවහුගේ භාවය = **ලොලුප්පායිතත්තං** ය.

**පුච්ඡකතා** යනු යම් තණ්හාවකින් ලාභ ස්ථානයන්හි වලග සලනා සුනඛයන් මෙන් සැලෙමින් හැසිරෙත් ද, එය ඒ කම්පන තෘෂ්ණාවට නමකි. යහපත් (මනාප) මනාප විෂයන් කැමති වේ යනු = **සාධුකාමො** ය. එහි භාවය = **සාධුකම්පතාය**, මව මවගේ සොහොයුරිය ආදීන් කෙරෙහි අයුතු තැන රාගය යනු = **අධම්මරාගො** ය. සුදුසු තැනදී ද බලවත්ව උපන් ලෝභය = **විසමලොභො** ය. රාගය විසමය යන වචනයෙන් හෝ

සුදුසු තැන හෝ නුසුදුසු තැන හෝ උපන් ඡන්දරාගය අර්ධමාර්ථයෙන් **අධම්මරාගො** ය. විෂමාර්ථයෙන් විෂමලෝභය යැයි දතයුතුයි. ආරම්මණයන්ට ආශාකිරීම් වශයෙන් **නිකන්ති** ය. ආශා කරන ආකාරය **නිකාමනා** ය. ප්‍රාර්ථනා වශයෙන් **පත්ථනාය**, ප්‍රියවීම් වශයෙන් **පිහායනාය**, මනාව ප්‍රාර්ථනා කිරීම් වශයෙන් **සම්පත්ථනා** ය. පංචකාම ගුණයන්හි තෘෂ්ණාව **කාමතණ්හාය**. රූපාරූප භවයන්හි තෘෂ්ණාව **භවතණ්හාය**. උච්ඡේද සංඛ්‍යාත විභවයෙහි තෘෂ්ණාව **විභව තණ්හාය**. ශුද්ධ වූ රූප භවයෙහි ම තෘෂ්ණාව **රූප තණ්හාය**. අරූප භවයෙහි තෘෂ්ණාව **අරූප තණ්හාය**. උච්ඡේද දෘෂ්ටි සහගත රාගය **දිට්ඨි රාගො** ය. නිරෝධයෙහි තෘෂ්ණාව **නිරොධ තණ්හාය**. (රූපයෙහි තෘෂ්ණාව **රූපතණ්හා**) ය. ශබ්දයෙහි තෘෂ්ණාව **සද්ද තණ්හාය**. ගන්ධතණ්හා ආදීන්හි ද මේ නය ම ය.

ඕඝාදීහු කියන ලද අර්ථ ඇත්තාහු ම ය. කුශල ධර්මයෙහි හැසිරේ යනු = **ආවරණය**, වැසීම් වශයෙන් **ඡාදනං** ය. සත්ත්වයන් සංසාරයෙහි බඳී යනු = **බන්ධනං** ය. සිතට පැමිණ කෙලෙසෙයි කිලිටු කරයි යනු = **උපක්කිලෙසො** ය. බලයට පත් අර්ථයෙන් අනුව සයනය කරයි යනු = **අනුසයො** ය. උපන්නා වූ සිත මැඩගනී යනු = **පරියුට්ඨානං** ය. උපදින්නට නොදීමෙන් කුශලාචාරය ගනී යන අර්ථයි. මෙසේ මෙහි ද ආදීන්හි වනාහි මාර්ගය ගත්තාහුය යන අර්ථයි. මෙසේ මෙහි ද ග්‍රහණාර්ථයෙන් පරියුට්ඨානය දතයුතුයි. හාත්පසින් වෙළන අර්ථයෙන් ලතාවක් මෙනි යනු = **ලතා** ය. 'ලතා උබ්භිජ්ජ තිට්ඨති' යැයි ආ තැන ද මේ තෘෂ්ණාව ලතා යැයි කියන ලදී. විවිධ වස්තූන් කැමති වේ යනු **වෙවිච්ඡං** ය. සංසාර දුකට මූලය යනු = **දුක්ඛමූලං** ය. ඒ දුකට නිදානය යනු = **දුක්ඛනිදානං** ය. ඒ දුක මෙයින් ප්‍රභව වේ යනු = **දුක්ඛප්පභවො** ය. බන්ධනාර්ථයෙන් පුඩුවක් මෙන් ය යනු = **පාසො** ය. මාරයාගේ පාසය = **මාරපාසො** ය. වැමෑරිය නොහැකිය යන අර්ථයෙන් බිළියක් වැනිය යනු = **බළිසං** ය. මාරයාගේ බිළියය = **මාරබළිසං** ය. තෘෂ්ණාවෙන් මඩනා ලද්දාහු මාරයාගේ විෂය නොඉක්මවත්, ඔවුන් මත්තෙහි මාරයා වශයේ පවතීය යන මේ පර්යායයෙන් මාරයාගේ විෂය යනුයි. **මාරවිසයො** ය. ගලාබසී යන අර්ථයෙන් තෘෂ්ණාවම නදියක යනු **තණ්හා නදීය**.

වසාගෙන පැතිරෙන අර්ථයෙන් තෘෂ්ණාව ම ජාලයක් වූයේ **තණ්හාජාලං** ය. **සම්පටියකින්** බඳනා ලද සුනඛයෝ යම්සේ කැමති තැනකට පමුණුවනු ලබත් ද මෙසේ තෘෂ්ණාවෙන් බඳනා ලද සත්ත්වයෝ ද

දැඩිව බඳනා ලද අර්ථයෙන් සම්පටියක් මෙනැයි **ගද්දූලං** ය. තණ්හාව ම ගද්දූලය වූයේ **තණ්හා ගද්දූලං** ය. පිරවීමට දුෂ්කරය යන අර්ථයෙන් තණ්හාව ම සමුද්ද වූයේ **තණ්හා සමුද්දො** ය.

ද්වේෂ නිර්දේශයෙහි **අනත්ථං මෙ ආචරි** යනු මට අනභිවෘද්ධියක් (පාඩුවක්) කෙළේය. මෙම උපායෙන් සියලු පදයන්හි අර්ථය දතයුතුයි. **අට්ඨානෙ වා පන ආඝාතො** යනු නිකරුණෙහි කෝපයයි. ඇතැම් අයෙක් වැස්ස අධික ව වසීයැයි කිපෙත්. නො වසී යැයි කිපෙත්. සූර්යයා තවයි යැයි කිපෙත්. නො තවයි යැයි කිපෙත්. සුළඟ හමන විටත් කිපෙත්. නො හමන විටත් කිපෙත්. හමදින්නට නො හැකි ව බෝපත්වලටත් කිපෙත්. සිවුරු පොරවාගත නො හැකිව ද එයට කිපෙත්. පය හැපී කණුවට කිපෙත්. මෙය සඳහා **අට්ඨානෙ වා පන ආඝාතො ජායති** යැයි වදාරන ලදී. එහිදී යට නවාතැනෙක සතුන් අරබයා උපන් හෙයින් කර්මපථභේදය වෙයි. අස්ථානාඝාතය වනාහි සංස්කාරයන්හි උපන්නේ කර්මපථ භේදය නො කරයි. සිතට ආඝාත කෙරෙමින් උපන්නේ යනු = **චිත්තස්ස ආඝාතො** ය. එයට වඩා බලවතර වූයේ **පටිඝාතො** ය. හැපීම් වශයෙන් **පටිඝ** ය. ප්‍රතිවිරුද්ධ වේ යනු = **පටිවිරොධො** ය. කිපීම් වශයෙන් **කොපො** ය. **පකොපො සම්පකොපො** යැයි උපසර්ගයෙන් පදය වැඩිණ. දූෂ්‍යවීම් වශයෙන් **දොසො** ය. **පදොසො සම්පදොසො** යැයි උපසර්ගයෙන් පදය වැඩිණ. **චිත්තස්ස බ්‍යාපත්ති** යනු සිත විනාශ වී ගිය බව විපර්යාස වෙන ආකාරයයි. සිත දූෂණය උපදී යනු = **මනොපදොසො** ය. කිපීම් වශයෙන් = **කොධො** ය. කිපෙන ආකාරය **කුජ්ඣනා** ය. කිපුණහුගේ භාවය = **කුජ්ඣිතත්තං** ය. දැන් අකුශල නිර්දේශයෙහි කියන ලද නය දක්වන්නට **දොසො දුස්සනා** යන ආදිය කියන ලදී. එහෙයින් **යො එවරූපො චිත්තස්ස ආඝාතො -පෙ- කුජ්ඣිතත්තං** යැයි මෙහි කියන ලද්ද **දොසො දුස්සනා** ආදී නයින් ම යට කියන ලදී. **අයං වුච්චති දොසො** යැයි මෙසේ මෙහිදී යෝජනාව කළයුතුයි. මෙසේ ඇති කල්හි වනාහි පුනරුක්ත දෝෂය ප්‍රතිෂේධ කරන ලද්දේ වෙයි.

මෝහ නිර්දේශය අමෝහ නිර්දේශයෙහි කියන ලද්දට ප්‍රතිපක්ෂ නයින් දතයුතු යි. මෙය වනාහි සර්වාකාරයෙන් විභංග අටුවා කථාවෙහි මතු පළවන්නේ ය. **තෙහි ධම්මෙහි (යෙ ධම්මා) සහෙතුකා** යනු ඒ හේතු ධර්මයන්ගෙන් අන්‍ය වූ යම් හේතුධර්මයෝ හෝ නහේතු ධර්මයෝ හෝ වෙත්නම් සහේතුකයෝ ය. අහේතුක පදයෙහි ද මේ නය ම ය. මෙහිදී

හේතුව හේතුව ම වෙයි. තිදෙනෙකුගේ හෝ දෙදෙනෙකුගේ එකට ඉපදීමේ දී සහේතුක ද වෙයි. විචිකිච්ඡා උද්ධච්ච සහගත මෝහය වනාහි හේතු අහේතුක ය. හේතු සම්ප්‍රයුක්ත ද්වික නිර්දේශයෙහි ද මේ නය ම ය. සංඛත දුක නිර්දේශයෙහි පළමු දුකයෙහි කියන ලද අසංඛතධාතුව සඳහා 'යො එව සො ධම්මො' යැයි ඒකවචන නිර්දේශය කරන ලදී. පුරිම දුකයෙහි වනාහි බහුවචන වශයෙන් විචාරීම උද්ධෘත හෙයින් 'ඉමෙ ධම්මා අප්පච්චයා' යැයි පෘච්ඡානුසන්ධි වශයෙන් බහුවචනයෙන් කරන ලදී. **ඉමෙ ධම්මා සනිදස්සනා** යනාදීන්හි ද මේ නය ම ය.

කෙනචි විඤ්ඤෙය්‍ය දුක නිර්දේශයෙහි **චක්ඛු විඤ්ඤෙය්‍යා** යනු චක්ෂුර් විඥානයෙන් දතයුතු? සෙසු පදයන්හි ද මේ නය ම ය. මෙහි ද **කෙනචි විඤ්ඤෙය්‍යා** යනු චක්ෂුර් විඥානාදීන් අතුරෙන් චක්ෂුර් විඥානයෙන් හෝ ශ්‍රෝත විඥානයෙන් හෝ කිසියම් එකකින් දැනගත යුතු වූ, **කෙනචි න විඤ්ඤෙය්‍යා** යනු චක්ෂුර් විඥානයෙන් හෝ ශ්‍රෝත වඥානයෙන් හෝ කිසිවෙකින් නො දතයුතු වූ, මෙසේ ඇති කල්හි පද දෙකෙහි ම නානත්වයෙන් දුකය වේ යැයි යට කියන ලද හෙයින් යම් ඒ ධර්ම කෙනෙක් චක්ෂුර් විඥෙය්‍ය ද ඒ ධර්මයෝ ශ්‍රෝත විඥෙය්‍ය නොවෙත් යැයි මෙය දුකයක් නො වේ ද? රූපය වනාහි චක්ෂුර් විඥෙය්‍ය ය, ශබ්දය චක්ෂුර් විඥෙය්‍ය නොවේ යන මේ අර්ථය ගෙන යම් ඒ ධර්මකෙනෙක් චක්ෂුර් විඥෙය්‍ය ද ඒ ධර්මයෝ ශ්‍රෝත විඥෙය්‍ය නො වෙත්. යම් හෝ ඒ ධර්ම කෙනෙක් ශ්‍රෝත විඥෙය්‍ය නො වෙත්. යම් හෝ ඒ ධර්ම කෙනෙක් ශ්‍රෝත විඥෙය්‍ය ද, ඒ ධර්මයෝ චක්ෂුර් විඥෙය්‍ය නොවෙත් යැයි මේ එක් දුකයෙකැයි දතයුතුයි. මෙසේ එක් එක් ඉන්ද්‍රිය මූලකයන් සතර සතර කොට දුක විස්සක් බෙදන ලදැයි දතයුතුයි.

කිම මනෝවිඥානයෙන් කෙන චි විඥෙය්‍යයෝත් කෙනචි නවිඥෙය්‍යයෝත් නැත් ද එහෙයින් මෙහි දී දුකයෝ නො කියන ලද්දාහු ද, යනුයි. නැත්තාහු නො වෙත්. ව්‍යවස්තාභාවයෙන් වනාහි නො කියන ලදී. එසේ චක්ෂුර්විඥානයෙන් අවිඥෙය්‍ය මය යැයි ව්‍යවස්ථානයක් නොමැත. මෙසේ මනෝවිඥානයෙන් ද ව්‍යවස්ථානයක් නැතිහෙයින් මෙහි දුකයෝ නො කියන ලදහ. මනෝවිඥානයෙන් වනාහි විඥෙය්‍යයෝ මෙන් ම අවිඥෙය්‍යයෝත් වෙති යනු මේ මෙහි අර්ථය (ඇත.) එහෙයින් එය නො කියන ලද නමුත් යථාලාභ වශයෙන් දතයුතුයි. මනෝවිඥාන සංඛ්‍යාත කාමාවචර ධර්මයන් විසින් කාමාවචර පමණක් ම කෙහිචි

විශෙෂ්ක්ඛයයෝ ය. (කෙහි චි අවිශෙෂ්ක්ඛයයෝය) ඔවුන් විසින් ම රූපාවචරාදී ධර්මයෝ ද කෙහිචි විශෙෂ්ක්ඛයයෝ ය. කෙහිචි අවිශෙෂ්ක්ඛයයෝ ය. රූපාවචරයන් විසින් ද කාමාවචරයෝ කෙහිචි විශෙෂ්ක්ඛයයෝ ය. කෙහිචි අවිශෙෂ්ක්ඛයයෝ ය. ඔවුන් විසින් ම රූපාවචරාදීහු ද කෙහිචි විශෙෂ්ක්ඛයයෝ ය. කෙහිචි අවිශෙෂ්ක්ඛයයෝ ය. අරූපාවචරයන් විසින් වනාහි කාමාවචරයෝ ද රූපාවචරයෝ ද අපර්යාපන්නයෝ ද නෙවවිශෙෂ්ක්ඛයයෝ ය. අරූපාවචරයෝ වනාහි කෙහිචි විශෙෂ්ක්ඛයයෝ ය. කෙහිචි අවිශෙෂ්ක්ඛයයෝ ය. ඔව්හු ද කෙච්ඡව විශෙෂ්ක්ඛයයෝ ය. කෙචි අවිශෙෂ්ක්ඛයයෝ ය. අපර්යාපන්නයන් විසින් කාමාවචරාදීහු නෙව විශෙෂ්ක්ඛයයෝ ය. අපර්යාපන්නයෝ වනාහි නිර්වාණයෙන් අවිශෙෂ්ක්ඛයය හෙයින් කෙච්දෙව විශෙෂ්ක්ඛයයෝ ද කෙචි අවිශෙෂ්ක්ඛයයෝ ද වෙත්. ඔව්හු ද මාර්ගඵල විශෙයය හෙයින් කෙච්දෙව විශෙෂ්ක්ඛයය ද කෙචි අවිශෙෂ්ක්ඛයය ද වෙත්.

ආශ්‍රව නිර්දේශයෙහි පංච කාමගුණික රාගය **කාමාසව** නම්. රූපාරූප භවයන්හි ඡන්දරාගය ධ්‍යාන තෘෂ්ණාව ශාස්වත දෘෂ්ටිය සමග උපන් රාගය, භව වශයෙන් ප්‍රාර්ථනාව **භවාසව** නම්. දෙසැටක් දෘෂ්ටි දිට්ඨාසව නම්. අෂ්ට ස්ථානයන්හි නොදැනීම **අවිජ්ජාසව** නම්. ඒ ඒ තැන්හි ආ භවයන්හි අසම්මෝහය පිණිස ඒකවිධාදි භේදය දතයුතුයි. මොව්හු වනාහි අර්ථ වශයෙන් බොහෝ කලක් එක්ව විසීම් අර්ථයෙන් ආශ්‍රවයෝ යැයි මෙසේ ඒකවිධ වෙත්. විනයෙහි වනාහි 'දිට්ඨ ධම්මිකානං ආසවානං සංවරාය සම්පරායිකානං ආසවානං පටිඝාතාය' යැයි දෙයාකාරයකින් ආවාහු ය. සූත්‍රාන්තයෙහි සළායතනයෙහි වනාහි 'තයොමෙ ආවුසො ද ආසවා කාමාසවො භවාසවො අවිජ්ජාසවො' යැයි ත්‍රිවිධව ආවාහු ය. නිබ්බෙධිකපරියායෙහි 'අත්‍ථි භික්ඛවෙ, ආසවා නිරයගාමිනියා, අත්‍ථිආසවා තිරච්ඡානයොනි නාමිනියා, අත්‍ථි ආසවා පෙත්තිවිසය ගාමිනියා, අත්‍ථි ආසවා මනුස්ස ලොගමනීයා, අත්‍ථි ආසවා දෙවලොකගාමිනීයා' යැයි පංචවිධව ආවාහු ය. ඡක්කනිපාතයෙහි ආහුණෙය්‍ය සූත්‍රයේ 'අත්‍ථි භික්ඛවෙ, ආසවා සංවරා පහාතබ්බා, අත්‍ථි අසවා පටිසෙවනා පහාතබ්බා, අත්‍ථි ආසවා අධිවාසනා පහාතබ්බා' අත්‍ථි ආසවා පරිවජ්ජනා පහාතබ්බා, අත්‍ථි ආසවා විනොදනා පහාතබ්බා, අත්‍ථි ආසවා භාවනා පහාතබ්බා' යැයි ෂට්විධව ආවාහු ය. සබ්බාසව පරියාය සූත්‍රයෙහි දර්ශනා ප්‍රහාතව්‍යයන් සමග සප්තවිධව ආවාහු ය. මෙහිදී වනාහි ඔව්හු කාමාශ්‍රවාදී භේදයෙන් චතුර්විධ ව ආවාහු ය. මේ එහි

වචනාර්ථයයි. පංචකාමගුණ සංඛ්‍යාත කාමයෙහි ආශ්‍රවය **කාමාසවයයි.** රූපසංඛ්‍යාත වූ කර්මයෙන් ද උත්පත්තියෙන් ද යන දෙවැදෑරුම් භවයෙහි ආශ්‍රවය **භවාසව** යයි. දෘෂ්ටියට ආශ්‍රවය වූයේ **දිට්ඨාසවයයි.** අවිද්‍යාවම ආශ්‍රවය වූයේ **අවිජ්ජාසව** යයි.

**කාමෙසු** යනු පංචකාම ගුණයන්හි, **කාමච්ඡන්දො** යනු කාමසංඛ්‍යාත ඡන්දයයි. කත්තුකම්‍යතා ඡන්දය නො වේ. ධර්මච්ඡන්දය නොවේ. කාම වශයෙන් ද ඇලීම් වශයෙන් ද කාමය ම රාගය වූයේ **කාමරාගයයි.** කාම වශයෙන් ද සතුටුවීම් වශයෙන් ද කාමය ම නන්දිය ම වූයේ = **කාමනන්දියයි.** මෙසේ සියලුතැන්හි කාමාර්ථය දැන තෘෂ්ණාකිරීම් වශයෙන් **කාමතණ්හා** ය. ස්නේහනාර්ථයෙන් **කාමසිනෙහො** ය. හාත්පසින් දවන අර්ථයෙන් **කාමපරිලාහො** ය. මූර්ඡනාර්ථයෙන් කාමුච්ඡාය. ගිලී අවසන්වන අර්ථයෙන් **කාමජ්ඣොසනය** යැයි දතයුතුයි. අයං වුච්චති යනු පද අටකින් බෙදන ලද (මෙය) කාමාසව නමැයි කියනු ලැබේ. **භවෙසු භවඡන්දො** යනු රූපාරූප භවයන් භවප්‍රාර්ථනා වශයෙන් ම පවත්නා ඡන්දය **භවඡන්දයයි.** සෙසු පදයන් ද මේ නයින් ම දතයුතුයි.

**සස්සතො ලොකො** තිවා යනාදී දස ආකාරයෙන් දෘෂ්ටි ප්‍රභේදය ම කියන ලදී. එහි **සස්සතො ලොකො** යන මෙහිදී ස්කන්ධ පංචකය ලෝකය යැයි ගෙන මේ ලෝකය නිත්‍යය ධ්‍රැවය සර්වකාලිකයැයි ගන්නහුගේ ශාස්වතයැයි ගන්නා ආකාරයෙන් පවත්නා දෘෂ්ටියයි. **අසස්සතො** යනු ඒ ලෝකය ම සිඳෙන්නේ ය, විනාශවන්නේ යැයි ගන්නහුගේ උච්ඡේද ග්‍රහණාකාරයෙන් පවත්නා දෘෂ්ටියයි. **අනතවා** යනු කුල්ලක් පමණ වූ හෝ හැන්දක් පමණ වූ කසිණයෙහි සමවැදුණු, සමවත ඇතුළත පැවති රූපාරූප ධර්මයන් ලෝකය යැයි ද කසිණ පරිච්ඡේදාන්තයෙන් අන්තවත් යැයි ද ගන්නා වූ. පරිත්ත කසිණලාභියාගේ ලෝකය අනන්තවත් යැයි ගන්නා ආකාරයෙන් පවත්නා දෘෂ්ටියයි. එය ශාස්වත දෘෂ්ටියක් වෙයි. උච්ඡේද දෘෂ්ටියක් වෙයි. (*අනතනවානි අනන්තවා යනු) විපුලකසිණයෙහි සමවැදුණු සමවත ඇතුළත පවත්නා රූපාරූප ධර්මයන් ලෝකය යැයි ද කසිණ පරිච්ඡේදන්තයෙන් අනන්ත යැයි ගන්නා වූ විපුලකසිණලාභියාගේ

---

(* අනතනවාති අනන්තවා යනු) මෙම අනන්තවා යන්නත් එයට අර්ථයත් පරිවර්තක විසින් එකතු කරන ලදී. මෙයට නිරීක්ෂක මණ්ඩලය නිරීක්ෂක මණ්ඩලයේ අවධානය යොමුවිය යුතු ය.

ලෝකය අනන්තයැයි ගන්නා ආකාරයෙන් පවත්නා දෘෂ්ටියයි. එය ශාස්වත දෘෂ්ටිය ද වෙයි. උච්ඡේද දෘෂ්ටිය ද වෙයි. **තං ජීවං තං සරීරං** යනු බිඳීම ස්වභාවය කොට ඇති ශරීරය ජීවයයැයි ගත්හෙයින් ශරීරය බිඳෙන කල්හි ජීවය ද බිඳේයැයි ශාස්වත ග්‍රහණාකාරයෙන් පවත්නා දෘෂ්ටියයි. **හොති තථාගතො (පරම්මරණා)** යනාදීන්හි සත්ත්වයා තථාගත නම්. ඒ සත්ත්වයා මරණින් මතු වන්නේ යැයි ගන්නහුගේ ශාස්වත දෘෂ්ටිය පළමුවැන්නයි. **න හොති** යැයි ගන්නහුගේ උච්ඡේද දෘෂ්ටිය දෙවැන්නයි. **හොති ච නහොති** ගන්නහුගේ ඒකත්‍ය ශාස්වත දෘෂ්ටිය තුන්වැන්නයි. **නෙව හොති න නහොති** යැයි ගන්නහුගේ අමරා වික්ෂේප දෘෂ්ටිය සතර වැන්නයි. **ඉමෙ ධම්මා ආසවා** යනු මේ කාමශ්‍රවයෝ ද භවාශ්‍රවයෝ ද රාග වශයෙන් එක්කොට සංක්ෂේපයෙන් තුනකි. විස්තර වශයෙන් ධර්ම සතර ආශ්‍රව නම්.

බ්‍රහ්මයින්ගේ විමාන කල්ප වෘක්ෂ ආභරණාදීන්ගේ යම් ඡන්දරාගයක් උපදීද, එය කාමාශ්‍රව නම් වේද නො වේ ද යත්, නවේ. කවර හෙයින් ද? පංච කාමගුණික රාගය මෙහිදී ම ප්‍රහීණ බැවිනි. ලෝභය හේතු සමූහයකට පැමිණ හේතු නම් වෙයි. ගන්ථ ගොච්ඡකයට පැමිණ අභිජ්ඣා කායගන්ථ නම් වේ. ලෝභය කිලෙස සමූහයකට පැමිණ කිලේස නම් වේ. දෘෂ්ටි සහජාත රාගය කාමාශ්‍රව වේ ද නො වේ ද යත්, නො වේ. දෘෂ්ටිරාග නම් වෙයි. මෙය ද වදාරන ලදී. 'දෘෂ්ටිරාග රක්න පුද්ගලයා කෙරෙහි දුන් දානය මහත්ඵල මහානිසංස නො වේ' යනුයි. මේ ආශ්‍රවයන් වනාහි ක්ලේශ පටිපාටියෙන් මෙන් ම මාර්ග පටිපාටියෙන් ද ගෙනහැර දක්වන්නට වටී. දිට්ඨාසවය ක්ලෙශ පටිපාටියෙන් අනාගාමි මාර්ගයෙන් ප්‍රහීණ වෙයි. භවාසවය අර්හත් මගින් ද දිට්ඨාසවය සෝවාන් මගින් ද අවිජ්ජාසවය අර්හත් මගින් ද ප්‍රහීණ වේ. මාර්ග පටිපාටියෙන් සෝවාන් මගින් දිට්ඨාසවයත් අනාගාමි මාර්ගයෙන් කාමාසවයත් අරහත් මගින් භවාසව අවිජ්ජාසව දෙකත් ප්‍රහීණ වේ.

මාන නිර්දේශයෙහි සංයෝජනයන්හි **සෙය්‍යොහමස්මි මානො** යනු උත්තමාර්ථයෙන් මම ශ්‍රේෂ්ඨ වෙමි යැයි මෙසේ උපන් මානයයි. **සදිසො හමස්මි මානො** යනු සමසමාර්ථයෙන් මම සමානයැයි මෙසේ උපන් මානයයි. **හීනොමස්මීති මානො** යනු ලාමකාර්ථයෙන් මම හීනයෙක්මි යන මානයයි. මෙසේ සෙය්‍යමානය සදිසමානය හීනමානය යන මාන තුන තිදෙනෙකුට උපදී. ශ්‍රේෂ්ඨයාටත් සමානයාටත් හීනයාටත්

ශ්‍රේෂ්ඨයෙමි. සමාන වෙමි. හීනවෙමි යන මාන තුන ම උපදී. එහි ශ්‍රේෂ්ඨයාට සෙය්‍යමානයම යථාවමානයයි. ඉතිරි දෙක අයථාවමාන ය, සදිසයාට සදිස මානය ම හීනයාට හීනමානය ම යථාවමාන ය. ඉතිරි දෙක අයථාව මාන ය. මෙයින් කුමක් කියන ලද ද? එකෙකුට මාන තුනක් උපදී යැයි කියන ලදී. ඛුද්දක වත්‍ථුවෙහි පඨමකමාන භාජනීයයෙහි එක මානය තිදෙනාට උපදීයැයි කියන ලදී. මානකරණ වශයෙන් **මානො** ය. **මඤ්ඤනා මඤ්ඤිතත්තං** යනු ආකාර භාව නිර්දේශයෝ ය. උස්සිතාර්ථයෙන් **උන්නති** ය. යමෙකුට උපදීද ඒ පුද්ගලයා උස්වෙයි. ඔසවා තබයි යනු **උන්නමො** ය. ඔසවා තබන ලද අර්ථයෙන් **ධජො** ය. උත්ක්ෂිපණාර්ථයෙන් සිත ඔසවා තබයි යනු =**සම්පග්ගාහො** ය. බොහෝ ධ්වජ අතුරෙන් ඉතා උඩට ගිය ධව්ජය කේතුයැයි කියනු ලැබේ. මානය ද නැවත නැවත උපදිනුයේ ඔබමොබ සලකා ඉතා උඩට ගිය අර්ථයෙන් කේතුවක මෙනැයි කේතු ය. කේතුව කැමති වේ යනු = කේතුකම්‍යතා ය. එහි භාවය **කෙතුකම්‍යතාය.** එය වනාහි සිතටය. තමාට නො වේ. එහෙයින් **කෙතුකම්‍යතා චිත්තස්ස** යැයි කියන ලදී. මානසම්ප්‍රයුක්ත සිත වනාහි කේතුව කැමති වෙයි. එහි භාවය ද **කෙතුකම්‍යතා** ය. කේතුසංඛ්‍යාත මානයයි.

ඊර්ෂ්‍යා නිර්දේශයෙහි **යා පරලාභ සක්කාර** ගරුකාරමානන වන්‍දන **පූජනාසු ඉස්සා** යනු මෙකී අන්‍යයන්ගේ ලාභාදියෙහි දී මොවුන්ට මෙයින් කිනම් ප්‍රයෝජනදැයි පරසම්පත් පිරිහෙළීම ලක්‍ෂණකොට ඇති යම් ඊර්ෂ්‍යාවක් වේද, එහි ලාභ යනු සිවුරු ආදී සිවුපසය පිළිබඳ ප්‍රතිලාභයයි. ඊර්ෂ්‍යා කරන පුද්ගලයා අන්‍යයාගේ එම ලාභය හෙළා දකී. මොහුට මෙයින් කවර ප්‍රයෝජනදැයි නො කැමති වෙයි. සත්කාර යනු මනාව කරන ලද සොඳුරු වූ එම ප්‍රත්‍යයන්ගේ ම ප්‍රතිලාභයයි. ගරුකාර යනු ගරුක්‍රියා කිරීමයි. මානන යනු මනසින් ප්‍රිය කිරීමයි. වන්දන යනු පසඟ පිහිටුවීමෙන් වැඳීමයි. පූජනා යනු ගඳමල් ආදියෙන් පිදීමයි. ඊර්ෂ්‍යාකිරීම් වශයෙන් **ඉස්සා ය.** ඊර්ෂ්‍යාකාරය **ඉස්සායනා ය.** ඊර්ෂ්‍යා කළ බව **ඉස්සා චිත්තත්ත** ය. උසූසසනා ආදිය ඊර්ෂ්‍යා ආදියට පර්යාය වචනයෝ ය. මෙයින් වනාහි අගාරිකයා විසිනුත් අනගාරිකයා විසිනුත් ඊර්ෂ්‍යාව පිළිබඳ කිපී යන ලක්‍ෂණය දැක්විය යුතුයි. ඇතැම් ගිහියෙක් වනාහි ගොවිතැන වෙළඳම ආදී එක්තරා ජීවන මාර්ගයකින් තම පුරුෂාකාරය හේතු කොටගෙන සොඳුරු යානයක් හෝ වාහනයක් (රත්නයක් හෝ) ලබයි. අනිකා ඔහුට අලාභයක් කැමති වනුයේ ඒ ලාභයෙන් නොසතුටු වෙයි.

මෙතෙම කවදා නම් මේ සැපතින් පිරිහී දුගියෙක් වී හැසිරේදැයි සිතා (යම් කලෙක ඔහු) එක් හේතුවකින් ඔහු ඒ සැපතින් පිරිහුණු කල්හි සතුටු වේද, ඊර්ෂ්‍යා මනසක් ඇති ඇතැම් අනගාරිකයෙක් ද තමාගේ ශ්‍රැතිපර්යාප්ති ආදිය නිසා උපන් ලාභසම්පත් ඇති අන්‍යයෙකු දැක මෙතෙම කවර කලෙක මේ ලාභාදීන්ගෙන් පිරිහේදැයි සිතා යම්කලෙක එක් හේතුවකින් පිරිහුණු ඔහු දකී ද, එකල්හි සතුටු වෙයි. මෙසේ ඊර්ෂ්‍යාව අනුන්ගේ සම්පත් ක්ෂයකිරීම ලක්ෂණකොට ඇත්තේයැයි දතයුතුයි.

මාත්සර්ය නිර්දේශයෙහි වස්තුවෙන් මාත්සර්යය දැක්වීම පිණිස පංච මච්ඡරියානි **ආවාසමච්ඡරියං** යනාදිය කියන ලදී. එහි ආවාසයෙහි මාත්සර්යය = **ආවාස මච්ඡරිය** යයි. සෙසු පදයන්හි ද මේ නය මය. මුළු අරම ද, පිරිවෙන ද, එක් කාමරයක් ද, රාත්‍රිස්ථාන දිවාස්ථානාදිය ද ආවාසය නම් වෙයි. එම ආවාසයන්හි වසන්නෝ සුවසේ වසත්. ප්‍රත්‍යයන් ලබත්. එක් භික්ෂුවක් වත්සම්පන්න වූ ම ප්‍රියශීලී භික්ෂුවක එහි පැමිණීම නො කැමති වෙයි ද, ආයේ ද වහා යේවයි සිතයි ද, මෙය **ආවාස මච්ඡරිය** නම්. කලහ කාරකාදීන් එහි විසීම නො කැමති හෙයින් ආවාස සමාත්සර්යය නම් නො වෙයි.

කුලය යනු උපස්ථායක කුලය ද ඥාතිකුලය ද වෙයි. අන්‍යයෙකු එහි පැමිණීම නො කැමැත්තහුට **කුලමච්ඡරිය** වෙයි. පාපී පුද්ගලයෙකු පැමිණීම නො කැමති වන්නේ ද මාත්සර්යයක් නම් නො වෙයි. හෙතෙම වනාහි ඔවුන් ප්‍රසාදභේදය පිණිස පිළිපදී. ප්‍රසාදය රකින්ට සමර්ථ වූ ම භික්ෂුව එහි පැමිණීම නො කැමති වන්නේ මච්ඡරී නම් වෙයි.

ලාභො යනු සිව්පසය ලැබීමම ය. එය අන් සිල්වතකු ලබද්දී ම නො ලබාවායි සිතන්නාට **ලාභමච්ඡරිය** වෙයි. යමෙක් වනාහි ශ්‍රද්ධාවෙන් දෙන ලද්ද විනාශ කරයි ද, අපරිභෝග දුෂ්පරිභෝගාදී වශයෙන් විනාශ කරයි ද, කුණුවීමට යන දෙයකුදු අන්‍යයාට නො දෙයි ද, එය දැක මෙය මෙතෙම නො ලබයි ද අන්‍ය වූ සිල්වතෙක් ලබයි ද පරිභෝගයට යයිදැයි සිතන්නාටමසුරුකම නම් නැත.

ශරීර වර්ණය ද ගුණවර්ණය ද වර්ණනම් වෙයි. එහි ශරීර වර්ණයෙහි මසුරු පුද්ගලයා අන්‍යයෙක් ප්‍රසාදිකය රූපවත්යැයි කී කල්හි නො කියනු

කැමැත්තේ වෙයි ද, ගුණවර්ණයෙහි මසුරු වූයේ ශීලයෙන් ධුතාංගයෙන් ප්‍රතිපදාවෙන් ආචාරයෙන් ගුණ කියන්නට නොකැමැත්තේ වෙයි.

ධර්මය යනු පර්යාප්ති ධර්මය හා ප්‍රතිවේධ ධර්මය යි. එහිදී ආර්ය ශ්‍රාවකයෝ ප්‍රතිවේධ ධර්මයට මසුරු නො කරත්. තමා ප්‍රතිවේධ කළ ධර්මයත් දෙවියන් සහිත ලෝකයා ප්‍රතිවේධ කිරීම කැමති වෙත්. ඒ ප්‍රතිවේධය වනාහි අන්‍යයෝ දනිත්වායි කැමැති වෙත්. ධම්මමච්ඡරිය නම් පෙළදහමෙහි ම වෙයි. එයින් යුක්ත පුද්ගලයා යම් ගූඪ ග්‍රන්ථයක් හෝ කථා මාර්ගයක් හෝ දනීද එය අනිකෙකුට නො දන්වනු කැමැත්තේ වෙයි. යමෙක් වනාහි පුද්ගලයා සලකා බලා ධර්මානුග්‍රහයෙන් හෝ ධර්මය සලකා බලා පුද්ගලානුග්‍රහයෙන් හෝ නො දෙයි ද, මෙතෙම ධර්ම මාත්සර්යයා නම් නො වෙයි. එහිදී එක් පුද්ගලයෙක් ලොල් වෙයි. කලෙක ශ්‍රමණයෙක් වෙයි. කලෙක බ්‍රාහ්මණයෙක් වෙයි. කලෙක නිගණ්ඨයෙක් වෙයි. යම් භික්ෂුවක් වනාහි මේ පුද්ගල තෙමේ ප්‍රවේණියෙන් ආ මෘදුසියුම් ධර්මාන්තරය වූ පාළිය බිඳ කළඹන්නේයැයි නො දෙයි ද මේ තෙමේ පුද්ගලයා සලකා බලා ධර්මානුග්‍රහයෙන් නො දෙයි නම්. යමෙක් වනාහි මේ ධර්මය මෘදු ය. සියුම් ය. ඉදින් මේ පුද්ගල තෙමේ ගන්නේ නම් අනෙකකු අවබෝධ කරවා තමාට කියා නැසෙන්නේ යැයි නො දෙයි. මේ තෙමේ ධර්මය සලකා පුද්ගලානුග්‍රහයෙන් නො දෙයි නම්. යමෙක් වනාහි ඉදින් මේ ධර්මය ගන්නේ ද අපගේ සමය බිඳින්නට වන්නේ යැයි නො දෙයි ද, මෙතෙමේ ධම්ම මච්ඡරී ම නම් (වේ.)

මෙහි පංච මච්ඡරියයන් අතුරෙන් ආවාස මච්ඡරියයෙන් වනාහි යක්ෂයෙක් හෝ ප්‍රේතයෙක් වී එම ආවාසයේ ම කසළ හිසින් ඔසවාගෙන හැසිරෙයි. කුලමච්ඡරියෙන් එම (කුලයෙහි) අන්‍යයන් දානමානාදිය කරන්නවුන් දැක ඒකාන්තයෙන් මාගේ කුලය බිඳිණැයි සිතන්නහුගේ මුවින් ලේ ද මතුවෙයි. බඩවිරේක ද වෙයි. අතුනු ද කඩ කඩ ව නික්මෙයි. ලාභමච්ඡරියෙන් සංඝයා හෝ ගණයා සතු ලාභයෙකි. මසුරු වී පෞද්ගලික පරිභෝගයක් මෙන් පරිභෝග කොට යක්ෂයෙක් හෝ ප්‍රේතයෙක් හෝ මහා පිඹුරෙක් ව උපදී. ශරීර වර්ණ ගුණවර්ණ මාත්සර්යයෙන් ද පර්යාප්ති ධර්ම මාත්සර්යයෙන් ද තමාගේ ම ගුණ වර්ණනා කරයි. අන්‍යයන්ගේ ගුණයෙහි මේ කවර ගුණයෙක්දැයි ඒ ඒ දොස් කියමින්, පර්යාප්ති ධර්මය ද කිසිවෙකුටත් නො දෙනුයේ දුර්වර්ණයෙකු මෙන් ම කෙළතොල්ලෙක් ද වෙයි. තව ද ආවාස

මාත්සර්යයෙන් ලෝහ ගෙයක පැසෙයි. කුල මාත්සර්යයෙන් අල්පලාභී වෙයි. ලාභමාත්සර්යයෙන් ගූථනිරයෙහි උපදී. වර්ණ මාත්සර්යයෙන් කුක්කුළ (උණු අළු) නිරයෙහි උපදී යනුයි. මසුරුකම් කිරීම් වශයෙන් **මච්ඡෙරං** ය. මසුරුකිරීම ආකාරය **මච්ඡරායනා** ය. මසුරු බැවින් යුක්ත වූවහුගේ මසුරු බැවින් සමන්විත වූවහුගේ ස්වභාවය **මච්ඡරායිතත්ත** ය.

මට ම වේවා අන්‍යයාට නො වේවායි සියලු ම සම්පත් තමාට ම පතුරුවාගන්නට කැමැති වේ යනු = **විවිච්ඡ** ය. විවිච්ඡියාගේ ස්වභාවය **වෙවිච්ඡ** ය.මෙය මෘදුමාත්සර්යයට නමකි. අනාර්යයා කදරියයා යැයි කියනු ලැබේ. ඔහුගේ ස්වභාවය **කදරියං** ය. මෙය තද මසුරාට නමකි. එයින් යුත් පුද්ගලයා දන් දෙන අන්‍යයා ද වළක්වයි. මෙය ද කියන ලදී.

**කදරියො පාපසංකප්පො මිච්ඡාදිට්ඨි අනාදරො**
**දදමානං නිවාරෙති යාචමානාන භොජනං**

පාප සංකල්ප ඇති මිසදිටු වූ ආදර රහිත තදමසුරා භෝජන ඉල්ලන්නහුට දෙන්නහුද වළක්වයි යනුයි.

යාචකයින් දැක කටුකභාවයෙන් සිත හකුළා ගනී සංකෝචනය කරයි යනු කටකඤ්චුකය, ඔහුගේ භාවය **කටුකඤ්චුකතා** ය. තවත් නයකි, හැඳිභාගය කටුකඤ්චුකතා යැයි කියනු ලැබේ. ගැට්ටෙන් පිටට යන තරමට පිරුණු සැළියෙන් බත් ගන්නේ සර්වභාගයෙන් ම හැකුළුණු හැන්දේ කෙළවරින් ගනී ද, පුරවා ගන්නට නොහැකි වේද, මෙසේ මසුරුකම පුද්ගලයාගේ සිත හකුළයි. සිත හැකිළුණු කල්හි කය ද එසේ ම හැකිළෙයි. විශේෂයෙන් හැකිළෙයි. නවතී. නො දිගහැරෙයි යනුවෙන් මසුරුබව **කටුකඤ්චුකතා** යැයි කියන ලදී. අග්ගහිතත්තං චිත්තස්ස යනු අනුන්ට උපකාර කිරීමේදී දානාදි ආකාරයෙන් යම්සේ නො දිගහැරේ ද සිත පිළිබඳව මෙසේ හැසිරගත් බවයි. යම්හෙයකින් වනාහි මසුරු පුද්ගලයා තමා සතු දෙය අනුන්ට නොදෙනු කැමැත්තේ වෙයි ද, අන්සතු දෙය ගනු කැමැත්තේ වෙයි ද, එහෙයින් මේ ආශ්චර්යය මට ම වේවා. අන්‍යයන්ට නොවේවායි පැවතීම් වශයෙන් ඔහුගේ තම සම්පත් සැඟවීම් ලක්ෂණ බව හෝ තම සම්පත් ගැනීම් ලක්ෂණතාව හෝ දතයුතුයි. සෙස්ස මේ ගොච්ඡකයෙහි ප්‍රකට අර්ථ ඇත්තේ ම ය.

මේ සංයෝජන වනාහි ක්ලේශ පටිපාටියෙන් ද මාර්ග පටිපාටියෙන් ද ගෙනහැර දක්වන්නට වටී. ක්ලේශ පටිපාටියෙන් කාමරාග පටිඝ සංයෝජන අනාගාමි මාර්ගයෙන් ප්‍රහීණ වෙයි. මාන සංයෝජනය අර්හත් මාර්ගයෙන් ද දිට්ඨි විචිකිච්ඡා සීලබ්බත පරාමාස යන සංයෝජන සෝවාන් මාර්ගයෙන් ද, භවරාග සංයෝජනය අර්හත් මාර්ගයෙන් ද ඊර්ෂ්‍යා මාත්සර්ය සෝවාන් මාර්ගයෙන් ද, අවිද්‍යාව අර්හත් මාර්ගයෙන්ද ප්‍රහීණ වෙයි. මාර්ග පටිපාටියෙන් දිට්ඨි විචිකිච්ඡා සීලබ්බත පරාමාස ඉස්සා මච්ඡරියයෝ සෝවාන් මාර්ගයෙන් ප්‍රහීණ වෙත්. කාමරාග පටිඝයෝ අනාගාමි මාර්ගයෙන් ප්‍රහීණ වෙත්. මාන භව රාග අවිජ්ජාවෝ අර්හත් මාර්ගයෙන් ප්‍රහීණ වෙත් යනුයි.

අභිධ්‍යා කායග්‍රන්ථ පොකුරෙහි නාමකාය ච්‍යුතිප්‍රතිසන්ධි වශයෙන් ගොතයි. සසරෙහි වද්දවයි යනු = **කායගන්ථය**, සර්වඥ භාෂිතය ද ප්‍රතික්ෂේප කොට 'සසසතො ලොකො ඉදමෙව සච්චං මොඝමඤ්ඤන්ති ඉමිනා ආකාරෙන අභිනිවිසති' යන ඉදං සච්චාභි නිවෙසය යම්හෙයකින් අභිධ්‍යා කාමරාගයන්ගෙන් වෙනසක් ඇද්ද, එහෙයින් අභිධ්‍යා කායග්‍රන්ථයාගේ පද භාජනයෙහි 'යො කාමෙසු කාමච්ඡන්දො කාමරාගො' යැයි නොකියා **යො රාගො සාරාගො** යනාදිය කියන ලදී. මෙයින් යට බ්‍රහ්මයන්ගේ විමානාදීන්හි ඡන්දරාගය කාමාසව නම් නො වෙයි. ග්‍රන්ථ ගොච්ඡකයට පැමිණ අභිධ්‍යාකායග්‍රන්ථය වේයැයි යමක් කියන ලද ද, එය මනාව කියන ලදැයි දතයුතුයි. පරම ක්ලේශ පොකුරෙහි ද මේ නයමය. **ඨපෙත්වා සීලබ්බත පරාමාසං** යන මෙය යම්හෙයකින් සීලබ්බත පරාමාසය 'ඉදං සච්චං' යන ආදී ආකාරයෙන් නොවැදගනීද, එහෙයින් මිථ්‍යා දෘෂ්ටි වූවහු ද ප්‍රතික්ෂේප කරමින් ඨපෙත්වා යැයි කීය.

නීවරණ පොකුරෙහි ථීනමිද්ධ නිර්දේශයෙහි **චිත්තස්ස අකල්ලතා** යනු සිතේ ගිලන් බවයි. ගිලන්වූයේ වනාහි අකල්ලක යැයි කියනු ලැබේ. විනයෙහි ද මෙසේ කියන ලදී. 'නාහං භන්තෙ අකල්ලකො' යනුයි. **අකම්මඤ්ඤතා** යනු චිත්ත ගෙලඤ්ඤ සංඛ්‍යාත අකර්මණ්‍යතා කාරයයි. **ඔලීයනා** යනු පසුබස්නා ආකාරයයි. ඊර්‍ය්‍යාපථය දරන්නට නො හැකි ඊර්‍යාපථිකයාගේ සිත වනාහි වෘක්ෂයෙහි වවුලකු මෙන් ද උලෙහි එල්බුණු පැණිකළය මෙන් ද පසුබසී. ඔහුගේ ඒ ආකාරය සඳහා **ඔලීයනා** යැයි කියන ලදී. දෙවන පදය උපසර්ග වශයෙන් වර්ධනය කරන ලදී. **ලීනං** යනු නොපැතිරුණු බැවින් හැකුළුණු ය. ඉතිරි දෙක ආකාර භාව

නිර්දේශයෝ ය. **ථීනං** යනු ගිතෙල් පිඬක් මෙන් නො විසුරුණු බැවින් ඝනභාවයෙන් සිටියේ, **ථීයනා** යනු ආකාර නිර්දේශයයි. ථීයනභාවය **ථියිතත්තං** ය. නො විසිරීම් වශයෙන් ම තදබව යනු අර්ථයි. **කායස්ස** යනු ස්කන්ධත්‍රය සංඛ්‍යාත නාමකායට, **අකල්ලතා අකම්මඤ්ඤතා** යනු යට කියන ලද නය ම ය. මේඝය අහස මෙන් කය වෙළයි යනු = **ඔනාහො** ය. සර්වභාගයෙන් වෙළීම **පරියොගාහො** ය. අභ්‍යන්තරයෙහි වළක්වානුයි **අන්තොසමොරොධො** ය. යම්සේ වනාහි නගරයක් අවුරාගත් කල්හි මිනිස්සු පිටතට යා නො හැක්කෝ වෙත් ද, මෙසේ ම මිද්ධයෙන් ආවරණය වූ කල්හි ධර්මයෝ පැතිරීම් වශයෙන් නික්මීම නො ලබත්. එහෙයින් **අන්තො සමොරොධො** යැයි කියන ලදී. හිංසා කෙරේනුයි = **මිද්ධ** ය. අකර්මණ්‍යභාවයෙන් හිංසා කරයි යන අර්ථයි. මෙයින් නිදත් නුයි = **සොප්පං** ය. ඇස් පෙති ආදිය සොලවන බව කෙරේ යනු = **පචලායිකා** ය. **සුප්පනා සුප්පිතත්තං** යනු ආකාරභාව නිර්දේශයෝ ය. මොවුන්ගේ ඉදිරියෙන් යම් සොප්ප යන පදයක් වී ද එය නැවත කීමෙහි හේතුව කියන ලද ම ය. **ඉදං වුච්චති ථීනමිද්ධ නීවරණං** යන මෙය ථීනයත් මිද්ධයත් එක්කර ආවරණාර්ථයෙන් ථීනමිද්ධ නීවරණය යැයි කියනු ලැබේ. යම් ථීන මිද්ධයක් ශෛක්‍ෂ පෘථග්ජනයන්ගේ නින්දට පූර්ව අපරභාගයන්හි උපදී ද, එය අර්හත් මාර්ගයෙන් විනාශ වෙයි. ක්‍ෂීණාශ්‍රවයන්ගේ කරජකාය දුබල බැවින් භවාංගයට බැසගැනීම වෙයි. එය අසම්මිශ්‍රව පවතිනවිට ඔව්හු නිදත්. එය ඔවුන්ගේ නිදීම නම් වෙයි.

එහෙයින් භාග්‍යවතුන් වහන්සේ මෙසේ වදාළහ. 'ගිනිවෙස්න, මම ගිම්හානයෙහි පශ්චිම මාසයෙහි සඟළ සිවුර සතරපටක් කොට පණවා සිහියෙන් යුතුව සම්‍යක්ප්‍රඥාවෙන් යුතුව දක්‍ෂිණ පාර්ශ්වයෙන් නින්දට බැසගත් බව දනිමි' යනුයි. කරජකය පිළිබඳ දුබලබව මෙබඳුය. මාර්ගයෙන් විනාශ කළ නොහේ උපාදින්නකයෙහි මෙන් ම අනුපාදින්නකයෙහි ද ලැබේ. උපාදින්නකයෙහි ලබනුයේ යම්කලෙක ක්‍ෂීණාශ්‍රවයන් වහන්සේ දීර්ඝ මාර්ගයක ගියේ වේද, එක්තරා වැඩක් හෝ කොට ක්ලාන්ත වූයේ හෝ වේද, එබඳු කාලයෙහි ලැබේ. අනුපාදින්නකයෙහි ලබනුයේ පුෂ්ප පත්‍රයන්හි ලැබේ. ඇතැම් වෘක්‍ෂයන්ගේ පත්‍ර ඉර අව්වෙන් දිගහැරේ. රාත්‍රියෙහි හැකිළෙයි. පියුම් මල් ආදිය ඉර අව්වෙන් පිපෙයි. නැවත රාත්‍රියෙහි හැකිළෙයි. මේ මිද්ධය වනාහි අකුසල බැවින් ක්‍ෂීණාශ්‍රවයන්ට නො වේ යනුයි. එහි මෙසේ ද වන්නේ ය. මිද්ධය අකුසල නො වේ. කවරහෙයින් ද? රූප හෙයිනි. රූපය වනාහි අව්‍යාකෘතය.

මෙය ද රූපයකි. එහෙයින් ම මෙහිදී කායස්ස අකල්ලතා අකම්මඤ්ඤතා යැයි කායග්‍රහණය කරන ලදී. කායස්ස යැයි කී පමණින් මේ රූපය ද කායපස්සද්ධි ආදී ධර්මයෝ ද රූප ම වන්නාහ.

කයින් සැපය ද විඳී. කයින් ද පරමාර්ථ සත්‍යය සාක්ෂාත් කරයි යනුවෙන් සුඛ පටිසංවේදන පරමාර්ථ සත්‍ය සාක්ෂාත් කරණයෝ ද රූප කායයෙන් ම වන්නාහු ද, එහෙයින් මේ රූපය මිද්ධ යැයි නො කිවයුතුයි. මෙහි කාය නම් නාමකායයි. නාමකාය නම් කවර හෙයින් **සොප්පං පචලායිකා** යැයි කියන ලදද? නාමකාය නොනිදයි. චලනය නො වෙයි යනු ලිංගාදිය මෙන් ඒ ඉන්ද්‍රියාගේ ඵලය හෙයිනි. යම්සේ වනාහි ස්ත්‍රීලිංගය ස්ත්‍රී නිමිත්ත ස්ත්‍රී ක්‍රියා ස්ත්‍රී ආකල්ප යන මේ ලිංගාදිය ඉන්ද්‍රියයාගේ ඵල හෙයින් කියන ලදී. මෙසේ මේ නාමකාය සංඛ්‍යාත මිද්ධයාගේ ඵල හෙයින් නිදීම ආදිය කියන ලදී. මිද්ධය ඇති කල්හි වනාහි එකී ඵල වේයැයි ඵලූපචාරයෙන් මිද්ධයත් අරූපයත් සමාන සොප්පං පචලායිතා සුපනා සුපිතත්තං යනු කියන ලදී. අක්ෂි දලාදීන්ගේ චලනභාවය කෙරේනුයි = පචලායිකා යන වචනාර්ථයෙන් ද මේ අර්ථය සිද්ධ කරන ලද්දේ ම ය. මෙසේ රූපය මිද්ධය නො වේ.

ඕනාහාදීන්ගෙන් ද මේ අරූපභාවය දක්වන ලද්දේ ම ය. රූපය නාමකායට ආවරණයක් හාත්පසින් ආවරණයක් ඇතුළත බාධා කිරීමක් නො වේ යනුවෙනි. මේ කාරණයෙන් ද මෙය රූපය නො වන්නේ ද අරූපයක් නොවේ. කිසිවෙකුටත් ආවරණයක් නො වේ. හාත්පසින් ආවරණයක් නො වේ. ඇතුළත බාධාකිරීමක් නොවේ යනුයි. එසේ නම් ආවරණයක් ද නොවන්නේ ය. එහෙයින් නො වේ. යම්සේ කාමච්ඡන්දාදී අරූපධර්මයෝ ආවරණාර්ථයෙන් නීවරණයෝ ද මෙසේ මෙහි ද (ඕහනාදී අර්ථයෙන්) ඕහනාදිතාව දතයුතුයි.

තවත් 'චිත්තෝප ක්ලේශයන් වූ ප්‍රඥාව දුර්වල කරන පංච නීවරණයන් දුරුකොට යන වචනයෙන් ද මෙය අරූපය රූපය නො වේ. චිත්තෝපක්ලේශය ප්‍රඥාව දුර්වල කරන්නේ නො වේ ද, කවර හෙයින් නො වන්නේ ද? මෙසේ වදාරන ලද්දේ නොවේ ද, 'මහණෙනි, රහමෙර පානය කරන සුරාමේරය පානයෙන් නො වැළකුණු ඇතැම් මහණ බමුණෝ ඇත්තාහ. මහණෙනි, මෙය මහණ බමුණන්ගේ ප්‍රථම උපක්ලේශයයි යනුවෙනි. අන්‍ය කාරණයක් ද වදාරන ලදී. 'ගෘහපති

පුත්‍රය, සුරාමේරය මජ්ජපමාදට්ඨානානු යෝගයෙහි මේ ආදීනව සයෙකි. මෙලොවදී ධන හානිය කලහ වර්ධනය රෝගායතනයක් වීම අපකීර්තිය ඇතිවීම ලජ්ජාව නැතිවීම ප්‍රඥාව දුර්වලකිරීම යැයි මේ සවන පදය වෙයි' යනුයි. ප්‍රත්‍යක්‍ෂ වශයෙන් ද මෙය සිද්ධ ම ය. මද්‍යය උදරගත වූ කල්හි යම්සේ සිත කෙලෙසෙයි ද, ප්‍රඥාව දුර්වල වෙයි. එහෙයින් මද්‍යය මෙන් ම මිද්ධය ද සිත කෙලෙසන්නේ ද ප්‍රඥාව දුර්වල කරන්නේ ද වෙයි යනුයි. ප්‍රත්‍යය නිර්දේශයෙන් නො වේ. යම්හෙයකින් වනාහි මද්‍යය සංක්ලේශයක් වන්නේ ද, සො ඉමෙ පංචනීවරණො පහාය චෙතසො උපක්කිලෙසෙ යැයි ද, එවමෙව ඛො භික්ඛවෙ, පඤ්චිමෙ චිත්තස්ස උපක්කිලෙසා යෙහි උපකිලිට්ඨං චිත්තං නචෙව මුදුහොති නච කම්මනීයං න පභස්සරං නච පභංගු නච සම්මා සමාධියති ආසවානං ඛයා ය, කතමෙ පඤ්ච, කාමච්ඡන්දො භික්ඛවෙ, චිත්තස්ස උපක්කිලෙසො යැයි ද කතමෙ ච භික්ඛවෙ? චිත්තස්ස උපක්කිලෙසා අභිජ්ඣා විසමලොභො චිත්තස්ස උපක්කිලෙසො යැයි ද මේ ආදී උපක්ලේශ නිර්දේශයන්හි නිර්දේශ වන්නේ ය. සිත කෙලෙසන ප්‍රඥාව දුර්වල කරන යම් උපක්ලේශයෝ වෙත් ද යම්හෙයකින් වනාහි ඒ උපක්ලේශයෝ එහි ද උපදිත් ද, එහෙයින් එය ඔවුන්ට ප්‍රත්‍යය හෙයින් ප්‍රත්‍යය නිර්දේශයෙන් මෙසේ කියන ලදී. මිද්ධය වනාහි තෙමේ ම චිත්තෝප ක්ලේශය මෙන් ම ප්‍රඥාව දුර්වල කරන්නේ ද වෙයි යැයි මිද්ධය අරූපම ය. බොහෝ කීමෙන් කිම? සම්ප්‍රයෝග වචන වශයෙන් ථීනමිද්ධ නීවරණය අවිද්‍යා නීවරණය සමග නීවරණයක් මෙන් ම නීවරණ සම්ප්‍රයුක්තයක්දැයි කියන ලද ම ය. එහෙයින් සම්ප්‍රයෝග වචනයෙන් මෙය රූපයක් නො වේ. රූපය සම්ප්‍රයුක්ත නම නො ලබයි යනුයි. තව ද මෙය යථාලාභ වශයෙන් කියන ලද්දේ වෙයි. යම්සේ වනාහි 'සිප්පි සම්බුකම්පි සක්ඛර කඨලම්පි මච්ඡගුම්බම්පි චරන්තම්පි තිට්ඨන්තම්පි' යැයි (මෙසේ එක්කොට) යථාලාභ වශයෙන් කියන ලදී. බොරළු කැට කැබලිති වනාහි සිටියේ ම ය. නො හැසිරෙයි. ඉතිරි දෙදෙනා සිටින්නෝ හැසිරෙන්නෝ ද වෙත්. මෙසේ මෙහි ද මිද්ධං නීවරණය ම ය. සම්ප්‍රයුක්ත නො වේ. ථීනය නීවරණ ද සම්ප්‍රයුක්ත දැයි සියල්ල එක්කොට යථාලාභ වශයෙන් නීවරණය ම නීවරණ සම්ප්‍රයුක්තයැයි කියන ලදී.

යම්සේ කැටකැබලිති සිටින්නේ ම ද නො හැසිරේ ද මෙසේ මිද්ධය වනාහි නීවරණය ම ය. සම්ප්‍රයුක්තය නො වේ. එහෙයින් රූපභාව සිද්ධ හෙයින් රූපය ම මිද්ධය යනු නො වේ. කැටකැබලිති වනාහි

නො හැසිරේ යනු සූත්‍රයෙන් තොරව ද සිද්ධ ය. එහෙයින් එහි අර්ථය යථාලාභ වශයෙන් වේවා. සිද්ධය වනාහි රූපයයි යන මෙය අසිද්ධ ය. මේ සූත්‍රයෙන් එහි රූපභාවය සිද්ධ කළ නො හැකි ය යන මිද්ධයාගේ රූපභාව අසිද්ධියෙන් මෙය යථාලාභ වශයෙන් නො වේ යැයි කියන ලදැයි අරූපය ම මිද්ධය යි. බොහෝසෙයින් කීමෙන් ප්‍රයෝජන කිම? වත්‍ථත්‍ථා යන ආදි වචනයෙන් විභංගයෙහි වනාහි 'විගත ථීනමිද්ධො යනු ඒ ථීනමිද්ධය අත්හළ හෙයින් ද වමාරා දැමූ හෙයින් ද මිදූ හෙයින්ද ප්‍රහීණ කළ හෙයින් ද අත්හරින ලද හෙයින් ද යන මෙයින් විගත ථීනමිද්ධයැයි කියනු ලැබේ යනුවෙන් ද 'මේ සිත මේ ථීනමිද්ධයෙන් පිරිසිදු කරයි. විශේෂයෙන් පිරිසිදු කරයි ද හාත්පසින් පිරිසිදු කරයි ද මුදයි ද විශේෂයෙන් මුදයි ද හාත්පසින් මුදයි ද එහෙයින් ථීනමිද්ධයෙන් සිත මුදයි යැයි කියනු ලැබේ' යනුවෙන් දැයි මෙසේ වත්‍ථත්‍ථා යන ආදිය කියන ලදී. එහෙයින් ද අරූපය ම මිද්ධය යි. චිත්තයාගේ අසම්භව වචනයෙන් නො වේ. මිද්ධය වනාහි චිත්තජය උතුජය ආහාරජයැයි ත්‍රිවිධ ය. එහෙයින් යම් මිද්ධයක් එහි චිත්තජ ද විභංගයේදී එහි ධ්‍යානසිත් සමග අසම්භවය කියන ලදී. අරූපභාව සිද්ධ නොකරන ලදැයි ද රූපය ම මිද්ධයැයි ද න රූපභාව අසිද්ධියෙන් රූපය ම මිද්ධ යැයි කියන ලදී. මිද්ධය වනාහි රූපභාවය සිද්ධ කල්හි මෙය ලැබිය හැකිය. එහිදී චිත්තයාගේ සම්භවය කියන ලදී. එය ම ද සිද්ධ නො වේ. අරූපය ම මිද්ධයයි. බොහෝකොට කීමෙන් ප්‍රයෝජන කිම? ප්‍රහාණ වචනයෙනි. භාග්‍යවතුන් වහන්සේ විසින් වනාහි 'මහණෙනි, ධර්ම සයක් ප්‍රහාණය කොට ප්‍රථමධ්‍යානයට සමවැද වාසය කරන්නට භව්‍ය වෙයි. කවර සයක් ද? කාමච්ඡන්‍දය ව්‍යාපාදය ථීනමිද්ධය උද්ධච්චය කුක්කුච්චය විචිකිච්ඡාවය යන සයකි.

'ඔහු විසින් වනාහි කාමයන්ගේ ආදීනව සම්‍යක් ප්‍රඥාවෙන් මනාව දක්නා ලද්දේ වෙයි' යනු ද 'මේ පංච නීවරණය දුරුකොට බලවත් ප්‍රඥාවෙන් ආත්මාර්ථය හෝ (පරාර්ථය හෝ) දැනගත්තේය' යන ආදීන්හි ද මිද්ධයාගේ ප්‍රහාණය ද කියන ලදී. රූපය පහකළයුතු නො වේ. මෙසේ ද කියන ලදී. 'රූපස්කන්ධය විශේෂයෙන් දතයුතුයි. පිරිසිඳ දතයුතුයි. පහකළ යුත්තේ නො වේ. වැඩියයුත්තේ නො වේ. (සාක්‍ෂාත් කළයුත්තේ නො වේ) යනුයි. මෙහි ප්‍රහාණ වචනයෙන් ද මිද්ධය අරූපම ය. රූපයාගේ ද ප්‍රහාණ වචනයෙන් නො වේ. 'මහණෙනි, රූපය තොපගේ නො වේ. එය අත්හරිව්' යන මෙහි වනාහි රූපයාගේ ප්‍රහාණයද කියන ලදමය. එහෙයින්

අන් අයුරකින් නො කියන ලද හෙයින් මෙය කාරණයක් නො වේ. එම සූත්‍රයෙහි වනාහි 'මහණෙනි, රූපයෙහි යම් ඡන්දරාගය දුරුකිරීමෙක් වේද, එය එහි ප්‍රහාණයයි' යැයි මෙසේ ඡන්දරාග ප්‍රහාණ වශයෙන් රූපප්‍රහාණය කියන ලදී. 'ඒ ධම්මෙ අප්පහාය පංච නීවරණෙ පහාය' යැයි මෙන් නොවේ. මෙසේ පහකළ යුත්තක් ම කියන ලදී යනුයි. අන් අයුරකින් කියන ලද හෙයින් රූපය මිද්ධය නො වේ. එහෙයින් 'සො ඉමෙ පංචනීවරණෙ පහාය චෙතසො උපක්කිලෙසෙ' යන ආදී යම් ඒ සූත්‍රයෝ වෙත් ද, මේ සූත්‍රයන්ගෙන් මෙන් ම අන්‍ය වූ සූත්‍රයන්ගෙන් ද අරූපය ම මිද්ධය යැයි දතයුතුයි.

එසේ ම මහණෙනි, සිතට ආරූඪ වූ ප්‍රඥාව දුර්වල කරන මේ ආවරණ නීවරණ පසෙකි. කවර පසෙක් ද? මහණෙනි, කාමච්ඡන්දය ආවරණයකි. නීවරණයකි. -පෙ- මහණෙනි, ථීනමිද්ධය සිතට ආරූඪ වූ ප්‍රඥාව දුර්වල කරන ආවරණයකි. නීවරණයකි' යනු ද 'මහණෙනි, ථීනමිද්ධ නීවරණය අන්ධකරණයකි. අචක්ඛුකරණයකි. අඥානකරණයකි. ප්‍රඥාව වළක්වන්නකි. විඝාත පාක්ෂිකය, නිවන් පිණිස නොපවතින්නකි.' යනු ද, 'බමුණ, මෙපරිද්දෙන් වනාහි යම් සමයෙක්හි ථීනමිද්ධයෙන් මඩනා ලද සිතින් වැඩුණු සිතින් වාසය කෙරේ ද? යනු ද, 'මහණෙනි, නුනුවණින් මෙනෙහි කරන්නාට නූපන්නා වූ ද කාමච්ඡන්දය උපදී. -පෙ- නූපන්නා වූ ද ථීනමිද්ධය උපදී' යනු ද, මහණෙනි, යම් මේ පංච නීවරණ වේ ද, මේ අකුසල රාශිය කෙවලය යැයි ද මෙහි අරූපභාවය ප්‍රකාශ කරන්නා වූ ම මේ ආදී නොයෙක් සූත්‍ර ප්‍රකාශ කරන ලදී. යම්හෙයකින් මෙය අරූප ද එහෙයින් අරූපී ලෝකයන්හි ද උපදී. මහාපට්ඨාන සූත්‍රයෙහි මෙය කියන ලද්දේ ම ය. නීවරණං ධම්මං පටිච්ච නීවරණො ධම්මො උප්පජ්ජති නපුරෙජාත පච්චයා යනුයි. මෙයට විභංගයෙහි 'ආරුප්පෙ කාමච්ඡන්ද නීවරණං පටිච්ච ථීනමිද්ධං උද්ධච්චං අවිජ්ජා නීවරණං' යන සියල්ල විස්තර කළයුතුයි. එහෙයින් මෙහිදී මිද්ධය අරූපම යැයි නිගමනයට යා යුතුයි.

කුක්කුච්ච නිර්දේශයෙහි **අකප්පියෙ කප්පිය සඤ්ඤිතා** යනාදිය මුලින් කුක්කුච්චය දැක්වීම පිණිස කියන ලදී. මෙවැනි හැඟීමෙන් කරන ලද ව්‍යතික්‍රමණය වස්තුව පිළිබඳ වැරදි හැසිරීම නිමි කල්හි නැවත හටගත් සිහිය ඇත්තනුට ද මා විසින් නපුරක් කරන ලදැයි තැවෙනවිට පශ්චත්තාප වශයෙන් මෙය උපදී. එහෙයින් මෙය මුලින් දැක්වීම පිණිස

**අකපපියෙ කපපිය සඤඤිතා** යනාදිය කියන ලදී. එහිදී අකප්පිය භෝජනය කප්පියසඤ්ඤීව පරිභෝග කරයි. අකැප මස් කැපමස් යන හැඟීමෙන් ද වලස් මස් ඌරුමස් යැයි ද දිවිමස් හෝ මුවමස් යැයි ද කති. කාලය ඉක්මගිය කල්හි කාලය යැයි හැඟීමෙන් ද, පවරා නොපවරන ලදැයි යන හැඟීමෙන් ද පරිභෝග කරයි. මෙසේ අකැප වස්තුවෙහි කැපය යන සංඥාවෙන් ව්‍යතික්‍රමය කරයි නම්. ඌරුමස් වලස්මස් යන සංඥාවෙන් කන්නේ ද කාලයෙහි විකාල සංඥාවෙන් අනුභව කරනුයේ කැප වස්තුව අකැපය යන සංඥාවෙන් ව්‍යතික්‍රමය කරයි නම්. නිවැරදි කිසිවක් වනාහි වරදය යන සංඥාවෙන් ද වරදෙහි ද නිවැරදිය යන සංඥාවෙන් ද කරනුයේ නිවරදෙහි වැරදිය යන සංඥාවෙන් ද ව්‍යතික්‍රමය කරයි නම්. මෙය වනාහි යම්හෙයකින් මා විසින් වනාහි ඒකාන්තයෙන් යහපතක් නො කරන ලදී. කුසලක් නො කරන ලදී. බියෙන් ගොඩනැගීමේ ක්‍රියාවක් නො කරන ලදී. පවක් කරන ලදී. රෞද්‍ර ක්‍රියාවක් කරන ලදී. නපුරු ක්‍රියාවක් කරන ලදී යැයි මෙසේ නිවරදෙහි වැරදිය යන සංඥාවෙන් ද කරන ලද ව්‍යතික්‍රමණයේ දී උපදී. එහෙයින් මෙයට වෙනත් වස්තුක් ද දක්වන්නේ යං එවරූපං යනාදිය කීය.

එහි කුක්කුච්ච යන පදය කියන ලද අර්ථ ඇත්තේ ම ය. කුකුස්වන ආකාරය **කුකකුචචායතන** ය. වැඩුණු කුකුසෙන් යුත් පුද්ගලයාගේ භාවය **කුකකුචචායිතතත** ය. **චෙතසො විපපටිසාරො** යන මෙහි කළ නො කළ දේ පිළිබඳව හෝ සාවද්‍ය අනවද්‍යයත් පිළිබඳව ඉදිරියට යාම **විපපටිසාර** නම්. යම්හෙයකින් වනාහි හෙතෙම කරන ලද පාපය හෝ නොකරන ලද්දක් නො කරයි. නොකරන ලද කල්‍යාණය කරන ලද්දක් නො කරයි. එහෙයින් විරූප වූ හෝ පිළිකුල් වූ හෝ තැවීම යනු **විපපටිසාරො** ය. මෙය වනාහි සිත පිළිබඳවය. සත්ත්වයා පිළිබඳව නොවේ යැයි දැන්වීම පිණිස **චෙතසො විපපටිසාරො** යැයි කියන ලදී. මේ මෙහි ස්වභාව නිර්දේශයයි. උපදනා කුකුස වනාහි ඉදිකටු මූණත රන්බඳුන සූරන්නා මෙන් සිත පහුරුගාමින් ම උපදී. එහෙයින් **මනොවිලෙඛො** යැයි කියන ලදී. මේ මෙහි කෘත්‍ය නිර්දේශයයි. විනයෙහි වනාහි 'ඉක්බිති ශාරිපුත්‍ර ආයුෂ්මතුන් වහන්සෙ භාග්‍යවතුන් වහන්සේ විසින් ප්‍රතික්ෂිප්ත (විසීමක්) වාසය කොට) වාසය කොට ආවාසයට ලැබුණු පිණ්ඩාහාරය වළඳන්නට යැයි කුකුස් කරනුයේ නො පිළිගත් සේක යැයි යම් කුකුසක් ආයේ ද, එය නීවරණයක් නො වේ. රහතන් වහන්සේට මා විසින් මේ නපුර කරන

ලදැයි මෙසේ පසුතැවිල්ලක් නොමැත. කැප ද අකැපද යන මේ නීවරණ ප්‍රතිරූපකය වීමර්ශන සංඛ්‍යාත විනය කුක්කුච්ච නම්.

"කතමෙ ධම්මා නීවරණා චෙව නීවරණා සම්පයුත්තා ච" යන පදයාගේ නිර්දේශයෙහි යම්හෙයකින් ථීනමිද්ධය ඔවුනොවුන් අත් නො හරී ද, එහෙයින් ථීනමිද්ධ නීවරණය අවිද්‍යා නීවරණයත් සමග නීවරණයක් ද නීවරණ සම්ප්‍රයුක්තයක්දැයි නොබිඳ කියන ලදී. යම්හෙයකින් වනාහි උද්ධච්චය ඇති කල්හි ද කුක්කුච්චයේ අභාවයෙන් කුක්කුච්චයෙන් තොරව ද උද්ධච්චය උපදී. එහෙයින් බිඳ කියන ලදී. යමක් යමක් සමග සම්ප්‍රයෝගයට නො යේ ද, එය නො යොදන ලදැයි දතයුතුයි. මෙකී නීවරණයන් වනාහි ක්ලේශ පටිපාටියෙන් ද මාර්ග පටිපාටියෙන් ද ගෙනහැර දක්වන්නට වටී. ක්ලේශ පටිපාටියෙන් කාමච්ඡන්ද ව්‍යාපාදයෝ අනාගාමි මාර්ගයෙන් ප්‍රහීණ වෙත්. ථීනමිද්ධ උද්ධච්චයෝ අර්හත් මාර්ගයෙන් ප්‍රහීණ වෙත්. කුක්කුච්ච විචිකිච්ඡාවෝ සෝවාන් මාර්ගයෙන් ප්‍රහීණ වෙත්. අවිද්‍යාව අර්හත් මාර්ගයෙන් ප්‍රහීණ වෙයි. මාර්ග පටිපාටියෙන් සෝවාන් මාර්ගයෙන් කුක්කුච්ච විචිකිච්ඡා දෙක ප්‍රහීණ වෙයි. අනාගාමි මාර්ගයෙන් කාමච්ඡන්ද ව්‍යාපාදයෝ ප්‍රහීණ වෙත්. අර්හත් මාර්ගයෙන් ථීනමිද්ධ උද්ධච්ච අවිද්‍යාවෝ ප්‍රහීණ වෙත්.

පරාමාස කොටසෙහි තෙ ධම්මෙ ඨපෙත්වා යැයි පෘච්ඡාසභාග වශයෙන් බහුවචනය කරන ලදී. උපාදාන නිර්දේශයෙහි වස්තු සංඛ්‍යාත කාමය උපාදානය කෙරේ නුයි = **කාමූපාදානය** කාමයත් එයයි උපාදානයත් එයයි යනු ද = **කාමූපාදානං** ය. උපාදාන යනු දැඩිව ගැනීමයි. මෙහි දෘඪාර්ථය දෙන උප ශබ්දය වනාහි උපායාස උපකට්ඨාදීන්හි මෙනි. එසේ ම දිට්ඨියත් එයයි. උපාදානයත් එයයි යනු = **දිට්ඨුපාදානං** ය. 'සස්සතො අත්තා ච ලොකො ච' යනාදීන්හි වනාහි උත්තර දෘෂ්ටිය පළමු දෘෂ්ටිය දැඩිව ගනී. එසේ ම සීලබ්බතය දැඩිව ගනී යනු = **සීලබ්බතුපාදානය,** සීලබ්බතයත් එය ය උපාදානයත් එය යනු ද = **සීලබ්බතුපාදානය,** මෙසේ වනාහි ගෝශීල ගෝව්‍රතාදිය ශුද්ධිය යැයි ගන්නාට තෙමේ ම උපාදානයෝ ය. මෙයින් එසේ කියයි යනු = **වාදො** ය. මෙයින් දැඩිව ගනී යනු = උපාදාන ය. තමා පිළිබඳව කුමක් කියත් ද කුමක් දැඩිව ගනිත් ද යන අත්තනො වාදය දැඩිව ගැනීම **අත්තවාදූපාදාන** යයි. ආත්මවාද මාත්‍රයම හෝ ආත්මය යැයි මෙයින් දැඩිව ගනිත් යනු = **අත්තවාදූපාදානයයි.** යො කාමෙසු කාමච්ඡන්දො යන මෙහි ද වස්තු

කාමයෝ ම නිරවශේෂයෙන් කාමයෝ යැයි අභිප්‍රේතයහ. එහෙයින් මෙහි කාමූපාදානං යනු වස්තුකාමයන්හි කාමච්ඡන්දයයි. අනාගාමීන්ට ද එය සිද්ධ වේ. ඔහුට වනාහි පංච කාමගුණ වස්තුක කාමරාගය ද නැත්තේ ය යනුයි. දෘෂ්ටි උපාදාන නිර්දේශයෙහි **නත්‍ථි දින්නං** යනු දෙන ලද්දේ නම් නැත. කිසිවෙකුට කිසිවක් දිය හැකියැයි දනී. දෙන ලද්දෙහි ඵලවිපාක නැතැයි ගනී. **නත්‍ථි යිට්ඨං** යනුවෙහි යිට්ඨං යනු මහා යාගයයි. එය කරන්නට හැකියැයි දනී. යාගයෙහි ඵලවිපාක නැතැයි නැතැයි ගනී. **හුතං** යනු පූජා පඬුරු පිළිබඳ මංගලක්‍රියා ය. එය කළ හැකියැයි දනී. එහි ඵලවිපාක නැතැයි ගනී. **සුකට දුක්කටානං** යන මෙහි දශකුශල කර්මපථයෝ සුකෘත කර්ම නම්. දශ අකුශල කර්මපථයෝ දුෂ්කෘත කර්ම නම්. ඒවා ඇතිබව දනී. ඵලවිපාක වනාහි නැතැයි ගනී. **නත්‍ථි අයං ලොකො** යනු පරලොව සිටියේ මෙලොව නැතැයි ගනී. **නත්‍ථි පරො ලොකො** යනු මෙලොව සිටියේ පරලොව නැතැයි ගනී. **නත්‍ථි මාතා නත්‍ථි පිතා** යනු මවුපියන් ඇතිබව දනී. ඔවුන් විෂයෙහි කළ ප්‍රත්‍යයෙන් කිසි ඵලවිපාකයක් නැතැයි ගනී. **නත්‍ථි සත්තා ඕපපාතිකා** යනු චුතවන උපදනා සත්ත්වයෝ නැතැයි ගනී. **සම්මග්ගතා සම්මා පටිපන්නා** යනු අනුලෝම ප්‍රතිපදාවට පිළිපන් ධාර්මික ශ්‍රමණ බ්‍රාහ්මණයෝ ලෝකයෙහි නැතැයි ගනී. **යෙ ඉමඤ්ච ලොකං පරඤ්ච ලොකං සයං අභිඤ්ඤා සච්ඡිකත්වා** පවෙදෙන්ති යනු මෙලොවත් පරලොවත් තමාගේ විශිෂ්ටඥාන දැන ප්‍රකාශ කරන්න සමත් සර්වඥ බුදුරජාණන් වහන්සේ නම් නැතැයි ගනී. මේ උපාදාන වනාහි (ක්ලේශ පටිපාටියෙන් මාර්ග පටිපාටියෙන් ද) ගෙනහැර දක්වන්නට වටී. ක්ලේශ පටිපාටියෙන් කාමූපාදානය සතර මාර්ගයන්ගෙන් ප්‍රහීණ වෙයි. සෙසු තුන සෝවාන් මාර්ගයන් ගෙන් ප්‍රහීණ වෙයි. සෙසු තුන සෝවාන් මාර්ගයෙන් ප්‍රහීණ වෙයි. මාර්ග පටිපාටියෙන් සෝවාන් මාර්ගයෙන් දිට්ඨූපාදානාදිය ප්‍රහීණ වෙයි. සතර මාර්ගයන්ගෙන් කාමූපාදානය ප්‍රහීණ වෙයි.

ක්ලේශ කාණ්ඩයෙහි ක්ලේශයෝ ම = **කිලෙසවත්‍ථූනි** ය. ලෝභාදියෙහි පිහිටි හෙයින් ක්ෂීණාශ්‍රව නො වන සත්ත්වයෝ මෙහි වෙසෙත්නුයි හෝ වත්‍ථූනි ය. ක්ලේශයෝත් ඔව්හුය. එහි පිහිටි සත්ත්වයන්ගේ වාසස්ථාන ද ඔව්හුය යනු = **කිලෙස වත්‍ථූනි** ය. යම්හෙයකින් මෙහි අනන්තර ප්‍රත්‍යාදී භාවයෙන් උපදනා ක්ලේශයෝ ද වසන්නේ නම් වෙයි. එහෙයින් ක්ලේශයන්ට වාසස්ථානයෝ ය යනු ද = කිලෙස වත්‍ථූනි ය. **තත්‍ථ කතමො ලොභො යො රාගො සාරාගො** යන මේ ලෝභය වනාහි

හේතු කොටසය. ග්‍රන්ථ කොටසය. මේ කිලෙස කොටසය යන ස්ථාන තුනෙක අතිරේක පද සියයකින් දක්වන ලදී. ආසව සංයෝජන ඕඝ යෝග නීවරණ උපාදාන යන ගොච්ඡකයන්හි අට අට පදයකින් දක්වන ලදී. ඒ මේ ලෝභය අතිරේක පද සියයකින් දැක්වූ දැක්වූ තැන ද අට අට පදයකින් දැක් වූ තැන ද නිෂ්ප්‍රදේශ වශයෙන් ම ගන්නා ලදැයි දතයුතුයි. ඔවුනතුරෙන් හේතු ග්‍රන්ථ නීවරණ උපාදාන ක්ලේශ කොටස්හි සිව්මඟ වඳකරණ තෘෂ්ණාව එකම කොටසකින් සිටියේ ය. ආසව සංයෝජන ඕඝ යෝගයන්හි සිව්මග වඳකරනුයේ ද දෙකොටසක් ව සිටියේය. කෙසේද? ආශ්‍රවයන්හි කාමාශ්‍රව භවාශ්‍රව යැයි ද සංයෝජනයන්හි කාමරාග සංයෝජනය භවරාග සංයෝජනය යනුවෙන් ද ඕඝයන්හි කාමෞඝ භවෞඝ යනුවෙන් ද යෝගයන්හි කාමයෝග භවයෝග යනුවෙනි. මේ ක්ලේශ වස්තු ක්ලේශ පටිපාටියෙන් ද මාර්ග පටිපාටියෙන්ද ගෙනහැර දක්වන්ට වටී. ක්ලේශ පටිපාටියෙන් ලෝභය සතර මගින් ප්‍රහීණ වෙයි. ද්වේෂය අනාගාමි මාර්ගයෙනි. මෝහය හා මානය අර්හත් මාර්ගයෙනි. දිට්ඨි විචිකිච්ඡා දෙක සෝවාන් මාර්ගයෙනි. ථීනාදිය අර්හත් මාර්ගයෙනි. මාර්ග පටිපාටියෙන් සෝවාන් මාර්ගයෙන් දිට්ඨි විචිකිච්ඡා දෙක ප්‍රහීණ වෙයි. අනාගාමි මාර්ගයෙන් ද්වේෂය ප්‍රහීණ වෙයි. අර්හත් මාර්ගයෙන් සෙසු සත ප්‍රහීණ වෙයි.

කාමාවචර නිර්දේශයෙහි **හෙට්ඨතො** යනු යටභාගයෙන්, **අවීචි නිරයං** යනු ගිනිදැල්වලින් හෝ සත්ත්වයින්ගෙන් හෝ දුක් වේදනාවෙන් හෝ අතරක් සිදුරක් මෙහි නැත යනු = අවීචි ය. සුඛසංඛ්‍යාත අය මෙහි නැත යනු = නිරයෝ ය. අර්ථයෙන් ද (ආස්වාදයෙන් ද) රතියක් නොමැතියේ නිරයෝ ය. **පරියන්තං කත්වා** යනු අවීචි සංඛ්‍යාත ඒ නිරය කෙළවර කොට, **උපරිතො** යනු මතුභාගයෙන්, **පරනිම්මිත වසවත්ති දෙවෙ** යනු පරනිර්මිත කාමයන්හි වසයෙහි පවතින හෙයින් මෙසේ ලද ව්‍යවහාර ඇති දෙවියන්, **අන්තො කරිත්වා** යනු ඇතුළත බහා, **යං එතස්මිං අන්තරෙ** යනු යම්කෙනෙක් මේ අවකාශයෙහි, **එත්ථාවචරා** යනු යම්හෙයකින් මේ අතර කවරදාක කොතැනක හෝ හටගැනීමෙන් මෙයින් අන්‍යයෝ ද හැසිරෙත් ද, එහෙයින් ඔවුන් නොගැනීම සඳහා **අවචරා** යැයි කියන ලදී. එහෙයින් මේ අතර යම්කෙනෙක් බැසගෙන ම හැසිරෙත්ද, හැමතැන ම හැමකල්හි ම හටගන්නා හෙයින් යටභාගයෙහි හැසිරෙත්. අවීචි නිරයෙහි යට භූතයන් ගෙන පැවති බැවින් ඔවුන්ගේ සංග්‍රහය කරන ලද්දේ වෙයි. ඔව්හු වනාහි ගැලුණෝව ම හැසිරෙත්. යට

භාගයෙහි ම හැසිරෙත් යනු = අවචරා ය. **එත්ථ පරියාපන්නා** යනු යම්හෙයකින් වනාහි මෙහි හැසිරෙන මොව්හු මෙයින් අන්තැනෙකද හැසිරෙත් ද එහි අන්තර්ගත වූවෝ නො වෙත්. එහෙයින් අන්තැන්හි ද හැසිරෙන ඔවුන් ඇතුළත් කරන ලදී. දැන් මෙහි ඇතුළත් ඒ ධර්මයන් රාශි ශූන්‍යතා ප්‍රත්‍යභාව වශයෙන් (මෙන් ම ස්වභාව වශයෙන් ද) දක්වමින් **ඛන්ධා** යනාදිය කී ය.

රූපාවචර නිර්දේශයෙහි **බ්‍රහ්මලොකං** යනු ප්‍රථමධ්‍යාන සංඛ්‍යාත බ්‍රහ්මයන්ගේ ස්ථානයයි. සෙස්ස මෙහි කාමාවචර නිර්දේශයෙහි කියන ලද නයින් ම දතයුතුයි. **සමාපන්නස්ස** යනාදීන්හි ප්‍රථම පදයෙන් කුශලධ්‍යානය කියන ලදී. දෙවැන්නෙන් විපාකධ්‍යානය කියන ලදී. තෙවැන්නෙන් ක්‍රියාධ්‍යානය කියනලදැයි දතයුතුයි.

අරූපාවචර නිර්දේශයෙහි **ආකාසානඤ්චායතනූපගෙ** යනු ආකාසානඤ්චායතන සංඛ්‍යාත භවයට පැමිණියවුන්, දෙවන පදයෙහි ද මේ නය ම ය. සෙස්ස යට කියන ලද නයින් දතයුතුයි.

සරණාද්වික නිර්දේශයෙහි ත්‍රිවිධ අකුශල මූලයන් අතුරෙන් යම් ඒ මෝහයක් වේද එය ලෝභ සම්ප්‍රයුක්ත වූයේ **ලෝභයෙන් සරණය,** (කෙලෙස් සහිතය) ද්වේෂ සම්ප්‍රයුක්ත වූයේ **ද්වේෂයෙන් සරණය,** විචිකිච්ඡා උද්ධච්ච සම්ප්‍රයුක්ත මෝහය වනාහි දෘෂ්ටි සම්ප්‍රයුක්තයෙන් මෙන් ම රූපරාග අරූපරාග සංඛ්‍යාත රාගසරණය සමගද ප්‍රහාණ එකස්ථ භාවයෙන් **සරණ සරජො** යැයි දතයුතුයි.

සූත්‍රාන්තික ද්විකයෙහි මාතෘකා කථාවෙහි අර්ථ වශයෙන් විවේචනය කළහෙයින් ද ඔවුන්ගේ යම් නිර්දේශ පදයෝ වෙත්නම් ඔවුන් පිළිබඳව ද යට කියන ලද නයින් ම මනාව දතහැකි බැවිනුත් බොහෝසෙයින් ම ප්‍රකට අර්ථ ඇත්තාහුම ය. මෙය වනාහි මෙහි විශේෂ මාත්‍රයයි. විජ්ජූපමද්‍රකයෙහි වනාහි ඇස් ඇති පුරුෂයෙක් මේඝාන්ධකාර (රාත්‍රියක) මගට පිළිපන්නේ ය. අඳුරු බැවින් ඔහුට මාර්ගය නො පෙනිණ. විදුලියක් නික්ම අඳුර නැති කෙළේ ය. ඉක්බිති අඳුර පහවීමෙන් මාර්ගය ප්‍රකට විය. හෙතෙම දෙවන වර ද ගමන ඇරඹීය. දෙවන වර ද අඳුර පැතිරිණ. (මාර්ගය නො පෙනිණ.) විදුලිය නික්ම එය විනාශ කෙළේ ය. අඳුර පහව ගිය කල්හි මාර්ගය ප්‍රකට විය. තුන්වෙනි වර ද ගමන ඇරඹී ය. අඳුර

පැතිරිණ. මාර්ගය නො පෙනිණ. විදුලිය නික්ම අඳුර විනාශ කෙළේය. එහිදී ආර්යශ්‍රාවකයාගේ සෝවාන් මාර්ගය සඳහා විදර්ශනාරම්භය ඇස් ඇති පුරුෂයා අඳුරෙහි මඟට බැසීම මෙනි. සත්‍යය වසන මෝහාන්ධකාරය අඳුරෙහි මාර්ගය නොපෙනෙන කාලය මෙනි. සෝවාන් මාර්ගයේ ආලෝකයෙන් ඉපිද සත්‍යය වසන මෝහාන්ධකාරය දුරුකරන කාලය විදුලිය නික්ම අඳුර දුරුකරන කාලය මෙනි. සෝවාන් මාර්ගයට චතුරාර්ය සත්‍යය ප්‍රකට වූ කාලය අඳුර පහවූ කල්හි මාර්ගය ප්‍රකට වූ කාලය මෙනි. මාර්ගය ප්‍රකටවීම වනාහි මාර්ගයට සම්බන්ධ පුද්ගලයාට ප්‍රකට ම ය. සකෘදාගාමී මාර්ගය පිණිස විදර්ශනාරම්භය දෙවනවර ගමන් ඇරඹීම මෙනි. සත්‍යය වසාලන මෝහාන්ධකාරය අඳුරෙහි මාර්ගය නො පෙනෙනකාලය මෙනි. සකෘදාගාමී මාර්ගාලෝකයෙන් ඉපිද සත්‍යය වසාලන අඳුර දුරුකරන කාලය දෙවනවර විදුලිය නික්ම අඳුර දුරුකරන කාලය මෙනි. සකෘදාගාමි මාර්ගයට චතුරාර්ය සත්‍යය ප්‍රකට වූ කාලය අඳුර පහවගිය කල්හි මාර්ගය ප්‍රකට වූ කාලය මෙනි. මාර්ගය ප්‍රකටවීම වනාහි මාර්ගයට සම්බන්ධ පුද්ගලයාට ප්‍රකට ම ය. අනාගාමී මාර්ගය පිණිස විදර්ශනාරම්භය තුන්වන ගමනාරම්භය මෙනි. සත්‍යය වසාලන මෝහාන්ධකාරය අඳුරෙහි මාර්ගය නො පෙනෙන කාලය මෙනි. අනාගාමි මාර්ගයේ ආලෝකයෙන් ඉපිද සත්‍යය වසාලන මෝහාන්ධකාරය දුරුකළ කාලය තුන්වන වර විදුලිය නික්ම අන්ධකාරය දුරුකළ කාලය මෙනි. තුන්වන වර විදුලිය නික්ම අන්ධකාරය දුරුකළ කාලය මෙනි. අනාගාමී මාර්ගයට චතුරාර්ය සත්‍යය ප්‍රකට වූ කාලය අඳුර පහව ගියකල්හි මාර්ගය ප්‍රකට වූ කාලය මෙනි. මාර්ගය ප්‍රකටවීම වනාහි මාර්ගයට සම්බන්ධ පුද්ගලයාට ප්‍රකට ම ය.

වජ්‍රයට නොබිඳිය හැකි පාෂාණයක් හෝ මැණිකක් නම් නැත. යම්තැනෙක වැටේ ද එය විනිවිදිනේ ම වෙයි. වජ්‍රය ගෙවාදමන වස්තුව ඉතිරි නොකොට ගෙවාදමයි. වජ්‍රය ගිය මාර්ගය නම් නැවත ප්‍රකෘතිමත් නො වෙයි. මෙපරිද්දෙන් අර්හත් මාර්ගයට විනාශ නොකළ හැකි ක්ලේශයක් නම් නැත. වජ්‍රය මෙන් සකල ක්ලේශයන් විනිවිද යයි. වජ්‍රය ගිය මාර්ගය නැවත ප්‍රකෘතිභාවයක් නැත්තා සේ අර්හත් මාර්ගය ද කෙලෙස් ක්‍ෂය කරනුයේ ඉතිරි නො කොට ක්‍ෂය කරයි. අර්හත් මාර්ගයෙන් ප්‍රහීණ ක්ලේශයන් නැවත උදාවීමක් නම් නැත යනුයි.

බාලද්වික නිර්දේශයෙහි බාලයන් කෙරෙහි අහිරික අනොත්තප්ප ද සෙසු බාලධර්මයන්ගේ මූල ද ප්‍රකට ම ය. අහිරික පුද්ගලයා ද අනොත්තාපි පුද්ගලයා ද කිසි අකුශලයක් නො කරන්නේ නම් නොවේ යැයි මේ දෙක පළමුවෙන් ම වෙන්ව කියන ලදී. ශුක්ල පක්ෂයේද මේ නය ම ය. කෘෂ්ණාද්විකයෙහි ද එසේ ම ය.

තපනීයද්වික නිර්දේශයෙහි කළහෙයින් ද නො කළ හෙයින් ද තැවීම දතයුතුයි. කායදුශ්චරිතාදිය වනාහි කළහෙයින් තැවෙයි. කාය සුචරිතාදිය නොකළ හෙයින් තැවෙයි. ඒ එසේ ම ය. පුද්ගලයා මා විසින් කායදුශ්චරිතයක් කරන ලදැයි තැවෙයි. මා විසින් කාය සුචරිතයක් නොකරන ලදැයි තැවෙයි. මා විසින් වාක් දුශ්චරිතයක් කරන ලදැයි තැවෙයි. -පෙ- මා විසින් මනෝ සුචරිතයක් නො කරන ලදැයි තැවෙයි. අතපනීයයෙහි ද මේ නය ම ය. කල්‍යාණකාරී පුද්ගලයා වනාහි මා විසින් කාය සුචරිතයක් කරන ලදැයි නො තැවෙයි. මා විසින් කාය දුශ්චරිතයක් නොකරන ලදැයි නොතැවෙයි. (මා විසින් වචී සුචරිතයක් කරන ලදැයි නො තැවෙයි) -පෙ- මා විසින් මනෝ සුචරිතයක් කරන ලදැයි නො තැවෙයි යනුයි.

අධිවචනද්වික නිර්දේශයෙහි **යා තෙසං තෙසං සතතානං** යනු සර්වධර්ම ග්‍රහණයයි. නම්කෙරේනුයි = **සංඛාය**, නම් කියයි යන අර්ථයි. **සංකථීයති** යනු කිම? අහං යැයි ද මමං යැයි ද පාරො යැයි ද පරසස යැයි ද සත්ත්වයා යැයි ද ගාවො යැයි ද පොසො යැයි ද පුද්ගලයා යැයි ද නර යැයි ද මානවයා යැයි ද කියයි යැයි ද දතත යැයි ද මඤ්ච යැයි භිසි යැයි ද බිම්බොහන යැයි ද විහාරය යැයි ද පරිවේණ යැයි ද ද්වාරය යැයි ද වාතපාතය යැයි ද මෙසේ නොයෙක් ආකාරයෙන් නම් කියානුයි = **සංඛාය** නම් කෙරේනුයි = **සමඤ්ඤාය**, කුමක් නම් කෙරේ ද? අහං යැයි ද මමං යැයි ද -පෙ- ද්වාරය වාතපානය යැයි නම් කෙරේනුයි = **සමඤ්ඤා ය**, පණවනු ලැබේනු යි = **පඤ්ඤත්ති** ය. ව්‍යවහාර කෙරේනුයි = **වොහාරො** ය. කුමක් ව්‍යවහාර කෙරේ ද? අහං යැයි ද මමං යැයි ද -පෙ- ද්වාරං වාතපානං යැයි ද ව්‍යවහාර කෙරේනුයි = **වොහාරො** ය.

නාමං යනු සාමාන්‍ය නාමය ගුණ නාමය කීර්ති නාමය ඖපපාතික නාමය යන චතුර්විධ නාමයයි. එහි ප්‍රථමකල්පිත මහාජනයා විසින් සම්මන්ත්‍රණය කොට තැබූ හෙයින් මහාසම්මත යන රජුගේ නාමය

සාමාන්‍ය නාමය නම්. එය සඳහා මෙසේ කියන ලදී. 'වාසෙට්ඨය, මහාජන සම්මතය යන්න වනාහි මහාසම්මතයැයි ම පළමු අකුර උපන්නේ ය' යනුයි. ධර්මකථිකයාය පංසුකූලිකයාය විනයධරයාය ත්‍රිපිටකධරයාය ශ්‍රද්ධාවන්තයාය ප්‍රසන්නයාය යනාදිය ද තථාගතයන් වහන්සේගේ නොයෙක් සියගණන් ගුණනාමයෝ ද ගුණනාමයෝ ම ය. එහෙයින් මෙසේ කියන ලදී.

අසංඛෙය්‍යානි නාමානි සගුණෙන මහෙසිනො
ගුණෙන නාමං උද්ධෙය්‍යං අපි නාමසහස්සතො ති

මහර්ෂී වූ බුදුරජාණන් වහන්සේගේ ගුණ වශයෙන් අසංඛ්‍ය ගණන් නාමයෝ වෙති. දහස්ගණන් නම්වලින් ද ගුණයෙන් නාමය උපුටා දක්වන්නෙමි යනුයි.

උපන් කුමාරයකුගේ නම් තබන දවසෙහි දක්ෂිණාර්හයන්ට සත්කාර කොට සමීපයෙහි සිටි නෑයෝ කල්පනා කොට (කල්පනා කොට) මෙතෙම අසුවලා නමැයි යම් නාමයක් කරත් ද, මෙය කීර්තිනාමය නම්. පළමුවෙන් කළ යම් ප්‍රඥප්තියක් පශ්චිම ප්‍රඥප්තියෙහි වැටේ ද, පළමුවෙන් කළ ව්‍යවහාරයක් පශ්චිම ව්‍යවහාරයෙහි වැටේ ද, එය කෙසේද යත්, ප්‍රථම කල්පයෙහි ද චන්ද්‍රය චන්ද්‍රයා නම් ම ය. දැනුදු චන්ද්‍රයා ම ය. අතීතයෙහි සූර්යයා - සමුද්‍රය - පෘථුවිය - පර්වතය නම් මය. දැනුදු - පර්වතය ම යැයි යන මෙය ඕපපාතික නාමය නම්. මෙහිදී මේ චතුර්විධ නාමය ම නාමයම වෙයි. **නාම කම්මං** යනු නම් කිරීමයි. **නාමධෙය්‍යං** යනු නම් තැබීමයි. **නිරුත්ති** යනු නාම නිරුක්තියයි. නාම ව්‍යඤ්ජනයයි. යම්හෙයකින් වනාහි මෙය අර්ථය ප්‍රකට කෙරේ ද, එහෙයින් මෙසේ කියන ලදී. **අභිලාපො** යනු නාමය කීමයි.

**සබ්බෙව ධම්මා අධිවචනපථා** යනු අධිවචනයට පථ ධර්මයක් නැත්තේ නම් නොවෙයි. එක් ධර්මයක් සියලු ධර්මයන්හි වැටෙයි. සියලු ධර්මයෝ එක් ධර්මයෙක්හි වැටෙත්. කෙසේ ද? මේ නාම ප්‍රඥප්තිය වනාහි එක් ධර්මයෙකි. එය සියලු චාතුර්භූමක ධර්මයන්හි වැටෙයි. නාමයෙන් මිදුණු සත්ත්වයෙක් හෝ සංස්කාරයෙක් නම් නැත. පර්වතාදීන්හි පෘථුවිය ද ජානපදිකයන්ට වෘක්ෂය ද භාරය. ඔව්හු වනාහි මේ කිනම් වෘක්ෂයක් දැයි විචාරන ලද්දෝ කිහිරිය කැලය යැයි තමා

දන්නා නාමය කියත්. යම් රුකෙක නාමය නො දනිත් ද එය ද අනාමක නමැයි ද කියත්. එය ද එහි නාමය ම වී සිටී. සමුද්‍රයෙහි මස්කැසුබු ආදීන් කෙරෙහි ද මේ නය ම ය. ඉතිරි දුක දෙක මෙය හා සමානාර්ථ ඇත්තේ ම ය.

නාමරූප දුකයෙහි නමන අර්ථයෙන් ද නමවන අර්ථයෙන් ද නාමයයි. එහි ස්කන්ධ සතරක් වනාහිනාමකරණාර්ථයෙන් නාමය යම්සේ වනාහි මහාජනයා විසින් සම්මත කරන ලද හෙයින් මහාසම්මත රජුට මහාසම්මතයැයි නම වී ද, යම්සේ මව්පියෝ මෙතෙම තිස්ස නම් වේවා, ඵුස්ස නම් වේවායි මෙසේ පුතුට කීර්තිනාමය කරත් ද, යම් සේ වනාහි ධර්මකථිකයාය. විනයධරයා යැයි ගුණයෙන් නාමයට පැමිණේ ද, වේදනාදීන්ට මෙසේ නො වේ. වේදනාදීහු වනාහි මහාපෘථුවි ආදීන් මෙන් තමාගේ නාමය කරමින් ම උපදිත්. ඔවුන් උපන් කල්හි ඔවුන්ගේ නාමය උපන්නේ ම වෙයි. උපන් වේදනාවටඔබ වේදනා නම් වෙවයි කිසිවෙක් නො කියයි. ඒ පිළිබඳ නාමග්‍රහණ කෘත්‍යයක් නැත. යම්සේ පෘථුවිය උපන්කල්හි ඔබ ඔබ පෘථුවි නම් වෙවයි නාමග්‍රහණ කෘත්‍යයක් නැත් ද, සක්වළ මහමෙර සඳ හිරු නැකත්තරු උපන්කල්හි ඔබ සක්වළ නම් වෙව - ඔබ ඔබ නැකත්තරුව නම් වෙවයි නාමග්‍රහණ කෘත්‍යයක් නැත. නම උපන්නේ ම වෙයි. ඕපපාතික ප්‍රඥප්තියෙහි වැටෙයි. මෙසේ වේදනාව උපන්කල්හි ඔබ වේදනාව නම් වෙවයි නාමග්‍රහණ කෘත්‍යයක් නැත. එය උපන්කල්හි වේදනා යන නාමය උපන්නේ ම වෙයි. (ඕපපාතික ප්‍රඥප්තියෙහි වැටෙයි.) සංඥා ආදියෙහි ද මේ නය ම ය. අතීතයෙහි ද වේදනාව වේදනාව ම ය. සංඥාව, සංස්කාර විඥානය ම ය. අනාගතයේ ද වර්තමානයේ ද (එසේ ම ය.) නිර්වාණය වනාහි හැමකල්හිම නිර්වාණය ම යැයි නාමකරණාර්ථයෙන් නාමයයි. මෙහි ගමනාර්ථයෙන් ද ස්කන්ධ සතර නාමය. ඔව්හු වනාහි අරමුණට අභිමුඛව නැමෙත්. නාමනාර්ථයෙන්ද සියල්ල ම නාමය, ස්කන්ධ සතර වනාහි අරමුණෙහි ඔවුනොවුන් නමත්. නිර්වාණය ආරම්මණාධිපතිප්‍රත්‍ය හෙයින් තමා කෙරෙහි අනවද්‍ය ධර්මයන් නමත්. අවිද්‍යාව හා භව තෘෂ්ණාව වට්ටමූල සමුදාචාරය දැක්වීම පිණිස ගන්නා ලදී. **භවිසසති අතතා ච ලොකො ච** යනු ස්කන්ධ පංචකය ආත්මය යැයි ද ලෝකය යැයි ද ගෙන එය වන්නේ යැයි ග්‍රහණාකාරයෙන් පිවිසි ශාස්වත දෘෂ්ටිය යි. දෙවැන්න නො වන්නේ ය යන ආකාරයෙන් පිවිසගත් උච්ඡේද දෘෂ්ටිය යි. පුබ්බනතං ආරබ්භ යනු අතීත කොට්ඨාශය අරමුණු කොට, මෙයින් බ්‍රහ්මජාල සූත්‍රයෙහි ආ අටළොස් පූර්වාන්තානු

දෘෂ්ටීහු ගන්නා ලදහ. අපරන්තං ආරබ්භ යනු අනාගත කොට්ඨාශයය අරමුණු කොට, මෙයින් එහි ම ආ සූසාළිස් අපරාන්ත දෘෂ්ටීහු ගන්නා ලදහ.

දොවචස්සතා නිර්දේශයෙහි **සහධම්මිකෙ වුච්චමානෙ** යනු සහධම්මිකයා නම් භාග්‍යවතුන් වහන්සේ විසින් යම් ශික්ෂාපදයක් පණවන ලද ද එහි වස්තුව දක්වා ආපත්තියට ආරෝපණය කොට ඔබ මෙවන් ඇවතකට පැමිණියේ ය. එහෙනම් ඇවත දෙන්න. ඇවතින් නැගිටින්න පූතිකර්ම කරවයි කියන්නවුත්, **දොවචස්සායං** යන ආදීන්හි මෙසේ චෝදනා කරන්නාට ප්‍රතිචෝදනා වශයෙන් හෝ අල්ප දක්ෂිණාග්‍රාහිත්වයෙන් හෝ පූර්වචයාගේ කර්මය = **දොවචස්සායං ය.** එයම දොවචස්සං යැයි ද කියනු ලැබේ. එහි භාවය **දොවචස්සියං ය.** අනෙක එහිම පරියාය වචනයකි. **විප්පටිකුලගාහිතා** යනු විරුද්ධ පැත්ත ගැනීමයි. විලෝමග්‍රහණ සංඛ්‍යාත විරුද්ධ වීමෙන් සැපයක් මොහුට ඇත යනු = විපච්චනීක සාත ය. සතුරු සේනාවක් ගෙන එකපහරින් ම ඔහු නිහඬ කෙළෙමි යි සැප ලබන්නාට මෙය නමකි. ඔහුගේ භාවය = **විපපනීක සාතතා** ය. අවවාද නො ගැනීම් වශයෙන් ආදර නොකරන්නාගේ භාවය = **අනාදරියං** ය. අනෙක එහි ම පරියාය වචනය යි. නො ගන්නා ආකාරය හෝ = **අනාදරතා ය.** ගරු වාසයක් නො විසීම් වශයෙන් උපන් අගාරවභාවය **අගාරවතාය.** සජෙට්ඨක වාසයක් නොවිසීම් වශයෙන් උපන් අකීකරුභාවය = **අප්පතිස්සවතාය,** **අයං වුච්චති** යනු මෙබඳු ස්වරූප ඇති මෙය දොවචස්සතා නමැයි කියනු ලැබේ. මෙය වනාහි අර්ථ වශයෙන් ඒ ආකාරයෙන් පැවති ස්කන්ධ සතර සංස්කාර ස්කන්ධය ම ය යනුයි.

**පාපමිත්තතාදියෙහි** ද මේ නය ම ය. දොවචස්සතා පාපමිත්තතා ආදිය වනාහි වෙනම චෛතසික ධර්මයෝ නම් නැත. මොවුන්ට ශ්‍රද්ධාව නැත්තේ ය යනු = **අස්සද්ධා** ය. බුද්ධාදී වස්තූන් නො අදහත් යනු අර්ථයි. **දුස්සීලා** යනු සීලයට දුර්නාමයක් නම් නැත. සීලය නැති යන අර්යි. **අප්පස්සුතා** යනු ශ්‍රැත රහිතයෝ ය. පංචමාත්සර්යයෝ මොවුන් ඇත යනු = **මච්ඡරිනො** ය. **දුප්පඤ්ඤා** යනු ප්‍රඥා නැත්තෝ ය. සේවනක වශයෙන් **සෙවනා** ය. බලවත් සේවනය **නිසෙවනා ය.** සර්වභාගයෙන් ම සේවනය **සංසෙවනාය,** උපසර්ග වශයෙන් ද පදය වර්ධනය කරන ලදී. තුනෙන් ම සේවනය ම කියන ලදී. **භජනා** යනු ළඟට එළඹී ම ය. **සම්භජනා** සර්වභාගයෙන් භජනය කිරීමය. උපසර්ග වශයෙන් ද පදය

වර්ධනය කරන ලදී. **භත්ති** යනු දෘඪ භක්තියයි. **සම්භත්ති** යනු සර්වභාගයෙන් භක්තියයි. උපසර්ග වශයෙන් ද පදය වර්ධනය කරන ලදී. දෙකෙන් ම දැඩි භක්තිය කියන ලදී. **තංසම්පවංකතා** යනු එම පුද්ගලයන් කෙරෙහි කයින් මෙන් ම සිතින් ද විශේෂයෙන් නැවෙන බවයි. එයට නිම්න බව එයට පහත් වූ බව එයට බර වූ බව යන අර්ථයි. සොවචස්සතා දුක නිර්දේශය ද කියන ලද්දට ප්‍රතිපක්ෂ නයින් දතයුතු යි.

**පඤ්චපි ආපත්තික්ඛන්ධා** යනු මාතෘකා නිර්දේශයෙන් පාරාජිකාව සංඝාදිසේසය පාචිත්තිය පාටිදේසනීය දුක්කටය යන මේ පංච ආපත්තීහු ය. **සත්තපි ආපත්තික්ඛන්ධා** යනු විනය නිර්දේශයෙන් පාරාජිකාව සංඝාදිසෙසය ථුල්ලච්චය පාචිත්තිය පාටිදේසනීය ය දුක්කටය දුබ්භාසිතය යන මේ සප්ත ආපත්තීහු ය. එහි වස්තුවත් සමග ඒ ආපත්තීන්ගේ පරිච්ඡේදය දන්නා ප්‍රඥාව **ආපත්ති කුසලතා** නම්. කර්මවාචාව සමග ආපත්තියෙන් නැගිටීමේ පරිච්ඡේදය දන්නා ප්‍රඥාව වනාහි **ආපත්ති වුට්ඨාන කුසලතා** නම්. සමවැදිය යුතු හෙයින් සමාපත්තිය. පරිකර්ම සමග අර්පණා පරිච්ඡේදය දන්නා ප්‍රඥාව වනාහි **සමාපත්ති කුසලතා** ය. චන්ද්‍රයා හෝ සූර්යයා හෝ නැකත්තරු හෝ මෙතෙක් තැන් ගිය කල්හි නැගිටිමියි නොවරදවා එම වේලාවෙහි ම නැගිටීමේ ප්‍රඥාව ඇතිහෙයින් **සමාපත්තිවුට්ඨාන කුසලතා** නම්.

අෂ්ටාරස ධාතූන් පිළිබඳ උද්ග්‍රහණ මනසිකාර ශ්‍රවණ ධාරණ පරිච්ඡේද දන්නා ප්‍රඥාව **ධාතු කුසලතා** නම්. ඒවා පිළිබඳව උද්ග්‍රහ මනසිකාර දන්නා ප්‍රඥාව **මනසිකාර කුසලතා** නම්. ද්වාදශ ආයතනයන් පිළිබඳ උද්ග්‍රහණ මනසිකාර ශ්‍රවණ ධාරණ පරිච්ඡේද දන්නා ප්‍රඥාව **ආයතන කුසලතා** නම්. මෙකී ත්‍රිවිධ කුශලතාවන්හි හෝ උද්ග්‍රහය මනසිකාරය ශ්‍රවණය සම්මර්ශනය ප්‍රතිවේධය ප්‍රත්‍යවේක්ෂණය යන සියල්ල වටී. එහි ශ්‍රවණ උද්ග්‍රහ ප්‍රත්‍යවේක්ෂණයෝ ලෞකිකයහ. ප්‍රතිවේධය ලෝකෝත්තර ය. සම්මර්ශන මනසිකාරයෝ ලෞකික ලෝකෝත්තර මිශ්‍රයහ. 'අවිජ්ජා පච්චයා සංඛාරා' යනාදිය ප්‍රතීත්‍ය සමුත්පාද විභංගයෙහි මතු පළවන්නේ ය. මේ ප්‍රත්‍යයෙන් වනාහි මෙය වේයැයි දන්නා ප්‍රඥාව **පටිච්ච සමුප්පාද කුසලතා** නම්.

ඨානාඨාන (කුසලතා) දුක නිර්දේශයෙහි **හෙතුපච්චයො** යන මේ දෙකම අන්‍යොන්‍ය පර්යාය වචනයකි. **චක්ඛුප්පසාදො** යනු රූපය අරමුණු

කොට උපදනා චක්ෂුර් විඥානයට හේතුව මෙන් ම ප්‍රත්‍යය, **සොතප්පසාදාදිය** ශ්‍රෝත විඥානාදීන්ට ද එසේමය. අඹඵලයන්ට අඹබීජය මෙනි. ද්විතීය නයෙහි **යෙ යෙ ධම්මා** යනු විසභාග ප්‍රත්‍යය ධර්මයන්ට නිදර්ශනය, **න හෙතු න පච්චයා** යනු චක්ෂුර් ප්‍රසාදය ශබ්දය අරමුණුකොට උපදනා ශ්‍රෝත විඥානයට හේතු නොවේ. ප්‍රත්‍ය නොවේ. ශ්‍රෝත ප්‍රසාදීහු අවශේෂ විඥානාදීන්ට ද එසේම ය. අඹ ආදිය තල් ආදීන් මෙනි යැයි මෙසේ අර්ථය දතයුතුයි.

අජ්ජව මද්දව නිර්දේශයෙහි **නීචචිත්තතා** යනු පදමාත්‍රය පමණක් විශේෂ ය. එහි අර්ථය මානය නැති බැවින් නීච සිතක් මොහුට ඇත යනු = නීච චිත්තය, නීච චිත්තයාගේ භාවය = **නීච චිත්තතාය**, ශේෂය චිත්තුජ්ජුකතා චිත්ත මුදුතා පදභාජනීයෙහි ආයේ ම ය.

ක්ෂාන්ති නිර්දේශයෙහි ඉවසීම් වශයෙන් **ඛන්ති** ය, ඉවසන ආකාරය **ඛමන තා** ය. මෙයින් ඉවසත් තමාට උඩින් තබා වාසය කරවත් බැහැර නොකරත් විරුද්ධතාවෙන් නොසිටිත් යනු **අධිවාසනතා** ය. චණ්ඩ නො වන බව **අචණ්ඩික්ක** ය. **අනසුරොපො** යනු මනාව රෝපණය නො කරන ලද හෙයින් නපුරුකොට කියන ලද වචනය අසුරෝප යැයි කියනු ලැබේ. එය ප්‍රතික්ෂේප වශයෙන් **අනසුරෝප ය**. මනාව කියන ලද වචනය යන අර්ථයි. මෙසේ මෙහි ඵලූපචාරයෙන් කාරණය දක්වන ලදී. **අත්තමනතා චිත්තස්ස** යනු සොම්නස් වශයෙන් සිතෙහි ස්වමනතාවයි. තමාගේ සිතේ ස්වභාව ම ය. ව්‍යාපාදයට නොපත් සිත් ඇති බව යන අර්ථයි.

සොරච්ච නිර්දේශයෙහි **කායිකො අවීතික්කමො** යනු ත්‍රිවිධ කායික සුචරිතයයි. **වාචසිකො අවීතික්කමො** යනු චතුර්විධ වචී සුචරිතයයි. **කායික වාචසිකො** යනු මේ කායවාක් ද්වාරයන්ගෙන් නැගුණු ආජීවට්ඨමක සීලය සම්පූර්ණයෙන් ගනු ලැබේ. **ඉදං වුච්චති සොරච්චං** යනු මෙය පාපයෙන් මනාව මෙතෙර හෙයින් සෝරච්ච නමැයි කියනු ලැබේ. **සබ්බොපි සීලසංවරො** යනු මෙය යම්හෙයකින් හුදෙක් කයින් හා වචනයෙන් ම පමණක් අනාචාරයේ නො හැසිරෙයි. මනසින් ද හැසිරේමය. එහෙයින් මානසික සීලය හාත්පසින් දැක්වීමට කියන ලදී.

සාඛල්‍යං නිර්දේශයෙහි **අණ්ඩකා** යනු යම්සේ දොස් සහිත රුකෙක ගැට මතුවේද මෙසේ සදොස් බැවින් බුංසන වම්භනාදී වචනවලින්

හටගත් ගැට ඇති, **කකකයා** යනු කුණු වූ, යම් සේ නම් කුණු වූ රුකක් කර්කශ වේද, වැගිරුණු සුණු ඇත්තේ වේ ද එය ද මෙසේ කර්කශ වෙයි. කනට ගටන්නාක් මෙන් පිවිසෙයි. එහෙයින් **කකකාසා** යැයි කියන ලදී. **පරකටුකා** යනු අන්‍යයාට කටුක අමනාප දෝෂ උපදවන, **පරාභිසජ්ජනී** යනු වක්‍ර කටුඅතු මෙන් සම් විද අන්‍යයන්ට කෝප ඇතිකරන යන්නට කැමති අයට ද යන්නට නොදී ඇලීම කරන, **කොධ සාමන්තා** යනු කෝධයට ආසන්න වූ, **අසමාධි සංවත්තනිකා** යනු අර්පණා සමාධිය පිණිස හෝ උපචාර සමාධිය පිණිස නො පවත්නා වූ, මෙසේ මේ සියල්ල දොස් සහිත වචනයට පර්යාය වචනයෝ ය. **තථාරූපිං වාචං පහාය** යනු මේ එරුෂ වචනය අතනොහැර සිටියහු අතරතුර පැවතියා වූ මෘදුවචන (රළු වචන) ම නමැයි දැක්වීම පිණිස කියන ලදී. **නෙළා** යනු එළා යනු දෝෂය යි. මෙයට දෝෂයක් නැත යනු **නෙළා** ය. නිදොස් යන අර්ථයි. 'නෙළංගො සෙතපච්ඡාදො' (පිරිසිදු අංග ඇති සුදු අඳින) යන මෙහි කියන ලද සීලය මෙනි. **කණ්ණසුඛා** යනු ව්‍යඤ්ජන මධුරතාව නිසා කන්වලට සැප වූ, ඉඳිකටුවෙන් විදිනා මෙන් කනට තුලක් නූපදවයි. අර්ථ මධුරතාව නිසා ශරීරයෙහි කෝපයක් නූපදවා ප්‍රේමය උපදවයි යනු = **පෙමනීයා** ය. හෘදය කරා යයි නොගැටෙමින් සුවසේ සිතට පිවිසෙයි යනු = **හදයංගමාය**, ගුණයෙන් පිරිපුන් බැවින් පුරයෙහි හටගත්තේය යනු = **පොරී** ය. නුවර වැසියන්ගේ කථා යන අර්ථයි. නුවරවැසියෝ වනාහි යුක්තිකථා ඇත්තෝ ම වෙත්. පියා වැන්නවුන්ට පියා යැයි ද සහෝදරයා වැන්නවුන්ට සහෝදරයා යැයි ද කියත්. මෙබඳු කථා බොහෝදෙනාට කාන්ත වේ යනු = **බහුජනකන්තා** ය. කාන්ත භාවයෙන් ම බොහෝදෙනාට මනාපය. සිතේ අභිවෘද්ධිය කරන්නේ ය යනු **බහුජන මනාපා ය**, **යා තථා** යනු යමක් ඒ පුද්ගලයා කෙරෙහි, **සණ්හ වාචතා** යනු මටසිලුටු වචන ඇති බවයි. **සඛිලවාචතා** යනු මෘදුවචන ඇතිබවයි. **අඵරුසවාචතා** යනු කර්කශ නො වන වචන ඇතිබවයි.

පටිසන්ථාර නිර්දේශයෙහි **ආමිස පටිසන්ථාරො** යනු ආමිස අලාභයෙන් තමා සමග අන්‍යයන් ගේ සිදුරු වසන පරිදි සඟවන පරිදි ආමිසයෙහි පිළිසඳර කිරීමයි. **ධම්ම පටිසන්ථාරො** යනු ධර්මය නොලැබීමෙන් තමා සමග අන්‍යයන්ගේ සිදුරු වැසෙන පරිස සඟවන පරිදි ධර්මයෙන් පිළිසඳර කිරීමයි. **පටිසන්ථාරකො හොති** යනු ලෝක සන්නිවාසයෙහි වනාහි සිදුරු දෙකක් ම ය. ඒවා පිළිබඳව පිළිසඳර කරන්නෙක් වෙයි. **ආමිස පටිසන්ථාරෙන වා (ධම්ම පටිසන්ථාරෙන වා)**

යනු මේ දෙවැදෑරුම් පිළිසඳරින් පිළිසඳර කරන්නෙක් වෙයි. පටිසන්ථාරතී යනු නිතර කරයි. මේ එහි මුලපටන් කථාවයි. පිළිසඳර කරන භික්ෂුව විසින් වනාහි ආගන්තුකයක එනු දැකම පෙරගමන්කොට පාසිවුරු ගතයුතුයි. අසුනක් දිය යුතුයි. තල්වැටින් පවන් සැලිය යුතු ය. පා සෝදා තෙල් තැවරිය යුතුයි. ගිතෙල් පැණි ඇතිකල්හි බෙහෙත් දිය යුතුයි. පැන් අවශ්‍යදැයි විචාරිය යුතුයි. ආවාසය පිළිදැගුම් කළයුතුයි. මෙසේ ඒකදේශයකින් ආමිස පටිසන්ථාරය කෙළේ නම් වෙයි. සවස වනාහි නවකතරයන් තමාට උපස්ථානයට එන්නට පළමුවෙන් ම ඔහු වෙතට ගොස් හිඳ අවිෂය දෑ නො විචාරා ඔහුට විෂය ප්‍රශ්නයත් විචාරිය යුතුයි. ඔබ කිනම් භාණකයෙක්දැයි නො විචාරා (ඔබගේ) ආචාර්යයොාපාධ්‍යයෝ කවර ග්‍රන්ථයක් භාවිතා කෙරෙත්දැයි විචාරා පොහෝනා තැනකින් ප්‍රශ්නයක් විචාරිය යුතුයි. කියන්නට හැකිවෙයි නම් ඒ ප්‍රමාණවත් ය. නොහැකි වේනම් තමා කියා දියයුතුයි. මෙසේ ඒකදේශයකින් පිළිසඳර කෙළේ නම් වෙයි. ඉදින් තමා වෙත වාසය කරයි නම්, ඔහු රැගෙන නිතර පිඬු පිණිස හැසිරිය යුතුයි. ඉදින් යනු කැමැත්තේ වෙයි නම් දෙවන දිනයෙහි ගමනට සහභාගිවීම් වශයෙන් ඔහු රැගෙන එක් ගමෙක පිඬු පිණිස හැසිර පිටත් කළයුතුයි.

ඉදින් අන් දිසාභාගයෙක භික්ෂූහු නිමන්ත්‍රණය කළෝ වෙත් ද ඒ භික්ෂුව කැමති නම් රැගෙන යා යුතු ය. මට මේ දිසාව සභාග නොවේයැයි යන්නට අකමැති කල්හි සෙසු භික්ෂූන් යවා ඔහු ගෙන පිඬු පිණිස හැසිරය යුතු ය. තමා විසින් ලබන ලද ආමිසය ඔහුට දිය යුතු ය. මෙසේ ආමිස පටිසන්ථාරය කරන ලද්දේ නම් වෙයි. ආමිස සන්ථාරකයා විසින් වනාහි තමා ලද දෙය කවරෙකුට දිය යුතු ද? පළමු ව ආගන්තුකයාට දිය යුතුයි. ගිලනෙක් හෝ අවශ්‍ය අයෙක් වෙත් නම් ඔවුන්ට දිය යුතුයි. ආචාර්යයෝපාධ්‍යායන්ට දියයුතුයි. බඩු ගෙන යන්නාට දිය යුතුයි. සාරාණීය ධර්මපූරකයා විසින් වනාහි සියවාරයක් ද දහස්වාරයක් ද ගෙනෙන ගෙනෙන ලද දෙයින් ථේරාසනයේ පටන් දිය යුතුයි. පටිසන්ථාරකයා විසින් වනාහි යම් යම් කෙනෙකුන් ගෙන් ලබන ලද ද ඒ ඒ කෙනාට දිය යුතුයි. ගමින් පිට නික්ම මහලු වූ හෝ අනාථ වූ හෝ භික්ෂුවක හෝ භික්ෂුණියක දැක ඔවුන්ට ද දිය යුතුයි. මේ එහිදී වස්තුවයි. සොරුන් විසින් ගුත්තලගම පැහැරි කල්හි එකෙණෙහි ම නිරෝධ සමාපත්තියෙන් නැඟිටි එක් රහත් තෙරණියක් ළදරු භික්ෂුණියක ලවා බඩු ගෙන්වාගෙන මහජනයා සමග මගට බැස මධ්‍යාහ්නයෙහි නකුල නුවර ගම්දොරට

පැමිණ රුක්මුලෙක හුන්නාහ. එසමයෙහි කාලවල්ලි මණ්ඩපවාසී මහානාග ස්ථවිරයන් වහන්සේ නකුලු නුවරගම පිඬු පිණිස හැසිර නික්මෙන සේක් තෙරණිය දැක බතින් විචාළහ. තෙරණිය මට පාත්‍රයක් නැතැයි කීවාය. තෙරණුවෝ මෙයින් ම වළඳන්නැයි පාත්‍රය සමග ම දුන්හ. තෙරණිය බත්කිස කොට පාත්‍රය සෝදා තෙරුන්ට දී මෙසේ කීහ. දරුව, අද නම් පිඬු පිණිස හැසිරීමෙන් වෙහෙසට පත්වූයෙහිය. මෙතැන් පටන් වනාහි පිඬු සිඟීමෙන් වෙහෙසක් නො වන්නේ ය යනුයි. එතැන් පටන් තෙරුන්ට උණු කහවණුවක් අගනා පිණ්ඩපාතයක් නම් නූපන් විරූ ය. මේ සිව්පසයෙන් සත්කාර කිරීම නම්. භික්ෂුව විසින් මේ පටිසන්ථාරය කොට සංග්‍රහ පක්ෂයෙහි සිට ඒ භික්ෂුවට කර්මස්ථාන කිවයුතු යි. ධර්මය කියවිය යුතු ය. කුකුස දුරුකළ යුතු ය. උපන් කළයුතු කිස කළයුතු යි. අබ්භාන වුට්ඨාන මානත්ත පරිවාස දිය යුතුයි. පැවිද්දට සුදුස්සෙක් නම් පැවිදි කළයුතු යි. උපසම්පදාවට සුදුස්සෙක් නම් උපසම්පදා කළයුතු යි. භික්ෂුණියක විසින් ද තමා වෙත උපසම්පදාව කැමතිවනු ලැබේ නම් කර්මවාචා කරන්නට වටී. මේ ධම්ම සන්ථාර නම්. මෙකී පටිසන්ථාර දෙකින් පටිසන්ථාරක භික්ෂූන් වහන්සේ නූපන් ලාභ උපදවති. උපන් ලාභ ස්ථාවර කරති. භය සහිත තැනදී තම ජීවිතය රැකගනී. පාත්‍රය ගත් අතින් ම චෝරනාග රජුගේ අග්‍රහාරය ගෙන පාත්‍රයෙන් ම බත් විසුරුවන තෙරුන් වහන්සේ මෙනි.

නො ලද ලාභ ඉපදවීමෙහි වනාහි මෙරටින් පැන පරතෙරට ගොස් එක් තෙරකෙනෙකුන්ගේ සංග්‍රහ ලැබ නැවත අවුත් රාජ්‍යයෙහි පිහිටි මහානාම රජු විසින් ජේතවම්බංගනයෙහි දිවිහිමියෙන් පැවැත් වූ මහා භේසජ්ජදාන වස්තුව කිවයුතුයි. උපන් ලාභය තහවුරු කිරීම පිළිබඳව දීඝභාණක අභය තෙරුන් අතින් පිළිසඳර ලැබ චෛතිය පබ්බතයෙහි සොරුන් විසින් බඩු නොපැහැර ගැනීම පිළිබඳ වස්තුව කිවයුතු යි.

ඉන්ද්‍රියෙසු අගුත්තද්වාරතා නිර්දේශයෙහි චක්ඛුනාරූපං දිස්වා යනු කරුණු වශයෙන් චක්ඛු යැයි ලබන ලද ව්‍යවහාරයෙන් රූප දර්ශනයෙහි සමර්ථ චක්ෂුර් විඥානයෙන් රූපය දැක, පොරාණකයෝ වනාහි මෙසේ කීහ. ඇස රූපය නො දකී. අචිත්තක බැවිනි. සිත නොදකී. අචක්ෂුක බැවිනි. ද්වාරාරම්මණ සංඝර්ෂණයෙන් වනාහි ප්‍රසාදවස්තුක සිතින් දකී. එය එසේමය. දුන්නෙන් විදී ආදියෙහි මෙන් සසම්භාර කථා නම් වෙයි. එහෙයින් චක්ෂුර් විඥානයෙන් රූපය දැක යනු මෙහි අර්ථයි.

**නිමිත්තගාහී** යනු ස්ත්‍රීපුරුෂ නිමිත්ත හෝ ශුභ නිමිත්තාදිය හෝ ක්ලේශ වස්තුභූත නිමිත්තක් ඡන්දරාග වශයෙන් ගනී. දෘෂ්ටි මාත්‍රයෙන් ම නො පිහිටයි. **අනුබ්‍යඤ්ජනගාහී** යනු ක්ලේශයන්ගේ අනුව්‍යඤ්ජන ප්‍රකටභාවය කිරීම් වශයෙන් අනුව්‍යඤ්ජනයැයි ව්‍යවහාර ලද අත්පා මඳ සිනා සිනා කථා බැලීම් ආපසු බැලීම් ආදී භේද ඇති ආකාරය ගනී. **යත්වාධිකරණමෙනං** යනාදියෙහි යම් කෙනෙකුගේ චක්ෂුරේන්ද්‍රිය සංවරයට යමක් කරුණු වේද හේතුවේද ඒ පුද්ගලයා සතිකවාටයෙන් නො වසන ලද චක්ෂුර් ද්වාරය ඇතිව වාසය කරන්නහු අභිධ්‍යාදී ධර්මයෝ අනුව එන්නාහු ය. ලුහුබඳින්නාහු ය. මඩනාහු ය. **තස්ස සංවරාය න පටිපජ්ජති** යනු ඒ චක්ෂුරේන්ද්‍රිය සතිකවාටයෙන් වැසීමට නො පිළිපදී.

මෙසේ ම වූයේ න **රක්ඛති චක්ඛුන්ද්‍රියං න චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති** යැයි කියනු ලැබේ. එහි කිසිසේත් චක්ෂුරෙන්ද්‍රියයෙහි සංවරයක් හෝ අසංවරයක් නැත. චක්ෂුර් ප්‍රසාදය නිසා සිහියක් හෝ සිහිමුළාවක් නූපදී. නමුත් යම්කලෙක රූපාරම්මණය චක්ෂුසෙහි විෂයබවට පැමිණේ ද එකල්හි භවාංග සිත දෙවරක් ඉපිද නිරුද්ධ වූ කිරියමනෝධාතුව ආවර්ජන කෘත්‍යය සිද්ධ කරමින් ඉපිද නිරුද්ධ වෙයි. ඉක්බිති චක්ෂුර්විඥානය දර්ශන කෘත්‍යය ද, ඉක්බිති විපාක මනෝධාතුව සම්පටිච්ඡන කෘත්‍යය කරයි. ඉක්බිති විපාකහේතුක මනෝවිඥාන ධාතුව සන්තීරණ කෘත්‍යය කරයි. ඉක්බිති ක්‍රියාහේතුක මනෝවිඥානධාතුව ව්‍යවස්ථාපන කෘත්‍යය සිදුකරමින් ඉපිද නිරුද්ධ වෙයි. ඊට අනතුරුව ජවන් සිත ජවනය කරයි. එහිදී ද භවාංග සමයෙහි ද ආවර්ජනාදීන්ගෙන් එක්තරා හෝ සමයක ද සංවරයක් හෝ අසංවරයක් නැත. ජවනක්ෂණයෙහි වනාහි දුශ්ශීල බව හෝ සිහිමුළාව හෝ අඥානය හෝ නො ඉවසීම හෝ කුසීත බව හෝ උපදී. අසංවර වෙයි. මෙසේ වන එය වනාහි චක්ෂුරේන්ද්‍රියයෙහි අසංවරය යැයි කියනු ලැබේ. කවර හෙයින්ද? යම්හෙයකින් එහි සතිද්වාරය ද භවංගය ද ආවර්ජනාදී විථිසිත් ද අගුප්ත වේ ද, කුමක් මෙන් ද, යම්සේ නගරයෙක සතර දොරටු නොවැසූ කල්හි ඇතුළු ගේදොරවල් ගබඩා ආදිය මනාව වැසුවත්, ඇතුළු නගරයෙහි සියලු ම භාණ්ඩ අනාරක්ෂිත ම වෙයි. අගෝපිත ම වෙයි. සොරු නුවර දොරින් පිවිස කැමති දෙයක් කරති. මෙපරිද්දෙන් ජවනයෙහි දුශ්ශීල්‍යාදිය උපන් කල්හි එහි අසංවරය ඇති කල්හි සති ද්වාරය ද භවංගය ද ආවර්ජනාදී වීථිසිත් ද අගුප්ත ම වෙයි. **සොතෙන සද්දං සුත්වා** යන ආදියෙහි ද මේ නය ම ය. **යා ඉමෙසං** යනු මෙසේ සංවරයට නො පැමිණෙන්නාගේ මේ ෂඩින්ද්‍රියන්ගේ යම්

අගුප්තයක් යම් අගෝපනයක් යම් අනාරක්‍ෂාවක් යම් අසංවරයක් යම් නො වැසීමක් වහන්තරාවක් යන අර්ථයි.

භොජනෙ අමත්තඤ්ඤුතා නිර්දේශයෙහි **ඉධෙකච්චො** යනු මේ සත්ත්වලෝකයෙහි ඇතැම් කෙනෙක්, **අප්පටිසංඛා** යනු විමසා බලන ප්‍රඥාවෙන් නොදැන නොසලකා, **අයොනිසො** යනු උපායෙන් තොරව, **ආහාරං** යනු කෑමබීම ආදි ගතයුතු දේ, **ආහාරෙති** යනු පරිභෝග කරයි ගිලියි. **දවාය** යන ආදිය උපාය නොදන්නා බව දැක්වීමට කියන ලදී. අනුපායයෙන් ආහාර ගනුයේ ක්‍රීඩා පිණිස මදය පිණිස මණ්ඩනය පිණිස අලංකාරය පිණිස නො ගනී. මේ ප්‍රමාණයැයි සලකා නොවේ. **යා තත්ථ අසන්තුට්ඨිතා** යනු එම අනුවණින් ආහාර පරිභෝගයෙහි යම් සන්තෝස නො වන බවක් නො සතුටු බවක්, **අමත්තඤ්ඤුතා** යනු අමාත්‍රඥභාවය ප්‍රමාණසංඛ්‍යාත මාත්‍රය නො දැනීම, **අයං වුච්චති** යනු මෙය ප්‍රත්‍යවේක්‍ෂා නො කොට පරිභෝග කිරීම් වශයෙන් පැවති භෝජනයෙහි අමාත්‍රඥතාව නමැයි කියනු ලැබේ.

ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරතා නිර්දේශයෙහි **චක්ඛුනා** යනාදිය කියන ලද නයින් ම දතයුතුයි. **න නිමිත්තග්ගාහී හොති** යනු ඡන්දරාග වශයෙන් උක්තප්‍රකාර නිමිත්ත නොගනී. මෙසේ අවශේෂ පද ද කියන ලද්දට ප්‍රතිපක්‍ෂ නයින් දතයුතුයි. යම්සේ යට ජවනයේදී දුශ්ශීලාදිය උපන් කල්හි එහි අසංවරය ඇතිවිට ද්වාරය ද භවංගය ද ආවර්ජනාදිය ද වීථි සිත් ද අගුප්ත වේයැයි කියන ලදී. මෙසේ එහි ශීලාදිය ද වීථිසිත් ද අගුප්ත වේයැයි කියන ලදී. මෙසේ එහි ශීලාදිය උපන්කල්හි ද්වාරය ද භවංගය ද ආවර්ජනාදිය ද වීථිසිත් ද ආරක්ෂා කරන ලද්දේ වෙයි. කුමක් මෙන් ද? යම්සේ නගරද්වාරයන් මනාව වැසූ කල්හි ඇතුළත ගෘහාදිය නො වසන ලද නමුත් නගරය ඇතුළත සියලු බඩු සුරක්‍ෂිත ම වෙයි. සුගෝපිත ම වෙයි. නගරද්වාරයන් වැසූ කල්හි සුරුන්ගේ පිවිසීමක් නැත. මෙපරිද්දෙන් ජවනයෙහි සීලාදිය උපන්කල්හි ද්වාරය ද භවංගය ද ආවර්ජනාදිය ද වීථිසිත් ද ආරක්ෂා කරන ලද්දේ වෙයි. එහෙයින් ජවන ක්‍ෂණයෙහි උපදිනුයේ ද චක්‍ෂුරේන්ද්‍රියයෙහි සංවරය යැයි කියන ලදී. **සොතෙන සද්දං සුත්වා** යන ආදීන්හි ද මේ නය ම ය.

භොජනෙ **මත්තඤ්ඤුතා** නිර්දේශයෙහි **පටිසංඛා යොනිසො ආහාරං ආහාරෙති** යනු විමසා බලන ප්‍රඥාවෙන් දැන උපායෙන් ආහාර වළඳයි.

දැන් ඒ උපාය දක්වන්නට **නෙවදවාය** යනාදිය කියන ලදී. එහි **නෙව දවාය** යනු ක්‍රීඩාව පිණිස ආහාර නො ගනී. එහි නළු පිනුම්කරු ආදීහු ක්‍රීඩා පිණිස ආහාර ගනිත් නම් වේ. යම් භෝජනයක් අනුභව කළ කෙනෙකුන්ට නෘත්‍ය ගීත කාව්‍ය ශ්ලෝක සංඛ්‍යාත ක්‍රීඩාවක් අතිරේකව වැටහේ ද, ඒ භෝජන විෂම වූ අධර්මයෙන් සොයා ඔව්හු අනුභව කරති. මේ භික්ෂු තෙමේ වනාහි එසේ අනුභව නො කරයි. **න මදාය** යනු මාන මද පුරුෂ මදයන් වැඩීම සඳහා අනුභව නොකරයි. එහි රාජරාජ මහාමාත්‍යයෝ මදය පිණිස ආහාර ගනිත් නම්. ඔව්හු වනාහි තමාගේ මාන මද පුරුෂ මද වර්ධනය පිණිස පිඬු රසභෝජනාදී ප්‍රණීත භෝජන අනුභව කරත්. මේ භික්ෂුතෙම වනාහි මෙසේ ආහාර අනුභව නො කරයි. **නමණ්ඩනාය** යනු ශරීරය සැරසීම සඳහා ආහාර අනුභව නො කරයි. එහි රූපය නිසා ජීවත්වන ස්ත්‍රීහු ද අනතඃපුර ස්ත්‍රීහු ද ගිතෙල් පැණි බොන්නාහු නම් වෙත්. ඔව්හු වනාහි සිනිඳු මෘදු මොලොක් භෝජන අනුභව කරත්. මෙසේ ඇඟිලි ඇට මනාව පිහිටියේ වන්නේ ය. ශරීරයෙහි ඡවි වර්ණය ප්‍රසන්න වෙයි කියාය. මේ භික්ෂු තෙම වනාහි මෙසේ අනුභව නො කරයි. **න විභූසනාය** යනු ශරීරයෙහි මාංශ විභූෂණය සඳහා ආහාර අනුභව නො කරයි. එහි මල්ල යුද්ධකරුවෝ මුට්ඨික මල්ලවයෝ කොලුවෝ යනාදීහු සිනිඳු මත්ස්‍ය මාංශාදියෙන් ශරීරය පිනවති. මෙසේ අපගේ මස් ප්‍රහාර සහනය සඳහා පිරෙන්නේ ය කියා ය. මේ භික්ෂු තෙම වනාහි මෙසේ ශරීරයෙහි මාංශ විභූෂණය සඳහා ආහාර අනුභව නො කරයි.

**යාවදෙව** යනු ආහාර ගැනීමේ ප්‍රයෝජනය පිළිබඳ පරිච්ඡේද නියමය දැක්වීමයි. **ඉමස්ස කායස්ස ඨිතියා** යනු මේ චාතුර්මහාභූතික කරජ කායයාගේ ස්ථාපනය පිණිස ආහාර අනුභව කරයි. මේ මොහුගේ ආහාර ගැනීමේ ප්‍රයෝජනයයි යන අර්ථයි. **යාපනාය** යනු ජීවිතේන්ද්‍රිය ය විහිංසා නම් නො බුදීම හේතුකොට ගෙන උපදනා සාගින්නයි. එය වැළැක්වීම පිණිස සංසිඳවීම පිණිස ආහාර අනුභව කරයි. **බ්‍රහ්මචරියානුග්ගහාය** යනු බ්‍රහ්මචර්යාව නම් ත්‍රිවිධ ශික්ෂාව යි. සකල ශාසනය යි. එයට අනුග්‍රහය පිණිස ආහාර අනුභව කරයි. **ඉති** යනු උපාය දැක්වීමයි. මේ උපායෙන් යන අර්ථයි.

**පුරාණඤ්ච වෙදනං පටිහංඛාමි** යනු පුරාණ වේදනා නම් නොබුදීම හේතුවෙන් උපන් වේදනාවයි. එය නසන්නෙමියි ආහාර අනුභව කරයි. **නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි** යනු අලුත් වේදනා නම් වැඩියෙන්

අනුභව කිරීමෙන් උපදනා වේදනාවයි. එය නූපදවමියි ආහාර අනුභව කරයි. නොහොත් අනුභව කිරීම හේතුවෙන් උපදනා වේදනාවයි. එය නූපන් හෙයින් නූපදීම පිණිස ම ආහාර අනුභව කරයි.

**යාත්‍රා ච මෙ භවිස්සති** යනු මාගේ යැපීම ද වන්නේ ය. අනවජ්ජතා ච යනු මෙහි සාවද්‍යයක් ද ඇත. අනවද්‍යයක් ද ඇත. එහි අධාර්මික පර්යේෂණය අධාර්මික ප්‍රතිග්‍රහණය අධර්මයෙන් පරිභෝග කිරීම යන මෙය සාවද්‍ය නමි. ධර්මයෙන් සොයා ධර්මයෙන් පිළිගෙන ප්‍රත්‍යවේක්ෂා කොට පරිභෝග කිරීම අනුවද්‍ය නමි. ඇතැම් කෙනෙක් අනවද්‍ය ම සාවද්‍ය කෙරෙයි. මා විසින් ලබන ලදැයි පමණ ඉක්මවා පරිභෝග කරයි. එය දිරවන්නට නො හැකි ව උද්ධ විරේචන අධෝ විරේචන ආදියෙන් වෙහෙසට පත්වෙයි. මුළු විහාරයෙහි භික්ෂූහු ඔහුට සිරුර පිළිදැගුම් කිරීම බෙහෙත් සෙවීම ආදියෙහි උත්සුක බවට පැමිණෙත්. මේ කුමක්දැයි කී කල්හි 'අසුවලාගේ උදරය ඉදිමිණ' යනාදිය කියත්. 'මෙතෙම නිතර ම මෙබඳු ප්‍රකෘතියක් ඇත්තේ ම ය. තමාගේ කුසේ ප්‍රමාණය නම් නො දන්නේ'යැයි නින්දා කරත්. ගර්හා කරත්. මෙතෙම අනවද්‍ය ම සාවද්‍ය කෙරෙයි නමි. මෙසේ නො කොට නිරවද්‍ය බව ද වන්නේ යැයි ආහාර අනුභව කරයි.

**ඵාසු විහාරොච** යන මෙහි ද ඵාසු විහාරයෙක් ඇත. නඵාසු විහාරයෙක් ඇත. එහි ආහාරහත්ථක අලංසාටක තත්‍රවට්ටක කාකමාසක භුත්තවමිතක යන මෙකී බ්‍රාහ්මණයන් පස්දෙනාගේ භෝජනය නඵාසුවිහාර නමි. මොවුනතුරෙන් ආහාරහත්ථක නම් බොහෝ අනුභව කොට තමාගේ ධර්මතාව නිසා නැගිටිය නො හැකිවූයේ ආහාර හත්ථක යැයි කියයි. අලංසාටක නම් ඉතා ඉදිමුණු කුස ඇතිහෙයින් නැගිටියේ ද සළුව හැඳගන්නට නො හැකි වෙයි. තත්‍රවට්ටක නම් නැගිටිය නො හැකි ව එහි ම පෙරළෙයි. කාකමාසක නම් කපුටන් විසින් මෙන් ආමර්ශනය කරන්නට හැකි වේද මෙසේ මුවදොර දක්වා ආහාර අනුභව කරයි. භුත්තවමිතක නම් මුවින් දරන්නට නො හැකි ව එහි ම වමනය කරයි. මෙසේ නො කොට මාගේ ඵාසුවිහරණය ද වන්නේයැයි ආහාර අනුභව කරයි.

ඵාසුවිහාර නම් ආලෝප සතරකින් පහකින් අඩු උදරයක් ඇති බවයි. මෙපමණක් අනුභවකොට පැන් බොන්නාගේ සතර ඉරියව් සුවෙන් පවතී. එහෙයින් දම්සෙනෙවි සැරියුත් තෙරණුවෝ මෙසේ වදාළහ.

**චත්තාරො පඤ්ච ආලොපෙ අභුත්වා උදකං පිවෙ**
**අලං ඵාසුවිහාරාය පහිතත්තස්ස භික්ඛුනො**

ආලෝප සතරක් පහක් අනුභව නො කර දිය බොන්න එය භාවනාවට මෙහෙයවන ලද සිත් ඇති භික්ෂුවගේ පහසු විහරණයට යෝග්‍යයි යනුයි.

මේ ස්ථානයේදී වනාහි අංග සමෝධානය කළයුතුයි. නෙවදවාය යනු එක් අංගයකි. න මදාය යනු එකකි. න මණ්ඩනාය යනු එකකි. න විභූසනාය යනු එකකි. යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය යනු එකකි. විහිංසූපරතියා බ්‍රහ්මචරියානුග්ගහාය යනු එකකි. ඉති පුරාණඤ්ච වෙදනං පටිහංඛාමි නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි යනු එකකි. යාත්‍රා ච මෙ භවිස්සති යනු එකකි. අනවජ්ජතා ච ඵාසුවිහාරො ච යනු මෙහි භෝජනානිසංසයෝ ය.

මහාසිව ස්ථවිරයන් වහන්සේ මෙසේ වදාළහ. 'යට සතර අංගය ප්‍රතික්ෂේප නම්. මතු අංග අට වනාහි සමෝධානය කළයුතුයි' යනුයි. එහි යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යනු එක් අංගයකි. යාපනාය යනු එකකි. විහිංසූපරතියා යනු එකකි. බ්‍රහ්මචරියානුග්ගහාය යනු එකකි. ඉති පුරාණඤ්ච වෙදනං පටිහංඛාමි යනු එකකි. නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි යනු එකකි. යාත්‍රා ච මෙ භවිස්සති යනු එකකි. අනවජ්ජතා ච යනු එකකි. ඵාසුවිහාරො යනු භෝජනානිසංසයයි යනුයි. මෙසේ අෂ්ටාංග සමන්වාගත ආහාරය අනුභව කරනුයේ භෝජනෙ මත්තඤ්ඤු නම් වෙයි. අයං වුච්චති යනු මේ පර්යේෂණ ප්‍රතිග්‍රහණ පරිභෝජනයන්හි යුක්ත ප්‍රමාණය දැනීම් වශයෙන් පැවැති ප්‍රත්‍යවේක්ෂිත පරිභෝගය භෝජනේ මත්තඤ්ඤුතා නමැයි කියනු ලැබේ.

මුට්ඨස්සච්ච නිර්දේශයෙහි **අසති** යනු සතිවිරහිත සතර ස්කන්ධයෝ ය. **අනනුස්සති අප්පටිස්සති** යැයි උපසර්ග වශයෙන් පදය වර්ධනය කරන ලදී. **අසරණතා** යනු අසරණාකාරයයි. **අසරණතා** යනු දරන්නට අසමත් බවයි. එයින් යුත් පුද්ගලයා නොදැරිය හැකි තත්ත්වයට පත්වූයේ නිධානක්ෂම නො වේ. ජලයෙහි ලබු කබලක් මෙන් අරමුණෙහි පාවෙයි යනු = **පිලපනතා** ය. **සමුස්සනතා** යනු නටුවා වූ මුළා වූ සිහි

ඇති බවය. එයින් යුත් පුද්ගලයා වනාහි බත් සැඟවූ කපුටෙකු මෙන් ද මස් ඉවත දැමූ සිවලෙකු මෙන් ද වෙයි.

භාවනාබල නිර්දේශයෙහි **කුසලානං ධම්මානං** යනු බොධිපාක්ෂික ධර්මයන්ගේ, **ආසෙවනා** යනු ආදියෙන් සේවනය කිරීමයි. **භවනා** යනු වැඩීමයි. **බහුලීකම්මං** යනු නැවත නැවත කිරීම ය.

සීල විපත්ති නිර්දේශය සීලසම්පදා නිර්දේශයට ප්‍රතිපක්ෂ වශයෙන් දතයුතුයි. දිට්ඨි විපත්ති නිර්දේශය දිට්ඨි සම්පදා නිර්දේශයට ප්‍රතිපක්ෂ වශයෙන් ද, දිට්ඨි සම්පදා නිර්දේශය දිට්ඨි උපාදාන නිර්දේශයට ප්‍රතිපක්ෂ වශයෙන් ද සීලවිසුද්ධි නිර්දේශය සීල සම්පදා නිර්දේශයට සමාන වුව ද එහිදී වනාහි විශුද්ධි සම්ප්‍රාපක ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය කියන ලදී. මෙහි විශුද්ධිප්‍රාප්ත ශීලය ස්මෘතිය ද සම්ප්‍රජන්‍යය ද ප්‍රතිසංඛ්‍යාන බලය ද භාවනා බලය ද සමථය ද විදර්ශනාව ද සමථ නිමිත්ත ද ප්‍රග්‍රාහ නිමිත්ත ද ප්‍රග්‍රහාහය ද අවික්ෂේපය ද ශීල සම්පත්තිය දැයි මෙකී දුකසයෙන් චාතුර්භූමක ලෞකික ලෝකෝත්තර ධර්මයෝද කියන ලදී.

දෘෂ්ටි විශුද්ධි නිර්දේශයෙහි **කම්මස්සකතාඤාණං** යනු මේ කර්මය ස්වකීය ය. මෙය ස්වකීය නො වේයැයි දන්නා ප්‍රඥාවයි. එහි තමා විසින් කරන ලද්දේ හෝ වේවා අන්‍යයකු විසින් හෝ වේවා සියලු ම අකුශල කර්මය ස්වකීය නො වේ. කවර හෙයින් ද? අර්ථය නසන හෙයින් හා අනර්ථය උපදවන හෙයිනි. කුශලකර්මය වනාහි අනර්ථය නසන හෙයින් ද අර්ථය උපදවන හෙයින් ද ස්වකීය නම් වෙයි. එහි යම්සේ ධනය සහිත භෝග සහිත පුරුෂයෙක් දීර්ඝ මාර්ගයට පිළිපන්නේ අතරමග ගම්නියම්ගම් ආදියෙහි දී නැකත් ඝෝෂා කළ කල්හි මම ආගන්තුකයෙක්මි. කුමක් නිසා නැකත් කෙළි කෙළින්නෙම්දැයි නො සිතා යම් යම් ආකාරයකින් කැමති වේද ඒ ඒ ආකාරයෙන් නැකත් කෙළි කෙළිමින් සුවසේ කාන්තාරය ඉක්මවයි ද, මෙපරිද්දෙන් මේ කර්මස්ථාන ඥාණයෙහි සිට මේ සත්ත්වයෝ බොහෝ සංසාරගාමී කර්ම රැස්කොට සැපයෙන් සැප අනුභව කරමින් රහත්බවට පැමිණියෝ සංඛ්‍යාපථය ඉක්මවූවාහු ය. **සච්චානුලොමිකඤාණං** යනු චතුරාර්ය සත්‍යයන්ගේ අනුලෝම විදර්ශනා ඥානය යි. **මග්ග සමංගිස්ස ඤාණං ඵලසමංගිස්ස ඤාණං** යනු මාර්ගඥාන ඵලඥානයෝ ම ය. **දිට්ඨි විසුද්ධි ඛොපන** යනු පදයාගේ නිර්දේශයෙහි **යා පඤ්ඤා පජානනා** යනාදී

පදයන්ගෙන් යට කියන ලද කම්මස්සකතඤාණාදිය ම චතුර්විධ ඥාන ලෙස බෙදන ලදී. **යථා දිට්ඨිස්ස ච පධානං** යන පදයාගේ නිර්දේශයෙහි **යො චෙතසිකො විරියාරම්භො** යනාදි පදවලින් දක්වන ලදවීර්යය ප්‍රඥා ගතික ම ය. ප්‍රඥාව ලෞකික ස්ථානයෙහි ලෞකිකය. ලෝකෝත්තර ස්ථානයෙහි ලෝකෝත්තර යැයි දතයුතුයි.

සංවේග දුක නිර්දේශයෙහි **ජාතිභයං** යනු ජාතිය, භය වශයෙන් දැක සිටි ඥානයයි. **ජරාමරණභය** ආදියෙහි ද මේ නය ම ය. **අනුප්පන්නානං පාපකානං** යනාදියෙන් ජාති ආදිය භය වශයෙන් දැක ජාති ජරා ව්‍යාධි මරණයන්ගෙන් මිදෙනු කැමැත්තහුගේ උපාය ප්‍රධානය කියන ලදී. පද භාජනීයයාගේ අර්ථය විභංගට්ඨ කථාවෙහි මතු පළවන්නේ ය.

**අසන්තුට්ඨිතා ච කුසලෙසු ධම්මෙසු** යන පද නිර්දේශයෙහි **භියොග්‍යාකම්‍යතා** යනු විශේෂ කම්‍යතාවයි. මෙහි ඇතැම් කෙනෙක් පළමුවෙන් ම පක්ෂයෙහි දෙන බත හෝ සලාක බත හෝ (උපෝසථික බත හෝ පෑළවියට දෙන බත හෝ) දෙයි. හෙතෙම එයින් අසතුටුව නැවත ධුරබතක් සඞබතක් වස්සාවාසික බතක් දෙයි. ආවාසයක් කරවයි. සිවුපසයම දෙයි. එහි ද අසතුටු වූයේ සරණයයි. පන්සිල් සමාදන් වෙයි. එහි ද අසතුටු වූයේ පැවිදි වෙයි. පැවිදිව එක් නිකායක් නිකාය දෙකක් යැයි ත්‍රිපිටක බුද්ධ වචනය ගනී. අෂ්ට සමාපත්ති වඩයි. විදසුන් වඩා අර්හත්වයට පත්වෙයි. අර්හත්වයට පත්වීමෙන් පටන් මහා සන්තුෂ්ටියෙක් නම් වෙයි. මෙසේ අර්හත්වය දක්වා විසෙසකාමතා භියොග්‍යාකම්‍යතා නම්. **අප්පටිවානිතා ච පධානස්මිං** යන පද නිර්දේශයෙහි යම්හෙයකින් ප්‍රාන්ත සේනාසනයක්හි දී අධි කුසලධර්මයන් භාවනා කිරීමට කළකිරෙනුයේ පධානං පටිවාසෙති නම්. නො කළකිරෙනුයේ නො පටිවාසෙති නම්. එහෙයින් ඒ නය දක්වන්නට **කුසලානං ධම්මානං** යන ආදිය කියන ලදී. එහි **සක්කච්ච කිරියා** යනු කුසල් කිරීමේ දී සකසා කරන බවයි. **සාතච්ච කිරියා** යනු නිතරම කිරීමයි. **අට්ඨිත කිරියා** යනු (කඩ නොකොට) නො නවත්වා කිරීමයි. (**අලීනවුත්තිකා** යනු නො සැඟවුණු ජීවිත ඇති බවයි. නො සැඟවුණු පැවතුම් හෝ ඇති බවයි.) **අනික්ඛිත්ත ඡන්දතා** යනු කුශලච්ඡන්දය බැහැර නො කිරීමයි. **අනික්ඛිත්ත ධුරා** යනු කුසල් කිරීමේදී වීර්ය සංඛ්‍යාත ධුරය බැහැර නො කිරීමයි. **පුබ්බෙ නිවාසානුස්සති ඤාණං විජ්ජා** යන මෙහි පුබ්බෙනිවාසො යනු පෙර විසූ ස්කන්ධ හා ස්කන්ධ ප්‍රතිබද්ධය ද වේ. පූර්වේනිවාසය අනුස්මරණය =

පුබ්බනිවාසානුස්සති ය. එය හා සම්ප්‍රයුක්ත ඥානය = පුබ්බ නිවාසානුස්සති ඤාණයයි. ඒ මේ පෙරවිසූ ස්කන්ධ ප්‍රතිච්ඡාදක අඳුර විදීනුයි විජ්ජා ය. ඒ අඳුර විඳ ඒ ස්කන්ධයන් දැනීම ප්‍රකටබව කරයි යනු අර්ථයෙන් ද විජ්ජා ය.

චූතූපපාතෙ ඤාණං යනු චුතියෙහි ද උපපාතයෙහි ද ඤාණයයි. මෙය ද සත්ත්වයන්ගේ චුතිපටිසන්ධි වසාලන අඳුර විදීනුයි විජ්ජා ය. ඒ අඳුර විඳ සත්ත්වයන්ගේ චුතිපටිසන්ධි දැනීම ප්‍රකට කිරීම කෙරේ යනුවෙන් දැනීම කරන අර්ථයෙන් ද විජ්ජා ය. ආසවානං ඛයෙ ඤාණං යනු සියලු කෙලෙස් ක්‍ෂය කරන ඥානයයි. ඒ ඥානය චතුස්සත්‍යය ප්‍රතිච්ඡාදක අඳුර විදීනුයි = විජ්ජා ය. ඒ අඳුර විඳ චතුස්සත්‍ය විදීම කෙරේ. ප්‍රකට කෙරේ යැයි දැනීම් කිරීම් අර්ථයෙන් ද විජ්ජාය.

චිත්තස්ස ච අධිමුත්ති නිබ්බාණඤ්ච යන මෙහි අරමුණෙහි ඇලෙන අර්ථයෙන් ද විරුද්ධ ධර්මයන්ගෙන් මනාව මිදෙන අර්ථයෙන් ද අෂ්ට සමාපත්ති චිත්තස්ස අධිමුත්ති නම්. මෙහි අනෙකක් තෘෂ්ණා සංඛ්‍යාත වානයක් නැත. ඒ වානයෙන් - තෘෂ්ණාවෙන් නික්මුණේ ය යනු නිබ්බාණං ය. එහි අෂ්ට සමාපත්තීහු තමා විෂ්කම්භනය කළ ක්ලේශයන්ගෙන් මිදුණු හෙයින් විමුක්ති යැයි කියන ලදහ. නිර්වාණය වනාහි සකල ක්ලේශයන්ගෙන් අත්‍යන්තයෙන් විමුක්ත හෙයින් විමුක්තිය ය. මග්ග සමංගිස්ස ඤාණං යනු සතර මාර්ගඥානයෝ ය. ඵලසමංගිස්ස ඤාණං යනු සතර ඵලඥානයෝ ය. එහි ප්‍රථම මාර්ගඥානය පංච ක්ලේශයන් ගෙවමින් නිෂේධ කරමින් සංසිඳුවමින් ප්‍රතිප්‍රසම්භනය කරමින් උපදී යනු ඛයෙ ඤාණං නම් විය. ද්විතීය මාර්ගඥානය චතුර්විධ ක්ලේශයන් ද එසේ ම තෘතීය මාර්ගඥානය ද, චතුර්ථ මාර්ගඥානය වනාහි අෂ්ට ක්ලේශයන් ගෙවමින් (නිරෝධ කරමින් සංසිඳුවමින්) යටපත් කරමින් උපදී යනු ඛයෙ ඤාණං නම් විය. ඒ ඒ මාර්ගඵලඥාන වනාහි ඒ ඒ ක්ලේශයන් ක්‍ෂය වෙද්දී නිරුද්ධ වෙද්දී සංසිඳෙද්දී යටපත් වෙද්දී නූපන් කල්හි නොපවතිද්දී උපන්නේ ය යනු අනුප්පාදෙ ඤාණං නම් වීය යනුයි.

**අට්ඨසාලිනී නම් ධර්මසංග්‍රහ අර්ථ කථාවෙහි**
**නික්ෂේපකාණ්ඩ (බහා තැබීම) වර්ණනාව නිමියේ ය.**

දැන් නික්ෂේප කණ්ඩයන්ට අනතුරු ව තබන ලද අර්ථකථා කාණ්ඩයේ වර්ණනාක්‍රමය පැමිණියේ ය. කවර හෙයින් මෙය වනාහි අට්ඨකථා කාණ්ඩය නම් වීද, ත්‍රිපිටක බුද්ධවචනයේ අර්ථය උදුරා තැබූ හෙයිනි. පිටක තුනෙහි ම වනාහි ධර්මයට අනතුරු ව ආවත් අට්ඨකථා කණ්ඩයෙන් ම පිරිසිඳ විනිශ්චය කරන ලද්දේ මනාව නිශ්චය කරන ලද්දේ නම් වෙයි. සියලු අභිධර්ම පිටකයෙහි නයමාර්ගය මහා ප්‍රකරණයෙහි ප්‍රශ්නෝද්ධාරය හා ගණවාරය නො සලකන්නකු විසින් ද අට්ඨකථා කාණ්ඩයෙන් ම ගෙනහැර දක්වන්නට වටී. මෙය කොතැනකින් ප්‍රභව වීද යත්, ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේගෙන් ප්‍රභව විය. ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ වනාහි නික්ෂේප කාණ්ඩයෙහි අර්ථෝද්ධාරය සලකා ගන්නට නො හැකි වූ තමාගේ සද්ධිවිහාරිකයෙකුට අර්ථකථා කාණ්ඩය කියවා දුන්හ. මහ අටුවාවෙහි වනාහි මෙය ප්‍රතික්ෂේප කොට මෙසේ කියන ලදී. අභිධර්මය නම් ශ්‍රාවක විෂය නො වේ. ශ්‍රාවක ගෝචර නොවේ. මෙය බුද්ධ විෂය ය. බුද්ධගෝචර ය. දම්සෙනෙවි සැරියුත් තෙරණුවෝ වනාහි සද්ධිවිහාරිකයා විසින් විචාරන ලදුව ඔහු රැගෙන බුදුන් වෙත ගොස් සම්මා සම්බුදුන්ට කීහ. සම්මා සම්බුදුරජාණන් වහන්සේ ඒ භික්ෂුවට අර්ථකථා කාණ්ඩය කියවා දුන් සේක. කෙසේ ද? භාග්‍යවතුන් වහන්සේ වනාහි 'කතමෙ ධම්මා කුසලා' යැයි විචාළ සේක. කුශලධර්මයෝ නම් කවරහ යැයි සැලකුහ යනු අර්ථයි. ඉක්බිති තුෂ්ණීභූත වූ ඔහුට මා විසින් '**කතමෙ ධම්මා කුසලා යස්මිං සමයෙ කාමාවචරං කුසලං චිත්තං උප්පන්නං හොති** යනාදී නයින් භූමි නිර්දේශයෙන් යම් කුසලයක් දක්වන ලද නොවේද? ඒ සියල්ල සතර භූමින්හි කුශලය, 'ඉමෙ ධම්මා කුසලා' යැයි මේ නයින් කර්ණික කර්ණිකා වශයෙන් ගුළි ගුළි කොට පොකුරු පොකුරු කොට අර්ථෝද්ධාර වශයෙන් කුශලාදී ධර්මයන් දේශනා කරන සේක් කියවා දුන්හ.

එහි **චතුසු** යනු කාමාවචර රූපාවචර අරූපාවචර ලෝකුත්තරයන්හි **කුසලං** යනු ස්පර්ශාදී භේද ඇති කුශලය, **ඉමෙ ධම්මා කුසලා** යනු ඒ ඒ භූමින්හි කියන ලද මේ සියලු ම ස්පර්ශාදී ධර්මයෝ කුශලයෝ නම්හ. අකුශලයන්ට වනාහි භූමි වශයෙන් භේදයක් නැතිහෙයින් **ද්වාදස අකුසල චිත්තුප්පාදා** යැයි වදාළහ. එහි උපදී යනු = උප්පාදො ය. සිත ම උත්පාදය වූයේ = **චිත්තුප්පාදො** ය. මෙය දේශනා ශීර්ෂයක් ම ය. යම් සේ වනාහි රජ ආවේය යැයි කී කල්හි අමාත්‍යාදීන්ගේ පැමිණීම කියන ලද්දේ ම වෙයි. මෙසේ චිත්තුප්පාදො යැයි කී කල්හි ඔවුන් හා සම්ප්‍රයුක්ත ධර්මයෝ ද

කියන ලද්දෝ ම වෙත් යැයි සියලු තැන්හි ම චිත්තෝත්පාද ග්‍රහණයෙන් සම්ප්‍රයුක්ත ධර්ම සහිත සිත ගන්නා ලදැයි දතයුතුයි.

මින් පසුව **චතුසු භූමීසු විපාකො** යනාදී සියලු ම තික දුක භාජනීය පදයන්ගේ අර්ථයන් වේදනාත්‍රිකාදීන්හි සුඛාදීන්ගේ අර්ථයන් නොකිවයුතු හෙයින් යට කියන ලද නයින් ම පාළියේ අර්ථය විමසා දතයුතුයි. විශේෂ මාත්‍රයක් පමණක් ම කියමි.

එහි පරිත්තාරම්මණත්තිකයෙහි වනාහි **සබ්බො කාමාවචරස්ස විපාකො** යනු මෙහි දෙපස් විඥානයෝ චක්ෂුප්‍රසාදාදීන් නිසා නියමයෙන් ම ඉෂ්ටා නිෂ්ටාදි භේද ඇති රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ ධර්මයන් අරබයා පවතිත් යනු = **පරිත්තාරම්මණ ය.** කුශලාකුශල විපාක මනෝධාතු දෙක හදවත ඇසුරු කොට චක්ෂුර් විඥානාදීන්ට අනතුරු ව නියමයෙන් රූපාදීන් ම අරබයා පවතී යනු = **පරිත්තාරම්මණා ය.** කුසලවිපාක අහේතුක මනෝවිඥාන ධාතුව හා සෝමනස්ස සහගතයෝ ද පංච ද්වාරයෙහි සන්තීරණ වශයෙන් ෂට් ද්වාරයන්හි තදාරම්මණ වශයෙන් යන නියමයෙන් රූපාදි සය පරිත්තාරම්මණයන් ම අරබයා පවතිත් යැයි = **පරිත්තාරම්මණා ය.**

උපේක්ෂා සහගත කුශලාකුශල විපාක අහේතුක මනෝවිඥාන ධාතු දෙක පංච ද්වාරයෙහි සන්තීරණ වශයෙන් ෂට්ද්වාරයන්හි තදාරම්මණ වශයෙන් නියම හෙයින් රූපාදී පරිත්තාරම්මණ සය අරබයා පවතී. ප්‍රතිසන්ධි වශයෙන් පවත්නේ ද පරිත්ත කර්මය හෝ කර්ම නිමිත්ත හෝ ගති නිමිත්ත අරමුණ කරයි. ප්‍රවෘත්තියෙහි භවංග වශයෙන් ද පර්යාවසානයෙහි චුති වශයෙන් පවත්නේ ද එය ම අරමුණු කරයි යනු = **පරිත්තාරම්මණං** ය. සහේතුක විපාක චිත්තෝත්පාද අට වනාහි මෙහි කියන ලද නයින් ම තදාරම්මණ වශයෙන් ප්‍රතිසන්ධි භවාංග චුති වශයෙන් ද පරිත්ත ධර්මයන් ම අරබයා පවතී. කිරිය මනෝධාතුව පංචද්වාරයෙහි රූපාදිය අරබයා පවතී. සොම්නස් සහගත අහේතුක කිරිය මනෝවිඥාන ධාතුව ෂට්ද්වාරයත් පවතිද්දී මනෝද්වාරයෙහි අතීතානාගතයන්හි ද පරිත්ත රූපාදී ධර්මයන් ම අරබයා ක්ෂීණාශ්‍රවයන්ට සතුටු ආකාරයක් කරමින් පවතී යනු **පරිත්තාරම්මණ** ය. මෙපරිද්දෙන් පස්විසි චිත්තෝත්පාදයෝ ඒකාන්තයෙන් ම පරිත්තාරම්මණයෝ යැයි දතයුත්තාහ.

විඤ්ඤාණඤ්චායතන නේවසඤ්ඤානාසඤ්ඤායතන ධර්මයෝ (තමාගේ) තමාගේ යට ම සමවත අරබයා පවත්නා හෙයින් මහග්ගතාරම්මණා ය. මාර්ගඵල ධර්මයෝ නිර්වාණාරම්මණ හෙයින් අප්පමාණාරම්මණා ය. කුශල වශයෙන් සතරක් ද කිරිය වශයෙන් සතරක්දැයි ඥානවිප්‍රයුක්ත අසත්කෘත්‍යදාන ප්‍රත්‍යක්ෂණ ධර්මශ්‍රවණාදීන්හි කාමාවචර ධර්මයන් අරබයා පැවති කාලයෙහි පරිත්තාරම්මණා ය. ඒ කාරණයෙන් ම සප්තවීසති මහද්ගත ධම්මයන් අරබයා පැවති කාලයෙහි මහග්ගතාරම්මණා ය, අතිප්‍රගුණ ප්‍රථමධ්‍යානාදීන් ප්‍රත්‍යවේක්ෂා කරන කාලයේදී මහග්ගතරම්මණා ය. කසිණ නිමිත්තාදී ප්‍රඥප්ති ප්‍රත්‍යවේක්ෂණ කාලයෙහි නවත්තාබ්බාරම්මණා ය. දිට්ඨිගත සම්ප්‍රයුක්ත සතර අකුශල චිත්තෝත්පාදයෝ පස්පනස් කාමාවචර ධර්මයන්ට සත්ත්වයාය සත්ත්වයා යැයි පරාමර්ශන ආස්වාදන අභිනන්‍දන කාලයෙහි පරිත්තාරම්මණා ය. එම ආකාරයෙන් සප්තවිංශති මහද්ගත ධර්මයන් අරබයා පවත්නා කාලයෙහි මහග්ගතාරම්මණා ය. ප්‍රඥප්ති ධර්මයන් අරබයා පවත්නා කාලයෙහි නවත්තබ්බාරම්මණා වන්නේ ය. දෘෂ්ටි විප්‍රයුක්තයන්ට එම ධර්මයන් ම අරබයා හුදෙක් ආස්වාදන අභිනන්දන වශයෙන් ද ප්‍රතිඝ සම්ප්‍රයුක්තයන්ගේ ප්‍රවෘත්තියෙහි දෝමනස්ස වශයෙන් ද විචිකිච්ඡා සම්ප්‍රයුක්ත චිත්තෝත්පාදයට අනිට්ඨං ගත වශයෙන් ද උද්ධච්ච සහගතයාට වික්ෂේපන වශයෙන් ද වන්නේ ය. අවූපසම වශයෙන් පැවැත්මේදී ද පරිත්ත මහග්ගත නවත්තබ්බාරම්මණතාව දතයුතුයි.

මොවුනතුරෙහි වනාහි එක් ධර්මයක්වත් අප්පමාණාරම්මණයන් අරබයා පවතින්නට නො හැකි වෙයි. එහෙයින් අප්පමාණාරම්මණ නො වෙයි. කුශල වශයෙන් සතරක් ද කිරිය වශයෙන් සතරක්දැයි ඥාන සම්ප්‍රයුක්ත චිත්තෝත්පාද අටක් ශෛක්ෂ පෘථුග්ජන ක්ෂීණාශ්‍රවයන්ට සත්කෘත්‍යදාන ප්‍රත්‍යවේක්ෂණ ධර්මශ්‍රවණාදීන්හි උක්තප්‍රකාර ධර්මයන් අරබයා පවත්නා කාලයෙහි පරිත්ත මහග්ගත නවත්තබ්බාරම්මණයෝ වෙත්. ගෝත්‍රභූ කාලයෙහි වනාහි ලෝකෝත්තර ධර්මය ද ප්‍රත්‍යවේක්ෂණ කාලයෙහි ඔවුන්ගේ අප්පමාණාරම්මණතාව ද දතයුතුයි.

යම් මේ රූපාවචර චතුර්ථධ්‍යානයක් වේද එය සර්වත්‍රපාදක චතුර්ථීය ආකාශකෘෂ්ණ චතුර්ථිය ආලෝක කෘෂ්ණ චතුර්ථිය බ්‍රහ්මවිහාර චතුර්ථීය ආනාපාන චතුර්ථිය ඍද්ධිවිධ චතුර්ථීය දිව්‍යශ්‍රෝත චතුර්ථීය චේතෝපර්යඥාන චතුර්ථිය යථාකර්මූපගත ඥාන චතුර්ථිය දිව්‍යචක්ෂුරහි

ඥාන චතුර්ථිය පූර්වේනිවාසඥාන චතුර්ථිය අනාගතඥාන චතුර්ථිය යැයි කුශල වශයෙන් ද ක්‍රියා වශයෙන් ද ද්වාදශවිධ වේ. එහි සර්වත්‍රපාදක චතුර්ථධ්‍යානය නම් අටවැදෑරුම් කසිණයන්හි චතුර්ථධ්‍යානයයි. එය වනාහි විදර්ශනාවට ද පාදක වේ. එය අභිඥාවන්ට ද නිරෝධයට ද වෘත්තයට ද පාදක වේ ම යැයි සර්වත්‍රපාදක යැයි කියනලදී. ආකාශ කසිණ ආලෝක කසිණ චතුර්ථයෝ වනාහි විදර්ශනාවට ද අභිඥාවන්ට ද වෘත්තයට ද පාදක වෙත්. නිරෝධ පාදකයෝ නම් (නො) වෙත්. බ්‍රහ්මවිහාර ආනාපාන චතුර්ථය විදර්ශනාවට මෙන් ම වෘත්තයට ද පාදක වෙත්. අභිඥානයන්ට මෙන් ම නිරෝධයටත් පාදක නො වෙත්. එහි දශවිධ වූ ම කසිණ ධ්‍යාන කසිණ ප්‍රඥප්තිය අරබයා පවත්නා හෙයින් ද, බ්‍රහ්මවිහාර චතුර්ථිය සත්වප්‍රඥප්තිය අරබයා පවත්නා හෙයින් ද, ආනාපාන චතුර්ථිය නිමිත්ත අරබයා පවත්නා හෙයින් ද, පරිත්තනාදී වශයෙන් නොකිය යුතු ධර්ම අරමුණු කොට ඇති හෙයින් නවත්තබ්බාරම්මණ නම් වෙයි.

ඍද්ධි චතුර්ථිය පරිත්ත මහග්ගතාරම්මණ වෙයි. කෙසේ ද? එය වනාහි යම් අවස්ථාවෙක කය චිත්ත සන්නිශ්‍රිත කොට අදෘශ්‍යමාන කයින් යනු කැමැත්තේ වේද චිත්ත වශයෙන් කය වෙනස් කරයි. මහද්ගත සිතෙහි ඇතුළත් කරයි ද ආරෝපණය කරයි ද, එකල්හි උපයෝගයෙන් ලද්ද අරමුණ වේයැයි කොට රූපකායාරම්මණයෙන් පරිත්තාරම්මණ වෙයි. යම්කලෙක සිත කාය සන්නිශ්‍රිත කොට දෘශ්‍යමාන කයින් යනු කැමැත්තේ වේ ද, කාය වශයෙන් සිත වෙනස් කරයි. පාදකධ්‍යාන සිත රූපකායෙහි ඇතුළත් කරයි. ආරෝපණය කරයි. එකල්හි උපයෝගයෙන් ලද්ද අරමුණු වේයැයි කොට මහග්ගත චිත්තාරම්මණයෙන් මහග්ගතාරම්මණය වෙයි. දිව්‍යශ්‍රෝත්‍ර චතුර්ථය ශබ්දය අරබයා පවත්නා හෙයින් ඒකාන්ත පරිත්තාරම්මණ ම ය. චේතෝපර්යාය ඥාන චතුත්ථය පරිත්ත මහග්ගත අප්පමාණ අරමුණු වෙයි. කෙසේ ද? එය වනාහි අන්‍යයන්ගේ කාමාවචර සිත් දැනගන්නා කාලයෙහි පරිත්තාරම්මණ වේ. එසේ ම රූපාවචර අරූපාවචරසිත් දැනගන්නා කාලයෙහි මහග්ගතාරම්මණ වෙයි. මාර්ගඵල දැනගන්නා කාලයෙහි අප්පමාණාරම්මණ වෙයි. මෙහි ද පෘථග්ජන තෙමේ සෝතාපන්නයාගේ සිත නො දනී. සෝතාපන්නයා ද සකෘදාගාමියාගේ දැයි මෙසේ රහතන් වහන්සේ තෙක් පැමිණවිය යුතුයි. රහතන් වහන්සේ වනාහි සියල්ලන්ගේ ම

සිත් දැනගනිති. අන්‍ය වූ ද උපරිමයා හෙට්ඨිමයාගේ යැයි මේ විශේෂය දතයුතු යි.

යථා කම්මූපගඥාන චතුර්ථිය කාමාවචර කර්ම ජානන කාලයෙහි පරිත්තාරම්මණය වේ. රූපාවචර අරූපාවචර කර්ම ජානන කාලයෙහි මහග්ගතාරම්මණ වේ. දිව්‍යචක්ඛු ඥාණ චතුර්ථිය රූපාරම්මණ හෙයින් ඒකාන්ත පරිත්තාරම්මණය ම ය. පූර්වේනිවාසානුස්මෘති ඥාන චතුර්ථිය පරිත්ත මහග්ගත අප්‍රමාණ නවත්තව්‍යාරම්මණ වෙයි. කෙසේ ද? එය වනාහි කාමාවචර ස්කන්ධ අනුස්මරණ කාලයෙහි පරිත්තාරම්මණ වෙයි. රූපාවචර අරූපාවචර ස්කන්ධ අනුස්මරණ කාලයෙහි පරිත්තාරම්මණ වෙයි. රූපාවචර අරූපාවචර ස්කන්ධ අනුස්මරණ කාලයෙහි මහග්ගතාරම්මණය, අතීතයෙහි තමාවිසින් හෝ අන්‍යයන් විසින් හෝ වඩනා ලද මාර්ගය ද සාක්ෂාත් කරන ලද ඵලය ද අනුස්මරණය කරන කාලයෙහි අප්‍රමාණාරම්මණය, අතීතයෙහි බුදුවරූ මාර්ගය වැඩූහ. ඵලය සාක්ෂාත් කළහ. පරිනිර්වාණ ධාතුවෙන් පිරිනිවියහයි සිඳින ලද (සංසාර) මාර්ගය ඇති අය සිහිකිරීම් වශයෙන් මාර්ග ඵලනිර්වාණ ධර්මයන් ප්‍රත්‍යවේක්ෂා කරන්නාට ද අප්‍රමාණාරම්මණය. අතීතයෙහි විපස්සී නම් භාග්‍යවතුන් වහන්සේ වූහ. උන්වහන්සේට බන්ධුමතී නම් නුවරක් විය. පියා බන්ධුමතී රජය. මෑණියෝ බන්ධුමතී නම් වූහ යනාදී නයින් නාමගෝත්‍ර පාථුවි නිමිති ආදිය අනුස්මරණ කාලයෙහි නවත්තබ්බාරම්මණ වෙයි.

අනාගතංසඥාන චතුර්ථයෙහි ද මේ නය ම ය. එය වනාහි මේ තෙමේ අනාගතයේ දී කාමාවචරයේ උපදින්නේ යැයි දැනගන්නා කාලයේ දී පරිත්තාරම්මණ වෙයි. රූපාවචරයෙහි හෝ අරූපාවචරයෙහි උපදීයැයි දැනගන්නා කාලයේ දී මහග්ගතාරම්මණය, මාර්ගය වඩන්නේ ඵලය සාක්ෂාත් කරන්නේ ය. නිර්වාණධාතුවෙහි පිරිනිවන්පාන්නේ යැයි දැනගන්නා කාලයේදී අප්‍රමාණාරම්මණය. අනාගතයෙහි මෛත්‍රිය නම් භාග්‍යවතුන් වහන්සේ උපදනා සේක. උන්වහන්සේගේ පියා සුබ්‍රහ්ම නම් බමුණෙක් වන්නේ මව බ්‍රහ්මවතී නම් බැමිණියක් වන්නේ යැයි ආදී නයින් නාමගෝත්‍ර දැනගන්නා කාලයේ දී නවත්තබ්බාරම්මණ වෙයි. අරූපාවචර චතුර්ථය හා ආශ්‍රවක්ෂ චතුර්ථය ද පාළියෙහි පැමිණි පැමිණි තැන්වල ම කියනු ලැබේ. උපේක්ෂා සහගත ක්‍රියාහේතු මනෝවිඥාන ධාතුව මෙකී සියලුම කුශලාකුශල ක්‍රියා චිත්තයන්ට පුරේචාරික ය. එහි ආරම්මණ භේදය ඒ තැන්වල කියන ලද නයින් ම දතයුතුයි. පංචද්වාරයෙහි

වොට්ඨපන වශයෙන් පැවැත්වීමේදී වනාහි ඒකාන්ත පරිත්තාරම්මණ ම වෙයි. රූපාවචක ත්‍රික චතුෂ්ක ධ්‍යානාදිය පරිත්තාරම්මණ බැවින් නවක්තවා ධර්මය අරබයා පවත්නා හෙයින් නවත්තාරම්මණය. එහි වනාහි රූපාවචරයෝ පෘථුවි කසිණාදීන්හි පවතිත්. ආකාසානාඤ්චායතනය හා උද්ඝාටිත ආකාශයෙහි ආකිඤ්චඤ්ඤායතනය විඥානාපගමයෙහි ය.

මාර්ගාරම්මණාත්‍රිකයෙහි ආදියෙහි කියනලද ඥාන සම්ප්‍රයුක්ත චිත්තෝත්පාද අට ශෛක්ෂයින්ට තමා විසින් ප්‍රතිවේධ කරන ලද මාර්ගයන් ප්‍රත්‍යවේක්ෂා කරන කාලයෙහි මාර්ගාරම්මණය, මාර්ගය සමග සහජාත නොවන හෙයින් මාර්ගහේතුක නොවේ. තමා විසින් ප්‍රතිවේධ කරන ලද මාර්ගය ගරුකොට ප්‍රත්‍යවේක්ෂා කරන කාලයෙහි ආරම්මණාධිපති වශයෙන් ද අන්‍යධර්ම අරමුණු කරන කාලයෙහි නවතතබබයෝ මාර්ගාරම්මණයැයි මාර්ගාධිපති යැයි වෙත්. සතර ආර්යමාර්ගයෝ මාර්ගසංඛ්‍යාත මාර්ග සම්ප්‍රයුක්තය හෝ හේතුව ඇති බැවින් ඒකාන්තයෙන් මාර්ග හේතුකයෝ ය. වීර්යය වනාහි වීමංසාව ජ්‍යෙෂ්ඨ කොටගෙන මාර්ගභාවනා කාලයෙහි සහජාතාධිපති මාර්ගාධිපති වන්නේ ය. නො ඡන්ද චිත්තයන්ගෙන් අන්‍යතරයෙකු ජ්‍යෙෂ්ඨ කාලයෙහි මාර්ගාධිපතීහු යැයි නො කියයුතුයි. ද්වාදශවිධ රූපාවචර චතුර්ථ ධ්‍යානයෙහි සර්වත්‍රපාදක චතුර්ථධ්‍යානාදී නව ධ්‍යාන මාර්ගාරම්මණ ද නො වේ. මාර්ගහේතුක ද නො වේ. මාර්ගාධිපති ද නො වේ.

චේතෝපර්යා ඥානය පූර්වේනිවාසානුස්මෘති ඥානය අනාගතංශ ඥාන චතුර්ථය යන මොව්හු වනාහි ආර්යයන්ගේ මාර්ග චිත්ත විජානන කාලයෙහි මාර්ගාරම්මණයෝ වෙත්. මාර්ගය සමග සහජාත නො වූ හෙයින් වනාහි මාර්ගහේතුක නො වෙත්. මාර්ගය ගරුකොට නො පවත්නා හෙයින් මාර්ගාධිපති ද නො වෙත් යනුයි. මොව්හු වනාහි කවර හෙයින් මාර්ග ගරු නො කරත් ද? තමා මහත්ගත හෙයිනි. යම්සේ වනාහි මුළු ලෝකයා රජු ගරු කරයි. මව්පියෝ වනාහි ගරු නො කරත්. ඔව්හු රජු දැක අසුනෙන් නො නැගිටිත්. ඇඳිලි බැඳීම් ආදිය නො කරත්. ළදරු කාලයෙහි ව්‍යවහාර කළ නයින් ම ව්‍යවහාර කරති. මෙසේ මොවුහු ද තමාගේ මහත්ගත භාවයෙන් ගරු නො කරත්. ක්‍රියාහේතුක මනෝ විඥාන ධාතුව ද ආර්යයන් මාර්ගප්‍රත්‍යවේක්ෂණ කරන කාලයෙහි ප්‍රත්‍යවේක්ෂණා පුරේචාරික හෙයින් මාර්ගාරම්මණ වෙයි. මාර්ගය හා සහජාත නො වන හෙයින් වනාහි මාර්ග හේතුක නො වෙයි. මාර්ගය

ගරුකොට නො පවත්නා හෙයින් මාර්ගාධිපති නො වේ. කවර හෙයින් ගරු නො කරයි ද, තමා අහේතුක බැවිනි. හීන බැවිනි. ජඩ බැවිනි. යම් සේ වනාහි රජුට මුළු ලෝකයා ගරු කරයි ද, තමාගේ පිරිවර ජනයා වූ කුදු වාමනක චේටකාදීහු තමාගේ අඥාන භාවයෙන් පණ්ඩිත මිනිසුන් මෙන් ඉතා ගරු නො කරත්. මෙපරිද්දෙන් මේ සිත ද තමා අහේතුක බැවින් ද හීන බැවින් ද ජඩ බැවින් ද මාර්ගයට ගරු නො කරයි. ඥාන විප්‍රයුක්ත කුශලාදිය ඥානාභාවයෙන් මෙන් ම ලෞකික ධර්මාරම්මණතාවෙන් ද මාර්ගාරම්මණාදිභාවය නොලබයි. න වත්තබ්බාරම්මණ ම වේයැයි දතයුතුයි යනුයි.

අතීතාරම්මණත්‍රිකයෙහි විඤ්ඤාණඤ්චායතන නේවසඤ්ඤා නාසඤ්ඤායතන ධර්මයෝ යට අතීත සමාපත්තිය අරබයා පවත්නා හෙයින් ඒකාන්තයෙන් ම අතීතාරම්මණයෝ ම ය. නියෝග අනාගත අරමුණු නැත යනු නියමවෙත් වෙන්වුණු අනාගතාරම්මණ සිතක් නම් නැත. අනාගතංශඥානයත් ඒකාන්තයෙන් ම අනාගතය අරමුණු කරගත් චේතෝපරියාය ඤාණයත් අනාගතය අරබයා පවත්නේ වේද, නො පවත්නේ නො වේ. මෙය වනාහි වෙන ම එක් සිතක් නම් නැත. රූපාවචර චතුර්ථ ධ්‍යානය සමග සංගෘහීත බැවින් අන්‍ය මහත්ගත සිත් සමග මිශ්‍ර වෙයි. එහෙයින් මෙසේ කියන ලදී. 'නියෝගා අනාගතාරම්මණා නත්ථි' යනුයි. දෙපස් විඤ්ඤාණ ද මනෝධාතු තුන ද වර්තමාන රූපාදියෙහි පවත්නා හෙයින් පච්චුපන්නාරම්මණ නම්.

දස චිත්තුප්පාදා යන මෙහි සහේතුක අට වනාහි දෙව් මිනිසුන්ගේ පිළිසිඳ ගන්නා කාලයෙහි කර්මය හෝ කර්ම නිමිත්ත අරබයා පැවැත්මේදී අතීතාරම්මණාය, භවංග චුති කාලයන්හි ද මේ නය මය. ගති නිමිත්ත අරබයා පිළිසිඳ ගන්නා කාලයෙහි ද ඉන් පසුව භවංග කාලයෙහි ද පච්චුපන්නාරම්මණය, පංච ද්වාරයෙහි තදාරම්මණ වශයෙන් පැවැත්මේදී ද එසේ ම ය. මනෝද්වාරයෙහි වනාහි අතීත, අනාගත පච්චුප්පන්නාරම්මණ ජවනයන්ට අරමුණ ගෙන පැවැත්මෙන් අතීතානාගත පච්චුප්පන්නාරම්මණ ය, කුසලවිපාක අහේතුක උපේක්‍ෂා සහගත මනෝවිඥාන ධාතුවෙහි ද මේ නයම ය. එය වනාහි හුදෙක් මනුෂ්‍යයන් අතුරෙහි ජාත්‍යන්ධාදීන්ට ප්‍රතිසන්ධිය වෙයි. පංචද්වාරයෙහි ද සන්තීරණ වශයෙන් ද ප්‍රත්‍යුත්පන්නාරම්මණ වේ යන මෙය මෙහි විශේෂයයි.

සෝමනස්ස සහගතයෝ වනාහි පංචද්වාරයෙහි සන්තීරණ වශයෙන් ද තදාරම්මණ වශයෙන් ද පච්චුප්පන්නාරම්මණ වෙත්. මනෝද්වාරයෙහි තදාරම්මණ වශයෙන් සහේතුක විපාකයන් මෙන් අතීතානාගත පච්චුප්පන්නාරම්මණ යැයි දතයුතු යි. අකුශලවිපාක හේතුක මනෝවිඥාන ධාතුව වනාහි කුශලවිපාක උපේක්ෂා සහගත අහේතුකයට සමාන ගතික ම ය. හුදෙක් එය වනාහි ආපායිකයන්ට ප්‍රතිසන්ධි භවංග ච්‍යුති වශයෙන් පවතී යනු මෙහි විශේෂය යි. සෝමනස්ස සහගත ක්‍රියා හේතුක මනෝවිඥාන ධාතුව ක්ෂීණාශ්‍රවයින්ට පංචද්වාරයෙහි ප්‍රහර්ෂා කාරයක් කරමින් ප්‍රත්‍යුත්පන්නාරම්මණ වෙයි. මනෝද්වාරයෙහි අතීතාදී භේද ඇති ධර්මයන් අරබයා හසිතෝත්පාද වශයෙන් පැවැත්මේදී අතීතානාගත ප්‍රත්‍යුත්පන්නාරම්මණ වෙයි.

කාමාවචර කුසලං යන ආදීන්හි කුශල වශයෙන් වනාහි ඥාන සම්ප්‍රයුක්ත සතර චිත්තෝත්පාදයෝ අතීතාදි භේද ඇති ස්කන්ධ ධාතු ආයතන සම්මර්ශනය කරන ප්‍රත්‍යවේක්ෂා කරන ශෛක්ෂ පෘථග්ජනයින්ට අතීතානාගත ප්‍රත්‍යුත්පන්න ආරම්මණයෝ වෙත්. ප්‍රඥප්ති නිර්වාණ ප්‍රත්‍යවේක්ෂණයෙහි න වත්තබ්බාරම්මණයෝ වෙත්. ඥාන විප්‍රයුක්තයන්හිද මේ නය ම ය. හුදෙක් ඔවුන්ට වනාහි මාර්ගඵල නිර්වාණ ප්‍රත්‍යවේක්ෂණ නැත. මෙහි විශේෂය මෙය ම ය.

අකුශලයෙන් චතුර්විධ දෘෂ්ටි සම්ප්‍රයුක්ත චිත්තෝත්පාදයෝ අතීතාදී භේද ඇති ස්කන්ධධාතු ආයතනයන්ට ආස්වාදන අභිනන්දන පරාමර්ශන කාලයෙහි අතීතාදී ආරම්මණයෝ වෙත්. ප්‍රඥප්තිය අරබයා ආස්වාදනය කරන සතුටුවන (සත්ත්වයාය) සත්ත්වයා යැයි පරාමර්ශනය කොට ගන්නාට නවත්තබ්බාරම්මණයෝ වෙත්. දෘෂ්ටි විප්‍රයුක්තයන්හි ද මේ නය ම ය. හුදෙක් (ඔවුන් විසින්) වනාහි පරාමර්ශන ග්‍රහණයක් නැත. ප්‍රතිඝ සම්ප්‍රයුක්ත චිත්තෝත්පාද ද්වය අතීතාදී භේද ඇති ධර්මයන් අරබයා දෝමනස්සිතයන්ට අතීතාදී ආරම්මණ වෙයි. ප්‍රඥප්තිය අරබයා දෝමනස්සිතයන්ට නවත්තබ්බාරම්මණය, විචිකිච්ඡා උද්ධච්ච සම්ප්‍රයුක්තයෝ එම ධර්මයන්හි ම අනිට්ඨංගත භාවයෙන් මෙන් ම උද්ධත භාවයෙන් ද පැවැත්මේ දී අතීතානාගත ප්‍රත්‍යුත්පන්න නවත්තබ්බාරම්මණයහ. ක්‍රියා වශයෙන් අෂ්ට සහේතුක චිත්තෝත්පාදයෝ කුශල චිත්තෝත්පාදකගතිකයෝ ම ය. උපේක්ෂා සහගත ක්‍රියාහේතුක මනෝවිඥාන ධාතුව පංචද්වාරයෙහි ව්‍යවස්ථාපන වශයෙන් පැවැත්මේදී

ප්‍රත්‍යුත්පන්නාරම්මණ ම ය. මනෝද්වාරයෙහි අතීතානාගත ප්‍රත්‍යුත්පන්නයන්ට මෙන් ම ප්‍රඥප්ති ආරම්මණයන්ට ද ජවනයන්ට පූර්වචාරික කාලයෙහි අතීතානාගතප්‍රත්‍යුත්පන්න නවත්තබ්බාරම්මණය එසේ කියන ලද ප්‍රභේද ඇති රූපාවචර ධ්‍යානයෙහි සර්වත්‍රපාදක චතුර්ථ ධ්‍යානය ආකාශ කසිණ චතුර්ථිය ද ආලෝක කසිණ චතුර්ථය ද බ්‍රහ්මවිහාර චතුර්ථය ද ආනාපාන චතුර්ථය ද යන මේ පස නවත්තබ්බාරම්මණ ම ය. ඍද්ධිවිධ චතුර්ථය කාය වශයෙන් සිත වෙනස් කරන්නට අතීතපාදක සිත අරබයා පවත්නා හෙයින් අතීතාරම්මණ ය.

මහා ධාතු නිධානයේ දී මහා කාශ්‍යපස්ථ විරාදීන්ට මෙන් අනාගතය අධිෂ්ඨාන කරන්නවුන්ට අනාගතාරම්මණය වෙයි. මහා කාශ්‍යප ස්ථවිරයන් වහන්සේ වනාහි මහා ධාතු නිධානය කරන සේක් අනාගතයේ අවුරුදු දෙසිය දහඅටක් මේසුවඳ නො වියලේවා. මල් නො මැලවේවා. පහන් නො නිවේවායි අධිෂ්ඨාන කළ සේක. සියල්ල එසේ ම විය. අස්සගුත්ත ස්ථවිරයන් වහන්සේ වත්තනිය සේනාසනයෙහි භික්ෂු සංඝයා වහන්සේලා වියලි බත් වළඳනු දැක ගල්පොකුණ දිනපතා පෙරවරුවෙහි දීර්ඝ වේවායි අධිෂ්ඨාන කළ සේක. පෙරවරුවෙහි (ගන්නා ලද ජලය) දීර්ඝ විය. පස්වරුවෙහි ප්‍රකෘතියෙන් ම විය. කාය චිත්තසන්නිශ්‍රිත අදෘශ්‍යමාන කයින් කොට වඩිනා කල (අන්‍යයෙකුට ප්‍රාතිහාර්යයක් හෝ කරන කල) කය අරබයා පවත්නා හෙයින් පච්චුප්පන්නාරම්මණ වෙයි.

දිව්‍යශ්‍රෝත චතුර්ථිය විද්‍යමාන ශබ්දය ම අරබයා පවත්නා හෙයින් ප්‍රත්‍යුත්පන්නාරම්මණය, චේතෝපරියාඥාන චතුර්ථිය අතීතයෙහි සත්දිනක් ඇතුළත ද අනාගතයෙහි සත්දිනක් ඇතුළත ද අන්‍යයන් ගේ සිත දන්නහුට අතීතාරම්මණය ද අනාගතාරම්මණය ද වෙයි. සත් දවස ඉක්මීමේදී වනාහි එය දැනගන්ට නො හැකි වෙයි. අතීත අනාගතශඥානයන්ගේ වනාහි මෙය වෙනසයි. මොහුට වනාහි වර්තමානය දන්නා කාලයෙහි පච්චුප්පන්නාරම්මණය නො වේ.

මේ ප්‍රත්‍යුත්පන්නය ද ඛණ පච්චුප්පන්නය සන්තති පච්චුප්පන්නය අද්ධාන පච්චුප්පන්නය යැයි ත්‍රිවිධ ය. එහි උත්පාද ස්ථිති භංගප්‍රාප්ත වූයේ ඛණපච්චුප්පන්න ය. ඒකද්විසන්තතිවාර පර්යාපන්න වූයේ සන්තති පච්චුප්පන්න ය. එහි අඳුරෙහි හිඳ ආලෝක ස්ථානයකට ගියහුට එකෙණෙහි අරමුණ ප්‍රකට නො වේ. යම් අවස්ථාවක එය ප්‍රකට වේද, මේ අතර

ඒකද්වි සන්තති වාර දතයුතුයි. ආලෝකය ඇති තැනක හැසිර කාමරයකට පිවිසියකුට ද එකෙණෙහි වහා රූප ප්‍රකට නො වෙයි. යම් අවස්ථාවක එය ප්‍රකට වේ ද, මේ අතර ඒකද්විසන්තති වාර දතයුතුයි. දුර සිට වනාහි රදවුන්ගේ හස්තවිකාරය ගෙඩිබෙර ආදිය ගසන විකාර දැක ද එකෙණෙහි ශබ්දය නො අසයි. යම් අවස්ථාවක එය අසයි ද මේ අතර ද ඒකද්විසන්තති වාරයෝ දතයුතුයි. මේ වනාහි මධ්‍යම භාණකයෝ ය.

සංයුක්ත භාණකයෝ වනාහි රූප සන්තතිය, අරූප සන්තතිය යැයි සන්තති දෙකක් කියා ජලය ඇක්ම ගියහුගේ තීරයෙහි ජලරේඛා යම්තාක් නො පෑදේද, මාර්ගයෙන් ආවහුගේ කයෙහි උණුසුම් බව යම්තාක් නොසන්සිඳේ ද, අව්වේ අවුත් ගැබට පිවිසියහුගේ අඳුරු බව යම්තාක් පහ නො වේ ද, ඇතුළු ගැබෙහි කමටහන් මෙනෙහි කොට දවල් කවුළුව විවරකොට බලන්නහුගේ ඇස්වල සැලෙන බව යම්තාක් නොසන්සිඳේද මෙය රූප සන්තතිනම්. ජවනවාර දෙක තුනක් අරූප සන්තති නමැයි ද කියා ඒ දෙක ම සන්තති පච්චුප්පන්න නමැයි කියති.

එක් භවයකට සීමා වූයේ වනාහි අද්ධාන පච්චුප්පන්න නම්. යමක් සඳහා භද්දේක සූත්‍රයෙහි 'ඇවැත්නි, යම් මනසක් වේද, යම් සම්ප්‍රයුක්ත ධර්මයෝ වෙත් ද මේ දෙක ම පච්චුප්පන්නය, විඥානය ඒ පච්චුප්පන්නයෙහි ඡන්දරාග ප්‍රතිබද්ධ වෙයි. විඥානය ඡන්දරාග ප්‍රතිබද්ධ හෙයින් එහි සතුටුවෙයි. එහි සතුටුවන්නේ ප්‍රත්‍යුත්පන්න ධර්මයන්හි එකතුවෙයි' යැයි කියන ලදී. මෙහි සන්තති පච්චුප්පන්නය අට්ඨකථාවන්හි ආයේය. අද්ධානපච්චුප්පන්නය සූත්‍රයෙහි ය. එහිදී ඇතැම් කෙනෙක් ක්‍ෂණ ප්‍රත්‍යුත්පන්න සිත චේතෝ පර්යාඥානයට අරමුණු වේයැයි කියත්. කවර කරුණක් නිසා ද? යම්හෙයකින් ඍද්ධිමතාටත් අන්‍යයාටත් එකම ක්‍ෂණයෙක සිත උපදී යන මෙය ද ඔවුන්ගේ උපමාවකි.

යම්සේ මල්මිටක් අහසට දැමූ කල්හි අවශ්‍යයෙන් එක් මලක් එකක නටුවෙහි සම්බන්ධ වෙයි. නටුවෙන් නටුව සම්බන්ධ වෙයි. මෙසේ අන්‍යයෙකුගේ සිත දැනගනිමියි රාශි වශයෙන් මහජනයාගේ සිත් ආවර්ජනා කළ කල්හි අවශ්‍යයෙන් එකෙකුගේ සිත මේ සිත සමග උත්පාද ක්‍ෂණයෙහි හෝ (ස්ථිතික්‍ෂණයෙහි හෝ) භංගක්‍ෂණයෙහි හෝ සම්බන්ධ වෙයි. එය වනාහි වර්ෂ සියයක් ද වර්ෂ දහසක් ද ආවර්ජනා කරනුයේ යම් සිතකින් ආවර්ජනය කෙරේ ද යමෙකු විසින් දැනගනී ද

ඒ දෙදෙනාගේ එක්ව සිටීමක් නැති බැවින් ද ආවර්ජන ජවනයන් ද නො නිමි තැනදී නානාරම්මණයන්ට පැමිණීමේ දෝෂයෙන් අයුතු හෙයින් අර්ථකථාවන්හි ප්‍රතික්ෂේප කරන ලදී. සන්තති පච්චුප්පන්නය වනාහි අද්ධාන පච්චුප්පන්නය ද අරමුණු වේයැයි දතයුතු යි. එහි වර්තමාන ජවන වීථියෙන් අතීතානාගත වශයෙන් දෙතුන් ජවන වීථි ප්‍රමාණයක කාලයක් යම් අන්‍යයෙකුගේ සිතක් වේද ඒ සියල්ල ද සන්තති පච්චුප්පන්න නම්. අද්ධාන පච්චුප්පන්නය වනාහි ජවන ද්වාරයෙන් දැක්විය යුතුයැයි යමක් අට්ඨකථාවෙහි කියන ලද ද, එය මනා සේ කියන ලදී.

මේ එහි දැක්වීමයි. ඍද්ධිමත් තැනැත්තේ අන්‍යයාගේ සිත දැනගනු කැමතිව ආවර්ජනා කරයි. ආවර්ජනය ක්ෂණ ප්‍රත්‍යුත්පන්න ආරම්මණ කොට එය සමගම නිරුද්ධ වෙයි. ඉන්පසු ජවන සතරක් හෝ පහක් වෙති. ඔවුන්ට පශ්චිම ව ඍද්ධි සිත ය. සෙසු සිත් කාමාවචර ය. ඒ සියල්ලන්ට ම එකී නිරුද්ධ සිත අරමුණු වෙයි. ඒ සිත් නානාරම්මණ නො වේ. අද්ධාන පච්චුප්පන්න වශයෙන් පච්චුප්පන්නාරම්මණ බැවින් ඒකාරම්මණ ය. ඒකාරම්මණත්වයෙහි ද ඍද්ධි සිත ම අන්‍යයාගේ සිත දැනගනී. අන් සිත් දැනගන්නේ නො වේ. යම්සේ චක්ඛු ද්වාරයේ දී චක්ඛු විඤ්ඤාණය ම රූපය දකී ද අන්‍ය විඤ්ඤාණයෝ නො දකිත් යනුයි. මෙසේ මෙය සන්තති පච්චුප්පන්නයාගේ ද අද්ධාන පච්චුප්පන්නයාගේ ද වශයෙන් පච්චුප්පන්නාරම්මණ වෙයි. යම්හෙයකින් හෝ සන්තති පච්චුප්පන්නය ද අද්ධාන පච්චුප්පන්නයේ ම වැටේ ද, එහෙයින් මෙය අද්ධාන පච්චුප්පන්න වශයෙන් පච්චුප්පන්නාරම්මණ යැයි දතයුතුයි.

පූර්වේනිවාසඥාන චතුර්ථිය නම් ගෝත්‍රානුස්මරණයෙහි ද නිර්වාණ නිමිත්ත ප්‍රත්‍යවේක්ෂණයෙහි ද නවත්තබ්බාරම්මණය, සෙසු කාලයෙහි අතීතාරම්මණය ම ය. යථා කම්මූපගඥාණ චතුර්ථය ද අතීතාරම්මණ මය. එහි ඇතැම්විට පූර්වේනිවාස චේතෝපර්යාය ඥානයෝ ද අතීතාරම්මණයෝ වෙත්. තව ද ඔවුන්ගෙන් පූර්වේනිවාස ඥානයාගේ අතීත ස්කන්ධයෝ ද ස්කන්ධ ප්‍රතිබද්ධය ද කිසිසේත් අනාරම්මණ නම් නැත. එය වනාහි අතීතස්කන්ධ බන්ධූපනිබද්ධ ධර්මයන්හි සර්වඥතාඥාන සමගතික වෙයි. චේතෝපර්යාය ඥානයට ද සත්දිනක් ඇතුළත අතීත සිත ම අරමුණ වූවත්, එය වනාහි අන්‍ය ස්කන්ධයක් හෝ ස්කන්ධ ප්‍රතිබද්ධයක් හෝ නො දනී. මාර්ග සම්ප්‍රයුක්ත චිත්තාරම්මණ හෙයින්

වනාහි පර්යාය වශයෙන් මාර්ගාරම්මණයැයි කියන ලදී. යථා කර්මූපග ඥානයට අතීත චේතනා මාත්‍රය ම අරමුණයැයි මේ විශේෂය දතයුතුයි.

මේ මෙහි අට්ඨකථා නයයි. යම්හෙයකින් වනාහි 'අකුශල ස්කන්ධයෝ ඍද්ධිවිධ ඥානයට ද චේතෝපර්යාය ඥානයට ද පූර්වේ නිවාසානුස්මෘති ඥානයට ද යථා කර්මූපග ඥානයට ද අනාගතංශ ඥානයට ද ආරම්මණප්‍රත්‍ය වශයෙන් ප්‍රත්‍යයැ'යි ප්‍රස්ථානයෙහි කියන ලද ද, එහෙයින් සතර ස්කන්ධයෝ චේතෝපර්යායඥාන යථා කර්මූපග ඥානයන්ට අරමුණු වෙත් ද, එහි ද යථා කර්මූපග ඥානයට කුශලා කුශලයෝ ම ය යනුයි. දිව්‍ය චක්ෂුර්ඥාන චතුර්ථිය විද්‍යමාන වර්ණාරම්මණ හෙයින් ප්‍රත්‍යුත්පන්නාරම්මණ ම ය. අනාගතංශ ඥාන චතුර්ථය අනාගතාරම්මණ ම ය. එය වනාහි අනාගත ස්කන්ධ ස්කන්ධූප නිබද්ධ ධර්මයන්හි පූර්වේනිවාසඥානය මෙන් සර්වඥතා ඥානයට සමගතිකය වෙයි. එය වනාහි සත්දිනක් ඇතුළත උපදනා සිතම අරමුණු කරයි. මෙය අනාගතයෙහි කල්ප ලක්‍ෂයකදී උපදනා සිත ද ස්කන්ධය ද ස්කන්ධූප නිබද්ධය ද අරමුණු කරයි.

රූපාවචර ත්‍රික චතුෂ්ක ධ්‍යානාදිය අතීත අනාගත වර්තමාන එකම ධර්මයක්වත් අරබයා නොපවත්නා හෙයින් ඒකාන්තයෙන් නවත්තබ්බාරම්මණයෝ යැයි දතයුත්තාහ.

ආධ්‍යාත්මත්‍රිකයෙහි අනින්ද්‍රියබද්ධ රූපය ද නිර්වාණය ද බාහිරයැයි ද මෙය යම්සේ ඉන්ද්‍රිය බද්ධ ද පරපුද්ගල සන්තානයෙහි බාහිරයැයි කියනු ලබන්නේ ද එය ආත්ම සන්තාන පර්යාපන්න හෙයින් නියතාධ්‍යාත්ම ද වෙයි. මෙසේ කිසියම් පර්යායකින් ආධ්‍යාත්ම නො(වේයැයි) නියතාධ්‍යාත්ම පර්යායයාගේ අභාවයෙන් බාහිරයැයි කියන ලදී. න නියතාධ්‍යාත්ම මාත්‍රයාගේ අසම්භවයෙන් නියතාධ්‍යාත්ම මාත්‍රයාග් අභාවමාත්‍රය සඳහා ආධ්‍යාත්මාරම්මණත්‍රිකයෙහි බහිද්ධාරම්මණතාව කියන ලදී. ආධ්‍යාත්ම ධර්මාපගම මාත්‍රයෙන් ම ආකිඤ්චඤ්ඤායතනා රම්මණයාගේ ආධ්‍යාත්මභාවය ද බහිද්ධාභාවය ද ආධ්‍යාත්ම බහිද්ධා භාවය ද අනුනො දැන ආකිඤ්චඤ්ඤායතනය නොකිය යුතුයි. අජ්ඣත්තාරම්මණං යන ආදිය කියන ලදී. එහි හුදෙක් එය පමණක් නවත්තබ්බාරමමණ නො වේ. එහි ආවර්ජනය ද උපචාර සිත් ද එම අරමුණේ ප්‍රත්‍යවේක්ෂණ සිත් ද එහි ම ආස්වාදනාදී වශයෙන් පවත්නා

අකුශල සිත් ද නවත්තබ්බාරම්මණයෝ ම ය. එම සිත් ද එහි ම කී කල්හි කියන ලද්දෝ ම වෙත් යැයි වෙන ම නො කියන ලදහ.

කෙසේ නම් කියන ලද්දෝ ම වෙත් ද යත්, මේ ආකිඤ්චඤ්ඤායතනය ද එය පුරේචාරිකව ආවර්ජන උපචාරාදී වශයෙන් පවත්නා යමක් වේ ද එය හා ඒකාරම්මණ වන්නේ ය. ඒ සියල්ල අතීතාරම්මණත්‍රිකයෙහි කාමාවචර කුශලය අකුශලයත්‍රිකයෙන් නව චිත්තෝත්පාදයෝය රූපාවචර චතුර්ථ ධ්‍යානය යැයි මෙසේ කියන ලද මේ චිත්තෝත්පාද නවත්තබ්බ වන්නේය. අතීතාරම්මණාපි යනාදී නයින් ආකිඤ්චඤ්ඤායතනයටද නවත්තබ්බාරම්මණ භාවය අනුඤ්ඤාත හෙයින් ය. ආකිඤ්චඤ්ඤායතනය අපර්යාපන්න මාර්ග සතරය. සාමඤ්ඤඵල සතරය යන මේ ධර්මයෝ නවත්තබ්බය අතීතාරම්මපි යැයි මෙසේ ඒකාන්තයෙන් නවවත්තබ්බාරම්මණත්ත යැයි කීමෙන් නවත්තබ්බාරම්මණ යැයි කියන ලදී.

දැන් ආධ්‍යාත්මාරම්මණාත්‍රිකයෙහි කියනු ලබන ඒ යම්හෙයකින් යට එය සමග ඒකාරම්මණභාවය ද නිසා කාමාවචර කුශලාදීන්ගේ නවත්තබ්බාරම්මණතාව කියන ලදී. එහෙයින් මෙහි ද ඔවුන්ගේ නවත්තබ්බාරම්මණභාවය දක්වයි. එය සමග ඒකාරම්මණයන්ගේ නවත්තබ්බාරම්මණභාවයෙහි කවර අන්තරායෙක් ද යනුයි. මෙසේ එහිදී කී කල්හි කියන ලද්දෝ ම වෙත්යැයි දතයුතුයි. ශේෂය මෙහි ආධ්‍යාත්මාරම්මණාත්‍රිකයෙහි පාළියෙන් පැහැදිලි කරන ලද්දේ ම ය. ආරම්මණ විභාගයෙහි වනාහි විඤ්ඤාණඤ්චායතනය නේවසඤ්ඤානාසඤ්ඤායතනය යන මොවුන්ට වනාහි කුසල විපාකකිරිය වශයෙන් චිත්තෝත්පාද සයකට තමාගේ සන්තාන සම්බන්ධ හෙට්ඨිම සමාපත්තිය අරබයා පැවැත්මෙන් ආධ්‍යාත්මාරම්මණභාවය දතයුතුයි.

මෙහි ද කිරිය හා ආකාසානඤ්චායතනය කිරිය විඤ්ඤාණඤ්චායතනයට ම අරමුණු වේ. අනෙකකට අරමුණු නොවේ. කවර හෙයින් ද? ආකාසානඤ්චායතන කිරිය සමංගි කුසලයට හෝ විපාකයට හෝ විඤ්ඤාණඤ්චායතනයාගේ අභාවයෙනි. කුසලය වනාහි කුසලවිපාක කිරිය තුනටම අරමුණු වෙයි. කවර හෙයින් ද? ආකාසානඤ්චායතන කුසලය උපදවා සිටි ඉන් උඩ ත්‍රිවිධ විඤ්ඤාණඤ්චායතනයාගේ උත්පත්ති සම්භවයෙනි. විපාකය වනාහි කවරෙකුටවත් අරමුණු නොවේ. කවර

හෙයින් ද? විපාකයෙන් නැගී සිතට අභිනීහාර සම්භවයෙනි. නේවසඤ්ඤානාසඤ්ඤායතනයට ආරම්මණකරණයේදී ද මේ නය ම ය. රූපාවචරත්‍රික චතුෂ්ක ධ්‍යානාදී සියල්ලගේ ම නියතජ්ඣත්තභාවයෙන් බාහිර බැවින් බහිද්ධාභූත පඨවි කසිණාදිය අරබයා පැවැත්මෙන් බහිද්ධාරම්මණතාව දතයුතු යි.

සියලු ම කාමාවචර කුශලාකුශල ව්‍යාකෘත ධර්මයෝ ය. රූපාවචර චතුර්ථධ්‍යානය යන මෙහි කුශල වශයෙන් වනාහි ඥාන සම්ප්‍රයුක්ත චිත්තෝත්පාද සතර තමාගේ ස්කන්ධාදීන් ප්‍රත්‍යවේක්ෂා කරන්නහුට ආධ්‍යාත්මාරම්මණ ය, අන්‍යයන්ගේ ස්කන්ධාදීන් ප්‍රත්‍යවේක්ෂා කිරීමේදී ද ප්‍රඥප්ති නිර්වාණ ප්‍රත්‍යවේක්ෂා කිරීමේදී ද බහිද්ධාරම්මණයහ. තදුභය වශයෙන් ආධ්‍යාත්ම බාහිර ආරම්මණයහ. ඤාණ විප්‍රයුක්තයන්හි ද මේ නය ම ය. හුදෙක් (ඔවුන්ට) නිර්වාණප්‍රත්‍යවේක්ෂණයක් නැත. අකුශලයෙන් දෘෂ්ටි සම්ප්‍රයුක්ත චිත්තෝත්පාද සතර තම ස්කන්ධාදීන් ආස්වාදන අභිනන්දන පරාමර්ශන ග්‍රහණ කාලයෙහි ආධ්‍යාත්මාරම්මණ ය. අන්‍යයන්ගේ ස්කන්ධාදියෙහි මෙන් ම අනින්ද්‍රිය බද්ධ රූපකෘත්ෂ්ණාදියෙහිද එසේ ම පවත්නා කාලයෙහි බහිද්ධාරම්මණ ය. තදුභය වශයෙන් (පැවැත්මේ දී) ආධ්‍යාත්ම බාහිර ආරම්මණ ය. දෘෂ්ටි විප්‍රයුක්තයන්හි ද මේ නය ම ය. හුදෙක් ඔවුන්ගේ වනාහි පරාමර්ශග්‍රහණයක් නැත. ප්‍රතිඝ සම්ප්‍රයුක්ත දෙක ද තම ස්කන්ධාදියෙහි ද දෝමනස්ස ආධ්‍යාත්මාරම්මණය, අන්‍යයාගේ ස්කන්ධාදියෙහි මෙන් ම අනින්ද්‍රියබද්ධ රූප ප්‍රඥප්තීන්හි ද බහිද්ධාරම්මණ ය. විචිකිච්ඡා උද්ධච්ච සම්ප්‍රයුක්තගේ ද උක්තප්‍රකාර ධර්මයන්හි විචිකිච්ඡන එඬභාව වශයෙන් පැවැත්මේදී ආධ්‍යාත්මාදී ආරම්මණතාව දතයුතු යි.

දෙපස් විඥාන තුන් මනෝධාතු යන මේ තෙළෙස් චිත්තෝත්පාද තමාගේ රූපාදිය අරබයා පැවැත්මේ දී ආධ්‍යාත්මාරම්මණ ය, අන්‍යයාගේ රූපාදියෙහි පැවතියේ බහිද්ධාරම්මණය, තදුභය වශයෙන් අධ්‍යාත්ම බාහිර ආරම්මණය, සෝමනස්ස සහගත අහේතුක විපාක මනෝවිඥාන ධාතු පංචද්වාරයෙහි සන්තීරණ තදාරම්මණ වශයෙන් තමාගේ පංචරූපාදී ධර්මයන් ද මනෝද්වාරයෙහි තදාරම්මණ වශයෙන් අන්‍ය වූ ආධ්‍යාත්මික කාමාවචර ධර්මයන් ද අරබයා පැවැත්මේදී ආධ්‍යාත්මාරම්මණ ය. අන්‍යයන්ගේ ධර්මයන්හි පවත්නාහු බහිද්ධාරම්මණයහ. උපාය වශයෙන් ආධ්‍යාත්ම බාහිර ආරම්මණයහ. උපේක්ෂා සහගත විපාක අහේතුක

මනෝවිඥාන ධාතු දෙකෙහි ද මේ නය ම ය. හුදෙක් මේවා වනාහි සුගතියෙහි ද දුගතියෙහි ද ප්‍රතිසන්ධි භවංග චුති වශයෙන් ද අධ්‍යාත්මාදී භේද ඇති කර්මාදියෙහි පවතී. අෂ්ට මහාවිපාක සිත් ද ඒ දෙකට ම සමානගතික ය. හුදෙක් මේවා වනාහි සන්තීරණ වශයෙන් (නො) පවතී. ප්‍රතිසන්ධි භවංග චුති වශයෙන් ම මේවා සුගතියෙහි ම පවතී.

සොම්නස් සසහගත අහේතුක කිරිය සිත් පංචද්වාරයෙහි තමාගේ රූපාදිය අරබයා පහටු ආකාර කිරීම් වශයෙන් පැවැත්මේ දී ආධ්‍යාත්මාරම්මණ ය, අන්‍යයාගේ රූපාදියෙහි පවතිනවිට බහිද්ධාරම්මණ ය. මනෝද්වාරයේ දී තථාගතයන් වහන්සේට ජෝතිපාල මානව, මඛාදේව රාජ, කණ්හතාපස, ආදී කාලයන්හි තමා කළ ක්‍රියා ප්‍රත්‍යවේක්‍ෂා කරන්නහුට හසිතෝත්පාද වශයෙන් පැවතියේ ආධ්‍යාත්මාරම්මණ ය. මල්ලිකා දේවියට සන්තති මහ ඇමතිට සුමන මල්කරුට යැයි මේ ආදීන්ට ක්‍රියා කිරීම අරබයා පැවති කාලයෙහි බහිද්ධාරම්මණ ය. උභය වශයෙන් ආධ්‍යාත්ම බාහිර ආරම්මණ ය.

උපේක්‍ෂා සහගත කිරිය අහේතුක මනෝවිඥාන ධාතුව පංච ද්වාරයෙහි වොට්ඨපන වශයෙන් ද මනෝද්වාරයෙහි ආවර්ජන වශයෙන් ද පැවැත්මේ දී ආධ්‍යාත්මාදී ආරම්මණය අට්ඨමහා මහාකිරියා කුසලචිත්ත ගතික ම ය. හුදෙක් ඒවා ක්‍ෂීණාශ්‍රවයන්ට උපදී. කුසල් ශෛක්‍ෂ පෘථග්ජනයන්ට උපදී. මෙහි වෙනස මෙපමණ ය. උක්තප්‍රකාර රූපාවචර චතුර්ථධ්‍යානයෙහි සර්වත්‍රපාදක චතුර්ථාදී පංචධ්‍යාන මේ ත්‍රිකයෙහි අවකාශ ලබයි. මේවා වනාහි කසිණ ප්‍රඥප්ති නිමිත්තාරම්මණ හෙයින් බහිද්ධාරම්මණ ය.

ඍද්ධිවිධ චතුර්ථිය කාය වශයෙන් සිත ද චිත්ත වශයෙන් කය ද වෙනස් කරන කාලයේදී ද තමාගේ කුමාරකවර්ණාදිය මවන කාලයේදී ද ස්වකීය කාය චිත්තයන් අරමුණු කරන හෙයින් අජ්ඣත්තාරම්මණ ය. බාහිර ඇත් අස් ආදීන් දක්වන කාලයේ දී බහිද්ධාරම්මණ ය. කාලයකදී ආධ්‍යත්මය කාලයකදී බාහිරය. පැවැත්මේදී ආධ්‍යාත්ම බාහිරාරම්මණය.

දිව්‍යශ්‍රෝත චතුර්ථිය තමාගේ කුසෙහි ශබ්ද අසන කාලයෙහි ආධ්‍යාත්මාරම්මණය. අන්‍යයන්ගේ ශබ්දය අසන කාලයෙහි බහිද්ධාරම්මණය. උභය වශයෙන් ආධ්‍යාත්ම බාහිර ආරම්මණය.

චේතෝපර්යාය ඥාන චතුර්ථය අන්‍යයන්ගේ සිත් අරමුණු හෙයින් බහිද්ධාරම්මණ ම ය. තමාගේ සිත දැනීමේ දී වනාහි එයින් ප්‍රයෝජනයක් නැත.

පූර්වේනිවාස චතුර්ථය තමාගේ ස්කන්ධ අනුස්මරණ කාලයෙහි ආධ්‍යාත්මාරම්මණ ය. අන්‍යයාග් ස්කන්ධ අනින්‍ද්‍රියබද්ධ රූපය ත්‍රිවිධ ප්‍රඥප්ති අනුස්මරණය කරන්නාට බහිද්ධාරම්මණ ය. උභය වශයෙන් ආධ්‍යාත්ම බහිද්ධාරම්මණ ය.

දිව්‍යචක්ෂු චතුර්ථය තමාගේ කුක්ෂිගත රූපාදිය දක්නා කාලයේ දී ආධ්‍යාත්මාරම්මණ ය. අවශේෂ රූප දක්නා කාලයේ දී බහිද්ධාරම්මණ ය. උභය වශයෙන් ආධ්‍යාත්ම බහිද්ධාරම්මණ ය.

අනාගතංශ ඥාන චතුර්ථය තමාගේ අනාගත ස්කන්ධ අනුස්මරණ කාලයේදී ආධ්‍යාත්මාරම්මණ ය, අන්‍යයාගේ අනාගත ස්කන්ධ හෝ අනින්‍ද්‍රිය බද්ධ රූපයන් අනුස්මරණය කරන කාලයේ දී බහිද්ධා රම්මණය, උභය වශයෙන් ආධ්‍යාත්ම බහිද්ධාරම්මණය, ආකිඤ්චඤ්ඤායතන ය නවත්තබ්බාරම්මණ බැවින් කාරණය යට කියන ලද ම ය.

හේතුගොච්ඡක නිර්දේශයෙහි **තයො කුසලහෙතූ** යනාදී නයින් හේතුව දක්වා නැවත ඒ හේතූන් ම උත්පත්ති ස්ථාන වශයෙන් දක්වන්නට **චතුසුභූමීසු කුසලෙසු උප්පජ්ජන්ති** යනාදිය කියන ලදී. මෙම උපායෙන් සෙසු කාණ්ඩයන්හි ද දේශනා නය දතයුතුයි. **යත්ථ** **දෙව තයො ආසවා එකතො උප්පජ්ජන්ති** යන මෙහි තෙයාකාරයකින් ආශ්‍රවයන්ගේ එකට ඉපදීම දතයුතුයි. එහි සතර දෘෂ්ටි විප්‍රයුක්තයන්හි අවිද්‍යාශ්‍රවයන් සමගද දෘෂ්ටි සම්ප්‍රයුක්තයන්හි දෘෂ්ට්‍යාශ්‍රව අවිද්‍යාශ්‍රවයන් සමගදැයි කාමාශ්‍රවය දෙයාකාරයකින් එකට උපදී. භවාශ්‍රවය දෘෂ්ටි විප්‍රයුක්ත සතරෙහි අවිද්‍යාශ්‍රවය සමග එක් ආකාරයකින් එකට උපදී. මෙසේ මෙහි යම්තැනෙක සංයෝජන දෙක තුන එකට උපදී යැයි මෙහි ද සංයෝජනයන්ගේ උත්පත්තිය දශවිධව එකට වෙයි.

මෙහි ද කාමරාගය සතර ආකාරයකින් එකට උපදී. ප්‍රතිඝය තෙයාකාරයකින් උපදී. මානය ඒකවිධය. විචිකිච්ඡාව මෙන් ම භවරාගය ද එසේ ය. කෙසේ ද? කාමරාගය වනාහි මානය සංයෝජන අවිජ්ජා

සංයෝජනයන් සමග මෙන් ම දිට්ඨි සංයෝජන අවිජ්ජා සංයෝජනයන් සමග ද සීලබ්බත පරාමාස අවිජ්ජා සංයෝජනයන් සමග ද අවිජ්ජා සංයෝජනය පමණක් සමග දැයි මෙසේ සතර අයුරකින් එකට උපදී. ප්‍රතිඝය වනාහි ඉස්සා සංයෝජන අවිජ්ජා සංයෝජනයන් සමග මෙන් ම මච්ඡරිය සංයෝජන අවිජ්ජා සංයෝජනයන් සමග එක අයුරකින් එකට උපදී. විචිකිච්ඡාව ද එසේ ය. එය වනාහි අවිජ්ජා සංයෝජනය සමග එකට උපදී. භවරාගයෙහි ද මේ නයම යැයි මෙසේ මෙහි සංයෝජන දෙකතුනක් එකට (එක්ව) උපදී.

නීවරණ ගොච්ඡකයෙහි යම්තැනෙක නීවරණ දෙකතුනක් එකට උපදීයැයි යමක් කියන ලදද, එහි ද අට අයුරකින් නීවරණයන්ගේ එකට ඉපදීම දතයුතුයි. මොවුනතුරෙහි ද කාමච්ඡන්‍දය දෙවිදියකින් එකට උපදී. ව්‍යාපාදය සතර අයුරකිනි. උද්ධච්චය එක් අයුරකිනි. විචිකිච්ඡාව ද එසේය. කෙසේ ද? කාමච්ඡන්‍දය වනාහි අසංස්කාරික සිත්හි උද්ධච්ච නීවරණ අවිජ්ජා නීවරණයන් සමග ද සසංඛාරික සිත්හි ථීනමිද්ධ උද්ධච්ච අවිජ්ජා නීවරණයන් සමග දෙයාකාරයකින් එකට උපදී.

ද්වෙ තීණි යැයි යමක් කියන ලද ද, එය හෙට්ඨිම පරිච්ඡේද වශයෙන් කියන ලදී. එහෙයින් සතර දෙනෙකුට ද එකට උපදී යැයි යන වචනය යෙදේ. මෙසේ වනාහි ව්‍යාපාදය ද අසංස්කාරික සිතෙහි උද්ධච්ච නීවරණ අවිජ්ජා නීවරණයන් සමග ද සසංස්කාරිකයෙහි ථීනමිද්ධ උද්ධච්ච අවිජ්ජා නීවරණයන් සමග ද අසංස්කාරිකයෙහි ම උද්ධච්ච කුක්කුච්ච අවිජ්ජා නීවරණයන් සමග ද සසංස්කාරිකයෙහිම ථීනමිද්ධ උද්ධච්ච කුක්කුච්ච අවිජ්ජා නීවරණයන් සමගදැයි සතර අයුරකි. එකට උපදී. උද්ධච්චය වනාහි අවිජ්ජා නීවරණය සමග පමණක් එක් අයුරකින් එකට උපදී. විචිකිච්ඡා උද්ධච්ච අවිජ්ජා නීවරණයන් සමග එක් අයුරකින් ම එකට උපදී.

කිලේස සමූහයෙහි **යත්‍ථ ද්වෙ තයො කිලෙසා එකතො උප්පජ්ජන්ති** යැයි මේ යමක් කියන ලද ද, එහි කෙලෙස් දෙකක් අන් කෙලෙස් සමග ද කෙලෙස් තුනක් හෝ අන් කෙලෙස් සමග ද උපදීයැයි මෙසේ අර්ථය දතයුතුයි. කවර හෙයින් ද? දෙකක තුනක ම එකට උත්තියක අභාවයෙනි. එහි දස අයුරකින් කෙලෙසුන්ගේ එකට ඉපදීම වෙයි. මෙහි වනාහි ලෝභය සය අයුරකින් එකට උපදී. ප්‍රතිඝය දොයාකාරයකිනි.

මෝහය ද එසේයැයි දතයුතුයි. කෙසේ ද? අසංඛාරික දිට්ඨි විප්පයුත්ත ලෝභය වනාහි මෝහ උද්ධච්චඅහිරික අනොත්තප්පයන් සමග ය. සසංස්කාරික ව ම ද මෝහ මාන ථීන උද්ධච්ච අහිරික අනොත්තප්පයන් සමග උපදී. දිට්ඨි විප්පයුත්ත වූ අසංඛාරිකය වනාහි මෝහ උද්ධච්ච දිට්ඨි අහිරික අනොත්තප්පයන් සමග උපදී. සසංඛාරිකය මෝහ දිට්ඨි උද්ධච්ච අහිරික අනොත්තප්පයන් සමගදැයි සයාකාරයකින් එකට උපදී. පටිඝය වනාහි අසංඛාරික වූයේ මෝහ උද්ධච්ච අහිරික අනොත්තප්පයන් සමග ය. සසංඛාරිකය මෝහ ථීන උද්ධච්ච අහිරික අනොත්තප්පයන් සමගදැයි දෙඅයුරකින් එකට උපදී. විචිකිච්ඡා සම්ප්‍රයුක්ත මෝහය වනාහි විචිකිච්ඡා උද්ධච්ච අහිරික අනොත්තප්පයන් සමග උපදී. උද්ධච්ච සම්ප්‍රයුක්ත වූ උද්ධච්ච අහිරික අනොත්තප්පයන් සමගයැයි මෙසේ දෙයාකාරයකින් එකට උපදී. ශේෂය සියලු තැන්හි ප්‍රකට අර්ථ ඇත්තේ ම ය යනුයි.

අත්‍ථසාලිනී නම් ධර්මසංගණී අර්ථකථාවෙහි
අර්ථකථා කාණ්ඩ වර්ණනාව නිමියේ ය.

එත්තාවතා ච

චිත්ත රූපඤ්ච නික්ඛෙපං අත්‍ථුද්ධාරං මනොරමං
යං ලොකනාථො භාජෙන්තො දෙසෙසි ධම්ම සංගණිං

අභිධම්මස්ස සංගය්හ ධම්මෙ අනවසෙසතො
ඨිතාය තස්සා ආරද්ධා යා මයා අත්‍ථ වණ්ණනා

අනාකුලාන මත්‍ථානං සම්භවා අත්‍ථසාලිනී
ඉති නාමෙන සා එසා සන්නිට්ඨාන මුපාගතා

එකුන චත්තාළීසාය පාළියා භාණවාරතො
චිරට්ඨිතත්‍ථං ධම්මස්ස නිට්ඨපෙන්තෙන තං මයා

යං පත්තං කුසලං තස්ස ආනුභාවෙන පාණිනො
සබ්බෙ දසධම්ම රාජස්ස ඤත්වා ධම්මං සුඛාවහං

පාපුණන්තු විසුද්ධාය සුඛාය පටිපත්තියා
අසොකමනුපායාසං නිබ්බාණං සුඛමුත්තමං

චිරං තිට්ඨතු සද්ධම්මො ධම්මෙ හොන්තු සගාරවා
සබ්බෙපි සත්තා කාලෙන සම්මා දෙවො පවස්සතු

යථා රක්ඛිංසු පොරාණා සුරාජානො තථෙවිමං
රාජා රක්ඛතු ධම්මෙන අත්තනො ව පජං පජං

මෙපමණකින්

ලෝකනාථ වූ බුදුරජාණන් වහන්සේ විසින් චිත්තය රූපය නික්ෂේපය මනෝරම වූ අර්ථෝද්ධාරය යැයි බෙදමින් යම් ධර්ම සංගනියක් දේශනා කරන ලද ද,

අභිධර්මය පිළිබඳ ධර්මයන් නිරවශේෂයෙන් සංග්‍රහකොට සිටි ඒ ධර්ම සංගනිය පිළිබඳ යම් අර්ථ වර්ණනාවක් මා විසින් පටන්ගන්නා ලද ද,

නිරවුල් අර්ථ සම්භවයෙන් යුතු ව ඒ මේ අර්ථ වර්ණනාව අත්‍ථසාලිනී නමින් නිමාවට පැමිණියේ ය.

පාළියෙන් එකුන් සාළිසක් බණවරින් යුතුව ධර්මයේ චිරස්ථිතිය පිණිස එය නිමවනු ලබන මා විසින්,

යම් කුසලයක් සිදුකරන ලද ද, එහි ආනුභාවයෙන් සියලු සත්ත්වයෝ සැප ගෙන දෙන ධර්මරාජයන් වහන්සේගේ ධර්මය දැනගෙන,

නිවන් සුවය පිණිස වූ පිරිසිදු ප්‍රතිපත්තියෙන් යුතු ව ශෝක රහිත උපායාස රහිත උතුම් නිවන් සැපයට පැමිණෙත්වා.

සද්ධර්මය බොහෝ කලක් පවතීවා. සියලු ම සත්ත්වයෝ ධර්මයෙහි ගෞරව සහිත වෙත්වා. සුදුසු කල්හි වර්ෂාව මනාව වසීවා.

පැරණි දැහැමි රජදරුවෝ මේ ප්‍රජාව යම්සේ ආරක්ෂා කළෝ ද, එපරිද්දෙන් රජ තෙමේ තම ප්‍රජාව දැහැමෙන් රකීවා.

අතිශයින් පිරිසිදු ශ්‍රද්ධා බුද්ධි වීර්යයන්ගෙන් ප්‍රතිමණ්ඩිත ශීලාචාර වූ ඍජු බව මෘදුබව ආදී ගුණ සමූහයෙන් යුක්ත වූ ස්වසමය සමයාන්තරයන් ඉගෙනීමට ඒවාට බැසගැනීමට සමර්ථ වූ ප්‍රඥාවෙන් වියත් බවෙන් යුත් අර්ථකථා සහිත ත්‍රිපිටක පර්යාප්තිප්‍රභේද වූ ශාස්තෲ ශාසනයෙහි අප්‍රතිහත ඥානප්‍රභාවෙන් යුක්ත මහා ව්‍යාකරණඥයකු වූ කරණ සම්පත්තියෙන් ජනිත සුවයෙන් නික්මි මිහිරි උදාර වචන ලාවණ්‍යයෙන් යුත් යුක්ති මුක්ති වාදී වූ වාදීන්ගෙන් උතුම් වූ මහාකවි වූ ප්‍රසන්න ප්‍රතිසම්භිදා පරිවාර ෂඩභිඥා ප්‍රතිසම්භිදා ආදී භේද ගුණයන්ගෙන් යුත් උත්තරි මනුෂ්‍යධර්මයෙහි මනාව පිහිටි බුද්ධි ඇති ස්ථවිර වංශයට ප්‍රදීප වූ මහාවිහාරවාසී ස්ථවිරයන් වහන්සේලාගේ වංශයට අලංකාරයක් වූ මහත් වූ පිරිසිදු බුද්ධියෙන් යුක්ත ගෞරවයෙන් ගත් බුද්ධඝෝෂ යන නම් ඇති ස්ථවිරයන් විසින් මේ අර්ථසාලිනී නම් ධර්මසංග්‍රහ අර්ථකථාව කරන ලදී.

**තාව තිට්ඨතු ලොකස්මිං ලොකනිත්ථරණෙසිනං**
**දසෙසන්ති කුලපුත්තානං නයං පඤ්ඤා විසුද්ධියා**

**යාව බුද්ධොති නාමම්පි සුද්ධ චිත්තස්ස තාදිනො**
**ලොකම්හි ලොකජෙට්ඨස්ස පවත්ති මහෙසිනො ති**

පිරිසිදු සිත් ඇති තාදීගුණයෙන් යුත් ලෝකයට ජ්‍යෙෂ්ඨ වූ මහර්ෂී වූ බුදුරජාණන් වහන්සේ බුද්ධ යන නාමය ලෝකයෙහි යම්තාක් කල් පවතී ද,

ලෝකයෙන් එතෙරවීම සොයන කුලපුත්‍රයින්ට ප්‍රඥා විසුද්ධිය සඳහා නය දක්වමින් (මේ අර්ථසාලිනිය) ඒතාක් ලෝකයෙහි පවතීවා.

**අර්ථසාලිනී නම් ධර්ම සංග්‍රහ අර්ථකථාව නිමියේ ය.**

# සූචිය


අජපද දණ්ඩ 226
අඤ්ජන රාගය 303
අට කසිණ 242
අඤ්ඤානු පේක්ෂාව 249
අට්ඨාන පරිකප්පන සූත්‍රය 385
අදණ්ඩාරහව 148

අධිවචන දුක 86
අනුභවන රස 161
අනභිධ්‍යා 145
අනුරාවය 165

අනෝජ මල්දම 43

අන්තවත් දෘෂ්ටිය 101
අපරදීප තාව 191
අපරිණාසකය 207
අපරියාපන්නයෝ 416
අපණ්ණක 304

අප්පටිසතාව 388
අම්බරිය විහාරය 154
අභාවතර 180
අභිනිබ්බත්තියක් 389

අමර නම් නුවර 37

අවහාර පස 149
අවහාරය 149
අවිතක්ක අවිචාර 91

අව්‍යාකත පර 88

අසත් ප්‍රායයන් 221

ආගමට්ඨ කථා 243
ආචය ගාමී 92

ආණාරහ බුදුන් 23
ආපාථගත 225
ආමර්ශනය 98
ආමෝදනකාරය 195
ආයූහන රසතාව 162-268

ආර්ය මාර්ග විරතිය 155
ආවර්ජනය 336

ඉදල් මැස්ස 43
ඉණිමග 268

උක් සකුරු 259
උක් හැල් 394
උපන් නෑ විය 109
උපාදාන දුක 86
උපභාග කළේය 87
උපාදින්න නිර්දේශය 386

උළු වඩුවෙකු 92

ඕඝාත දුක 97

කටු ඇතිරිය 43
කටු කඤ්චුකතා 422
කන කැස්බා 109
කර්මායූහන 321
කාල කුෂ්ටාදිය 390
කුලුම්බ සූත්‍රය 141
කුලු මී දෙනක් 151
කුලුම්බය 141
කුසල පර 88
කූට කහාපන 259
කූට මාසක 259
ඛාරොපමාව 422

ගද්දූල 414
ගුම්බන්තර පරිච්ඡේදය 4
ගොච්ඡකය 86
ගොමුත්ත වංක 203
ග්‍රන්ථිනීය යෝ 98
ඝරා වාසගත 234

චන්ද ලේඛාවංක 204
චිත්ත සමුට්ඨාන 386
චිත්ත සහභූත 386
චිත්‍ර තිලක 191
චුල්ලන්තර දුක 86

දළ මඬුලු 43
දල්හි කර්ම 191
දස පලිබෝධ 221
දිරූ සළුව 43
දුර්විඥෙය භාවය 386
දුස්සෝපමාව 386
දේශනා විලාස 233

දොළොස් පදික ප්‍රත්‍යාහාරය 4
ධර්මච්ඡේදක 151
ධර්ම ධාතුවක් 223
ධර්ම සාමාග්‍රියෙන් 274

නාම රූප දුක 86
නාස්තික අහේතුක ආනතිය 152
නිරුත්ති දුක 86
නිම්නචීරණ සමුද්‍ර චාර භාවය 331

පච්ච භික්‍ඛුඤාණ රස 161
පඤ්ච තිකය 20
පඤ්ඤත්ති දුක 86
පණ්ඩර 193, 316
පරමාස දුක 86
පදත්ථුති 191
පර භණ්ඩාභි මුඛ 154
පහාතබ්බ දුක 86
පරූපඝාත කර්මය 142
පාක භේදයෙන් 388
පිටඨික දුක 86
පිරිකර කද 43
පරායත්ත වෘත්ති 110
පාසාද තල සාටිකා උපමාව 295
පුච්ඡා 104
පානාගාරය 334
පාන ව්‍යසනය 234
පුරුෂ කාරය 419

පේළාව 297
පේළෝපමා 296

පංච මච්ඡරිය 421

භව තණ්හා 101
භාරත යුද්ධය 157
බ්‍රහ්ම ස්වරය 6

මහණ දම් 43
මහන්තර දුක 86
මහා ධම්ම පදය 4
මහා සහස්‍රී ලෝකධාතු 15
මිච්ඡත්තනියත 94
මිද්ධ රූපය 388
මෝස වාර 324

යථාගත මග්ග 206
යමාමහ පෙළහර 406
යේවාපනක ධර්ම 304

වටුමායන මග 46
වවුලු යෝනිය 18
වර්ණ භණනය 215
වැහැරි සිවුර 43

විතණ්ඩවාදී 4
විභව දිට්ඨි විමුත්තය 44

විරලාකාර 293

විසකණ්ටක වෙළෙන්දා 259
විසාහාරය 197

වොත්ථපන 330

සප්ත ප්‍රකරණ 4

සප්තමිථ්‍යා දෘෂ්ටිය 152

සප්ත සත්ප්‍රායයන් 221
සමුච්ඡේද වාර 155
සමෝධානය 23

සම්පත්ති නියත 94
සසත්ථාවචර 111

සාරසූචිය 43
සාල්ලෙක 43
සීතාහරණය 151

සැරයටිය 43
සුද්ධික නවක 243
සුමේධ තාපස 43

සුසන්තික දුක 86

සෙතු සාත 275

ෂට් ප්‍රකරණ 4
ශුද්ධික ප්‍රතිපදාව 277

හිරි බල නිර්දේශය 202
හේතු ගොච්ඡක 86



THE BO-TREE AT ANARAJAPOORA.

ටෙනන්ට් 1859

හදන්ත බුද්ධඝොෂාචාර්යපාදයන් අනුරාධපුර
ශ්‍රී මහා බෝධිය අසල ප්‍රදේශයෙහි වැඩවසමින්
සිහළට්ඨකථා පාලියට පරිවර්තනය කළ බව
බොහෝදෙනාගේ විශ්වාසයයි

බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය
125, ඇන්ඩර්සන් පාර, නැදිමාල, දෙහිවල.
දුරකථන: 2734256, 2728468, 2726234 ෆැක්ස්: 2736737
විද්‍යුත් තැපැල: bcc456@sltnet.lk, info@buddhistcc.com
www.buddhistcc.com

ISBN 978-955-1604-30-1